ජාතික ඉතිරිකිරීමේ බැංකුව

ඒකාබද්ධ වාර්ෂික වාර්තාව

2023



දිරියෙන් යුතුව අපගේ ශක්තිය කුළුගන්වමින්

දිරියෙන් යුතුව අපගේ ශක්තිය කුළුගන්වමින්

අපගේ අරමුණ නොසැලෙන ධෛර්යයකින් ශක්තිමත් කර ගනිමින් දරුණු ආර්ථික කුණාටු හමුවේ පවා අඩසියවසක් පුරාවට ජාතික ඉතිරිකිරීමේ බැංකුව සඵලදායීව ඉදිරියට පැමිණෙන ලදී. දුෂ්කරතාවයන්ගේ පරීක්ෂණයට බඳුන් වී ශක්තිය උරගා බැලුනු අපගේ නිමැවුම් හා සේවා කළඹ, වඩාත් සමෘද්ධිමත් සමයන්හිදී අපට සෞභාග්‍යය උදාකර දී ඇත. අප බැංකුවේ අත්‍යන්ත ශක්තියේ පදනම සහ අපගේ ශ්‍රම බලකායෙහි කැපී පෙනෙන කැපවීම මධ්‍යයේ අප විසින් අත් කර ගන්නා ලද ජයග්‍රහණ රැසකි. ඉදිරියේදී පැන නගින අභියෝගවලට මුහුණපෑමට හැකි ලෙස මෙකී ශක්තීන් වර්ධනය කර ගැනීමටත් දියුණු කර ගැනීමටත් අනාගත දැක්මක් ඇතිව අපි ප්‍රතිඥා දෙන්නෙමු. ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ දිරියෙන් යුතුව අපගේ ශක්තිය කුළුගැන්වීම, නොනවතින ප්‍රයත්නයකි – එය අපගේ නොසැලෙන ධෛර්යය පිළිබඳ සාක්ෂි සපයයි.



NSB

පටුන

අපගේ ඒකාබද්ධ වාර්තාව ගැන 03

ඒකාබද්ධ වාර්තාව | **සංයුක්තය**

පූර්විකාව 07

ජාතික ඉතිරිකිරීමේ බැංකුව පිළිබඳව කෙටියෙන් 08
සන්ධිස්ථාන 10
නිමැවුම් සහ සේවා 11
වැදගත් තොරතුරු 12
සභාපතිතුමාගේ පණිවිඩය 14
සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීගේ සමාලෝචනය 18

අපගේ තිරසාර වටිනාකම් නිර්මාණය කිරීමේ ආකෘතිය 25

මෙහෙයුම් පරිසරය සහ අවදානම් සහ අවස්ථා 26
ප්‍රමාණාත්මකභාවය 45
අපගේ තිරසාර වටිනාකම් නිර්මාණය කිරීමේ ව්‍යාපාරික ආකෘතිය 60
උපායමාර්ග හා සම්පත් වෙන් කිරීම 62
ඒකාබද්ධ පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වය 81

කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණය 95

මූල්‍ය ප්‍රාග්ධනය 96
ව්‍යාපාර මාර්ගසමාලෝචනය 106
නිෂ්පාදිත ප්‍රාග්ධනය 112
බුද්ධිමය ප්‍රාග්ධනය 118
මානව ප්‍රාග්ධනය 124
සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය 136
ස්වාභාවික ප්‍රාග්ධනය 146

ආයතනික පාලනය පිළිබඳ ප්‍රකාශය 151
අවදානම් කළමනාකරණය පිළිබඳ ප්‍රකාශය 152
ස්වාධීන සහතිකවීමේ ප්‍රකාශය 153

පාලනය 157

අධ්‍යක්ෂ මණ්ඩලය 158
ආයතනික කළමනාකාරීත්වය 162
විධායක කළමනාකාරීත්වය 163
ප්‍රධාන කළමනාකරුවන් 165
ආයතනික පාලනය 167
අධ්‍යක්ෂක මණ්ඩල විගණන කමිටු වාර්තාව 182
අධ්‍යක්ෂක මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු වාර්තාව 185
අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටු වාර්තාව 187
අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව 188
හදිසි නොවන සහ අත්‍යවශ්‍ය නොවන වියදම් පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල කමිටු වාර්තාව 190
අවදානම් සමාලෝචනය 191

මූල්‍ය වාර්තා 215

මූල්‍ය දින දර්ශනය 216
අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව 217
මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම සම්බන්ධ ප්‍රකාශය 223
මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය 224
අභ්‍යන්තර පාලනය පිළිබඳ ස්වාධීන සහතිකවීමේ වාර්තාව 226
සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීගේ සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීගේ වගකීම පිළිබඳ ප්‍රකාශය 227
විගණකාධිපති වාර්තාව 228
මූල්‍ය ප්‍රකාශනවල අන්තර්ගතය 231
ආදායම් ප්‍රකාශය 232
විස්තීරණ ආදායම් ප්‍රකාශය 233
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 234
හිමිකමේ වෙනස්වීමේ ප්‍රකාශය 236
මුදල් ප්‍රවාහ ප්‍රකාශය 240
මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 242

අතිරේක තොරතුරු 387

බැංකු පනතේ නියාමනයන් සමඟ අනුකූල වීම 388
ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ යහපරිච සංග්‍රහය සමඟ අනුකූලතාවය 408
ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කරන ලද අනෙකුත් හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවයන් 413
2016 අංක 01 දරන බැංකු පනතේ නියෝගයෙහි III උපලේඛන ප්‍රකාර බාසල් III හෙළිදරව් කිරීම් 420
දේශීය පද්ධති අනුව වැදගත් බැංකු තක්සේරු කිරීමේ ක්‍රියාකාරකම – 2023 432
මධ්‍ය නිර්ණායක සමඟ අනුකූල අන්තර්ගත දර්ශකය 434
ආදායම් ප්‍රකාශය (ඇමරිකානු ඩොලර්) 437
විස්තීර්ණ ආදායම් ප්‍රකාශය (ඇමරිකානු ඩොලර්) 438
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය (ඇමරිකානු ඩොලර්) 439
සංඛ්‍යාලේඛනාත්මක දර්ශකයන් 2014 - 2023 440
තැන්පතු විශ්ලේෂණය 441
අනුරූප බැංකු 442
විදේශ විනිමය හුවමාරු සමාගම් 442
යුරෝජයිරෝ සාමාජිකත්වය 443
මූල්‍ය සහ බැංකුකරණයට අදාළ පාරිභාෂික වචන මාලාව 444
ආයතනික තොරතුරු 450



අපගේ ඒකාබද්ධ වාර්තාව ගැන

ජාතික ඉතිරිකිරීමේ බැංකුව එහි නව වැනි ඒකාබද්ධ වාර්තාව ඉදිරිපත් කරන්නේ ඉමහත් සතුටිනි. මූල්‍ය සම්පත්, නිෂ්පාදන ප්‍රාග්ධනය, බුද්ධිමය ප්‍රාග්ධනය, මානව සම්පත්, සමාජ සම්බන්ධතා හා පාරිසරික මෙහෙයුම් හඳුනා ගනු ලබන ඒකාබද්ධ චින්තන ප්‍රවේශයක් ඔස්සේ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ දිගුකාලීන සාර්ථකත්වයට දායක වන අයුරු එමගින් ප්‍රමුඛ ලෙස දක්වයි.

ඒකාබද්ධ වාර්තාවේ මූලික අවධානය යොමු වන්නේ බැංකුවේ උපාය මාර්ග, මූල්‍ය කාර්ය සාධන සහ අප මෙහෙයුම් සිදු කරනු ලබන ප්‍රජාවන්හි හා පාලන ආයතන, නියාමකයින්, ව්‍යාපාරික පාර්ශ්ව, සේවකයින්, ගනුදෙනුකරුවන්, ආයෝජකයින් හා උනන්දුව දක්වන පාර්ශ්වයන් ඇතුළත්ව අදාළ උනන්දුව දක්වන පාර්ශ්ව, වාතාවරණය, සමාජය, ආර්ථිකය යන අංශ වෙත එමගින් ඇති කරලන බලපෑම පිළිබඳ විස්තීරණ විමසුමක් ලබාදීම කෙරෙහිය.

සීමාව හා විෂය පථය

අපගේ ඒකාබද්ධ වාර්තාකරණ සීමා

පහත ත්‍රිත්වය මගින් පැන නගින අවදානම්, අවස්ථා හා ප්‍රතිඵල ආවරණය කරයි.

මෙහෙයුම් පරිසරය සහ අවදානම් සහ අවස්ථා
පිටු අංක 26 - 44

ප්‍රමාණාත්මකතාව හා තිරසාර වටිනාකම් උත්පාදන ව්‍යාපාරික ආකෘතිය
පිටු අංක 45 - 61

උපාය මාර්ගික හා සම්පත් වෙන් කිරීම
පිටු අංක 62 - 80

සය මාදිලියේ ප්‍රාග්ධන භාවිතය හා බලපෑම
පිටු අංක 96 - 150

ඒකාබද්ධ පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වය
පිටු අංක 81 - 93

අපගේ මූලික එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක

1 NO POVERTY
4 QUALITY EDUCATION
5 GENDER EQUALITY
7 AFFORDABLE AND CLEAN ENERGY
8 DECENT WORK AND ECONOMIC GROWTH
9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE
11 SUSTAINABLE CITIES AND COMMUNITIES
12 RESPONSIBLE CONSUMPTION AND PRODUCTION
16 PEACE, JUSTICE AND STRONG INSTITUTIONS

අපගේ ද්විතියික එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක

2 ZERO HUNGER
3 GOOD HEALTH AND WELL-BEING
6 CLEAN WATER AND SANITATION
10 REDUCED INEQUALITIES
13 CLIMATE ACTION
14 LIFE BELOW WATER
15 LIFE ON LAND
17 PARTNERSHIPS FOR THE GOALS

අපගේ මූල්‍ය වාර්තාකරණ සීමා

අපගේ මූල්‍ය ප්‍රකාශ වාර්තාකරණ සීමා (පාලන මගින් නිර්වචිත) හා අනුගත අතර පරිපාලිත සමාගම් ඊට ඇතුළත්ය.

පරිපාලිත සමාගම්

(ජාතික ඉතිරිකිරීමේ බැංකුව පිළිබඳ කෙටියෙන් යන සටහනෙහි පිටු අංක 9 හි මුළුමනින්ම අයිති පරිපාලිත සමාගම් ද්විත්වය දක්වා ඇත.)

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ 2023 ජනවාරි 1 සිට 2023 දෙසැම්බර් 31 දක්වා මූල්‍ය වර්ෂය, කාර්යසාධන තොරතුරු මගින් ආවරණය වෙයි. මේදිනෙන් පසු හා මෙම වාර්තාවේ අනුමැතිය දක්වා දිනට සැලකියයුතු හෝ වැදගත් සිදුවීම් මීට ඇතුළත් කර ඒ අනුව සටහන් කර ඇත.

මෙම වාර්තාකරණ සීමාවන්ට, ජාතික ඉතිරිකිරීමේ බැංකුව ("බැංකුව" ලෙස ද දක්වා ඇති) සහ ඊට සම්පූර්ණයෙන්ම අයත් පරිපාලිත සමාගම් වන එන්එස්බී ෆන්ඩ් මැනේජ්මන්ට් සමාගම සහ ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව අයත් වේ. සමස්තයක් ලෙස ගත්විට මේ ආයතන "සමූහය" ලෙස හඳුනාගනු ලැබෙයි. අපගේ 2014 වාර්තාවෙහි ස්ථාපිත කර ඇති ආකෘතිය අනුව ගත් විට බැංකුව සහ සමූහය යන ද්විත්වයට අදාළව මූල්‍ය කරුණු, සාකච්ඡාවට බඳුන් කර ඇති අතර වෙනත් ආකාරයෙන් නිශ්චිතව දක්වා නොමැති අවස්ථාවන්හිදී මූලිකවම බැංකුවට අදාළව මූල්‍ය නොවන කරුණු සාකච්ඡාවට ගෙන ඇත.

ඒකාබද්ධ වාර්තාව මගින් ආවරණය වන වාර්තා කරනු ලබන කාලසීමාවට මූල්‍ය හා තිරසාර වාර්තාකරණය සඳහා වාර්ෂික වාර්තාකරණ චක්‍රය හා අනුගත 2023 ජනවාරි 01 සිට 2023 දෙසැම්බර් 31 දක්වා මූල්‍ය වර්ෂය ඇතුළත් වේ. එමෙන්ම 2023 දෙසැම්බර් 31 දිනෙන් පසු අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලත් දිනය වන 2024 මාර්තු 20 දින තෙක් වාර්තා වන කිසියම් වැදගත් සිදුවීම් වෙතොත් එයද ඇතුළත් වේ. විෂය පථය හා අංශ සීමාවන් අනුව පෙර වාර්තාකරණ කාලපරිච්ඡේද වලින් සැලකියයුතු වෙනස්කම් නොමැති අතර නැවත වර්ගීකරණය කරන ලද හෝ නැවත ප්‍රකාශ කරන ලද සංසන්දනාත්මක තොරතුරු අදාළ අංශවල අනාවරණය කර සාකච්ඡා කෙරේ.

මූල්‍ය නොවන කාර්ය සාධනය, අවස්ථා, ඇල්මැති පාර්ශ්වයන්, අදාළ අවදානම්/ප්‍රතිඵල, උපාය මාර්ගය, ව්‍යාපාර ආකෘතිය, මෙහෙයුම් සන්දර්භය, ප්‍රමාණාත්මක අවදානම්, පාර්ශ්වකාර බැඳියාවන්, කාර්ය සාධනය සහ පාලනය පිළිබඳ තොරතුරු ද වාර්තාවට ඇතුළත් වේ.

අන්තර් ක්‍රියාකාරී PDF

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ වාර්ෂික වාර්තාව වඩාත් පහසුවෙන් අනෙකුත් වාර්තා හා සන්සන්දනාත්මකව කරුණු විමසිය හැකි පරිදි වැඩිමනත් අන්තර්ගත සංචලන අවස්ථා සලසමින් හා හයිපර්ලින්ක් භාවිත කරමින් අන්තර් ක්‍රියාකාරී PDF ලෙස ලබාගත හැකි අතර, වාර්තාව තුළ පාඨකයාට විවිධ සංචලන සඳහා ඉඩ ප්‍රස්තාව සලසා දෙයි.

සහතිකවීම

බාහිර සහතිකවීම් සපයන්නන්, අභ්‍යන්තර විගණන, කළමනාකරණ අධීක්ෂණ ඇතුළත් ද්වි ප්‍රවේශයක් හරහා අපගේ මූල්‍යමය මෙන්ම මූල්‍යමය නොවන දත්තවල විශ්වසනීයත්වය ඉහළ තැනක තබා ගැනීම අපගේ අරමුණයි. අපගේ කීර්තිනාමය සහ කොටස් හිමියන්ගේ වටිනාකම වඩාත් ශක්තිමත් කිරීමට මෙකී ක්‍රියාවලිය උපකාරී වෙයි. බැංකුව තුළ සවිමත් අභ්‍යන්තර පාලන රාමුවක් ස්ථාපිත කිරීමට අප කැපවී සිටින අතර එමගින් කළමනාකාරිත්වය, අධ්‍යක්ෂ මණ්ඩලය, එහි අනු කමිටු මගින් අභ්‍යන්තර තිරණ ගැනීම ඔස්සේ දත්තවල විශ්වසනීයත්වය අධීක්ෂණය කිරීමට මෙයින් හැකියාව ලැබෙන අතර බාහිර වාර්තාවන්හි නිරවද්‍යතාව සහතික කර ගැනීමට ද අවස්ථාව උදා වේ.

අපගේ ඒකාබද්ධ වාර්තාව ගැන

ඒකාබද්ධ වාර්තාවේ අන්තර්ගත කරුණු පහත පරිදි වේ.

ඒකාබද්ධ වාර්තාකරණය

සහතිකවීම් පිළිබඳ තත්ත්වය හා සැපයුම්කරු

සියලු නියාමන හා ව්‍යවස්ථාපිත අවශ්‍යතා මෙන්ම අන්තර් ජාතික මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් පදනමෙහි ආකෘතිය මත පදනම්ව ඒකාබද්ධ වාර්තාකරණය සැලසුම් කර තිබේ. මූල්‍ය ප්‍රකාශ විගණකාධිපති විසින් විගණනය කරනු ලැබ ඇති අතර තිරසාර බව පිළිබඳ වාර්තාකරණය ශ්‍රී ලංකා KPMG ආයතනය විසින් විගණනය කරනු ලැබිණි. බැංකුවේ සමාජ හා පාරිසරික බලපෑම් පිළිබඳව ගෝලීය වාර්තාකරණ දර්ශක ප්‍රමිතීන් හා මූලධර්මයන්ට අනුකූලව ඉදිරිපත් කර ඇත. එක්සත් ජාතීන්ගේ මූලික තිරසාර සංවර්ධන ඉලක්ක අතරින් බැංකුවට ප්‍රධාන වශයෙන්ම අදාල ඉලක්ක 9 ක්ද, ද්විතීයික තිරසාර සංවර්ධන ඉලක්ක ලෙස සාපේක්ෂව බලපෑම අඩු සෙසු ඉලක්ක 8 ක්ද වෙත බැංකුවේ සැලකිය යුතු දායකත්වය පිළිබඳව මෙම වාර්තාව අවධානය යොමු කරයි.

1971 අංක 30 දරණ ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත හා එහි සංශෝධන

මූල්‍ය තොරතුරු

සහතිකවීම් පිළිබඳ තත්ත්වය හා සැපයුම්කරු

1988 අංක 30 දරන බැංකු පනතේ අවශ්‍යතා ප්‍රකාර ඊට අනුකූලව, සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් හා අනුකූලව සම්පාදිත මූල්‍ය ප්‍රකාශ වෙතින් සංක්ෂිප්ත මූල්‍ය තොරතුරු උපුටා ගනු ලැබෙයි. මෙකී මූල්‍ය ප්‍රකාශ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී විසින් සහතික කරනු ලැබ ඇති අතර බැංකුවේ සභාපති ඇතුළු අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු සහ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී විසින් අනුමත කර අත්සන් තබා ඇත.

පිළිගත් මූල්‍ය නොවන කාර්යසාධන ප්‍රමිතීන්

සහතිකවීම් පිළිබඳ තත්ත්වය සහ සැපයුම්කරු

ඒකාබද්ධ වාර්තාවන්හි ඇතුළත් පිළිගත් මූල්‍ය නොවන කාර්යසාධන ප්‍රමිතීන් KPMG ආයතනය මගින් සත්‍යාපනය කරනු ලැබ ඇත.

සෙසු සියලු මූල්‍ය නොවන කාර්යසාධන තොරතුරු

සහතිකවීම් පිළිබඳ තත්ත්වය සහ සැපයුම්කරු

සියලු අතිරේක මූල්‍ය නොවන දත්ත මැනීම සඳහා ඇති ක්‍රමවේද කළමනාකාරිත්වය විසින් තහවුරු කර ඇති අතර ඉන් අනතුරුව මෙකී ක්‍රියාවලීන් පිළිබඳවද සහතිකවීම් සපයා ඇත. බැංකුවේ නියාමන හා ව්‍යාපාරික ආකෘතිවලට අනුගතව තොරතුරු හා දත්ත සපයා ගනු ලැබිණි.


ප්‍රමාණාත්මකභාවය

තීරණ ගැනීම කෙරෙහි බලපාන අපගේ ඒකාබද්ධ චින්තන ප්‍රවේශයට ප්‍රමාණාත්මකතා ඇගැයීම තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරනු ලබන අතර එමගින් බැංකුවේ තිරසර බව සුරක්ෂාකර ගැනීමටද, සියළු උනන්දුව දක්වන පාර්ශවයන්ට ඇති වටිනාකම වර්ධනය කර ගැනීමටද ඉවහල් වෙයි. විවිධ කාල පරාසයන් තුළ වටිනාකම් උත්පාදනය කිරීමට අප සතු හැකියාවට සැලකියයුතු ලෙස බලපෑම් එල්ල කරනු ලබන සාධක, අප විසින් වැදගත් තේමා වශයෙන් හඳුනාගනු ලබයි. එමෙන්ම ඒවායෙහි කෙටිකාලීන හා දිගුකාලීන බලපෑම් හඳුනා ගැනීමට ඒකාබද්ධ දැක්මක් උපයෝගී කරගනු ලබයි. බැංකුවේ මෙහෙයුම් හා උපාය මාර්ගික ආකෘතියට වැදගත් ලෙස සලකනු ලබන මෙකී නිශ්චිත තේමා යටතේ බැංකුවට අදාළ වැදගත් තොරතුරු වර්ගීකරණය කරනු ලැබ ඇත.

කෙටි කාලීන, මධ්‍ය කාලීනව හා දීර්ඝ කාලීනව පරිසරය, ප්‍රජාව හා සමාජය (බලපෑමෙහි ප්‍රමාණාත්මකභාවය) වෙත අපගේ බලපෑම සහ නිෂ්පාදනයට හෝ වටිනාකම සුරක්ෂා කර ගැනීමට (මූල්‍ය ප්‍රමාණාත්මකභාවය) කෙරෙහි අපගේ බලපෑමට අදාළ කරුණු තීරණය කරනු ලස් බැංකුව විසින් ද්විත්ව ප්‍රමාණාත්මකතා ප්‍රවේශයක් අනුගමනය කරනු ලැබෙයි. කැපී පෙනෙන ලෙස වටිනාකම් උත්පාදනයට හෝ සංරක්ෂණය කර ගැනීමට හෝ වටිනාකම් ක්ෂයවීමට තුඩු දෙන සැලකිය යුතු කරුණු කෙරෙහි අදාල වන සන්දර්භය මෙම වාර්තාව ඉදිරිපත් කරයි.

බැංකුව විසින් වාර්තා කළයුතු වන සැලකිය යුතු කරුණු හඳුනා ගැනීමට මෙන්ම උනන්දුව දක්වන පාර්ශ්වයන් සමග නිරතවීම් මගින් හා අපගේ මෙහෙයුම් වාතාවරණ හමුවේ පැන නගින අවස්ථා හා මූලික අවදානම් අප විසින් උත්තෝලනය කරනු ලැබ ඇත.

අපගේ සැලකිය යුතු තේමා තීරණය කිරීමේ ක්‍රියාවලිය පහත දක්වා ඇත.



අපගේ ප්‍රමාණාත්මක තේමා

ගෝලීය හා දේශීය සමාජ – දේශපාලනික හා ආර්ථික භේදන පුද්ගලයින්, ලාභය හා පෘථිවිය යන තලයන්හිදී අභියෝගවලට ඔරොත්තුදීමේ හැකියාව සහතික කරමින් ආර්ථික, සමාජ – දේශපාලන අවිනිශ්චිතතා හරහා ඉදිරියට යාම.


ජනවිකාශ විපර්යාස හා වැඩ ලෝකයේ පරිණාමය කුසලතා හා හැකියාවන්ගේ ප්‍රත්‍යාගණනයට සහභාගිවීම, රාජකාරී හා පරම්පරා අතර අභිලාෂයන් පිළිබඳ සේවකයින් ඉදිරිපත් කරන වටිනාකම් ඇතුළත් යෝජනා සලකා බැලීම.

ඩිජිටල් භේදන හා ඉහළ යන තරඟකාරීත්වය නව තාක්ෂණය අනුසාරයෙන් ගනුදෙනුකාර සේවාව යළි හැඩ ගස්වන අයුරු, නව්‍යකරණයට පෙළඹවීම සහ අත්දැකීම් වෙනස් කරවන අයුරු හඳුනා ගැනීම

නියාමන සුපරීක්ෂණය ඉහළයාම සයිබර් ආරක්ෂණ තර්ජන හා මූල්‍ය අපරාධ වලින් බැංකුව හා ගනුදෙනුකරුවන් ආරක්ෂා කර ගැනීමට සහ සන්නාමය සවිමත් කිරීමේ නියාමන හා අනුකූලවීම.

තිරසාර බව හා දේශගුණ විපර්යාස කළමනාකරණය කිරීම අපගේ කාබන් පියසටහන් අවම කිරීමට හා පරිසර හිතකාමී පරිවයන් වඩාත් දිරි ගැන්වීමට තිරසර මෙහෙයුම් ඇතුළත් කිරීම සහ වගකිවයුතු ලෙස මූල්‍යයන කටයුතු කිරීම.

අපගේ ඒකාබද්ධ වාර්තාව ගැන



SPE – ගෝලීය හා දේශීය සමාජ - දේශපාලනික හා ආර්ථික භේදන CD – ජනවිකාශ විපර්යාස හා වැඩ ලෝකයේ පරිණාමය
DDC – ඩිජිටල් භේදන හා ඉහළ යන තරඟකාරීත්වය RC – නියාමන සුපරීක්ෂණය ඉහළයාම CCS – තිරසාර බව හා දේශගුණ විපර්යාස කළමනාකරණය කිරීම

ඉදිරි දැක්ම

ඉදිරි දැක්ම යටතේ පහත ප්‍රශ්ණවලට පිළිතුරු සැපයෙයි.

"අපගේ උපායමාර්ග දියත් කිරීමේදී කෙබඳු අභියෝග, අවස්ථා හා අවිනිශ්චිතතාවයන්ට මුහුණපෑමට සිදුවේද? බැංකුවේ ව්‍යාපාරික ආකෘතියට හා අනාගත කාර්යසාධනයට ඇති විය හැකි බලපෑම් කවරේද?"

මෙම වාර්තාවේ ඉදිරි දැක්ම යටතේ පහත සඳහන් පරිච්ඡේද යටතේ තොරතුරු දක්වා ඇත.

සභාපතිතුමාගේ පණිවුඩය
පිටු අංක 14

සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරීගේ සමාලෝචනය
පිටු අංක 16

මෙහෙයුම් පරිසරය සහ අවදානම් සහ අවස්ථා
පිටු අංක 26-41

උපායමාර්ගික හා සම්පත් වෙන් කිරීම
පිටු අංක 62

මූල්‍ය ප්‍රාග්ධනය
පිටු අංක 96

නිෂ්පාදිත ප්‍රාග්ධනය
පිටු අංක 112

බුද්ධිමය ප්‍රාග්ධනය
පිටු අංක 123

මානව ප්‍රාග්ධනය
පිටු අංක 124

සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය
පිටු අංක 136

ස්වාභාවික ප්‍රාග්ධනය
පිටු අංක 146

ඉදිරි දැක්ම පිළිබඳ ප්‍රකාශ

මෙම වාර්තාව තුළ බැංකුවේ අනාගත කාර්ය සාධනය සහ දර්ශනයන් සම්බන්ධයෙන් ඉදිරි දැක්ම පිළිබඳ ප්‍රකාශ ඇතුළත්ය. මෙම ප්‍රකාශයන්, වාර්තාව පිළියෙල කරන කාලය තුළ අපගේ වර්තමාන විනිශ්චයන් සහ අපේක්ෂාවන් පිළිඹිබු කරයි. කෙසේ වෙතත්, මතුවන විවිධ අවදානම්, අවිනිශ්චිතතාවයන්, සහ වෙනත් වැදගත් සාධක බැංකුවේ ව්‍යාපාරික කටයුතු සහ මූල්‍ය ප්‍රතිඵලවලට සෘණාත්මක බලපෑම් එල්ල කරමින් අපගේ මූලික අපේක්ෂාවන්ගේ ප්‍රතිඵලය ප්‍රමාණාත්මකව වෙනස් කළහැකි බව සඳහන් කිරීම වැදගත්ය.

අධ්‍යක්ෂ මණ්ඩල වගකීම් ප්‍රකාශය

ඒකාබද්ධ වාර්තාකරණයෙහි පාරදෘශ්‍ය භාවය හා විශ්වසනීයත්වය සම්බන්ධයෙන් ඇති වගකීම, ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ පාලන ආකෘතියෙහි භාරකරුවන් වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිළිගනු හා සහතික කරනු ලබයි. එමෙන්ම එමගින් විවිධ උනන්දුව දක්වන පාර්ශ්වයන් මත විස්තීර්ණ හා නිරවද්‍ය අයුරින් බැංකුවේ කාර්යසාධනය, උපාය මාර්ග, අවදානම් හා බලපෑම් බලපාන අයුරු මෙන්ම කෙටිකාලීන, මධ්‍ය කාලීන හා දිගුකාලීනව වටිනාකම් උත්පාදනයට එහි හැකියාව ද සවිලදායීව සන්නිවේදනය කරනු ලබන බව විශ්වාස කරයි. ඒකාබද්ධ වාර්තාකරණ ආකෘතියට අනුගතව ඒකාබද්ධ වාර්තාව සම්පාදනය කරන ලද බවට අධ්‍යක්ෂ මණ්ඩලය සහතික වෙයි.

කළමනාකාරිත්වයේ අධීක්ෂණය යටතේ සහ අභ්‍යන්තර හා බාහිර සමාලෝචන ක්‍රියාපටිපාටිය හරහා නිශ්චය කර ගන්නා ලදුව සම්පාදනය කරනු ලැබූ ඒකාබද්ධ වාර්තාවේ විශ්වසනීයත්වය, නිරවද්‍යතාව හා සවිලදායී බව පිළිබඳ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩලය

ආචාර්ය හර්ෂ කබ්‍රාල් – සභාපති/ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ

ශූඩ් නිලුක්ෂාන් – නිල බලයෙන් පත් අධ්‍යක්ෂ ස්වාධීන නොවන, විධායක නොවන අධ්‍යක්ෂ

එස් ආර් ඩබ්ලිව් එම් රුවන් පාලිත සත්කුමාර – නිල බලයෙන් පත් අධ්‍යක්ෂ ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ

එච් කේ ඩී ලක්ෂ්මන් ගාමිණී – (2023 දෙසැම්බර් 14 දින විශ්‍රාම යන ලදී) ස්වාධීන නොවන, විධායක නොවන අධ්‍යක්ෂ

දුෂ්‍යන්ත බස්නායක – ස්වාධීන නොවන, විධායක නොවන අධ්‍යක්ෂ

අශේන් ජයසේකර – ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ

විමසීම්

මෙම වාර්තාව සම්බන්ධයෙන් ඔබේ අදහස් හා යෝජනා අප අගය කරන අතර ඒවා පහත දැක්වෙන ලිපිනයට යොමු කළ හැකිය.

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
මුදල් හා සැලසුම් අංශය
ජාතික ඉතිරිකිරීමේ බැංකුව
අංක 255, ගාලු පාර, කොළඹ 03.

අපගේ ඒකාබද්ධ වාර්තාව ගැන

සංචලන සළකුණු

ප්‍රාග්ධනයන්

- මූල්‍ය ප්‍රාග්ධනය
- නිෂ්පාදිත ප්‍රාග්ධනය
- බුද්ධිමය ප්‍රාග්ධනය
- මානව ප්‍රාග්ධනය
- සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය
- ස්වභාවික ප්‍රාග්ධනය

පාර්ශ්වකරුවන්

- කොටස් හිමියා/ ආයෝජකයා
- ගනුදෙනුකරුවන්
- සේවකයින්
- නියාමකයින් හා රජයේ ආයතන
- ව්‍යාපාර හවුල්කරුවන්
- සමාජය හා පරිසරය

වෙනත්

- පිටු යොමුව

කෙටිකාලීන සිට මධ්‍ය කාලීන දක්වා උපායමාර්ග

- ගනුදෙනුකාර අත්දැකීම් වැඩි කිරීම
- සේවක සහභාගිත්වය වැඩි කිරීම
- අවදානම් සංස්කෘතිය නැවත බලගැන්වීම
- ෙඑන්ද්‍රිය වර්ධනය ප්‍රවර්ධනය
- ඩිජිටල්කරණය වේගවත් කිරීම
- ආදර්ශය මගින් නායකත්වය

දිගුකාලීන උපායමාර්ග

- ගනුදෙනුකාර කේන්ද්‍රිය
- පාලන විශිෂ්ටත්වය
- තිරසාර වර්ධනය
- පරිවර්තනීය නායකත්වය

ප්‍රමාණාත්මක කරුණු

- Risk 1 මූල්‍ය අවදානම
- Risk 2 උපාය මාර්ගික අවදානම
- Risk 3 මෙහෙයුම් අවදානම
- Risk 4 ණය අවදානම
- Risk 5 වෙළඳපොළ අවදානම
- Risk 6 ද්‍රවශීලතා අවදානම
- Risk 7 කීර්තිනාමය පිළිබඳ අවදානම
- Risk 8 ESG අවදානම

ප්‍රමාණාත්මක කරුණු

- ආර්ථික, සමාජ සහ දේශපාලන අවිනිශ්චිතතාව හමුවේ ව්‍යාපාරික ඔරොත්තුදීම
- මූල්‍ය තිරසාරභාවය හා ලාභදායීතාව
- නිපුනතා හා හැකියාවන්
- සේවක වටිනාකම් කොටස
- ඩිජිටල් පරිනාමනය
- නව්‍යකරණය හා කඩිසරකම
- ගනුදෙනුකාර සේවය හා අත්දැකීම්
- පාලනය හා අනුකූලතාව
- සයිබර් තර්ජනය හා තොරතුරු ආරක්ෂාව
- මූල්‍ය අපරාධය
- CO_2 අපගේ කාබන් පාසටහන කළමනාකරණය
- වගකීම් සහගත මූල්‍යකරණය

ඒකාබද්ධ වාර්තාව

පූර්විකාව

ජාතික ඉතිරිකිරීමේ බැංකුව පිළිබඳව කෙටියෙන් 08

සන්ධිස්ථාන 10

නිමැවුම් සහ සේවා 11

වැදගත් මූල්‍ය තොරතුරු 12

සභාපතිතුමාගේ පණිවිඩය 14

සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරීගේ සමාලෝචනය 18

ජාතික ඉතිරිකිරීමේ බැංකුව පිළිබඳ කෙටියෙන්

අපගේ දැක්ම

ඉතිරිකිරීම් සහ ආයෝජන සඳහා වඩාත් ස්ථාවර හා තේරීම බවට පත්වීම

අපගේ මෙහෙවර

ගනුදෙනුකරුවන්ගේ ඉතුරුම් හා ආයෝජන අවශ්‍යතා ප්‍රශස්ත ලෙස සපුරාලීමට අවශ්‍ය පරිපූර්ණ මූල්‍ය විසඳුම් සැපයීම හා බැංකුව පිළිබඳ උනන්දු වන සියළුම පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂාවන් මුදුන් පැමිණවීම.

අපගේ වටිනාකම්

අපගේ ඒදිනෙදා ව්‍යාපාරයට ඉක්මන්ව සහ නව්‍යතාවයෙන් යුතුව ප්‍රතිචාර දැක්වීම සඳහා අනොන්‍ය ගෞරවයෙන් යුතුව ක්‍රියා කිරීම

ශ්‍රී ලංකාවේ මූල්‍ය ස්ථාවරත්වය සහ සවිබලගැන්වීමේ ප්‍රදීපයක් සේ පෙනී සිටින ජාතික ඉතිරිකිරීමේ බැංකුව දිවයින පුරා ඉතිරිකිරීමේ සංස්කෘතිය ස්ථාපනය කිරීමෙහිලා පුරා වසර 50 ක් මුළුල්ලේ කැපවී සිටින ආයතනයකි. සම්මානික ඉතුරුම් ආයතන හතරක ඒකාබද්ධතාවයකින් 1972 වර්ෂයේදී ස්ථාපිත කරනු ලැබූ ජාතික ඉතිරිකිරීමේ බැංකුව මෙරට මූල්‍ය උරුමයේ භාරකරුවෙකු ලෙස ඉදිරියට පැමිණ සිටියි.

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ මූලාරම්භය, 1832 දී ස්ථාපිත කරන ලද සිලෝන් ඉතිරිකිරීමේ බැංකුව තෙක් දිවෙන අතර, ඉතිරිකිරීමේ ක්ෂේත්‍රයේ සියවසකට අධික ඉතිහාසයකට උරුමකම් කියයි. ජාතිය, සමාජ පන්තිය හෝ ස්ත්‍රී පුරුෂභාවය නොසලකා සියලු සමාජ කොට්ඨාශයන් අතර ඉතිරිකිරීමේ පුරුද්ද ප්‍රවර්ධනය කිරීම මගින් මූල්‍ය අන්තර්ග්‍රහණය සාක්ෂාත් කර ගැනීමේ අරමුණ පෙරදැරිව 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් ලෙසින් ජාතික ඉතිරිකිරීමේ බැංකුව ස්ථාපිත කෙරිණි. අද වන විට සක්‍රීය ගිණුම් මිලියන 13 ඉක්මවූ ජාතික ඉතිරිකිරීමේ බැංකුව මෙරට වඩාත් මූල්‍ය අන්තර්ග්‍රහණය අතින් ඉදිරියෙන්ම සිටින බැංකුවක් ලෙස කටයුතු කරයි.

අප බැංකුව විසින් එය පිහිටුවීමේදී පාදක කරගනු ලැබූ ප්‍රතිපත්තීන් වෙනුවෙන් පෙනී සිටීමට තවදුරටත් කැප වන අතර, අපගේ ගනුදෙනුකාර හවතුන්ගේ වෙනස් වන මූල්‍ය අවශ්‍යතාවයන්ට සරිලන පරිදි අප සේවා දියුණු තියුණු කිරීමට ද යුහුසුළු වෙයි. පසුගිය වර්ෂ කිහිපය මුළුල්ලේ රට තුළ පැවති අභියෝගාත්මක වාතාවරණය මැද වුවද තනි තනිව ගත්විට පුද්ගලයින්ගේ ජීවිත කෙරෙහි ධණාත්මක බලපෑමක් ඇති කරලිය හැකි ලෙස අපගේ මූලික මෙහෙවර කෙරෙහි අභියෝග හමුවේ නොසැලී සිටීමේ ගුණය ප්‍රකට කරන ලදී. එලෙස අභියෝග හමුවේ නිරුපද්‍රිතව යාත්‍රා කිරීමේ බැංකුව සතු හැකියාව හේතුවෙන් සියලුම උනන්දුව දක්වන පාර්ශ්වයන්හට වඩාත් හොඳින් සේවා සැපයීමට අවස්ථාව සැලසිණි.


සන්නාම ශ්‍රේණිගත කිරීම්

"ද ලංකා රේටින්ග් ඒජන්සි" ආයතනය විසින් 2026 වසර සඳහා ත්‍රිත්ව ණඑඒ ස්ථාවර ශ්‍රේණිගත කිරීමක් බැංකුව වෙත ලබා දී ඇත. එමෙන්ම බ්‍රෑන්ඩ් ෆයිනෑන්ස් ලංකා ලිමිටඩ් ආයතනය විසින් ශ්‍රී ලංකාවේ හත්වන වටිනාම සන්නාමය ලෙස ජාතික ඉතිරිකිරීමේ බැංකුව නම් කරනු ලැබිණි.

ශාඛා ජාලය

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ඉතිරිකිරීමේ බැංකුව ලෙස ජාතික ඉතිරිකිරීමේ බැංකුව සතුව ගනුදෙනුකාර ප්‍රජාවට වඩාත් හොඳ සේවාවක් සැලසීමට හැකිවන පරිදි ශාඛා 262 ක්, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර/සීආර්එම් යන්ත්‍ර 417 ක් මෙන්ම නියෝජිතායතන 4,006 කින් (තැපැල් කාර්යාල හා උප තැපැල් කාර්යාල) සමන්විත නියෝජිතායතන ජාලයකින් සවිමත් සුවිසල් ශාඛා ජාලයක් පවතී.

අපගේ ශක්තිය හා ස්ථාවරත්වය



රූපය 1 →

ජාතික ඉතිරිකිරීමේ බැංකුව පිළිබඳ කෙටියෙන්

ජාතික ඉතිරිකිරීමේ බැංකුව වඩාත් කැපී පෙනීමට හේතුව

දිවයිනෙහි ප්‍රමුඛතම ඉතිරිකිරීමේ බැංකුවක් ලෙස ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් වඩාත් අර්ථාන්විත ව්‍යාපාරික පරිවයන් වෙත ප්‍රමුඛතාව ලබාදීමටත් එහි සම කළ නොහැකි විශ්වසනීය බව අරුත් ගන්වන ව්‍යාපාරික සංස්කෘතියක් ඔසවා තැබීමටත් මුල් වෙයි.

සිය තැන්පතු අතරින් 60% ක් ඉතා සුදුසු රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කිරීමට නෛතිකව බැඳී සිටින හෙයින් සියලුම තැන්පතු සහ එකී තැන්පතු මත උපචිත වන පොලී මුදල් සඳහා 100% ක උපරිම රාජ්‍ය ආරක්ෂාවක සහතිකය ලබාදිය හැකි මෙරට එකම බැංකුව ලෙස ජාතික ඉතිරිකිරීමේ බැංකුව නම් දරයි.

මෙම බැඳීම අපගේ ගනුදෙනුරුවන් අතර ඉතා ශක්තිමත් විශ්වාසයේ පදනමක් බිහිවීමට හේතු පාදක වී ඇති බව බැංකුව විසින් සේවා සපයනු ලබන සක්‍රීය ගිණුම් මිලියන 13.0 ක් පැවතීමෙන් පැහැදිලි වන කරුණකි. ණයදීම් හා ශක්තිමත් අවදානම් කළමනාකරණ ක්‍රියාවලියක් සම්බන්ධයෙන් වඩාත් විපරම්ශීලී ප්‍රවේශයක් අනුගමනය කිරීම මගින් හානිකරණ ණය ප්‍රතිශතය අවම මට්ටමේ (අදියර 3) පවත්වා ගැනීමට ජාතික ඉතිරිකිරීමේ බැංකුව සමත් වී තිබේ.

රජයේ මහා භාණ්ඩාගාරයට බදු, අයබදු, ගාස්තු හා ලාභාංශ යනාදී මූල්‍යමය බැඳීම් ලෙසින් දායකවීම මගින් රජයේ ජාතික සංවර්ධනය කෙරෙහි බැංකුව සක්‍රීයව සිය දායකත්වය පිරිනමයි. බැංකුව විසින් ජාතිය ගොඩනැංවීමේ ක්‍රියාවලියට කැපී පෙනෙන ලෙස දායක වෙමින් රජයේ දීර්ඝ කාලීන සංවර්ධන සැලසුම් හා සමාජ - ආර්ථික ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමෙහිලා උත්සුක වෙයි. සමාජයීය අභිමතාර්ථ සපුරාලීමට තුඩු දෙන ආචාරධර්ම රැගත් ප්‍රමිතීන් සුරැකීමට කැප වෙන ජාතික ඉතිරිකිරීමේ බැංකුව පළපුරුදු කළමනාකාරිත්වයකින් මෙහෙයවනු ලබන අතර ශක්තිමත් ආයතනික පාලන ප්‍රතිපත්ති මත පිහිටා කටයුතු කරනු ලබයි.

ජාතික ඉතිරිකිරීමේ බැංකු සමූහය

NSB

ශාඛා බැංකුකරණය

- ඉතිරිකිරීමේ පතාක යෝධයෙකු ලෙස ක්ෂේත්‍රයේ වසර 50 ඉක්මවූ සේවා පළපුරුද්ද
- පාරිභෝගික බැංකුකරණය (තැන්පතු ලබා ගැනීම පාරිභෝගික ණයදීම, බැංකු ඇපකර, කාඩ් විසඳුම් සහ ගනුදෙනු බැංකුකරණය ඇතුළු සම්පූර්ණ සේවා පරාසයක් ඇතුලත්

ආයතනික මූල්‍ය

- මූල්‍ය ආයතන සහ ඒවායේ පරිපාලන සමාගම්වලට සෘජු ණයදීම
- ණය දෙන්නන් සහ ණයගන්නා/ණයගන්නන් අතර නිරවුල් කිරීම සහ ගනුදෙනු කිරීම අතර සම්බන්ධීකරණය කරන සංගත පහසුකම් සඳහා නියෝජිතයාගේ කාර්යභාරය ඉටු කරයි
- භාර සහතිකපත්, පුද්ගලික ස්ථාපන සහ ණයකරවල ආයෝජනය
- යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා අරමුදල් ලබාදීමේ ක්ෂේත්‍රයේ ණයදීමේ පළපුරුද්ද
- ණය සුරැකුම්පත් නිකුතුව

ජාත්‍යන්තර බැංකුකරණය

- ඇ. ඩොලර්, යුරෝ, බ්‍රිතාන්‍ය පවුම්, ඔස්ට්‍රේලියානු ඩොලර්, සිංගප්පූරු ඩොලර් පවුම් සහ ජපන් යෙන් වලින් කරනු ලබන විදේශ මුදල් තැන්පතු (ඉතුරුම් සහ ස්ථාවර තැන්පතු)
- අභ්‍යන්තර සහ බාහිර ප්‍රේෂණ
- විදේශ විනිමය හුවමාරුව
- ආනයන ණයවර ලිපි නිකුත් කිරීම
- ආනයන බිල්පත් නිරවුල් කිරීම
- නැව් හා ගුවන් භාණ්ඩ ඇප නිකුත් කිරීම

භාණ්ඩාගාරය

- රජයේ සුරැකුම්පත්, ස්කන්ධ සහ විදේශ විනිමය, ප්‍රතිමිලදී ගැනීමේ ණය දීම් සහ ප්‍රති විකුණුම් ණයදීමේ ගිවිසුම්වල ආයෝජනය ස්ථාවර ආදායම් වෙළඳපළ නිර්මාණය
- රාජ්‍ය ණය සම්බන්ධයෙන් මූලික අරමුදල් සැපයීම
- මුදල් කළමනාකරණයේ ප්‍රවණතා සැපයීම

සී/ස. එන්එස්බී ෆන්ඩ් මැනේජ්මන්ට් සමාගම

NSB Fund Management

- මූලික වෙළෙඳපොල කටයුතු
- ද්විතියික වෙළෙඳපොල කටයුතු
- මහ බැංකුව සමඟ ගිණුම් පියවීම (Lanka Settle)
- මහ බැංකුව සමඟ පවතින සුරැකුම් ගිණුම (Lanka Secure)
- ආයතනික ණය සුරැකුම්පත් වෙළඳාම
- ස්විෆ්ට් සම්බන්ධතාව
- කළඹ කළමනාකරණය
- මුදල් කළමනාකරණය

ශ්‍රී ලංකා ඉතුරුම් බැංකුව

SLS Bank

- ඉතුරුම්
- ණය
- කල්බදු
- ආයතනික මූල්‍ය
- උකස්කර
- විශේෂිත බලපත්‍රලාභී බැංකුකරණ කටයුතු සියල්ල

තාක්ෂණය සහ මෙහෙයුම් ඇතුළුව ආයතනික සේවා

- සෑම ශ්‍රී ලාංකික පුරවැසියෙකු හටම සරිලන දෛනික බැංකුකරණ විසඳුම් මගින් සන්නද්ධ දීපව්‍යාප්ත 262 ක් වූ ශාඛා ජාලය හා තැපැල් බැංකු ජාලය
- සියලු කාණ්ඩ හරහා විහිදුණු සැලකිය යුතු ගනුදෙනුකාර සංචිතය
- දේශීය නිවාස ඉදිකිරීම් සඳහා අරමුදල් සැපයුම සහ ක්ෂේත්‍රයේ පුරෝගාමී විශේෂඥභාවය

- රජයේ ව්‍යාපෘති සම්බන්ධයෙන් ප්‍රධාන පෙළේ යටිතල පහසුකම් සපයනු ලබන්නන් අතර එක් ආයතනයක් වීම.
- මූල්‍ය අභියෝග වලට මුහුණපාන ගනුදෙනුකරුවන් හට සහාය වන සළුදායී ණය හා රැස්කිරීම් පිළිබඳ විශේෂඥභාවය

- විශේෂයෙන් යුරෝපයේ හා දකුණු කොරියාවේ සිට ශ්‍රී ලංකාවට මුදල් ප්‍රේෂණය අතින් විශ්වසනීය පාර්ශවකරු

- ස්ථාවර ආදායම් වෙළඳපළ නිර්මාණය
- රාජ්‍ය ණය සම්බන්ධයෙන් මූලික අරමුදල් සැපයීම
- මුදල් කළමනාකරණයේ ප්‍රවණතා සැපයීම

- පුද්ගල බද්ද සංවාද හා උපදෙස් හරහා ධන උත්පාදනය

- විශේෂිත බලපත්‍රලාභී බැංකුකරණ කටයුතු සියල්ල

රූපය 2 →

සන්ධිස්ථාන

1972
එවකට පැවති සාම්ප්‍රදායික ඉතිරිකිරීමේ ආයතන සතරක් ඒකාබද්ධ කිරීම ඔස්සේ ජාතික ඉතිරිකිරීමේ බැංකුව ස්ථාපිත කිරීම සඳහා පාර්ලිමේන්තු පනතක් මගින් පහසුකම් සැලසිණ.

1979
දිනුම් ඇදීමක් සහිත ඉතුරුම් සහතිකපත් හඳුන්වාදීම.

1981
ග්‍රාමීය ජන කොටස් වෙත සම්පවීමට ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් ජංගම බැංකු සේවය හඳුන්වාදීම.

1994
පළමු ATM යන්ත්‍රය ස්ථාපිත කිරීම.

1995
ව්‍යාපාර කටයුතු විවිධාංගීකරණය කිරීම සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත සංශෝධනය කෙරිණ.

1998
හපන් පුංචි හපන් ළමා ඉතිරිකිරීමේ ගිණුම් හඳුන්වාදෙන ලදී.

1999
ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ 100 වැනි ශාඛාව නිට්ටඹුවේදී විවෘත කෙරිණ.

ඉතුරු මිතුරු ගිණුම හඳුන්වාදීම.

2000
බැංකුවේ පරිපාලිත සමාගම වන NSB ෆන්ඩ් මැනේජ්මන්ට් සමාගම ස්ථාපිත කරන ලදී.

2002
ස්ත්‍රී ගිණුම හඳුන්වාදීම.

2003
ජාතික ඉතිරිකිරීමේ බැංකුව AAA(lka) ෆිච් ණය ශ්‍රේණිගත කිරීම හිමිකරගත් ප්‍රථම ශ්‍රී ලාංකික බැංකුව බවට පත්වීම.

2004
ජාත්‍යන්තර බැංකු කටයුතු ආරම්භ කෙරිණ.

2008
ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ඇමතුම් මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම - 24x7

2011
බැංකුවේ 200 වැනි ශාඛාව මැදවච්චියේදී විවෘත කෙරිණ.

2012
ජාතික ඉතිරිකිරීමේ බැංකුව සිය 40 වන සංවත්සරය සමරයි.

2013
ශ්‍රී ලාංකික බැංකුවක් විසින් නිකුත් කරන ලද ඇමරිකානු ඩොලර් මිලියන 750 ක විශාලතම බැඳුම්කර නිකුතුව.

2014
උසස් අධ්‍යාපන කටයුතු සඳහා ලබාදෙන බුද්ධි පුද්ගලික ණය ක්‍රමය හඳුන්වාදීම. ඇ.ඩො.මි. 250 ජ්‍යෙෂ්ඨ බැඳුම්කර නිකුතුව 2013.

2016
සිය 250 වන ශාඛාව කෝපායිහිදී ආරම්භ කෙරිණ. ග්ලෝබල් ෆයිනෑන්ස් ආයතනය විසින් ශ්‍රී ලංකාවේ සුරක්ෂිතම බැංකුව ලෙස නම් කරනු ලැබීම වෙළඳ මූල්‍ය කටයුතු ආරම්භ කිරීම ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් රු. බිලියන 06 ක වටිනාකමකින් යුත් සිය ප්‍රථම ණයකරය නිකුත් කරන ලදී.

2017
රුපියල් ට්‍රිලියනක වත්කම් පදනමක් හිමිකරගත් මෙරට ප්‍රථම විශේෂිත බැංකුව බවට පත්වීම.

2019
ගෙවීම් කාඩ්පත් ක්ෂේත්‍රය - දත්ත ආරක්ෂණ ප්‍රමිතිය හිමි කරගත් ප්‍රථම ශ්‍රී ලාංකික රාජ්‍ය බැංකුව වීම. ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ පූර්ණ පරිපාලිත සමාගමක් බවට පත් විය. තැන්පතු පදනම රුපියල් ට්‍රිලියනය ඉක්මවීම. ඇමරිකානු ඩොලර් මිලියන 250 ක බැඳුම්කරය සාර්ථකව ගෙවා අවසන් කිරීම.

2020
දෙමුහුන් ණය උපකරණ සාර්ථක ලෙස නිකුත් කිරීම.
(සදාකාලික ණයකර)

2021
“NSB Pay” ජංගම දුරකථන යෙදවුම හඳුන්වාදීම.

2022
බැංකුව සිය 50 වන සංවත්සරය සමරයි.

2023
NSB Next Gen ඩිජිටල් බැංකුකරණ සේවාව දියත් කිරීම.

සමස්ත ආයෝජන ප්‍රමාණය රු. ට්‍රිලියනය ඉක්මවීම

නිමැවුම් සහ සේවා

























ඉතුරුම් තැන්පතු

- සාමාන්‍ය ඉතුරුම්
- ළමා ඉතුරුම් - කිරිකැටි හපන්, පුංචි හපන්, හපන් ළමා ඉතුරුම් ගිණුම
- යෞවන ඉතුරුම් - නියෝ ඉතුරුම් ගිණුම
- තරුණ ඉතුරුම් - I'M ඉතුරුම් ගිණුම
- කාන්තා ඉතුරුම් - ස්ත්‍රී ඉතුරුම් ගිණුම
- විශේෂ ඉතුරුම් - හැපී ඉතුරුම් ගිණුම, ස්මයිල් ඉතුරුම් ගිණුම

ඉතුරුම්/විශ්‍රාම සැලසුම්

- එන්එස්බී පෙන්ෂන් +
- පස් අවුරුදු ඉතුරුම්
- රියැලිටි ඉතුරුම් සැලසුම
- ප්‍රාර්ථනා
- ප්‍රාර්ථනා +
- සවිබල ඉතුරුම්

කාලීන තැන්පතු

- සාමාන්‍ය තැන්පතු - ස්ථාවර තැන්පතු (FDs)
- ජ්‍යෙෂ්ඨ පුරවැසි තැන්පතු - ගෞරව ස්ථාවර තැන්පතු ගිණුම,

විදේශ මුදල් නිෂ්පාදන

- පුද්ගලික විදේශ මුදල් ගිණුම් (PFCA)
- ව්‍යාපාරික විදේශ මුදල් ගිණුම් (BFCA)
- අභ්‍යන්තර ආයෝජන ගිණුම් (IIA)
- විදේශ මුදල් කාලීන තැන්පතු
- විශේෂ තැන්පතු ගිණුම් (SDA)
- මුදල් මාරු කිරීමේ ව්‍යාපාර

පාරිභෝගික ණයදීමේ ව්‍යාපාර

- නිවාස/දේපළ ණය - ගේ දොර, අලංකාර, රාජ්‍ය සේවකයන් සඳහා නිවාස ණය

පුද්ගලික ණය

- NSB පුද්ගලික ණය
- බුද්ධි ණය
- විශේෂ විශ්‍රාමික ණය
- NSB විංග්ස්
- තැන්පතු මත ණය - ක්ෂණික ණය

කාඩ්පත් සේවා

- Shopping + ATM කාඩ්පත
- NSB ඊසි කාඩ්පත

වෙනත් සේවා

- ප්‍රේෂණ NSB U Trust
- විකුණුම් ලක්ෂ්‍ය (POS) උපාංගය පදනම් කරගත් ඉතුරුම් බලමුලු ගැන්වීම - NSB Reach
- වෙළඳ මූල්‍ය
- ඇපකර
- ස්ථාවර නියෝග
- සෘජු හර පහසුකම්
- ආරක්ෂිත තැන්පතු සේප්පු
- නාමයෝජනා
- උපයෝගීතා බිල්පත් ගෙවීම
- කෙටි පණිවිඩ බැංකුකරණය (SMS Banking)

ආයතනික ණයදීම

ඩිජිටල්/ඉලෙක්ට්‍රොනික් බැංකුකරණය

- NSB Pay ඇප්
- අන්තර්ජාල බැංකුකරණය
- ක්ෂණික ප්‍රතිචාර කේත බැංකුකරණය

පාසල්වල එකතු කිරීමේ මධ්‍යස්ථාන

පාරිභෝගික සම්බන්ධතා මධ්‍යස්ථානය - NSB ඇමතුම් මධ්‍යස්ථානය

භාණ්ඩාගාර

- භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර, ප්‍රතිමිලදී ගැනුම් සහ ප්‍රතිවිකුණුම්, ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර, ප්‍රවර්ජන (SPOT) සහ ඉදිරි හුවමාරු ගිවිසුම්

වැදගත් තොරතුරු

දෙසැම්බර් 31 දිනට	බැංකුව			සමූහය		
	2023	2022	වෙනස %	2023	2022	වෙනස %
වර්ෂයේ ප්‍රතිඵලය (රු.මිලියන)						
දළ ආදායම	**232,064**	174,530	32.97	**238,825**	174,977	36.49
මූල්‍ය එකතුකළ අගය මත බදු වලට පෙර ලාභය	**5,589**	7,763	(28.00)	**10,109**	5,738	76.18
බදුකරණයට පෙර ලාභය (PBT)	**4,287**	4,510	(4.93)	**8,022**	2,340	242.90
ආදායම් බදු වියදම්	**(2,929)**	1,980	(247.94)	**(1,594)**	1,391	(214.65)
බදුකරණයට පසු ලාභය	**7,216**	2,530	185.27	**9,617**	949	913.37
වසර අවසානය වන විට මූල්‍ය තත්වය (රු.මිලියන)						
කොටස්කරුවන්ගේ අරමුදල් (මුළු හිමිකම්)	**81,374**	72,892	11.64	**87,788**	76,390	14.92
අනෙකුත් ගණුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු/ගණුදෙනුකරුවන්ගේ තැන්පතු	**1,482,532**	1,476,740	0.39	**1,482,951**	1,475,809	0.48
ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් - ණය සහ වෙනත් උපකරණ	**943,705**	919,129	2.67	**953,056**	927,916	2.71
ණය සහ ලැබිය යුතු දෑ	**526,521**	553,027	(4.79)	**523,809**	553,052	(5.29)
මුළු වත්කම්	**1,686,965**	1,616,686	4.35	**1,712,308**	1,630,637	5.00
සාමාන්‍ය කොටස් මත තොරතුරු (රු.)						
ඉපයුම් (මූලික)	**7.68**	2.69	185.27	**10.23**	1.01	913.31
ඉපයුම් (diluted)	**7.68**	2.69	185.27	**10.23**	1.01	913.31
ශුද්ධ වත්කම් වටිනාකම	**86.57**	77.54	11.64	**93.39**	81.27	14.92

	2023	2022	වෙනස (bps)	2023	2022	වෙනස (bps)
අනුපාතික						
ශුද්ධ පොලී ආන්තිකය (%)	**1.79**	2.03	(24)	**1.91**	2.08	(17)
සාමාන්‍ය කොටස්කරුවන්ගේ අරමුදල් මත ප්‍රතිලාභ (%)	**9.36**	3.40	596	**11.72**	1.20	1,051
සාමාන්‍ය කොටස් මත ප්‍රතිලාභ (ROA) (%)	**0.26**	0.28	(2)	**0.48**	0.14	34
ඉපයීම් වල වර්ෂ අනුරූප වර්ධනය (%)	**185.27**	(88.56)	27,384	**913.37**	(95.71)	100,908
ව්‍යවස්ථාපිත ද්‍රවශීල අනුපාතික (%)						
ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් - අවම අවශ්‍යතාවය 20%	**54.99**	40.62	1,437	**අදාල නැත**	අදාල නැත	–
රුපියල් - අවම අවශ්‍යතාවය - 100%	**299.20**	195.44	10,376	**අදාල නැත**	අදාල නැත	–
සියළු මුදල් ඒකක - අවම අවශ්‍යතාවය - 100%	**293.71**	193.49	10,022	**අදාල නැත**	අදාල නැත	–
ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතිකය - අවම අවශ්‍යතාවය - 100%	**180.49**	180.51	(2)	**අදාල නැත**	අදාල නැත	–
ව්‍යවස්ථාපිත ප්‍රාග්ධන අවශ්‍යතා - බාසල් III						
ස්ථර - 1 - අවම අවශ්‍යතාවය (8.5%)	**16.91**	15.78	(112)	**19.94**	17.90	204
සමස්ත ප්‍රාග්ධනය - අවම අවශ්‍යතාවය (12.5%)	**19.26**	18.00	(98)	**22.24**	19.96	228
ද්‍රවශීලතා අනුපාතිකය - අවම අවශ්‍යතාවය (3%)	**6.22**	7.43	(206)	**7.05**	8.14	(109)

මූල්‍ය ඉලක්ක සහ ජයග්‍රහණ - බැංකුව

මූල්‍ය දර්ශකය		ඉලක්ක				
	අරමුණ	2023	2022	2021	2020	2019
ශුද්ධ පොලී ආන්තිකය (%)	1.62	**1.79**	2.03	3.71	2.77	2.63
සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභ (ROA) %	0.14	**0.26**	0.28	1.93	1.24	0.95
සාමාන්‍ය කොටස්කරුවන්ගේ අරමුදල් මත ප්‍රතිලාභ (ROE) (%)	7.36	**9.36**	3.40	33.92	20.15	14.25
ආදායමේ වර්ධනය (%)	33.40	**32.97**	29.34	5.80	4.61	8.96
වර්ෂය සඳහා ලාභයේ වර්ධනය (බදු පසු ලාභය) (ඡ්ඩ)	122.88	**185.27**	(88.56)	118.83	58.40	41.80
සමස්ත වත්කම් වල වර්ධනය (%)	6.72	**4.35**	2.38	15.79	17.78	11.68
ප්‍රාග්ධන අවශ්‍යතා - බාසල් III						
ස්ථර - 1- අවම අවශ්‍යතාවය (8.5%)	Over 8.5%	**16.91**	15.78	18.60	13.65	13.49
මුළු වත්කම් - අවම අවශ්‍යතාවය (12.5%)	Over 12.5%	**19.26**	18.00	20.83	16.45	15.82

වගුව 1 →

වැදගත් තොරතුරු

කාර්ය සාධන දර්ශකයන් - ජනතාව, ලෝකය, ලාභය



ජනතාව

අපගේ සේවකයින්

4,358 දෙනෙකුට ගෙවූ මුදල

රු. බිලියන 16.1

(2022 - සේවකයින් 4,528 දෙනෙකුට රු. බිලියන 13.8)

අපගේ සේවකයින්ගෙන්

54.9%

කාන්තාවන් වේ.

(2022 - 54.8%)

අපගේ සැපයුම්කරුවන් 256 දෙනෙකුට ප්‍රසම්පාදනය සඳහා

රු. මිලියන 1,575.6 ක් ගෙවන ලදී.

(2022 - සැපයුම්කරුවන් 184 දෙනෙකුට රු. මිලියන 906.1 ගෙවන ලදී)

96.3%

රඳවාගැනීමේ අනුපාතය

(2022 - 98.1%)

කුසලතා සංවර්ධනයට ආයෝජනය කළ මුදල

රු. මිලියන 13.2

(2022 - රු. මිලියන 12.8)

ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර

295

(2022 - 293)

මුදල් තැන්පත් කිරීමේ යන්ත්‍ර

122

(2022 - 97)

තැපැල් සහ උප තැපැල් කාර්යාල

4,006

(2022 - 3,996)



ලෝකය

පරිභෝජනය කළ ශක්තීන්

29,697 GJ

(2022 - 27,256 GJ)

461,584 kWh

සූර්ය බලය ජාතික විදුලි පද්ධතියට සම්බන්ධ කර ඇත.

(2022 - 344,347 kWh)

පරිභෝජනය කළ ජලය

ඝන මීටර් 73,895

(2022 - ඝන මීටර් 70,430)

ශාඛා 45

ශුද්ධ මැනීම් මත ජාතික විදුලි පද්ධතියට සම්බන්ධ කර ඇත

(2022 - 45)



ලාභය

පොළී ආදායම

රු. බිලියන 227

(2022 - රු. බිලියන 172.9)

රජයේ සුරැකුම්පත් වල ආයෝජනය

රු. බිලියන 885.4

(2022 - රු. බිලියන 821.5)

තැන්පත්කරුවන් ගෙවූ පොළිය

රු. බිලියන 197.4

(2022 - රු. බිලියන 140.5)

සභාපතිතුමාගේ පණිවිඩය

GRI 102-14

විශ්වාසය ගොඩනැගීම සඳහා බැංකුව තුල ක්‍රියාත්මක කෙරෙන ප්‍රතිපත්තිමය වෙනස්කම් පිළිබඳව ගනුදෙනුකරුවන්, සේවා නියුක්තිකයන්, නියාමකයන් සහ ප්‍රජාව වෙත විනිවිදභාවයෙන් යුතුව සන්නිවේදනය කිරීම ඔස්සේ අපගේ පාර්ශ්වකරුවන් සමග ගැඹුරින් සම්බන්ධවීම කෙරෙහි වන අපගේ කැපවීම අඛණ්ඩව පවත්වාගැනීමට ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අපි ප්‍රතිඥා දෙමු.



අපි මුහුණදුන් අභියෝග මධ්‍යයේ ජාතික ඉතිරිකිරීමේ බැංකුව (බැංකුව) ප්‍රකට කළ අපූර්ව නොසැලෙන ගුණය හා අනුවර්තනය වීමේ හැකියාව පිළිඹිබු කෙරෙන මේ වර්ෂයේ වාර්ෂික වාර්තාව මා ඔබ වෙත ඉදිරිපත් කරන්නේ මහත්වූ ගෞරවයෙනි. පිරිපුන් ඉතිහාසයකට හිමිකම් කියන රාජ්‍ය ඉතිරිකිරීමේ බැංකුවක් වශයෙන් ශ්‍රී ලංකාවේ රජය සහ බැංකු ක්ෂේත්‍රයේ සිට ආයෝජකයන් හා ගනුදෙනුකරුවන් දක්වා වන පුළුල් පරාසයකට අයත් විවිධ වූ ගනුදෙනුකරුවන් සමුදායක් විසින් අප කෙරෙහි තබන ලද විශ්වාසය නොබිඳී පවත්වා ගැනීමට අපි උදක්ම කැපවී සිටිමු.

2023 වර්ෂයේදී, විශේෂයෙන් බැංකු ක්ෂේත්‍රය මෙන්ම තවත් ක්ෂේත්‍ර ගණනාවක් කෙරෙහි බලපෑම් ඇති කළ අර්බුදකාරී ආර්ථික තත්ත්වයක නියත ප්‍රතිඵල සමග ගැටෙමින් අභියෝග රැසකට මුහුණපෑමට ජාතික ඉතිරිකිරීමේ බැංකුවට සිදු විය. ලොව වටා පැතිර ගිය කොවිඩ්-19 වසංගතයෙන් පසුව උද්ගතවූ ශ්‍රී ලංකාව නිදහස ලැබීමෙන් පසු මුහුණදුන් දරුණුතම ආර්ථික අර්බුදයත් සමග හිස එසවූ සමාජ දේශපාලන අස්ථාවරත්වය මෙන්ම මූල්‍යමය බාධක හේතුවෙන් අපගේ ගනුදෙනුකාර පදනම දැඩි මූල්‍ය හා ආර්ථික දුෂ්කරතා වලට ලක් විය. එසේම, ගෘහස්ත ආර්ථික විචලන මෙන්ම ගෝලීය මූල්‍ය විපර්යාස හේතුවෙන් පැන නැගි නියාමන බාධක හමුවේ ඉතා සියුම් ප්‍රවේශයක් අනුගමනය කරමින් බැංකුවේ අනාගත ස්ථායීතාවය සහතික කිරීම සඳහා වන වැදගත් ව්‍යුහමය ප්‍රතිසංස්කරණ සිදු කරන අතරම ද්විත්ව අවශ්‍යතා ඉටු කිරීමට පියවර ගත යුතු විය.

ආර්ථික අභියෝග අඛණ්ඩව පැවති පසුබිමක ආර්ථිකය ප්‍රකෘතිමත් කිරීමෙහි ප්‍රයත්න මධ්‍යයේ සුරක්ෂිත හා පහසු මූල්‍ය සේවා ලබාදීමේ අවශ්‍යතාවය දැඩිව අවධාරණය කෙරුණු අතර අපගේ මාර්ගගත සහ ජංගම බැංකුකරණ සේවා ශක්තිමත් කිරීම අරමුණු කරගෙන බැංකුව තුල ඩිජිටල් පරිවර්තනය බලගැන්වීම තවදුරටත් කඩිනම් කිරීමට අපි උත්සුක වීමු. ඊට සමගාමීව බැංකු ක්ෂේත්‍රය විකාශය වෙමින් තිබෙන අතරතුර වෙනත් රටවල අධ්‍යාපන හා රැකියා අවස්ථා සීඝ්‍රයෙන් විවෘත වීම මත මෙරට ජනගහනයෙන් සැලකිය යුතු පිරිසක් විදේශයන්ට සංක්‍රමණය වීම හේතුවෙන් ශ්‍රී ලංකාවට සිය ශ්‍රම බලකාය සැලකිය යුතු පහළ යාමේ අවදානමක් පැන නැගිණ. තරඟකාරීත්වය පවත්වාගැනීම සහ අපගේ පාර්ශ්වකරුවන් කෙරෙහි වන අපගේ වගකීම ඉටු කිරීම උදෙසා මෙකී පවර්තන වලට අනුගතවීම බෙහෙවින් වැදගත් බව හඳුනාගනිමින් ජාතික ඉතිරිකිරීමේ බැංකුව සක්‍රියව ඉදිරියට ගමන් කළේය. ආර්ථික අර්බුදයකින් හා වේගවත් ඩිජිටල්කරණයකින් සලකුණුවූ විචලනය වන ආර්ථික තත්ත්වයක් මධ්‍යයේ විශ්වසනීයත්වය හා විශිෂ්ටත්වය වෙනුවෙන් කැපවෙමින් ප්‍රමුඛතම තිරසර ඉතිරිකිරීමේ හා ආයෝජන විසඳුම් සපයන්නා ලෙස සිය ස්ථානය ශක්තිමත් කරගැනීම සඳහා බැංකුව විසින් උපායමාර්ගික ක්‍රියාමාර්ග රැසක් ගන්නා ලදී.

පාර්ශ්වකරුවන් සමග සම්බන්ධතාවය සහ සමාජ වගකීම

ආර්ථික අර්බුදය හේතුවෙන් නිර්මාණයවූ වේගයෙන් වෙනස් වන මූල්‍ය වටපිටාව සහ ඩිජිටල්කරණයේ සීඝ්‍ර වර්ධනය පදනම් කරගෙන අඛණ්ඩ තරඟකාරත්වයක් පවත්වා ගැනීම සහ අපගේ විවිධවූ පාර්ශ්වකරුවන් වෙත විශ්වාසයෙන් යුතුව සේවා සැපයීම සඳහා එකී පරිවර්තන වලට අනුගතවීම අත්‍යාවශ්‍ය බව බැංකුව විසින් හඳුනාගන්නා ලදී. වෙනස්වන වාතාවරණය පිළිබඳව නිවැරදි අවබෝධයකින් යුතුව අපගේ යුතුකම් හා වගකීම් ඵලදායීව ඉටු කිරීම උදෙසා අපි සියලු වෙනස්කම් සමග අනුගත වීමු.

විශ්වාසය ගොඩනැගීම සඳහා බැංකුව තුල ක්‍රියාත්මක කෙරෙන ප්‍රතිපත්තිමය වෙනස්කම් පිළිබඳව ගනුදෙනුකරුවන්,

සභාපතිතුමාගේ පණිවිඩය

සේවා නියුක්තිකයන්, නියාමකයන් සහ ප්‍රජාව වෙත විනිවිදභාවයෙන් යුතුව සන්නිවේදනය කිරීම ඔස්සේ අපගේ පාර්ශ්වකරුවන් සමග ගැඹුරින් සම්බන්ධවීම කෙරෙහි වන අපගේ කැපවීම අඛණ්ඩව පවත්වාගැනීමට ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අපි ප්‍රතිඥා දෙමු. මෙම සාකල්‍ය ප්‍රවේශය අනුගමනය කිරීමේදී, විවිධවූ පාර්ශ්වකරුවන්ගේ අභිලාෂ ගැටෙන විට ඇතිවන අසමතුළිතතා නිපුණත්වයෙන් යුතුව කළමනාකරණය කරන අතරම මෙම පාර්ශ්වකරුවන් අතර පවතින සංකීර්ණ ක්‍රියාකාරිත්වය සහ සම්බන්ධතාවය ගැඹුරින් අවබෝධ කරගැනීමේ අවශ්‍යතාවය පැන නගී. මෙම අසමතුළිතතා මැනවින් හඳුනාගැනීම සහ බැංකුව ක්‍රියාත්මක වන මෙහෙයුම් පරිසරයේ සංකූලතා සංයෝග කරගත් තොරතුරු මත පදනම්වූ තීරණ ගැනීම බැංකුවේ යුතුකමක් ලෙස අප සලකන අතර එහි ප්‍රතිඵලයක් ලෙස ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සාමූහික සාර්ථකත්වය කඩිනම් කිරීමට අපට හැකියාව ලැබුණි.

බැංකුවේ වටිනාකම් ප්‍රස්තුතය සම්බන්ධයෙන් එක් එක් පාර්ශවකාර කාණ්ඩය එකිනෙකින් වෙනස්වූ මත දරන බවත් එකිනෙකට සුවිශේෂී ආකාරයෙන් ජාතික ඉතිරිකිරීමේ බැංකුව සමග සම්බන්ධ වන බව සහ සිය අවශ්‍යතා කෙරෙහි ප්‍රමුඛතාවය ලබාදෙන බව සැලකීමේදී ඒ සෑම කණ්ඩායමක් සමගම අඛණ්ඩ සංවාදයක් පවත්වා ගැනීම ඉතා වැදගත් වේ. අදාළ සියලුම පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා තෘප්තිමත් කරන බව සහතික කරමින් බැංකුවේ වටිනාකම් කළඹ ඵලදායීව සකස් කරගැනීම හා සංයෝග කරගැනීම සඳහා වෙළඳපොල සමීක්ෂණ සිදු කිරීම සහ නිතිපතා ප්‍රතිපෝෂණ ලබාගැනීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම අවැසි වේ.

බැංකුවේ **ඒකාබද්ධ චින්තන** පරිච සඳහා මගපෙන්වනු ලබන්නේ අධ්‍යක්ෂ මණ්ඩලයේ විචක්ෂණශීලී අධීක්ෂණය විසිනි. පාර්ශ්වකරුවන් කෙරෙහි ඇති විය හැකි විවිධවූ බලපෑම් එමගින් මනාව සැලකිල්ලට ගනේ. සේවා නියුක්තිකයන්, ගනුදෙනුකරුවන්, ප්‍රජාව සහ පරිසරය කෙරෙහි එලෙස ගනු ලබන තීරණ මගින් ඇති කෙරෙන බලපෑම පිළිබඳව පුළුල් තක්සේරුවක් සිදු කිරීමෙන් පසුව පමණක් එම තීරණවලට එළඹෙන බව මෙම ප්‍රවේශය මගින් සහතික කෙරේ. එසේම, අවසානයේ ප්‍රශස්ත ප්‍රතිඵල ළඟා කරගැනීමට උත්සුක වෙමින් ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සහ එහි පාර්ශ්වකරුවන්ගේ දිගුකාලීන අභිලාෂ සම්බන්ධයෙන් ප්‍රමුඛතාවය ලබාදෙන ආචාරධර්මීය තීරණ ගැනීමේ ක්‍රියාවලි පවත්වාගැනීමට බැංකුව වගබලා ගනියි.

ජාතික ඉතිරිකිරීමේ බැංකුව ශ්‍රී ලාංකික ප්‍රජාව තුල ඉතා වැදගත් භූමිකාවක් ඉටු කරන අතර ජාතියේ ඉතිරිකිරීමේ බැංකුව වශයෙන් ආර්ථික ප්‍රතිසාධනය සඳහා උපකාර කිරීමෙහිලා වන වගකීම ඉටුකිරීමට ස්ථිරව කැපවී සිටී. ජාතික සහ දේශීය ආර්ථික සචලතාව ඉහළ නැංවීම සඳහා බදු දායකත්වය ලබාදීම මෙන්ම පාරිසරික, සමාජයීය සහ පාලන ප්‍රතිපත්ති අපගේ මෙහෙයුම් හා ආයෝජන තීරණ සමග බද්ධ කිරීමෙන් සමාජය හා පරිසරය වෙනුවෙන් වටිනාකම් උත්පාදනය කිරීම ඔස්සේ අපි අපගේ ඒ කැපවීම ප්‍රකට කළෙමු.

කොවිඩ්-19 ගෝලීය වසංගතය සහ ඉන් පසුව ඇතිවූ ආර්ථික පසුබෑම සමග ගනුදෙනුකරුවන් බොහොමයක් විසින් මුහුණ දෙන ලද මූල්‍ය දුෂ්කරතා හඳුනාගෙන ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් සහන ක්‍රියාමාර්ග රැසක් ක්‍රියාත්මක කරන ලදී. ණය සහනය, පොලී අනුපාත පහළ දැමීම සහ නම්‍යශීලී ණය ආපසු ගෙවීමේ ක්‍රම ආදිය ඔස්සේ ගනුදෙනුකරුවන්ගේ මූල්‍ය දුෂ්කරතා අවම කිරීමට කටයුතු කෙරිණ. එහි ඩිජිටල් පරිවර්තනය මධ්‍යයේ ගනුදෙනුකරුවන්ගේ දත්ත ආරක්ෂා කිරීමට බැංකුව විසින් සයිබර් ආරක්ෂණ ක්‍රමවේද ක්‍රියාවට නැංවිණ. ඒ සමගම, තැපැල් කාර්යාල ජාලය බැංකු මෙහෙයුම් සඳහා භාවිතයට ගැනීම, ජංගම බැංකු ඒකක සහ මූල්‍ය සාක්ෂරතා වැඩසටහන් ඔස්සේ තවමත් පූර්ණ වශයෙන් හෝ කිසිසේත්ම විධිමත් බැංකුකරණයට යොමු නොවූ ජනගහනය වෙත ළඟාවීමෙහිලා වන අපගේ ප්‍රයත්නය තීව්‍ර කරන ලදී.

එම සන්නාම සදාචාරය සමග අනුරූපීව ජාතික ඉතිරිකිරීමේ බැංකුව සමාජ වගකීම ඉටු කිරීමෙහිලා අඛණ්ඩව කැපවූ අතර අධ්‍යාපනය හා පාරිසරික තිරසාරභාවය කෙරෙහි අවධානය යොමු කරමින් ක්‍රියාත්මක කරන ලද මුලපිරීම් මගින් ඒ බව සනාථ වේ.

ඒකාබද්ධ පාර්ශ්වකාර සබඳතා

විශ්වාසය ස්ථාපිත කිරීම, අනුකූලතා අවශ්‍යතා සපුරාලීම, බැංකුවේ කීර්ති නාමය බලගැන්වීම සහ දිගුකාලීන ජීවගුණය ප්‍රවර්ධනය කිරීම සඳහා පාර්ශ්වකරුවන් සහ බැංකුව අතර සිදුවන අන්තර් ක්‍රියා ඉතා වැදගත් වේ.

වැඩිදුර විස්තර සඳහා පිටු අංක 81 සිට 93 දක්වා බලන්න.

විතැන්වන නියාමන පරිසරයක් මධ්‍යයේ තුලනය පවත්වාගැනීම

2023 වර්ෂයේදී පැවති ගෘහස්ත ආර්ථික තත්ත්වය සහ ගෝලීය මූල්‍ය ප්‍රවණතා විසින් හැඩගන්වන ලදුව බැංකු ක්ෂේත්‍රය තුල සිදුවූ හදිසි ව්‍යුහමය ප්‍රතිසංස්කරණ හේතුවෙන් නිර්මාණයවූ බහුවිෂයයික නියාමන පරිසරය තුල සාර්ථකව සිය මෙහෙයුම් කටයුතු සිදු කිරීමට ජාතික ඉතිරිකිරීමේ බැංකුවට හැකි විය. මෙම අභියෝග හමුවේ ස්ථායීතාවය ප්‍රවර්ධනය කිරීම, වර්ධනය අභිප්‍රේරණය කිරීම සහ සචලතාවය බලගැන්වීම අතර සියුම් තුලනයක් පවත්වාගැනීම සඳහා ප්‍රමුඛතාවය ලබාදීමට අපි කටයුතු කළෙමු. තරඟකාරීත්වය, ස්ථායීතාවය හා පුළුල් කිරීම පවත්වා ගැනීම සඳහා මෙම අභියෝග හා බාධක ඵලදායීව ජයගැනීම සහ අත්‍යාවශ්‍ය ව්‍යුහමය ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම තීරණාත්මක වේ.

කෙටිකාලයේදී මෙන්ම දිගු කාලයේදී බැංකු ක්ෂේත්‍රය බලගැන්වීම සඳහා අවධානය අපේක්ෂා කරමින් නියාමන අභියෝග කිහිපයක් අප හමුවේ තැබිණ. ආර්ථික පසුබෑම කළමනාකරණය කරගැනීම සහ ප්‍රතිසාධන ප්‍රයත්න ශක්තිමත් කිරීම සඳහා ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාවය සහ ද්‍රවශීලතාවය සහතික කිරීම; ණය ලබාදීමේ ශක්‍යතාවය ආරක්ෂා කරගැනීම සඳහා අක්‍රිය ණය පහසුකම් හා සම්බන්ධ ගැටළු නිරාකරණය කිරීම; තාක්ෂණයෙන් සවිබලගැන්වුණු මූල්‍ය විසඳුම් වෙනුවෙන් ආයෝජනය කරන අතරතුර ඩිජිටල් බැංකුකරණය පිළිබඳ නියාමන අවශ්‍යතා හා අනුකූලවීම, පාරිසරික, සමාජයීය හා පාලන ප්‍රතිපත්ති අනුකූලතාවය බැංකු මෙහෙයුම් හා බද්ධ කිරීම; සහ දේශීය මුදලේ ස්ථායීතාවය පවත්වා ගැනීම ඉලක්ක කරගත් නියාමන හා අනුකූලවෙමින් දේශීය මුදලේ විවලන මධ්‍යයේ විදේශ විනිමය අවදානම් සාර්ථකව කළමනාකරණය කිරීම එවැනි නියාමන අවශ්‍යතා කිහිපයකි.

මෙම නියාමන අභියෝග ජයගැනීම සඳහා පුළුල් ව්‍යුහමය ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කළ යුතු වේ. ණය, වෙළඳපොල, සහ මෙහෙයුම් අවදානම් ඇතුළු විවිධ මූල්‍ය අවදානම් පූර්වාපේක්ෂණය කිරීම සහ වළක්වා ගැනීම සඳහා ඉහළ මට්ටමේ අවදානම් කළමනාකරණ කාර්යරාමු අත්‍යාවශ්‍ය වේ. ප්‍රවේශය ඉහළ නැංවීම, වියදම් අවම කිරීම සහ ගනුදෙනුකරුවන්ගේ අත්දැකීම ඉහළ මට්ටමකට ගෙන ඒම සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කඩිනම් කිරීම ඔස්සේ ඩිජිටල් බැංකු සේවා පුළුල් කිරීම සිදු කළ යුතුය. විශේෂයෙන් ශ්‍රී ලංකාවේ තවමත් පූර්ණ වශයෙන් හෝ කිසිසේත්ම විධිමත් බැංකුකරණයට යොමු නොවූ ජනතාව වෙනුවෙන් මූල්‍ය අන්තර්ග්‍රහණය ප්‍රවර්ධනය කිරීමෙහිලා සඳහා නිතිපතා නිකුත් කෙරෙන නියාමන හා දිරිදීමනා අත්‍යාවශ්‍ය සාධක වේ. එසේම, ක්‍රමයෙන් ඉහළ යන භෞතික හා සයිබර් ආරක්ෂණ තර්ජනවලට ප්‍රතිචාර වශයෙන් යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, ශක්තිමත් ආපදා කළමනාකරණ සැලසුම් සකස් කිරීම සහ ඵලදායී ණය ආපසු අයකරගැනීමේ උපායමාර්ග ක්‍රියාත්මක කිරීම ඔස්සේ මෙහෙයුම් සවලතාව බලගැන්විය හැකිය.

සභාපතිතුමාගේ පණිවිඩය

සචලතාව මත ගොඩනැගුණු කාර්යසාධනයක්

පසුගිය වර්ෂයට සාපේක්ෂව 2023 වසරේදී ජාතික ඉතිරිකිරීමේ බැංකුව රුපියල් බිලියන 232.1 ක දළ ආදායමක් වාර්තා කළ අතර රාජ්‍ය ණය සුරැකුම්හි ආයෝජන වලට අදාළ පොලී ආදායම මූලික වශයෙන් ඊට පාදක විය. කෙසේවුවත්, පොලී අනුපාත ඉහළයාම හේතුවෙන් පොලී වියදම 40.5% න් ඉහළ ගිය අතර එහි ප්‍රතිඵලයක් ලෙස ශුද්ධ පොලී ආදායම ආශ්‍රිතව 8.9% ක ඍණ වර්ධනයක් වාර්තා විය. වෙළඳ හා මූල්‍ය වත්කම් වලින් ලද ආදායම ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායමේ පහළ යාමට හිළවූ විය. ශුද්ධ පොලී ආදායමේ පහළ යාම සහ උද්ධමනය හේතුවෙන් පුද්ගල වියදම් සහ අනෙකුත් මෙහෙයුම් වල ඉහළ යාම මත පදනම්ව බදු පෙර ලාභය 4.9% කින් පහළ ගොස් රුපියල් බිලියන 4.3 ක් බවට පත් විය. එහෙත්, රුපියල් බිලියන 2.9 ක ප්‍රමාදවූ බදු ණය හේතු කොටගෙන බදු පසු ලාභය රුපියල් බිලියන 7.2 ක් බවට පත්වූ අතර එය 2022 වසරට සාපේක්ෂව සැලකිය යුතු වර්ධනයකි. 2023 දෙසැම්බර් 31 දිනට සමස්ත වත්කම් 4.4% ක වර්ධනයක් සමග රුපියල් ට්‍රිලියන 1.69 ක් දක්වා ඉහළ ගියේය. ඉතා පහසුවෙන් ක්ෂේත්‍රයේ සාමාන්‍යය ඉක්මවමින් බැංකුව ශක්තිමත් ප්‍රාග්ධන අනුපාතික පවත්වාගත් අතර ඉහළ ද්‍රවශීලතා අනුපාතික වාර්තා කරමින් "ශ්‍රී ලංකාවේ සුරක්ෂිතම බැංකුව" බවට පත්වීමට බැංකුවට හැකි විය.

මූල්‍ය ප්‍රාග්ධනය

අපි අපගේ මූල්‍ය සම්පත් කළමනාකරණය කරගැනීම කෙරෙහි ප්‍රමුඛතාවය ලබාදෙන අතර ජාතික ඉතිරිකිරීමේ බැංකුව තුල ශක්තිමත් මූල්‍ය පදනමක් පවත්වා ගැනීමට උත්සුක වෙමු.

වැඩිදුර විස්තර සඳහා පිටු අංක **96** සිට **105** දක්වා බලන්න.

අපගේ ගනුදෙනුකාර පදනම සමග විශ්වාසය ගොඩනගා ගැනීම...

ක්‍රමිකව ඉහළ යන උද්ධමනය සහ පොලී අනුපාත හේතුවෙන් ඉතුරුම් වල වටිනාකම පහළ ගිය අතර එහි ප්‍රතිඵලයක් ලෙස ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ නිමැවුම් හා සේවා වල ආකර්ෂණය කෙරෙහි බලපෑම් එල්ල විය. තැන්පත්කරුවන් වඩා මූල්‍යදායක හා ස්ථාවර අයෝජන මාර්ග කෙරෙහි සිය අවධානය යොමු කළ අතර ඒ හේතුවෙන්, පැවති අඩු පොලී අනුපාත මධ්‍යයේ තැන්පතු සංචලනය පහළ ගියේය. අනෙක් අතට එම පොලී අනුපාත 2023 වර්ෂයේ ජූනි මාසය තෙක් පැවතීම හා ඉන් පසුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මූල්‍යමය ලිහිල්කරණ ප්‍රවේශයක් අනගමනය කිරීම මත පුද්ගලික ණය ක්ෂයවූ අතර එය බැංකුවේ ණය කළඹ වර්ධනය කෙරෙහි බලපෑම් ඇති කළේය.

එමෙන්ම විදේශ විනිමය ගනුදෙනුවලින් අත්විය හැකි අලාභ සමඟ, මෙහෙයුම් වියදම් සහ විදේශ මුදල් වගකීම්වල පිරිවැය ඉහළ යාමට හේතු වෙමින්, ශ්‍රී ලංකා රුපියල පහත වැටීම ජාතික ඉතිරිකිරීමේ බැංකුවට අහිතකර ලෙස බලපාන ලදී.

ද්‍රවශීලතා සීමා හේතුකොට ගෙන තැන්පත්කරුවන්ගේ විශ්වාසය තවදුරටත් අඩාලවීමක්ද සිදු වූ අතර එය ආයතනයේ ණය සැපයීමේ හැකියාවට බාධාවක් වන අතරම මුදල් ආපසු ගැනීම් වැඩිවීමට ද බලපාන ලදී.

කෙසේ වුවද ගනුදෙනුකරුවන්ගේ සහය වර්ධනය කරමින් සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීම අරමුණු කරගනිමින් බහුවිධ උපායමාර්ග ප්‍රවේශයක් ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලදී.

අනවශ්‍ය පීඩනයකින් තොරව ආපසු ගැනීමේ ඉල්ලීම් නිසි ලෙස ඉටුකිරීමට ද්‍රවශීලතා කළමනාකරණය උපරිම තලයකට ගෙනඒමට, විශේෂයෙන්ම ණය හා අත්තිකාරම් ආදී වත්කම්වල ගුණාත්මකභාවය සමාලෝචනය කිරීමට, අක්‍රීය වත්කම්වීමට ඉඩ ඇති අවස්ථාවනට විසඳුම් සොයා ගැනීමට අවධානම් නිරාවරණය අවම කිරීමට, ණය හා ආයෝජන කළඹ විවිධාංගීකරණය කිරීමට ලාභදායීතාවය වැඩි කිරීම පිණිස වඩාත් ඉහළ පොලී උපයන රාජ්‍ය සුරැකුම්පත් වෙත යොමු වූ උපාය මාර්ගික අවධානයක් ඇතිව විශේෂයෙන්ම භෞතික වශයෙන් බැංකුකරණය අභියෝගකාරී වන අවස්ථාවන්හිදී මෙහෙයුම් පොදුකාර්යය පිරිවැය අඩු කිරීමට සහ ගනුදෙනුකරුවන් වෙත ප්‍රවේශවීමේ හැකියාව ඉහළ නැංවීම සඳහා නව ඩිජිටල් බැංකුකරණ සේවා සැපයීම ශීඝ්‍ර කිරීමට මෙය රුකුලක් විය.

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ගනුදෙනුකරුවන් විසින් වේගයෙන් ඩිජිටල් බැංකුකරණ විසඳුම් වැළඳගැනීම, මතුවූ අවස්ථාවන් බවට පත්වීමකි. ඒ ඔස්සේ මෙහෙයුම් කාර්යක්ෂමතාවය ඉහළ නැංවුණ අතර නව ආදායම් උත්පාදන මාර්ග විවෘත විය.

රාජ්‍ය බැංකුවක් වශයෙන් ජාතික ඉතිරිකිරීමේ බැංකුව, භාවිත කරන්නන්ගේ අත්දැකීම් පෝෂණය කිරීම සඳහා ස්වකීය වටිනාකම් සමඟ අනුරූපී වන, නව්‍යකරණ බැංකු නිමැවුම් හඳුන්වාදීමෙහිලා පුරෝගාමී වන සහ රොබෝ තාක්ෂණය, කෘතිම බුද්ධිය (AI) සහ දත්ත විශ්ලේෂණ (Data Analytics) රටවලට බ්ලොක්චේන් තාක්ෂණය ඇතුළු නවීන ඩිජිටල් පරිවර්තන මෙවලම් භාවිතයට ගන්නා ආයතන සමග සක්‍රීයව සම්බන්ධ වෙයි. අන්‍යෝන්‍ය ප්‍රතිලාභ ළඟා කරගැනීම සහ ඩිජිටල්කරණය සඳහා වන ආයෝජන උපරිම කරගැනීම සඳහා එවැනි ආයතන සමග ඇතිකර ගන්නා උපාය මාර්ගික සබඳතා ඔස්සේ එම තාක්ෂණික ප්‍රවණතා උපයෝජනය කිරීම ජාතික ඉතිරිකිරීමේ බැංකුව අපේක්ෂා කරයි. මෙයට අමතරව, බැංකු ක්ෂේත්‍රය ආශ්‍රිත ස්ථාවරභාවය ඉලක්ක කරගෙන රජය විසින් ක්‍රියාත්මක කරන ලද මූලපිරීම් වෙතින් සැලකිය යුතු සහයක් ලබාගැනීමට ජාතික ඉතිරිකිරීමේ බැංකුවට හැකි විය.

අපගේ සේවා නියුක්තිකයන් දිනවමින්...

විශේෂයෙන් ගෝලීය ඩිජිටල් පරිවර්තන පසුබිම තුළ බැංකුවේ අඛණ්ඩ සාර්ථකත්වය සහතික කිරීම උදෙසා අපගේ සේවා නියුක්තිකයන් ඉතා වැදගත් වේ. නවෝත්පාදනය සහ අනුවර්තනය ඉස්මතු කරන සංස්කෘතියක් ප්‍රවර්ධනය කරමින් එහි ශාඛා බල ප්‍රදේශවල වෙසෙන ජනතාව අතුරින් කුසලතා පිරිපුන් පුද්ගලයන් සේවයට බඳවා ගැනීම ජාතික ඉතිරිකිරීමේ බැංකුව ප්‍රමුඛ කාර්යයක් ලෙස සලකයි.

ඩිජිටල් සාක්ෂරතාවය, ගනුදෙනුකාර සේවාවේ විශිෂ්ටත්වය සහ විශ්ලේෂණ හැකියාව ළඟාකර ගැනීම සඳහා සිය කුසලතා වර්ධනය කර ගැනීමට නව කුසලතා අත්කර ගැනීමට සේවා නියුක්තිකයන් නිරන්තරයෙන් දිරිගැන්වීම තුළින් නව තාක්ෂණික ප්‍රවණතා හා අනුරූපීව ඉදිරියට යාමට ජාතික ඉතිරිකිරීමේ බැංකුව අපේක්ෂා කරයි. අපගේ සේවා නියුක්තිකයන් ධෛර්යමත් කිරීම සඳහා බැංකුව තුලදීම ව්‍යක්තීය දියුණුව සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය තරම් අවස්ථා සලසන අතරතුර ගනුදෙනුකරුවන් උදෙසා අසමසම සේවාවන් සහ උපදේශනයක් ලැබෙන බව සහතික කිරීමට බැංකුවේ එකී වැඩපිළිවෙල සහාය වේ.

විශේෂයෙන්, ව්‍යක්තීය ජීවිතය හා පෞද්ගලික ජීවිතය අතර තුලනය හා අරමුණක් සහිත ක්‍රියාකාරකම් ප්‍රමුඛතාවය කරගත් මීලේනියල්ස් හා Z පරම්පරාවේ සේවා නියුක්තිකයන් අතර සිදුවන ශ්‍රමබලකා අපේක්ෂාව ආශ්‍රිත විවලනවලට අනුගතවීමේ අභියෝගයට ජාතික ඉතිරිකිරීමේ බැංකුව මුහුණපා සිටී. මෙම වෙනස්වනසුළු අවශ්‍යතා හඳුනාගෙන සිත්ගන්නාසුළු පැකේජ ලබාදීම සහ ආධාරක පරිසරයක් නිර්මාණය කිරීම සඳහා එවැනි කාණ්ඩ වලට අයත් සේවා නියුක්තිකයන් ආකර්ෂණය කර ගැනීම හා ඔවුන් බැංකුව තුල රඳවා ගැනීම අරමුණු කරගෙන බැංකුව සිය මානව සම්පත් ප්‍රතිපත්ති නැවත සමාලෝචනය කරයි. ඩිජිටල් මෙවලම් බැංකු මෙහෙයුම් හා බද්ධ කිරීමේ ක්‍රියාවලිය සඳහා ඩිජිටල්කරණය කේන්ද්‍රකරගත් සමාජයක හැදී වැඩුණු එවැනි පුද්ගලයන් ජාතික ඉතිරිකිරීමේ බැංකුව කාලයට

සභාපතිතුමාගේ පණිවිඩය

සුදුසු හා තරඟකාරී මට්ටමක ස්ථානගතවී සිටින බව සහතික කිරීම සඳහා සුදුසුම අපේක්ෂකයන් වේ. ක්ෂේත්‍රය තුළ බැංකුව ඉහළට ඔසවා තැබීමට හැකියාව ලබාදෙන සේවයට කැපවූ අපගේ ශ්‍රම බලකාය ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ පදනම සකස් කරයි.

මානව ප්‍රාග්ධනය

ක්ෂේත්‍රය තුළ බැංකුව ඉහළට ඔසවා තැබීමට හැකියාව ලබාදෙන සේවයට කැපවූ අපගේ ශ්‍රම බලකාය ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ පදනම සකස් කරයි.

වැඩි විස්තර සඳහා 124 සිට 135 දක්වා වන පිටු වෙත යොමු වන්න.

තිරසාර විශිෂ්ටත්වය කරා යන මඟ...

වගවීම හා තිරසාරභාවය විශේෂ ලක්ෂණ කරගත් අවධියක දැඩි පාලනය, ක්‍රමානුකූල විගණන හා අභ්‍යන්තර පාලන සහ පුරෝගාමී තිරසාර යහපාලන මූලපිරීම් කෙරෙහි පවත්නා කැපවීම අඛණ්ඩව පවත්වා ගැනීමට ජාතික ඉතිරිකිරීමේ බැංකුව ක්‍රියා කරයි. ආර්ථික අර්බුදය පාදක කරගෙන පැන නගින අවදානම් එළඳාගීව විගණනය කිරීම සහ වළක්වා ගැනීම අරමුණ කරගෙන ඉහළ අවදානම් සහිත ක්ෂේත්‍ර ඇතුළත් කරමින් මේ වසරේදී ජාතික ඉතිරිකිරීමේ බැංකුව සිය අභ්‍යන්තර විගණන සැලැස්මේ විගණන ආවරණය පුළුල් කර තිබේ. ඊට අමතරව මෙහෙයුම් නම්‍යශීලීතාවය ප්‍රශස්ත මට්ටමකට පත් කරන අතරතුර අනුකූලතාවය සහතික කිරීම සඳහා ව්‍යුහමය ප්‍රතිසංස්කරණ හා නියාමන වෙනස්කම් අනුරූපව බැංකුව විසින් සිය ප්‍රතිපත්ති හා පරිචයන් සංශෝධනය කරන ලදී.

බැංකුවේ මෙහෙයුම් හා මූල්‍ය පැවැත්ම කෙරෙහි ඇතිවිය හැකි අහිතකර බලපෑම් වළක්වා ගනිමින් ආර්ථික හා නියාමන පරිසරයේ ඇති වන විචලන වලට ක්ෂණිකව ප්‍රතිචාර දැක්වීම සඳහා අනුවර්තීය අවදානම් කළමනාකරණ උපායමාර්ගද බැංකුව විසින් සකස් කරන ලදී. තිරසාරභාවය කෙරෙහි වන ගෝලීය ප්‍රයත්නයට අනුගත වෙමින් ජාතික ඉතිරිකිරීමේ බැංකුව හරිත බැංකුකරණ පරිචයන් සිය මෙහෙයුම් සමග ඒකාබද්ධ කර තිබේ. එසේ කිරීම මඟින් ශ්‍රී ලාංකික බැංකු ක්ෂේත්‍රය තුළ තිරසාරභාවය ආශ්‍රිත ප්‍රවණතා කෙරෙහි දායකත්වය දක්වන අතරතුර අනාගත බදු හා නියාමන ප්‍රතිලාභ උපයෝජනය කිරීමට සිය ස්ථානගතවීම සහතික කිරීමට ජාතික ඉතිරිකිරීමේ බැංකුවට හැකියාව ලැබේ.

බැංකුවේ පාරිසරික, සමාජයීය හා පාලන උපායමාර්ගය සමග අනුරූපීව සැපයුම්කරුවන්ගේ සහභාගිත්වය ලබා ගැනීම ඔස්සේ ගුණාත්මක භාවයෙන් ඉහළ සේවාවක් සහතික කිරීමටද ජාතික ඉතිරිකිරීමේ බැංකුව ක්‍රියා කරයි. ව්‍යාපාරික ගනුදෙනුවලදී විනිවිදභාවය ප්‍රවර්ධනය කිරීම, උපාය මාර්ගික මූලපිරීම් මෙහෙයුම් යාවත්කාලීන කිරීම්, සහ පාර්ශ්වකරුවන්ට අදාළ කරුණු සම්බන්ධයෙන් සක්‍රීයව සන්නිවේදන කටයුතු සිදු කිරීම, ඉහත සඳහන් කළ උපායමාර්ගයේ ඇතුළත් වේ. එලෙස තොරතුරු හුවමාරු කර ගැනීම ඔස්සේ ජාතික ඉතිරිකිරීමේ බැංකුව, පාර්ශ්වකරුවන්, ණය දෙන්නන් සහ නියාමනයන් සමග සැලසුම් කිරීම හා සම්බන්ධවීම වැඩිදියුණු කිරීමට අපේක්ෂා කරයි.

අනාගතය පිළිබඳ සුභාවාදීත්වය

විශිෂ්ටත්වය සඳහා වන අපගේ කැපවීම, නවෝත්පාදනය සහ පාර්ශ්වකරුවන් සමග පවත්නා සබඳතාවය යන සාධක විසින් බලගන්වන ලදුව, සාර්වආර්ථික අභියෝග මධ්‍යයේ අපි අනාගතය පිළිබඳව සුභවාදීව සිටිමු.

අපගේ සාර්ථකත්වය උදෙසා ඉතා වැදගත්වූ අපගේ සියලුම පාර්ශ්වකරුවන්ගේ අනගිබවනීය සහය වෙනුවෙන් මම මගේ හෘදයාංගම කෘතඥතාවය පුද කරමි. අප සාර්ථක වූයේ අපගේ සේවා නියුක්තිකයන්ගේ කැපවීම, අපගේ පාර්ශ්වකරුවන්ගේ හිතේෂිභාවය මෙන්ම ඔවුන් අප කෙරෙහි තැබූ විශ්වාසය සහ අධ්‍යක්ෂ මණ්ඩලය ලබාදුන් නොසැලෙන සහය නිසාවෙනි. මම ඒ සියල්ලම වෙනුවෙන් ඒ සියලු දෙනාටම මාගේ ස්තුතිය පිරිනමමි.

අපගේ බැංකු සේවා ලබාගනිමින් වසර ගණනාවක් මුළුල්ලේ අප සමග රැඳී සිටිමින් ශක්තිමත් සබඳතාවයක් පවත්වාගෙන යන අපගේ ගනුදෙනුකරුවන්ටද මම සැබවින්ම ස්තුතිවන්ත වෙමි.

අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා සහ ගරු මුදල් අමාත්‍යතුමා, භාණ්ඩාගාර ලේකම්තුමා, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිතුමා, අදාළ ආයතනවල ප්‍රධානීන්, ජනාධිපති ලේකම්තුමා, ගරු නීතිපතිතුමා සහ ගරු විගණකාධිපතිතුමා අප වෙත දැක්වූ සහාය හා සහයෝගය විශිෂ්ට වේ.

තැපල්පතිතුමා සහ තැපැල් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් නොවන්නට අපගේ දීප ව්‍යාප්ත මෙහෙයුම් සාර්ථක නොවනු ඇත. එබැවින්, ඔවුන්ටද මාගේ හදපිරි ස්තුතිය ප්‍රකාශ කරමි.

අවසාන වශයෙන්, එවැනි අඛණ්ඩ සහයෝගයක් සමග ඉදිරි වසර වලදී තවදුරටත් ශක්තිමත් වෙමින් ශ්‍රී ලාංකික බැංකු ක්ෂේත්‍රයේ ස්ථායීතාවයේ හා විශ්වසනීයත්වයේ සළකුණ බවට පත්වීමට බැංකුවට හැකියාව ලැබෙන බව උදක්ම විශ්වාස කරමි.



ආචාර්ය හර්ෂ කබ්රාල්
සභාපති
2024 මාර්තු 25



සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරීගේ පණිවිඩය

මෙරට ඉතිරිකිරීමේ පතාක යෝධයා ලෙස අපගේ වගකීම වන්නේ අපගේ ජනතාවට වඩා හොඳ සේවාවක් සැලසීම සඳහා නවීන ගෝලීය මූල්‍ය අවස්ථා පිළිබඳව මැනවින් දැනුවත් වීමයි.

අපගේ ගනුදෙනුකරුවන්, සේවා නියුක්තිකයන් සහ ආයෝජකයන් පමණක් නොව සමස්ත ප්‍රජාවට, කොවිඩ් - 19 වසංගතය සහ ආර්ථික පසුබෑම යන සාධක ද්විත්වයේ සංයෝජනයෙන් නිර්මාණයවූ අවිනිශ්චිත වාතාවරණ සහ අභියෝග රැසකට මුහුණදීමට 2023 වර්ෂයේදී බැංකුවට සිදු විය. එලෙස විවිධ අභියෝගවලට මුහුණ දෙමින් වුවද පැසසුම් සහගත ප්‍රතිඵල අත්කර ගනිමින් 2023 වර්ෂයේදී විශිෂ්ට සවලතාවයක් ප්‍රකට කිරීමට බැංකුව සමත් වූ බව මම වාර්තා කරන්නේ සාඩම්බරයෙනි. බැංකුව වෙනස්වන ලෝකය තුළ තරඟකාරීව හා යෝග්‍ය ලෙස නැගී සිටින බව සහතික කරමින් වෙනස්වන ජනගහන රටා වලට අනුරූපීවීම සහ ආයතනික පාරිසරික සාධක ඒකාබද්ධ කිරීම සඳහා නැගී එන තාක්ෂණික ප්‍රවණතා උපයෝජනය කිරීම අරමුණු කරගෙන සකස් කරන ලද උපායමාර්ගික ව්‍යාපාරික සැලැස්මක් ඔස්සේ, සීඝ්‍රයෙන් විචලනය වන ගෝලීය සන්දර්භයක් විසින් අප හමුවේ තැබෙන අවස්ථා හා අභියෝග වලට බැංකුව සක්‍රීයව ප්‍රතිචාර දක්වමින් සිටී.



සංකීර්ණ මෙහෙයුම් වටපිටාව තුළ සාර්ථකව ඉදිරියට යමින්...

2023 වර්ෂය තුළදී මතුවූ අභියෝග විවිධ විය. ඒවා ආර්ථික, සමාජයීය මෙන්ම බැංකුව ක්‍රියාත්මක වන මූල්‍ය සන්දර්භයේ විවිධ වෙනත් පැතිකඩ නියෝජනය කරන සාධක විය. කොවිඩ් - 19 වසංගතය හා ඊට පසුව රට තුළ නිර්මාණයවූ ආර්ථික අර්බුදය හේතුවෙන් බොහෝ ගනුදෙනුකරුවන් ආර්ථික අපහසුතා වලට පත්විය. මෙම නව තත්ත්වයට ක්‍රමයෙන් හැඩගැසීමට හා දිනෙන් දින වෙනස්වන නියාමන සමග අනුකූලවීමට බැංකු ක්ෂේත්‍රයට සිදු විය. ඒ සමගම, බොහෝ පුද්ගලයන් වඩා හොඳ අවස්ථා සොයා විදෙස් රටවලට සංක්‍රමණයවීම පාදක කරගෙන ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකාය ආශ්‍රිතව සැලකිය යුතු අඩුවීමක් දක්නට ලැබිණි. බැංකුව කෙරෙහි බලපෑම් ඇති කරන නූතන ප්‍රවණතා පිළිබඳව ගනුදෙනුකරුවන්, කොටස් හිමිකරුවන් සහ අනෙකුත් පාර්ශ්වකරුවන් දැනුවත් කිරීම සඳහා පවතින අවිනිශ්චිතතාවය සහ අවදානම් මධ්‍යයේ විනිවිදභාවය පවත්වා ගැනීම අත්‍යවශ්‍ය කරුණක් බවට පත්ව ඇත. අනාගත අභියෝග ජයගැනීමට අවැසි පදනම සකස් කරන අතරතුර නියාමන කඩුලු ජයගනිමින් මූල්‍ය වර්ෂය තුල පැන නැගුණු හදිසි කරුණ ආමන්ත්‍රණය කිරීම සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් උපායමාර්ග කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී.

මාර්ගගත හා ජංගම දුරකථන බැංකුකරණ සේවා වැඩිදියුණු කිරීම සඳහා ඩිජිටල් පරිවර්තන ව්‍යාපෘති කඩිනම් කිරීම සහ ගනුදෙනුකරුවන්ට දැරීමට සිදුවූ මූල්‍ය දුෂ්කරතා අවම කිරීමේ අරමුණෙන්, ක්‍රියාත්මක කළ ණය සහනය, පොලී අනුපාත පහළ දැමීම සහ නම්‍යශීලී ආපසු ගෙවීමේ ක්‍රම වැනි සහන ක්‍රමවේද ඉහත සඳහන් කළ උපායමාර්ගයට අයත් විය. බැංකුවේ සේවය කරන හා නව සේවා නියුක්තිකයන් පුහුණු කිරීම හා ඔවුන්ගේ කුසලතා වර්ධනය කිරීම සඳහා අප ආයෝජනය කළ අතර ඔවුන්ගේ සේවය අඛණ්ඩව ලබාගැනීම සහ මතුවූ සේවක හිඟය පියවා ගැනීම එමගින් අපේක්ෂා කෙරිණ.

සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරීගේ පණිවිඩය

අනුකූලතාවයෙන් හා විනිවිදභාවයෙන් යුතු සන්නිවේදනයක් ඔස්සේ බැංකුවේ මූල්‍ය තත්ත්වය, අවදානම් කළමනාකරණ ප්‍රයත්න සහ අනාගත විභවතාවය පිළිබඳව පාර්ශ්වකරුවන් මනාව දැනුවත්ව සිටින බව සහතික කිරීමට බැංකුව ක්‍රියා කර තිබේ. 2023 වර්ෂයේදී බැංකුව වෙනත් අභියෝග බොහොමයකටද මුහුණ දුන් අතර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා සහ ද්‍රවශීලතා අවශ්‍යතා, අක්‍රීය ණය ප්‍රතිශතය පහළ දැමීම, තාක්ෂණය බද්ධ කරගත් මූල්‍ය විසඳුම් සඳහා ආයෝජනය කිරීම, පාරිසරික සමාජයීය හා පාලන ප්‍රමිති බැංකු මෙහෙයුම් හා ඒකාබද්ධ කිරීම සහ විදේශ විනිමය අවදානම කළමනාකරණය කිරීම එම අභියෝග වලින් කිහිපයකි.

සමස්ත ජාතියේ ජනතාවට සේවය කිරීමට කැපවූ බැංකුවක් ලෙස ණය, වෙළඳපොළ සහ මෙහෙයුම් අවදානම හඳුනාගැනීම සහ වළක්වා ගැනීම, ඩිජිටල් බැංකුකරණ සේවා හා නිමැවුම් පුළුල් කිරීම, සේවා කෙරෙහි ප්‍රවේශවීමේ හැකියාව ඉහළ නැංවීම, වියදම් අවම කිරීම, ගනුදෙනුකරුවන්ගේ අත්දැකීම් උසස් තත්ත්වයකට ගෙනඒම සහ තවමත් පූර්ණ වශයෙන් හා අර්ධ වශයෙන් විධිමත් බැංකුකරණය වෙත යොමු නොවූ ප්‍රජාවට සේවය සැලසීම සඳහා වන බැංකුව සතු හැකියාව වැඩිදියුණු කරගැනීම අවශ්‍ය විය.

උපායමාර්ගය හා සම්පත් වෙන් කිරීම

මනා අවදානම් තක්සේරු ක්‍රියාත්මක කිරීම සහ මතු විය හැකි අවදානම් පිළිබඳව සක්‍රීයව හඳුනා ගැනීම ඔස්සේ බැංකුවේ උපරිම ආරක්ෂාව පවත්වා ගැනීම සඳහා අවස්ථාව සැලසේ.

වැඩි විස්තර සඳහා 62 සිට 80 දක්වා වන පිටු වෙත යොමුවන්න.

අපට මඟපෙන්වන උපායමාර්ග

මෙම අභියෝග හඳුනාගනිමින් සපලතාව, මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ ඉහළ ගනුදෙනුකාර සහය කේන්ද්‍ර කරගත් පුළුල් උපායමාර්ගයක් අප විසින් අනුගමනය කරන ලදී. පැවති පීඩාකාරී වාතාවරණය මධ්‍යයේ මුදල් ආපසු ගැනීම් මනාව පවත්වා ගැනීම සඳහා බැංකුව සිය ද්‍රවශීලතා කළමනාකරණය දියුණු කළේය. විභව අක්‍රීය වත්කම් ක්ෂණිකව හඳුනා ගැනීම සහ ඒ සඳහා අවශ්‍ය විධිවිධාන සැලසීම සඳහා විශේෂයෙන් ණය හා අත්තිකාරම් ආශ්‍රිත වත්කම්වල ගුණාත්මකභාවය වැඩිදියුණු කළේය. අවදානම් බෙදීයාම සහතික කිරීම සහ ආර්ථික අර්බුදය බැංකුවේ මූල්‍ය ප්‍රතිඵල කෙරෙහි ඇති කරන බලපෑම අවම කිරීම සඳහා බැංකුවේ ආයෝජන හා ණය කළඹ විවිධාංගීකරණය කරන ලදී. ගනුදෙනුකරුවන්ට අපගේ බැංකු සේවා වෙත පහසුවෙන් ළඟාවීමේ හැකියාව ඉහළ දැමීම, මෙහෙයුම් වියදම් අවම කිරීම සහ සේවා කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා ඩිජිටල් බැංකුකරණ සේවා පුළුල් කිරීම වේගවත් කරන ලදී.

අප විසින් ඉහළ ආදායම් උපදවන, ශූන්‍ය අවදානමක් සහිත රාජ්‍ය සුරැකුම්හි ආයෝජනය කළ අතර දැඩි ව්‍යවස්ථාපිත ද්‍රවශීලතා අනුපාතික (ව්‍යවස්ථාපිත ද්‍රවශීලතා වත්කම් අනුපාතිකය සහ ද්‍රවශීලතා ආවරණ අනුපාතිකය) සමඟ අනුකූල වන ලදී. පාරිසරික, සමාජයීය හා පාලන සාධක අපගේ කළමනාකරණ කාර්යරාමුව හා ඒකාබද්ධ කරන ලදී. මූල්‍ය අන්තර්ග්‍රහණය ඉලක්ක කරගත් මූලපිරීම් ඔස්සේ ප්‍රජාවට අත්වැලක් සපයන ලදී. එසේම අපගේ සයිබර් ආරක්ෂාව බලගන්වන ලදී. දුෂ්කර අවධියක අපගේ ගනුදෙනුකරුවන් සහ සමස්ත ප්‍රජාව වෙත සහාය සලසන අතරතුර බැංකුවේ ව්‍යාපාරික මෙහෙයුම්හි තිරසාරභාවය ඉහළ නංවමින් හා ස්ථායීතාවය ප්‍රවර්ධනය කරමින් 2023 වර්ෂයේ සංකීර්ණතා හා අවිනිශ්චිතතා ඵලදායක ලෙස කළමනාකරණය කිරීම සඳහා ඉහත දැක්වූ ක්‍රියාමාර්ග ගන්නා ලදී.

ඩිජිටල් පරිවර්තනය හා තාක්ෂණය සමඟ අනුගතවීම

සාම්ප්‍රදායික බැංකුකරණ සේවා ඩිජිටල් මූලපිරීම් සමඟ ඒකාබද්ධ කිරීමේදී ඇති වන සංකීර්ණතා සාර්ථකව කළමනාකරණය කරගන්නා අතරතුර තාක්ෂණික නවෝත්පාදනය වැළඳ ගැනීම, ගනුදෙනුකරුවන්ගේ අත්දැකීම් ඉහළ නැංවීම සහ මෙහෙයුම් විධිමත් කිරීම සඳහා සකස් කරන ලද පුළුල් සිතියමක් ලෙස අපගේ ඩිජිටල් උපායමාර්ගය හඳුන්වාදිය හැක. බැංකුව තුළ ඩිජිටල්කරණයට ප්‍රමුඛස්ථානය ලබාදීම ප්‍රවර්ධනය කරමින්, ඩිජිටල් ශක්‍යතා ඉහළ නංවමින්, පැරණි පද්ධති නව තාක්ෂණය සමඟ සංයෝග කිරීම සහ විවෘත බැංකුකරණය ආශ්‍රිත අවස්ථා පිළිබඳව සොයාබැලීම ඩිජිටල් අත්දැකීම් හා සම්බන්ධයෙන් ගනුදෙනුකරුවන්ගේ දෘෂ්ටිකෝණයෙන් තක්සේරු කිරීම සඳහා වන උපායමාර්ග අපගේ ඩිජිටල් උපායමාර්ගයේ ඇතුළත් වේ. එවැනි ආයෝජන මගින් මෙහෙයුම් කාර්යක්ෂමතාවය, ගනුදෙනුකරුවන්ගේ අත්දැකීම සහ අනුකූලතා කළමනාකරණය ඉහළ නැංවෙන බව අපි අපේක්ෂා කරමු. ඒ අනුව, ඩිජිටල් බැංකුකරණ පද්ධති, කෘතිම බුද්ධිය (AI) ආශ්‍රිත උපදේශන සේවා සහ සුරක්ෂිත ගනුදෙනු සඳහා බ්ලොක්චේන් තාක්ෂණය අපගේ නියාමන කාර්යරාමුව සමඟ අනුරූප වන බව අපි විශ්වාස කරමු. එසේම, ඉදිරි වසර වලදී කරළියට එන තාක්ෂණික ප්‍රවණතා සමඟ අනුගතවීම සඳහා අබණ්ඩ ආයෝජනවල වැදගත්කම අපි හඳුනා ගනිමු.

නිමැවුම් සහ සේවා නවෝත්පාදනය

අපගේ ජනතාවට වඩා හොඳ සේවාවක් ලබාදීම සඳහා නවීන ගෝලීය හා දේශීය මූල්‍ය අවස්ථා පිළිබඳව දැනුවත්ව සිටීම මෙරට ඉතුරුම්හි පතාක යෝධයා ලෙස නැගී සිටින අපගේ වගකීම වේ. මේ වසරේදී. ඩිජිටල් ඉතුරුම් ගිණුම් සහ විවිධ ගනුදෙනුකාර කාණ්ඩයන්හි වෙනස් වන අවශ්‍යතා සපුරාලිය හැකි, ඩිජිටල් ඉතුරුම් ගිණුම් සහ ආයෝජන නිමැවුම් ඇතළු නව නිමැවුම් හා සේවා ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් හඳුන්වා දෙන ලදී. එයට අමතරව, තැපැල් බැංකු ජාලය, ජංගම බැංකුකරණ ඒකක සහ මූල්‍ය සාක්ෂරතා වැඩසටහන් ඔස්සේ තවමත් පූර්ණ හෝ අර්ධ වශයෙන් විධිමත් බැංකුකරණය භාවිතයට යොමු නොවූ ජනතාව වෙත බැංකුව සිය ප්‍රවේශය පුළුල් කළ අතර ජාතියේ විවිධ කලාප නියෝජනය කරන ජනතාව වෙතද සිය ප්‍රවේශය පුළුල් කළේය.

ගනුදෙනුකරුවන්ගේ අත්දැකීම් සහ සබඳතාවය

ගනුදෙනුකරුවන් බැංකු මෙහෙයුම්හි කොඳු නාරටිය ලෙස ක්‍රියා කරයි. මෙම මූලික යථාර්ථය මනාව පිළිගෙන සහ අවබෝධ කරගෙන බැංකුව, අධ්‍යාපනය, පාරිසරික තිරසාරභාවය සහ මූල්‍ය සාක්ෂරතාවය ඉලක්ක කරගත් විවිධ මූලපිරීම්හි නිරතවූ අතර එහි සේවා කළඹ අබණ්ඩව ඉහළ නැංවීම, විමසීම් සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සහ සෑම සේවා කවුළුවකදීම ගනුදෙනුකරුවන් වෙත ධනාත්මක ප්‍රතිචාර සහතික කිරීම සඳහා ගනුදෙනුකරුවන්ගේ ප්‍රතිපෝෂණය අපේක්ෂා කිරීම මෙන්ම ආදර්ශමත් ගනුදෙනුකාර සේවාවක් සහතික කිරීම සඳහා සේවා නියුක්තිකයන්ගේ කුසලතා හා ආකල්ප වර්ධනය උදෙසා ආයෝජනය කිරීම සිදු කරන ලදී. ඉදිරිය සලකන විට, ඩිජිටල් පද්ධති ඔස්සේ ප්‍රශස්ත සේවාවක් සැපයීම සඳහා සේවා නියුක්තිකයන් පුහුණු කිරීම ඔස්සේ අපගේ ගනුදෙනුකාර සේවාව සම්බන්ධයෙන් මෙම විශිෂ්ටත්වයේ ප්‍රමිතිය පවත්වා ගැනීමේ අවශ්‍යතාවය ඉහළ යමින් තිබේ.

සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරීගේ පණිවිඩය

මෙහෙයුම් කාර්යක්ෂමතාවය සහ අවදානම් කළමනාකරණය

අපගේ සාර්ථකත්වයට පදනම් වූ සාධක සමුදායක් අතුරින් ඉහළ කාර්යක්ෂමතාවය සහ දැඩි අවදානම් කළමනාකරණය, ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ශක්තිය පසුපස තිබෙන තීරණාත්මක සාධක ලෙස හඳුන්වාදිය හැකිය. ආර්ථික අවිනිශ්චිතතා වලට සාර්ථකව මුහුණදීම සඳහා විවිධ තත්ත්ව සැලසුම්කරණය ක්‍රියාත්මක කිරීම සහ අවදානම් තක්සේරුව සඳහා විවිධ විශ්ලේෂණ මෙවලම් භාවිතයට ගැනීම ඔස්සේ ණය, වෙළඳපොළ, මෙහෙයුම් සහ සයිබර් ආරක්ෂණ අවදානම් ආමන්ත්‍රණය කිරීම උදෙසා අපි අපගේ අවදානම් කළමනාකරණ උපායමාර්ග බලගැන්වූයෙමු.

මානව ප්‍රාග්ධනය සංවර්ධනය

බැංකුවේ සේවා නියුක්තිකයන් එහි අභිවෘද්ධිය සඳහා අත්‍යවශ්‍ය වන අතර ජාතික ඉතිරිකිරීමේ බැංකුව එහි මානව ප්‍රාග්ධනය කෙරෙහි බලපෑම් ඇති කරන සාධක සමූහයක් සැලකිල්ලට ගෙන ඇත. මෙරට ශ්‍රමිකයන් විදෙස් රටවලට සංක්‍රමණයවීම, සේවය පිළිබඳව විවිධ අභිලාෂ සහිත නව පරම්පරාවේ ශ්‍රමිකයන් සහ තාක්ෂණික ප්‍රවණතා ආශ්‍රිත සීඝ්‍ර විකාශය මධ්‍යයේ බැංකුවේ සාර්ථකත්වයේ සංස්කෘතිය සහතික කරන මානව සාධකය රඳවා ගැනීම සඳහා විවිධ අවශ්‍යතා සපුරාලියයුතු බව හඳුනා ගැනීම ඉතා වැදගත් වේ. ජාතික ඉතිරිකිරීමේ බැංකුව විශේෂයෙන් ඩිජිටල් සාක්ෂරතාවය, ගනුදෙනුකාර සේවාවේ විශිෂ්ඨත්වය සහ විශ්ලේෂණ කුසලතා හා සම්බන්ධ කුසලතා වර්ධනය හා පුළුල් කිරීමේ වැඩසටහන් සඳහා ඇතුළත්වීමට සිය සේවා නියුක්තිකයන්ට අවස්ථාව දුන් අතර මෙරට විශිෂ්ටතම කුසලතා රැගත් පිරිසක් ආකර්ෂණය කරගැනීම හා රඳවා ගැනීම සඳහා ඉවහල් වන ආකාරයේ අභිප්‍රේරණය වන කාර්යාලීය පරිසරයක් නිර්මාණය කිරීම සඳහා නම්‍යශීලීභාවය හා නවෝත්පාදනය මුහුවූ සංස්කෘතියක් ඇති කිරීමට බැංකුව විසින් ක්‍රියා කරන ලදී.

උපායමාර්ගික සබඳතා හා හවුල්කාරිත්වය

රට වෙනුවෙන් සිදු කරන ලද සේවය මත පදනම්ව, බැංකුවේ ඉලක්ක හා දැක්ම පොදු සාධකය කරගත් මෙරට තවත් බොහෝ සංවිධාන හා ආයතනවල තෝරාගත් බැංකුව ලෙස ජාතික ඉතිරිකිරීමේ බැංකුව අඛණ්ඩව නැගී සිටී. ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ නිමැවුම් ප්‍රතිලාභ වර්ධනය කිරීමට උපකාර වන පරිදි මූල්‍ය තාක්ෂණය ගරු කොටගත් සමාගම්වල තාක්ෂණය හා ව්‍යාපාරික ආකෘති භාවිතයට ගැනීම සඳහා එවැනි සමාගම් සමග සබඳතා වලට එළඹීම, ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ප්‍රවේශය හා ශක්‍යතාවය (ගෙවීම් පද්ධතිය, ප්‍රේෂණ සේවා ආදිය ඇතුළුව) පුළුල් කිරීමට ආධාර වන ලෙස අනෙකුත් බැංකු හා මූල්‍ය ආයතන සමග සම්බන්ධතා ඇති කර ගැනීම සහ (ඩිජිටල් මූල්‍ය සේවා මගින් ජනනය වන ගාස්තු සහ ඩිජිටල් නාලිකා ඔස්සේ සිදු කරන හරස් විකුණුම් වැනි) නව ආදායම් ප්‍රභව වෙත අවතීර්ණවීම සඳහා මධ්‍ය කාලයේදී ඩිජිටල් පරිවර්තනයට එළඹීම ඔස්සේ රජයේ මෙන්ම ජනතාවගේ උත්තනිය උදෙසා කැපවූ සමාන අභිලාෂ සහිත පාර්ශ්වකරුවන් සමග කටයුතු කිරීම ආඩම්බරයට කරුණක් ලෙස ජාතික ඉතිරිකිරීමේ බැංකුව සලකයි.

මූල්‍ය කාර්යසාධන සාරාංශය - 2023

සාර්ව ආර්ථික සාධක හේතුවෙන් පැන නැගුණු බොහෝ අභියෝගවලට මුහුණ දෙමින් වුවද විශිෂ්ට කාර්යසාධනයක් අත්කර ගනිමින් සවලතාවය ප්‍රකට කිරීමට ජාතික ඉතිරිකිරීමේ බැංකුව සමත් විය. 2022 වර්ෂයේදී වාර්තා කළ රු. බිලියන 174.5 ක අගයට හා 29.3% ක වර්ධනයට සාපේක්ෂව බැංකුවේ දළ ආදායම 33% ක වර්ධනයක් සමගින් රු.බිලියන 232.1 ක් දක්වා ඉහළ ගියේය. 2022 වසරේ පැවති ඉහළ පොලී අනුපාත උපයෝජනය කරමින් රාජ්‍ය ණය සුරැකුම් හි බැංකුව සිදු කරන ලද ආයෝජනය හේතුවෙන් පොලී ආදායම 31.2% න් ඉහළ යාම, දළ ආදායමේ ඉහළ යාමට ප්‍රධාන වශයෙන් පාදක විය. ණය හා අත්තිකාරම් වෙතින් ලද පොලියද 36.3% න් ඉහළ ගොස් රු.බිලියන 23.4 ක් බවට පත් විය.

මූල්‍ය ප්‍රාග්ධනය

අපගේ මූල්‍ය ප්‍රාග්ධනය අපගේ මෙහෙයුම් සඳහා එන්ද්‍රීය වන අතර ශක්තිමත් මූල්‍ය කාර්යසාධනයක් පවත්වා ගැනීම සඳහා අපි කැපවී සිටිමු.

වැඩි විස්තර සඳහා 96 සිට 105 දක්වා වන පිටු වෙත යොමුවන්න.

කෙසේ වුවත්, තැන්පතු මිශ්‍රනයේ අන්තර්ගත ස්ථාවර තැන්පතු සැලකිය යුතු ලෙස ඉහළ අගයක් ගන්නා පසුබිමක වෙළඳපොළේ පොලී අනුපාත ඉහළ යාමට අනුරූපීව බැංකුවේ පොලී වියදම්ද පසුගිය වසරට සාපේක්ෂව 40.5% කින් ඉහළ ගියේය. මෙම අගය පොලී ආදායම වර්ධන අනුපාතය ඉක්මවූ අතර එය ශුද්ධ පොලී ආදායම් වර්ධනය කෙරෙහි සෘණාත්මක බලපෑමක් ඇති කළේය. වගකීම් ප්‍රතිමිලකරණයේ මන්දගාමී බලපෑම එයට හේතුවූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස ශුද්ධ පොලී ආදායම 8.9% ක සෘණ වර්ධනයක් වාර්තා කළේය.

ඉහළ පොලී අනුපාත මධ්‍යයේ වුවද ණය හා අත්තිකාරම් සඳහා අඩු ඉල්ලුමක් පැවතීම හේතු කොටගෙන ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම පහළ ගියේය. විදේශ විනිමය නැවත තක්සේරු කිරීමෙන් පසු ඇතිවූ පාඩුවක් සහ ලාභාංශ ආදායමේ පහළයාම පාදක කරගෙන ශුද්ධ වෙනත් ආදායම් ද පහළ ගියේය. එහෙත්, එය වෙළඳ කටයුතු මගින් ජනිත ශුද්ධ ආදායම් සහ මූල්‍ය වත්කම් ශේෂ පනුයෙන් ඉවත් කිරීම හේතුවෙන් ලැබුණු ශුද්ධ ආදායම්වල ඉහළයාමට වඩා වැඩි අගයක් ගෙන තිබිණි.

2022 වර්ෂයේදී රුපියල් බිලියන 4.9 ක් ලෙස සටහන් වූ හානිකරණ වියදම් වසර තුළදී 12.4% ක පහළ යාමත් සමඟ රු.බිලියන 4.3 ක මට්ටමක පවත්වා ගැනීමට බැංකුව සමත් විය. ණය හා අත්තිකාරම් කළඹෙහි පහළයාම සහ ශ්‍රී ලංකා මුදල් ඒකකයෙන් නිකුත් කරන ලද ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර හුවමාරු කිරීම, ඉහත සඳහන් හානිකරණ වියදම පහළ යාමට මූලිකවම හේතු විය. උද්ධමනයේ පීඩනය හේතුවෙන් පුද්ගල වියදම් සහ වෙනත් වියදම් කාණ්ඩ පිළිවෙලින් 16.8 කින් හා 13.3% කින් ඉහළ ගියේය.

එකී සාධකවල සංයෝගයෙන් ඇතිවූ බලපෑම හේතුකොටගෙන 2022 වර්ෂයේ රුපියල් බිලියන 4.5 ක් ලෙස සටහන් වූ බදු පෙර ලාභය, 4.9% කින් පහළ ගොස් රුපියල් බිලියන 4.3 ක් බවට පත්විය. කෙසේ වුවත්, ප්‍රමාදවූ බදු ණය පාදක කරගෙන ආදායම් බද්ද, 2022 වර්ෂයේදී සටහන් වූ රුපියල් බිලියන 2.0 ට සාපේක්ෂව රුපියල් බිලියන ප්‍රතිවර්තනයක් වාර්තා කළ අතර එහි ප්‍රතිඵලයක් ලෙස 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා බැංකුව රුපියල් බිලියන 7.2 ක බදු පසු ලාභයක් වාර්තා කිරීමට සමත් විය. එය 2022 වර්ෂයේ වාර්තා වූ රුපියල් බිලියන 2.5 ක අගයට සාපේක්ෂව සැලකිය යුතු ඉහළ අගයකි.

සාර්වමූල්‍ය තත්ත්වය විසින් එල්ල කරන ලද අභියෝග මධ්‍යයේ වුවද වසරකට පෙර රුපියල් ට්‍රිලියන 1.62 ක අගයක් ගත් සමස්ත වත්කම් 2023 දෙසැම්බර් 31 දිනට 4.3% ක වර්ධනයක් සමඟ රුපියල් ට්‍රිලියන 1.69 ක් බවට පත්කර ගැනීමට බැංකුව සමත් විය. පොලී අනුපාත ක්‍රමයෙන් පහළ ගියද බැංකුවේ තැන්පතු පදනම, වසර තුළදී රු.බිලියන 10.7 ක් දක්වා ඉහළ ගියේය.
ශ්‍රී ලංකා රජයේ පූර්ණ හිමිකාරිත්වය යටතේ බැංකුව පැවතීම සහ ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත ඔස්සේ, බැංකුවේ තැන්පතු හා ඉන් ඉපැයෙන පොලිය මත සැපයෙන ශ්‍රී ලංකා රජයේ 100% ක සුවිශේෂී රාජ්‍ය ආරක්ෂාව විසින් ගොඩනගන ලද ගනුදෙනුකරුවන්ගේ විශ්වාසය බැංකුවේ තැන්පතු පදනම ඉහළ යාමේ පදනම විය.

සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරීගේ පණිවිඩය

වෙනත් ආදායම් ඔස්සේ සාධාරණ අගය මත තක්සේරු කරන ලද මූල්‍ය වත්කම් හා අනෙකුත් බැංකුවල සිදු කරන ලද ආයෝජන මගින් වත්කම් පාර්ශවයේ වර්ධනය පිළිඹිබු කෙරුන අතර අත්තිකාරම් කළඹ 4.8% කින් සංකෝචනය විය. ණය හා ලැබිය යුතු දෑ සඳහා පැවති අවම ඉල්ලුම සමග එහි පොලී උපයන වත්කම් වඩා ලාභදායී විකල්ප සඳහා වෙන් කිරීමට බැංකුව විසින් ගන්නා ලද තීරණය හේතුවෙන් බැංකුවේ ආයෝජන කළඹ රුපියල් බිලියන 74.5 කින් වර්ධනය විය.

ජාතික ඉතිරිකිරීමේ බැංකුව සමස්ත ණය ප්‍රතිශතයෙන් ස්ථර 3 ණය ප්‍රතිශතය (හානිකරණ විධිවිධානය ඉවත් කිරීමෙන් පසුව) 2.41% ක් ලෙස අඛණ්ඩව පවත්වා ගත් අතර එය ක්ෂේත්‍රයේ සාමාන්‍යයට වඩා පහළ මට්ටමක පැවතිණ. ස්ථාවර ප්‍රාග්ධන අනුපාතිකද හිතකර මට්ටමක පවත්වාගැනීමට බැංකුවට හැකිවූ අතර ස්ථර ෂ ප්‍රාග්ධන අනුපාතිකය 19.3% ක් ලෙස හා සමස්ත ප්‍රාග්ධන අනුපාතිකය 16.9% ක් ලෙස සටහන් විය. එය පිළිවෙලින් 13.8% ක් හා 16.9% ක්වූ ක්ෂේත්‍රයේ සාමාන්‍යය ඉක්මවා තිබිණ. බැංකුව පාලනය වන නියාමන විසින් පනවන ලද සීමා ඔස්සේ වුවද ප්‍රාග්ධන සම්පාදනය සඳහා වන අවශ්‍යතාවයෙන් තොරව නියාමන අවශ්‍යතා සුපරාලීම සම්බන්ධයෙන් බැංකුව සතු ශක්‍යතාවය හා බැංකුවේ මූල්‍ය ශක්තිය, ඉහතින් සඳහන් කළ හිතකර ප්‍රාග්ධන තත්ත්වයන් විසින් පිළිබිඹු කෙරේ.

2023 වර්ෂයේදී, ජාතික ඉතිරිකිරීමේ බැංකුව, 62.4% ක සමස්ත වත්කම් වලින් ආයෝජන අනුපාතිකයක් වාර්තා කළ අතර 55.0% ක ඉහළ ද්‍රවශීලතා වත්කම් කළඹක් පවත්වාගැනීමට සමත් විය. ඊට ආදළ ක්ෂේත්‍රයේ සාමාන්‍යය 44.9% කි. ඒ අනුව, එමගින් 20% ක අවම ද්‍රවශීලතා අවශ්‍යතාවය ඉක්මවා තිබේ. ද්‍රවශීලතා ආවරණ අනුපාතිකය (සියලු මුදල් ඒකක) 293.7% ක්වූ අතර 100% ක අවම අවශ්‍යතාවය අභිබවා ඇත. ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතික සම්බන්ධයෙන් බැංකුව පැහැදිලිවම පැසසුම් සහගත ස්ථානයක පසුවන අතර එය අවම නියාමන අවශ්‍යතා ඉක්මවා තිබේ. වසර අවසානය වන විට, ද්‍රවශීලතාවය, ශේෂ පත්‍ර කළමනාකරණය, කාර්යසාධනය සහ ණය සහ වෙළඳ අවදානම කළමනාකරණය ආදී සෑම අංශයකින්ම "ශ්‍රී ලංකාවේ සුරක්ෂිතම බැංකුව" ලෙස සාර්ථකව හා අඛණ්ඩව ස්ථානගතවී සිටී.

ඇංගික කාර්යසාධනය

2023 වර්ෂයේදී බැංකුවේ ප්‍රධාන ව්‍යාපාරික අංශ සතර සුවිශේෂී අවස්ථා හා දුෂ්කරතා වලට එකසේ මුහුණ පෑවේය. ශාඛා බැංකුකරණය ආර්ථික විචලන වලට මුහුණ දුන් අතර ආයතනික මූල්‍ය, ගනුදෙනුකරුවන්ගේ කාර්යසාධනය ආශ්‍රිත විචලන වලට මුහුණ පෑවේය. ජාත්‍යන්තර බැංකුකරණයට අදාළව ප්‍රේෂණ වර්ධනයක් වාර්තාවූ අතර නිරන්තරයෙන් වෙනස් වන වෙළඳපොල තත්ත්වය යටතේ ක්‍රියාත්මක වීමට භාණ්ඩාගාර හා ගනුදෙනු (Dealing) අංශ වලට සිදු විය. අදාළ තොරතුර පහත දැක්වේ.

ව්‍යාපාරික අංශ සමාලෝචනය

අපගේ ව්‍යාපාරික අංශ, බැංකුවේ විවිධවූ ගනුදෙනුකාර පදනම වෙත සේවා සැලසීමෙහි පමණක් නොව පුළුල් ආර්ථික අරමුණු සමග අනුරුපී වීමෙහි සහ ගෝලීය බැංකුකරණ ප්‍රවණතා වලට අනුගතවීමෙහිලා උපායමාර්ගික භූමිකාවක් ඉටු කරයි.

වැඩි විස්තර සඳහා 106 සිට 111 දක්වා වන පිටු වෙත යොමු වන්න.

ශාඛා බැංකුකරණය

තැන්පතු සංචලනය හා ණය කළඹ කෙරෙහි බලපෑමක් ඇති කරමින් සිදුවූ ආර්ථික පුනර්ජීවනය, උද්ධමනය සහ විචලනය වන පොලී අනුපාත මධ්‍යයේ බැංකුවේ ශාඛා බැංකුකරණ අංශයට අභියෝග වලට මුහුණ පෑමට සිදු විය.

මෙම බාධක මධ්‍යයේ වුවද ශාඛා බැංකුකරණය ආශ්‍රිතව පොලී ආදායම ඉහළ ගියේය. කෙසේවුවත්, පැවති හානිකරණ ගාස්තු ඉහළ යාමද ඒ සමග සිදු විය. තැන්පතු වර්ධනය බලගැන්වීම සඳහා ඩිජිටල් මුලපිරීම් සහ ප්‍රවර්ධන වැඩසටහන් ආදී මුලපිරීම් ක්‍රියාත්මක කරන ලද අතර සුරැකුම් මත පදනම්වූ ණය පහසුකම් කෙරෙහි අවධානය යොමු කරමින්, ප්‍රවේශම් සහගත ප්‍රවේශයක් අනුගමනය කෙරිණ. "NSB නෙක්ස්ට් ජෙන්" මැයෙන් ඩිජිටල් බැංකුකරණ සේවා හඳුන්වාදීම ඔස්සේ ගනුදෙනුකරුවන්ගේ පහසුව සහ බැංකු සේවා වෙත ළඟාවීමේ හැකියාව ඉහළ නැංවීමට අපේක්ෂා කරයි. ඩිජිටල් සේවා පුළුල් කිරීම, ගනුදෙනුකාර සේවාව ඉහළ නැංවීම සහ සාම්ප්‍රදායික ණය ප්‍රතිපත්ති කෙරෙහි අවධානය යොමු කරමින් උද්ධමන පීඩනය මධ්‍යයේ වුවද 2024 වසර තුලදී ඉහළ ස්ථායීතාවයක් කරා ළඟාවීමට බැංකුව අපේක්ෂා කරයි. වෙළඳපොල කොටස පවත්වා ගැනීම සහ ගනුදෙනුකාර සේවාව කෙරෙහි ප්‍රමුඛතාවය ලබාදීම තවදුරටත් බැංකුවේ ප්‍රධාන අරමුණු වන අතර හරස් විකුණුම් අවස්ථා ඔස්සේ නව ගනුදෙනුකරුවන් ආකර්ෂණය කරගැනීම සහ ඩිජිටල් සේවා නාලිකා ශක්තිමත් කිරීම යන කරුණු වල අවශ්‍යතාවය අවධාරණය කෙරේ. වත්කම් වල ගුණාත්මකභාවය සහ මූල්‍ය ස්ථායීතාවය සහතික කිරීම සඳහා රැස්කිරීම් හා හානිකරණ වෙන්කිරීම් කෙරෙහි අවධානය යොමු කරමින් ණය ලබාදීම සම්බන්ධයෙන් විචක්ෂණශීලී ප්‍රවේශයක් අනුගමනය කිරීමට බැංකුව කැපවී සිටී.

ආයතනික මූල්‍ය

ණය ආපසු ගෙවීම හා සම්බන්ධ දුෂ්කරතා සහ ආයතනික ණය කළඹෙහි කැපී පෙනෙන පහළ යාමකට මග පාදමින් පැවති අභියෝගාත්මක මෙහෙයුම් පරිසරය විසින් ආයතනික බැංකුකරණ අංශයේ ගනුදෙනුකරුවන්ගේ කාර්යසාධනය කෙරෙහිද බලපෑම් එල්ල කරන ලදී. කෙසේවුවත්, ඉහළ පොලී අනුපාත සහිත ආයතනික ණය සුරැකුම් ආයෝජන වල ඉපැයුම් ඉහළ ගියේය. ආර්ථික ආතතිය සාර්ථකව කළමනාකරණය කිරීම සහ හිතකර වත්කම් කළඹක් පවත්වාගැනීම සඳහා බොහෝ ක්ෂේත්‍ර වලට ලබාදුන් ණය සීමාකරමින් ආයතනික ණය අංශය විසින් ප්‍රවේශම්කාරී ණයදීමේ ප්‍රවේශයක් අනුගමනය කරන ලදී. ඒ වෙනුවට, වෙළඳපොල තත්ත්වයන්ට සචල ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කෙරුණු අතර විචක්ෂණශීලී කළඹ කළමනාකරණයක් සහ මනා වත්කම් ගුණාත්මකභාවයක් කෙරෙහි ප්‍රමුඛස්ථානය ලබාදෙන ලදී. ගනුදෙනුකරුවන්ගේ මුදල් ප්‍රවාහ විශ්ලේෂණය කිරීම සහ ඔවුන්ගේ ව්‍යාපාරික මෙහෙයුම් අවබෝධ කරගැනීම ඔස්සේ බැංකුව ගනුදෙනුකරුවන්ගේ අභිරුචිය අනුව සැකසූ විසඳුම් තිළිණ කළ අතර නිසි කලට ණය අයකර ගැනීමට සහ ණය ගුණාත්මකභාවය කෙරෙහි අවධානය පවත්වාගැනීමට එමගින් අවස්ථාව හිමිවිය. වර්තමාන වෙළඳපොල තත්ත්වයන් යටතේ සචලතාව ප්‍රකට කරන ක්ෂේත්‍ර ඉලක්ක කරගෙන කළඹ නිරාවරණ කළමනාකරණය කරගැනීම, 2024 වර්ෂය සඳහා වන බැංකුවේ ප්‍රමුඛතා වලට ඇතුළත් වේ. හරිත ආර්ථිකයක් ප්‍රවර්ධනය කිරීම සඳහා වන රජයේ වැඩපිළිවෙල සමග අනුකූල වෙමින් පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා ණය ලබාදීමේ අවස්ථා හඳුනාගැනීමට හා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය. එසේම, මෙහෙයුම් විධිමත් කිරීම සඳහා සිය ඩිජිටල් ශක්‍යතාවය ඉහළ නංවන අතර සිය සබඳතා ශක්තිමත් කරගැනීමට, ශ්‍රී ලංකාව තුල සිය සළකුණ පුළුල් කිරීමට සහ ණය කළඹෙහි ගුණාත්මනභාවය ආරක්ෂා කරගැනීමට අපේක්ෂා කරයි.

ජාත්‍යන්තර බැංකුකරණය

ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම සහ සංචාරක කර්මාන්තයේ හා විදෙස් ශ්‍රමික ප්‍රේෂණ වල පුනර්ජීවනය වැනි සාධක පදනම් කරගෙන විදේශ විනිමය තැන්පතු සහ ප්‍රේෂණ ආශ්‍රිතව

සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරීගේ පණිවිඩය

සැලකිය යුතු වර්ධනයක් වාර්තා කිරීමට බැංකුවේ ජාත්‍යන්තර අංශයට හැකි විය. 2022 වර්ෂයේදී රුපියල් බිලියන 71.8 ක අගයක් ගත් බැංකුවේ ප්‍රේෂණ 2023 දී රුපියල් බිලියන 128.5 ක් දක්වා ඉහළ ගියේය. ඒ අනුව, 2022 වර්ෂයේ දෙසැම්බර් මාසයේදී 5.7% ක් ලෙස සටහන්වූ බැංකුවේ ප්‍රේෂණ වෙළඳපොල කොටස 2023 දෙසැම්බර් මාසයේදී 6.6% ක් දක්වා ඉහළ ගියේය. ආනයන ආශ්‍රිත ව්‍යාපාර කෙරෙහි බලපෑමක් ඇති කරමින් පැන නැගුණු විදේශ විනිමය ද්‍රවශීලතා ගැටළු වැනි අභියෝග මධ්‍යයේ වුවද ප්‍රේෂණ හා සම්බන්ධ සිය වෙළඳපොල කොටස ඉහළ නංවාගැනීමට බැංකුවේ ආයතනික මූල්‍ය අංශය සමත් විය.

බැංකුවේ විදේශ මුදලින් වර්ධනය වන තැන්පත් කිරීම් කළඹ මත තැන්පතුවල පොලිය තුළින් ලැබෙන ඉපයීම්, ප්‍රධාන විශේෂාංගයකි. 2024 වර්ෂය වනවිට ජාත්‍යන්තර බැංකු අංශය, විදේශ මුදල් තැන්පතු සහ ප්‍රේෂණ වැඩි කිරීම මගින් ඩොලර් ද්‍රවශීලතා තත්ත්වය ශක්තිමත් කිරීම අරමුණු කරයි. ප්‍රධාන ප්‍රේෂණ මූලාශ්‍ර වෙළඳපළවල වෙළඳපළ තුළට පිවිසීම සහ වර්ධනය, ප්‍රයෝජනයට නොගත් වෙළඳපළ කෙරෙහි අවධානය යොමු කිරීම සහ නව ආයෝජන මෙහිදී ප්‍රමුඛතාවන් අතරට වැටේ.

මීට අමතරව, අපනයන වෙළඳ මූල්‍ය කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමටත්, ඩිජිටල් හැකියාවන් හා විධිමත්, ප්‍රවාහගත මෙහෙයුම් හරහා කාර්යක්ෂමතාව වර්ධනය කරන අතර ටෙලිග්‍රාෆික් හුවමාරු මෙහෙයුම් වැඩි දියුණු කිරීමටත් සැලසුම් කර ඇත.

භාණ්ඩාගාරය සහ වෙළඳ ගනුදෙනු

දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳ නිවේදනයත් සමග රාජ්‍ය සුරැකුම්පත්වල ප්‍රතිලාභ පහත යාමක් සනිටුහන් කරමින් ගතික වෙළඳපළ තත්ත්වයක් බැංකුවේ භාණ්ඩාගාර හා වෙළඳ ගනුදෙනු අංශය විසින් අත්දකින ලදී. කරුණු මෙසේ පැවතියද, ඉහළ පොලී අනුපාතික කාලසිමාව යටතේ ක්‍රමිකව ඉහළ යන ඉපයීම් සමගින් මෙම අංශය එහි ඔරොත්තුදීමේ හැකියාව පෙන්නුම් කරන ලදී. සඳහන් කළයුතු කරුණක් නම්, ප්‍රති මිලදී ගැනීම් ණය කළඹෙහි කැපී පෙනෙන වර්ධනයක් සිදු වන අතරතුර පාරිභෝගික ණය සඳහා වූ ඉල්ලුම අඩුවීම හේතු කොට ගෙන රාජ්‍ය සුරැකුම්පත්හි සිදු කළ ආයෝජන ඉහළ නැගීමයි. කෙසේ වුවද සීමා සහිත ද්‍රවශීලතාව සහ වෙළඳපළ අවස්ථාවනට බලපෑම් ඇති කරමින් ස්ථීර ආදායම් වෙළඳාම්හි වෙළඳපළ සහභාගීත්වය යනාදී අභියෝග පැවතිණි.

2024 වර්ෂය වෙත අවධානය යොමු කරන විට තවදුරටත් මෙහෙයුම් ප්‍රවාහගත කිරීම පිණිස ඩිජිටල් මෙහෙයුම් වර්ධනය කිරීම, වත්කම් හා වගකීම් කළමනාකරණය වැඩිදියුණු කිරීම හා අඩු පිරිවැය අරමුදල් සැපයුම් මාර්ග උපයෝගී කර ගැනීම යනාදිය වෙත ප්‍රමුඛතාව ලබාදිය යුතුව පවතී. වැඩිමනත් වශයෙන් ගත්විට, සෘජු වෙළඳ සහභාගීත්ව තත්ත්වයක් හා පරිපාලනමය කටයුතු මධ්‍යගත කිරීම යනාදිය මගින් අවධාරණය කරනු ලබන්නේ පැන නගින මූල්‍ය වාතාවරණ කාර්යක්ෂමව කළමනාකරණය කර ගැනීමට හා නව්‍යකරණය සඳහා එම අංශයෙහි කැපවීමයි.

දක්ෂයින්ගේ සහභාගීත්වය, කුසලතාවන්ට ඉඩදීම

2023 දී විදේශ සංක්‍රමණයේ කැපී පෙනෙන ඉහළයාමක් සිදුවීමත් සමග දක්ෂ ශ්‍රමිකයින්ගේ බුද්ධිගලනයක් රට තුළ සිදු විය. මෙවැනි තත්ත්වයක් තුළ අපගේ මූලික වත්කම ලෙස අප සතු මානව සම්පත්වල තීරණාත්මක වැදගත්කම අවධාරණය වෙයි. මෙවැනි අභියෝග හමුවේ වුවත් අපගේ කණ්ඩායමේ කැපවීම, ඔරොත්තුදීමේ හැකියාව සහ දක්ෂතා අප බැංකුව ඉදරියට ගෙනයාමට සමත් විය. අපි එක්ව ආයතනික අරමුණු සාක්ෂාත් කර ගත්තෙමු. බාධක ජය ගත්තෙමු. නව භූමිකාවන් වැළඳ ගත්තෙමු. එමෙන්ම සැලකියයුතු පෙරළිකාර තත්ත්වයන් මධ්‍යයේ සහයෝගයෙන් ඵලදායී ලෙස කටයුතු කළෙමු.

මානව ප්‍රාග්ධනය

අපගේ සේවකයින්, අපගේ විශාලතම ශක්තිය වන අතර ඔවුන් පුහුණු කිරීම සඳහා අපි අපගේ සම්පත් ආයෝජනය කරන්නෙමු.

විස්තර සඳහා කරුණාකර පිටු අංක 124 - 135 වෙත යොමු වන්න.

කාර්යමණ්ඩල හිඟය මධ්‍යයේ දක්ෂ සේවකයින් බඳවා ගැනීම සහ රඳවා ගැනීමේ අභියෝග මෙන්ම තාක්ෂණික සහ ඩිජිටල් සාක්ෂරතා කුසලතාවන් සහිත සේවකයින් සඳහා වන හදිසි අවශ්‍යතාව මෙන්ම “Baby Boomers” ”Generation X”, “Millennials” සහ “Generation Z” යනාදී වෙනස් පරම්පරාවලට අයත් ශ්‍රමබලකායක් තුළ පැන නගින විවිධ අපේක්ෂාවන් මෙම බාධාවන්ට ඇතුළත් වේ. පුහුණු වැඩසටහන්, වැඩමුළු සහ e-learning පාඨමාලා ඇතුළුව බැංකුව විසින් සපයනු ලබන ඩිජිටල් සාක්ෂරතාව සහ ප්‍රවීණතා පුහුණු මූලපිරීම්වලට සහභාගි වෙමින් නව තාක්ෂණයෙන් සහ මාධ්‍ය අනුගමනය කරමින් කාර්ය මණ්ඩල සාමාජිකයින් බැංකුවේ ඩිජිටල් පරිවර්තන ප්‍රයත්නයන් වැළඳගෙන ඇත. මීට අමතරව, තරුණ සේවකයින්ගේ වෙනස්වන මනාපයන්ට ගැලපෙන පරිදි වෘත්තීය ප්‍රගමනයට ඇති අවස්ථා නම්‍යශීලීභාවය සහ අරමුණු මත පදනම් වූ භූමිකාවන් පිරිනැමීමට බැංකුව සිය මානව සම්පත් ප්‍රතිපත්ති සකස් කරමින් පවතී. අදහස්, ප්‍රතිපෝෂණ සහ සැලකිය යුතු කරුණු බෙදා ගැනීමට පහසුකම් සැලසීම සඳහා විනිවිදභාවය සහ විවෘතභාවය පිළිබඳ සංස්කෘතියක් පෝෂණය කරමින් බැංකුවේ දැක්ම සහ අරමුණු සඳහා ඔවුන් සම්බන්ධ කර ගැනීම සඳහා සේවකයන් දිරිමත් කිරීම සහ ඔවුන්ගේ තනතුරුවලට අදාළ සහතිකකරණ ලබා ගැනීම සඳහා දිරිගැන්වීම සහ සහායවීම මෙයට ඇතුලත් වේ.

අනාගතය දෙස හැරෙමින්

බැංකු ක්ෂේත්‍රය තුළට ඩිජිටල් පරිවර්තනයේ සම්ප්‍රාප්තියත් සමඟ, මෙතෙක් පරිහරණයට නොගත් ආදායම් මාර්ග ගණනාවක් ඉස්මතුවීමද ඇරඹිණි. මේ අතරට ඩිජිටල් මූල්‍ය සේවා මත අය කරන ගාස්තු, උපාය මාර්ගික හවුල්කාරිත්වය/නව වෙළඳපොළ විනිවිද යාමට නව්‍යකරණය හා එක්ව නිර්මාණය කිරීම් සඳහා තාක්ෂණික ආයතන සමග ඒකාබද්ධව කටයුතු කිරීම, සහ ඩිජිටල් මාධ්‍ය හරහා පුද්ගලාරෝපිත නිමැවුම් යෝජනා ලබාදීමෙන් ඉලක්කගත විකුණුම් මූලපිරීම් වැඩිදියුණු කිරීම සඳහා පාරිභෝගිකයන් සමග සිදුවන ගනුදෙනු ඩිජිටල්කරණය මගින් ජනනය වන ගාස්තු ඇතුළත් වේ.

මෙලෙස නව පිරිනැමීම් හඳුන්වාදීම තුළින් ඊටම අවේනික අභියෝග මාලාවකටද මුල පිරෙනු ඇති බව නොඅනුමානය. දේශීය හා ගෝලීය ආර්ථික අස්ථාවරත්වය, උද්ධමන පීඩනය, මුදල් අවප්‍රමාණවීම සහ උච්චාවචනය වන පොලී අනුපාත, බැංකුවේ මෙහෙයුම්වලට සහ සමස්තව මූල්‍ය කාර්යසාධනය කෙරෙහි බලපෑම් එල්ල කරනු ලැබීමට ඉඩ ඇත. අනුකූලතාව හා තරඟකාරිත්වය සහතික කිරීම සඳහා පවතින පරිවයන් සහ ප්‍රතිපත්තිවල සැලකියයුතු වෙනස්කම් ඇති කරලීමට නියාමන වෙනස්කම් හේතු විය හැකිය. එමෙන්ම තරඟකාරී බාධා කිරීම් මගින් අපගේ වත්කම්වල ගුණාත්මකභාවයට බලපෑම් එල්ල විය හැකිය. ආර්ථික අවිනිශ්චිතතාව හමුවේ අක්‍රීය ණය ඵලදායී ලෙස කළමනාකරණය කිරීම අතිශය වැදගත් වේ. ඒ උදෙසා ණය අවදානම අවම කිරීම ඉලක්ක කරගත් විවක්ෂණශීලී ණයදීමේ උපායමාර්ග සහ සක්‍රීය ණය අධීක්ෂණය මෙන්ම ශක්තිමත් අවදානම් කළමනාකරණ පරිචයන් අත්‍යවශ්‍ය වනු ඇත.

සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරීගේ පණිවිඩය

ගතික වර්ධනයක් සහ ලාභයක් අත්කර දෙන බවට වන පොරොන්දුව සමඟින් බැංකු ක්ෂේත්‍රය අසමසම තාක්ෂණික විප්ලවයකට බඳුන් වෙමින් පවතී. මෙම පරිවර්තනය මධ්‍යයේ, ගනුදෙනුකාර අත්දැකීමට ප්‍රමුඛත්වය ලබාදීම අත්‍යවශ්‍ය කරුණකි. මේ සඳහා සියලුම අන්තර් ක්‍රියා/ගනුදෙනු සිදුවන ස්ථානයන්හිදී බාධාවකින් අවහිරයකින් තොරව පුද්ගලානුබද්ධ ගනුදෙනුකාර අත්දැකීම් සහිත ගමන් මගක් තිබීම අවශ්‍ය වේ. රජයේ සුරැකුම්පත්වල ආයෝජනය, බැංකුවේ ස්ථාවරත්වය සහතික කිරීමේ ප්‍රධාන මාර්ගයක් ලෙස ඉස්මතු වන අතර එමගින් පාර්ශ්වකරුවන් වෙතද තහවුරුවක් ලැබෙනු ඇත. මෙම අවිනිශ්චිත වාතාවරණය හමුවේ ගමන් ගන්නා විට, බැංකුව එහි මෙන්ම එහි පාර්ශ්වකරුවන්ගේ අභිමතාර්ථ රැකගැනීමෙහිලා ස්ථිරව ක්‍රියාකරන අතර කල්යල් බලා හමුවන ඉදිරි අවස්ථා වලින් උපරිම ප්‍රයෝජන ගැනීමට සූදානමින් සිටියි.

කෘතඥතාව


ගෙවුණු මූල්‍ය වර්ෂය දෙස ආපසු හැරී බලන විට, බැංකුව අඛණ්ඩ සාර්ථකත්වය කරා මෙහෙයවීමට දායකත්වය සැපයූ සියල්ලන්ගේ සාමූහික වෑයම සම්බන්ධයෙන් මා සතු වන්නේ දැඩි කෘතඥතාවයකි. ශ්‍රී ලංකාවට සේවය කිරීමෙහිලා වන අපගේ විශිෂ්ටත්වය කරා යන ගමනට දිරි සපයමින් සිය මූල්‍ය අවශ්‍යතා සපුරා ගැනීමේදී උපරිම විශ්වාසය අප වෙත තැබූ අපගේ අගනා ගනුදෙනුකාර හවතුන් වෙත මාගේ හදපිරි ස්තුතිය පිරිනමමි. සෑම දිනකම අපගේ ඉදිරි ප්‍රගතිය උදෙසා දක්වන නොසැලෙන කැපවීම වෙනුවෙන් අපගේ ලෙන්ගතු සේවක මඩුල්ලට මාගේ තුති පළ කරමි.

මෙවැනි අභියෝගපිරි මූල්‍ය කාල පරිච්ඡේදයක් පුරාවට ජාතික ඉතිරිකිරීමේ බැංකුවට සිය සාමූහික ඉලක්ක සපුරා ගැනීමෙහිලා අවැසි මාර්ගෝපදේශ, උපදෙස් සැපයූ සභාපතිතුමාට හා අධ්‍යක්ෂ මණ්ඩලයට ඔවුන්ගේ එම සහයෝගය වෙනුවෙන් මාගේ කෘතඥතාවය මෙහිදී පළ කරනු කැමැත්තෙමි.

බැංකුවේ ප්‍රයත්නයන්ට රුකුල් දෙමින් පාලන ආයතන විසින් දක්වන ලද නොසැලෙන සහයට ද මම අතිශයින්ම කෘතවේදී වෙමි. මුදල් අමාත්‍යවරයා වන ගරු ජනාධිපතිතුමාට, ගරු අග්‍රාමාත්‍යතුමා, භාණ්ඩාගාර ලේකම් හා නිලධාරී මණ්ඩලයට ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ඇතුළු නිලධාරී මණ්ඩලයට මාගේ හදපිරි ස්තුතිය පුද කරමි. එමෙන්ම නීතිපතිතුමා, විගණකාධිපතිතුමා ඇතුළු ඔවුන්ගේ කණ්ඩායම්වලට සහ වෙනත් නියාමන ආයතනාධිපතීන් ඇතුළු ඔවුන්ගේ කණ්ඩායම්වලට මාගේ ස්තුතිවන්තභාවය පළ කරමි. වර්ෂය මුළුල්ලේ තැපැල්පතිතුමා ඇතුළු තැපැල් දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරීන් දක්වන ලද මිල කළ නොහැකි දායකත්වයද අගය කළ යුතුමය. මෙකී සෑම පාර්ශ්වයක්ම බැංකුවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරන ලද අතර අප අත්කරගත් ජයග්‍රහණයන්ට ඔවුන්ගේ සහයෝගය මහඟු පිටුවහලක් විය.

අප විසින් අත්පත් කරගත් පොදු ජයග්‍රහණයන්හි එෙන්ද්‍රිය කොටස්කරුවන් වූ අපගේ ගෞරවනීය හවුකරුවන්ට හා පාර්ශ්වකරුවන්ට ඔවුන්ගේ ස්ථිරසාර නොසැලෙන සහයෝගය වෙනුවෙන් මාගේ කෘතඥ බව ප්‍රකාශ කර සිටිමි. මේ සියල්ලන් හා එක්ව අපි, අභියෝග ජයගනිමින්, අවස්ථාවන් හඹා යමින් විශ්වසනීය මූල්‍ය ආයතනයක් ලෙස ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ස්ථානය ශක්තිමත් කර ගැනීමට සමත්වීමු.

මෙලෙස අප එක්ව යන ගමනේදී අප බැංකුවට, එය සතු විශිෂ්ඨ ඔරොත්තුදීමේ හැකියාව තවදුරටත් ප්‍රකට කරමින් අනාගතයේදී වඩාත් ඉදිරියට යනු ඇති බවට මම විශ්වාස කරමි.



ශමී කණ්ඩම්බි
සාමාන්‍යාධිකාරී/
ප්‍රධාන විධායක නිලධාරී

2024 මාර්තු 25





ඒකාබද්ධ වාර්තාව

අපගේ තිරසාර වටිනාකම් නිර්මාණය කිරීමේ ආකෘතිය

මෙහෙයුම් පරිසරය සහ අවදානම් සහ අවස්ථා
26

ප්‍රමාණාත්මකතාවය
45

අපගේ තිරසාර වටිනාකම් නිර්මාණය කිරීමේ ව්‍යාපාරික ආකෘතිය
60

උපායමාර්ග හා සම්පත් වෙන් කිරීම
62

ඒකාබද්ධ පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වය
81

මෙහෙයුම් පරිසරය සහ අවදානම් සහ අවස්ථා

අපගේ මෙහෙයුම් පරිසරය විසින් අපි අබණ්ඩවම බලපෑමට ලක් කරන අතර, ඒ අනුව කෙටි, මධ්‍යම සහ දිගුකාලීනව පාර්ශ්වකරුවන් සඳහා වටිනාකම නිර්මාණය කිරීමේ අපගේ හැකියාවට බලපා ඇති අපගේ බාහිර පරිසරයේ සිදුවන සංවර්ධනයන් අපි සමීපව නියාමනය කරමු. අපගේ මෙහෙයුම් පරිසරය අපට ගෝලීය, දේශීය සහ ක්ෂේත්‍රයේ මට්ටමින් බලපාන සාධකවලින් සමන්විත වේ.

පහත රූපසටහනින් "මෙහෙයුම් පරිසරය" පරිච්ඡේදය සංවිධානය කරන ආකාරය පෙන්වයි.

ප්‍රධාන ප්‍රවනතා


මෙයට අපගේ කාර්යසාධනය සහ වටිනාකම නිර්මාණ ක්‍රියාවලිය හැඩ ගස්වන ප්‍රධාන ප්‍රවනතා ඇතුළත්ය. සෑම ප්‍රවනතාවයක්ම දේශපාලන, ආර්ථික, සමාජ, තාක්ෂණික, පාරිසරික සහ නෛතික සාධක නියෝජනය කරයි. ආර්ථික සාධකය යටතේ, ගෝලීය සංදර්භය, ශ්‍රී ලංකා ආර්ථිකය, සහ ක්ෂේත්‍රයේ කාර්යසාධනය සාකච්ඡා කරන ලදී. තවද, එක් එක් ප්‍රවනතාවයෙන් මතුවන අවදානම සහ අවස්ථා, අපගේ වටිනාකම නිර්මාණ ක්‍රියාවලිය සඳහා ගම්‍යාර්ථ, අපගේ උපායමාර්ගික ප්‍රතිචාරය, ප්‍රතිචාරය තුළ පාලනය සහ එක් එක් ප්‍රවනතාව සඳහා දැක්මක් පැහැදිලි කරනු ලබයි.

පංචබල විශ්ලේෂණය

ඉන් යම් ක්ෂේත්‍රයක තරඟකාරී වාතාවරණය විශ්ලේෂණය කරයි.

SWOT විශ්ලේෂණය

මෙම පරිච්ඡේදයෙන් අපගේ ශක්තීන්, දුර්වලතා, අවස්ථා සහ තර්ජන පිළිබඳ තක්සේරුව සහ තර්ජන අවම කරමින් සහ අවස්ථාවන් හී වාසිය ලබා ගනිමින් එය අපගේ උපායමාර්ගික තේරීම්වලට බලපාන ආකාරය කෙටියෙන් දක්වයි.



ප්‍රධාන ප්‍රවනතා

ප්‍රධාන ප්‍රවනතා ක්ෂේත්‍රයේ වාතාවරණය හැඩගස්වන සහ උපායමාර්ගික ගැලපීම් සහ නව්‍යකරණ මාර්ග යන් සොයන පරිනාමන බලකායන් නියෝජනය කරයි. මෙම ප්‍රවනතා ගොඩ නැගූ අවදානම්වල ඇතුළත් වනවා පමණක් නොව වර්ධනය සහ වෙනස්වීම සඳහා අසමසම අවස්ථා පිරිනමයි. ජනවිකාස, තාක්ෂණය සහ සමාජ-ආර්ථික ගතිකත්වයන්හි විශාල වෙනස්වීම් නව වෙලෙඳපොලවල් සහ ආදායම් ප්‍රවාහයන් විවෘත කිරීම සඳහා නවෝත්පාදනය සහ වර්ධනය සඳහා සාරවත් භූමියක් සැපයීමට නැඹුරු වේ. එය සාම්ප්‍රදායික ව්‍යාපාරික ආකෘතීන් කඩාබිඳ දැමිය හැකි අතර, ආයතනවලට ඔවුන්ගේ උපාය මාර්ගයට අනුවර්තනය විමට සහ අනපේක්ෂිත අභියෝග හඳුන්වා දීමට අවශ්‍ය වේ. ඉදිරි වසරවලදී වාතාවරණය සහ අපගේ ව්‍යාපාරය නැවත හැඩගස්වන ප්‍රධාන ප්‍රවණතා පහක් අපි හඳුනාගෙන ඇත. මෙම ප්‍රවණතා වන්නේ;

මෙහෙයුම් පරිසරය සහ අවදානම් සහ අවස්ථා

ප්‍රධාන ප්‍රවනතා



ගෝලීය සහ දේශීය සමාජ දේශපාලන සහ ආර්ථික බිඳ වැටීම්


ගෝලීය පරිසරය ප්‍රධාන බලවතුන් අතර වැඩිවූ නොඉවසුම් ගතිය සහ ජාත්‍යන්තර ආයතන අබණ්ඩව දුර්වලවීම සමඟ 2023 දී විවිධ අර්බුද මඟින් හැඩගස්වන ලදී. රුසියාව - යුක්‍රේණිය සහ ඊශ්‍රායල් - හමාස් අතර අර්බුදවල මෑතකාලීන වැඩිවීම යුද පසුබිමේ ගැටළුව අන්තර් - රාජ්‍ය සම්බන්ධතාවල පෙරමුණට රැගෙන ඇත. මතුවන තාක්ෂණයන් ගෝලීය ආර්ථික සාමය කණ්ඩනය කිරීම වේගවත් කරමින් ගෝලීය බල තුලනයේ වඩාත් වැදගත් තීරකයින් බවට පත් වෑඇත. කෙසේවෙතත්, කොවිඩ් 19 වසංගතයෙන් ගෝලීය ආර්ථික ප්‍රතිසාධනය, රුසියාවේ යුක්‍රේන ආක්‍රමණය, ඊශ්‍රායල්-හමාස් අර්බුදය සහ ජීවන වියදම් අර්බුදය පුදුමාකාරව ඔරොත්තදීම සපයමින් සිටී.

උද්ධමනය එහි 2022 උපරිමයෙන් බලාපොරොත්තු වූවාට වඩා වේගයෙන් පහත වැටෙමින් පවතින අතර, රැකියා සහ කටයුතු මත අපේක්ෂිත ප්‍රමාණයට වඩා කුඩා සංඛ්‍යාවක් සමඟ, සැපයුම් අංශයේ හිතකර වර්ධනයන් සහ මහ බැංකුව විසින් දැඩි කිරීම පිළිබිඹු කළ අතර එය උද්ධමනය අපේක්ෂිත සීමාවේ තබා ඇත. ඊට අමතරව, වර්ධනය පවත්වා ගැනීමට උත්සාහ දරමින් උද්ධමනය අඩු කිරීමට 2022 සහ 2023 දී ලොව පුරා බැංකු පොළී අනුපාත ඉහළ නංවන ලදී.

බොහෝ සංවර්ධිත රටවල ශ්‍රම වෙළෙඳපොල අඩු රැකියා නියුක්ති අනුපාත සහ පුනරාවර්තන සේවකයින්ගේ හිඟයෙහි වඩා අඩු අවස්ථා සමඟ ඔරොත්තදීම අබණ්ඩව පෙන්නුම් කර ඇත. සමස්ථයක් ලෙස, දැඩි ණයදීමට විභවතාව අඩුවී ඇති අතර ගෝලීය වර්ධනයට අවදානම් තිරුද්ධමනය සහ ස්ථීර වර්ධනය හේතුවෙන් පුළුල් වශයෙන් තුළනය කෙරේ.

2023 සහ 2024 සඳහා සැබෑ GDP වර්ධන ප්‍රක්ෂේපන

ප්‍රස්ථාරය 1




ගෝලීය

තත්ත්වය	2023	2024
ද.දේ.නි. වර්ධනය	දැඩි මූල්‍ය ප්‍රතිපත්ති දුර්වල ගෝලීය වෙළෙඳාම, සීමාකළ මූල්‍ය තත්ත්වයන් හේතුවෙන් ගෝලීය වර්ධනය 3.1%ක් විය.	දැඩි මූල්‍ය ප්‍රතිපත්ති, ශ්‍රම වෙළෙඳපොලෙහි අදාළ ලිහිල්වීමක් සහ සාපේක්ෂව බලශක්ති මිලගණන්වල මුල් සහ දැනට පවතින පහත වැටීම්වල සිට විනිවිද යන බලපෑම්වල අබණ්ඩ ප්‍රතිඵලයක් ලෙස 2024 දී ගෝලීය වර්ධනය 3.1%ට පුරෝකථනය කෙරේ.

වර්ධනය

ප්‍රස්ථාරය 2



උද්ධමනය	2023 දී උද්ධමනය 6.8%ට පහත වැටුනි.	ගෝලීය ශීර්ෂ උද්ධමනය 2024 දී 5.8% දක්වා තවදුරටත් පහත වැටීම අපේක්ෂා කෙරේ.
පොලී අනුපාත	2023 ජූනි සිට සිය මූල්‍ය ප්‍රතිපත්ති ස්ථාවරත්වය ලිහිල් කිරීම මහ බැංකුව ආරම්භ කළේය.	සියලුම මහ බැංකු 2024 දිඅනුපාත කපා හරිනු ඇත. නමුත් පූර්ව වසංගත මට්ටම්වලට ඉහළ පවතිනු ඇත.
නුවමාරු අනුපාත	2023 දී ශක්තිමත්ව පැවතුනි.	පසු බැසීමේ හැකියාව හේතුවෙන් අනුපාත ඉහළ යා හැක නැතිනම් පීඩාවට පත් වනු ඇත.
වෙළෙඳ	නැගෙනහිර ආසියාවේ ආර්ථිකවල කාර්යසාධනය සහ වෙළෙඳ ද්‍රව්‍යවල මිල ගණන්වල අඩුවීමක් යටතේ සංවර්ධිත ජාතීන්ගේ අඩුකළ ඉල්ලුම් මඟින් බලපෑම් කරමින් 2023 දිආසන්න වශයෙන් 5% කින් පහත වැටීම ගෝලීය වෙළෙඳාමෙන් අපේක්ෂා කළ හැකිය	ඉහළ යන වෙළෙඳ විරුපතාවන් සහ භූ ආර්ථික කණ්ඩණයන් ගෝලීය වෙළෙඳාමේ මට්ටමට බලපෑම් කරනු ඇතැයි අපේක්ෂා කරන බැවින් ගෝලීය වෙළෙඳ වර්ධනය 3.3%ක් වේ යයි පුරෝකථනය කෙරේ.

මෙහෙයුම් පරිසරය සහ අවදානම් සහ අවස්ථා

ශ්‍රී ලංකා ආර්ථිකය සහ දේශපාලන පරිසරය

2022 සහ 2023 දී, ශ්‍රී ලංකාව 1948 දිසිය නිදහසින් පසු දරුණුම ආර්ථික හා දේශපාලනික අර්බුදයට මුහුණ පෑවේය. කෙසේවෙතත්, රටේ දේශපාලන සහ ආර්ථික වාතාවරණය 2023 අවසානයට ස්ථාවරවීමේ තාවකාලික සංඥා පෙන්නුම් කළේය. මෙයට උද්ධමනය පාලනය කිරීමට පොලී අනුපාත වැඩි කිරීම, ඉන්ධන අනුග්‍රාහ ඉවත් කිරීම, බදු වැඩි කිරීම, බොහෝ අත්‍යවශ්‍ය අයිතම සඳහා වෙළෙඳපොල මිලකරණය හඳුන්වාදීම, සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ස්වාධීනත්වය සහ වගවීම වර්ධනයට නීතියක් සම්මත කිරීම වැනි ස්ථායිකරණ ක්‍රියාමාර්ග රජයෙන් ක්‍රියාත්මක කිරීම මෙයට සහය විය.

රජය මෙහෙයවන බදු ප්‍රතිසංස්කරණ යෝජනා 2022 මැයි සිට ක්‍රියාත්මකවීම යටතේ පැවති අතර එයට නව බදු හඳුන්වාදීම, බදු අයකිරීමේ කාර්යක්ෂමතාව වර්ධනය කිරීමට සහ අනුකූලතාව වැඩි කිරීමට අපේක්ෂා කරමින් බදු අනුපාත සහ පදනම්වලට පුළුල් ගැලපීම් රාශියක් ඇතුළත්ය. විදුලිය, ඉන්ධන, ගෑස්, සහ ආහාර වැනි අත්‍යවශ්‍ය අයිතම සඳහා ඇති වූ මිල ගැලපීම් බැහැරකළ හැකි ආදායම තුළ පහත වැටීම විභව සමාජ අසහනය පිළිබඳ ගැටළු මතු වී ඇත.

මෙම ක්‍රියාමාර්ගවල ප්‍රතිඵල වේගවත් විය. තත්‍ය ද.දේ.නි 2023 - 3වැනි කාර්තුවේදී වාර්ෂිකව 1.6% ක ධනාත්මක වර්ධනයන් වාර්තා කළේය. මෙය අඛණ්ඩව කාර්තු හයක් තුළ පළමු පුළුල් වීම වූ අතර ප්‍රතිසාධනයේ පළමු සංඥා පෙන්වන ලදී. උද්ධමනය 2022 සැප්තැම්බර්වල ඉහළම අගය වූ 69.8% සිට 2023 නොවැම්බර්වල 1.3% දක්වා පහත වැටුනී.

ණය ප්‍රතිව්‍යුහගතකරණය

රජය ණය හිමියන් සමඟ බාහිර ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ සාකච්ඡා පැවැත් වූ අතර, ආර්ථික ඇපදීමක් සම්බන්ධයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) සමඟ සාකච්ඡා තීව්‍ර කළේය, ඉන්දියානු ආධාර ඉල්ලා සිටි අතර ආසියානු ක්‍රියාපියවාදයේ ප්‍රමුඛ නිදහස් වෙළෙඳ ගිවිසුම්වල නිරත විය.

IMF සමඟ සාකච්ඡා කිරීමෙන් පසුව, 2023 මාර්තු මාසයේදී IMF මණ්ඩල අනුමැතියට පෙර මහ බැංකුව පොලී අනුපාත 100 bps ඉහළ නැංවීය. කෙසේවෙතත්, උද්ධමනයේ වේගවත් පහත වැටීම සමඟ, මහ බැංකුව ප්‍රතිපත්ති අනුපාත 650 bps කින් කපා දැමූ අතර වෙළෙඳපොල අනුපාත පහත වැටීම වේගවත් කිරීමට 200bps කින් SRR ද කපා හැරියේය.

2023 මාර්තු මාසයේදී, IMF මණ්ඩලය විසින් මාස 48 කට වැඩි කාලයක් පුරා ඇ. ඩොලර් බිලියන 2.9 ක් වටිනා විස්තීරණ අරමුදල් පහසුකමක් අනුමත කරන ලද අතර ඉන් ආදායම් මත පදනම් මූල්‍ය ඒකාග්‍රතාවය සහ පාලන ප්‍රතිසංස්කරණ අවධාරණය කරයි. 2023 දෙසැම්බර් 12 වන දින IMF මණ්ඩලය විසින් කරන ලද පළමු සමාලෝචනය මඟින් "ශ්‍රී ලංකාවේ කාර්යසාධනය සතුටුදායක" ලෙස ශ්‍රේණිගත කර ඇති අතර මුළු IMF විසර්ජනය ඇඩොල්ර් මිලියන 670 ක් 2023 දී (22%) වනු ඇති බව එයින් අදහස් වේ. IMF පහසුකම තුළින් සමාජ ආරක්ෂණය, මූල්‍ය අංශය සහ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ලෝක බැංකුවෙන් සහ ආසියානු සංවර්ධන බැංකුවෙන් (ADB) අමතර අරමුදල් විවෘත කරන ලදී.

රජය සතු ව්‍යවසායන් (SOEs) සඳහා වන ප්‍රතිසංස්කරණ කෙරෙහි IMF අවධානය යොමු කර ඇති ප්‍රධාන අංගයක් වී ඇති අතර ශ්‍රී ලංකාව පෞද්ගලීකරණ මුලපිරීම් කිහිපයක විශාල ප්‍රගතියක් ලබා ඇත

විදේශ විනිමය


භාවිතා කළ හැකි විදේශ සංචිත 2022 අප්‍රේල් මාසයේදී පැවති ඇ. ඩොලර් මිලියන 20 සිට 2023 ඔක්තෝම්බර් මාසයේදී ඇ. ඩොලර් බිලියන 2 දක්වා ඉහළ යාමත් සමඟ, විදේශ විනිමය ද්‍රවශීලතා පීඩනය ලිහිල් විය. අත්‍යවශ්‍ය භාණ්ඩ සඳහා පෝලිම් අතුරුදහන් වී ඇත. මහ බැංකුව රුපියලේ දිශානතියට බලපෑම් නොකර රුපියල නිදහසේ ගනුදෙනු කිරීමට දිගටම තවදුරටත් ඉඩ ලබා දුන්නේය. වසර සඳහා සංචිත ඉලක්ක සපුරා ගැනීම සඳහා මහ බැංකුව වසර පුරා ඩොලර් මිලදී ගැනීම දිගටම කරගෙන ගියේය.

කෙසේ වෙතත්, වසරේ අග භාගයේදී, මුදලේ ඉල්ලුම සහ සැපයුම මත පදනම් වී රුපියල චලනය වීමට ඉඩ සලසමින්, වෙළෙඳපොලේ ගනුදෙනු වලින් වැළකී සිටින බව මහ බැංකුව නිවේදනය කළේය. මුදලේ මූලික අවප්‍රමාණ පීඩන නිරීක්ෂණය වූ නමුත් පසුව අගයකිරීමේ පීඩනය වාර්තා කළේය. කෙසේ වෙතත්, එය සමාලෝචිත කාලසීමාව තුළ රු. 320 සහ 360 හි ඉලක්කගත පරාශය තුළ දිගටම පැවතියේය.

සාර්ව ආර්ථික සාධක	2023	2024
ද.දේ.නි. වර්ධනය	ප්‍රතිසාධනයේ පළමු සංඥා පෙන්නුම් GDP 2023 දී තෙවැනි කාර්තුවේදී 1.6%ක ධනාත්මක වර්ධනයක් වාර්තා කළේය	ලෝක බැංකුවට අනුව, ශ්‍රී ලංකාවේ ආර්ථිකය 2023 දී 3.8%කින් සංකෝචනය වීමෙන් පසු 2024 දී1.7% දක්වා වර්ධනය අපේක්ෂා කෙරේ.

කාර්තුමය ද.දේ.නි. වර්ධනය – ශ්‍රී ලංකාව

ප්‍රස්ථාරය 3




උද්ධමනය	2022 අවසානයේදී වාර්තා කළ 57.2%ට අනුව 2023 දෙසැම්බර් වන විට උද්ධමනය 4.0% දක්වා. පහත වැටුනී	ආහාර උද්ධමනය තවදුරටත් වැඩිවිය හැකි බැවින් සහ 18% දක්වා වැට් බදු ඉහළ දැමීමෙන් වියහැකි බලපෑම මඟින් බලපෑම් ඇති කරමින් උද්ධමනය ඉහළම ස්ථානයක පවතිනු ඇත.

මෙහෙයුම් පරිසරය සහ අවදානම් සහ අවස්ථා

සාර්ව ආර්ථික 2023 2024

උද්ධමනය


ප්‍රස්ථාරය 4



පොලී අනුපාත	මූල්‍ය ප්‍රතිපත්ති ලිහිල් කිරීමේ ක්‍රියාමාර්ගවල ඵලදායී සම්ප්‍රේෂණය සහතික කිරීමට සහ පාරිභෝගිකයින් ආරක්ෂා කිරීමට පොලී අනුපාත සීමාව හඳුන්වා දෙන ලදී.	පොලී අනුපාත පහළ මට්ටමක් පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ

පොලී අනුපාත

ප්‍රස්ථාරය 5



විනිමය අනුපාතය	විනිමය අනුපාතය ස්ථාවරව පැවතීමත් සමඟ වර්ධිත විදේශ විනිමය ගලාඒම් ද්‍රවශීලතා පීඩන ලිහිල් කර ඇත	වෙළෙඳාම ලිහිල් කිරීම හමුවේ වියහැකි සුළු අවප්‍රමාණය සමඟ විනිමය අනුපාතය ස්ථාවරව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ
වෙළෙඳ	අපනයන ඉපයීම් ඉක්මවාගිය ආනයන වියදම හේතුවෙන් 2010 සිට වෙළෙඳ හාණ්ඩවල වෙළෙඳ හිඟය පහල මට්ටමක විය. වෙළෙඳ හිඟය 2023 දෙසැම්බර් වර්ධනය වූ නමුත් මෑතකාලීන ආනයන සීමාලිහිල් කිරීම මධ්‍යයේ අපනයන තවදුරටත් මධ්‍යස්ථව පවති.	ආර්ථික ප්‍රතිසාධනය වෙළෙඳ හිඟය තුළ ප්‍රසාරණයට හේතු විය හැකිය
ශ්‍රී ලංකා මූල්‍ය ඒකාබද්ධතාව	2023 පළමු මාස නවය තුළ රු.බිලියන 1,613.6 දක්වා අයවැය හිඟය පුළුල් වූ අතර, පළමු මාස නවය තුළ මූලික හිඟය රු. බිලියන 123.8ක මූලික අතිරික්තයකට මාරුවිය. කෙසේවෙතත්, මධ්‍ය කාලය තුළ, ණය ප්‍රතිව්‍යුහගතකරණය සහ ආදායම් පදනම් මූල්‍ය ඒකාබද්ධතාව අවසන් කිරීමත් සමඟ සමස්ත ශේෂය අඩු වේයයි අපේක්ෂා කෙරේ.	පිරිවැය - ඵලදායී මූල්‍යකරණ යාන්ත්‍රණ ක්‍රියාත්මක කිරීම රජයට අයත් ව්‍යාපාර ව්‍යවසායන්හී මූල්‍යමය කාර්යසාධනය වර්ධනයට සහය වන බැවින් සහ රජය විසින් දේශීය ණය ප්‍රශස්තකරණ මෙහෙයුම සාර්ථකව අවසන් කිරීමෙන් පසු අයවැය හිඟය 2014 දී මධ්‍යස්ථ වන බවට අපේක්ෂා කෙරේ.

බැංකු ක්ෂේත්‍රයේ විශ්ලේෂණ

බැංකු ක්ෂේත්‍රය වසර පුරා කැලඹිලි සහිත ආර්ථික තත්ත්වයන්ට මුහුණ දුන්නේය. 2019 පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසු ආරම්භ වූ කුණාටු සහිත ආර්ථික තත්ත්වයන් සහ ඉන් පසුව 2020 දී කොවිඩ්-19 මතුවීම සහ 2021 පුරා සමාජ හා ආර්ථික කටයුතු කෙරෙහි එහි දිගුකාලීන ප්‍රතිවිපාක සමඟ සංකලනය වූ දැඩි ගෙවුම් ශේෂ පීඩාවන් සහ අසමසම ප්‍රතිපත්ති උභතෝකෝටික මධ්‍යයේ 2022 දී ඇති වූ සමාජ ආර්ථික හා දේශපාලනික කැළඹීම, පුද්ගලයන්ට සහ ව්‍යවසායන්ට පෙර නොවූ විරූ අභියෝග ඇති කරමින් ආර්ථික මෙහෙයුම්වලට බෙහෙවින් බලපා ඇත. රැකියා අහිමි වූ අතර සැබෑ ආදායම සැලකිය යුතු ලෙස පහත වැටුණු අතර, බොහෝ දෙනෙකුට ඉමහත් දුෂ්කරතා ඇති විය මෙම සියලු දුෂ්කරතා වලින් පසුව, 2023 වසර ප්‍රතිසාධනයේ ආරම්භය ලෙස සනිටුහන් කරමින් වෙළෙඳපොල සහභාගිවන්නන්ට ඔවුන්ගේ ආදායම් සහ ආධිපත්‍ය නැවත ගොඩනඟා ගැනීමට බලාපොරොත්තු විය හැකි වසර විය. දේශීය ණය අඩුකිරීම් සහ පොලී අනුපාත කපාහැරීම් ඇතුළු පිඩාකාර ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග බැංකු කර්මාන්තයට ද බලපා ඇත. මෙවැනි දුෂ්කරතා මධ්‍යයේ වුවද, 2023 අවසන් වන විට මුළු වත්කම්වල රු. ට්‍රිලියන 20 සලකුණු කිරීමට ක්ෂේත්‍රයට හැකි විය.

ලාභදායිතාව

2023 වසර තුළ, ඉපැයීම් සහ ලාභ බැංකුවල මූල්‍ය තත්ත්වයේ වඩාත් අභියෝගාත්මක සංරචකය අංගය විය. වෙළෙඳපොල තුළ පොලී අනුපාත පහත වැටීමක් තිබියදීත්, මුළු වත්කම්වල රු. ට්‍රිලියන 2.8 සලකුණු කිරීමට ක්ෂේත්‍රයට හැකි විය. එය පසුගිය වසරේ සිට 19.31% ක වැඩිවීමකි. කෙසේ වෙතත්, ශුද්ධ පොලී ආදායම (NII) වත්කම් සහ වගකීම් නැවත මිල කිරීමේ බලපෑම හේතුවෙන් 4.93% කින් අඩු වී ඇත. වර්ෂය තුළ පැවති දුර්වල සාර්ව ආර්ථික තත්ත්වයන් පිළිබිඹු කරමින් මුළු පොලී නොවන ආදායම ද 26.31% කින් අඩු විය. වසර තුළ කොටස් වෙළෙඳපොළ පසුබෑම හේතුවෙන් ශුද්ධ වෙළඳාමෙන් ඇති වූ ලාභය ද පසුගිය වසරට සාපේක්ෂව 83.66% කින් පහත වැටුනී. වසර තුළ බදු වෙනස්වීම්වලට අනුකූලව මූල්‍ය සේවා මත VAT, NBT, සහ වෙනත් බදු පසුගිය වසරට සාපේක්ෂව 46.96% කින් වැඩි වී ඇත.

මෙහෙයුම් පරිසරය සහ අවදානම් සහ අවස්ථා

මෑතකාලීන බදු ප්‍රතිසංස්කරණ හේතුවෙන් ආයතනික බද්ද ද 338.87% කින් වැඩි විය. දැඩි මූල්‍ය තත්ත්වයන් යටතේ වුවද, බදු පෙර ලාභය (PBT) ලෙස රු. බිලියන 294 ක් සහ බදු පසු ලාභය (PAT) ලෙස රු. බිලියන 189 ක් ඉපයීමට බැංකු ක්ෂේත්‍රය සමත් විය. වත්කම්වල ගුණාත්මක භාවය ඉහළ යාම සහ බැංකු විසින් ගනු ලැබූ නිවැරදි ප්‍රතිසාධන ක්‍රියාමාර්ග හේතුවෙන් හානිකරණ සහ අනෙකුත් අලාභ ද 65.06% කින් අඩු විය.

ක්ෂේත්‍රයේ ස්කන්ධය මත ඉපයීම් 10.6% ක් වූ අතර, එය පසුගිය වසරට සාපේක්ෂව සුළු වැඩිවීමකි. වත්කම් මත ඉපයීම් (බදු පසු) 0.9% කින් අවසන් වූ අතර එය පසුගිය වසරට වඩා 15.59% ක වැඩිවීමකි.

ණය සහ අත්තිකාරම්

2023 පළමු අර්ධය තුළ පැවති ඉහළ පොලී අනුපාත හේතුවෙන් ණය සහ අත්තිකාරම් 3.29% කින් පිරිහී ඇත.

තැන්පත් සහ අරමුදල්කරණය

බැංකු අංශයේ මුළු තැන්පතු පදනම 2023 අවසානයේ ට්‍රිලියන 16.6ක් වූ අතර ඉන් පසුගිය වසරට සාපේක්ෂව 12.63%ක වර්ධනයක් පෙන්නුම් කරයි. තැන්පතු මුසුව කාලීන තැන්පතු සහ ඉතුරුම් තැන්පතු ලෙස පිළිවෙළින් 66% සහ 26% බැගින් බෙදා හරින ලදී.

ණය සහ ලැබීම්

ක්ෂේත්‍රය
රු.ට්‍රි 10.1

බැංකුව
රු.ට්‍රි. 0.5

ආයෝජන

ක්ෂේත්‍රය
රු.ට්‍රි 7.3

බැංකුව
රු.ට්‍රි. 1.1

මුළු වත්කම්

ක්ෂේත්‍රය – රු.ට්‍රි **20.4**

බැංකුව – රු.ට්‍රි.1.7



තැන්පත්

ක්ෂේත්‍රය
රු.ට්‍රි 16.6

බැංකුව
රු.ට්‍රි. 1.5


ණය ගැනීම්

ක්ෂේත්‍රය
රු.ට්‍රි 1.39.


බැංකුව
රු.ට්‍රි. 0.09

ශුද්ධ පොලී	වත්කම් මත ඉපයීම	ස්කන්ධය මත ඉපයීම	අදියර 3 හානිකරණ ආවරණය	මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය
ක්ෂේත්‍රය – 3.6%	ක්ෂේත්‍රය – 1.5%	ක්ෂේත්‍රය – 10.6%	ක්ෂේත්‍රය – 49.0%	ක්ෂේත්‍රය – 16.91%
බැංකුව – 1.8%	බැංකුව – **0.3%**	බැංකුව – **9.4%**	බැංකුව – **53.3%**	බැංකුව – **19.26%**


වත්කම්වලට තැන්පත් ප්‍රස්ථාරය 6




තැන්පත්වලට ණය ප්‍රස්ථාරය 7



මුළු ණයවලට අදියර 3 ණය ප්‍රස්ථාරය 8



ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් ප්‍රස්ථාරය 9



මෙහෙයුම් පරිසරය සහ අවදානම් සහ අවස්ථා

ආයෝජන

2023 පළමු අර්ධය තුළ භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර පොලී අනුපාත ඉහළ යාම හේතුවෙන් බැංකු ක්ෂේත්‍රයේ ආයෝජන 23.3% කින් ඉහළ ගිය අතර රූට්ලියන 7.3 දක්වා ලඟා විය.

ද්‍රවශීලතාව

දැඩි ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සහ සාර්ව ආර්ථික තත්ත්වයන් මධ්‍යයේ වුවද, බැංකු අංශය යහපත් ද්‍රවශීල තත්ත්වයක් පවත්වා ගැනීමට සමත් විය. මුළු වත්කම් අනුපාතයට ද්‍රවශීල වත්කම් 39.8% ක් වූ අතර එය පසුගිය වසරට සාපේක්ෂව 46% ක වැඩිවීමකි. බාසල් III ව්‍යවස්ථාපිත ද්‍රවශීලතා අනුපාත ක්ෂේත්‍රයේ මායිම්වලට වඩා ඉහළින් පවත්වා ගන්නා ලදී. මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය 16.93% ක් වූ අතර පළමු පෙළ ප්‍රාග ්ධන ප්‍රමාණාත්මතා අනුපාතය 13.77% ක් විය. ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය 46.7% ක් විය.

බැංකු අංශය 2023 වසර තුළ ද්‍රවශීලතා අවදානම කරා වඩා ඉහළ ඔරෙත්තදීම පෙන්වා ඇත.

වටිනාකම සඳහා ගම්‍යාර්ථ

ගෝලීය සහ දේශීය දේශපාලන සහ ආර්ථික තත්ත්තවයන් බැංකු ක්ෂේත්‍රය කෙරෙහි සැලකියයුතු බලපෑම් ඇත.

භූදේශපාලනික සහ දේශීය දේශපාලන සංවර්ධනයන්ට අපගේ ව්‍යාපාර සහ වෙළෙඳපොල අඛණ්ඩතා, නියාමන, උපායමාර්ග ික සහ මෙහෙයුම් පරමාර්ථ සහ අරමුදල් අනුව අපගේ පාර්ශ්වකරුවන් සඳහා වටිනාකම නිර්මාණය කිරීමේ අපගේ හැකියාවට බාධා කළ හැකිය. මැද පෙරදිග සහ චීනයේ අවිනිශ්චිතතාවයන් අපගේ ව්‍යාපාරය සඳහා විශේෂයෙන් වැදගත් වේ. මැද පෙරදිග අවිනිශ්චිතතාවයන් ඉන්ධන හා ගෑස් මිලේ අඛණ්ඩ වෙනසකට හේතු වන අතර, එය ව්‍යාපාරය සහ ප්‍රවාහනය කෙරෙහි බලපායි. චීනයේ ගැටළුව මෙරටට අපනයනය කරන ලෝකය වටා වෙළෙඳ ද්‍රව්‍ය අපනයනකරුවන්ට බලපායි. කලාප දෙකෙහිම අවිනිශ්චිතතාවයන් වෙළෙඳ ද්‍රව්‍ය මිල ගණන් කෙරෙහි බලපෑ හැකිය.

සාර්ව ආර්ථික අස්ථාවරත්වය ගනුදෙනුකරුවන්ට, ව්‍යාපාර කාර්යසාධනයට (ආදායම, පිරිවැය, ලාභය, මුදල් ප්‍රවාහ උත්පාදනය) සහ ආයෝජක විශ්වාසය කෙරෙහි බලපාන අතර, මන්දගාමී දළ දේශීය නිෂ්පාදිතයේ (GDP) වර්ධනය සමඟ වඩා ඉහළ උද්ධමනය, පොලී අනුපාත සහ දුර්වල විනිමය ගනුදෙනුකරුවන්ගේ බැහැර කළ හැකි ආදායම, යෙදවුම් පිරිවැය සහ අරමුදල් මත පීඩනය ඇති කරයි.

එවැනි අභියෝගාත්මක ආර්ථික පරිසරයන් සහ දේශපාලන වාතාවරණය තුළ ඇති අවිනිශ්චිතතාවය අපගේ උපායමාර්ගික මූලපිරීම් ක්‍රියාත්මක කිරීමේ හැකියාව කෙරෙහි බලපායි.

අවදානම් සහ අවස්ථා

අපගේ අවදානම්

- ගනුදෙනුකරුවන්ගේ මිලදී ගැනීමේ ශක්තියට සැලකිය යුතු ලෙස බලපාන රජයට අයත් ව්‍යවසාය ආශ්‍රිත බොහෝ සේවාවන්හි වෙළෙඳපොල මිලකරණය සමඟ විවිධාකර බදු ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කර ඇත.
- වඩා අඩු බැහැර කළ හැකි ආදායම ගනුදෙනුකරුවන්ගේ ආපසු ගෙවීමේ හැකියාවට බලපාන අතර එය වත්කම්වල ගුණාත්මකභාවයට බලපායි.
- වැඩි කාලයක් ඉහළ මට්ටමේ පැවති පොලී අනුපාත අරමුදල් සහ මෙහෙයුම් පිරිවැය කෙරෙහි සැලකියයුතු බලපෑමක් ඇත.
- රන් බැඳුම්කර ශ්‍රේණිගතකරණය පහත වැටීම හේතුවෙන් අරමුදල් කරා පිවිසීම.
- වෙළෙඳපොල ද්‍රවශීලතා අවදානම්
- විදේශ විනිමය අවදානම

අපගේ අවස්ථා

- අපගේ වෙළෙඳපොල තුළ සාර්ව-ආර්ථික අභියෝග විසඳීම තුළින් නව්‍යකරණය සඳහා අවස්ථා ග්‍රහනය කරමින් සුපිරි පන්තියේ ව්‍යාපාරයක් සංවර්ධනය කිරීම
- අනාගතයේ මෙවැනි තත්ත්වයන්ගේ බලපෑමට ප්‍රතිචාර දැක්වීම පිණිස වත්කම් කළඹ නැවත සැලසුම් කිරීම.
- නව සංවර්ධනයන්ට අනුව අපගේ උපායමාර්ගය නිවැරදිකර ගැනීමේ සීග්‍රතාව වැඩි කිරීමේ හැකියාව

අපගේ උපායමාර්ගික ප්‍රතිචාරය

- බැංකුවේ ද්‍රවශීලතාව සහ ප්‍රාග්ධනය ආරක්ෂා කිරීම.
- ඵලදායී භාණ්ඩාගාර කළමනාකරණය, ප්‍රාග්ධන කළමනාකරණය සහ මූල්‍ය සැලසුම් කිරීම.
- අවම කිරීමේ ක්‍රියාමාර්ග සංවර්ධනය කරමින්, සහ තීරණ ගැනීමට මඟ පෙන්වීම සඳහා ඒවායේ ඵලදායීත්වය තක්සේරු කරමින් විවිධ සාධකවල විභව ප්‍රතිඵල ඇගයීම සඳහා ක්‍රියාදාම විශ්ලේෂණය.
- පොලී අනුපාත සහ හානිකරණයේ වෙනස්වීම් අතර සම්බන්ධය සමීපව නියාමනය කිරීම සහ අවශ්‍ය පියවර ගැනීම.
- ශක්තිමත් අයකිරීමේ ක්‍රියාවලියක් පවත්වා ගැනීම.
- පොලී අනුපාත අවදානමට සහ ද්‍රවශීලතා අවදානමට ඔරොත්තු දීම සඳහා කළඹ ප්‍රතිනිර්මාණය කිරීම සහ ප්‍රතිමිලකරණය කිරීම මගින් වත්කම් වගකීම් නොගැලපීම අඩු කිරීම.

මෙහෙයුම් පරිසරය සහ අවදානම් සහ අවස්ථා

කෙටි කාලයේ සිට මධ්‍ය කාලය දක්වා අදාළ උපායමාර්ගික ප්‍රමුඛතා

සම්බන්ධිත වැදගත් කරුණු

අදාළ ප්‍රාග්ධනයන්

අදාළ අවදානම්

Risk 3 Risk 4 Risk 5 Risk 6

අදාළ SD අරමුණු

1 NO POVERTY
8 DECENT WORK AND ECONOMIC GROWTH
9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE
11 SUSTAINABLE CITIES AND COMMUNITIES
12 RESPONSIBLE CONSUMPTION AND PRODUCTION

ක්‍රියාත්මක පාලනය

අධ්‍යක්ෂ මණ්ඩලය පොලී අනුපාත අවදානම සහ ණය ගුණාත්මකභාවය කළමනාකරණය කිරීම සඳහා අවදානම් අභිරුචි සීමාවන් නැවත නිරීක්ෂණය කරන ලද අතර, ණය ඇගයීම සහ අනුමත කිරීමේ ක්‍රියා පටිපාටි ශක්තිමත් කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් සමස්ත ණය දීමේ මූලධර්ම පරීක්ෂා කිරීම.

වත්මන් අවදානම් තක්සේරුවල සොයාගැනීම් සමඟ ගැලපෙන පරිදි ව්‍යාපාර සැලසුම් අබණ්ඩව නැවත පෙලගැස්වීම ඇති කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවේ කෙටි හා මධ්‍ය කාලීන උපාය මාර්ග සංශෝධනය කරන ලදී.

අනාගත දැක්ම

ගෝලීය

ලොව වටා ආර්ථික සහ දේශපාලන තත්ත්වයන් මත පදනම් වී, පරීක්ෂා කිරීම සඳහා වන ප්‍රධාන භූදේශපාලන අවදානම් වන්නේ රුසියාව සහ NATO අතර නොඉවසුම් ගති, සයිබර් තර්ජන, ඇමෙරිකාව සහ චීනය අතර උපායමාර්ගික තරඟය, ගෝලීයකරන විරෝධය, කාලගුණ අවදානම, බලශක්තිවල ආරක්ෂාව, සහ කොවිඩ්-19 වසංගතයේ පිරිහීම බව බැංකුව විශ්වාස කරයි.

2024 දී ඊශ්‍රායලය (මැදපෙරදිග තෙල් හා වෙළෙඳ මාර්ග), යුක්‍රේනය (නැගෙනහිර යුරෝපයේ ස්ථාවරත්වය සහ බල තුලනය) සහ තායිවානය (නැගෙනහිර ආසියාවේ උසස් තාක්ෂණික සැපයුම් දාමයන්) ඇතුළුව වැදගත් ස්ථාන තුනක ගැටුම් උත්සන්න වීම දැකිය හැකි අතර, සෘජුවම ප්‍රධාන බලවතුන් ආකර්ෂණය කර ගනිමින් සහ ගැටුමේ පරිමාණය උත්සන්න කරමින් මේවා පුළුල් කලාපීය අස්ථාවරත්වයට හේතු විය හැක. උත්සන්න වූ ගැටුම් වඩාත් දරුණු මානුෂීය අර්බුදවලට ද හේතු වේ. අනෙකුත් ගැටළු සම්බන්ධයෙන්, කෘතිම බුද්ධිය (AI) සහ සාගර මට්ටම් ඉහළයාම භූ දේශපාලනික තරඟකාරිත්වය සහ නියාමන ගතිකතාවයන් අභිප්‍රේරණය කරමින් නව ගැටළු ලෙස මතු වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ගෝලීය ආර්ථික පරිසරය තුළ, 2023 සඳහා ගෝලීය වර්ධන ප්‍රක්ෂේපනය 3.1% ක් විය. එය 2024 දී එම අනුපාතයෙහිම පැවති අතර, එක්සත් ජනපදය සහ විශාල නැගී එන-වෙළෙඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් හි අපේක්ෂිත ඔරොත්තුදීම වඩා වැඩිවීම නිසා 2025 දී 3.2% දක්වා පමණක් මධ්‍යස්ථ ලෙස ඉහළ යනු ඇත. ලෝක වෙළඳ වර්ධනය 2024 දී 3.3% සහ 2025 දී 3.6% ලෙස පුරෝකථනය කර ඇති අතර, මෙය 4.9% ක් වන එහි ඓතිහාසික සාමාන්‍ය වර්ධන අනුපාතයට වඩා අඩුය. ඉහළ යන වෙලෙඳ විකෘතිවීම් සහ භූ ආර්ථික බණ්ඩනය ඉහළයාම තුළින් ගෝලීය වෙලෙඳාමේ මට්ටම මත තවදුරටත් බර තබනු ඇතැයි අපේක්ෂා කෙරේ.

දැඩි මූල්‍ය ප්‍රතිපත්ති, ශ්‍රම වෙළෙඳපොල තුළ අදාළ මෘදු කිරීම, බලශක්ති මිල ගණන් සම්බන්ධයෙන් මුල සිට පසු කර යාමේ බලපෑම් සහ පවත්නා පහත වැඩිවීමවල ප්‍රතිඵලයක් ලෙස, ගෝලීය ශීර්ෂ උද්ධමනය 2023 දී අපේක්ෂිත 6.8% (වාර්ෂික සාමාන්‍ය) සිට 2024 දී 5.8% දක්වා සහ 2025 දී 4.4% දක්වා පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකාව

ශ්‍රී ලංකාවේ ආර්ථික හා දේශපාලන තත්ත්වයන් මත පදනම්ව, ආර්ථික අර්බුදයෙන් පසුව, ශ්‍රී ලංකාව 2024 දී ජනාධිපතිවරණයකින් පසුව මහ මැතිවරණයකට යනු ඇති බව බැංකුව විශ්වාස කරයි. මැතිවරණ වටා ඇති අවිනිශ්චිතතාවය දිගු කාලීන බැඳීම් සිදු කිරීමෙන් ආයෝජකයින් වලක්වනු ඇති අතර ඔවුන් ඒ වෙනුවට තත්ත්වය පැහැදිලි වන තුරු කෙටි කාලීන බැඳීම් කෙරෙහි අවධානය යොමු කිරීමට කැමති විය හැක. තවද, බාහිර ණය ප්‍රතිව්‍යුහගත කිරීම සම්පූර්ණ කිරීම වඩාත් වැදගත් සන්ධිස්ථානයක් වන අතර එය ශ්‍රේණිගත කිරීම් සහ විදේශීය කටයුතු ඉහළ නැංවීමට පවා තුඩු දිය හැකිය

ලෝක බැංකුවට අනුව, ශ්‍රී ලංකාවේ ආර්ථිකය 2023 දී 3.8% කින් සංකෝචනය වීමෙන් පසු 2024 දී 1.7කින් වර්ධනය වනු ඇති අපේක්ෂා කරන අතර, එය ආර්ථිකයේ ධනාත්මක ප්‍රතිසාධනය පිළිබඳ සංඥාවකි. එළවළුවල මිලගණන් අධික ලෙස ඉහළ යාම සහ වැටී බදු 18% දක්වා ඉහළ දැමීමෙන් වියහැකි බලපෑම හමුවේ වුවත් ආහාර උද්ධමනය තවදුරටත් ඉහළ යනු ඇති බැවින් 2024 ආරම්භයේදී උද්ධමනය ඉහළ මට්ටමක පවතිනු ඇත. 2023 දී ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන සඳහා ඉල්ලුම තවදුරටත් අඩුවීම දුර්වල ගෝලීය ආර්ථිකයකින් අපේක්ෂා කරන අතර, වඩා ඉහළ බදු සහ වඩා පහළ සැබෑ ආදායම් දේශීය ඉල්ලුමට බාධා කරනු ඇත.

වෙළෙඳ ලිහිල් කිරීම් මධ්‍යයේ විය හැකි සුළු අවප්‍රමාණය සමඟ විනිමය අනුපාතිකය 2024 පුරා ස්ථාවර වීමට ඉඩ ඇත. මහ බැංකුව විසින් වෙළෙඳපොලේ ඇමෙරිකානු ඩොලර් මිලදී ගැනීම සඳහා ඉහළ ගලා ඒමේ අවස්ථාව භාවිතා කිරීමට ඉඩ ඇත. 2024 දී ආර්ථිකය යථා තත්ත්වයට පත් වන විට, වෙළෙඳ හිඟය පුළුල්වීමට නැඹුරු විය හැකිය. ගෙවුම් ශේෂය යථා තත්ත්වයට පත් වීම දැනටමත් දැකගත ඇති අතර, බහුපාර්ශ්වික ණය දෙන්නන් සහ විදේශීය ගලා ඒම්වල සහය ඇතිව ආසන්න කාලය තුළ ධනාත්මක වනු ඇතැයි අපේක්ෂා කෙරේ. සංචාරකයින්ගේ පැමිණීම් සහ සේවක ප්‍රේෂණවල වර්ධනයන් හමුවේ. විදේශ සංචිතවල ස්ථාවර වර්ධනයක් දැකීම අපේක්ෂා කෙරේ. සංචාරක ව්‍යාපාරයේ සහ ප්‍රේෂණවල ශක්තිමත් ප්‍රබෝධයක් මගින් මෙහෙයවනු ලබන, අපේක්ෂිත ප්‍රමාණයට වඩා වේගවත් වර්ධනය ප්‍රතිසාධනය පෝෂණය කර අමතර ස්වාරක්ෂක ගොඩනගනු ඇත.

මෙහෙයුම් පරිසරය සහ අවදානම් සහ අවස්ථා


බැංකු අංශයේ අනාගත දැක්ම

ශ්‍රී ලංකා ආර්ථිකය සහ එහි ජනතාව මෑත වසරවල මුහුණ දුන් අභියෝග මෙරට නිදහස ලබා ගැනීමේ සිට වඩාත් අවධානග්‍රාහී බවට පත්ව ඇත. ආර්ථිකය ක්‍රමානුකූලව ප්‍රතිසාධනය වන බැවින්, ශ්‍රී ලංකාවේ බැංකු අංශය අද දක්වා එහි ඉහළම අපේක්ෂාවන්ට මුහුණ දෙමින් සිටී. මූලික අරමුණ වන්නේ මූලික මට්ටමේ ප්‍රජාවන්ගේ ආදායම් උත්පාදන හැකියාව වැඩි කරමින් සැබෑ ආර්ථිකයට පහසු ණය ප්‍රවාහ සහතික කිරීමයි. මෙය සාක්ෂාත් කර ගැනීම සඳහා, තම ශක්තිය සහ ප්‍රමාණවත් ප්‍රාග්ධනීයකරණය සහතික කිරීම අරමුණු කරමින් ප්‍රධාන බැංකු නවයක ප්‍රතිව්‍යුහගතකරණය සහ ප්‍රතිප්‍රාග්ධනීයකරණය සඳහා මාර්ග සිතියමක් මහ බැංකු විසින් සකස් කර ඇත.

බැංකු පනතට යෝජිත සංශෝධන මගින් බලපතලාභී බැංකු පාලනය කරන නීතිමය සහ නියාමන රාමුව තවදුරටත් ශක්තිමත් කිරීම අරමුණු කරයි. ප්‍රධාන යෝජිත සංශෝධන අවම බලපත්‍ර නිර්ණායක ශක්තිමත් කිරීම, ආයතනික පාලනය වැඩි දියුණු කිරීම, කොටස් හිමියන්ගේ යෝග්‍යතාවය, විදේශීය බැංකුවල විභව සහනාධාර සහතික කිරීම, බැංකු හිමිකාරිත්වය නියාමනය කිරීම, මූල්‍ය නොවන පරිපාලිත සමාගම් අත්පත් කර ගැනීම්, සංයුක්ත කිරීම් සහ ඒකාබද්ධ කිරීම්, මූල්‍ය නොවන පරිපාලිත සමාගම් ඉවත් කිරීම, ඒකාබද්ධ අධීක්ෂණය ක්‍රියාත්මක කිරීම, ගිණුම්කරණ සහ විගණන ප්‍රමිතීන් ශක්තිමත් කිරීම, සමානුපාතිකත්වය පවත්වා ගැනීම, විශාල නිරාවරණ කළමනාකරණය සහ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු නියාමනය කිරීම ඇතුළත් වේ. බැංකු (සංශෝධන) පනත් කෙටුම්පත 2024 මුල් භාගයේදී පාර්ලිමේන්තුවේදී සම්මත වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

තිරසාර මූල්‍ය උත්සාහයන් සඳහා බලපතලාභී බැංකුවල දායකත්වය තිරසාර හා දේශගුණික හිතකාමී මූල්‍ය කටයුතු දිරිමත් කිරීම සඳහා හඳුන්වා දී ඇති දිරිගැන්වීම් සමඟින්, සැලසුම් කරනු ලබයි. මධ්‍ය කාලීනව, කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ බැංකු පරිමාණය, කාර්යක්ෂමතාව සහ මූල්‍ය ස්ථාවරත්වය උත්තේජනය කිරීමට සුදුසු මූල්‍ය ආයතන අත්පත් කර ගැනීම හෝ ඒ සමඟ සංයුක්ත කිරීම මගින් ඒකාබද්ධ වීමේ අවස්ථා ගවේෂණය කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. ශ්‍රී ලංකා මහ බැංකුව වෙළෙඳපොල ගතිකතාවන් මත පදනම් වී එවැනි ඒකාබද්ධවීමේ ක්‍රියාවලිවලට පහසුකම් සැපයීමට අරමුණු කරයි.

ප්‍රධාන ප්‍රවනතා



ඩිජිටල් බිඳවැටීම් සහ වැඩි වන තරඟය

ප්‍රධාන සාධක

- අන්තර් ජාල භාවිතයෙහි වර්ධනය
- අන්තර්ජාලවල වැඩි වූ යොදා ගැනීම
- අන්තර්ජාලවල වැඩි වූ භාවිතය
- වැඩි වූ සයිබර් තර්ජන
- දත්ත රහස්‍යතා ගැටළු
- ඉ-වාණිජ්‍ය වැඩිපුර යොදා ගැනීම
- වැඩි කරීමේ මාර්ගවල බාධාකාරී ඩිජිටල්කරණය
- ව්‍යාපාර ක්‍රියාවලි ඩිජිටල්කරණය
- වේගවත් ඩිජිටල්කරණ යොදා ගැනීමේ අවශ්‍යතාව, එසේවුවත් මානව සම්පත් නායකයින්ගෙන් 66%ක් වැඩ කිරීමේ දෙමුහුන් මාර්ගය දැනටමත් ක්‍රියාවට නංවා ඇති බව සඳහන් කරයි.
- ජංගම තාක්ෂණය, පින්ටෙක් හවුල්කාරත්වයන්, අතත්‍ය පරිගණගතකරණය, විශාල දත්ත, උසස් විශ්ලේෂණ, යාන්ත්‍රික ඉගෙනීම, බ්ලොක්චේන් තාක්ෂණය, කෘතිම බුද්ධිය, රොබෝවරු, සහ ජෙවමිතිකවල අධික භාවිතය

වටිනාකම සඳහා ගමන්මාර්ග

තාක්ෂණයේ අතීශය ප්‍රගතිය සහ තිව්‍ර තරඟකාරිත්වය මෙහෙයුම් අවදානම් මට්ටම් වැඩි කරන අතරම අපගේ ගනුදෙනුකරුවන්ට අදාළව සිටීමට ඇති හැකියාවට සහ කර්මාන්තයේ අපගේ තරඟකාරිත්වයට බලපායි.

ඩිජිටල් පරිවර්තන යනු ගනුදෙනුකරුවන් ඇතුළත් කිරීම සහ නිෂ්පාදන අලෙවියේ සිට සේවා සැපයීම දක්වා අප ව්‍යාපාර කරන ආකාරය මූලික වශයෙන් වෙනස් කරයි.

වේගයෙන් වෙනස්වන තරඟකාරී වාතාවරණයක්, වෙනස්වන පාරිභෝගික ඉල්ලුම, මූල්‍යමය ගොඩ ගැනීම, සහ බිඳවැටෙන තාක්ෂණයන් ගනුදෙනුකරුවන්ට වඩා යහපත් නිෂ්පාදන ලබාදීම, අවදානම් කළමනාකරණය වර්ධනය කිරීම සහ ලාභදායිතාව ප්‍රශස්තකරණය සඳහා ඩිජිටල් කාන්ෂණය අවංකවම වැළඳ ගන්නා රටාවකට අපගේ ව්‍යාපාර ආදර්ශයේ පරිනාමය වේගවත් කර ඇත.

දත්ත කාන්දුවීම සහ වෙනත් ආරක්ෂක කඩකිරීම්වලින් ආරක්ෂාව කාර්යාත්මක ගෙවීම් පවත්වා ගැනීම සහ පද්ධති නිරවුල් කිරීමේදී බැංකු විසින් ඉටු කරන අත්‍යවශ්‍ය කාර්යභාරය හේතුවෙන් තීරණාත්මක වන අතර මෙසේ අවධානග්‍රාහී අමතර මූලාශ්‍රයන් මෙම ප්‍රමුඛ ක්ෂේත්‍රයට මාර්ගයකි.

මෙහෙයුම් පරිසරය සහ අවදානම් සහ අවස්ථා

අවදානම් සහ අවස්ථා

අපගේ අවදානම්

- සයිබර් අවදානම ඉහළම අවදානමක් ලෙස හඳුනාගෙන ඇති අතර, නිෂ්පාදන හා සේවා ඩිජිටල්කරණයෙන් පසුව එය වඩාත් වැදගත් බවට පත්ව ඇත.
- සයිබර් අවදානමක් සේවා බිඳවැටීමකට සහ සුද්ගල සහ රහසිගත දත්ත කඩකිරීමකට හේතු විය හැකිය.
- බැංකුවේ, සයිබර්ප්‍රහාර ව්‍යාපාර කීර්තිනාමය, කීර්තිනාම හානි, මූල්‍ය අලාභ, සහ වැඩිකළ නියාමන පරීක්ෂාවට සහ දොස් පැවරීමේ අවදානම් ඇති කරයි.
- ගනුදෙනුකරුවන් සඳහා, සයිබර් ප්‍රහාර ඔවුන්ගේ ආරක්ෂාව සහ සුරක්ෂිතභාවයට අවදානම් ඇති කරයි.
- ගනුදෙනුකාර කේන්ද්‍රීය ආදර්ශයට විතැන් කිරීමක ප්‍රමාදය ආපසු ඩිජිටල් සහ මූල්‍ය අන්තර්කරණය සහ වටිනාකම අගුලු හැරීමේ පියවර පහත හෙලයි.

අපගේ අවස්ථා

- බැංකුව සඳහා අවස්ථාවන්ට බාධාකාරී තාක්ෂණයන් සහ ඩිජිටල් යොදා ගැනීම තුළින් අපගේ ගනුදෙනුකාර අත්දැකීම (සමාජ ප්‍රාග්ධනය) අබණ්ඩව වැඩි කිරීම ඇතුළත් වන අතර, ඒ තුළින් ගනුදෙනුකාර පරිමාවන් සහ ආදායම ඉපයීමේ අපගේ අරමුණ සපුරාලන අතර, තාක්ෂණය (සේවය සඳහා වඩා අඩු පිරිවැය) තුළින් කාර්යක්ෂමතාව වැඩි කරයි.
- ආරක්ෂාව පාලක පරිසරය ශක්තිමත් කිරීමේ උත්සාහයන් සහ දැනුවත්කම ගොඩනගමින් නව තාක්ෂණයන් යොදා ගැනීම තුළින් සැලසුම් සඳහා අබණ්ඩව දායකවීම.
- නැවුම්කළ සහ වර්ධනය කළ ආරක්ෂක සැලසුම් තුළින් බැංකුවේ සමස්ථ ආරක්ෂක තත්ත්වය වැඩි කිරීම
- ව්‍යාපාරයේ තිරසාරභාවය සහතික කිරීමට සයිබර් ඔරෙත්තුදීමේ වැඩසටහන් අබණ්ඩව වැඩි කිරීම
- වේගවත් ඩිජිටල් සහ මූල්‍ය අන්තර්කරණය ඇති කිරීම.

අපගේ උපායමාර්ගික ප්‍රතිචාරය

- අපගේ ව්‍යාපාරය තුළ ආරක්ෂක, කඩිසර, සහ සුපිරි පන්තිමේ මෙහෙයුම් පරිසරයක් ලබාදීමට අපගේ ඩිජිටල් සම්පත් සහ අවකාශ තුළ අපි සැලකියයුතු ආයෝජන සිදු කරමින් සිටිමු.
- මෙම සැමදා වෙනස්වන වාතාවරණය තුළ අපි අපගේ ඩිජිටල් උපායමාර්ග, අබණ්ඩව දියුණු කර, සංවර්ධනයන් නිරීක්ෂණය කර අපගේ ප්‍රතිචාර තුළනම්‍යශීලීව රැඳී සිටිමු.
- වැඩිකළ නියාමනය, වාර්තාකරණය සහ තර්ජනවලට ප්‍රතිචාරය තුළින් සයිබර් ආරක්ෂක පාලනය සහ මෙහෙයුම් ව්‍යූහය අපි වර්ධනය කරමු. තවද, අවශ්‍ය තැන්වලදී සයිබර් ආරක්ෂක පරිසරයට උසස්කිරීම්වල අපි ආයෝජනය කරමු.
- අපි සයිබර් ආරක්ෂක දැනුවත් කිරීමේ වැඩසටහන් පිරිනමන අතර පුහුණුව ශක්තිමත් කරමු.
- අපි ගනුදෙනුකරුවන්ගේ සහ ඔවුන්ගේ දත්තවල ආරක්ෂාව අබණ්ඩව වැඩි කිරීමේ පාලනයන් වැඩි කරමු. (වැඩිදුර තොරතුරු සඳහා සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය පිළිබඳ 136 සිට 1450 පිටු බලන්න.)

ක්‍රියාත්මක පාලනය

කොවිඩ්-19 ව්‍යාපාරය සඳහා ප්‍රවේශයට බැංකුවේ වේගවත්කළ වෙනස්වීම් සඳහා උත්ප්‍රේරකයක් වී ඇති අතර එහි අදාළත්වය පවත්වා ගැනීමට උපායමාර්ගික අවධානය සහ

ක්‍රියාත්මක කිරීමේ හැකියාවන් තියුණු කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ ව්‍යාපාතිවලින් බහුතරය මධ්‍ය බැංකුකරණ ක්‍රියාත්මක කිරීම සහ ඩිජිටල් පරිනාමයන්ට (තොරතුරු ආරක්ෂාව තුළ වර්ධනයක් ඇතුළුව) අදාළ වේ.

ඉතින් එකතුකළ කෙටි කාලයේ සිට මධ්‍ය කාලය දක්වා උපායමාර්ගය (ඩිජිටල්කරණය වේගවත් කිරීම) පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාකච්ඡා තුළින් ව්‍යාපාරය සමඟ ගැඹුරු ඒකාබද්ධවීම අවශ්‍යය. ක්ෂේත්‍රය තුළ අවශ්‍ය වෙනස් පිළිබඳ පියවර සපුරාලීමට නව්‍යකරණ හැකියාවන්හි ශක්තිය වර්ධනය කිරීමේ මාර්ගවලට 2021 සිට අවධානය යොමු කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය අවස්ථාවාදී තර්ජන කාරක, වැඩිකළ ඩිජිටල්කරණය, සහ දුරස්ථ වැඩකරන වැඩපිළිවෙලට මාරුවීම තුළින් පොදුවේ මතුවන වැඩි වූ සයිබර් ආරක්ෂක තර්ජන මැඩලීමේ බැංකුව හරහා ක්‍රියාමාර්ග පාලනය කරයි.

කෙටි කාලයේ සිට මධ්‍ය කාලය දක්වා අදාළ උපායමාර්ගික ප්‍රමුඛතා



අදාළ වැදගත් කරුණු



අදාළ ප්‍රාග්ධණයන්



අදාළ අවදානම්

Risk 3 Risk 4 Risk 5 Risk 6

අදාළ SD අරමුණු



මෙහෙයුම් පරිසරය සහ අවදානම් සහ අවස්ථා

අනාගත දැක්ම

ආර්ථික පහත වැටීම හමුවේ, පාර්ශ්වකරුවන්ගේ ක්‍රමයෙන් වෙනස්වන අවශ්‍යතාවල පසුබිම මත ඩිජිටල් සහ විදුලි සන්නිවේදන සේවා සඳහා වැඩිවන ඉල්ලුම මඟින් පෝෂණය කරමින් තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය අඛණ්ඩව වර්ධනය වනු ඇති බව අපි අපේක්ෂා කරමු. ශාඛාවලට භෞතිකව පැමිණීමට අකැමැති පුද්ගලයින් වැඩිවීම තුළින් ඇති කළ වර්ධනය සඳහා ඩිජිටල් මාර්ග යොදා ගැනීම, ස්මාර්ට් ජංගම උපාංගවල විනිවිදයාම වඩාතියුණු කිරීමට සහ වඩා ලාභ දත්ත තර පිවිසීම අපි අපේක්ෂා කරමු.

සයිබර් ආරක්ෂාව තාක්ෂනික උසස්වීම් සහ භූදේශපාලන සංවර්ධනයනට සමගාමීව නිරන්තරයෙන් වෙනස් වේ. අපගේ ඩිජිටල් පරිනාමන උපායමාර්ගය තුළින් මතුවන තර්ජන සහ සාධක සලකා බලයි. මුලින් සැලසුම්කළ වියදම සහ ව්‍යාපාර ප්‍රතිලාභ සමඟ පෙළ ගැසෙමින් කාර්යක්ෂම පද්ධති, අදාළ නිපුනතා, සහ ඩිජිටල් ප්‍රවීනත්වය පිළිබඳ නැවුම් මුසුවක් සමඟ පරිනාමන වැඩසටහන් පිරිනැමීම අපට අවශ්‍යය.

ප්‍රධාන ප්‍රවනතා



ජනවිකාශවල වෙනස්වීම් සහ වෙනස්වන වැඩ ලෝකය

ප්‍රධාන සාධක

ජනවිකාශනවල වෙනස

- වයස්ගත ජනතාව වැඩිවීමථ ජනගහනය වඩා වයසට පත්වෙමින් සිටින අතර අනෙකුත් බොහෝ සංවර්ධනය වන ආර්ථිකයන්ට වඩා වේගයෙන් වයසට අනු ඇත.
- 2000 සහ 2020 අතර, ශ්‍රී ලංකාවේ මධ්‍යම වයස අවුරුදු 26.9 සිට 39.2 දක්වා ඉහළ යනු ඇති බවට පුරෝකථනය කෙරේ.
- මුළු ජනගහනයෙන් වැඩකරන වයසේ ජනගහනයේ කොටස (අවුරුදු 15 සිට 64 දක්වා අය) පහත වැඩිම ආරම්භ වී ඇති අතර වැඩකරන වයසේ ජනගහනයේ පරම සංඛ්‍යාව 2023 වන විට පහත වැටීම ආරම්භ වනු ඇත.

බුද්ධි ගලනය

- විදේශ රැකියා සඳහා පිටවීම් සැලකියයුතු මට්ටමක ඇත
- දක්ෂ සේවකයින්ගේ සැලසුම් නොකළ සහ අධික පිටතට ගලායාම ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ ප්‍රතිසාධන උත්සාහයන්ට සෘණාත්මක බලපෑමක් ඇති කරනු ඇත.

ශ්‍රම වෙළෙඳපොල තුළ විනැන්වීම්

- දෙමුහුන් වැඩ කිරීමේ ආකෘතිය සාමාන්‍ය වී ඇත.
- බාහිරින් ගන්නා වැඩවල ඉහළයාම සහ පවත්නා ආර්ථික ආදර්ශ සඳහා වැඩිවන විකල්ප.
- තාක්ෂණික කුසලතා සඳහා ඉල්ලුම සහ තාක්ෂණික සමාගම්වලින් තීව්‍ර තරඟය තීරණාත්මක සහ දුර්ලභ දක්ෂයින් බඳවාගැනීම සහ රඳවා ගැනීම සම්බන්ධයෙන් බැංකුවලට පීඩනය ඇති කර ඇත.
- වැඩ අපේක්ෂාවන් හි පරම්පරාගත වෙනස්වීම්.
- ඉහළ ඉල්ලුමේ නිපුනතාවල හිඟය.
- වැඩ-ජීවිත තුලනය සහ නම්‍යශීලීභාවය සඳහා වැඩි වූ කැමැත්ත.
- මානසික සෞඛ්‍ය පිළිබඳ වැඩිකළ අවධානය හා ඵලදායිතාව කෙරෙහි බලපෑම.

වටිනාකමේ ගමන්මාර්ග

සමාජයේ ජනවිකාශ ඉතුරුම්, ආයෝජන, සහ ණය කෙරෙහි බලපෑමක් ඇති අතර, සේවා ලබාදීම පිළිබඳ දිගුකාලීන ගමන්මාර්ග නිර්මාණය කරයි. ජනවිකාශ ව්‍යූහය තුළ වෙනස්වීම් හැසිරීම නිෂ්පාදන හා සේවා, බෙදාහැරීමේ මාර්ග, සහ ගනුදෙනුකරුවන්ට පිරිනමන වටිනාකම කොටසේ ස්වභාවයට බලපෑම් කරයි.

අපි දේශීය වශයෙන් දක්ෂයින් බඳවා ගන්නා අතර, එබැවින් ජන විකාශ අපගේ වටිනාකම් නිර්මාණයට සහ ව්‍යාපාර වර්ධනයට බලපෑම් ඇති කරයි. සමාජය තුළ ප්‍රවනතා අපගේ බැංකුවේ අදාළත්වය තීරණය කරන අතර දක්ෂයින් ආකර්ෂණය කර රඳවා ගැනීමට යම් අසමත්වීමක් අපගේ අනුප්‍රාප්ත සැලැස්ම සහ පුළුල් කිරීමේ සැලසුම්වලට බාධා සිදු කරයි.

අපගේ ඩිජිටල් පරිනාමනයේ සංදර්භය තුළ හිඟ සහ තීරණාත්මක නිපුනතා සඳහා ඉල්ලුම අපගේ අපේක්ෂිත ව්‍යාපාර ආර්ශය සාක්ෂාත් කර ගැනීමට බලපෑම් කරනු ඇත. දැනට සිටින ශ්‍රම බලකාය නැවත නිපුනතා ඇති කර ගැනීමට සහයවීම රඳවා ගැනීම ඇති කිරීම පමණක් නොව මූලික ව්‍යාපාර අවශ්‍යතා ද සපුරාලයි. වර්තමානයේ බැංකු වඩාත් කඩිසර සහ අනුවර්තනය වන මෙහෙයුම් ආදර්ශ ගොඩ නැගීමට වැඩිවන පීඩනය යටතේ සිටිති.

වැඩකරන වයසේ ජනගහනයට වැටෙන කොටස සහ වයස්ගත ජනගහනය වර්ධනය මත බාධාවක් විය හැකිය. විශ්‍රාම ගන්නා සේවකයින්ගේ ගණන වැඩි වන අතර, ශ්‍රම බලකායට ඇතුළත්වන ජනතාවගේ ගණන පහත යනු ඇති අතර මෙය වඩා පහළ ඵලදායිතාව, වඩා අඩු බදු, වඩා අඩු ජාතික ආදායම, වඩා අඩු වර්ධනය, සහ වඩා අඩු ඉතුරුම්වලට හේතු වේ.

මෙහෙයුම් පරිසරය සහ අවදානම් සහ අවස්ථා

අවදානම් සහ අවස්ථා

අපගේ අවදානම්

- ඉහළ නිපුණතා සහිත සේවකයින් බඳවා ගැනීම සඳහා මිල අධික වෙමින් පවතින අතර කුසලතා සහ අධ්‍යාපනික පුද්ගලයින්ගේ සංක්‍රමණය වේගවත්වීම මධ්‍යයේ රඳවා ගැනීමට අපහසු වී ඇත.
- ඩිජිටල් පරිනාමනය අනාගතයට අවශ්‍ය කුසලතා සහ දක්ෂතා පරිවර්තනය කරන බැවින් හිඟ සහ තීරණාත්මක කුසලතා සඳහා ඇති ඉල්ලුම අබණ්ඩව ඉහළ යයි.
- "පශ්චාත්-වසංගත" සේවා ස්ථානයක් වටා ඇති උපකල්පන බොහෝ දුරට පරීක්ෂාවට ලක් නොවන අතර, අපගේ ආයෝජන තීරණවලට මඟ පෙන්වීම සඳහා පරිචයන් වෙනස් වෙමින් පවතින අතර වැඩ කරන ස්ථානය සහ කාලය නොසලකා සේවක අත්දැකීම් වැඩිදියුණු කිරීම.
- වර්තමාන ලෝකය මුහුණ දෙන තීරණාත්මක සමාජ ගැටළු විසඳීම සඳහා දායක වීමට බැංකුව වැඩිවන පීඩනයකට ලක්ව ඇත.
- වඩාත් හිතකර පරිසරයක් නිර්මාණය කිරීමේ අභියෝග සහ නව වැඩ ආකෘති අනුගමනය කිරීම කඩිසර බව සහ නම්‍යශීලීභාවය වැඩි කරයි.
- වෙනස්වන ගනුදෙනුකාර මනාපයන්ට අනුවර්තනය වීම සහ අවදානම් තක්සේරු ආකෘති සංශෝධනය කිරීම.

අපගේ අවස්ථා

- සේවක අවශ්‍යතා වඩාත් පරිපූර්ණ ලෙස සපුරාලීම සඳහා අපගේ යහපැවැත්මේ වටිනාකම් කොටස පුළුල් කිරීම.
- සේවකයින් සඳහා වැඩිදියුණු කළ සහාය අත්දැකීමක් ලබා දීමේ හැකියාව.
- නව නායකත්ව හැකියාවන් සමඟ වඩාත් අතථ්‍ය, විවිධාංගීකරණය වූ ශ්‍රම බලකායක් මෙහෙයවීමට නායකයින් බල ගැන්වීම සඳහා ප්‍රබෝධමත් නායකත්ව සංවර්ධන ප්‍රවේශයක්.
- කුසලතා රඳවා තබා ගැනීම සහ සංවර්ධනය කිරීම සඳහා ආයෝජනය කිරීම බැංකුවේ සන්නාමය ගොඩනැගීමට සහ ජාතිය සංවර්ධනය කිරීමට හැකියාව ඇති කරයි.
- අපගේ වෙළෙඳපොල පුරා සිටින පුද්ගලයින්, විශේෂයෙන් තරුණයින් සහ කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා තාක්ෂණයේ බලය උපයෝගී කර ගනිමින් සමාජ ආර්ථික සංවර්ධනය ක්‍රියාත්මක කර සැමට සමාජ ඇතුළත් කිරීම් මෙහෙයවීම.
- ව්‍යාපාරයේ අනාගතය සඳහා අපගේ කුසලතා පදනම නැවත ස්ථානගත කිරීම පුද්ගලයන්ට සහ ව්‍යාපාරවලට සහයෝගය දැක්වීමට අපට හැකි බව සහතික කිරීමට උපකාරී විය හැකිය.

අපගේ උපායමාර්ගික ප්‍රතිචාර

- අපගේ සේවකයින්ගේ නිපුණත්වය නැවත ඇති කිරීම සහ ඉහළ නැංවීමට සහ අනාගතයට ගැලපෙන ශ්‍රම බලකායක් පෝෂණය කිරීමට නිපුණතා සංවර්ධන සහ නායකත්ව වැඩසටහන් තුළ අබණ්ඩ ආයෝජනය කිරීම.
- අනාගතයේ ශ්‍රම බලකාය සඳහා සූදානම්ව සිටින අපගේ සේවකයින් නැවත පුහුණු කිරීමට සහ සහාය වීමට නියමු අවස්ථා.
- අවශ්‍ය අවස්ථාවේදී හිඟ සහ තීරණාත්මක කුසලතා ස්ථාවර සැපයුමක් සහතික කරන අතර අභ්‍යන්තරව දක්ෂතා වර්ධනය කිරීමට සහ බලමුලු ගැන්වීමට මාර්ගගත ඉගෙනුම් සහ පුහුණු විසඳුම් දියත් කිරීම,
- ඩිජිටල් අධ්‍යාපනයට පහසුකම් සැලසීමෙන් සහ ඩිජිටල් කුසලතා වර්ධනය කිරීමට උදවු කිරීමෙන් වඩාත් සහභාගී ගනුදෙනුකාර අත්දැකීමක් ලබා දීමට උත්සාහ කිරීම.
- විවිධත්වයේ සහ ඇතුළත් කිරීමේ වැදගත්කම අවධාරණය කරමින් යහපැවැත්ම සහ වඩාත් හිතකර සේවා පරිසරයක් නිර්මාණය කිරීම.
- ගනුදෙනුකරුවන් සඳහා ප්‍රවේශ්‍යතාව වැඩි කිරීම සඳහා බැංකුවේ විවිධ ජාල හරහා පුළුල් ආවරණය.
- අපගේ පුළුල් බෙදාහැරීමේ මාර්ග සහ අබණ්ඩ වටිනාකම එකතු කිරීම් සහිත නිෂ්පාදන තුළින් විවිධ ගනුදෙනුකාර අංශ වෙත සැපයීම සහ ඔවුන්ගේ ජීවිතයේ සෑම අදියරකදීම ඔවුන්ගේ අවශ්‍යතා සපුරාලීම.

(වැඩිදුර තොරතුරු සඳහා සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය පිළිබඳ 136 සිට 145 පිටු බලන්න.)

ක්‍රියාත්මක පාලනය

අධ්‍යක්ෂ මණ්ඩලය ජනවිකාශ වෙනස්වීම්වලට එකඟවෙමින්, වෙනස්වන සේවක සහ ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීමට එම වෙනස්වන අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීමට විසඳුම් සපයමින් නිසි සැලකිල්ල ලබා දේ. මානව ප්‍රාග්ධනයේ වෙනස්වීම් ආමන්ත්‍රණය කිරීමට විශ්‍රාමගැනීම්, ඉල්ලා අස්වීම් යනාදියට සහයවීමට අනුප්‍රාප්තික සැලැස්ම උසස්වීම් ක්‍රියාත්මක කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කරන ලදි.

කෙටි කාලයේ සිට මධ්‍ය කාලය දක්වා අදාළ උපායමාර්ගික ප්‍රමුඛතා

අදාළ වැදගත් කරුණු

අදාළ ප්‍රාග්ධනයන්

අදාළ අවදානම්

Risk 2 Risk 7

අදාළ SD අරමුණු

2 ZERO HUNGER 4 QUALITY EDUCATION 5 GENDER EQUALITY 8 DECENT WORK AND ECONOMIC GROWTH 11 SUSTAINABLE CITIES AND COMMUNITIES


මෙහෙයුම් පරිසරය සහ අවදානම් සහ අවස්ථා

අනාගත දැක්ම

බැංකුකරණයේ අනාගතය අදට වඩා බෙහෙවින් වෙනස් වනු ඇත. වෙනස්වන ගනුදෙනුකාර අපේක්ෂාවන්ට මුහුණ දෙමින්, තර්ජන දෘශ්‍යතාව වැඩිදියුණු කිරීමට සහ වංචා ඵලදායී ලෙස හඳුනා ගැනීමට බැංකු විශ්ලේෂණ සහ කෘතිම බුද්ධිය වැනි උසස් තාක්ෂණයන් වැලඳ ගත යුතුය. වෙනස්වන ව්‍යාපාරික පරිසරයක් තුළ සාර්ථක වීමට ඩිජිටල් පරිනාමය බැංකුවලට ඉතා වැදගත් අත්‍යවශ්‍ය දෙයකි. තාක්ෂණය ව්‍යාපාර වර්ධනයේ ධාවකයා ලෙස දිගටම පවතිනු ඇති අතර ශක්තිමත් ගනුදෙනුකාර අත්දැකීම් තුළින් පුළුල් පරාසයක සේවා සැපයීම සඳහා එය කේන්ද්‍රීය වේ. බොහෝ බැංකු තවමත් තාක්ෂණය සක්‍රීය පරිනාමනයන් වෙත ස්ථාවර, තිරසාර සහ නිර්හීත පියවර ගැනීමට ඇත. ගනුදෙනුකරුවන්ට බාධා නොමැතිව සේවය කිරීම සඳහා බැංකු කඩිසරකම වැලඳගෙන ඩිජිටල් සහ මානව ශ්‍රම බලකාය සාර්ථකව ඒකාබද්ධ කළ යුතුය. ගනුදෙනුකරු වඩා හොඳින් අවබෝධ කර ගැනීමට සහ ඔහුට සේවය කිරීමට බැංකුවලට තම නිෂ්පාදන සහ සේවා ප්‍රශස්ත කිරීමට ඒවා පිටුපස ඇති අවකාශ සහ දත්ත භාවිත කිරීමට අවශ්‍ය වනු ඇත.

ශ්‍රී ලංකාව වැඩිවන වයස්ගත ජනගහනයක් සමඟ ජන විකාශන සංක්‍රාන්තියේ දියුණු අවධියකට පැමිණ ඇත. මෙය දිගුකාලීන බලපෑම් ඇති කිරීමට අපේක්ෂා කෙරේ. සේවා සැපයීම, විශ්‍රාම වැටුප්, රැකියා සහ රාජ්‍ය මූල්‍ය සඳහා දිගුකාලීන ගම්‍යාර්ථ ඇතැයි අපේක්ෂා කෙරේ. ශ්‍රම වෙලඳපොලට කාන්තා ප්‍රවේශය පෝෂණය කරන ප්‍රතිපත්ති තිබීම ද වැදගත් වේ. අධ්‍යයනයන්ට අනුව, කාන්තා ශ්‍රම බලකායේ සහභාගීත්වය වැඩිදියුණු කිරීම මගින් 2025 වන විට වාර්ෂික දළ දේශීය නිෂ්පාදිතයට ඇ. ඩොලර් බිලියන 20ක් එකතු කරනු ඇති අතර, එය ශ්‍රී ලංකාවේ වේගයෙන් වයස්ගත වන ජනගහනයට එරෙහිව සටන් කිරීමට උපකාරී වනු ඇත.

ප්‍රධාන ප්‍රවනතා



වැඩිකළ නියාමන පරීක්ෂාව

ප්‍රධාන සාධක

- වැඩි වූ තරඟකාරිත්වය, තාක්ෂණික වෙනස්වීම් සහ බාධාකාරී ව්‍යාපාර ආකෘතීන් නියාමන ආයතන යාවත්කාලීන නියාමනයක් හඳුන්වා දීමට හේතු වී ඇත.
- නිෂ්පාදන, මූල්‍ය ස්ථාවරත්වය, පාරිභෝගික ආරක්ෂාව, ඩිජිටල් පරිනාමනය, සයිබර් ආරක්ෂාව, කාලගුණ විපර්යාසය, ගෙවීම්, විවිධත්වය සහ ඇතුළත් කිරීම, සහ මූල්‍ය අංශයට අදාළ රෙගුලාසිය මහජන ප්‍රවේශයේ සාපේක්ෂ වැදගත්කම නියාමක විසින් පරීක්ෂාකාරීව බරතබන තාක්ෂණ ඉල්ලුම වර්ධනය තුළින් මූල්‍ය ප්‍රජාතන්ත්‍රවාදය.

වටිනාකමේ ගම්‍යාර්ථ

නියාමනය හෝ නියාමනය ඉවත් කිරීම මූල්‍ය ආයතනයකට තමාට සහ එහි ගනුදෙනුකරුවන් සඳහා වටිනාකම උත්පාදනය කිරීමට හෝ ආරක්ෂා කිරීමට ඇති හැකියාවට සෘජුවම බලපායි.

බාසල් ප්‍රතිසංස්කරණ, ගිණුම්කරණ ප්‍රමිතීන් ප්‍රතිසංස්කරණය කිරීම, මූල්‍ය හා පිස්කල් ප්‍රතිපත්තිවල වෙනස්වීම්, මූල්‍ය අපරාධ පිළිබඳ රෙගුලාසි, නැගී එන පොද්ගලිකත්වය, සයිබර් ආරක්ෂාව සහ හැසිරීම පිළිබඳ නීති සම්පාදනය ඇතුළුව වෙනස්වන නියාමන සහ වාර්තාකරණ වාතාවරණය අපගේ ව්‍යාපාර ආකෘතියට බලපාන අතර අනුකූලතා අවදානමක් ඇති කරයි.

නියාමන/නෛතික බැඳීම්වල වෙනස අනුකූලතා අවශ්‍යතාව වැඩි කරන අතර අපගේ සමස්ථ වර්ධනය, ආදායම, සහ ලාභදායිතාව කෙරෙහි බලපෑ හැකිය.

අපගේ වෙලෙඳපොලවල නීති සම්පාදනය හා හැසිරීම් වලට අනුකූල නොවීම සඳහා දඬුවම් සහ නියාමන සම්බාධක සඳහා ඇති හැකියාව තුළින් සංඛ්‍යාව හා උග්‍රතාව වැඩි වෙමින් පවතී.

තවද, ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාවල වෙනස්වීම්, පොලී අනුපාත උච්චාවචනයන් සහ පාලනය, මූල්‍ය ප්‍රතිපත්ති සහ ණය අනුපාත සීමාවල වෙනස්වීම් ඇතුළු ප්‍රධාන නියාමන ගැටළු ද බැංකුවේ උපාය මාර්ග සහ අගය නිර්මාණය කිරීමේ කටයුතු කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කරයි.

මෙහෙයුම් පරිසරය සහ අවදානම් සහ අවස්ථා

අවදානම් සහ අවස්ථා

අපගේ අවදානම්

- නියාමන වෙනස්වීම් සහ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවල වැඩිවන පියවර සහ සංවර්ධනය වන සංකීර්ණතාව බැංකුව මත විශාල බරක් තැබිය හැක.
- වඩා ඉහළ ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීමට නොහැකිවීමේ අවදානම සහ ද්‍රවශීලතා කළමනාකරණයේ දුෂ්කරතා
- අනුකූලතාව සහ මෙහෙයුම් පිරිවැය (මානව සම්පත්, තොරතුරු තාක්ෂණ යනාදී) වැඩිවීම.
- මූල්‍ය ආයතන මත ක්‍රියාත්මක කිරීමේ පිරිවැය විශාලය (අවශ්‍ය වුවත්) ඔවුන් අනුකූලවීමට සහ කිර්තිනාම අලාවලින් නිදහස්වීමට කැමතිනම්.
- ඩිජිටල් තාක්ෂණය සහ වඩාත් කාර්යක්ෂම අරමුදල් මාරු කිරීමේ මාර්ගවල වේගවත් දියුණුව සමඟ ඇති වූ මූල්‍ය අපරාධය දැඩිකළ වංචාව සහ කුටෝපක්‍රම අවදානම් ඇති කරයි.
- නව අඩුවෙන් නියාමනය වන තරඟකරුවන් සමඟ විපරීත තරඟය.
- තෙවැනි සහ සිව්වැනි පාර්ශව සැපයුම්කරුවන්ගෙන් ඇතිවිය හැකි දත්ත කාන්දුවීම් සඳහා වැඩිවන නිරාවරණ.
- එවැනි ප්‍රමිති පිළිපැදීමට අසමත්වීම මඟින් අනුකූලතා සහ කීර්තිනාම අවදානම් ඇති වන අතර පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය ක්ෂය වේ.

අපගේ අවස්ථා

- සේවක අවශ්‍යතා වඩාත් සාකල්‍යව ලබාදීමට අපගේ යහපැවැත්මේ වටිනාකම කොටස පුළුල් කිරීම
- සේවකයින් සඳහා වර්ධනය කළ සහය අත්දැනීමක් ලබාදීමට ඇති හැකියාව.
- නව නායකත්ව හැකියාවන් සමඟ වඩාත් අතථ්‍ය, විවිධාංගීකරණය වූ ශ්‍රම බලකායක් මෙහෙයවීමට නායකයින් බල ගැන්වීම සඳහා ප්‍රබෝධමත් නායකත්ව සංවර්ධන ප්‍රවේශයක්.
- රඳවා ගැනීමේ සහ සංවර්ධන නිපුනතාවල ආයෝජනය කිරීම බැංකුවේ සන්නාමය ගොඩ නැගීම සහ ජාතිය සංවර්ධනය සවිබල ගන්වයි.
- අපගේ වෙළෙඳපොල පුරා සිටින පුද්ගලයින්, විශේෂයෙන් තරුණයින් සහ කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා තාක්ෂණයේ බලය උපයෝගී කර ගනිමින් සමාජ ආර්ථික සංවර්ධනය ක්‍රියාත්මක කර සැමට සමාජ ඇතුළත් කිරීම් මෙහෙයවීම.
- ව්‍යාපාරයේ අනාගතය සඳහා අපගේ කුසලතා පදනම නැවත ස්ථානගත කිරීම පුද්ගලයින්ට සහ ව්‍යාපාරවලට සහයවීමට අපට හැකි බව සහතික කිරීමට සහය විය හැකිය.
- ගනුදෙනුකරුවන් සහ ආයෝජකයන් ආකර්ෂණය කර ගැනීමට සහ රඳවා තබා ගැනීමට විශ්වාසදායක වීම සඳහා කීර්තියක් ලබාගත හැකිය.

අපගේ උපායමාර්ගික ප්‍රතිචාරය

- අපගේ ප්‍රතිපත්ති, ක්‍රියාවලි සහ පාර්ශවකාර සහභාගිත්ව වැඩසටහන් මඟින් මෙහෙයවන අවශ්‍යතාවන්ට දැඩි අනුකූලතාව සහතික කිරීම.
- බැංකු ක්ෂේත්‍රය සහ වඩා පුළුල් ආර්ථිකය සඳහා වඩාත් සුදුසු ප්‍රතිඵල සහතික කිරීමට ඉදිරි නියාමන වෙනස්වීම් පිළිබඳ නියමන බලධාරීන් සහ වෙනත් පාර්ශ්වකරුවන් සමඟ සහභාගිත්වය.
- වේගවත් වෙනසට ඉඩහරිමින් නියාමන අනුකූලතාව ක්‍රමවත් කිරීමට සහ සරල කිරීමට අත්‍යවශ්‍ය අවස්ථාවක් ලෙස අපි තාක්ෂණය දකින අතර එය අපගේ ගනුදෙනුකරුවන්ට වඩාත් කාර්යක්ෂම සහ ආරක්ෂිත සේවා ලබාදීමට බැංකුවට හැකියාව ඇති කරයි.
- අනෙකුත් ක්‍රියාමාර්ග සමඟ සංකීර්ණ සහ විස්තීර්ණ අභ්‍යන්තර පාලන රාමුවක් තුළින් ආයතනය තුළ අනුකූලතා සංස්කෘතිය වැඩි කිරීම.
- සේවකයින්, ක්‍රියාවලි සහ බැංකුව තුළ පද්ධතිවල අඛණ්ඩ ආයෝජනය තුළින් නියාමන වෙනස්වීම් ඇගයීමට ඒවාට ප්‍රතිචාර දැක්වීමට සහ නියාමනය කිරීමට සම්බන්ධකරණය කළ, විස්තීර්ණ සහ අනාගතය දකින ප්‍රවේශයක් පවත්වා ගැනීම.
- අපගේ ESG ප්‍රතිපත්ති සහ ක්‍රියාවලි ශක්තිමත් කිරීම සහ අපි ඵලදායී - විනිවිද අනාවරණ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කරන බව සහතික කරමු.

(වැඩිදුර තොරතුරු සඳහා සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය පිළිබඳ 136 සිට 145 පිටු බලන්න)

ක්‍රියාත්මක පාලනය

BIRMC සහ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC) තමන්ට අදාළ බලතල තුළ වර්තමාන සහ අපේක්ෂිත නියාමන වෙනස්වීම් නියාමනය කරයි

2023 වසරේදී සිදුකළ සමාලෝචනවල බැංකුවේ පිරිහෙමින් පවත්න ණය තත්ත්වය, ව්‍යවස්ථාපිත සහ ආර්ථික ප්‍රාග්ධන සංයුතීන් සහ මට්ටම්, නියාමන අවශ්‍යතා සලකාබැලීම, පීඩන ක්‍රියාදාම, සහ පොලී අනුපාත ප්‍රතිසංස්කරණ ඇතුළත් නමුත් එයටම සීමා නොවේ.

කෙටි කාලයේ සිට මධ්‍ය කාලය දක්වා අදාළ උපායමාර්ගික ප්‍රමුඛතා

අදාළ වැදගත් කරුණු

අදාළ ප්‍රාග්ධනයන්

වැදගත් අවදානම්

Risk 3 Risk 9 Risk 10

අදාළ SD අරමුණු

8 DECENT WORK AND ECONOMIC GROWTH
9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE
16 PEACE, JUSTICE AND STRONG INSTITUTIONS

මෙහෙයුම් පරිසරය සහ අවදානම් සහ අවස්ථා

අනාගත දැක්ම

නව බැංකු පනත

නව බැංකු පනත මහ බැංකුව විසින් හඳුන්වා දීමට අපේක්ෂිත තීරණාත්මක නෛතික ක්‍රියාවලික වැදගත් අංගයකි. මහ බැංකුව 1988 අංක 30 දරන දැනට පවතින බැංකු පනතේ විධිවිධාන තවදුරටත් ශක්තිමත් කිරීමේ සහ ක්‍රමවත් කිරීමේ සහ එහි විධිවිධාන ජාත්‍යන්තර ප්‍රමිතිවලට සමගාමී වන බව සහතික කිරීමේ අරමුණ ඇතිව නව බැංකු පනත කෙටුම්පත් කිරීම තුළ නියැලී සිටී. යෝජිත පනත තුළින්, බැංකු ක්ෂේත්‍රය සම්බන්ධයෙන් මහ බංකුවේ අධීක්ෂණ සහ නියාමන බලතල තවදුරටත් ශක්තිමත් කරන අතර ආයතනික පාලන රාමුවක් ද හඳුන්වා දෙනු ලැබේ.

නව බැංකු පනත යටතේ සිදුකළ වර්තමාන යෝජනාවලට දැනට නිකුත් කරන බැංකු බලපත්වල වර්ගයන්ට වෙනස්වීම්, ශාඛා සහ වෙනත් බැංකු අලෙවිකුටි ස්ථාපිත කිරීමේ අනුමැතිය ක්‍රමවත් කිරීම, ගනුදෙනුකාර ආරක්ෂාව ශක්තිමත් කිරීම, තැන්පත් රක්ෂණය ලබාදීම, පාලනය ශක්තිමත් කිරීම, අක්වෙරළ බැංකු සහ දේශීය බැංකු ඒකකවල මෙහෙයුම් තනි බැංකු ව්‍යාපාරයකට ඒකාබද්ධ කිරීම, සහ විසඳීම, සවිබල ගැන්වීම, සහ අධීක්ෂණ කටයුතු වර්ධනය ඇතුළත්ය. යෝජිත පනතින් කොළඹ වරාය නගරයේ ඉදිරි කොළඹ ජාත්‍යන්තර මූල්‍ය මධ්‍යස්ථානය තුළ බැංකු බලපත්‍ර සහ රෙගුලාසිය පාලනය කරන බව සඳහන් කළ යුතුය.

ක්ෂුද්‍ර මූල්‍ය සහ ණය නියාමන පනත

මහ බැංකුවික්ෂුද්‍ර මූල්‍ය සහ ණය නියාමන පනති නමින් නව නීති සම්පාදනයක් අවසන් කිරීමට පියවර ගෙන ඇත, මෙය බලපත්‍රලාභී ක්ෂුද්‍ර මූල්‍ය ආයතනවලට අදාළ නියාමන රාමුව දියුණු කරන අතර රටේ මුදල් ණයට දෙන ව්‍යාපාර සඳහා නව නියාමන රාමුවක් ද හඳුන්වා දේ. කෙටුම්පත් නීතියෙන් 2016 අංක 06 දරන පවත්නා ක්ෂුද්‍ර මූල්‍ය පනත අවලංගු කිරීමට අරමුණු කරන අතර ණය නියාමන අධිකාරියක් (CRA) ස්ථාපිත කිරීමට ද අරමුණු කරයි. තවද, නව පනතින් මුදල් ණයටදෙන සහ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාර සඳහා නියාමන සහ අධීක්ෂණ රාමුවත් යෝජනා කරන අතර, ගනුදෙනුකාර ආරක්ෂාව සහ පාලන මූලධර්ම සඳහා නෛතික රාමුවක් ද බල ගන්වයි.

වෙනත්

වර්තමාන සහ අපේක්ෂිත සයිබර් ආරක්ෂක ගැටළු හේතුවෙන්, බැංකු ප්‍රතිපත්ති, ආරක්ෂාව උවදුරේ නොදමා නම්‍යතාව වැඩි කිරීමේ මාර්ග සොයමින් ප්‍රවේශ කළමනාකරණය පිළිබඳ තම සමහර ප්‍රොටෝකෝල පසුකර යා හැකිය. බැංකු අංශය පොදු මේඝ පරිසරයන් වෙත සිය තොරතුරු තාක්ෂණයේ කොටස් විතැන් කරනු ඇත. හදිසි අවස්ථාවලදී මේවා පවත්වා ගැනීම අභියෝගයක් විය හැකි වුවත් බැංකු බොහොමයක් වර්තමානයේ ඔවුන්ට අයත් පුද්ගලික මේඝ භාවිතා කරයි. බැංකුවල තොරතුරු තාක්ෂණය සහ ආරක්ෂාව පිළිබඳ රෙගුලාසිය සැලකියයුතු ලෙස වෙනස් විය හැකි වුවද, සයිබර් ආරක්ෂාව බැංකු සඳහා අනාගතයේදී ඉහළ ප්‍රමුඛතාවක්ව පවතිනු ඇත.

තවද, බලපත්‍රලාභී බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතනවලට නොගැලපෙන/අගය කිරීමට දුෂ්කර වත්කම් සිය ශේෂ පත්‍රවලින් ඉවත් කර ගැනීමට නීතියෙන් අවසර දීමේ අරමුණ ඇතිව, මූල්‍ය වත්කම් කළමනාකරණ සමාගම මත නව නීතියක් ද හඳුන්වා දෙනු ලැබේ,

ප්‍රධාන ප්‍රවනතා



කාලගුණ වෙනස සහ තිරසාරභවය කළමනාකරණය

ප්‍රධාන සාධක

- මානව සෞඛ්‍ය සහ රෝග පැතිකඩ වෙනස්වීම් මත බලපෑම ඇතුළුව කාලගුණ වෙනසේ බලපෑම.
- පාරිසරික වෙනස්වීම් (ජෛව විවිධත්වය නැතිවීම සහ පරිසර පද්ධතිය කඩා වැටීම).
- ස්වභාවික ආපදා: මෑත කාලීන ගංවතුර ව්‍යාපාර සහ පිරිවැය කෙරෙහි බලපෑම් කරමින් සමාජ යුහසාධනය පීඩාවට පත්කර ඇත.
- නාගරීකරණය
- ESG හි නැගීම
- කාලගුණ වෙනසේ බලපෑමෙන් තමන්ව ආරක්ෂා කර ගැනීමට සහ ගෝලීය මෙන්ම ජාතික තිරසාර න්‍යාය පත්‍රය සමඟ පෙළ ගැනීමට බැංකු මත නියාමන සහ වාණිජමය පීඩන
- තිරසාර සංවර්ධනය සහ ESG පිළිබඳ වැඩි වූ පාර්ශවකාර අවධානය

වටිනාකමේ ගම්‍යතාර්ථ

බැංකුවේ කීර්තිනාමය සහ සාර්ථකත්වය පාලන ප්‍රමිති පිළිගැනීම ඇතුළුව අපගේ ESG කාර්යසාධනයට බෙහෙවින් සම්බන්ධ වේ.

අපගේ ESG ප්‍රතිපත්ති, ක්‍රියාවලි සහ අනාවරණවල ශක්තිමත්භාවය ආයෝජකයින්ගේ මතය අනුව අපගේ ව්‍යවසායමය වටිනාකමට බලපායි.

කාලගුණ වෙනස අප ක්‍රියාත්මක වන ආකාරයට සහ අපගේ ගනුදෙනුකරුවන්, සම්බන්ධ කිරීමේ, අපගේ නිෂ්පාදන හා සේවා බෙදාහැරීමේ, සහ ආදායම සහ මුදල් ප්‍රවාහ උත්පාදනය කිරීමේ අපගේ හැකියාවට බලපායි.

අපගේ ESG වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සහ ඒ පිළිබඳ වාර්තා කිරීමට අපට ඇති හැකියාව අපගේ ව්‍යාපාරයේ දිගුකාලීන තිරසාරභාවයට, රටේ ප්‍රගතිය සඳහා ප්‍රමුඛ ඩිජිටල් විසඳුම්වල උපායමාර්ගික අපේක්ෂාව, සහ අපගේ පාර්ශ්වකරුවන් සඳහා හුවමාරු වටිනාකම නිර්මාණය කිරීමේ ප්‍රමුඛතාව සඳහා අත්‍යවශ්‍යය.

මෙහෙයුම් පරිසරය සහ අවදානම් සහ අවස්ථා

අවදානම් සහ අවස්ථා

අපගේ අවදානම්

- වඩාත් නිරන්තර හා බරපතල කාලගුණ අවස්ථා සහ කාලගුණ රටාවල දිගුකාලීන වෙනස්වීම් හමුවේ ඇප සුරැකුම් ලෙස දරන දෑ ඇතුළුව බැංකුවේ වත්කම් හානිකරණය.
- කාලගුණ වෙනස සැලකියයුතු ණය අවදානම් ගම්‍යාර්ථ ඇති කරමින් ප්‍රජාවන්ගේ සහ ව්‍යාපාරවල තිරසාරභාවයටට බරපතල අභියෝග ඇති කරයි.
- බැංකුවේ මූල්‍ය කාර්යසාධනය සහ කීර්තිනාමය ප්‍රමාණවත් දේශගුණික බැඳීම්, නව අවස්ථා මූල්‍යකරණය සඳහා ප්‍රමාණවත් නොවන මූල්‍යකරණය,හෝ පරිසරයට හානි කරන හෝ මානව හිමිකම් කඩ කරන සංවිධාන සමඟ හවුල් වීම ද බලපෑ හැකිය.
- දේශගුණික විපර්යාස දුෂ්කර මානව සංවර්ධන ජයග්‍රහණ ආපසු හැරවීමට, අසමානතා නරක අතට හැරවීමට සහ බලහත්කාර සංක්‍රමණය සහ ගැටුම් ඇති කළ හැකිය. එය ආපදා අවදානම්වල ප්‍රධාන ධාවකයක් වන අතර, වැඩි වාර ගණන, විශාලත්වය සහ ජීවිත, ජීවනෝපාය සහ සමාජ-ආර්ථික සංවර්ධනය කෙරෙහි දේශගුණය නිසා ඇතිවන ආපදාවල බලපෑම් ඇති කරයි.
- දේශගුණික විපර්යාසවල බලපෑම්වලට වැඩි ස්වභාවික ආපදා සහ අවශ්‍ය අවස්ථාවලදී යටිතල පහසුකම් නැවත ගොඩනැගීමට (හෝ ප්‍රතිනිර්මාණය කිරීමට) වැඩි පිරිවැය, වැඩි වූ බලශක්ති පිරිවැය, ජල හිඟය සහ ගුණාත්මක ගැටළු, සහ වැඩි වූ ආහාර මිල සහ හිඟය ඇතුළත් වේ,
- දේශගුණික විපර්යාසවල භෞතික අවදානම් බලවත් හා පැහිර පවතී. හරිතාගාර වායු නිසා ඇතිවන උණුසුම් වීම ජීවත්වීමේ හැකියාව සහ වැඩ කිරීමේ හැකියාවට හානි විය හැක
- ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම ආහාර පද්ධති, භෞතික වත්කම්, යටිතල පහසුකම් සහ ස්වභාවික වාසස්ථාන (ජෛව විවිධත්වය අහිමි වීම) අඩපණ කරනු ඇත.

අපගේ අවස්ථා

- කල්පවත්නා තරඟකාරී වාසියක් නිර්මාණය කිරීම සඳහා තිරසාර-සංවර්ධන මූල්‍ය හරහා තිරසර සංවර්ධන අරමුණු සඳහා සහාය වීම.
- අපි තීක්ෂ්ණ බුද්ධිය සහ හැකියාවන් අඛණ්ඩව ගොඩනගන බැවින්, දේශගුණික – විපර්යාස හා – සම්බන්ධ අවදානම් සක්‍රීයව කළමනාකරණය කිරීමට සහ අනාගතය සඳහා සූදානම් වීමට අපගේ ගනුදෙනුකරුවන්ට සහාය වීමට නව විසඳුම් සංවර්ධනය කිරීමට අපට හැකි වනු ඇත.
- වඩා යහපත් දේශගුණික අවදානම් කළමනාකරණය සඳහා වාණිජමය අවශ්‍යතා ද වැඩි වෙමින් පවතී. බැංකු බොහෝ විට ඔවුන්ගේ හරිත සාක්ෂි පත්‍ර මත විනිශ්චය කරනු ලබන තරඟකාරී පරිසරයක් තුළ, තිරසාර-මූල්‍ය පිරිනැමීම් සංවර්ධනය කිරීම සහ ප්‍රාග්ධන ප්‍රතිපාදන, ණය අනුමත කිරීම්, කළඹ නියාමනය සහ වාර්තාකරණයට දේශගුණික සාධක ඇතුළත් කිරීම අර්ථවත් කරයි.
- අඩු කාබන් ගමන් මඟක් යොදා ගැනීමේදී ආයතනික ගනුදෙනුකරුවන්, ආයතනික සහ කුඩා ව්‍යාපාර සඳහා සහයවීම සඳහා ආයෝජන සහ මූල්‍ය විසඳුම් සංවර්ධනය කිරීම.
- පැරිස් ගිවිසුමට අනුකූලව අඩු බලශක්ති පරිභෝජනය කරන ආර්ථිකයකට පාරිභෝගිකයින්ගේ හැසිරීම අනුවර්තනය කිරීමට ඔවුන් සවිබල ගැන්වීමට සහ ඔවුන්ගේ ඉතිරිකිරීම් පාරිසරික හා සමාජීය ගැටළු සඳහා යෙදවීමට අමතර නිෂ්පාදන සහ සේවාවන්.
- නව ආර්ථික ආදර්ශවලට ප්‍රතිචරාත්මකව මූල්‍ය නව්‍යකරණය (විශේෂයෙන් තිරසාර කෘෂිකර්මය)

අපගේ උපායමාර්ගික ප්‍රතිචාරය

- වගකීම් සහගත ආයතනික පුරවැසිභාවය සහ තිරසාර අරමුණු අපගේ උපාය මාර්ගයට ආධාර කරයි. අපගේ නිෂ්පාදන සහ සේවාවන්වල අපගේ ආයෝජන මඟින් ඒවා අදාළව පවතින බව සහ අපගේ ගනුදෙනුකරුවන්ට වටිනාකමක් ලබා දෙන බව සහතික කරයි.
- අපගේ ESG ප්‍රතිපත්ති සහ ක්‍රියාවලි ශක්තිමත් කිරීම සහ අපි ඒවා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීම – අපගේ ප්‍රගතිය විනිවිදභාවයෙන් හෙළිදරව් කරයි.
- ජලය, පුනර්ජනනීය බලශක්තිය සහ කෘෂිකර්මාන්තයට අදාළව ශ්‍රී ලංකාව තුළ විශේෂිත තිරසාර මූල්‍යකරණ අවස්ථා හඳුනාගෙන ඇත. මෙම අවස්ථාවට අනුකූලව, බැංකුව විසින් වාණිජමය වශයෙන් ශක්‍ය ආයෝජන සඳහා සහය ලබා දෙන අතරම සමාජීය සහ පාරිසරික අභියෝග ඒ සමඟම විසඳමින් සහ රටේ තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීමට සහ COP27 සමුළුවේ ප්‍රතිඵල සමඟ පෙළගැසීමට සහය වනු ඇත.
- මෙයට සමගාමීව, අපගේ සේවාදායකයින්ගේ අවශ්‍යතා, පිරිනමනු ලබන උපායමාර්ගික අවස්ථාවන්හි ප්‍රමාණය සහ මෙම ක්ෂේත්‍රයේ අපගේ තරඟකාරී වාසිය දිගටම ප්‍රයෝජනයට ගැනීමට ඇති අපගේ අභිලාෂයට ගැලපෙන ආකාරයෙන් තිරසාර සංවර්ධන මූල්‍යකරණය අඩු කාබන් ආර්ථිකයක් බවට පරිවර්තනය කිරීම සඳහා රජයේ මූලපිරීම්වලට සහය දැක්වීමට සහ අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීමට අපි කැපවී සිටිමු.
- දේශගුණික විපර්යාස හා සම්බන්ධ අවදානම් සහ අවස්ථාවන් කළමනාකරණය කිරීම සඳහා අපගේ උපාය මාර්ග, ප්‍රතිපත්ති, ක්‍රියාවලි, නිෂ්පාදන සහ සේවා ශක්තිමත් කිරීම.
- යම් ස්වාභාවික ආපදාවලින් පසුව වෙනස් වූ පිවිසුම් ස්ථාන හේතුවෙන් ගනුදෙනුකරුවාට සිදුවන ඍණාත්මක බලපෑම් අවම කිරීම සඳහා ආපදා ප්‍රතිසාධන සහ ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් සකස් කර ක්‍රියාත්මක කර ඇත.

(වැඩිදුර තොරතුරු සඳහා ස්වභාවික ප්‍රාග්ධනය පිළිබඳ 146 සිට 150 පිටු බලන්න).

මෙහෙයුම් පරිසරය සහ අවදානම් සහ අවස්ථා

අනාගත දැක්ම

මූල්‍ය පද්ධතියේ තිරසාරභාවය කාර්යක්ෂමව සහ සාර්ථකව ආරක්ෂා කිරීම සඳහා මූලික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ රාමුවට දේශගුණික විපර්යාස සහ දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව ඇතුළත් කිරීමේ වැදගත්කම අවබෝධ කරමින්, මහ බැංකුව විසින් දියත් කරන ලද – "තිරසාර මූල්‍ය සඳහා මාර්ග සිතියම" – ශ්‍රී ලංකාවේ දේශගුණික විපර්යාසය වැඩලීමට දේශගුණික ඔරොත්තු දීමේ ව්‍යාපෘති සඳහා මූල්‍යකරණය ප්‍රවර්ධනය කිරීම සඳහා මූල්‍ය පද්ධතිය දිරිමත් කරයි. මෙම මාර්ග සිතියම මූල්‍ය නියාමකයින්ට සහ මූල්‍ය ආයතනවලට ඔවුන් විසින් අරමුදල් සපයන ව්‍යාපෘති හා සම්බන්ධ ඔවුන්ගේ ESG අවදානම් ඵලදායි ලෙස කළමනාකරණය කිරීමට පුළුල් මග පෙන්වීමක් සපයයි. එය වඩා හරිත, දේශගුණික හිතකාමී සහ සමාජීය වශයෙන් ඇතුළත් වන ව්‍යාපාර සඳහා සහය ප්‍රවර්ධනය කරයි. වඩාත් ඔරොත්තු දෙන සහ තිරසාර හරිත ආර්ථිකයක් ගොඩනැගීම සඳහා මූල්‍ය අංශයේ දායකත්වය ඉහළ නැංවීමට මාර්ග සිතියම උත්සාහ කරයි.

බැංකු ඔවුන්ගේ නිෂ්පාදන පිරිනැමීම් සහ ආයෝජන තීරණ මෙන්ම හිඟ සම්පත් භාවිතා කිරීමේදී සමාජීය හා පාරිසරික වශයෙන් වගකිව යුතු වේ. තිරසාර ව්‍යාපාරික ව්‍යවහාර යොදා ගනිමින් සහ රජය විසින් නියම කර ඇති රෙගුලාසිවලට අනුකූලව එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන අරමුණු සමඟ පෙළ ගැසීමට බැංකුවලට වැඩි අවශ්‍යතාවක් පවතී. අනුකූලතාව දැක්වීමට අපොහොසත් වීම නිසා බැංකුව කෙරෙහි පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය ක්ෂය වීම සහ කීර්තිනාම අවදානම්වලට නිරාවරණය වීමට හේතු වේ.

දේශගුණික විපර්යාස, සම්පත් හිඟකම, පරිසර පද්ධති සංරක්ෂණය, අසමානතාවය සහ මානව හිමිකම් ඇතුළු සමාජ සහ පාරිසරික ගැටළු වලට විසඳුම් සෙවීම ව්‍යාපාරික අවශ්‍යතාවයක් බවට පත්ව ඇත. එබැවින්, අපි අපගේ වටිනාකම නිර්මාණය කිරීමේ ආකෘතියට සමාජ හා පාරිසරික ගැටළු ඒකාබද්ධ කරමු. අඩු කාබන් ආර්ථිකයක් බවට පරිවර්තනය කිරීමේදී අපි අත්‍යවශ්‍ය කාර්යභාරයක් ද ඉටු කරමු. ආර්ථිකය. කෙටි හා මධ්‍ය කාලීන වශයෙන්, අපගේ තීරණවල සමාජ බලපෑම් පිළිබඳව ඉතා හොඳින් දැනුවත්ව, ක්‍රමවත් සංක්‍රාන්තියක් සඳහා අපි සැලසුම් කරමු

තවද, ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (IFRS) පදනම විසින් 2021 දී ග්ලාස්ග්‍රෝ හි පැවති එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස සමුළුවේදී ජාත්‍යන්තර තිරසාර ප්‍රමිති මණ්ඩලය (ISSB) පිහිටුවීම විධිමත් ලෙස ප්‍රකාශයට පත් කරන ලදී. පසුව, 2023 ජූනි මාසයේදී, 2023, ISSB විසින් එහි පළමු IFRS තිරසාර ප්‍රමිති හෙළිදරව් කිරීම් දෙක නිකුත් කරන ලදී. (IFRS S1: තිරසාරභාවයට අදාළ මූල්‍ය තොරතුරු හෙළිදරව් කිරීම් සහ IFRS S2 දේශගුණය ආශ්‍රිත හෙළිදරව් කිරීම් සඳහා වන සාමාන්‍ය අවශ්‍යතා). CASL විසින් මෙම ප්‍රමිතීන් දෙක ආයතනික අංශයට සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ට හඳුන්වා දෙන ලද අතර, 1 යන දෙකම හඳුන්වා දෙන ලදී. IFRS S1 සහ IFRS S2 යන දෙකම 2024 ජනවාරි 1 හෝ ඊට පසුව ආරම්භ වන වාර්ෂික වාර්තාකරණ කාල සීමාවන් සඳහා ක්‍රියාත්මක වේ.

ක්‍රියාත්මක පාලනය

2022 දී, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පරිසරය තුළ වෙනස්වීම් සැලකිල්ට ගනිමින් තිරසාර ප්‍රතිපත්ති සහ පාරිසරික හා සමාජ අවදානම් කළමනාකරණ රාමුව වෙත තිරසාර අවදානම ඉහළ නැංවීම සමාලෝචනය කරන ලදී. 2018 වසරේ දී තෝරාගත් එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අරමුණු හතර සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ක්‍රියාමාර්ග අඛණ්ඩව ධනාත්මක බලපෑමක් ඇති කළේය. අධ්‍යක්ෂ මණ්ඩලය සිය මෙහෙයුම්වලින් ඇතිවන තිරසාර අවදානම්වල බලපෑම අඛණ්ඩව නියාමනය කරන අතර, එහි වටිනාකම් නිර්මාණ ක්‍රියාවලිය තුළ බලපෑම් අවම කිරීම සඳහා සෑම ක්‍රියාමාර්ගයක්ම ගනී.

කෙටි කාලයේ සිට මධ්‍ය කාලය දක්වා අදාළ උපායමාර්ගික ප්‍රමුඛතා

අදාළ වැදගත් කරුණු

අදාළ ප්‍රාග්ධනයන්

අදාළ අවදානම්

Risk 2 Risk 8

අදාළ SD අරමුණු

7 AFFORDABLE AND CLEAN ENERGY
11 SUSTAINABLE CITIES AND COMMUNITIES
12 RESPONSIBLE CONSUMPTION AND PRODUCTION
17 PARTNERSHIPS FOR THE GOALS



මෙහෙයුම් පරිසරය සහ අවදානම් සහ අවස්ථා

SWOT විශ්ලේෂණයි

අපගේ අභ්‍යන්තර ශක්තීන් සහ දුර්වලතා මෙන්ම බාහිර පරිසරය තුළ අවස්ථා සහ තර්ජන පිළිබඳ දැක්මක් ලබාදීමට SWOT විශ්ලේෂණයක් පවත්වනු ලැබේ.

ශක්තීන්

- තැන්පතු හා පොළී ගෙවීම් රජය විසින් සම්පූර්ණයෙන්ම සහතික කිරීම
- ශක්තිමත් සන්නාම කීර්තිනාමය – සන්නාම මූල්‍ය අනුව ශ්‍රී ලංකාව තුළ හත් වැනි විශිෂ්ඨතම සන්නාමය ලෙස පිළිගැනීම
- වසර 190ක බැංකුකරණ උරුමය
- 100% රජය සතු බැංකුව
- සේවා ස්ථාන 4000 ඉක්මවමින් දිවයින පුරා විස්තීර්ණ ගනුදෙනුකාර ලඟාවීම
- ඉහළ රඳවා ගැනීමේ අනුපාතය සමඟ ශක්තිමත් සේවක පක්ෂපාතිත්වය
- ලංකා ශ්‍රේණිගත ආයතනය මඟින් AAA ණය ශ්‍රේණිගතකරණය
- යටිතල පහසුකම් ව්‍යාපෘති සහ පිරිසිදු බලශක්තිය සඳහා මූල්‍යකරණය තුළ විශේෂවීම
- තැපැල් ජාලය සමඟ සහයෝගය
- POS සේවය

දුර්වලතා

- ජාතික ඉතිරි කිරීමේ පනත තුළින් ව්‍යාපාර පුළුල්කිරීම කෙරෙහි පනවනලද සීමාවන් (ක්ෂුද්‍ර මූල්‍ය, SME අංශයට ණයදීම)
- රජයේ සුරැකුම්පත්වල තැන්පතුවලින් 60%ක් ආයෝජනය කිරීමේ අනිවාර්ය අවශ්‍යතාව
- ගාස්තු සහ කොමිස් පදනම් කරගත් ආදායම උත්පාදනය කිරීමේ සීමා
- බැංකුව විසින් ඇප පදනම් ණයදීම කෙරෙහි රඳාපැවතීම
- අරමුදල් සැපයීමේ මූලික ප්‍රභවය කාලීන තැන්පතු වීම
- නිලධාරිවාදී ක්‍රියාවලි සහ ක්‍රියාපටිපාටි
- පූර්ණ වශයෙන් ඒකාබද්ධ වූ පද්ධති නොපැවතීම හේතුවෙන් නම්‍යශීලීභාවය සීමා වී ඇත
- මධ්‍යස්ථ අවදානම් සංස්කෘතිය සහ ව්‍යාපාර ප්‍රතිපත්තිය

අවස්ථා

- ශ්‍රී ලංකාවේ යටිතල පහසුකම් වර්ධනය කිරීම සඳහා රජයේ වගකීම ක්‍රියාත්මක කිරීමේදී ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ කාර්යභාරය
- එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අරමුණු සඳහා රජයේ බැඳීම
- දේශගුණික වෙනස කෙරෙහි වර්ධනය වන අවධානය සහ හරිත ආර්ථිකයක් කරා විතැන්වීම
- බැංකු කටයුතුවල ගතික තාක්ෂණික වැඩි දියුණු වීම
- පොදු ජනතාවගේ මූල්‍ය සාක්ෂරතාව වර්ධනය
- වැඩිවන සංක්‍රමණය හේතුවෙන් විදේශ විනිමය ප්‍රේෂණ සඳහා වර්ධනය වන වෙළෙඳපොල

ශක්තීන් උත්තේජනය කරමින් අවස්ථා උපරිම කිරීම

- අපගේ විශේෂ විෂය දැනුම සමඟ රජයේ යටිතල පහසුකම් සංවර්ධනය ව්‍යාපෘතිවලට සහයෝගය දැක්වීම
- හරිත ආර්ථිකය ප්‍රවර්ධනය සම්බන්ධයෙන් ණය නිෂ්පාදන ලබාදීම සහ හරිත බලශක්ති මූල්‍යකරණය තුළ විශේෂඥ නිපුනතා භාවිතා කිරීම
- සංක්‍රමණ ශ්‍රම බලකායේ විදේශීය ප්‍රේෂණ ආකර්ශනය කර ගැනීමට අපගේ සන්නාම නාමය සහ 100% රජයේ ඇප භාවිතා කිරීම


ශක්තීන් උත්තේජනය කරමින් තර්ජන අවම කිරීම

- අපගේ පුළුල් පිවිසුම් මාර්ග තුළින් සුවිශේෂී ගනුදෙනුකාර අත්දැකීම පිරිනැමීමට විස්තීර්ණ ගනුදෙනුකාර පිවිසීම
- වඩා ඉතුරුම් සංස්කෘතියන් දිරිගන්වමින් අපගේ POS සේවය හරහා ගනුදෙනුකරු ලඟටම සේවා පිරිනැමීම
- පිරිහෙන ආර්ථික තත්ත්වයන් සහ විශ්වාසය අහිමිවීමේ බලපෑමට සමස්ථ ක්ෂේත්‍රය මුහුණ දෙන බැවින් 100%ක් රජයේ පසුබිම සහිත ආරක්ෂිතම බැංකුව ලෙස අපි අපව අලෙවි කර ගැනීම

බොහෝ අවස්ථා ඇති කරමින් දුර්වලතා ජය ගැනීම

- අපට කරගෙනයාමට ඉඩ දුන් සීමිත සේවා කෙරෙහි අවධානය සහ එකි වෙළෙඳපොල තුළ විශේෂ වීම – ප්‍රධාන වශයෙන් ප්‍රේෂණ වෙළෙඳපොල ග්‍රහනය සහ ගාස්තු පදනම් ආදායම වැඩි කිරීම
- කාර්යක්ෂමතාව සහ ඵලදායිත්වය වැඩි කිරීමට තාක්ෂණය යොදා ගැනීම සහ ඒ තුළින් දෝෂ අවම කිරීම
- ඉතුරුම් තැන්පතු වැඩි කිරීමට ස්වයංක්‍රීය ක්‍රියාවලි

මෙහෙයුම් පරිසරය සහ අවදානම් සහ අවස්ථා



තර්ජන

- දුර්වල ආර්ථික තත්ත්වයන් සහ දේශපාලන ස්ථාවරත්වය බැංකු හා මූල්‍ය අංශ කෙරෙහි විශ්වාසය අහිමිවීමට හේතු වේ.
- ආර්ථික තත්ත්වයන් පිරිහීම හේතුවෙන් බුද්ධි ගලනය
- වැඩිවන පොළී අනුපාත දුර්වල ණය සංස්කෘතියකට හේතු වේ
- උද්ධමනය හේතුවෙන් ගෘහස්ථ ඉතුරුම් අඛණ්ඩව පහළ වැටීම
- වාණිජ බැංකු මෙන්ම බැංකු නොවන තරඟකරුවන් වෙතින් දැඩි තරඟකාරිත්වය
- බැංකු හා මූල්‍ය සේවා ක්ෂේත්‍රය කෙරෙහි දැඩි නියාමන හා අධීක්ෂණ වැඩපිළිවෙල
- සම්ප්‍රදායික ව්‍යාපාර ආකෘතින්ට අභියෝග කරන බාධාකාරී තාක්ෂණික ක්‍රම
- ගනුදෙනුකාර අවශ්‍යතා සහ අපේක්ෂා නිරන්තරයෙන් වෙනස්වීම
- ණය ශ්‍රේණිගත කිරීම් පහත වැටීම

දුර්වලතා හා තර්ජනවලට මුහුණ දීම

- තොරතුරු තාක්ෂණය හා දත්ත විශ්ලේෂණය වැනි අනාගත බැංකු කටයුතු සඳහා අවශ්‍ය නිපුනතා සහිත නව දක්ෂයින් අත්කර ගැනීම
- පහසු සහ වර්ධිත ගනුදෙනුකාර සේවා සහතික කිරීමට නව තාක්ෂණයන් කෙරෙහි අවධානය
- ක්ෂේත්‍රයෙහි තරඟ කිරීමට නම්‍යශීලී නිෂ්පාදන නිර්මාණය කිරීම

මෙහෙයුම් පරිසරය සහ අවදානම් සහ අවස්ථා

ක්ෂේත්‍රයේ ආකර්ශනීයත්වය සහ තරඟකාරිත්වයන්

ශ්‍රී ලංකාවේ තරඟකාරී බැංකු අංශය තුළ අපගේ ස්ථානය පවත්වා ගැනීමට, මයිකල් පෝටර්ගේ පස් වැදෑරුම් බලකායන් විශ්ලේෂණය අපි යොදාගෙන ඇත. මෙම රාමුව අපගේ කෂේත්‍රයට බලපාන තීරණාත්මක බාහිර අංග අවබෝධ කර ගැනීමට, අපගේ බැංකුව මුහුණපාන ප්‍රධාන අභියෝග පෙන්වා දීමට සහ උපායමාර්ගික ප්‍රමුඛතා සකස් කිරීමට අපට සහය වේ. මෙවැනි බලපෑම් ඵලදායීව ආමන්ත්‍රණය කිරීම අප බැංකුවේ ඔරෝත්තදීම සුරක්ෂිත කිරීමේදිප්‍රධාන වේ. පහත, බැංකු ක්ෂේත්‍ර පරිසරය තුළ මෙම බලකායන් පහේ තීව්‍රතාව සහ බලපෑම අපි විස්තර කරමු.

1 නව ප්‍රවේශකයින්ගේ තර්ජන

නව තරඟකරුවන්

නව රෙගුලාසි සහ අනුකූලතා අවශ්‍යතා

- බැංකුවක් සංස්ථාගත කිරීම සඳහා බලපත්‍රය ලබා ගැනීමේදී ඉහළ ප්‍රාග්ධන අවශ්‍යතාවය අභියෝගයකි
- බාසල් III අවශ්‍යතාවලට අනුකූල වීම සඳහා ඉහළ ආයෝජන අවශ්‍යතාව
- සේවකයින්, තොරතුරු තාක්ෂණ, සහ බෙදාහැරීමේ මාර්ගවල ඉහළ ප්‍රාග්ධන ආයෝජන සඳහා අවශ්‍යතාවය
- නියාමන සහ අනුකූලතා අංශවල අවශ්‍යතා වැඩි කිරීම

2 ගනුදෙනුකරුවන්ගේ කේවල් කිරීමේ බලය

දැනට සිටින සහ අනාගත ගනුදෙනුකරුවන්

- පුද්ගලගතතල සහ උසස් ප්‍රමිතීන් සහිත සේවා සඳහා ගනුදෙනුකරුවන්ගේ ඉල්ලුම වැඩි වීම
- වෙළඳපොලේ සමාන නිෂ්පාදන සහ සේවා ලබා ගැනීමේ හැකියාව
- අධික පිරිවැයක් දැරීමෙන් තොරව තරඟකරුවන් සහ ආදේශකයින් වෙත මාරු වීමට ගනුදෙනුකරුවන්ට හැකිවීම
- නව පරම්පරාවේ ගනුදෙනුකරුවන්ට ගනුදෙනුකාර පක්ෂපාතිත්වය නොමැත
- ඉහළ ශුද්ධ වටිනාකමක් ඇති ගනුදෙනුකරුවන්ට අඩු මිල ගණන් සාකච්ඡා කිරීමේ හැකියාව ඇත

3 සැපයුම්කරුවන්ගේ කේවල් කිරීමේ බලය

භාණ්ඩ හා සේවා සපයන්නන්

සේවකයින්

- ඉහළ ප්‍රතිලාභ සහ අඩු අවදානම් සඳහා තැන්පත්කරුවන්ගෙන් ඇති ඉල්ලුම
- ඩිජිටල් සේවා සපයන්නන් මත වැඩි රඳා පැවැත්ම
- වෘත්තීය සමිති හරහා සේවකයින්ගේ ඉහළ කේවල් කිරීමේ හැකියාව
- ලිපි ද්‍රව්‍ය සැපයුම්කරුවන්, බාහිරින් ලබා ගැනීම සහ කොන්ත්‍රාත් සේවකයින් වැනි අනෙකුත් සැපයුම්කරුවන් මත අඩු රඳා පැවැත්ම

4 තරඟකාරී විරෝධය


- ක්ෂේත්‍රයේ ඉහළ තරඟකරුවන් සංඛ්‍යාව (බලපත්‍රලාභී වාණිජ බැංකු (LCB) 24 සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු (LSB) 6කි)
- ගනුදෙනුකරුවන්ගේ අඩු මාරුවීමේ පිරිවැය සහ සමාන නිෂ්පාදන සහ සේවා පිරිනැමීම හේතුවෙන් තරඟකරුවන් අතර දැඩි තරඟය

5 ආදේශකයින්ගේ තර්ජන

බැංකු නොවන මූල්‍ය ආයතන

ගෙවීම් පහසුකම් සපයන්නන්

- කාර්යක්ෂම ගෙවීම් විසඳුම් ලබා දෙන විදුලි සංදේශ සමාගම් සහ අනෙකුත් ගෙවීම් සපයන්නන්ගෙන් තර්ජනය වැඩි වීම (FinTech සමාගම්)
- මිල, ගුණාත්මකභාවය හෝ විශේෂාංගවල වෙනසක් නොමැතිව අඩු මිලට සමාන නිෂ්පාදන ලබා ගැනීමේ හැකියාව
- තැන්පතුකරුවන් සහ ණය දෙන්නන් පිරිනමන නිෂ්පාදනවල පොලී අනුපාතවල වෙනස්වීම්වලට ඉතා සංවේදී වේ




ප්‍රමාණාත්මකභාවය

ප්‍රමාණාත්මකභාවය තීරණය කිරීමේ ක්‍රියාවලි

ජාතියේ ඉතුරුම් දැවැන්තයා ලෙස, බැංකුව රටේ ආර්ථික සංවර්ධනයේ හවුල්කරුවෙකු වන අතරම ධනය නිර්මාණය කිරීමට, වර්ධනය කිරීමට සහ ආරක්ෂා කිරීමට සහය වෙමින් පුද්ගලයන්ගේ, ප්‍රජාවන්ගේ සහ අවසාන වශයෙන් ජාතියේ ආර්ථික කටයුතු සඳහා අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කරයි. අපගේ මෙහෙයුම් පරිසරය, පාර්ශ්වකරුවන්, අවදානම් සහ අවස්ථාවන්ට අප ප්‍රතිචාර දක්වන ආකාරය සහ අප තෝරාගත් උපාය මාර්ගය ඇතුළු බොහෝ සාධක මගින් වටිනාකම නිර්මාණය කිරීමට සහ ආරක්ෂා කිරීමට අපගේ හැකියාව තීරණය වේ.

අනාවරණ වාර්තා කිරීම සඳහා අදාළ කරුණු තීරණය කිරීම සඳහා බැංකුව ද්විත්ව ප්‍රමාණාත්මකතා ප්‍රවේශයක් යොදා ගන්නා අතර, අපගේ වටිනාකම (මූල්‍ය ප්‍රමාණාත්මකභාවය) නිර්මාණය කිරීමට හෝ ආරක්ෂා කිරීමට ඇති හැකියාව සහ කෙටි, මධ්‍ය කාලීන සහ දිගු කාලීන වශයෙන් පරිසරය, ප්‍රජාවන් සහ සමාජයට (බලපෑම් ප්‍රමාණාත්මකභාවය) බලපාන අපගේ බලපෑම් කරුණු හඳුනා ගනී. මෙම කරුණුවල ගතික ස්වභාවය අප ගණන් ගන්නා බව සහතික කිරීම සඳහා, අපි අපගේ ප්‍රමාණාත්මකභාවය ඇගයීමට ලක් කරමු. වාර්ෂිකව. මෙම වාර්තාව මගින් අපගේ ප්‍රමාණාත්මක කරුණු ලෙස අප සැලකූ දේ සඳහා සන්දර්භය සපයයි - එය වටිනාකම නිර්මාණය කිරීමට හෝ ආරක්ෂා කිරීමට අපගේ හැකියාවට සැලකිය යුතු ලෙස බලපාන අතර කෙටි, මධ්‍ය කාලීන හෝ දිගුකාලීන වශයෙන් වටිනාකම ක්ෂයවීමට හේතු වේ. අපගේ ප්‍රමාණාත්මකභාවය තීරණය කිරීමේ ක්‍රියාවලිය පහත සකච්ඡා කර විශ්ලේෂණය කෙරේ:



යෙදවුම්

අපගේ වටිනාකම නිර්මාණය කෙරෙහි මෙහෙයුම් පරිසරයේ බලපෑම සමාලෝචනය කිරීම

පිටු අංක 26 සිට 44 – මෙහෙයුම් පරිසරය

අපගේ පාර්ශවකාර බැඳියාවන්, අවශ්‍යතා සහ අපේක්ෂාවන් සමාලෝචනය කිරීම

පිටු අංක 81 සිට 93 – ඒකාබද්ධ පාර්ශවකාර සහභාගිත්වය

උපායමාර්ගික පරමාර්ථ අත්කර ගැනීමට බැංකුවේ හැකියාවට වඩාත් වැදගත් අපගේ අවදානම් සමාලෝචනය කිරීම

පිටු අංක 27 සිට 41 – අවදානම් සහ අවස්ථා
පිටු අංක 191 සිට 213 – අවදානම් සාමාලෝචනය

අධ්‍යක්ෂ මණ්ඩල සහ අනුකමිටුවල ප්‍රධාන තීරණ සමාලෝචනය කිරීම

පිටු අංක 182 සිට 190 – අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු වාර්තා

වෙනත් යෙදවුම්

- මාධ්‍ය සමාලෝචනය
- තරඟකරුවන් සමාලෝචන
- බාහිර/පර්යේෂණ ප්‍රකාශන
- 2022 වාර්තාකරණය තුළ අනාවරණය කළ පෙර කරුණු
- ක්ෂේත්‍රයේ තරඟකරුවන්ගේ වාර්තාකරණය තුලින් හඳුනාගත් වෙනත් කරුණු

හඳුනාගැනීම

අපි අපගේ ව්‍යාපාර සංදර්භය, මෙහෙයුම් පරිසරය, අප විශ්වාස කරන සම්පත්, සහ අපගේ පාර්ශ්වකරුවන්ගෙන් ලද අභ්‍යන්තර සහ බාහිර ප්‍රතිපෝෂණ

ඒකාබද්ධ චින්තනය ප්‍රවේශය යොදා ගනිමින් මූල්‍ය, කීර්තිනාම, මෙහෙයුම්, පාරිසරික, සමාජීය, උපායමාර්ගිකව, හෝ නෛතික වැදගත්කම

තක්සේරු කිරීම සඳහා විශ්ලේෂණය කරමු. සිදුවී ඇති සිදුවීම් කෙටි, මධ්‍ය, සහ දිගුකාලිනව අපගේ ව්‍යාපාරයට බලපෑ හැකි කරුණු අපි සලකා ලබමු.

ප්‍රමුඛතා

මෙම විශ්ලේෂණයේ ප්‍රතිඵල සහ ප්‍රමාණාත්මක අනුකෘතියේ නිරූපණය කර ඇති පරිදි හඳුනාගත් ප්‍රධාන අවදානම් සහ අවස්ථා භාවිතා කරමින්, අපගේ උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමට සහ අපගේ පාර්ශ්වකරුවන්ට කෙටි, මධ්‍යම හා දිගු කාලීන වශයෙන් තිරසාර වටිනාකමක් ඇති කිරීමට අපට ඇති හැකියාවට වඩාත් ප්‍රයෝජනවත් වන කරුණු වලට අපි ප්‍රමුඛත්වය දෙමුග ප්‍රමාණාත්මක කරුණු අපි ප්‍රමුඛ කරන ආකාරය අවබෝධ කර ගැනීමට 47 පිටුවේ ප්‍රමාණාත්මක අනුකෘතිය බලන්න

ඒකාබද්ධ කිරීම

අපි අපගේ ප්‍රමාණාත්මක කරුණු උපායමාර්ගික අරමුණු සඳහා අපගේ ඒකාබද්ධ ප්‍රවේශයට මඟ පෙන්වන උපායමාර්ගික ප්‍රමුඛතා පහට සන්දර්භගත කිරීමෙන් අපගේ උපාය මාර්ගයට ඒකාබද්ධ කරමුග

අපගේ ප්‍රාග්ධන හය අතර විභව්‍ය සමතුලිතතා ඇගයීම මගින් අපගේ තීරණ ගැනීමේ සහ වටිනාකම්-නිර්මාණය කිරීමේ ක්‍රියාවලීන්හි මෙම කරුණු වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

ඒවායේ බලපෑම තක්සේරු කරමින් සහ වටිනාකම් නිර්මාණයට ඇති විය හැකි බාධා අවම කිරීම සඳහා සුදුසු උපාය මාර්ග සැලසුම් කරමින් මෙන්ම ඉහළ වටිනාකමක් නිර්මාණය කිරීම සඳහා අවස්ථාව ලබා දුන් එම සාධක ප්‍රාග්ධනනිය කරණය කිරීමට කළමනාකරණ මැදිහත්වීම් ක්‍රියාත්මක කරමින් ප්‍රතිචාර දක්වමු.

තක්සේරු කිරීම

අපි උපායමාර්ගික අරමුණු ලබාදීමට බැංකුව පුරා ක්‍රියාත්මක හඳුනාගෙන ඇති මූලික කාර්යසාධන ක්ෂේත්‍ර (KPAs) සහ මූලික කාර්යසාධන දර්ශක (KPIs) භාවිතා කරමින් උපාය මාර්ගයට එරෙහිව අපගේ කාර්ය සාධනය නිරීක්ෂණය කරමු තවද, අපගේ උපායමාර්ගය අදාළව පවතින බව සහතික කිරීම සඳහා වාර්ෂික උපායමාර්ගික ව්‍යාපාර සැලසුම් වැඩමුළුවලදී අපි කරුණු අඛණ්ඩව තක්සේරු කර සමාලෝචනය කරන්නෙමු.

ප්‍රතිචාරය

ඉහළ වටිනාකම නිර්මාණය කිරීම සඳහා අවස්ථාව සලසන එම සාධකවල වාසිය ලබා ගැනීම සඳහා සුදුසු කළමනාකරණ ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීමෙන් මෙන්ම එය බිඳ දැමීමේ හැකියාව ඇති ඒවා අවම කිරීමට මැදිහත් වීමෙන් අපගේ ප්‍රමාණාත්මක කරුණුවලට ප්‍රතිචාර දක්වමු.

වාර්තාව

හඳුනාගත් ප්‍රමාණාත්මක කරුණු අපගේ සියලුම අභ්‍යන්තර සහ බාහිර පාර්ශ්වකරුවන් වෙත වාර්තා කරන්නෙමු. ප්‍රමාණාත්මක නිර්ණායක සපුරාලන කරුණු මෙම ඒකාබද්ධ වාර්තාවේ විස්තර කර ඇත.

ප්‍රමාණාත්මකභාවය

ප්‍රමාණාත්මක අනුකෘතිය

පාර්ශ්වකරුවන්ගේ සලකා බැලීම් මට්ටම සහ අපගේ ව්‍යාපාරයේ ශක්‍යතාව, පාර්ශ්වකරුවන් සමඟ ඇති සම්බන්ධතාවය මෙන්ම මානෘකාවේ සීමා කෙරෙහි බලපාන ප්‍රමාණය මත පදනම්ව අපි ප්‍රමාණාත්මක සිතියමක හඳුනාගත් ගැටළු ලකුණු කළෙමු. අපගේ ප්‍රමාණාත්මක කරුණු සමාජ, ආර්ථික සහ පාරිසරික වශයෙන් කාණ්ඩ තුනකට වර්ග කෙරේ.

ඒ අනුව, අපගේ මෙහෙයුම්වලට බලපෑම් කළ හැකි සහ අපගේ පාර්ශ්වකරුවන්ට ඉතා වැදගත් වන ප්‍රමාණාත්මක ගැටළු 12 ක් 2023 මූල්‍ය වර්ෂය සඳහා හඳුනා ගන්නා ලදී. අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකාරිත්වය අපගේ මූල්‍ය ශක්තිය පවත්වා ගැනීමට සහ අපගේ ගනුදෙනුකරුවන්ට සහ ප්‍රජාවට මෙම අභියෝගාත්මක කාලවලදී සහය ලබා දීම සහතික කිරීම සඳහා අවශ්‍ය පරිදි තත්ත්වය සක්‍රීයව නියාමනය කර අපගේ ප්‍රතිචාරය අනුගත කිරීම දිගටම කරගෙන යයි.

මෙහෙයුම් සන්දර්භය යටතේ අප හඳුනාගත් ප්‍රධාන ප්‍රවණතා පහ යටතේ අපගේ ප්‍රමාණාත්මක කරුණු පහත දක්වා ඇති පරිදි වර්ග කර ඇත.

2023 දී ප්‍රමාණාත්මක කරුණු (MM)

පහත රූප සටහන මගින් නිරූපණය කර ඇති පරිදිප්‍රමාණාත්මක ගැටළු ප්‍රධාන කුළුණු තුනක් යටතේ එනම් ජනතාව, ලාභය සහ මිහිතලය ලෙස කාණ්ඩගත කර ඇත, අපි එම කරුණු ප්‍රමුඛ කර ඇති අතර 47 පිටුවේ දක්වා ඇති ප්‍රමාණාත්මක අනුකෘතිය මත ඒවා ලකුණු කර ඇත.

ගෝලීය සහ දේශීය සමාජ-දේශපාලනික සහ ආර්ථික බිඳවැටීම්

ජනතාව | ලාභය | මිහිතලය

ආර්ථික, සමාජ සහ දේශපාලනික අවිනිශ්චිතතාව හමුවේ ව්‍යාපාර ඔරොත්තුදීම

ලාභය

මූල්‍ය ස්ථාවරත්වය සහ ලාභදායීතාව

ඩිජිටල් බැඳවැටීම් සහ වැඩි වූ තරඟය

ලාභය | මිහිතලය

ඩිජිටල් පරිනාමනය

නව්‍යකරණය හා කඩිසරකම

ජනතාව | ලාභය

ගනුදෙනුකාර සේවය සහ අත්දැකීම

කාලගුණ වෙනස සහ තිරසාරභාවය කළමනාකරණය කිරීම

මිහිතලය

අපගේ කාබන් පාසටහන කළමනාකරණය කිරීම

ජනතාව | මිහිතලය

වගකීමසහගත මූල්‍යකරණය

ජනවිකාශ වෙනස්වීම් සහ වෙනස්වන කාර්ය බහුල ලෝකය

ජනතාව

නිපුනතා සහ හැකියාවන්

සේවක වටිනාකම් කොටස

වැඩි වූ නියාමන පරීක්ෂාව

ජනතාව


පාලනය සහ අනුකූලතාව

සයිබර් තර්ජන සහ තොරතුරු ආරක්ෂාව

ජනතාව | ලාභය

මූල්‍ය අපරාධය

ප්‍රමාණාත්මකභාවය



රූපය 3 → ප්‍රමාණාත්මක අනුකෘතිය

අධ්‍යක්ෂ මණ්ඩලය සහ කමිටු ඔවුන්ගේ උත්සාහයන් කෙරෙහි අවධානය යොමු කරන අපගේ ප්‍රමාණාත්මක මාතෘකා තුළ ඇති විශේෂිත අවදානම් සහ අවස්ථා මෙම කොටසින් විස්තර කරයි. අපගේ පාර්ශ්වකරුවන්ට වටිනාකමක් නිර්මාණය කිරීමට හෝ කෙටි, මධ්‍ය කාලීන සහ දිගු කාලීන අපගේ උපාය මාර්ග ලබා දීමට අපට ඇති හැකියාවට බලපෑම් කළ හැකි පවතින සහ නැගී එන අවදානම් මුසුවක් එයට ඇතුළත් වේ.

අවදානම් වර්ගීකරණ:



කාල රාමුව:

එක් එක් ප්‍රධාන බාහිර සාධක සඳහා, බැංකුව වෙත සැලකිය යුතු ලෙස බලපානු ඇතැයි අප තක්සේරු කරන කාල රාමුව අපි දක්වන්නෙමු. මෙම ඒකාබද්ධ වාර්තාව සඳහා, කෙටි කාලීන යනු ඊළඟ මූල්‍ය වර්ෂය (2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන), මධ්‍ය කාලීන යනු 2026 දෙසැම්බර් 31 දක්වා කාලසීමාව වන අතර දිගුකාලය 2023 දෙසැම්බර්වලින් ඉදිරියට වේ.

වාර්ෂික වෙනස්වීම්:

වැඩිකල/මතුවන/ස්ථාවර/අඩුකළ

අපගේ වටිනාකම් දාමයට ප්‍රමාණාත්මක කරුණු අනුරූපනය

ප්‍රමාණාත්මක කරුණු	ඉහළ ස්ථරය (සැපයුම්කරුවන්, ආයෝජකයින්, නියාමන ආයතන)	බැංකු මෙහෙයුම්	පහළ ස්ථරය (ගනුදෙනුකරුවන් සේවකයින්, සමාජය හා පරිසරය)
1. ආර්ථික,සමාජ හා දේශපාලන අවිනිශ්චිතතා හමුවේ ව්‍යාපාර ඔරොත්තු දීම	✓	✓	✓
2. මූල්‍ය ස්ථාවරත්වය සහ ලාභදායිතාව	✓	✓	✓
3. නිපුනතා සහ හැකියාවන්		✓	✓
4. සේවක වටිනාකම් කොටස			✓
5. ඩිජිටල් පරිනාමනය	✓	✓	✓
6. නව්‍යකරණය සහ කඩිසරකම	✓	✓	
7. ගනුදෙනුකාර සේවය සහ අත්දැකීම		✓	✓
8. පාලනය සහ අනුකූලතාව	✓	✓	
9. සයිබර් තර්ජන සහ තොරතුරු ආරක්ෂාව	✓	✓	✓
10. මූල්‍ය අපරාධය	✓	✓	✓
11. අපගේ කාබන් පාසටහන කළමනාකරණය		✓	✓
12. වගකීම් සහගත මූල්‍යකරණය	✓	✓	

වගුව 2 →

1. GRI 201 ආර්ථික කාර්යසාධනය
2. GRI 202 වෙළෙඳපොල පැවැත්ම
3. GRI 203 වක්‍ර ආර්ථික බලපෑම්
4. GRI 204 ප්‍රසම්පාදන ව්‍යවහාර
5. GRI 205 දූෂණ -විරෝධය
6. GRI 206 දූෂණ -තරඟකාරී හැසිරීම
7. GRI 302 බලශක්තිය
8. GRI 303 ජලය සහ අපජලය
9. GRI 401 රැකියා නියුක්තය
10. GRI 403 වෘත්තීමය සෞඛ්‍ය සහ ආරක්ෂාව
11. GRI 404 පුහුණු සහ ආරක්ෂාව
12. GRI 405 විවිධත්වය හා සමාන අවස්ථාව
13. GRI 406 වෙනස් ලෙස නොසැලකීම
14. GRI 413 දේශීය ප්‍රජාවන්
15. GRI 417 අලෙවිකරණය සහ ලේබල්කරණය
16. GRI 418 ගනුදෙනුකාර රහස්‍යතාවය

ප්‍රමාණාත්මකභාවය

MM 1 ආර්ථික, සමාජ හා දේශපාලනික අවිනිශ්චිතතාවන් හමුවේ ව්‍යාපාරයේ ඔරොත්තු දීම

සංදර්භය/විස්තරය

භූ දේශපාලනය සහ ඒ ආශ්‍රිත අස්ථාවරත්වය, රටේ ආර්ථික, සමාජීය සහ දේශපාලන වාතාවරණය තුළ ඇති සංකීර්ණත්වය සහ අපැහැදිලි බව නිසා සමාජීය හා ආර්ථික වශයෙන් බිඳවැටීම් තත්ත්වයන් ඇති කළ හැකි අතර, ප්‍රවණතා වේගවත් කරමින්, හා ව්‍යුහාත්මක ගැටළු ඉස්මතු කරමින් මෙහෙයුම් සන්දර්භය සැලකිය යුතු ලෙස වෙනස් කරයි.

එය වැදගත්වන ආකාරය

ඕනෑම ප්‍රධාන ආර්ථික, සමාජීය සහ දේශපාලන බිඳවැටීමක ප්‍රතිඵලයක් ලෙස අපගේ ලාභදායීතාවයට සහ මුදල් ප්‍රවාහ උත්පාදනයට බලපෑම් කරමින් අපගේ නිෂ්පාදන සහ සේවා සඳහා ඇති ඉල්ලුම අඩුවීමට සහ අපගේ ගනුදෙනුකරුවන් ක්‍රය ශක්තිය අඩුවීමට හේතු වේ. එය තරඟකාරිත්වයේ මට්ටම ආරක්ෂා කර ගැනීමට සහ අඛණ්ඩ සේවාව, විචක්ෂණශීලී අවදානම් කළමනාකරණය සහ ශක්තිමත් ප්‍රාග්ධන තත්වය තුළින් බැංකුවේ විශ්වසනීයත්වය තහවුරු කිරීමට අපට බල කරයි.

වාර්ෂික වෙනස්වීම

වැඩිවිය

වෙනස සඳහා හේතුව

ආර්ථිකය හැකිලීම, ඉහළ විරැකියා මට්ටම්, මුදල් අස්ථාවරත්වය, ඉහළ යන ද්‍රව්‍යශීලතා පීඩනය, වැඩි වූ සමාජ නොසන්සුන්තාව, ඉහළ පරිපාලන වියදම්, උද්ධමනය සහ සාර්ව ආර්ථික මූලධර්ම දුර්වල වීම වැනි සාධක වර්ධනයට හා ආයෝජනයට බාධා කරන අතර එමඟින් ණය දීම සඳහා ඇති ඉල්ලුම අඩු කිරීම, ව්‍යාපාර කිරීමේ පිරිවැය සහ ගනුදෙනුකාර හැරීම් සඳහා ඇති හැකියාව වැඩි කරයි.

කළමනාකරණ ප්‍රවේශය

- අපි ආර්ථිකය, අංශ-විශේෂිත, කලාපීය සහ ගෝලීය දේශපාලන සිදුවීම් ඇතුළුව දේශීය සහ ගෝලීය තත්ත්වයන් නියාමනය කරමු.
- ක්‍රියාකාරී අවදානම් කළමනාකරණ උපාය මාර්ග හරහා බාහිර හා අභ්‍යන්තර බාධකවලින් පැන නගින උපායමාර්ගික, ක්‍රියාත්මක කිරීම් සහ ව්‍යාපාරික අවදානම් අපි අවම කරමු.
- නම්‍යතාවය පවත්වා ගැනීම, උපාය මාර්ග වලට අනුගතවීම,ප්‍රග්ධන ප්‍රමුඛතාවයන් මෙහෙයුම් සන්ධර්භයට අනුව වෙනස් කිරීම යන කාර්යන් සඳහා ආයතනික සැලසුම්කරණය සහ අයවැය ක්‍රියාවලිය තුල අපි සහභාගි වන්නෙමු.
- පවතින තත්ත්වයන්ට ඔරොත්තු දීමට සහ අනාගත විභව අවස්ථාවලට අනුවර්තනය වීමට අපි මූලික සන්ධර්භයන් ස්ථානගත කරමු.
- පවතින අවස්ථා සැලසුම් කිරීම මගින් සහාය ලබන උපාය මාර්ගික අරමුණු සමඟ අපගේ අවධානයට ලක් වූ සහ තෝරාගත් ආයෝජන උපාය මාර්ග.
- අපි රජය, ප්‍රජාවන් සහ පාරිභෝගිකයන් සමඟ ක්‍රියාකාරීව සම්බන්ධ වී ආර්ථික දුෂ්කරතා මඟහරවා ගැනීමේ මූලපිරීම්වලට සහාය වන්නෙමු.
- අපි උපායමාර්ගික සහ විශාල වෙනස්වීම් ව්‍යාපෘති නිසියාකාරව විෂයගතකර, සම්පූර්ණයෙන් ධාරිතාගතකර ස්වාධීන තත්ත්ව සහතිකය ඇතුළුව ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්ව අධීක්ෂණය හරහා සමීපව නියාමනය කරනු ලබන බව සහතික කරමු.
- අපි 2024 සහ ඉන් ඔබ්බට ඉදිරියට ප්‍රතිචාර වශයෙන් අවදානම් අභිරුචිය සැකසීම සඳහා ගතික ප්‍රවේශයක් පවත්වාගෙන යන්නෙමු.

ප්‍රමාණාත්මක කරුණු අප කළමනාකරණය කරන ආකාරය

වැඩිදුර බැලීම: සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීගේ පණිවිඩය පිටුව 18, කාබනික වර්ධනය ප්‍රවර්ධනය පිටුව 75, මූල්‍ය ප්‍රාග්ධනය පිටුව 95.

අවදානම් වර්ගය

Risk 1 Risk 3 Risk 4 Risk 5

බලපානලද ප්‍රාග්ධනය

බලපාන ලද කෙටිකාලයේ සිට මධ්‍ය කාලීන උපායමාර්ගික ප්‍රමුඛතා

ඇල්මැති පාර්ශ්වකරුවන්

අදාළ GRI සහ සීමාව

GRI 201 ආර්ථික කාර්යසාධනය - අභ්‍යන්තර හා බාහිර

GRI 202 වෙළඳපොල පැවැත්ම

GRI 203 වක්‍ර ආර්ථික බලපෑම් - බාහිර

බලපාන මූලික UN SDGs

1 NO POVERTY
8 DECENT WORK AND ECONOMIC GROWTH
9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE
11 SUSTAINABLE CITIES AND COMMUNITIES
12 RESPONSIBLE CONSUMPTION AND PRODUCTION

බලපාන ලද ද්විතියික UN SDGs

2 ZERO HUNGER

කාල රාමුව

කෙටි කාලයේ සිට මධ්‍ය කාලය දක්වා

ප්‍රමාණාත්මකභාවය

MM 2 මූල්‍ය ස්ථාවරත්වය සහ ලාභදායිතාව

සංදර්භය/විස්තරය

ආර්ථික හා මූල්‍ය කැලඹීම් වලදී අපගේ මූල්‍ය ශක්තිය ආරක්ෂා කර ගැනීම සහ ප්‍රති-චක්‍රීය භූමිකාවක් ඉටුකිරීම.

එය වැදගත්වන ආකාරය

මූල්‍ය ස්ථාවරත්වය සහ ලාභදායිතාව අපගේ පාර්ශ්වකරුවන් සඳහා වටිනාකමක් ඇති කිරීමට සහ කෙටි, මධ්‍ය කාලීන සහ දිගු කාලීන අපගේ ව්‍යාපාරය වර්ධනය කිරීමේ ප්‍රධාන සක්‍රීය කරන්නන් ලෙස සැලකේ.

වාර්ෂික වෙනස්වීම

වැඩිවිය

වෙනස සඳහා හේතුව

- කාලය සමඟ වත්කම්වල මිල වෙනස්වීම් (හුවමාරු අනුපාත, පොලී අනුපාත, දේපල සහ ස්කන්ධය - කොටසක් අවිනිශ්චිතතාව හේතුවෙන් - ඉලක්කගත වර්ධනය සහ ද්‍රවශීල මට්ටම් අත්කර ගැනීමට අපට ඇති හැකියාවට අහිතකර බලපෑම සහ එය වත්කම්වල අඩුවීමකට හේතු විය හැක.
- වත්කම් මිලෙහි අස්ථාවරත්වය වැඩිවීම, ප්‍රතිමිලකරණ අවදානම හේතුවෙන් වත්කම්වල ඉපැයීමේ හැකියාව කෙරෙහි බලපෑමක් ඇති කිරීමට ඉඩ ඇත.
- ස්කන්ධය තුල ආයෝජනවල මිල, ස්ථාවර ආදායම (රාජ්‍ය සුරැකුම්පත්වල තැන්පත් කර ඇති මුදලින් 60%ක් ආයෝජනය කිරීම) සහ මුදල් වෙළෙඳපොළ කළඹ වැඩි වූ ප්‍රතිමූල්‍යකරණ අවදානමත් සමඟ අඩු වී ඇත.
- නිශ්චල වෙළෙඳපොල වර්ධනය හේතුවෙන් ආදායම් උත්පාදනය කෙරෙහි බලපෑම.
- උද්ධමන තත්ත්වයන් වැඩි වීම හේතුවෙන් මෙහෙයුම් සහ අනෙකුත් වියදම් වැඩි වීම.
- ගනුදෙනුකරුවන්ගේ ගෙවීම් පැහැර හැරීම සහ ගනුදෙනුකරුවන් ව්‍යාපාර බේරා ගැනීමට යාම හේතුවෙන් ඉහළ ණය නිරාවරණය.
- වඩා අඩු ආදායම් විවිධාංගීකරණය සහ ඉහළ ප්‍රතිමූල්‍ය අවදානම්.
- ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනවල තක්සේරු කිරීම් සහ ණය මූල්‍යකරණය කෙරෙහි ඒවායේ බලපෑම.

කළමනාකරණ ප්‍රවේශය

- උඅපට දැඩි හා ගතානුගතික ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාවය සහ ද්‍රවශීලතා කළමනාකරණය ඇත.
- අපට වැඩ කිරීමේ මාර්ගවල තිරසාර පිරිවැය-සම්පීඩන ක්‍රියාමාර්ග සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව ඇත.
- අපි අයවැයකරණය, පුරෝකථනය කිරීම සහ ක්‍රමවේද විශ්ලේෂණ ක්‍රියාවලීන් පරීක්ෂා කරන්නෙමු.
- අපි ගතානුගතික කළඹ විවිධාංගීකරණය හරහා විවිධාංගීකරණය වූ ආදායම් මාර්ගවල ශක්‍යතා අධ්‍යයනයන් සිදු කරන්නෙමු.
- සියලුම ආයෝජන සඳහා අපි ණය අවදානම් තක්සේරුව සහ අබණ්ඩතා නිසි සම්ප්‍රජන්‍ය පවත්වමු.
- ආදායම් උත්පාදන හිඟ පරතරය පියවීම සඳහා අපට නව ව්‍යාපාර සංවර්ධන මුලපිරීම් ඇත.
- අපට අබණ්ඩ කාරක ප්‍රාග්ධන කළමනාකරණයක් ඇත. (ණයගැතියන් සහ ණය හිමියන් කළමනාකරණය, ඉහළ ණය නිරාවරණ සහිත ගනුදෙනුකරුවන් නියාමනය).
- විවිධ ක්‍රියාදාම හරහා ප්‍රතිලාභ ලබා දිය හැකි සමබර කළඹක් තබාගනිමින් අපි අපගේ ශේෂ පත්‍රය ශක්තිමත් කරමු.

ප්‍රමාණාත්මක කරුණු අප කළමනාකරණය කරන ආකාරය

වැඩිදුර බැලීම: සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීගේ පණිවිඩය පිටුව 18, කාබනික වර්ධනය ප්‍රවර්ධනය පිටුව 75, මූල්‍ය ප්‍රාග්ධනය පිටුව 95.

අවදානම් වර්ගය

Risk 1 Risk 3 Risk 4 Risk 5

බලපානලද ප්‍රාග්ධනය

බලපාන ලද කෙටිකාලයේ සිට මධ්‍ය කාලීන උපායමාර්ගික ප්‍රමුඛතා

ඇල්මැති පාර්ශ්වකරුවන්

අදාළ GRI සහ සීමාව

GRI 201 ආර්ථික කාර්යසාධනය - අභ්‍යන්තර හා බාහිර

GRI 202 වෙළඳපොල පැවැත්ම

GRI 203 වක්‍ර ආර්ථික බලපෑම් - බාහිර

බලපාන මූලික UN SDGs

1 NO POVERTY
8 DECENT WORK AND ECONOMIC GROWTH
9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE
11 SUSTAINABLE CITIES AND COMMUNITIES
12 RESPONSIBLE CONSUMPTION AND PRODUCTION

බලපාන ලද ද්විතියික UN SDGss

2 ZERO HUNGER

කාල රාමුව

කෙටි කාලයේ සිට මධ්‍ය කාලය දක්වා

ප්‍රමාණාත්මකභාවය

MM 3 නිපුනතා සහ හැකියාවන්

සංදර්භය/විස්තරය

නව තාක්ෂණයන්හි ප්‍රගතිය, සාර්ව ආර්ථික තත්ත්වයන් වෙනස් කිරීම සහ නියාමන අපේක්ෂාවන් වැඩි කිරීම, පාර්ශ්වකරුවන් විසින් අපේක්ෂා කරන කාර්ය සාධනය ලබා දීම සඳහා නව සහ විවිධ කුසලතා රාමු මෙන්ම ගැඹුරු බැංකුකරණ විශේෂඥතාවක් ඇති සේවකයන්ගේ අවශ්‍යතාව ඇති කරයි.

එය වැදගත්වන ආකාරය

අපගේ උපාය මාර්ගයේ සාර්ථකත්වයට සහ නොහැකියාවට අපගේ සේවකයින් ඉතා තීරණාත්මකය. නිවැරදි දක්ෂතා සහ හැකියාවන් ආකර්ෂණය කර ගැනීමට හෝ රඳවා ගැනීමට නොහැකියාව අපගේ දිගු කාලීන අරමුණු ලබාදීමෙන් අපව වළක්වා ගත හැකිය. විශේෂයෙන් බැංකුකරණයේ සෘජුව තරඟ කිරීමට ඉලක්ක කරන සම්ප්‍රදායික නොවන තාක්ෂණ තරඟකරුවන් බිහිවීමත් සමඟ මෙම කුසලතා ආකර්ෂණය කර ගැනීම සහ රඳවා ගැනීම වඩාත් අපහසු විය හැකිය.

වාර්ෂික වෙනස්වීම

වැඩි විය

වෙනස සඳහා හේතුව

- 4 වන කාර්මික විප්ලවයේ ව්‍යාපාර ආකෘතිවලට සම්පූර්ණයෙන්ම ප්‍රතිචාර දැක්වීමට ප්‍රමාණවත් නොවන කුසලතා සහ නිපුණතා නොමැති වීමේ අවදානම.
- දිගුකාලීන ව්‍යාපාර තිරසාරත්වය.
- ව්‍යාපාර සහ වෙළෙඳපොල වර්ධනය

කළමනාකරණ ප්‍රවේශය

- ජ්‍යේෂ්ඨ කළමනාකරණය ඇතුළු පගේ සේවකයින් සංවර්ධනය කිරීම සඳහා අපට ඉලක්ක කරගත් පුහුණු වැඩසටහන් ඇත.
- අපගේ දක්ෂ සහ ව්‍යක්තීය ප්‍රවේශය මඟින් අපගේ සේවකයින්ගේ විශේෂඥතාවය, හැකියාවන් සහ අභිලාෂයන් හඳුනා ගනිමින් ව්‍යක්තීය අවස්ථා පිරි නමමින් උසස් හැකියාව ඇති සේවකින් ආකර්ෂණය කර රඳවාගැනීමට උත්සාහ දරයි.
- අපගේ සේවකයින්ගේ හැකියාවන් වර්ධනය කිරීමට සහ බැංකුව පුරා සංස්කෘතික හා චර්යාත්මක වෙනස්කම් ඇති කිරීමට අවශ්‍ය කුසලතා සහ ප්‍රවේශයන්ගෙන් ඔවුන් සන්නද්ධ කිරීමට අපි මූලපිරීම් සකස් කර ඇත.
- අපගේ සේවකයින් අනාගතයේ ශ්‍රම බලකායට සුදානම් කිරීම සඳහා ඔවුන්ව නැවත පුහුණු කිරීම සහ ඔවුන්ව සහයවීමට අවස්ථාවන් කරා අපි ඔවුන් ගෙන යන්නෙමු.
- තථ්‍ය ඉගෙනුම් සහ පුහුණු විසඳුම් ඇතුළුව සේවකයින්ගේ කාර්යභාරයන්ට සහ පුද්ගලික සංවර්ධන අවශ්‍යතාවලට අනුකූලව පුහුණු සහ සංවර්ධන මූලපිරීම් අප සතුව ඇත.

ප්‍රමාණාත්මක කරුණු අප කළමනාකරණය කරන ආකාරය

වැඩිදුර බැලීම: සේවක සහභාගිත්වය වැඩි කිරීම පිටුව 71, මානව ප්‍රාග්ධනය පිටුව 124

අවදානම් වර්ගය

Risk 1 Risk 2 Risk 3 Risk 7

බලපානලද ප්‍රාග්ධනය

බලපාන ලද කෙටිකාලයේ සිට මධ්‍ය කාලීන උපායමාර්ගික ප්‍රමුඛතා

ඇල්මැති පාර්ශ්වකරුවන්

අදාළ GRI සහ සීමාව

GRI 401 සේවානියුක්තිය - අභ්‍යන්තර

GRI 404 පුහුණුව සහ අධ්‍යාපනය - අභ්‍යන්තර

බලපාන මූලික UN SDGs

4 QUALITY EDUCATION
5 GENDER EQUALITY
8 DECENT WORK AND ECONOMIC GROWTH
11 SUSTAINABLE CITIES AND COMMUNITIES

බලපාන ලද ද්විතියික UN SDGs

2 ZERO HUNGER

කාල රාමුව

කෙටි කාලයේ සිට දිගුකාලය දක්වා

ප්‍රමාණාත්මකභාවය

MM 4 සේවක වටිනාකම් කොටස

සංදර්භය/විස්තරය

වත්මන් සහ අනාගත ව්‍යාපාරික අවශ්‍යතා සඳහා කුසලතා ආකර්ෂණය කර රඳවා ගැනීමට පහසුකම් සැලසෙන, අපගේ වටිනාකම් සහ ආචාර ධර්ම තුළ නැංගුරම් ලා ඇති ඉහළ කාර්යසාධන සංස්කෘතියක් පවත්වාගෙන යන, ඉහළ සේවක සහභාගිත්වය සහ ඉහළ ඵලදායිතාවක් පවත්වාගන්නා, විවිධත්වය සහ සියල්ල ඇතුළත් කිරීම සහතික කරන, යහපත් ආයතනික වෙනස්කම් කළමනාකරණය කරන සහ යහපත් කම්කරු සබඳතා (කම්කරු ක්‍රියා සහ බිඳවැටීම්)සඳහා පහසුකම් සලසන ආකර්ෂණීය සේවක වටිනාකම් කොටසක් පිරිනැමීමට අපට ඇති හැකියාව හා සම්බන්ධ අවදානම් ඇතුලත්ය.

එය වැදගත්වන ආකාරය

අපගේ හැකියාව ඉහළ නැංවීම සඳහා හිතකර පරිසරයක ක්‍රියාත්මක වන ජයග්‍රාහී කණ්ඩායමක් සංවර්ධනය කිරීම, හවුල් වටිනාකමක් අඛණ්ඩව නිර්මාණය කිරීම සහ අපගේ ව්‍යාපාරික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අපගේ උපාය මාර්ග කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා ඉතා තීරණාත්මකය.

වාර්ෂික වෙනස්වීම

වැඩි විය

වෙනස සඳහා හේතුව

- මානසික, කායික, අධ්‍යාත්මික, බුද්ධිමය සහ මූල්‍ය දර්ශනයන්ගෙන් සේවක යහපැවැත්ම සඳහා සාකල්‍ය ප්‍රවේශයක් යොදා ගැනීම (මානසික සෞඛ්‍ය සඳහා අවශ්‍යතාව වැඩිවීම, නම්‍යශීලි වැඩකරන රටා, වැඩ-ජීවිත තුළනය, යහපැවැත්මේ සම්ප්‍රධායික නොවන ආකාරයෙන් පීඩන කළමනාකරණය, සිහිකල්පනාව හෝ මූල්‍ය ශුභසාධනය)
- කොවිඩ් 19ත් පසු දුරස්ථ වැඩ සහ නම්‍යශීලී වැඩ සූදානම් කිරීමේ ප්‍රවනතාව වැඩි වී ඇත.
- සංස්කෘති පරිනාමන ගමනක් සහ වෙනස කළමනාකරණය වැඩසටහනක අවශ්‍යතාව.

කළමනාකරණ ප්‍රවේශය

- අපි තරඟකාරී පාරිශ්‍රමික, ප්‍රදාන සහ ප්‍රතිලාභ රාමු සහ ප්‍රතිපත්ති ශුභසාධන වැඩසටහන් පිරිනැමීම තුළින් අපගේ වටිනාකම් කොටස තුළ අඛණ්ඩව ආයෝජනය කරමු.
- සියලු දෙනා ඇතුළත් විවිධ ශ්‍රමබලකායක් අපි පෝෂණය කරමු
- සේවක සහභාගිත්වය පිළිබඳ අපගේ උපායමාර්ගික පරමාර්ථවලට සහයවන බව සහතික කිරීමට බැංකුවේ පාරිශ්‍රමික රාමුව අඛණ්ඩව අපි තවදුරටත් සමාලෝචනය කරමු.
නවෝත්පාදන සංස්කෘතියක් පෝෂණය කිරීම සහ ඵලදායී අවදානම් කළමනාකරණ පිළිවෙත් පවත්වාගෙන යාම අතර නිවැරදි සමතුලිතතාවය සොයා ගැනීම සඳහා අවදානම් රුචිය, අවදානම් තක්සේරු කිරීමේ නිර්ණායක සහ අසාර්ථකත්වය සඳහා දරාගැනීමේ සීමාව අනුව තුලනය කිරීම අවශ්‍ය වේ.

පවතින සම්පත් මත බලපෑම (ප්‍රාග්ධන)



අවදානම් සංස්කෘතිය ශක්තිමත් කිරීම සහ බැංකුවේ කීර්තිය සහ නෛතික තත්ත්වය පවත්වා ගැනීම සඳහා නියාමන අනුකූලතා අවශ්‍යතා සපුරාලීම අත්‍යවශ්‍ය වුවද, දැඩි අනුකූලතා ප්‍රමිති ව්‍යාපාරික අරමුණු, පාරිභෝගික අවශ්‍යතා හෝ වෙළඳපොළ අවස්ථා සමඟ ගැටීමට හැකිය.

පවතින සම්පත් මත බලපෑම (ප්‍රාග්ධන)



උපාය මාර්ගය සහ සම්පත් වෙන් කිරීම

අප ඉටු කළ ආකාරය

උපායමාර්ගික අරමුණ	2023 සඳහා ප්‍රමුඛතා	ප්‍රධාන බෙදා හැරීම්	තත්ත්වය	සත්‍ය		අදහස්
				2023	2022	
	සයිබර් ආරක්ෂාව	PCI DSS සහතික නඩත්තු කිරීම	✓	නඩත්තු කර ඇත	නඩත්තු කර ඇත	
	ශක්තිමත් ප්‍රාග්ධන ප්‍රමාණතා මට්ටම් පවත්වා ගැනීම	BASEL III CAR සමඟ අනුකූල වීම අවශ්‍යතා ස්ථරය	✓	**16.91%**	15.8%	
		BASEL III CAR සමඟ අනුකූල වීම අවශ්‍ය මුළු ප්‍රාග්ධනය	✓	**19.26%**	18%	
	මූල්‍ය අපරාධ අනුකූලතාව	නව AML පද්ධතියක් සහ පිරික්සුම් මොඩියුලයක් ප්‍රසම්පාදනය	✓	ප්‍රසම්පාදනය කර ඇත	ප්‍රසම්පාදනය අවසන් කර ඇත	
	අනුකූල නොවීම ශුන්‍ය ඉවසීම	නියාමන දඩ හෝ දඬුවම් (රු. මිලි.)	✓	නොමැත	0.8	
	ණය අවදානම කළමනාකරණය කිරීම	ශුද්ධ අදියර 3 මුලු ණය වල ප්‍රතිශතයක් ලෙස	✓	**2.4%**	2.8%	

වගුව 6 →

✓ නිර්මාණය කරන ලද අගය ✕ බාදනය වූ අගය − සුරැකි අගය

ඉදිරිය බැලීම

- අපි ආර්ථික, නියාමන, තාක්ෂණික හෝ භූ දේශපාලනික භූ දර්ශනයේ වෙනස්වීම්, කර්මාන්ත ප්‍රවණතා, වෙළඳපොළ වර්ධනයන් සහ මතුවෙමින් පවතින තර්ජන කල්තියා හඳුනාගෙන ඒවා අවම කිරීම සඳහා මතුවන තර්ජනවලින් මතුවිය හැකි අවදානම් අපේක්ෂා කර තක්සේරු කරමු.
- අවදානම් කළමනාකරණ රාමුව, ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි යාවත්කාලීන කර ඇති බව සහතික කරමින්, බැංකුවේ අවදානම් කළමනාකරණ පිළිවෙත් සහ වගකීම් කෙරෙහි බලපෑ හැකි නියාමන වෙනස්කම් සහ විකාශනය වන අනුකූලතා අවශ්‍යතා නිරීක්ෂණය කිරීමේ
- නවතම නියාමන වර්ධනයන් සහ කර්මාන්තයේ හොඳම භාවිතයන් පිළිබිඹු කිරීමට දිගටම කරගෙන යමු.
- අවදානම් ඵලදායී ලෙස හඳුනා ගැනීමට, තක්සේරු කිරීමට, සහ අවම කිරීමට බැංකුවට ඇති හැකියාව වැඩිදියුණු කිරීම සඳහා අවදානම් කළමනාකරණ මෙවලම් සහ පද්ධතිවල
- තාක්ෂණික දියුණුව සහ නවෝත්පාදන ලබා ගනිමු. අවදානම් අධීක්ෂණය, ආකෘති නිර්මාණය සහ තීරණ ගැනීමේ ක්‍රියාවලීන් වැඩිදියුණු කිරීම සඳහා දත්ත විශ්ලේෂණ, කෘතිම බුද්ධිය සහ ස්වයංක්‍රියකරණ තාක්ෂණ උත්තෝලනය කිරීම මෙයට ඇතුළත් වේ.

අපේක්ෂිත ප්‍රතිඵල


- අවදානම් කල්තියා හඳුනාගෙන ඒවාට පිළියම් යෙදීමෙන්, බැංකුව සිය මෙහෙයුම්වලට සහ කීර්තියට බලපෑම් කළ හැකි අහිතකර සිදුවීම්වල සම්භාවිතාව සහ බරපතලකම අවම කරයි.
- අවදානම් ඇඟවුම් සලකන සහ බැංකුවේ අවදානම් රුචිය උපායමාර්ගික අරමුණු සමඟ සමපාත වන දැනුවත් තීරණ ගැනීම.
- අභිප්‍රේරිත සහ ඔරොත්තු දෙන ශ්‍රම බලකායකට දායක වන සේවක තෘප්තිය, පක්ෂපාතිත්වය සහ රැඳී සිටීම පෝෂණය කිරීම.

උපාය මාර්ගය සහ සම්පත් වෙන් කිරීම

4

කාබනික වර්ධනය ප්‍රවර්ධනය කිරීම

අපි වර්ධනය නිර්මාණය කරමු



කාබනික වර්ධනය ප්‍රවර්ධනය කරන්නේ ඇයි?

NSB හි, කාබනික වර්ධනය ප්‍රවර්ධනය කිරීම නවීන මූල්‍ය ක්ෂේත්‍රයේ අභියෝගවල සැරිසැරීමට හැකි ඔරොත්තු දෙන, පාරිභෝගික කේන්ද්‍රය සහ තරඟකාරී මූල්‍ය ආයතනයක් ගොඩනැගීම සඳහා වූ පුළුල් ප්‍රවේශයකි

අප අපේ සම්පත් වෙන් කරන ආකාරය

නවෝත්පාදන, පාරිභෝගික සබඳතා, මෙහෙයුම් විශිෂ්ටත්වය සහ අවදානම් කළමනාකරණය සඳහා තිරසාර වටිනාකමක් නිර්මාණය කිරීම සහ තරඟකාරී වාසි සඳහා දිගුකාලීන ආයෝජන සමඟ කෙටි කාලීන ප්‍රතිලාභ සමතුලිත කිරීම මගින් අවදානම් ගැලපුම් ප්‍රතිලාභ කෙරෙහි අපි උපායශීලීව අවධානය යොමු කරමු.

අදාළ වැදගත් කරුණු



යෙදූ ප්‍රාග්ධනය



වැදගත් අවදානම්වලට සබැඳිය



ප්‍රාථමික UN SDGs



ද්විතියික UN SDGs



ප්‍රධාන තුලන

කාබනික වර්ධනයක් ලුහුබැඳීම සඳහා නව වෙළඳපොළ වෙත ව්‍යාප්ත වීම සහ නව නිෂ්පාදන සංවර්ධනය කිරීම වැනි අවදානම් අපේක්ෂා කිරීම අවශ්‍ය වේ, එය අවිනිශ්චිත ප්‍රතිඵලවලට තුඩු දිය හැකි අතර බැංකුවේ මූල්‍ය ක්‍රියාකාරිත්වයට බලපෑම් කළ හැකි ය.

පවතින සම්පත් මත බලපෑම (ප්‍රාග්ධන)



සමහර කාබනික වර්ධන උපාය මාර්ග සඳහා කෙටි කාලීන මූල්‍ය පීඩනයකට තුඩු දෙන ප්‍රතිඵල ලබා දීමට කාලය ගතවන සැලකිය යුතු පෙර ආයෝජන අවශ්‍ය වේ.

පවතින සම්පත් මත බලපෑම (ප්‍රාග්ධන)



කාබනික වර්ධන මූලපිරීම්වලට සහාය වීම අවදානම් කළමනාකරණය, අනුකූලතාවය හෝ මෙහෙයුම් කාර්යක්ෂමතාව වැනි බැංකුවේ අනෙකුත් ක්ෂේත්‍රවලින් සම්පත් හරවයි.ග

පවතින සම්පත් මත බලපෑම (ප්‍රාග්ධන)



කාබනික වර්ධනයක් ඇති කිරීම සඳහා නවෝත්පාදන සඳහා ආයෝජනය කිරීම අවිනිශ්චිතභාවය හඳුන්වා දිය හැකි අතර පවත්නා ව්‍යාපාරික ක්‍රියාවලි කඩාකප්පල් කළ හැකිය, එය බැංකුවේ ස්ථාවරත්වයට සහ මෙහෙයුම් කාර්යක්ෂමතාවයට බලපෑම් කළ හැකිය.

පවතින සම්පත් මත බලපෑම (ප්‍රාග්ධන)



කාබනික වර්ධනයක් ඇති කිරීම සඳහා පාරිභෝගික අත්දැකීම් වැඩිදියුණු කිරීම සඳහා තාක්ෂණය, පිරිස් සහ යටිතල පහසුකම් සඳහා ආයෝජන අවශ්‍ය වන අතර බැංකුව සඳහා පිරිවැය වැඩි කිරීම අවශ්‍ය වේ.

පවතින සම්පත් මත බලපෑම (ප්‍රාග්ධන)



උපාය මාර්ගය සහ සම්පත් වෙන් කිරීම

අප ඉටුකළ ආකාරය

උපායමාර්ගික අරමුණ	2023 සඳහා ප්‍රමුඛතා	ප්‍රධාන කෙඳා හැරීම්	තත්ත්වය	සත්‍ය 2023	සත්‍ය 2022	අදහස්
	වර්ධනය මූලික ක්ෂේත්‍රය	තැන්පතු වර්ධනය බැංකු ක්ෂේත්‍රයේ NSB	✗	**8.7%** **0.4%**	18.8% 3.4%	
		වර්ධනය ණය දීම බැංකු ක්ෂේත්‍රයේ NSB	✗	**(2.6%)** **(4.8%)**	5.5% 2.6%	
	වෙළඳපොළ කොටස රඳවා තබා ගැනීම.	තැන්පතු වෙළඳපොළ කොටස රඳවා ගැනීම.	✗	**8.6%**	9.2%	
	අඩු කිරීම පිරිවැය	පිරිවැය ආදායම් අනුපාතය	✗	**71.6%**	62.9%	
	කොටස් හිමියන්ගේ අගය වැඩි කිරීම	වැඩිදියුණු කිරීම කොටස් හිමියා කොටස්හිමි අගය ලාභ ROE ඉලක්කය ඉහළ නැංවීමෙන්	✓	**9.4%**	3.4%	

වගුව 7

✓ නිර්මාණය කරන ලද අගය ✗ බාදනය වූ අගය − සුරැකි අගය



ඉදිරිය බැලීම

- බැංකුකරණයේ අනාගතය හැඩගස්වා ගැනීමට ඉඩ ඇති නැඟී එන තාක්ෂණ (කෘත්‍රිම බුද්ධිය, බ්ලොක්චේන්, ඉන්ටර්නෙට් ඔෆ් තින්ග්ස් (IoT) සහ ක්වොන්ටම් පරිගණක වැනි), බැංකුවට වාසිදායක ලෙස ලබා ගත හැකි ආකාරය අපේක්ෂා කිරීමට දැනුවත් වී සිටීම.
- නොගැළපෙන පාරිභෝගික අවශ්‍යතා සහ වේදනා ස්ථාන සම්බන්ධව කටයුතු කරන නව්‍ය නිෂ්පාදන සහ සේවා අදහස් කිරීමට, පරීක්ෂා කිරීමට සහ දියුණුත් කිරීමට හරස් ක්‍රියාකාරී සහයෝගීතාව, වේගවත් ක්‍රමවේද සහ සැලසුම් චින්තන මූලධර්ම දිරිමත් කිරීම.
- සයිබර් ආරක්ෂණ තර්ජන, භූ දේශපාලන අස්ථාවරත්වය සහ දේශගුණය ආශ්‍රිත අවදානම් වැනි අවදානම් හඳුනා ගැනීමට සහ අවම කිරීමට අවස්ථා සැලසුම් කිරීම, ආතතිය පරීක්ෂා කිරීම සහ ව්‍යාපාර අඛණ්ඩ අභ්‍යාස පැවැත්වීම.

අපේක්ෂිත ප්‍රතිඵල

- විකාශනය වන පාරිභෝගික අපේක්ෂා අපේක්ෂා කිරීමට සහ ඒවා සපුරාලීමට බැංකුවට හැකියාව ලබා දීම.
- නව වර්ධන අවස්ථා හඳුනා ගැනීම සහ තරඟකරුවන්ගෙන් බැංකුව විවේධාංගීකරණය කිරීම.
- කාර්යක්ෂමතාව සහ වේගවත් බව වැඩි දියුණු කිරීම සඳහා මෙහෙයුම් විධිමත් කිරීම, ක්‍රියාවලි ප්‍රගස්ත කිරීම සහ ස්වයංක්‍රීයකරණය උත්තේජනය කිරීම.
- පාර්ශ්වකරුවන් සඳහා දිගුකාලීන වටිනාකමක් ඇති කරන තිරසාර වර්ධන උපාය මාර්ග අනුගමනය කිරීම

උපාය මාර්ගය සහ සම්පත් වෙන් කිරීම

5

ඩිජිටල්කරණය වේගවත් කිරීම

මායිම් නොමැතිව ජාලකරණය



ඩිජිටල්කරණය වේගවත් කිරීම වැදගත් වන්නේ ඇයි?

ඩිජිටල් පරිවර්තනය යොදා ගැනීමෙන්, බැංකුවට පාරිභෝගික අත්දැකීම් වැඩිදියුණු කිරීමට, මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි කිරීමට, නවෝත්පාදනයන් පෝෂණය කිරීමට සහ සියලු පාර්ශ්වකරුවන් සඳහා තිරසාර වටිනාකමක් නිර්මාණය කිරීමට සහ ඩිජිටල් යුගයේ අදාළ, තරඟකාරී සහ ඔරොත්තු දීමේ හැකියාවක් ලැබෙනු ඇත.



අප අපගේ සම්පත් වෙන් කරන ආකාරය

අපි බැංකුවේ තාක්ෂණික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට සහ නවීකරණය කිරීමට සම්පත් වෙන් කරන්නෙමු, පරිමාණ කළ හැකි සහ ශක්තිමත් මූලික බැංකු පද්ධති, ඩිජිටල් වේදිකා, ක්ලවුඩ් කම්පියුටින් සහ දත්ත විශ්ලේෂණ මෙවලම් සඳහා ආයෝජනය කරමින් මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කරන ඩිජිටල් මූලපිරිමිවලට සහාය වන්නෙමු. අපි සයිබර් ආරක්ෂණ පියවර ශක්තිමත් කිරීමට සහ උසස් ආරක්ෂක තාක්ෂණ හරහා පාරිභෝගික දත්ත සයිබර් ආරක්ෂණ තර්ජන සහ වංචාවලින් ආරක්ෂා කිරීමට ද ආයෝජනය කරමු (එනම් සංකේතනය, ජෛවමිතික සත්‍යාපනය, සහ චර්යාත්මක විශ්ලේෂණ) මේවා ඩිජිටල් නාලිකා සහ යටිතල පහසුකම් ආරක්ෂා කිරීමට උපකාරී වේ.

අදාළ වැදගත් කරුණු



යෙදූ ප්‍රාග්ධනය



වැදගත් අවදානම්වලට සබැඳිය



ප්‍රාථමික UN SDGs



ද්විතියික UN SDGs



ප්‍රධාන තුලන

නවීන තාක්ෂණ සහ ඩිජිටල් විසඳුම් යොදා ගැනීමෙන් නව ආරක්ෂක අවදානම් සහ හානි ඇති විය හැකිය.

පවතින සම්පත් මත බලපෑම (ප්‍රාග්ධන)



තාක්ෂණික යටිතල පහසුකම් සහ කුසලතා ස්ථාපනය කිරීමට, වැඩිදියුණු කිරීමට සහ නඩත්තු කිරීමට සැලකිය යුතු ආයෝජන අවශ්‍ය වන බැවින් ඩිජිටල්කරණය වේගවත් කිරීම මූල්‍ය සම්පත් පීඩාවට පත් කළ හැකිය.

පවතින සම්පත් මත බලපෑම (ප්‍රාග්ධන)



ඩිජිටල්කරණය හරහා පාරිභෝගික අත්දැකීම් වැඩිදියුණු කිරීම සඳහා නව සහ පවතින පාරිභෝගිකයන් ව්‍යාකූල කිරීමට හෝ කලකිරීමට පත් කළ හැකි සංකීර්ණ ඩිජිටල් විසඳුම් හඳුන්වා දීම අවශ්‍ය වේ.

පවතින සම්පත් මත බලපෑම (ප්‍රාග්ධන)



ඩිජිටල්කරණය වේගවත් කිරීම සඳහා ස්වයංකරණය හරහා සමහර සම්ප්‍රදායික රැකියා විස්ථාපනය කළ හැකි, නව තාක්ෂණ සහ භූමිකාවලට අනුවර්තනය වීමට සේවකයින්ගේ කුසලතා වැඩි කිරීම හෝ නැවත පුහුණු කිරීම අවශ්‍ය වේ.

පවතින සම්පත් මත බලපෑම (ප්‍රාග්ධන)



උපාය මාර්ගය සහ සම්පත් වෙන් කිරීම

අප ඉටු කළ ආකාරය

උපායමාර්ගික අරමුණ	2023 සඳහා ප්‍රමුඛතා	ප්‍රධාන බෙදා හැරීම්	තත්ත්වය	සත්‍ය 2023	සත්‍ය 2022	අදහස්
	IT සම්බන්ධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම	ඩිජිටල් බැංකු ඒකකයක් ස්ථාපිත කිරීම	✓	ක්‍රියාත්මක කර ඇත	අදාළ නොවේ	
		නව අන්තර්ජාලය බැංකු ගනුදෙනුකරුවන් අත්කර ගැනීම	✓	**9,640**	8,267	ජනමාධ්‍ය ප්‍රවර්ධන අවධාරණය කරමින් ඩිජිටල් බැංකුකරණ පරිශීලක පදනම පුළුල් කිරීමේ අපේක්ෂාව සමඟින් අපේක්ෂිත ඉලක්කය ස්ථාපිත කරන ලදී. කෙසේ වෙතත් වියදම් පාලනය සම්බන්ධයෙන් මූදල් අමාත්‍යාංශය විසින් මතු කරන ලද කරුණු හේතුවෙන් මෙම ප්‍රවර්ධන සිදු නොකරන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ශාඛා වෙත පැමිණෙන ගනුදෙනුකරුවන් ප්‍රවර්ධනය කිරීම තුළින් අන්තර්ජාල බැංකුකරණ පරිශීලක පදනම පුළුල් කර ගැනීමට හැකි විය
		තැපැල් අංශ ඩිජිටල්කරණය	✓	ඒ-තැපැල් නිෂ්පාදනය දියත් කර ඇති අතර දැනටමත් ජංගම උපාංග 20 ක් තැපැල් කාර්යාල වෙත භාර දී ඇත	අදාළ නොවේ	නිෂ්පාදනය උප තැපැල් කාර්යාල මට්ටමින් හොඳින් ක්‍රියාත්මක වන තුරු ප්‍රධාන තැපැල් කාර්යාලවල ඒ-තැපැල් ගිණුම ක්‍රියාත්මක කිරීම ප්‍රමාද කිරීමට කළමනාකාරිත්වය තීරණය කර ඇත
		නව මානව සම්පත් පද්ධතිය ක්‍රියාත්මක කිරීම – අදියර I සහ II අදියරෙහි ඉතිරි මොඩියුල	✓	ක්‍රියාත්මක කර ඇත	ක්‍රියාත්මක කර ඇත අදියර 1	
		භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම	✗	ක්‍රියාත්මක කර නැත	ක්‍රියාත්මක කර නැත	පවතින තත්ත්වය හේතුවෙන් 2024 දක්වා කල් දමා ඇත
		ALM පද්ධතිය ක්‍රියාත්මක කිරීම	✗	ක්‍රියාත්මක කර නැත	ක්‍රියාත්මක කර නැත	පවතින තත්ත්වය හේතුවෙන් 2024 දක්වා කල් දමා ඇත
		ALM පද්ධතිය ක්‍රියාත්මක කිරීම	✗	ක්‍රියාත්මක කර නැත	ක්‍රියාත්මක කර නැත	පවතින තත්ත්වය හේතුවෙන් 2024 දක්වා කල් දමා ඇත

වගුව 8 →

✓ නිර්මාණය කරන ලද අගය ✗ බාදනය වූ අගය − සුරැකි අගය

ඉදිරිය බැලීම

- කෘත්‍රිම බුද්ධිය, බ්ලොක්චේන්, ඉන්ටර්නෙට් ඔෆ් තින්ග්ස් (IoT) සහ ක්වොන්ටම් පරිගණකකරණය ක්‍රියා කරන ආකාරය තේරුම් ගැනීම පාරිභෝගික අත්දැකීම් වැඩිදියුණු කිරීමට, මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමට සහ බැංකු සේවාවල නවෝත්පාදනයන් සඳහා තාක්ෂණය යෙදීමට හැකියාව.
- අපේක්ෂා කරන නව්‍ය නිෂ්පාදන සහ සේවා සංවර්ධනය කිරීමට නැගී එන තාක්ෂණ උත්තෝලනය සහ පාරිභෝගික වේදනා ලකුණු සම්බන්ධව කටයුතු කිරීම, පුද්ගලාරෝපිත අත්දැකීම් සහ අගය එකතු කළ විසඳුම් ලබා දීම.
- පාරිසරික, සමාජීය සහ පාලන (ESG) සලකා බැලීම් ඩිජිටල්කරණ උපායමාර්ග සහ ව්‍යාපාරික මෙහෙයුම්වලට ඒකාබද්ධ කිරීම.
- සයිබර් ආරක්ෂණ තර්ජන, දත්ත කඩ කිරීම් සහ මෙහෙයුම් බාධා කිරීම්වලින් ආරක්ෂා වීමට ඩිජිටල්කරණ ප්‍රයත්නයන්හිදී ඔරොත්තු දීමේ හැකියාව සහ සයිබර් ආරක්ෂාවට ප්‍රමුඛතාව ලබා දීම.

අපේක්ෂිත ප්‍රතිඵල

- පුද්ගලාරෝපිත පිරිනැමීම්, විධිමත් ක්‍රියාවලි, සහ පාරිභෝගික අපේක්ෂාවන් සපුරාලන සහ ඉක්මවා යන බාධාවකින් තොර අන්තර්ක්‍රියා.
- පාරිභෝගිකයින් සමඟ අනුනාද වන නව්‍ය නිෂ්පාදන, සේවා සහ අත්දැකීම් ලබා දීමෙන් වෙළඳපල තුළ විවිධාංගීකරණය.
- වැඩිදියුණු කළ කාර්යක්ෂමතාව, පිරිවැය අඩු කිරීම සහ වෙනස්වන වෙළඳපල තත්ත්වයන්ට වේගවත් ප්‍රතිචාර දැක්වීම.
- සියලුම පාර්ශ්වකරුවන් සඳහා තිරසාර වටිනාකමක් නිර්මාණය කිරීම.

උපාය මාර්ගය සහ සම්පත් වෙන් කිරීම

6

ආදර්ශයෙන් මග පෙන්වීම අපි ලාභයෙන් ඔබ්බට සිතමු



ආදර්ශයෙන් පෙරමුණ ගැනීම වැදගත් වන්නේ ඇයි?

විශ්වාසය ගොඩනඟා ගැනීමට, අනුකූලතාව පවත්වා ගැනීමට, පාරිභෝගික විශ්වාසය වැඩි දියුණු කිරීමට සහ සේවක නියැලීම සඳහා බැංකුවට ආදර්ශයෙන් මඟ පෙන්වීම අත්‍යවශ්‍ය වේ. ඵලදායී නායකත්වය ආයතනික සංස්කෘතිය සහ හැසිරීම් සඳහා තානය සකසයි, නවෝත්පාදන පෝෂණය කිරීම, ආයතනික වගකීම් තහවුරු කිරීම සහ එහි කීර්තිය සහ සන්නම් ප්‍රතිරූපය ආරක්ෂා කිරීම මගින් බැංකුවේ සාර්ථකත්වයට සහ දිගුකාලීන තිරසාරභාවයට බලපෑම් කරයි.

අප අපගේ සම්පත් වෙන් කරන ආකාරය

සදාචාරාත්මක පරිචයන් සහ පාලනය, සේවක සංවර්ධනය සහ යහපැවැත්ම, පාරිභෝගික කේන්ද්‍රය සේවා ප්‍රජා සහභාගීත්වය සහ සමාජ වගකීම, තිරසාර බැංකු භාවිතයන්, තාක්ෂණය සහ සයිබර් ආරක්ෂාව, සහ විනිවිදභාවය සහ සන්නිවේදනය යන කාර්යයන් හරහා අපි උපාය මාර්ගිකව අපගේ සම්පත් වෙන් කරමු. මෙම ප්‍රවේශය මූල්‍ය පරිසර පද්ධතියේ සමස්ත සෞඛ්‍ය සහ තිරසාරභාවයට දායක වන අතරම බැංකුවේ කීර්තිය සහ තරඟකාරී තත්ත්වය ශක්තිමත් කරයි.

අදාළ වැදගත් කරුණු



යෙදූ ප්‍රග්ධනය



වැදගත් අවදානම්වලට සබැඳිය



ප්‍රාථමික UN SDGs



ද්විතියික UN SDGs



ප්‍රධාන තුලන

තිරසාර භාවිතයන්, සේවක සංවර්ධනය සහ ප්‍රජා සහභාගීත්වය සඳහා ආයෝජනය කිරීම දිගුකාලීන තිරසාරභාවය සහ කීර්තිය වැඩි දියුණු කළ හැකි නමුත් කෙටි කාලීන ලාභදායීතාව අඩු කරයි.

පවතින සම්පත් මත බලපෑම (ප්‍රාග්ධන)



නවෝත්පාදනය, විශේෂයෙන්ම ඩිජිටල් බැංකුකරණය සහ නව මූල්‍ය නිෂ්පාදන, සයිබර් ආරක්ෂණ තර්ජන සහ මෙහෙයුම් අසාර්ථකවීම් ඇතුළුව ආවේණික අවදානම් දරයි.

පවතින සම්පත් මත බලපෑම (ප්‍රාග්ධන)



කෙටි කාලීන මූල්‍ය ඉලක්ක සාක්ෂාත් කර ගැනීම දිගුකාලීන තිරසාරත්වයේ වියදමින් පැමිණිය හැකිය, විශේෂයෙන් එයට ආක්‍රමණශීලී පිරිවැය කැපීම හෝ තාක්ෂණය සහ මානව සම්පත් සඳහා අවශ්‍ය ආයෝජන නොසලකා හැරීම ඇතුළත් වේ.

පවතින සම්පත් මත බලපෑම (ප්‍රාග්ධන)







උපාය මාර්ගය සහ සම්පත් වෙන් කිරීම

ඉටු කළ ආකාරය

උපායමාර්ගික අරමුණ	2023 සඳහා ප්‍රමුඛතා	ප්‍රධාන බෙදා හැරීම්	තත්ත්වය	සත්‍ය 2023	සත්‍ය 2022	අදහස්
	ධනාත්මක සන්නම් සැසියක් නිර්මාණය, SDG අධීක්ෂණය,	ජාතික පාසල් 81ක අ.පොස.ස උ.පෙ. ඉංග්‍රීසි භාෂාව සමත් වීමේ අනුපාතය වැඩි කිරීම සඳහා කාර්ය සාධන ඇගයීම	✓	පවත්වා ඇත	පවත්වා ඇත	
	දේශීය ප්‍රජාව නගා සිටුවීම සහ ඉහල නැංවීම.	දේශීය සැපයුම්කරුවන්ගේ වියදම් ප්‍රතිශතයක් ලෙස.	✓	**100**	100	
	මෙහෙයුම් ක්‍රියාවලියේ කාබන් පියසටහන අඩු කිරීම.	බලශක්ති පරිභෝජනය (GJ)	✗	**29,697**	27,256	
		ජල පරිභෝජනය (m3)	✗	**73,895**	70,430	
	ආර්ථික සහාය	සෘජු සහ වක්‍ර ගෙවූ බදු (රු. බිලි.)	✗	**(1.6)**	5.2	
		ගෙවූ ලාභාංශ (රු. බිලි.)	✗	ගෙවීමක් නැත	ගෙවීමක් නැත	

වගුව 9 →

✓ නිර්මාණය කරන ලද අගය ✗ බාදනය වූ අගය − සුරැකි අගය



ඉදිරිය බැලීම

- පාරිභෝගික අපේක්ෂාවන් සහ සේවා සැපයීම නැවත සකස් කිරීම සඳහා තාක්ෂණික දියුණුව සඳහා (කෘත්‍රිම බුද්ධිය, බ්ලොක්චේන් සහ ෆින්ටෙක් සහයෝගිතා වැනි) ආයෝජනය කිරීම දිගටම සිදුකිරීම
- ගනුදෙනුකරුවන්, ආයෝජකයින් සහ නියාමකයින් බැංකු විසින් ඔවුන්ගේ මෙහෙයුම්, ආයෝජන තීරණ සහ ණය දීමේ පරිචයන්වලදී ESG නිර්ණායක අනුගමනය කිරීමට වැඩියෙන් අපේක්ෂා කරන බැවින් තිරසාරභාවය සහ සමාජ වගකීම කෙරෙහි වැඩි අවධානය යොමු කිරීම.
- දත්ත කඩකිරීම්, වංචා සහ අනෙකුත් සයිබර් අවදානම්වලින් බැංකුව සහ එහි පාර්ශ්වකරුවන් ආරක්ෂා කිරීම සඳහා ඩිජිටල් බැංකුකරණය පුළුල් වන බැවින් සයිබර් ආරක්ෂාව කෙරෙහි තීරණාත්මක අවධානය යොමු කිරීම.

අපේක්ෂිත ප්‍රතිඵල

- ආරක්ෂිත, පරිශීලක-හිතකාමී සහ නව්‍ය මූල්‍ය සේවා සැපයීමේ ප්‍රමුඛයා ලෙස නැගී සිටීම.
- බැංකු සන්නම ශක්තිමත් කිරීම සහ ගැළපෙන ගනුදෙනුකරුවන් සහ ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීම.
- උසස් සයිබර් ආරක්ෂණ පියවර සඳහා ප්‍රගාමීව ආයෝජනය කිරීම සහ කර්මාන්තය සඳහා මිනුම් සලකුණක් තබමින් බැංකුව සහ එහි ගනුදෙනුකරුවන් ආරක්ෂා කිරීම සඳහා ආරක්ෂක ප්‍රොටෝකෝල අඛණ්ඩව අධීක්ෂණය කිරීම

ඒකාබද්ධ පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වය


ඉතා ඉහළ නියාමනයක් සහිත වෙනස්වන සුළු වාතාවරණයක් යටතේ මෙහෙයුම් කටයුතු ඉටු කිරීම හා පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වය විශ්වාසය ගොඩ නංවයි. රෙගුලාසි හා අනුකූලතාවය සහතික කරවයි, බැංකුවේ කීර්තිනාමය ඉහළ නංවයි. එමෙන්ම දිගුකාලීන තිරසාරභාවය ගොඩ නංවයි. පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වය යෙදවුමක් සහ ප්‍රතිඵලයක් ලෙස අපගේ මූල්‍ය හා සමාජ වටිනාකම් නිර්මාණය කිරීමේ මූලික අංගයකි. ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් පාර්ශ්වකරුවන් සඳහා ඉලක්ක තබන අතර අගය නිර්මාණය කිරීමේ දර්ශක සහ අපගේ සබඳතාවල ගුණාත්මකභාවය අනුව සැපයුම මැන බලන ඵලදායී අගය මැනීමේ ක්‍රියාවලියක් අප විසින් ස්ථාපිත කර ඇත.

අපගේ ඒකාබද්ධ පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්ව ක්‍රියාවලිය

මෙම ක්‍රියාවලියට විවිධ පාර්ශ්වකරුවන්ගේ බලපෑම් මට්ටම සහ අපගේ බලපෑම සමග පෙළ ගැස්වීම සඳහා විස්තීරණවූත්, උපාය මාර්ගිකවූත්, ප්‍රවේශයක් ඇතුළත් වේ. ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සියලු ස්ථරයන්ගේ කැපවීම ඇතුළත් ගතික මූලපිරීමක ප්‍රතිඵලයක් ලෙස ඔවුන්ගේ ගැටළු අවබෝධ කර ගැනීමට සහ තීරණ ගැනීමේදී අදාළ යෙදවුම් උපයෝගී කර ගැනීමට බැංකුව කැපවී සිටියි.

අපගේ පාර්ශ්වකාර සහභාගීත්ව ක්‍රියාවලිය පහත අදියර වලින් සමන්විත වේ.

1. පාර්ශ්වකරුවන් හඳුනා ගැනීම
2. අපගේ වටිනාකම් නිර්මාණ ක්‍රියාවලිය පුරා බලපෑම් මත ප්‍රධාන පාර්ශ්වකරුවන් ප්‍රමුඛකරණය
3. පාර්ශ්වකාර අවශ්‍යතා හා අපේක්ෂාවන් මත පදනම් වී සහභාගීත්ව ක්‍රම තීරණය කිරීම
4. පාර්ශ්වකාර සම්බන්ධතා ඇගැයීමට නියාමන යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම




අනාගත වටිනාකම් උත්පාදනයට අපගේ ප්‍රාග්ධන වියදම් සඳහා වෙන් කිරීමට දුවශීලතාව ආරක්ෂාකර ගැනීමට අප බෙදා හැරිය හැකි ලාභයෙන් 3.2% ක් (2022 - 1.5%) රඳවා ගන්නා ලදී.

රජයට සහ නියාමකවරුන්ට ගෙවන ලද බදු හා අයබදු තුළින් උත්පාදිත වටිනාකමින් 0.1% ක් (2022 - 4.0%) අප බෙදා දෙන ලදී

පාර්ශ්වකරුවන්ට අයබදු ගෙවීම තුළින් උත්පාදිත වටිනාකමින් 0.1% ක් (2022 - 0.2%) අප බෙදා දෙන ලදී.

සැපයුම්කරුවන්ට ඔවුන් විසින් සපයන ලද සේවා සඳහා කරන ලද ගෙවීම් තුළින් උත්පාදිත වටිනාකමින් 2.2% ක් (2022 - 2.4) අප බෙදා දෙන ලදී.



කුලී සේවා පදනම මත සේවය කරන සේවකයින් හට සිදු කරන ලද ගෙවීම් තුළින් සමාජයට හා පරිසරයට උත්පාදිත වටිනාකමින් 0.2% ක් (2022 - 0.3%) අප බෙදා දෙන ලදී

ගනුදෙනුකරුවන්ට දෙවන ලද පොලී මුදල් තුළින් අත්පාදිත වටිනාකමින් 87.2% ක් (2022 - 83.5%) අප බෙදා දෙන ලදී

සේවකයින්ට වැටුප්, වේතන හා වෙනත් දීමනා ලෙස ගෙවන ලද ගෙවීම් තුළින් උත්පාදිත වටිනාකමින් 7.1% ක් (2022 - 8.2%) අප බෙදා දෙන ලදී.

රූපය 8

ඒකාබද්ධ පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වය

පාර්ශ්වකරුවන් හඳුනාගැනීම

අපගේ ක්‍රියාකාරකම්, නිමැවුම් හා සේවා මගින් විශාල වශයෙන් ප්‍රතිලාභ ලබන පාර්ශ්වකරුවන් හා පුද්ගලයන් පිරිසක් අප හඳුනාගෙන ඇති අතර අනෙක් අතට මෙම පාර්ශ්වවරුවන්ගේ ඉදිරි දර්ශන සහ ඉලක්ක අපගේ ව්‍යාපාර ක්‍රියාවලීන් සහ උපාය මාර්ගික මූලපිරීම් කෙරෙහි සැලකියයුතු බලපෑමක් ඇති කරයි. පහත දැකවෙන්නේ අපගේ ඉලක්කය, දිගුකාලීන හා ධනාත්මක සබඳතා ගොඩනගා ගැනීම සහ පවත්වාගෙන යාම වන බැංකුවේ ව්‍යාපාරික මෙහෙයුම් කෙරෙහි සෘජු හා වක්‍ර බලපෑමක් ඇති කරන ප්‍රධාන පාර්ශ්වකරුවන් වේ.

පාර්ශ්වකරුවන්


- පාර්ශ්වකරුවන් ආයෝජකයන්
- සේවකයන්
- ගනුදෙනුකරුවන්
- නියාමකයන් හා රජයේ ආයතන
- සමාජය හා පරිසරය
- ව්‍යාපාරික හවුල්කරුවන්

අපගේ වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාවලියට ඇති බලපෑම මත පදනම් වූ ප්‍රධාන පාර්ශ්වකරුවන්ගේ ප්‍රමුඛතාවය

ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් පාර්ශ්වකරුවන්ගේ බලපෑමේ තීව්‍රතාවය සහ බැංකුවේ කටයුතු සම්බන්ධයෙන් පාර්ශ්වකරුවන් උනන්දුව දක්වන මට්ටම මත පදනම්ව පාර්ශ්වකාර විශ්ලේෂණ අනුකෘතියේ ඒ ඒ පාර්ශ්වකරුවන් ඇතුළත් කර ඇත. මෙමගින් පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා හා ගැටළු අවබෝධ කර ගැනීමට අපට හැකියාව ලැබේ. ජාතික ඉතිරිකිරීමේ බැංකුව කෙරෙහි දැඩි උනන්දුවක් දක්වන පුද්ගලයින් සහ සංවිධාන වලට ප්‍රමුඛතාවය ලබාදීමට පහත නිර්ණායක භාවිතා කරනු ලබයි.

- බැංකුවේ පැවැත්මට අනිවාර්යයෙන් අත්‍යවශ්‍ය පිරිස
- අදාළ තර්ජන හා අවස්ථාවන්ට සම්බන්ධ පිරිස
- බැංකුවේ හැසිරීමට බලපෑම් කිරීමට සදාචාරාත්මක හෝ නෛතික හැකියාවක් ඇති පිරිස
- සිය කැමැත්තෙන් තීරණ ගැනීමට යොමු නොවන අයවළුන් තීරණ ගැනීමට පෙලඹීමට බලපෑම් කරන පිරිස
- බැංකුව හා වැදගත් ප්‍රධාන සම්බන්ධතා පවත්වන පිරිස

මෙකී වර්ගීකරණය වාර්ෂිකව පවත්වාගෙන යනු ලබන අතර කාලයාගේ ඇවෑමෙන් පාර්ශ්වකරුවන්ගේ ඉල්ලුම, අභිලාෂයන් සහ අපේක්ෂාවන් හඳුනා ගැනීමට එය බැංකුවට ඉවහල් වෙයි.



රූපය 9

පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා හා අපේක්ෂාවන් මත පදනම්ව සහභාගීත්වයේ ක්‍රමෝපායයන් නිර්වචනය කිරීම

මතුවී ඇති ප්‍රධාන ගැටළු හඳුනා ගැනීමට සහ ඒ සඳහා සිය ප්‍රතිචාර දැක්වීම සඳහා පාර්ශ්වකරුවන් සමග සන්නිවේදනය කිරීමට බැංකුව විවිධ විධිමත් ක්‍රමවේද ස්ථාපිත කර ඇත. අභ්‍යන්තර සහ බාහිර යන පාර්ශ්වකරුවන් ද්විත්වයම මෙකී යාන්ත්‍රණයට ඇතුළත් වේ. පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂාවන් හා ගැටළු සාකච්ඡා කිරීමට මුහුණට මුහුණ හමුවිය හැකි අවස්ථා සම්මන්ත්‍රණ සහ සමාජ මාධ්‍යවේදිකා වැනි බොහෝ ජාල භාවිතා වේ. පාර්ශ්වකරුවන්ගෙන් ලැබෙන ප්‍රතිපෝෂණ සාර්ථක උපාය මාර්ග නිර්මාණය කිරීමට උපකාරී වේ.

පාර්ශ්වකරුවන්ගේ සබඳතා තක්සේරු කිරීම සඳහා අධීක්ෂණ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම

සම්පත් වෙන් කිරීම සඳහා වැදගත් ක්ෂේත්‍ර තීරණය කිරීම සඳහා වරින්වර පාර්ශ්වකරුවන්ගේ සබඳතා ඇගයීමෙහිලා බැංකුව නිරත වෙයි. ඉදිරියට යන විට සම්බන්ධතාවන්හි ගුණාත්මකභාවයට සහ වටිනාකම් නිර්මාණය කිරීමට සම්බන්ධ ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPIs) භාවිතා කිරීමට ජාතික ඉතිරිකිරීමේ බැංකුව උත්සාහ දරන අතර බැංකුව හරහා මෙම දර්ශක නිවැරදිව හා ස්ථාවර ලෙස මැනීමට උත්සාහ දරයි.

පාර්ශ්වකරුවන් සඳහා උත්පාදනය කරන ලද වටිනාකම

අභිරුචිගත නියැළීමේ සැලසුම් සකස් කර ඇති අතර දැනට පවතින සියලුම ක්‍රමෝපායන් පිළිබඳ අබණ්ඩ තක්සේරුව මගින් ජාතික ඉතිරිකිරීමේ බැංකුවට පාර්ශ්වකරුවන් සමග ඇති සබඳතාවල අඩුපාඩු හා තිරණාත්මක සාර්ථක සාධක හඳුනා ගැනීමට ඉඩ සලසෙයි. දැනුවත් තක්සේරු කිරීම් සඳහා තත්ත්ව මිනුම් මෙවලම ලෙස තනි පාර්ශ්වකරුවන්ගේ ප්‍රතිපෝෂණ භාවිත කරයි.

අපගේ පාර්ශ්වකාර සම්බන්ධතාවල අභ්‍යන්තර තත්ත්ව තක්සේරුව	සම්බන්ධතා දර්ශකවල තත්ත්වය
අනෝන්‍ය ප්‍රතිලාභී ශක්තිමත් සම්බන්ධතාවය	★★★★★
වර්ධනය කිරීමට ඉඩකඩ ඇති මනා තත්ත්වයේ අනෝන්‍ය ප්‍රතිලාභ සම්බන්ධතාවයකි.	★★★★☆
සම්බන්ධතා ස්ථාපිතය වටිනාකම් උත්පාදනය කරන සම්බන්ධතාවයකි. නමුත් වර්ධනය කිරීමට ඉඩකඩ ඇත.	★★★☆☆
සම්බන්ධතා ස්ථාපිත වුවද, සම්බන්ධතාවේ ගුණාත්මකභාවය වර්ධනය කිරීමට වැඩ කළ යුතුය	★★☆☆☆
සම්බන්ධතා නොමැත	★☆☆☆☆

ඒකාබද්ධ පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වය

වටිනාකම් නිර්මාණ ක්‍රියාවලිය තුළ අපගේ ප්‍රධාන පාර්ශ්වකරුවන්ගේ සාරාංශය

ඉහළ ධාරාව | බැංකුවේ මෙහෙයුම් | පහළ ධාරාව

කොටස්හිමියන්/ ආයෝජකයින්	නියාමකයින් සහ රජයේ ආයතන	සේවකයින්	ව්‍යාපාර හවුල්කරුවන්	ගනුදෙනුකරුවන්	සමාජය හා පරිසරය
පාර්ශ්වකාර අරමුණු					
මුළු ප්‍රතිඵලවල තිරසාර වර්ධනය	වෙනත් සහ අදාළ මූල්‍ය විසඳුම් සපයන්නා	තෝරාගන්නා සේවා යෝජක	කැමතිම ව්‍යාපාර හවුල්කරු	නීතිගරුක ආයතනික පුරවැසියා	වගකීම් සහගත ආයතනික පුරවැසියා
ඔවුන් කවුරුන්ද					
ශ්‍රී ලංකා රජය බැඳුම්කර හිමියන්	ශ්‍රී ලංකා මහ බැංකුව මුදල් අමාත්‍යාංශය විගණකාධිපති දෙපාර්තමේන්තුව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙනත් රජයේ සහ වෘත්තීය ආයතන	ස්ථිර සේවකයින් කොන්ත්‍රාත් පදනම මත සේවකයින් බාහිර පුද්ගලයින් වෘත්තීය සමිති	සැපයුම්කරුවන් උපයෝගිතා සේවා සපයන්නන් වෙනත් සේවා සපයන්නන් හුවමාරු නිවාස අනුරූප බැංකු	තනි පුද්ගලයින් ආයතන සංවිධාන	ශ්‍රී ලංකා පුරවැසියන් පරිසරය මාධ්‍ය මතපළකරන්නන් සහ බලපෑම්කරුවන්
අපගේ අරමුණු ලබාදීමට ගලපන ලද වටිනාකම් කොටස					
උපායමාර්ගික ප්‍රාග්ධනය වෙන් කිරීම මගින් තිරසාර ආදායම හා ප්‍රාග්ධන වර්ධනය ලබාදීම සහ විචක්ෂණ ශේෂ පත්‍රය සහ සක්‍රිය අවදානම් කළමනාකරණය සහතික කිරීම	නීති ගරුක ආයතනික පුරවැසියෙක් වීම අනුකූලතා නොවීමේ පිරිවැය අඩුකරන අතර ආයෝජකයින්ට සහ පොදු ජනතාවට විශ්වාසය ඇති කරයි	මුළු ප්‍රධාන මත අවධානය තුළින් සේවකයින් බලගැන්වීම සහ වගවීම ප්‍රවර්ධනය	අනෝන්‍ය ප්‍රතිලාභය නිර්මාණය කිරීමට අපට ඉඩදෙමින් අසමසම සේවාවක් ලබාදීමට අපගේ ව්‍යාපාර හවුල්කරුවන් සමඟ සහයෝගීවීම	ගනුදෙනුකරුවන්ට කැපීපෙනෙන සේවයක් ලබාදීමට සහ ඔවුන්ගේ වෙනස්වන අවශ්‍යතාවන්ට අදාළව සිටීමට අපගේ ශක්තීන් සහ අවස්ථා භාවිතා කිරීම	ප්‍රජාවන් සමඟ හවුල්වෙමින් ඔවුන් නගා සිටුවීම සහ සවිබල ගැන්වීම

සම්බන්ධතාවයේ ගුණාත්මකභාවය

2023 මූල්‍ය වර්ෂය
2022 මූල්‍ය වර්ෂය
2021 මූල්‍ය වර්ෂය

★ සම්බන්ධතාවයේ ගුණාත්මකභාවය වැඩිවීම ☆ සම්බන්ධතාවයේ ගුණාත්මකභාවය අඩුවීම ⛔ සම්බන්ධතාවයේ ගුණාත්මකභාවය නොවෙනස්ව පැවතීම

රූපය 10 →

ඒකාබද්ධ පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වය



පාර්ශ්වකරු/ ආයෝජකයන්

අපගේ සහභාගිත්වයට හේතු

- බැංකුවලට බලපානු ලබන වැදගත් කරුණු සම්බන්ධයෙන් දැනුවත් වනු ලැබීමට පාර්ශ්වකරුවන් හෝ ආයෝජකයින් සතු අයිතියට ජාතික ඉතිරිකිරීමේ බැංකුව ගරු කරයි.
- පිරිවැයට ඵලදායී ප්‍රතිලාභ ලෙසින් පාර්ශ්වකරුවන්ට හා ආයෝජකයන්ට මූල්‍ය ප්‍රවේශයක් ඇති බව බැංකුව අවබෝධ කරයි.
- උපාය මාර්ගික තීරණ ගැනීමට තුඩු දෙන තීරණාත්මක යෙදවුමක් ලෙස ක්‍රියාකළ හැකි වැදගත් දැක්මක් හා දෘෂ්ටිකෝණයන් පාර්ශ්වකරුවන් හා ආයෝජකයින් සතු බව ජාතික ඉතිරිකිරීමේ බැංකුව හඳුනාගනියි.
- පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා හා අපේක්ෂා අවබෝධ කර ගැනීම තුළින් ආයෝජක අවශ්‍යතා තෘප්තිමත් කිරීමට බැංකුවට හැකියාව ලැබේ.

අපට අවශ්‍ය දේ

අපගේ ඉලක්කය

පාර්ශ්වකරු වෙත ලැබෙන සම්පූර්ණ ප්‍රතිලාභවල තිරසාර වර්ධනයේ ප්‍රභවයක්වීම සහ ණය සපයන්නන්ට ප්‍රතිලාභ ලබා දෙන විශ්වසනීය මූලාශ්‍රයක්වීම

- අරමුදල් සඳහා ප්‍රවේශය
- ගැටළු තේරුම් ගැනීමට සහ විසඳීමට හැකි සංවාදයක් ඇරඹීම
- ආයෝජක-අනුගත ESG ඒකාබද්ධ කිරීම් හරහා වෙළඳපළ වෙනස්කම්වලට හා අභියෝගවලට අනුවර්තනයවීමේ හැකියාව වැඩිදියුණු කිරීම.

ඔවුන්ට අවශ්‍ය දේ

අපගේ වටිනාකම් යෝජනාව

විවිධ ආර්ථික චක්‍ර ඔස්සේ උපාය මාර්ගික ප්‍රාග්ධන වෙන්කිරීම් සහ අරමුදල් ඵලදායීව කළමනාකරණය කිරීම තුළින් අපගේ පාර්ශ්වකරුවන්ට සහ ආයෝජකයින්ට තිරසාර ප්‍රාග්ධන වර්ධනයක් සහ ලාභාංශ ලබාදීමට අපි කැප වී සිටිමු.

- කාලයත් සමග ප්‍රාග්ධනය සහ ලාභාංශවල තිරසාර වර්ධනයක්
- පොළී හා ප්‍රාග්ධන ආපසු ගෙවීම් කාලානුරූපීව ආපසු ගෙවීම
- අඩු කාබන් ආර්ථිකයකට සංක්‍රමණයවීම සඳහා ඉදිරි චින්තන දැක්ම
- සෑම තරාතිරමකම සාදාචාරාත්මක සහ පාරිසරික සවිඥාණක තීරණ ගැනීම සහතික කිරීම
- තිරසාරභාවය, යහපාලනය සහ ශක්තිමත් අවදානම් කළමනාකරණය සහතික කිරීම
- ව්‍යාපාර උපායමාර්ග වලට ඒකාබද්ධ කරන ලද කළමනාකරණ පාලන

ප්‍රධාන පාර්ශ්වකරුවන්/ ආයෝජක අපේක්ෂාවන්

අපගේ උපායමාර්ගික ප්‍රතිචාරය

ආයෝජන මත තිරසාර ප්‍රතිලාභ	කොටස් මත ලාභාංශ ගෙවීම්, ප්‍රාග්ධන හා බැඳුම්කරවල පොළී ගෙවීම් සහ ණය සඳහා පොළී ගෙවීම් හරහා ආයෝජනවල ප්‍රතිලාභ තිරසාර ලෙස ලබාදීම, බෙදා හැරිය හැකි ආදායමට බලපාන ධනාත්මක සහ සෘණාත්මක සාධක පිළිබඳව පාර්ශ්වකරු/ආයෝජකයින් සමග සන්නිවේදනයේ විනිවිදභාවයෙන් සිටීම.
වත්මන් ආර්ථික වාතාවරණයතුළ පවතින වත්කම් තවදුරටත් පවත්වා ගැනීම හෝ වැඩිදියුණු කිරීම	විශ්වාසය ගොඩනැගීම සහ අවදානම් ගැලපුම් ප්‍රතිලාභ ලබාදීම්, ආරක්ෂිත සහ ස්ථාවර බැංකු පද්ධතියකට දායක වන ශක්තිමත් ශේෂපත්‍රයක් පවත්වා ගැනීම, විශ්වාසය ඇති කිරීම සහ අවැසි අවදානමෙන් ආරක්ෂාවීම.
දීර්ඝ කාලීන වර්ධනය සඳහා උපාය මාර්ගික දැක්මක් ඇතිව ක්‍රියාකිරීම සහ ඒවා සාක්ෂාත් කර ගැනීම පිණිස ඇති ආයතනික සැලසුම්	බැංකුවේ දිශානතිය, වර්ධන මුල පිරීම් සහ අවදානම් කළමනාකරණ උපායමාර්ග පිළිබඳව මුදල් අමාත්‍යාංශයේ අදාළ නිලධාරීන් වෙත සන්නිවේදනය කිරීම.
විශ්වාසය ගොඩනැංවීම සහ අවදානම් ගැලපුම් ප්‍රතිලාභ ලබාදීම.	අවදානම් හඳුනා ගැනීමට සහ කල්තියා අවදානම් කළමනාකරණය කිරීම සඳහා අවදානම් කළමනාකරණ උපාය මාර්ගයක් භාවිත කිරීම.

අපගේ සහභාගිත්වයේ උපායමාර්ග

වෙනත් යෝග්‍ය මාධ්‍ය හා සන්නිවේදන, වාර්තාකරණය හරහා අපගේ වටිනාකම් පිළිබඳ යෝජනා ඉදිරිපත් කිරීමේ හැකියාව පෙන්වාදීම, අපගේ පාර්ශ්වකරුවන්ගේ සහ ආයෝජකයන්ගේ අවශ්‍යතා හඳුනා ගැනීම, අප අරමුණ වන අතර, ප්‍රාග්ධනය වෙත අපගේ ප්‍රවේශය එමගින් ශක්තිමත් කිරීමද අභිප්‍රායයකි.

අපගේ සහභාගිත්වය සිදුවන අයුරු

- වාර්ෂික හා අන්තර් වාර්ෂික මූල්‍ය ප්‍රකාශ
- වාර්ෂික ඒකාබද්ධ වාර්තා
- ආයතනික වෙබ් අඩවිය
- මුදල් අමාත්‍යාංශයේ නියෝජිතයින් සහ වෙනත් ආයෝජකයින් සමග මුහුණට-මුහුණ හමුවී සාකච්ඡා කළ හැකි රැස්වීම්
- පාර්ශ්වකරුවන්ගේ වෙබ් වැඩසටහන්

ප්‍රමාණාත්මක භාවය පිළිබඳ කරුණු



සම්බන්ධිත ප්‍රාග්ධනය



තිරසාර සංවර්ධන ඉලක්කවලට සම්බන්ධය

මූලික



ද්විතියික



ඒකාබද්ධ පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වය

සබඳතාවයේ අපේක්ෂිත අගය අවබෝධ කර ගැනීම සහ මිනීම

ආයෝජන අපේක්ෂිත අගය

අගය උත්පාදනයේ ප්‍රතිඵලය

- **රු.මි. 320** පාර්ශ්වකරුට ආරෝපණය කළ
- **1.79%** ශුද්ධ පොලී ආන්තිකය
- පාර්ශ්වකරුට සමස්ත ප්‍රතිලාභය **9.36%**
- **රු.බි. 7.6** බැඳුම්කර හාරකරුවන්ට ගෙවන ලද පොලී
- ත්‍රිත්ව ඒ ණය ශ්‍රේණිගත කිරීම් පවත්වා ගැනීම

අපගේ අපේක්ෂිත අගය

- හිමිකම් කොටස් ප්‍රාග්ධන යෙදවුම්
- ණය වෙළඳපළ සඳහා ප්‍රවේශය
- ආයෝජක විශ්වාසය
- ධනාත්මක ණය ශ්‍රේණිගත කිරීම
- හිමිකම් හා ද්‍රවශීලතාවයට වැඩි ප්‍රවේශය

නිසි මගට එළඹ ඇත	දැනට අවශ්‍ය කටයුතු ක්‍රියාත්මකව පවතී	අවධානය අවශ්‍යවේ.

→ ප්‍රතිඵල වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාමාර්ග

- වෙන්දේසිය වර්ධනයකට යොමු කිරීම
- අරමුදල් සැපයුම් මූලාශ්‍ර අතරින් වඩාත් සුදුසු මූලාශ්‍රය තෝරා ගැනීම
- අරමුදල් සපයන්නන් සමග අබණ්ඩව නියුතුවීම

ගණුදෙනුකරුවන්

අපගේ සහභාගිත්වයට හේතු

- මාර්ගගත හා ජංගම දුරකථන මාධ්‍ය ඔස්සේ ගනුදෙනුකරුවන් සමග නිරතවීම් අඛණ්ඩව සිදු කිරීම
- පාරදෘශ්‍ය හා නිරන්තර සන්නිවේදනය ඔස්සේ ගනුදෙනුකරුවන් හා විශ්වාසය ගොඩනංවා ගැනීම හා පවත්වාගෙන යාම
- දීර්ඝකාලීන වටිනාකම් වර්ධනය කරමින් මෙන්ම ගනුදෙනුකරුවන් බැංකුවට අහිමිවීම අඩු කරලමින් නිරන්තර නිරතවීම් හා අන්තර් ක්‍රියාකාරිත්වය සමග ගනුදෙනුකාර පක්ෂපාතිත්වය වැඩිදියුණු කර ගැනීම
- ගනුදෙනුකාර අපේක්ෂා අමන්දානන්දයට පත්කරලනසුලු ගනුදෙනුකරුවන්ට විශේෂිත වූ නිමැවුම් හා සේවා සැපයීම පිණිස අවැසි අවශ්‍යතා හා කැමැත්ත වඩාත් හොඳින් අවබෝධ කර ගැනීම

අපට අවශ්‍ය දේ

අපගේ ඉලක්කය

ගනුදෙනුකරුවන් අමන්දානන්දයට පත් කළ හැකි අන්දමේ විශේෂිත නිමැවුම් හා සේවා සැපයීම.

- ණය හා අත්තිකාරම් කාලීනව ගෙවීම් සිදු කිරීම
- ණය වර්ධනය සහ තැන්පතු රඳවා ගැනීමේ අනුපාතිකය ඉහළ නැංවීම
- වටිනාකම් උත්පාදනය හා අනෝන්‍ය වර්ධනය උදෙසා අපගේ ස්වයං සේවා මාධ්‍ය භාවිතය ඉහළ නැංවීම ආදී සේවා පදනම් වූ සම්බන්ධතා

ඔවුන්ට අවශ්‍ය දේ

අපගේ වටිනාකම් යෝජනාව

ඔවුන්ගේ වෙනස්වන අවශ්‍යතාවයන්ට සරිලන නිමැවුම් හා සේවා ගනුදෙනුකරුවන්ට සැපයීම

- වෙළඳපළ ප්‍රවණතා හා ගනුදෙනුකාර අවශ්‍යතා හා අනුගත වන නිමැවුම් හා සේවා සැපයුම
- තරඟකාරී අනුපාත තිරසාරව පවත්වා ගැනීම
- සදාචාර සම්පන්න ESG අරමුණු පෙරදැරිකරගත් ආයතනයක් පෝෂණය කිරීම
- ඩිජිටල් පරිවර්තනය හා ගනුදෙනුකාර සහාය මත අඛණ්ඩ අවධාරණය යොමු කිරීම මගින් වැඩි අවධානය යොමු වූ ගුණාත්මක සබඳතා පවත්වා ගැනීම.
- බැංකුවේ ව්‍යාපාරික කටයුතුවලදී ශක්තිමත් අලෙවිකරණ සහයෝගයක් හා ගනුදෙනුකාර හැසිරීම පිළිබඳ අගනා දෘෂ්ටිකෝණයක් ලබා ගැනීම
- විශිෂ්ඨ සේවා සැපයුමක් පිළිබඳ පොරොන්දුව ඉටුකරලීම

ප්‍රධාන ගනුදෙනුකාර අපේක්ෂා	අපගේ උපායමාර්ගික ප්‍රතිචාර
ඩිජිටල් මාධ්‍ය හරහා සහ ශාඛා හරහා බැංකු සේවා පහසු ප්‍රවේශ සැපයීම	ගනුදෙනුකරුවන්හට වඩාත් වැඩිදියුණු වූ ගනුදෙනුකාර සේවාවක් සැපයීම පිණිස අළුතින් හඳුන්වා දෙනු ලැබූ ඩිජිටල් මාධ්‍ය සහ අපගේ දීපව්‍යාප්ත ශාඛා ජාලය
වඩාත් ඒකාබද්ධ හා පහසු සේවාවක්	ප්‍රතිලාභ ඉහළ නංවන අතරතුර තැන්පතු සහ ආයෝජන සුරැකීම
කාලෝචිත හා කාර්යක්ෂම ගනුදෙනුකාර සේවාවක්	ඇමතුම් මධ්‍යස්ථානයේ සහ වෙනත් මාර්ගගත මාධ්‍ය ඔස්සේ 24x7 ගනුදෙනුකාර ප්‍රවේශයක් සහිත විශිෂ්ඨ ගනුදෙනුකාර අත්දැකීමක් සැපයීමට හැකි ලෙස සේවකයින් සවිබල ගැන්වීම්
ඉතුරුම් හා ණය නිමැවුම් මත තරඟකාරී පොලී අනුපාත මෙන්ම සාධාරණ හා පාරදෘශ්‍ය සේවා ගාස්තු	වෙළඳපොළ තත්ත්වයෙන් සහ මනා තරඟකාරී විශ්ලේෂණයක් ඔස්සේ සුපරීක්ෂාකාරී විමර්ශණයක් මත පදනම්ව පොලී අනුපාත සහ ගාස්තු ව්‍යුහයක් සැපයීම
පුද්ගලානුරූපී මූල්‍යමය විසඳුම්	අපගේ ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා අවබෝධ කර ගනිමින් පුද්ගල බද්ධ විස්තීර්ණ මූල්‍ය විසඳුම් සැපයීම
ගනුදෙනුකාර දත්ත හා පෞද්ගලිකත්වය සුරක්ෂිත කිරීම	සයිබර් ආරක්ෂණ තර්ජනවලට සක්‍රීයව ප්‍රතිචාර දක්වමින් ගනුදෙනුකාර පෞද්ගලිකත්වය හා ආරක්ෂාව සුරක්ෂිත කිරීම.

ඒකාබද්ධ පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වය

ප්‍රධාන ගනුදෙනුකාර අපේක්ෂා

ශක්තිමත් තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම්	තොරතුරු තාක්ෂණ පද්ධතීන්ගේ ස්ථාවරත්වය, ආරක්ෂාව හා වේගය පවත්වා ගැනීම
විස්තීර්ණ මූල්‍ය අන්තර්ග්‍රහණය	නිමැවුම්, සැපයුම් මාධ්‍ය හා වෙළඳපළ හරහා මූල්‍ය අන්තර්ග්‍රහණයට දායකවීම
කාර්යක්ෂම සේවා සැපයුම	ක්‍රියාවලීන්ගේ කාර්යක්ෂම බව හා ස්වයංක්‍රියකරණය ඉහළ නැංවීම
ගනුදෙනුකාර ඉල්ලුම හැසිරවීමේ හැකියාව	බහුවිධ සේවා සැපයුම ශක්තිමත් කිරීම හා සේවා සැපයුම් ස්ථානීය ධාරිතාව වැඩි කිරීම

අපගේ සහභාගීත්වයේ උපාය මාර්ග

- ගනුදෙනුකරුවන්හට ස්ථාවර අත්දැකීමක් ලබා ගැනීමේ අවස්ථාව ප්‍රවර්ධනය කරනු පිණිස අපගේ සේවාව අඛණ්ඩව තක්සේරුවට ලක් කරමින් සේවාව වර්ධනය කිරීම
- සන්නාමයේ තහවුරුව සහ වටිනාකම් යෝජනාව සන්නිවේදනය කිරීම
- අඛණ්ඩව අලෙවිකරණ කටයුතු ක්‍රියාත්මක කිරීම
- සන්නිවේදනය සඳහා විවිධ ඩිජිටල් මාධ්‍ය, ගනුදෙනු භාවිතය තුළින් ගනුදෙනුකාර අවශ්‍යතාවන්ට සරිලන සේවා සැපයීමට ඩිජිටල්කරණය සඳහා ප්‍රමුඛත්වය ලබාදීම සහ තත්කාලීන යාවත්කාලීන කිරීම් සැපයීම

අප සහභාගිවන අයුරු

- ශාඛා හා අංශ හරහා පුද්ගලානුබද්ධ අන්තර් ක්‍රියාකාරකම්
- මෙහෙයුම් ගැටළුවලට විසඳුම් සැපයීම පිණිස විද්‍යුත් තැපෑල, ආයතනික වෙබ් අඩවිය සහ දුරකථන මාර්ග ආදී විවිධ මාර්ග භාවිත කිරීම
- ගනුදෙනුකාර තෘප්තිය ශ්‍රේණිගත කිරීම පිණිස සමීක්ෂණ දියත් කිරීම
- මෙහෙයුම් ආශ්‍රිත ගැටළුවලට විසඳුම් සැපයීම පිණිස ප්‍රවර්ධනාත්මක වැඩසටහන්, ආයතනික වෙබ් අඩවිය, ජන මාධ්‍ය සහ සමාජ මාධ්‍ය භාවිත කිරීම
- ඇමතුම් මධ්‍යස්ථාන සහ ආයතනික හමුවීම් ආදී වෙනත් සන්නිවේදන මාධ්‍ය

ප්‍රමාණාත්මක භාවය පිළිබඳ කරුණු

සම්බන්ධිත ප්‍රාග්ධනය

නිරසාර සංවර්ධන ඉලක්කවලට සම්බන්ධය

මූලික



ද්විතීයික



සම්බන්ධතාවයේ අපේක්ෂිත අගය අවබෝධ කර ගැනීම සහ මිනීම

ගනුදෙනුකාර අපේක්ෂිත අගය

අගය උත්පාදනයේ ප්‍රතිඵලය

13.03 ක සක්‍රීය ගිණුම්
(2022 - සක්‍රීය ගිණුම් මි.13)

තැන්පත්කරුවන්ට ගෙවන ලද පොලිය
රු.බි. 185.7

ඩිජිටල් වේදිකා මත සහභාගිත්වය හා වර්ධනය අන්තර්ජාල බැංකුකරණයේ 7.8% ක වර්ධනය
(2022 - 9.8%)

අපගේ අපේක්ෂිත අගය

- ගනුදෙනුකරුවන්ගේ මූල්‍ය විසඳුම් සාක්ෂාත් කිරීම/ ගනුදෙනුකරුවන්ට ලබාදෙන සඵලදායී මූල්‍ය විසඳුම්
- හොඳ ගනුදෙනුකාර අත්දැකීමක් සැපයීම
- ගනුදෙනුකරුවන් අත්කර ගැනීම හා රඳවා ගැනීම
- වෙළඳපළ කොටස වර්ධනය
- තවදුරටත් හිමිකම් කොටස් හා ද්‍රවශීලතාවයට ප්‍රවේශය

නිසි මගට එළඹ ඇත	දැනට අවශ්‍ය කටයුතු ක්‍රියාත්මකව පවතී	අවධානය අවශ්‍යවේ.

ප්‍රතිඵල වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාමාර්ග

- ගනුදෙනුකාර තෘප්තිමත්භාවය පිළිබඳ සමීක්ෂණය නිරතුරුව පැවැත්වීම
- ගනුදෙනුකාර ප්‍රතිපෝෂණ නිරතුරුව ඇගැයීම
- ගනුදෙනුකරුවන්ට ස්ථාවර අත්දැකීමක් සම්පාදනය වන්නේදැයි විමසීමට සියලු සේවා සැපයුම් ස්ථාන හරහා ගනුදෙනුකාර අත්දැකීම් පිළිබඳ දත්ත රැස්කිරීම.

ඒකාබද්ධ පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වය

සේවකයින්

අපගේ සහභාගිත්වයට හේතු

- සන්නාම වර්ධනය කිරීම සඳහා ව්‍යාපාරික අරමුණු දියත් කිරීම පිණිස සහ උපාය මාර්ගික සැලසුම් මත ක්‍රියාත්මක වීමේදී බැංකුවේ සේවකයින් මූලික පදනම වේ
- සහභාගිත්වය ඉහළ සේවකයින් සිය රාජකාරියේ නියැලීමේදී වඩාත් අභිප්‍රේරනයෙන් යුක්ත වන අතර එය වඩාත් ඉහළ ඵලදායිතා මට්ටමකට මෙන්ම සමස්ථයක් වශයෙන් ඉහළ කාර්යසාධනයක් දක්වමින් බැංකුවේ සාර්ථකත්වයට දායක වෙයි.

අපගේ සහභාගිත්වයේ උපාය මාර්ග

- ශ්‍රමබලකාය අභිප්‍රේරණ කිරීම පිණිස සේවකයින්ගේ ස්ථාවර සහභාගිත්වය හා සන්නිවේදනය
- සහායක හා බලගන්වන සුළු රාජකාරී සංස්කෘතියක් නිර්මාණය කිරීමේදී බලපාන ගැටළු විසඳීම සඳහා සේවක ප්‍රතිපෝෂණවලට ප්‍රමුඛතාව ලබාදීම
- නව කුසලතා සංවර්ධනය සඳහා හා රැකියාවේ දියුණුව පිණිස උපකාරී වන පුහුණු වැඩසටහන් හා වැඩමුළු ආදී අඛණ්ඩ පුහුණුව හා වෘත්තීමය වර්ධනය සඳහා අවස්ථාව සැපයීම
- සේවක රැකියා ජීවිත චක්‍රයේ විවිධ අවස්ථාවලදී ඔවුන් සිය රැකියා වාතාවරණයට හා අත්දැකීම්වලට සම්බන්ධිත ක්‍රියාවලීන්හිදී තිරණ ගැනීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් සේවකයන්ට ඇහුම්කන්දීම හා උපදේශන ලබාදීම.

අප සහභාගි වන අයුරු

- සේවකයින් හා රේඛීය කළමනාකාරිත්වය අතර මුහුණට මුහුණ හමුවී කටයුතු කිරීම
- බහුවිධ වේදිකා හරහා අභ්‍යන්තර සන්නිවේදනය
- සේවක ප්‍රණාම හා ඇගැයීම් වැඩසටහන්
- කාර්යසාධන සමාලෝචන හා සේවයෙන් ඉවත්ව යාමේදී ලබා දෙන සමාලෝචන පරීක්ෂණ
- සහභාගිත්වය අදාළ වන අවස්ථා
- ඉගෙනුම් හා පුහුණු/සංවර්ධන අවස්ථා

අපට අවශ්‍ය දේ

අපගේ ඉලක්කය

ධනාත්මක බලපෑමක් ඇතිකරලීම පිණිස නිමැවුම් හා සේවා පිරිනමන පුද්ගලයින් පෝෂණය කිරීම හා දිරි ගැන්වීම

- උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීමට, ව්‍යාපාරික වර්ධනය ශීඝ්‍ර කරවීමට, නව අවස්ථා උදාකර ගැනීමට සහයෝගීත්වය දක්වන කුතුහලයෙන් පිරි සහභාගිත්වය ඉහළ මට්ටමක සිටින සේවකයින්
- තමා සේවා ස්ථානයට අයත් පුද්ගලයෙකු බව සේවකයින්ට දැනෙන ධනාත්මක සේවක අන්තර්ග්‍රහණය සහිත වැඩ පරිසරයක් නිර්මාණය කිරීම
- අඛණ්ඩ පුහුණුව හා සංවර්ධනය තුළින් මානව ප්‍රාග්ධනයේ ආයෝජනය මත ප්‍රතිලාභ ඉහළ නැංවීම
- අන්තර්ග්‍රහණය සහිත රාජකාරී වාතාවරණයක් හා විවිධත්වය මනාව පිළිගැනීම

ඔවුන්ට අවශ්‍ය දේ

අපගේ වටිනාකම් යෝජනාව

තනි පුද්ගලයින් හා බැංකුව සඳහා ධනවාදී ප්‍රතිලාභ උත්පාදනය කිරීම පිණිස සේවකයින් බලගැන්වීම, නව්‍යකරණය අඛණ්ඩ පුහුණු සංස්කෘතියක් ගොඩනැංවීම

- සේවකයින්ගේ පෞද්ගලික අවශ්‍යතා හා වෘත්තීමය වගකීම් වලට ඉඩ සලසන නම්‍යශීලී රාජකාරී වාතාවරණයක් ඇති කිරීම
- ඉහළ සේවක තෘප්තිමත්භාවය සහ සහභාගිත්වයක් සහිත විශ්වාසය හා තීරණ ගැනීමේ අවස්ථාව සහිත සංස්කෘතියක් නිර්මාණය කිරීම
- තමාගේ වටිනාකම පිළිබඳ ගැඹීම් දනවන, අභිප්‍රේරණය කරනසුළු තත්ත්වයක් උදාකර ගැනීම පිණිස ඉටු කළයුතු යුතුකම හා තිරසාර ආදායමක් එකට මුසු කිරීම
- සේවකයින්හට සිය කුසලතා හා හැකියාවන් වර්ධනය කර ගැනීම සඳහා පුහුණු හා සංවර්ධනය සඳහා අවස්ථා ප්‍රවේශය සැපයීම
- සෞඛ්‍ය සම්පන්න වෘත්තීය ස්ථාන නිර්මාණය කිරීම

මූලික සේවක අපේක්ෂා	අපගේ උපාමාර්ගික ප්‍රතිචාර
සාධාරණ, වෙළඳපළ හා සාපේක්ෂ වේතන	සාමූහික කේවල් කිරීම හා අනුගත කරඟකාරී වේතන
සේවා ස්ථානීය නම්‍යශීලීභාවය	විවිධ රාජකාරී ස්වභාවයන්ට සරිලන නම්‍යශීලී රාජකාරී කාර්ය ක්‍රියාවිධීන් සේවා නියුක්තිය හා විශ්‍රාම යාමෙන් අනතුරුව මූල්‍යමය, භෞතික හා මානසික සහය සපයන සුළු සෞඛ්‍ය නංවන වැඩසටහන් පැවැත්වීම.
මානසික සෞඛ්‍ය පිළිබඳ අවධානය	සඵලදායී තොරතුරු බෙදාහැරීම හා තත්කාලීන ප්‍රතිපෝෂණ හා සංවාද සඳහා බැංකුවේ අභ්‍යන්තර තොරතුරු විවරණිකා, අභ්‍යන්තර පරිගණක ජාලාව යාවත්කාලීන කිරීම් ආදී විවිධ සන්නිවේදන මෙවලම් හා මාධ්‍ය උපයෝගී කර ගැනීම.
බහුවිධ මාධ්‍ය ඔස්සේ ද්විපාර්ශ්වික සන්නිවේදනය	අන්‍යෙන්‍ය විශ්වාසය හා අවබෝධයෙන් යුතුව ගැටළු, දුක් ගැනවිලි හෝ ගැටුම් නිරාකරණය කර ගැනීම.
සාමූහික කේවල්කරණය සඳහා ස්වාධීනත්වය	අභ්‍යන්තර රැකියා වර්ධනය දිරි ගැන්වීමට සහ අදාළභාවය රැක ගැනීමට සිය කුසලතා හා හැකියාවන් වර්ධනය කර ගැනීම සඳහා සේවකයින් හට සහාය දීම හා දිරි ගැන්වීම.
වෘත්තීය සුරක්ෂිතබව	මානව හිමිකම් සුරැකීමට/ඇගැයීමට අදාළ සියලු නීතිවලට අනුකූලව ඊට අනුගතව ක්‍රියා කිරීම.
වෙනස්කොට නොසලකනු ලබන සහ සුරක්ෂිත රාජකාරී වාතාවරණය	අනාගත අවශ්‍යතා හා සේවක සංවර්ධනයට අවශ්‍ය ධාරිතාව වර්ධනය සඳහා සහාය වන පුහුණු හා සංවර්ධන වැඩසටහන් ඉදිරිපත් කිරීම.
රැකියා ප්‍රගතිය හා වෘත්තීය සංවර්ධනයට ඇති අවස්ථා	

ඒකාබද්ධ පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වය

ප්‍රමාණාත්මක භාවය පිළිබඳ කරුණු

සම්බන්ධිත ප්‍රාග්ධනය

තිරසාර සංවර්ධන ඉලක්කවලට ඇති සම්බන්ධතාව

මූලික



ද්විතීයික




ප්‍රතිඵල වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාමාර්ග

- දුෂ්කරතා හමුවේ උත්සුකව ක්‍රියාත්මක වන, වෙනස්වීම් වලට අවශ්‍ය පරිදිඅනුවර්තනය වන, අභියෝග නිසි ලෙස කළමනාකරණය කර ගැනීමේ හැකියාව සහිත ඔරොත්තු දෙන සුළු ශ්‍රම බලකායක් ගොඩ නැංවීම.
  - අභියෝගවලට ඔරොත්තුදීමේ සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම
  - පුහුණු හා සංවර්ධන අවස්ථා අඛණ්ඩව සැපයීම
  - වෘත්තීය හා පෞද්ගලික ජීවන තුලිතතාව දිරිගැන්වීම
  - සඵලදායී සන්නිවේදනය
  - සේවක සහය සලසන වැඩසටහන් ඉදිරිපත් කිරීම
  - සාර්ථකත්වය සැමරීම
- අපගේ සේවක අගය පිළිබඳ යෝජනා මත පදනම්ව ක්‍රියාකිරීමෙන් හා නව්‍යකරණයට දිරිදීමෙන් ඵලදායීත්වය උපරිම තලයකට ගෙනඒම
- සෑම සේවකයෙකුහටම සිය අනන්‍ය දැක්ම හා කුසලතා ආශ්‍රයෙන් දායකත්වය දැක්වීමට හැකි වන සේ සේවකයින් සවිබල ගැන්වීම, තමන්ට වටිනාකමක් ගෞරවයක් ලබාදෙන ස්ථානයක් බවට රැකියා ස්ථානය පත්කිරීමේ ආයතනික සංස්කෘතියක් කරා යන ගමනේදී අන්තර්ග්‍රහණය හා විවිධත්වය මත පදනම්වීම කෙරෙහි අවධානය යොමු කිරීම

නියාමකයින් හා රාජ්‍ය ආයතන

අපගේ සහභාගීත්වයට හේතු

- නියාමන ප්‍රතිපත්ති, නීති සම්පාදනය හා රෙගුලාසි මගින් ව්‍යාපාර කිරීමේ පිරිවැයට හා ආයෝජන මත සාධාරණ ප්‍රතිලාභයක් ලබා ගැනීමට බැංකුවලට ඇති හැකියාව සැලකිය යුතු ලෙස බලපෑ හැකි බැවින්, නියාමන අභියෝගවලට අනුවර්තනය වීමට සහ කළමනාකාරණය කිරීමට බැංකුව නියාමන වර්ධනයක් කල්තියා අධීක්ෂණය කරයි.
- නියාමන අනුකූලතාවයේ වැදගත්කම, අවධාරණය කරමින් අනුකූල නොවීම සඳහා වන දඩවලට ලක්වීමේ ඉඩකඩ හේතුවෙන් පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය පවත්වා ගැනීමට, මූල්‍ය ස්ථාවරත්වය ආරක්ෂා කිරීමට, බැංකුව නීති හා රෙගුලාසිවලට අනුකූල වේ.
- මූල්‍ය වෙළඳපලවල විනිවිදභාවය, වගවීම හා සාධාරණත්වය ප්‍රවර්ධනය කිරීම මගින් නියාමන සහ හෙළිදරව් කිරීමේ රාමු ආයෝජක විශ්වාසයේ අත්‍යවශ්‍ය කුළුණු ලෙස ක්‍රියාකරන බැවින්, සදාචාරාත්මක හැසිරීම, වගකීම් පාලනය සහ ආයෝජකයින්ගේ සහ ජනතාවගේ දිගුකාලීන අවශ්‍යතා සඳහා තම කැපවීම ප්‍රදර්ශනය කිරීම සඳහා බැංකුව මෙම රාමුවලට අනුගත වේ.



අපේක්ෂිත අගය අවබෝධ කර ගැනීම සහ මිනීම සම්බන්ධතාවයන් අපේක්ෂා

සේවක අපේක්ෂිත අගය	අගය උත්පාදනයේ ප්‍රතිඵලය	අපගේ අපේක්ෂිත අගය	අගය උත්පාදනයේ ප්‍රතිඵලය
බිලියන 16.1 සේවක පාර්ශ්‍රමික	✓	බැංකුවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම	✓
පිරිමි **45%** ස්ත්‍රී **55%**	✓	කුසලතා පූර්ණ පිරිස් ආකර්ෂණය හා රඳවා ගැනීම	✓
නිවැරදිහැසිරීම් අවධාරණයකිරීම මගින් හා ඊට අවධානය යොමු කිරීම මගින් අප සංස්කෘතිය වැඩිදියුණු කිරීම	✓	නව්‍යකරණයට සූදානම් කැපවුණු ශ්‍රමබලකාය	✓
පුහුණු පැය ගණන **52,630**	✓	සඵලදායී, කාර්යක්ෂම හා දක්ෂ ශ්‍රම බලකාය	✓
		ආචාරධර්ම හා වෘත්තීමයභාවය ඔසවා තැබීම	✓

✓ නිසි මගට එළඹ ඇත — ✓ දැනට අවශ්‍ය කටයුතු ක්‍රියාත්මකව පවතී — ✓ අවධානය අවශ්‍යවේ.

ඒකාබද්ධ පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වය

අපට අවශ්‍ය දේ

අපගේ ඉලක්කය

මූල්‍ය පද්ධතියේ ආරක්ෂාව සහ ශක්තිමත්බව පවත්වා ගනිමින් අදාළ නීති, රෙගුලාසි සහ අධීක්ෂණ අවශ්‍යතාවලට අනුකූල වන බවට සහතිකවීම.

- ශ්‍රී ලංකා මහ බැංකුව, මූල්‍ය නියාමන අධිකාරිය සහ රජය විසින් දක්වා ඇති අදාළ අනෙකුත් නියාමනවලට අනුකූලවීම.
- නියාමන අනුකූලතා අවදානය, ණය අවදානම, වෙළඳපළ අවදානම හා මෙහෙයුම් අවදානම ආදී අවදානම් ඵලදායී ලෙස කළමනාකරණය කිරීම.
- නියාමකයින්ට, කොටස්හිමියන්ට සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ට නිවැරදිසහ කාලෝචිත වාර්තා සැපයීම.
- පාරිභෝගික අවශ්‍යතා ආරක්ෂා කිරීම සහ ඔවුන්ගේ ගනුදෙනුවලදී සාධාරණව සලකනු ලබන බවට සහතික කිරීම.
- පද්ධතිමය අවදානම් කළමනාකරණය කිරීම සහ මූල්‍ය පද්ධතියේ සුමට ක්‍රියාකාරිත්වයට දායකවීම.

ඔවුන්ට අවශ්‍ය දේ

අපගේ වටිනාකම් යෝජනාව

ආරක්ෂිත, ඔරොත්තු දෙන සහ හොඳින් ක්‍රියාත්මක වන මූල්‍ය පද්ධතියක් ප්‍රවර්ධනය කිරීම සඳහා අනුකූලතාවය, ස්ථාවරත්වයළ අඛණ්ඩතාව විශ්වසනීයත්වය සහ කැපවීම පෙන්නුම් කිරීම.

- බැංකු ක්ෂේත්‍රය පාලනයට අදාළ නීති, රෙගුලාසි සහ මාර්ගෝපදේශවලට බැංකුව, අනුකූල වන බවට නියාමකයින්ට සහතිකවීම.
- බැංකු මෙහෙයුම්වල ආරක්ෂාව සහ ශක්තිමත් බව සහතික කිරීම සඳහා සවිමත් අවදානම් කළමනාකරණ රාමුව, අභ්‍යන්තර පාලන සහ ආතති පරීක්ෂා කිරීමේ ක්‍රියා පටිපාටි පිළිබඳ සාක්ෂි සැපයීම.
- අහිතකර ආර්ථික තත්ත්වයන් සහ කම්පනයන්ට ඔරොත්තදීමට බැංකුවට ඇති හැකියාව පෙන්නුම් කිරීම, එමගින් පද්ධතිමය අවදානම් අවම කිරීම සහ බැංකු පද්ධතිය කෙරෙහි විශ්වාසය ප්‍රවර්ධනය කිරීම.
- ක්‍රියාශීලී නියැළීම, විවෘත සන්නිවේදන සහ නිර්මාණාත්මක සංවාදය හරහා නියාමකයින් සමඟ සහයෝගී සබඳතාවයක් ඇති කර ගැනීම.

ප්‍රධාන නියාමකයින් සහ රාජ්‍ය ආයතනයන්හි අපේක්ෂා

දේශීය හා ජාත්‍යන්තර බැංකු රෙගුලාසිවලට අනුකූලවීම හා ඵලදායී අවදානම් කළමනාකරණ පිළිවෙත් ක්‍රියාත්මක කිරීම.

වංචා හා විෂමාචාර වැළැක්වීම සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන ක්‍රියාත්මක කිරීමත් සමඟ සඵලදායී අධ්‍යක්ෂ මණ්ඩලයක් ඇතුළු ශක්තිමත් පාලන ව්‍යුහයක් පිහිටුවීම.

ගනුදෙනුකරුවන්ගේ දත්ත සහ බැංකුවේ යටිතල පහසුකම් අරක්ෂා කිරීම සඳහා ශක්තිමත් සයිබර් ආරක්ෂණ පියවර ක්‍රියාත්මක කිරීම.

අපගේ උපාය මාර්ගික ප්‍රතිචාර

භාවිත යාන්ත්‍රණය යාවත්කාලීන කරනු පිණිස ස්ථාපිත ශක්තිමත් අනුකූලතා සහ අවදානම් කළමනාකරණ පිළිවෙත්වලට අනුගතවීම සහ නව නියාමන හා ඉදිරියට එන ප්‍රවණතා අඛණ්ඩව ඇගැයීම. පිටු අංක 191 සිට 213 දක්වා අවදානම් කළමනාකරණ වාර්තාව

කාලයත් සමඟ කොටස් හිමියන්ගේ වටිනාකම් ආරක්ෂා කිරීම සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ආයතනික පාලන ව්‍යූහය ශක්තිමත් කිරීම. පිටු අංක 167 සිට 181 දක්වා ආයතනික පාලන වාර්තාව

ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව සිද්ධීන්ට ප්‍රතිචාර දැක්වීමේ හැකියාවන් සහිත 24 X 7/365 පුරා ක්‍රියාත්මක ආරක්ෂක මෙහෙයුම් මධ්‍යස්ථානයක් ක්‍රියාත්මක කිරීම.

අපගේ සහභාගිත්වයේ උපාය මාර්ගය

- අනුකූල නොවීම් ශුන්‍ය උපාය මාර්ගයක් යෙදවීම.
- බැංකු ක්ෂේත්‍රයේ ජාත්‍යන්තර හා දේශීය හොඳව භාවිතයන් අනුගමනය කිරීම.
- බැංකුවේ ක්‍රියාකාරකම් සහ මූලපිරීම් පිළිබඳ යාවත්කාලීන කිරීම සැපයීම සඳහා නියාමකයින් සමඟ නිරන්තර සන්නිවේදන මාර්ග ස්ථාපිත කිරීම.
- නියාමන ප්‍රවණතා පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට සහ නියාමකයින් සමඟ සබඳතා ගොඩනගා ගැනීමට සම්මන්ත්‍රණ, සමුළු හා වැඩමුළුවලට සහභාගිවීමෙන් නියාමකයින් හා සෙසු සමකාලීනයින් හා සබඳතා ගොඩනගා ගැනීමට ක්ෂේත්‍රයට අදාළ සංගම්වලට සම්බන්ධවීම.
- නියාමකයින්ගෙන් තොරතුරු සඳහා වන ඕනෑම විමසීමක් හෝ ඉල්ලීමක් සඳහා කඩිනමින් හා සවිස්තරාත්මකව ප්‍රතිචාර දැක්වීම.

අප සහභාගි වන අයුරු

- නීති, රෙගුලාසි, චක්‍රලේඛ හා නියාමනවලට අනුකූලවීම මගින්
- රාජ්‍ය හා නියාමන නියෝජිතයින් සමඟ එකිනෙකා හා සම්මුඛව සහභාගි වන හමුවීම් හා අන්තර් ක්‍රියාකාරිත්වය මගින්
- වාර්ෂික හා අන්තර් වාරික මූල්‍ය ප්‍රකාශ ප්‍රකාශයට පත් කිරීම මගින්
- ක්ෂේත්‍රයටම අදාළ හා පොදු සංසද වලට සහභාගිවීම
- නියාමන හා රාජ්‍ය ආයතන මගින් සිදු කරනු ලබන ව්‍යවස්ථාපිත පරීක්ෂණවලට ප්‍රතිචාර දැක්වීම
- රෙගුලාසි කෙටුම්පත් හා නියාමන කෙටුම්පත් සම්දානයේදී සහභාගිත්වය
- විවිධ සමාජයීය වැඩසටහන්වල හවුල්කාත්වයි

ප්‍රමාණාත්මක භාවය පිළිබඳ කරුණු



සම්බන්ධිත ප්‍රාග්ධනය



තිරසාර සංවර්ධන ඉලක්කවලට ඇති සම්බන්ධතාව

ප්‍රාථමික



ද්විතියික



ඒකාබද්ධ පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වය

සම්බන්ධතාවයේ අපේක්ෂිත අගය අවබෝධ කර ගැනීම සහ මිනීම

නියාමයකින්ගේ හා රජයේ අපේක්ෂිත අගය

අගය උත්පාදනයේ ප්‍රතිඵලය

සමස්ත ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය
19.26%
(අවම නියාමන අවශ්‍යතාවය 12.5%)

රජයට ගෙවන ලද බදු
රු.බි. (1.6)
(2022 - රු.බි. 5.2)

අනුකූල නොවීම් ශූන්‍යවීම

අපගේ අපේක්ෂිත අගය

බැංකු ව්‍යාපාරික කටයුතු දිරිගන්වන සාධාරණ රෙගුලාසි හා ප්‍රතිපත්ති

- නිසි මගට එළඹ ඇත
- දැනට අවශ්‍ය කටයුතු ක්‍රියාත්මකව පවතී
- අවධානය අවශ්‍යවේ.

ප්‍රතිඵල වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාමාර්ග

- සක්‍රීය සහභාගිත්වය - ගැටළු පැහැනැගීමට පෙරාතුව නියාමකයින් සමග සංවාදයන්ට මුලපිරීම
- විවෘත සන්නිවේදනය - නියාමකයින් සමග විවෘත හා විනිවිද පෙනෙන සන්නිවේදන මාර්ග පවත්වාගෙන යාම, ව්‍යාපාර මෙහෙයුම්වල වෙනස්කම්, අවදානම් පැතිකඩ සහ අනුකූලතා මුල පිරීම් පිළිබඳව ඔවුන්ව දැනුවත් කිරීම සහ අනුකූලතා කාරණා සහ නියාමන වර්ධනයන් පිළිබඳව නියාමකයින්ගෙන් ප්‍රතිපෝෂණ සහ මඟ පෙන්වීම ලබාගැනීම.
- අනුකූලතා සමාලෝචන සහ ස්වයං - ඇගැයුම්: වඩිදියුණු කළහැකි ක්ෂේත්‍ර හඳුනා ගැනීමට සහ ඇති වියහැකි අනුකූලතා හිඩැස් ආමන්ත්‍රණය කිරීමට නිතිපතා අනුකූලතා සමාලෝචන සහ ස්වයං-ඇගැයුම් පැවැත්වීම,
- අඛණ්ඩ වැඩිදියුණු කිරීම් : උගත් පාඩම්, නියාමකයින්ගේ ප්‍රතිපෝෂණ හා නියාමන පරිසරයේ වෙනස්කම් මත පදනම්ව අනුකූලතා වැඩසටහන් අඛණ්ඩව ඇගැයීම හා වැඩිදියුණු කිරීම. විකාශනය වන නියාමන අවශ්‍යතාවලට ඵලදායී ලෙස අනුවර්තනයවීමට අඛණ්ඩ වැඩි දියුණු කිරීමේ සංස්කෘතියක් ක්‍රියාත්මක කිරීම.



ව්‍යාපාරික හවුල්කරුවන්

අපගේ සහභාගිත්වයට හේතුව

- විශේෂිත ආයතන හා හවුල්කාරිත්වය මගින් බැංකුවට බැංකුව තුළින් සොයාගත නොහැකි විශේෂඥ සහයක් වේ නම්, එය ලබාගත හැකිවීම.
- සාම්ප්‍රදායික බැංකුකරණය මගින් සපයනු ලබන නිමැවුම් හා සේවා වලින් එපිට නිමැවුම් හා සේවා මාලාවක් වෙත ව්‍යාප්තවීමේ හැකියාව.
- නව ගනුදෙනුකාර කොටස් සොයා අපගේ වෙළඳපළ ව්‍යාප්ත කර ගැනීමට වෙනස් භූගෝලීය කලාපයන්හි ව්‍යාපාර හා හවුල්කාරිත්වයන්ට එළඹීම.
- බැංකු මෙහෙයුම් හා සම්බන්ධ ඇතැම් අවදානම් අවම කිරීමට

අපගේ සහභාගිත්වයේ උපාය මාර්ග

- ඔවුන්ගේ කීර්තිනාමය, මූල්‍ය ස්ථාවරත්වය සහඅපගේ වටිනාකම් හා අරමුණු සමග පෙළගැස්වෙන අයුරු තක්සේරු කිරීමේ සූක්ෂම ඇගැයීමකින් පසුව බැංකුවේ ශක්තීන් හා උපාය මාර්ගික ප්‍රමුඛතාවලට අනුපූරක කවන හැකියාවන් සහිත ව්‍යාපාරික හවුල්කරුවන් හඳුනා ගැනීම.
- ව්‍යාපාරික හවුල්කරුවන් සඳහා ප්‍රධාන සම්බන්ධතා පිවිසුම ලෙස සේවය කිරීමට කැප වූ සම්බන්ධතා කළමනාකරුවන් හෝ හවුල්කාරිත්ව සම්බන්ධීකාරකවරුන් සමග විශ්වාසය, අන්‍යෝන්‍ය ගෞරවය හා විවෘත සන්නිවේදනය මත පදනම්ව ව්‍යාපාරික හවුල්කරුවන් හා ශක්තිමත් සබඳතා ගොඩ නගා ගැනීම.
- ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා තොරතුරු, යාවත්කාලීන කිරීම් සහ ප්‍රතිපෝෂණ බෙදාගැනීමට සහ කාලෝචිත ලෙස ගැටළු විසඳීම සඳහා විධිමත් හා විනිවිද පෙනෙන සන්නිවේදන මාර්ග පවත්වාගෙන යාම.

අප සහභාගි වන අයුරු

- ප්‍රසම්පාදන හා පහසුකම් සහිත එකිනෙකා සම්මුඛ වන රැස්වීම්
- සැපයුම්කරු ඇතුළත් කර ගැනීමේ හා ප්‍රේරක වැඩසටහන්
- සේවා මට්ටමේ ගිවිසුම් කළමනාකරණය සහ සේවා බෙදාහැරීමේ ප්‍රතිපෝෂණ සහ සැපයුම්කරුගේ චර්යාධර්ම සංග්‍රහයට අනුකූලවීම අධීක්ෂණය කිරීම
- නිමැවුම් හා සේවා පිළිබඳ පුහුණු සැසි
- අඛණ්ඩ ක්ෂේත්‍ර විසිත්ත කිරීම

ඒකාබද්ධ පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වය

අපට අවශ්‍ය දෑ

අපගේ ඉලක්කය

ව්‍යාපාරික අවස්ථා නිර්මාණය කර ගන්නා අතරතුර අර්ථවත් සබඳතා ගොඩනගා ගනිමින් සදාචාරාත්මක හැසිරීම, නෛතික අනුකූලතාවය හා තිරසාරභාවය තුළින් වගකිම් සහගත මෙන්ම අනුකූල ව්‍යාපාරික හවුල්කරුවෙකුවීම.

- රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ පිළිපැදීම
- ශක්තිමත් පරිවර්තනීය අරමුණු හා සුදුසුකම් සහිත සැපයුම්කරුවන් සමග හවුල්වීම
- තිරසරබව ප්‍රවර්ධනය කරන ආර්ථිකයක් සඳහා අවස්ථා නිර්මාණය කිරීම පිණිස බැංකුවේ මූල්‍ය විශේෂඥතාවය, ක්ෂේත්‍ර දැනුම හා පාර්ශ්වකරුවන්ගේ ජාලය උපයෝගී කර ගැනීම
- අපගේ වටිනාකම්, චර්යාධර්ම සංග්‍රහය හා ආචාරධර්ම ප්‍රමිතීන් සමග සමපාත වන සේවාවක් සැපයීම.

ඔවුන්ට අවශ්‍ය දේ

අපගේ වටිනාකම් යෝජනාව

සැපයුම් ජාලය ශක්තිමත් කිරීම, නවෝත්පාදනයන් මෙහෙයවීම සහ සම්බන්ධ වන සියලුම පාර්ශ්වකරුවන් සඳහා වටිනාකමක් නිර්මාණය කිරීම පිණිස සැපයුම්කරුවන් සමග අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රයෝජනවත් හවුල්කරිත්වයක් ඇති කිරීම.

- ව්‍යාපාර වර්ධනය කර ගැනීම සඳහා අවශ්‍ය වන අවස්ථා හා හවුල්කාරිත්වයන් හඳුනා ගැනීම හා ඒ ඔස්සේ උපරිම ප්‍රයෝජන ලබා ගැනීම.
- සාධාරණ අවස්ථා හා සාකච්ඡා ක්‍රියාවලීන් ප්‍රවර්ධනය කිරීම.
- සදාචාරාත්මක ප්‍රමිතීන් ආරක්ෂා කිරීම, රෙගුලාසිවලට අනුකූලවීම හා සමාජීය හා පාරිසරික වශයෙන් වගකීම් සහගත ලෙස ව්‍යාපාර පවත්වාගෙන යාම.
- පැහැදිලිව සන්නිවේදනය කරන ලද සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටිතුළ නියමිත වෙලාවට ගෙවීම් කරනු ලබන බවට සහතිකවීම.
- ප්‍රසම්පාදන ක්‍රියාවලීන් සමඟ තිරසාරභාවය පිළිබඳ සලකා බැලීම් ඒකාබද්ධ කිරීම.

ප්‍රධාන ව්‍යාපාරික හවුල්කාර අපේක්ෂා

හවුල්කාරිත්ව සඳහා සහයෝගය පිණිස මූල්‍ය ස්ථාවරත්වය හා ධාරිතාව

පැහැදිලි හා පාරදෘශ්‍ය සන්නිවේදනය

සත්‍ය හා සාධාරණ ප්‍රතිකර්ම ලබාදීම.

අපගේ උපායමාර්ගික ප්‍රතිචාරය

ලංකා රේටින්ග්ස් ආයතනය මගින් සිදු කරනු ලබන ත්‍රිත්ව "ඒ" ස්ථාවර ශ්‍රේණිගත කිරීම පවත්වා ගැනීම.

ව්‍යාපාරික හවුල්කරුවන්ගේ අවශ්‍යතා, ගැටළු හා සැලකිය යුතු කරුණු පිළිබඳ අවබෝධ කර ගැනීමට සක්‍රීය සන්නිවේදනය (අපගේ සන්නාම ප්‍රතිභාවළ උපායමාර්ග, ව්‍යාපාරික යාවත්කාලීන කිරීම් හා මෙහෙයුම් කටයුතු පිළිබඳ කරුණු අන්තර්ගත) සහ ප්‍රතිපෝෂණ යාන්ත්‍රණයක් පවත්වා ගැනීම.

සැපයුම්කරුවන් හා ගිවිසුම් අඛණ්ඩව සමාලෝචනය කර වැඩිදියුණු කිරීම

ප්‍රමාණාත්මක භාවය පිළිබඳ කරුණු

සම්බන්ධිත ප්‍රාග්ධනය

තිරසාර සංවර්ධන ඉලක්කවලට ඇති සම්බන්ධතාව

ප්‍රාථමික

8 DECENT WORK AND ECONOMIC GROWTH
9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE
12 RESPONSIBLE CONSUMPTION AND PRODUCTION

ද්විතියික

17 PARTNERSHIPS FOR THE GOALS

සම්බන්ධතාවයේ අපේක්ෂිත අගය අවබෝධ කර ගැනීම සහ මිනීම

ව්‍යාපාරික හවුල්කරුවන් අපේක්ෂිත අගය

අගය උත්පාදනයේ ප්‍රතිඵලය

දේශීය ප්‍රසම්පාදන මත වියදම් කිරීම
රු.මි. 1,575.6
(2022 - රු.මි. 906.1)

තොරතුරු තාක්ෂණ සේවා සැපයුම්කරුවන්ගෙන් ප්‍රසම්පාදනය
රු.මි. 350.6
(2022 – රු.මි. 370.1)

අනුකූල නොවීම් ශූන්‍යවීම
(2022 – අනුකූලතා නොවීම් ශූන්‍යවීම්)

අපගේ අපේක්ෂිත අගය

දේශීය ප්‍රසම්පාදනයට සහායවීම, සේවා නියුක්තිය හා කුඩා හා මධ්‍යම පරිමාණ වෙළඳ ආයතන ඉහළ නැංවීම

නිසි මගට එළඹ ඇත	දැනට අවශ්‍ය කටයුතු ක්‍රියාත්මකව පවතී	අවධානය අවශ්‍යවේ.

ප්‍රතිඵල වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාමාර්ග

- විවිධ පසුබිම්වලින් ක්‍රියාත්මක විවිධාකාර සැපයුම්කරුවන් හා ව්‍යාපාරික කටයුතුවල නිරතවීම මගින් හා සක්‍රීයව ඔවුන් සොයා ගැනීම මගින් සැපයුම්කාර විවිධත්වය හා අන්තර්ග්‍රහණය ප්‍රවර්ධනය කිරීම.
- තිරසාර හා වගකීම් සහගත ව්‍යාපාරික පරිචයන් අනුගමනය කිරීමට සැපයුම්කරුවන්ට සහායවීම හා දිරිගැන්වීම.
- ව්‍යාපාරික අඛණ්ඩතාව හා ඔරොත්තදීමේ හැකියාව සහතික කරලීම පිණිස සැපයුම් ජාලය තුළ පවතින අවදානම් හඳුනා ගැනීම හා අවම කිරීම.

ඒකාබද්ධ පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වය



සමාජය හා පරිසරය

අප සහභාගිවීමට හේතුව

- අප විසින් සේවා සපයනු ලබන ප්‍රජාවන්ගේ ගැටළු හා අභියෝග අවබෝධ කර ගැනීම තුළින් එකී ප්‍රජාවන්ට ධනාත්මකව දායකත්වය ලබාදීම හා ඒ සමග අන්‍යෝන්‍ය ප්‍රතිලාභ ගෙන දෙන සුළු සම්බන්ධතා පවත්වා ගැනීම.
- සමාජ හා පාරිසරික වගකීම ඇතුළු තිරසාර ව්‍යාපාර පරිචයන් ඔස්සේ දීර්ඝ කාලීන මූල්‍ය කාර්යසාධන හා තිරසාරභාවය මත පිහිටා කටයුතු කිරීම.

අපගේ සහභාගිත්වයේ උපායමාර්ගය

- බැංකුවේ සමස්ත මෙහෙයුම්, වටිනාකම් හා උපායමාර්ග ශා සමපාත වන සමාජයීය හා පාරිසරික සහභාගිත්වයක් සඳහා වූ නිශ්චිත හා මිනිය හැකි අරමුණු නිශ්චය කොට දැක්වීම.
- බැංකුවේ සමස්ත ව්‍යාපාරික උපායමාර්ග, තීරණ ගැනීමේ ක්‍රියාවලිය හා අවදානම් කළමනාකරණ රාමුව තුළට සමාජයීය හා පාරිසරික කරුණු පිළිබඳව සලකා බැලීම් ඒකාබද්ධ කිරීම.
- බැංකුවේ මෙහෙයුම් සම්බන්ධයෙන් අබණ්ඩ පාරිසරික විශ්ලේෂණ හා බලපෑම පිළිබඳ ඇගැයීම් සිදු කිරීම.

අප සහභාගි වන අයුරු

- බහුවිධ මාධ්‍ය ඔස්සේ ප්‍රජාවන් සමග සෘජු හා වක්‍ර සන්නිවේදනය
- **සෘජු:** ආයතනික වෙබ් අඩවිය, සමාජ මාධ්‍යය, වෙළඳ දැන්වීම්, සම්මුඛ පරීෂණ, දැන්වීම්, වාර්ෂික වාර්තා හා මූල්‍ය ප්‍රකාශ
- **වක්‍ර:** කුසලතා සංවර්ධන සැසි, පාරිසරික දැනුවත් කිරීමේ සැසි, සමාජ සංවර්ධනය

අපට අවශ්‍ය දෑ

අපගේ ඉලක්කය

සියලුම පාර්ශ්වකරුවන්ට වටිනාකම් උත්පාදනය වන අයුරින් හා තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය වන ලෙසින් මෙන්ම වත්මන් හා අනාගත පරම්පරාවන්හි සුබසිද්ධිය පිණිස දායක වන අයුරින් මෙහෙයුම් කටයුතු සිදු කිරීම.

- සේවා අවශ්‍ය තරම් නොලබන හා අඩු වරප්‍රසාදලාභී ජනතාව වෙත බැංකු සේවාවන්ට, ණය හා මූල්‍යමය නිමැවුම්වලට ප්‍රවේශය සැපයීම තුළින් ඔවුන් සඳහා මූල්‍ය අන්තර්ග්‍රහණය ප්‍රවර්ධනය කිරීම.
- ඵලදායී ආයෝජන, ව්‍යවසායකත්වය හා නව්‍යකරණයට පහසුකම් සැලසීම, රැකියා අත්පාදනයට ව්‍යාපාර ව්‍යාප්තියට රුකුල්දීම පිණිස ප්‍රාග්ධනය වෙන් කිරීම්.
- ආයෝජන තීරණ සහ ව්‍යාපාරික පරිචයන් වෙත පාරිසරික කරුණු පිළිබඳ සලකා බැලීම් ඇතුළත් කිරීම.
- අගතියට පත්විය හැකි ජන කොටස්වල ජීවන තත්වයන් උසස් කරලීම සහ ඔවුන් සඳහා ධනාත්මක සමාජයීය ප්‍රතිඵල ගෙන එන සුළු ව්‍යාපෘති හා වැඩසටහන් කෙරෙහි මූල්‍ය සම්පත් හා විශේෂඥභාවය යොදා ගැනීම.
- බැංකුව තුළ හා ඔවුනගේ උනන්දුව දක්වන පාර්ශ්වයන් අතර වගකීම් සහගත පාලන පරිචයන් ප්‍රවර්ධනය කිරීම.

ඔවුනට අවශ්‍ය දේ

අපගේ වටිනාකම් යෝජනාව

වගකීම් සහගත බැංකු පරිචයන්, තිරසර ආයෝජන සහ උනන්දුව දක්වන පාර්ශ්වයන් සමග සක්‍රීය නිරතවීම් ඔස්සේ ධනාත්මක වූ සමාජයීය, ආර්ථික හා පාරිසරික ප්‍රතිඵල ජනනය කිරීම් සඳහා රුකුලක්වීම්.

- විධිමත් ආර්ථිකයට සහභාගීවීමට, වත්කම් වර්ධනයට හා ඔවුන්ගේ ආර්ථික අභිමතාර්ථ වැඩිදියුණු කර ගැනීමට හැකි ලෙෂ තනි තනි පුද්ගලයන් මෙන්ම ව්‍යාපාර සවිබල ගැන්වීම.
- ව්‍යවසායකත්වය හා නව්‍යකරණයට සහයවීම මෙන්ම වාණිජ ව්‍යාපාර සඳහා පහසුකම් සැලසීම මගින් හා ඵලදායී ආයෝජන කටයුතු වෙනුවෙන් ප්‍රාග්ධනය වෙන් කිරීම මගින් ආර්ථික වර්ධනය හා දියුණුවට පිටුවහලක්වීම.
- නියාමන අනුකූලතාව හා මූල්‍ය කාර්යසාධනය ඉක්මවා යන ආයතනික සමාජ වගකීම් පිළිබඳ මුලපිරීම් හරහා සමාජයට මෙන්ම පරිසරයට අපගේ කැපවීම සහතිකවීම.
- සියලු පාර්ශ්වයන්ට සක්‍රීයව සවන්දීම හා ඔවුන්ගේ ප්‍රතිපෝෂණ උපයෝගී කර ගැනීම, සියලුම උනන්දුව දක්වන පාර්ශ්වකරුවන්හට බෙදියන වටිනාකම් උත්පාදනයට විශ්වාසය ගොඩනැංවීමට අදාළ තීරණ ගැනීමේ ක්‍රියාවලිය හා වෙනත් ආයතන හා එක්ව කටයුතු කිරීම.

ප්‍රධාන සමාජ හා පාරිසරික අපේක්ෂා

මානව/පාරිසරික හිතකාමී මූලපිරීම් මෙන්ම මූල්‍යමය අන්තර්ග්‍රහණ වැඩසටහන් සහ සේවා පහසුකම් අඩුවෙන් ලබන ජන කොටස් වෙත සහායවීමෙන් සමාජ සුබසාධනයට හා ප්‍රජා සංවර්ධනයට දායකවීම.

අඩු ආදායම්ලාභී පුද්ගලයින්, කුඩා ව්‍යාපාරිකයන් හා ග්‍රාමීය ජන කොටස් ඇතුළුව සේවා පහසුකම් අඩු වශයෙන් ලබන හා අඩු වරප්‍රසාදලාභී ප්‍රජාවන් වෙත වඩාත් පහසුවෙන් ප්‍රවේශ විය හැකි දරාගත හැකි මූල්‍ය සේවා සැපයීම

ගනුදෙනුකරුවන්, ආයෝජකයින්, නියාමකයින් හා වෙනත් උනන්දුව දක්ව පාර්ශ්වකරුවන් හා කටයුතු කිරීමේදී ආචාරධර්ම පිරි ව්‍යාපාර පරිචයන්ට අනුකූලවීම පාරදෘශ්‍යභාවය සහිතව ක්‍රියා කිරීමට හා විශ්වසනීයත්වය රැකගැනීම යන කරුණුවලට අනුව කටයුතු කිරීම.

අපගේ උපායමාර්ගික ප්‍රතිචාරය

බැංකුවේ හර ව්‍යාපාරික මෙහෙයුම්වලට, තීරණ ගැනීමේ ක්‍රියාවලියට හා අවදානම් කළමනාකරණ රාමුව යන කරුණු වෙත සමාජයීය හා පාරිසරික කරුණු පිළිබඳව සලකා බැලීම් ඇතුළත් වන අන්දමේ ඒකාබද්ධ තිරසාරභාවය පිළිබඳ උපාය මාර්ගයක් සංවර්ධනය කිරීම.

සේවා පහසුකම් සඳහා අඩු වශයෙන් හිමිකම් කියනු ලබන ප්‍රජාවන්හි යටිතල පහසුකම් වර්ධනය, දේශීය ආර්ථිකය, දියුණුබව අධ්‍යාපනයට හා සෞඛ්‍ය සේවාවනට සහයවීම පිණිස ප්‍රජා සහභාගීත්ව වැඩසටහන් හා මූලපිරීම් ක්‍රියාවට නැංවීම.

සමාජ හා පාරිසරිස අභියෝගවලට විසඳුම් සැපයීමට හා තීරණාත්මක තිරසරභාවය පිළිබඳ කරුණු මත සාමූහික ක්‍රියාවලියක් වෙත යොමුවීමට ඩිජිටල් සමාජයීය ආයතන, පර්සරික කණ්ඩායම්, අධ්‍යාපනික ආයතන හා වෙනත් කොටස් හිමියන් සමගක උපාය මාර්ගික හවුල්කාරිත්වයනට හා සන්ධානවලට එළඹීම.

ඒකාබද්ධ පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වය

ප්‍රමාණාත්මක භාවය පිළිබඳ කරුණු

සම්බන්ධිත ප්‍රාග්ධනය

තිරසාර සංවර්ධන ඉලක්කවලට ඇති බැඳියාව

මූලික



ද්විතීයික





සම්බන්ධතාවය මගින් පැන නගින අපේක්ෂිත වටිනාකම් අවබෝධ කර ගැනීම සහ මිනීම

සමාජය හා පරිසරය තුළ අපේක්ෂිත වටිනාකම

අගය උත්පාදනයේ ප්‍රතිඵලය

ජල පරිභෝජනය ඉහළයාම
ඝන මීටර් 3,465
(2022 - 18,556)

ජාතික පද්ධතියට
කිලෝවොට් 461,584 ක
විදුලි ධාරිතාවක් සැපයීම

අනුකූල නොවීම් නොමැතිවීම
(2022 - අනුකූලතා නොවීම් නොමැත)

අපගේ අපේක්ෂිත වටිනාකම්

යහපත් ආයතනික පුරවැසිභාවය

යෞවන හා කාන්තා බලගැන්වීම්

ප්‍රජාවන් හා හවුල් ව්‍යාපාරවලට එළඹීම

නිසි මගට එළඹ ඇත

දැනට අවශ්‍ය කටයුතු ක්‍රියාත්මකව පවතී

අවධානය අවශ්‍ය වේ

ප්‍රතිඵල වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාමාර්ග

- සමාජයීය හා පාරිසරික අභියෝග සාමූහිකව ආමන්ත්‍රණය කිරීමට, ප්‍රතිපෝෂණ ලබාගැනීමට, විවිධ දෘෂ්ටිකෝණවලට සවන්දීමට සහ තීරණ ගැනීමේදී පාර්ශ්වකරුවන්ගේ අදහස්/යෙදවුම් ඒකාබද්ධ කිරීමට පාර්ශ්වකරුවන් සමඟ (පාරිභෝගිකයන්, සේවකයන්, පාර්ශ්වකරුවන්/ආයෝජකයන්ළ නියාමකයන් සහ ව්‍යාපාරික හවුල්කරුවන් ඇතුළුව) සංවාදය, සහයෝගිතාවය සහ හවුල්කාරිත්වය පෝෂණය කිරීමේ ක්‍රියාවලීන්.
- සමාජ සමානාත්මතාවය, පාරිසරික තිරසාරත්වය සහ වගකිවයුතු ව්‍යාපාරික භාවිතයන් ප්‍රවර්ධනය කරන ප්‍රතිපත්ති සහ රෙගුලාසි වෙනුවෙන් පෙනී සිටීම.
- ප්‍රතිපත්ති සම්පාදකයින්, කාර්මික සංගම් සහ උපදේශන කණ්ඩායම් සමඟ සම්බන්ධ වී තීරණ ගැනීමට බලපෑම් කිරීම සහ ප්‍රාදේශීය, ජාතික සහ ගෝලීය මට්ටමින් ධනාත්මක වෙනස්කම් ඇති කිරීම.



ඒකාබද්ධ වාර්තාව

කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණය

මූල්‍ය ප්‍රාග්ධනය **96**

ව්‍යාපාර මාර්ග සමාලෝචනය **106**

නිෂ්පාදිත ප්‍රාග්ධනය **112**

බුද්ධිමය ප්‍රාග්ධනය **118**

මානව ප්‍රාග්ධනය **124**

සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය **136**

ස්වභාවික ප්‍රාග්ධනය **146**

මූල්‍ය ප්‍රාග්ධනය

තිරසාර වර්ධනය සඳහා පදනමක්



බැංකුව සඳහා මූල්‍ය ප්‍රාග්ධනයෙන් අදහස් කරන දෑ

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ මූල්‍ය ප්‍රාග්ධනය එහි මෙහෙයුම් හා උපාය මාර්ගික රාමුව නියෝජනය කරන තීරණාත්මක සාධකයක් වන අතර, කොටස් ආයෝජන, රඳවාගත් ඉපැයීම් සහ ණය මූල්‍යකරණයෙන් සමන්විත වේ.

මෙම මූල්‍ය සම්පත එදිනෙදා මෙහෙයුම්වලට පමණක් නොව බැංකුවට වර්ධන අවස්ථාවන් හඹායාමට, නව්‍යකරණ තාක්ෂණයන් හි ආයෝජනය කිරීමට සහ සිය වෙළෙඳපොල පැවැත්ම පුළුල් කිරීමට සවිබල ගන්වයි.

අපගේ තිරසාර වටිනාකම් නිර්මාණයට මූල්‍ය ප්‍රාග්ධනය සහයවන ආකාරය

මූල්‍ය ප්‍රාග්ධනය අපගේ වටිනාකම් නිර්මාණ අරමුණු කරා යාම අපව ශක්තිමත් කරන ප්‍රධාන ප්‍රතිඵලය වන අතර එය අපගේ ගනුදෙනුකරුවන්ට, සේවකයින්ට, කොටස්හිමියාට, සහ පුළුල් ලෙස ප්‍රජාවටම සුපිරි වටිනාකමක් ලබාදීමට කැපවූ මූල්‍ය ක්ෂේත්‍රයේ විශ්වාසදායී සහ ප්‍රමුඛ ආයතනයක් ලෙස අපට රැඳී සිටීමට සහතික කරයි.

වටිනාකම් පරිවර්තනය

- වර්ධනය, කාර්යක්ෂමතාව සහ තිරසාරභාවය ක්‍රියාත්මක කරන විවිධ උපායමාර්ග වැඩසටහන්වල අපගේ මූල්‍ය ප්‍රාග්ධනය උපායමාර්ගිකව යෙදවීම මඟින්, බැංකුව එහි මූල්‍ය ප්‍රමිතිය පමණක් නොව එහි තරඟකාරී තත්ත්වය, කීර්තිනාමය, සහ දිගු-කාලීන තිරසාරභාවය වැඩි කරමින් පාර්ශ්වකරුවන් වෙත සිය වටිනාකම් කොටස පරිවර්තනය කරයි. මෙම සාකල්‍ය වටිනාකම් පරිවර්තනය බැංකුවේ පුළුල් පරමාර්ථ වන, වර්ධනය, ගනුදෙනුකාර තෘප්තිය, සහ පාර්ශවකාර සහභාගිත්වයට සහය වේ.

ප්‍රධාන යෙදවුම

- මුදල් හා මුදල් සමාන දේවල්
- කොටස් ප්‍රාග්ධනය හා සංචිත
- ගනුදෙනුකරුවන්ගේ තැන්පතු
- දිගුකාලීන සහ කෙටිකාලීන ණය ගැනීම්

ප්‍රධාන නිමැවුම

උපායමාර්ගික කාර්ය සාධනය

පොළි ආදායම් වර්ධනය	පොළි ආදායම	ආදායමට පිරිවැය අනුපාතය
31.2%	රු. බි. 227.0	71.59%
(2022 – 31.6%)	(2022 – රු. බිලියන 172.9)	(2022 – 62.93%)

කොටස්හිමියන් සඳහා වටිනාකම

හිමිකම් මත ලාභය
9.36%
(2022 – 3.40%)

වැඩි වූ අවදානම් පිරිවැය

ආවරණ අලාභය සඳහා ප්‍රතිපාදනය (අදියර) 3
53.3%
(2022 – 38.9%)

වත්කම් හා තැන්පතුවල වර්ධනය

වත්කම් වර්ධනය	තැන්පතු සංචලනය
4.35%	රු. බි. 10.7
(2022 – 2.38%)	(2022 – රු. බිලියන 16.0.)

ශක්තිමත් ප්‍රාග්ධනය හා ද්‍රවශීලතාව

සමස්ථ ප්‍රාග්ධන අවශ්‍යතා	ද්‍රවශීලතා ආවරණ අනුපාතය (සියලු මුදල් ඒකක)
19.26%	293.71%
(2022 – 18.00%)	(2022 – 193.49%)

මූල්‍ය ප්‍රාග්ධනය

අප අපේ මූල්‍ය ප්‍රාග්ධනය වර්ධනය කරන ආකාරය

- ආදායම් මාර්ග වැඩිදියුණු කිරීම සහ පිරිවැය මට්ටම් ප්‍රශස්ථ කිරීම තුළින් ලාභදායිතාවයේ ස්ථාවර වර්ධනයක් පවත්වා ගනිමින් ශක්තිමත් උපායමාර්ගික කාර්ය සාධනයක් ලබා ගැනීම.
- අභියෝග මධ්‍යයේ ණය දීම, ආයෝජන අවස්ථා මත ප්‍රාග්ධනය යෙදීම, සහ විචක්ෂණ ණය පැතිකඩක් පවත්වා ගැනීම තුළින් ශේෂ පත්‍රයේ වර්ධනය සහතික කිරීම,
- නියාමන සීමාවන් ඉක්මවන සහ බැංකුවේ අවදානම් රුචිය තුළ ශක්තිමත් ප්‍රාග්ධන මට්ටම් පවත්වා ගැනීම.
- බැංකුවේ මෙහෙයුම්වල සුමට බව සහතික කිරීම සහ මූල්‍ය පද්ධතිය තුළ විශ්වාසය ඇති කිරීම සඳහා ප්‍රමාණවත් අරමුදල් සුරක්ෂිත කිරීම සහ ද්‍රවශීලතා මට්ටම් කළමනාකරණය කිරීම.

ප්‍රතිඵල කළමනාකරණය සඳහා ප්‍රවේශ

- වැඩිදියුණු කිරීම අවශ්‍ය වන ක්ෂේත්‍ර හඳුනා ගැනීම සඳහා මූලික කාර්යසාධන දර්ශක තුළින් ලාභදායිතාව, ද්‍රවශීලතා අනුපාත, ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාත, සහ වත්කම්වල තත්ත්ව දර්ශක නිරන්තරයෙන් නියාමනය.
- ණය, වෙළෙඳපොල, ද්‍රවශීලතාව,සහ මෙහෙයුම් අවදානම් ඇතුළුව මූල්‍ය ප්‍රාග්ධනයට වියහැකි තර්ජන හඳුනා ගැනීමට විස්තීර්ණ අවදානම් තක්සේරු පැවැත්වීම. අහිතකර සිදුවීම්වල බලපෑම අවම කිරීම සඳහා විවිධාංගීකරණය, ඉදිරි රැකීම්, සහ අහඹු සැලසුම් කිරීම වැනි අවදානම අවම කිරීමේ උපායමාර්ග ක්‍රියාත්මක කිරීම.
- ඉහළම ආදායම් විභවතා සහිත ක්ෂේත්‍රවලට ප්‍රාග්ධනය වෙන් කිරීම සහ අවදානම්-ගලපන ලද ප්‍රතිලාභය සහ කාර්යක්ෂමව ප්‍රාග්ධනය වෙන් කිරීම සැලකිල්ලට ගැනීම.
- ද්‍රවශීලතා අවදානම් අවම කිරීමට අරමුදල් මූලාශ්‍ර විවිධාංගීකරණය, කල්පිරීමේ නොගැලපීම් කළමනාකරණය සහ අරමුදල් වෙළෙඳපොලට ප්‍රවේශය පවත්වා ගැනීම.

සාර්ථකත්වයේ තීරණාත්මක සාධක/උපායමාර්ගික මූලිකාංග

- ස්ථාවර ලාභ උත්පාදනය.
- වියහැකි අලාභ උකහා ගැනීමට සහ නියාමන අවශ්‍යතා පසුරාලීමට යහපත් ප්‍රාග්ධන මට්ටම් පවත්වා ගැනීම.
- ණය, වෙළෙඳපොල, ද්‍රවශීලතාව, සහ මෙහෙයුම් අවදානම් ඇතුළුව මූල්‍ය අවදානම් ඵලදායීව කළමනාකරණය.
- උසස් තත්ත්වයේ වත්කම් කළඹක් පවත්වා ගැනීම
- ද්‍රවශීලතා අවදානම් අවම කිරීමට සහ මූල්‍ය ස්ථාවරත්වය සුරැකීමට ශක්තිමත් ද්‍රවශීලතාව අවදානම් කළමනාකරණ ව්‍යවහාර ක්‍රියාත්මක කිරීම, ප්‍රමාණවත් මුදල් සංචිත පවත්වා ගැනීම, සහ අරමුදල් සංචිත විවිධාංගීකරණය.

පාර්ශ්වකරුවන්ට නිර්මාණය කළ වටිනාකම

කොටස්හිමියා/ආයෝජකයින්

බැංකුවේ මූල්‍ය කාර්යසාධනය වර්ධනය වන විට කොටස්වල වටිනාකම/ලාභදායිතාවය වර්ධනයවීම තුළින් ලැබෙන ප්‍රතිලාභ.

නියාමකයින් සහ රජයේ ආයතන

බැංකු පද්ධතිය තුළ ස්ථාවරත්වය සහ විශ්වාසය පෝෂණය කරන නියාමන ප්‍රාග්ධන අවශ්‍යතා සහ විචක්ෂණ ප්‍රමිති සමඟ බැංකුවේ මූල්‍ය ප්‍රාග්ධනය ගිණින් සහතික කරයි. බැංකුවේ මෙහෙයුම් සහ ආර්ථික වර්ධනයට සහ සංවර්ධනයට දායකත්වයන්ගෙන් උත්පාදිත බදු ආදායම්වලින් රජයේ ආයතන ප්‍රතිලාභ ලබයි.

ගනුදෙනුකරුවන්

සිය මූල්‍ය අරමුණු සාක්ෂාත් කර ගැනීමට සහයවන සාධාරණ බැංකු සේවා සඳහා ප්‍රවේශය, තරඟකාරී පොළී අනුපාත, සහ නව්‍යකරණ මූල්‍ය විසඳුම්.

ව්‍යාපාරික හවුල්කරුවන්

සහයෝගය, නව්‍යකරණය සහ ව්‍යාපාර සම්බන්ධතාවල අවදානම් අවම කර ගැනීමට පිරිනමන අරමුදල් කරා විශ්වාසය ගොඩ නැගීම සහ ප්‍රවේශය ලබාදීම.

සේවකයින්

උපකාරී සේවා පරිසරයක්, වෘත්තීය අභිවෘද්ධි අවස්ථා සහ බැංකුවේ මූල්‍ය කාර්යසාධනයට සම්බන්ධ දිරිදීමනා.

සමාජය හා පරිසරය

අධ්‍යාපනය, සොබ්‍යාරක්ෂාව, යටිතල පහසුකම්, සමාජ යහසාධන වැඩසටහන් සහ ස්වභාවික සම්පත් සුරැකීම තුළ ආයෝජන බැංකුව විසින් සේවය ලබාදෙන ප්‍රජාවන්ගේ ආර්ථික හා සමාජ සුභසාධනයට දායක වන අතර පරිසරය ආරක්ෂා කරයි.



මූල්‍ය ප්‍රාග්ධනය

අප මූල්‍ය ප්‍රාග්ධනය ප්‍රයෝජනයට ගන්නා ආකාරය

නිෂ්පාදිත ප්‍රාග්ධනය
යටිතල පහසුකම්, පද්ධති,සහ ක්‍රියාවලි වැඩි කිරීම වර්ධිත ව්‍යාපාර කාර්යයන්ට හේතු වේ.

බුද්ධිමය ප්‍රාග්ධනය
ශාඛා පුළුල් කිරීම් සහ සන්නාමය ප්‍රවර්ධනය කරන අතර ඩිජිටල් යටිතල පහසුකම් කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය කරයි.

මානව ප්‍රාග්ධනය
- ක්‍රියාවලි වර්ධනයන් සහ නව පද්ධති ක්‍රියාත්මක කිරීම නව රැකියා අවස්ථා, පුහුණුව, සහ හැකියා පුළුල් කිරීම ඇති කරයි.
- නව දක්ෂතා සහ ඩිජිටල් කුසලතා සංවර්ධනය කරයි.

සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය
- භෞතික හා ඩිජිටල් යටිතල පහසුකම් පුළුල් කිරීම මඟින් ගනුදෙනුකරුවන් සහ සැපයුම්කරුවන් සමඟ ශක්තිමත් සම්බන්ධතා ලබා දේ.
- ගනුදෙනු කාලය අඩු කිරීම

ස්වාභාවික ප්‍රාග්ධනය
තිරසාර භෞතික යටිතල පහසුකම්වල හා ඩිජිටල් යටිතල පහසුකම්වල ආයෝජනය කාබන් පාසටහන අඩු කරයි.

ප්‍රමාණාත්මකතාව, පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධතාව

ප්‍රමාණාත්මක කරුණු

පාර්ශ්වකරුවන්

ප්‍රාථමික UN SDGs

8 DECENT WORK AND ECONOMIC GROWTH

ප්‍රජාව තුළ ආර්ථික අභිවර්ධනය සහ වර්ධිත ජීවන තත්ත්වයන්ට මඟ පාදමින් සේවකයින්ට අධ්‍යාපනය සහ සමාන අවස්ථා ලබාදෙන බව පුහුණුව හා සංවර්ධනය තුළ ආයෝජනය සහතික කරයි.

9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE

භෞතික හා ඩිජිටල් යටිතල පහසුකම් යන දෙක සඳහා අරමුදල් සපයමින් නිෂ්පාදන හා සේවාවන් හි නවෝත්පාදනය ඇති කිරීම.

ද්විතියික UN SDGs

11 SUSTAINABLE CITIES AND COMMUNITIES

මානව හිතවාදී සංවර්ධන වැඩසටහන් සහ මූලාශ්‍ර සහ මූලාශ්‍ර නොවන අවස්ථා සොයාගනිමින් ප්‍රත්‍යස්ථ සහ ආර්ථිකමය වශයෙන් ප්‍රබල ප්‍රජාවන් බිහි කිරීම.

ජනනය කර බෙදාහැරි සෘජු ආර්ථික වටිනාකම

GRI 201-1

	2023 රු. මිලියන	2022 රු. මිලියන
ජනනය කන ලද සෘජු ආර්ථික වටිනාකමථ	**232,064**	174,530
මෙහෙයුම් වියදම්වලට	**12,643**	12,180
තැන්පත්කරුවන්හට	**197,402**	140,477
සේවකයින්හට	**16,110**	13,791
ප්‍රාග්ධන සැපයුම්කරුවන්	**–**	–
රජය (ලාභාංශය හැර)	**(1,308)**	5,553
රඳවාගත් සෘජු ආර්ථික වටිනාකම	**7,216**	2,530
බෙදාහරින ලද සෘජු ආර්ථික වටිනාකම	**224,848**	172,001

වගුව 10 →

විභව්‍ය හුවමාරුවීම්

- **නිෂ්පාදිත ප්‍රාග්ධනය** – බැංකුවේ තාක්ෂණය හා ශාඛා ජාලය උසස් කිරීමට මූල්‍ය ප්‍රාග්ධනය භාවිතා කිරීම වෙනත් මූල්‍ය අවස්ථාවන් හී ආයෝජනයේ ඇති අවස්ථාවන් නැති කරයි.
- **බුද්ධිමය ප්‍රාග්ධනය** – නව මූල්‍ය ව්‍යාපාරවල ආයෝජනය කරන විට පර්යේෂණ සහ සංවර්ධනය වෙනුවෙන් පිර්වැය දැරිය යුතු අතර පවත්නා මූල්‍ය නිෂ්පාදන දියුණු කිරීමට හෝ පවත්වාගෙන යෑමට ඇති ආයෝජනය අඩු කරයි.
- **මානව ප්‍රාග්ධනය** – තාක්ෂණය හෝ යටිතල පහසුකම්වල මූල්‍ය ප්‍රාග්ධනය ආයෝජනය සේවා නියුක්තිය සහ සේවක කුසලතා අවශ්‍යතාවන්ට බලපාන ශ්‍රම - තීව්‍ර ක්‍රියාවලියක අවශ්‍යතාව මූලිකව අඩු කළ හැකිය.
- **සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය** – ඉහළ පොලියක් සහිත ණය කෙරෙහි අවධානය තුළින් ලාභදායීතාවය ඉහළ ගියත් එය වගකිව යුතු ණය දෙන්නෙක් ලෙස සමාජයේ බැංකුව පිළිබඳ කීර්තිනාමය අඩු කරයි.
- **ස්වභාවික ප්‍රාග්ධනය** – මූල්‍ය ප්‍රාග්ධනය කෙරෙහි අධික අවධානය ස්වභාවික ප්‍රාග්ධනය අවදානමේ හෙලන පාරිසරිකමය පිරිහීමට සහ ස්වභාවික සම්පත් හානියට මඟ පාදයි.




මූල්‍ය ප්‍රාග්ධනය

අපගේ මූල්‍ය ජයග්‍රහණ මැනිම

ශුද්ධ ණය හා අත්තිකාරම්

පිටුව 10




	2019	2020	2021	2022	**2023**	CAGR
රු. බි.	454	517	539	553	527	3.75%

ශුද්ධ ණය සහ අත්තිකාරම් ගැනීම්

තැන්පතු හා ණය ගැනීම්

පිටුව 11




	2019	2020	2021	2022	**2023**	CAGR
රු. බි.	1,017	1,237	1,428	1,477	1,483	9.89%
රු. බි.	83	53	53	45	94	3.29%

තැන්පතු ● ණය ගැනීම්

ආයෝජන

පිටුව 12




	2019	2020	2021	2022	**2023**	CAGR
රු. බි.	648	799	981	979	1,053	12.92%
රු. බි.	613	741	834	821	885	9.64%

මුළු ආයෝජන ● රජයේ සුරැකුම්පත්

1 ශුද්ධ පොලි ආදායම් (NII)

පිටුව 13




	2019	2020	2021	2022	**2023**	CAGR
රු. බි.	29	35	55	32	30	0.63%

ශුද්ධ පොලි ආදායම් (NII)

2 පොලී නොවන ආදායම්

පිටුව 14




	2019	2020	2021	2022	**2023**	CAGR
රු. බි.	3.07	4.88	3.29	1.36	4.78	11.73%

පොලී නොවන ආදායම්

3 හානිකරණ ගාස්තු

පිටුව 15




	2019	2020	2021	2022	**2023**	CAGR
රු. බි.	0.57	4.87	4.30	4.86	4.26	65.66%

හානිකරණ ගාස්තු

4 මෙහෙයුම් වියදම් හා සහ බදු

පිටුව 16




	2019	2020	2021	2022	**2023**	CAGR
රු. බි.	15.8	15.6	19.3	21.4	24.8	11.93%
රු. බි.	9.3	9.3	12.4	5.2	(1.6)	

මෙහෙයුම් වියදම් ● බදු

5 බදු පසු ලාභය

පිටුව 17



	2019	2020	2021	2022	**2023**	CAGR
රු. බි.	6	10	22	3	7	3.12%

බදු පසු ලාභය

මූල්‍ය ප්‍රාග්ධනය

1 ශුද්ධ පොලී ආදායම

බැංකුවේ ශුද්ධ පොලී ආදායම (NII) රු.බිලියන 29.6ක් වූ අතර, පසුගිය වසරේ රු.බිලියන 32.5ට සාපේක්ෂව 8.9%ක අඩුවීමක් පෙන්විය. 2023 වසර සඳහා පොලී ආදායම රු. බිලියන 227.3ක් වූ අතර පසුගිය වසරේ පැවති රු.බිලියන 173.0ට වඩා 31.2%ක සාමාන්‍ය වැඩිවීමක් වාර්තා කරයි. මෙයට මූලික වශයෙන් රජයේ සුරැකුම්පත්වල ආයෝජනවලින් ලද පොලී ආදායම හේතු විය. 2023 ජූනි මස සිට ප්‍රතිපත්ති අනුපාත පාදාංක 500ක අඩු කිරීමක් මධ්‍යයේ, පොලී වියදම් පසුගිය වසරේ වාර්තාකළරු. බිලියන 140.5ට සාපේක්ෂව මෙම වසර තුළ රු. බිලියන 197.4 දක්වා 40.5%කින් වර්ධනය වී ඇත. මෙයට හේතුව මහ බැංකුව විසින් පොලී අනුපාත අඩුකිරීමෙන් පසු වහාම ප්‍රතිමිලකරණ නොකිරීමෙන් 2022 දී වඩා ඉහළ අනුපාතයකට තැන්පතු සේවයේ යෙදවීමයි. පොලී ආදායම පසු කරමින් පොලී වියදම්වල වැඩිවීම සමඟ, බැංකුවේ ශුද්ධ පොලී ආන්තිකය පසුගිය වසරේ වාර්තාකළ 2.03%ට සාපේක්ෂව 2023 දෙසැම්බර් අවසානයට 1.79% දක්වා පහත වැටුණි.

2 පොලී නොවන ආදායම

2023 දී, ශුද්ධ පොලී නොවන ආදායම 2022දී වාර්තා කළ රු. බිලියන 1.4 සිට සැලකියයුතු වැඩිවීමක් වාර්තා කරමින් රු. බිලියන 4.8 දක්වා වේගයෙන් ඉහළ ගියේය. මෙම සැලකියයුතු වර්ධනයට වෙළෙඳ කටයුතුවලින් ශුද්ධ ලැබීම් රු. බිලියන 1.4 දක්වා ලඟාවීම මෙන්ම රු.බිලියන 1.8ක් වූ අනෙකුත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ අගයට භාණ්ඩාගාර බැඳුම්කර හඳුනා නොගැනීම මත ලාභ හේතු විය.

2023 දී, බැංකුවේ ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම රු.බිලියන 1.3ක් වූ අතර, පෙර වසරේදි වාර්තාකළ රු.බිලියන 1.9ට සාපේක්ෂාව 34.2%ක අඩුවීමක් මින් පෙන්වා දේ. මෙම පහත වැටීමට ප්‍රධාන වශයෙන් පොලී අනුපාත ඉහළ යාම සහ අඩු වූ ආර්ථික කටයුතුවලින් පසු ණය සහ අත්තිකාරම්වලට වඩා අඩු ප්‍රසාරණය හේතු විය.

3 හානිකරණ පිරිවැය

හානිකරණ ගාස්තු තීරණය කිරීමේදී, බැංකුව 2022 දි වඩා ඉහළ වෙන් කිරීම් දැනටමත් සිදුකර ඇති බැවින් බැංකුව මධ්‍යස්ථ ප්‍රවේශයක් ගත්තේය. මෙම වෙන් කිරීම් සාධක කිහිපයක් සැලකිල්ලට ගත් අතර ඒවාට විදේශ මුදලින් නම්කළ රජයේ සුරැකුම්පත් උපකරණ (ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර) සඳහා වටිනාකම තුළ වියහැකි අඩුකිරීම්වල අපේක්ෂාව සහ ඉහළ අවදානම් ඇති අංශවලට නිරාවරණය වීමේ මට්ටම් ඇතුළත් වේ.

අපගේ මූල්‍ය ජයග්‍රහණ මැනීම



රූපය 11 →

ආර්ථික මුලධර්මවල බිඳවැටීම, සමාජ අසහනය, සහ දේශපාලන අස්ථාවරත්වය වැනි සාධක සැලකිල්ලට ගනිමින් අතිශයින් අවිනිශ්චිත සහ වෙනස්වන වාතාවරණය තුළ අපේක්ෂා නොකළ අවදානම් මූලිකාංග ඇතුළත් කිරීමට අභ්‍යන්තර ආදර්ශ ගලපන ලදී.

මෙවැනි පරීක්ෂාකාරී වෙන්කිරීමේ ක්‍රම සහ ආර්ථික මෙහෙයුම්වල පුනර්ජීවය හේතු කොට ගෙන, බැංකුව වර්තමාන කාලසීමාව තුළ හානිකරණ වෙන් කිරීම් වැඩි කිරීමෙන් වැලකි සිටියේය. එහි ප්‍රතිඵලයක් ලෙස, බැංකුව විසින් දරන හානිකරණ ගාස්තු පෙර වසරේ වාර්තාකළ රු. බිලියන 4.9ට සාපේක්ෂව රු.බිලියන 4.3 දක්වා 12.4%කින් අඩුවිය. මෙම පහත වැටීමට ණය සහ අත්තිකාරම් කළඹ තුළ 4.8%ක අඩුවීමක් සමඟ රු. බිලියන 9.4ක් වටිනා ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර රුපියල්වලින් නම්කළ බැඳුම්කරවලට මාරු කිරීම ප්‍රධාන වශයෙන් හේතු විය.

4 මෙහෙයුම් වියදම්

කාර්ය මණ්ඩලය පිරිවැය, ක්ෂය කිරීම සහ ක්‍රමක්ෂය, සහ වෙනත් පොදු කාර්ය පිරිවැය ඇතුළත් මෙහෙයුම් වියදම් 2022 පැවති රු.බිලියන 21.2 සිට 15.6% වැඩිවීමක් වාර්තා කරමින් 2023 දි රු.බිලියන 24.5 දක්වා ඉහළ ගිය අතර එයට පිරිවැය ඉතුරුම් උපායමාර්ග සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හමුවේ පුළුල්ව පැතිරුණු මිල ඉහළ යාම හේතු විය. මුළු මෙහෙයුම් වියදමෙන් 65.8%ක් දායක වන කාර්ය මණ්ඩලය පිරිවැය පමණක් පසුගිය වසරේ රු.බිලියන 13.8 සිට 16.8%ක වැඩිවීමක් පිළිබිඹු කරමින් රු.බිලියන 16.2ක් විය. මුළු මෙහෙයුම් වියදමෙන් 5.8%කට දායක වන ක්ෂය කිරීම සහ ක්‍රමක්ෂය වියදම්, පෙර වසරේ පැවති රු.බිලියන 1.41 ට සාපේක්ෂව රු.බිලියන 1.43 දක්වා 1.3%ක සුළු ඉහළ යාමක් පෙන්නුම් කළේය.

මූල්‍ය ප්‍රාග්ධනය

පරිපාලනය, ආයතනික වියදම් සහ අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමිකවලින් සමන්විත වෙනත් මෙහෙයුම් වියදම් 2023 දී රු.බිලියන 6.9 දක්වා 16.1% කින් ඉහළ ගියේය. එහි ප්‍රතිඵලයක් ලෙස, බැංකුවේ ආදායමට පිරිවැය අනුපාතය (බදු රහිත) 71.6%ට ලඟා වූ අතර, මුලිකවම උද්ධමනීය පීඩනයන් හේතුවෙන් 2022 දී වාර්තාකළ 62.9%ට වඩා සැලකියයුතු ලෙස ඉහළ අගයකි.

බැංකුවේ මුළු බදු වියදම රු. බිලියන 2.9ක ආදායම් බදු ආපසු හැරවීම, රු.බිලියන 1.1ක් වූ මූල්‍ය සේවා මත එකතුකළ අගය මත බදු, සහ රු.මිලියන 158.7ක් වූ මූල්‍ය සේවා මත සමාජ ආරක්ෂක දායක බදුවලින් සමන්විත වේ. මූල්‍ය සේවා මත එකතුකළ අගය මත බදු රු.බිලියන 1.1 දක්වා අඩු වී ඇති අතර, පසුගිය වසරේ වාර්තාකළ රු.බිලියන 3.2 සිට 64.1%ක අඩුවීමක් ඉන් පෙන්වයි. ඊට අමතරව, විලම්බිත බදු බැර හේතුවෙන්, ආදායම් බදු 2022 දී අනුරූප කාලසීමාව තුළ වාර්තාකළ රු. බිලියන 2.0ට සාපේක්ෂව රු. බිලියන 2.9ක ආපසු හැරවීමක් වාර්තා කර ඇත.

5 බදු පසු ලාභය

GRI 207-3

2023 දී, බැංකුව රු. බිලියන 4.3ක බදු පෙර ලාභයක් වාර්තා කළ අතර 2022 දී වාර්තා කළ රු. බිලියන 4.5 සමඟ සැසඳීමේදී 4.9%ක අඩුවීමක් පෙන්නුම් කරමින් රු. බිලියන 4.3 ක් විය. වසර සඳහා බදු පසු ලාභය 185.3%ක සැලකියයුතු වැඩිවීමක් සිදු කරමින් පෙර වසරේ දී පැවති රු. බිලියන 2.6 සිට රු. බිලියන 7.2 දක්වා ඉහළ ගියේය. ලාභවල මෙම සැලකිය යුතු ඉහළ යාම ප්‍රධාන සාධක තුනක් හේතු විය හැකිය: ඒවානම් භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර විකිණීමෙන් උපලබ්ධි වූ ලාභ, අඩු වූ හානිකරණ ගාස්තු සහ බදු වියදම්වල සැලකියයුතු ආපසු හැරවීමයි.

බැංකුවේ වර්ධිත කාර්යසාධනය සමඟ බැඳුණු, ස්කන්ධය මත ඉපයීම් 2022 අවසානයට වාර්තාකළ 3.40%ට සාපේක්ෂව 9.36% දක්වා වැඩි විය. වත්කම් මත ඉපයීම මුල් වසරේ වාර්තා කළ 0.28% සිට 2023 අවසානයට 0.26% දක්වා සුළු වශයෙන් අඩුවී ඇත.

සාරාංශගත ආදායම් ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා	වෙනස %	2023 රු. බිලියන.	2022 රු. බිලියන.	
දළ ආදායම	33	232.06	174.53	1
පොලී ආදායම	31	226.97	172.94	
අඩුකළා : පොලී වියදම්	41	197.40	140.48	
ශුද්ධ පොලී ආදායම	(9)	29.57	32.46	2
ශුද්ධ පොලී ආන්තිකය (NIM) (%)		**1.79**	**2.03**	
පොලී නොවන ආදායම	252	4.78	1.36	3
අඩුකළා : හානිකරණ ගාස්තු (12)	(12)	4.26	4.86	4
වෙන්කිරීම් ආවරණය (%)		**91.34**	**75.22**	
ශුද්ධ මෙහෙයුම් ආදායම	4	30.09	28.96	
අඩුකළා ඵමෙහෙයුම් වියදම්	16	24.50	21.20	5
ආදායමට පිරිවැය (%)		**71.59**	**62.93**	
බදු පෙර මෙහෙයුම් ලාභය	(28)	5.59	7.76	
වැට් හා සමාජ ආරක්ෂණ දායක බදු	(60)	1.30	3.25	
බදු පෙර ලාභය	(5)	4.29	4.51	6
ආදායම් බදු	(248)	(2.93)	1.98	
බදු පසු ලාභය	185	7.22	2.53	

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	වෙනස %	2023 රු.මිලියන	2022 රු.මිලියන
සේවකයෙකුට ලාභය (බදු පසු)	196	1.66	0.56

වගුව 11 →

1 දළ ආදායම

සංයුතිය: පොලී ආදායම, ශුද්ධ ගාස්තු හා කොමිස් - පදනම් ආදායම, වෙළෙඳාමෙන් ශුද්ධ ලාභය/(අලාභය), ලාභය හෝ අලාභය තුළින් සාධාරණය අගයට මූල්‍ය උපකරණවලින් ශුද්ධ ලාභය/ (අලාභය) මූල්‍ය වත්කම් බැහැර කිරීමෙන් ශුද්ධ ලාභය/ (අලාභය), සහ වෙනත් ශුද්ධ මෙහෙයුම් ආදායම.

ප්‍රධාන ධාවකයින්: ගනුදෙනුකරුවන්ගේ ප්‍රමාණය, ලබාගතහැකි නිෂ්පාදන පරාශය, මිලකරණ ව්‍යූහ, ආර්ථික හා ගනුදෙනුකාර සහභාගිත්ව මට්ටම්, විනිමය හුවමාරු අනුපාත. වෙළෙඳ ද්‍රව්‍යවල සහ ස්කන්ධ වෙළෙඳපොල තුළ මිලකරණ ගතිකතා, තරඟකාරී වාතාවරණය සහ වෙළෙඳපොල ස්ථාවරත්වය.

2 ශුද්ධ පොලී ආදායම

සංයුතිය: පොලී ආදායම සහ පොලී වියදම් අතර වෙනස

ප්‍රධාන ධාවකයින්: ගනුදෙනුකරුවන්ගේ ප්‍රමාණය, ලබාගතහැකි නිෂ්පාදන පරාශය, මිලකරණ ව්‍යූහ, ආර්ථික හා ගනුදෙනුකාර සහභාගිත්ව මට්ටම්, විනිමය හුවමාරු අනුපාත. වෙළෙඳ ද්‍රව්‍යවල සහ ස්කන්ධ වෙළෙඳපොල තුළ මිලකරණ ගතිකතා, තරඟකාරී වාතාවරණය සහ වෙළෙඳපොල ස්ථාවරත්වය.

3 පොලී නොවන ආදායම

සංයුතිය: ශුද්ධ ගාස්තු හා කොමිස්-පදනම් ආදායම, වෙළෙඳාමෙන් ශුද්ධ ලාභය/(අලාභය), ලාභය හෝ අලාභය තුළින් සාධාරණය අගයට මූල්‍ය උපකරණවලින් ශුද්ධ ලාභය/(අලාභය) මූල්‍ය වත්කම් බැහැර කිරීමෙන් ශුද්ධ ලාභය/(අලාභය), සහ වෙනත් ශුද්ධ මෙහෙයුම් ආදායම.

ප්‍රධාන ධාවකයින්: ගනුදෙනුකරුවන්ගේ ප්‍රමාණය, ගනුදෙනුවල බැංකු පරිමාවන්, මිලකරණ ව්‍යූහ, ප්‍රාග්ධන වෙළෙඳපොල සහභාගිත්වය, වෙළෙඳ පරිමාවන්, වෙළෙඳපොල උච්ඡාවචන, ප්‍රකාශිත හා ප්‍රකාශ නොකළ කොටසක්වල ආයෝජනය.

4 හානිකරණ පිරිවැය

සංයුතිය: බැංකු විසින් ණය කළඹේ තත්ත්වය, ආර්ථික තත්ත්වයන්, සහ පුද්ගල ණය හා බැඳුණු විශේෂ අවදානම් සාධක වැනි සාධක මත අපේක්ෂිත ණය අලාභ සඳහා වෙන් කිරීම් සිදු කරයි.

ප්‍රධාන ධාවකයින්: ආර්ථික තත්ත්වයන්, ණය කළඹේ ණයවල තත්ත්වය, ක්ෂේත්‍රයේ සහ භූගෝලීය සංකේන්ද්‍රතා, ඇපවල ඇගයීම, පොලී අනුපාත සහ වෙළෙඳපොල තත්ත්වයන්, නියාමන සහ ගිණුම්කරණ වෙනස්වීම්, අවදානම් කළමනාකරණ ව්‍යවහාර, සහ සාර්ව-ආර්ථික සාධක.

5 මෙහෙයුම් පිරිවැය

සංයුතිය: වර්තමාන සහ අනාගත ආදායම් යන දෙකම උත්පාදනය කිරීමට දරන ලද වියදම්, කාර්ය මණ්ඩලය පිරිවැය, ක්ෂය කිරීම සහ ක්‍රමක්ෂය, සහ වෙනත් පොදු කාර්ය පිරිවැය ඇතුළත් මෙහෙයුම් වියදම්.

ප්‍රධාන ධාවකයින්: උද්ධමනීය සාධක, ශ්‍රම බලකායේ ප්‍රමාණය, ක්‍රමක්ෂයට මඟ පාදන ගාඛා සහ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම්වල ආයෝජන, මෙහෙයුම් සඳහා පොදු කාර්ය පිරිවැය (නව්‍යකරණය හා වැඩ කාර්යක්ෂම මූලපිරීම් ඇතුළුව), සහ මෙහෙයුම් කටයුතුවලින් උපචිත අලාභ.

6 බදු පෙර ලාභය

සංයුතිය: බැංකුව විසින් "බදු පෙර ලාභය (PBT)" හෝ "බදු පසු ලාභය." යනුවෙන් හඳුන්වන ආයතනික ආදායම් බදු ගෙවීමට පෙර සමාගමේ ලාභය දෙස බලන මැනිම.

ප්‍රධාන ධාවකයින්: ආදායම් වර්ධනය, පිරිවැය කළමනාකරණය, මෙහෙයුම් කාර්යක්ෂමතාව, ඵලදායී ප්‍රාග්ධන වෙන් කිරීම, පොලී වියදම් කළමනාකරණය, වෙළෙඳපොල තත්ත්වයන් සහ ඉල්ලුම, ආර්ථික පරිසරය, නියාමන පරිසරය, විනිමය උච්ඡාවචන.


මූල්‍ය ප්‍රාග්ධනය

කොටස් හිමියන්ගේ ප්‍රතිලාභ මැනීම

අපගේ ස්කන්ධය මත ඉපයීම (ROE) ඉපයීම් වර්ධනය හා ප්‍රාග්ධන උපයෝජනය වැනි සියලුම ප්‍රධාන නිර්ණායක සාධක ඒ විස්තරාත්මක මිනුමක් බවට ඒකාබද්ධ කරමින් කාලය පුරා අපගේ මූල්‍ය කාර්ය සාධනයේ මූලික මිම්ම ලෙස සේවය කරයි. අපගේ ආයතනය තුළ, නියාමන ප්‍රාග්ධන උපයෝජනය සම්බන්ධයෙන් ඉපයිම්වල වඩා සෘජු තක්සේරුවක් ලබා දෙමින් අභ්‍යන්තරව අවදානම බරතබන ලද වත්කම් (RoRWA) මත අපගේ ඉපයීම අපි තක්සේරු කරමු.


සාමාන්‍ය අවදානමට බර තබන ලද වත්කම්

ප්‍රස්ථාරය 18




අවදානමට බර තබන ලද වත්කම් මත ඉපයීම

ප්‍රස්ථාරය 19



මූල්‍යමය තෝලනය

ප්‍රස්ථාරය 20



සාමාන්‍ය අවදානමට බරතබන ලද වත්කම්

බැංකුවේ අවදානමට බර තබන ලද වත්කම් (RWA) පසුගිය වසරට සාපේක්ෂව 10%කින් අඩු විය. මෙයට මූලිකම හේතුව වන්නේ රජයේ සුරැකුම්පත්වල ගුණාත්මක අවදානමට බර තබන ලද ආයෝජනවල වැඩිවීම, ණය හා අත්තිකාරම් කළඹ තුළ අඩුවීම, සහ වෙළෙඳපොල අවදානමට බර තබන ලද වත්කම් සහ මෙහෙයුම් අවදානමට බර තබන ලද වත්කම් යන දෙකෙහි අඩුවීමය.

අවදානමට බරතබන ලද වත්කම් මත ඉපයීම්


වැඩි වූ බදු පසු ලාභයෙහි (PAT) හිතකර බලපෑමේ ප්‍රතිඵලයක් ලෙස, අවදානමට-බර තබන ලද වත්කම් මත ඉපයීම 2023 දී 2.2% දක්වා ඉහල ගිය අතර, පසුගිය වසරේ අතුරුඵල කාලසීමාව තුළ වාර්තා වූ 0.7% සිට සැලකියයුතු වැඩිවීමක් ඉන් පෙන්නුම් කරයි. අවදානමට-බර තබන ලද වත්කම්වල (RWA) අඩුවීම ද මෙම වැඩිවීමට ධනාත්මකව දායක විය.

මූල්‍යමය තෝලනය

බැංකුව සාමාන්‍ය අවදානමට-බර තබන ලද වත්කම් මඟින් සාමාන්‍ය කොටස්හිමියාගේ ස්කන්ධය බෙදීම තුළින් මූල්‍ය තෝලනය තීරණය කරයි. සාමාන්‍ය අවදානමට-බර තබන ලද වත්කම් 4.8%කින් අඩුවීම සහ සාමාන්‍ය කොටස්හිමියන්ගේ ස්කන්ධය 4.5%කින් වැඩිවීමත් සමඟ, මූල්‍ය තෝලනය වසරකට පෙර වාර්තාකළ 4.7 සිට 7.3 ගුණයක් දන්වා වර්ධනය විය.


බදු පසු ලාභය

ප්‍රස්ථාරය 21




සාමාන්‍ය කොටස්හිමියාගේ ස්කන්ධය

ප්‍රස්ථාරය 22



සාමාන්‍ය කොටස්හිමියාගේ ස්කන්ධය මත ඉපයීම

ප්‍රස්ථාරය 23



සාමාන්‍ය කොටස්හිමියාගේ ස්කන්ධය

වසරකට පෙර වාර්තාකළ රු බිලියන 2.5 ට සාපේක්ෂව බදු පෙර ලාභය තුළ රු. බිලියන 7.2 දක්වා වැඩිවීම මඟින් ක්‍රියාත්මකව සාමාන්‍ය කොටස්හිමියාගේ ස්කන්ධය 3.6% කින් වැඩි විය.

ස්කන්ධය මත ඉපයීම


ස්කන්ධය මත ඉපයීම තුළ ද වර්ධනයක් දැකගත හැකි වූ අතර බදු පසු ලාභයෙහි මූලිකව වැඩිවීම හේතුවෙන් 2022 දී පැවති 3.4%ට සාපේක්ෂව 2023 දී එය 9.36 දක්වා වැඩි විය.

මූල්‍ය ප්‍රාග්ධනය

මුළු වත්කම්

ආර්ථිකය සහ බැංකු ක්ෂේත්‍රය විසින් මුහුණ දුන් අභියෝග මධ්‍යයේ, බැංකුවේ වත්කම් පදනම වසරකට පෙර වාර්තාකළ රු. ට්‍රිලියන 1.6ට සාපේක්ෂව 2023 වසර අවසානයේදී රු. ට්‍රිලියන 1.7 දක්වා ලඟාවෙමින් 4.3%ක ඉතා සුළු වර්ධනයක් වාර්තා කළේය. රජයේ සුරැකුම්පත්වල ආයෝජනය, බැංකු සමඟ ස්ථාපන සහ භාණ්ඩාගාරයෙන් ලැබීම් මෙයට මූලිකවම හේතු විය.

මුළු වත්කම් ප්‍රස්ථාරය 24




ආයෝජන

ස්කන්ධ හා ණය සුරැකුම්පත්වල ආයෝජනය

ස්කන්ධ හා ණය සුරැකුම්පත්වලින් සමන්විත බැංකුවේ සමස්ථ ආයෝජන කළඹ, 2022 දී වාර්තාකළ රු. බිලියන 979ට සාපේක්ෂව 2023 අවසානය වන විට රු. ට්‍රිලියන 1.0 දක්වා 7.6%කින් වැඩි විය. රජයේ සුරැකුම්පත්, ආයතනික ණය උපකරණ, සහ භාර සහතිකපත් ඇතුළත් ණය උපකරණ ස්කන්ධ සුරැකුම්පත්වලින් සමන්විත පවත්නා කොටස සමඟ මුළු කළඹින් 99.6%ක් විය. ඉහළ පොලී අනුපාත අවස්ථාව මඟින් ඇති වූ අඩු පුද්ගල ණය වර්ධනය හේතුවෙන්, බැංකුව රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කෙරෙහි වඩාත් අවධානය යොමු කළ අතර එය 2022 වසරට සාපේක්ෂව 7.7%කින් ඉහළ ගියේය. බැංකුවේ ස්කන්ධ කළඹ 2022 දී පැවති රු. බිලියන 4.3 සිට 2023 දී රු. බිලියන 3.9 දක්වා පහත වැටුණු අතර ඒ සඳහා ස්කන්ධ වෙළෙඳපොල තුළ වෙළෙඳපොල ඇණහිටීම සහ උපායමාර්ගික ඉවත් කිරීම හේතු විය.

ආයෝජනවල සංයුතිය ප්‍රස්ථාරය 25




ණය සහ අත්තිකාරම්

ප්‍රධාන වශයෙන් නිවාස ණය, උකස් ණය, පුද්ගලික ණය, සහ වෙනත් වර්ගයේ ණය ඇතුළත් බැංකුවේ ණය හා අත්තිකාරම් කළඹ 2023 දෙසැම්බර් අවසානය වන විට රු. බිලියන 526.5ක් විය.


මෙම අඩුවීම මඟින් දුර්වල ආර්ථික තත්ත්වයන් මෙන්ම ණය දීමේදී ක්‍රියාත්මක කරන පරීක්ෂාකාරීබව පිළිබඳ බැංකුවේ උපායමාර්ගික ප්‍රවේශයට ආරෝපිත වූ අඩු ඉල්ලුම පිළිබිඹු කරයි. වසර පුරා මුහුණ දුන් විවිධ අභියෝග හමුවේ, බැංකුව මුළු ණයට සාපේක්ෂ ශුද්ධ අදියර 3 ණය අනුපාතය ක්ෂේත්‍රයේ සාමාන්‍ය වන 7% පසු කරමින් 2.41%ක පවත්වා ගන්නා ලදී. මෙම සාර්ථකත්වයට බැංකුවේ පරීක්ෂාකාරී ණය දීමේ ව්‍යවහාර හේතු වූ අතර, එයට ශක්තිමත් පාලය යාන්ත්‍රණ සහිත ඉහළ අවදානම් අංශ වෙත නිරාවරණය අවම කිරීම, ආක්‍රමණශීලී ණය එකතු කිරීමේ උත්සාහයන්, සහ කළමනාකරණය විසින් පනවන ලද වෙන් කිරීමේ ප්‍රතිපත්ති ඇතුළත්ය.

බැංකුවට අදියර 3 හානිකරණ වෙන් කිරීමේ ආවරණය අනුපාතය තුළ වර්ධනයක් දැක ගත හැකි වූ අතර විචක්ෂණ වෙන් කිරීමේ උපායමාර්ගයන් අනුව 2022 දී පැවති 38.9% සිට 2023 දී 53.3 දක්වා ළඟාවීමට පදනම් ලකුණු 1441 කින් වැඩි විය.

ණය සහ අත්තිකාරම් ප්‍රස්ථාරය 26



ණයවල සංයුතිය ප්‍රස්ථාරය 27



මූල්‍ය ප්‍රාග්ධනය

තැන්පතු සහ අරමුදල් කරණය


ගනුදෙනුකාර තැන්පත් මුළු අරමුදල්වලින් 94%කින් සමන්විතව ප්‍රධාන අරමුදල් මූලාශ්‍ර ලෙස පැවතුණි. 2023 දී, ගනුදෙනුකරුවන්ගේ තැන්පත්වල 0.4%ක සුළු වැඩිවීමක් පෙන්වා ඇති අතර. පසුගිය වසරේ වාර්තාකළ රු. බිලියන 1.477 සිට රු. බිලියන 1.483 දක්වා ලඟා වී ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2023 දී පදනම් ලකුණු 550 කින් ප්‍රතිපත්ති පොලී අනුපාත අඩු කිරීමෙන් පසු, බැංකුව අරමුදල් පිරිවැය වර්ධනය කර ගැනීමට ඉහළ-පිරිවැය ස්ථිර තැන්පත් වෙත යාමට සිය තැන්පතු පොලී අනුපාත ඒ අනුව ගලපන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, මුළුතැන්පත්වලින් 81.2%ක් සඳහා දායක වන ස්ථාවර තැන්පත් රු. ට්‍රිලියන 1.2 දක්වා 0.6%කින් සුළු වශයෙන් අඩු විය. කෙසේවෙතත්, ඉතුරුම් තැන්පතු පදනමෙහි 5.2%ක් වර්ධනයක් වූ අතර, එය 2022 අවසානයට පැවති රු. බිලියන 264.5ට සාපේක්ෂව 2023 අවසානයට රු. බිලියන 278.2 දක්වා ලඟා විය.

එසේ වුවත්, ණය ගැනීම්වල පසුගිය වසර පුරාම සැලකියයුතු 112%ක ඉහළයාමක් පෙන්නුම් කළ අතර, එයට ප්‍රතිමිලදී ගැනීමේ ණය ගැනීම්වල ඉහළ යාම මූලිකවම බලපාන ලද අතර එය අරමුදල්වල පිරිවැය වැඩි වීමේදි ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළේය.

ඉතුරුම් සහ කාලීන තැන්පත්

ප්‍රස්ථාරය 28




ප්‍රාග්ධන කළමනාකරණය

විචක්ෂණ ප්‍රාග්ධන කළමනාකරණය බැංකුවේ ඉහළම ප්‍රමුඛතාවයකි. විශේෂයෙන් දුෂ්කර මෙහෙයුම් වාතාවරණයකට මුහුණ දීම තුළ, අනුපූරක ප්‍රාග්ධන යෙදවීමේ අවශ්‍යතාව ඉටු කරමින් වසර පුරාම එහි ශක්තිමත් ප්‍රාග්ධනය දක්ෂ ලෙස සුරකින ලදී. සියලුම ප්‍රාග්ධන අනුපාත පහසුවෙන්ම අවම නියාමන සීමාවන් පසුකළේය. 2023 වසර අවසානය වන විට, පළමු පෙළ ප්‍රාග්ධන අනුපාතය 16.91%ද, මුළු ප්‍රාග්ධන අනුපාතය 19.26% ද පැවති අතර, එම අනුපාත දෙකම 2022 වසර තුළ වාර්තා කළ 15.78% සහ 18.00% සිට වර්ධනය වෙමින් පිළිවෙලින් 8.5% සහ12.5%ක නියාමන අවශ්‍යතාවන්ට වඩා ඉහළ මට්ටමක පැවතුනි. තවද, බැංකුවේ බාසල් III තෝලන අනුපාතය 3%ක අවම නියාමන ප්‍රමිතිය ඉක්මවමින් සැලකියයුතු ලෙස 6.22% දක්වා ඉහළ ගියේය.

බාසල් III ද්‍රවශීලතා ආවරණ අනුපාතය (රුපියල් සහ සියලුම මුදල් ඇතුළත්) සහ ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය ඇතුළත් බැංකුවේ ද්‍රවශීලතා ක්‍රියාමාර්ග පහසුවෙන්ම 100%ක නියාමන සීමාවන්ට වඩා ඉහළින් පැවතුනි.


ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාත

ප්‍රස්ථාරය 29



ද්‍රවශීලතා අනුපාත

ප්‍රස්ථාරය 30





මූල්‍ය ප්‍රාග්ධනය

සාරාංශගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනට	වෙනස %	2023 රු. බිලියන.	2022 රු. බිලියන.
වත්කම්			
මුදල් හා මහා බැංකුව සමඟ ශේෂ	9	9.76	8.97
ස්ථාපන	116	22.58	10.47
රජයේ සුරැකුම්පත්	8	885.43	821.46
තැන්පතුවලට රජයේ සුරැකුම්පත් (%)		68.62	64.76
වෙනත් ආයෝජන	(0)	145.26	146.85
ණය සහ අත්තිකාරම්	(5)	526.52	553.03
තැන්පතුවලට ණය (%)		35.51	37.45
වෙනත් වත්කම්	28	97.42	75.92
මුළු වත්කම්	4	1,686.96	1,616.69
වත්කම් මත ඉපයීම (%)		0.26	0.28
වගකීම්			
තැන්පත්	0	1,482.53	1,476.74
ණය ගැනීම්	112	94.40	44.63
වෙනත් වගකීම්	28	28.66	22.42
මුළු වගකීම්	4	1,605.59	1,543.79
ස්කන්ධය			
ප්‍රකාශිත ප්‍රාග්ධනය/පැවරූ ප්‍රාග්ධනය	–	9.40	9.40
වෙනත් සංචිත	13	71.97	63.49
මුළු කොටස්හිමියන්ගේ ස්කන්ධය	12	81.37	72.89
ස්කන්ධය මත ඉපයීම (%)		9.36	3.40
මුළු ස්කන්ධය හා වගකීම්	4	1,686.96	1,616.69

වගුව 12 →

1 මුළු වත්කම්

සංයුතිය: බැංකුවේ මුළු වත්කම් ජංගම නොවන සහ ජංගම වත්කම්වලින් සමන්විත වේ. බැංකුවේ ප්‍රාග්ධනයේ වත්කම් කොටස මුදල්, රජයේ සුරැකුම්පත්වල සහ වෙනත් මූල්‍ය වත්කම්වල සහ පොලී දරන ණය සහ අත්තිකාරම් සහ වෙනත් වත්කම්වල ආයෝජනවලින් සමන්විත ය.

ප්‍රධාන ධාවකයින්: ණය කළඹ තුළ වර්ධනය, සුරැකුම්පත්වල ආයෝජන, අක්‍රීය වත්කම්, මහ බැංකුවේ සංචිත සහ නියාමන අවශ්‍යතා.

2 ආයෝජන

සංයුතිය: බැංකු සමඟ ස්ථාපන, ණය උපකරණ ඇතුළුව මූල්‍ය වත්කම්වල ආයෝජන, සහ පරිපාලිත සමාගම්වල ආයෝජන ආයෝජනවලට ඇතුළත් වේ.

ප්‍රධාන ධාවකයින්: ආයෝජන අනුපාත, ආර්ථික තත්ත්වයන්, නියාමන පරිසරය, වෙළෙඳපොල තත්ත්වයන්, ණයවල තත්ත්වය, සහ අවදානම් කළමණාකරණ ව්‍යවහාර.

3 ණය සහ අත්තිකාරම්

සංයුතිය: මෙයට පාරිභෝගික සහ ආයතනික ගනුදෙනුකරුවන් සඳහා දෙන ලද ණය සහ අත්තිකාරම් ඇතුළත්ය,

ප්‍රධාන ධාවකයින්: ගනුදෙනුකරුවන්ගේ තත්ත්වය, ලබාගතහැකි නිෂ්පාදන පරාශය, තරඟකාරී වාතාවරණය, ආර්ථික හා ගනුදෙනුකාර සහභාගිත්වයේ මට්ටම, නැවත ගෙවීමේ අනුපාත, සහ ණය අලාභවල ප්‍රමාණය.

4 මුළු තැන්පතු

සංයුතිය: මෙම අරමුදල් සේවාදායකයින්ට ණය ලබාදීමට බැංකුව ශක්තිමත් කරන අතර ඒ තුළින් අමතර අරමුදල් අවශ්‍ය අය සමඟ ප්‍රාග්ධනය සැපයුම්කරුවන් සම්බන්ධ කිරීමේදී සිය කාර්යභාරය ඉටු කරයි. එසේ කරමින්, වඩා පුළුල් මූල්‍ය පද්ධති මෙහෙයුම් සිදු කිරීමේදී බැංකුව අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කරයි.

ප්‍රධාන ධාවකයින්: ආදායම්ථ ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා, මූල්‍ය ගනුදෙනු සහ ඉතුරුම්.

→ ඉදිරි ගමන්මඟ

- මෙහෙයුම් කාර්යක්ෂමතාව, ගනුදෙනුකාර අත්දැකීම වර්ධනය කිරීමට කෘතිම බුද්ධිය*, බ්ලොක්චේන්, සහ සයිබර් ආරක්ෂාව වැනි නව තාක්ෂණ ඇතුළත් කර ගැනීම.
- සයිබර් තර්ජන, දත්තවල රහස්‍යතාව, සහ නැගිඑන මූල්‍ය තාක්ෂණයන් වැනි ගැටළු ආමන්ත්‍රණය කිරීමට රෙගුලාසි යොදා ගනී. බැංකුව මෙම වෙනස්වීම් අපේක්ෂාවෙන් එහි ප්‍රාග්ධන වෙන් කිරීම අනාගත රෙගුලාසිවලට ගැලපෙන බව සහතික කරයි.
- හරිත ව්‍යාපෘතිවලට මූල්‍යකරණය, තිරසාර ව්‍යවහාර සහිත ව්‍යාපාරවලට සහයවීම, සහ අඩු-කාබන් ආර්ථිකයක් කරා පරිවර්තනයට දායක වීම.
- ඩිජිටල් වොලට්, එක සමාන ණයදීමේ අවස්ථාවන් සහ තිරසාරභාවය කෙරෙහි අවධානය යොමු කරන ආයෝජන නිෂ්පාදන වැනි වෙනස්වන ගනුදෙනුකාර අවශ්‍යතා සපුරාලන නව්‍යකරණ මූල්‍ය නිෂ්පාදන සංවර්ධනය කිරීම. මෙයට සේවය නොකළ අංශවලට ගැලපෙන සේවාවන් ද ඇතුළත්ය.

ව්‍යාපාර මාර්ග සමාලෝචනය

පාරිභෝගික බැංකුකරණය

අප පිරිනමන දෑ

ඉතුරුම් ගිණුම්, ස්ථාවර තැන්පතු, නිවාස ණය, පුද්ගලික මූල්‍යකරණය, කුඩා ව්‍යාපාර සඳහා ණය, සහ දෛනික මූල්‍ය හා ආයෝජන මාර්ගෝපදේශ ඇතුළුව, අපගේ පුද්ගල ගනුදෙනුකරුවන්ගේ ජීවිතයේ විවිධ අවධීන් පුරාවටම අද්විතීය අවශ්‍යතා සපුරාලීම සඳහා නිර්මාණය කර ඇති පුළුල් නිෂ්පාදන කට්ටලයක්. මෙහි පුළුල් අරමුණ වන්නේ ඔවුන්ට ස්පෘශ්‍ය මූල්‍ය ප්‍රගතීන් ලබා ගැනීමට උපකාර කරමින්, සෑම සහභාගිත්වයකදීම කැපී පෙනෙන ගනුදෙනුකාර අත්දැකීමක් පිරිනැමීමයි

මෙහෙයුම් වාතාවරණය

- ආර්ථික කටයුතු පුනර්ජීවනය කිරීම
- උද්ධමන පීඩනයන්
- වසරේ මුල් අර්ධය තුළ ඉහළ පොලී අනුපාත පැවති අතර දෙවන අර්ධය තුළ පොලී අනුපාත අඩු කිරීම.
- සැපයුම් කොටසේ බාධා කිරීම් සහ ආනයන මත සීමා කිරීම්.
- බහු බදු ප්‍රතිසංස්කරණ සහ නව බදු ව්‍යුහය නිසා බැහැර කළ හැකි ආදායම හැකිලීමකට හේතු විය.
- 2024 මැතිවරණයට පෙර දේශපාලන අවදානම

බලපෑම


- අරමුදල් පිරිවැයෙහි තියුණු වැඩිවීම සහ ණය ඉල්ලුමෙහි පහළ වැටීම. පාරිභෝගික බැංකු අංශයේ ආන්තිකය කෙරෙහි බලපාන ලදී
- උද්ධමනීය පීඩනයන් සහ බදු පුද්ගලයන්ගේ ආදායම් උත්පාදනයට සහ වියදම් කිරීමේ හැකියාවට බාධාකළ අතර, ණයකරුවන්ගේ ආපසු ගෙවීමේ හැකියාවට අහිතකර ලෙස බලපා වත්කම්වල තත්ත්වය පිරිහීමකට ද හේතු විය.

ප්‍රධාන වැදගත් සිදුවීම්


2023 වර්ෂය තුළ ණය සහ අත්තිකාරම්වල වැඩි වූ පොලී අනුපාත මඟින් සහය වූ වැඩි වූ පොලී ආදායම.

හානිකරණ ගාස්තු ද පැවති ආර්ථික බිඳවැටීම හේතුවෙන් ඉහළ ගියේය.

ආදායම ප්‍රස්ථාරය 31




හානිකරණය ප්‍රස්ථාරය 32



අයහපත් ආර්ථික තත්ත්වයන් මධ්‍යයේ වුවද බැංකුවේ තැන්පත් පදනම ස්ථාවරව පැවතුනි. කෙසේවෙතත්, ණය කළඹ තුල පසුගිය වසරට සාපේක්ෂව 2023 දී සුළු අඩුවීමක් පෙන්නුම් කළේය.

ණය සහ තැන්පත් ප්‍රස්ථාරය 33



කාර්යසාධනය හා උපායමාර්ගය

තැන්පත්

2023 ජූනි මාසයේ සිට ඉදිරියට ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) මුදල් ප්‍රතිපත්ති පොලී අනුපාතික අඩු කිරීම මධ්‍යයේ, 2023 දී, තැන්පතු එකතු කිරීමේ ප්‍රයත්නයන්ට ජනතාව අතර බැහැරකළ හැකි ආදායම අඩුවීම මඟින් සැලකිය යුතු ලෙස බලපෑම් කරන ලදී. තැන්පතු සංචලනය තුළ ධනාත්මක සහ උපරිම වර්ධනයක් සුරක්ෂිත කිරීම සඳහා බැංකුව පහත සඳහන් ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කර ඇත.

- තැපැල් බැංකු අංශය ඩිජිටල් ලෝකයට ගෙයාමට විප්ලවීය පරිවර්තනයක් ඉලක්ක කර ගනිමින් ඉ-තැපැල් ඩිජිටල් ගිණුමක් හඳුන්වා දෙන ලදී
- NSB ඩෙබිට් කාඩ් මුදල් ආපසු ප්‍රවර්ධනය සහ විශේෂ තැන්පතු සංචලන වැඩසටහන් පවත්වන ලදී
- රජයේ සමාජ සහය වැඩසටහනට සමාගාමීව “අස්වැන්න” නව ඉතුරුම් ගිණුම් හඳුන්වාදෙන ලදී.
- ද්‍රවශීලතා කළමනාකරණයේ අරමුණ සඳහා කෙටි-කාලීන ස්ථිර තැන්පත් යෝජනා ක්‍රමයක් නැවත දියත් කිරීම (තරඟකාරී පොලී අනුපාතවලට මාස 4 සහ මාස 7 ස්ථිර තැන්පත් යෝජනා ක්‍රමය)

ව්‍යාපාර මාර්ග සමාලෝචනය

පාරිභෝගික ණය

- පාරිභෝගික ණය දීම සම්බන්ධයෙන් ප්‍රවේශම් සහගත ප්‍රවේශයක් අනුගමනය කරන ලදී. නව ණය දීමේ කටයුතුවලදී විචක්ෂණශීලී ප්‍රවේශයක් ගෙන ඇති අතර වඩාත් දැඩි අභ්‍යන්තර පාලන සහ නිවාරණ ප්‍රොටෝකෝල ක්‍රියාත්මක කර ඇත.
- ඇප මත පදනම් වූ ණය ලබා දීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම සහ පුද්ගලික ඇපකර මත ලබා දී ඇති ණය සඳහා නිරාවරණය අඩු කිරීමට අවශ්‍ය පියවර ගැනීම. උකස් අත්තිකාරම් ප්‍රවර්ධනය කිරීම සඳහා බැංකුව සිය ව්‍යාපාරය තීව්‍ර කළේය.
- අභ්‍යන්තර පාලන රාමුව, ණය ඇගැයීම් සහ ණය ව්‍යවහාරවල ඇති අඩුපාඩු නිවැරදි කිරීම තුළින් බැංකුවේ ණය සංස්කෘතිය වැඩිදියුණු කිරීමේ අදහසින් මධ්‍යගත ණය පරිපාලන ඒකකය (CAU) පිහිටුවන ලදී.

ඩිජිටල් බැංකුකරණය

- වසර තුළදී, බැංකුව විසින් බැංකුවේ ඩිජිටල් බැංකුකරණ සේවා සඳහා "NSB NextGen" සන්නාම නාමය හඳුන්වා දෙන ලදී. ඩිජිටල් බැංකුකරණ සේවා එනම් NSB e-KYC, NSB e-Post, නව අන්තර්ජාල බැංකුකරණ අවස්ථාව, NSB PayApp සහ NSB මාර්ගස්ථ කාඩ්පත දියත් කර ඇත. මෙමගින් ගනුදෙනුකරුවන්ට ශාඛාවකට නොපැමිණ ඉතුරුම් ගිණුම් විවෘත කිරීම සඳහා පහසුකම් සැලසෙන අතර ගනුදෙනුකරුවන්ට ඕනෑම තැනක සිට ඕනෑම වේලාවක ඇතුළත්වීම් සහ ගිණුම් විවෘත කිරීම සඳහා තම තොරතුරු අන්තර්ජාලය හරහා ඉදිරිපත් කළ හැකිය.

අවදානම සහ අවස්ථාවන් සහිත අනාගත දැක්ම

මූල්‍යමය ප්‍රතිපත්ති නිදහස් කිරීමත් සමඟ, උද්ධමනය වැඩිවේ යයි අපේක්ෂා කෙරේ. තවද, පවත්නා උද්ධමන පීඩනයන්ගේ ප්‍රතිඵල සැලකියයුතු කාලසීමාවක් සඳහා ගනුදෙනුකරුවන්ගේ ක්‍රය ශක්තිය අඩු කරනු ඇති. අතර ඔවුන්ගේ පරිභෝජනය සඳහා ඔවුන්ට සිය ඉතුරුම් භාවිතා කිරීමට සිදු වනු ඇත. එමනිසා, බැංකුවට අඩු -පිරිවැය අරමුදල් ආකර්ෂණය කර ගැනීම දුෂ්කර වනු ඇත. මෙම පීඩනය ජය ගැනීම සඳහා, POS ගනුදෙනු සහ ඩිජිටල් වශයෙන් දැනට සිටින ගනුදෙනුකරුවන් ඇතුළත් කර ගැනීම, විශේෂයෙන් තරුණ ජනතාව ඉලක්ක කරමින් නව ගනුදෙනුකරුවන් ආකර්ෂණය කිරීම වැඩි කර ගැනීමට අපේක්ෂා කෙරේ. බැංකුව ආර්ථික තත්ත්වයන් ක්‍රමානුකූලව වර්ධනය වන බැවින් සිය ගනුදෙනුකාර පදනම ඒකාබද්ධ කිරීමට සහ යථා කාලයේදී පොලී අනුපාත ස්ථාවර කර ගැනීමට මඟ පෑදීමට අරමුණු කරයි. 2023 දී යොදා ගත් විචක්ෂණ ප්‍රවේශය ආසන්න කාලය තුළ ණයදීමට අඛණ්ඩව බලපෑම් කරනු ඇත.

පාරිභෝගික සබඳතා ප්‍රමුඛතාවයක් ලෙස පවතිනු ඇති අතර උසස් ගනුදෙනුකාර සේවාව සහ පහසුව තුළින් වෙනස්කම් ඇති කරමින් වෙනස් වන ගනුදෙනුකාර අවශ්‍යතා සපුරාලීම සඳහා එහි ඩිජිටල් වටිනාකම් කොටස අඛණ්ඩව වැඩිදියුණු කරනු ඇත. මේ අතර, ගෙවීම් අවකාශය තුළ අපගේ පැවැත්ම ශක්තිමත් කිරීම කෙරෙහි අපි අවධානය යොමු කරමින් සිටින අතර, අපගේ ගනුදෙනුකරුවන්ගේ බැංකුකරණ අත්දැකීම පරිවර්තනය කරන නව සහයෝගිතා සහ හවුල්කාරිත්වයන් දිගටම ගවේෂණය කරන්නෙමු.

අපගේ ප්‍රමුඛතා

- හඳුනාගත් ක්ෂේත්‍ර/නිෂ්පාදන තුළ ඉලක්කගත වර්ධනය සාක්ෂාත් කර ගනිමින් වෙළෙඳපොල කොටස පවත්වා ගැනීම.
- ණයවල තත්ත්වය පවත්වා ගැනීම.
- ඩිජිටල් හැකියාවන් හී මෙහෙයුම් හා ආයෝජනය සරල කරමින් සහ ක්‍රමවත් කරමින් කාර්යක්ෂමතා ඇති කිරීම.

2024 සඳහා අවධානය

- සමහර කාණ්ඩවල සාධාරණ වර්ධනයක් සහිතව වෙළෙඳපොල කොටස පවත්වා ගැනීම.
- ශුද්ධ පොලී ආදායම සහ ගනුදෙනු සංඛ්‍යාව කරෙහි දැඩි අවධානයක් යොමු කිරීම
- මධ්‍යස්ථ ණය ප්‍රතිපත්තිය සහ එකතු කිරීම් සහ හානිකරණ කෙරෙහි අවධානය යොමු කිරීම.
- ශක්තිමත් කරන ලද ඩිජිටල් බෙදාහැරීමේ මාර්ග හරහා උසස් ගනුදෙනුකාර සේවාවක් ලබා දීම.
- හරස් විකුණුම් අවස්ථා අනුගමනය කරමින් නව ගනුදෙනුකරුවන් අත්පත් කර ගැනීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම.

ආයතනික බැංකුකරණය

GRI 203-1

අප පිරිනමන දෑ

මෙයට ආයතනික ණය දීම, බහු මූල්‍ය, ණය සම්මේලනය සහ ණය උත්පාදනය මෙන්ම අවදානම් කළමනාකරණ නිෂ්පාදන ඇතුළත් වේ. ආයතනික මූල්‍ය යනු විශාල සමාගම්, බැංකු, අනෙකුත් මූල්‍ය ආයතන සහ ඒවායේ අනුබද්ධ ආයතන මෙන්ම රජයට අයත් ව්‍යවසාය සඳහා අරමුදල් මූලාශ්‍ර සැපයීමේ ව්‍යාපාරයයි. ව්‍යාපාරික මාර්ග මඟින් සිදු කරනු ලබන කාර්යයන් පහත දැක්වේ:

- ව්‍යුහගත මූල්‍ය පහසුකම් (සේවාදායකයින් සඳහා ව්‍යුත්පන්න නිෂ්පාදන).
- ණය දෙන්නන් සහ ණය ගැතියන් අතර පියවීම් සහ ගනුදෙනු සම්බන්ධීකරණය කරන සම්මේලන පහසුකම් සඳහා නියෝජිතයාගේ කාර්යභාරය ඉටු කරයි.
- භාර සහතික, පුද්ගලික ස්ථාපන සහ ණයකරවල ආයෝජනය කිරීම.
- යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා අරමුදල් සැපයීම තුළ ක්ෂේත්‍රයේ කැපීපෙනෙන ප්‍රවීනතාව.

මෙහෙයුම් වාතාවරණය

- ආර්ථික කටයුතු පුනර්ජීවනය කිරීම.
- උද්ධමන පීඩනයන් සහ පොලී අනුපාත අඩු කිරීම.
- සැපයුම් පැත්ත බිඳ වැටීම් සහ ආනයන මත සීමා කිරීම්.
- විවිධාකාර බදු ප්‍රතිසංස්කරණ සහ නව බදු ව්‍යූහ.
- 2024 මැතිවරණයට පෙර දේශපාලන අවදානම.

බලපෑම


- සේවාදායකයින්ගේ කාර්යසාධනය ඍණාත්මකව බලපාන ලද අතර එය ණය ආපසු ගෙවීම තුළ දුෂ්කරතාවන් ඇති කරයි.
- විනිමය ද්‍රවශීලතා අර්බුදය හේතුවෙන් ආනයනයට අදාළ ව්‍යාපාරවලට බලපාන ලදී. (ඉදිකිරීම්, සංචාරක සහ කෘෂිකර්මය වැනි සමහර ක්ෂේත්‍ර පහත වැටීම).
- ප්‍රතිශෝධිත බදු ප්‍රතිසංස්කරණ හමුවේ ගනුදෙනුකාර ඉල්ලුම දුර්වල වීම.

ව්‍යාපාර මාර්ග සමාලෝචනය

ප්‍රධාන වැදගත් සිදුවීම්


පිරිනමන ලද වඩා ඉහළ පොලී අනුපාත හේතුවෙන් ආයතනික ණය සුරැකුම්පත් ආයෝජනයෙන් වැඩි වූ ඉපයීම්.

පොලී ඉපයීම් ප්‍රස්ථාරය 34



නව ණය නිකුත් කිරීම තාවකාලිකව නැවැත් වූ බැවින් ආයතනික ණය කළඹට සැලකියයුතු අඩුවීමක් ඇත.

ණය සහ ආයෝජන ප්‍රස්ථාරය 35



කාර්යසාධනය හා උපායමාර්ගය

ආර්ථික පීඩනය සහ ඉහළ පොලී අනුපාත බර හේතුවෙන්, බැංකුව දැනුවත්වම පුනර්ජනනීය බලශක්ති අංශය ඇතුළුව බොහෝ අංශ වෙත ණයදීම අඩු කරන ලදී. බැංකුව ඉහළ පොලී අනුපාත වාතාවරණය සමඟ යහපත් වත්කම් කළඹක් පවත්වා ගැනීමට පරීක්ෂාකාරී ප්‍රවේශයක් යොදා ගෙන ඇත. එසේ වුවත්, තීක්ෂණ කළඹ කළමනාකරණය සහ යහපත් වත්කම් තත්ත්වය පවත්වා ගන්නා ලද අතර, කාලීන අයකිරීම් සහ ගනුදෙනුකරුවාගේ මුදල් ප්‍රවාහ විශ්ලේෂණය කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදී. ගනුදෙනුකරුවාගේ ව්‍යාපාර මෙහෙයුම් අවබෝධ කර ගනිමින්, වඩාත් ගලපන ලද විසඳුම් පිරිනැමීමට බැංකුවට හැකිවිය.

අවදානම සහ අවස්ථාවන් සහිත අනාගත දැක්ම

- පවතින අභියෝග ඉදිරි කාලය තුළ දිගටම පවතිනු ඇති බැවින්, කළඹ නිරාවරණ කළමනාකරණය අනාගතයේදී බැංකුවේ ප්‍රධාන ප්‍රමුඛතාවය වනු ඇත. මෙම සන්දර්භය තුළ, ඉදිරි වසර සඳහා සමස්ත ණය ලබා දීමේ ප්‍රවේශය වත්මන් වෙළෙඳපොල තත්ත්වයන් යටතේ ඔරොත්තු දෙන තෝරාගත් අංශ කෙරෙහි වනු ඇත.
- රජය විසින් පහසුකම් සපයමින් සිටින කෘෂිකර්මය, තොරතුරු තාක්ෂණය සහ පුනර්ජනනීය බලශක්ති අංශ වැනි නවතම අයවැය යෝජනාවල සඳහන් නව කර්මාන්ත කෙරෙහි බැංකුව තවදුරටත් අවධානය යොමු කරනු ඇත. ඒකාබද්ධ චක්‍ර බලාගාර සහ පුනර්ජනනීය බලශක්ති (සූර්ය හා සුළං) සඳහා විදුලි හා බලශක්ති අංශයට හරිත බලශක්ති ණය දීමේ අවස්ථා කෙරෙහි වත්මන් රජයේ ප්‍රතිපත්තිය සමඟ ක්‍රියාත්මක වීමට අපේක්ෂා කෙරේ. ඇඟලුම්, කෘෂිකර්මාන්තය සහ පතල් කර්මාන්තය තුළ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට ණයදීමේ අවස්ථා මඟින් රජය දේශීය නිෂ්පාදන ක්‍රියාකාරීව ප්‍රවර්ධනය කිරීම අපේක්ෂා කෙරේ.

අපගේ ප්‍රමුඛතා

- ඉහළ අවදානම නිරාවරණ අංශය කෙරෙහි පරීක්ෂාකාරීව සිටීම මඟින් වාණිජකරණ හැකියාවන් තුලින් ප්‍රධාන වර්ධන අංශ කෙරෙහි අවධානය.
- ණයවල ගුණාත්මක බව කළමනාකරණය
- අඩු-පිරිවැය අරමුදල් අවස්ථා සොයා බැලීම.
- ඩිජිටල් හැකියාවන් හී මෙහෙයුම් හා ආයෝජනය සරල කරමින් සහ ක්‍රමවත් කරමින් කාර්යක්ෂමතා ඇති කිරීම.

2024 සඳහා අවධානය

- ඉහළ වර්ධන සහ අඩු මට්ටමේ සිට මධ්‍ය මට්ටම දක්වා අවදානම් පැතිකඩක් සහිත අංශ සඳහා ණයදීම.
- ඒකාබද්ධ චක්‍ර බලාගාර සහ පුනර්ජනනීය බලශක්ති (සූර්ය හා සුළං) සඳහා විදුලි හා බලශක්ති අංශයට හරිත බලශක්ති ණය දීමේ අවස්ථා කෙරෙහි වත්මන් රජයේ ප්‍රතිපත්තිය සමඟ ක්‍රියාත්මක වීමට අපේක්ෂා කෙරේ.
- ඇඟලුම්, කෘෂිකර්මාන්තය සහ පතල් කර්මාන්තය තුළ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට ණයදීමේ අවස්ථා මඟින් රජය දේශීය නිෂ්පාදන ක්‍රියාකාරීව ප්‍රවර්ධනය කිරීම අපේක්ෂා කෙරේ.
- ශ්‍රී ලංකාව තුළ අපගේ පා සටහන පුළුල් කිරීමට හවුල්කරුවන්ගේ වාසිය යොදා ගනිමින් ඔවුන් ශක්තිමත් කිරීම.
- ණය කළඹ තුළ ගුණාත්මක භාවය සුරැකීම.

ව්‍යාපාර මාර්ග සමාලෝචනය

ජාත්‍යන්තර බැංකුකරණය

අප පිරිනමන දෑ

මෙම අංශය විදේශ විනිමය, USD, EUR, GBP, AUD & JPY යන මුදල් වලින් විදේශ විනිමය තැන්පතු කටයුතුවල යෙදීම, (ඉතුරුම් සහ ස්ථිර තැන්පත්), අභ්‍යන්තර සහ බාහිර ප්‍රේෂණ, විදේශ විනිමය හුවමාරුව, ආනයන ණයවර ලිපි නිකුත් කිරීම, ආනයන බිල්පත් නිරාකරණය සහ නැව් කටයුතු සහ ගුවන් භාණ්ඩ ඇප නිකුත් කිරීම සම්බන්ධව විසඳුම් රාශියක් පිරිනමයි.

මෙහෙයුම් වාතාවරණය

- ආර්ථික කටයුතු පුනර්ජීවනය කිරීම සහ නිෂ්පාදන අංශ ප්‍රතිසාධනය
- හුවමාරු අනුපාත සහ ආනයන සීමා ලිහිල් කිරීමට ගන්නා ක්‍රියාමාර්ග ස්ථායිකරණය.
- IMF 1 වැනි සමාලෝචනය සාර්ථකව සම්පූර්ණ කිරීම සහ EFF හි 2වන රන් ලභාව සඳහා අනුමැතිය ලබා ගැනීම.
- සේවකයින්ගේ ප්‍රේෂණවල යහපත් මට්ටම සහ සංචාරක පැමිණීමෙහි සැලකියයුතු තරඟකාරිත්වය.
- පොළී අනුපාතවල පහත වැටීම.
- 2024 මැතිවරණයට පෙර දේශපාලන අවදානම.


බලපෑම

- විනිමය ද්‍රවශීලතා අර්බුදය හේතුවෙන් ආනයනයට අදාළ ව්‍යාපාරවලට බලපාන ලදී. (ඉදිකිරීම්, සංචාරක සහ කෘෂිකර්මය වැනි සමහර ක්ෂේත්‍ර පහත වැටීම).
- විදේශ විනිමය ගෙන ඒන සංචාරක කර්මාන්තය සහ සේවක ප්‍රේෂණවල පුබුදුව විදේශ විනිමය ද්‍රවශීලතාව වර්ධනය කර ඇත.


ප්‍රධාන වැදගත් සිදුවීම්

අංශයට ලැබෙන ආදායමෙන් ප්‍රධාන කොටස ස්ථාපන ආදායමෙන් ලැබේ. කාලසීමාව තුළ, බැංකුවේ ස්ථාපන කළඹ විදේශ විනිමය තුළින් ලද වඩා ඉහළ තැන්පතු හේතුවෙන් වැඩි වෙමින් පැවතියේය.

පොළී ඉපයීම් ප්‍රස්ථාරය 36



තැන්පත්වලට අනුව ස්ථාපන ප්‍රස්ථාරය 37



කාර්යසාධනය හා උපායමාර්ගය

2023 වසර තුළ, ප්‍රධාන වශයෙන් රුපියල අවප්‍රමාණය කිරීම හේතුවෙන් 2022 දී වාර්තාකළ රු. බිලියන 10.5ට අනුව රු. බිලියන 0.93ක විදේශ විනිමය තැන්පතු සංචලනය කරන ලදී. පසුගිය වසර තුළ වාර්තාකළ රු. බිලියන 71.8ට සාපේක්ෂව 2023 වසර තුළ රු., බිලියන 128.5ක් වටිනා ප්‍රේෂණ බැංකුව වෙත ලැබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, ප්‍රේෂණවල වෙළෙඳපොල කොටස 2022 දෙසැම්බර් පැවති 5.73% සිට 2023 දෙසැම්බර් 6.59% දක්වා වැඩි වී ඇත.

අවදානම සහ අවස්ථාවන් සහිත අනාගත දැක්ම

ආර්ථික නිමැවුමේ හැකිලීම, ස්වෛරී ණය ප්‍රතිව්‍යුහගත කිරීම, ඉහළ පොළී අනුපාත පරිසරය, බදු සංශෝධන සහ රජයට අයත් ව්‍යාපාර ආයතන (SOBEs) වෙත බැංකු අංශයේ ඉහළ නිරාවරණය සමඟ වත්මන් ආර්ථික පරිසරය හමුවේ බැංකු ක්ෂේත්‍රය සැලකිය යුතු අභියෝගවලට මුහුණ දීමට ඉඩ ඇත. කෙසේවෙතත්, 2023 3වන කාර්තුව තුළ 1.6% (වාර්ෂික) ක සැලකියයුතු වර්ධනයක් ආර්ථිකයේ සිදුවූ අතර මෙයට අඩු වූ පොළී අනුපාත, හුවමාරු අනුපාතය තුළ YTD අගය කිරීම, සහ ආනයනය සීමා ලිහිල් කිරීම සහය විය

2023 වසර තුළ ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව රුපියල 320-360 පරාශය තුළ තවදුරටත් අඛණ්ඩව පැවති අතර, ඉදිරි වසර පුරා 320-360 පරාශයක් තුළ තබා ගනිමින් වෙළෙඳ ලිහිල් කිරීම මධ්‍යයේ USD/LKR හුවමාරු අනුපාතය ක්‍රමානුකූලව අවප්‍රමාණය වේයයි අපේක්ෂා කෙරේ. බැංකුව සිය විදේශ විනිමය තැන්පත් සහ ප්‍රේෂණ වැඩි කරගනිමින් එහි ඩොලර් ද්‍රවශීලතාව ශක්තිමත් කිරීම සහ ශ්‍රී ලංකාවේ සිට සහ ඒ තුළට ආනයනය සහ අපනයන වෙළෙඳාමේ අඛණ්ඩතාව සඳහා වෙළෙඳ පහසුකම් ඇති කිරීමේ විසඳුම් පිරිනැමීමට හැකි වීම කෙරෙහි අවධානය යොමු කරනු ඇත.

ව්‍යාපාර මාර්ග සමාලෝචනය

අපගේ ප්‍රමුඛතා

- ප්‍රේෂණ සඳහා ප්‍රධාන මූලාශ්‍ර වෙළෙඳපොල තුළ වෙළෙඳපොල විනිවිදයාම සහ වෙළෙඳපොල සංවර්ධනය.

2024 සඳහා අවධානය

- ප්‍රධාන වර්ධනය ක්‍රියාත්මක වෙළෙඳපොල කෙරෙහි අඛණ්ඩ අවධානය.
- මේ දක්වා ඇතුළත් නොවූ වෙළෙඳපොල වෙත ඇතුළත් වෙමින් වෙළෙඳපොල කොටස වැඩි කිරීම.
- ඊශ්‍රායලය සහ ඩෙන්මාර්කය වැනි නව වෙළෙඳපොල කරා ව්‍යාපාරය පුළුල් කිරීම සහ නව ගිවිසුම්වලට ඇතුළත් වීම
- අපනයන වෙළෙඳ මූල්‍ය ව්‍යාපාර වෙත වැඩි වැඩියෙන් සංකේන්ද්‍රණය වීම.
- මෙහෙයුම් සරල කරමින් සහ ක්‍රමවත් කරමින් කාර්යක්ෂමතාවන් ඇති කිරීම සහ ඩිජිටල් හැකියාවන් හී ආයෝජනය.



භාණ්ඩාගාරය සහ ගනුදෙනු

අප පිරිනමන දෑ

භාණ්ඩාගාරය සහ ගනුදෙනු වත්කම් වගකීම් කළමනාකරණය තුළින් බැංකුවේ වෙළෙඳපොල අවදානම් සහ ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය කිරීමේදී අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කරයි, මෙම අංශය රජයේ සුරැකුම් පත්, ස්කන්ධ සහ FX, REPO ණයගැනීම් සහ ප්‍රති REPO ණයදීම තුළ ආයෝජනය තුළ යෙදී සිටී. එමෙන්ම එය බැංකුවේ ද්‍රවශීලතා අවශ්‍යතාව මත පදනම් වී ණයකර සහ බැඳුම්කර තුලින් අරමුදල් ඉහළදැමීමේ කටයුතු කරගෙන යයි.

මෙහෙයුම් වාතාවරණය

- දේශීය ණය ප්‍රශස්ථකරණය (DDO) ප්‍රකාශයට පත් කිරීමත් සමඟ රජයේ සුරැකුම්පත්වල ඉපයීම් අඛණ්ඩව පහත වැටුණි.
- මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය ලිහිල් කිරීමට අනුකූලව පොලී අනුපාත පහත වැටීම.
- දේශීය මුදල් වෙළෙඳපොළ ද්‍රවශීලතාව වැඩිදියුණු කිරීම.
- IMF 1 වැනි සමාලෝචනය සාර්ථකව සම්පූර්ණ කිරීම සහ EFF හි 2වන වාරිකය සඳහා අනුමැතිය ලබා ගැනීම.


බලපෑම

- 2023 වසර පුරා ද්‍රවශීලතාවය සහ වෙළෙඳපොල සහභාගිවන්නන්ගේ හිඟකම හේතුවෙන් ස්ථාවර ආදායම් වෙළෙඳාම තුළ වෙළෙඳ අවස්ථාවන්ට අහිතකර ලෙස බලපෑවේය.
- වසර 1ක සහ දිගු කාලීන සුරැකුම්පත්වල අඩු ඉපයීමක් ලබා දීමෙන් වැඩි ද්‍රවශීල කෙටි-කාලීන සුරැකුම්පත් වෙත ආයෝජකයින්ගේ ආකර්ෂණය.
- දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ අවිනිශ්චිතතාවය සහ ස්ථාවර ආදායම් සුරැකුම්පත්වල ආයෝජනයේ බලපෑම.

ප්‍රධාන වැදගත් සිදුවීම්


භාණ්ඩාගාරයේ ඉපයීම් සහ ගනුදෙනු ඉහළ පොලී අනුපාත පාලනය ක්‍රමය යටතේ කාලසීමාව තුළ ඉහළ යමින් පැවතින.

මුළු ඉපයීම් ප්‍රස්ථාරය 38




ප්‍රති මිලදී ගැනීමේ ණය ගැනීම් කළඹ ද ඉහළ ගියේය.

ණය ගැනීම් හා ණය ප්‍රස්ථාරය 39



ව්‍යාපාර මාර්ග සමාලෝචනය

රජයේ සුරැකුම්පත්වල ආයෝජන පාරිභෝගික ණය සඳහා අඩු ඉල්ලුම හේතුවෙන් වැඩි විය.



කාර්යසාධනය හා උපායමාර්ගය

2023 ජූනිවලින් පසු ප්‍රතිපත්ති අනුපාත පහත වැටීමෙන් පසු, භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කරවල පොලී අනුපාත අඛණ්ඩව පහත වැටුණි. මාස තුන මාස හය සහ එක් -වසරක කාලසීමාව සඳහා 2023 සාමාන්‍ය භාණ්ඩාගාර බිල්පත් අනුපාතය පිළිවෙලින් 22.52%, 21.24% සහ 19.34% ක් විය. කෙසේවෙතත්, පසුගිය වසරේ වඩා ඉහළ අනුපාතයට සිදුකළ ආයෝජන හේතුවෙන් වසර තුළ රජයේ සුරැකුම්පත්වල ආයෝජනය තුලින් සැලකියයුතු ලාභයක් ලබා ගැනීමට බැංකුවට හැකිවිය. ඉන් පසුව, රු. බිලියන 1.4ක වෙළෙඳ කටයුතුවලින් උත්පාදිත ශුද්ධ ඉපයීම් සමඟ රු. බිලියන 1.8ක අනෙකුත් විස්තරාත්මක ආදායම තුලින් සාධාරණ අගයේදී භාණ්ඩාගාර බැඳුම්කර හඳුනා නොගැනීම මත ඉපයීම් බැංකුවේ බදු පෙර මෙහෙයුම් ලාභයට සැලකියයුතු ලෙස දායක විය.

බැංකුව එහි මූල්‍ය, මෙහෙයුම්, සහ වෙළෙඳපොල අවදානම අවම කරමින් ද්‍රවශීලතාව, ආයෝජන ලැබීම් සහ මූල්‍ය වෙළෙඳපොල ගනුදෙනු ප්‍රශස්ථ කිරීම සඳහා බැංකුවේ භාණ්ඩාගාර කළමනාකරණ අංශය ශක්තිමත් කිරීම සඳහා බැංකුව දැනට භාණ්ඩාගාර කළමනාකරණ විසඳුමක් ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියේ නිරත වී සිටී.

අවදානම සහ අවස්ථාවන් සහිත අනාගත දැක්ම

- රටේ අවදානම් පැතිකඩ අනුව විදේශ අරමුදල් කරා පිවිසීමේදී අභියෝග සැහැල්ලු කිරීම.
- 2024 පළමු අර්ධය තුළ බාහිර ණය ප්‍රතිව්‍යුහගතකරණය සම්පූර්ණ කිරීමත් සමඟ, සමස්ථ ආදායම් චක්‍රය පහළ වැටෙනු ඇත.
- ස්කන්ධ වෙළෙඳපොල සඳහා අනාගත දැක්ම සාර්ව-ආර්ථික මූලධර්ම ක්‍රියාත්මක කිරීම මත ධනාත්මක විය යුතුය.
- මහ බැංකුව මූල්‍ය ප්‍රතිපත්ති සම්ප්‍රේෂණය සහ මූල්‍ය ප්‍රතිපත්ති ස්ථාවරත්වයේ සංඥා බලපෑම වර්ධනය කිරීමට දැනට පවත්නා ද්විත්ව ප්‍රතිපත්ති පොලී අනුපාත වෙනුවට තනි ප්‍රතිපත්ති පොලී අනුපාතයක් කරා විතැන්වීම සලකා බැලීමට සැලසුම් කරමින් සිටී.

මෙහෙයුම් වාතාවරණය

- නව අඩු-පිරිවැය අරමුදල් මාර්ග සෙවීම.
- ඩිජිටල් හැකියාවන් හී මෙහෙයුම් හා ආයෝජන සරල කරමින් හා ක්‍රමවත් කරමින් කාර්යක්ෂමතා ඇති කිරීම.

2024 සඳහා අවධානය

- ආයෝජන මත ඉපයීම ප්‍රශස්ත කරණය සහ වත්කම් වගකීම් කළමනාකරණ කාර්යය ශක්තිමත් කිරීම.
- භාණ්ඩාගර කළමනාකරණ පද්ධතිය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීම.
- වෙළෙඳ සෘජු සහභාගිකයාගේ තත්ත්වය දියත් කිරීම/NSB FMC ව්‍යාපාර උකහා ගැනීමට මූලික වෙළෙඳ ඒකකය ස්ථාපිත කිරීම.
- මුදල් පරිසර පද්ධතිය පරිවර්තනය කිරීම සහ ප්‍රධාන පරිපාලන කටයුතු තුරන් කරමින්, සරල කරමින් හෝ මධ්‍යගත කරමින් අපගේ ඉදිරි පෙළ ශාඛා සේවකයින්ගේ හැකියාව සැලකියයුතු ලෙස වැඩි කරන ලදී.



නිෂ්පාදිත ප්‍රාග්ධනය

අපගේ මෙහෙයුම්වල කොඳු නාරටිය



බැංකුව සඳහා නිෂ්පාදිත ප්‍රාග්ධයෙන් අදහස් කරන දෑ

බැංකුවේ නිෂ්පාදිත ප්‍රාග්ධනය, තිරසාර වටිනාකම් නිර්මාණය ක්‍රියාවලිය තුළ සිය මෙහෙයුම් සේවා ලබාදීම පහසුකරන භෞතික හා තාක්ෂණික වත්කම්වලින් සමන්විත වේ. බැංකුව තුළ, නිෂ්පාදිත ප්‍රාග්ධනය අපගේ ශාඛා ජාලය, කාර්යාල ගොඩනැගිලි, PPE, ATMs, CRMs, විකිණීම පිළිබඳ වෙළෙඳ ස්ථාන (POS) සහ අතින් දරන POS යන්ත්‍ර, තැපැල් කාර්යාල, උප තැපැල් කාර්යාල, තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම්, මෘදුකාංග පද්ධති, සහ අන්තර්ජාල බැංකුකරණය, chatbox , සහ සමාජ මාධ්‍ය වැනි ඩිජිටල් අවස්ථාවන්ගෙන් සමන්විත වේ.

අපගේ තිරසාර වටිනාකම් නිර්මාණයට නිෂ්පාදිත ප්‍රාග්ධනය සහයවන ආකාරය

නිෂ්පාදිත ප්‍රාග්ධනය මෙහෙයුම් ඔරොත්තුදීම, කාර්යක්ෂමතාව සහ නව්‍යකරණය වැඩි කරයි. තාක්ෂණ සහ යටිතල පහසුකම්වල ආයෝජනය ආරක්ෂිත, නව්‍යකරණ, සහ පාරිසරිකමය හිතකාමී සේවාවන් ගනුදෙනුකරුවන්ට ලබා දෙමින් මෙහෙයුම් කාර්යසාධනය වැඩිකර, පිරිවැය අඩුකර, සහ මැනීමේ හැකියාව ශක්තිමත් කරයි. හරිත තාක්ෂණය සහ ඩිජිටල් විශ්ලේෂක භාවිතා කිරීම පුද්ගලගත බැංකුකරණය, මූල්‍ය අන්තර්කරණය ප්‍රවර්ධනය කිරීම සහ තිරසාර අරමුණු සමඟ පෙළ ගැස්වීමට තවදුරටත් සහය වේ. මෙම උපායමාර්ගික අවධානය දිගු-කාලීන සාර්ථකත්වය සහ ප්‍රජා යහපැවැත්ම අත්කර ගැනීමට නිෂ්පාදිත ප්‍රාග්ධනය මූලික කර ගනිමින් සමාජීය සහ පාරිසරිකමය වගකීම වෙත බැංකුවේ කැපවීම නැවත තහවුරු කරයි.

වටිනාකම් පරිනාමනය

- නව ශාඛා විවෘත කිරීම
- ස්ථාවර වත්කම් එකතු කිරීම සහ ඉවත් කිරීම
- ප්‍රාග්ධන වියදම පිළිබඳ ප්‍රඥාගෝචර තක්සේරුව
- ඩිජිටල් යටිතල පහසුකම් සංවර්ධනයන් පර්යේෂණය
- 51ක් වැනි සංවත්සරය සැමරීමට සමගාමීව බැංකුවේ ඩිජිටල් අවස්ථාවන් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන
- ඩිජිටල් යටිතල පහසුකම් නඩත්තුව සහ උසස් කිරීම

ප්‍රධාන යෙදවුම්

- දේපල, පිරියත හා උපකරණ
- ප්‍රාග්ධන වියදම
- භෞතික පිවිසුම් ස්ථාන
- තත්‍ය පිවිසුම් ස්ථාන/ඩිජිටල් මාර්ග
- ඩිජිටල් යටිතල පහසුකම්

ප්‍රධාන නිමැවුම්

ගනුදෙනුකාර පිවිසුම් ස්ථාන:

තැපැල් කාර්යාල/උප තැපැල් කාර්යාල ගණන: **4,006** (2022 – 3,996)	ශාඛා ගණන: **262** (2022 – 262)	ATMs ගණන: **295** (2022 – 293)
සුහුරු කලාප ගණන : **122** (2022 – 97)	CRMs ගණන: **122** (2022 – 97)	ප්‍රාදේශීය කාර්යාල ගණන: **8** (2022 – 8)

නව අන්තර්ජාල බැංකුකරණය ගනුදෙනුකරුවන්: **9,640** (2022 – 11,060)

ස්ථීර වත්කම්

දේපල, පිරියත සහ උපකරණවල ශුද්ධ පොත් අගය:

රු.මිලියන 17,249
(2022 – රු.මිලියන 14,756)

ඩිජිටල් ප්‍රාග්ධනය තුළ ආයෝජනය:

රු.මිලියන 350.6
(2022 – රු.මිලියන 370.1)

නව මාර්ග

- ඩිජිටල් ගනුදෙනුකාර ඇතුළත් කර ගැනීම
- නව ERP හඳුන්වාදීම (ඔරකල් පද්ධතිය)
- ඩිජිටල් බැංකුකරණ සේවා එනම් NSB e-KYC මෙන්ම NSB e-post, NSBPay App, සහ NSB මාර්ගස්ථ කාඩ්පත ලබාදෙන “NSB NextGen” සන්නාමය හඳුන්වාදීම

මූලික කාර්යසාධන දර්ශක

ශාඛාවකට ආදායම

2023 – රු.මිලියන 885.7
(2022 – රු.මිලියන 666.1)

ශාඛාවකට ශුද්ධ ලාභය

(2023 – රු.මිලියන 27.5)
(2022 – රු.මිලියන 9.7)

නිෂ්පාදිත ප්‍රාග්ධනය

2023 දී ප්‍රධාන අභියෝග

- ඉතා අධික උද්ධමනීය ආර්ථික වාතාවරණය මත නිෂ්පාදිත ප්‍රාග්ධනය කෙරෙහි සාර්ව-ආර්ථික සාධකවල බලපෑම
- දැඩි මූල්‍ය ප්‍රතිපත්තිය හේතුවෙන් ප්‍රාග්ධන වියදම මත සීමාකළ වෙන් කිරීම ප්‍රශස්ථව භාවිතා කිරීම.
- ඩිජිටල් ගනුදෙනුකාර පිවිසුම් ස්ථාන සඳහා වැඩිවන ඉල්ලුම කෙරෙහි තරඟකාරී පීඩනය සහ බාධා රහිත පරිසරයක් තුළ ඩිජිටල් අවකාශ භාවිතය පහසු කිරීම
- සයිබර් අවදානම්
- ආයතනිකමය ඔරෙත්තුදීමේ හැකියාව
- බැංකුවේ ව්‍යුහමය සීමාවන්ට අනුව ෆින්ටෙක්හි වේගවත් වැඩි දියුණුව
- සමහර ගනුදෙනුකාර අංශවලින් නව තාක්ෂණයට ප්‍රතිරෝධය
- ගනුදෙනුකාර තනිපුද්ගල මනාපවල අඛණ්ඩ පරිණාමනය

2023 දී ප්‍රධාන අවස්ථා

- ඩිජිටල් යටිතල පහසුකම්වල වැඩිකළ ආයෝජන සමඟ මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි කිරීමේ හැකියාව
- ගනුදෙනුකරුවන් කරා ලඟාවීමට ෆින්ටෙක් නිර්මාණය කළහැකි පුළුල් අවස්ථා වැඩි දියුණුව
- අළුතින් හඳුන්වා දුන් ERP තුළින් ප්‍රසම්පාදන කළමනාකරණය සහ තොග ස්වයංක්‍රීයකරණය

තිරණාත්මක සාර්ථකත්ව සාධක/උපායමාර්ගික ධාවක

- තැපැල් කාර්යාල තුළින් විශාලතම භෞතික ගනුදෙනුකාර පිවිසුම් ස්ථාන ජාලය බැංකුව සතුවන බැවින් තැපැල් කාර්යාල සහ උප තැපැල් කාර්යාල තුළින් මෙතෙක් සේවය නොලද ග්‍රාමීය වෙළෙඳපොල කරා ලඟාවීමට ඇති තරඟකාරී වාසිය.
- ගනුදෙනුකරුවන් ඇතුළත් කර ගැනීම සහ ඩිජිටල් ගිණුම් විවෘත කිරීම වැනි ක්‍රියාවලි සරල කරමින් ස්වයංක්‍රියකරණය සහ ඩිජිටල්කරණය ක්‍රියාත්මත කිරීමේ ආම්පන්න කරා විතැන්වීමට අපගේ තාක්ෂණය අපව ශක්තිමත් කරයි.

අපගේ නිෂ්පාදිත ප්‍රාග්ධනය අප වර්ධනය කරන ආකාරය

- ඩිජිටල් යටිතලපහසුකම් සංවර්ධනයන්හි අඛණ්ඩව ආයෝජනය සහ අනෙකුත් ව්‍යාපාර ක්‍රියාවලි ඒකාබද්ධ කිරීම.
- අපගේ පැවැත්ම පුළුල් කිරීම සහ දිවයින පුරා ශාඛා ජාල හරහා ලඟාවීම

විභව්‍ය හුවමාරුවීම්

- **මූල්‍ය ප්‍රාග්ධනය**
  නිෂ්පාදිත ප්‍රාග්ධනය තුළ ආයෝජනය කිරීම් හේතුවෙන් ඉතුරුම් හා මූල්‍ය වත්කම්වල ආයෝජනය ඇති මූල්‍ය වත්කම් අඩුවන අතර එය මූල්‍ය ස්ථාවරත්වයට හා ද්‍රවශීලතාවයට බලපෑම් ඇති කරයි.
- **බුද්ධිමය ප්‍රාග්ධනය**
  භෞතික වත්කම් මත පමණක් අවධානය යොමු කිරීම තුළින් පර්යේෂණ හා සංවර්ධනය හෝ දැනුම කළමනාකරණ ක්‍රම වැනි බුද්ධිමය ප්‍රාග්ධනය තුළ ආයෝජන නොසලකා හැරිය හැකි අතර බුද්ධිමය ප්‍රාග්ධනය නිෂ්පාදන/සේවා වර්ධනයන් සහ වෙළෙඳපොල පුළුල් කිරීමේදී අත්‍යවශ්‍ය වන බැවින් නව්‍යකරණයට බාධා ඇති කරමින් දිගු-කාලීන තරඟකාරිත්වයන් සිමා කරයි.
- **මානව ප්‍රාග්ධනය**
  භෞතික යටිතලපහසුකම් හෝ තාක්ෂණය තුළ ආයෝජනය කෙරෙහි වැඩිපුර අවධානය යොමු කිරීම පුහුණු වැඩසටහන් හෝ සේවක ශුභසාධන මූලපිරීම් වැනි මානව ප්‍රාග්ධන සංවර්ධනය තුළ අඩුකළ ආයෝජනයකට මඟ පෑදිය හැකි අතර එය සේවක තෘප්තිය අඩුකරමින් වඩා පහළ ඵලදායිතාවය සහ අඩුකළ නව්‍යකරණයට හේතු වේ.
- **සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය**
  ප්‍රජා සහභාගිත්ව වැඩසටහන් හෝ ආයතනික සමාජ වගකීම් වැඩසටහන් වැනි සමාජ ප්‍රාග්ධනයට වඩා නිෂ්පාදිත ප්‍රාග්ධනය තුළ ආයෝජනය ප්‍රමුඛ කිරීම ගනුදෙනුකරුවන්, ප්‍රජාවන් සහ පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධතා දුර්වල කරනු ඇති අතර එය කීර්තිනාම අවදානම් සහ විශ්වාසය අහිමිවීමට හේතු වන අතර දිගු-කාලීන ව්‍යාපාර තිරසාරභාවයට එය බලපානු ඇත.
- **ස්වභාවික ප්‍රාග්ධනය**
  යටිතලපහසුකම් ව්‍යාප්‍රෘති වැනි නිෂ්පාදිත ප්‍රාග්ධනය තුළ ආයෝජන අහිතකර බලපෑම් ඇති කරන අතර එය ස්වභාවික සම්පත් පිරිහීමට හෝ වාසභූමි බිඳවැටීමකට හේතු වේ.

පාර්ශ්වකරුවන් සඳහා නිර්මිත කළ වටිනාකම

පාර්ශ්වකරුවන්/ආයෝජකයින්
කාර්යක්ෂම බැංකුකරණ ක්‍රියාවලි ලාභදායිතාව වර්ධනය කරයි

ගනුදෙනුකරුවන්
බැංකුකරණ පහසුව, බහුමාර්ග බැංකුකරණ අත්දැකීම සියලුම ගනුදෙනුකාර අංශවලට ලබාදීම

සේවකයින්
ඩිජිටල්කරණය කළ පරිසරය තුළ කුසලතා වර්ධනය කරයි.

නියාමකයින් සහ රජයේ ආයතන
නියාමන වාර්තා කාලීනව ඉදිරිපත් කිරීම

ව්‍යාපාර හවුල්කරුවන්
විශ්වාසදායී යටිතල පහසුකම්, උසස් තාක්ෂණය, ආරක්ෂිත පරිසරය, එකිනෙකාගේ අවශ්‍යතා මත සැකසූ විසඳුම්, අනුකූලතා සහතිකය, සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව ලබා දේ

සමාජය සහ පරිසරය
අවසානයේදී සමාජය සඳහා පහසු බැංකුකරණය

අපගේ නිෂ්පාදිත ප්‍රාග්ධනය අප යොදා ගන්නා ආකාරය

මූල්‍ය ප්‍රාග්ධනය
වර්ධිත කාර්යක්ෂමතාව සහ ඵලදායිතාව සමස්ත පිරිවැය අඩුකරයි.

බුද්ධිමය ප්‍රාග්ධනය
ශාඛා පුළුල්කිරීම මගින් සන්නාම දෘශ්‍යතාව ප්‍රවර්ධනය කරන අතර ඩිජිටල් යටිතල පහසුකම් කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය කරයි.

මානව ප්‍රාග්ධනය
ක්‍රියාවලි වර්ධනයන් සහ නව පද්ධති ක්‍රියාත්මක කිරීම නව රැකියා අවස්ථා, පුහුණුව සහ ධාරිතාවයන් පුළුල් කිරීම නිර්මාණය කරයි. නව හැකියාවන් සහ ඩිජිටල් කුසලතා සංවර්ධනය කරයි.

සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය
භෞතික හා ඩිජිටල් යටිතලපහසුකම් ව්‍යාප්තිය ගනුදෙනුකරුවන් සහ සැපයුම්කරුවන් සමඟ ශක්තිමත් සම්බන්ධතා ලබා දෙන අතර ගනුදෙනු කාලය අඩු කරයි.

ස්වභාවික ප්‍රාග්ධනය
තිරසාර භෞතික සහ ඩිජිටල් පහසුකම්වල ආයෝජනය කාබන් පියසටහන අඩු කරයි.

නිෂ්පාදිත ප්‍රාග්ධනය

තිරසාර සංවර්ධන අරමුණු සඳහා දායකත්වය (UN SDGs)

ප්‍රාථමික UN SDGs

7 AFFORDABLE AND CLEAN ENERGY — ශාඛා බලශක්ති අවශ්‍යතා සඳහා සූර්ය බලශක්තිය වැඩි කිරීම

11 SUSTAINABLE CITIES AND COMMUNITIES — බලශක්ති කාර්යක්ෂම පිවිසිය හැකි භෞතික හා ඩිජිටල් යටිතල සහ නව්‍යකරණ, සියළු අවශ්‍යතාවලට සරිලන නිෂ්පාදන සහ සේවා ලබාදීම

12 RESPONSIBLE CONSUMPTION AND PRODUCTION — ඩිජිටල් බැංකුකරණය ප්‍රවර්ධනය තුළින් කඩදාසි පරිභෝජනය අඩුකිරීම.

ද්විතියික UN SDGs

8 DECENT WORK AND ECONOMIC GROWTH — සමස්ථ ආර්ථික වර්ධනය වැඩි කිරීමට වැඩිකළ කාර්යක්ෂමතාව සේවාවන්හි ඵලදායිතාව.

9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE — නව රැකියා අවස්ථා ලබාදීමට සහ බලශක්ති කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය කිරීමට නිෂ්පාදිත ප්‍රාග්ධනය තුළ ආයෝජනය.

10 REDUCED INEQUALITIES — වඩා පුළුල් ප්‍රජාවක් අතර ශාඛා ජාලය පුළුල් කිරීම සමඟ දිවයින පුරා සුහුරු කලාප වැඩි කිරීම මගින් බැංකු සේවා සඳහා පහසු පිවිසිම් ලබාදීම.

13 CLIMATE ACTION — බැංකුවේ කාබන් පා සටහන අඩු කිරීමට බලශක්ති කාර්යක්ෂම හා පුනර්ජනනීය (සූර්ය) බලශක්ති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

ප්‍රතිඵල කළමනාකරණය කිරීමේ ප්‍රවේශ

- භෞතික ප්‍රාග්ධනය හා ඩිජිටල් ප්‍රාග්ධනය තුළ ආයෝජන අතර සමබරතාවක් ඇති කිරීම සහ ගනුදෙනුකාර අපේක්ෂාවන්ගෙන් ඔබ්බට සේවය ලබාදීමට අවශ්‍ය ප්‍රශස්ථ මුසුව හඳුනා ගැනීම.
- පාර්ශවකාර අවශ්‍යතා උපරිම කිරීමට නිෂ්පාදිත ප්‍රාග්ධනය අනෙකුත් සම්පත් සමඟ භාවිතා කිරීම
- පිරිවැය ඵලදායී යටිතල පහසුකම් අත්කර ගැනීමට ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රමවත් කිරීම

ප්‍රමාණාත්මකතාව. පාර්ශ්වකරුවන්, සහ කෙටි කාලයේ-සිට-මධ්‍ය-කාලීන උපායමාර්ගික ප්‍රමුඛතා අතර සම්බන්ධතාව

ප්‍රමාණාත්මක කරුණු

පාර්ශ්වකරුවන්

කෙටි කාලයේ -සිට-මධ්‍ය කාලීන උපායමාර්ගික ප්‍රමුඛතා

1 ඩිජිටල් යටිතලපහසුකම් සංවර්ධනයන්

ඩිජිටල් බැංකුකරණ සේවා – "NSB NextGen"

2023 දී, අපගේ ඩිජිටල් බැංකුකරණ සේවාවක් වන "NSB NextGen" අපි හඳුන්වා දෙන ලද අතර ඒ යටතේ බැංකුවේ සියලුම ඩිජිටල් බැංකුකරණ සේවා වර්ග කර ඇත. මේ සමඟ, NSB e-KYC, NSB e-Post, NSB Pay App, සහ NSB මාර්ගස්ථ කාඩ්පත වැනි ඩිජිටල් බැංකුකරණ සේවා දියත් කරන ලදි.

බ්ලෝක්චේන් තාක්ෂණය සමඟ විද්‍යුත් මාර්ගයෙන් ඔබගේ ගනුදෙනුකරු හඳුනාගන්න (NSB e-KYC)

NSB e-KYC මගින් ශාඛාවක් කරා නොගොස් ගනුදෙනුකරුගේ විස්තර ඇතුළත් කර ගැනීම සහ ගිණුම් විවෘත කිරීමට පහසුකම් සලසයි. NSB e-KYC යනු භෞතික ලේඛණගත කිරීම සඳහා අවශ්‍යතාව නොමැතිව ගනුදෙනුකරුවාගේ අනන්‍යතාව ඩිජිටල්ව ක්‍රමය මගින් සහතික කිරීම වන බැවින්, ගනුදෙනුකරුවන්ට ගිණුමක් විවෘත කිරීමට ඕනෑම වේලාවක ඕනෑම ස්ථානයක සිට මාර්ගගතව ඔහුගේ තොරතුරු ඉදිරිපත් කළ හැක.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ශ්‍රී ලංකාවේ මූල්‍ය සේවා සඳහා බ්ලොක්චේන් තාක්ෂණයේ ලබාගතහැකි ප්‍රතිලාභ හඳුනාගෙන බැංකුවල සහ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ ස්වේච්ඡා සහභාගිත්වය සමඟ අන්තර්-ක්ෂේත්‍ර අධ්‍යයනයක් ආරම්භ කරන ලදී. මහ බැංකුව සියළුම බැංකු හවුල්කර ගනිමින් KYC විසඳුමක් සංවර්ධනය කරමින් සහ බ්ලොක්චේන් තාක්ෂණය-පදනම් හුවමාරු KYC සංවර්ධනය ආරම්භ කිරීමට ගිවිසුම්වලට ඇතුළත් වෙමින් රටතුළ බ්ලොක්චේන් තාක්ෂණය-පදනම් මූල්‍ය සේවා විසඳුම් සඳහා මාර්ගය පාදාදීමට තීරණය කරන ලදී ඒ අනුව, බැංකුව බ්ලොක්චේන් තාක්ෂණය e-KYC සඳහා යොදා ගැනීමට අදාළ මූලික පියවර ගෙන ඇත.

NSB e-Post

බැංකුව "e-Post Digital Account" නමින් නව ඩිජිටල් තැපැල් ඉතුරුම් ගිණුමක් හඳුන්වාදීමට තීරණය කළ අතර එම ගිණුම ග්‍රාමීය ජනතාවට වඩාත් පහසු බැංකු සේවා ලබාදීමට ඩිජිටල් ලෝකයට තැපැල් බැංකු අංශය සම්බන්ධ කරයි. e-Post ඩිජිටල් ගිණුම්වලට NSB POS යන්ත්‍ර සහිත උප තැපැල් කාර්යාල සහ තැපැල් දෙපාර්තමේන්තුවේ e-Pay පහසුකම භාවිතා කරන පරිගණක කළ තැපැල් කාර්යාල සහ උප තැපැල් කාර්යාල හරහා විවෘත කළ හැකිය. පහත සඳහන් පහසුකම් ඇතුළුව ශාඛා ඉතුරුම් ගිණුම් පිරිනමන පහසුකම්වලට සමාන ලක්ෂණ එය සතු වේ:

- NSB Pay ජංගම යෙදුම
- ATM කාඩ් පහසුකම



නිෂ්පාදිත ප්‍රාග්ධනය

- CRM භාවිතා කරන තැන්පත් ගනුදෙනු සිදු කිරීම
- අන්තර්ජාල බැංකු සේවා
- SMS සංඥා සේවය
- විදේශීය ප්‍රේෂණ

මෙම ගිණුම විවෘත කරන අවස්ථාවේදී භෞතික ඉතුරුම් පොතක් නිකුත් නොකෙරේ. ගනුදෙනුකරුවන්ට ගිණුම් විස්තර ලබා ගැනීම සඳහා NSBPay යෙදුම හෝ අන්තර්ජාල බැංකු සේවා භවිතා කළ හැකිය. තැපැල් කාර්යාල සහ උප තැපැල් කාර්යාලවලදී මෙම ගිණුම මගින් ගනුදෙනු කිරීමට, ගනුදෙනුකරුවන්ට ගිණුම් අංකය, ජාතික හැඳුණුම්පත් අංකය හෝ ලියාපදිංචි දුරකථන අංකය භාවිතා කළ හැකිය.

e-පදනම් නිවාඩු අනුමත කිරීමේ ක්‍රමය

කඩදාසි භාවිතය අඩු කිරීම සහ බැංකුවේ චර්යානුගත අනුමත කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම පිණිස, ඉලෙක්ට්‍රොනික නිවාඩු අනුමත කිරීමේ ක්‍රියාවලිය අපි හඳුන්වා දී ඇති අතර එය කාබන් පාසටහන අඩුකිරීමට සහය වේ.

NSB මාර්ගස්ථ කාඩ්පත

ජාතික මාර්ගස්ථ කාඩ්පත් ක්‍රමයක් හඳුන්වාදීමට ජාතික ප්‍රවාහන කොමිෂන් සභාව සහ ලංකා ක්ලියර් හි වැඩසටහන යටතේ, බැංකුව ඩෙබිට් සහ ගබඩාකළ වටිනාකම් කාර්යයන් යන දෙකම සමන්විත JCB/Lanka Pay සම- සන්නාම ඩෙබිට් කාඩ්පත නිකුත් කිරීමේ ව්‍යාපෘතිය නිම කරන ලදී. (ගබඩාකළ වටිනාකම් සංරචකය මාර්ගස්ථ ගෙවීම් මාර්ග අපගතව සිදු කිරීම සඳහා විශේෂයෙන් නිර්මාණය කර ඇත).

2 අපගේ පැවැත්ම පුළුල් කිරීම

අපගේ ප්‍රවේශය වැඩිකර ගැනීමට ෆිසිටල් ක්‍රමයට (භෞතික සහ ඩිජිටල්) අනුගතවීම

ෆිසිටල් උපායමාර්ගය බැංකුව වඩා හොඳින් ඩිජිටල් පරිනාමනය කරා ගෙන යාමට සහාය වන අතර, ඒ තුළින් අපි තරඟකාරීව සිටින බව, ගනුදෙනුකාර අවශ්‍යතාවන්ට ප්‍රතිචාරාත්මකබව සහ තිරසාර වටිනාකම ලබාදීමට හැකියාව ඇති බවට සහතික කරයි.

මෙම උපායමාර්ගය පහසු සහ කාර්යක්ෂම ඩිජිටල් සේවා පිරිනමන අතර, භෞතික මැදිහත්වීම් මඟින් පුද්ගලයින් සමඟ අන්‍යොන්‍ය සබඳතා පවත්වා ගනිමින් ෆිසිටල් වෙත යමින්, බැංකුවට සිය ගනුදෙනුකරුවන්ගේ විවිධ මනාපයන් සපුරාලීමට හැකි වන අතර, ඉන් බැංකු සේවාවන්ට මුහුණට මුහුණ උපදේශන අගය කරන පුද්ගලයින්ට මෙන්ම ක්ෂණික, මාර්ගගත ප්‍රවේශය ඉල්ලා සිටින අයට ද පහසුකම් සපයයි. මෙම ප්‍රවේශය ගනුදෙනුකාර සහභාගිත්වය සහ පක්ෂපාතිත්වය වැඩි දියුණු කරමින් බැංකුවේ පැවැත්ම සහ ප්‍රවේශවීමේ හැකියාව පුළුල් කර ඇත.

තවද, ෆිසිටල් ආදර්ශය ඩිජිටල් හා භෞතික මාර්ගවලින් දත්ත රැස්කර විශ්ලේෂණය කිරීමට බැංකුවට ඉඩ ලබා දෙන අතර, එය වර්ධිත ගනුදෙනුකාර අවබෝධය, පුද්ගලගත සේවා, සහ නව්‍යකරණ නිෂ්පාදන පිරිනැමීම්වලට හේතු වේ.

බැංකුව සිය ජාලය හරහා දිවයින පුරා එහි භූගෝලීය පාසටහන් පුළුල් කර ඇති අතර, එය සමාජයේ සෑම ප්‍රජාවක් සහ සෑම ස්ථරයක් වෙතම නිෂ්පාදන සහ සේවා සමඟ ලඟාවීමට බැංකුව ශක්තිමත් කරයි. අපගේ ජාලය ශාඛා 262 කින්, ප්‍රාදේශිය කාර්යාල 8 කින්, සහ විසා සහ මාස්ටර් ඩෙබිට් කාඩ් සහිත ATMs/Cash Recycle Machines (CRMs) 417කින් සමන්විත වේ. එමෙන්ම අපි ලංකා පේ පොදු ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර ස්විචය සමඟ සහයෝගයෙන් ක්‍රියා කරන අතර, එය රටපුරා මුදල් තැන්පතු යන්ත්‍ර (CDMs) සහ CRMs ඇතුළුව 5,800කට ATMs වැඩි කරා සම්බන්ධකරන ජාලයකට ප්‍රවේශය ලබා දේ.



විස්තරය	2023	2022
නිකුත් කළ කාඩ්ගණන	**387,341**	161,467
දෙසැම්බර් 31 දිනට භාවිතයෙහි ඇති මුළු කාඩ් ගණන	**1,147,651**	2,203,309
ගනුදෙනු පරිමාව	**11,527,379**	9,831,714
ගනුදෙනු වටිනාකම (රු. මිලියන)	**32,201**	26,235
අන්තර්ජාලය සම්බන්ධ ගිණුම්	**133,231**	123,591
අන්තර්ජාල බැංකුකරණය - ගනුදෙනු පරිමාව	**1,547,575**	1,651,209
අන්තර්ජාල බැංකුකරණය - ගනුදෙනු වටිනාකම (රු. මිලියන)	**56,972**	56,567
භාවිතයේ ඇති ATMs ගණන	**295**	293
භාවිතයේ ඇති CRM ගණන	**122**	97

වගුව 13 →

නිෂ්පාදිත ප්‍රාග්ධනය

දිවයින පුරා ශාඛා ජාලය

අපගේ සන්නාමයේ දෘශ්‍යතාව සහ විද්‍යමානවීම ප්‍රකාශ කරන ශාඛා ගනුදෙනුකරුවන් සඳහා භෞතික පිවිසුම් ස්ථාන පවත්වාගෙන යාමේ අත්‍යවශ්‍ය සංරචකයකි. මෑතකාලීන වර්ෂවල බැංකු සේවා සඳහා ගනුදෙනුකාර කැමැත්ත ඩිජිටල් අවකාශ වෙත විතැන්වීමක් සලකුණු කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, බැංකුව ගනුදෙනුකරුවන්ගේ පුද්ගලික සහ ඩිජිටල් අවශ්‍යතා යන දෙකම දිවයින පුරා භෞතික පිවිසුම් ස්ථාන ස්ථාපනය කරමින් සහ ඩිජිටල් යටිතලපහසුකම් පුළුල් කරමින් සුදුසු ලෙස යොදා ගෙන ඇත.

අපි අපගේ ඩිජිටල් යටිතලපහසුකම් ගොඩනැඟීම කෙරෙහි අවධානය යොමු කරන අතරම, උපායමාර්ගිකව වැදගත් ස්ථානවල නව ශාඛා එකතු කරමින් අපගේ ශාඛා ජාලය වැඩි කිරීමට අරමුණු කරමු. කෙසේවෙතත්, ප්‍රාග්ධන වියදම් පාලනය කිරීම සඳහා මුදල් අමාත්‍යාංශය විසින් මතුකරන ලද නියාමනයට අනුව, ශාඛා විවෘත කිරීම 2023 දී තාවකාලිකව නතර කරන ලදී. ඒසේ වුවත්, ගනුදෙනුකාර අත්දැකීම වර්ධනය කිරීමට සහ අපගේ සේවකයින්ට ප්‍රසන්න සහ උපකාරී වැඩ පරිසරයක් ලබාදීමට වසර තුළ උපායමාර්ගික, ඉඩකඩ ඇති නව ස්ථාන සඳහා ශාඛා පහක් එනම් කහවත්ත, වාරියපොල, සූරියවැව, නාවල සහ බණ්ඩාරවෙල ශාඛා වෙනත් ස්ථානවලට ගෙන යන ලදි

ශාඛා	ATMs/ CRMs	සුනුරු කලාප	
20	30	10	උතුරු පළාත
14	21	7	1. යාපනය
1	2	1	2. කිලිනොච්චිය
2	3	1	3. මන්නාරම
2	2	–	4. මුලතිව්
1	2	1	5. වවුනියා

ශාඛා	ATMs/ CRMs	සුනුරු කලාප	
15	21	4	උතුරු මැද පළාත
12	18	4	6. අනුරාධපුරය
3	3	–	7. පොලොන්නරුව

ශාඛා	ATMs/ CRMs	සුනුරු කලාප	
27	41	11	වයඹ පළාත
8	14	5	8. පුත්තලම
19	27	6	9. කුරුණෑගල

ශාඛා	ATMs/ CRMs	සුනුරු කලාප	
82	162	60	බස්නාහිර පළාත
43	97	36	10. කොළඹ
27	48	19	11. ගම්පහ
12	17	5	12. කළුතර


ශාඛා	ATMs/ CRMs	සුනුරු කලාප	
39	53	13	දකුණු පළාත
15	20	5	13. ගාල්ල
13	19	4	14. මාතර
11	14	4	15. හම්බන්තොට

ශාඛා	ATMs/ CRMs	සුනුරු කලාප	
28	39	7	මධ්‍යම පළාත
4	6	2	16. මාතලේ
7	8	1	17. නුවරඑළිය
17	25	4	18. මහනුවර

ශාඛා	ATMs/ CRMs	සුනුරු කලාප	
17	21	3	නැගෙනහිර පළාත
2	2	–	19. ත්‍රිකුණාමලය
8	10	2	20. අම්පාර
7	9	1	21. මඩකලපුව

ශාඛා	ATMs/ CRMs	සුනුරු කලාප	
13	21	6	ඌව පළාත
6	13	4	22. බදුල්ල
7	8	2	23. මොනරාගල

ශාඛා	ATMs/ CRMs	සුනුරු කලාප	
21	29	8	සබරගමුව පළාත
10	13	3	24. කෑගල්ල
11	16	5	25. රත්නපුර



අපගේ ශාඛා සහ ජාලය පිළිබඳ වැඩි විස්තර සඳහා ස්කෑන් කරන්න.

රූපය 12 →

විවිධ හැකියාවන් සහිත පුද්ගලයින් සඳහා ප්‍රවේශය

සෑම ගනුදෙනුකරුවෙකු සඳහාම සමාන ප්‍රවේශය සහතික කිරීම සඳහා අපගේ කැපවීමට අනුකූලව, දිවයින පුරා පිහිටි ශාඛා තුළ විවිධ හැකියාවන් සහිත පුද්ගලයින්ට පහසුකම් ලබාදීමට බැංකුව සැලකියයුතු උත්සාහයන් සිදු කර ඇත. බැංකුවට අයත් ශාඛා 47 ක් සහ අපගේ කල්බදු ස්ථානවලින් 90% ක ආබාධිත ප්‍රවේශය සමඟ වැඩිදියුණු කර ඇත. මෙම අරමුණ ඉදිරියට යමින්, සියලුම අළුතින් ස්ථාපිත ශාඛා මෙම ප්‍රවේශ්‍යතා නිර්ණායකය ඉටු කිරීම සඳහා සැලසුම් කරනු ලැබේ. අපගේ අරමුණ වන්නේ සියලුම දෙනාට සමාන ප්‍රවේශය ලබාදෙන පහසුකම් සහිතව බැංකුවේ සෑම ශාඛාවක්ම ස්ථාපිත කිරීමයි.

නිෂ්පාදිත ප්‍රාග්ධනය


බලශක්ති කාර්යක්ෂමතා ගොඩනැගිලි

අපි අපගේ පාරිසරික වගකීම ඉතා බැරෑරුම් ලෙස සලකන අතර පිරිවැය අඩු කිරීම, බලශක්ති සංරක්ෂණය සහ අපගේ කාබන් පියසටහන අඩු කිරීම සඳහා බලශක්ති කාර්යක්ෂමතා ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කර ඇත. බලශක්ති කාර්යක්ෂමතා ගොඩනැගිලි ඉදිකිරීම පිළිබඳ අපගේ අවධානය තුළින් අඩුකළ බලශක්ති පරිභෝජනයකට හේතුවන ස්වභාවික ආලෝකය සහ සහ වාතය ප්‍රශස්ත කරමින් සියලුම නව ශාඛා ඉදිකරන බව බලශක්ති කාර්යක්ෂමතා ගොඩනැගිලි පිළිබඳ අවධානය සහතික කරයි.

එහි ප්‍රතිඵලයක් ලෙස, ශාඛා සහ සංචාරක බංගලා 45ක් සූර්ය බලශක්තියෙන් සමන්විත කර ඇති අතර, අපගේ ශාඛා ජලයෙන් 17%ක් පුනර්ජනනීය බලශක්තියෙන් දැනට ක්‍රියාත්මක වේ. අපගේ කතරගම සංචාරක බංගලාව එහි ස්වභාවික ආලෝකය සහ වාතය ප්‍රශස්තකරණය හේතුවෙන් අවම විදුලි පරිභෝජනය සහිත බලශක්ති කාර්යක්ෂමතා ගොඩනැගිල්ලක් ලෙස පිළිගෙන ඇති අතර මේ සියල්ල බලශක්ති සංරක්ෂණයට දායක වේ. කරුණාකර අපගේ පරිසර හිතකාමී මූලපිරීම් පිළිබඳ වැඩි විස්තර සඳහා 145 සිට 150 දක්වා පිටු බලන්න.

3 මෙහෙයුම් ක්‍රියාවලි වර්ධනයන්

ලෝකය ඩිජිටල්කරණය කරා පරිවර්තනය වෙමින් සිටින බව අප අවබෝධ කරගෙන ඇත. එබැවින් අපගේ භෞතික හා ඩිජිටල් යටිතලපහසුකම් එකිනෙකට අනුව කටයුතු කරන බව අප සහතික කර ඇති අතර ඒ තුළින් පහසු හා කාර්යක්ෂම මෙහෙයුම් ක්‍රියාවලි ලබාදේ. ඩිජිටල් යුගය තුළ ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා සහ අපේක්ෂාවන්ට ඉක්මණින් ප්‍රතිචාර දැක්වීමේ අපගේ අධිෂ්ඨානය පෙරමුනේ තබා ගනිමින් අපගේ පද්ධති සහ ක්‍රියාවලි අඛණ්ඩව යාවත්කාලීන කරන්නෙමු. සිය නිෂ්පාදන වර්ධනය කිරීමට බැංකුව විසින් සිදුකළ උත්සාහයන් පහත දැක්වේ.




රූපය 13

Oracle fusion ක්‍රියාත්මක කිරීම

වසර තුළ බැංකුව Oracle fusion සැපයුම් දාම කළමනාකරණය (SCM) සාර්ථකව ක්‍රියාත්මක කර ඇති අතර එය සැපයුම් දාමය කළමනාකරණය කිරීමට අනුමත ප්‍රවේශයක් ලබාදීමට වෙනත් ඔරකල් යෙදුම් සමඟ පහසුවෙන් ඒකාබද්ධ කරන මෙස-පදනම් විසඳුමකි. Oracle Fusion SCM පුළුල් ක්‍රියාකාරිත්වයන් රාශියකින් සමන්විත වන අතර ඉන් සැපයුම් දාම දෘශ්‍යතාව වර්ධනය, කාර්යක්ෂමතාව වැඩි කිරීම, පිරිවැය අඩු කිරීම, සහ වෙළෙඳපොල වෙනස්වීම් සහ ගනුදෙනුකාර ඉල්ලුමට වඩාත් ඉක්මණින් ප්‍රතිචාර දැක්වීමට බැංකුව ශක්තිමත් කිරීම අරමුණු කරයි.

ඉදිරි ගමන්මඟ

- පුද්ගලගත බැංකු අත්දැකීම් සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව සඳහා කෘත්‍රිම බුද්ධිය සහ යන්ත්‍ර ඉගෙනීම ඒකාබද්ධ කිරීම දැඩි අවධානයට ලක් කෙරේ.
- පුනර්ජනනීය බලශක්තිය, තිරසාර ද්‍රව්‍ය සහ බලශක්ති කාර්යක්ෂම සැලසුම් භාවිතා කරන හරිත ශාඛා සංවර්ධනය වැඩි කිරීම.
- වෙනස්වන තර්ජන වලින් ආරක්ෂා වීමට සයිබර් ආරක්ෂණ යටිතල පහසුකම් අබණ්ඩව වැඩිදියුණු කිරීම. මෙයට දියුණු තර්ජන හඳුනාගැනීමේ පද්ධති, ආරක්ෂිත අනත්‍ය ගබඩා විසඳුම් සහ සේවකයින් සඳහා සයිබර් ආරක්ෂණ පුහුණුව ඇතුළත් විය හැකිය.
- වැඩි දියුණු කරන ලද ආපදා ප්‍රතිසාධන පද්ධති, දත්ත උපස්ථ සහ ව්‍යාපාර අබණ්ඩතා සැලසුම් හරහා භෞතික හා ඩිජිටල් බිඳවැටීම්වලට, විශේෂයෙන් වැඩිවන දේශගුණය ආශ්‍රිත අවදානම් සහ සයිබර් ආරක්ෂණ තර්ජන හමුවේ, අපගේ ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම,




බුද්ධිමය ප්‍රාග්ධනය

අභ්‍යන්තර බලාගාරය



අපගේ තිරසාර වටිනාකම් නිර්මාණයට බුද්ධිමය ප්‍රාග්ධනය සහයවන ආකාරය

බැංකු තුළ, බුද්ධිමය ප්‍රාග්ධනය ආයතනික වටිනාකම සහ ඔරොත්තුදීම සඳහා මූලිකාංගයක් ලෙස සේවය කරයි. අපගේ බුද්ධිමය ප්‍රාග්ධනය පෝෂණය කරමින්, අපගේ ව්‍යූහගත හැකියාවන් වැඩිකරමින්, ගනුදෙනුකාර සම්බන්ධතා ගොඩනඟමින් සහ, නවෝත්පාදන සංස්කෘතියක් ඇති කරමින්, අපි සැමදා වෙනස්වන වෙළෙඳපොලක් තුළ තිරසාර සාර්ථකත්වය සඳහා අපවම ස්ථානගත කරමු. බැංකුව ගතික අභියෝගවලින් ඉදිරියට යාම සහ නැගී එන අවස්ථා ග්‍රහණය කර ගැනීම අඛණ්ඩව සිදුකරන බැවින්, නව්‍යකරණ විසඳුම්, සුවිශේෂී අත්දැකීම්, සහ අපගේ ගනුදෙනුකරුවන්, සේවකයින්, කොටස් හිමියා සහ ප්‍රජාවන් සඳහා අත්දැකීම් සහ කල් පවත්නා වටිනාකම ලබා දීම සඳහා අපගේ බුද්ධිමය ප්‍රාග්ධනය උත්තේජනය කිරීමට අපි කැපවී සිටිමු.



රූපය 14 →

බැංකුව සඳහා නිෂ්පාදිත ප්‍රාග්ධයෙන් අදහස් කරන දෑ

බුද්ධිමය ප්‍රාග්ධනය යනු ආර්ථික වාසි උපයාගැනීමට හැකියාව ඇති බැංකුවේ සමුච්චිත දැනුම සහ සම්පත්වල වටිනාකමයි. එය ආයතනය තුළ ඇති තාක්ෂණික ප්‍රවීණතාවය සහ ක්‍රියාවලි දැනුම සංක්ෂිප්ත කරන අතර, එහි අස්පෘශ්‍ය වත්කම් දැක්වීමට සහ ඒවා හඳුනාගත හැකි කණ්ඩායම් වලට වර්ග කිරීමට භාවිතා කරයි.

අපගේ බුද්ධිමය ප්‍රාග්ධනය යනු අපගේ සාමූහික දැනුම, අපගේ ප්‍රවීනතාවය සහ අපගේ පාර්ශ්වකරුවන්ට අතිවිශාල වටිනාකම නිර්මාණය කරණ අපගේ අස්පෘශ්‍ය වත්කම්වල වටිනාකමයි

අපගේ බුද්ධිමය ප්‍රාග්ධනය අපගේ හැකියාවන් සහ දක්ෂතා වැඩි කරන අතර, වර්ධිත කාර්යසාධනය සහ තිරසාර සංවර්ධනය කරා අපව මෙහෙයවනු ලබයි.

වටිනාකම් පරිණාමනය

- අඛණ්ඩ දැනුම කළමනාකරණය
- නව්‍යකරණය හා නිර්මාණශීලිත්වය
- මානව සම්පත් සංවර්ධනය
- ශක්තිමත් හා තිරසාර ගනුදෙනුකාර සම්බන්ධතා ගොඩනැගීම
- සන්නාමය හා කීර්තිනාමය
- උපායමාර්ගික හවුල්කාරත්වයන්

ප්‍රධාන යෙදවුම්

- ඒකාබද්ධ ව්‍යාපාර උපායමාර්ගය
- මනා පරිවය පාලනය
- උපාය මාර්ග සැකසීම සහ උපාය මාර්ගික ප්‍රමුඛතා ක්‍රියාත්මක කිරීම සඳහා කඩිසර ප්‍රවේශය
- තාක්ෂණය සහ නවෝත්පාදනයන් භාවිතා කිරීම
- ආයතනික සංස්කෘතිය

බුද්ධිමය ප්‍රාග්ධනය

ප්‍රධාන නිමැවුම්

සන්නාම වටිනාකම:	සන්නාම ශ්‍රේණිගතකරණය:	ණය ශ්‍රේණිගතකරණය:	වසර 10ට වැඩි සේවය සහිත සේවකයින්:
රු. බිලියන 23 (2022 - රු. බිලියන 30.4)	AA (2022 - AA)	AAA (2022 - **AAA**)	1,916 (2022 - 1,648)

2023 දී ප්‍රධාන අභියෝග

- අඩුකළ ප්‍රාග්ධනය හේතුවෙන් සීමිත ප්‍රවාරණ වැඩසටහන්
- කෙටි කාලසීමාවක් තුළ පුහුණු සේවකයින්ගේ වැඩි කොටසක සංක්‍රමණය
- සන්නාම වටිනාකම පවත්වා ගැනීම
- සයිබර් ඔරොත්තුදීම සහ තොරතුරු ආරක්ෂාව

2023 දී ප්‍රධාන අවස්ථා

- ඩිජිටල්කරණය
- නවෝත්පාදනය සහ කඩිසරකම
- වර්ධිත දැනුවත් තීරණ ගැනීම
- ඵලදායී පාර්ශවකාර සහභාගිත්වය සහ සහයෝගය

තිරසාරත්වය සාර්ථකත්ව සාධක/උපායමාර්ගික ධාවක

- සේවකයින්ට දායක වීමට, සහයෝගී වීමට සහ අඛණ්ඩව ඉගෙනීමට දිරිමත් කරන දැනුම බෙදාගැනීමේ සංස්කෘතියක් පෝෂණය කිරීම
- දක්ෂ වෘත්තිකයන් ආකර්ෂණය කර ගැනීම, අඛණ්ඩ පුහුණු සහ සංවර්ධන අවස්ථා ලබා දීම, සහ බැංකුව තුළ වර්ධනය සහ අභිවෘද්ධිය දිරිමත් කරන වෘත්තීය මාර්ග නිර්මාණය කිරීම.
- ගනුදෙනුකාර අවශ්‍යතා, මනාප සහ ප්‍රතිපෝෂණ අවබෝධ කර ගැනීම, සහ වටිනාකම ලබා දෙන සහ ගනුදෙනුකාර තෘප්තිය සහ පක්ෂපාතිත්වය වැඩිදියුණු කරන නිෂ්පාදන, සේවා සහ අත්දැකීම් සකස් කිරීමට මෙම තොරතුරු භාවිතා කිරීම.
- ගනුදෙනුකරුවන්, ආයෝජකයින් සහ අනෙකුත් පාර්ශ්වකරුවන් සමඟ විශ්වාසය සහ විශ්වසනීයත්වය ගොඩනැගීම සඳහා උසස් තත්ත්වයේ නිෂ්පාදන සහ සේවා සැපයීම, සදාචාරාත්මක ප්‍රමිතීන් ආරක්ෂා කිරීම සහ එහි වටිනාකම් සහ මෙහෙවර ඵලදායී ලෙස සන්නිවේදනය කිරීම
- ශක්තිමත් අවදානම් කළමනාකරණ ක්‍රියාවලීන් ක්‍රියාත්මක කිරීම, මතුවන අවදානම් නියාමනය කිරීම, සහ විභව තර්ජන අවම කිරීම සහ ආයතනික වත්කම් ආරක්ෂා කිරීම සඳහා නියාමන වෙනස්කම් පිළිබඳව යාවත්කාලීනව සිටීම.

ප්‍රතිඵල කළමනාකරණය කිරීමේ ප්‍රවේශ

- සේවකයින් දිරිමත් කිරීම සහ ඔවුන්ගේ රැකියා තෘප්තිය සහ සහභාගිත්වය වැඩි දියුණු කිරීම සඳහා පුහුණු සහ සංවර්ධන වැඩසටහන්, වෘත්තීය අභිවර්ධන අවස්ථා සහ තරඟකාරී වැටුප් සහ ප්‍රතිලාභ යෝජනා පිරිනැමීම.
- සේවක නිපුණතා මාලාව නිතිපතා තක්සේරු කිරීම සහ බැංකුවේ උපාය මාර්ගික පරමාර්ථ සමඟ පෙළගැස්වීම සඳහා පුහුණුව සහ සංවර්ධනය අවශ්‍ය ක්ෂේත්‍ර හඳුනා ගැනීම.

අපගේ බුද්ධිමය ප්‍රාග්ධනය අප වර්ධනය කරන ආකාරය

- විනිවිදභාවය සහ සදාචාර බැංකු මූලධර්ම සමඟ වටිනාකම් මත පදනම් වූ ආයතනික සංස්කෘතියක් පෝෂණය කිරීම.
- ශක්තිමත් පාලනය සහ අවදානම් කළමනාකරණ ක්‍රියාවලීන් අනුගමනය කරන බව සහතික කිරීම.
- වර්තමාන සහ අනාගත ඉල්ලීම් තෘප්තිමත් කිරීම සඳහා ඩිජිටල් විසඳුම් සහ ශක්තිමත් ICT යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
- දක්ෂයින් රඳවා තබා ගැනීමට සහ අනාගත අවස්ථා සඳහා ඔවුන් පුහුණු කිරීමට සේවකයින් හඳුනාගෙන ත්‍යාග පිරිනමන පරිසරයක් නිර්මාණය කිරීම

පාර්ශ්වකරුවන් සඳහා නිර්මාණය කළ වටිනාකම

කොටස් හිමියා/ආයෝජකයින්
වැඩි වූ ගනුදෙනුකාර පක්ෂපාතිත්වය හේතුවෙන් වැඩි වූ ලාභදායීතාවය බැංකුවට මූල්‍ය සේවා කර්මාන්තයේ තරඟකාරී වාසියක් ලබාදෙන අතර, එතුලින් ලාභදායීත්වය වැඩි කරයි.

ගනුදෙනුකරුවන්
ගනුදෙනුකරුවන්ගේ වෙනස් වන අවශ්‍යතා සපුරාලන නව මූල්‍ය නිෂ්පාදන, සේවා සහ විසඳුම් සංවර්ධනය කිරීම ගනුදෙනුකාර තෘප්තිය සහ පක්ෂපාතිත්වය වැඩි දියුණු කරයි.

සේවකයින්
සිය සේවකයින්ගේ සාමූහික දැනුම, කුසලතා සහ ප්‍රවිනතාව වැඩි කරයි.

නියාමකයින් සහ රජයේ ආයතන
නියාමකයින්ගේ සහ පුළුල් ප්‍රජාවගේ ලැදියාව සහ විශ්වාසය.

ව්‍යාපාර හවුල්කරුවන්
නවෝත්පාදනය සහ නිර්මාණශීලිත්වය පෝෂණය කිරීම, චින්තන නායකත්වය ලබාදීම, සහයෝගීතාවය සහ සම-නිර්මාණය සක්‍රීය කිරීම, පුහුණුව සහ සංවර්ධනය සඳහා පහසුකම් සැලසීම සහ ශක්තිමත් අවදානම් කළමනාකරණය සහ අනුකූලතා ව්‍යවහාර බව සහතික කිරීම

සමාජය සහ පරිසරය
ආර්ථික අන්තර්ගහනය පෝෂණය කිරීම සහ අසමානතා අවම කිරීම.

බුද්ධිමය ප්‍රාග්ධනය

අපගේ බුද්ධිමය ප්‍රාග්ධනය භාවිතා කරන ආකාරය

මූල්‍ය ප්‍රාග්ධනය
සන්නාමය සහ කාර්ය මණ්ඩල සංවර්ධනය යන ක්ෂේත්‍රවල වර්ධිත ආයෝජනය වර්ධිත ආයතනික කීර්තිනාමය සහ පාර්ශ්වකාර විශ්වාසය සඳහා හේතු වේ.

නිෂ්පාදිත ප්‍රාග්ධනය
වැඩිවන යටිතලපහසුකම්, පද්ධති සහ ක්‍රියාවලි වර්ධිත ව්‍යාපාර කටයුතුවලට හේතු වේ.

මානව ප්‍රාග්ධනය
පුහුණුව සහ සංවර්ධනය තුළ ආයෝජනය අපගේ සේවකයින්ගේ ආයතනික දැනුම, නිපුණතා සහ පළපුරුද්ද වැඩිකරන අතර එය මෙහෙයුම් අනර්ඝත්වයට දායක වේ.

සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය
අපගේ වටිනාකම, ව්‍යාපාර සාරධර්ම, සහ අවදානම් කළමනාකරණ රාමුව දැඩි අවධානයකින් යුතුව මනාව සකස් කර ඇති අතර එයින් ප්‍රමාණාත්මතාව. පාර්ශ්වකරුවන්, සහ කෙටි කාලයේ -සිට-මධ්‍ය-කාලීන උපායමාර්ගික ප්‍රමුඛතා අතර සම්බන්ධතාව ප්‍රමාණාත්මක කරුණු කීර්තිනාමය වැඩිවීම තුළින් විශ්වාසය ඇති වේ.

ස්වභාවික ප්‍රාග්ධනය
තිරසාර මුලපිරීම් කෙරෙහි අපගේ අවධානය අපගේ විද්‍යාව - පදනම් ප්‍රවේශය ශක්තිමත් කරන අතර ඒ තුළින් පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය ස්ථාපිත කරයි.

විභව්‍ය හුවමාරුවීම්

- **මූල්‍ය ප්‍රාග්ධනය –** බුද්ධිමය ප්‍රාග්ධනය තුළ ආයෝජනය යටිතල පහසුකම් හෝ අලෙවිකරණ වැඩසටහන් සඳහා වෙන්කිරීම්වලට බලපෑ හැකි මූල්‍ය සම්පත් බොහෝ සෙයින් අඩු කළ හැකිය.
- **නිෂ්පාදින ප්‍රාග්ධනය –** දැනුම් කළමනාකරණ ක්‍රම හෝ නවෝත්පාදන ක්‍රියාවලි වැනි බුද්ධිමය ප්‍රාග්ධන වැඩසටහන් තුළ ආයෝජනය භෞතික වත්කම් හෝ යටිතලපහසුකම් ව්‍යාපෘතිවලින් සම්පත් හරවා යැවිය හැකිය.
- **මානව ප්‍රාග්ධනය –** බුද්ධිමය ප්‍රාග්ධනයේ වාසිය ලබා ගැනීම ඵලදායිතාව, චිත්ත ධෛර්ය, හෝ කාලය සහ ප්‍රවීණතාව මත වැඩිවන ඉල්ලුම හේතුවෙන් වැඩ ජීවිත සමබරතාව කෙරෙහි බලපාමින් මානව සම්පත් පිඩාවට පත් කළ හැකිය.
- **සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය –** බාහිර සහයෝගය තුලින් බුද්ධිමය ප්‍රාග්ධනයේ වාසිය ලබා ගැනීම පරමාර්ථවලට පෙළ ගැස්වීමේදී ව්‍යහැකි ආරාවුල්, අසම්මුති, හෝ අභියෝග හේතුවෙන් සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය පීඩවට පත් කළ හැකිය.
- **ස්වභාවික ප්‍රාග්ධනය –** තාක්ෂණික යටිතලපහසුකම් හෝ දැනුම් හුවමාරු වැඩසටහන් වැනි බුද්ධිමය ප්‍රාග්ධන වැඩසටහන් බලශක්ති පරිභෝජනය හෝ සංචාරයට අදාළ විමෝචන වැඩිකළ හැකිය.

ප්‍රමාණාත්මතාව, පාර්ශ්වකරුවන්, සහ කෙටි කාලයේ-සිට-මධ්‍ය-කාලීන උපායමාර්ගික ප්‍රමුඛතා අතර සම්බන්ධතාව



UN තිරසාර සංවර්ධන අරමුණු (UN SDGs) සඳහා දායකත්වය

ප්‍රාථමික UN SDGs

8 DECENT WORK AND ECONOMIC GROWTH
පීවන තත්ත්වයන් හා ආර්ථික වර්ධනය වැඩි කිරීමට සේවකයින්ගේ බුද්ධිමය ප්‍රාග්ධනය හඳුනාගෙන සංවර්ධනය කිරීම.

9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE
තාක්ෂණය හා යටිතලපහසුකම්වල ආයෝජනය කරමින් නව්‍යකරණය පදනම් සංස්කෘතියක් ඇති කිරීම.

10 REDUCED INEQUALITIES
සේවකයින් අතර විෂමතාව අඩු කිරීමට බුද්ධිමය ප්‍රාග්ධනය ආයෝජනය කිරීම සහ ඒ තුළින් සාර්ථකත්වය සඳහා සමාන අවස්ථාව වැඩියෙන් උදා කිරීම

ද්විතියික UN SDGs

16 PEACE, JUSTICE AND STRONG INSTITUTIONS
බැංකුව සහ ක්ෂේත්‍රය තුළ සදාචාර හැසිරීම, යහපාලනය සහ අනුකූලතාවය ප්‍රවර්ධනය කිරීම.

බුද්ධිමය ප්‍රාග්ධනය

ඒකාබද්ධ චින්තනය

වර්තමාන වේගයෙන් වෙනස්වන ව්‍යාපාර වාතාවරණය තුළ, චින්තනය සඳහා බණ්ඩිත ප්‍රවේශයක් තවදුරටත් වලංගු නොවේ. ඒකාබද්ධ චින්තනය උපායමාර්ගය, පාලනය, කාර්යසාධනය, සහ අනාගත කටයුතු වල විවිධ අංශ ඒකාබද්ධ කරමින් ප්‍රගතිගාමී ආයතනය සඳහා අත්‍යවශ්‍ය බවට පත්ව ඇත.


අපගේ උපායමාර්ගය අපගේ බුද්ධිමය ප්‍රාග්ධනයේ මූලික සංරචකයක් නියෝජනය කරයි. අපගේ විස්තරාත්මක වාර්ෂික උපායමාර්ගික සමාලෝචන ක්‍රියාවලිය ආයෝජන තෝරා ගැනීම් සහ සම්පත් වෙන්කිරීම්, සහ දෛනික මෙහෙයුම් කළමනාකරණය හැඩ ගස්වමින් අපගේ වඩා පුළුල් මෙහෙයුම් වාතාවරණයට සම්බන්ධ අවදානම් සහ අවස්ථා අතීශයින් නිවැරදිව තක්සේරු කරයි. මෙවැනි ක්‍රියාවලි තුළින්, අපගේ උපායමාර්ගයේ ක්‍රියාත්මකවීම අපි සහතික කරන අතර, ඒ තුළින් වර්තමානය සහ වැඩිවන අවිනිශ්චිත අනාගතයක් හමුවේ අපගේ ආයතනය සහ අපගේ පාර්ශ්වකරුවන් සඳහා වටිනාකම නිර්මාණය කරයි.

ව්‍යාපාරය සඳහා අපගේ ඒකාබද්ධ ප්‍රවේශය පිළිබඳ ගැඹුරු අවබෝධයක් සඳහා පිටු 62 සිට 80 දක්වා බලන්න.

සන්නාමය

අර්ධ ශතකයකට වැඩි කාලයක් පුරා ව්‍යාපාරය තුළ සිටීමින්, බැංකුව ගනුදෙනුකරුවන්ගේ මනස තුළ ලෙන්ගතු ප්‍රතිරූපයක් දැනටමත් ස්ථාපිත කරගෙන ඇත. සැම වසරකම, ප්‍රචාරණය සහ අලෙවිකරණ වැඩසටහන් තුලින් අපගේ ඉලක්කගත ජනතාව අතර උපරිම සන්නාම පැවත්මක් ස්ථාපිත කිරීමට අපි උත්සාහ දැරුවෙමු.

2023 දී, අභ්‍යන්තර සහ බාහිර ගැටළු මත අඩුකළ සමස්ථ වියදම නිරීක්ෂණය කරමින්, බැංකුව රූපවාහිනිය, ගුවන් විදුලි ජාල, පුවත්පත් සහ බාහිර ස්ථාන වැනි ප්‍රධාන මාධ්‍යවල අඛණ්ඩව සීමිත ප්‍රචාරණ වැඩසටහන් මෙහෙයවන ලදී. අපගේ අවධානය වූයේ සමාජ මාධ්‍ය අවකාශය තුළ අපගේ පැවැත්ම වැඩි කිරීම වන අතර ඒ මඟින් අපි සැලකියයුතු ගනුදෙනුකාර සංඛ්‍යාවක් කරා ලඟාවීමට සාපේක්ෂව අඩු පිරිවැය විසඳුමක් ක්‍රියාවට නංවන ලදී.




රූපය 15 →

ආයතනික සංස්කෘතිය

බැංකුව යනු විශ්වාසය, අනෝන්‍ය ගෞරවය, අවංකකම, ආරක්ෂාව,සහ නිර්මාණශීලිත්වය සහිතව ව්‍යාපාරය කරගෙන යාම පිළිබඳ දැඩි විශ්වාසයක් සමඟ වටිනාකම-පදනම් ආයතනයකි. මෙවැනි විශ්වාසයන් පාර්ශ්වකරුවන් සමඟ ධනාත්මකව මැදිහත්වීමට සේවකයින් සහ කළමනාකරණය මෙහෙයවන බැංකුවේ සංස්කෘතියක් හැඩගස්වා ඇත. අපගේ සංස්කෘතියට සදාචාර බැංකුකරණ ව්‍යවහාර ඇතුළත් කර ඇති අතර ඒ තුළ විනිවිදභාවය දිරිමත් කෙරේ, ශක්තිමත් ප්‍රජාවන් ගොඩ නගයි, ස්ථාපිත මූලධර්ම බැංකුවේ සෑම අංගයක්ම පාලනය කරන අතර, අනාගතය සඳහා අදාළ වර්ධනයන් සිදුකරමින් නිරන්තරයෙන් බාධක කපොලු හඳුනාගෙන ඒ අනුව කටයුතු කරයි.

රූපය 16 →



බුද්ධිමය ප්‍රාග්ධනය

සම්මාන සහ පිළිගැනීම්

වෙළෙඳපොල තුළ අපගේ පැවැත්ම 2023 දී බැංකු ක්ෂේත්‍රයේ පුරෝගාමීන් විසින් පිළිගැනීමට ලක් කර ඇත. අපගේ ශක්තිය, විශිෂ්ඨත්වය, ගනුදෙනුකාර තෘප්තිය, සහ අඛණ්ඩ බැඳීම අවස්ථා කිහිපයකදීම ගෞරවයට පාත්‍ර වී ඇත.

TAGS සම්මාන 2023 දී "රාජ්‍ය බැංකු" වර්ගීකරණය යටතේ රිදී සම්මානය (CA ශ්‍රී ලංකා)

2023 කාන්තා හිතවාදී සේවා ස්ථාන සම්මානවලදී CIMA සහ Satynmag.com විසින් අඛණ්ඩව තෙවැනි වරටත් කාන්තා හිතවාදී සේවා ස්ථානයක් ලෙස පිළිගැනීම

2023 ඒකාබද්ධ වාර්තා සම්මානවලදී CMA විශිෂ්ඨත්වය

රජයට අයත් ව්‍යවසාය/සමාගම් අංශය තුළ බැංකු හා මූල්‍ය වර්ගීකරණය සඳහා විශිෂ්ඨ ඒකාබද්ධ වාර්තාව

ඊළඟ විශිෂ්ඨ ඒකාබද්ධ වාර්තා දහයෙන් එකකි



රු. බිලියන 23ක සන්නාම වටිනාකමක් සහිත ශ්‍රී ලංකාවේ හත්වැනි වඩාත් වටිනා සන්නාමය ලෙස පිළිගැනීම.

වඩාත් පිළිගත් සමාගම් 2023

විශිෂ්ඨ වෙබ් අඩවිය කුසලතා සම්මානය 2023

රූපය 17 →

සාමූහික බුද්ධිය

අපගේ සේවකයින්ගේ සාමූහික බුද්ධිය අපගේ තීරණ මෙහෙයවා, අපගේ ක්‍රියාවන් හැඩගස්වමින් අපගේ උපායමාර්ගික අරමුණු කරා අපව වේගයෙන් ඉදිරියට යවයි. බැංකුවේදී, අපි අපගේ ශ්‍රමබලකාය තුළ විවිධත්වය ප්‍රසංශා කරන අතර ශක්තිමත් වීම සඳහා සාමූහික බුද්ධියට ඉඩදීමේ පරිසරයක් අපි පෝෂණය කරමු. අපගේ සේවකයින්ගේ සාමූහික බුද්ධිය ශක්තිමත් වෙමින්, සැමදා වෙනස්වන වාතාවරණයක් තුළ අපි අඛණ්ඩව නව්‍යකරණය, අනුවර්තනය වී විශිෂ්ඨත්වය දක්වනු ඇත.

බැංකු නොවන/විශේෂ කාර්ය මණ්ඩලය **124**	කාර්ය මණ්ඩල රඳවා ගැනීමේ අනුපාතය **96.3%**
වසර 10ට වැඩි පළපුරුද්ද සහිත සේවකයින් **1,916**	පුහුණු වියදම **රු. මිලියන 13.2**

2023 දී, සංක්‍රමණික අවස්ථා හඹායාමට බොහෝ සේවකයින් බැංකුවෙන් ඉවත් වූ බැවින්, බැංකුව සේවකයින් රඳවා තබා ගැනීමට, ත්‍යාග ලබාදෙන සහ පිළිගන්නා, විශේෂ පුහුණු ලබාදෙන, අනාගත ප්‍රතිලාභ සඳහා දැනුම හුවමාරු කරන, සහ අනාගත උසස්වීම් සඳහා අපේක්ෂිත සේවකයින් හඳුනාගන්නා සහ සහභාගි කරවන පරිසරයක් නිර්මාණය කරමින් උපරිම උත්සාහයන් දරා ඇත.

බුද්ධිමය ප්‍රාග්ධනය

තාක්ෂණය සහ නව්‍යකරණය

ඩිජිටල් විසඳුම් ශක්තිමත් බුද්ධිමය ප්‍රාග්ධනයක් වන අතර, වටිනාකම නිර්මාණය සහ තිරසාර වර්ධනය සඳහා අපි ඒ කෙරෙහි විශ්වාසය තබා වර්ධිත ගනුදෙනුකාර තෘප්තිමත් මට්ටමක් ඇති කිරීමට අපි පිරිවැය-කාර්යක්ෂම ඩිජිටල් විසඳුම්වල ආයෝජනය කරමු.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහෙයවනු ලබන බැංකුවේ තොරතුරු තාක්ෂණ මෙහෙයුම් කමිටුව (ITSC) බැංකුව තුළ කාර්යක්ෂම මෙහෙයුම් කළමනාකරණය සහතික කරමින් වර්තමාන සහ අනාගත ඉල්ලුම් සපුරාලීමට ICT සේවා සහ යටිතලපහසුකම් පිරිනැමීමට කැප වී සිටී. ආරක්ෂිත, පහසු, සහ කාර්යක්ෂම ව්‍යාපාර පරිසරයක් නිර්මාණය කිරීමේ බැංකුවේ පරමාර්ථය ඉටු කිරීම පිණිස, ITSC විසින් ආයතනය පුරා නියාමන රාමුව තුළ පාලන ප්‍රමිති සහ උපායමාර්ග ක්‍රියාත්මක කරන ලදී.

අපගේ ෂඕක උපායමාර්ගික ප්‍රවේශය තාක්ෂණික නව්‍යකරණය දිරිමත් කර, නව චින්තනයේ අභිවෘද්ධිය වැඩි කරමින්, සමස්ථ වර්ධනය පෝෂණය කරයි.

2023 වැදගත් සිදුවීම්

- ගනුදෙනුකරුවන්ට පුළුල්කළ ඩිජිටල් සේවා ලබාදීමට කිරුළපන ඩිජිටල් බැංකු මධ්‍යස්ථානය විවෘත කිරීම.
- බැංකුවේ ඩිජිටල් බැංකු සේවා සඳහා (NSB NextGen) සන්නාම නාමය හඳුන්වාදීම.
- මාර්ගගත ගනුදෙනුකරුවන්ට ශාඛාවක් වෙත යාමේ අවශ්‍යතාවයක් නොමැතිව ඔවුන් ඇතුළත් කර ගැනීමට සහ ඉතුරුම් ගිණුම් විවෘත කිරීමට පහසුකම් සැලසීමට NSB e-KYC හඳුන්වාදීම.
- තොග, ස්ථාවර වත්කම්, සහ ගෙවියයුතු ගිණුම් සඳහා Oracle Fusion පද්ධතිය ක්‍රියාත්මක කිරීම
- (e-Post ඩිජිටල් ගිණුම) හඳුන්වාදීම.
- මාරුවීම් සඳහා මාර්ගගත ඉල්ලීම් ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීම.
- ජංගම පදනම් අතථ්‍ය ගෙවීම් නිකුත් කිරීම ආරම්භ කළ ශ්‍රී ලංකාවේ පළමු බැංකුව බවට පත්වෙමින් අතථ්‍ය කාඩ්පත් ව්‍යාපෘති දෙකක් ක්‍රියාත්මක කිරීම.
- අභ්‍යන්තරව ක්‍රියාත්මක කළ වංචා නියාමනය සහ වැලැක්වීමේ පද්ධතිය පැය 24 පුරාම ක්‍රියාත්මක කරමින් ගනුදෙනුකරුවන් ආරක්ෂා කිරීම.

ක්‍රියාවලි සහ ක්‍රියාපටිපාටි

වූහගත ප්‍රාග්ධනය යනු බැංකුවේ බුද්ධිමය ප්‍රාග්ධනයේ ප්‍රධාන සංරචකයකි. අපගේ මෙහෙයුම් සහ සියලුම කටයුතු බැංකුවේ දැක්ම හා මෙහෙවර මත පදනම් වන අතර ලේඛණගත ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි අනුව ධූරාවලියට නිදහස් කෙරේ.

බැංකුව ව්‍යාපාරය කරගෙන යාමේ සිද්ධාන්තමය සහ ප්‍රායෝගික අංගයන් යන ද්විත්වයම සලකා බලමින් බැංකුවේ ආයතනික කළමනාකරණය සමඟ උපදේශකත්වයෙන්, ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි සකස් කරයි. බැංකුවේදී, සීයලුම සේවකයින්ගෙන් සදාචාරබව, විනිවිදභාවය පිළිබඳ ඉහළම ප්‍රමිති පිළිගැනීම සහ මෙම ප්‍රතිපත්තිවල දක්වා ඇති නියාමන අවශ්‍යතාවන්ට අනුකූලවීම අපේක්ෂා කෙරේ.

පාලනය සහ අවදානම් කළමනාකරණය


අපගේ පාලනය සහ අවදානම් කළමනාකරණ ශිල්ප අපගේ බුද්ධිමය ප්‍රාග්ධනයේ වැදගත් කොටසක් ලෙස අපගේ ආදර්ශයට වටිනාකම එකතු කරන බව අපි විශ්වාස කරමු. මේ සම්බන්ධයෙන් මනා පරිචයන් අපගේ ගනුදෙනුකරුවන්ගේ මානස තුළ විශ්වාසය හා පැහැදීම ගොඩ නැගීමට සහ තරඟකාරී වාසියක් සංවර්ධනය කිරීමට අපව ශක්තිමත් කරන බව අපගේ මතය වේ.

ඵලදායී පාලනයන් ස්ථාපිත කිරීමට සහ සදාචාර නායකත්වය ප්‍රවර්ධනය කිරීමට බැංකුවේ පාලන වූහ සහ ක්‍රියාවලි නිර්මාණය කර ඇත. සියලුම යහපාලන ව්‍යවහාර, සදාචාර ප්‍රමිති, නියාමන අවශ්‍යතා සහ වෙනත් අදාළ නීති අපගේ අභ්‍යන්තර ප්‍රතිපත්ති රාමුවට ඒකාබද්ධ කරන බව අපි සහතික කරමු.. තවද, පාර්ශවකාර විශ්වාසය තුළින් තිරසාර වටිනාකම් නිර්මාණය කිරීම යහපාලනයේ ප්‍රතිඵලයක් බව බැංකුවේ විශ්වාසය වේ.

අවදානම් කළමනාකරණය යනු බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ (BIRMC) අවධානයකි. අපගේ උපායමාර්ග ව්‍යාපාරය තුළ අභ්‍යන්තර සහ බාහිර වර්තමාන සහ අනාගත අවදානම් සලකා බලමින් ගොඩ නගයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත, අපගේ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුව යම් යාවත්කාලීන කිරීම් අඛණ්ඩව නියාමනය සහ වාර්තා කරමින් විවිධ අවදානම් හඳුනාගෙන කළමනාකරණය කිරීමට භාවිතා කෙරේ.


ඉදිරි ගමන්මඟ

- මතුවන තාක්ෂණයන් (කෘතිම බුද්ධිය, බ්ලොක්චේන්, සහ දත්ත විශ්ලේෂක වැනි) පිළිබඳ දැනුවත්ව සිටීම සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි කරන, ගනුදෙනුකාර අත්දැකීම වර්ධනය කරන, සහ බැංකු සේවාන්හී නවෝත්පාදන ඇති කරන එම තාක්ෂණයන් හී ආයෝජනය කිරීම.
- වෙනස්වන ගනුදෙනුකාර අපේක්ෂාවන් සහ මනාපයන් සපුරාලීමට ඩිජිටල් පරිවර්තනීය වැඩසටහන් වැළඳ ගැනීම.
- ගනුදෙනුකාර හැසිරීම, වෙළෙඳපොල ප්‍රවණතා, සහ ව්‍යාපාර කාර්යසාධනය පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබා ගැනීමට විශාල දත්ත සහ විශ්ලේෂණ භාවිතා කිරීම.
- මෙහෙයුම් ප්‍රශස්ථ කිරීමට, ගනුදෙනුකාර මැදිහත්වීම් පුද්ගලගත කිරීමට, සහ නව වර්ධන අවස්ථා හඳුනා ගැනීමට දත්ත -පදනම් තීරණ ගැනීම භාවිතා කිරීම.



මානව ප්‍රාග්ධනය

සමෘද්ධිමත් බැංකුවක මුල්ගල



බැංකුව සඳහා මානව ප්‍රාග්ධයෙන් අදහස් කරන දෑ

ව්‍යාපාරය ඉදිරියට ගෙන යනු ලබන පුද්ගලයින් විසින් වටිනාකම නිර්මාණය කරන බව අපි අවබෝධ කර ගනිමු, එමනිසා, අපගේ සේවකයින් අපගේ තරඟකරුවන්ගෙන් බැංකුව වෙනස් කොට තැබීමට අපට ඉඩදෙමින් බැංකුවේ කේන්ද්‍රය සකස් කරන බව අපි පිළිගනිමු. අපගේ සේවකයින්ගේ ප්‍රවීනතාව, කැපවීම, සහ නොසැලෙන බැඳීම තුළින්, අපි අපව වෙන් කර තබාගෙන අනාගතය සඳහා අපගේ තිරසාරභාවය ආරක්ෂා කරමු.


අපගේ තිරසාර වටිනාකම් නිර්මාණයට මානව ප්‍රාග්ධනය සහයවන ආකාරය

අපගේ අපේක්ෂාවන් ස්පෘශ්‍ය ප්‍රතිඵල බවට පරිවර්තනය කිරීමට. අපගේ ශ්‍රමබලකායේ දෛනික දායකත්වයන් මත අපි රඳා පවතිමු. අභිප්‍රේරිත සහ සහභාගී සේවකයින් අපේක්ෂාවන් ඉක්මවායාම සඳහා වඩා හොඳින් ස්ථානගත කෙරේ. එමනිසා, අපි සේවක තෘප්තිය ප්‍රවර්ධනය කරන වැඩ පරිසරයක් පෝෂණය කිරීම ප්‍රමුඛ කරමු. අපගේ අරමුණ වන්නේ සේවකයින් ජනතාව-කේන්ද්‍රීය සන්නාම බැඳීමකට පෙළ ගැස්වීම සහ බැංකුවේ වටිනාකම්වලට ශක්තිමත් සම්බන්ධයක් පවත්වා ගැනීමයි.

වටිනාකම් පරිනාමනය

බැංකුව ශ්‍රමබලකායේ දායකත්වයන් මත රඳා පවතින අතර, ඒ අනුව සේවක තෘප්තිය ප්‍රවර්ධනය කරන වැඩ පරිසරයක් තුළින් සේවකයින් අභිප්‍රේරණය කර සහභාගි කර තබා ගනී.

ප්‍රධාන යෙදවුම්



ප්‍රධාන ප්‍රතිඵල GRI 404-1

සේවක සහභාගිත්වය

සමස්ත සේවකයින් සංඛ්‍යාව
4,358
(2022 – 4,528)

සේවකයෙකුට සාමාන්‍ය ආදායම
රු. මිලියන 53.3
(2022 – රු. මිලියන 38.6)

රඳවාගැනීමේ අනුපාතය
96.3%
(2022 – 98.1%)

සේවක පිරිවැටුම් අනුපාතය
3.7%
(2022 – 1.9%)

සමාන අවස්ථාව

කාන්තා සේවිකාවන් සංඛ්‍යාව
2,391
(2022 – 2,481)

පුහුණුව සහ සංවර්ධනය

පුහුණුව සහ සංවර්ධනය තුළ ආයෝජන
රු. මිලියන 13.2
(2022 – රු. මිලියන 12.8)

සේවකයෙකුට සාමාන්‍ය පුහුණු පැය
12.19
(2022 – 5.0)



මානව ප්‍රාග්ධනය

2023 දී ප්‍රධාන අභියෝග

- රටේ පවතින අයහපත් ආර්ථික තත්ත්වය හමුවේ ශ්‍රම බලකායට බාධා පමුණුවමින් සේවක ඉල්ලා අස්වීම් සහ වැටුප් රහිත නිවාඩු මත විදේශගත වන සේවකයන්.
- පවතින ආර්ථික අර්බුදයකදී සේවකයන් අභිප්‍රේරණය කර තබා ගැනීම.
- විශේෂයෙන් තාක්ෂණයේ නව ප්‍රවණතා තුළ සුදුසුකම් ලත් කුසලතා හිඟයක් සමඟින් වයස්ගත ශ්‍රම බලකායක්.
- ක්‍රියාවලීන් ඩිජිටල්කරණය තුළින් අඩු තාක්ෂණික දැනුමැති ගනුදෙනුකරුවන් සඳහා සේවය සැලසීමට ඇති අවස්ථා.
- අබණ්ඩ ඒකාබද්ධ කිරීම්, අත්පත් කර ගැනීම් සහ උපාය මාර්ගික සන්ධාන හරහා ආයතනික වෙනසක් ඇති කරන ලාභදායීත්වය සහ රජයේ ප්‍රතිපත්ති සමනය කිරීම.
- රාජ්‍ය බැංකුවක් ලෙස මානව සම්පත් කළමනාකරණයට බාධා කළ හැකි ව්‍යාත්තිය සමිති සහ දේශපාලන බලපෑම් සමඟ කටයුතු කිරීම

2023 දී ප්‍රධාන අවස්ථා

- දක්ෂ සේවකයින් රඳවා ගැනීමට ආකර්ශණීය වැඩ පරිසරයක් නිර්මාණය කිරීම.
- කාලය සහ සම්පත් ඵලදායී ලෙස භාවිතා කිරීම සඳහා මානව සම්පත් ක්‍රියාවලි හා ලේඛනගත කිරීම සංවර්ධනය කිරීම.
- සේවකයින් අභිප්‍රේරණය කිරීමට යහපත් වැඩ-ජීවිත සමබරතාවයකට සහය වීම

තිරසාර්ථක සාර්ථකත්ව සාධක/උපායමාර්ගික ධාවක

- ඉහළ දක්ෂයින් ආකර්ෂණය කර ගැනීමට, බඳවා ගැනීමට සහ රඳවා ගැනීමට ඇති හැකියාව
- සේවකයින් පුහුණු කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා ආයෝජනය කිරීම
- සහභාගී සහ තෘප්තිමත් සේවකයින්
- විවිධත්වය ඇතුළත් කර ගැනීම සහ සියලු දෙනා ඇතුළත් සේවා ස්ථාන සංස්කෘතියක් පෝෂණය කිරීම
- පැහැදිලි කාර්යසාධන අපේක්ෂාවන් ස්ථාපිත කිරීම, නිරන්තර ප්‍රතිපෝෂණ ලබාදීම සහ සේවක දායකත්වයන් පිළිගෙන ප්‍රදාන ලබාදීම
- සක්‍රීය ශ්‍රම බලකාය සැලසුම් කිරීම සහ අනුප්‍රාප්තික කළමනාකරණය
- සේවක සෞඛ්‍යය, ආරක්ෂාව සහ සුබසාධනය සඳහා ප්‍රමුඛත්වය දීම

අපි මානව ප්‍රාග්ධනය වර්ධනය කරන ආකාරය

- බැංකුවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පවතින කණ්ඩායම් සමඟ වැඩ කළ හැකි දක්ෂයින් ආකර්ෂණය කර ගැනීම.
- දැඩි පුහුණුව සහ නිපුණතා සංවර්ධනය තුළින් ජයග්‍රාහී කණ්ඩායම් පෝෂණය කිරීම සහ සංවර්ධනය කිරීම.
- මතු බාලාපොරොත්තු සහිත දක්ෂයින්ට සුදුසු උසස්වීම් ලබා දීම.
- වෙනස් ලෙස නොසලකා හැකියාවන් මත පදනම්ව බඳවා ගැනීමෙන් විවිධත්වය සහ සමාන අවස්ථා සැමරීම.
- ඵලදායිතාව වැඩි දියුණු කිරීම සඳහා සහයෝගී වැඩ පරිසරයක් ස්ථාපිත කිරීම.

ප්‍රතිඵල කළමනාකරණය කිරීමේ ප්‍රවේශය

- **දක්ෂයින් අත්පත් කර ගැනීම:** පළපුරුදු ව්‍යාත්තිකයන්ගේ සිට විවිධ පසුබිම්වලින් නවක උපාධිධාරීන් දක්වා විවිධාකාර කුසලතා සහ අත්දැකීම් සම්මිශ්‍රණයක් සහතික කිරීම සඳහා බහු මූලාශ්‍රවලින් සේවකයින් ආකර්ෂණය කර ගැනීම, රඳවා තබා ගැනීම සහ සංවර්ධනය කිරීම.
- **සේවක සහභාගිත්වය සහ සන්නිවේදනය:** සහයෝගී වැඩ පරිසරයක් ඇති කිරීම සඳහා කළමනාකරණය සහ සේවකයින් අතර නිසි සන්නිවේදනයක් යෙදවීම.
- **පුහුණුව සහ සංවර්ධනය:** රැකියා ස්ථානයේ පුහුණුව, ඩිජිටල් සම්පත්, පුහුණු කිරීම් සහ උපදේශන, වැඩමුළු, ව්‍යුහගත වැඩසටහන් සහ උසස් අධ්‍යාපනය සඳහා මූල්‍ය ආධාර හරහා වෙනස් වන රෙගුලාසි, සයිබර් ආරක්ෂණ තර්ජන සහ නැඟී එන තාක්ෂණයන් මත පදනම් වූ සංකීර්ණ විමසීම් විශ්වාසයෙන් යුතුව ආමන්ත්‍රණය කිරීමට පුහුණු වූ සේවකයින් තුළින් ගනුදෙනුකාර සේවය වැඩි දියුණු කිරීම.
- **රැකියා ස්ථානයේ හිරිහැරකිරීම නොඉවසීම:** කිසියම් ආකාරයක රැකියා ස්ථානයේ හිරිහැර කිරීම ඉවත් කිරීම සඳහා දැඩි ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සවිබලගැන්වීම



පාර්ශ්වකරුවන්ට නිර්මාණය කළ වටිනාකම

පාර්ශ්වකරුවන්/ ආයෝජකයින්
බැංකුවේ දිගුකාලීන තිරසාරභාවය සහ ඔරොත්තුදීම.

ගනුදෙනුකරුවන්
වඩා යහපත් ගනුදෙනුකාර සේවාව, දිගුකාලීන සම්බන්ධතා සහ පක්ෂපාතිත්වය පෝෂණය කරමින් වැඩි වූ ගනුදෙනුකාර තෘප්තියට හේතු වේ.

සේවකයින්
සේවක සහභාගිත්වය, රැකියා තෘප්තිය, සහ රඳවා ගැනීමේ අනුපාත වැඩි කරයි..

නියාමකයින් සහ රජයේ ආයතන
මනාව පුහුණු සේවකයින් නීතිමය සහ කීර්තිනාම අවදානම අඩු කරමින් නියාමන අවශ්‍යතා සහ සදාචාර ප්‍රමිති සමඟ අනුකූලතාවය සහතික කරයි.

ව්‍යාපාර හවුල්කරුවන්
ප්‍රවීනතාව සහ දැනුම පිරිනමයි, ශක්තිමත් සම්බන්ධතා පෝෂණය කරයි, ප්‍රතිචාරාත්මක සහය ලබා දේ, ගලපන ලද විසඳුම් ලබාදී අබණ්ඩ වර්ධනය සහ නවෝත්පාදනය සඳහා මෙහෙයවයි.

සමාජය සහ පරිසරය
ආයතනික සමාජ වගකීම්සහගත වැඩසටහන්වල සහභාගිත්වය, සහ ආයතනයෙන් ඔබ්බට වටිනාකම නිර්මාණය කරමින් ප්‍රජාව තුළ බැංකුව ධනාත්මකව නියෝජනය කිරීම.

මානව ප්‍රාග්ධනය

අපගේ මානව ප්‍රාග්ධනය අප භාවිතා කරන ආකාරය

මූල්‍ය ප්‍රාග්ධනය
මානව ප්‍රාග්ධනය තුළ ආයෝජනය මගින් වැඩි වූ ඵලදායිතාව, කාර්යක්ෂමතාව සහ සමකළ නොහැකි ගනුදෙනුකාර අත්දැකීම තුළින් දිගුකාලීන මූදල් ඉපයීමට දායක වේ.

නිෂ්පාදිත ප්‍රාග්ධනය
හිතකර සේවා ස්ථාන ගොඩනැගීම, මානව සම්පත් ක්‍රියාවලි ස්වයංක්‍රියකරණය සහ බැංකුව ඩිජිටල්කරණය තුළ ආයෝජන, සේවක තෘප්තිය සහ බැංකුවේ වඩා ඉහළ කාර්යසාධනය සහතික කරයි.

බුද්ධිමය ප්‍රාග්ධනය
පුහුණුව සහ සංවර්ධනය තුළ ආයෝජනය සේවක දැනුම, කුසලතා, සහ ව්‍යාපාර පුහුණුව කුලින් බැංකුවට ලැබෙන ප්‍රතිලාභ ඉහළ නංවයි.

සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය
රැකියා අවස්ථා සඳහා වෙන් කිරීම බැංකුවේ සන්නාම ප්‍රතිරූපයට උපකාරී වන ප්‍රජා සම්බන්ධතා නිර්මාණය කරයි.

ස්වභාවික ප්‍රාග්ධනය
තිරසාරතා වැඩසටහන් සේවක සෞඛ්‍ය සහ ආරක්ෂාව වර්ධනය කරන අතර හරිත දැනුවත් සංස්කෘතියක් ප්‍රවර්ධනය කරයි.

විභව්‍ය සමතුලිතතා:

- **මූල්‍ය ප්‍රාග්ධනය:** පුහුණු වැඩසටහන් හෝ සේවක ප්‍රතිලාභ වැනි මානව ප්‍රාග්ධන සංවර්ධනය තුළ අධික ආයෝජනය මූල්‍ය ස්ථාවරත්වයට සහ දුවශීලතාවයට බලපාන යටිතලපහසුකම් හෝ තාක්ෂණික ආයෝජනය වැනි වෙනත් ක්ෂේත්‍ර වැනි වෙනත් ක්ෂේත්‍ර සඳහා මූල්‍ය සම්පත් යෙදවීම මඟ හැරවිය හැකිය.
- **නිෂ්පාදිත ප්‍රාග්ධනය:** මානව ප්‍රාග්ධන සංවර්ධනය කෙරෙහි අධික අවධානය භෞතික යටිතලපහසුකම් හෝ මෙහෙයුම් වත්කම්වල ආයෝජන නොසලකා හැරීමට හේතු විය හැකි අතර, ඉන් පසුව ඇතිවන යල්පැනගිය පහසුකම්, ප්‍රමාණවත් නොවන ක්‍රියාවලි, සහ අඩුකළ මෙහෙයුම් කාර්යක්ෂමතාව සේවා තත්ත්වයට සහ ගනුදෙනුකාර තෘප්තියට බලපානු ඇත.
- **බුද්ධිමය ප්‍රාග්ධනය:** මානව ප්‍රාග්ධන සංවර්ධනය කෙරෙහි අධික අවධානය පර්යේෂණ හා සංවර්ධනය හෝ දැනුම කළමනාකරණ පද්ධති වැනි බුද්ධිමය ප්‍රාග්ධනයේ ආයෝජනවල වියදමට හේතු වේ. බුද්ධිමය ප්‍රාග්ධනය නිෂ්පාදන/සේවා වර්ධනයන් සහ වෙළෙඳපොල පුළුල් කිරීමට අත්‍යවශ්‍ය වන බැවින් මේවා නවෝත්පාදනයට සහ දිගුකාලීන තරඟකාරිත්වයන්ට බාධා ඇති කළ හැක.
- **සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය:** මානව ප්‍රාග්ධන සංවර්ධනය කෙරෙහි අවධානය සේවකයින් සමඟ වඩා ශක්තිමත් සම්බන්ධතාවලට හේතු විය හැකි නමුත්, බැංකුවේ කීර්තිනාමයට සහ ගනුදෙනුකරුවන්, ප්‍රජාවන් සහ පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධතාවන්ට බලපාන ප්‍රජා සහභාගිත්ව වැඩසටහන් හෝ **CSR** වැඩසටහන් වැනි සමාජ ප්‍රාග්ධනය තුළ ආයෝජන නොසලකා හැරිය හැකිය.
- **ස්වභාවික ප්‍රාග්ධනය:** මානව ප්‍රාග්ධන සංවර්ධනය ප්‍රමුඛ කරමින් පාරිසරික තිරසාරභාවය, හෝ පරිසර හිතකාමී ව්‍යවහාරවල ආයෝජන නොසලකා හැරීම ස්වභාවික සම්පත් පිරිහීමට සහ ජනාවාස බිඳවැටීමට මඟ පාදමින් අහිතකර පාරිසරික බලපෑම් ඇති විය හැකිය. මෙම විභව්‍ය සමතුලිතතා දිගුකාලීන තිරසරභාවය පිඩාවට පත් කරන අතර, පාරිසරික හායනයට දායක වේ.

ප්‍රමාණාත්මතාව පාර්ශ්වකරුවන්, සහ කෙටි කාලයේ සිට මධ්‍ය කාලීන උපායමාර්ගික ප්‍රමුඛතා අතර සම්බන්ධතාව

වැදගත් කරුණු	
පාර්ශ්වකරුවන්	
කෙටිකාලයේ සිට මධ්‍ය කාලය දක්වා උපායාමර්ගික ප්‍රමුඛතා	

UN තිරසාර සංවර්ධන අරමුණු (UN SDGs) සඳහා දායකත්වය

මූලික UN SDGs අරමුණු

1 NO POVERTY රැකියා අවස්ථා ලබාදීම මගින් ආර්ථික සංවර්ධනයට සහයවීමග

5 GENDER EQUALITY ශ්‍රමබලකායට ඇතුළත්වීමට බොහෝ කාන්තා අයදුම්කරුවන් දිරි ගැන්වීම.

4 QUALITY EDUCATION කුසලතා පුහුණු කිරීමට හා සංවර්ධනය කිරීමට අවස්ථා සැලසීම.

8 DECENT WORK AND ECONOMIC GROWTH ආරක්ෂිත සහ අගනා ප්‍රතිඵල ලබාදෙන සේවා ස්ථානය ඇති කිරීම.

ද්විතියික UN SDGs අරමුණු

2 ZERO HUNGER සෘජු රැකියා අවස්ථා ලබාදීමෙන් සේවකයින්ගේ ජීවන තත්ත්වය වර්ධනය.

10 REDUCED INEQUALITIES ශ්‍රමබලකාය තුළ ඉහළ කාන්තා සහභාගිත්වය සඳහා ආරක්ෂිත හා උපකාරී පරිසරයක් නිර්මාණය.

මානව ප්‍රාග්ධනය

සේවකයින් ප්‍රමුඛකරන සංස්කෘතිය

පසුගිය වසර 50 තුළ, ජාතික ඉතිරිකිරීමේ බැංකුව බොහෝ අංගවලින් පරිණාමය වී ඇත, නමුත් එහි සේවක කේන්ද්‍රීය සංස්කෘතිය ස්ථාවරව පවතී. විවෘත සන්නිවේදනය දිරිමත් කරමින්, මනෝවිද්‍යාත්මක ආරක්ෂාව ලබාදෙමින් සහ නවෝත්පාදනයන් දිරිමත් කරමින් බැංකුව සෑමවිටම සිය සේවකයන්ට මුල් තැන දී ඇත. බැංකුව ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි සහ ක්‍රියාවලි ඇතුළු විවිධ ක්‍රම තුළින් සේවකයින්ගේ අපේක්ෂාවන් අඩුවෙන්නට නොදී තබා ගැනීමට උත්සාහ දරයි. වසර ගණනාවක් පුරා, බැංකුව අවධාරණය කරන ලද පුද්ගල උපාය මාර්ගයක් හරහා නිපුණතා ගොඩනැගීමට සහ හැකියා වැඩිදියුණු කිරීමට උපකාර කිරීම කෙරෙහි අඛණ්ඩව අවධානය යොමු කර ඇත.

අපගේ සේවකයින් බැංකුවේ මුහුණුවර බව අපි විශ්වාස කරමු, එබැවින් සේවකයෙකු බැංකුවේ සිටින කාලය පුරාම උපරිම සැලකිල්ලක් දැක්වීම අත්‍යවශ්‍ය වේ.

වටිනාකම පදනම් ආයතනික සංස්කෘතියක් නිර්මාණය

බැංකුවේ ශක්තිමත් ආයතනික සංස්කෘතිය අප කරන සෑම දෙයක් සඳහාම පදනම ලෙස සේවය කරන් අතර එය අපගේ ක්‍රියාවන් මෙහෙයවමින්, ඒකාබද්ධ චින්තනය පෝෂණය කරමින් අවසානයේදී ව්‍යාපාර උපායමාර්ගය සාර්ථකව ක්‍රියාත්මක කිරීමට සහය වේ. බැංකුව වර්තමානයේ සේවකයින් ඔවුන්ගේ සේවය තුළ අරමුණක් සොයන බව අවබෝධ කර ගනිමින් බැංකුව ආයතනය තුළ මෙම සදාචාර සංස්කෘතිය සක්‍රීයව ප්‍රවර්ධනය කරයි. සේවකයින් සහ බැංකුවේ මෙහෙවර අතර ශක්තිමත් සම්බන්ධයක් පෝෂණය කරමින්, බැංකුව සහභාගිත්වය මෙහෙයවා, රඳවාගැනීම වර්ධනය කර, සහ අවසානයේදී වඩාත් අභිප්‍රේරිත සහ සාර්ථක ශ්‍රමබලකාය සාක්ෂාත් කර ගනී.


සාර්ථකත්වය ලබා ගැනීමට අපගේ සේවකයින් සවිබල ගැන්වීම

අපගේ උපායමාර්ගික අරමුණු බැංකුවේ කණ්ඩායමේ අඛණ්ඩ දායකත්වයෙන් සාක්ෂාත් කරගනු ලැබේ. සේවකයින් ඉටු කරන වැදගත් කාර්යභාරය හඳුනා ගනිමින්, ගනුදෙනුකාර තෘප්තිය ප්‍රශස්ත කිරීමට කැපවී සිටින පුද්ගලයින් පෝෂණය කිරීම සහ අභිප්‍රේරණය කිරීම සහ තිරසාර වටිනාකම් නිර්මාණය කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කිරීම සඳහා අපගේ උපාය මාර්ගය සැලසුම් කර ඇත. මෙම පරමාර්ථය දෘෂ්ටිකෝණ තුනකින් එනම්: පුද්ගලයා, බැංකුව, සහ වඩා පුළුල්ව සමාජය තුළින් අත්කර ගනී. මෙයට ඔවුන් අපගේ උපායමාර්ගික පරමාර්ථ සමඟ මැදිහත්වන ආකාරය සහ ඒවා ඉටු කිරීමට ගන්නා පියවර ඇතුළත් වේ.

අපගේ අරමුණ වන්නේ ඉහළ දක්ෂයින් ආකර්ෂණය කර ගැනීම, පෝෂණය කිරීම සහ රඳවා තබා ගනිමින්, බැංකුව පුද්ගලයන්ට දියුණු වීමට සහ ඔවුන්ගේ හැකියාවන් පුළුල් කිරීමට හැකි ස්ථානයක් බව සහතික කරමින් තෝරා ගැනීමේ සේවා යෝජකයෙකු බවට පත්වීමයි.

මෙයට ආකර්ශනීය සේවක වටිනාකම් යෝජනාවක් (EVP) සැකසීම සහ අනාගතයේ ඇති වන කැලඹීම් සඳහා ශ්‍රම බලකාය සූදානම් කිරීම සඳහා කුසලතා වර්ධනයට ප්‍රමුඛත්වය දීම ඇතුළත් වේ. එක් එක් කණ්ඩායම් සාමාජිකයාගේ වැදගත්කම හඳුනා ගනිමින් විවිධාකාර සහ සියල්ල ඇතුළත් පරිසරයක් පෝෂණය කිරීමට අපි කැපවී සිටිමු. මෙයට සේවක යහපැවැත්ම වැඩි දියුණු කිරීම, සෞඛ්‍ය සම්පන්න සේවා ස්ථාන නිර්මාණය කිරීම, අපගේ නායකත්වය තුළ විශ්වාසය ගොඩ නැගීම, සහ විවිධත්වය, සමානතාව, සහ සියළු දෙනා ඇතුළත්වීම සඳහා ශක්තිමත් බැඳීමක් පවත්වා ගෙන යාම ඇතුළත් වේ.

තවද, අපි සහයෝගිතාව සහ නවෝත්පාදනය පිළිබඳ සංස්කෘතියක් පෝෂණය කිරීමට අරමුණු කරන අතර. ඒ තුළ සෑම සේවකයාට සමාජීය අභිවෘද්ධිය ක්‍රියාත්මක කිරීමේදී තම දායකත්වයන් අර්ථවත් බවට සහ එහිදී තම කාර්යභාරය අවබෝධ කර ගන්නා බවට හැඟීමක් ඇති වේ. අපගේ පාරිසරික, සමාජීය හා පාලන (ESG) වැඩසටහන් වැළඳ ගැනීමට සියලුම දෙනා දිරිගන්වමින්, සහ සවිබලගැන්වීම සඳහා තාක්ෂණයේ වාසි ලබා ගනිමින්, අපි අපගේ අරමුණ, දැක්ම, මෙහෙවර සහ වටිනාකම් පෙළ ගස්වමු. මෙම විස්තීර්ණ ප්‍රවේශය වේගවත් ජාතික වර්ධනය කරා අපව පොළඹවමින් අපගේ සේවකයින්ට සහ අප සේවය කරන සමාජයන් කෙරෙහි ධනාත්මක බලපෑමක් පෝෂණය කිරීමට සැලසුම් කෙරේ.



මානව සම්පත් (HR) පාලනය සහ කළමනාකරණ ප්‍රවේශය

බැංකුව මානව සම්පත් කාර්යය තුළ නිදහස සහ විනිවිදභාවය සහතික කිරීමට කැප වී සිටී. එමනිසා, මානව සම්පත් (HR) කාර්යය ප්‍රධානී සෘජුවම සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීට වාර්තා කරයි.

කාර්ය මණ්ඩල ස්ථාන මාරුවීම්, උසස්වීම්, බඳවා ගැනීම් සහ වෙනත් කාරණා සම්බන්ධ ඕනෑම කරුණක් ආයතනික කළමනාකාරිත්වයේ වඩාත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පස්දෙනෙකුගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද මානව සම්පත් කමිටුව (HRC) විසින් පරීක්ෂා කරනු ලැබේ. කමිටුව විසින් ඉහත සඳහන් කළ මානව සම්පත් ගැටළු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව (BHRRC) සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කරයි.

මානව ප්‍රාග්ධනය

ජා.ඉ.බැං. කණ්ඩායම

GRI 405-1

2023 දී, බැංකුවේ ශ්‍රමබලකාය සේවකයින් 4,358ක් වූ අතර, ඉන් 4,316ක් ස්ථිර සේවකයින් වූ අතර 43ක් කොන්ත්‍රාත් පදනම මත විය. මෙම මුළු අගයෙන්, 2,391ක් කාන්තාවන් වූ අතර, 1,967ක් පිරිමින් විය. එය බැංකුව තුළ සාධාරණ ස්ත්‍රිපුරුෂ තුලනයකට හේතු වන අතර සේවකයින්ගෙන් 44%ක් ඔවුන්ගේ පක්ෂපාතිත්වය පිළිබිඹු කරමින් වසර 10 වැඩි කාලයක් සේවය කර ඇත.


සේවක වර්ගය සහ ස්ත්‍රිපුරුෂභාවය අනුව මුළු සේවකයින්

	2023			2022		
වර්ගය	කාන්තා	පිරිමි	එකතුව	කාන්තා	පිරිමි	එකතුව
ස්ථිර	**2,364**	**1,952**	**4,316**	2,458	2,031	4,489
කොන්ත්‍රාත්/පුහුණු	**27**	**15**	**42**	23	16	39
මුළුගණන	**2,391**	**1,967**	**4,358**	2,481	2,047	4,528

වගුව 14 →


ස්ත්‍රිපුරුෂභාවය අනුව මුළු සේවකයින්

ප්‍රස්ථාරය 41




සේවා කාලය අනුව සංයුතිය

ප්‍රස්ථාරය 42



ස්ත්‍රිපුරුෂභාවය අනුව ශ්‍රේණි සංයුතිය


ප්‍රස්ථාරය 43



A ජ්‍යෙෂ්ඨ ශ්‍රේණිය
B කළමනාකරුවන්
C විධායක
D මාණ්ඩලික සහකාර
E කාර්යාල සහයක


වයස් කාණ්ඩ අනුව සේවකයින්

ප්‍රස්ථාරය 44




සේවකයින්ගේ භූගෝලීය ව්‍යාප්තිය

ප්‍රස්ථාරය 45




සේවා කාලය අනුව සේවක සංයුතිය

ප්‍රස්ථාරය 46



මානව ප්‍රාග්ධනය

අපගේ අවධානය



රූපසටහන 18 →

වසර 10 වැඩි පළපුරුද්ද සහිත සේවකයින්

සේවා වර්ගය	2023	2022
අවුරුදු 11 සිට 15	**1,081**	899
අවුරුදු 16 සිට 20	**462**	319
අවුරුදු 25ට වැඩි	**373**	430
මුළු ගණන	**1,916**	1,648
මුළු ස්ථිර සේවකයින්	**4,316**	4,489
ස්ථිර සේවකයින්ගෙන් ප්‍රතිශතයක් ලෙස (%)	**44**	**37**

වගුව 16 →

කාන්තා නායකත්වය

තනතුර	2023	2022
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී	**3**	4
සහකාර සාමාන්‍යාධිකාරී	**8**	10
ප්‍රාදේශීය කළමනාකරුවන්	**3**	2
ශාඛා කළමනාකරුවන්	**99**	90
වෙනත් ප්‍රධානී/ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්	**144**	163
මුළු ගණන	**257**	269

වගුව 17 →

දක්ෂයින් අත්කර ගැනීම

GRI 202-2, 401-1

බැංකුවේ සාර්ථකත්වය එහි වර්ධනය සහ තිරසාර වටිනාකම් නිර්මාණය සහතික කළ හැකි සේවකයින් ආකර්ෂණය කර ගැනීම, රඳවා තබා ගැනීම සහ සංවර්ධනය කිරීමට ඇති හැකියාව මත රඳා පවතී. එබැවින්, සියළුම බඳවා ගැනීමේ තීරණ පදනම් කර ගනිමින්, ජාතිය, ආගම සහ ස්ත්‍රිපුරුෂ භේදයකින් තොරව දක්ෂතා, කුසලතා, සුදුසුකම් සහ පළපුරුද්ද මත පදනම් වී පළපුරුදු වෘත්තිකයන්ගේ සිට විවිධ පසුබිම්වලින් යුත් නවක උපාධිධාරීන් දක්වා විවිධාකාර කුසලතා සහ අත්දැකීම් සම්මිශ්‍රණයක් සහතික කිරීම සඳහා බැංකුව විවිධ මූලාශ්‍රවලින් බඳවා ගන්නා අතර, ඔවුන්ට බැංකුවේ දැනට සිටින කණ්ඩායම සමඟ සම්මිශ්‍රණය විය හැකිය. මෙම ප්‍රවේශය තුළින් සමාජ-ආර්ථික හා සංස්කෘතික අදාළත්වය අනුව හුවමාරු අත්දැකීම් මෙන්ම පොදුබව තුළින් අපගේ ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා සපුරාලීමට අදාළව සහ ඵලදායීව අපි සිටින බව සහතික කරයි.

2023 දී අභියෝගාත්මක මෙහෙයුම් පරිසරය සමඟ රජය විසින් පනවන ලද වියදම් සහ නව බදවාගැනීම් පිළිබඳ සීමාවන් සමඟ, දක්ෂයින් අත්කර ගැනීම බැංකුවට බලාපන අවශ්‍යතා මත දැඩිව පදනම් වී උපරිම මූල්‍ය විනය සමඟ සිදු කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, බැංකුව බැංකු නොවන ධාරාවන්ගෙන් ඇබෑර්තු පිරවීමට පුද්ගලයින් 20 දෙනෙක් පමණක් බඳවා ගන්නා ලදී.

තීරණ ගැනීමේ තනතුරුවල තාරුණ්‍ය දායකත්වය

	අවුරුදු 25-40	
තනතුර	2023	2022
ශාඛා කළමනාකරුවන්	**97**	109
වෙනත් ප්‍රධානී/ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්	**94**	132
මුළු ගණන	**191**	241
මුළු ස්ථිර සේවකයින්	**4,316**	4,489
ස්ථිර සේවකයින්ගෙන් ප්‍රතිශතයක් ලෙස	**4%**	**5%**

වගුව 15 →

සේවක සහභාගිත්වය සහ සන්නිවේදනය

සහභාගී සේවකයින් අභිප්‍රේරිත ශ්‍රමබලකායකට මඟ පාදන වන අතර එය වඩා ඉහළ කාර්යසාධනයට, වැඩවල වර්ධිත තත්ත්වයකට, සහ සාර්ථක ප්‍රතිඵලවලට හේතු වේ. මේ අනුව, විධිමත් සන්නිවේදනය සහභාගි සේවකයින්ට ප්‍රධාන වන අතර, එය බැංකුවේ තීරණ ගැනීමේ ක්‍රියාවලියට සේවකයින් ඇතුළත් කරයි. හිතකාමී, සහයෝගී වැඩ වාතාවරණය සමඟ, කළමනාකරණය සහ සේවකයින් අතර විවෘත සන්නිවේදනය විමසුමා අඩුකර, සතුට වැඩිකරමින් ඵලදායිතාව වර්ධනය කරයි. හැකි සෑම අවස්ථාවකදීම, බැංකුව සමඟ ඔවුන්ගේ පවුල් සහ ආදරණීයන් සහභාගි කරවීමට අපි උත්සාහ ගනිමු.

මානව සම්පත් අංශය, පුහුණු හා සංවර්ධන අංශයේ සහය ඇතිව, “Webinar” සංකල්පය ආරම්භ කළ අතර, එහිදී ප්‍රධාන කාර්යාලය සහ ශාඛාවලට මාර්ගගතව සම්බන්ධවී, තොරතුරු හුවමාරු කර ගැනීමට සහ “Webinar” සැසි හරහා විවෘත සාකච්ඡාවන් හී ගැටළු විසඳීමට හැකි වේ. 2023 දී, අපි සාර්ථකව සැසි අඛණ්ඩව පවත් වූ අතර, ඒවා අවම පිරිවැයකට ඵලදායී සන්නිවේදන මාර්ග සපයන ලදී.

මානව ප්‍රාග්ධනය

වෘත්තීය සමිති සමඟ සම්බන්ධතාවය-රැස්වීමේ සහ සාමූහික කේවල් කිරීමේ නිදහස

සේවකයින්ගේ සහ බැංකුවේ ප්‍රතිලාභ සඳහා දිගුකාලීන සංවර්ධනය සහතික කිරීමට වෘත්තීය සමිති සහ අනෙකුත් නියෝජිත සංගම් සමඟ කටයුතු කරමින් බැංකුව සිය සේවකයින්ගේ රැස්වීමේ නිදහස සහ සාමූහික කේවල් කිරීමේ අයිතිය පිළිබඳ ඵලදායී හඳුනා ගැනීම පිළිගනී. වෘත්තීය සමිති නියෝජිතයින් සමඟ සම්බන්ධතා බැංකුවේ ව්‍යාපාර කටයුතු සහ අරමුණු පිළිබඳ සම්පූර්ණ අවබෝධයක් ලබා ගැනීමට එහි සාමාජිකයින්ට සහ අනෙකුත් නියෝජිතයින්ට ඉඩදෙමින් තොරතුරු ලබාදීමට වැඩිදුර අවස්ථාව නිර්මාණය කරයි.

පුහුණුව හා සංවර්ධනය


GRI 404-2

මනාව-පුහුණුවූ සහ සංවර්ධිත ශ්‍රමබලකායක් අපගේ ශක්තිමත් වත්කම බව අපි අවබෝධ කර ගනිමු. සේවක පුහුණුව තුළ ආයෝජනය අඛණ්ඩ ඉගෙනුම් සංස්කෘතියක් පෝෂණය කරන අතර වෙනස්වන රෙගුලාසි, සයිබර් ආරක්ෂක තර්ජන, සහ මතුවන තාක්ෂණයන් සමඟ ඉදිරියට යාමට අවශ්‍ය දක්ෂතාවන්ගෙන් සේවකයින් පරිපූර්ණ කරයි. සේවකයින්ට ගලපන ලද මූල්‍ය විසඳුම් පිරිනැමිය හැකි බැවින් සහ සංකීර්ණ විමසීම්වලට විශ්වාසයෙන් ආමන්ත්‍රණය කළ හැකි බැවින්, මෙය වැඩි කළ ගනුදෙනුකාර සේවයකට පරිවර්තනය කරයි. තවද, පුහුණු වැඩසටහන්වලට බැංකුවේ සමස්ථ සාර්ථකත්වය මෙහෙයවන වඩාත් සහභාගි සහ ලාභ උපදවන ශ්‍රම බලකායක් නිර්මාණය කරමින් සේවක චිත්ත ධෛර්ය සහ රඳවා ගැනීම වැඩි කළ හැකිය. සේවක සංවර්ධනය ප්‍රමුඛ කරමින්, බැංකුවට තරඟකාරීව, අනුරූපව සිටිය හැකිවන අතර, සිය ගනුදෙනුකරුවන්ට සුවිශේෂී වටිනාකමක් ලබාදිය හැකිය.

මෙයට කාර්යස්ථ පුහුණුව, ඩිජිටල් සම්පත්, පුහුණුව සහ උපදේශනය, වැඩමුළු, ව්‍යුහගත වැඩසටහන්, සහ උසස් අධ්‍යාපනය සඳහා මූල්‍ය සහය පවා ඇතුළත්ය. අඛණ්ඩ ඉගෙනුම කෙරෙහි අවධානය යොමු කරමින්. අපගේ ශ්‍රමබලකාය විවිධ ව්‍යාපාර ක්ෂේත්‍ර අතර සිය කුසලතා සංවර්ධනය කර ගැනීමට ශක්තිමත් කරන අතර එය වර්ධිත ව්‍යාපාර කාර්යසාධනයට සෘජුවම පරිවර්තනය කරයි. අපගේ පරමාර්ථය වන්නේ අපගේ ශ්‍රමබලකායෙන් 80%ක් විවිධ ව්‍යාපාර පාලනයන් හරහා දැනුම වැඩිකරගැනීමට සහ ප්‍රවීනතාව සාක්ෂාත් කර ගැනීමට ඉහළ දක්ෂතා සහ යොදාගත හැකි ශ්‍රමබලකායක් සහතික කරමින් වාර්ෂිකව අවම වශයෙන් එක් ඉගෙනුම් කාර්යයක සහභාගි වී සිටීමයි.


පුහුණු වැඩසටහන් ගණන

ප්‍රස්ථාරය 47



ශ්‍රේණිය අනුව පුහුණු පැය

ප්‍රස්ථාරය 48






මානව ප්‍රාග්ධනය

ශ්‍රේණිය අනුව පුහුණු වැඩසටහන් වර්ග සඳහා සහභාගිත්වය

ප්‍රස්ථාරය 49




	විගණන	මධ්‍ය බැංකුකරණය	ණය හා අයකිරීම්	මූල්‍ය හා ගිණුම්කරණය	මා.ස.සං.	ජාත්‍යන්තර බැංකුකරණය	IT හා IT ආරක්ෂාව	අලෙවිකරණ, විකුණුම් හා ගනුදෙනුකාර සේවය	බැංකු මෙහෙයුම්	වෙනත්	අවදානම හා නෛතික අනුකූලතාව	නිපුනතා වැඩි කිරීම	භාණ්ඩාගාර මෙහෙයුම්
●	–	94	24	9	–	1	12	–	19	2	8	–	1
●	45	999	61	22	–	34	37	10	94	1	32	6	5
●	16	1,165	103	71	–	67	42	31	190	1	14	20	4
●	2	2,366	182	225	1	113	26	80	181	–	8	74	–
●	–	–	–	–	63	–	–	–	–	–	–	433	–

● ජේෂ්ඨ - කළමනාකරු ● විධායක ● කාර්යාල සහයක
● කළමනාකරු ● මාණ්ඩලික සහකාර

පුහුණු වැඩසටහන් වර්ගය අනුව සහභාගිවූවන්

ප්‍රස්ථාරය 50



A විගණන
B මධ්‍ය බැංකුකරණය
C ණය හා අයකිරීම්
D මූල්‍ය හා ගිණුම්කරණය
E මා.ස.සං
F ජාත්‍යන්තර බැංකුකරණය
G IT හා IT ආරක්ෂාව
H අලෙවිකරණ,විකුණුම් හා ගනුදෙනුකාර සේවය
I බැංකු මෙහෙයුම්
J වෙනත්
K අවදානම හා නෛතික හා අනුකූලතාව
L නිපුනතා වැඩි කිරීම
M භාණ්ඩාගාර මෙහෙයුම්

බැංකුවේ පුහුණු සහ සංවර්ධන අංග වැඩි කිරීම පිණිස පුහුණු අංශය විසින් පහත සඳහන් ක්‍රියාමාර්ග ගෙන ඇත.

- මධ්‍ය බැංකුකරණ පුහුණුව
- බැංකු සහ බැංකු නොවන මෙහෙයුම් පිළිබඳ පුහුණුව

2023 දී පුහුණු වැඩසටහන් තුළ රු. මිලියන 13.2ට වඩා ආයෝජනය කළ අතර එය 2022 දී වෙන්කළ මුදලට වඩා රු. මිලියන 0.4ක වැඩිවීමකි. සේවකයින් පුහුණු පැය 52,630කට සහභාගි වී ඇති අතර, සේවකයෙකුට සාමාන්‍ය පුහුණු පැය ගණන පැය 12.2ක් විය.

පිළිගැනීම සහ පාරිශ්‍රමිකය

GRI 201-3, 202-1, 401-2, 405-2

වර්තමාන ආර්ථික සන්දර්භය සැලකිල්ලට ගනිමින්, බැංකුව තරඟකාරී, උනන්දු කරවන, සහ සාධාරණ පාරිශ්‍රමිකයට පක්ෂ වූ අතර, සියලුම සේවකයින්ට සිය කාර්යභාරය සහ කාර්යසාධනය අනුව සාධාරණව ප්‍රතිඵලදායක කිරීමට බැංකුව බැඳී සිටී.

මානව ප්‍රාග්ධනය

එබැවින්, ස්ථිර කරන ලද සියලුම සේවකයින් වාර්ෂික වර්ධක, ප්‍රසාද දීමනා, නිවාඩු මුදල් කිරීම, වෛද්‍ය වියදම් ප්‍රතිපූරණය, මරණය, ස්ථිර ආබාධිත හෝ අර්ධ ආබාධිත අවස්ථාවලදී වන්දි යෝජනා ක්‍රම, සහනදායී ණය අනුපාත, සහ සාමාජිකත්වය සහ සම්මාන ගෙවීම් ඇතුළුව මූල්‍ය ප්‍රතිලාභ රාශියක් භුක්ති විඳීමට සුදුසුකම් ලබයි, බැංකුවේ සේවකයින් නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සඳහා ද සුදුසුකම් ලබයි.

බැංකුවේ සාර්ථකත්වයට සේවකයින්ගේ දායකත්වයේ වටිනාකම බැංකුව වටහාගෙන ඇති බව පෙන්වමින් සේවකයෙකුගේ වෘත්තීය ජීවිතය තුළ පිළිගැනීම සමානව වැදගත් ලෙස බැංකුව සලකන අතර මේ අනුව ආරක්ෂාව සහ අභිප්‍රේරණය පිළිබඳ හැඟීමක් ගොඩනඟයි. අයදුම්කරුගේ සුදුසුකම්, හැකියාව සහ අතීත කාර්ය සාධනයේ ගුණාත්මකභාවය පිළිබඳ සංසන්දනාත්මක සමාලෝචනයක් මත පදනම්ව රැකියා ආශ්‍රිත ක්ෂේත්‍ර අනුව උසස්වීම් හරහා පිළිගැනීමට බැංකුව සහාය දක්වයි. බැංකුවේ ධුරාවලිය තුළ එක් එක් ශ්‍රේණියට උසස්වීම් සඳහා සම්මුඛ පරීක්ෂණ බැංකුවේ උසස්වීම් දින දර්ශනය සහ අදාළ ශ්‍රේණිවල පවතින පුරප්පාඩු අනුව උපලේඛනගත කෙරේ. කෙසේ වෙතත්, 2023 දී රටේ පැවති ආර්ථික අර්බුදය සහ වියදම් සීමා කිරීමේ රෙගුලාසි හේතුවෙන් උසස්වීම් ලබා දී නොමැත.

අනුප්‍රාප්තික සැලසුම් කිරීම ද වැදගත් වේ. බැංකුව තීරණාත්මක තනතුරු කලින්ම හඳුනා ගන්නා අතර අවශ්‍ය විටෙක එවැනි තනතුරු පිරවීම සඳහා සුදුසු පුද්ගලයින් පුහුණු කර සංවර්ධනය කිරීමට සැලසුම් සකස් කරයි. මෙම ක්‍රියාවලිය දක්ෂ පුද්ගලයින්ට ඔවුන්ගේ උත්සාහයන් සඳහා පිළිගැනීමට දොරටු විවර කරයි.

ක්‍රීඩා, කලාව සහ සාහිත්‍යය වැනි රැකියාවට සම්බන්ධ නොවන ක්ෂේත්‍රවල ඔවුන් පෙන්වා ඇති විශේෂ කුසලතා සහ කැපවීම සඳහා සේවකයින් ඉස්මතු කිරීමට ද පිළිගැනීම යොදා ගනී. වාර්ෂික වර්ණ රාත්‍රිය මගින් බැංකුවේ ක්‍රීඩා තරු හඳුනා ගන්නා අතර, අනෙකුත් ජයග්‍රහණ බැංකුවේ සියලු දෙනාටම බැලීම සඳහා බැංකුවේ අන්තර් ජාලයේ නිසි පරිදි යාවත්කාලීන කරනු ලබයි.

කාර්යසාධන කළමනාකරණය

GRI 404-3

බැංකුව විස්තීරණ කාර්ය සාධන ඇගයීම් ක්‍රමයක් තුළින් අඛණ්ඩ සේවක වර්ධනය සඳහා කැපවී සිටී. නිරන්තර කාර්යසාධන සමාලෝචන තුළින් වටිනා සංවර්ධන මෙවලම් ලබාදීම, සේවකයින්ට ශක්තින් හඳුනා ගැනීමට සහයවීම, දුර්වලතා ආමන්ත්‍රණය, සහ අවසාන වශයෙන් සම්පූර්ණ හැකියාවන්ට ලඟාවීම සිදුකරයි. මෙම අඛණ්ඩ ක්‍රියාවලිය මගින් සෑම කෙනෙකුම බැංකුවේ අරමුණු සමඟ පෙළගැසී ඇති බව සහ සුවිශේෂී සේවය බෙදා හැරීමට සන්නද්ධ පරිපූර්ණව සිටින බව සහතික කරයි. අනුකූලතාව සහ ඵලදායීත්වය සහතික කිරීම සඳහා, පහත සඳහන් ප්‍රධාන අංග කෙරෙහි අවධානය යොමු කරන පැහැදිලි මාර්ගෝපදේශ ගෙනහැර දක්වන කැපවූ කාර්ය සාධන කළමනාකරණ ප්‍රතිපත්තියක් අප සතුව ඇත:

- සාර්ථකත්වය කරා යාමට කුසලතා පරතරය සමනය කිරීම
- කුසලතා පරතරය ඉතා සියුම් ලෙස පෙන්වා වඩා ශක්තිමත් කණ්ඩායම් ගොඩ නැඟීම
- අපගේ කර්යසාධන කළමනාකරණ ක්‍රියාවලිය ප්‍රගස්ථ කිරීම

සාධාරණ සහ ස්ථාවර කාර්ය සාධන ඇගයීම සඳහා අපගේ කැපවීම අපගේ විස්තීරණ පද්ධතියෙන් පිළිබිඹු වේ. විධායක නිලධාරීන් සහ අධීක්ෂක නිලධාරීන්ගේ සිට මෙහෙයුම් සහ සුළු කාර්ය මණ්ඩලය දක්වා විවිධ රැකියා මට්ටම්වලට ගැලපෙන පරිදි පූර්ව-නිශ්චිත නිර්ණායක භාවිතා කරමින් බැංකුවේ සියලුම සේවකයින්ගේ වාර්ෂික සමාලෝචන අපි පවත්වමු. සෑම කෙනෙකුටම ඔවුන්ගේ නිශ්චිත කාර්යභාරයන් සහ වගකීම් මත පදනම්ව තක්සේරු කරනු ලබන බව මින් සහතික කරයි. පක්ෂග්‍රාහීත්වය තවදුරටත් ඉවත් කිරීම සඳහා, අපි මූලික කාර්යසාධන දර්ශක (KPIs) මත පදනම්ව ආයතනික කළමනාකරණය ඇගයීමට ලක් කරන සමබර ලකුණුපත් ප්‍රවේශයක් භාවිතා කරමු. මෙම ඉලක්ක පදනම් කාර්යසාධන කළමනාකරණ පද්ධතිය විෂයමූලකත්වය ප්‍රවර්ධනය කරන අතර, සේවකයින්ට ඔවුන්ගේ දායකත්වය බැංකුවේ සමස්ත අරමුණු සමඟ සමපාත වන ආකාරය අවබෝධ කර ගැනීමට හැකියාව ලබා දේ.

මානසික යහපැවැත්ම

බැංකුවේ මානව ප්‍රාග්ධන කළමනාකරණය යටතේ සේවකයින්ගේ මානසික යහපැවැත්ම ඉතාමත් වැදගත් සාධකයකි. පහත කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් අපගේ සේවකයින්ගේ හොඳම දේ පිටතට ගෙන එන පරිසරයක් නිර්මාණය කිරීමට අපි කැපවී සිටිමු:

රැකියා-ජීවිත සමබරතාව

↓

මැසිවිලි විසඳීමේ යාන්ත්‍රණ


↓

සෞඛ්‍ය හා ආරක්ෂාව

↓

සේවා ස්ථාන හිරිහැර කිරීම නොඉවසීම

රැකියා-ජීවිත සමබරතාව



බැංකුව විසින් පුද්ගලයෙකුගේ පෞද්ගලික ජීවිතය ඔවුන්ගේ වෘත්තිය මෙන්ම වැදගත් ලෙස සලකන අතර, යහපත් පුද්ගලික සහ වෘත්තීය සබඳතා ප්‍රවර්ධනය කරන සෞඛ්‍ය සම්පන්න රැකියා-ජීවිත සමතුලිතතාවයක් පවත්වා ගැනීමට සේවකයින් දිරිමත් කිරීම සඳහා විවිධ පහසුකම් ලබා දේ. මේවාට පහත දෑ ඇතුළත් විය හැකිය:

- පවුලේ සාමාජිකයින්ට ද සම්බන්ධ වීමට ආරාධනා කර බැංකුවේ වර්ණ රාත්‍රිය, වෙසක් බක්ති ගී, නත්තල් කැරොල් සහ අලුත් අවුරුදු සැමරුම් වැනි වාර්ෂික උත්සව පැවැත්වීම.
- බැංකුවේ ප්‍රධාන කාර්යාලයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද රෝහලක් මගින් අභ්‍යන්තර වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යනු ලැබේ. මසකට දෙවරක්, අභ්‍යන්තර වෛද්‍ය මධ්‍යස්ථානයේදී උපදෙස් ලබා ගත හැකි විශේෂඥ වෛද්‍යවරුන්ගේ සේවය බැංකුව ලබා ගනී.
- සේවකයන්ගේ ප්‍රයෝජනය සඳහා ප්‍රධාන කාර්යාලයේ දී ප්‍රධාන පෞද්ගලික රෝහල් වෛද්‍ය සායන පවත්වයි.
- සුභසාධන අංශය මගින් සංවිධානය කරන ලද පීඩන කළමනාකරණය සහ හෘදවාහිනී රෝග නිවාරණය වැනි විෂයයන් පිළිබඳව වෘත්තීය සම්පත් දායකයින් විසින් පවත්වනු ලබන සම්මන්ත්‍රණ සහ දේශන.
- සහනදායක මිලට ප්‍රධාන කාර්යාලයේ ආපනශාලාවෙන් උසස් තත්ත්වයේ ආහාර.
- බැංකුවේ ක්‍රීඩා සමාජය හරහා සේවකයින්ට ක්‍රීඩාවේ ඔවුන්ගේ දක්ෂතා වර්ධනය කර ගැනීමට සහ යහපත් තරඟකාරිත්වයක් ඇති කිරීමට ක්‍රීඩා අවස්ථා

මානව ප්‍රාග්ධනය


- බැංකුවේ ක්‍රීඩා සමාජය විසින් ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ පවත්වාගෙන යනු ලබන බැංකුවේ අභ්‍යන්තර ව්‍යායාම් ශාලාවක්.
- සේවකයින්ගේ දැනුම වර්ධනය කිරීමට පුස්තකාල පහසුකම්
- බැංකුවේ කලා කවය විසින් සංවිධානය කරන ලද නාට්‍ය, චිත්‍රපට සහ සංගීත සංදර්ශන වැනි විනෝදාස්වාද පහසුකම්.

සේවක මැසිවිලි විසඳීමේ යාන්ත්‍රණ


පිළිගත නොහැකි ක්‍රියාපටිපාටි මුල් අවධියේදීම හඳුනා ගැනීම සහ විසඳීමට සමත් විවෘත සේවක මැසිවිලි විසඳීමේ යාන්ත්‍රණයක් බැංකුව සතුව ඇත.

බැංකුවට මැසිවිලි විසඳීම සඳහා ප්‍රවේශ දෙකක් ඇත. "පියවර ඉනිමඟ පද්ධතිය" සහ "දොර විවෘත ප්‍රතිපත්තිය".

පියවර ඉනිමඟ පද්ධතිය



දොර විවෘත ප්‍රතිපත්තිය



මානව ප්‍රාග්ධනය

සෞඛ්‍ය සහ ආරක්ෂාව

GRI 403-9

බැංකුවේ මානව සම්පත් ප්‍රතිපත්ති අත්පොත සේවකයින්ගේ සෞඛ්‍ය සහ ආරක්ෂාව සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග පැහැදිලිව දක්වා ඇති අතර එහිදී වෘත්තීමය සෞඛ්‍ය සහ ආරක්ෂාව (OSH) සලකා බලනු ලබයි. ප්‍රතිපත්තිය ක්‍රියාත්මකවීමත් සමඟ, බැංකු පරිශ්‍රය තුළ වාර්තා වූ සුළු අනතුරු සංඛ්‍යාව හතක් වූ අතර 2023 දී ප්‍රධාන අනතුරු කිසිවක් වාර්තාවී නොමැත.

සේවා ස්ථානයේ හිරිහැර කිරීම නොඉවසීම GRI 406-1

බැංකුවට කිසියම් ආකාරයක සේවා ස්ථාන හිරිහැර කිරීම සඳහා ශූන්‍ය ඉවසුම් මට්ටමක් ඇති අතර ඒවා සේවකයාගේ මානව අයිතිවාසිකම් කඩකිරීමක් ලෙස මෙන්ම ඔහුගේ/ඇයගේ බරපතල මානසික සෞඛ්‍ය ගැටළු ඇති කරන පෞද්ගලික ගරුත්වය පිළිබඳ ප්‍රශ්න ලෙස දකී. එමනිසා, බැංකුවට එවැනි අවස්ථා සිදුවීම වැලැක්වීමට දැඩි ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි ඇත.

ගනුදෙනුකරුවන්, වෙළෙන්දන්, වෙනත් සේවකයින්, හෝ අමුත්තන් ඇතුළුව බැංකුවේ යම් පාර්ශ්වකරුවන්ට හිරිහැර කිරීම සේවකයින්ට අතීශයින් තහනම් කර ඇත. උසස්වීම්, වැටුප් වර්ධක, ස්ථානමාරු, හෝ යම් සමාන පොරොන්දු සඳහා ප්‍රතික්‍රියා ලෙස යටත් සේවකයෙකුට හිරිහැර කරන හෝ කැමතිවන ලෙස බලකරන (ලිංගික කැමැත්ත ඇතුළුව) යම් සේවකයෙක් සම්බන්ධව බැංකුවේ විනය සංග්‍රහ ප්‍රකාරව කටයුතු කරනු ලැබේ. යම් සේවකයෙක්ට ඔහු/ඇය හිරිහැරකිරීමට හෝ වෙනස් ලෙස සැලකීමට ලක්වන බව දැනුනහොත්, එම ගැටළුව සමඟ කටයුතු කිරීමට බැංකුවට පැහැදිලි ක්‍රියාපටිපාටියක් ඇත.

විශේෂයෙන් කාන්තා සේවිකාවන්ගේ මානසික සහ කායික යහපැවැත්ම සහ ආරක්ෂාව සහතික කිරීමට ඔවුන්ගේ මැසිවිලි නිරාකරණය කිරීමට 2022දී මැසිවිලි විසඳීමේ කමිටුවක් සකස් කරන ලදී. මෙම කමිටුව කාන්තා නිලධාරීන්ගෙන්/ඉහළ කළමනාකරණයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීන්ගෙන් සමන්විත වන අතර මානව සම්පත් අංශයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී විසින් මෙහෙයවනු ලබයි. කාන්තා කාර්ය මණ්ඩල සාමාජිකාවන් විසින් මුහුණදිය හැකි යම් හිරිහැර කිරීමකට හෝ වෙනස් ලෙස සැලකීමකට අදාළ පැමිණිලි කමිටුවේ සභාපතිනිය වෙත ඉදිරිපත් කළ හැකිය.

විවිධත්වය සහ සමාන අවස්ථාව


GRI 401-3, 405-1

ජාතිය, වර්ණය, ආගම, ස්ත්‍රීපුරුෂභාවය, වයස, විවාහක තත්ත්වය, ජනවර්ගය හෝ ආබාධිතතාව නොසලකා බැංකුව තුළ එක් එක් පුද්ගලයාට සමාන අවස්ථා ලබාදීම බැංකුවේ ප්‍රතිපත්තිවලින් අරමුණු කරයි. නව සේවකයින් බඳවා ගැනීමේදී අචේතනික නැඹුරුවීමේ හැකියාව ඉවත් කරන රැකියා විස්තර ලිවීමට බැංකුව දැනුවත් උත්සාහයන් සිදු කර ඇත. 2023 දී, අයිතිවාසිකම් කඩකිරීම හෝ වෙනස් ලෙස සැලකීමේ ක්‍රියාවන් සම්බන්ධයෙන් පැමිණිලි කිසිවක් නොමැත.

තවද, වන්දි, ප්‍රතිලාභ, ස්ථාන මාරුවීම්, පුහුණුව සහ සංවර්ධනය, අධ්‍යාපනික සහය, විනෝදාත්මක වැඩසටහන් සහ සියලුම රැකියා වර්ගීකරණය තුළ පුද්ගල උසස්වීම් පිළිබඳ බැංකුවේ ප්‍රතිපත්තිවලින් බැංකුවේ සමාන අවස්ථාව සහ විවිධත්වය පිළිබඳ සාර්ථකත්වය පිළිබිඹු කරයි..

කාන්තාවන්ට පිරිමි අනුපාතය

ප්‍රස්ථාරය 51



සමාන අවස්ථා සඳහා නිදසුනක් ලෙස, අපගේ කණ්ඩායම (ස්ථිර සේවකයන්) 55%ක කාන්තා නියෝජනයකින් සමන්විත වේ, ජ්‍යේෂ්ඨ කළමනාකරණ සහ මධ්‍යම කළමනාකරණ තනතුරුවලින් පිළිවෙලින් 44%ක් සහ 49%ක් සඳහා කාන්තාවන් දායක වේ.

තවද, බැංකුවේ සියලුම කාන්තා සේවිකාවන් සම්පූර්ණ ප්‍රතිලාභ සහිතව දින 84ක ප්‍රසූත නිවාඩුවට හිමිකම් කියනු ලබන අතර, පිරිමි සේවකයින්ට දින 3ක පීතෘ නිවාඩුවක් ලබා ගත හැක. 2023 දී, කාන්තා සේවිකාවන් 256ක් ප්‍රසූත නිවාඩු භාවිතා කර ඇති අතර එය සම්පූර්ණ කිරීම මත 100%ක ප්‍රතිශතයක් නැවත සේවයට පැමිණ ඇත. එමෙන්ම පිරිමි සේවකයින් 147ක් පීතෘ නිවාඩුවේ වාසිය ලබා ගෙන ඇත.

දක්ෂයින් රඳවා ගැනීම


GRI 401-1

2023 සේවකයින් රඳවා ගැනීම සම්බන්ධයෙන් වඩාත් අභියෝගාත්මක වසර බවට පත්ව ඇති අතර, දක්ෂ සේවකයින් රඳවා තබා ගැනීමට බැංකු සක්‍රීයව කටයුතු කරමින් සිටී. සේවකයින් 97ක් බැංකුවෙන් ඉල්ලා අස් වූ අතර, සේවකයින් 40ක් විදේශීය අධ්‍යාපනික සහ රැකියා අවස්ථා සඳහා වැටුප් රහිත නිවාඩු ලබා ගෙන ඇත. ඊට අමතරව, රටේ අවිනිශ්චිත ආර්ථික තත්ත්වය ප්‍රධාන ගැටළුව බවත්, රජයේ ප්‍රතිපත්ති තුළින් වැඩිකළ බදු අනුපාත විශේෂයෙන් සුවිශේෂී ක්ෂේත්‍රවල පුද්ගලයින් පුද්ගලික අංශයේ නව රැකියා අවස්ථා සෙවීමට ඔවුන් පෙළඹවීමෙන් සේවකයින් අධෛර්යයට පත් කර ඇති බව පැවති සම්මුඛ සාකච්ඡාවල ප්‍රතිපෝෂණවලින් පෙන්නුම් කරයි.

ඒ අනුව, වසර සඳහා මුළු සේවක පිරිවැටුම 2022 දී වාර්තාකළ 85 ට සාපේක්ෂව 163ක් වූ අතර එය 91.8%ක වැඩිවීමකි. තවද, පසුගිය වසර කිහිපය තුළ රටේ බරපතල බුද්ධි ගලනය හේතුවෙන් තොරතුරු තාක්ෂණ සහ භාණ්ඩාගාර වැනි විශේෂිත කාර්යයන් සඳහා බඳවා ගැනීමේදී බැංකුව දුෂ්කරතාවන්ට මුහුණ දුන්හ. එමනිසා, බැංකුවට දක්ෂයින් රඳවා ගැනීම ඉහළ අභියෝගයක් බවට පත් වූ අතර, කාර්ය මණ්ඩලය අතර කුසලතා පරතරවල වියහැකි අවදානමකට මුහුණ දේ. අපි සියලුම එවැනි සම්මුඛ සාකච්ඡාවල ප්‍රතිපෝෂණ අගය කරන අතර, බැංකුව තරඟකාරී සහ සිත්ගන්නා වැඩ පළපුරුද්දක් පිරිනමන බව සහතික කරමින් අපගේ සේවක රඳවා ගැනීමේ වැඩසටහන් නිරවුල් කර ගැනීමට අපි ඒවා භාවිතා කරමු.

සේවක පිරිවැටුමේ සංයුතිය


ප්‍රස්ථාරය 52



මානව ප්‍රාග්ධනය


වයස අනුව සේවක පිරිවැටුම

ප්‍රස්ථාරය 53



සේවක පිරිවැටුම සඳහා හේතුව

ප්‍රස්ථාරය 54



	2023 %	2022 %
පිරිවැටුම් අනුපාතය	3.7	1.9
රඳවා ගැනීමේ අනුපාතය	96.3	98.1
ස්වේච්ඡා පිරිවැටුම	2.2	1.0

වගුව 18 →

ඉදිරි ගමන් මඟ

බැංකුව මානව ප්‍රාග්ධනය අනුව අභියෝගාත්මක වසරක් අපේක්ෂා කරන අතර, සංක්‍රමණික අරමුණ සඳහා 2022 සහ 2023 අතර ඉල්ලා අස්වීම්වල විශාල වැඩි වීමක් ඇති බැවින් සිදුවියහැකි කුසලතා පරතර බලාපොරොත්තු වේ. එබැවින්, අනාගත අවශ්‍යතා පුරෝකථනය කිරීමට වර්තමාන අවස්ථාවෙන් ඉදිරිය බලමින් අභියෝග ජය ගැනීමට බැංකුව කටයුතු කරමින් පහත සඳහන් අත්‍යවශ්‍ය උපායමාර්ග ක්‍රියාත්මක කරමින් සිටී:

- වෙළෙඳපොල තුළ ඉහළ දක්ෂයින් හඳුනාගෙන බඳවා ගැනීමට බැංකුවේ හැකියාව වැඩි කිරීම. ඉහළින් කටයුතු කරන පුද්ගලයින් රඳවා ගැනීම සහ අභියෝග කිරීම, සහ සංවර්ධනය සහ අභිවෘද්ධිය සඳහා අවස්ථා පිරිනැමීම.
- නායකයින්ට ඩිජිටල් වාතාවරණයේ වේගවත් පරිනාමය හමුවේ තම කණ්ඩායම්වලට ජය ගැනීම සඳහා මෙහෙයවීමට හැකි බව සහතික කිරීමට නායකත්ව ඵලදායිතා වැඩි කිරීම.
- අපගේ උපායමාර්ගය ආරක්ෂා කිරීමේ සංස්කෘතිය ශක්තිමත් කිරීම, අනාගත අරමුණු සමඟ අපගේ ශ්‍රමබලකාය පෙළ ගැස්වීමට වර්යාවන් රාශියක් එකතු කර පුරිපූර්ණ කිරීම.
- සේවකයින් සඳහා බලපාන කොටස පිරිනැමීම, අපගේ සමස්ථ සේවක පිරිනැමීම් විශේෂයෙන් සමහර සේවක අංශ සඳහා තත්ත්වයෙන් නොගැලපිය හැකි බව සහතික කිරීම.





සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය

විශ්වාසය ගොඩ නැගීම, වටිනාකම ගොඩ නැගීම



බැංකුව සඳහා සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධයෙන් අදහස් කරන දෑ

සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය ගනුදෙනුකරුවන්, සේවකයින්, ව්‍යාපාර හවුල්කරුවන්, නියාමකයින් සහ පුළුල්ව ප්‍රජාව ඇතුළු පාර්ශ්වකරුවන් සමඟ බැංකුවේ සම්බන්ධතා සහ මැදිහත්වීම්වලින් උත්පන්න වන වටිනාකම සමන්විත වේ. මේ ආකාරයේ ප්‍රාග්ධනය තීරණාත්මක වන්නේ එය විශ්වාසය, පක්ෂපාතිත්වය සහ කීර්තිනාමය ගොඩනගන බැවින් වන අතර තිරසාර දිගුකාලීන ව්‍යාපාර සාර්ථකත්වය සඳහා එය අත්‍යවශ්‍යය. එයට බැංකුවේ සන්නාම හිමිකම, ගනුදෙනුකාර තෘප්තිය සහ පක්ෂපාතිත්වය, හවුල්කාර සහ සන්ධාන ජාලය සහ ප්‍රජාව සහ නියාමක ආයතන සමඟ බැංකුවේ පෙනීසිටීම ඇතුළත් වේ.

බැංකුවේ වටිනාකම නිර්මාණයට සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය සහයවන ආකාරය

බැංකුව කල්පවත්නා සාර්ථකත්වය සහ ප්‍රජා බලපෑම සහතික කිරීමට එහි සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය ඉතා පරීක්ෂා සහිතව පෝෂණය කර ඇත. පාර්ශ්වකරුවන් සමඟ අර්ථවත් ලෙස නියැලෙමින්, බැංකුව සුපිරි ගනුදෙනුකාර සේවාව ලබාදෙමින් සහ කාලය පුරා අනෝන්‍ය වටිනාකමට මඟපාදන වැඩසටහන් නිර්මාණය කිරීමේ මූලික අරමුණ සමඟ සිය පරමාර්ථ සහ පිරිනැමීම් පෙළ ගස්වා ඇත.

වටිනාකම් පරිනාමනය

- නිවැරදි ගනුදෙනුකාර පදනම් ආකර්ෂණය
- වටිනා ගනුදෙනුකරුවන් රඳවා ගැනීම
- නිවැරදි කුසලතා රාමු ආකර්ෂණය
- සේවකයින් අඛණ්ඩව පුහුණු කිරීම සහ සංවර්ධනය
- ප්‍රසම්පාදන ක්‍රියාවලිය ස්වයංක්‍රීයකරණය
- ගනුදෙනුකරුවන්, ව්‍යාපාර හවුල්කරුවන්, නියාමකයින් සහ ප්‍රජාවන් සමඟ අඛණ්ඩ සහභාගිත්වය

ප්‍රධාන යෙදවුම්

- අපගේ පාර්ශ්වකරුවන්ගෙන් අඛණ්ඩ සහය
- ප්‍රයෝජනවත් සේවක සහභාගිත්වය
- රජය සහ නියාමකයින් සමඟ ධනාත්මක සම්බන්ධතා
- දිගුකාලීන ගනුදෙනුකාර සම්බන්ධතා
- මාධ්‍ය සහ ප්‍රජාවන් සමඟ සක්‍රීය සහභාගිත්වය
- ඵලදායී සේවා ලබාදීම සහ සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් සමඟ සහභාගිත්වය

ප්‍රධාන ප්‍රතිඵල

ගනුදෙනුකරුවන් අත්කර ගැනීම

මුළු සක්‍රීය ගිණුම් සංඛ්‍යාව	භාවිතයේ ඇති කාඩ්පත් සංඛ්‍යාව
රු. මිලියන 13.03	1,147,651
(2022 – රු. මිලියන 12.98)	(2022 – 2,203,309)

වගකීම් සහගත ප්‍රසම්පාදනය

ලියාපදිංචි සැපයුම්කරුවන් සංඛ්‍යාව	ප්‍රසම්පාදනය මත වියදම් කළ ගණන
256	රු. බිලියන 1.6 ක්
(2022 – 184)	(2022 – රු. බිලියන 0.9)

සමාජයට දායකත්වය

මුදල් අමාත්‍යාංශය විසින් ආරම්භ කළ ගෘහසාධන වැඩසටහන සඳහා "අස්වැසුම ගිණුම්" විවෘත කිරීම.

බැංකුවේ යූ ටියුබ් නාලිකාව මත 5 වසර "හපන්" ශිෂ්‍යත්ව විභාගයට සූදානම් කිරීමේ වැඩසටහන දියත් කිරීම, සහ විශේෂ ජයග්‍රහකයින් සඳහා මුදල් ත්‍යාග සමඟ ආදර්ශ ප්‍රශ්න පොත් පරිත්‍යාග කිරීම.

51ක් වැනි සංවත්සරය සමරමින් මාර්තු වාසයේදී ඉපදුනු සියලුම ළදරුවන් සඳහා "NSB සෙනෙහසේ දායාදය" යටතේ දායකත්ව තැන්පතුවක් සමඟ හපන් ළමාගිණුමක් විවෘත කිරීම

සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය

2023 දී ප්‍රධාන අභියෝග

- ආර්ථික අවිනිශ්චිතතාව හේතුවෙන් ව්‍යාපාරවල බිඳ වැටීම
- වෙනස්වන පාරිභෝගික අපේක්ෂාවන් සහ පාරිභෝගික බැඳියා පිළිගැටුම හඳුනාගෙන කළමනාකරණය කිරීම
- විවිධ පාරිභෝගික අවශ්‍යතා ඉටු කිරීමට සම්පත් වෙන් කිරීමේදී කාර්යක්ෂමතාව
- සුහද සම්බන්ධතා පවත්වා නොගන්නා විට වියහැකි කීර්තිනාම හානිය

2023 දී ප්‍රධාන අවස්ථා

- අපගේ ව්‍යාපාරය තුළට පාරිභෝගික අවශ්‍යතා ගොඩ නැගීමේ හැකියාව සහ බැඳීම් සාර්ථකව ලබාදීම
- පාර්ශ්වකරුවන්ගේ වෙනස්වන ගැටළුවලට සහභාගිවීමේ සහ ප්‍රතිචාර දැක්වීමේ හැකියාව
- ප්‍රජාව තුළ ධනාත්මක දිගුකාලීන බලපෑමත් ඇති කිරීමමේ අපේක්ෂාව

තිරසාර සාර්ථකත්ව සාධක/උපායමාර්ගික මූලිකාංග

රෙගුලාසි සමඟ ස්ථීර අනුකූලතාවට බැංකුව සියලුම පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය දිනා ගැනීම සඳහා එහි කටයුතුවලදී සීමාවන්ට ඉහළින් සහ විනිවිදව සිටින බව සහතික කිරීමට විවිධ රෙගුලාසි අනුගමනය කරයි..

මුදල් විශුද්ධිකරණය, අල්ලස සහ දූෂණයට බැංකුව අවදානම් ක්ෂේත්‍ර හඳුනාගෙන ඇති අතර ඒ අනුව ගනුදෙනුකරුවන් ආරක්ෂා කිරීමට, සහ සයිබර් අපරාධ, මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට අරමුදල් යෙදීම වැලැක්වීමට නියාමකයින්ට සහය වීමට අවදානම් කළමනාකරණ පද්ධතියක් ගොඩ නගා ඇත.

ශක්තිමත් පාලනය සහ විචක්ෂණ අවදානම් කළමනාකරණය: මෙහෙයුම් අවදානම්වලින් ආරක්ෂාකර පවත්වා ගත හැකි බව සහතික කිරීමට බැංකුවට දැඩි පාලන පද්ධතියක් සහ තියුණු අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තියක් ඇත.

පාර්ශ්වකරුවන්ට නිර්මාණය කළ වටිනාකම

පාර්ශ්වකරුවන්/ආයෝජකයින්
පාර්ශ්වකරුවන්/ආයෝජකයින් සඳහා තිරසාර වටිනාකම නිර්මාණය, විශ්වාසය, විනිවිදභාවය සහ දිගුකාලීන මූල්‍ය ස්ථාවරත්වය පෝෂණය කිරීම.

ගනුදෙනුකරුවන්
ගනුදෙනුකරුවන්ගේ විශේෂ අවශ්‍යතා සපුරාලන පුද්ගලගත සේවා සහ ගලපන ලද මූල්‍ය නිස්පාදන.

සේවකයින්
උපකාරී සහ සහභාගී සේවා ස්ථාන පරිසරයක් පෝෂණය කිරීම.

නියාමකයින් සහ රජයේ ආයතන
බැංකු ක්ෂේත්‍රය සඳහා ප්‍රයෝජනවත් නියාමන පරිසරයක් සහ කල්පවත්නා තිරසාර වර්ධනයකට පහසුකම් සැලසීම.

ව්‍යාපාර හවුල්කරුවන්
අනෝන්‍ය සෞභාග්‍ය සහ තිරසාර ව්‍යාපාර ප්‍රතිඵල ඇති කරන ව්‍යාපාර හවුල්කරුවන් සඳහා

සමාජය සහ පරිසරය
ධනාත්මක වෙනස ඇති කිරීම සහ සමාජයේ සහ පරිසරයේ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම.

අපි සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය වර්ධනය කරන ආකාරය

- සුපිරි ගනුදෙනුකාර සේවය, නව්‍යකරණ නිෂ්පාදන හා විසඳුම්, දත්තවල ආරක්ෂාව සහ රහසභාවය තුළින් පක්ෂපාතී ගනුදෙනුකාර පදනමක් ගොඩ නැගීම.
- උපායමාර්ගික සංධානවලට ව්‍යාපාර හවුල්කරුවන් කණ්ඩායම් කිරීම
- අනුකූලව සිටීම සහ විචක්ෂණ අවදානම් කළමනාකරණය ක්‍රියාවේ යෙදවීම
- සමාජයට ආපසු දීම සහ ප්‍රජාවන් ගොඩ නැගීමට මූල්‍ය අන්තර්කරණය ප්‍රමුඛ කිරීම.

ප්‍රතිඵල කළමනාකරණය කිරීමේ ප්‍රවේශ

- ගනුදෙනුකාර මැදිහත්වීම්, මනාපයන් සහ ප්‍රතිපෝෂණ විපරම් කිරීමට ගනුදෙනුකාර සම්බන්ධතා කළමනාකරණ ක්‍රියාවලි කෙරෙහි අවධානය.
- අපගේ ගනුදෙනුකාර පදනම් සමඟ පුද්ගලගත සම්බන්ධතා පවත්වා ගැනීම සහ අපගේ ව්‍යාපාර මෙහෙයුම් තුළ විනිවිදභාවය සහ වගවීම සහතික කිරීම.
- සන්නිවේදනය සහ ගැටළු නිරාකරණය වැනි විෂය ක්ෂේත්‍රවල සේවක පුහුණුව සහ සංවර්ධනය තුළ ආයෝජනය.
- ගනුදෙනුකරුවන් සමඟ සහභාගිවීමට ඩිජිටල් අවකාශ සහ සමාජ මාධ්‍ය නාලිකා භාවිතා කිරීම සහ මාර්ගගත ප්‍රජාව පෝෂණය කිරීම.
- මාර්ගගත සහය පිරිනැමීම සහ ගනුදෙනුකාර සහභාගිත්වය සහ තෘප්තිය වැඩි කිරීමට ප්‍රයෝජනවත් සාකච්ඡා ඇති කිරීම



සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය

අපගේ සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය අප භාවිතා කරන ආකාරය

මූල්‍ය ප්‍රාග්ධනය
සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය ගොඩ නගා පෝෂණය කිරීම වෙත යොමුකළ ආයෝජන මූලිකවම මූල්‍ය ප්‍රාග්ධනය අඩුකරනු ලැබුවද ඇතිවන සන්නාම පක්ෂපාතිත්වය සහ සන්නාම හිමිකම දිගුකාලීන ලාභදායිතාවයට හේතු වේ.

නිෂ්පාදිත ප්‍රාග්ධනය
අපගේ භෞතික හා ඩිජිටල් යටිතලපහසුකම් පාර්ශවකාර අවශ්‍යතා සමඟ පෙළගැසීම කරා පාර්ශවකාර දායකත්වයේ සහභාගිත්වය සහ ප්‍රතිපෝෂණය.

බුද්ධිමය ප්‍රාග්ධනය
ගනුදෙනුකාර කේන්ද්‍රීයතාව, නියාමන මනා පරිච, වගකීම්සහගත මූලාශ්‍රකරණය, සහ අප ක්‍රියාත්මක ප්‍රජාවන් තුළ ආයෝජනය යන සියල්ල අපගේ ගනුදෙනුකාර පක්ෂපාතිත්වය, සන්නාමය හා කීර්තිනාමය වැඩි කිරීමට දායක වේ.

මානව ප්‍රාග්ධනය
පාර්ශ්වකරුවන්, ජාල සහ පුළුල් ප්‍රජාවන් සමඟ ගැඹුරු සම්බන්ධතා පෝෂණය සන්නාම හිමිකම ශක්තිමත් කරන අතර එය ඉහළ සක්‍රීය වෘත්තිකයන් ආකර්ෂණය කර රඳවා ගැනීමේදී සහය වේ.

ස්වභාවික ප්‍රාග්ධනය
නියාමන අනුකූලතාව සමඟ සමාජීය බැඳීම ස්වභාවික සම්පත් වගකීම්සහගත භාවිතය සහ සංරක්ෂණය සඳහා දායක වේ.

UN තිරසාර සංවර්ධන අරමුණු (UN SDGs) සඳහා දායකත්වය

4 QUALITY EDUCATION — "හපන්" ශිෂ්‍යත්ව විභාගයට සූදානම් කිරීමේ වැඩසටහන ගුණාත්මක අධ්‍යාපනය වර්ධනය කිරීම.

10 REDUCED INEQUALITIES — "අස්වැසුම" ගිණුම් විවෘත කිරීම

12 RESPONSIBLE CONSUMPTION AND PRODUCTION — දැඩි ප්‍රසම්පාදන ක්‍රියාවලියක් තුළින් තිරසාර පරිභෝජනය සහ නිෂ්පාදනය ස්ථාපිත කිරීම

13 CLIMATE ACTION — CSR වැඩසටහන් තුළින් අභ්‍යන්තර හා බාහිර පාර්ශ්වකරුවන් අතර පාරිසරික දැනුම වැඩි කිරීම

11 SUSTAINABLE CITIES AND COMMUNITIES — මානව හිතවාදී සංවර්ධන ව්‍යාපෘති මෙන්ම අවස්ථා ලබාගැනීම සහ ඇති කිරීම තුළින් ඔරොත්තුදෙන, ආර්ථික වශයෙන් තිරසාර ප්‍රජාවන් ගොඩ නැගීම

විභව්‍ය සමතුලිතතා

- **මූල්‍ය ප්‍රාග්ධනය** – සමාජීය වැඩසටහන්, අනුග්‍රාහකත්වයන්, සහ ප්‍රජා සහභාගිත්ව කටයුතුවලට කෙටි-කාලීන ලාභදායිතාවයට බලපෑම් කළහැකි සහ යටිතලපහසුකම් හෝ තාක්ෂණය තුළ ආයෝජන සීමා කළ හැකි මූල්‍ය සම්පත් අවශ්‍ය වේ.
- **නිෂ්පාදිත ප්‍රාග්ධනය** – සමාජ ප්‍රාග්ධනය ගොඩ නැගීම යන්ත්‍ර හෝ කාර්යාල උපස්කිරීම් වැනි භෞතික වත්කම්වල ආයෝජනය සමහර අවස්ථාවල දියුණුව අවම කළ හැකිය.. කෙසේවෙතත්, දිගුකාලීන කාර්යක්ෂමතාව සහතික කිරීමට තුලනයක් අවශ්‍ය වේ.
- **බුද්ධිමය ප්‍රාග්ධනය** – සම්බන්ධතා ගොඩ නැගීම කෙරෙහි ශක්තිමත් අවධානයක් බාධාකාරී තාක්ෂණයන් හෝ නව්‍යකරණ විසඳුම් ගවේශණය තුළ ස්ථාපිත හවුල්කාරත්වයන් සඳහා මනාපයකට හේතු විය හැකිය.
- **මානව ප්‍රාග්ධනය** – සේවක පුහුණුව හා සංවර්ධනය තුළින් ශක්තිමත් සම්බන්ධතා ගොඩනැගීම හා ධනාත්මක කීර්තිනාමයක් ගොඩනැගීමට කාලයක් ගතවිය හැකිය.
- **ස්වභාවික ප්‍රාග්ධනය** – සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය වැඩි කිරීම අරමුණු කළ වැඩසටහන් ස්වභාවික ප්‍රාග්ධනය අඩුකරන වඩා ඉහළ සම්පත් භාවිතයකට හේතු වේ.

ප්‍රමාණාත්මතාව. පාර්ශ්වකරුවන්, සහ කෙටි කාලයේ සිට මධ්‍ය කාලීන උපායමාර්ගික ප්‍රමුඛතා අතර සම්බන්ධතාවය



සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය

1 ගනුදෙනුකාර ප්‍රාග්ධනය

සහභාගිත්වය සහ නවෝත්පාදනය තුළින් වටිනාකම ඇති කිරීම

ගනුදෙනුකාර ප්‍රාග්ධනය යන්නෙන් බැංකුව සිය ගනුදෙනුකරුවන් සමඟ දියුණු කර ගෙන ඇති සම්බන්ධතා සහ ජාලය තුළ වටිනාකම අදහස් වේ. එයට පක්ෂපාතිකම, විශ්වාසය, සහ සන්නාමය පිළිබඳ ඔවුන්ට ඇති තෘප්තිය සහ හරස් විකුණුම, ඉහළ විකුණුම සහ ගනුදෙනුකාර රඳවා ගැනීම තුළ ජනනය කළ අනාගත ආදායම් සඳහා විභවතාව ඇතුළත් වේ.

අපගේ ගනුදෙනුකාර වටිනාකම් කොටස

බැංකුවේ ගනුදෙනුකාර ප්‍රාග්ධනයෙන් කල්පවත්නා සම්බන්ධතා ගොඩ නැගීම, නවෝත්පාදනය ඇති කිරීම, සහ මූල්‍ය ගනුදෙනුවලින් ඉදිරියට වටිනාකම ලබාදීම කෙරෙහි යොමු වේ. අපි අඛණ්ඩව වෙනස්වන බැවින් සහ අපගේ ගනුදෙනුකරුවන්ගේ පෝෂණය කිරීමට, සහ අපගේ ගනුදෙනුකරුවන් සහ ප්‍රජාවන් සඳහා තිරසාර වර්ධනය ඇති කිරීමට හේතු වේ. වෙනස්වන අවශ්‍යතාවන්ට අනුවර්තනය වන බැවින්, ගනුදෙනුකාර ප්‍රාග්ධනය තුළ ආයෝජනය අර්ථවත් අත්දැකීමක් නිර්මාණයට, දිගු-කාලීන සම්බන්ධතා පෝෂණය කිරීමට, සහ අපගේ ගනුදෙනුකරුවන් සහ ප්‍රජාවන් සඳහා තිරසාර වර්ධනය ඇති කිරීමට හේතු වේ.

ගනුදෙනුකාර වටිනාකම වැඩි කිරීමේ උපායමාර්ග

- ගනුදෙනුකාර තෘප්තිය සහ පක්ෂපාතිත්වය වැඩි කිරීමට තනි පුද්ගල ගනුදෙනුකාර අවශ්‍යතා, මනාපයන් සහ මූල්‍ය අරමුණු සපුරාලීමට ගලපන ලද සේවා.
- පිවිසීමේ හැකියාව, පහසුව, සහ බැංකු සේවාන් හී කාර්යක්ෂමතාව වර්ධනය කිරීමට ඩිජිටල් අවකාශ සහ තාක්ෂණයන්හී ආයෝජනය.
- මූල්‍ය සාක්ෂරතාව පිළිබඳ ගනුදෙනුකරුවන් දැනුවත් කිරීමට සම්පත් සහ වැඩමුළු ලබාදීම සහ ඉතුරුම් හා ආයෝජනය පිළිබඳ ඔවුන්ට දැනුවත් තීරණ ගැනීමට ඔවුන් සවිබල ගැන්වීම
- වර්ධනය සඳහා ක්ෂේත්‍ර හඳුනාගැනීමට සහ සමස්ථ ගනුදෙනුකාර අත්දැකීම වැඩි කිරීමට ගනුදෙනුකාර ප්‍රතිපෝෂණ මත සක්‍රීයව ක්‍රියාකර කටයුතු කිරීම.
- වෙනස්වන ගනුදෙනුකාර අවශ්‍යතා සහ මනාපයන් ආමන්ත්‍රණය කරන නව්‍යකරණ මූල්‍ය නිෂ්පාදන හා සේවා හඳුන්වාදීම.

පහසු සහ නව්‍යකරණ මූල්‍ය සේවා

බැංකුව තුළ, ගනුදෙනුකරුවන්ට බාධා රහිත සහ පහසු බැංකු අත්දැකීමක් ලබා දීමේ වැදගත්කම අපි අවබෝධ කර ගනිමු, බහු මාර්ග ප්‍රවේශයක වාසි ලබා ගනිමින්, පිවිසීමේ හැකියාව සහ ගනුදෙනුකරුවන් සඳහා තේරීම සහතික කිරීමට අපි ඩිජිටල්, මාර්ගගත, ඇමතුම් මධ්‍යස්ථාන, සහ භෞතික ශාඛා ඇතුළුව අවකාශ රාශියක් අපි පිරිනමමු.

ශ්‍රී ලංකාව පුරා උපායමාර්ගිකව ස්ථාපිත ශාඛා 262ක සහ ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර, මුදල් තැන්පතු යන්ත්‍ර සහ මුදල් ප්‍රතිචක්‍රීය යන්ත්‍ර (ATMs/CRMs) 417ක ජාලයක් සමඟ, ගනුදෙනුකාර ඉතුරුම් සහ ආයෝජන අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීමට ප්‍රායෝගික සහ දැරිය හැකි මූල්‍ය නිෂ්පාදන හා සේවාවන් හි විස්තීරණ කළඹක් ගනුදෙනුකරුවන්ට අපි පිරිනමමු.

ඊට අමතරව, බැංකුව ඉක්මන් ප්‍රතිචාර කාලයක් සමඟ ප්‍රශස්ථකළ සන්නිවේදන මාර්ග තුළින් වටිනා ගනුදෙනුකාර සහභාගිත්වය දිරි ගන්වයි. නවීන මෙවලම් භාවිතා කරමින්, බැංකුව වසර ගණනාවක් පුරා පෝෂණය කළ බහුපරම්පරාගත ගනුදෙනුකාර සම්බන්ධතා හරහා ඉහළ මට්ටමේ තෘප්තිය ඵලදායීව මැන දරා ගැනීමට අපි අරමුණු කරමු.

සුවිශේෂී සේවා අත්දැකීම්


පහසු බැංකු මාර්ග (ඩිජිටල් අවකාශ, ජංගම බැංකුකරණය, විස්තීර්ණ ශාඛා ජාලය), කාර්යක්ෂම ගනුදෙනුකාර ක්‍රියාවලි, සහ පුද්ගලගත සහය සඳහා කැපවූ මනාව පුහුණු කාර්ය මණ්ඩලය පිරිනැමීමට මැදිහත් වන සියලුම පිවිසුම් ස්ථාන හරහා සුවිශේෂී සේවාක් ලබා දෙමින් ගනුදෙනුකාර අපේක්ෂාවන් ඉක්මවා යාමට අපි උත්සාහ ගනිමු.

ඩිජිටල් වශයෙන් ණය ලබාදීම

වර්ධනය වන ඩිජිටල් ලෝකයක් තුළ, අපගේ ඩිජිටල් සැලැස්ම සහ දත්ත හැකියාවන් ගනුදෙනුකාර අත්දැකීම වැඩි කිරීමේදී සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව ඇති කිරීමේදී අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කරයි. උසස් තාක්ෂණයන් සහ දත්ත විශ්ලේෂණ භාවිතා කරමින්, අපට ගනුදෙනුකාර මනාපයන් සහ චර්යාවන් වඩා හොඳින් අවබෝධ කර ගැනීමට හැකි වන අතර, එය ඔවුන්ගේ අවශ්‍යතා අපේක්ෂා කිරීමට සහ අදාළ සහ කාලීන විසඳුම් ලබාදීමට හැකියාව ඇති කරයි.

වටිනාකම නිර්මාණය කිරීමේ මූලිකාංග

රූපය 20 →



සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය

අපගේ ඩිජිටල් නවෝත්පාදනය තුළ දැනට පවතින ආයෝජනය මගින් ප්‍රතිභාන සහ පරිශීලක හිතකාමී බැංකු විසඳුම් සමඟ අපගේ ගනුදෙනුකරුවන් සවිබලගන්වමින් තාක්ෂණික අභිවෘද්ධීන්හි පෙරමුනේ අපි සිටින බව සහතික කරයි.

2023 වසර තුළ පහත සඳහන් නිෂ්පාදන හඳුන්වා දුන් බැවින් එම වසර ඩිජිටල් පරිනාමන වසර වේ. (වැඩි විස්තර සඳහා නිෂ්පාදිත ප්‍රාග්ධනය බලන්න)

- NSB NextGen
- e-KYC
- NSB e-Post
- NSP Payapp
- NSB Transit Card

ගනුදෙනුකාර දත්ත සහ රහස්‍යතාව ආරක්ෂාව

GRI 418-1

බැංකුව ගනුදෙනුකාර අපේක්ෂාවන් සහ නියාමන අවශ්‍යතාවයන්ට අනුකූලව ආරක්ෂිත සහ වගකීම්සහගත ආකාරයෙන් ගනුදෙනුකාර දත්ත හසුරුවයි. බැංකුවේ ඩිජිටල් පැවැත්ම සහ තාක්ෂණික හැකියාවන් අඛණ්ඩව පුළුල් කිරීමත් සමඟ, සයිබර් ආරක්ෂාව පිළිබඳ වැඩිවන තර්ජන බැංකුව සයිබර් ආරක්ෂාව සැලකියයුතු ගැටළුවක් ලෙස ප්‍රමුඛ කිරීමට මෙහෙයවා ඇත. මෙවැනි අවදානම් සක්‍රීය ලෙස ආමන්ත්‍රණය කිරීමට, අපි අපගේ ගනුදෙනුකාර ප්‍රඥාප්තිය සහ තොරතුරු පද්ධති ආරක්ෂක ප්‍රතිපත්තිය නැවත ශක්තිමත් කළ අතර, අපගේ වෙනස්වන පද්ධතිවල ආරක්ෂාව සත්‍යාපනය කිරීමට නිරන්තරයෙන් තක්සේරු කිරීම් පවත්වන ලදී. ඊට අමතරව, සයිබර් ආරක්ෂක අවදානම කළමනාකරණය ස්වාධීනව පාලනය කිරීමට සහ අදාළ ක්‍රියාමාර්ග සහ සංවර්ධනයන් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කිරීමට විශේෂිත තොරතුරු ආරක්ෂක නිලධාරියෙක් (ISO) බැංකුව සේවයේ යොදවා ඇත.

අපගේ සක්‍රීය ක්‍රියාමාර්ගවලට පහත දෑ ඇතුළත්ය:

- 2019 දී ගෙවීම් කාඩ් කර්මාන්තයේ දත්ත ආරක්ෂක ප්‍රමිතිය (PCIDSS) සහතිකය ලබාගෙන එය දිගටම පවත්වාගෙන ගොස් ඇති අතර 2023 දක්වා අනුකූලතා තත්ත්වය පවත්වා ගෙන ඇත.
- දත්ත කාන්දුවීම වැලැක්වීමේ (DLP) පද්ධතිය ක්‍රියාත්මක කිරීම

2023 දී, බැංකුව ගනුදෙනුකාර රහස්‍යතාව හෝ දත්ත අහිමිවීම කඩවීම් සම්බන්ධයෙන් ශූන්‍ය පැමිණිලි වාර්තා කර ඇති අතර, බැංකුව දඩ හෝ සම්බාධක කිසිවක් දරා නොමැත.

වගකිම්සහගත බැංකුකරණය

සදාචාරබව, විනිවිදභාවය, සහ ගනුදෙනුකාර-කේන්ද්‍රීයතාව පිළිබඳ ඉහළම ප්‍රමිති දරා ගනිමින්, බැංකුව දිගුකල් පවත්නා සම්බන්ධතා පෝෂණය කිරීමට විශ්වාසය අවංකකම සහ අනෝන්‍ය ගෞරවය ගොඩ නැගීමට අරමුණු කරමු.

බැංකුවේ වගකිම්සහගත බැංකු උපායමාර්ගය අසමසම අවශ්‍යතා ආමන්ත්‍රණය කරමින්, මූල්‍ය අන්තර්ගහනය පෝෂණය කරමින්, සහ ගලපනලද විවිධ පිරිනැමීම් රාශියක් තුළින් පුද්ගලයින් සහ ව්‍යාපාර සවිබල ගන්වමින් සියලුම ජන විකාශවලට පිවිසිය හැකි පරම මූල්‍ය සේවා ලබාදීමට ක්‍රියාවේ යොදවා ඇත.

ඊට අමතරව, නිත්‍ය සහභාගිත්වය සහ ප්‍රතිපෝෂණ යාන්ත්‍රණයන් හරහා ගනුදෙනුකරුවන්ගේ වෙනස් වන මනාපයන් අවබෝධ කර ගැනීමට ඔවුන්ගේ ප්‍රතිපෝෂණ ක්‍රියාශීලී වන අතර ඒවායින් ඔවුන්ගේ සමස්ත බැංකු අත්දැකීම් වැඩිදියුණු කිරීම සඳහා අපගේ පිරිනැමීම් අඛණ්ඩව වැඩිදියුණු කරමු.

අලෙවිකරණය සහ ලේබල්කරණය

GRI 417-2, 417-3

නිෂ්පාදන සහ සේවා සම්බන්ධ සියලුම නියමයන් සහ කොන්දේසි බැංකුවේ ගනුදෙනුකාර ප්‍රඥප්ති මාර්ගෝපදේශ අනුගමනය කරමින් ගනුදෙනුකරුවන්ට විනිවිදභාවයෙන් සන්නිවේදනය කෙරේ. මීට අමතරව, මූල්‍ය ඔම්බුඩ්ස්මන් හරහා පහසුකම් සපයන අපගේ පැමිණිලි විසඳීමේ ක්‍රියාවලිය මහ බැංකුවේ නියෝගවලට අනුකූලව සියලුම ශාඛාවන් හරහා ප්‍රමුඛව ප්‍රදර්ශනය කෙරේ.

ශ්‍රී ලංකාවේ තොරතුරු දැනගැනීමේ අයිතිය (RTI) පිළිබඳ පනත අනුව සියලුම පාර්ශ්වකරුවන්ට සහ ජනතාවට බැංකුවේ අදාළ තොරතුරු කරා ප්‍රවේශය ඇති බව සහතික කිරීමට බැංකුව පොදු තොරතුරු නිලධාරියෙක් නම් කර ඇත. මෙම රෙගුලාසිවලට අනුකූලවීම සඳහා, බැංකුවේ සියලුම ප්‍රචාරණ දැන්වීම්වලට පහත දෑ ඇතුළත්ය.

- ඇමතුම් මධ්‍යස්ථානය සහ ආයතනික වෙබ් ලිපිනය පිළිබඳ ඇමතුම් විස්තර
- බැංකුවේ ණය ශ්‍රේණිගතකරණය – ලංකා ශ්‍රේණිගතකරණ (පුද්ගලික) සමාගම
- බැංකුවේ විශේෂ ලක්ෂණය – 100% රජයේ ඇපය, බැංකුවේ ලොගෝව සහ තේමාපාඨය

2023 දී, නිෂ්පාදන සහ සේවා තොරතුරුවල ලේබල්කරණය සම්බන්ධයෙන් අනුකූල නොවූ කිසිදු අවස්ථාවක් නොමැති අතර, අලෙවිකරණ සන්නිවේදන සම්බන්ධයෙන් ද අනුකූල නොවූ අවස්ථා කිසිත් නොමැත.

විවිධ හා බහුපරම්පරාගත සේවා දායකයින්ට සේවා සැලසීම

අපගේ ගනුදෙනුකරුවන් ප්‍රගතිය සහ පරිවර්තනයන්ට භාජනය වන බැවින්, ඔවුන්ගේ බැංකු අවශ්‍යතා ඒ අනුව වෙනස් වේ. ගනුදෙනුකාර ගතික අවශ්‍යතාවලට ප්‍රතිචාර දැක්වීමට, ඔවුන්ගේ අවශ්‍යතා අවබෝධ කර ගැනීමට සහ ඉක්මනින් අනුවර්තනය වීමට එක් එක් ජන විකාශනය තුළ ප්‍රමුඛතා මාරු කිරීම සමීපව නිරීක්ෂණය කිරීමට බැංකුව කඩිසර ය.


බැංකුව සමාජයේ සෑම අංශයකම විහිදෙන නිෂ්පාදන, සේවා සහ අගය එකතු කළ විශේෂාංග රාශියක් සපයන අතර එමඟින් එහි විවිධ ගනුදෙනුකාර පදනමට ඔවුන්ගේ වයස, ස්ත්‍රී පුරුෂ භාවය සහ ජීවන රටාවට ගැලපෙන බැංකු විසඳුමක් සොයා ගත හැකි බව සහතික කරයි. අපගේ වටිනා ගනුදෙනුකරුවන්ගේ අසමසම මූල්‍ය මනාපයන් සහ ජීවන අවස්ථා සමඟ පෙළගස්වන බහුකාර්ය සහ ඇතුළත් විකල්ප පරාසයක් පිරිනැමීමට අපි කැපවී සිටිමු.

ගනුදෙනුකාර ප්‍රතිපෝෂණ අගය කිරීම

බැංකුව තුළ, අපගේ ගනුදෙනුකරුවන්ගේ කථාකිරීමේ ශක්තීන් බැංකුවේ අඛණ්ඩ වර්ධනය සඳහා අත්‍යවශ්‍යය. ඒ නිසාම අපි ගනුදෙනුකාර ප්‍රතිපෝෂණ අගය කිරීම ප්‍රමුඛ කරන අතර, ඔවුන් සමඟ සම්බන්ධ වීමට බහු මාර්ග පිරි නමයි.

- **කැපවූ ප්‍රතිපෝෂණ මාර්ග:** අපි පහසුවෙන් ප්‍රවේශ විය හැකි මාර්ගගත ප්‍රතිපෝෂණ ආකෘති, ශාඛාවල යෝජනා පෙට්ටි සහ ප්‍රතිපෝෂණ සඳහා විශේෂයෙන් ක්ෂණික දුරකථන සපයන්නෙමු.
- **සමාජ සවන්දීම:** ගනුදෙනුකාර හැඟීම් අවබෝධ කර ගැනීමට, නැඟී එන ප්‍රවණතා හඳුනා ගැනීමට සහ ඕනෑම ගැටළුවක් කඩිනම්ව විසඳීමට අපි සමාජ මාධ්‍ය අවකාශ සක්‍රීයව නිරීක්ෂණය කරමු.
- **ගනුදෙනුකාර තෘප්තිමත් සමීක්ෂණ:** අපගේ නිෂ්පාදන, සේවා සහ සමස්ත බැංකු අත්දැකීම් පිළිබඳ තෘප්තිය මැන බැලීම සඳහා අපි නිතිපතා ගනුදෙනුකාර තෘප්තිමත් සමීක්ෂණ පවත්වමු.

සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය



රූපය 21 →

ගනුදෙනුකාර සහභාගිත්ව සංඛ්‍යා

ලද ගනුදෙනුකාර පැමිණිලි සංඛ්‍යාව

488

(2022 – 252)

විසඳන ලද ගනුදෙනුකාර පැමිණිලි සංඛ්‍යාව

361

(2022 – 194)

දුරකථනය හරහා ලද විමසුම් සංඛ්‍යාව

434,110

(2022 – 378,856)

→ ඉදිරි ගමන් මඟ

- සෑම ගනුදෙනුකරුවෙකුගේම අසමසම මනාපයන්, චර්යාවන්, සහ මූල්‍ය අරමුණුවලට ගැලපෙන ඉහළ පුද්ගලගත බැංකු අත්දැකීම් ලබාදීමට උසස් දත්ත විශ්ලේෂණ සහ කෘතිම බුද්ධිය භාවිතා කිරීම.
- පහසු බහුමාර්ග සහභාගිත්වය ලබාදීම, ජංගම යෙදුම්, මාර්ගගත බිහිදොර, සමාජ මාධ්‍ය, සහ භෞතික ශාඛා ඇතුළුව බැංකුව තුළ විවිධ පිවිසුම් ස්ථාන සමඟ කටයුතු කිරීමට ගනුදෙනුකරුවන්ට ඉඩදීම.
- ගනුදෙනුකාර සහභාගිත්වය සහ තෘප්තිය වැඩි කිරීමට නවීන ඩිජිටල් හැකියාවන් හි ආයෝජනය
- තනි ඒකාබද්ධ අවකාශයක් තුළ පුළුල් අන්තර් සම්බන්ධ සේවා රාශියක් පිරිනැමීමට තෙවැනි-පාර්ශව සැපයුම්කරුවන් සමඟ සහයෝගයෙන් පරිසර පද්ධති බැංකුකරණය වැළඳ ගැනීම.
- වෙනස්වන ගනුදෙනුකාර අවශ්‍යතා සහ අපේක්ෂාවන් සපුරාලීමට අඛණ්ඩව නව්‍යකරණය වෙමින් කඩිසරව, අනුරූපව සිටීම.

2

ව්‍යාපාර හවුල්කාර ප්‍රාග්ධනය

උපායමාර්ගික සහයෝගිතා භාවිතා කිරීම


ඉදිරිය සිතන මූල්‍ය ආයතනයක් ලෙස, ව්‍යාපාරික පරිසර පද්ධතිය හරහා විවිධ පාර්ශ්වකරුවන් සමඟ ශක්තිමත් හවුල්කාරිත්වයන් සහ සන්ධාන ගොඩනැගීමේ උපායමාර්ගික වැදගත්කම අපි හඳුනා ගනිමු. මෙම සහයෝගිතා බැංකුවේ හැකියාවන් වැඩි දියුණු කිරීම, එහි වෙළෙඳපොල පැවැත්ම පුළුල් කිරීම සහ ගනුදෙනුකරුවන්ගේ සහ ප්‍රජාවන්ගේ වෙනස්වන අවශ්‍යතා සපුරාලන නව්‍ය විසඳුම් ලබා දීමෙහිලා ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. අපගේ ව්‍යාපාරික හවුල්කරුවන්ට අනුරූප බැංකු, විදේශ විනිමය හුවමාරු සමාගම්, බාහිරින් සේවා සපයන්නන් සහ වෙනත් සැපයුම්කරුවන් ඇතුළත් වේ.

සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය

වටිනාකම නිර්මාණය කිරීමේ මූලිකාංග

- සහයෝගිතාවන් තුළින් නව ව්‍යාපාර අවස්ථා ඇති කිරීම.
- ගෝලීය සලකුණුවලට අනුගතව විනිවිද සහ තිරසාර ප්‍රසම්පාදන ව්‍යවහාර තවදුරටත් පවත්වා ගැනීම.
- අවධානයට ලක් නොවූ ජනවිකාශ අතර පුළුල් ලඟාවීම නිර්මාණය කරන උපායමාර්ගික සන්ධාන ගොඩ නැගීම.
- වෙළෙන්දන් කළමනාකරණය සඳහා තාක්ෂණික ඒකාබද්ධ කිරීම.

ව්‍යාපාර හවුල්කාර වටිනාකම නිර්මාණ මූලිකාංග



රූපය 22 →

වගකීම්සහගත ප්‍රසම්පාදනය

GRI 204-1

බැංකුව සිය සැපයුම් දාමය පුරා සදාචාරාත්මක මූලාශ්‍ර, තිරසාරභාවය සහ විනිවිදභාවය ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගත් දැඩි මූලධර්ම සහ ව්‍යවහාර රාශියක් පිළිපදිනු ලැබේ. අපගේ ප්‍රසම්පාදන තීරණවලට සැලකිය යුතු සමාජ, පාරිසරික සහ ආර්ථික බලපෑම් ඇති කළ හැකි බව අපි හඳුනා ගනිමු. එබැවින්, ප්‍රසම්පාදන ක්‍රියාවලියේ සෑම අදියරකටම වගකීම්සහගත ව්‍යවහාර ඒකාබද්ධ කිරීමට අපි උත්සාහ කරමු.

ව්‍යාපාරික හවුල්කරුවන් සමඟ සිය සහභාගිත්ව ක්‍රියාවලියේ දී, බැංකුව තිරසාර සැපයුම් දාමයක් සාර්ථකව ස්ථාපිත කරන ලද අතර, එය ගුණාත්මකභාවය, සේවාව සහ ආචාර ධර්ම පිළිබඳ ඉහළම ප්‍රමිතීන් ආරක්ෂා කරන ප්‍රසම්පාදන ක්‍රියාවලියක් මගින් තහවුරු කර ඇත.

අදාළ කාලසීමාව තුල, අපගේ දැඩි ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටි තුළින් පහත දෑ ලබාගැනීමට අපි සමත් වීමු.

- ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ ආර්ථික වටිනාකම සහ කාර්යක්ෂමතාව උපරිම කිරීම.
- නියමිත ප්‍රමිති, පිරිවිතර. නියමයන් හා රෙගුලාසිවලට අනුකූල වන අතරම ශ්‍රී ලංකා රජය විසින් දක්වා ඇති ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට සියලුම සැපයුම්කරුවන් අනුකූල බව සහතික කිරීම.
- ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ සහභාගිවීමට උනන්දුවක් දක්වන සියලු පාර්ශ්වයන් සඳහා සාධාරණ සහ සමාන අවස්ථා සහතික කිරීම.
- භාණ්ඩ හා සේවා කඩිනමින් බෙදාහැරීම ක්‍රියාත්මක කිරීම සහතික කිරීම.
- ලංසුකරු ලබාදෙන තොරතුරුවල රහස්‍යතාව රඳවා ගනිමින් විනිවිද ආකාරයකින් සැපයුම්කරුවන් අගය කිරීම සහ තෝරා ගැනීම පැවත්වීම.

බැංකුවේ විවිධ ප්‍රසම්පාදන අවශ්‍යතා සඳහා විශේෂ ක්‍රියාපටිපාටි බැංකුවේ ප්‍රසම්පාදන ප්‍රතිපත්තියේ පැහැදිලිව දක්වා ඇත. බැංකුවේ සැපයුම් අංශය ප්‍රසම්පාදනය කරගෙන යන අතර, නම්කළ ප්‍රසම්පාදන කමිටු විසින් පාලනය සිදු කෙරේ, මෙයට අධ්‍යක්ෂ මණ්ඩලය, සාමාන්‍යාධිකාරී හෝ ප්‍රධාන විධායක නිලධාරී හෝ බලය පවරන බලධාරියා විසින් පත්කළ තාක්ෂණික ඇගයීම් කමිටුව සහ ලංසු විවෘත කිරීමේ කමිටුව ඇතුළත්ය. සැපයුම් අංශය මූලික පාරිසරික පරීක්ෂණ (IEE), පාරිසරික බලපෑම් තක්සේරු කිරීම් (EIA) සමඟ අනුකූලතාව සහතික කරන අතර, අවශ්‍ය අවස්ථාවේදි බලධාරීන්ගෙන් අවශ්‍ය අනුමැතීන් ලබාගනී. අපගේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළට ආර්ථික, සමාජීය, සහ පාරිසරික ප්‍රතිඵලයන් ඒකාබද්ධ කරන අතර, අනෙකුත් නිර්ණායක සේවා සහ නිෂ්පාදනවල තත්ත්වය, තරඟකාරී මිලගණන්, පළපුරුද්ද, මූල්‍ය ස්ථාවරත්වය, නම්‍යතාව, හැකියාව සහ නෛතික අනුකූලතාව ආවරණය කෙරේ.

තාක්ෂණය භාවිතා කරමින්, වසර තුළ බැංකුව කාර්යක්ෂමතාව වැඩි කිරීම සහ මෙහෙයුම් ක්‍රමවත් කිරීමේ පරමාර්ථය ඇතිව ප්‍රසම්පාදන ඉන්වොයිස් සහ ගෙවීම් ක්‍රියාවලිය සඳහා ඩිජිටල් මෙවලමක් වනත Oracle fusion ක්‍රියාත්මක කරන ලදී.

බැංකුවේ සන්නිවේදන ප්‍රතිපත්තිය මගින් සියලුම ව්‍යාපාර හවුල්කරුවන්ට අදාළ වන බාහිර සන්නිවේදන ප්‍රතිපත්තිය පැහැදිලි කරයි. ව්‍යාපාර හවුල්කරුවන් සමඟ අපගේ මැදිහත්වීම් විනිවිදව, වගවීමෙන්, සහ අනුකූල ආකාරයෙන් හසුරුවනු ලැබේ.


2023 දී, රු.බි. 1.6ක මුළු ප්‍රසම්පාදන වියදමක් කරමින් දේශීය සැපයුම්කරුවන්ගෙන් සියලුම භාණ්ඩ හා සේවා ලබා ගැනීම සඳහා බැංකුවේ බැඳීම පවත්වාගෙන ඇත. ඊට අමතරව, 2023 දී බැංකුවේ වෙනස්වන අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීමට අපගේ ප්‍රසම්පාදන සැලැස්ම අපි වාර්ෂිකව යාවත් කළෙමු.

බාහිරින් ලබාගැනීම තුළින් මෙහෙයුම් ක්‍රමවත් කිරීම

මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ උපායමාර්ගික අවධානය වැඩි කිරීම සඳහා බාහිරින් ලබාගැනීමේ පුළුල් උපාය මාර්ග යක් බැංකුව අනුගමනය කර ඇත. බාහිර විශේෂඥතාවයන් සහ විශේෂිත සම්පත් වෙත පිවිසීමෙන්, බැංකුව සිය මෙහෙයුම් විධිමත් කිරීම සහ සමස්ත කාර්ය සාධනය වර්ධනය කිරීම අරමුණු කරයි. සූක්ෂම විකුණුම්කරුවන් තෝරා ගැනීම සහ හවුල්කාරිත්වයන් හරහා, බාහිරින් ලබාගන්නා කාර්යයන් ආයතනික අරමුණු සමග පෙළ ගස්වන අතර ගුණාත්මක හා අනුකූලතාවයේ උසස් ප්‍රමිතීන්ට අනුකූලව තබා ඇත. මෙම උපායමාර්ගය බාහිරින් ලබා ගැනීමේ හවුල්කරුවන් විසින් පිරිනමනු ලබන නම්‍යශීලී බව, පරිමාණය සහ පිරිවැය-ඵලදායිතාවය භාවිතා කරන අතරම, මූලික නිපුණතා සඳහා අභ්‍යන්තර සම්පත් වෙන් කිරීමට බැංකුවට හැකියාව ඇති කරයි. දැඩි නියාමනය සහ ඇගයීම් ක්‍රියාවලීන් වගවීම, අවදානම් අවම කිරීම, සහ බාහිරින් ලබාගැනීමේ කටයුතුවල අඛණ්ඩ වැඩිදියුණු කිරීම් සහතික කරයි.

පසුගිය වසර තුළ, බාහිර සේවා සපයන්නන් වෙත රු. මිලියන 486ක් අපි වියදම් කළෙමු. බැංකුවේ බාහිරින් ලබා ගැනීමේ ප්‍රතිපත්තිය බාහිරින් ලබාගැනීමේ කටයුතු සේවා, ක්‍රියාවලිවල අවශ්‍යතාව හෝ කාර්යයන් මෙන්ම ඒවායේ ක්‍රියාත්මකවීම ඇගයීම සඳහා පැහැදිලි මාර්ගෝපදේශ පිරිනමයි.

සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය



කර්මාන්ත සහයෝගීතාව

කර්මාන්ත සහයෝගීතාව පෝෂණය කිරීමේදී, පොදු අභියෝගවලට මුහුණ දීම, මනා පරිචයන් හුවමාරු කරගැනීම සහ වර්ධනය සහ සංවර්ධන අවස්ථා ගවේෂණය කිරීම සඳහා උපාය මාර්ගික සන්ධාන, කර්මාන්ත සංසද සහ සහයෝගීතා මූලපිරීම් හරහා බැංකුවේ ප්‍රධාන පාර්ශ්වකරුවන් සහ හවුල්කරුවන් සමඟ ක්‍රියාකාරීව සම්බන්ධ වේ. නියාමන ආයතන, කර්මාන්ත සංගම් සහ තරඟකාරී ආයතන සමඟ සමීපව කටයුතු කිරීමෙන්, මූල්‍ය ක්ෂේත්‍රය තුළ ස්ථාවරත්වය, විනිවිදභාවය සහ අඛණ්ඩතාව ප්‍රවර්ධනය කරන කර්මාන්ත ප්‍රමිතීන්, රෙගුලාසි සහ ප්‍රතිපත්තිවල දියුණුවට බැංකුව දායක වේ. ඊට අමතරව, කර්මාන්තයේ සිදුවීම්, සම්මන්ත්‍රණ සහ ක්‍රියාකාරී කණ්ඩායම්වල අපගේ සහභාගිත්වය ක්ෂේත්‍රයේ තරඟකරුවන් සමඟ දැනුම, තීක්ෂ්ණ බුද්ධිය සහ ප්‍රවීණත්වය හුවමාරු කර ගැනීමට අපට ඉඩ සලසන අතර, නැගී එන ප්‍රවණතා, තාක්ෂණයන්, සහ වෙළෙඳපොල වර්ධනයන් වෙත යාවත්කාලීනව සිටීමට අපට හැකියාව ඇති කරයි.

ක්ෂේත්‍රයේ අභියෝග විසඳීමට සහ උපකාරී මෙහෙයුම් පරිසරයක් නිර්මාණය කිරීමට බැංකුව පහත සඳහන් ආයතනවල සාමාජිකත්වයන් දරයි:

- ජාතික වාණිජ මණ්ඩලය
- ලංකා ක්ලියර් පුද්ගලික සමාගම
- ලංකා හාම්පුතුන්ගේ සංගමය
- වර්ල්ඩ් වයිඩ් ඉන්ටර් බැන්ක් ෆිනැන්සියල් ටෙලිකොම්නිකේෂන් (SWIFT) සමාජය
- ශ්‍රී ලංකා SWIFT පරිශීලක සමාජය
- Eurogiro ගෝලීය ගෙවීම් ප්‍රජාව
- ලෝක ඉතුරුම් බැංකුකරණ ආයතනය

ඉදිරි ගමන්මඟ

- ව්‍යාපාරික හවුල්කරුවන් සමඟ ශක්තිමත් සබඳතා ගොඩනඟා ගැනීමට සහ පවත්වා ගැනීමට අඛණ්ඩව ප්‍රමුඛත්වය දීම.
- අපගේ සියලු මැදහත්වීම්වලදී නියාමන අවශ්‍යතා සහ සදාචාරාත්මක ව්‍යවහාර අඛණ්ඩව පිළිපැදීම.
- ව්‍යාපාරික හවුල්කරුවන්ගේ වෙනස්වන අවශ්‍යතා සපුරාලීම සඳහා නම්‍යශීලීව සහ පිළිගත හැකිව සිටීම

3 GRI 205-2

නියාමන ප්‍රාග්ධනය
ස්ථාවරත්වය ආරක්ෂා කිරීම, වර්ධනය පෝෂණය කිරීම

නියාමන ප්‍රාග්ධනය යන්නෙන් බැංකුව එහි නියාමන අධිකාරීන් විසින් නියම කර ඇති පරිදි පවත්වාගෙන යා යුතු මූල්‍ය වත්කම් නියෝජනය කරයි.

එය පහත දැ ඇතුළුව අරමුණු කිහිපයක් සඳහා සේවය කරයි:

- අවදානම් අවම කිරීම
- අලාභ දරා ගැනීම
- පාර්ශවකාර විශ්වාසය පෝෂණය කිරීම
- වත්කම් වර්ධනය කළමනාකරණය
- ගනුදෙනුකරුවන් ආරක්ෂා කිරීම


මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය ආරක්ෂා කිරීමේ දී අපගේ අත්‍යවශ්‍ය කාර්යභාරය සැලකිල්ලට ගනිමින් නියාමකයින් සහ රාජ්‍ය ආයතන සමඟ ශක්තිමත්, ධනාත්මක සහ ප්‍රයෝජනවත් සබඳතා පවත්වා ගැනීම තීරණාත්මක ව පවතින බව අපි තේරුම් ගනිමු.

ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට තිරසාර සහ ධනාත්මක බලපෑමක් ඇති කිරීම සඳහා ව්‍යාපාරික ආචාර ධර්ම සහ මනා පරිචයන්ට අදාළ ජාතික හා ජාත්‍යන්තර ප්‍රමිතීන් යන දෙකටම අනුකූලව බැංකුව කඩිසරව ක්‍රියා කරයි.

වටිනාකම වැඩි කිරීමේ උපායමාර්ග

- නියාමන වෙනස්වීම් හඳුනාගැනීම, තක්සේරු කිරීම, සහ ප්‍රතිචාර දැක්වීමට යාන්ත්‍රණ ක්‍රියාත්මක කිරීම
- මෙහෙයුම් ප්‍රත්‍යාස්ථතාව ශක්තිමත් කිරීම
- පීඩන පරීක්ෂණ ප්‍රමිතීන් වැඩි දියුණු කිරීම
- බලපෑම් ඉවසීම සමාලෝචනය
- කාර්යසාධන ප්‍රමිති සියුම් ලෙස ගැලපීම
- ක්ෂේත්‍රයේ නියාමන මූලපිරීම්වල සහභාගිවීම (උපදේශන පත්‍රිනා)

වටිනාකම නිර්මාණය කිරීමේ මූලිකාංග



රූපය 23 →

සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය

රෙගුලාසි සමඟ ස්ථීර අනුකූලතාව

බැංකුව පහත රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල වේ.

- 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත සහ එහි සංශෝධන
- 1988 අංක 30 දරන බැංකු පනත සහ එහි සංශෝධන
- මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත
- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද විනිමය පාලන පනත සහ අනෙකුත් සියලුම රෙගුලාසි

බැංකුව පහත ආයතන සමඟ සමීප සම්බන්ධතා පවත්වාගනී:

- මුදල් අමාත්‍යාංශය
- දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
- විගණකාධිපති දෙපාර්තමේන්තුව
- නීතිපති දෙපාර්තමේන්තුව
- ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති අධීක්ෂණ මණ්ඩලය
- ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

ඊට අමතරව, මහ බැංකුව නිකුත් කරන ලද විධානයන්ට අනුකූලව බැංකුවේ මෙහෙයුම්වලට අදාළ කාලානුරූපී තොරතුරු ඉදිරිපත් කරයි.

මුදල් විශුද්ධිකරණය, අල්ලස සහ දූෂණ විරෝධය

GRI 205-3, 206-1

බැංකුව ඩිජිටල්කරණ යුගය තුළ ප්‍රධාන අවදානම් ක්ෂේත්‍ර තුන හඳුනාගෙන ඇත.

- සයිබර් ආරක්ෂාව
- වංචා වැලැක්වීම
- මුදල් විශුද්ධිකරණ විරෝධය

ගනුදෙනුකරුවන් වංචාවෙන් ආරක්ෂා කිරීම සඳහා සහ සැක කටයුතු හඳුනාගෙන වාර්තා කිරීම මඟින් සයිබර් අපරාධ, මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම වැළැක්වීම සඳහා නියාමකයින්ට සහයවීම සඳහා බැංකුව ශක්තිමත් අවදානම් කළමනාකරණ පද්ධතියක් ගොඩනගා ඇත.

2023 දී. දූෂණය, තරඟකාරී විරෝධී හැසිරීම්, විශ්වාස-විරෝධී, ඒකාධිකාරී භාවිතයන් සහ නිෂ්පාදන සහ සේවා භාවිතයට අදාළ නීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම හේතුවෙන් පනවන ලද දඩමුදල් හෝ මූල්‍ය නොවන සම්බාධක අවස්ථා ශූන්‍ය බව අපි වාර්තා කරමු.

ශක්තිමත් පාලනය හා විචක්ෂණ අවදානම් කළමනාකරණය

ශක්තිමත් පාලන මූලධර්ම පිළි පැදීමට සහ අවදානම් අවම කිරීමට, බැංකුව:

- කාන්දු නොවන පාලන පද්ධතියක් සහ දැඩි අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තියක් පවත්වාගනී.
- කෙටි හා මධ්‍ය කාලීන උපාය මාර්ගික ප්‍රමුඛතාවයක් ලෙස අවදානම් සංස්කෘතියක් ශක්තිමත් කරයි.
- අභ්‍යන්තර හා බාහිර පරිසරයෙන් පැන නගින අවදානම් ඵලදායී ලෙස අපේක්ෂා කරන, කළමනාකරණය කරන සහ අවම කරන ශක්තිමත් අවදානම් සංස්කෘතියක් ක්‍රියාවේ යොදවයි.

ශ්‍රී ලංකා රජයට දායකත්වය

බැංකුව අදාළ අවස්ථාවලදී පහත සඳහන් දායකත්වයන් සිදුකරයි:

- රජය වෙනුවෙන් බදු ගෙවීම සහ එකතු කිරීම
- අපගේ සේවකයින් වෙනුවෙන් සහ ඔවුන් සම්බන්ධයෙන් ගෙවිය යුතු සියලුම අදාළ බදු ගෙවීම
- රජයට සහ අනෙකුත් අදාළ නියාමන සහ ව්‍යවස්ථාපිත අධිකාරීන්ට ගෙවියයුතු අදාළ සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් සිදු කිරීම

ඉදිරි ගමන්මඟ

- අනපේක්ෂිත අලාභ සහ වෙළෙඳපොල උච්චාවචනයන් හැසිරවීමට නියාමන අවශ්‍යතාවන්ට ඉහළ ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාත අඛණ්ඩව නියාමනය කිරීම සහ පවත්වාගෙන යාම.
- අවදානම් අවස්ථා සහ ප්‍රතිඵල වඩා හොඳින් පුරෝකථනය කිරීමට උසස් විශ්ලේෂණ සහ මූල්‍ය තාක්ෂණය ක්‍රියාත්මක කිරීම
- අනුකූලතාව සහතික කිරීම සඳහා දේශීය හා ගෝලීය වශයෙන් නියාමන ප්‍රමිතීන් සහ රාමු වල වෙනස්වීම් සමඟ යාවත්කාලීනව සිටීම.
- නියාමකයින්, ආයෝජකයින් සහ අනෙකුත් පාර්ශ්වකරුවන් සමඟ විනිවිදභාවය සහතික කිරීම සඳහා මූල්‍ය වාර්තාකරණයේ ගුණාත්මකභාවය සහ වාර ගණන වැඩි දියුණු කිරීම.
- බැංකුවේ ප්‍රාග්ධනය කෙරෙහි අහිතකර ආර්ථික තත්ත්වයන්ගේ බලපෑම තක්සේරු කිරීම සඳහා පීඩන පරීක්ෂණ නීතිපතා පැවැත්වීම.

4

ප්‍රජා ප්‍රාග්ධනය: සම්බන්ධතා වර්ධනය කිරීම, ප්‍රජාවන් සවිබල ගැන්වීම

බැංකුව තුළ, අපගේ සාර්ථකත්වය ප්‍රජාවගේ යහපැවැත්ම සමඟ බද්ධ වී ඇති බව හඳුනා ගනිමින් අප ක්‍රියාත්මක වන ප්‍රජාවන් ශක්තිමත් කිරීමට දැඩි ලෙස කැපවී සිටිමු. මූල්‍ය අන්තර්කරණය සඳහා ආයෝජනය කිරීම, දේශීය මූලපිරීම්වලට සහාය වීම, සහ පාරිසරික වගකීමට ප්‍රමුඛත්වය දීම මඟින්, අපි සැමට වඩාත් සමෘද්ධිමත් සහ තිරසාර අනාගතයක් ගොඩනැගීමට දායක වෙමු.

එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අරමුණු (UN SDGs), සමඟ පෙලගැසී, බැංකුව කල් පවත්නා සමාජ බලපෑමක් ඇති කිරීම අරමුණු කරගත් ප්‍රජා මුල්පිරීම් සැලසුම් කර ක්‍රියාත්මක කරයි. අපගේ අරමුණ සහ සන්නාමය සමඟ ඔවුන්ගේ පෙළගැස්ම මත පදනම්ව විවිධ පරාසයක බාහිර සංවිධාන වෙත අපගේ සහය දිගු කරන්නෙමු. මේ අතර, අපගේ දායකත්වය මූලික වශයෙන් අවශ්‍ය පරිදි අපගේ අංශයේ ප්‍රවීණතාවයෙන් පරිපූරණය කරන ලද මූල්‍ය සහය පිළිබඳ ස්වරූපය ගනී. බැංකුව සිය ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතිවල සඵලතාවය සහ බලපෑම නිරීක්ෂණය කිරීමේදී පරීක්ෂාකාරීව සිටියි.


වටිනාකම වැඩි කිරීමේ උපායමාර්ග

- ජනහිතකාමී වැඩසටහන් සහ ආයෝජන සඳහා සමාජ, ආර්ථික සහ පාරිසරික සාධක සලකා බැලීම.
- ප්‍රජා ව්‍යාපෘතිවල ස්වේච්ඡාවෙන් කටයුතු කිරීමට සහ ආරම්භ කිරීමට සේවකයන් දිරිමත් කිරීම සහ දිරි ගැන්වීම.
- සුළු ජාතීන්, බැංකු රහිත, බැංකු අඩුවෙන් ඇති සහ අඩුවෙන් සේවය ලත් කණ්ඩායම් කෙරෙහි ඉහළ අවධානය යොමු කිරීම.
- මෙහෙයුමේ දේශීය ප්‍රජාවන් තුළ පුරවැසි සහභාගිත්වය ඉහළ නැංවීම.

සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය

වටිනාකම නිර්මාණය කිරීමේ මූලිකාංග

GRI 413-1



රූපය 24 →

ජාතික ප්‍රගතිය ඉදිරියට ගෙන යාමට උපායමාර්ගික හවුල්කාරත්වයන් ස්ථාපිත කිරීම

UN SD අරමුණු සමඟ සහයෝගී ප්‍රයත්නයන් පෙළගස්වා ගැනීමෙන්, අපගේ සමාජය සහ මිහිතලය මුහුණ දෙන වඩාත්ම දැවෙන අභියෝගවලට විසඳුම් සෙවීමට දායක විය හැකි බව බැංකුව විශ්වාස කරයි.

තරුණ තරුණියන් අතර ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය ප්‍රවර්ධනය කිරීම සඳහා, අධ්‍යාපන අමාත්‍යාංශය ජාතික ඉතිරිකිරීමේ බැංකුව සමඟ සහයෝගයෙන් පාසල්වල ඉගැන්වෙන ඉංග්‍රීසි භාෂා කුසලතා වැඩි දියුණු කිරීම සඳහා රටපුරා වැඩසටහනක් ආරම්භ කර ඇත.

පාරිසරික තිරසාරභාවයට සහයවීම

ප්‍රජා සංවර්ධනයේ දී ස්වභාවික ප්‍රාග්ධනයේ වැදගත්කම හඳුනා ගනිමින්, බැංකුව පාරිසරික තිරසාරත්වය සඳහා කැපවී සිටී. ස්වභාවික සම්පත් සංරක්ෂණය කිරීම, දේශගුණික විපර්යාස බලපෑම් අවම කිරීම සහ පරිසරය ආරක්ෂා කිරීම සඳහා පරිසර හිතකාමී ව්‍යවහාර සහ මූලපිරීම් බැංකුව ප්‍රවර්ධනය කරයි.

2023 දී, 99 වැනි ලෝක සකසුරුවම් දිනය සැමරීම සඳහා සහ සිංහල හා හින්දු අලුත් අවුරුදු ගනුදෙනු සඳහා ශාඛා වෙත පැමිණෙන ගනුදෙනුකරුවන්ට පැල බෙදා හැරීමේ ජාතික වැඩසටහනකට බැංකුවේ සියළුම ශාඛා සහභාගි විය.

මූල්‍ය අන්තර්කරණය

බැංකුව තුළ, මූල්‍ය සේවා කරා පිවිසීම පුද්ගලයන් සවිබලගන්වන, ආර්ථික වර්ධනය ඇති කරන, සහ සමාජ සංවර්ධනය පෝෂණය කරන මූලික අයිතියක් බව අපි හඳුනා ගනිමු.

ගනුදෙනුකාර – කේන්ද්‍රීය ප්‍රවේශය

බැංකුව එහි ගනුදෙනුකරුවන්ගේ විවිධ මූල්‍ය අවශ්‍යතා අවබෝධ කරගෙන සපුරාලීම සඳහා කැප වී සිටින අතර ඒ සඳහා විවිධ සමාජීය අංශවල විවිධ අවශ්‍යතාවන් සැපයීමට ගලපනලද විවිධ නිෂ්පාදන සහ සේවා රාශියක් පිරි නමයි. ගනුදෙනුකරුවන් මෙහෙයුම්වල කේන්ද්‍රයේ තබමින්, බැංකුව සිය සේවා ආදායම් මට්ටම හෝ භූගෝලීය ස්ථානය නොසලකා ප්‍රවේශවිය හැකි, දැරිය හැකි සහ සෑමට අදාළ බව සහතික කරයි.

බැංකුවේ ගනුදෙනුකාර-කේන්ද්‍රීය ප්‍රවේශය පිළිබඳ වැඩි විස්තර සඳහා, කරුණාකර මෙම වාර්ෂික වාර්තාවේ ගනුදෙනුකාර ප්‍රාග්ධනය පිළිබඳව 139 සිට 141 දක්වා පිටු බලන්න.

අවසාන-සැතපුම් සම්බන්ධතාව

පුළුල්ව පැතිරුණු අන්තර්කරණය සඳහා මූල්‍ය සේවාවල සම්පත්වය තීරණාත්මක බව අපි විශ්වාස කරමු. මේ අන්තයෙන් බැලීමේදී, බැංකුව අපගේ ශාඛා ජාලය පුළුල් කිරීම තුළ සහ නියෝජිත බැංකුකරණය සහ ජංගම බැංකුකරණය වැනි නව්‍යකරණ බෙදාහැරීමේ මාර්ග සේවයේ යෙදවීම තුළ ආයෝජනය කර ඇත. සේවය නොලත් ප්‍රජාවන් වෙතබැංකුවේ බැංකු සේවා වඩා සමීප කරමින්, බැංකුව ප්‍රවේශය කරා බාධාවන් බිඳ හෙලමින් සහ විධිමත් මූල්‍ය පද්ධතිය තුළ සහභාගි වීමට පුද්ගලයින් සවිබල ගන්වමින් සිටී.

බැංකුවේ ගනුදෙනුකාර-කේන්ද්‍රීය ප්‍රවේශය පිළිබඳ වැඩි විස්තර සඳහා, කරුණාකර මෙම වාර්ෂික වාර්තාවේ නිෂ්පාදිත ප්‍රාග්ධනය පිළිබඳව 112 සිට 117 දක්වා පිටු බලන්න.

මූල්‍ය සාක්ෂරතාව සහ අධ්‍යාපනය

මූල්‍ය සේවා සඳහා ප්‍රවේශය පමණක් ප්‍රමාණවත් නොවන බවත්, ඒවා ඵලදායී ආකාරයෙන් භාවිතා කිරීමට ඔවුන්ට දැනුම සහ කුසලතා තිබිය යුතු බවත් බැංකුව හඳුනා ගනී. ඒ අනුව, බැංකුව ගනුදෙනුකරුවන්ගේ අනාගතය සහ පවුල් වර්ධනය කිරීමට දැනුවත් මූල්‍ය තීරණ ගැනීමට අවශ්‍ය මෙවලම් සහ සම්පත් සමඟ ගනුදෙනුකරුවන් පරිපූර්ණ කිරීමට ඉලක්කගත මුල්පිරීම් සහ සමාජීය බලපෑම්සහගත වැඩසටහන් තුළින් මූල්‍ය සාක්ෂරතාව සහ අධ්‍යාපනය ප්‍රවර්ධනය කරමින් සිටී. 2023 දී, බැංකුව පුළුල් සහභාගිවූවන් කොටසක් වෙත ලබාදීමට සියලුම සමාජ මාධ්‍ය අවකාශ තුළින් මූල්‍ය සාක්ෂරතා වැඩසටහන් රාශියක් පවත්වන ලදී.

ඩිජිටල් නවෝත්පානය

බැංකුව තාක්ෂණික සාක්ෂරතා මට්ටම් නොසලකා, බැංකුකරණය සඳහා සම්ප්‍රධායික බාධා ජයගත හැකි සහ පහසු, පරිශීලක-හිතකාමී අත්දැකීම් ලබාදිය හැකි මාර්ගගත ගිණුම් විවෘත කිරීම සඳහා ජංගම බැංකුකරණ යෙදුම් පරාශයක් තුළින් ගනුදෙනුකරුවන් සඳහා පිවිසීමේ හැකියාව, කාර්යක්ෂමතාව, සහ පහසුව වැඩි කිරීම සඳහා ඩිජිටල් නවොත්පාදනවල බලය බැංකුව ශක්තිමත් කර ඇත.
බැංකුවේ ගනුදෙනුකාර-කේන්ද්‍රීය ප්‍රවේශය පිළිබඳ වැඩි විස්තර සඳහා, කරුණාකර මෙම වාර්ෂික වාර්තාවේ බුද්ධිමය ප්‍රාග්ධනය පිළිබඳව 118 සිට 123 දක්වා පිටු බලන්න.

ඉදිරි ගමන්මඟ

- කාරණයට-අදාළ අලෙවිකරණ වැඩසටහන් ගවේෂණය කරමින් සම්ප්‍රදායික අනුග්‍රහකත්වයෙන් ඔබ්බට විතැන්වීම කෙරෙහි අවධානය යොමු කිරීම, විශාල බලපෑම සඳහා සහ තරුණ ජනවිකාශ සහභාගි කරවීමට සමාජ මාධ්‍ය භාවිතය.
- බැංකුව සේවය කරන ප්‍රජාවන් තුළ මතුවන සමාජ හා පාරිසරිකමය අභියෝග හඳුනාගෙන විසඳීම සඳහා දත්ත විශ්ලේෂණ භාවිතා කිරීම.
- "gig ආර්ථිකය" යේ අවශ්‍යතා සඳහා ගලපන ලද මූල්‍ය නිෂ්පාදන සහ සේවා සංවර්ධනය කිරීම සහ සේවක රටාවන් වෙනස් කිරීම.
- මූල්‍ය යහපත්, පාරිසරික තිරසාරභාවය, සහ මූල්‍යකරණය තුළ සදාචාර කෘතිම බුද්ධිය වැනි ගැටළු පිළිබඳ සංකල්පිත නායකයෙක් ලෙස බැංකුව ස්ථානගත කිරීම
- තිරසාරභාවය සහ සමාජීය වගකීම ප්‍රමුඛ කරන ගනුදෙනුකරුවන් සහ ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීමට ESG ව්‍යවහාරවල නායකත්වය ප්‍රදර්ශනය කිරීම.

GRI 201-2

ස්වාභාවික ප්‍රාග්ධනය


බැංකුවේ පාරිසරික භාරකාරත්වය



වටිනාකම පරිනාමනය

- පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා ණය ලබාදීම සහ ශක්තිමත් පරිසර කාර්යසාධන වාර්තා සහිත ව්‍යාපාරවලට ප්‍රමුඛතාවය.
- බලශක්ති-කාර්යක්ෂම ගොඩනැගිලි වැඩි කිරීම, ඩිජිටල් පරිනාමය තුළින් කඩදාසි භාවිතය අඩු කිරීම, සහ සැපයුම් දාම කළමනාකරණය සඳහා ධරජකැ Fusion ක්‍රියාත්මක කිරීම මඟින් හරිත ප්‍රසම්පාදන ප්‍රතිපත්ති යොදා ගැනීම (SCM).
- කාලගුණ විපර්යාස සහ පාරිසරික හායනය හා බැඳුණු අවදානම් අවම කිරීමට ණයගැතියන්ගේ පාරිසරික බලපෑම් සහ තිරසාරතා ව්‍යවහාර ඇගයීම
- ගෝලීය වාර්තාකරණ ප්‍රවේශය (GRI) යොදා ගැනීම

ප්‍රධාන යෙදවුම්



ප්‍රධාන නිමැවුම්

අඩු කාබන් ආර්ථිකයට සහයවීම

ශුද්ධ මීටර්කරණයට සම්බන්ධ ශාඛා	ජාතික පද්ධතියට මාරුකිරීම
45	කි.වොට් 461,584 (2022 – කි.වොට් 344,347)

වගකිම්සහගත පරිභෝජනය

එක් සේවකයෙකුට බලශක්ති පරිභෝජනය෧	එක් ශාඛාවකට බලශක්ති පරිභෝජනය*	ජල පරිභෝජනය
6.81 GJ (2022 – 6.02 GJ)	113.35 GJ (2022 – 104.03 GJ)	73,895 m3 (2022 – 70,430 m3)

* විදුලි පරිභෝජනය පමණක් සැලකිල්ලට ගෙන ඇත.

බැංකුව සඳහා ස්වාභාවික ප්‍රාග්ධයෙන් අදහස් කරන දෑ

ස්වාභාවික ප්‍රාග්ධනය භූ විද්‍යාව, පස, වායුව, ජලය සහ ජීවිතයේ සෑම ආකාරයක්ම ඇතුළත්වන ස්වාභාවික සම්පත්වල ගෝලීය තොගයෙන් සමන්විත වේ. මෙවැනි සම්පත් ආයතන සඳහා අත්‍යවශ්‍ය යෙදවුම් ලෙස සේවය කරන අතර ස්වාභාවික සම්පත් යෙදවුම් සහ පාරිසරික සේවා ලබාදෙමින් ආර්ථික නිෂ්පාදනයට දායක වේ.

වටිනාකම නිර්මාණයට සමාජ හා ස්වාභාවික ප්‍රාග්ධනය සහයවන ආකාරය

ස්වාභාවික සම්පත් සහ පරිසර පද්ධතිවල නෛසර්ගික වටිනාකම හඳුනා ගනිමින්, බැංකුව ස්වාභාවික ප්‍රාග්ධන ප්‍රතිෂ්ඨාවන් සිය ව්‍යාපාර උපායමාර්ගයට සහ තීරණ ගැනීමේ ක්‍රියාවලීන්ට ඒකාබද්ධ කරයි. තිරසාර වටිනාකම් නිර්මාණය සඳහා ස්වභාවික ප්‍රාග්ධනය අපි භාවිතා කරන බැවින්. ඉදිරි පරම්පරාව සඳහා රටේ වටිනා සම්පත් සුරක්ෂිත කිරීමට අපි කැප වී සිටිමු.

ස්වාභාවික ප්‍රාග්ධනය

2023 දී ප්‍රධාන අභියෝග

- ස්වාභාවික ප්‍රාග්ධනය හා හරිත ව්‍යාපෘති කළමනාකරණයේ වැදගත්කම පිළිබඳ පාර්ශ්වකරුවන් දැනුවත් කිරීම.
- වඩා ඉහළ ආයෝජනය අවශ්‍යවන හරිත වැඩසටහන්.
- බැංකුවේ පාරිසරික බලපෑම මැනීමේ දුෂ්කරතා.
- බැංකුවේ කාබන් පාසටහන අඩුකිරීම පසුපස සංකීර්ණතා.

2023 දී ප්‍රධාන අවස්ථා

- හරිත නිෂ්පාදන, හරිත මූල්‍ය, සහ හරිත ගොඩනැගිලි වැනි හරිත වැඩසටහන් ප්‍රවර්ධනයට හැකිවීම
- බැංකුවේ දිගුකාලීන තිරසාරභාවය පවත්වා ගැනීමේ අවශ්‍යතාව පාරිසරික පාසටහන අවම කිරීමට හේතු ලබා දේ.
- පූර්ව සැලසුම්කරණය මෙහෙයුම්වල වඩා අඩු පාරිසරික බලපෑම්වලට ඉඩ ලබා දේ.
- සම්පත් කාර්යක්ෂමව භාවිතය අඩු පිරිවැයට හා ශක්තිමත් මූල්‍ය ස්ථාවරත්වයට හේතු වේ.

තීරණාත්මක සාර්ථකත්ව සාධක/උපායමාර්ගික මූලිකාංග

- ශක්තිමත් පාරිසරික සහ සමාජ පාලන (ESG) රාමුවක් සංවර්ධනය කිරීම.
- ආයතනික පාලන ව්‍යුහයට තිරසාරභාවය ඇතුළත් කර ගැනීම.
- වර්තමාන පාරිසරික අභියෝග සහ ප්‍රමිති පිළිබිඹු කිරීමට නිරන්තරව තිරසාර ප්‍රතිපත්ති යාවත් කිරීම, සහ මෙම ප්‍රතිපත්ති බැංකුවේ සැම මට්ටමකම ක්‍රියාත්මක කරන බව සහතික කිරීම.
- දේශීය පාරිසරික වැඩසටහන්, සංරක්ෂණ ව්‍යාපෘති, සහ තිරසාර අධ්‍යාපනික වැඩසටහන්වලට සහය දීම.

අපගේ ස්වාභාවික ප්‍රාග්ධනය අප වර්ධනය කරන ආකාරය

- බැංකුකරණය කරා අපගේ ප්‍රවේශය තුළ පරිසර-හිතකාමී ගොඩනැගිලි සහ ඵලදායී සම්පත් කළමනාකරණය පිළිබඳ සංකල්පය වැළඳ ගැනීම.
- වගකීම්සහගත පරිභෝජනය ප්‍රවර්ධනය කිරීම.
- සමස්ථයක් ලෙස පරිසරය සහ සමාජය කෙරෙහි සෘණාත්මක බලපෑම අඩු කිරීමට අපගේ ණය ව්‍යාහාරවලට තිරසාර මූල්‍යකරණය ඇතුළත් කිරීම.

ප්‍රතිඵල කළමනාකරණය කිරීමේ ප්‍රවේශ

- **අපද්‍රව්‍ය කළමනාකරණය** – වර්ධිත අපජල සහ කැලිකසල පද්ධතියක් ස්ථාපනය සහ අපද්‍රව්‍ය වෙන් කිරීමේ ව්‍යවහාර ප්‍රවර්ධනය කිරීම.
- **කඩදාසි පරිභෝජනය අඩු කිරීම** – කඩදාසි භාවිතය සුරැකීම සඳහා ඩිජිටල් බැංකු ක්‍රම විවර්තන කිරීම.
- **බලශක්ති පරිභෝජනය** – ජාතික පද්ධතිය තුළින් විදුලිය පරිභෝජනය කිරීමට විරුද්ධව සූර්ය බලය උත්පාදනය වැඩි කිරීම.

අපගේ ස්වාභාවික ප්‍රාග්ධනය භාවිතා කරන ආකාරය

මූල්‍ය ප්‍රාග්ධනය
පුනර්ජනනීය බලශක්තිය හා තිරසාර මූලපිරිමිවල ආයෝජනය දිගුකාලීනව පිරිවැය අවම කරයි. හරිත මූල්‍යකරණය තුළ වඩා ඉහළ වෙළෙඳපොල කොටස දිගුකාලීනව ආදායම සහ ලාභ ඉලක්ක කරා ගමන් කිරීමට සහයවනු ඇත.

නිෂ්පාදිත ප්‍රාග්ධනය
සම්ප්‍රදායික බැංකුකරණ ආකෘති යාවත්/ප්‍රතිෂ්ඨාපනය කිරීමට නව්‍යකරණ නව විසඳුම් හඳුන්වාදීමට අවස්ථා ලබා දේ. තිරසාර ගොඩනැගිලි සහ පුනර්ජනනීය බලශක්තිය තුළ ආයෝජනය බැංකුවේ භෞතික සම්පත් ශක්තිමත් කරයි.

බුද්ධිමය ප්‍රාග්ධනය
තිරසාර මෙහෙයුම් ප්‍රමුඛ කරන බැංකුවක් ලෙස බැංකුවේ කීර්තිනාමය වැඩි කරයි. හරිත වැඩසටහන් සන්නාම ප්‍රතිරූපය ශක්තිමත් කර බැංකුවට දෘශ්‍යතාව ලබා දේ.

මානව ප්‍රාග්ධනය
තිරසාරභාවය හා හරිත දැනුවත්කම ප්‍රවර්ධනය යහපත් සේවා ස්ථානයක් සහ වඩා පුළුල් දැනුමක් සහිත පරිසරයක් නිර්මාණය කරයි.

සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය
සැපයුම්කරුවන් සමඟ දිගුකාලීන සම්බන්ධතා පවත්වා ගනිමින් තිරසාර වටිනාකම් දාම නිර්මාණය කිරීම.

පාර්ශ්වකරුවන් සඳහා නිර්මාණය කළ වටිනාකම

කොටස්හිමියන්/ආයෝජකයින්
පාරිසරිකමය අවදානම් සක්‍රීයව කළමනාකරණය කිරීම මගින් පාරිසරික අලාභය හෝ නියාමන අනුකූල නොවීම හා බැඳුණු වියහැකි මූල්‍ය අලාභවලින් බැංකුව ආරක්ෂා කරන අතර මෙය ආයෝජන බැඳියාවන් සුරක්ෂිත කරයි..

සේවකයින්
හරිත කාර්යාල ව්‍යවහාර සහ බලශක්ති කාර්යක්ෂමතාව, අපද්‍රව්‍ය අඩු කිරීම, සහ යහපත් සේවා පරිසරයක් ප්‍රමුඛ කරන ගොඩනැගිලි සේවක යහපැවැත්ම සහ ඵලදායිතාව වැඩි කරයි.

ව්‍යාපාර හවුල්කරුවන්
පාරිසරික තිරසාරභාවය ප්‍රවර්ධනය අවදානම් අඩුකර කීර්තිනාමය සහ දිගු--කාලීන ඔරොත්තුදීම වැඩි කරයි..

ගනුදෙනුකරුවන්
හරිත මූල්‍ය නිෂ්පාදන පිරිනැමීම ධනාත්මක පාරිසරික බලපෑමක් ප්‍රවර්ධනය කරමින් පරිසර හිතකාමී ව්‍යාපෘතිවල ආයෝජනය කිරීමට ගනුදෙනුකරුවන් දිරිමත් කරයි.

නියාමකයින් සහ රජයේ ආයතන
පාරිසරික රෙගුලාසිවලට අනුකූලතාව සහ තිරසාර ව්‍යවහාරවලට ණය දීම නියාමන අවදානම් අඩු කරයි.

සමාජය හා පරිසරය
රුක් රෝපනය, හෝ පිරිසිදු කිරීමේ ව්‍යාපාර වැනි දේශීය පාරිසරික ව්‍යාපෘතිවල සහභාගිවීම සහ සහයදීම සෘජුවම දේශීය පරිසරික සහ ප්‍රජා යහ පැවැත්මට ප්‍රතිලාභ අත්කරයි.

ස්වාභාවික ප්‍රාග්ධනය

UN තිරසාර සංවර්ධන අරමුණු (UN SDGs) සඳහා දායකත්වය

මූලික UN SDGs අරමුණු

7 AFFORDABLE AND CLEAN ENERGY

දූරියහැකි හා පිරිසිදු බලශක්තිය උත්පාදනයට හරිත ගොඩනැගිලි හා සූර්ය බලශක්ති ශාඛා ඉදිකිරීම.

11 SUSTAINABLE CITIES AND COMMUNITIES

පාරිසරික හිතකාමී අවකාශ අත්කර ගැනීමට බැංකුවේ කෘෂි වනවගා ව්‍යාපෘතිය ප්‍රවර්ධනය කිරීම

12 RESPONSIBLE CONSUMPTION AND PRODUCTION

බැංකු ක්‍රියාවලියේ වර්ධිත ඩිජිටල්කරණය තුළින් කඩදාසි පරිභෝජනය අඩු කිරීම.

ද්විතියික UN SDGs අරමුණු

6 CLEAN WATER AND SANITATION

පිරිසිදු ජලය හා සනීපාරක්ෂාව: ජල සංරක්ෂණ ව්‍යාපෘති හා වගකීම් සහගත පරිභෝජනය තුළින් පිරිසිදු ජලය හා සනීපාරක්ෂාව ප්‍රවර්ධනය

13 CLIMATE ACTION

හරිත වැඩසටහන්, ඩිජිටල්කරණය, වගකියයුතු ණය දීම හා සම්පත් යහපත් ලෙස කළමනාකරණය තුළින් ස්වාභාවික ප්‍රාග්ධනය කළමනාකරණයට සමස්ත වගකීම්සහගත ප්‍රවේශයක් ක්‍රියාවේ යෙදවීම.

ප්‍රමාණාත්මතාව. පාර්ශ්වකරුවන්, සහ කෙටි කාලයේ සිට මධ්‍ය කාලීන උපායමාර්ගික ප්‍රමුඛතා අතර සම්බන්ධතාව

වැදගත් කරුණු



පාර්ශ්වකරුවන්



කෙටි කාලයේ සිය මධ්‍ය කාලය දක්වා අපායමාර්ගික ප්‍රමුඛතා



විභව්‍ය සමතුලිතතා

- **මූල්‍ය ප්‍රාග්ධනය** – ස්වභාවික සම්පත් භාවිතා කිරීම බලවත් ලෙස පරිසර හායනයට හේතු වන අතර එය නැවත යථා තත්ත්වයට පත් කිරීමට සැලකියයුතු මුදල් සම්පත් අවශ්‍ය වන බැවින් මූල්‍ය ප්‍රාග්ධනයට සෘණාත්මකව බලපායි.
- **නිෂ්පාදිත ප්‍රාග්ධනය** – ගොඩනැගිලි වැනි නිෂ්පාදිත ප්‍රාග්ධනය වැඩි කරන යටිතලපහසුකම් ව්‍යාපෘතිවලට මුදල් යෙදීම නිතරම පාරිසරික බිඳවැටීමට හේතු වේ.
- **බුද්ධිමය ප්‍රාග්ධනය** – තිරසාර ව්‍යාපෘතිවල පර්යේෂණ හා සංවර්ධනය සඳහා සම්පත් වෙන් කිරීම වෙනත් ලාභදායී විය හැකි නමුත් අඩු තිරසාර ව්‍යාපාරයන්හි මුදල් ආයෝජනය අඩුකරලීමට හේතුවේ..
- **මානව ප්‍රාග්ධනය** – වායුව සහ ජල දූෂණය වැනි ස්වභාවික ප්‍රාග්ධනයේ පිරිහීම මානව ප්‍රාග්ධනයේ ගුණාත්මකභාවයට බලපෑම් කරමින් මිනිසුන් මත සෘජු සෘණාත්මක සෞඛ්‍ය බලපෑම් ඇති කළ හැකිය..
- **සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය** – පාරිසරික වශයෙන් හානි සිදුවන ව්‍යාපාතිවල ආයෝජනය බැංකුවේ කීර්තිනාමය සහ පාර්ශ්වකරුවන් සමඟ එහි සම්බන්ධතා හානි කළ හැකිය.

අපගේ පරිසර කළමනාකරණ ප්‍රතිපත්තිය

අපගේ පාරිසරික ප්‍රතිපත්තිය පාරිසරික තිරසාරභාවය සහ ආයතනික වගකීම සඳහා අපගේ බැඳීමේ මූලිකාංගය ලෙස කටයුතු කරයි. අපගේ පාරිසරික පාසටහන අවම කිරීමට සහ තිරසාර ව්‍යවහාර ප්‍රවර්ධනය කිරීමට අවල කැපවීමත් සමඟ, අපගේ ප්‍රතිපත්තිය මඟින් බැංකුවේ මෙහෙයුම් ඉහළ පාරිසරික ප්‍රමිති සපුරාලන බව සහතික කරමින් අදාළ සියලුම පාරිසරික නීති, රෙගුලාසි, සහ ප්‍රමිතිවලට අනුකූලවීමට ප්‍රතිඥා දේ. දූෂණය වැලැක්වීම, සම්පත් සංරක්ෂණය, සහ බලශක්ති කාර්යක්ෂමතාව ප්‍රතිපත්තියේ ප්‍රධාන පිළිගත් මතයන් වන අතර අපද්‍රව්‍ය උත්පාදනය අඩු කිරීම, සම්පත් භාවිතය ප්‍රශස්ත කිරීම සහ පාරිසරික බලපෑම් අවම කිරීම සඳහා උත්සාහයන්ට මඟ පෙන්වයි.

තවද, තිරසාර චර්යාවන් ඇතුළත් කර ගැනීමට සහ පරිසර සංරක්ෂණ උත්සාහයන්ට දායක වීමට සේවකයින්, ගනුදෙනුකරුවන්, සහ පාර්ශ්වකරුවන් සවිබල ගන්වන පාරිසරික දැනුවත්කම සහ පුහුණුව අපි ප්‍රමුඛ කරමු. අඛණ්ඩ වර්ධනය සහ කාර්යසාධන නියාමන චක්‍රයක් තුළින්, බැංකුව පාරිසරික කළමනාකරණය තුළ විශිෂ්ඨත්වය අත්කර ගැනීමට උත්සාහ දරයි. ජ්බ්ටැපැබඑග

අනාගතය සඳහා පරිසරය සංරක්ෂණය කිරීම කරා අපගේ දායකත්වය

හරිත ගොඩනැගිලි

2023 අවසානයේදී, බැංකුවේ ශාඛා 45ක් පුනර්ජනනීය බලශක්තියෙන් ක්‍රියාත්මක වේ.

ජාතික පද්ධතියට මාරු කිරීම

කිලෝ වොට් 461,584ක් මාරු කිරීම 2022 සිට 34% ක වැඩි වීමකි



ස්වාභාවික ප්‍රාග්ධනය

බලශක්ති කාර්යක්ෂමතාව සහ සංරක්ෂණය

බැංකුව මෙහෙයුම් කාර්යක්ෂමතාව උපරිම කරමින් අපගේ බලශක්ති පරිභෝජනය සහ පාරිසරික බලපෑම අවම කිරීමේ වැදගත්කම අපි හඳුනා ගනිමු. බලශක්ති කළමනාකරණය සඳහා විස්තීර්ණ ප්‍රවේශයක් තුළින්, අපි බලශක්ති භාවිතය ප්‍රශස්ත කිරීමට, කාබන් විමෝචන අවම කිරීමට සහ පුනර්ජනනීය බලශක්ති විසඳුම් ප්‍රවර්ධනය කිරීමේ ක්‍රියාමාර්ග අපි ක්‍රියාත්මක කරමු.

හරිත ගොඩනැගිලි

හරිත ගොඩනැගිලි සංකල්පය වසර ගණනාවක් බැංකුවේ න්‍යාය පත්‍රයේ තිබුණි. 2023 දී, බැංකුව බලශක්තිය, ජලය සහ ස්වභාවික සම්පත් කළමනාකරණය කිරීමට වර්ධනයන් කිහිපයක් සිදු කර ඇත.

බැංකුවේ නව ශාඛා ස්වභාවික ආලෝකය සහ වායුවවල උපරිම භාවිතය ලබාදීමට සැලසුම් කරන අතර අනෙකුත් සියලුම ශාඛා බලශක්තිය ප්‍රශස්ත කිරීමට වීදුරු ජනේලවලින් සමන්විත කරන ලදී. බැංකුවේ කතරගම නව සංචාරක බංගලාව හරිත ගොඩනැගිලි සංකල්පයට අනුව නිම කරන ලද අතර නාගරික සංවර්ධන අධිකාරිය විසින් නියාමනය කරන ලදී.

බැංකුවේ සියලුම ශාඛා බලශක්ති කාර්යක්ෂම උපාංග සහ ආලෝකකරණ උපකරණ වලින් සන්නද්ධ කරන ලදී.

දූෂණය වැලැක්වීම සහ සම්පත් සංරක්ෂණය

බැංකුවේ තිරසාර බලශක්තියේ මූලික කුළුණු ලෙස, දූෂණය වැලැක්වීම සහ සම්පත් සංරක්ෂණය සඳහා දැඩි ලෙස කැපවී සිටී. අපද්‍රව්‍ය උත්පාදනය අවම කිරීම, ප්‍රතිචක්‍රීකරණය ප්‍රවර්ධනය කිරීම සහ හැකි සෑම අවස්ථාවකදීම නැවත භාවිත කිරීමේ මූලපිරීම් සඳහා දැඩි අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රොටෝකෝල හරහා අපගේ මෙහෙයුම්වල සෑම අංශයකම දූෂණය අවම කිරීම සහ සම්පත් භාවිතය ප්‍රශස්ත කිරීම සඳහා පුළුල් ක්‍රියාමාර්ග අපි ක්‍රියාත්මක කර ඇත. මීට අමතරව, බලශක්ති කාර්යක්ෂම උපකරණ සහ වාහනවල ආයෝජනය වැනි විමෝචන අවම කිරීම සඳහා පරිසර හිතකාමී ව්‍යවහාර සහ තාක්ෂණයන් යොදා ගැනීමට අපි ප්‍රමුඛත්වය දෙමු. පරිසර සංරක්ෂණය සඳහා අපගේ බැඳීම අභ්‍යන්තර මෙහෙයුම්වලින් ඔබ්බට ජලය සහ බලශක්ති සංරක්ෂණ උත්සාහයන් ඇතුළත් කර ගැනීම දක්වා විහිදේ.

බලශක්ති පරිභෝජනය

GRI 302-1, 303-5

- ජාතික පද්ධතිය තුළින් විදුලි පරිභෝජනයට විරුද්ධව සූර්ය බලශක්ති උත්පාදනය වැඩි කිරීම.
- බලශක්ති පරිභෝජනය ඉතිරි කරන සහ කාබන් විමෝචනය අඩුකරන ක්‍රම රහිත අපවර්තක ක්‍රියාත්මක වායුසමීකරණ සවිකිරීම.
- සාමාන්‍ය බැංකුකරණ කාලවේලාවන්වල වායු සමීකරණ භාවිතය සීමා කිරීම.
- නිවාඩු දිනවල සේවය කිරීමට සේවකයින් අධෛර්යමත් කිරීම.
- LED බල්බ සහ ක්‍රෑබ් බල්බ සවිකිරීම .
- LED තිර පරිගණක මොනිටර් භාවිතා කිරීම
- ප්‍රතිචක්‍රියකරණය දැඩිව ප්‍රවර්ධනය කිරීම.
- බලශක්ති සංරක්ෂණයේ වැදගත්කම පිළිබඳ සේවකයින් සමඟ අඛණ්ඩ සන්නිවේදනවල නියැලීම.

ජල පරිභෝජනය

- වැසි ජලය පොදු කාණු මගින් බැහැර කරන අතර අපජලය පරිශ්‍රය තුළ සම්මත පෙඟවුම් වල තුළින් බැහැර කෙරේ.

අපද්‍රව්‍ය කළමනාකරණය

- නව ශාඛාවල ස්ථාපිත අපජල සහ කැලිකසල පද්ධති වර්ධනය කර ඇත.
- අපද්‍රව්‍ය රැස්කරන සෑම ස්ථානයකදීම අපද්‍රව්‍ය වෙන් කිරීම සිදු කිරීම.
- අදාළ මහනගර/නගර සභා/සභ මධ්‍යම පරිසර අධිකාරිය හරහා අපද්‍රව්‍ය බැහැර කිරීම.
- CEA – අනුමත තෙවැනි පාර්ශව ප්‍රතිචක්‍රියකරණ සේවා සපයන්නන් භාවිතා කිරීම.
- ආහාර සහ පොලිතීන් අපද්‍රව්‍ය නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහනට භාර දීම.
- අනෙකුත් අපද්‍රව්‍ය සැපයුම් අංශය විසින් වෙන්දේසි කිරීම.

කඩදාසි භාවිතය අඩු කිරීම

වර්ධනය වන ඩිජිටල් බැංකුකරණ කටයුතු ස්වභාවික සම්පත් භාවිතය අඩු කරන බැවින්, මෙම අවශ්‍යතාව ඉටු කිරීමට අපගේ ගනුදෙනුකාර පදනමට අන්තර්ජාල සහ ජංගම බැංකුකරණය අපි පුළුල් ලෙස ප්‍රවර්ධනය කරමින් සිටිමු.

- බැංකුව සිය 51 වැනි සංවත්සරය සමරමින් ගනුදෙනුකරුවන්ට පුළුල්කළ ඩිජිටල් සේවා ලබාදීමට ප්‍රධාන කාර්යාලයේ ඩිජිටල් බැංකුකරණ මධ්‍යස්ථානය ස්ථාපිත කර ඇත.
- වෙනත් ප්‍රචාරණ ක්‍රමවලට සාපේක්ෂව ප්‍රචාරණය සඳහා සමාජ මාධ්‍ය කෙරෙහි අවධානය
- කඩදාසි භාවිතය අඩු කිරීමට ඉ-අළුත් කිරීමේ ලිපි ක්‍රමය සහ කෙඩි පණිවිඩ (SMS) හරහා පුද්ගලික රහස්‍ය අංකය (PIN) නිකුත් කිරීම ක්‍රියාත්මක කිරීම.
- කඩදාසි-පදනම් අභ්‍යන්තර සටහන් සහ අනුමැතීන් වෙනුවට ඉ-පදනම් අනුමත ක්‍රමය හඳුන්වාදීම.

හරිත මූල්‍යකරණය

අපගේ හරිත මූල්‍ය වැඩසටහන් තිරසාර සංවර්ධනය ඇති කිරීමේදී සහ පාරිසරික භාරකාරත්වය පෝෂණය කිරීමේදී අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කරයි. හරිත ව්‍යාපෘති සඳහා විශේෂිත මූල්‍ය විසඳුම් ලබා දීමෙන්, ධනාත්මක පාරිසරික, ආර්ථික සහ සමාජීය ප්‍රතිඵල ගෙනයාමට, පාරිසරික වශයෙන් තිරසාර මුල පිරීම් හඹා යාමට බැංකුව ව්‍යාපාර, ප්‍රජාවන් සහ පුද්ගලයන් සවිබල ගන්වයි. අපි අපගේ හරිත මූල්‍යකරණ මුලපිරීම් අඛණ්ඩව පුළුල් කරන බැවින්, තිරසාර වර්ධනයේ නවෝත්පාදනය ප්‍රවර්ධනය කිරීමට බැංකුව කැපවී සිටී.

අපගේ ව්‍යාපාර ආදර්ශය අනාගතය සඳහා උපාය මාර්ග සකස් කිරීමේදී තිරසාරතා මූලධර්ම සාධක බවට පත්කරයි. අපගේ තිරසාරතා මූලධර්මවල ප්‍රධාන සංරචකයන් වන්නේ පරිසරයට වියදමක් නොමැතිව අපගේ බැංකු කටයුතු පවත්වා ගැනීමයි.

තවද, ඉහළ ESG අවදානම් සම්බන්ධතා සමීපව පරීක්ෂා කිරීමෙන් ඇගයීමට ලක් කෙරෙන ණය දීමේ ව්‍යවහාරයන් සඳහා අපගේ ණය සහ අවදානම් ඇගයීම් ක්‍රියාවලියට පාරිසරික, සමාජීය සහ පාලන (ESG) ප්‍රතිෂ්ඨාවන් ඇතුළත්

ස්වාභාවික ප්‍රාග්ධනය

කර ඇත. ණය සඳහා අයදුම් කිරීමේදී, පරිසරයට සෘණාත්මක බලපෑමක් ඇති කරන කිසිදු ණයක් සඳහා අපි මූල්‍ය පහසුකම් ලබා නොදෙන බැවින්, සියලුම ගනුදෙනුකරුවන් අදාළ සාක්ෂි සපයන, දේශීය ESG සම්බන්ධ නීති සහ රෙගුලාසිවලට අනුකූල වීමට අවශ්‍ය වේ


2023 සකසුරුවම් දිනය සහ අප්‍රේල් මාසයේ අලුත් අවුරුදු සැමරුම්වලට සමගාමීව, බැංකුකරණයේ හරිත සංකල්පයට දායක වෙමින් ගනුදෙනුකරුවන් අතර පැල බෙදා හැරීමට පියවර ගන්නා ලදී. මීට අමතරව, කාබන් පාසටහන අඩු කිරීම සඳහා ඉතා කාර්යක්ෂම ගෑස් ටර්බයිනයක් භාවිතා කරමින් කෙරවලපිටියේ මෙගාවොට් 350 ක විදුලි ව්‍යාපෘතියක් ඉදිකිරීම සඳහා සෝබාධනව් ලිමිටඩ් වෙත රු. බිලියන 1 ක මූල්‍ය පහසුකම අනුමත කරන ලදී.

ඩිජිටල් පරිනාමනය හරහා වඩාත් හරිත මෙයුම්

ඩිජිටල් තාක්ෂණයන් සහ නව්‍යකරණ විසඳුම්වල උපායමාර්ගික ආයෝජනය තුළින්, බැංකුව මෙහෙයුම් ක්‍රමවත් කිරීමට, සම්පත් වෙන් කිරීම ප්‍රශස්ථ කිරීමට, සහ අපගේ ආයතනය හහරහා තිරසාර ව්‍යාපාර ව්‍යවහාර ප්‍රවර්ධනය කිරීමට ඩිජිටල්කරණය ශක්තිමත් කිරීමට අපි අරමුණු කරමු. බැංකු ගනුදෙනු, ගනුදෙනුකාර මැදිහත්වීම්, සහ අභ්‍යන්තර ක්‍රියාවලි සඳහා ඩිජිටල් මාර්ගවලට පරිනාමනය වෙමින්, කඩදාසි-පදනම් ලියවිලි, භෞතික යටිතල පහසුකම්, සහ සම්ප්‍රදායික බැංකු ව්‍යාහාර හා බැඳුණු බලශක්ති තිව්‍රර මෙහෙයුම් සඳහා අවශ්‍යතාව අපි සැලකියයුතු ලෙස අඩු කර ඇත. තවද, අපගේ ඩිජිටල්කරණ උත්සාහයන් ශාඛා වෙත සංචාරය සහ භෞතික පැමිණීම සඳහා අවශ්‍යතාව අඩුකරමින් අපගේ බැංකු සේවා සඳහා දුරස්ථ පිවිසීම සක්‍රීය කරන අතරම ඒ තුළින් ප්‍රවාහනය හා බැඳුණු කාබන් විමෝචන අවම කරයි. අපගේ ඩිජිටල් මූලපිරීම් පිළිබඳ වැඩි විස්තර සඳහා 77 සිට 78 දක්වා පිටු බලන්න.

ඉදිරි ගමන්මඟ

- ස්වභාවික ප්‍රාග්ධනය කෙරෙහි මූල්‍ය කටයුතුවල බලපෑම් අගය කරමින්, ශක්තිමත් පාරිසරික බලපෑම් තක්සේරු කිරීම් එහි ණය දීමේ ව්‍යවහාරවලට ඒකාබද්ධ කිරීමට බැංකුව අරමුණු කරයි.
- බැංකුව වෙනස්වන පාරිසරික ප්‍රවනතා, තාක්ෂණයන් හා රෙගුලාසි සමඟ එක පෙළට සිටීමින් අඛණ්ඩ ඉගෙනීමේ සහ අනුවර්තනය වීමේ සංස්කෘතියක් වැළඳ ගනිමින් සිටී
- පාරිසරිකමය වශයෙන් දැනුවත් ගනුදෙනුකරුවන් ලබාදීම සඳහා බැංකුව හරිත උකස්කර සහ තිරසාර ආයෝජන විකල්ප වැනි මූල්‍ය නිෂ්පාදන හා සේවා සංවර්ධනය කරමින් සිටී.
- නුදුරු අනාගතයේදී IFRS S1 සහ S2 මනා පරිචයන් අපි යොදා ගනිමින් සිටිමු.



ආයතනික පාලනය පිළිබඳ ප්‍රකාශය

බැංකු අංශය තුළ පාලනය හුදෙක් නියාමන අනුකූලතාව ඉක්මවා යන බව බැංකුව හඳුනා ගනී. වටිනාකම නිර්මාණය කිරීමේ සන්තනිවල සෑම අංගයකටම බලපාන සදාචාර සහ වගකීයයුතු කළමනාකරණයේ මූලික කුළුණක් ලෙස එය පෙනී සිටී. පාලනය සංකීර්ණ ලෙස **ඒකාබද්ධ චින්තන** දර්ශනය වෙත ගලපන ලබන අතර එය අපගේ ප්‍රධාන වටිනාකම් සහ උපායමාර්ගික පරමාර්ථ සමඟ පෙළගැසෙමින් සදාචාර, වගකීම්සහගත, සහ චිත්තවේගී සෘජු මූලධාර්ම දරා ගැනීමට මෙහෙයවයි. අපගේ පාලන රාමුව අවංක සහ තිරසාර සංස්කෘතියක් පෝෂණය කරන දිගුකාලීන වටිනාකම් නිර්මාණය ප්‍රමුඛ කරයි.


ආයතනික පාලනය ආයතනයනක් ලෙස අපගේ මෙහෙයුම් තුළ විනිවිදභාවය සහ වගවීම සහතික කරයි.

බැංකුවේ පාලන රාමුව නායකත්වය, අපක්ෂපාතී පාලනය, සහ ශක්තිමත් සදාචාර පදනමක් මත ගොඩ නැගුණු කළමනාකරණ වගවීම මගින් තහවුරු කරයි. බැංකුවේ විධි නියෝගය අධ්‍යක්ෂ මණ්ඩලයට අවසාන වගකීම පවරමින් පැහැදිලි පාලන සීමා සලකුණු කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී විසින් මෙහෙයවන අධ්‍යක්ෂ මණ්ඩල කමිටු සහ ආයතනික කළමනාකරණය වෙත උපායමාර්ගික නියෝග සඳහා බලය පවරයි.

අධ්‍යක්ෂ මණ්ඩලය පාර්ශවකාර බැඳියාවන් සමඟ පෙළ ගැසෙමින් ඔවුන්ගේ ආර්ථික, සමාජ, සහ පාරිසරික තිරසාරභාවය සහතික කරමින් බැංකුවේ කටයුතු පිළිබඳ පාලනය ක්‍රියාත්මක කරයි. ඔවුන් සියලුම පාර්ශ්වකරුවන් සඳහා සමබර වටිනාකම නිර්මාණය ප්‍රමුඛ කරමින් බැංකුවේ

උපායමාර්ගය සහ මෙහෙයුම් පරමාර්ථ ස්ථාපිත කර අනුමත කරයි. අවංකකම, කාර්යක්ෂමතාව, වගවීම, අපක්ෂපාතිබව, සහ විනිවිදභාවය වැනි ගුණාංග අවධාරණය කරමින් බැංකුවේ සදාචාර සහ කාර්යක්ෂම බැංකු මෙහෙයුම් පවත්වා ගැනීම අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කරයි.

කර්මාන්ත ප්‍රමිති, රෙගුලාසි, ප්‍රතිපත්ති සහ නීති පිළිපැදීම තුළින් සදාචාර ආයතනික චර්යාවට බැංකුවේ කැපවීම පිළිබිඹු කරයි. බැංකුවේදී පාලනය යනු උපායමාර්ගික අරමුණු වර්ධනය කිරීම, පාර්ශවකාර බැඳියාවන් ආරක්ෂා කිරීම, සහ සමාජයට සදාචාර සහ තිරසාර සේවාවන් ලබාදීම අරමුණු කළ බහුමුහුණත් උත්සාහයකි. එබැවින්, බැංකුව සඳහා පාලනය සියල්ලටම ප්‍රධාන අවධානයක් ලෙස පවතී. බැංකුවේ ආයතනික පාලනය සහ අනුකූලතා තත්ත්වය පිළිබඳ ගැඹුරින් පරීක්ෂාකිරීම සඳහා කරුණාකර 167 සිට 181 දක්වා පිටු බලන්න.



රූපය 25 → අපගේ ප්‍රතිඵල-පදනම් පාලන ප්‍රවේශය

අවදානම් කළමනාකරණය පිළිබඳ ප්‍රකාශය

බැංකුවේ ආසන්න සහ අනාගත සීමාවන් දක්වා විහිදෙමින් අපගේ ආයතනයේ තිරසාරභාවය නිවාරණය කිරීමේදී අවදානම් කළමනාකරණයේ තීරණාත්මක කාර්යභාරය අපි හඳුනා ගනිමු. වසර ගණනාවක් පුරා වටිනාකම නිර්මාණය කිරීමේ අපගේ හැකියාවට අවදානම් කළමනාකරණය සෘජුව බලපාන බැවින් අපගේ ආයතනික උපායමාර්ගයට සහ මෙහෙයුම් රාමුවට ඒකාබද්ධ අවදානම් කළමනාකරණයේ වැදගත්කම අපි පහසුවෙන් ග්‍රහනය කරමු. අපගේ අවදානම් කළමනාකරණ ක්‍රමවේදය සමස්ථ සමූහය හරහා විස්තීර්ණ අවදානම් ඇගයීමකට මඟ පාදමින් බැංකුවට සම්පූර්ණයෙන් අයත් එහි පරිපාලිත සමාගම් එනම් ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව, සහ NSB අරමුදල් කළමනාකරණ ආයතනය දක්වා පැතිර පවතී.

අපගේ පාර්ශ්වකරුවන්ගේ බැඳියාවන් සුරක්ෂිත කරමින් මූල්‍ය සහ මූල්‍ය නොවන අවදානම් අවම කිරීමේදී නිරවද්‍යතාවය සහ විනිවිදභාවයට ප්‍රමුඛත්වය දෙමින් අවදානම් කළමනාකරණ කාර්යය අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටුකරයි. එය ප්‍රාග්ධනයේ ප්‍රශස්ථ වෙන්කිරීම පාලනය කරමින් අවදානම් හඳුනාගැනීමට, ඇගයීමට, ප්‍රමාණනය කිරීමට හා එකතු කිරීමට සහ අවම කිරීමට සැලසුම්කළ රාමුවක් මත ක්‍රියාත්මක වේ.

නිති සහ නියාමන විධි නියෝග සහ අපගේ සමස්ථ ව්‍යාපාර උපායමාර්ගය සමඟ අනුකූලතාව සහතික කරමින් වටිනාකම් නිර්මාණය තුළ අවදානම සහ ප්‍රදාන අතර පරීක්ෂාකාරී තුලනයක් අපි පවත්වා ගනිමු.


අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් අපගේ අවදානම් අභිරුචිය අර්ථ දක්වන අතර අපගේ අවදානම් කළමනාකරණ ප්‍රවේශයන් හී ඵලදායීත්වය සහ යෝග්‍යතාව වැඩිකිරීමට සහයවීමට අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව පත් කරයි. විස්තීර්ණ සහ සහයෝගී අවදානම් කළමනාකරණ ක්‍රියාවලියක් ප්‍රවර්ධනය කරමින් ආයතනය තුළ අවදානම් කළමනාකරණය ආවේණික ලක්ෂණයක් බව මෙම සක්‍රිය සහභාගිත්වය මඟින් සහතික කරයි.

අනාගත දැක්ම

2023 දී රටතුළ බොහෝ අර්බුද පැවතියද, ව්‍යාපාර මෙහෙයුම්වල උපායමාර්ගික වෙනස්වීම් සඳහා ස්ථාවර සහයක් ලබාදීමට සහ අපගේ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුව ශක්තිමත් කිරීමට අපගේ ඩිජිටල් යටිතලපහසුකම් නගා සිටුවීමට අපි කැපවී සිටියෙමු. බැංකුවේ අවදානම් කළමනාකරණ රාමුව තුළ සියලුම සංවර්ධනයන් ජාත්‍යන්තර මනා පරිචයන් සහ බැංකුව විසින් නියමකළ නියාමන රාමුව සමඟ අනුකූල වන බව මෙයින් සහතික කරනු ඇත.

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අවදානම් කළමනාකරණය

අපට ශක්තිමත් අවදානම් කළමනාකරණ රාමුවක් ක්‍රියාත්මකව ඇති අතර ඉන් මතුවන අවදානම් කාලීනව හඳුනා ගැනීමට සහ නිවැරදි කිරීමේ/වැලැක්වීමේ ක්‍රියාමාර්ග ගැනීමට පහසුකම් සලසන ශක්තිමත් අවදානම් කළමනාකරණ රාමුවක් අප සතුය. පූර්ව නිශ්චිත අවදානම් රුචියට අනුව අපගේ මූල්‍ය සහ මෙහෙයුම් කාර්යසාධනය නිරතුරුව නියාමනය කරන අතර පරිසරයේ ඇතිවන අස්ථාවරත්වය, අවිනිශ්චිතතාව, සංකීර්ණත්වය හා අපැහැදිලි බව (VUCA) පරිසරය හේතු වෙන් ඇතිවන අවදානම් ආමන්ත්‍රණය කිරීමට අපගේ රාමුව අපයෝගී කර ගනී. 2023 දී නුබුන්වත් දර්ශකවල අපගේ අවදානම් රුචි මට්ටම් සපුරාලීමට අපට හැකි විය. බැංකුවේ අවදානම් කළමනාකරණය පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා කරුණාකර 191 සිට 213 දක්වා පිටු බලන්න.



රූපය 26 අවදානම් සංස්කෘතිය

ස්වාධීන සහතිකවීමේ ප්‍රකාශය

KPMG
(Chartered Accountants)
32A, Sir Mohamed Macan Markar Mawatha,
P.O. Box 186,
Colombo 00300, Sri Lanka.

Tel +94 - 11 542 6426
Fax +94 - 11 244 5872
+94 - 11 244 6058
Internet www.kpmg.com/lk

Independent Assurance Report to National Savings Bank

We have been engaged by the Directors of National Savings Bank ("the Bank") to provide reasonable assurance and limited assurance in respect of the sustainability indicators as identified below for the year ended 31 December 2023. The Sustainability Indicators are included in the National Savings Bank Integrated Annual Report for the year ended 31 December 2023 (the "Report")

The reasonable assurance sustainability indicators covered by our reasonable assurance engagement are:

Assured Sustainability Indicators as per the statutory Financial Statements (Audited) for the Year ended 31 December 2023, dated 20 March 2024 and the Audit report dated 22 March 2024 thereon	Integrated Annual Report page
Highlights	12

The limited assurance sustainability indicators covered by our limited assurance engagement are:

Limited assurance sustainability indicators	Integrated Annual Report page
Economic, social and environment indicators	13
Information provided on following	
Financial capital	96 to 105
Manufactured capital	112 to 117
Intellectual capital	118 to 123
Human capital	124 to 135
Social and relationship capital	136 to 145
Natural capital	146 to 150

Our conclusions

Our conclusion has been formed on the basis of, and is subject to, the matters outlined in this report. We believe that the evidence we have obtained is sufficient and appropriate to provide a basis for our conclusions.

Reasonable assurance sustainability indicators

In our opinion, in all material respects, the reasonable assurance sustainability indicators, as defined above, for the year ended 31 December 2023, in all material respects, has been prepared and presented by the management of National Savings Bank in accordance with the Consolidated Set of Global Reporting Initiative Sustainability Reporting Standards Guidelines.

Limited assurance sustainability indicators

Based on the evidence we obtained from the assurance procedures performed, as described below we are not aware of any material misstatements that causes us to believe that the limited assurance sustainability indicators, as defined above, for the year ended 31 December 2023, have not in all material respects, been prepared and presented by the management of National Savings Bank in accordance with the Consolidated Set of Global Reporting Initiative Sustainability Reporting Standards Guidelines.

Management's responsibility

Management is responsible for the preparation and presentation of the Reasonable Assurance Sustainability Indicators and the Limited Assurance Sustainability Indicators in accordance with the Consolidated Set of Global Reporting Initiative Sustainability Reporting Standards Guidelines.

These responsibilities include establishing such internal controls as management determines are necessary to enable the preparation of the reasonable assurance sustainability indicators and the limited assurance Sustainability Indicators that are free

KPMG, a Sri Lankan partnership and a member firm of the KPMG global organization of independent member firms affiliated with KPMG International Limited, a private English company limited by guarantee.

C. P. Jayatilake FCA
Ms. S. Joseph FCA
S. T. D. L. Perera FCA
Ms. B.K.D.T.N. Rodrigo FCA
Ms. C.T.K.N. Perera ACA
T. J. S. Rajakarier FCA
Ms. S.M.B. Jayasekara FCA
G. A. U. Karunaratne FCA
R. H. Rajan FCA
A.M.R.P. Alahakoon ACA
W. J. C. Perera FCA
W. K. D. C. Abeyrathne FCA
R.M.D.B. Rajapakse FCA
M.N.M. Shameel FCA
Ms. P.M.K. Sumanasekara FCA

Principals: S.R.I. Perera FCMA(UK), LLB, Attorney-at-Law, H.S. Goonewardene ACA, Ms. F.R Ziyard FCMA (UK), FTII

ස්වාධීන සහතිකවීමේ ප්‍රකාශය

from material misstatement whether due to fraud or error.

Management is responsible for preventing and detecting fraud and for identifying and ensuring that the Bank complies with laws and regulations applicable to its activities.

Management is also responsible for ensuring that staff involved with the preparation and presentation of the description and Report are properly trained, information systems are properly updated and that any changes in reporting encompass all significant business units.

Our responsibility

Our responsibility is to express a reasonable assurance conclusion on the Bank's preparation and presentation of the Reasonable Assurance Sustainability Indicators and a limited assurance conclusion on the preparation and presentation of the Limited Assurance Sustainability Indicators included in the Report, as defined above.

We conducted our assurance engagement in accordance with Sri Lanka Standard on Assurance Engagements SLSAE 3000: Assurance Engagements other than Audits or Reviews of Historical Financial Information (SLSAE 3000) issued by the Institute of Chartered Accountants of Sri Lanka.

We have complied with the independence and other ethical requirements of the Code of Ethics for professional Accountants issued by CA Sri Lanka (Code of Ethics).

SLSAE 3000 requires that we plan and perform the engagement to obtain reasonable assurance about whether the Reasonable Assurance Sustainability Indicators are free from material misstatement and limited assurance about whether the Limited Assurance Sustainability Indicators are free from material misstatement.

Our firm applies Sri Lanka Standard on Quality Control (SLSQC) 1, which requires the firm to design, implement and operate a system of quality management including policies or procedures regarding compliance with ethical requirements, professional standards and applicable legal and regulatory requirements.

Reasonable assurance over reasonable assurance sustainability indicators

The procedures selected in our reasonable assurance engagement depend on our judgment, including the assessment of the risks of material misstatement of the Reasonable Assurance Sustainability Indicators whether due to fraud or error.

In making those risk assessments, we have considered internal controls relevant to the preparation and presentation of the Reasonable Assurance Sustainability Indicators in order to design assurance procedures that are appropriate in the circumstances, but not for the purposes of expressing a conclusion as to the effectiveness of the Bank's internal controls over the preparation and presentation of the Report.

Our engagement also included assessing the appropriateness of the Reasonable Assurance Sustainability Indicators, the suitability of the criteria, being the Consolidated Set of Global Reporting Initiative Sustainability Reporting Standards Guidelines, used by the Bank in preparing and presenting the Reasonable Assurance Sustainability Indicators within the Report, obtaining an understanding of the compilation of the financial and non-financial information to the sources from which it was obtained, evaluating the reasonableness of estimates made by the Bank, and re-computation of the calculations of the Reasonable Assurance Sustainability Indicators.

Limited assurance on the assured sustainability indicators

Our limited assurance engagement on the Limited Assurance Sustainability Indicators consisted of making enquiries, primarily of persons responsible for the preparation of the Limited Assurance Sustainability Indicators, and applying analytical and other procedures, as appropriate. These procedures included:

- interviews with senior management and relevant staff at corporate and selected site level concerning sustainability strategy and policies for material issues, and the implementation of these across the business;
- enquiries of management to gain an understanding of the Bank's processes for determining material issues for the Bank's key stakeholder groups;
- enquiries of relevant staff at corporate and selected site level responsible for the preparation of the Limited Assurance Sustainability Indicators;
- enquiries about the design and implementation of the systems and methods used to collect and report the Limited Assurance Sustainability Indicators, including the aggregation of the reported information;
- comparing the Limited Assurance Sustainability Indicators to relevant underlying sources on a sample basis to determine whether all the relevant information has been appropriately included in the Report;
- reading the Limited Assurance Sustainability Indicators presented in the Report to determine whether they are in line with our overall knowledge of, and experience with, the sustainability performance of the Bank;

– reading the remainder of the Report to determine whether there are any material misstatements of fact or material inconsistencies based on our understanding obtained as part of our assurance engagement.

The procedures performed in a limited assurance engagement vary in nature and timing from, and are less in extent than for, a reasonable assurance engagement, and consequently the level of assurance obtained in a limited assurance engagement is substantially lower than the assurance that would have been obtained had a reasonable assurance engagement been performed. Accordingly, we do not express a reasonable assurance conclusion on the Limited Assurance Sustainability Indicators.

Purpose of our report

In accordance with the terms of our engagement, this assurance report has been prepared for the Bank for the purpose of assisting the Directors in determining whether the Bank's Reasonable and Limited Assurance Sustainability Indicators are prepared and presented in accordance with the Consolidated Set of Global Reporting Initiative Sustainability Reporting Standards Guidelines and for no other purpose or in any other context.

Restriction of use of our report

This report has been prepared for the Directors of National Savings Bank for the purpose of providing an assurance conclusion on the Reasonable Assurance Sustainability Indicators and the Limited Assurance Sustainability Indicators included in the National Savings Bank Integrated Annual Report for the year ended 31 December 2023 and may not be suitable for another purpose. We disclaim any assumption of responsibility for any reliance on this report, to any person other than the Directors of National Savings Bank, or for any other purpose than that for which it was prepared.



Chartered Accountants
Colombo

22 April 2024



සංයුක්තය

පාලනය

අධ්‍යක්ෂ මණ්ඩලය 158
ආයතනික කළමනාකාරිත්වය 162
විධායක කළමනාකාරිත්වය 163
ප්‍රධාන කළමනාකරුවන් 165
ආයතනික පාලනය 167
අධ්‍යක්ෂක මණ්ඩල විගණන කමිටු වාර්තාව 182
අධ්‍යක්ෂක මණ්ඩලමානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු වාර්තාව 185
අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටු වාර්තාව 187
අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව 188
හදිසි නොවන සහ අත්‍යවශ්‍ය නොවන වියදම් පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල කමිටු වාර්තාව 190
අවදානම් සමාලෝචනය 191

අධ්‍යක්ෂ මණ්ඩලය



ජනාධිපති නීතිඥ ආචාර්ය හර්ෂ කබ්රාල් මහතා
සභාපති
ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ
BNNEC

පත්වූ දිනය
2023 මැයි 3

නිපුනතා සහ අත්දැකීම්

ආචාර්ය හර්ෂ කබ්රාල් මහතා ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ නීතිය, වාණිජ නීතිය, වාණිජ බේරුම්කරණය, ආරක්ෂණ නීති, ජාත්‍යන්තර වාණිජ නීතිය යන ක්ෂේත්‍රයන්හි සිවිල් හා අපරාධ නීතිය සම්බන්ධයෙන් වසර 35 ක අත්දැකීම් බහුල ප්‍රවීණයෙකි. ජනාධිපති නීතිඥයෙකු ලෙස වසර 17 ක් කටයුතු කර ඇති හෙතෙම ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ හා වාණිජ මහාධිකරණයේ පුළුල් අත්දැකීම් සම්භාරයකට හිමිකම් කියන අතර කනිෂ්ඨ නීතිඥවරු 16 දෙනෙක් ඔහු යටතේ කටයුතු කරති.

ඔහු ඕස්ට්‍රේලියාවේ කැන්බරා සරසවියේ ආයතනික නීතිය පිළිබඳ පශ්චාත් උපාධිධාරියෙක් වන අතර, 2021 වර්ෂය තෙක් වර්ෂ 06 ක්ම පැරිසියේ ජාත්‍යන්තර වාණිජ මණ්ඩලයේ (ICC) බේරුම්කරණය පිළිබඳ ජාත්‍යන්තර අධිකරණයේ සාමාජිකයෙකු ලෙස කටයුතු කර තිබේ. එමෙන්ම, ඒකාබද්ධ ගැටුම් කළමනාකරණය පිළිබඳ සම්මේලනයේ නියෝජිත සාමාජිකයෙකු (FICM) සහ ජාත්‍යන්තර වාණිජ ගැටුම් පිළිබඳ විනිශ්චය සභාවේ නියෝජිත සාමාජිකයෙකු (ICDT) මෙන්ම එක්සත් රාජධානියේ හා අයර්ලන්තයේ වරලත් පාලන ආයතනයේ අධි සාමාජිකයෙකි. (UK and Ireland)

ශ්‍රී ලංකාවේ සමාගම් නීතිය පිළිබඳ උපදේශක කොමිසමෙහි සාමාජිකයකු ලෙස ආචාර්ය කබ්රාල් මහතා වත්මන් සමාගම් පනත වන 2007 අංක 07 දරන සමාගම් පනත සකස් කිරීමට දායක වී තිබේ.

මෙරට සහ විදේශ විශ්ව විද්‍යාල කිහිපයක ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු ලෙස සේවය කරන ආචාර්ය කබ්රාල් මහතා ප්‍රවීණ කථිකයෙක් මෙන්ම ගත්කතුවරයෙක්ද වේ. ඔහු ආයතනික නීතිය, බුද්ධිමය දේපළ නීතිය, වාණිජ බේරුම්කරණය, ජාත්‍යන්තර වාණිජ නීතිය පිළිබඳ මෙරට හා විදේශයන්හි ශාස්ත්‍රීය ලිපි පළකර ඇති විද්‍යාර්ථීයෙකි. අධිකරණ කටයුතුවල නියැලීම හා දේශන කටයුතුවලට අමතරව දේශීය හා විදේශීය ඒක පුද්ගල බේරුම්කරණ ක්‍රියාවලීන් විශාල සංඛ්‍යාවක ඒකපුද්ගල බේරුම්කරු, සමබේරුම්කරු හා සභාපති ලෙස කටයුතු කර ඇත. ආචාර්ය හර්ෂ කබ්රාල් මහතා විසින් ප්‍රකාශයට පත් කරන ලද කෘති පහත දැක්වේ.

- ආයතනික නීතිය, ව්‍යුත්පන්න ක්‍රියාමාර්ගඃ සන්සන්දනාත්මක ප්‍රවේශයක්
- ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ නීතිය
- 2007 අංක 07 දරන සමාගම් පනත හා ශ්‍රී ලංකාවේ සමාගම් නීතිය
- සමාගම් අධ්‍යක්ෂවරුන්ගේ කාර්යභාරය හා ශ්‍රී ලංකාවේ ආයතනික පාලනය
- ශ්‍රී ලංකාවේ වාණිජ බේරුම්කරණ නීති හා පරිචය
- කබ්රාල් බේරුම්කරණ නීති වාර්තා (වෙළුම 1) [1895-2020]
- කබ්රාල් බුද්ධිමය දේපල නීති වාර්තාව (වෙළුම 1) [1888-1995]
- කබ්රාල් බුද්ධිමය දේපල නීති වාර්තාව (වෙළුම 11) [1995-2020]
- කබ්රාල් සමාගම් නීති වාර්තාව (වෙළුම 1) [1881-1982]
- කබ්රාල් සමාගම් නීති වාර්තාව (වෙළුම 11) [1983-1993]
- කබ්රාල් සමාගම් නීති වාර්තාව (වෙළුම 111) [1994-2012]
- කබ්රාල් සමාගම් නීති වාර්තාව (වෙළුම 1V) [2013-2021]

වෙනත් වර්තමාන තනතුරු

ආචාර්ය හර්ෂ කබ්රාල් මහතා ශ්‍රී ලංකාවේ නීති කොමිෂන් සභාවේ සාමාජිකයෙකි. ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ පිළිබඳ උපදේශක කොමිසමෙහි සාමාජිකයෙකි. අධිකරණ අමාත්‍යාංශයේ බුද්ධිමය දේපළ නීති සංශෝධන ව්‍යාපෘතියේ සභාපති මෙන්ම ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ ආයතනික පාලන කමිටුවේ සහ ආයතනික පාලන පීඨයේ සාමාජිකයෙකි. එමෙන්ම, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පශ්චාත් උපාධි වෛද්‍ය ආයතනය (PGIM). සඳහා නාමයෝජිත සාමාජිකයෙකුද වේතවද ආචාර්ය හර්ෂ කබ්රාල් මහතා ක්‍රීඩා අමාත්‍යාංශයට සම්බන්ධ නව ජාතික ක්‍රීඩා පිළිබඳ නීති සම්පාදනය, අධිකරණ අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද “නව අධිකරණ නිවහන” ව්‍යාපෘතිය සහ අධිකරණ අමාත්‍යාංශයේ වාණිජ නීති ප්‍රතිසංස්කරණ හා සම්බන්ධ ජ්‍යෙෂ්ඨ උපදේශකයෙකි.

ශ්‍රී ලංකාවේ සිමෙන්ති වෙළඳපොළෙහි ඉහළම කොටස් හිමිකම සහිත ටෝකියෝ සිමෙන්ට් සමූහයේ සභාපතිත්වය දරයි. එමෙන්ම ඩිමෝ පුද්ගලික සමාගම, හේලීස් පුද්ගලික සමාගම, ඇලුමෙක්ස් පුද්ගලික සමාගම, ටෝකියෝ සිමෙන්ට් කම්පැනි (ලංකා) පුද්ගලික සමාගම, සීමාසහිත ටෝකියෝ සුපර් සිමෙන්ට් ලංකා, සීමාසහිත ටෝකියෝ සිමෙන්ට් පවර් ලංකා, සීමාසහිත ටෝකියෝ ඊස්ටන් සිමෙන්ට් පුද්ගලික සමාගම, සී/ස ටෝකියෝ සුපර් ඇග්‍රිගේට් පුද්ගලික සමාගම, සී/ස ටෝකියෝ සුපර් මික්ස් පුද්ගලික සමාගම, මෙව්රන් ලුබ්රිකන්ට්ස් ලංකා පුද්ගලික සමාගම, සී/ස සෙලින්කෝ ජීවිත රක්ෂණ සමාගම යන ආයතනයන්හි විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු ලෙස මේ වන විට කටයුතු කරයි. ඩාලි ප්‍රොපර්ටි හෝල්ඩින්ස් සමාගම, CCC-ICLP ඉන්ටර්නැෂනල් ADR සෙන්ටර් (ඇපලාහී) සමාගම, ජාත්‍යන්තර ඔලිම්පික් කමිටුවේ (NOC) ආචාර ධර්ම කමිටුව, ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ (ඇපලාහී) සමාගම, (SLIIT) හා ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතන ජාත්‍යන්තර පුද්ගලික සමාගම (SLIIT International (Private) Limited) සහ නැණදිරිය (ඇපලාහී) සමාගම යන ආයතනවල සභාපති ධූරය දරන කබ්රාල් මහතා විගණන කමිටු, නාමයෝජනා කමිටු, පාරිශ්‍රමික කමිටු, ණය අයකර ගැනීම් කමිටු සහ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනුකාර කමිටු ආදී කමිටු ගණනාවකට සම්බන්ධව හා ඉන් බොහොමයක සභාපතීත්වය දරමින් කටයුතු කරයි.

මින් පෙර දැරූ තනතුරු

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ (BOI) හිටපු සාමාජිකයෙකු වන ආචාර්ය හර්ෂ කබ්රාල් මහතා ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර බේරුම්කරණ මධ්‍යස්ථානයේ ආරම්භක අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකි. ඔහු වත්මන් පනත වන 1995 අංක 11 දරන බේරුම්කරණ පනත කෙටුම්පත් කිරීමෙහිලා දායක වී ඇත. එසේම, ශ්‍රී ලංකාවේ විශාලතම මූල්‍ය ආයතනයක් වන LOLC ෆිනෑන්ස් පුද්ගලික සමාගමේ හිටපු සභාපතිවරයා වන ඒ මහතා, සීමාසහිත LOLC රක්ෂණ සමාගම, කොමර්ෂල් ලීසින් ඇන්ඩ් ෆිනෑන්ස් ලිමිටඩ්, රිචඩ් පීරිස් ඩිස්ට්‍රිබියුටර්ස් සමාගම යන ආයතනයන්හි අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කර ඇත. එමෙන්ම, හැටන් නැෂනල් බැංකුවෙහි (HNB) වැඩ බලන සභාපතිවරයා වශයෙන්ද යූනියන් බැංකුවෙහි ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයෙකු ලෙසද කටයුතු කර ඇත. ජාතික වෙළඳ ප්‍රතිපත්තිය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුවෙහි සාමාජිකත්වය දැරූ ඒ මහතා ශ්‍රී ලංකාවේ නීති ප්‍රතිසංස්කරණය පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා සාමාජිකයෙකි.

අධ්‍යක්ෂ මණ්ඩලය



ජූඩ් නිලුක්ෂාන් මහතා

නිල බලයෙන් පත්වූ අධ්‍යක්ෂ
ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂ

BAC BHRRC BNC **BIRMC** BNNEC BITSC

පත් කරන ලද දිනය

2022 පෙබරවාරි 28

නිපුනතා සහ අත්දැකීම්

නිලූක්ෂාන් මහතා දකුණු කොරියාවේ ක්යොන් (Kyung Hee) විශ්ව විද්‍යාලයෙන් අන්තර්ජාතික වෙළඳාම සහ ආර්ථික සහයෝගීතාවය පිළිබඳ පශ්චාත් උපාධිය සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් දෙවන පන්තියේ ඉහළ සාමාර්ථයක් සහිතව කළමනාකරණය පිළිබඳ විශේෂ විද්‍යාවේදී උපාධියක් ලබා ඇත. ඔහු කීර්තිමත් දේශීය සහ අන්තර්ජාතික ආයතන/විශ්ව විද්‍යාල ගණනාවකින් රාජ්‍ය මූල්‍ය කළමනාකරණය පිළිබඳව පුහුණුව ලබා ඇත. ඔහු ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙන් (SLIDA) රාජ්‍ය පරිපාලනය පිළිබඳ සහතිකයක් ලබාගෙන ඇති අතර අනෙකුත් අදාළ කළමනාකරණ සුදුසුකම් සපුරා තිබේ. ජූඩ් නිලූක්ෂාන් මහතා, රාජ්‍ය අංශයේ වසර 22 කට වැඩි අත්දැකීම් සමුදායකට හිමිකම් කියන ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිළධාරියෙකි. ඔහු විසින් සිය රාජ්‍ය සේවය තුළදී මහා භාණ්ඩාගාරයේ සහ කැබිනට් අමාත්‍යවරුන්ගේ කාර්යාලයේ විවිධ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරු දරන ලදී.

වෙනත් වර්තමාන තනතුරු

ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ (SLIDA) අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු සහ අග්‍රාමාත්‍යවරයාගේ ලේකම්වරයා විසින් සභාපතිත්වය දරන ජාතික මෙහෙයුම් කමිටුවේ සහ අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද විවිධ නිල කමිටු වල සාමාජිකයෙකු වශයෙන් කටයුතු කර ඇත.

මින් පෙර දැරූ තනතුරු

2015 – 2020 කාලය තුළ කැබිනට් අමාත්‍යවරුන්ගේ කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා රේගුවේ සුරාබදු අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ සහ ශ්‍රම වාසනා අරමුදල් මණ්ඩලයේ සභාපති යන තනතුරු දැරූ ඒ මහතා විසින් ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය (CEB) මූල්‍ය අධ්‍යයනය පිළිබඳ ඇකඩමිය (MILODA) ශ්‍රී ලංකා ඖෂධ නිෂ්පාදන සංස්ථාව (SPMC) ජාතික උද්භිත උද්‍යාන භාර අරමුදල, සීමාසහිත ස්වාධීන රූපවාහිනී ජාලය (ITN), සමුද්‍ර පරිසර ආරක්ෂණ අධිකාරිය, පළාත් පාලන ණය මණ්ඩලය, ශ්‍රී ලංකා යොවුන් සේනාංකය, ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය (NBRO) සහ රාජ්‍ය සේවකයන්ගේ අනොන්‍ය අර්ථසාධක අරමුදල (PSMPA) වැනි රජය සතු ආයතනයන්හි මහා භාණ්ඩාගාරය නියෝජනය කරන ලදී.



එස් ආර් ඩබ් එම් රුවන් පාලිත සත්කුමාර මහතා

නිල බලයෙන් පත්වූ අධ්‍යක්ෂ
ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

BHRRC **BNC** BIRMC BITSC

පත් කරන ලද දිනය

2023 මාර්තු 27

නිපුනතා සහ අත්දැකීම්

සත්කුමාර මහතා කැලණිය විශ්ව විද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් දෙවන පන්තියේ ඉහළ සාමාර්ථයක් සහිතව කළමනාකරණය පිළිබඳ විශේෂ විද්‍යාවේදී උපාධියක් ලබා ඇත.

ඔහු ව්‍යවසායකත්ව සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමාවක්ද සංවර්ධන පරිපාලන ආයතනය වෙතින් වෘත්තීයවේදීන් සඳහා වූ ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමාවද ලබා ඇත. ඔහු සංවර්ධන පරිපාලන ආයතනයේ මහජන ප්‍රසම්පාදනය හා ගිවිසුම් පරිපාලනය පිළිබඳව උසස් ජාතික ඩිප්ලෝමාධාරියෙකි. රාජ්‍ය අංශයේ වසර 23 කට වැඩි අත්දැකීම් සහිත සත්කුමාර මහතා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිළධාරියෙකි.

වෙනත් වර්තමාන තනතුරු

තැපැල්පති, තැපැල් දෙපාර්තමේන්තුව, අමාත්‍යාංශ නියෝජිත/ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

මින් පෙර දැරූ තනතුරු

ශ්‍රී.ල.ප.සේ කැඩෙට් – ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, හිමිකම් ලියාපදිංචි කිරීම පිළිබඳ සහකාර කොමසාරිස් – ඉඩම් නිරවුල්කිරීමේ දෙපාර්තමේන්තුව, සහකාර ප්‍රාදේශීය ලේකම් – ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ගනේවත්ත, ප්‍රාදේශීය ලේකම් – ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, උඩුබද්දාව, අමාත්‍යාංශ නියෝජිත/අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික – ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව, ප්‍රාදේශීය ලේකම් – ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ඉපලෝගම, අධ්‍යක්ෂ – කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව (මහා භාණ්ඩාගාරය), නියෝජ්‍ය අධ්‍යක්ෂ/අධ්‍යක්ෂ – ශ්‍රී ලංකා රේගුව, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්/අධ්‍යක්ෂ (ක්‍රීඩා සංවර්ධන), අතිරේක ලේකම් – ජන සන්නිවේදන අමාත්‍යාංශය, අධ්‍යක්ෂ – මන්තායි සෝල්ට් ලිමිටඩ්, කොමිෂන් සභා සාමාජික – ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම (LRC), අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික – සී/ස කුසලතා සංවර්ධන අරමුදල් සමාගම (SDFL), වැඩ බලන සභාපති – ස්වාධීන රූපවාහිනී සංස්ථාව (ITN), අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික – දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය (NATA), අමාත්‍යාංශ නියෝජිත – ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික – සැලසිනේ රූපවාහිනී ආයතනය



දුෂ්‍යන්ත බස්නායක මහතා

ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

BAC BNC BNNEC **BITSC**

පත් කරන ලද දිනය

2023 මාර්තු 31

නිපුනතා සහ අත්දැකීම්

බස්නායක මහතා එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනයේ (CIMA-UK) අධිසාමාජිකයෙකු සහ වරලත් ගෝලීය කළමනාකරණ ගණකාධිකාරිවරයෙකු (CGMA) වේ. ඔහු ශ්‍රී ලංකා අලෙවි ආයතනයේ

අධ්‍යක්ෂ මණ්ඩලය

සහතිකලත් සාමාජිකයෙකු මෙන්ම ශ්‍රී ලංකා වරලත් වෘත්තීය කළමනාකරුවන්ගේ ආයතනයේ අධි සාමාජිකයෙකි. ඒ මහතා එක්සත් රාජධානියේ ලන්ඩන් මෙට්‍රොපොලිටන් විශ්ව විද්‍යාලයේ (UK) ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශ්‍රාස්ත්‍රවේදී (ගෞරව) උපාධිධරයෙකු වන අතර ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණය පිළිබඳව පශ්චාත් උපාධි ආයතනයෙන් (PIM) ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විධායක පශ්චාත් උපාධියක් (EMBA) ලබා ඇත. එමෙන්ම, ඔහු එක්සත් රාජධානියේ කාඩිෆ් මෙට්‍රොපොලිටන් විශ්ව විද්‍යාලයේ ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ නීතිපති උපාධියකට හිමිකම් කියයි.

බස්නායක මහතා ලොව විශාලතම වෘත්තීය සේවා ජාලයක් වන අර්න්ස්ට් ඇන්ඩ් යන්ග් (Ernst & Young) ආයතනයෙන් තම ගණකාධිකාරී වෘත්තිය ආරම්භ කළේය. ඔහු විවිධ රාජ්‍ය ආයතන වල සහ රාජ්‍ය අංශයේ සමාගම් වල විධායක තනතුරු දැරූ පුළුල් නිපුනතාවයක් හා වසර 35 කට වැඩි අත්දැකීම් සහිත කළමනාකරණ උපදේශක වරයෙකි.

වෙනත් වර්තමාන තනතුරු

සභාපති – සී/ස ආයු වෙන්චර්ස් පුද්ගලික සමාගම, සී/ස මෙඩිමාකට් පුද්ගලික සමාගම අධ්‍යක්ෂ – MIDAS සෙක්රටේරියල් සර්විසස් පුද්ගලික සමාගම, ඒෂියන් මැනේජ්මන්ට් පුද්ගලික සමාගම, ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව

මින් පෙර දැරූ තනතුරු

කළමනාකරණ අධ්‍යක්ෂ – ශ්‍රී ලංකා රක්ෂණ සමාගම, සිනොලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා පුද්ගලික සමාගම, මූල්‍ය අධ්‍යක්ෂ – සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම, අධ්‍යක්ෂ – සී/ස ගල්ඔය වැවිලි සමාගම, විධායක අධ්‍යක්ෂ – Apogee සමූහය සහ සී/ස ලංකා ප්‍රවෘත්ති පත්‍ර සමාගම



අශේන් ජයසේකර මහතා
ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

BAC BHRRC BIRMC BITSC

පත් කරන ලද දිනය
2024 ජනවාරි 9

නිපුනතා සහ අත්දැකීම්

අශේන් මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ, එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනයේ (CIMA-UK) සහ බ්‍රිතාන්‍ය පරිගණක සමාජයේ අධිසාමාජිකයෙකි. ඔහු සිංගප්පූරු බෙරැම්කරණ ආයතනයේ සහ වරලත් අලෙවි ආයතනයේ අනුබද්ධ සාමාජිකයෙක් වන අතර එක්සත් රාජධානියේ වරලත් අලෙවි ආයතනයේ අලෙවිකරණය පිළිබඳ උපාධිධරයෙකි. ඒ මහතා ලන්ඩන් මෙට්‍රොපොලිටන් විශ්වවිද්‍යාලයෙන් තොරතුරු පද්ධති පිළිබඳ විද්‍යාවේදී උපාධියක් සහ දකුණු කැරොලිනා විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනවේදී පශ්චාත් උපාධියක් ලබා ඇත. එසේම, ඔහු එක්සත් රාජධානියේ කාඩිෆ් මෙට්‍රොපොලිටන් විශ්ව විද්‍යාලයේ තොරතුරු තාක්ෂණය හා බුද්ධිමය දේපළ පිළිබඳ නීතිපති උපාධියක් හිමිකරගෙන තිබේ. ජයසේකර මහතා සහතිකලත් අභ්‍යන්තර විගණකවරයෙක්, සහතිකලත් වංචා විමර්ශකයෙක්, සහතිකලත් තොරතුරු පද්ධති විගණකවරයෙක් මෙන්ම ඇමරිකා එක්සත් ජනපදයේ පරිගණක අපහාරක වෝහාරික විමර්ශකයෙක් ද වේ. වර්තමානයේදී ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ පාලක කවුන්සිලයේ සාමාජිකයෙක් ලෙස කටයුතු කරන අතර ගිණුම්කරණ හා ව්‍යාපාර පාසලේ කළමනාකරණ අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති ධූරය දරයි. හෙතෙම ප්‍රධාන පෙළේ රාජ්‍ය හා පෞද්ගලික විශ්වවිද්‍යාල රැසක බාහිර කථිකාචාර්යවරයෙක් ලෙස කටයුතු කරන අතර වංචා හා වෝහාරික ගිණුම්කරණය ශ්‍රී ලංකාවේ උපාධි හා පශ්චාත් උපාධි පාඨමාලා සඳහා විෂයයක් ලෙස හඳුන්වාදීම සහ උගැන්වීමෙහිලා පුරෝගාමී මෙහෙවරක් ඉටු කළේය.

වෙනත් වර්තමාන තනතුරු

ශ්‍රී ලංකාවේ බී ඩී ඕ පාර්ට්නර්ස් ආයතනයේ නියෝජ්‍ය කළමණාකරණ අධ්‍යක්ෂ සහ සීමාසහිත බී ඩී ඕ පාර්ට්නර්ස් පුද්ගලික සමාගමේ කළමණාකරණ අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ සභා සාමාජික, කොළඹ විශ්ව විද්‍යාලයේ සභා සාමාජික (අයි එස් ඒ සී ඒ ග්ලෝබල් යූ එස් ඒ ආයතනයට අනුබද්ධ තොරතුරු තාක්ෂණ පද්ධති විගණන සහ පාලන සංගමයේ ශ්‍රී ලාංකික පරිෂදයේ (ISACA Sri LANKA Chapter) උප සභාපති, ඇමෙරිකා එක්සත් ජනපදයේ සහතිකලත් වංචා විමර්ශකයන්ගේ සංගමයේ ගෝලීය උපදේශන සභාවේ (Global ADVISORY Council of the Association of Certified Fraud Examiners USA) සාමාජික, ඇමෙරිකා එක්සත් ජනපදයේ විද්‍යුත් වාණිජ්‍ය පිළිබඳ උපදේශකවරුන්ගේ සභාවේ පරිගණක අධිකරණ වෛද්‍ය විද්‍යාව පිළිබඳ ගෝලීය උපදේශන සභාවේ (Global Advisory Board on Computer Forensics of EC Council USA) සාමාජික.

මින් පෙර දැරූ තනතුරු

LB ෆිනෑන්ස් පුද්ගලික සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකයෙක් ලෙස මෙන්ම බීටී කම්යුනිකේෂන් පුද්ගලික සමාගම (එක්සත් රාජධානියේ බ්‍රිටිෂ් ටෙලිකොම් ග්ලෝබල් සර්විසස් ආයතනයේ පරිපාලිතයකි), බී ඩී ඕ බී පී ඕ සේවා පුද්ගලික සමාගම සහ බී ඩී ඕ ප්‍රයිම් කන්සල්ටන්ස් පුද්ගලික සමාගම යන ආයතන වල අධ්‍යක්ෂවරුයෙකු ලෙසද අශේන් මහතා කටයුතු කර තිබේ.



එච් කේ ඩී ලක්ෂ්මන් ගාමිණී මහතා
ස්වාධීන නොවන
විධායක නොවන අධ්‍යක්ෂක

පත් කරන ලද දිනය
2020 දෙසැම්බර් 14

විශ්‍රාම ගිය දිනය
2023 දෙසැම්බර් 14

නිපුනතා සහ අත්දැකීම්

ගාමිණී මහතා අත්දැකීම් බහුල බැංකුකරුවකු වන අතර ඔහු මහජන බැංකුවේ දශක 03 කට වැඩි කාලයක් සේවය කර 2014 වසරේ විශ්‍රාම ලබා ඇත. ඔහු සිය සේවා කාලය තුළ පුළුල් වශයෙන් ශාඛා බැංකු කටයුතු හා ජාත්‍යන්තර බැංකු කටයුතු යන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් කටයුතු කර ඇත.

වෙනත් වර්තමාන තනතුරු

අධ්‍යක්ෂ – ත්‍රී ස්ට්‍රාර් ලොජිස්ටික් පුද්ගලික සමාගම, අධ්‍යක්ෂ – එන් එස් බී ෆන්ඩ් මැනේජ්මන්ට් පුද්ගලික සමාගම, අධ්‍යක්ෂ – ණය තොරතුරු කාර්යාංශය (CRIB).

මින් පෙර දැරූ තනතුරු

උප සභාපති, රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව, අධ්‍යක්ෂ – නිපුණතා සංවර්ධන අරමුදල, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුනුණු අමාත්‍යාංශය.

අධ්‍යක්ෂ මණ්ඩලය



ශෂී කණ්ඩම්බි මහත්මිය
සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී

පත් කරන ලද දිනය

2024 ජනවාරි 10

නිපුනතා සහ අත්දැකීම්

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාත් කළමනාකරණ උපාධි ආයතනයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධියක් සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරුවන්ගේ ආයතනයෙන් ව්‍යාපාර සහ මූල්‍ය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා ඇති ඇය ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයෙන් බැංකුකරණය පිළිබඳ ඩිප්ලෝමාවක් හදාරා තිබේ.

කණ්ඩම්බි මහත්මිය සම්පත් බැංකුවේ ජාත්‍යන්තර බැංකු කටයුතු අංශයේ හිටපු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරිය වන අතර ඇය එහිදී දීර්ඝ සහ සාර්ථක වෘත්තීය ජීවිතයක් ගොඩනගා ගැනීමට සමත් වූවාය. ඇය ආයතන කළමනාකරණය ඇතුළුව වසර 35 කට වැඩි බැංකුකරණ අත්දැකීම් සමුදායකට හිමිකම් කියයි. ජාත්‍යන්තර බැංකු මෙහෙයුම් හා වෙළඳ සේවා, ආයතනික ණය, ආයතනික ඩිජිටල්කරණය, ආයතනික මූල්‍ය, විදේශ විනිමය බැංකුකරණ ඒකකය, භාණ්ඩාගාර, ප්‍රාථමික ගනුදෙනු ඒකකය, නීති, ණය අයකරගැනීම් සහ ජාත්‍යන්තර වෙළඳ යන අංශ සම්බන්ධයෙන් පුළුල්ව අත්දැකීම් ලද ඇය සාර්ථකව උපායමාර්ගික සැලසුම් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම, මූල්‍ය සම්පත් කළමනාකරණය, අවදානම් අවම කරගැනීම සහ දැඩි ආයතනික පාලන ප්‍රමිතීන් පවත්වා ගැනීම සම්බන්ධයෙන් සිය ප්‍රවීණතාවය සනාථ කර තිබේ. ගනුදෙනුකරුවන් කේන්ද්‍ර කරගත් නව්‍යකරණය සහ තාක්ෂණය, නියාමන අනුකූලතාවය සහ ආපදා කළමනාකරණය පිළිබඳවද හසල දැනුමක් ඇය සතුය.

වෙනත් වර්තමාන තනතුරු

ඒ මහත්මිය, SWIFT User Group හි සහ ජාතික සමාජික කණ්ඩායමේ (National Member Group) සභාපතිධුරය හොබවන අතර ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා මූල්‍ය ඔම්බඩ්ස්මන්වරයාගේ අධ්‍යක්ෂ, අධ්‍යක්ෂ – එන්එස්බී ෆන්ඩ් මැනේජ්මන්ට් සමාගම හා ලංකා ෆයිනෑන්ෂල් සර්විසස් සමාගම සහ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ සංගමයේ උපදේශකවරුන්ගේ කවුන්සිලයේ සාමාජික යන තනතුරුද දරයි.

මින් පෙර දැරූ තනතුරු

ආයතනික කළමනාකරණය සඳහා වෙන්වූ වසර 10 ක කාලයක් ඇතුළුව බැංකුකරණ ක්ෂේත්‍රයේ දශක තුනකට වැඩි අත්දැකීම් හා පළපුරුද්ද සමග ඇය සම්පත් බැංකුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි තනතුර දැරුවාය. වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමයේ හිටපු සභාපතිනිය හා ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ සංගමයේ අධ්‍යයන කවුන්සිලයේ සාමාජිකාවක වශයෙන්ද ඒ මහත්මිය කටයුතු කළාය.



අනුපමා මුහන්දිරම් මිය
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

පත් කරන ලද දිනය

2016 දෙසැම්බර් 6

නිපුනතා සහ අත්දැකීම්

නීතිඥවරියක් වන අනුපමා මුහන්දිරම් මහත්මිය එක්සත් රාජධානියේ කාර්ඩිෆ් මෙට්‍රොපොලිටන් විශ්ව විද්‍යාලයෙන් නීතිපති උපාධියක් (LLM), ඉන්දියාවේ මනිපාල් විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධියක් (MBA) සහ නීති අධ්‍යාපනය පිළිබඳ ශ්‍රී ලංකා සංස්ථාපිත කවුන්සිලයෙන් බැංකු සහ රක්ෂණය පිළිබඳ පශ්චාත් නීතිඥ ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා ඇත. දැනට ඇය වරලත් ආයතනික ලේකම්වරයෙකු ලෙස සුදුසුකම් ලැබීම සඳහා අවශ්‍ය සුදුසුකම් හදාරමින් සිටී.

2016 දෙසැම්බර් 6 වන දින ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් තනතුරට පත්වීමට ප්‍රථම ඇය 2015 නොවැම්බර් මස සිට 2016 දෙසැම්බර් මස දක්වා අධ්‍යක්ෂ මණ්ඩල සහකාර ලේකම්වරිය ලෙස කටයුතු කළාය. එසේම, ඇය 2015 සිට 2017 දක්වාවූ කාල සීමාව තුළදී එන් එස් බී ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පැනි ලිමිටඩ් හි සමාගම් ලේකම් වශයෙන්ද කටයුතු කළාය. ඒ මහත්මියගේ වසර 27 කට වැඩි බැංකු හා මූල්‍ය ක්ෂේත්‍රයේ අත්දැකීම් අතුරින් වසර 18 කට වැඩි කාලයක් ඇය මහජන බැංකුවේ ජ්‍යෙෂ්ඨ නීති නිලධාරිණියක හා අධ්‍යක්ෂ මණ්ඩල සහකාර ලේකම්වරියක ලෙස සේවය කර ඇත.

සබරගමුව විශ්ව විද්‍යාලයේ වාණිජ නීතිය පිළිබඳ බාහිර කථිකාචාර්යවරියක් ලෙසද සේවය කරන මුහන්දිරම් මහත්මිය ශ්‍රී ලංකා බැංකු අධ්‍යක්ෂ මණ්ඩල/සමාගම් ලේකම්වරුන්ගේ සංගමයේ නිර්මාතෘ ලේකම්වරිය වේ. ඇය පුහුණු නීතිවේදිනියක ලෙස ඔස්ට්‍රේලියානු නීති සමාගමකට අනුයුක්තව නීති ක්ෂේත්‍රයට අදාළව විදෙස් අත්දැකීම් ලබාගැනීමට යොමුව සිටී.

BNNEC
හදිසි නොවන සහ අත්‍යවශ්‍ය නොවන වියදම් පිළිබඳ කමිටුවේ – සාමාජික

BNNEC
හදිසි නොවන සහ අත්‍යවශ්‍ය නොවන වියදම් පිළිබඳ කමිටුවේ – සභාපති

BIRMC
ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ – සාමාජික

BIRMC
ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ – සභාපති

BAC
අධ්‍යක්ෂක මණ්ඩල විගණන කමිටුවේ – සාමාජික

BAC
අධ්‍යක්ෂක මණ්ඩල විගණන කමිටුවේ – සභාපති

BHRRC
මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේ – සාමාජික

BHRRC
මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේ – සභාපති

BNC
නාමයෝජනා කමිටුවේ – සාමාජික

BNC
නාමයෝජනා කමිටුවේ – සභාපති

** 2024 පෙබරවාරි 20 වැනි දින සභාපති/සාමාජිකත්වයෙන් සැදුම් ලත් අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු ප්‍රතිසංවිධානය කරන ලදී.*

ආයතනික කළමනාකාරිත්වය



ශෂී කණ්ඩම්බි මහත්මිය
සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී



කේ රවීන්ද්‍රන් මහතා
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී



ජී වී ඒ ඩී ඩී සිල්වා මෙය
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(භාණ්ඩාගාර සහ ජාත්‍යන්තර)



ජී ඩබ්ලිව් ඊ ජයවීර මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (විගණන)



එම් එන් ඒ ප්‍රනාන්දු මෙය
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් සංවර්ධන)



ආචාර්ය ඒ කේ එල් ඉලේසිංහ මහතා
ප්‍රධාන තොරතුරු නිලධාරී
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (තොරතුරු තාක්ෂණ)



ඩබ් එම් ආර් බී වීරකෝන් මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පරිපාලන)



කේ ඩී ජයතිලක මිය
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නීති)/ප්‍රධාන නීති නිලධාරී

විධායක කළමනාකාරිත්වය



කේ එම් ඩබ් එම් කරුණාරත්න මහතා
සහකාර සාමාන්‍යාධිකාරී (ඉංජිනේරු)



ජේ එච් ටී චන්ද්‍රරත්න මහතා
සහකාර සාමාන්‍යාධිකාරී (ඉංජිනේරු)



ඒ එල් ඒ හලීම් මහතා
සහකාර සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්)



ඩබ්ලිව් පී යූ ඒ ද සිල්වා මිය
සහකාර සාමාන්‍යාධිකාරී (ආයතනික මූල්‍ය)



ආර් ඒ එන් එන් විජේසිංහ මිය
සහකාර සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්)



අයි කේ එල් සසී මහේන්ද්‍රන් මිය
අනුකූලතා නිලධාරී



ආර් පී ඒ එම් පී රාජනායක මිය
ප්‍රධාන අවදානම් නිලධාරී



සී ඩබ් පතිරණ මිය
සහකාර සාමාන්‍යාධිකාරී (උපකාරක සේවා)



එස් ඩබ් ඒ වීරසිංහ මිය
සහකාර සාමාන්‍යාධිකාරී (භාණ්ඩාගාර)

විධායක කළමනාකාරිත්වය



එල් සී සේනානායක මහතා
සහකාර සාමාන්‍යාධිකාරී (තොරතුරු තාක්ෂණ)



එම් ඒ පී මුහන්දිරම් මිය
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්



එම් ඩී සුරන්ජන මහතා
සහකාර සාමාන්‍යාධිකාරී (විගණන)



එච් එම් පී පී ජේ හේරත් මහතා
සහකාර සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්)



එස් සිවසොරුපන් මහතා
සහකාර සාමාන්‍යාධිකාරී (තැපැල් බැංකු)



ඩී එම් සී පී බී දිසානායක මහතා
සහකාර සාමාන්‍යාධිකාරී
(මධ්‍යගත බැංකුකරණ පද්ධති)



එස් එච් ඒ එස් කුමාරි මිය
සහකාර සාමාන්‍යාධිකාරී (ණය අයකර ගැනීම්)



ඩී එල් පී අබේසිංහ මහතා
ප්‍රධාන විධායක නිලධාරී
(එන්එස්බී ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පනි)



එච් එම් එම් හේරත් මහතා
සහකාර සාමාන්‍යාධිකාරී (තොරතුරු තාක්ෂණ)

ප්‍රධාන කළමනාකරුවන්

එච් එම් පී හේරත් මහතා
ශාඛා කළමනාකරු
බත්තරමුල්ල ශාඛාව

එස් පී එස් පී කේ පියරත්න මහතා
ශාඛා කළමනාකරු
ප්‍රධාන කාර්යාලයීය ශාඛාව

කේ වී ඩබ් එස් දර්ශන මහතා
ශාඛා කළමනාකරු
කළුතර ශාඛාව

එච් එම් ආර් පුෂ්පකුමාර මහතා
ශාඛා කළමනාකරු
කුලියාපිටිය ශාඛාව

ටී ඒ ඩී එන් අනුරුද්ධි මිය
ශාඛා කළමනාකරු
ගාල්ල ශාඛාව

ඊ ඒ ආර් අබේසිංහ මහතා
ප්‍රධාන කළමනාකරු
ණය අංශය

ජී ඒ ඩී ගොඩමුල්ල මිය
ප්‍රධාන කළමනාකරු (සැලසුම්)
මුදල් හා සැලසුම් අංශය

අයි එන් එස් ඒ නානායක්කාර මහතා
ශාඛා කළමනාකරු
නුගේගොඩ ශාඛාව

ඩබ් එම් එම් ආර් පී පෙරේරා මහතා
ශාඛා කළමනාකරු
නගර ශාඛාව

ආර් එම් සී කේ රාජපක්ෂ මහතා
ප්‍රධාන කළමනාකරු
තැපැල් බැංකු පාලන අංශය

ඒ ඩී ධර්මප්‍රිය මිය
ප්‍රධාන කළමනාකරු (නීති)
මහනුවර ශාඛාව

ඩබ් ඒ යූ නන්දන මහතා
ශාඛා කළමනාකරු
පිළියන්දල ශාඛාව

පී වී ආර් සිසිර කුමාර මහතා
ශාඛා කළමනාකරු
කුරුණෑගල ශාඛාව

එස් එස් ජේ පී එස් ද සිල්වා මිය
ප්‍රධාන කළමනාකරු (මූල්‍ය)
මුදල් හා සැලසුම් අංශය

එච් එස් පී රණවීර මහතා
ප්‍රධාන කළමනාකරු (මූල්‍ය)
මුදල් හා සැලසුම් අංශය

එස් ඒ ඒ බටුවන්තුඩාව මහතා
ප්‍රධාන කළමනාකරු
ණය අංශය

එස් ඒ එම් ඒ සී ජේ එස් කේ සේනාරත්න මිය
ප්‍රධාන කළමනාකරු (නීති)
නීති අංශය

එන් අයි ගුණතිලක මිය
ප්‍රධාන කළමනාකරු
ණය අංශය

කේ බී එන් සී කුමාරි මිය
ප්‍රධාන කළමනාකරු (මූල්‍ය)
මුදල් හා සැලසුම් අංශය

එම් ඩී ටී පෙරේරා මිය
ප්‍රධාන කළමනාකරු (අලෙවි)
අලෙවි අංශය

ඩබ් ඊ සී පෙරේරා මිය
ප්‍රධාන කළමනාකරු
අවදානම් කළමනාකරණ අංශය

ජේ එල් පී මංජුල මහතා
ප්‍රධාන කළමනාකරු (සැපයුම්)
සැපයුම් අංශය

කේ සී ත්‍යානන්දන් මිය
ශාඛා කළමනාකරු
යාපනය ශාඛාව

ඒ එම් ජී අලහකෝන් බණ්ඩා මහතා
ශාඛා කළමනාකරු
ගම්පහ ශාඛාව

එන් ඩී සී ඩී කුලරත්න මහතා
ශාඛා කළමනාකරු
මීගමුව ශාඛාව

ආර් ටී සුබසිංහ මහතා
ශාඛා කළමනාකරු
හෝමාගම ශාඛාව

සී එන් ඒකනායක මිය
ප්‍රාදේශීය කළමනාකරු (බටහිර 2)
ප්‍රාදේශීය කාර්යාලය (බටහිර 2)

එස් බී සුරංග මහතා
ප්‍රාදේශීය කළමනාකරු (බටහිර 1)
ප්‍රාදේශීය කාර්යාලය (බටහිර 1)

ජේ එම් ඒ කේ ජයසිංහ මිය
ප්‍රාදේශීය කළමනාකරු (වයඹ)
ප්‍රාදේශීය කාර්යාලය (වයඹ)

එන් බහිරදන් මහතා
ප්‍රාදේශීය කළමනාකරු (උතුර)
ප්‍රාදේශීය කාර්යාලය (උතුර)

එච් ඩී යූ සුසන්ත කුමාර මහතා
ප්‍රාදේශීය කළමනාකරු (දකුණ)
ප්‍රාදේශීය කාර්යාලය (දකුණ)

ඩී ඒ වී විජේවන්ත මිය
ප්‍රාදේශීය කළමනාකරු (සබරගමුව)
ප්‍රාදේශීය කාර්යාලය (සබරගමුව)

කේ සන්සායන් මහතා
ප්‍රාදේශීය කළමනාකරු (නැගෙනහිර)
ප්‍රාදේශීය කාර්යාලය (නැගෙනහිර)

එස් එන් ආර් සේනාධීර මහතා
ප්‍රාදේශීය කළමනාකරු (මධ්‍යම)
ප්‍රාදේශීය කාර්යාලය (මධ්‍යම)

ඒ බී සී ආර් විජයපාල මහතා
ප්‍රධාන කළමනාකරු
ශාඛා කළමනාකරණ අංශය

එම් වී ජී සුසිල් කුමාර මහතා
ප්‍රධාන කළමනාකරු (ජාත්‍යන්තර බැංකු)
ජාත්‍යන්තර බැංකු අංශය

එම් ඩබ්ලිව් කේ සී ද සිල්වා මහතා
ප්‍රධාන කළමනාකරු
සේවාවසාන ප්‍රතිලාභ අංශය

කේ ඩී කේ කේ විජයවර්ධන මහතා
ප්‍රධාන කළමනාකරු
කාඩ් මධ්‍යස්ථානය

ඒ පී ආර් ද සොයිසා මහතා
ප්‍රධාන කළමනාකරු (තොරතුරු තාක්ෂණ)
තොරතුරු තාක්ෂණ අංශය

ප්‍රධාන කළමනාකරුවන්

ඒ බී විමලදාස මහතා
ශාඛා කළමනාකරු
මහරගම ශාඛාව

ඩී ජී එස් ජයතිස්ස මහතා
ශාඛා කළමනාකරු
බදුල්ල ශාඛාව

එච් එල් එස් විජේසිංහ මහතා
ප්‍රධාන කළමනාකරු (මුදල්)
මුදල් හා සැලසුම් අංශය

ඊ ඒ ඒ චන්දිම මහතා
ප්‍රධාන කළමනාකරු (පරිශ්‍ර)
පරිශ්‍ර අංශය

බී එම් එම් සී කේ බස්නායක මිය
ප්‍රධාන කළමනාකරු (තොරතුරු තාක්ෂණ)
තොරතුරු තාක්ෂණ අංශය

යූ පී මල්ලිකා මිය
ප්‍රධාන කළමනාකරු (තොරතුරු තාක්ෂණ)
තොරතුරු තාක්ෂණ අංශය

එස් තනීස්වරන් මහතා
ශාඛා කළමනාකරු
වැල්ලවත්ත ශාඛාව

බී ඒ පේමරත්න මහතා
ප්‍රධාන කළමනාකරු
විගණන හා සුපරීක්ෂණ අංශය

කේ එච් ඒ සුනිල් මහතා
ශාඛා කළමනාකරු
මාතර ශාඛාව

එම් ඩී ඒ පී ගුණතිලක මිය
ප්‍රධාන කළමනාකරු
විදුහුත් බැංකුකරණ ඒකකය

කේ පී රණසිංහ මිය
ශාඛා කළමනාකරු
පානදුර ශාඛාව

එච් පී ටී ජයසූරිය මහතා
ප්‍රධාන කළමනාකරු
ණය අයකර ගැනීම් අංශය

එච් ඒ ඒ සෞම්‍යකාන්ත මහතා
ප්‍රධාන කළමනාකරු
ශාඛා කළමනාකරණ අංශය

අයි එස් ජයසූරිය මහතා
ප්‍රධාන කළමනාකරු
ශාඛා කළමනාකරණ අංශය

එන් එච් එන් එල් නවරත්න මහතා
ප්‍රධාන කළමනාකරු (සුබසාධක)
සුබසාධක අංශය



ආයතනික පාලනය



සභාපතිතුමාගේ පණිවිඩය

ශක්තිමත් ආයතනික පාලනයක් සමගින් අභියෝග මැද ජාතික ඉතිරිකිරීමේ බැංකුව පෙරට ගෙනයමින්...

දයාබර පාර්ශ්වකරුවනි,

නිරන්තර වෙනස්වීම් සහ අවිනිශ්චිත බව පොදු ලක්ෂණය වූවත් ආයතනික පාලනයේ විශිෂ්ටත්වය නොවෙනස්ව පවත්වාගැනීමෙහිලා ජාතික ඉතිරිකිරීමේ බැංකුව කැපවී සිටී. විවලනය වන ආර්ථික පරිසරය, වේගයෙන් විකාශය වන ගෝලීය භූ දර්ශනය හේතුවෙන් ඇතිවන සංකීර්ණතා සහ තාක්ෂණික දියුණුව විසින් එල්ල කරන ලබනු අභියෝග මධ්‍යයේ මග හෙළි කරගෙන ඉදිරියට ගමන් කිරීමට අපට උපකාර වන්නේ අපගේ ඒ නොසැලෙන කැපවීමයි.

පුළුල් පරාසයක විහිදුනු විශේෂඥ, දැනුමෙන් හෙබි මෙරට විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරන ප්‍රවීණ ව්‍යක්තිකයන්ගෙන් සමන්විත අපගේ අධ්‍යක්ෂ මණ්ඩලය අපගේ පාලන කාර්ය රාමුවෙහි පදනම වේ. දූරදර්ශීව හා නිසි ඉදිරි දැක්මකින් යුතුව පවතින දුෂ්කර හා අභියෝගකාරී ආර්ථික වාතාවරණය මධ්‍යයේ අප සවිමත්ව පෙරට යන බව සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් උපයාශීලී මගපෙන්වීම සහ අධීක්ෂණය සිදු කරනු ලබයි. අපගේ පාර්ශ්වකරුවන්ගේ අභිලාෂ ඉටුවන අයුරින් තොරතුරු මත පදනම් වූ තීරණ ගැනීමේ ක්‍රියාවලියකට මග පාදමින් විවෘත සංවාද සහ විස්තීරණ විවාද කෙරෙන සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීමට අපි කැපවී සිටිමු.

වෙනස්වන ආර්ථික පරිසරයක් මැද පෙරටම...

ආර්ථික විවලන යනු ඕනෑම මූල්‍ය ආයතනයකට ප්‍රතික්ෂේප කළ නොහැකි යථාර්ථයකි. කෙසේවුවත්, ශක්තිමත් ආයතනික පාලන පරිචයන් සමග මෙම දුෂ්කරතා ජයගැනීමට බැංකුව මැනවින් සූදානම්ව සිටී. අනපේක්ෂිත පාඩු වලට සාර්ථකව මුහුණදීම සඳහා උපකාර වන පලිහක් ලෙස ක්‍රියාකරන සහ ආර්ථික පසුබෑම්වලදී මෙහෙයුම් වල අඛණ්ඩතාවය සහතික කරන ශක්තිමත් ප්‍රාග්ධන පදනමක් පවත්වාගැනීම ප්‍රමුඛ කාර්යයක් ලෙස අප විසින් හඳුනාගෙන ලැබ තිබේ. එයට අමතරව, අපගේ මෙහෙයුම්හි සියළු මට්ටම්හිදී මතු විය හැකි අවදානම් හඳුනාගැනීමට, තක්සේරු කිරීමට සහ වළක්වාගැනීමට ආධාර වන විස්තීරණ කාර්ය රාමුවක් භාවිතයට ගැනීම ඔස්සේ මනා අවදානම් කළමනාකරණ මූලධර්ම සමග අනුකූලවීමට අපි කටයුතු කරන්නෙමු. අවසාන වශයෙන් අපි බැංකුව තුල විනිවිදභාවය හා වගවීම මත පදනම්වූ සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීමට උත්සුක වන්නෙමු. මෙලෙස පැහැදිලි සන්නිවේදනයක් සහතික කිරීම උදෙසා වන අපගේ කැපවීම සහ ඉහළම මට්ටමේ ආචාර ධර්මීය ප්‍රමිති සම්බන්ධයෙන් දක්වන අනුකූලතාවය අපගේ පාර්ශ්වකරුවන් හා අප අතර විශ්වාසය ගොඩනගාගැනීමට මෙන්ම ඕනෑම ආර්ථික තත්ත්වයක් යටතේ වුවත් තොරතුරු මත පදනම්වූ තීරණ ගැනීමේ ක්‍රියාවලියක් පවත්වා ගැනීමට අපට හැකියාව ලබාදෙයි.

වේගයෙන් පරිවර්තනය වන ගෝලීය සන්දර්භයට අනුගත වෙමින්...

වර්තමාන ගෝලීය සන්දර්භය නිරන්තරයෙන් වෙනස්වෙමින් හා විකාශය වෙමින් තිබෙන අතර එම ස්වභාවය විසින් වාසිදායක අවස්ථා මෙන්ම අනපේක්ෂිත අභියෝග අප ඉදිරියේ තබනු ලබයි. ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ශක්තිමත් පාලන කාර්ය රාමුව මෙකී පරිවර්තන වලට අපට අනුගත වීමට හා ප්‍රතිචාර දැක්වීමට අපට උපකාර කරයි. අපගේ ව්‍යාපාරය කෙරෙහි බලපෑමක් ඇති කරන ගෝලීය ආර්ථික ප්‍රවණතා සමග උරෙනුර ගැටී හිඳිමින් අපි පැන නගින ප්‍රවණතා සක්‍රීයව නිරීක්ෂණය කරන්නෙමු. එසේම, අපගේ සේවා වල ගුණාත්මකභාවය ඉහළ නැංවීම, කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම සහ විශිෂ්ට ගනුදෙනුකාර අත්දැකීමක් තිළිණ කිරීම සඳහා අපි නව්‍යකරණය වෙනුවෙන් උපායමාර්ගිකව ආයෝජනය කරමින් නව තාක්ෂණික ප්‍රවණතා අපගේ මෙහෙයුම් සමග බද්ධ කිරීමට සැදී පැහැදී සිටිමු. මනා ආයතනික පාලනයක් ඇති කිරීම අපගේ ප්‍රමුඛතම කාර්යයක් ලෙස හඳුනාගැනීම ඔස්සේ තොරතුරු මත පදනම්වූ තීරණ ගැනීමට, අපගේ උපායමාර්ග සුමට ලෙස අනුගත කිරීමට සහ නිරන්තරයෙන් විකාශය වන මූල්‍ය ක්ෂේත්‍රය තුල තරඟකාරී වාසියක් පවත්වා ගනිමින් මතු වන නව වෙළඳපොල අවස්ථා උපරිම ලෙස උපයෝජනය කිරීමට අපට හැකියාව ලැබේ.

තිරසාරභාවය ප්‍රධාන වටිනාකමක් ලෙස හඳුනාගනිමින්...

ජාතික ඉතිරිකිරීමේ බැංකුව තුල තිරසාරභාවය යන යෙදුම හුදෙක් ප්‍රචලිත ව්‍යවහාරයක් පමණක් නොවේ: එය අපගේ ආයතනික පාලන දර්ශනය හා ගැඹුරින් සංයෝග වූ ප්‍රධාන මූලධර්මයකි. අපගේ ව්‍යාපාර පරිචයන් ලාභදායීතාවය පමණක් නොව සමාජ වගකීමද යථාර්ථවත් කරන බව සහතික කරමින් පාරිසරික, සමාජයීය සහ පාලන සාධක අපගේ තීරණ ගැනීමේ ක්‍රියාවලිය හා බද්ධ කිරීමට අපි කටයුතු කරමු. එසේම, මූල්‍ය අන්තර්ග්‍රහණය ප්‍රවර්ධනය කිරීම, සියළු සමාජ ස්ථර වලට අපගේ මූල්‍ය සේවා වෙත පහසුවෙන් ළඟාවීමේ හැකියාව ලබාදීම සහ ආර්ථික සවිබලගැන්වීම හා වර්ධනය ප්‍රවර්ධනය කිරීම පිණිස අපි කැපවී සිටිමු.

දිගු කාලීනව නොසැලී සිටිමින්...


ශක්තිමත් ආයතනික පාලනයක් සඳහා ප්‍රමුඛතාව ලබාදෙමින් ජාතික ඉතිරිකිරීමේ බැංකුව අභියෝග හමුවේ නොසැලී සිටීමේ ධර්මතාව ප්‍රකට කරයි. ආර්ථික පසුබෑම් වලට සාර්ථකව මුහුණ දීමට, වෙනස්වන වෙළඳපොල සාධක වලට අනුගත වීමට සහ නව අවස්ථා ග්‍රහණය කරගැනීමට අපි මනාව සූදානම්ව සිටිමු. අපගේ ස්ථාවර මූල්‍ය පරිචයන් සහ අවදානම් කළමනාකරණ උපායමාර්ග ආර්ථික දුෂ්කරතා එළඳාසීව කළමනාකරණය කරගැනීමට අපට ආධාර වේ. එසේම, වෙළඳපොල විකාශනය සමග පැන නගින නව අවස්ථා වාසිදායක අයුරින් උපයෝජනය කිරීමට සහ මතු වන අවදානම් වළක්වාගැනීම සඳහා අපගේ අනුවර්තනීය පාලන කාර්ය රාමුව අපට සහය වේ. අවසාන වශයෙන්, අපගේ ව්‍යාපාර පරිචයන් ඔස්සේ ලාභදායීතාවය ජනිත කරන අතරම අප සේවා සපයන ප්‍රජාවගේ යහපැවැත්ම සඳහා දායක වන බව සහතික කිරීමට තිරසාරභාවය කෙරෙහි වන අපගේ කැපවීම හේතු සාධක වේ.

අවසාන වශයෙන්, ලබාදුන් විශිෂ්ට සහයෝගය සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව කෙරෙහි තබන ලද නොසැලෙන විශ්වාසය වෙනුවෙන් අපගේ පාර්ශ්වකරුවන්, ගනුදෙනුකරුවන්, සේවා නියුක්තිකයන් සහ අනෙකුත් පාර්ශ්වකරුවන් වෙත මාගේ හෘදයාංගම ස්තුතිය පුද කිරීමට මා මෙය අවස්ථාව කරගනිමි. ආචාර ධර්මීය පරිචයන්, විනිවිදභාවය, සහ වගවීම හා සම්බන්ධයෙන් ප්‍රකට කරන ලද අප්‍රතිහත කැපවීම ඔස්සේ වර්තමාන සංකීර්ණතා වලට සාර්ථකව මුහුණදීමටත් නුදුරේදීම මෙරට බැංකු ක්ෂේත්‍රයේ ප්‍රමුඛයෙක් ලෙස නැඟී සිටීමටත් අපට හැකියාව තිබෙන බව අපි උදක්ම විශ්වාස කරමු. ඉදිරියේදී අප හමුවට එන වාසිසහගත අවස්ථා හා අභියෝග මධ්‍යයේ පෙරට යාමට, ශක්තිමත් පාලනයක් කෙරෙහි වන අපගේ නොසැලෙන කැපවීම අපට අඛණ්ඩව උපකාර වනු ඇත.

ජනාධිපති නීතීඥ, ආචාර්ය හර්ෂ කබ්රාල්
සභාපති
2024 මාර්තු 25
කොළඹ

ආයතනික පාලනය

ප්‍රතිඵල පාදක කරගත් අපගේ පාලන ප්‍රවේශය



රූපස 27 →

1 තිරසාර වටිනාකම් උත්පාදනය සඳහා අපගේ ආයතනික පාලන දැක්ම

අන්තර්ග්‍රහණ චින්තනය

අවංකභාවය, විනිවිදභාවය, වගවීම සහ තිරසාරභාවය යන මූලික වටිනාකම් මත පදනම්ව ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අපගේ පාලන දර්ශනය සකස්වී තිබේ. අපගේ පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය ගොඩනැගීම සහ දිගු කාලීන වටිනාකම් උත්පාදනයට අවැසි අත්‍යන්ත සාධකය වන එළදායී පාලනය අපගේ මෙහෙයුම් හි පදනම වේ. අපගේ පාර්ශ්වකරුවන් උදෙසා පමණක් නොව අපගේ සේවකයන්, ගනුදෙනුකරුවන්, ප්‍රජාවන් සහ පරිසරය වෙනුවෙන්ද අප විසින් ඉටු කරනු ලැබිය යුතු යුතුකම් කොටසක් පවතින බව හඳුනාගැනීම පාලනය කෙරෙහි වන අපගේ ප්‍රවේශය තුල ගැබ්ව තිබේ. අප විසින් සිදු කරනු ලබන සියළු කාර්යයන්හිදී අපගේ සියළු පාර්ශ්වකරුවන්ගේ අභිලාෂ සාක්ෂාත් කිරීම පිණිස අවංකභාවයෙන් යුතුව තීරණ ගන්නා බව සහතික කිරීම සඳහා ආචාරධර්මීය ප්‍රවේශයක් කෙරෙහි ප්‍රමුඛතාව ලබාදීමට අපි කටයුතු කරමු. විවෘත සන්නිවේදනය සහ හෙළිදරව් කිරීම ඔස්සේ විශ්වාසය සහ රහස්‍යභාවය ගොඩනැගෙන බව අප විශ්වාස කරන නිසාම විනිවිදභාවය අපගේ පාලන දර්ශනයේ ප්‍රධාන සාධකයක් ලෙස පවත්වාගැනීමට අපි කටයුතු කළෙමු. ඉහළම ප්‍රමිතියේ කාර්ය සාධනයක් සහ ආචාර ධර්මීය ප්‍රවේශයක් සඳහා කැපවෙමින් අභ්‍යන්තර මෙන්ම බාහිර මට්ටමේදීත් අපගේ ක්‍රියා වෙනුවෙන් වගවීමට අපි බැඳී සිටිමු. එසේම, අපගේ මෙහෙයුම් හේතුවෙන් පරිසරය කෙරෙහි ඇතිවන බලපෑම අවම කිරීම, ආයතනික සමාජ සත්කාරක වගකීම ප්‍රවර්ධනය කිරීම සහ අප සේවා සපයන ප්‍රජාවන්ගේ අභිවෘද්ධිය උදෙසා දායකත්වය ලබාදීම සඳහා වන අපගේ ප්‍රයත්නයට මගපෙන්වීම සැපයෙන පරිදි අපි තිරසාරභාවය අපගේ පාලන දර්ශනය තුල කේන්ද්‍රීය සාධකය බවට පත් කළෙමු. මෙම මූලධර්ම වලට අනුකූලවීම ඔස්සේ හුදෙක් නියාමන අවශ්‍යතා සපුරාලීම පමණක් නොව බැංකු ක්ෂේත්‍රය තුල ආයතනික පාලනයෙහි විශිෂ්ටත්වය සම්බන්ධයෙන් මිනුම් දණ්ඩක් ස්ථාපිත කරමින් අපගේ පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂා සපුරාලීම සඳහාද අපි උත්සුක වන්නෙමු.

2 ආයතනික පාලනය හා සම්බන්ධ අපගේ ප්‍රවේශය සහ කාර්යරාමුව

විනිවිදභාවය, වගවීම සහ තිරසාරභාවය අවධාරණය කෙරෙන පුළුල් කාර්ය රාමුවක් මගින් ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අපගේ

ආයතනික පාලනය

ආයතනික පාලනය හා සම්බන්ධ අපගේ ප්‍රවේශය පිළිඹිබු කරයි. ආයතනයේ සියළු මට්ටම් වලදී ඵලදායී අධීක්ෂණය, නිසි තීරණ ගැනීමේ ක්‍රියාවලිය සහ ආයතනික පාලනය හා අනුකූලවීම සහතික කිරීම සඳහා අපගේ ආයතනික පාලන කාර්යරාමුව සකස් කර ඇත. උපායමාර්ගික දිශානතිය ස්ථාපිත කිරීම, කාර්යසාධනය නිරීක්ෂණය කිරීම සහ අවංක භාවයේ ඉහළම ප්‍රමිති පවත්වාගැනීම යන කාර්යයන්හි වගකීම පැවරෙන අධ්‍යක්ෂ මණ්ඩලය අපගේ පාලන ප්‍රවේශයේ කේන්ද්‍රය නියෝජනය කරයි. පාලනයේ ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා වන නිශ්චිත වගකීම් කොටසක් ඉටු කිරීම සඳහා පත් කර තිබෙන අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ වේතන කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩල හදිසි නොවන අත්‍යාවශ්‍ය නොවන ව්‍යදම් කමිටුව යන අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු අධ්‍යක්ෂ මණ්ඩලයට සහය වේ. අවදානම් සක්‍රියව හඳුනාගැනීම, තක්සේරු කිරීම සහ වළක්වාගැනීම සඳහා ශක්තිමත් පද්ධති සමගින් අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් අප විසින් දැඩි අවධානයක් යොමු කරනු ලැබ තිබේ. ඊට අමතරව, පාරිසරික, සමාජයීය සහ පාලන සාධක අපගේ තීරණ ගැනීමේ ක්‍රියාවලීන් සමග බද්ධ කිරීමෙහිලා මාර්ගෝපදේශ සැපයෙන අයුරින් තිරසාරභාවයේ මූලධර්ම අපගේ පාලන කාර්යරාමුවට ඇතුළත් කර ඇත. නිරන්තරයෙන් වෙනස්වන නියාමන අවශ්‍යතා සහ ක්ෂේත්‍රයේ මනා පරිචයන් සමග අනුකූල වීම සඳහා අපගේ පාලන පරිචයන් අඛණ්ඩව වැඩිදියුණු කිරීම, කලින් කලට සමාලෝචනය කිරීම සහ යාවත්කාලීන කිරීම වෙනුවෙන් අපි කැපවී සිටිමු. වගවීම, විනිවිදභාවය සහ තිරසාරභාවය කේන්ද්‍ර කරගත් සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම ඔස්සේ සියළුම පාර්ශ්වකරුවන් වෙනුවෙන් දිගු කාලීන වටිනාකම් නිර්මාණය කිරීම සහ අපගේ ගනුදෙනුකරුවන්, කොටස්කරුවන්, සේවකයන් සහ පුළුල් ප්‍රජාව අතර අප කෙරෙහි විශ්වාසය වර්ධනය කිරීමට අපි උත්සුක වන්නෙමු.

3 අප පාලනය කරන අයුරු

ආදර්ශමත් මූලධර්මීය හැසිරීම, පුද්ගලික මෙන්ම ආයතනික අවංකභාවය සහ අනොන්‍ය ගෞරවය වෙනුවෙන් ප්‍රමුඛතාවය ලබාදෙන සහ ඇගයීමට ලක් කරන පරිසරයක් ප්‍රවර්ධනය කිරීමට අප නිරන්තරයෙන් උත්සුක වන හෙයින් ඉහළම මට්ටමේ පාලනයක් සහතික කිරීම සඳහා වන අපගේ කැපවීම නොසැලෙන සුළුය. වගකිවයුතු ආයතනික පුරවැසිභාවය අවධාරණය කිරීමට අප ගන්නා උත්සාහයේදී අපි අදාළ නියාමන අවශ්‍යතා, ස්වේච්ඡා මාර්ගෝපදේශ හා බැංකුවේම අභ්‍යන්තර ආයතනික පාලන කාර්ය රාමු සමග අපි අනුකූලවීමට අපි කටයුතු කරන්නෙමු.

නියාමන කාර්ය රාමුව

- 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත සහ එහි සංශෝධන
- 1988 අංක 30 දරන බැංකුකරණ පනත සහ එහි සංශෝධන
- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපතලාභී විශේෂිත බැංකු සඳහා නිකුත් කර ඇති සියළු නියාමන, විශේෂයෙන් ආයතනික පාලනය පිළිබඳ 2007 අංක 12 දරණ බැංකු පනත් නියාමනය (පිටු අංක 388 සිට 407)
- 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනත සහ එහි සංශෝධන
- 1954 අංක 19 දරණ සාප්පු හා කාර්යාල පනත
- 2022 අංක 09 දරණ පුද්ගලික දත්ත ආරක්ෂණ පනත
- ශ්‍රී ලංකාවේ පොදු ව්‍යවසාය සඳහා ආයතනික පාලනයේ යහපරිච සංග්‍රහය
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය පිළිබඳ බැංකුවල අධ්‍යක්ෂවරුන් උදෙසා වන මාර්ගෝපදේශය

බැංකුවට අදාල ස්වේච්ඡා නීති සංග්‍රහ

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ යහපරිච සංග්‍රහය (පිටු අංක 408 සිට 412)

අභ්‍යන්තර උපාංග

- අධ්‍යක්ෂ මණ්ඩලයේ හා අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුවල විෂයය ක්ෂේත්‍රය
- සේවක ආචාර ධර්ම පද්ධතිය
- අධ්‍යක්ෂ මණ්ඩල ආචාර ධර්ම පද්ධතිය
- අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත ප්‍රතිපත්ති හා ක්‍රමවේද

පාලන ව්‍යුහය

කෙටිකාලීන, මධ්‍ය කාලීන හා දීර්ඝ කාලීන වටිනාකම් නිර්මාණය හා ආරක්ෂා කිරීමට බැංකුව සතු හැකියාවට සහායවීම පිණිස අපගේ ආයතනික ව්‍යුහය මනාව නිර්වචනය කර ඇත. මනා ලෙස සැලසුම් කරන ලද පාලන ව්‍යුහය හා ක්‍රමවේද මගින් බැංකුව මනා ලෙස කළමනාකරණය කෙරෙන හා පාලනය වන බවට සහතික වේ. විචක්ෂණශීලී රාමුවක් සහ ඵලදායී පාලන තුල සිට පාර්ශ්වකරුවන්ගේ වටිනාකම් නිර්මාණය සහ ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය නායකත්වය සහ උපාය මාර්ගික මගපෙන්වීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා දෙනු ලබයි. දීර්ඝ කාලීන තිරසාර සංවර්ධනයක් හා වර්ධනයක් සහතික කිරීමට අවැසි ලෙස අවදානම් කළමනාකරණය හා ඇගැයීමට මෙමගින් හැකියාව ලැබේ. බැංකුවේ කටයුතු හා කාර්ය සාධනය සම්බන්ධයෙන් අවසන් වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරෙන අතර ආචාර ධර්ම මත පදනම් වූ හැසිරීම් අතින් ඉහළතම ප්‍රමිතියට අනුකූල වන බවට එය වගබලා ගනියි. කාර්යරාමු මගින් පනවනු ලබන තීරණ ගැනීමේ අයිතිය හා පැහැදිලිව නිර්වචිත නියාමන අනුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඇතැම් කාර්ය භාරයන් අනුකමිටු වෙත බෙදා දෙනු ලබයි. මෙහිදී අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුවල සභාපතිවරුන් වෙත අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුවල කාර්යක්ෂම ක්‍රියාකාරිත්වය පිළිබඳ වගවීම පැවරේ. අනුකමිටු වෙත පැවරී ඇති කාර්යයන් පිළිබඳ ගැඹුරින් අවධානය යොමු වන බවට සහතික වන අතරම උපායමාර්ගික තීරණ කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට මෙමගින් අවස්ථාව හිමි වේ.


බැංකුවේ කටයුතුවල හා දෛනික ව්‍යාපාරික කටයුතු කළමනාකරණය කිරීම, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී වෙත පවරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම, ආයතනික කළමනාකරණය සහ කළමනාකරණ කමිටු වෙත පැවරේ. එකග වී ඇති අවදානම් මට්ටම තුල මෙහෙයුම් කටයුතු සිදු කිරීමේ වගකීම උපාය මාර්ගික ව්‍යාපාරික අංශ වෙත පැවරේ.

බැංකුවේ පාලන ව්‍යුහය පිටු අංක 170 හි දැක්වේ.



ආයතනික පාලනය

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ පාලන ව්‍යුහය



CMC ආයතනික කළමනාකරණ කමිටුව
ALCO වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුව
CC ණය කමිටුව
IC ආයෝජන කමිටුව
EC හිමිකම් කමිටුව
TNIC තෙත්ඩර් සහ නව ආයෝජන කමිටුව
PRC කාර්යසාධන සමාලෝචන කමිටුව
BOSC ශාඛා මෙහෙයුම් නියාමන කමිටුව
IT SC තොරතුරු තාක්ෂණ නියාමන කමිටුව
MKTC අලෙවිකරණ කමිටුව
ORMC මෙහෙයුම් අවදානම් කළමනාකරණ කමිටුව
PDC නිමැවුම් ප්‍රවර්ධන කමිටුව
HRC මානව සම්පත් කමිටුව
CPC Major ආයතනික ප්‍රසම්පාදන කමිටුව (මහා පරිමාණ)
CPC Minor ආයතනික ප්‍රසම්පාදන කමිටුව (සුළු පරිමාණ)
EPC විධායක ප්‍රසම්පාදන කමිටුව
CSC ආයතනික තිරසාර කමිටුව
SMC ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කමිටුව
ISC තොරතුරු තාක්ෂණ ආරක්ෂණ කමිටුව
RCPSC ආපසු අයකර ගැනීමේ සැලැස්මේ මෙහෙයුම් කමිටුව

රූපය 28

* 2024 පෙබරවාරි 20 වන දින පිහිටුවා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය


ඉහළම බලාධිකාරිය ලෙස ක්‍රියාත්මක වන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් උපාය මාර්ග නිශ්චය කිරීම, ඒවා ක්‍රියාත්මක වන අයුරු අධීක්ෂණය කිරීම, බැංකුවේ වටිනාකම්, ප්‍රමිතිය සහ සංස්කෘතිය ස්ථාපිත කිරීම යන කටයුතු සිදු කරනු ලබයි. බැංකුව විසින් කාර්යක්ෂම ලෙස අවදානම් කළමනාකරණය කිරීම, මූල්‍ය කාර්ය සාධනය අධීක්ෂණය කිරීම, වාර්තාකරණය සිදු කරනු ලබන බවටත් යෝග්‍ය හා කාර්යක්ෂම අනුප්‍රාප්තික සැලසුම් ක්‍රියාත්මක කරනු ලබන බවටත් අධ්‍යක්ෂ මණ්ඩලය වගබලා ගනියි. මෙම කාර්ය රාමුව තුළ බැංකුව තුළ නව ව්‍යවසායකත්ව නායකත්වයක් ඇති කරලීමට

ආයතනික පාලනය

අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කරයි. අධ්‍යක්ෂ මණ්ඩල සාකච්ඡා වලදී විවිධ දෘෂ්ටිකෝණ සැලකිල්ලට ගනිමින් සහ කළමනාකාරිත්වය සාධනීය ලෙස අභියෝගයට ලක් කිරීම ඔස්සේ තිරසාර වටිනාකමක් නිර්මාණය කිරීම මගින් ඔවුහු අර්ථාන්විත ලෙස බැංකුවට දායකත්වය සපයති. අධ්‍යක්ෂක මණ්ඩලයේ වගකීම් පැහැදිලි ලෙස බෙදා දැක්වීම මගින් තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී කිසිදු අධ්‍යක්ෂවරයෙකුට අසීමිත බලයක් නොමැති බව සහතික කෙරේ.

1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ හා එහි සංශෝධන වල ප්‍රතිපාදන ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩලය ස්ථාපිත කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියෙහි අධ්‍යක්ෂ මණ්ඩලයට අයත් බලතල හා පැවරී ඇති වගකීම් විස්තර වෙයි. බැංකුවේ මෙහෙයුම් කාර්යක්ෂමතාවය, මූල්‍ය සෞඛ්‍යය සහ අභ්‍යන්තර පාලන පද්ධති වල පරිපූර්ණත්වය සම්බන්ධයෙන් ආයතනික කළමනාකාරිත්වය වගකියන බව සහතික කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරය වේ. සියළු වැදගත් කරුණු අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානයට කඩිනමින් යොමු කෙරෙන බව සහතික කරමින් කළමනාකාරිත්වය අධ්‍යක්ෂ මණ්ඩලය හා විවෘතව විනිවිද භාවයෙන් යුක්තව කටයුතු කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය හා ආයතනික කළමනාකාරිත්වය අතර ගැඹුරු සංවාදයක් පැවතීම මගින් බැංකුවේ තීරණ ගැනීමේ කියාවලිය ශක්තිමත් වන අතර අනෙන්‍යාන්‍ය ගෞරවයෙන් හා අවංක භාවයෙන් යුතු හිතකර බල තුලනයක් සහතික කෙරේ.

අධ්‍යක්ෂ මණ්ලයේ භූමිකාව, වගකීම් හා බලතල



රූපස 29 →

අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රඥප්තිය ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩලයේ භූමිකාව, වගකීම් හා බලතල පහත පරිදි වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ බලතල

- අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තිය මගින් පනවා ඇති සීමා හෝ බල පැවැත්වෙන නීති/නියාමන වලට යටත්ව බැංකුවට අදාළ ඕනෑම කරුණක් සම්බන්ධයෙන් අවසාන තීරණ ගැනීමේ අධිකාරිය ලෙස කටයුතු කිරීම.
- බැංකුවේ අනුමත ප්‍රසම්පාදන සංග්‍රහයේ විධිවිධාන හා බලපැවැත්වෙන වෙනත් අදාල නීති/නියාමන වලට යටත්ව මූල්‍යමය කරුණු සම්බන්ධයෙන් සුදුසු තීරණ වලට එළඹීම.
- සෑම මට්ටමකදීම වඩාත් වාසිදායක ව්‍යාපාරික ප්‍රවේශ අනුගමනය කර ඇති බවට සහතික වීම සඳහා බැංකුවේ සියළුම කටයුතු පාලනය කිරීම උදෙසා ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ සම්පාදනය.
- වාර්තා කැඳවීම, කමිටුවක් පත් කිරීම හෝ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන වෙනත් සුදුසු ක්‍රමවේදයක් ඔස්සේ බැංකුවේ කාර්යසාධනය, කළමනාකරණය හෝ පරිපාලනයට අදාල ඕනෑම කරුණක් විමර්ශනය කිරීම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ භූමිකාව සහ වගකීම්

- බැංකුවේ සමස්ත ක්‍රියාවලිය පිළිබඳ නිරන්තර අධීක්ෂණය හා පිරික්සුම.
- ඕනෑම අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුවක්, අධ්‍යක්ෂවරයෙක්, සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී හෝ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවරනු ලැබ ඇති බලතල ක්‍රියාත්මක කරන වෙනත් ඕනෑම කමිටුවක් විසින් ඉදිරිපත් කරනු ලබන නිර්දේශ මත පදනම්ව සුදුසු පියවර ගැනීම.
- බැංකුවේ කාර්ය සාධනය සහ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී ඇතුළු ප්‍රධාන කළමනාකරණ නිළධාරීන්ගේ කාර්ය සාධනය අධීක්ෂණය කිරීම හා ඇගයීම.
- සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී පත් කිරීම සහ අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේ සහ අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුවේ යොමු කිරීමේ අනුදේශ වලට අනුකූලව ප්‍රධාන කළමනාකරණ නිළධාරීන් ස්ථානගත කිරීම හා උසස්වීම් සිදු කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩලයේ මගපෙන්වීම/ මාර්ගෝපදේශකත්වය අවශ්‍ය වන ඕනෑම සාර්ව මට්ටමේ කටයුත්තක නිරත වීම

ආයතනික පාලනය

අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය

වයස, ස්ත්‍රී පුරුෂභාවය, සංස්කෘතිය, අධ්‍යාපන පසුබිම, කුසලතා, අත්දැකීම් සහ දැනුම යන සාධක පදනම්ව විවිධාංගීකරණය වූ අධ්‍යක්ෂ මණ්ඩලයක් අප සතුය. මෙමගින් සාකච්ඡා, විවාද, අභියෝග සහ කල්පනාකාරී ප්‍රතිඵල සඳහා සාරවත් පරිසරයක් නිර්මාණය කෙරේ. අප ක්‍රියාත්මක වන පරිසරය සැලකිල්ලට ගනිමින් අපගේ පාලන, සමාජ සහ නියාමන වගකීම් ඉටුකරන බව සහතික කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය කැපවී සිටී.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරෙන කරුණු පිළිබඳව විචාරය කිරීමේ නිපුණතාවයෙන් යුත් තමන් තෝරාගත් ක්ෂේත්‍රයෙහි කැපීපෙනෙන ව්‍යක්තියවේදීන් වන විධායක නොවන අධ්‍යක්ෂවරු සත්දෙනෙකුගෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ නායකත්වය සහ එහි කාර්යක්ෂමතාව සහතික කිරීමේ සමස්ත වගකීම පැවරෙන්නේ සභාපතිවරයාටය. ඉන් අධ්‍යක්ෂවරුන් දෙදෙනෙක් ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් වූ අතර සෙසු අධ්‍යක්ෂවරු පස් දෙනා ස්වාධීන නොවන හා විධායක නොවන අධ්‍යක්ෂවරු වූහ. බැංකුව මෙම කාර්ය රාමුව තුල ඵලදායී ලෙස අවදානම් කළමනාකරණය කරන බව, මූල්‍ය කාර්යසාධන හා වර්තාකරණය අධීක්ෂණය කරන බව සහ සාධනීය අභ්‍යන්තර පාලන හා ක්‍රමවේද ක්‍රියාත්මක කර ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික කරනු ලබයි. මෙම කාර්ය රාමුව යටතේ බැංකුව තුළ ව්‍යවසායකත්ව නායකත්වය සැපයීම හා දිරිමත් කිරීමද සිදු කෙරේ.

2023 වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩලයේ විස්තර පිටු අංක 158 සිට 161 දක්වා ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටුවල සාමාජිකත්වය පිළිබඳ තොරතුරු පිටු අංක 174 හි දැක්වේ. වත්මන් අධ්‍යක්ෂ මණ්ඩලය සාමාජිකයන් පස්දෙනෙකුගෙන් සමන්විත වේ. වත්මන් අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂවරුන් වන අතර දෙදෙනෙක් ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂවරු වෙති.

අධ්‍යක්ෂ මණ්ඩල නිපුණත්වය හා ප්‍රවීණතාව

මූල්‍ය ආයතනයක් ලෙස සියළු පාර්ශ්වකරුවන් සඳහා ඵලදායීව වටිනාකම් නිර්මාණය කිරීම උදෙසා බැංකුවට පුළුල්වූත් විවිධවූත් කුසලතා සමුදායක් අවශ්‍ය වේ. කුසලතා, ජනවිකාසය, ස්ත්‍රී පුරුෂභාවය, අත්දැකීම් සහ තනතුරු යන සාධක වල තුලනාත්මක සංයෝජනයකින් සුසැදි අධ්‍යක්ෂ මණ්ඩලයේ සමූහ ප්‍රවීණතාවය, සිය පාලන වගකීම් විෂයයානුකූලව හා කාර්යක්ෂම ඉටු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට අවකාශ සලසයි. නිපුණත්වයේ හා ප්‍රවීණත්වයේ මනා සංකලනය සමග වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාවලිය සඳහා බැංකුවේ උපායමාර්ගික දිශානතියට මගපෙන්වීමේ සහ ස්ථාපිත කිරීමේ හැකියාව සහිත එක්සත් කණ්ඩායමක් ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කරයි.

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් සතුව ඉහළ මට්ටමේ අවංකභාවයක්, පාලන මූලධර්ම පිළිබඳ ගැඹුරු අවබෝධයක්, පූර්ව තාක්ෂණික, මූල්‍ය හා මූල්‍ය නොවන දැනුම මෙන්ම ශක්තිමත් අන්තර් පුද්ගල කුසලතාද පැවතිය යුතු බවට අපේක්ෂා කෙරේ. අපගේ අධ්‍යක්ෂ මණ්ඩලය, බැංකුකරණය, මූල්‍ය, ආර්ථික, පර්යේෂණ, උපායමාර්ග, සැලසුම්, තොරතුරු තාක්ෂණ, සයිබර් ආරක්ෂණය, මානව ශාස්ත්‍ර, කළමනාකරණය, පරිපාලනය සහ ජාත්‍යන්තර සබඳතා යන අංශයන්හී නිපුණත්වයෙන් හා ප්‍රවීණත්වයෙන් යුතු සාමාජිකත්වයකට හිමිකම් කියයි.

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ සුදුසුකම්, කුසලතා, අනෙකුත් වැදගත් තනතුරු සහ අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුවල සාමාජිකත්වය ඇතුළු තොරතුරු පිටු අංක 158 සිට 161 දක්වා වන පිටුවල ඇතුළත් වේ.


අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය

2 ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු

3 ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂවරු


විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ ධුර කාලය

ප්‍රස්ථාරය 55



කුසලතා වල විවිධත්වය

ප්‍රස්ථාරය 56



ආයතනික පාලනය

අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රමවේදය

ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත අනුව එකඟ වූ රැස්වීම් කාලසටහනක් මත අවම වශයෙන් සති හයකට වරක් අධ්‍යක්ෂ මණ්ඩලය රැස් වේ. අවශ්‍යතාවය මත පදනම්ව අමතර රැස්වීම් කැඳවනු ලැබේ. විධිමත් ලෙස රැස්වීම් වලට සහභාගි වන අධ්‍යක්ෂවරු සාකච්ඡා වලට සක්‍රියව දායක වෙති. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සහභාගීත්වය පිළිබඳ විස්තර පිටු අංක 174 හි දැක්වේ. අධ්‍යක්ෂවරුන් හට නිසි තීරණ ගැනීම සඳහා නිවැරදි තොරතුරු නිවැරදි වේලාවට නිවැරදි ආකෘතියට අනුකූලව ලැබෙන බව සහතික කිරීම සඳහා බැංකුව සතුව සංකීර්ණ හා අඛණ්ඩ අභ්‍යන්තර පැහැදීමක් හා කඩිනම් කරවීමේ ක්‍රමවේදයක් පවතී. සාමාන්‍යාධිකාරීතුමාගේ හා අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්ගේ සහය ඇතිව සභාපතිවරයා මෙම ක්‍රියාවලිය මෙහෙයවයි. උපාය මාර්ගික සාකච්ඡා හා තීරණාත්මක ව්‍යාපාරික අයිතම සඳහා ප්‍රමාණවත් කාලය වෙන් කිරීමක් සිදු කිරීමට මෙම ක්‍රියාවලිය ආධාර වේ. විවෘත සාකච්ඡා, විවාද හා අභියෝග කිරීම් සඳහා පහසුකම් සැලසිය හැකි පරිදි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ව්‍යුහගත කර ඇති බවට සභාපතිවරයා වගබලා ගනියි. එමෙන්ම සාකච්ඡාවට ගැනීමට හා තීරණ ගැනීමට අවැසි අයිතම න්‍යාය පත්‍රයට ඇතුළත් කරන ලෙස අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් හටද ඉල්ලීම් සිදු කළ හැකිය. රැස්වීමේ න්‍යාය පත්‍රය, අදාළ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සමගින් රැස්වීමට සතියකට පෙර අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් අතර විද්‍යුත් මාධ්‍යයෙන් බෙදා හරිනු ලැබේ. අධ්‍යක්ෂවරුන් විසින් නිතිපතා භෞතිකව හෝ මාර්ගගත ක්‍රමයට රැස්වීම්වලට සහභාගී වන අතර තීරණ ගැනීමේදී සක්‍රියව දායක වෙයි. විශේෂ අවස්ථාවලදී කෙටි දැනුම්දීමකින් හදිසි අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා භාරදීම හෝ රැස්වීම් අතරතුර සභාගත කිරීම සිදු කෙරේ. රැස්වීම් පිළිබඳ ප්‍රමාණාත්මක විස්තර සහිත වාර්තා සහ එහිදී ගනු ලබන තීරණ අධ්‍යක්ෂවරුන්ගේ පරිශීලනය සඳහා ලේඛනගත කොට පවත්වාගෙන යයි.

ගැටෙන අභිලාෂ

අධ්‍යක්ෂවරුන් හට පෞද්ගලික ලාභාපේක්ෂා සඳහා හෝ වෙනත් පුද්ගලයෙකු වෙත අයෝග්‍ය ලෙස ප්‍රතිලාභ ළඟා කරදීම සඳහා සිය තනතුර හෝ විශ්වාසනීය තොරතුරු භාවිත කිරීම විශේෂයෙන් වළක්වාලමින් ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත හා 2007 අංක 12 දරණ (සංශෝධිත) ආයතනික පාලන නියෝගය මගින් අධ්‍යක්ෂවරුන්ගේ විශ්වාසවන්තභාවය පිළිබඳ වගකීම් ස්ථාපිත කර ඇත.

යම් ව්‍යාපාරික අයිතමයකට අදාළ අභිලාෂ ගැටුමක් හෝ එසේ ගැටුමක් ඇතිවීමේ විභවතාවයක් වෙතොත් ඒ සම්බන්ධව අධ්‍යක්ෂවරුන් වහාම අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කළයුතුය. යම් අධ්‍යක්ෂවරයෙකුට යම් කාරණයක් සම්බන්ධයෙන් පෞද්ගලික හෝ ව්‍යාපාරික අභිලාෂයක් වෙතොත් අදාළ අධ්‍යක්ෂවරයා ඊට අදාළ සාකච්ඡාවට සහභාගී වීමෙන් හෝ තීරණ ගැනීමෙන් වැළකී සිටිය යුතුය. එවැනි අධ්‍යක්ෂවරයෙක් එවැනි කරුණක් සම්බන්ධයෙන් සාකච්ඡා පැවැත්වෙන හෝ තීරණ ගැනීමක් සිදු කරන රැස්වීම් වලට සහභාගී වීමෙන් වැළකී සිටිය යුතුය.

න්‍යාය පත්‍රයේ ඇතුළත් වන සහ ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් රැස්වීම් වාර්තාවට ඇතුළත් කරන ලද කිසියම් කරුණක් සම්බන්ධයෙන් කිසියම් ගැටෙන අභිලාෂයක් වෙතොත් ඒ බව ප්‍රකාශ කිරීමට සම්මත න්‍යාය පත්‍ර අයිතමයක් ඇතුළත් කර ඇත. අදාළ වර්ෂය තුළ සිදුවන කිසියම් අභිලාෂයන්ගේ වෙනස්වීමක් වෙතොත් ඒ වෙනුවෙන් සංශෝධිත අභිලාෂ ප්‍රකාශයක් සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතුය.

බැංකුව හා ඊට අදාල පාර්ශව අතර සිදුවන ගනුදෙනු විනිවිදභාවය පිළිබඳ ප්‍රතිපත්ති මත පදනම්ව ඇති බවත් එවැනි ආශ්‍රිත පාර්ශ්ව අතර සිදුවන ගනුදෙනු වලදී ගැටෙන අභිලාෂ වැළැක්වෙන බව හා අවැසි මග පෙන්වීම සැපයෙන බව සහතික වනු පිණිස බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ආශ්‍රිත පාර්ශව අතර ගනුදෙනු පිළිබඳ ප්‍රතිපත්තියක් ස්ථාපිත කරනු ලැබ ඇත. අධ්‍යක්ෂවරුන් වෙත සපයන ලද ඕනෑම බැංකුකරණ පහසුකමක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරන ලද බලය පැවරීම හා අනුකූල වේ. මූල්‍ය ප්‍රකාශයේ සටහන් අංක 49.5.2 හි දක්වා ඇති පරිදි හැර 2023 වර්ෂය තුළ බැංකුව හෝ එහි පරිපාලිත සමාගම් විසින් අත්සන් තබන ලද කිසිදු කොන්ත්‍රාත්තුවක් හෝ විධිවිධානයක් සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන් කිසිවෙකුට සැලකිය යුතු අභිලාෂයක් නොතිබුණි.

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

2023 වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 11 ක් පෙර සැලසුම් කරන ලද පරිදි පැවැත්විණි. එම රැස්වීම් වලට අධ්‍යක්ෂවරුන්ගේ පැමිණීම පිළිබඳ විස්තර පිටු අංක 174 හි දැක්වේ. ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත ප්‍රකාරව අවම වශයෙන් සති 6කට වරක් හෝ අවශ්‍යතාව අනුව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වේ. කල්පවතින ආර්ථික අර්බුදය, දේශීය ණය ප්‍රශස්තකරණය වෙතින් බැංකුව කෙරෙහි එල්ල වන බලපෑම සහ එම ගැටළු කළමනාකරණය කරගැනීම සඳහා භාවිතයට ගත යුතු උපායමාර්ග ආදී මූලික කරුණු අඛණ්ඩව නිරීක්ෂණය හා අධීක්ෂණය කෙරෙන බව සහතික කරන අතර ගෝලීය වසංගතයට පසුව උද්ගතවූ ඉන්ධන අර්බුදය හා නැගී එන ව්‍යාපාරික ප්‍රමුඛතා ආදිය හේතුවෙන් මාර්ගගත ක්‍රමයට අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීම වැනි වෙනස්වන වාතාවරණ වලට ප්‍රතිචාර දැක්වීම සඳහා අනුගතවීමේ සහ නම්‍යශීලීවීමේ අවශ්‍යතාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හඳුනාගන්නා ලදී.

වටිනාකම් උත්පාදන ක්‍රියාවලියේදී බැංකුවේ තෙවසරක උපායමාර්ගික ව්‍යාපාරික සැලසුම සම්පාදනය කිරීමෙහිලා ආයතනික කළමනාකාරිත්වයට අවැසි පැහැදිලි මග පෙන්වීම ලබාදීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය සිය කාලය කැප කරන ලද අතර එහි ප්‍රතිඵලයක් ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය විසින් උපායමාර්ගික ව්‍යාපාරික සැලසුම සමාලෝචනය කර අනුමත කරන ලදී. ගෙවුණු වසර තුළදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රාග්ධන කළමනාකරණය සඳහා අඛණ්ඩව කාලය කැප කරන ලද අතර උපායමාර්ගික ව්‍යාපාර සැලැස්මෙහි කාර්යසාධනය හා ක්‍රියාත්මක කිරීම සමාලෝචනය කිරීමද සිදු කරන ලදී. එසේම, තවදුරටත් අවධානය යොමු විය යුතු කරුණු, අවදානම් කළමණාකරණය, අනුකූලතාව සහ ආයතනික පාලනය පිළිබඳව සාකච්ඡා කරන ලදී.

2024 -2026 තෙවසරට අදාළ බැංකුවේ තෙවර්ෂ උපායමාර්ගික ව්‍යාපාර සැලැස්ම සකස් කිරීම සඳහා ආයතනික කළමනාකාරිත්වයට අවශ්‍ය මගපෙන්වීම ලබාදෙමින් අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවේ උපායමාර්ගික දිශානතිය හැඩගැන්වීමෙහිලා සක්‍රියව දායක විය.

2022 වර්ෂයේදී මෙරට ණය ශ්‍රේණිගත කිරීම පහළ යාම හේතුවෙන් විශේෂයෙන් විදෙස් මුදලින් නිකුත් කරන ලද රාජ්‍ය සුරැකුම් ආශ්‍රිතව ඇතිවූ ණය පාඩු ඉහළ යාමෙන් පසු බැංකුවේ ද්‍රවශීලතාවය හා ප්‍රාග්ධනය ඵළදායීව කළමනාකරණය කිරීමේ අවශ්‍යතාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිරන්තරයෙන් අවධාරණය කරන ලදී. මෙම තත්ත්වය මෙන්ම රජයේ විදේශ ණය ප්‍රතිව්‍යුහගතකරණ සැලැස්ම, පසුබෑමට ලක්වූ ණය තත්ත්වය සහ පැන නැගුණු බදු අවශ්‍යතා විසින් බැංකුවේ වර්ධනය ස්ථාවරව පවත්වාගැනීම සහ තිරසර වටිනාකම් ප්‍රවර්ධනය කිරීම සඳහා මනා මූල්‍ය නායකත්වයක වැදගත්කම පිළිඹිබු කෙරිණ. මාසිකව පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් මගින් බැංකුවේ උපායමාර්ගික අරමුණු වලට සාපේක්ෂව බැංකුවේ කාර්යසාධනය තක්සේරු කිරීම කෙරෙහි ක්‍රමිකව අවධානය යොමු කෙරුණු අතර එහිදී ප්‍රගතිය සහ තවදුරටත් අවධානය යොමු කළ යුතු කරුණු සමාලෝචනය කිරීම සඳහා ප්‍රමාණවත් කාලයක් වෙන් කෙරිණ. බලපෑමට ලක්වූ ණය කාණ්ඩ ආශ්‍රිත අවදානම් නිරාවරණය පිළිබඳව දැඩිව සොයා බලමින්, හානිකරණ පරිවයන්හි ඵළදායීතාවය තක්සේරු කරමින්, අවදානම් ආකෘති විතැන්වීම් නිරීක්ෂණය කරමින් සහ ගැටළු සහිත ණය පහසුකම් කළමනාකරණය කරමින් අධ්‍යක්ෂ මණ්ඩලයද ණය ගුණාත්මකභාවය පිළිබඳ ස්වකීය පාලනය මුවහත් කරගන්නා ලදී.

ආයතනික පාලනය

අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු වල සංයුතිය සහ පැමිණීම


අධ්‍යක්ෂවරයාගේ නම	පත්වූ දිනය	වයස	අධ්‍යක්ෂ තත්ත්වය	සහභාගී වූ/සහභාගී විමට සුදුසුකම් ඇති						අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටි කාලසීමාව (අවු.)
				අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්	අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව	අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව	අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුව	අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු	අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ උපාය මාර්ගික කමිටුව	
ජනාධිපති නීතීඥ, ආචාර්ය හර්ෂ කබ්රාල් සභාපති	2023 මැයි 2	63	NED/ID	9/9	–	–	–	–	5/5	<1
ශූඩ් නිලූකෂාන් මයා නිල බලයෙන් පත්වූ අධ්‍යක්ෂ	2022 පෙබරවාරි 28	53	NED/NID	9/11	7/9	7/8	3/3	6/7	4/5	2+
එස් ආර් ඩබ්ලිව් එම් රුවන් සත්කුමාර මයා නිල බලයෙන් පත්වූ අධ්‍යක්ෂ	2023 මාර්තු 27	53	NED/ID	11/11	–	8/8	3/3	7/7	2/2	1
දුෂ්‍යන්ත බස්නායක මහතා අධ්‍යක්ෂ	2023 මාර්තු 31	59	NED/NID	11/11	9/9	–	3/3	–	5/5	1
එච් කේ ඩී ලක්ෂ්මන් ගාමිණී මයා අධ්‍යක්ෂ	2020 දෙසැම්බර් 14 2023 දෙසැම්බර් 14	70	NED/NID	11/11	7/7	8/8	–	6/6	2/2	3
අශේන් ජයසේකර මයා අධ්‍යක්ෂ	2024 ජනවාරි 09	44	NED/ID	–	–	–	–	–	–	<1

NED – විධායක නොවන **NID –** ස්වාධීන නොවන අධ්‍යක්ෂ **ID –** ස්වාධීන අධ්‍යක්ෂ

වගුව 19 →

අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු

ස්වාධීන විනිශ්චයක් ප්‍රවර්ධනය කිරීම, නිසි බලතුලනයක් පවත්වා ගැනීම සහ වගකීම් ඵලදායීව ඉටු කිරීම සඳහා බලතල බෙදා හැරීම උපකාර වන බව සහතික කිරීමේ හැකියාව ඇති සුදුසු යැයි හැඟෙන ඕනෑම කමිටුවක් හෝ කමිටු කිහිපයක් වෙත සිය බලතල, අභිමතය සහ අධිකාරිය පැවරීමට අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තිය විසින් අධ්‍යක්ෂ මණ්ඩලය බලගන්වනු ලැබ ඇත. එක් එක් අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුවේ භූමිකාව, වගකීම් හා අභිමත සීමා නිශ්චිතව දක්වා ඇති සිය යොමු කිරීමේ අනුදේශ ප්‍රකාරව එක් එක් අනු කමිටුව ක්‍රියාත්මක වේ. ඇතැම් නිශ්චිත බලතල අනුකමිටු වෙත පැවරුවද, අධ්‍යක්ෂ මණ්ඩලය, අනු කමිටු වල තීරණ පිළිබඳව වගකීම අබණ්ඩව සිදු කරයි. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව යන අනිවාර්යය කමිටු සතර 2007 අංක 12 දරන බැංකු පනත් නියාමනය ප්‍රකාරව ස්ථාපිත කර ඇති අතර, 2023 අංක 01 දරන බැංකු පනත් නියාමනයට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩල හදිසි නොවන අත්‍යාවශ්‍ය නොවන වියදම් කමිටුව ස්ථාපිත කෙරිණ. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් සියළුම අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටුවලද ලේකම් ලෙස කටයුතු කරන අතර අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු වල තොරතුරු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරයි. තොරතුරු දැන ගැනීම, සමාලෝචනය, අදහස් දැක්වීම සහ අවශ්‍ය අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත රැස්වීම් වාර්තා ඉදිරිපත් කෙරේ. යොමු කිරීමේ අනුදේශ, සංයුතිය, කාර්යභාරය හා වගකීම්, සාමාජිකයන්ගේ පැමිණීම, 2023 වසර තුළ සිදුකළ ක්‍රියාකාරකම් හා ඒ ඒ අනුකමිටු වෙතින් 2024 සඳහා අවධානය යොමු වන කරුණු අදාළ කමිටු වාර්තා යටතේ පිටු අංක 182 සිට 190 දක්වා සඳහන් කර ඇත.



ආයතනික පාලනය

කළමනාකරණ කමිටු

අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු වලට අමතරව අනුමත කරන ලද යොමු කිරීමේ ආදේශ ප්‍රකාරව බැංකුව විසින් කළමනාකරණ කමිටු කිහිපයක් ස්ථාපිත කරනු ලැබ තිබේ. යොමු කිරීමේ අනුදේශ ප්‍රකාරව සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී සියළු කළමනාකරණ කමිටු විසින් පහත වගුවේ දැක්වෙන පරිදි බැංකුවේ මෙහෙයුම්වලට සම්බන්ධ තීරණාත්මක කරුණු පිළිබඳව සාකච්ඡා කරනු ලබයි.

කළමනාකරණ කමිටුව	අරමුණ හා වගකීම්	සංයුතිය
ආයතනික කළමනාකරණ කමිටුව	ප්‍රතිපත්ති හා උපායමාර්ග සැකසීම හා සම්බන්ධ කරුණු අධීක්ෂණය, මෙහෙයුම් මට්ටමේදී ප්‍රතිපත්ති හා උපායමාර්ග ක්‍රියාවට නැංවීම	බැංකුව තුළ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී හා ඊට ඉහළ තනතුරු හොබවන සියළු නිළධාරීන්
වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුව	ආදායම් ප්‍රශස්ත මට්ටමකට ගෙන ඒම සඳහා බැංකුවේ වෙළඳපොළ සහ ද්‍රවශීලතා අවදානම පූර්ව නිශ්චිත අවදානම් අභිරුචි මට්ටමක් තුල පවත්වා ගැනීම	සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, මූල්‍ය හා සැලසුම්, ජාත්‍යන්තර බැංකු, මෙහෙයුම්, ණය, භාණ්ඩාගාර සහ අවදානම් කළමනාකරණ අංශ වල ප්‍රධාන කළමනාකරණ නිළධාරීන්
ණය කමිටුව	බැංකුවේ ණය ප්‍රතිපත්තිය කලින් කලට සමාලෝචනය කිරීම, ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම සහ ආදායම් ප්‍රශස්ත මට්ටමකට ගෙන ඒම සඳහා බැංකුවේ අවදානම් අභිරුචි මට්ටම තුල සිට හිතකර ණය කළඹක් පවත්වාගෙන යාමෙහි නිරතවීම.	සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, මූල්‍ය හා සැලසුම්, මෙහෙයුම්, ණය, භාණ්ඩාගාර, නීති සහ අවදානම් කළමනාකරණ අංශ වල ප්‍රධාන කළමනාකරණ නිළධාරීන්
ආයෝජන කමිටුව	බැංකුවේ ආයෝජන ප්‍රතිපත්ති කලින් කලට සමාලෝචනය කිරීම සහ බැංකුවේ සමස්ත අවදානම් අභිරුචි මට්ටම තුල සිට බැංකුවේ ආයෝජන ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම.	සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, මූල්‍ය හා සැලසුම්, ජාත්‍යන්තර බැංකු, ණය, භාණ්ඩාගාර, නීති සහ අවදානම් කළමනාකරණ අංශ වල ප්‍රධාන කළමනාකරණ නිළධාරීන්
කාර්යසාධන සමාලෝචන කමිටුව	මූල්‍ය කාර්යසාධනය සමාලෝචනය, දැනට ක්‍රියාත්මක ක්‍රියාකාරකම් වල ප්‍රගතිය, සහ කාර්යසාධනයට පහසුකම් සපයන වෙනත් ඕනෑම උපකාරක සේවාවක් සමාලෝචනය කිරීම	සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, සියළුම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරවරු, සියළු උපදේශකවරුන් සහ අංශ ප්‍රධානීන්, සියළුම සහකාර සාමාන්‍යාධිකාරවරුන්, අනුකූලතා නිළධාරී සහ කමිටුව විසින් පත්කරන ලද වෙනත් ඕනෑම සාමාජිකයෙක්.
ශාඛා මෙහෙයුම් නියාමන කමිටුව	පවරා ඇති මූල්‍ය අධිකාරිය තුල සිට ශාඛා මෙහෙයුම් බලාත්මක කිරීම අධීක්ෂණය කිරීම	සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, මූල්‍ය හා සැලසුම්, ණය, නීති සහ පරිශ්‍ර අංශ වල ප්‍රධාන කළමනාකරණ නිළධාරීන්
තොරතුරු තාක්ෂණ නියාමන කමිටුව	තොරතුරු තාක්ෂණ උපායමාර්ගය බැංකුවේ ව්‍යාපාරික උපායමාර්ගවලට අනුරූප බව සහතික කිරීම	සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, මූල්‍ය හා සැලසුම්, ජාත්‍යන්තර බැංකු, මෙහෙයුම්, ණය, භාණ්ඩාගාර, නීති, මානව සම්පත් සංවර්ධන, අලෙවි, තොරතුරු තාක්ෂණ, අනුකූලතා සහ අවදානම් කළමනාකරණ අංශ වල ප්‍රධාන කළමනාකරණ නිළධාරීන්
අලෙවි කමිටුව	අධ්‍යක්ෂ මණ්ඩලයට සහ ආයතනික කළමනාකාරිත්වයට අලෙවිකරණ උපදෙස්, විශේෂඥතාව සහ සහය ලබාදීම සහ බැංකුවේ සියළු අලෙවිකරණ කටයුතු සමාලෝචනය කිරීම සහ ඒ සඳහා මග පෙන්වීම	සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, මූල්‍ය හා සැලසුම්, මෙහෙයුම් සහ අලෙවි අංශ වල ප්‍රධාන කළමනාකරණ නිළධාරීන්

ආයතනික පාලනය

කළමනාකරණ කමිටුව	අරමුණ හා වගකීම්	සංයුතිය
මෙහෙයුම් අවදානම් කළමනාකරණ කමිටුව	මෙහෙයුම් අවදානම් කළමනාකරණ ක්‍රමවේද ක්‍රියාවට නැංවීම, අධීක්ෂණය කිරීම සහ අදාළ ක්‍රියාමාර්ග ගැනීම ඔස්සේ අභ්‍යන්තර පාලනයන්හි අඛණ්ඩභාවය පවත්වා ගැනීම අතරතුර බැංකුවේ මෙහෙයුම් අවදානම් කළමනාකරණය කිරීම.	සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, මෙහෙයුම්, මානව සම්පත් සංවර්ධන, තොරතුරු තාක්ෂණ, උපකාරක සේවා, පරිශ්‍ර, නීති, අවදානම් කළමනාකරණ, අනුකූලතා සහ තොරතුරු ආරක්ෂණ අංශ වල ප්‍රධාන කළමනාකරණ නිළධාරීන්
නිමැවුම් සංවර්ධන කමිටුව	ඉහළ යන තරඟකාරීත්වයට මුහුණදීම සඳහා නවෝත්පාදක නිමැවුම් සංවර්ධනය ඔස්සේ දිගුකාලීන වටිනාකම් නිර්මාණය කිරීම අධීක්ෂණය කිරීම.	සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, මෙහෙයුම්, ජාත්‍යන්තර බැංකු, තොරතුරු තාක්ෂණ, ශාඛා ණය, අලෙවි සහ සැලසුම් අංශ වල ප්‍රධාන කළමනාකරණ නිළධාරීන්
මානව සම්පත් කමිටුව	බැංකුවේ උපායමාර්ගික අරමුණු වලට අනුකූලව මානව සම්පත් සංවර්ධනය කිරීම.	සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, මූල්‍ය හා සැලසුම්, මානව සම්පත් සංවර්ධන, ණය සහ නීති අංශ වල ප්‍රධාන කළමනාකරණ නිළධාරීන්
ආයතනික ප්‍රසම්පාදන කමිටුව (මහා පරිමාණ)	බැංකුවේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිසි පරිදි සිදු වන බව සහතික කිරීම	සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, මූල්‍ය හා සැලසුම්, මෙහෙයුම් අංශ වල ප්‍රධාන කළමනාකරණ නිළධාරීන් හා මුදල් අමාත්‍යාංශයේ නියෝජිතයෙක්
ආයතනික ප්‍රසම්පාදන කමිටුව (සුළු පරිමාණ)	බැංකුවේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිසි පරිදි සිදු වන බව සහතික කිරීම	සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, මූල්‍ය හා සැලසුම්, මෙහෙයුම් අංශ වල ප්‍රධාන කළමනාකරණ නිළධාරීන් හා මුදල් අමාත්‍යාංශයේ නියෝජිතයෙක්
විධායක ප්‍රසම්පාදන කමිටුව	බැංකුවේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිසි පරිදි සිදු වන බව සහතික කිරීම	ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ණය), ප්‍රධාන කළමනාකරු (මූල්‍ය)
ආයතනික තිරසාරභාවය පිළිබඳ කමිටුව	තිරසාර කාර්යසාධනය හා සංවර්ධනය හා සම්බන්ධ ආයතනික අරමුණු මඟින් අර්ථ දක්වා ඇති ආකාරයට ආචාර්ධර්මීය, සමාජයීය හා පාරිසරික වගකීම අපගේ දෛනික ව්‍යාපාර මෙහෙයුම් සමග බද්ධ කිරීම ඔස්සේ ප්‍රධාන පාර්ශ්වකරුවන් සඳහා වටිනාකම් නිර්මාණය කිරීමට දායකවීම	සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, හා ණය, ජාත්‍යන්තර බැංකු කටයුතු, අලෙවි, මෙහෙයුම්, මානව සම්පත් සංවර්ධන, මුදල් හා සැලසුම් යන අංශයන්හි ප්‍රධාන කළමනාකරණ පිරිස්
ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කමිටුව	මානව සම්පත් ආශ්‍රිත කරුණු සලකා බැලීම	සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ණය), නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් සංවර්ධන), නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (විගණන),
තොරතුරු ආරක්ෂණ කමිටුව	බැංකුවේ තොරතුරු ආරක්ෂාව කළමනාකරණය කිරීම හා නියාමන අවශ්‍යතාවය හා අනුකූලවීමේ මට්ටම සහ බැංකුවේ තොරතුරු ආරක්ෂණය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය පාලන ක්‍රියාත්මක කිරීමට හා එවැනි පාලන වල ඵලදායීතාවය තක්සේරු කිරීමට පියවර ගැනීම.	සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්), ප්‍රධාන තොරතුරු ආරක්ෂක නිළධාරී, තොරතුරු තාක්ෂණ, මානව සම්පත් සහ ආරක්ෂක අංශවල ප්‍රධාන කළමනාකාරීත්ව පිරිස්,

ආයතනික පාලනය

කළමනාකරණ කමිටුව	අරමුණ හා වගකීම්	සංයුතිය
ණය අයකරගැනීමේ සැලසුම් නියාමන කමිටුව	බැංකුවේ ප්‍රාග්ධන, ද්‍රවශීලතා සහ සමස්ත මෙහෙයුම් කෙරෙහි බලපෑමක් ඇති කරන විවිධ දැඩි එහෙත් කළමනාකරණය කළ හැකි ආතති තත්ත්වයන් හේතුවෙන් ඇති විය හැකි බිඳවැටීම්වලට විසඳුම් සැපයීම සඳහා බැංකුවේ ණය අයකරගැනීමේ සැලැස්ම සකස් කිරීම, නිරන්තරයෙන් ඇගයීම සහ ක්‍රියාත්මක කිරීම.	සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, භාණ්ඩාගාර, ණය, ආයතනික මූල්‍ය, ණය අයකරගැනීම්, ජාත්‍යන්තර බැංකු, අලෙවි, මානව සම්පත් සංවර්ධන, තොරතුරු තාක්ෂණ, මූල්‍ය හා සැලසුම්, නීති, අවදානම් කළමනාකරණ, අනුකූලතා, විගණන සහ පරිපාලන යන අංශ වල ප්‍රධාන කළමනාකාරිත්ව පිරිස්

වගුව 20 →

අධ්‍යක්ෂවරුන් පත් කිරීම, නැවත පත් කිරීම සහ ඉල්ලා අස්වීම

රාජ්‍ය හිමිකාරිත්වය සහිත බැංකුවක් ලෙස ජාතික ඉතිරිකිරීමේ බැංකුවට අධ්‍යක්ෂවරු පත් කිරීම 1971 අංක 30 දරණ ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත හා එහි සංශෝධන අනුව සිදු කෙරේ. ඒ අනුව, ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත ප්‍රකාරව අධ්‍යක්ෂවරු සත් දෙනාගෙන් පස් දෙනෙකු රාජ්‍ය බැංකු සඳහා වගකිවයුතු විෂයභාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන අතර අනෙක් අධ්‍යක්ෂවරු දෙදෙනාගෙන් එක් අයෙක් භාණ්ඩාගාර ලේකම් හෝ ඔහු විසින් නම් කරනු ලබන තැනැත්තෙක් විය යුතුය. අනෙක් පුද්ගලයා තැපැල්පති හෝ ඔහු විසින් නම් කරනු ලබන තැනැත්තෙක් විය යුතුය. යෝග්‍යතාව හා සම්මතය පිළිබඳ නිර්නායක සපුරා ඇත්නම්, කරන ලද පත්වීම් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කෙරේ. ආයතනික පාලනය පිළිබඳ 2007 අංක 12 දරණ බැංකු පනතේ විධිවිධාන ප්‍රකාරව අධ්‍යක්ෂවරයෙක්ට සිය ධුරය දැරිය හැකි උපරිම කාලය වසර නමයකට සීමා වේ.අධ්‍යක්ෂවරුන්ගේ ඉල්ලා අස්වීම හා නැවත පත් කිරීම සිදු කෙරෙන්නේ ද 1971 අංක 30 දරණ ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතට අනුව වන අතර ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව නිසි පරිදි දැනුවත් කෙරේ. අධ්‍යක්ෂවරුන් හා වෙනස්වීම් පිළිබඳ විස්තර පිටු අංක 174 හි දැක්වේ.

අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රේරණය හා පුහුණුව

වේගයෙන් විකාශය වන ව්‍යාපාරික, ආර්ථික, නෛතික සහ නියාමන වාතාවරණයක් මධ්‍යයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාකච්ඡා සඳහා අර්ථවත් දායකත්වයක් ලබාදීමට අධ්‍යක්ෂවරුන්ට හැකියාව තිබෙන බව සහතික කරමින් අධ්‍යක්ෂ මණ්ඩලය බලගැන්වීමෙහිලා අධ්‍යක්ෂවරුන්ගේ ශක්‍යතා වර්ධනය කිරීමේ වැදගත්කම බැංකුව විසින් හඳුනාගෙන ලැබ තිබේ. නිරන්තරයෙන් ඉදිරියට එන නවෝත්පාදන හා ව්‍යාපාරික පරිවර්ත ආශ්‍රිත ප්‍රවණතා පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත්ව සිටීම ඔස්සේ එළඳාගීව අවදානම් වළක්වාගැනීමට සහ මතු වන අවස්ථා උපරිම වශයෙන් උපයෝජනය කිරීමට බැංකුවට අවස්ථාව හිමිවේ. මේ සඳහා, බැංකුවේ මෙහෙයුම් මෙන්ම සියළු නෛතික සහ පාලන වගකීම් ඇතුළු අධ්‍යක්ෂවරුන්ට පැවරෙන භාරකාර සහ ව්‍යවස්ථාපිත වගකීම් පිළිබඳව නව අධ්‍යක්ෂවරුන්ට මනා අවබෝධයක් ලබාදීම උදෙසා විස්තීරණ ප්‍රේරණය සහ අඛණ්ඩ පුහුණුව ඉතා වැදගත් වේ. බැංකුවේ අධ්‍යක්ෂධුරයට පත්වීමෙන් පසුව 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත හා එහි සංශෝධන ඇතුළත් අධ්‍යක්ෂ මණ්ඩල අත්පොත සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලැබ ඇති නියාමන, අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තිය, අධ්‍යක්ෂ මණ්ඩල කමිටු ප්‍රඥප්ති, අනෙකුත් අදාල ව්‍යවස්ථා, චක්‍රලේඛ හා ලියවිලි අන්තර්ගත බෝර්ඩ් පැක් පරිගණක විසඳුම ප්‍රවේශය සපයනු ලැබේ. සිය ධුර කාලය තුල පැවැත්වෙන පුහුණු සැසි සහ යාවත්කාලීන කිරීම් ඔස්සේ අධ්‍යක්ෂවරුන් අඛණ්ඩව ආර්ථික, නියාමන සහ ක්ෂේත්‍ර ප්‍රවණතා පිළිබඳව දැනුවත්ව සිටින බවට අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් සහතික වෙයි. බැංකුව එළඳාගීව ඉදිරියට ගෙන යාම සඳහා සිය ශක්‍යතාවය තවදුරටත් වර්ධනය කරගැනීම අරමුණු කරගෙන නියාමන හෝ වෙනත් බලධාරීන් විසින් සංවිධානය කරනු ලබන පුහුණු/දැනුම් වර්ධන වැඩසටහන් වලට අධ්‍යක්ෂවරු සහභාගී වෙති.

තොරතුරු වෙත ප්‍රවේශය

අධ්‍යක්ෂවරුන්ට සිය කාර්යයන් හා වගකීම් ඉටු කිරීමට අවශ්‍ය තොරතුරු මෙන්ම සම්පත් වෙත අසීමිත ප්‍රවේශයක් පවතී. 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ හා එහි සංශෝධන වල ස්වාධීන වෘත්තීය උපදෙස් ලබාගැනීම සම්බන්ධයෙන් දැක්වෙන විධිවිධාන ප්‍රකාරව බැංකුවේ වියදමෙන් බාහිර විශේෂඥ උපදෙස් ලබා ගැනීමට අධ්‍යක්ෂවරුන්ට පහසුකම් සලසාදී ඇත. අධ්‍යයනය හා කරුණු ගොනු කර ගැනීම සඳහා ප්‍රමාණවත් කාලයක් අධ්‍යක්ෂවරුන්ට ලබාදෙමින් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා බෙදා හැරීම සඳහා පරිගණක මෘදුකාංගයක් හඳුන්වාදී තිබේ.

2023 වර්ෂයේ අවධානයට ලක්වූ ප්‍රධාන ක්ෂේත්‍ර

2023 වසර තුල පැවැති විවලනය වන සාර්ව ආර්ථික හා භූදේශපාලන සන්දර්භය තුල අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චිතව හඳුනාගන්නා ලද බැංකුවේ උපායමාර්ගය ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීම සඳහා සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී සහ ආයතනික කළමනාකරණ කණ්ඩායම සමග සහ සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ උපායමාර්ගික දිශානතිය කෙරෙහි අඛණ්ඩව අවදානය යොමු කරන ලදී. විනිවිදභාවය අවධාරණය කරමින්, ද්‍රවශීලත්වය හා මූල්‍ය කාර්යසාධනය අතර තුලනයක් පවත්වා ගනිමින්, එළඳායී පාලන පවත්වා ගනිමින් සහ බැංකුවේ සියළු ක්‍රියාකාරකම් ආශ්‍රිතව අඛණ්ඩතාවය හා දැඩි ආචාර ධර්මීය සංස්කෘතියක් ප්‍රවර්ධනය කරමින් ඉහළ ආයතනික පාලක ප්‍රමිති පවත්වා ගැනීම සඳහා වන සිය කැපවීම අඛණ්ඩව ඉදිරියට ගෙන යාමට ස්ථාපිත කර තිබෙන පරිචයන් ඔස්සේ අධ්‍යක්ෂවරුන්ට හැකියාව ලැබිණි. එසේම, අවදානම් කළමනාකරණය මෙන්ම බැංකුව නව්‍යකරණය, පුළුල් කිරීම සහ උපායමාර්ගිකව දිශානතිය වෙනස් කිරීම කෙරෙහි මනා අවධානයක් පවත්වා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කළේය.

ආයතනික පාලනය

පහත දැක්වෙන වගුවෙහි 2023 වර්ෂය තුළ, අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානය යොමු වූ ප්‍රධාන ක්ෂේත්‍ර කිහිපයක් දක්වා තිබෙන අතර ඊට අදාළ පාර්ශ්වකාර කණ්ඩායම් ද අදාළ කරුණු වලට කේන්ද්‍ර වූ කෙටි කාලීන හා මධ්‍ය කාලීන උපායමාර්ගික අරමුණු ද ඒ සම්බන්ධයෙන් ගනු ලැබූ තීරණ ද සටහන් කර ඇත.

2023 වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියාකාරකම්	ප්‍රතිඵල	කෙටිකාලීන – මධ්‍යකාලීන උපායමාර්ගික අරමුණු	පාර්ශ්වකරුවන්	2024 පාලන අරමුණු
ආයතනික උපාය මාර්ගය කාර්යසාධනය සහ වාර්තාකරණය				
• බැංකුවේ උපායමාර්ගය සකස් කිරීම සඳහා ගැඹුරු සාකච්ඡා සැසි පැවැත්වීම සහ 2024-2025 වර්ෂ සඳහා උපායමාර්ගික ව්‍යාපාරික සැලැස්ම අනුමත කිරීම • 2024 අයවැය සහ 2023 සංශෝධිත අයවැය අනුමත කිරීම • අන්තර් මූල්‍ය වාර්තා සහ වාර්ෂික මූල්‍ය වාර්තා අනුමත කිරීම	• අදාළ අරමුණු යථාර්ථවත් කෙරෙන පරිදි ක්‍රියාත්මකවූ සහ තිරසාර වටිනාකම් නිර්මාණය සහ බෙදාහැරීම වෙනුවෙන් කැපවූ මනා පාලනයක් සහිත බැංකුවක් • උපායමාර්ග හරහා බැංකුවේ මෙහෙවර හා වටිනාකම් සාක්ෂාත් කර ගැනීම • වටිනාකම් උත්පාදනය උදෙසා ඇති දායකත්වය ඉහළ නංවන පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය			සාර්ව ආර්ථික සාධකයන්හි අවිනිශ්චිතතාව සැලකිල්ලට ගනු ලබන අතර මෙහෙයුම් වාතාවරණයේ කාර්යරාමුව තුළ 2024-2026 සඳහා අනුමත උපාය මාර්ගික ව්‍යාපාරික සැලසුම් ක්‍රියාත්මක වීම අධීක්ෂණය කිරීම
තාක්ෂණය				
නිරන්තර සේවා සැපයුමක්ට ප්‍රශස්ත ගනුදෙනුකාර අත්දැකීමක් සහ තිරසාර ප්‍රතිලාභ ළඟා කරගැනීම සහතික කිරීමේ අරමුණින් බැංකුව තුළ ඇති කෙරෙන තාක්ෂණික පරිවර්ථනය හා ඩිජිටල් ගමන් මග අධීක්ෂණය	• තාක්ෂණයට හුරු පරිසරයක් තුළ මනාව හැඩ ගැසී කටයුතු කිරීම			ශීඝ්‍රයෙන් වෙනස්වීම් සිදුවන වාතාවරණයක් තුළ ස්ථායී සේවා සැපයුමක්, සුරක්ෂිත පරිසයරක්, ප්‍රශස්ත හා තිරසාර ගනුදෙනුකාර අත්දැකීමක් (වෙනස් වන ගනුදෙනුකාර ස්ථර හඳුනා ගනිමින්) සහ තිරසාර වටිනාකම් උත්පාදනයක් සහතික කිරීම සඳහා බැංකුවේ තාක්ෂණික හා ඩිජිටල් ගමන් මග අධීක්ෂණය කිරීම
ගණුදෙනුකරුවන්				
• ගනුදෙනුකරුවන්ගේ දත්ත ආරක්ෂා කිරීම සඳහා ප්‍රතිපත්ති හා පද්ධති පවතින බව සොයා බැලීම සහ ඒවා සමාලෝචනය කිරීම. • බැංකු කටයුතු වලට සහභාගි නොවන සමාජ කොටස් අතර බැංකු කටයුතුවලට ප්‍රවේශ වීම සඳහා අවස්ථාව සැලසීම	• උපායමාර්ගික අරමුණු ඉටුකරගනු පිණිස ගනුදෙනුකරුවන් කේන්ද්‍ර කරගත් සේවාවක් සැපයීම්			ගනුදෙනුකරුවන් කේන්ද්‍ර කරගත් සේවාවක් සැපයීමට අදාළව බැංකුවේ ප්‍රගතිය නිරීක්ෂණය හා තක්සේරු කිරීම

ආයතනික පාලනය

2023 වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියාකාරකම්	ප්‍රතිඵල	කෙටිකාලීන – මධ්‍යකාලීන උපායමාර්ගික අරමුණු	පාර්ශ්වකරුවන්	2024 පාලන අරමුණු
අවදානම් කළමනාකරණය • අවදානම් අභිරුචිය • අවදානම් අභිරුචි සීමා • ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කාර්ය රාමුව • සයිබර් ආරක්ෂක අවදානම් ඇගයීම • පාලන කාර්යක්ෂමතා සමාලෝචනය • නිතිපතා ගනු ලබන අවදානම් වාර්තා • අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වල වාර්තා • 2023 අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා ඇගයීම් ක්‍රියාවලි වාර්තා අනුමත කිරීම	• බැංකුවේ උපායමාර්ගික ප්‍රමුඛතා ළඟා කරගැනීම සඳහා උපකාර වන ආකාරයේ අවදානම් හා අනුකූලතා කළමනාකරණ පරිවයන් බැංකුව තුල ස්ථාපිත කර ඇත • තොරතුරු හා තාක්ෂණයේ වගකීම් හා සදාචාරාත්මක භාවිතය			දෙස් විදෙස් සාර්ව ආර්ථික සාධක සැලකිල්ලට ගනිමින් ක්‍රියාකාරී අවදානම් කළමනාකරණයක් සඳහා බැංකුවේ ප්‍රවේශය අධීක්ෂණය කිරීම.
නියාමන අනුකූලතාවය නියාමනයන් යාවත්කාලීන කිරීම	• නියාමන යාවත්කාලීන කිරීම් සැලකිල්ලට ගැනීම			ක්ෂේත්‍රයේ යහපරිච හා නියාමන අවශ්‍යතා සමග බැංකුව 100% ක අනුකූලතාවයෙන් යුතු බවට සහතිකවීම.
පාර්ශ්වකරුවන් සමග සම්බන්ධතා • සැලකිය යුතු පාර්ශ්වකරුවන් හඳුනාගෙන පාර්ශ්වකරුවන් සමග සම්බන්ධවීමට අදාළ උපාය මාර්ග සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම මෙහෙයවීම. • කොටස්කරුවන් සමග නිරන්තර හා අදාළ පරිදි සන්නිවේදන සබඳතා පැවැත්වීමට පහසුකම් සපයමින් කළමනාකාරිත්වය මෙහෙයවීම.	• පාලන භූමිකා හා වගකීම් ක්‍රියාත්මක කිරීමේදී පාර්ශ්වකරුවන් ඇතුළත් වන ප්‍රවේශයක් උපයෝගී කර ගැනීම. • බැංකුවේ අභිවෘද්ධිය හා පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂාද අභිමතාර්ථ හා අවශ්‍යතා අතර තාර්කික තුලනාත්මක බවත් පවත්වා ගැනීම. • දීර්ඝ කාලීන වටිනාකම් උත්පාදනය උදෙසා බැංකුවේ උපායමාර්ග වෙනුවෙන් පාරිසරික, සාමාජීය හා පාලන ප්‍රතිපත්ති ඒකාබද්ධ කිරීම.			අවශ්‍ය වැඩිදියුණු කිරීම් උදෙසා පාර්ශ්වකරුවන් සමග සම්බන්ධවීමේ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම.
ආයතනික පාලනය • ස්වාධීන අධ්‍යක්ෂ මණ්ඩල ඇගයීමක් හා අනුකමිටු ඇගයීමක් සිදු කිරීම. • නියාමන බලධාරීන් විසින් නිකුත් කරන ලද ආයතනික පාලන දිශානතීන් සැලකිල්ලට ගැනීම සහ අනුකූලතා තත්වය ඇගයීම.	• අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්ය සාධනය හා කාර්යක්ෂමතාව අබණ්ඩව ඉහළ යාම. • නියාමන දිශානති හා මාර්ගෝපදේශ සමග අනුකූලතාවය.			යහ පාලන පරිච වල ප්‍රමිති කෙරෙහි බැංකුවේ අනුකූලතාවය අධීක්ෂණය

වගුව 21 →

ආයතනික පාලනය

අවදානම් කළමනාකරණයේදී අධ්‍යක්ෂ මණ්ඩල කාර්යභාරය

අවදානම් කළමනාකරණය බැංකුවේ සමස්ත ව්‍යාපාරික උපායමාර්ගය සමග බද්ධ කිරීමේ වැදගත්කම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හඳුනාගනු ලබයි. අවදානම් කළමනාකරණ පරිච්ඡේදය දූරදර්ශීව අධීක්ෂණය කිරීමේ වැදගත්කම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවධාරණය කරනු ලබන අතර එම කාර්යභාරය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත පවරනු ලැබ ඇත. ඒ අනුව, බැංකුවේ අවදානම් කළමනාකරණ කාර්යය අධීක්ෂණය කිරීමේ වගකීම එම කමිටුව වෙත පැවරී ඇත. බැංකුවේ අවදානම් පැතිකඩ ඵලදායීව නිරීක්ෂණය කිරීම සඳහා බැංකුව විසින් ශක්තිමත් අවදානම් කළමනාකරණ කාර්යරාමුවක්, අවදානම් අභිරුචි සීමා සහ ශක්තිමත් යාන්ත්‍රණයක් සකස් කරන ලදී. අවදානම දැඩිව නිරීක්ෂණය කිරීම සහ තක්සේරු කිරීම සඳහා බැංකුවේ අවදානම් පැතිකඩ පිළිබඳ වාර්තා නිතිපතා අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව මගින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරේ. එකඟවූ අවදානම් අභිරුචි මට්ටම් අභිබවන අවස්ථාවලදී ඒ සම්බන්ධයෙන් කළමණාකාරිත්වයෙන් විමසනු ලබන අතර එවැනි අවස්ථා වළක්වා ගැනීමට අදාළ ක්‍රියාමාර්ග ගැනීම සඳහා අවශ්‍ය මගපෙන්වීම් සැපයේ. දිගු කාලීන උපායමාර්ගික අරමුණු මගින් අවදානම් සාධක මැනවින් ආමන්ත්‍රණය කෙරෙන බව සහතික කරමින් උපායමාර්ගික ව්‍යාපාර සැලැස්ම පිළිබඳ සාකච්ඡා කිරීමේදී ව්‍යාපාර ආශ්‍රිත අවදානම් සැලකිල්ලට ගැනීම හා ඒ පිළිබඳ ගැඹුරින් සලකා බැලීම සිදු කෙරේ. අවදානම් කළමනාකරණය පිළිබඳ වැඩිදුර විස්තර පිටු අංක 191-213 දක්වා වන අවදානම් සමාලෝචන වාර්තාවේ දැක්වේ.

සභාපතිවරයාගේ සහ ප්‍රධාන විධායක නිලධාරියාගේ කාර්යභාරය

1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත, එහි සංශෝධන, ශ්‍රී ලංකා මහ බැංකු නියාමන සහ ක්ෂේත්‍රයේ සම්මත පරිච්ඡේද වලට අනුකූලව කළමනාකරණ නිලධාරීන් පත් කිරීම හා බලතල පැවරීම සඳහා බැංකුව ව්‍යුහගත ප්‍රවේශයක් අනුගමනය කරයි. මෙම ප්‍රවේශය මගින් අදාළ භූමිකාවේ සුපැහැදිලි ඉහළ නැංවෙන අතර අදාළ කාර්යයන් සහ වගකීම් ඵලදායීව ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලසේ. සභාපතිවරයාගේ සහ ප්‍රධාන විධායක නිලධාරියාගේ කාර්යභාරය එකිනෙකින් වෙන්ව පවතින අතර ඔවුන්ට අදාළ වගකීම් නිශ්චිතව අර්ථ දක්වා ඇත. එලෙස එක් එක් තනතුරට අදාළ වගකීම් වෙන් වෙන්ම දක්වා තිබීමෙන් ඕනෑම පුද්ගලයෙකු නිර්බාධිත තීරණ ගැනීම හැකියාවක් නොපවතින බවත් සුදුසු බලතුලනයක් හා අධිකාරියක් පවතින බවත් සහතික කෙරේ.

සභාපතිවරයා

සභාපතිවරයා විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරයෙක් වන අතර සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රධාන කළමනාකරණ නිලධාරියෙක් වේ. එහෙත් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙක් නොවේ. අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තිය මගින් සභාපතිවරයාගේ සහ ප්‍රධාන විධායක නිලධාරියාගේ කාර්යභාරය හා වගකීම් පැහැදිලි විග්‍රහ කෙරේ. අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය ලබාදීම, අධ්‍යක්ෂ මණ්ඩලයේ ඵලදායී ක්‍රියාකාරිත්වයට පහසුකම් සැලසීම, ක්‍රමානුකූලබව පවත්වාගෙන යාම, අධ්‍යක්ෂ මණ්ඩලයේ ඵලදායීතාවය සහ බැංකුව තුළ ආයතනික පාලනය ආශ්‍රිත ඉහළම ප්‍රමිතීන් පවත්වා ගැනීම සහතික කිරීම සභාපතිවරයා වෙත පැවරෙන වගකීම් වේ. සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් සමග සාකච්ඡා කොට සභාපතිවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල න්‍යාය පත්‍රය සකස් කරනු ලබයි. සිය කාර්යයන් ඉටු කිරීමේදී තොරතුරු මත පදනම්වූ තීරණ ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ප්‍රමාණවත් පරිදි තොරතුරු ලැබෙන බවට සභාපතිවරයා සහතික වන අතර අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා එහි සාමාජිකයන්ගේ ඵලදායී සහභාගීත්වය සහතික කිරීම, පාර්ශ්වකරුවන් සමග ඵලදායී සන්නිවේදනයක් පවත්වා ගැනීම සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් සමග විවෘත සන්නිවේදනයක් පවත්වා ගැනීම යන වගකීම්ද ඉටු කරයි.

සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවරා දී ඇති පරිදි අනුමත කරන ලද අවදානම් අභිරුචි මට්ටම් වලට යටත්ව බැංකුවේ උපායමාර්ග සහ දෛනික ව්‍යාපාරික කළමනාකරණ කාර්යයන් සකස් කිරීම, සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී වෙත පැවරී තිබේ. සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී ආයතනික කළමනාකරණ සාමාජිකයන් වෙත නායකත්වය ලබාදෙන අතර ආයතනික පාලන කාර්යරාමුවට අනුකූලව සිය අධිකාරිය යටතේ පවතින ඇතැම් වගකීම් ආයතනික කළමනාකරණ කණ්ඩායම වෙත පවරයි. එසේම, ඔහු/ඇය කළමනාකරණ කමිටු වල සභාපතිත්වය දරණ අතර බැංකුවේ කාර්යසාධනය පිළිබඳව නිවැරදි, කාලීන හා පැහැදිලි තොරතුරු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලැබෙන බවට සහතික කරයි. බැංකුවේ කටයුතු පවත්වාගෙන යාමේදී යහපත් ආයතනික පාලනයක් හා ප්‍රශස්ත ප්‍රමිතීන් පවත්වා ගන්නා බවටද සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී විසින් සහතික කරනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්ගේ කාර්යභාරය

බැංකුව තුළ මනා ආයතනික පාලනයක් පවතින බව තහවුරු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පටිපාටි අනුගමනය කරන බව සහ නිතිපතා සමාලෝචනය කරන බව සහතික කිරීම අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් වෙත පැවරී තිබේ. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයාගේ කාර්යභාරය කෙටියෙන් පහත දක්වා ඇත.

- සියළු අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් හා අනුකමිටු රැස්වීම් සඳහා අවශ්‍ය පසුබිම සැකසීම.
- සියළුම අධ්‍යක්ෂ මණ්ඩල සහ අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු රැස්වීම් වල වාර්තා පවත්වා ගැනීම.
- අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියාමන සහ ව්‍යවස්ථාපිත අනුකූලතා පවත්වාගෙන යන බවට සහතික කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩලයේ ඵලදායී ක්‍රියාකාරිත්වය සහතික කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් හා අනුකමිටු රැස්වීම් පැවැත්වීමට අදාළ සියළු කරුණු සම්බන්ධයෙන් සභාපතිවරයාට අවැසි වෘත්තීමය සහය සැපයීම.
- අදාළ නීති හා රෙගුලාසි සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වෘත්තීය උපදෙස් ලබාදීම සහ ආයතනික පාලන ප්‍රතිපත්ති සහ වෙනත් ආශ්‍රිත කාර්ය රාමු සමග අනුකූල වන බව සහතික කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් හා අනුකමිටු රැස්වීම් වාර්තා සහ අධ්‍යක්ෂවරුන්ට අදාළ වෙනත් ලියවිලි වල භාරකරු ලෙස ක්‍රියා කරීම.
- අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා නිසි කලට අධ්‍යක්ෂවරුන් අතට පත්වන බවට හා අදාළ අධ්‍යක්ෂ මණ්ඩල තීරණ කාලීනව කළමනාකාරිත්වය වෙත සන්නිවේදනය කෙරෙන බවට සහතික වීම.
- අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටුව විසින් ගනු ලබන තීරණ සහ ඒවායේ ප්‍රතිඵල පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය මනා ලෙස දැනුවත් බව සහතික කිරීම.
- කළමනාකාරිත්වය විසින් අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ක්‍රියාත්මක කරන ලද ආකාරය හා එහි ප්‍රගතිය පිළිබඳ පසුවිපරම් කර අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කිරීම.

ආයතනික පාලනය

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් යනු ප්‍රධාන කළමනාකරණ පිරිසට ඇතුළත් තනතුරක් වන හෙයින් අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් පත් කිරීම හෝ ඉවත් කිරීම යනු අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුවේ උපදෙස් මත සමස්ත අධ්‍යක්ෂ මණ්ඩලයම සම්බන්ධ වන කරුණකි.

අධ්‍යක්ෂවරුන්ගේ මට්ටම හා චේතන සකස් කිරීම

1971 අංක 30 දරණ ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත හා එහි සංශෝධන ප්‍රකාරව අධ්‍යක්ෂවරුවන්ගේ චේතනය තීරණය කරනු ලබන්නේ විෂයභාර අමාත්‍යවරයා විසිනි. කිසිදු අධ්‍යක්ෂවරයෙකු සිය චේතනය තීරණය කිරීම සඳහා සම්බන්ධ නොවේ. වසර තුනකට වරක් සමාලෝචනය කෙරෙන සාමූහික ගිවිසුම මගින් නිර්දේශිත වැටුප් මත පදනම්ව අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව විසින් සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරියාගේ සහ ප්‍රධාන කළමනාකරණ පිරිසට අදාළ චේතන පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කරනු ලබයි. බැංකුව ප්‍රධාන කළමනාකරණ පිරිස සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද වැටුප් ප්‍රතිපත්තියක් අනුගමනය කරයි. අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේ නිර්දේශ මත පදනම්ව අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ විධිවිධාන සහ එහි සංශෝධන වලට අනුකූලව අවසාන අනුමැතිය ලබාදෙන, රාජ්‍ය බැංකු සම්බන්ධයෙන් වගකීම පැවරෙන අමාත්‍යවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වේ.

අධ්‍යක්ෂ මණ්ඩල සහ අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු ඇගයීම

2007 අංක 12 දරණ බැංකු පනත් නියාමන සහ වෙනත් අදාළ වන නීති හා රෙගුලාසි මෙන්ම ආයතනික පාලනය පිළිබඳ යහපරිච මගින් ඉදිරිපත් කෙරෙන වගකීම් ඇතුළත් අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිය වගකීම් ඉටු කරනු ලබන බවට සහතිකවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය සහ අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු වාර්ෂිකව ස්වයං ඇගයීමක නිරත වේ. ඇගයීම් ක්‍රියාවලියේදී සෑම අධ්‍යක්ෂවරයෙක්ම අධ්‍යක්ෂ මණ්ඩල කාර්යසාධන ඇගයීම් පත්‍රිකාවක් සම්පූර්ණ කරන අතර ඒවා අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව වෙත භාරදෙනු ලැබේ.

2023 වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ඇගයීම් 2024 වර්ෂයේ පළමු කාර්තුව තුලදී පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී කෙරිණ.

ප්‍රධාන විධායක නිළධාරී ඇගයීම

වර්ෂය ආරම්භයේදී සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී සමග එකඟවූ පරිදි ව්‍යාපාරික උපායමාර්ගික සැලැස්මේ මූල්‍ය හා මූල්‍ය නොවන ඉලක්ක වලට අනුකූල නිර්නායක මත පදනම්ව අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුවේ සහය ඇතිව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වාර්ෂිකව සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරීගේ කාර්යසාධන ඇගයීම සිදු කරනු ලබයි. එහිදී මෙහෙයුම් පරිසරයේ සිදු වන වෙනස්කම්ද සැලකිල්ලට ගැනේ. සභාපතිවරයා මේ සම්බන්ධයෙන් සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී සමග සාකච්ඡා කරන අතර ඔහුගේ/ඇයගේ නිල හා නිල නොවන ප්‍රතිපෝෂණය ලබාදෙයි. සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරීගේ කාර්යසාධනය ඇගයීම අනුමත කිරීමට පෙර ඒ සම්බන්ධයෙන් සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරීගේ ප්‍රතිචාර නිසි පරිදි සලකා බැලේ.



අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව

දුෂ්‍යන්ත බස්නායක මයා
සභාපති
අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව



කමිටුවේ සංයුතිය

සාමාලෝචනයට බඳුන් වූ වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව පහත සඳහන් විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත විය.

නම	සාමාජික තත්ත්වය	සහභාගිවීමට සුදුසු	සහභාගිවීම්
දුෂ්‍යන්ත බස්නායක මයා*	සභාපති	09	09
ජූඩ් නිලුක්ෂාන් මයා*	සාමාජික	09	07
එච් කේ ඩී ලක්ෂ්මන් ගාමිණී මයා*	සාමාජික	07	07

*විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ

ඉහත සාමාජිකයන්ගේ විස්තර පිටු අංක 158 සිට 161 දක්වා ඇතුළත්ය.

ආරාධනය මත නිතිපතා සහභාගි වූ නිලධාරීන්

විගණන අධිකාරි, ජාතික විගණන කාර්යාලය
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (විගණන),
සහකාර සාමාන්‍යාධිකාරී (විගණන)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූදල් ආයතනික සැලසුම් හා කළමනාකරණ පද්ධති)
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු රැස්වීම් දෙකක් (02) විධායක කළමනාකාරිත්වයේ සහභාගිත්වයෙන් තොරව රජයේ විගණක සමඟ පවත්වන ලදී.

ගණ පූරණය

අවමය අධ්‍යක්ෂවරුන්ගේ දෙදෙනෙකි.

කමිටුවෙහි ලේකම්

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවෙහි ලේකම් ලෙස කටයුතු කරයි.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු ප්‍රඥප්තිය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ ප්‍රඥප්තිය, නිතිපතා සමාලෝචනය කරනු ලබන අතර යොමු නියමයන් පැහැදිලිව අර්ථ දක්වා ඇත. බැංකු ක්ෂේත්‍රයේ නව ප්‍රවණතා සැලකිල්ලට ගනිමින් 2021 වර්ෂයේදී කමිටුවේ ප්‍රඥප්තිය අවසන් වරට සාමාලෝචනය කෙරිණ.

බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව ස්ථාපිත කරන ලද්දේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද 2007 අංක 12 දරණ බලපත්‍රලාභී විශේෂිත බැංකු නියාමනයේ 3 (6) (ii) වගන්තිය හා එහි පසුකාලීන සංශෝධන, ආයතනික යහපාලනය සඳහා වන පොදු ව්‍යවසාය මාර්ගෝපදේශ වල විධිවිධාන සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ යහපරිච සංග්‍රහයට අනුකූලවයි.

කමිටුවට එහි වගකීම් ඉටු කිරීමෙහිලා මෙන්ම පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් අධීක්ෂණ වගකීම් ඉටු කිරීමෙහිලා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කමිටුව බලගන්වනු ලැබ තිබේ.

(අ) බැංකුවේ මූල්‍ය ප්‍රකාශන වල අඛණ්ඩතාවය

(ආ) බැංකුවේ අවදානම් කළමනාකරණ කාර්යයෙහි ඵළදායීතාවය

(ඇ) බැංකුවේ අභ්‍යන්තර විගණන කාර්යයෙහි කාර්යසාධනය; සහ

(ඈ) බැංකුවේ බාහිර විගණන කාර්යයෙහි කාර්යසාධනය

කමිටුවේ කාර්යයන් සහ වගකීම් මෙන්ම අධිකාරී බලතලද කමිටු ප්‍රඥප්තියේ දැක්වේ. කමිටුවේ කටයුතු සහ වගකීම් ඉටු කිරීමේදී ප්‍රඥප්තිය කෙරෙහි වන අනුකූලතාවය මැන බැලීම සඳහා කමිටුවට සහායවීම පිණිස ප්‍රඥප්ති පිරික්සුම් ලැයිස්තු උපයෝගි කරගන්නා ලදි.

වාර්තාකරණය

සිය ක්‍රියාකාරකම් පිළිබඳව රැස්වීම් සටහන් සමගින් කමිටුව සෘජුව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරයි. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව, අභ්‍යන්තර විගණක, බාහිර විගණක සහ අධ්‍යක්ෂ මණ්ඩලය අතර විවෘත සන්නිවේදන මාර්ගයක් සහතික කරයි. කමිටුවේ යොමුකිරීමේ අනුදේශ සියලු ප්‍රමාණාත්මක ක්ෂේත්‍ර යටතේ අනුකූල වන බව කමිටුව විශ්වාස කරයි.

2023 වර්ෂයේ ක්‍රියාකාරකම්

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය තුළ කමිටුව විසින් අධ්‍යක්ෂ මණ්ඩල විගණන අනුකමිටු රැස්වීම් 9 ක් පවත්වා තිබිණි. නිරීක්ෂකයෙකු ලෙස විගණකාධිපතිවරයා නියෝජනය කරමින් විගණන දෙපාර්තමේන්තුවේ විගණන අධිකාරී, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු රැස්වීම් 9 කට සහභාගී වී තිබේ.

අවශ්‍යතාවය පරිදි බැංකුවේ සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරීන් ඇතුළු ජ්‍යෙෂඨ කළමනාකාරිත්වය ආරාධනය මත කමිටු රැස්වීම් වලට සහභාගී වුහ.

මූල්‍යමය තොරතුරු වාර්තාකරණය

මූල්‍ය ප්‍රකාශවල විශ්වසනීය බව අධීක්ෂණය සඳහා හා හෙළිදරව් කිරීම් සඳහා සකසන ලද කාර්තුමය වාර්තා අධීක්ෂණය සඳහා ද නිකුත් කිරීමට ප්‍රථම සැලකිය යුතු මූල්‍ය වාර්තාකරණ තීරණ ගැනීමට මූල්‍ය ප්‍රකාශයන්හි විශ්වසනීය බව අධීක්ෂණ සඳහා කමිටුව විසින් බැංකුවේ මූල්‍ය ප්‍රකාශ සමාලෝචනයට බඳුන් කරන ලදී. ප්‍රධාන තීරණ ගැනීමේ ක්ෂේත්‍ර වෙත ගිණුම්කරණ ප්‍රතිපත්ති හා පරිවයන්ගේ වෙනස්වීම්, විගණනයෙන් පැන නගින සැලකිය යුතු ගැලපීම්, අඛණ්ඩ ව්‍යාපාරික පැවැත්ම බැංකුවේ කාර්යසාධනය හා තත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ දැක්මක් ඇතිව මූල්‍ය ප්‍රකාශයන්හි වෙනත් නීතිමය අවශ්‍යතා, අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් හා අනුකූල වීම යන කරුණු කෙරෙහි කමිටුව විසින් අවධානය යොමු කරනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව

වර්ෂය තුළ ශ්‍රී ලාංකික රජය විසින් හඳුන්වාදෙනු ලැබූ දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහනෙහි කොටසක් ලෙස ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවලට හුවමාරුවක් ලෙස ලබාගත් ශ්‍රී ලංකා භාණ්ඩාගාර බැඳුම්කරවල පසුකාලීන වටිනාකම තක්සේරු කිරීම සිදු කළ අතර කමිටුව විසින් ගිණුම්කරණ පරිචයන් සුපරීක්ෂාවට ලක් කිරීම හා හානිකරණ ප්‍රතිපාදනවල ප්‍රමාණවත්භාවය ඇගැයීම ද සිදු කෙරිණි. තවද, කමිටුව විසින් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සහ ණය අත්තිකාරම් යන ද්විත්වයේම හානිකරණ ප්‍රතිපාදනවල ප්‍රමාණවත්බව සුපරීක්ෂාකාරීව සමාලෝචනයට බඳුන් කෙරිණි.

2023 න් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශයෙහි සමාලෝචනය පිළිබඳ වාර්තාව ද අභ්‍යන්තර විගණන අංශය වෙතින් එහි සොයා ගැනීම් සමග ඉදිරිපත් කරන ලද වාර්තාව ද අතර කාර්තුමය පදනම මත ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ කෙටුම්පත ද කමිටුව විසින් සමාලෝචනයට භාජනය කෙරිණි.

අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා ඇගැයීම් ක්‍රියාවලිය

බැංකුවේ ප්‍රාග්ධන ඇගයීම් ක්‍රියාවලියෙහි විශ්වාසනීයත්වය, නිරවද්‍යභාවය හා පිළිගත හැකි බව පිළිබඳ ස්වාධීන සාමාලෝචනයක්, අවශ්‍ය බව 2016 අංක 06 දරන බැංකු පනතෙහි නියාමන ප්‍රකාරව වගන්ති 10 මගින් දැක්වෙයි. අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා ඇගැයීම් ක්‍රියාවලියෙහි නියාමන අවශ්‍යතා සපුරාලීමට අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයෙහි කාර්යක්ෂමතාව කමිටුව විසින් සමාලෝචනය කර ඇත.

නියාමන අනුකූලතාව අධීක්ෂණය

කමිටුව විසින් බැංකුවේ සියලුම නියාමන සහ නෛතික බැඳීම් පිලිපැදීම, අනිවාර්ය බැංකු පරිචයන්ට අනුකූලවීම සහ පවතින පද්ධති සහ ක්‍රියාපටිපාටිවල සඵලතාවය ඉතා සූක්ෂම ලෙස විමර්ශනය කරන ලදී.

බැංකුවේ අනුකූලතා නිලධාරී විසින් මේ සම්බන්ධයෙන් බැංකු පනතේ විධායන්ට දක්වන අනුකූලතාවයේ තත්ත්වය පිළිබඳ මාසික වාර්තා ඉදිරිපත් කරනු ලබයි.

අවදානම් හඳුනාගැනීම සහ පාලනය

බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ එහි පරිපාලිත සමාගම් විසින් අවදානම් හඳුනාගැනීම සහ ඒවා ඇගයීම සම්බන්ධව මෙන්ම ව්‍යාපාරික කටයුතු වල මෙහෙයුම් සම්බන්ධයෙන් එමගින් ඇතිවිය හැකි බලපෑම් සහ මූල්‍යමය වාර්තා කිරීම් ආදිය සිදුකිරීම සම්බන්ධව වගකීමට බැඳී සිටී. තවද බැංකුව විසින් අවදානම් මත පදනම් වූ විගණන ක්‍රමයක් අනුගමනය කරන අතර කමිටුව විසින් මූල්‍ය කටයුතු වාර්තාකරණය සම්බන්ධ බැංකුවේ අභ්‍යන්තර පාලනයේ සඵලතාව සම්බන්ධයෙන් 2007 අංක 12 දරණ බැංකු පනතේ ඡේද අංක 3 (8) (ii) (බ්) යටතේ සහ ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය මගින් හඳුන්වාදී ඇති මාර්ගෝපදේශ මත පදනම්ව අවශ්‍ය තක්සේරු කිරීම් සිදුකර ඇත. එමෙන්ම අධ්‍යක්ෂක මණ්ඩල විගණන කමිටුව විසින් බැංකුවේ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය, ක්ෂේත්‍රයේ සමස්ත පාලනයේ ප්‍රමාණාත්මතාව සහ විශේෂයෙන් අවදානමට නිරාවරණය වියහැකි අංශ ආදිය සම්බන්ධ සමාලෝචනය කර අවශ්‍ය තක්සේරුකිරීම ද සිදුකර ඇත.

තවද අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් ගණනය කිරීම් සහ මූල්‍ය කටයුතු වාර්තා කිරීමේදී සිදුවන දෝෂ හඳුනාගැනීම, වත්කම් අපහරණය, නීතිරීති උල්ලංඝණය කිරීම් සහ ආයතනික සංග්‍රහයේ උපදේශ වල අනුකූලතා ආදිය හඳුනාගැනීමේ අභ්‍යන්තර පාලන ව්‍යුහයද සමාලෝචනයට සහ තක්සේරුවට ලක් කරන ලදී. තවද මෙම කමිටුව විසින් මෙම කරුණුවලට අදාළව අභ්‍යන්තර හා බාහිර විගණන අංශය විසින් හෙළිකරගත් කරුණු සහ නිර්දේශ ඒ හා සම්බන්ධ කළමනාකරණයේ ප්‍රතිචාර සමග සමාලෝචනය කරනු ලබයි.

අභ්‍යන්තර පාලන ව්‍යුහය සහ විගණකාධිපතිගේ වාර්තාව සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රකාශය පිටු අංක 224 සිට 225 දක්වා පිටුවල සඳහන් වේ. මේ සම්බන්ධයෙන් කමිටුවේ මතය වන්නේ යුක්ති සහගත තහවුරුවක් ලබාදීම පිණිස අවශ්‍ය කරන ක්‍රමවේද සහ පරීක්ෂණ කිරීමේ ක්‍රම හඳුන්වාදී ඇති බව ඉහතින් දන්වා ඇති අවශ්‍යතා බැංකුව විසින් සපුරා ඇති බවත්ය.

අභ්‍යන්තර විගණනය සහ පරීක්ෂණ කටයුතු

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් අභ්‍යන්තර විගණන කටයුතු සියල්ල ස්වාධීනව සිදුවන බවට තහවුරු කර ඇත. එසේම අභ්‍යන්තර විගණන අංශයේ විෂයපථයේ ප්‍රමාණාත්මතාව, ක්‍රියාකාරිත්වය සහ එහි සම්පත් සම්බන්ධව නිසි සමාලෝචන සිදුකර ඇත. එමෙන්ම මෙම අංශයට අදාළ විෂය කටයුතු සිදුකර ගෙනයාමට ඇවැසි බලය සතු බවටද කමිටු සැහීමට පත්විය.

බැංකුවේ අභ්‍යන්තර විගණන අංශය විසින් සිය වාර්ෂික විගණන සැලසුම අනුව ශාඛා, අංශ සහ අනෙකුත් අදාළ ඒකක අවශ්‍ය විගණන කටයුතු සිදු කර ඇත. ඇගයීමට ලක්වන අවධානමේ ස්වාභාවය අනුව අවශ්‍ය කරන විගණනය අවස්ථා නිර්ණය කරනු ලැබීය. එසේම විගණන සැලසුම එය ක්‍රියාත්මක කිරීම පිණිස අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් අනුමත කරන ලදී.

2023 වසර සඳහා අනුමත කරන ලද විගණන සැලැස්ම 2023 අවසානය වන විට සාර්ථකව ක්‍රියාත්මක කරනු ලැබීය. අභ්‍යන්තර විගණන අංශය විසින් ප්‍රතිපත්ති හා ක්‍රමවේද අනුගමනය කිරීම, අභ්‍යන්තර පාලන ව්‍යුහයේ සහ අනුකූලතා සම්බන්ධව සිදුකෙරෙන හෙළිකර ගැනීම් වලට අදාළව ගනු ලබන ක්‍රියාමාර්ග වල සඵලතා ආදිය තහවුරු කර ගැනීම පිණිස විගණන පරීක්ෂණ සිදුකර ඇත. තවද බැංකුවේ මෙහෙයුම් හා කළමනාකරණ කටයුතු සම්බන්ධව නිදහස් හා විෂය මූලික වාර්තා ලබාදීමේ අරමුණින් විගණන කටයුතු සිදුකරන ලදී.

එමෙන්ම අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් අභ්‍යන්තර විගණන අංශය මගින් සිදුකරන ලද අඛණ්ඩ විගණන සහ තොරතුරු පද්ධති විගණන ආදිය හරහා හෙළිකරගත් කරුණු සමාලෝචනය කරන ලදී. තවද මෙම කමිටුව මගින් 2022 දෙසැම්බර් සිට 2023 අගෝස්තු යන කාල පරිච්ඡේදය තුළ සිදු කළ අභ්‍යන්තර විමර්ශන වාර්තා, ව්‍යාජ ලෙස සිදු කළ මුදල් ආපසු ගැනීමේ සිදුවීම් සම්බන්ධ වාර්තාද සමාලෝචනයට ලක් කළ අතර අදාළ වර්ෂය තුළ විගණන හා සුපරීක්ෂණ අංශයේ ජ්‍යෙෂ්ඨ නිළධාරීන්ගේ කාර්ය සාධනය සම්බන්ධයෙන්ද සමාලෝචනය කරන ලදී.

බැංකුවේ අභ්‍යන්තර විගණන සංග්‍රහය අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ මෙහෙයවීම් සම්බන්ධව කෙටි විග්‍රහයක් ලබාදෙන අතර අභ්‍යන්තර විගණන ක්‍රියාවලින් මෙහෙයවීම සම්බන්ධව ප්‍රතිපත්ති, ප්‍රමිතීන් සහ ක්‍රියාවලීන් සම්බන්ධ විස්තරද ලබාදේ.

අභ්‍යන්තර විගණන ප්‍රඥප්තිය, (charter)
අභ්‍යන්තර විගණන අංශයේ වගකීම් කාර්යක්ෂම ලෙස හා ස්වාධීනව ඉටු කිරීම සඳහා උපකාරීවීම පිණිස යොදාගනු ලැබේ. මෙම ප්‍රඥප්තිය තුළ විෂය පථය, කාර්යභාරයන්, වගකීම් අධිකාරය, වාර්තා කිරීමේ පටිපාටි සහ ස්වාධීනත්වය සහ අභ්‍යන්තර විගණන අංශයේ අරමුණු ආදිය ඇතුළත් වේ.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව

බාහිර විගණක

ව්‍යවස්ථාපිතව, බැංකුවේ බාහිර විගණක වන්නේ විගණකාධිපතිවරයායි. සමාලෝචිත කාලය තුළ බාහිර විගණක සමග විධායක කළමනාකාරිත්වයේ සහභාගීත්වයෙන් තොරව අවම වශයෙන් දෙවතාවක් රැස්වී ඇත. එසේම ඔවුන්ට කමිටුව හමුවී විශේෂිත කරුණු සම්බන්ධයෙන් නිදහසේ සාකච්ඡා කිරීමටත් අදහස් ප්‍රකාශ කිරීමටත් අවකාශ ලබාදෙන ලදී.

විගණන ක්‍රියාවලියෙහි කාර්යක්ෂමතාව පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේදී රජයේ විගණන පාලක සමග සාකච්ඡා කෙරෙයි. විගණන අරමුණු උදෙසා බාහිර විගණකවරයා හට අවශ්‍ය කෙරෙන සියලු තොරතුරු හා ලියකියවිලි සපයන බවට කමිටුව සහතික වෙයි.

ගෙවුණු වසර තුළ කමිටුව විසින් :

- පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද 2022 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා බැංකුවේ මූල්‍ය ප්‍රකාශ පිළිබඳ විගණකාධිපති වාර්තාව සමාලෝචනය කරන ලදී. බැංකුවේ ආයතනික කළමනාකාරිත්වය විසින් ඉදිරිපත් කළ කළමනාකාරිත්ව ලිපිය හා ඊට අදාළ ප්‍රතිචාර ද සමාලෝචනය කෙරුණු අතර අවශ්‍ය නිරවද්‍ය කිරීමේ පියවර පසුවිපරම් කරන ලදී.
- විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද සැලකිය යුතු වාර්තා සමාලෝචනයට හා සාකච්ඡාවට ගැනුණු අතර අවශ්‍ය පරිදි යෝග්‍ය පියවර සඳහා මූලපුරන ලදී.

අභ්‍යන්තර පාලන අධීක්ෂණය

- විගණන අතරතුර හඳුනාගනු ලැබූ ගැටළු විසඳීම සඳහා පසුවිපරම් යාන්ත්‍රණය ශක්තිමත් කිරීම.
- විනයානුකූල කටයුතු හා විමර්ශන සම්බන්ධයෙන් වරින්වර සමාලෝචනය.
- වංචා හා අක්‍රමිකතාවයන් පිළිබඳ පොදු සිද්ධීන් හා කරුණු සමාලෝචනය කර ඉදිරියෙදී එවැනි සිදුවීම් වාර්තාවීමට ඇති අවස්ථාව වැළැක්වීමට මුලපිරීම.
- විමර්ශන/විනය පරීක්ෂණ යුහුසුළුව පැවැත්වීමට අවශ්‍ය දිශානතිය සැපයීම.

අචාර ධර්ම හා යහ පාලනය

බැංකුව තුළ ආයතනික යහ පාලන පරිවයන් දිගටම පවත්වා ගැනීමේ අවශ්‍යතාව කමිටුව විසින් අඛණ්ඩව සමාලෝචනය කර අවධාරණය කෙරිණි.

වංචා අවදානම් කළමනාකරණය සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අනතුරු හෙළිදරව් කිරීමේ ප්‍රතිපත්තිය (Whistle blowing Policy) මේ සම්බන්ධයෙන් බැංකුවේ විශ්වසනීයත්වය සුරක්ෂිත කරනු ලබන ප්‍රධානතම සාධකයන්ය. බැංකුවේ පාරදෘශ්‍යභාවය ඉහළ නැංවීමත්, එහි ක්‍රියාකාරකම් සහ කීර්තිනාමය පළුදු කළ හැකි පරිචයන් වළක්වාලීමේ පදනම සහිත පද්ධතිය ශක්තිමත් කිරීමත් උද්ගතවිය හැකි වෙනත් ගැටළු සහගත අවස්ථාවන් හෝ වංචා පෙරාතුව හඳුනාගැනීමට මඟපෑදීමත් මෙහි අරමුණු වේ.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් සියලු වංචා පිළිබඳ සිද්ධීන් කාර්තුමය පදනම මත සමාලෝචනය කරනු ලබයි. කාර්තුමය සමාලෝචනය අතරතුර, අධ්‍යක්ෂ මණ්ඩල විගණක කමිටුව විසින් සෑම සිද්ධියකම විස්තර හා සංඛ්‍යාත්මක තොරතුරුද ගනු ලැබූ පියවර සුපරීක්ෂා කරනු ලැබ අවශ්‍ය පරිදි වංචා වැළැක්වීමේ හා දඬුවම් ලබාදීමේ නියාමනය නිකුත් කරනු ලැබිණි. ඕනෑම මූලික විමර්ශණයක් හා එහි ප්‍රතිඵල පිළිබඳ සංෂිප්ත වාර්තාවක් කැඳවීමට අධ්‍යක්ෂ මණ්ඩල කමිටුවට ඕනෑම අවස්ථාවකදී අවසර ඇත.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්

බැංකුවට අදාළ වන නව හා සංශෝධිත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්/ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් මෙන්ම එහි නිර්දේශ මත අවශ්‍යතා මත අවශ්‍ය වන ප්‍රමිතීන් අනුගමනය කිරීමේ තීරණ කමිටුව විසින් සමාලෝචනය කර සංශෝධනය කෙරිණ.

අනුකූලතාව

නීති හා රෙගුලාසිවලට අනුකූලවීම අධීක්ෂණය කරනු ලබන ක්‍රමවේදයෙහි කාර්යක්ෂමතාව කමිටුව විසින් සමාලෝචනයට බඳුන් කරන ලදී. එමෙන්ම අනුකූල නොවීමේ යම් අවස්ථා පැන නැගිය හොත් ඒ පිළිබඳ කළමනාකාරිත්වයේ විමර්ශන හා පසුවිපරම් කිරීම් ද (විනය ක්‍රියාමාර්ග ද ඇතුළුව) කමිටුව සමාලෝචනය කරයි.

2024 වර්ෂය සඳහා ඉන් ඉදිරියට අවධානය යොමුවන ක්ෂේත්‍ර

- බැංකුව විසින් භාවිත කරනු ලබන මූල්‍ය පද්ධති, ක්‍රියාවලීන් හා අභ්‍යන්තර පාලන, බාහිර හා අභ්‍යන්තර වාතාවරණයන් තුළ පැන නගින සංකීර්ණ අවශ්‍යතාවන්ට ප්‍රතිචාර දක්වන්නේ ද හා සඵලදායී ලෙස මෙහෙයවනු ලබන්නේද යන කරුණු පිළිබඳ අවධානය අඛණ්ඩව යොමු කිරීම.
- බැංකුව වෙත ඇති කරලනු ලබන බලපෑම් ඇගයීම තුළින් විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද ස්වාධීන සමාලෝචන මත පදනම් අවශ්‍ය සැලසුම් කිරීම හා අධීක්ෂණය.

කමිටුවේ කාර්යසාධන ඇගැයීම

කමිටුවේ කාර්යක්ෂමභාවය පිළිබඳ වාර්ෂික ඇගයීමක් කමිටුව විසින් සිදු කරනු ලැබූ අතර, එහි ප්‍රතිඵල අධ්‍යක්ෂ මණ්ඩලයට සන්නිවේදනය කරනු ලැබෙයි.



දුෂ්‍යන්ත බස්නායක
සභාපති
අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව

25 මාර්තු 2024
කොළඹ

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු වාර්තාව

එස් ආර් ඩබ් එම් ආර් පී සත්කුමාර මයා
සභාපති
අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව



කමිටුවේ සංයුතිය

සාමාලෝචනයට බඳුන් වූ වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව පහත සඳහන් විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත විය.

නම	සාමාජික තත්ත්වය	සහභාගිවීමට සුදුසු	සහභාගිවීම්
එස් ආර් ඩබ් එම් ආර් පී සත්කුමාර මයා **	සභාපති	08	08
ජූඩ් නිලුක්ෂාන් මයා *	සාමාජික	08	07
එච් කේ ඩී ලක්ෂ්මන් ගාමිණි මයා *	සාමාජික	08	08

* විධායක නොවන, ස්වාධීන නොවන අධ්‍යක්ෂ ** විධායක නොවන, ස්වාධීන අධ්‍යක්ෂ

ඉහත සාමාජිකයන්ගේ විස්තර පිටු අංක 158 සිට 161 දක්වා ඇතුළත්ය.

ආරාධනය මත නිතිපතා රැස්වීම්වලට සහභාගීවූ නිළධාරීන්

සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී විසින් කමිටුවට අවශ්‍ය තොරතුරු සපයන අතර සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී හා සම්බන්ධ කරුණු සාකච්ඡා කෙරෙන අවස්ථාවන්හි දී හැර අනෙකුත් සියලු රැස්වීම්වලට සහභාගී වේ.

අවශ්‍යතාව මත හා ආරාධනය මත නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් සංවර්ධන) ඇතුළු ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය රැස්වීම් වලට සහභාගී වන ලදී.

ගණපූරණය

අවම සාමාජික සංඛ්‍යාව දෙදෙනෙකි

කමිටුවේ ලේකම්

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්, මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේ ලේකම් ලෙසද කටයුතු කරයි.

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සංවර්ධන හා පාරිශ්‍රමික කමිටු ප්‍රඥප්තිය

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සංවර්ධන හා පාරිශ්‍රමික කමිටුව සංස්ථාපනය කරන ලද්දේ 1988 අංක 30 දරන සංශෝධිත බැංකු පනතේ 76 J (1) වගන්තිය සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද 2007 අංක 12 දරන බැංකු පනත් නියාමනයේ 3 (6) (I) හා (III) වගන්තිය යටතේ වන විධිවිධාන වලට අනුකූලවය. කමිටුව සෘජුව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරන අතර කමිටු රැස්වීම් පටිපාටි නිතිපතා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කර ඇත.

කමිටුවේ කාර්යභාරය සහ වගකීම්

ප්‍රඥප්තිය අනුව කමිටුවේ කාර්යභාරය සහ වගකීම් පහත කරුණු වලින් සමන්විත වේ.

- සාමූහික ගිවිසුම මත තීරණය කරනු ලබන වේතන හැර බැංකුවේ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට අදාළ වේතන ප්‍රතිපත්තිය (වැටුප, දීමනා සහ අනෙකුත් මූල්‍ය ගෙවීම්) තීරණය කිරීමේ වගකීම කමිටුව සතුවේ.
- බැංකුවේ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් වෙත ඉලක්ක සහ අරමුණු ලබාදීම. එසේ ලබාදුන් ඉලක්ක හා අරමුණු වලට සාපේක්ෂව සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ කාර්යසාධනය නිතිපතා ඇගයීම සහ වේතන, දීමනා සහ ප්‍රතිශෝධනය කිරීමේ පදනම තීරණය කිරීම.
- ජ්‍යෙෂ්ඨ විධායක කාර්යය මණ්ඩලයට අදාල නියමයන් යන කොන්දේසි හැර වැදගත් මානව සම්පත් ප්‍රතිපත්ති, මූල පිරීම් වැටුප් ව්‍යුහයන් කමිටුව විසින් සමාලෝචනය කරන ලදී. මෙම ක්‍රියාවලියේදී බැංකුවේ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය වෙතින් අවශ්‍ය තොරතුරු සහ නිර්දේශ ලබාගන්නා ලදී.

2023 වසර තුළ කමිටුවේ ක්‍රියාකාරකම්

2023 වසර තුළ කමිටුව විසින් සිදු කළ හා සහභාගීත්වය දැක්වූ ප්‍රධාන ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

- 2022 වසර සඳහා ප්‍රධාන කළමනාකාරීත්ව පිරිස්හි (සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී) ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, සියලුම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී හා සහකාර සාමාන්‍යාධිකාරීන්ගේ ප්‍රධාන කාර්ය සාධන දර්ශක ඇගැයීම.
- බැංකුවේ අවශ්‍යතාව මත කාර්ය මණ්ඩලයේ නව බඳවා ගැනීම් හා උසස්වීම් සමාලෝචනය.
- මානව සම්පත් ආශ්‍රිත කරුණු සම්බන්ධයෙන් කාර්ය මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලැබූ අභියාචනා සැලකිල්ලට ගැනීම.
- කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ උසස්වීම් හා විනයානුකූල ක්‍රියාමාර්ග/දඬුවම් යනාදියෙන් ඇතිවන බලපෑම සමාලෝචනය කිරීම.
- බඳවා ගැනීමේ ක්‍රමවේද සමාලෝචනයට බඳුන් කිරීම.
- අභ්‍යාසලාභී නිලධාරීන් ඇතුළුව බැංකුවට අවැසි කාර්ය මණ්ඩල බඳවා ගැනීම.
- සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී තනතුරට බැංකුවට බාහිරින් අයදුම්කරුවෙකු බඳවා ගැනීම. ඒ අනුව, ශෂී කණ්ඩම්බි මිය බැංකුවේ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී ලෙස බඳවා ගන්නා ලදී.

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු වාර්තාව

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සංවර්ධන හා පාරිශ්‍රමික කමිටු ප්‍රඥප්තිය

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සංවර්ධන හා පාරිශ්‍රමික කමිටුව සංස්ථාපනය කරන ලද්දේ 1988 අංක 30 දරන සංශෝධිත බැංකු පනතේ 76 J (1) වගන්තිය සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද 2007 අංක 12 දරන බැංකු පනත් නියාමනයේ 3 (6) (I) හා (III) වගන්තිය යටතේ වන විධිවිධාන වලට අනුකූලවය. කමිටුව සෘජුව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරන අතර කමිටු රැස්වීම් පටිපාටි නිතිපතා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කර ඇත.

කමිටුවේ කාර්යභාරය සහ වගකීම්

ප්‍රඥප්තිය අනුව කමිටුවේ කාර්යභාරය සහ වගකීම් පහත කරුණු වලින් සමන්විත වේ.

- සාමූහික ගිවිසුම මත තීරණය කරනු ලබන වේතන හැර බැංකුවේ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට අදාළ වේතන ප්‍රතිපත්තිය (වැටුප්, දීමනා සහ අනෙකුත් මූල්‍ය ගෙවීම්) තීරණය කිරීමේ වගකීම කමිටුව සතුවේ.
- බැංකුවේ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් වෙත ඉලක්ක සහ අරමුණු ලබාදීම. එසේ ලබාදුන් ඉලක්ක හා අරමුණු වලට සාපේක්ෂව සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ කාර්යසාධනය නිතිපතා ඇගයීම සහ වේතන, දීමනා සහ ප්‍රතිශෝධනය කිරීමේ පදනම තීරණය කිරීම.
- ජ්‍යෙෂ්ඨ විධායක කාර්යය මණ්ඩලයට අදාල නියමයන් යන කොන්දේසි හැර වැදගත් මානව සම්පත් ප්‍රතිපත්ති, මූල පිරීම් වැටුප් ව්‍යුහයන් කමිටුව විසින් සමාලෝචනය කරන ලදී. මෙම ක්‍රියාවලියේදී බැංකුවේ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය වෙතින් අවශ්‍ය තොරතුරු සහ නිර්දේශ ලබාගන්නා ලදී.

2023 වසර තුළ කමිටුවේ ක්‍රියාකාරකම්

2023 වසර තුළ කමිටුව විසින් සිදු කළ හා සහභාගීත්වය දැක්වූ ප්‍රධාන ක්‍රියාකාරකම් පහත පරිදි වේ.


- 2022 වසර සඳහා ප්‍රධාන කළමනාකාරීත්ව පිරිස්හි (සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී) ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, සියලුම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී හා සහකාර සාමාන්‍යාධිකාරීන්ගේ ප්‍රධාන කාර්ය සාධන දර්ශක ඇගැයීම.
- බැංකුවේ අවශ්‍යතාව මත කාර්ය මණ්ඩලයේ නව බඳවා ගැනීම් හා උසස්වීම් සමාලෝචනය.
- මානව සම්පත් ආශ්‍රිත කරුණු සම්බන්ධයෙන් කාර්ය මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලැබූ අභියාචනා සැලකිල්ලට ගැනීම.
- කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ උසස්වීම් හා විනයානුකූල ක්‍රියාමාර්ග/දඬුවම් යනාදියෙන් ඇතිවන බලපෑම සමාලෝචනය කිරීම.
- බඳවා ගැනීමේ ක්‍රමවේද සමාලෝචනයට බඳුන් කිරීම.
- අභ්‍යාසලාභී නිලධාරීන් ඇතුළුව බැංකුවට අවැසි කාර්ය මණ්ඩල බඳවා ගැනීම.
- සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී තනතුරට බැංකුවට බාහිරින් අයදුම්කරුවෙකු බඳවා ගැනීම. ඒ අනුව, ශෂී කණ්ඩම්බි මිය බැංකුවේ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී ලෙස බඳවා ගන්නා ලදී.
- ටී එච් එස් අතපත්තු මයාගේ ඉල්ලා අස්වීම මත මූල්‍ය, ආයතනික සැලසුම් හා කළමනාකරණ තොරතුරු පද්ධතිය යන අංශයට නව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයෙකු සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ සහකාර සාමාන්‍යාධිකාරීවරයෙකු බඳවා ගැනීමට අවශ්‍ය මුලපිරීම් වර්ෂය තුළ සිදු කිරීම.
- 2023 වර්ෂය සඳහා විනය පරීක්ෂණ.
- මානව සම්පත් ප්‍රතිපත්ති මාලාව සංශෝධනය.
- බැංකුවේ ආයතනික ව්‍යුහය යළි ඇගැයීමට ලක් කිරීම.
- පුහුණු කිරීමේ හා සංවර්ධන ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීම.

2024 වර්ෂය හා ඉන් ඉදිරියට අවධානය යොමු කිරීම

- පාරිශ්‍රමික ප්‍රතිපත්තියේ අදාළත්වය බැංකුව විසින් අඛණ්ඩව පවත්වාගෙන යනු ලබන බවට සහතිකවීම.
- සේවක නිරතවීම් සංස්කෘතියක් අන්තර්ගත මානව සම්පත් උපායමාර්ග සැලසුමක් සංවර්ධනය කෙරෙහි අඛණ්ඩ අවධානය යොමු කිරීම.
- ප්‍රඥප්තියෙහි වගකීම් සපුරාලීම.

කමිටුවේ කාර්ය සාධනය ඇගැයීම

කමිටුවේ කාර්යක්ෂමභාවය පිළිබඳ වාර්ෂික ඇගයීමක් කමිටුව විසින් සිදු කරනු ලැබූ අතර, එහි ප්‍රතිඵල අධ්‍යක්ෂ මණ්ඩලයට සන්නිවේදනය කරනු ලැබෙයි.



එස් ආර් ඩබ් එම් ආර් පී සන්කුමාර මයා
සභාපති
අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව

25 මාර්තු 2024
කොළඹ

අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටු වාර්තාව

එස් ආර් ඩබ් එම් ආර් පී සත්කුමාර මහතා
සභාපති
අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව



කමිටුවේ සංයුතිය

සමාලෝචනයට බඳුන් වූ වර්ෂය තුළ, අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව පහත සඳහන් විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත විය.

නම	සාමාජික තත්ත්වය	සහභාගිවීමට සුදුසු	සහභාගිවීම්
එස් ආර් ඩබ් එම් ආර් පී සත්කුමාර මයා **	සභාපති	03	03
ජූඩ් නිලුක්ෂාන් මයා*	සාමාජික	03	03
දුෂ්‍යන්ත බස්නායක මයා*	සාමාජික	03	03

* විධායක නොවන, ස්වාධීන නොවන අධ්‍යක්ෂ ** විධායක නොවන, ස්වාධීන අධ්‍යක්ෂ

ඉහත සාමාජිකයන්ගේ විස්තර පිටු අංක 158 සිට 161 දක්වා ඇතුළත්ය.

ගණපූරණය

අවම වශයෙන් සාමාජිකයින් දෙදෙනෙකි.

ආරාධනයෙන් නිතිපතා සහභාගීවන්නන්

සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී විසින් කමිටුවට තොරතුරු සපයනු ලබන අතර ආරාධනය මත කමිටුවේ රැස්වීම්වලට සහභාගි වේ.

කමිටුවේ ලේකම්

අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්, අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුවේ (BNC) හි ලේකම් ලෙස කටයුතු කරයි.

කමිටුවේ ප්‍රඥප්තිය

1988 අංක 30 දරන බැංකු පනතේ 76 J (1) වගන්තිය යටතේ සංශෝධිත පරිදි, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා ආයතනික පාලනය, 2007 අංක 12 දරන බැංකු පනතේ උපදෙස්වලට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුව (BNC), ප්‍රධාන කළමනාකාරීත්ව පිරිස් තෝරා ගැනීම පිළිබඳ මණ්ඩලයේ අධීක්ෂණය සහ පාලනය සහතික කිරීම සඳහා පිහිටුවා ඇත.

කමිටුවේ කාර්යභාරය සහ වගකීම්

සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් තෝරා ගැනීම/පත් කිරීමේ ක්‍රියා පටිපාටියක් ක්‍රියාත්මක කිරීම, සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ තනතුරුවලට පත් කිරීම හෝ උසස් කිරීම සඳහා සලකා බැලිය යුතු සුදුසුකම්, පළපුරුද්ද සහ ප්‍රධාන ගුණාංග වැනි නිර්ණායක සැකසීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව වගකිව යුතුය.

තවද, අධ්‍යක්ෂවරුන්, සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් 3 (3) විධානයෙහි දක්වා ඇති සහ ප්‍රඥප්තිවල දක්වා ඇති නිර්ණායකවල දක්වා ඇති නිලතල දැරීමට සුදුසු සහ යෝග්‍ය පුද්ගලයින් බවට කමිටුව සහතික කළ යුතුය. කමිටුව විසින් වරින් වර අවශ්‍යතා සලකා බලා විශ්‍රාම යන ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා අමතර/නව විශේෂඥතාව සහ අනුප්‍රාප්තික සැලසුම් නිර්දේශ කළ යුතුය.

2023 වර්ෂය තුළ ක්‍රියාකාරකම්

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ නාමයෝජනා කමිටු රැස්වීම් තුනක් (3) පවත්වන ලදි.

වර්ෂය තුළ කාරක සභාව සහභාගී වූ සහ සිදු කරන ලද වැදගත් ක්‍රියාකාරකම් පහත පරිදි වේ:


- බැංකුවේ ප්‍රධාන කළමනාකාරීත්ව පිරිස් (KMPs) වලට අදාළ බඳවාගැනීමේ පටිපාටි සමාලෝචනය
- බැංකු සහ බැංකු නොවන විෂය ධාරාවන්හි ප්‍රධාන කළමනාකරණ පිරිස් (KMPs) වල පත්වීම්/උසස්වීම් සඳහා සම්මුඛ පරීක්ෂණ
- සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී තනතුර සඳහා ඉදිරිපත් වූ අයදුම්පත් අතුරින් කෙටි ලැයිස්තුගත කිරීම් (Short listing) සිදු කිරීම, සහ අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ කිරීම.
- තෝරා ගැනීමේ නිර්ණායක සහ තෝරා ගැනීමේ ක්‍රමවේදය සම්පාදනය කිරීම.

2024 සහ ඉන් ඔබ්බට අවධානය යොමු කිරීම

- ප්‍රධාන කළමනාකාරීත්ව පිරිස් KMPs සම්බන්ධ කරුණු පිළිබඳ සමාලෝචනය අඛණ්ඩව අධීක්ෂණය කිරීම සහ නියාමන අවශ්‍යතාවලට අනුකූල වීම.
- අනුප්‍රාප්තික සැලසුම සහ බැංකුවේ පිළිපැදීම අඛණ්ඩව අධීක්ෂණය කිරීම.
- ප්‍රඥප්තියේ වගකීම් ඉටු කිරීම.

කමිටුවේ ඇගයීම

කමිටුවේ කාර්යක්ෂමතාවය පිළිබඳ වාර්ෂික ඇගැයීමක් කමිටුව විසින් සිදු කරනු ලැබූ අතර, එහි ප්‍රතිඵල අධ්‍යක්ෂ මණ්ඩලයට සන්නිවේදනය කරනු ලැබෙයි.



එස් ආර් ඩබ් එම් ආර් පී සත්කුමාර
සභාපති
අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව

25 මාර්තු 2024
කොළඹ

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව

ජූඩ් නිලුක්ෂාන් මහතා
සභාපති
අධ්‍යක්ෂ මණ්ඩලය ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව



කමිටුවේ සංයුතිය

සමාලෝචනයට බඳුන් වූ වර්ෂය තුළ, අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව පහත සඳහන් (BIRMC) අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත විය.

නම	සාමාජික තත්ත්වය	සහභාගිවීමට සුදුසු	සහභාගිවීම්
ජූඩ් නිලුක්ෂාන් මයා *	සභාපති	07	06
එස් ආර් ඩබ් එම් ආර් පී සත්කුමාර මයා **	සාමාජික	07	07
එච් කේ ඩී ලක්ෂමන් ගාමිණී මයා *	සාමාජික	06	06

* විධායක නොවන, ස්වාධීන නොවන අධ්‍යක්ෂ ** විධායක නොවන, ස්වාධීන අධ්‍යක්ෂ

ඉහත සාමාජිකයන්ගේ විස්තර පිටු අංක 158 සිට 161 දක්වා ඇතුළත්ය.

අධ්‍යක්ෂ මණ්ඩල නොවන සාමාජිකයන්

සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී
ප්‍රධාන අවදානම් කළමනාකරණ නිලධාරී

ආරාධනය මත නිතිපතා සහභාගි වූ නිලධාරීන්

බැංකුවේ අනුකූලතා නිලධාරියා, ආරාධනය මත නිතිපතා සහභාගි වනු ලැබිණි.
සෙසු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන්, සහකාර සාමාන්‍යාධිකාරීවරුන් හා ප්‍රධාන කළමනාකරුවන්ද අවශ්‍ය පරිදි කමිටු රැස්වීම්වලට සහභාගිවීම සිදු වෙයි.

ගණපූරණය

අවම වශයෙන් සාමාජිකයින් දෙදෙනෙකි

කමිටුවේ ලේකම්

අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්, අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරයි.

කමිටුවේ ප්‍රඥප්තිය

1988 අංක 30 දරන බැංකු පනතට අනුව, මුදල් මණ්ඩලයට පැවරී ඇති බලය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා ආයතනික පාලනය සඳහා වන 2007 අංක 12 දරන බැංකු පනතේ උපදෙස්වලට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) පිහිටුවා ඇත.

කමිටුවේ කාර්යභාරයන් සහ වගකීම්

- අවදානම් කළමනාකරණයට අදාළ වගකීම් ඉටු කිරීමට සහ ඵලදායී අවදානම් කළමනාකරණ රාමුවක් ස්ථාපිත කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වීම.
- බැංකුව විසින් අනුමත කරන ලද ඒකාබද්ධ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය සහ අනෙකුත් අවදානම් ආශ්‍රිත ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහ බැංකුව පුරා අවදානම් කළමනාකරණ රාමුව වරින්වර යාවත්කාලීන කිරීම.
- බැංකුව මුහුණ දෙන සියලුම ණය, වෙළඳපොළ, මෙහෙයුම් සහ උපාය මාර්ගික අවදානම් හඳුනාගෙන, මැනීම, අධීක්ෂණය සහ ප්‍රමාණවත් ලෙස කළමනාකරණය කර ඇති බවට සහතිකවීම.
- අදාළ වගකිව යුතු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වෙතින් සියලුම තීරණාත්මක අවදානම් අංශ පිළිබඳ තොරතුරු ලබා ගැනීම සහ කමිටුව වෙත පවරා ඇති බලතල හා වගකීමට අයත් පරාසය ඇතුළත අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යෝග්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම.
- නව මෙහෙයුම් වර්ධනයන්හි අවදානම හඳුනා ගැනීම, සමාලෝචනය කිරීම, වාර්තා කිරීම සහ එම කරුණු වලට අදාළ අනුකූලතාව පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීම.
- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද බාසල් III උපදෙස් ක්‍රියාත්මක කිරීම සහ ඒවාට අනුකූල වීම සමාලෝචනය කිරීම.

බැංකුවට අදාළ අවදානම් සහ අනුකූලතාව පිළිබඳ ප්‍රතිපත්ති, වාර්තා සහ යෝජනා කමිටුව සමාලෝචනය කරයි. අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව එහි විධානය තුළ යෝජනා සඳහා අනුමැතිය ලබා දෙන අතර මණ්ඩලය විසින් පරීක්ෂා කිරීමට අවශ්‍ය වන යෝජනා/වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ කරයි.

අවදානම් කළමනාකරණය පිළිබඳ අදාළ පරිච්ඡේදය/කොටස බැංකුවේ අවදානම් කළමනාකරණ කාර්යයන් සහ එහි වැදගත්කම පිළිබඳ සවිස්තරාත්මක හැඳින්වීමක් ඉදිරිපත් කරයි. අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව අවදානම් කළමනාකරණය, අනුකූලතා අංශ සහ අනෙකුත් මෙහෙයුම් අංශ විසින් එහි වගකීම් ඉටු කිරීම මගින් සහාය දක්වයි.

2023 වර්ෂය තුළ ක්‍රියාකාරකම්

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව, කාර්තුමය පදනමින් රැස්වන නමුත් අවශ්‍යතා මත පදනම්ව, ඒ අනුව රැස්වීම් නියම කරමින් පවතී. 2023 වර්ෂය තුළ ජාතික ඉතිරිකිරීමේ බැංකුව රැස්වීම් 07ක් කැඳවා ඇත.

බැංකුවට අහිතකර ලෙස බලපෑ හැකි මෙහෙයුම්, ණය, වෙළෙඳපොළ, ද්‍රවශීලතාව වැනි සියලුම ප්‍රධාන අවදානම් කමිටුව විසින් තක්සේරු කරයි. අවදානම් කළමනාකරණය සඳහා එහි ව්‍යවස්ථාපිත, විශ්වාසනීය සහ නියාමන වගකීම් ඉටු කිරීම සඳහා එය ප්‍රධාන කළමනාකරණ පිරිස් සහ මණ්ඩලය සමඟ සමීප සබඳතාවක් පවත්වාගෙන යයි.

අවදානම් කළමනාකරණ ක්‍රියාවලියේ සඵලතාවය බැංකුවේ අභ්‍යන්තර විගණන අංශය විසින් වාර්ෂිකව විගණනය කරනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව

වර්ෂය තුළ කාරක සභාව සහභාගි වූ සහ සිදුකරන ලද වැදගත් ක්‍රියාකාරකම් පහත පරිදි වේ:

- දුර්වල වූ ආර්ථික තත්ත්වයන් හේතුකොට ගෙන ක්ෂය වූ ණය ගුණාත්මකභාවය සමාලෝචනය කිරීම.
- බැංකුවේ අවදානම් රුචිය, ඉවසීමේ සීමා සහ බැංකුවේ අවදානමේ විවිධ පැති ඉස්මතු කරන අනෙකුත් වාර්තා පිළිබඳ වාර්තා සමාලෝචනය (එනම්, ණය අවදානම, වෙළෙඳපොළ අවදානම, ද්‍රවශීලතා අවදානම, මෙහෙයුම් අවදානම, මානව සම්පත් අවදානම, තාක්ෂණික අවදානම, සයිබර් ආරක්ෂණ අවදානම ආදිය).
- විවිධ අවදානම් සීමා සමාලෝචනය කිරීම සහ අවශ්‍ය අනුමැතිය ලබා දීම.
- ICAAP ලේඛනයේ විගණන කරුණුවලට අනුකූලව කර්මාන්තයේ ජාත්‍යන්තරව පිළිගත් සම්මතයන්, ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමන රෙගුලාසි/මාර්ගෝපදේශ සහ අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාව තක්සේරු කිරීමේ ක්‍රියාවලිය (ICAAP) සපුරාලීම සඳහා බැංකුව විසින් පවත්වාගෙන යනු ලබන ක්‍රියාමාර්ග සහ ප්‍රමිතිවල ප්‍රමාණවත්භාවය සමාලෝචනය කිරීම.
- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඔවුන්ගේ පරීක්ෂණයේදී මතු කරන ලද අධීක්ෂණ ගැටලු නිවැරදි කිරීමේ ක්‍රියාවලියේ ප්‍රගතිය පසුවිපරම් කිරීම.
- සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු, මූල්‍ය වංචා, වංචා අවදානම් කළමනාකරණය වැනි බැංකුවේ ප්‍රධාන ගැටලු පිළිබඳ කාලානුරූප වාර්තා සමාලෝචනය කිරීම - විස්ල් බ්ලොවින්ග් ප්‍රතිපත්තිය.
- බැංකුවේ අනුකූලතා තක්සේරු කිරීම් සහ උකස් තැබීම, ණය, මානව සම්පත් කළමනාකරණය, KYC (ඔබේ පාරිභෝගිකයා දැන ගන්න) අවශ්‍යතා පවත්වා ගැනීම වැනි එහි මූලික කාර්යයන් පිළිබඳ සමාලෝචනය.
- බාසල් III ප්‍රමිතීන්ට අනුකූලව බැංකුවල තත්ත්වය පිළිබඳ අඛණ්ඩ අධීක්ෂණය සහ සමාලෝචනය.
- අනුකූලතා වැඩසටහනේ වාර්ෂික සමාලෝචනය සහ අනුකූලතා අත්පොත.

2024 සහ ඉන් ඔබ්බට අවධානය යොමු කිරීම

- සාර්ව හා ක්ෂුද්‍ර පාරිසරික සාධක, වෙළඳපල, දේශීය සහ ජාත්‍යන්තර අවදානම් සාධක කෙරෙහි අවධානය යොමු කිරීම අඛණ්ඩව සිදු කිරීම.
- බැංකුවේ අවදානම් සහ අනුකූලතා උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම පිළිබඳ අඛණ්ඩ අධීක්ෂණය.
- අවදානම් කළමනාකරණ ක්ෂේත්‍රයේ දේශීය මෙන්ම ජාත්‍යන්තර ප්‍රවණතා තක්සේරු කිරීම.
- අවදානම් කළමනාකරණය සහ අනුකූලතාව සඳහා වෙළඳපළ ප්‍රමුඛතා ප්‍රකාර හා වෙනස්වන නියාමන අවශ්‍යතා මත පදනම්ව බැංකුවේ ප්‍රවේශය කෙරෙහි දිගටම අවධානය යොමු කිරීම.

කමිටුවේ ඇගයීම

කමිටුවේ කාර්යක්ෂමතාවය පිළිබඳ වාර්ෂික ඇගැයීමක් කමිටුව විසින් සිදු කරනු ලැබූ අතර, එහි ප්‍රතිඵල අධ්‍යක්ෂ මණ්ඩලයට සන්නිවේදනය කරනු ලැබෙයි.



ජූඩ් නිලුක්ෂාන් මයා
සභාපති
අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව

25 මාර්තු 2024
කොළඹ

හදිසි නොවන සහ අත්‍යවශ්‍ය නොවන වියදම් පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල කමිටු වාර්තාව

ජනාධිපති නීතීඥ, ආචාර්ය හර්ෂ කබ්රාල්

සභාපති
හදිසි නොවන සහ අත්‍යවශ්‍ය නොවන වියදම් පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල කමිටුව



කමිටුවේ සංයුතිය

සාමාලෝචනයට බඳුන් වූ වසර තුළ හදිසි නොවන සහ අත්‍යවශ්‍ය නොවන වියදම් පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල කමිටුව පහත සඳහන් විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත විය.

නම	සාමාජික තත්ත්වය	සහභාගිවීමට සුදුසු	සහභාගිවීම්
ජනාධිපති නීතීඥ, ආචාර්ය හර්ෂ කබ්රාල්**	සභාපති	05	05
දුෂ්‍යන්ත බස්නායක මයා*	සාමාජික	05	05
ශූඩ් නිලුක්ෂාන් මයා*	සාමාජික	05	05
එස් ආර් ඩබ් එම් රුවන් පාලිත සත්කුමාර මයා**	සාමාජික	02	02
එච් කේ ඩී ලක්ෂමන් ගාමිණී මයා*	සාමාජික	02	02

* විධායක නොවන, ස්වාධීන නොවන අධ්‍යක්ෂ ** විධායක නොවන, ස්වාධීන අධ්‍යක්ෂ
2023 සැප්තැම්බර් 21 දින එම කමිටුව සාමාජිකයන් 3 දෙනෙකුගෙන් සමන්විත වේ.

ඉහත සාමාජිකයන්ගේ විස්තර පිටු අංක 158 සිට 161 දක්වා ඇතුළත්ය.

ආරාධනය මත නිතිපතා රැස්වීම්වලට සහභාගීවූ නිළධාරීන්

සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී විසින් කමිටුවට අවශ්‍ය තොරතුරු සපයන අතර සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී හා සම්බන්ධ කරුණු සාකච්ඡා කෙරෙන අවස්ථාවන්හි දී හැර අනෙකුත් සියලු රැස්වීම්වලට සහභාගී වේ.

ගණපූරණය

අවම සාමාජික සංඛ්‍යාව දෙදෙනෙකි

කමිටුවේ ලේකම්

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්, හදිසි නොවන සහ අත්‍යවශ්‍ය නොවන වියදම් පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල කමිටුවේ ලේකම් ලෙසද කටයුතු කරයි.

හදිසි නොවන සහ අත්‍යවශ්‍ය නොවන වියදම් පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල කමිටු ප්‍රඥප්තිය

2023 පෙබරවාරි 02 දිනැති 2023 අංක 01 දරන බැංකු පනතේ අංක 3.5 වගන්තිය මගින් බලපතලාභී බැංකුවලට එකී බැංකුවක් විසින් දරනු ලබන යම් හදිසි නොවන සහ/හෝ අත්‍යවශ්‍ය නොවන සහ/හෝ ප්‍රාග්ධන වියදම් වෙතොත් එය තත්සේරු කිරීමේ හා අනුමත කිරීමේ වගකීම සහිත අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටුවක් 2023 සහ 2024 වර්ෂයන්හි පිහිටුවා ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය මතු කරන ලදී.

ඒ අනුව ඉහත විධානය හා අනුකූල වෙමින් බැංකුව විසින් හදිසි නොවන සහ අත්‍යවශ්‍ය නොවන වියදම් පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල කමිටුවක් බැංකුව විසින් පිහිටුවන ලදී.

කමිටුවේ කාර්යභාරය සහ වගකීම්

ප්‍රඥප්තිය අනුව කමිටුවේ කාර්යභාරය සහ වගකීම් පහත කරුණු වලින් සමන්විත වේ.


(අ) හදිසි නොවන සහ අත්‍යවශ්‍ය නොවන වියදම් පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල කමිටුවේ පූර්ව අනුමැතිය අවශ්‍ය වියදම් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත ප්‍රතිපත්තියෙහි සඳහන් මාර්ගෝපදේශ අනුගමනය කිරීම.

(ආ) 2023 හා 2024 යන වර්ෂ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ කරන ලද බැංකුවේ හදිසි නොවන සහ/හෝ අත්‍යවශ්‍ය නොවන වියදම් සහ/හෝ ප්‍රාග්ධන වියදම්, පිරිවැයට සාපේක්ෂව ඵලදායී බැව් දැඩිව සාධාරණීයකරණය කළ හැකි වියදම් බවට සහතිකවීම සහ ඒ සම්බන්ධයෙන් මෙම කමිටුවේ අනුමැතිය ලබා ගැනීම.

(ඇ) 2023 හා 2024 වර්ෂ සඳහා බැංකුව විසින් අනවශ්‍ය පිරිවැය නොදරනු ලබන බවට සහ පමණ ඉක්මවා වියදම් නොකරන බව වගබලා ගැනීම.

2023 වර්ෂයට අදාළ ක්‍රියාකාරකම්

වියදම් මනා පාලනයකින් හා නිවැරදි විනිශ්චය මත සිදු කරනු ලබන බවට සුපරීක්ෂාකාරීව ඇගැයීම තුළින් අත්‍යවශ්‍ය ක්‍රියාකාරකම් සඳහා සම්පත් යෙදවීමට ප්‍රමුඛතාවය දීමටත් තීරණාත්මක නොවන වියදම් දරනු ලබන්නේ බැංකුවේ උපාය මාර්ගික අරමුණු හා අනුගතව මෙන්ම සාධාරණීකරණය කළ හැකි අවස්ථාවන්හිදී බවට කමිටුව වගබලා ගන්නා ලදී.



ජනාධිපති නීතීඥ, ආචාර්ය හර්ෂ කබ්රාල්
සභාපති
හදිසි නොවන සහ අත්‍යවශ්‍ය නොවන වියදම් පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල කමිටුව

25 මාර්තු 2024
කොළඹ

අවදානම් සමාලෝචනය

තවත් අභියෝගාත්මක වසරක් තුළ, අවදානම් වාතාවරණයේ සංකීර්ණතාව විශ්මය ඇති කරමින් වැඩි වූ අතර අවදානම් කළමනාකරණ හැකියාවන් ශක්තිමත් කිරීමට අවදානම් පැතිකඩ වඩාත් සමීපව නියාමනය කිරීම සඳහා එහි පාලනයේ දැඩි බව ශක්තිමත් කිරීමට කළමනාකරණය, BIRMC සහ අධ්‍යක්ෂ මණ්ඩලයට අවශ්‍ය විය.

2023 දී ප්‍රධාන අභියෝග

ආර්ථික ගැටළු: ශ්‍රී ලංකාවේ පැවති බරපතල ආර්ථික අභියෝග හමුවේ ජාතික ආර්ථිකයට සහය වෙමින් සහ ප්‍රතිපත්ති වෙනස්වීම් හමුවේ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවන්ට අනුකූල වෙමින් ගනුදෙනුකරුවන්ට සහ කොටස්හිමියන්ට සිය බැඳීම සපුරාලීමේ දී බැංකු මත පීඩනය ඇති කළේය. ශ්‍රී ලංකාව සාර්ව ආර්ථික අර්බුදයේ අති විශේෂ මට්ටමක සිට යථාවත් වෙමින් සිටී. ගෙවුම් ශේෂය සහ තුළ දිගුකාලීන ජංගම ගිණුමේ හිඟය, මූල්‍ය හිඟය වැනි දෑ ආර්ථිකයට ගති සංකලනයක් ලෙස පසුගිය වසරවල සුලභ බාධක මඟින් අභියෝග කර ඇත.

ආර්ථික අර්බුදයේ ප්‍රතිවිපාක අභියෝගාත්මක කොන්දේසි යටතේ අබණ්ඩව ක්‍රියාත්මක වීමට සිදු වූ බැවින්, මූල්‍ය අංශය අති විශේෂ අභියෝග රාශියකට මුහුණ පැවේය. 2023 වසර තුළ ඇති වූ සමස්ත ආර්ථික සංකෝචනයට බලපෑ බදු ඉහළ යාම, මිල මට්ටම් හා පොලී අනුපාත ඉහළ යෑම, මූල්‍ය අංශය තුළ පීඩනයට ලක් වූ ශේෂ පත්‍රවලට හේතු විය. සියලුම බැංකු විදේශ විනිමය ද්‍රවශීලතා ගැටළුවලින් පීඩාවට පත් වූ අතර ඒ සඳහා ශ්‍රී ලංකා රුපියලේ දැඩි අවප්‍රමාණයක් ඇති කරමින් සංචාරක සහ ප්‍රේෂණ වැනි මූලිකවම බාහිර අරමුදල් ගලාඒම අඩුවීම, වැඩි වූ උද්ධමනය සහ ආර්ථික වර්ධනයේ හැකිලීම හේතු විය. මෙය රටේ ශ්‍රේණිගතකරණය පහල දැමීම තීව්‍ර කළේය. ඊට අමතරව, ඉන්ධන මිල ගණන් සහ විදුලි ගාස්තු ඉහළ දමන අතර එය කර්මාන්ත යෙදවුම් සහ ගනුදෙනුකරුවන්ගේ ව්‍යාපාර මෙහෙයුම්වලට බලපාන ලද අතර සමහර සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සම්පූර්ණයෙන්ම සිය කටයුතු නවතා දමන ලදී.

ඉදිකිරීම, පොහොර, පුනර්ජනනීය බලශක්තිය වැනි විවිධ කර්මාන්ත සඳහා ගෙවීම් ප්‍රමාදවීම් මුදල් ප්‍රවහ මත පීඩනය ඇති කළ අතර ගනුදෙනුකරුවන්ගේ ණය ආපසු ගෙවීමේ හැකියාව කෙරෙහි බලපාන ලදී. පාරිභෝගික අංශය වැඩි වූ මිල මට්ටම්වලින් පීඩනයට පත් වූ අතර එය ණය ආපසු ගෙවීම ප්‍රමාදවීමට හෝ අත්හැර දැමීමට හේතු විය.

කොළඹ පාරිභෝගික මිල දර්ශකය (CCPI) විසින් මනින ලද ශීර්ෂ උද්ධමනය 2022 සැප්තැම්බර්වල 69.8% දක්වා ඉහල ගිය අතර අඩු ඉල්ලුම හමුවේ වුවත් ඉහළ පදනමක් සිට පසුව 2023 දෙසැම්බර් ඉතා තියුණු ලෙස 4% දක්වා පහත වැටුනි. උද්ධමනය පහත වැටුණ බැවින්, මහ බැංකුව මූල්‍ය ප්‍රතිපත්ති ස්ථාවරය ලිහිල් කළ අතර ජූනි සහ ජූලි මාසවල ප්‍රතිපත්ති අනුපාත කපා දමන ලදී. දේශීය ණය ප්‍රතිව්‍යූහගතකරණය පිළිබඳ වඩා යහපත් පැහැදිලි ප්‍රකාශය මත, දින 91 භාණ්ඩාගාර බිල්පත් අනුපාත 2022 සිට පළමුවරට 2023 ජූලිවල 20%වඩා පහළ ගියේය. 2023 වසර අවසානයේදී, දින 91 භාණ්ඩාගාර බිල්පත් අනුපාතය 14.51%ක් විය.

ඇමෙරිකානු ඩොලර්/ශ්‍රී ලංකා රුපියල් හුවමාරු අනුපාතය 2023 මාර්තුවල රටේ විදේශීය විනිමය සංචිත තත්ත්වය හේතුවෙන් 2023 තුළ 11%කින් අවප්‍රමාණය විය. සේවක ප්‍රේෂණ, සංචාරක කර්මාන්තයේ ඉපයීම්, ණය, ප්‍රදානවලින් ඇමෙරිකානු ඩොලර් මේරටට ගලාඒම සිදුවන අතර පාලනය කළ ආනයන සමඟ වර්ධිත වෙළෙඳ ශේෂය 2022 වාර්තාකළ හිඟයට සාපේක්ෂව සමස්ත ගෙවුම් ශේෂයේ අතිරික්තයක් වාර්තාකිරීමට හේතු විය.

තැන්පත් මත ඉහළ පොලී අනුපාත 2023 පළමු අර්ධය තුළ ස්කන්ධ වෙළෙඳපොල කාර්යසාධනය කෙරෙහි සෘණාත්මක බලපෑමක් ඇත. කෙසේවෙතත්, ස්කන්ධ වෙළෙඳපොල 2023 3වැනි කාර්තුවේ සිට වෙළෙඳපොල නිවැරදි කිරීම් කිහිපයක් සමඟ වසර තුළ විශාල ලෙස වෙනස් විය. ප්‍රතිපත්ති අනුපාත කපාහැරීම සහ අඩුකළ තැන්පත් අනුපාතවලින් පසු සියලු කොටස් මිල දර්ශකය (ASPI) තියුණු වර්ධනයක් වාර්තා කළේය.

ප්‍රධාන ද්විපාර්ශ්වික ණය හිමියන්ගෙන් මූල්‍ය සහතික ලබා ගැනීම, සාර්ව ආර්ථික ස්ථාවරත්වය සහ ණය තිරසාරභාවය ප්‍රතිෂ්ඨාපනය කිරීම කෙරෙහි අඛණ්ඩව අවධානය යොමු කරන ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) සහය දක්වන වැඩසටහන සමඟින්, දිළිඳු සහ අවදානමට ලක්විය හැකි අය ආරක්ෂා කරමින්, මූල්‍ය ස්ථාවරත්වය ආරක්ෂා කරමින් සහ දූෂණ අවධානම ආමන්ත්‍රණය කිරීම සඳහා ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සකස් කරමින්, ශ්‍රී ලංකාවේ ආර්ථිකය දෙසට වර්ධනය ගමන් කිරීම ආරම්භ කර ඇත. IMF හි විස්තීර්ණ අරමුදල් පහසුකම (EFF) අනුමැතිය ඇතිව, රජයේ දේශීය ණය ප්‍රශස්තකරණය (DDO) ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සහ 2023 ජූනි මාසයේදී මහ බැංකුව විසින් මුදල් ප්‍රතිපත්ති ක්‍රියාවලිය ලිහිල් කිරීම නිසා අවිනිශ්චිතතාවයන් සැලකිය යුතු ප්‍රමාණයකට අඩු විය.

තවද, මෙම ආකුල කාලසීමාව තුළ මහ බැංකුව මූල්‍ය ස්ථාවරත්වය සහතික කිරීමට සහ ණය ගැතියන් ආරක්ෂා කිරීමට විවිධ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කළේය.

සමාජ හා දේශපාලන ගැටළු: ශ්‍රී ලංකාවේ නොසන්සුන්තාවයෙන් වසරකට පසු, රට තවමත් එහි අස්ථාවරත්වයේ අහිතකර විපාක සමඟ කටයුතු කරමින් සිටී.

ආර්ථික අස්ථාවරතාවයේ ප්‍රතිඵලයක් ලෙස සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය වසා දැමීමට හේතු වූ අතර ණය ගෙවීමේ හැකියාවන්ට බලපෑම් කරමින් විරැකියාව ඇති කරයි. සොරකම සහ වංචාව වැනි සමාජ උවදුරුවල වැඩිවීම බැංකු මෙහෙයුම් අභියෝගයට ලක් කරන අතර ව්‍යාපාර අඛණ්ඩතාව සහතික කිරීමට සහ අභ්‍යන්තර පාලනය ව්‍යූහය සවිමත් කිරීමට අමතර ක්‍රියාමාර්ගවල අවශ්‍යතාව ඇති කරයි.

	1Q/2023	2Q/2023	3Q/2023	4Q/2023
AWDR (වසරකට %)	15.06	15.09	13.39	11.64
AWPLR (වසරකට %)	22.42	20.04	14.96	12.39
දින 91 භාණ්ඩාගාර බිල්පත් (%)	25.99	23.00	17.42	14.51
USD/LKR අනුපාතය (TT-mid) (රු)	327.14	308.92	323.58	323.98
සියලු කොටස් මිල දර්ශකය	9,301.09	9,442.95	11,335.61	10,654.16
Gold (LKR per Troy oz)	649,006	591,252	616,774	670,390

වගුව 22 → වෙළෙඳපොල තොරතුරු


අවදානම් සමාලෝචනය

ඉහත සාකච්ඡා කරන ලද ආර්ථික, දේශපාලනික සහ සමාජීය ගැටළු 2023 වසරේ මූල්‍ය අංශයේ ස්ථාවරත්වයට අභියෝග කළේය. එබැවින්, 2023 වසර තුළ පැවති ආර්ථික තත්ත්වයන් හේතුවෙන් බැංකුව බොහෝ අභියෝගවලට නිරාවරණය විය.

- 2022 වර්ෂය තුළ පොලී අනුපාතවල අධික ඉහළයාමේ බලපෑමක් ලෙස ඉහළ පොලී අනුපාත අවදානමකට නිරාවරණය වීම. එය අරමුදල් ආකර්ෂණය කර රඳවා තබා ගැනීමට ස්ථාවර තැන්පතු මත වඩා ඉහළ පිරිවැයක් ගෙවීමට හේතු විය. සමාලෝචිත වසරේ පළමු කාර්තු තුන තුළ දුර්වල පොලී ආන්තිකයට මෙය හේතු වී ඇත.
- පොලී අනුපාත නොසලකමින් පුද්ගලික සහ රාජ්‍ය ආයතනික ණය ගැණුම්කරුවන්ගෙන් ණය ඉල්ලුමේ සැලකිය යුතු පහත වැටීමක් නිරීක්ෂණය වූ අතර මෙය ණය සහ අත්තිකාරම් කළඹෙහි හැකිලීමක් ඇති කළේය. ණය පැහැර හැරීමේ අවදානම් මට්ටම කළමනාකරණය කිරීමට අමතර වැයමක් අවශ්‍ය කරමින්, අදියර 3 ණය අනුපාතය වැඩි විය.
- කෙසේ වෙතත් අවම බලපෑමක් සහිතව මහ බැංකුව දක්වන අනුපාතයට රජයේ දේශීය ණය ප්‍රශස්ථකරණ (DDO) වැඩසටහන යටතේ ශ්‍රී ලංකා රුපියල නම් කරන ලද විචල්‍ය කූපන් බැඳුම්කර සමඟ පවත්නා ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර හුවමාරු කර ගැනීම.
- ද්‍රවශීලතා අරමුදල් අවදානම සහ ණය ගැනීම සම්බන්ධ පිරිවැය වැඩි වීම.

ජාතික ඉතිරිකිරීමේ බැංකුව 1971 අංක 30 දරන NSB පනත යටතේ සංස්ථාපිත කර ඇති රජයට අයත් බලපත්‍රලාභී විශේෂිත බැංකුවකි. (LSB) තැන්පත්කරුවන් විසින් කරන ලද නීත්‍යානුකූල ඉල්ලීම් ගෙවීමට බැංකුවේ වත්කම් ප්‍රමාණවත් නොවේ නම්, ඒකාබද්ධ අරමුදලක් මත අයකිරීමක් මගින් බැංකුව සමඟ සිදුකරන තැන්පත් සහ ඒවායේ පොලිය ශ්‍රී ලංකා රජය විසින් 100%ක් සහතික කර ඇත. පනතේ අර්ථ දක්වා ඇති කාර්යයන් හේතුවෙන් තරඟකාරිත්වය පිළිබඳ ආවේනික සීමාවන් තිබුණද, ආපදාවන් අවම කර ගැනීමට අභියෝගාත්මක කාල පරිච්ඡේදය තුළ රාජ්‍ය අනුග්‍රහය අතිරේක ශක්තියක් විය.

බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් හේතුවෙන් මහ බැංකුවේ සම්මත ණය දීමේ පහසුකම සඳහා ප්‍රවේශය නොමැති අවස්ථාවක, ඍණාත්මක වෙළෙඳපොළ ද්‍රවශීලතා තත්ත්වයෙන් මතු වූ ද්‍රවශීල අවදානම් මහ බැංකුව විසින් පිරිනමනු ලබන මූල්‍ය පහසුකම් උපයෝගී කර ගනිමින් ඵලදායී ලෙස කළමනාකරණය කරන ලදී.



රූපය 30 →

Bow-tie විශ්ලේෂණය-අභියෝගාත්මක පරිසරයක අවදානම් කළමනාකරණය

අවදානම් සමාලෝචනය

අහිතකර ප්‍රතිවිපාක මධ්‍යයේ වුවද, ආර්ථික අර්බුදයෙන් උපලබ්ධි වූ අහිතකර ප්‍රතිවිපාකවල අවදානම කළමනාකරණය කිරීම සඳහා වැලැක්වීමේ සහ ප්‍රතිසාධන ක්‍රියාමාර්ග ඵලදායී ලෙස භාවිත කිරීම තුළින් සැලකිය යුතු අතිරික්තයක් සමඟ නියාමන නුබුන්වත් අවශ්‍යතාවන්ට බැංකුව ඔරෙත්තු දී අනුකූල විය. ඉදිරියේදී සාකච්ඡා කරන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුවේ (IRMF) දක්වා ඇති දැඩි අවදානම් කළමනාකරණ හැකියාවන් සමඟ මෙය කළ හැකි විය.

ශක්තිමත් අවදානම් කළමනාකරණ සංස්කෘතියක් පවත්වා ගැනීම සඳහා ඵලදායී අවදානම් කළමනාකරණ ව්‍යවහාර ඇතුළත් කිරීමේ අරමුණින් ව්‍යාපාරයට සහාය වන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කාර්යරාමුව (IRMF) අනුකූලව මෙවැනි අවදානම් හඳුනාගෙන පාලනය කරනු ලැබේ. බැංකුව එහි අවදානම් හඳුනාගෙන කළමනාකරණය කරන ආකාරය ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කාර්යරාමුව (IRMF) මගින් පාලනය කරයි.

අවදානම් අභිරුචිය

අවදානම් අභිරුචිය මඟින් විවිධ මට්ටමේ මූල්‍ය හා මෙහෙයුම් පීඩනයන් සැලකිල්ලට ගනිමින් විවිධ අවදානම් වර්ග හරහා බැංකුව පිළිගැනීමට සූදානම් වන අවදානම් මට්ටම නිර්වචනය කරයි. IRMF හි, අවදානම් අභිරුචි රාමුව ක්‍රියාත්මක කිරීම කාලෝචිත පාලනය සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග සඳහා අවදානම් හඳුනා ගැනීම, මැනීම සහ නියාමනයට කිරීම සඳහා පහසුකම් සපයයි.

බැංකුවේ අවදානම් අභිරුචි ප්‍රකාශය ව්‍යාපාරික මෙහෙයුම් සහ අවදානම් පෙළගස්වමින් වටිනාකම වැඩි කරයි. එය පිළිගත හැකි අවදානම් මට්ටම් තුළ රැඳී සිටින අතරම, උපකල්පනය කළ අවදානම සඳහා සුදුසු ප්‍රතිලාභ ශේෂයක් ලබාදීම සඳහා ව්‍යාපාරික කටයුතු සැලසුම් කිරීමට මාර්ගෝපදේශයක් ලෙස ක්‍රියා කරයි.

වටිනාකම් සහ මූල්‍ය තත්ත්වය කෙරෙහි අහිතකර බලපෑම් නියාමනය කිරීමේදී භාවිත කරන ගුණාත්මක හා ප්‍රමාණාත්මක පරාමිතීන් භාවිත කරමින් ආයතනික මට්ටමේදී අවදානම් අභිරුචිය සැකසීමේදී බැංකුව ඉහළ සිට පහළට ප්‍රවේශයක් භාවිත කරයි.

අවධානිත ක්ෂේත්‍රය	දර්ශකය	2023 – සැබෑ ප්‍රතිඵලය	අවදානම් අභිරුචියට අනුව කාර්යසාධනය
ලාභදායිතාව	ශුද්ධ පොලී ආන්තිකය	1.79	✓
	ස්කන්ධය මත ඉපයීම	9.36	✓
	වත්කම් මත ඉපයීම	0.26	✓
ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව	CET 1	15.33	✓
	Tier 1	16.91	✓
	මුළු ප්‍රාග්ධනය	19.26	✓
ද්‍රවශීලතාව	LCR (රු)	299.20	✓
	SLAR	54.99	✓
	NSFR	180.49	✓
උත්තෝලනය	උත්තෝලන අනුපාතය	6.22	✓

අවදානම් මට්ටම්

✓ අවදානම් අභිරුචි සීමාව තුළ
✓ උපරිම දරාගැනීමේ සීමාව තුළ
✓ උපරිම දරාගැනීමේ සීමාවට පහළ

වගුව 23 → අවදානම් අභිරුචි මට්ටම් අනුව මූල්‍ය දර්ශක

2023 මුදල් වර්ෂය සඳහා, 2023 වර්ෂය තුළ පැවති ආර්ථික තත්ත්වයන් තුළ ද්‍රවශීලතා දෘෂ්ටිකෝණයකින් නුබුන්වත්භාවය ආරක්ෂා කර ගැනීම සඳහා කෙටි කාලීන ලාභදායීතා පරමාර්ථය අත්හැරීමට සිදු විය. ද්‍රවශීලතා සහ උත්තෝලන අනුපාත අඩු අවදානම් මට්ටමක් පෙන්නුම් කරයි. ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව බැංකුවේ අවදානම් අභිරුචි මට්ටමට සහ නියාමන අවම අවශ්‍යතාවන්ට වඩා බෙහෙවින් ඉහළින් පවතී.

පාලන ව්‍යූහය

අවදානම් කළමනාකරණ ව්‍යවහාරවලින් ඉහළ පාලන ප්‍රමිතියක් පිළිබිඹු කරන බව සහතික කිරීමට බැංකුව කැපවී සිටී. මෙය අවදානම ගන්නා කටයුතු ඵලදායීව සහ විචක්ෂණව භාර ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයට සහ කළමනාකරණය ශක්තිමත් කරයි.


අධ්‍යක්ෂ මණ්ඩලය අවදානම් පාලන කාර්යභාරය තුළින්, ජ්‍යෙෂ්ඨ කළමනාකරණය විවිධ අවදානම් නිරාවරණ කළමනාකරණය කිරීමට ඒකාබද්ධ රාමුවක් ස්ථාපිත කර ඇති බව සහතික කරන අතර අභ්‍යන්තර ප්‍රතිපත්ති සුදුසු පරිදි ස්ථාපිත කර ඒ සමඟ අනුකූල වන බව සහතික කරයි.

මූල්‍ය සහ මූල්‍ය නොවන සියලුම අවදානම් වර්ග බැංකුවේ අවදානම් කළමනාකරණ රාමුවට අනුකූලව කළමනාකරණය කර වාර්තා කරනු ලබයි.

බැංකුවේ අවදානම් කළමනාකරණ කාර්යයේ ප්‍රමාණවත් බව සහ ඵලදායී බව සහතික කිරීම සඳහා එහි අවදානම් සම්බන්ධ වගකීම් සහ අභ්‍යන්තර පාලන ක්‍රියාපටිපාටි ඉටු කිරීමට සහාය වීමට අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේ අවදානම් කළමනාකරණ කමිටු දෙකක්, එනම් අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණය කමිටුව (BIRMC) සහ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC) ඇත.

ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය දැනුවත් තීරණ ගැනීම සඳහා වඩා හොඳ අවබෝධයක් ලබා දෙමින් සියලුම ව්‍යාපාරික මාර්ග හරහා පවතින සහ මතුවන අවදානම්, ප්‍රවණතා සහ ගැටළු හඳුනා ගැනීම සහ අවබෝධ කර ගැනීම කෙරෙහි අවධානය යොමු කරමින් කළමනාකරණ කමිටු රාමුවක් ස්ථාපිත කිරීම මගින් මූල්‍ය සහ මූල්‍ය නොවන අවදානම් යන දෙක සම්බන්ධ පාලනයේ දැඩි බව ඉහළ නැංවීමට පියවර ගෙන ඇත.

අවදානම් සමාලෝචනය



BIRMC – අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව **BAC –** අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව
GM/CEO – සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී **ISC –** තොරතුරු ආරක්ෂක කමිටුව
ORMC – මෙහෙයුම් අවදානම් කළමනාකරණ කමිටුව **ALCO –** වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුව
CC – ණය කමිටුව **IC –** ආයෝජන කමිටුව **CRMU –** ණය අවදානම් කළමනාකරණ ඒකකය
ORMU – මෙහෙයුම් අවදානම් කළමනාකරණ ඒකකය **MRMU –** වෙළෙඳපොල අවදානම් කළමනාකරණ ඒකකය


රූපය 31 → අවදානම් කළමනාකරණ පාලන ව්‍යුහය (ක්‍රියාත්මක වාර්තාකරණය)

තෙවැදෑරුම් ආරක්ෂක මාර්ග

බැංකුවේ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කාර්ය රාමුව හි දක්වා ඇති "තෙවැදෑරුම් ආරක්ෂක මාර්ග" යනු රාජකාරි වෙන් කර තබාගැනීම මඟින් පැහැදිලි ආරක්ෂක මාර්ගයක් විදහා පෙන්වන ආදර්ශයකි. පළමු ආරක්ෂක මාර්ගය මූල්‍ය, භාණ්ඩාගාරය, මානව සම්පත්, මෙහෙයුම්, තොරතුරු තාක්ෂණය සහ සහය සේවා ඇතුළු සියලුම ආශ්‍රිත සහය කාර්යයන් සමඟ ආදායම් – උත්පාදන සහ සේවාදායක-අභිමුඛ කාර්යයන්ගෙන් සමන්විත වේ. පළමු මාර්ගය අවදානම් හඳුනාගෙන, ආවේනික අවදානම් අවම කිරීමට පාලනයන් සකස් කර ක්‍රියාත්මක කරයි. පළමු මාර්ගයේ සේවකයින්ට ඔවුන්ගේ අවදානම් සඳහා මූලික වගකීමක් ඇති අතර, ඔවුන්ගේ කටයුතු දෙවන සහ තෙවැනි මාර්ගවල අදාළ කොටස්වලින් පාලනයට යටත් වේ

දෙවන ආරක්ෂක මාර්ගය අවදානම් කළමනාකරණ අංශයෙන් (RMD සහ අනුකූලතා අංශයෙන් සැදී ඇති අතර, අවදානම් නියාමනය සහ කළමනාකරණ මෙවලම් භාවිතයෙන් පළමු මාර්ගය පාලනය කරයි.

ප්‍රධාන අවදානම් ක්ෂේත්‍ර කළමනාකරණය කිරීම සඳහා අවදානම් කළමනාකරණ අංශය ප්‍රධාන ඒකක තුනකින් සමන්විත වේ, ඒවානම් ණය අවදානම් කළමනාකරණ ඒකකය (CRMU), භාණ්ඩාගාර මධ්‍යම කාර්යාලය (TMO)/වෙළෙඳපොල අවදානම් කළමනාකරණ ඒකකය (MRMU) සහ මෙහෙයුම් අවදානම් කළමනාකරණ ඒකකය (ORMU).



රූපය 32 → ත්‍රිවිධාකාර ආරක්ෂක මාර්ග

අවදානම් සමාලෝචනය

තෙවැනි ආරක්ෂක මාර්ගය අභ්‍යන්තර විගණන අංශයෙන් (IAD) සමන්විත වන අතර, එය පවත්නා, පද්ධතිමය සහ වෙනස්වන වන අවදානම් පාලනය, අවදානම් කළමනාකරණය සහ පාලනයේ ඵලදායිත්වය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයට ස්වාධීන සහතිකයක් ලබා දෙයි.

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය මගින් ප්‍රධාන අවදානම් ක්ෂේත්‍ර, අවදානම් කළමනාකරණ ප්‍රවේශයන් සහ වාර්තා කිරීමේ අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීමට වෙනම ප්‍රතිපත්ති සමඟින් බැංකුවේ ඔසෘඒත විස්තර කරයි.

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ යනු බැංකු අතර දෘෂ්ටිකෝණයක් මත අවදානම් අවබෝධ කර ගැනීම, කළමනාකරණය කිරීම සහ සන්නිවේදනය කිරීම සඳහා අඛණ්ඩ, සක්‍රීය, සහ ක්‍රමානුකූල ක්‍රියාවලියකි. එය සෑම මට්ටමකදීම බැංකුවේ විසහැකි අවදානම් හඳුනා ගැනීමට අඛණ්ඩ තක්සේරු කිරීමකින් සමන්විත වන අතර පසුව දැනුවත් තීරණ ගැනීම සඳහා පහසුව සැලසීමට වඩා ඉහළ මට්ටමට ප්‍රතිඵල සන්නිවේදනය කරයි

අවදානම් කළමනාකරණය බහුවිධ ක්‍රියාවලි, ආකෘති සහ මෙවලම් වලින් සමන්විත වන අතර, එය අවදානම් මත පදනම් වූ තීරණ ගැනීම සඳහා සහයවීම සහ මහ බැංකුව විසින් නියම කර ඇති ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව සහ අනෙකුත් විවක්ෂණ අවශ්‍යතා තක්සේරු කිරීම සඳහා බැංකුව තුළ අවදානම් හඳුනා ගැනීම, තක්සේරු කිරීම, නියාමනය සහ අවම කිරීමේ ක්‍රියාවලියේදී භාවිතා කරනු ලබයි.

අවදානම් කළමනාකරණය	ණය අවදානම	වෙළෙඳපොල අවදානම		මෙහෙයුම් අවදානම	
ප්‍රතිපත්ති	ඒකාබද්ධ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය	පිඩන පරීක්ෂණ ප්‍රතිපත්තිය	අවදානම් කළමනාකරණ අනාවරණ ප්‍රතිපත්තිය	ICAAP කළමනාකරණ ප්‍රතිපත්තිය	ආදර්ශ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය
	ණය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය		**වෙළෙඳපොල හා ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය**	**මෙහෙයුම් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය**	
අවදානම හඳුනා ගැනීම සහ තක්සේරු කිරීමේ ප්‍රවේශ	• අවදානම් සීමා නියාමනය • අභ්‍යන්තර ශ්‍රේණිගතකරණ ආදර්ශ • පූර්ව හඳුනාගැනීමේ දර්ශක • ක්‍රියාදාම විශ්ලේෂණ • පිඩන පරීක්ෂණය		• අවදානම් සීමා නියාමනය • අවදානමට වටිනාකම (VaR) • M – duration • සංවේදීතා විශ්ලේෂණ • ක්‍රියාදාම විශ්ලේෂණ • පිඩන පරීක්ෂණය	• අවදානම් සීමා නියාමනය • අලාභ සිදුවීම් දත්ත විශ්ලේෂණ • සිදුවීම නියාමනය • ව්‍යාපාර බලපෑම් විශ්ලේෂණ • මුල් හේතුව සහ ක්‍රියාදාම විශ්ලේෂණ • පිඩන පරීක්ෂණය • අවදානම් සහ පාලන ස්වයං තක්සේරු (RCSA) • ප්‍රධාන මෙහෙයුම් අවදානම් දර්ශක (KORIs)	
කළමනාකරණයට/ අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කිරීම	• අවදානම් අභිරුචි උපකරණ පුවරුව • පූර්ව හඳුනාගැනීම් දර්ශක • ණය අවදානම් සමාලෝචනය • ණය සමාලෝචන යාන්ත්‍රණය (LRM) පිළිබඳ වාර්තා • NPL නියාමනය සහ විශ්ලේෂණ		• අවදානම් අභිරුචි උපකරණ පුවරුව • ස්කන්ධ අවදානම් සමාලෝචනය • Fx අවදානම් සමාලෝචනය • පොලී අනුපාත අවදානම් සමාලෝචනය • රජයේ සුරැකුම්පත් කළඹ අවදානම් සමාලෝචනය • ද්‍රවශීලතා අවදානම් සමාලෝචනය	• අවදානම් අභිරුචි උපකරණ පුවරුව • අලාභ සිදුවීම් විශ්ලේෂණ • ගනුදෙනුකාර පැමිණිලි විශ්ලේෂණ • මුල් හේතුව විශ්ලේෂණ • ප්‍රධාන මෙහෙයුම් අවදානම් දර්ශක (KORIs) පුවරුව • අවදානම් සහ පාලන ස්වයං තක්සේරු (RCSA) වාර්තා	

වගුව 24 → ණය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති, ප්‍රවේශ IRMF තුළ වාර්තා

අවදානම් සමාලෝචනය

බැංකුවේ අවධානම් ලේඛනය තුල පවත්නා සහ අනාගත අවදානම් පිළිබඳ තොරතුරු ඇතුළත්ය. අවදානම් ලේඛනය අවදානම් කළමනාකරණ අංශය විසින් අවදානම් හඳුනාගැනීමේ සහ තක්සේරු කිරීමේ මෙවලම්/ආකෘති භාවිතා කරමින් නිරන්තරයෙන් යාවත්කරනු ලබයි. ඒ අනුව, ප්‍රධාන අවධානම් 4 ක් ඇත. මෙම ප්‍රධාන අවධානම් වන්නේ ණය අවදානම, වෙළඳපොල අවදානම, (එනම් කොටස්, විදේශ විනිමය, සහ පොළී අනුපාත) මෙහෙයුම් අවදානම සහ ද්‍රවශීලතා අවදානමයි.

අවදානම් කළමනාකරණය සම්බන්ධව වාර්ෂිකව ඉහළ කළමනාකරණයට හා අධ්‍යක්ෂක මණ්ඩල අනු කමිටු වලට වාර්තා කරනු ලබන අතර එහිදී ප්‍රධාන අවදානම් සහ අනිකුත් සියළුම පවත්නා සහ හදිසි අවදානම් සාකච්ඡා කරයි. 2023 දී ප්‍රධාන අභියෝග සහ සමාලෝචිත කාලසීමාව තුල ප්‍රධාන අවදානම් කළමනාකරණය කළ ආකාරය පිළිබඳ විස්තර මින්මතු සාකච්ඡා කෙරේ.

ණය අවදානම


ණය අවදානම යනු ණයකරුවෙක් හෝ ඇපකරුවෙක් ඔහුගේ මූල්‍ය හෝ ගිවිසුම්ගත බැඳීම් සපුරාලීමට අසමත්වීම හේතු කොට ගෙන ඇතිවන අනාගත අලාභ පිළිබඳ අවදානමයි. මෙම නිරාවරණයන් ප්‍රධාන වශයෙන් සෘජු ණයදීමේ කටයුතු මෙන්ම සහ බැඳීම් සහ අවිනිශ්චිතතාවලින් ව්‍යුත්පන්න වේ.

බැංකුවට ණය අවදානම ප්‍රධාන වශයෙන් ඇපකරුවන්ගේ පැහැරහැරීමේ අවදානම, සංකේන්ද්‍රණ අවදානම සහ නිරවුල් කිරීමේ අවදානම සමන්විත වේ.

ශේෂ පත්‍රයේ නිරාවරණ බැංකුවේ මුළු ණය අවදානම් නිරාවරණයෙන් 99.5%ක් නියෝජනය කරයි.

ණය නිරාවරණය: නිෂ්පාදනය/උපකරණය අනුව


ප්‍රස්ථාරය 57



බැංකුවේ ණය කළඹ ප්‍රධාන වශයෙන් පාරිභෝගික ණය දෙන නිෂ්පාදන වලින් සමන්විත වේ. පාරිභෝගික ණය කළඹේ 53.0% ක ඉහළම සංයුතිය නියෝජනය කරන අතර ණය ආයතනික ණය කළඹ ප්‍රධාන වශයෙන් භාණ්ඩාගාර ඇපවලින් සුරක්ෂිත ණය සහ ණය උපකරණ ආකාරයෙන් රජයට සහ රජයට අයත් ව්‍යවසාය වෙත දෙනු ලබන නිරාවරණයන්ගෙන් (92%) සමන්විත වෙයි.

ණය නිරාවරණ: ඇප අනුව

ප්‍රස්ථාරය 58



දෙසැම්බර් 31 දිනට	2023 උපරිම ණය අවදානම් නිරාවරණය			2022 උපරිම ණය අවදානම් නිරාවරණය			වෙනස
	දළ ධාරණ වටිනාකම රු. 000	ණය හානිකරණය රු. 000	ශුද්ධ නිරාවරණය රු. 000	දළ ධාරණ වටිනාකම රු. 000	ණය හානිකරණය රු. 000	ශුද්ධ නිරාවරණය රු. 000	%
උපරිම ණය අවදානම් නිරාවරණය	**1,613,180,178**	**22,386,638**	**1,590,793,540**	1,564,530,168	18,173,578	1,546,356,590	2.87
ශේෂ පත්‍රය මත නිරාවරණය (දළ පදනම)	**1,604,618,000**	**22,386,638**	**1,582,231,362**	1,551,632,118	18,173,578	1,533,458,540	3.18
ශේෂ පත්‍රයෙන් බාහිර නිරාවරණය	**8,562,178**	**–**	**8,562,178**	12,898,050	–	12,898,050	-33.62
ප්‍රධාන ණය අවදානම් නිරාවරණය ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම්							
– ණය සහ අත්තිකාරම්	**548,897,902**	**22,377,372**	**526,520,530**	570,255,736	17,228,415	553,027,321	-4.79
– ණය සහ වෙනත් උපකරණ	**943,705,329**	**645**	**943,704,684**	920,068,906	939,528	919,129,378	2.67
වෙනත් විස්තීරණ ආදායම් ඔස්සේ සාධාරණ වටිනාකම් මත තක්සේරු කරන ලද මූල්‍ය වත්කම් වේ.	**61,924,412**	**–**	**61,924,412**	27,662,763	–	27,662,763	123.85

වගුව 25 → උපරිම ණය අවදානම් නිරාවරණය

අවදානම් සමාලෝචනය

අවදානම් සංරචකය	අවදානම් කළමනාකරණ ප්‍රවේශය	ආවේනික අවදානම් මට්ටම	බලපෑම
ණය අවදානම	• අවදානම් තක්සේරු සමඟ ණය ඇගයීම් • අවදානම් ශ්‍රේණිගතකරණය • ණය අනුමැතිය සඳහා පවරන ලද බලතල • සුරැකුම්කරණය • LTV අනුපාත ඇගයීම/ප්‍රත්‍යාගණනය සහ නියාමනය • සීමා අනුව නියාමනය • පූර්ව අනතුරු ඇඟවීමේ දර්ශක, අක්‍රිය ණයවල ප්‍රවනතා නියාමනය • ස්වාධීන ණය සමාලෝචනය/ගනුදෙනු හා කළඹ මට්ටමේදී නියාමනය • පශ්චාත් ණය ප්‍රදාන සමාලෝචන/ණය සමාලෝචන යන්ත්‍රණය • ආතති පරීක්ෂාව • හානිකරණ වෙන්කිරීම • අඛණ්ඩ පුහුණුව හා සංවර්ධනය	ඉහළ	↑
සංකේන්ද්‍රණ අවදානම	• සීමා නියාමනය: නිරාවරණ සීමා, සංකේන්ද්‍රණ සීමා – (හර්ෆින්ඩාල් හර්ෂ්මාන් දර්ශකය (HHI) • ආතති පරීක්ෂාව	ඉහළ	↑
හරස් මායිම් අවදානම	• සුරැකුම්කරණය • සීමා නියාමනය • ආතති පරීක්ෂාව	පහළ	→

*ඉපයීම් සහ ප්‍රාග්ධනය කෙරෙහි බලපෑමෙහි වාර්ෂික වෙනස

බලපෑමෙහි වැඩිවීම ↑ වෙනසක් නැත → බලපෑමෙහි අඩුවීම ↓

වගුව 26 → ණය අවදානම් සමාලෝචනය

ණය කළඹ තුළ ගුණාත්මකභාවය


දළ අක්‍රීය ණය අනුපාතය මඟින් ගනුදෙනුකරුවන්ගේ ගිවිසුම්ගත ණය ගෙවීම් ප්‍රමාද වීමට ලක්ව ඇති ගනුදෙනුකරුවන්ගේ කොටස පෙන්නුම් කරයි. පසුගිය කාලය පුරාවට නිවාස හා දේපල ණය සහ පුද්ගලික ණය යන දෙඅංශයෙන්ම ඉහළ උද්ධමනය, ඉහළ පොලී අනුපාත වැනි අහිතකර සාර්ව ආර්ථික මූලධර්ම මඟින් ඇතිකළ වැඩිවන ප්‍රවණතාවක් පෙන්නුම් කරයි. කෙසේ වෙතත්, උකස් කළඹෙහි දළ අක්‍රීය ණය අනුපාතය පසුගිය වසරට සාපේක්ෂව පහත වැටී ඇත.

2023 වසර තුළ, ණය-හානිකරණ (අදියර 3) ණය සහ අත්තිකාරම් රු.බි. 27.1 ක් විය. (2022 ද රු බි 25.5) ණය කළඹ තුළ ගුණාත්මකභාවය පිරිහීම රු බි 5.4 හානිකරණ අයකිරීමට හේතු වූ අතර (2022 දී රු බි 5.3) එය මුළු ණය හානිකරණ වෙන්කිරීම රු.බි. 22.4 දක්වාද වසර අවසාන අදියර 3 වෙන්කිරීම 2023 වසරේ ආවරණය වූ 53.3% එරෙහිව 38.9% දක්වාද ඉහළ නැංවීමට හේතු විය.

බැංකුවේ අදියර 3 හානිකරණ ණය අනුපාත 2022 දී පැවති 2.8%ට සාපේක්ෂව 2023 දෙසැම්බර් 31 දිනට 2.4කි. කෙසේවෙතත්, එය ක්ෂේත්‍රයේ අනුපාතය වන 12.7%ට වඩා සැලකියයුතු ලෙස පහළ අගයකි.


දළ ණය හා අත්තිකාරම්

ප්‍රස්ථාරය 59



අදියර 3 ණය

ප්‍රස්ථාරය 60



අවදානම් සමාලෝචනය

වසර	අදියර 3 ණය හා අත්තිකාරම් රු. '000	පුද්ගල හානිකරණය සඳහා දීමනාව රු. '000	සාමූහික හානිකරණය සඳහා දීමනාව රු. '000	අපේක්ෂිත ණය අලාභ දීමනාව රු. '000
2022	25,100,000	2,115,825	7,797,610	9,913,435
2023	**27,120,378**	**4,062,127**	**10,386,780**	**14,448,907**

වගුව 27 → අදියර 3 හානිකරණය වූ ණය හා අත්තිකාරම්වල ව්‍යාප්තිය

සංකේන්ද්‍රණ අවදානම

බැංකුවේ අවදානම් අභිරුචි ප්‍රකාශය මගින් සංකේන්ද්‍රණය සඳහා සීමා පෙන්වා දෙන අතර ණය වාර්තාකරණය සඳහා නිරන්තර පදනමක් මත සීමාවලට අනුව ණය නිරාවරණය නියාමනය කරයි.


සංකේන්ද්‍රණ අවදානම තක්සේරු කර නියාමනය කිරීමට බැංකුව හර්ෆින්ඩාල් හර්ෂ්මාන් දර්ශකය (HHI) සහ ආතති පරීක්ෂාව භාවිතා කරයි. ආංශික සංකේන්ද්‍රණය සඳහා බැංකුවට මධ්‍යස්ථ අවදානම් අභිරුචියක් ඇත.

මහා පරිමාණ ණය බැංකුවේ ප්‍රධාන කාර්යාලයේ ණය අංශය මඟින් ලබාදීම හේතුවෙන් බස්නාහිර පළාත වෙත ඉහළ භූගෝලීය සංකේන්ද්‍රයක් පවතී.




අංශයේ සංකේන්ද්‍රණය

ප්‍රස්ථාරය 61



භූගෝලීය සංකේන්ද්‍රණය

ප්‍රස්ථාරය 62



අවදානම් සමාලෝචනය

හරස් මායිම් ණය අවදානම

විදේශීය බැංකු සමඟ තැන්පතු, ණය පහසුකම් සහ ලේඛණගත ණයවලින් ඇති වූ බැංකුවේ හරස් මායිම් නිරාවරණය මුළු වත්කම්වලින් 0.41% කට සීමාවිය.

ණය සහ ආයෝජන කළඹ මුළු වත්කම්වලින් 40.5%කට දායක වන බැවින් සහ ණය අවදානම බරතබන වත්කම් මුළු අවදානම-බර තබන ලද වත්කම්වලින් 80.2%කට දායක වන බැවින් ණය අවදානම විචක්ෂණ ආකාරයෙන් කළමනාකරණය කිරීම බැංකුවේ තිරසාරභාවයට තීරණාත්මකව වැදගත් වේ.

ණය අවදානම අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත ණය අවදානම් කළමනාකරණ රාමුව මඟින් නියාමනය කරන අතර, එයට අවදානම් පාලන ව්‍යුහයක් මෙන්ම අවදානම් කළමනාකරණ ක්‍රියාපටිපාටි රාමුවක්ද ඇතුළත්ය.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්ථාපිත ණය ප්‍රතිපත්ති සහ ක්‍රියාත්මක ක්ෂේත්‍රවල නිලධාරීන් අතර රාජකාරි බෙදා හැරීමට ස්ථාපිත කරන ක්‍රියාපටිපාටි ණය ක්‍රියාවලියේ ප්‍රධාන අවස්ථා තුන ඇතුළත් කරමින් ව්‍යාපාර මාර්ග මට්ටමේ දී ණය අවදානම් කළමනාකරණයට සහය වේ.

ණය ප්‍රතිපත්ති නිරන්තර පදනමක් මත සමාලෝචනය කරන අතර අවශ්‍ය ණය අභිරුචිය සහ ණය සීමා පවත්නා සහ අපේක්ෂිත වෙළෙඳපොල තත්ත්වයන් මත පදනම් වී තීරණය කෙරේ.

ආර්ථිකය, පරිසරය, සමාජය සහ කර්මාන්තවලට අදාළ සාධක ඇතුළුව පාරිභෝගික විශේෂිත, අභ්‍යන්තර සහ බාහිර සාධක සැලකිල්ලට ගනිමින් අවදානම් කළමනාකරණ අංශයේ ණය අවදානම් කළමනාකරණ ඒකකය මඟින් ගනුදෙනු සහ කළඹ මට්ටමින් ස්වාධීන අවදානම් විශ්ලේෂණය සහ නියාමනය හරහා ණය අවදානම නියාමනය කරයි.

ගනුදෙනු මට්ටමේදී ණය නිරාවරණ මත ස්වාධීන අවදානම් තක්සේරු සහ ශ්‍රේණිගතකරණ වලංගුතාවන් පවත්වනු ලබයි.

ණය අවදානම් කළමනාකරණය සඳහා වැලැක්වීමේ සහ නිවැරදි කිරීමේ ක්‍රියා සඳහා අවදානම් වාර්තාකරණය සහ දැනුවත්කමට පූර්ව අනතුරු ඇඟවීමේ දර්ශක, ණය කළඹ සමාලෝචන, ආතති පරීක්ෂාව සහ ක්‍රියාදාම විශ්ලේෂණ මඟින් පහසුකම් ඇති කරයි.

ණය අවදානම් කළමනාකරණ ඒකකය නිරන්තර පදනමත් මත පවත්වනු ලබන ණය හා සම්බන්ධ නිෂ්පාදන හා ක්‍රියාවලි සඳහා අවදානම් සහ පාලන ස්වයං-තක්සේරු කිරීමේ (RCSA) ප්‍රතිඵල මත පදනම් වී විචක්ෂණ ක්‍රියාවලි සහ පාලන වෙනස්කම් නිර්දේශ කරයි. ණය ලබාදීම සහ ලේඛනගත කිරීමේ ක්‍රියාවලිය තුළ පරතර කඩිනම්ව හඳුනා ගැනීම සහ නිවැරදි කිරීම මඟින් ණය අවදානම අවම කිරීමට බැංකුව ණය සමාලෝචන යාන්ත්‍රණය (LRM) භාවිතා කරයි. මාස තුනක අනුමැතිය තුළ අභ්‍යන්තර සීමාවන්ට ඉහළ ආයතනික සහ පාරිභෝගික ණයවල නියැදියක් සමාලෝචනය කරමින් ප්‍රධාන කාර්යාලය සහ ශාඛාවල ණය මෙහෙයුම් මින් ආවරණය කෙරේ.

වෙළෙඳපොළ අවදානම

වෙළෙඳපොළ අවදානම යනු ආයතනයට නිරාවරණයක් ඇති වෙළෙඳපොළ තුළ වෙනස්වීම්වලින් ඇතිවන අවදානමයි. අනාගත අපේක්ෂිත මුදල් ප්‍රවාහ, ඉපැයීම් සහ ප්‍රාග්ධන මට්ටම්වලට අහිතකර ලෙස වෙනස් කරන පොලී අනුපාත, විනිමය හුවමාරු අනුපාත කොටස් මිල සහ වෙළෙඳ ද්‍රව්‍යවල මිල ගණන් වැනි වෙළෙඳපොළ විචල්‍යතාවන් හි අහිතකර විතැන්වීමෙන් විය හැකි අලාභ ඇති වේ.

වෙළෙඳපොළ අවදානම බැංකුවේ නිරාවරණය වෙළෙඳ කළඹ හා වෙළෙඳ නොවන කළඹ තුළින් ඇති වේ.

මුළු වෙළෙඳපොළ ණය නිරාවරණය 2023 වසර අවසානයට මුළු වත්කම්වලින් 93.8% කට දායක විය. බොහෝ මූල්‍ය වත්කම් පොලී අනුපාත අවදානමට නිරාවරණය වන අතර එය මුළු වත්කම් වලින් 93.2%කට දායක වේ. විදේශ විනිමය අවදානම සඳහා විවෘත නිරාවරණය මුළු වත්කම්වලින් 1.9%ක් වන අතර, ස්කන්ධ මිල අවදානම සඳහා 0.2%ක් නිරාවරණය වේ.

ණය උත්පාදනය
- ණය ඇගයීම හා ශ්‍රේණිගතකරණය
- සුරැකුම්කරණය
- නීතිමය පරීක්ෂාවන්
- පරීක්ෂාව හා ඇගයීම
- බෙදාහැරි බලතල ව්‍යුහය යටතේ ණය අනුමැතිය

ලේඛණගත කිරීම සහ ණය ලබාදීම
- ලේඛනවල හරිවැරදි බැලීම
- ණය ගිවිසුම
- නියමයන් හා කොන්දේසි
- උකස් බැඳුම්කර
- රක්ෂණය (හිමිකම්/ගිනි රක්ෂණය/DTA)
- ණය බෙදාහැරීම
- ණය සමාලෝචන යාන්ත්‍රණය (LRM)

පශ්චාත් ණය බෙදාහැරීම් කළමනාකරණය
- ණය අයකිරීම හා නියාමනය
- පශ්චාත් බෙදාහැරීම් නියාමනය
- අයකිරීම්

රූපය 33 ණය අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය

අවදානම් සමාලෝචනය

2023 දෙසැම්බර් 31 දිනට	මූල්‍ය ප්‍රකාශනය පරිදි ප්‍රමාණය	වෙළෙඳ අවදානමට නිරාවරණය	වෙළෙඳ නොවන අවදානමට නිරාවරණය	වෙළෙඳපොල අවදානම් වර්ගය
	රු. '000	රු. '000	රු. '000	
මූල්‍ය වත්කම්				
මුදල් හා මුදලට සමාන දෑ	9,508,563		9,508,563	IRR, FX
මහ බැංකුව සමඟ ශේෂ	246,998		246,998	IRR
බැංකු සමඟ තැන්පතු	22,576,750		22,576,750	IRR, FX
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	924		924	IRR, FX
සාධාරණ අගයට මනින ලද මූල්‍ය වත්කම්	17,748,501	17,748,501		IRR, Equity
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් – ණය සහ ලැබිය යුතු	526,520,529		526,520,529	IRR, FX
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් – ණය සහ අනෙකුත් උපකරණ	943,704,684		943,704,684	IRR
අනෙකුත් විස්තීරණාත්මක ආදායම තුළින් සාධාරණ අගයට මනින ලද මූල්‍ය වත්කම්	61,924,412		61,924,412	IRR, Equity
එකතුව	1,582,231,361	17,748,501	1,564,482,860	
මූල්‍ය වගකීම්				
බැංකුවලට ගෙවිය යුතු	8,984,779		8,984,779	IRR, FX
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	201		201	IRR, FX
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වගකීම් – තැන්පත්කරුවන්ට ගෙවියයුතු	1,482,532,430		1,482,532,430	IRR, FX
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වගකීම් – ණයකරුවන්ට ගෙවියයුතු	61,611,014		61,611,014	IRR
කල්බදු වගකීම	1,365,547		1,365,547	IRR
නිකුත්කළ ණය සුරැකුම්පත්	23,806,514		23,806,514	IRR
එකතුව	1,578,300,484	–	1,578,300,484	

වගුව 28 → වෙළෙඳපොල අවදානම් නිරාවරණ

අවදානම් සංරචකය	අවදානම් කළමනාකරණ ප්‍රවේශය	ආවේනික අවදානම් මට්ටම	බලපෑම
ප්‍රතිමිලකරණ අවදානම	• ප්‍රතිමිලකරණ පරතර සීමා නියාමනය • අනුපාත සංවේදී වත්කම් සහ අනුපාත සංවේදී වගකීම් මත සීමා	ඉහළ	↑
ආදායම් චක්‍ර අවදානම	• සංවේදීතාවය/අනුපාත කම්පන සමග ආතති පරීක්ෂාව • කළඹේ ආදායම, කලාය, සහ කාලසීමා පරතර කියාමනය • අලාභ සීමා නැවැත්වීම	ඉහළ	↑
පදනම් අවදානම	• අනුපාත සංවේදී වත්කම් සහ අනුපාත සංවේදී වගකීම් පරතර මත අනුපාත කම්පනවල සංවේදීතාව	ඉහළ	→
විදේශ විනිමය අවදානම	• අවදානමේදී විදේශ විනිමය වටිනාකම • ආතති පරීක්ෂණය • හුවමාරු අනුපාත වෙනස්වීම් • සීමානියාමනය	මධ්‍යම	↑
ස්කන්ධ මිල අවදානම	• සීමා නියාමනය හා ආතති පරීක්ෂාව • අවදානමේදී සම කොටස් වටිනාකම • දෛනික පදනමක් මත FVPL සහ FVOCI කළඹ වෙළඳපොල අගය මත ලකුණු කිරීම	මධ්‍යම	↓
වෙළෙඳ භාණ්ඩ මිල අවදානම	• උකස්කර මත LTV නියාමනය • රත්‍රන් මිල පරීක්ෂාව	පහළ	→

*ඉපයීම් හා ප්‍රාග්ධනය මත බලපෑමෙහි වාර්ෂික වෙනස්කම්

බලපෑමෙහි වැඩිවීම ↑ වෙනසක් නැත → බලපෑමෙහි අඩුවීම ↓

වගුව 29 → වෙළෙඳපොල අවදානම් සමාලෝචනය

අවදානම් සමාලෝචනය

පොළී අනුපාත අවදානම

බැංකු කළඹ තුළ පොළී අනුපාත අවදානම

කළඹ වර්ගය	2023		2022	
	පොත් අගය රු. '000	සාධාරණ අගය රු. '000	පොත් අගය රු. '000	සාධාරණ අගය රු. '000
FVPL කළඹ	**16,445,943**	**16,923,123**	13,505,097	12,217,110
FVOCI කළඹ	**56,102,160**	**58,894,209**	25,050,275	25,348,941
එකතුව	**72,548,103**	**75,817,332**	38,555,372	37,566,051

වගුව 30 → රජයේ සුරැකුම්පත් FVPL සහ FVOCI කොටස්

වෙළෙඳ පොතෙහි ඇතිවන පොළී අනුපාත අවදානම, බැංකුවේ අනුපාත සංවේදී ආයෝජන තුල ඇති ලාභ අලාභ තුලින් සාධාරණ අගයේ (FVPL) ආයෝජන කළඹ මගින් ඇති වේ. වෙළෙඳ හා FVOCI කළඹ තුළ බැංකුවේ අනුපාත සංවේදී ආයෝජනය වසර අවසානයේදී රජයේ සුරැකුම්පත්වල මුළු ආයෝජනයෙන් 8.6%ක් විය. රජයේ සුරැකුම්පත් කළඹ විකිණීමෙන් පොළී අනුපාත අවදානම පූර්ව නිශ්චිත අභිරුචි සීමා, උපලබ්ධි නොවූ ලාභ/අලාභ සහ වෙළෙඳ කළඹ තුළ දරන සුරැකුම්පත්වල කාලය මත පදනම් වී ගණනය කළ ප්‍රාග්ධන අවශ්‍යතා අනුව M-duration නියාමනය තුළින් තක්සේරු කෙරේ.

පොළී අනුපාත අවදානමට බැංකුවේ නිරාවරණය වීම, වෙළෙඳපොළ පොළී අනුපාතවල ශුද්ධ පොළී ආදායම ආන්තික උච්චාවචනයන් මගින් බලපෑමට ලක්වීමේ ප්‍රතිඵලයක් ලෙස ඇති වේ. මෙය පාදක පොළී උපයන වත්කම්, පොළී දරන වගකීම් සහ ශේෂ පත්‍රයෙන් බැහැර අයිතම කෙරෙහි විභව බලපෑමක් ඇති කරයි. පොළී අනුපාත අවදානම් වෙත බැංකුවේ නිරාවරණය ප්‍රති මිලකරණ අවදානම, ඵලදා වක්‍ර අවදානම සහ පදනම් අවදානම යන ආකාරයෙන් හඳුනාගත හැකිය.

අහිතකර පොළී අනුපාත විතැන්වීම් බැංකුවේ ප්‍රාග්ධනය සහ ඉපයීම් කෙරෙහි බලපායි. වෙළෙඳ නොවන වත්කම් සහ වගකීම්වල කාල ව්‍යුහය සහ උපකරණ මිලකරණය කරන පදනම මත පොළී අනුපාත දර්ශකවල වෙනස තුළින් මෙවැනි ආකාරයේ පොළී අනුපාත අවදානම් ඇතිවේ. IRRBB, නිසි පරිදි කළමනාකරණය නොකළේනම්, බැංකුවේ ප්‍රාග්ධන පදනමට සහ අනාගත ඉපයීම් කෙරෙහි සැලකියයුතු අහිතකර බලපෑමක් ඇති කරයි.

බැංකු කළඹ තුළ පොළී අනුපාත අවදානම (IRRBB)


	<1 මාස	1-3 මාස	3-6 මාස	6-12 මාස	1-3 වසර	3-5 වසර	>5 වසර
අනුපාත සංවේදී වත්කම් (රු.මිලියන)	73,179	63,445	131,117	211,711	379,772	319,652	375,587
අනුපාත සංවේදී වගකීම් (රු.මිලියන)	267,726	522,503	377,057	323,222	44,804	24,169	17,453
කාල පරතරය (අනුපාත සංවේදී වත්කම්-අනුපාත සංවේදී වගකීම්) – (රු.මිලියන)	(194,547)	(459,058)	(245,940)	(111,511)	334,968	295,483	358,134
සමුච්චිත පරතරය – (රු.මිලියනග)	(194,547)	(653,606)	(899,546)	(1,011,056)	(676,088)	(380,605)	(22,471)
තත්‍ය පරතරය අනුපාත සංවේදී වගකීම් වල ප්‍රතිශතයක් ලෙස – 2023(%)	**-72.7**	**-87.9**	**-65.2**	**-34.5**	**747.6**	**1,222.6**	**2,052.0**
තත්‍ය පරතරය අනුපාත සංවේදී වගකීම් වල ප්‍රතිශතයක් ලෙස – 2022 (%)	-79.7	-88.2	-82.3	-46.3	1105.2	1,218.9	5,110.8

වගුව 31 → පොළී අනුපාත සංවේදී පරතරය – බැංකු කළඹ

අවදානම් සමාලෝචනය

රජයේ සුරැකුම්පත්වල ආයෝජනය

පිටුව 63




බැංකුව මූලික වශයෙන් පොළී අනුපාත ප්‍රතිමිලකරණ පරතරය පිළිබඳ විශ්ලේෂණයක් මගින් පොළී අනුපාත අවදානම තක්සේරු කරන අතර ඉන් අති විශේෂ අනුපාත කම්පනවලින් ඉපයීම් සහ ප්‍රාග්ධනයට අහිතකරතා පෙන්වා දී ඇත. නිශ්චිතව දක්වා ඇති කල්පිරීමේ කාල පරාසයක් තුලදී ප්‍රතිමිලකරණය වන පොළී උපයන වත්කම් සහ පොළී දරන වගකීම් අතර වෙනස පොළී අනුපාත ප්‍රතිමිලකරණ පරතර විශ්ලේෂණය මගින් මනිනු ලබයි. ඉපයීම් දෘෂ්ටිකෝණය සහ ආර්ථික වටිනාකම් දෘෂ්ටිකෝණය යන ක්‍රම මගින් බැංකුව පොළී අනුපාත අවදානම මනිනු ලබයි.

බැංකුවේ වත්කම් හා වගකීම්වලින් ආසන්න වශයෙන් 90%කට වඩා පොළී අනුපාත සංවේදී වන බැවින් පොළී අනුපාත අවදානම කළමනාකරණය කිරීම බැංකුවේ තීරණාත්මක අංගයක් වන අතර එහිදී බැංකුවේ ශුද්ධ පොළී ආදායම හෝ ශුද්ධ පොළී ආන්තිකය පොළී අනුපාත විචලනයන්ට යටත් වේ.

එමනිසා බැංකුවේ පොළී අනුපාත අවදානම කළමනාකරණ වැඩපිළිවෙල මගින් කල්පිරීම්වල (ස්ථාවර අනුපාත වත්කම් හෝ වගකීම්) නොගැලපීම් අවම කිරීමට හෝ ප්‍රතිමිලකරණ ගැලපීම (පාවෙන අනුපාත වත්කම් හෝ වගකීම්) අදහස් කරයි. 2023 දී සෘණාත්මක පරතරය සුළු වශයෙන් අඩුවී ඇති බැවින් මුල් කල් පිරීමේ බාණ්ඩවල වර්ධනයක් නිරීක්ෂණය විය.

රජයේ සුරැකුම්පත් ඵලදා චක්‍රය

පිටුව 64



ස්කන්ධ මිල අවදානම

කළඹ වර්ගය	2023		2022		
	පොත් අගය රු. '000	වෙළෙඳපොල අගය රු. '000	පොත් අගය රු. '000	වෙළෙඳපොල අගය රු. '000	උපලබ්ධි නොවූ ලාභය/අලාභය රු. '000
FVPL කළඹ	**1,048,601**	**825,378**	3,001,032	1,956,839	(223,223)
FVOCI කළඹ	**2,784,598**	**3,030,202**	3,230,241	2,313,822	245,604
Total	**3,833,199**	**3,855,580**	6,231,273	4,270,661	22,381


වගුව 32 → ස්කන්ධ කළඹ තුළ තත්ත්වය

ආදායමේ සහ සංචිත තුළ ඇති විය හැකි විචලනවලට බැංකුව නිරාවරණය කෙරෙමින් කොටස් වෙළෙඳපොල විචල්‍යතා හේතුවෙන් ස්කන්ධ කළඹ ආයෝජනවල වටිනාකම හීනවීමේ අවදානම ස්කන්ධ මිල අවදානම ලෙස හැඳින්වේ. සාමාන්‍ය කොටස් මෙන්ම ඒකක භාර වලට අදාළ ලැයිස්තුගත ස්කන්ධ උපකරණවල එහි ආයෝජනවලින් හටගන්නා ස්කන්ධ මිල අවදානමට බැංකුව නිරාවරණය වේ. වෙළෙඳපොල විචල්‍යතා සහ වෙළෙඳ මෙහෙයුම්වල වෙනස්වීම්වලින් ක්‍රියාත්මක ස්කන්ධ ගනුදෙනු සහ කළඹ අවදානම් නියාමනය කිරීමට විස්තරාත්මක සීමා ව්‍යුහයක් ක්‍රියාවට නංවා ඇත.

බැංකුවේ ලැයිස්තුගත ස්කන්ධ කළඹ, ලාභ හෝ අලාභ මත සාධාරණ වටිනාකම් කළඹ සහ වෙනත් විස්තීරණ ආදායම් මත සාධාරණ වටිනාකම් කළඹ යන දෙකෙන් සමන්විත වේ. FVOCI කළඹට උපායමාර්ගික හා ව්‍යවස්ථාපිත අරමුණු සඳහා සිදුකළ ස්කන්ධ ආයෝජන ඇතුළත්ය. ස්කන්ධ කොටස් ආයෝජනයේ ප්‍රමාණය අවදානම් සීමා කාර්යරාමුව, ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශය සහ වෙළෙඳපොල තත්ත්වයන් සලකා බලමින් තීරණය කෙරේ.

ස්කන්ධය තුළ ආයෝජන

පිටුව 65



අවදානම් සමාලෝචනය

විදේශ විනිමය අවදානම

විදේශ විනිමය අවදානම සියලුම විදේශ ව්‍යවහාර මුදල්වල ඉදිරි සුරැකුම් නොකළ ගණුදෙනු සමඟ සම්බන්ධ වේ. බැංකුව සම්මතකළ මිනුම් ප්‍රවේශය (SMA) යටතේ ශුද්ධ විදේශ විනිමය නිරාවරණය (NFCE) සලකාබලමින් විදේශ විනිමය අවදානම සඳහා ප්‍රාග්ධනය වෙන් කරයි. ශුද්ධ විවෘත තත්ත්වය (NOP) විදේශ විනිමය අවදානම කළමනාකරණය කිරීමට මහ බැංකු නියාමන සහ අභ්‍යන්තර සීමා අනුව දෛනික පදනමක් මත නියාමනය කෙරේ. 2023 වසර අවසානයේදී, බැංකුවේ ශුද්ධ විදේශ විනිමය තත්වය ඇමෙරිකානු ඩොලර් මිලියන 2.98 ක් වූ අතර, එය බැංකුවේ මුළු නියාමන ප්‍රාග්ධනයෙන් 1.6% කි.

	>1 මාස	1-3 මාස	3-6 මාස	6-9 මාස	9-12 මාස	1-3 අවුරුදු	3-5 අවුරුදු	>5 අවුරුදු
USD	(6,320,491)	(852,935)	3,516,545	4,905,312	(1,248,431)	–	–	–
EUR	(2,595,037)	(293,159)	2,978,439	(707,115)	616,873	–	–	–
GBP	(1,653,587)	(666,671)	1,209,831	812,055	298,371	–	–	–
SGD	–	–	–	–	–	–	–	–
AUD	(1,934,506)	(486,681)	138,034	1,020,321	1,262,833	–	–	–
JPY	–	–	–	–	–	–	–	–
AED	–	–	–	–	–	–	–	–
CAD	0	–	–	–	–	–	–	–
CHF	(0)	–	–	–	–	–	–	–

වගුව 33 → විදේශ විනිමය මෙහෙයුම් සඳහා මුදල අනුව කල්පිරීමේ පරතර


විනිමය මිලියනවලින්	2023	2022
ඇමෙරිකානු ඩොලර්	**(1.390)**	1.288
යූරෝ	**2.772**	0.052
මහා බ්‍රිතාන්‍ය පවුම්	**0.238**	0.413
ජපන් යෙන්	**1.900**	6.222
සිංගප්පූරු ඩොලර්	**–**	0.041
ඕස්ට්‍රේලියානු ඩොලර්	**1.184**	–

වගුව 34 → ව්‍යූහගත ශුද්ධ විදේශ විනිමය නිරාවරණ



සීමාවන්ට අනුව ශුද්ධ විවෘත තත්ත්වය


ප්‍රස්ථාරය 66



අවදානම් අභිරුචි සීමාව තුළ පවත්වා ගැනීමේ අපේක්ෂාවෙන් ස්කන්ධ වෙළෙඳ කළඹ සහ විදේශ විනිමය විවෘත තත්ත්වය සඳහා අවදානමට වටිනාකම භාවිතා කරමින් වෙළෙඳපොල අවදානම් කළමනාකරණ අංශය යටතේ මිල වෙනස්වීම් මනිනු ලබයි. ස්කන්ධ අවදානමේදී වටිනාකම බැංකුවේ අවදානම් ඉවසුම් සීමාව තුළ පවතී.

අවදානමේදී ස්කන්ධ වටිනාකම වෙනස්වීම්


ප්‍රස්ථාරය 67



අවදානම් සමාලෝචනය

අවදානමේදී විදේශ විනිමය (USD) වටිනාකම වෙනස්වීම

ප්‍රස්ථාරය 68



ද්‍රවශීලතාව සහ අරමුදල් අවදානම

ද්‍රවශීලතාව සහ අරමුදල් අවදානම යනු පිළිගත නොහැකි අලාභ දැරීමක් නොමැතිව ගෙවීමට සිදුවන ශේෂ පත්‍රයේ හෝ ඉන් බාහිර බැඳීම් ඉටු කිරීමට ප්‍රමාණවත් ස්ථාවර හෝ විවිධ අරමුදල් මූලාශ්‍ර බැංකුවට නොමැතිවීමේ අවදානමයි. බැංකුවේ ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ කාර්යරාමුව මගින් බැංකුවේ මෙහෙයුම් පෙර නිශ්චිත ද්‍රවශීලතා සීමා තුළ ක්‍රියාත්මක වන බව සහ බැංකුවේ ද්‍රවශීලතා ප්‍රතිපත්ති නියාමන අවශ්‍යතා සහ මනා ව්‍යවහාරවලට අනුකූලව පවත්නා බව බැංකුව විසින් සහතික කිරීම අවශ්‍ය වේ.

අවදානම් සංරචකය	අවදානම් කළමනාකරණ ප්‍රවේශය	ආවේනික අවදානම් මට්ටම	බලපෑම*
ද්‍රවශීලතා අවදානම	1. අවම අවශ්‍යතාවයට අනුව නියාමන අනුපාත නියාමනය 2. සීමා අනුව විවිධ කාල පරාසවල කල්පිරීම් පරතර නියාමනය. 3. තොග ප්‍රවේශය යටතේ අනුපාත නියාමනය 4. ද්‍රවශීලතා අසම්භාව්‍යතා සැලසුම් කිරීම 5. ආතති පරීක්ෂාව සහ ක්‍රියාදාම විශ්ලේෂණය	ඉහළ	↑

*පෙර වසරට සාපේක්ෂව

බලපෑමෙහි වැඩිවීම ↑ වෙනසක් නොමැත → බලපෑමෙහි අඩුවීම ↓

වගුව 35 → ද්‍රවශීලතා අවදානම් සමාලෝචන

ද්‍රවශීලතා සහ අරමුදල් අවදානම් කළමනාකරණයේ ප්‍රධාන පරමාර්ථය වන්නේ සාමාන්‍ය සහ පීඩන ක්‍රියාදාමයන් යටතේ නිවැරදි පිරිවැයට නිවැරදි කාලයට වගකීම් සපුරාලීමට අවශ්‍ය අරමුදල් ලබාගත හැකි බව තක්සේරු කර සහතික කිරීමයි.

නියාමන අනුපාත

බැංකුවේ නියාමන ද්‍රවශීලතා දර්ශක පෙර වසරට සාපේක්ෂව වර්ධනය වී ඇති අතර. අවම නියාමන අවශ්‍යතාවලට වඩා පහසු ව ඉහළින් පැවතුණි.

අනුපාත	2023	2022	නියාමන අවමය
ව්‍යවස්ථාපිත ද්‍රවශීලතා අනුපාතය (SLAR – DBU) %	**55.0**	40.6	20
LCR – රුපියල් %	**299.2**	195.0	100
LCR – සියලුම ව්‍යවහාර මුදල් %	**293.7**	195.5	100
ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය (NSFR) %	**180.5**	180.5	100

අවදානම් සමාලෝචනය


වගුව 36 → නියාමන ද්‍රවශීලතා අනුපාත

නිෂ්පාදන අනුව අරමුදල් විවිධාංගීකරණය

රටතුළ විදේශ විනිමය සංචිතවල හිඟය සමඟ ඇති වූ ආර්ථික අර්බුදය පොළී අනුපාත ඉහළම අන්තවලට ලඟාවීමට හේතු විය. බැංකුවේ තැන්පතු පදනම රු. ට්‍රිලියන 1.48 දක්වා ලඟාවෙමින් වාර්ෂිකව 0.4%කින් සුළු වශයෙන් වර්ධනය විය. වසර තුළ ස්ථීර තැන්පතු ආපසු ලබාගැනීම මෙම අඩු වර්ධනයට හේතු විය. බැංකුව අඩු පිරිවැය ඉතුරුම් තැන්පතු සේවයේ යෙදීමේ දී සාර්ථක වූ අතර එය වාර්ෂිකව 5.2% කින් වැඩි කළ අතර ස්ථීර තැන්පතු වාර්ෂිකව 0.6%ක අඩුවීමක් වාර්තා කළේය.

නිෂ්පාදන අනුව අරමුදල් විවිධාංගීකරණය


ප්‍රස්ථාරය 69



බැංකුවට එහි ශාඛා ජාලය තුළින් පුද්ගල තැන්පතු සහ ආයතනික තැන්පතු සඳහා පුළුල් රාමුවක් කරා ප්‍රවේශ වී ඇති අතර, එය ස්ථාවර අරමුදල්වල මූලික මූලාශ්‍රයක් ලෙස සලකයි. දිවයින පුරා ශාඛා ජාලය තුළින් පුද්ගල තැන්පතු කරා පිවිසීම (එනම් ඉතුරුම් හා ස්ථාවර තැන්පතු) අරමුදල්වල සංකේන්ද්‍රණ අවදානම අඩු කිරීම සිදුකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි රාමුව අනුව භාණ්ඩාගාර අංශයේ ALM ඒකකය විසින් අරමුදල් අවදානම කළමනාකරණය කරයි.


තැන්පතු විවිධාංගීකරණය

ප්‍රස්ථාරය 70



ස්ථීර තැන්පතු ඉතුරුම් මුසුව

ප්‍රස්ථාරය 71



බැංකුවේ ද්‍රවශීල අවදානම නියාමන අවශ්‍යතා සහ තොග ප්‍රවේශය සහ ප්‍රවාහ ප්‍රවේශවල අවශ්‍යතා යටතේ ප්‍රධාන ද්‍රවශීල දර්ශක නියාමනය කරමින් කළමනාකරණය කෙරේ. වත්කම් හා වගකීම්වල වෙනස්වීම් අරමුදල් අවශ්‍යතාවන්ට සාපේක්ෂව මනිනු ලබන අතර එය අපේක්ෂිත ද්‍රවශීල මට්ටම එක් එක් අවස්ථාවේදී පවත්වා ගන්නා බව සහ එය බැංකුවේ අවදානම් අභිරුචියට අනුකූලව බව සහතික කරයි. ද්‍රවශීලතා පරතර සඳහා අභ්‍යන්තර සීමා ක්‍රියාත්මකව පවතින අතර බැංකුවේ රූපියල් සහ විදේශ විනිමය ද්‍රවශීලතා පැතිකඩ යහපත් මට්ටමක් කළමනාකරණය කරන බව සහතික කිරීම සඳහා අඛණ්ඩ පදනමක් මත නියාමනය කෙරේ.

උසස් තත්ත්වයේ ද්‍රවශීල වත්කම් සහ විවිධ අරමුදල් මූලාශ්‍රවල ප්‍රමාණවත් ආරක්ෂණ පවත්වා ගනිමින් ද්‍රවශීලතා අවදානම අවම කර ගනී. තවද, බැංකුවේ අවිනිශ්චිත අරමුදල් සැලැස්මට අනුකූලව ප්‍රමාණවත් ද්‍රවශීල ආරක්ෂණ පවත්වා ගැනීම ලබාගැනීම සහතික කරමින් උපායමාර්ග/විකල්ප ක්‍රියාවට නංවා ඇත. බැංකුව ද්‍රවශීල අවදානම් පිළිබඳ දැඩි නියාමනය සහතික කර ඇති අතර අති-විශේෂ ආර්ථික තත්ත්වයන් තුළ, නියාමකගේ සහය ඇතිව බැංකුවේ අරමුදල් අවදානම් අවම කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. ඒ අනුව, මූල්‍ය මණ්ඩලය ද්‍රවශීලතා සංරෝධක අවම කිරීමට මුදල් නීති පනතේ 82 වගන්තිය සහ 83 (1) වගන්තිය යටතේ ණය පහසුකමක් ලබා දුන්නේය. මෙය රජයේ සුරකුම්පත් ඇපයට තබා ලබාගත් කෙටි කාලීන ණයක් ලෙස ව්‍යූහගත කෙරුණි.

තොග ප්‍රවේශය

බැංකුව අරමුදල් අවශ්‍යතාවල ප්‍රමාණතාව නියාමනය කිරීමට තොග ප්‍රවේශය යටතේ පහත ද්‍රවශීලතා අනුපාත නියාමනය කරන අතර අරමුදල් සහ ද්‍රවශීලතා අවදානම බැංකුවේ අවදානම් අභිරුචිය තුළ කළමනාකරණය කරන බව සහතික කරයි.



අවදානම් සමාලෝචනය

අනුපාත	2023 %	2022 %
මුළු වත්කම්වලට ශුද්ධ ණය	**31.2**	34.2
ගනුදෙනුකාර තැන්පතුවලට ණය	**37.0**	38.6
කෙටි කාලීන වගකීම්වලට ද්‍රවශීල වත්කම්	**54.0**	39.6
මුළු වත්කම්වලට මිලදී ගත් අරමුදල්	**19.7**	16.9
(විශාල වගකීම් – තාවකාලික ආයෝජන) / (අනුපාත සංවේදී වත්කම් – තාවකාලික ආයෝජන)	**-6.4**	4.8
මුළු ණය වලට බැඳීම්	**1.1**	2.5

වගුව 37 → කොග ප්‍රවේශය යටතේ අනුපාත

ප්‍රවාහ ප්‍රවේශය

ප්‍රවාහ ප්‍රවේශය යටතේ, ද්‍රවශීලතා පරතර විශ්ලේෂණය ද්‍රවශීලතා අවදානම් තක්සේරු කිරීමට බැංකුව විසින් භාවිතා කරන ක්‍රමයකි. ද්‍රවශීලතා පරතර සීමාවන්ට අනුව කලින් කල නියාමනය කරන අතර, සංවේදී විශ්ලේෂණය සහ පීඩන පරීක්ෂණය සඳහා භාවිතා කෙරේ.

මාස 12ට අඩු කාලසීමා තුළ තැන්පතුවල සංකේන්ද්‍රණය හේතු කොට ගෙන වසර එකට අඩු කල්පිරීම් කාලසීමා තුළ ඉහළ ඍණ ද්‍රවශීලතා පරතර නිරීක්ෂණය වේ. වඩා ඉහළ අනුපාත සංවේදී වෙළෙඳපොලක් තුළ අරමුදල් රඳවා ගැනීම සහ ආකර්ෂණය කර ගැනීම කෙරෙහි අවධානය අවශ්‍ය කරන ප්‍රමුඛ ගැටළුවක් බවට මෙය පත්වී ඇත.

බැංකුව – රු. මිලියන	මාස 0-3	මාස 3-12	අවුරුදු 1-3	අවුරුදු 3-5	අවුරුදු >5	එකතුව
ගිවිසුම්ගත කල්පිරීම් සහිත වත්කම්	160,256	350,206	431,774	336,011	408,717	1,686,964
ගිවිසුම්ගත කල්පිරීම් සහිත වගකීම්	793,649	707,821	45,434	25,268	114,792	1,686,964
කල්පිරීම් පරතරය	(634,673)	(357,616)	386,340	310,241	295,708	(0)
සමුච්චිත පරතරය	(634,673)	(992,289)	(605,949)	(295,708)	(0)	(0)
වගකීම්වල ප්‍රතිශතයක් ලෙස සත්‍ය පරතරය – 2023	**-80%**	**-51%**	**850%**	**1,228%**	**255%**	**0%**
වගකීම්වල ප්‍රතිශතයක් ලෙස සත්‍ය පරතරය – 2022	-85%	-64%	1,120%	1,204%	363%	0%

වගුව 38 → වත්කම් හා වගකීම්වල කල්පිරීමේ පැහිකඩ

වත්කම් සහ වගකීම්වල කල්පිරීමේ පරතර විශ්ලේෂණ නියාමනය මඟින් දැනුවත් අහිතකර ද්‍රවශීලතා මට්ටම් නිරීක්ෂණය කරයි. 2023 අවසානයට කල්පිරීමේ පරතරවල සුළු වශයෙන් වර්ධනයක් නිරීක්ෂණය කළ හැකිය.

මෙහෙයුම් අවදානම

මෙහෙයුම් අවදානම යනු ප්‍රමාණවත් නොවන හෝ අසාර්ථක අභ්‍යන්තර ක්‍රියාවලි, පුද්ගලයන් සහ පද්ධති හෝ බාහිර සිදුවීම් හේතුවෙන් පැන නඟින අවදානම වේ. නෛතික අවදානම, මෙහෙයුම් අවදානමට ඇතුළත් වුවත් කීර්තිනාම අවදානම සහ උපායමාර්ගික අවදානම ඊට අයත් නොවේ.

මෙහෙයුම් අවදානම් කාර්යය මෙහෙයුම් කාර්ය රාමුවේ ක්‍රියාත්මක කිරීම අර්ථ දැක්වීම සහ පාලනය සඳහා මෙන්ම බැංකුවේ මෙහෙයුම් අවදානම් පැතිකඩ නියාමනය කිරීම සඳහා වගකීමට බැඳී සිටී. මෙහෙයුම් අවදානම් කාර්යය කාලීන තීරණ ගැනීම සහ පළමු ආරක්ෂක මාර්ග යේ ක්‍රියාමාර්ග ගැනීම පිණිස අවදානම් මට්ටම් පිළිගත හැකි දරාගැනීමේ සීමාව ඉක්මවන අවස්ථාවේදී කළමනාකරණයට අනතුරු හඟවයි.

සියලුම බැංකු මෙහෙයුම්වලින් ඇතිවන මෙහෙයුම් අවදානම් ප්‍රධාන වශයෙන් අලාභ සිදුවීම් වර්ග හතක් සඳහා වර්ගීකරණය කෙරේ. ඒවානම් අභ්‍යන්තර වංචා, බාහිර වංචා, ක්‍රියාත්මක කිරීම, සැපීම සහ ක්‍රියාවලි කළමනාකරණය සේවා නියුක්තිකයන්ගේ පරිවයන් සහ සේවා ස්ථානයේදී ආරක්ෂාව,


ගනුදෙනුකරුවන් නිමවූම් සහ ව්‍යාපාර ආශිත පරිවයන් භෞතික වත්කම්වලට සිදුවූ අලාභ සහ ව්‍යාපාර බිඳවැටීම් සහ පද්ධති දෝෂ වේ.

2023 මූල්‍ය වර්ෂය තුළ, ඉහත සඳහන් සිදුවීම්වලින් ඇති වූ මුළු අලාභ වසර තුනක සාමාන්‍ය විගණනය කළ දළ ආදායමෙන් 0.23%ක් විය. එබැවින්, බැංකුව ස්ථාපිත අවදානම් අභිරුචි සීමාවන් තුළ යහපත් අයුරින් සිටී.

අවදානම් සමාලෝචනය

අවදානම් අභිරුචිය සහ දැරාගැනීමේ සීමාවන්ට අනුව සැබෑ මෙහෙයුම් අලාභ


ප්‍රස්ථාරය 72



පසුගිය වසර පහක කාලය තුළ වාර්තාවලින් මෙහෙයුම් අලාභ අවම මට්ටමින් පවත්වා ගෙන යාමේ හැකියාව පෙන්නුම් කරයි. මෙහෙයුම් අවදානම කළමනාකරණය කිරීම සඳහා පවතින පාලන ව්‍යුහය, ප්‍රතිපත්ති, අභ්‍යන්තර පාලන ව්‍යුහයන්, ක්‍රියාවලි සහ ක්‍රියා පටිපාටිවල සඵලතාවය මෙයින් අවධාරණය කෙරේ.


අලාභ ජනනයකරන සිදුවීම්වල සංඛ්‍යාතය

ප්‍රස්ථාරය 73




අලාභ ජනනයකරන සිදුවීම්වල උග්‍රතාවය

ප්‍රස්ථාරය 74



IF – අභ්‍යන්තර වංචා **EF –** බාහිර වංචා
EPWS – සේවානියුක්තිකයන්ගේ පරිවයන් සහ කාර්යාලයේදී ආරක්ෂාව
CPBP – ගනුදෙනුකරුවන් නිමවුම් සහ ව්‍යාපාර ව්‍යවහාර
DPA – භෞතික සම්පත් වලට සිදුවූ හානි
BDSF – ව්‍යාපාර බිඳවැටීම් සහ පද්ධති දෝෂ
EDPM – ක්‍රියාත්මක කිරීම, සැපයීම සහ ක්‍රියාවලි කළමනාකරණය

2023 වර්ෂය සඳහා අභ්‍යන්තර අලාභ සිදුවීම් සම්බන්ධ දත්ත විශ්ලේෂණ අනුව ක්‍රියාත්මක කිරීම, සැපයීම සහ ක්‍රියාවලි කළමනාකරණයේ දෝෂ අලාභ සිදුවීම් වල ඉහළම සංඛ්‍යාතය අනාවරණය කරන අතර උග්‍රතාවය අවම මට්ටමක පවතී. ඉහළම උග්‍රතාව අභ්‍යන්තර වංචාවලින් වාර්තා වන අතර බැංකුවේ දරාගැනීමේ සීමාව තුල පවතී.



අවදානම් සංරචකය	අවදානම් කළමනාකරණ ප්‍රවේශ	ආවේනික අවදානම් මට්ටම	බලපෑම*
වංචා අවදානම	• වංචා අවදානම් කළමනාකරණය සහ තොරතුරු දැනුම් දීමේ ක්‍රියාවලිය • අභ්‍යන්තර පාලනයන් • ප්‍රධාන මෙහෙයුම් අවදානම් දර්ශක (KORIs) නියාමනය • අලාභ ජනනය කරන සිදුවීම් නියාමනය • අවදානම් පාලන ස්වයං තක්සේරු (RCSA) • අල්ලස් හා දූෂණ විරෝධී අවදානම් කළමනාකරණය	මධ්‍යස්ථ	▲
තොරතුරු තාක්ෂණ අවදානම	• අභ්‍යන්තර පාලන • තොරතුරු ආරක්ෂණ කළමනාකරණ පද්ධතිය • මෙහෙයුම් අවදානම් දර්ශක (KORI) නියාමනය • සිදුවීම් වාර්තාකරණය • අවදානම් පාලන ස්වයං තක්සේරු (RCSA)	ඉහළ	▶
ව්‍යාපාර අඛණ්ඩතා අවදානම	• මෙහෙයුම් අවදානම් දර්ශක (KORIs) නියාමනය • ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ ක්‍රමය (BCMS) ක්‍රියාත්මක කිරීම	ඉහළ	▶
අනුකූලතා/නියාමන අවදානම	• අනුකූලතා වැඩසටහන් සහ පරීක්ෂණ • මෙහෙයුම් අවදානම් දර්ශකනියාමනය • අනුකූලතා අවදානම සඳහා ලකුණු කාඩ්පත	ඉහළ	▶
නෛතික අවදානම	• සියලු ගිවිසුම්ගත වගකීම් ආශ්‍රිත නෛතික නිරාකරණය • මෙහෙයුම් අවදානම් දර්ශක (KORI) නියාමනය	මධ්‍යස්ථ	▶

* ඉපයීම් සහ ප්‍රාග්ධනය මත බලපෑමෙහි වාර්ෂික වෙනස

බලපෑමෙහි වැඩිවීම ▲ වෙනසක් නැත ▶ බලපෑමෙහි අඩුවීම ▼


වගුව 39 → මෙහෙයුම් අවදානම් සමාලෝචනය

අවදානම් සමාලෝචනය

බැංකු ක්ෂේත්‍රය එහි මෙහෙයුම් ක්‍රියාවලිය සහ නියාමන පරිසරයේ ස්වභාවය හේතුවෙන් අසමසම මෙහෙයුම් අවදානම්වලට මුහුණ දේ.

මෙහෙයුම් අවදානම් කළමනාකරණය සඳහා පදනම පද්ධති පාලනයන්, පිවිසුම් පාලනයන්, රාජකාරි බෙදාදීම, බලය සහ වගකීම පිළිබඳ පැහැදිලි මායිම්, ද්විත්ව පාලනය, වත්කම් පිළිබඳව භෞතික පාලනයන්, වාර්තා තැබීම, සැසැඳීමේ ක්‍රියාවලිය, විගණන පරීක්ෂණ, සහ විගණන වාර්තා ඇතුළුව සුදුසු අභ්‍යන්තර පාලන යාන්ත්‍රණ තුළින් ස්ථාපිත කෙරේ.

අවදානම් කළමනාකරණය කාර්‍ය රාමුව, ශක්තිමත් ජ්‍යේෂ්ඨ කළමනාකරණ නියෝග, සහ මනාව දියුණු කළ මෙවලම් මෙහෙයුම් අවදානම් කළමනාකරණයේ ප්‍රධාන ශක්තීන් වෙති. බැංකුවට ඇති ආපදා අවම කිරීම හඳුනාගැනීම මඟින් වඩාත් සුදුසු අවදානම් කළමනාකරණ උපායමාර්ග තෝරාගනී.



වගුව 34 → මෙහෙයුම් අවදානම් කළමනාකරණ උපායමාර්ග

අවදානම් කළමනාකරණ අංශයෙහි මෙහෙයුම් අවධානම් කළමනාකරණ ඒකකය මෙහෙයුම් අවදානම් හඳුනාගෙන තක්සේරු කිරීමට ශිල්ප ක්‍රම සහ ක්‍රියාවලි කිහිපයක් භාවිතා කරයි. හඳුනාගත් අවදානම් කාලීන තීරණ ගැනීම පහසු කිරීම සඳහා මෙහෙයුම් අවදානම් කළමනාකරණ කමිටුව (ORMC)/අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවධානම් කළමනාකරණ කමිටුව (BIRMC) වෙත වාර්තා කෙරේ.

බැංකුව මූලික දර්ශක ප්‍රවේශය භාවිතා කරමින් මෙහෙයුම් අවදානම් සඳහා ප්‍රාග්ධනය වෙන් කරයි.

විශ්ලේෂණ තත්වයකදී මෙහෙයුම් අවදානම් වලින් ඇති වන බලපෑම හඳුනා ගැනීමට ආතති පරීක්ෂාව හා ක්‍රියාදාම විශ්ලේෂණය භාවිතා කෙරේ.

බැංකුව ප්‍රධාන මෙහෙයුම් අවදානම් දර්ශක (KORI) අනුකෘතිය භාවිතා කරන අතර ඉන් විගණන ගැටළු, ව්‍යාපාර අඛණ්ඩතාව, තොරතුරු ආරක්ෂාව, නිෂ්පාදනවල ගුණාත්මකභාවය, ක්‍රියාවලිවල ගුණාත්මකභාවය සහ අනුකූලතාවය යන ප්‍රධාන ක්ෂේත්‍ර හයක් මත KORI ආවරණය කරයි.

වැඩි අවදානම් සහිත මෙහෙයුම් සඳහා ක්‍රියාවලි හිමිකරුවන්ට අවදානම් කළමනාකරණ කණ්ඩායම සමඟ සාමූහිකව අවදානම් සහ පාලනයන් හඳුනාගැනීමට සහ ඇගයීමට පහසුකම් සැලසීම සඳහා අවදානම් පාලන ස්වයං තක්සේරුව (RCSA) ක්‍රියාත්මක කර ඇත.


මෙහෙයුම් අලාභ සිදුවීම් දත්ත එකතු කිරීම සහ විශ්ලේෂණය කිරීම බැංකුවේ මෙහෙයුම් අවදානම් කළමනාකරණ රාමුව තුළ ප්‍රධාන සංරචකයකි. එකතු කරන ලද දත්ත බාසල් ගිවිසුම් යටතේ ප්‍රකාශිත අලාභ සිදුවීම් කාණ්ඩවලට වර්ග කරන අතර සිදුවීමේ ස්වභාවය, මූල හේතු, බරපතලකම සහ සිදුවීමේ සම්භාවිතාව හඳුනා ගැනීමට භාවිතා කරයි.

ක්‍රියාවලි වර්ධනයන් සහ අවදානම අවම කිරීමේ කටයුතු අලාභ සිදුවීම් දත්ත විශ්ලේෂණ මත පදනම් වී නිර්දේශ කෙරේ.

බාහිරින් ලබා ගැනීම බැංකුව සඳහා ඵලදායී පිරිවැය ඉතිරිකිරීමේ සහ අවදානම් හුවමාරු කිරීමේ උපාය මාර්ගයකි. බැංකුවේ බාහිරින් ලබා ගැනීමේ වැඩපිළිවෙල පරිපාලන අංශය විසින් හඳුනාගෙන කළමනාකරණය කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද බාහිරින් ලබා ගැනීමේ ප්‍රතිපත්තියට අනුකූලව සහ මහ බැංකුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශයන්ට අනුකූලව බාහිරින් ලබා ගැනීමේ මෙහෙයුම් සිදු කරනු ලැබේ. බැංකුවේ අභ්‍යන්තර ප්‍රතිපත්තිවලට අනුකූලව අවශ්‍යතා අනුව බාහිරින් ලබාගන්නා කටයුතු ඉටු කිරීමට සේවා සපයන්නන්ගේ හැකියාවන් සහතික කිරීම සඳහා නව ගිවිසුම් ක්‍රියාත්මක කිරීමට හෝ පවතින ගිවිසුම් අලුත් කිරීමට පෙර බාහිරින් ලබාගන්නා වෙළෙන්දන් පිළිබඳ යෝග්‍යතාව සඳහා කඩිසර පරීක්ෂණ සිදු කරනු ලැබේ

බැංකුව සැලකියයුතු උග්‍රතාවය සමඟ මෙහෙයුම් අවදානම් සිදුවීම්වලට මුහුණ දෙන නමුත්, එහි අවදානමක් ඇතිවීමේ විභවතාවය අඩුය. මෙම ස්වභාවයේ රක්ෂණයකළ හැකි ප්‍රධාන අවදානම් මාරු කිරීමට ශිල්පයක් ලෙස රක්ෂණය භාවිතා කෙරේ. රක්ෂණ ඔප්පුවල ප්‍රමාණතාව බැංකුවට බාහ මතුවන අවදානම් සැලකිල්ලට ගනිමින් අඛණ්ඩව සමාලෝචනය කරනු ලබයි. රක්ෂණ කාර්යය පරිපාලන අංශය තුළ මධ්‍යගත කෙරේ.

මෙහෙයුම් අවදානම් කළමනාකරණ මෙවලම්



රූපය 35 → මෙහෙයුම් අවදානම් කළමනාකරණ උපායමාර්ග

අවදානම් සමාලෝචනය

වංචා අවදානම

වංචා අවදානම මූල්‍ය ආයතනයක ශක්‍යතාවයට සහ තිරසාරභාවයට සැලකිය යුතු තර්ජනයක් ඇති කරන අතර, එහිදී සිදුවන හානිය මූල්‍ය පාඩු ඉක්මවා යයි. මෙය අල්ලස හා දූෂණ සමඟ සම්බන්ධ විය හැකි බැවින් සේවකයින් සහ අදාළ සියලුම පාර්ශවයන් සපයනු ලබන සේවාව සඳහා ප්‍රතිලාභ වශයෙන් තෑගි සහ ආගන්තුක සත්කාර, පහසුකම් සඳහා ගෙවීම්, දේශපාලන දායකත්වයන්, මුදල් ගෙවීම් සහ කොමිස්, අනුග්‍රහය දක්වන ගමන් සහ නවාතැන්, සහ පුණ්‍යාධාර දායකත්වයන්ගෙන් වැලකී සිටිය යුතුය.

අභ්‍යන්තර පාලන ව්‍යුහයට පළමු ආරක්ෂක මාර්ගයේ දී මෙම අවදානම් අවම කිරීම සඳහා ක්‍රියාකාරී පාලනයන් ඇතුළත් වේ. මෙහෙයුම් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය, තොරතුරු දැනුම්දීමේ ප්‍රතිපත්තිය සහ අල්ලස් සහ දූෂණ විරෝධී ප්‍රතිපත්තිය මඟින් වංචා අවදානම, අල්ලස් සහ දූෂණ අවදානම් කළමනාකරණය කිරීමේ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි විස්තර කරයි.

තොරතුරු තාක්ෂණ අවදානම

තොරතුරු තාක්ෂණ අවදානම මෙහෙයුම් අවදානම්වල ප්‍රධාන සංරචකයක් වන අතර තොරතුරු තාක්ෂණවල අවදානම් සූරා කෑමට ලක්වන විට එය ව්‍යාපාරික දත්ත, තීරණාත්මක පද්ධති සහ විවිධ ව්‍යාපාරික ක්‍රියාවලීන්ට තර්ජන ඇති කරයි.

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ICT) තුළ කළහැකි සම්මත තාක්ෂණයන් භාවිතා කරමින් තොරතුරු පද්ධතිවල දත්තවල සංවේදීතාව, තීරණාත්මකබව සහ තොරතුරු පද්ධති යටිතලපහසුකම්වල වර්ගය සැලකිල්ලට ගනිමින් ව්‍යාපාරික ඔරොත්තු දීමේ හැකියාව ඇති කිරීමට තාක්ෂණ අවදානම් කළමනාකරණය මඟින් අදහස් කරයි.

බැංකුවට අත්‍යවශ්‍ය තාක්ෂණය තුළ උපායමාර්ගික වර්ධනයන් තාක්ෂණයන් අභාවයට යාමේ අවදානම් අවම කිරීමට සහ ක්ෂේත්‍රයේ තරඟකරුවන් සමඟ සමව සිටීමට උපායමාර්ගික සැලසුම් කිරීමේ ක්‍රියාවලිය තුළ තීරණය කෙරේ. පද්ධති බිඳවැටීම් සහ දෝෂ, පද්ධති මෙහෙයවීම තුලින් වංචා, සහ සයිබර් තර්ජන අනෙකුත් තොරතුරු තාක්ෂණ අවදානම් ලෙස සැලකිය හැකිය.

ප්‍රධාන තොරතුරු නිළධාරී (CIO)/නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තොරතුරු තාක්ෂණ විසින් මෙහෙයවන තොරතුරු තාක්ෂණ අංශය, තොරතුරු තාක්ෂණ නියාමන කමිටුවට (ITSC) පාලන වගකීමක් සමඟ තොරතුරු තාක්ෂණ අවදානම් කළමනාකරණය සහතික කරයි.

ප්‍රධාන තොරතුරු ආරක්ෂක නිලධාරී (CISO) විසින් මෙහෙයවන තොරතුරු ආරක්ෂක තාක්ෂණ අංශය (ISD) තොරතුරු ආරක්ෂක අවදානම් කළමනාකරණ රාමුව ක්‍රියාත්මක කිරීම සහ බාහිර ප්‍රවීන සේවා සපයන්නන්ගේ සහය ඇතිව තොරතුරු පද්ධති පිළිබව ස්වාධීන අවදානම් තක්සේරු කිරීම් පැවැත්වීම සඳහා වගකිව යුතුය.

කළමනාකරණ මට්ටමේදී, තොරතුරු ආරක්ෂක කමිටුව (ISC) තොරතුරු ආරක්ෂක අවදානම් කළමනාකරණයේ උපායමාර්ගික සහ මෙහෙයුම් අංග සඳහා වගකීමට බැඳී සිටී.

බැංකුව වෙනස්වන සයිබර් තර්ජන කරා ඔරොත්තුදීම වර්ධනය කිරීමට තොරතුරු ආරක්ෂක මූලපිරීම් අඛණ්ඩව ගෙන ඇත. බැංකුව ISD යටතේ 24X7ක්‍රියාත්මක ආරක්ෂක මෙහෙයුම් මධ්‍යස්ථානය (SOC) ක්‍රියාත්මක කර ඇත. දත්ත කාන්දුවීම වැලැක්වීම (DLP) සහ දත්ත වර්ගීකරණ විසඳුම දත්ත ආරක්ෂා කර සුරක්ෂිත කිරීමට සහ රෙගුලාසිවලට අනුකූලවීමට ගෙන ඇති ක්‍රියාමාර්ග වෙති.

තවද බැංකුව තොරතුරු තාක්ෂණ අංශය, තොරතුරු ආරක්ෂක අංශය, ආපදා ප්‍රතිසාධන වැඩභූමිය (DR Site) සහ කාඩ් මධ්‍යස්ථානය සඳහා ISO 27001:2013 සහතිකය අත්කරගෙන ඇත. එමෙන්ම බැංකුව ගෙවීම් කාඩ් හිමියන්ගේ දත්ත ආරක්ෂාව සහතික කිරීමට ගෙවීම් කාඩ් ක්ෂේත්‍රයේ දත්ත ආරක්ෂක ප්‍රමිතිය (PCI DSS) යටතේ බැංකුව සහතික කර ඇත.

තොරතුරු තාක්ෂණය සහ තොරතුරු ආරක්ෂණ කළමනාකරණ පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා "තාක්ෂණික අවදානම් කළමනාකරණය පිළිබඳ නියාමන කාර්යරාමුව සහ බලපතුලාභී බැංකුවල ඔරොත්තුදීම" පිළිබඳ මහ බැංකුවේ උපදෙස් අත්කර ගැනීම සහ නිරන්තර සමාලෝචන තුළින් ක්‍රියාත්මක පාලනයන්ගේ නඩත්තුව සඳහා බැංකුව පියවර ගනී.

මෙහෙයුම් අවදානම් කළමනාකරණ පද්ධතිය සහ තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තිය තොරතුරු තාක්ෂණ අවදානම් කළමනාකරණ රාමුව සාකච්ඡා කරයි.

මෙහෙයුම් අවදානම් කළමනාකරණ ඒකකය (ORMU) මඟින් ආපදා තක්සේරු කිරීම්, විනිවිද යාමේ පරීක්ෂණ, ආපදා ප්‍රතිසාධන සැලසුම් ක්‍රියාත්මක කිරීම ඇතුළු නියාමන අවශ්‍යතා ක්‍රියාත්මක කිරීම සහ KORI භාවිතා කරමින් ආරක්ෂක සිදුවීම් සහ පාඩු සිදුවීම් ඇතුළුව මනා පරිචයන් නියාමනය කරයි. තොරතුරු තාක්ෂණය පදනම් ක්‍රියාවලි සහ නිපැයුම්වල තොරතුරු තාක්ෂණ අවදානම් හඳුනා ගැනීමට සහ තක්සේරු කිරීමට මෙවලමක් ලෙස ද RCSA භාවිතා කරනු ලබයි. හඳුනාගත් අපගමනයන් කඩිනම් අවදානම් අවම කිරීමේ ක්‍රියාමාර්ග සඳහා BIRMC හරහා ඉහළ කළමනාකාරිත්වයට සහ අධ්‍යක්ෂ මණ්ඩලයට දැනුම් දෙනු ලැබේ.

ව්‍යාපාර අඛණ්ඩතා අවදානම

ව්‍යාපාර අඛණ්ඩතා අවදානම යනු ස්වභාවික හෝ මිනිසා විසින් සිදුකළ ආපදාවන්හිදී බැංකුවේ ප්‍රධාන පාර්ශ්වකරුවන්ගේ බැඳීම් සුරක්ෂිත කරමින් ඵලදායීව මෙහෙයුම්වල ඔරොත්තුදීම පවත්වා ගැනීමට ආයතනයේ හැකියාව කෙරෙහි වියහැකි අහිතකර බලපෑමයි.

බැංකුව ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණය (BCM) සඳහා ශක්තිමත් පාලන ව්‍යූහයක්, විස්තරාත්මක ප්‍රතිපත්ති ලියවිලි, සහ කාර්යක්ෂම ක්‍රියාවලි සහ පද්ධති ස්ථාපිත කර ඇත. ස්වභාවික ආපදා, මිනිසා විසින් සිදුකරන සිදුවීම් සහ තොරතුරු තාක්ෂණය පදනම් ආපදාවන්ගෙන් සිදුවුවද අවම බිඳවැටීම් සහිතව ව්‍යාපාර මෙහෙයුම් වල අඛණ්ඩතාව සහතික කිරීමට මෙම ක්‍රියාමාර්ග සැලසුම් කෙරේ.

විශේෂ ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් (BCP) ඒකකය BCM රාමුව ක්‍රියාත්මක කිරීම, පරීක්ෂා කිරීම සහ නියාමනය කිරීමේ තීරණාත්මක වගකීම භාර ගනී. මීට අමතරව, මෙම ඒකකය අත්‍යවශ්‍ය ආරක්ෂණ ස්ථරයක් ලබාදෙමින් බැංකුවේ ආපදා ප්‍රතිසාධන වැඩභූමිය කළමනාකරණය කරයි ස්ථර III සැලසුම් සහතිකය (TCDD) ක් සමඟ සහතික කර ඇති බැංකුවේ දත්ත මධ්‍යස්ථානය මෙහෙයුම් ස්ථාවරත්වය පවත්වා ගැනීමට සහ පාර්ශ්වකරුවන්ගේ බැඳියාවන් සුරක්ෂිත කිරීමට කැපවීම පෙන්නුම් කරමින් අපගේ ව්‍යාපාර අඛණ්ඩතා යටිතලපහසුකම්වල ඔරොත්තු දීමේ හැකියාව තවදුරටත් වැඩි දියුණු කරයි,

අවදානම් සමාලෝචනය

අනුකූලතා අවදානම

නියාමන අවදානම යනු නීති සහ රෙගුලාසිවල වෙනස්වීමක් ආරක්ෂාව, ව්‍යාපාරය, අංශය හෝ වෙළෙඳපොල කෙරෙහි සැලකියයුතු බලපෑමක් කළ හැකි අවදානමයි. අනෙක් අතට. අනුකූලතා අවදානම යනු කර්මාන්තයේ නීති සහ රෙගුලාසි, අභ්‍යන්තර ප්‍රතිපත්ති හෝ නියමිත මනා පරිචයන්ට අනුකූලව ක්‍රියා කිරීමට අපොහොසත් වීමෙන් ඇතිවන දඩවලට නිරාවරණය, මූල්‍ය අහිමිවීම් සහ වැදගත් අලාභ ඇතිවීමේ හැකියාවයි. මෙසේ, නියාමන අවදානම නීති සහ රෙගුලාසිවල වියහැකි වෙනසකට අදාළ වන අතර, අනුකූලතා අවදානම පවත්නා නීති සහ රෙගුලාසි කඩකිරීමට බැංකු ව්‍යාපාරයේ හැකියාවට අදාළ වේ. මෙය නියාමන සම්බාධක, මූල්‍ය දඩුවම්, ව්‍යාපාර මෙහෙයුම්වල බිඳවැටීම්, සහ කීර්තිනාම හානි වලට හේතු විය හැක.

අනුකූලතා භූ දර්ශනය වේගයෙන් වෙනස් වෙමින් පවතින අතර, බැංකුවට අවදානම් උපායමාර්ග, ක්‍රමවේද සහ කාර්යරාමු සංවර්ධනය කර ඒකාබද්ධ කිරීම අවශ්‍ය වේ.

එබැවින්, අනුකූලතා අවදානම ආමන්ත්‍රණය කිරීමට සම්ප්‍රදායික ප්‍රවේශ කෙරෙහි විශ්වාස කිරීම ක්ෂේත්‍රයේ අනුකූලතා පරිසර පද්ධතිවල වැඩිවන විවිධත්වයට අනුව ඵලදායි නොවේ. එමනිසා, අනුකූල වීමේ අවදානම ආමන්ත්‍රණය කිරීමට ඵලදායී පාලන රාමුවක් සමඟ නීති පදනම් ප්‍රවේශයේ සිට අවදානම් පදනම් ප්‍රවේශය දක්වා විතැන්වෙමින් අවදානම් තක්සේරුව සඳහා නවීන සහ නවෝත්පාදන උපාය මාර්ග බැංකුව පිළිගනී.

අනුකූලතා අංශය අනුකූලතා නිලධාරියා විසින් මෙහෙයවන අතර අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව හරහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සෘජුවම වාර්තා කරයි.

2023 වසර තුළ, බැංකුවේ අනුකූලතා සහ නියාමන අවදානම අවම කිරීමට පහත සඳහන් ක්‍රියාමාර්ග ගනු ලැබිය.

- ගනුදෙනු නියාමන යාන්ත්‍රණය සහ ශාඛා මට්ටමේ තොරතුරු අනුව 2006 අංක 6 දරන මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත තුළ දක්වා ඇති පරිදි මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීම, අනාවරණය කිරීම, විමර්ශනය කිරීම සහ නඩු පැවරීම සඳහා පහසුකම් සැලසීම සඳහා මූල්‍ය තොරතුරු ඒකකය (FIU) වෙත සැක සහිත ගනුදෙනු වාර්තා කිරීම
- බැංකුවේ ව්‍යාපාර සහ කටයුතු එහි අධ්‍යක්ෂ මණ්ඩලය සහ ආයතනික කළමනාකාරිත්වය විසින් සිදුකිරීමේදි බලතල බෙදීම සහ වගකීම තිරණය කිරීමට 1988 අංක 33 දරන බැංකු පනතේ 76 (ඒ) (1) වගන්තිය මගින් පවරන ලද බලතල ක්‍රියාත්මක කිරීමේදී ආයතනික පාලනය පිළිබඳ 2007 අංක 12 දරන පනත් නියෝගයට අනුකූලතාව. මෙසේ, බැංකුව මූල්‍ය ස්ථාවරත්වය සහ ඔවුන්ගේ ව්‍යාපාරය කරගෙන යන ආකාරය පවත්වා ගැනීමේ ආරක්ෂාව සහ යහපත්භාවය සහතික කරයි.
- අදාළ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි නිසි කලට සමාලෝචනය කෙරෙන බව සහතික කිරීම.
- බැංකුවේ ශාඛා, අංශ සහ නිෂ්පාදන පිළිබඳ අනුකූලතා තක්සේරු කිරීම් පැවැත්වීම සහ බැංකුවේ සමස්ත අනුකූලතාව තක්සේරු කිරීම
- පුහුණු සැසි ඔස්සේ දැනුවත්භාවය ඇති කිරීම.
- ස්වයංක්‍රිය මුදල් විශුද්ධිකරණ නියාමන පද්ධතිය තුළින් මුදල් විශුද්ධිකරණ කටයුතු හඳුනාගැනීම

නෛතික අවදානම

නෛතික අවදානම මෙහෙයුම් අවදානමෙහි ආවේනික කොටසකි. නෛතික අවදානම යනු ව්‍යාපාරය, එහි සම්බන්ධතා, ක්‍රියාවලි, ක්‍රියාපටිපාටි සහ සේවාවන් පිළිබඳ අවබෝධය නොමැතිකම හෝ වැරදි අවබෝධය, බහු අර්ථතාවය හෝ අදාළ නීති සහ රෙගුලාසිවලට නොසැලකිල්ල තුළින් ඇති විය හැකි මූල්‍ය හෝ කීර්තිනාමය අහිමිවීමේ අවදානමයි.

වැරදි ලියකියවිලි සහ කෙටුම්පත් කිරීමේ අඩුපාඩු හේතුවෙන් ගිවිසුම් බලාත්මක නොකිරීමේ ප්‍රතිඵලයක් ලෙස සිදුවන පාඩු මෙයට ඇතුළත් විය හැකි අතර එමඟින් දඩ, දඬුවම් සහ දඬුවම් අලාභ හෝ වගකීමක් හෝ අලාභයක් ඇති කළ හැකි බැංකුවට එරෙහිව හිමිකම් පෑමක් සිදු කිරීම ඇති කළ හැකිය.

නීත්‍යානුකූල අවදානම් කළමනාකරණය බැංකුවේ මෙහෙයුම් සහ කීර්තිනාමයට හානි කිරීමට පාදක වූ ධාවක හඳුනා ගැනීමේ ක්‍රියාවලියකි. බැංකුවේ නීති අංශය නෛතික අවදානම්වල දැඩිකම අවම කිරීමට කාර්යක්ෂමව සහ ඵලදායීව ප්‍රතිචාර දැක්වීමේදී අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කරයි. නීති අංශය මගින් අදාළ ව්‍යවස්ථාපිත රාමුවට අනුකූලව බැංකුවේ ව්‍යාපාරික මෙහෙයුම් පවත්වන බවට සහ ගිවිසුම්ගත සම්බන්ධතාවන්ට ඇතුළත්වන බවට සහතික කරයි.

නීති අංශය බැංකුවේ නීති අවදානම් උපායමාර්ගකව කළමනාකරණය කිරීමේදී සහභාගි වන අතර අනෙකුත් ව්‍යාපාර අංශ සමඟ සහයෝගයෙන් අනාගත නෛතික අවදානම් සහ ගැටළු හඳුනා ගැනීමට සක්‍රීයව කටයුතු කරමින් බැංකුවේ බැඳියාවන් සුරක්ෂිත කිරීමට ප්‍රමාණවත් සහ සුදුසු අවම කිරීමේ ක්‍රියාමාර්ග යොදා ගන්නා බව සහතික කරයි. නීති අංශය අර්බූද අවස්ථා කළමනාකරණය කිරීමට, පරිපාලිත සමාගම්වලට අදාළ ගැටළුවලට විසඳුම් ලබාදීමට, අයකිරීම් ලබාගැනීමට සහ බැංකුවේ මෙහෙයුම් කෙරෙහි සැලකියයුතු බලපෑමක් ඇති නීතියෙහි සංවර්ධනයන් සැලකිලිල්ලට ගනිමින් අභ්‍යන්තර ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි සංශෝධනයට සහ නීතිමය සහය, මඟපෙන්වීම සහ උපදෙස් ලබා දේ.

පාරිසරික, සමාජීය හා පාලන අවදානම

පාරිසරික සහ සමාජීය අවදානම් යනු ස්වභාවික පරිසරය හෝ ජනතා ප්‍රජාව කෙරෙහි බැංකුවට ඇතිවියහැකි සෘණාත්මක බලපෑම් (ප්‍රත්‍යක්ෂ බලපෑම්) වෙති. එයට කාලගුණික වෙනස ජෛව විවිධත්වය පාරිසරික අංග සහ මානව හිමිකම් සහ ස්ත්‍රිපුරුෂ විවිධත්වය වැනි සමාජ අංග ඇතුළත්ය. පාලනයට ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි, කළමනාකරණ පද්ධති සහ ආයතනික පාලන මනා පරිචයන් තුළින් වගකීම රඳවාගැනීම, දූෂණ විරෝධය, තොරතුරු දැනුම්දීම, මැසිවිලි යාන්ත්‍රණ, බදු සාධාරණත්වය වැනි දෑ ඇතුළත්ය.

අවදානම් සමාලෝචනය

පාරිසරික සහ සමාජීය අවදානම්වල ඵලදායී කළමනාකරණය යනු අහිතකරතා කළමනාකරණය කිරීම සඳහා වඩාහරිත, කාලගුණ හිතකාමී, සමාජීයව ඇතුළත් සහ සදාචාර ව්‍යාපාරික පරිසරය සහතික කිරීමේ තීරණාත්මක අවශ්‍යතාවයකි. එබැවින්, පාරිසරික සහ සමාජීය අවදානම් කළමනාකරණය IRM කාර්ය රාමුවට ඇතුළත් කෙරේ. IRM කාර්ය රාමුව තුළ අනුකූලතා අවදානම් කළමනාකරණය තුළ පාලන අවදානම කළමනාකරණය කෙරේ. එබැවින් බැංකුව තිරසාර ආකාරයෙන් ව්‍යාපාර කටයුතු හඳුනාගෙන සංවර්ධනය කිරීමට උත්සාහ දරන අතර තිරසාර වැඩසටහන්වලට සහයවීමට නවෝත්පාදන මූල්‍ය විසඳුම් සංවර්ධනය කරනු ලබයි.

කාලගුණ විපර්යාසවලින් හෝ කාලගුණ විපර්යාස අවම කිරීමේ උත්සාහයන් තුළින් ඇතිවන විභව අවදානම්, ඒවායේ ආර්ථික බලපෑම් සහ ඒවායේ ආර්ථික මෙහෙයුම් සහ මූල්‍යමය ප්‍රතිවිපාක කාලගුණයට අදාළ මූල්‍ය අවදානම් ලෙස සලකා බැලිය හැකිය.

බැංකුව කාලගුණ විපර්යාස හා බැඳුණු මූල්‍ය සහ මෙහෙයුම් අවදානම් හඳුනාගෙන කළමනාකරණය කිරීමට IRMF වෙත කාලගුණ අවදානම් කළමනාකාරණය ඇතුළත් කර ඇත. වසර තුළ, බැංකුව අවදානම් අභිරුචි සීමාවන් තුළ බලපෑම් කළමනාකරණය කිරීමට ප්‍රවේශය තීරණය කිරීමට කාලගුණ අවදානම්වල බලපෑම හඳුනා ගැනීමට ක්‍රියාදාම විශ්ලේෂණ අභ්‍යාසය පවත්වන ලදී.



කීර්තිනාම අවදානම

කීර්තිනාම අවදානම යනු බැංකුවේ කටයුතු, ව්‍යාපාර පරිචයන්, නිෂ්පාදන සේවා යනාදිය පිළිබඳ සෘණාත්මක පාර්ශ්වකාර හැඟීමක් හේතුවෙන් සන්නාම වටිනාකම කෙරෙහි අහිතකර බලපෑමේ අවදානමයි. අහිතකර කීර්තිනාමය බැංකුවට වියදම් ඇති කරන අතර බාහිර තත්ත්වයන් ඉපයීම් හා වත්කම් කෙරෙහි බලපායි. එබැවින්, බැංකුවේ කීර්තිනාම අවදානම කළමනාකරණය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකරණය සක්‍රීය ක්‍රියාමාර්ග ගනී.

බැංකුව විස්තීර්ණ පාලන රාමුව තුළ ක්‍රියාත්මක වන අතර නියාමකයින් සහ වෙනත් බලධාරීන් විසින් පනවන ලද නීති, උපදෙස් සහ මාර්ගෝපදේශවලට අනුකූල වේ. බැංකුවේ සෑම සේවා කාර්යයක්ම සන්නාම වටිනාකමේ සහ බැංකුවේ කීර්තිනාමයේ ආරක්ෂකයෙක් ලෙස කටයුතු කරයි. කීර්තිනාම අවදානම ගනුදෙනුකාර අත්දැකීමක් දිරිගන්වමින් සහ ගනුදෙනුකාර පක්ෂපාතිත්වය ප්‍රවර්ධනය කරමින් ක්‍රියාත්මක ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි, අභ්‍යන්තර පාලනයන් සහ වෙනත් අවදානම් කළමනාකරණ මනා පරිචයන් තුළින් කළමනාකරණය කෙරේ. අලෙවිකරණ අංශය ගැටළු ක්ෂේත්‍ර කඩිනමින් ආමන්ත්‍රණය කරමින් සමාජ මාධ්‍ය ඇතුළුව සියලුම මාධ්‍ය ප්‍රකාශකයින් සමීපව නියාමනය කරයි.

කීර්තිනාම අලාභ සඳහා ශූන්‍ය අවදානම් අභිරුචියක් බැංකුව සතුවේ. ආරක්ෂාවේ දෙවන මාර්ගයේදී, අවශ්‍ය අවදානම් කළමනාකරණ ක්‍රියාමාර්ග සඳහා කළමනාකරණය කාලීනව දැනුවත් කිරීමට අවදානම් කළමනාකරණ අංශය කීර්තිනාම අවදානම සමීපව නියාමනය කරනු ලබයි.

අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය තක්සේරු කිරීමේ ක්‍රියාවය තුළ කීර්තිනාම අවදානම තක්සේරු කිරීමට ලකුණු කාඩ්පතක් පදනම් ආකාතියක් භාවිතා කෙරේ.

උපායමාර්ගික අවදානම

උපායමාර්ගික අවදානම යනු අපේක්ෂිත ප්‍රතිඵල ලබා නොදීමේ අවදානම වන අතර එයට බැංකුවේ නුවුන්බත් දර්ශකවලට හානි ඇති කළ හැකිය. අහිතකර ආර්ථික තත්ත්වයන්, වෙනස්වන තරඟකාරී වාතාවරණය, ගනුදෙනුකාර මනාපය තුළ වෙනස්වීම්, තාක්ෂණික වෙනස්වීම් හෝ දුර්වල කළමනාකරණය හේතුවෙන් මෙම අවදානම මතුවිය හැකිය.

බැංකුව අභ්‍යන්තර සහ බාහිර පරිසරය, තරඟකාරී හැසිරීම, සහ ගනුදෙනුකාර ප්‍රවනතා සහ තාක්ෂණික සංවර්ධනයන් තුළ වෙනස්වීම් සලකා බලමින් බැංකුවේ දැක්ම, මෙහෙවර, සහ අවදානම් අභිරුචිය සමඟ පෙළ ගැසෙමින් උපායමාර්ගික අවදානම් කළමනාකරණය කිරීමට ජ්‍යෙෂ්ඨ කළමනාකරණයේ නියාමනය සමඟින් අධ්‍යක්ෂ මණ්ඩලයේ පාලනය සමඟ උපායමාර්ගික ව්‍යාපාර සැලැස්ම සකස් කරයි.

අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය තක්සේරු කිරීමේ ක්‍රියාවලිය තුළ උපායමාර්ගික අවදානම තක්සේරු කිරීමට ලකුණු කාඩ්පතක් පදනම් ආකාතියක් භාවිතා කෙරේ.

ප්‍රාග්ධන කළමනාකරණය

නියාමන ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම, එහි තැන්පත්කරුවන්/ණය හිමියන් වෙත මූල්‍ය සුරක්ෂිතතාව සැපයීම, අනාගත ව්‍යාපාරික පුළුල් කිරීම් සඳහා ඉඩ හසර පවත්වාගැනීම සහ එහි පාර්ශ්වකරුවන් වෙත ප්‍රමාණවත් ආදායමක් උත්පාදනය කිරීම සඳහා බැංකුව විසින් ශක්තිමත් ප්‍රාග්ධන තත්ත්වයක් පවත්වාගනු ලැබීම අත්‍යාවශ්‍ය වේ.

පාර්ශ්වකරුවන්ට ලැබීම් උත්පාදනය කරන අතරතුර බැංකුව සතු හැකියාව සහතික කිරීම ප්‍රාග්ධන කළමනාකරණයෙන් සිදු කෙරේ.

එබැවින්, කාර්යසාධනය සහ අවදානම අතර ප්‍රශස්ත තුළනයක් අත්කරගනිමින් සහ වත්කම මත බරතැබූ අවදානම් මුසුව සහ අවදානම් පැතිකඩෙහි වෙනස්කම් දැඩිව නිරීක්ෂණය කිරීම ඔස්සේ ප්‍රාග්ධනය වඩා ඵලදායී ලෙස කළමනාකරණය කරගැනීමට බැංකුව උත්සාහ ගනී. බැංකුවේ ප්‍රාග්ධන කළමනාකරණ ක්‍රියාවලිය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ වලට අනුකූල වේ.


අවදානම් සමාලෝචනය

බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා බාසල් III යටතේ ප්‍රාග්ධන අවශ්‍යතා පිළිබඳ 2019 අංක 11 දරන බැංකු පනත් නියෝගය පරිදි, 40 වගුවේ විස්තර කරන පරිදි අවම ප්‍රාග්ධන අනුපාත පවත්වාගෙන යාම අවශ්‍ය වේ. 2023 වසර සඳහා නියාමන අවම ප්‍රාග්ධන මට්ටමට වඩා ඉහළින් ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව පවත්වා ගැනීමට බැංකුව සමත්විය. වසර තුළ CET1 අනුපාත තත්ත්වය 2022 දෙසැම්බර් 31 දිනට පැවති 14.36% සිට 2023 දෙසැම්බර් 31 දිනට 15.33% දක්වා වැඩිවිය. බැංකුවේ Tier 1 ප්‍රාග්ධන අනුපාතය 2023 දෙසැම්බර් 31 දිනට 16.91% දක්වා වැඩිවිය. මුළු ප්‍රාග්ධන අනුපාතය 2022 දෙසැම්බර් 31 දිනට පැවති 18% ට සාපේක්ෂව 2023 දෙසැම්බර් 31 දිනට 19.26% දක්වා වැඩි විය.

සමූහයේ මුළු ප්‍රාග්ධන අනුපාතය 2022 දී පැවති 19.96% ට සාපේක්ෂව 2023 දී 22.24%ක් විය. 100%ක් රජයට අයත් ඉතුරුම් බැංකුවක් ලෙස, බාහිරින් නියාමන ප්‍රාග්ධනය වැඩි කිරීමට ඇති විකල්ප සීමිත වේ. එබැවින්, රඳවාගත් ඉපයීම් බැංකුවේ ප්‍රාග්ධනය වැඩි කිරීමේ එකම ප්‍රධාන මූලාශ්‍රය වේ. කෙසේවෙතත්, ප්‍රාග්ධනය වැඩි කිරීමට රඳවාගත් ඉපයීම්වල දායකත්වය 2022 වසරේ රු.බි. 2.5ට සාපේක්ෂව 2023 වසරේ රු.බි. 7.2කි.

ප්‍රාග්ධන මට්ටම – බැංකුව හා සමූහය

ප්‍රස්ථාරය 75



අනුපාත (%)	නියාමන අවමය	2023 දෙසැම්බර් 31 සත්‍ය අගය		2022 දෙසැම්බර් 31 සත්‍ය අගය	
		බැංකුව	සමූහය	බැංකුව	සමූහය
CET 1 අනුපාතය (+ CCB)	7.00	**15.33**	**18.39**	14.36	16.49
Tier 1 අනුපාතය (+ CCB)	8.50	**16.91**	**19.94**	15.78	17.90
මුළු ප්‍රාග්ධන අනුපාතය	12.50	**19.26**	**22.24**	18.00	19.96

වගුව 40 → ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාත

බැංකුව බාසල් කුළුණු I සහ කුළුණු II ආවරණය කිරීමට සහ පීඩන පරීක්ෂණ ස්වාරක්ෂකයක් ලෙස නියාමන අවම ප්‍රාග්ධන අතිරික්තයක ප්‍රාග්ධනය පවත්වා ගැනීමට අපේක්ෂා කරයි. පීඩන තත්ත්වයන් යටතේ ප්‍රාග්ධන අවශ්‍යතාව තක්සේරු කිරීමට පවත්නා සහ පුරෝකථනය කළ අවදානම් ක්ෂේත්‍ර පිළිබඳව පීඩන පරීක්ෂණය පවත්වනු ලැබේ.

අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව තක්සේරු කිරීමේ ක්‍රියාවලිය (ICAAP)

බැංකුවේ අවදානම් අභිරුචිය සමඟ එකඟවන අභ්‍යන්තර ප්‍රාග්ධන මට්ටම සහතික කිරීමට වඩාත් තාර්කික ආකාරයෙන් ව්‍යාපාර කාර්යසාධනය, අවදානම් කළමනාකරණ ක්‍රියාමාර්ග සහ අවදානම් සංවේදී ප්‍රාග්ධනය ICAAP විසින් ඒකාබද්ධ කරයි. BIRMC තුළින් අධ්‍යක්ෂ මණ්ඩලයේ පාලන වගකීම සමඟ සියලුම වැදගත් අවදානම් ග්‍රහනය කර ගැනීමට යහපත් අවදානම් කළමනාකරණ රාමුවත් සමඟ ICAAP විසින් අවදානම් අභිරුචිය, පීඩන පරීක්ෂණය සහ ප්‍රාග්ධනය සැලසුම් කිරීමේ සංකල්පය සම්බන්ධ කරයි. මෙම ක්‍රියාවලිය RMD විසින් විස්තරාත්මකව ලේඛනගත කරයි.

අධීක්ෂණ සමාලෝචන ක්‍රියාවලිය සහ ජාත්‍යන්තර මනා පරිචයන් පිළිබඳ බැංකුවලට නිකුත් කර ඇති බාසල් III කුළුණු II මාර්ගෝපදේශ පිළිබඳ මහ බැංකුවේ උපදෙස්වලට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත ICAAP ප්‍රතිපත්තිය පරිදි ICAAP පවත්වා ලියවිල්ල සකස් කරනු ලබයි.

බැංකුවේ ICAAP මූලධර්ම හතරකින් පාලනය කරන අතර ඒවා බැංකුව සහ නියාමක සඳහා වැදගත් වේ. ඒ අනුව, ප්‍රාග්ධන මට්ටම්වලට ICAAP සම්බන්ධ කෙරෙන අතර නියාමන අවමයේ අතිරික්තයක ප්‍රාග්ධනය රඳවා ගැනීමට අපේක්ෂා කෙරේ.

අවදානම් තක්සේරු කිරීම් කුළුණු 1 සහ කුළුණු 11 අවදානම් ග්‍රහනය කරයි. අවදානම් අභිරුචි සීමා ප්‍රාග්ධනය අවශ්‍යතා සලකා බලමින් නිරන්තර පදනමක් මත ප්‍රාග්ධන මට්ටම් නියාමනය ඇති කිරීමට සකස් කෙරේ.

ආතති පරීක්ෂාව

ආතති පරීක්ෂාව අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය තක්සේරු කිරීමේ ක්‍රියාවලියේ අත්‍යවශ්‍ය කොටසකි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ආතති පරීක්ෂාව පිළිබඳ ප්‍රතිපත්තිය සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ මගින් බැංකුවේ ආතති පරීක්ෂාව පිළිබඳ කාර්යරාමුව පාලනය කෙරේ. එයට ණය අවදානම, වෙළෙඳ පොතේ සහ බැංකු පොතේ පොලී අනුපාත අවදානම, මෙහෙයුම් අවදානම, ද්‍රවශීලතා අවදානම, සංකේන්ද්‍රණ අවදානම සහ ශේෂවූ ණය අවදානම වැනි සියළුම ප්‍රමාණාත්මක අවදානම් පිළිබඳ ආතති පරීක්ෂාවන් ඇතුළත් වේ. ආතති පරීක්ෂා අරමුණු සඳහා බැංකුව ඉහළයන සීඝ්‍රතා මට්ටම් තුනක් එනම් සුළු, මධ්‍ය සහ විශාල (හෝ පහළ, මධ්‍යම සහ ඉහළ) නිර්වචනය කර ඇත.

බැංකුව ක්‍රියාත්මක වන පරිසරය තුළ සිදුවන අහිතකර ආර්ථික, දේශපාලනික සහ භෞතික වෙනස්කම් යටතේ ඇති විය හැකි විවිධ සීඝ්‍රතා සහිත අනපේක්ෂිත තත්ත්වයන් දරාගැනීම සඳහා බැංකුව සතු හැකියාව පිළිබඳ අවබෝධයක් ආතති පරීක්ෂාව මගින් ලබා දේ

පොලී අනුපාත, විදේශ විනිමය අනුපාත සහ ස්කන්ධ මිල ඇතුළු විශේෂ උපකරණ හෝ කළඹ කෙරෙහි තනි තනි වෙළෙඳපොල සාධකවල විචලනවල බලපෑම මැනීම සඳහා බැංකුව විසින් සංවේදිතා විශ්ලේෂණය භාවිත කරනු ලබයි. අහිතකර පොලී අනුපාත විචලන හේතුවෙන් වෙළෙඳ හෝ බැංකු පොත මත ඇතිවන බලපෑම හඳුනාගැනීම සඳහා බැංකුව ප්‍රධාන වශයෙන් සංවේදිතා විශ්ලේෂණය භාවිත කරන අතර, නිරන්තර පදනමක් මත ALCO වෙත වාර්තා ඉදිරිපත් කෙරේ.

අවදානම් සමාලෝචනය

මෙම වාර්තා වත්කම් හා වගකීම් කළමනාකරණය තුළ මෙන්ම බැංකුවේ මිල තීරණය කිරීම සඳහා තීරණාත්මක වේ.

රු. මිලියන	FVPL	FVOCI	එකතුව
2023 වසර සඳහා උපලබ්ධි නොවූ ලාභය/අලාභය	**77**	**1,922**	**1,999**
අනුපාත කම්පන		M2M වටිනාකමේ වෙනස	
ආදායමේ 100 bps ඉහළයාම	(90.3)	(111.4)	(201.7)
ආදායමේ 200 bps ඉහළයාම	(177.9)	(222.3)	(400.2)
ආදායමේ 100 bps පහළයාම	93.0	112.0	205.0
ආදායමේ 200 bps පහළයාම	188.8	224.6	413.4

වගුව 41 → සංවේදිතා විශ්ලේෂණය - වෙළෙඳ කළඹෙහි රජයේ සුරැකුම්පත්වල පොළී අනුපාත

1 සෘණ පරතරය මත 100bp කම්පන අනුපාතිකය		මාස 1 දක්වා	මාස 1-3	මාස 3-6	මාස 6-12	අවුරුදු 1-3	අවුරුදු 3-5	අවුරුදු 5ට වැඩි	එකතුව
ස්වාධීන මට්ටම	පරතරය	(194,547)	(459,058)	(245,940)	(111,511)	334,968	295,483	358,134	(22,471)
	NII මත බලපෑම (රු. මිලියන)	(1,871)	(3,836)	(1,550)	(290)				(7,547)
ඒකාබද්ධ මට්ටම	පරතරය	(209,346)	(464,634)	(240,733)	(113,999)	336,441	301,176	358,375	(32,720)
	NII මත බලපෑම (රු. මිලියන)	(2,013)	(3,883)	(1,517)	(297)				(7,709)

වගුව 42 → සංවේදිතා විශ්ලේෂණය: බැංකු කළඹ තුළ ඵලදායී වතු අවදානම තක්සේරු කිරීම

පිඩන පරීක්ෂණ අභ්‍යාසයෙන් ලබාගත් ප්‍රතිඵල සක්‍රීය තීරණ ගැනීමට සහයවීම සඳහා භාවිතා කෙරේ. සීමා සැකසීම (අවදානම් අභිරුචිය සහ අවදානම් සීමා), ප්‍රාග්ධනය සැලසුම් කිරීම, උපායමාර්ගික ව්‍යාපාර සැලසුම් කිරීම, සහ තිරණාත්මක ව්‍යාපාර මෙහෙයුම්වල අවදානම් කළමනාකරණය කිරීමට භාවිතා කෙරේ.

අවදානම් ක්ෂේත්‍රය	ක්‍රියාදාමය	විවිධ ආතති මට්ටම්වලදී ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතිකය වෙත බලපෑම %		
		පහළ	මධ්‍යම	ඉහළ
ණය අවදානම	ණය අවදානම –PD හි වැඩිවීම			
	10% කින්	-0.39		
	20% කින්		-0.74	
	30% කින්			-1.15
වෙළෙඳපොල අවදානම	පොලී අනුපාත අවදානමථ වෙළෙඳපොල ඉපයීම්වල වැඩිවීම			
	පහළ 50bps	-0.01		
	මධ්‍යස්ථ 100bps		-0.03	
	ඉහළ 200bps			-0.06
	ස්කන්ධ මිල අවදානමථ වෙළෙඳපොල මිලගණන්වල අඩුවීම			
	පහළ 10%	-0.02		
	මධ්‍යස්ථ 20%		-0.13	
	ඉහළ 30%			-0.23
	විදේශ විනිමය අවදානම :රුපියල අවප්‍රමාණයවීම			
	පහළ 10%	-0.023		
	මධ්‍යස්ථ15%		-0.035	
	ඉහළ 20%			-0.046
මෙහෙයුම් අවදානම	බාසල් II අලාභ ජනිත කරන සිදුවීම් කාණ්ඩය යටතේ වර්ගීකරණය කරන ලද මෙහෙයුම් අලාභවල	-0.027	-0.039	-0.054

වගුව 43 → විවිධ පීඩන මට්ටම්වලදී සහ ප්‍රාග්ධනය ප්‍රමාණාත්මතාවයට බලපෑම

අවම අනාවරණ අවශ්‍යතා – Pillar III

වෙළෙඳපොළ තුළ ක්‍රියාත්මක වන පාර්ශ්වයන්ට බැංකුවේ ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය සහ අවදානම් නිරාවරණ පිළිබඳව තක්සේරු කරගැනීමට අවස්ථාව ලබාදීම පිණිස බාසල් III කාර්යරාමුවේ සීමා තුළ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවම හෙළිදරව් කිරීමේ අවශ්‍යතා හඳුන්වා දෙන ලදී. 2016 අංක 01 දරණ බැංකු පනත ප්‍රකාරව අවම හෙළිදරව් කිරීමේ අවශ්‍යතා සඳහා පිටු අංක 420 සිට 431 දක්වා බලන්න.


PATENT
MADE
IN
ENGLAND

සංයුක්තය

මූල්‍ය වාර්තා

මූල්‍ය දින දර්ශනය
216

අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව
217

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම සම්බන්ධ ප්‍රකාශය
223

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය
224

අභ්‍යන්තර පාලනය පිළිබඳ ස්වාධීන සහතිකවීමේ වාර්තාව
226

සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීගේ සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීගේ වගකීම පිළිබඳ ප්‍රකාශය
227

විගණකාධිපති වාර්තාව
228

මූල්‍ය ප්‍රකාශනවල අන්තර්ගතය
231

ආදායම් ප්‍රකාශය
232

විස්තීරණ ආදායම් ප්‍රකාශය
233

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය
234

හිමිකමේ වෙනස්වීමේ ප්‍රකාශය
236

මුදල් ප්‍රවාහ ප්‍රකාශය
240

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්
242

මූල්‍ය දින දර්ශනය

මූල්‍ය දින දර්ශනය 2023

2023 මාර්තු 31 දිනෙන් අවසන් කාර්තුව සඳහා අතුරු මූල්‍ය වාර්තා ප්‍රකාශයට පත් කිරීම	2023 මැයි 31
2023 ජූනි 30 දිනෙන් අවසන් කාර්තුව සඳහා අතුරු මූල්‍ය වාර්තා ප්‍රකාශයට පත් කිරීම	2023 අගෝස්තු 31
2023 සැප්තැම්බර් 30 දිනෙන් අවසන් කාර්තුව සඳහා අතුරු මූල්‍ය වාර්තා ප්‍රකාශයට පත් කිරීම	2023 නොවැම්බර් 30
2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාර්තුව සඳහා මූල්‍ය වාර්තා (විගණනය කළ) ප්‍රකාශයට පත් කිරීම	2024 මාර්තු 28

යෝජිත මූල්‍ය දින දර්ශනය 2024

2024 මාර්තු 31 දිනෙන් අවසන් කාර්තුව සඳහා අතුරු මූල්‍ය වාර්තා ප්‍රකාශයට පත් කිරීම	2024 මැයි 31
2024 ජූනි 30 දිනෙන් අවසන් කාර්තුව සඳහා අතුරු මූල්‍ය වාර්තා ප්‍රකාශයට පත් කිරීම	2024 අගෝස්තු 30
2024 සැප්තැම්බර් 30 දිනෙන් අවසන් කාර්තුව සඳහා අතුරු මූල්‍ය වාර්තා ප්‍රකාශයට පත් කිරීම	2024 නොවැම්බර් 29
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාර්තුව සඳහා අතුරු මූල්‍ය වාර්තා (විගණනය කළ) ප්‍රකාශයට පත් කිරීම	2025 මාර්තු 31



අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

1. සාමාන්‍ය කරුණු

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත සහ එහි සංශෝධනවල අවශ්‍යතාවන්ට අනුකූල වෙමින් 2023 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා බැංකුවේ කටයුතු පිළිබඳ ඒකාබද්ධ වාර්ෂික වාර්තාව සමඟ බැංකුවේ සහ සමූහයේ විගණනය කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සහ දිවිගණකාධිපතිවරයාගේ වාර්තාව ඉදිරිපත් කරන්නේ සතුටිනි. මෙම වාර්තාවට 1988 අංක 30 දරන බැංකුකරණ පනත සහ එයට සිදුකළ සංශෝධන සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා සංස්ථාපිත පාලනය පිළිබඳ නිකුත් කරන ලද 2007 අංක 12 දරණ බැංකු පනත් නියමයේ උපදෙස් යටතේ අවශ්‍ය යම් හෙළිදරව් කිරීම් ද එයට පසුකාලීන සංශෝධන ද ඇතුළත් වේ. වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කරන ලද අතර 2024 මාර්තු 20 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදි.

ජාතික ඉතිරිකිරීමේ බැංකුව 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතින් ශ්‍රී ලංකාවේදී සංස්ථාපිත කරන ලද අතර 1988 අංක 30 දරන බැංකු පනත සහ එයට සිදුකළ සංශෝධන ප්‍රකාරව බලපත්‍රලාභී විශේෂිත බැංකුවක තත්ත්වය පිරිනමන ලදී. බැංකුව ශ්‍රී ලංකා රජයට සම්පූර්ණයෙන්ම අයත් වේ. බැංකුවට ලංකා රේටින්ග් ආයතනය විසින් AAA (ස්ථාවර) දිගුකාලීන ණය ශ්‍රේණිගත කිරීම් ලබා දී ඇත.

2. ව්‍යාපාර සමාලෝචන

2.1 බැංකුවේ ප්‍රධාන ක්‍රියාකාරකම්

වසර තුළ බැංකුවේ ප්‍රධාන ක්‍රියාකාරකම් වූයේ 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත සහ එහි සංශෝධන මගින් බලය පවරන ලද ශ්‍රී ලංකාවේ ජනතාව අතර ඉතුරුම්, පාරිභෝගික බැංකුකරණය, ආයතනික බැංකුකරණය, වෙළඳ මූල්‍යකරණය, ප්‍රාථමික ගනුදෙනු, වෙනත් භාණ්ඩාගාර ගනුදෙනු සහ නියෝජිත බැංකුකරණය සහ මුදල් ප්‍රේෂණ පහසුකම්, උකස් ණය, විදේශ විනිමය ගනුදෙනු සහ අනෙකුත් මූල්‍ය සේවා ප්‍රවර්ධනය කිරීමයි.

2.2 දැක්ම, මෙහෙවර සහ වටිනාකම්

බැංකුවේ දැක්ම, මෙහෙවර සහ අගයන් මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 8 හි සඳහන් කර ඇත. සියලු ස්ථිර සේවකයන් බැංකුවේ දැක්ම සහ මෙහෙවර කරා ලඟා වීමේ දැක්මෙන් යුතුව බැංකුවේ ආයතනික චර්යාධර්ම සංග්‍රහයට සහ රජයේ ප්‍රතිඥාවට අනුකූලව කටයුතු කරයි.

2.3 රජයේ සහතික වීම

ශ්‍රී ලංකා රජය, බැංකුවේ තැන්පත් කළ මුදල් සමග පොලී මුදල් ආපසු ගෙවීමට සහතික වෙයි.

2.4 බැංකුවේ පරිපාලිත සමාගම්

එන්එස්බී අරමුදල් කළමනාකරණ සීමිත සමාගම සහ ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව සම්පූර්ණයෙන්ම අයත් පරිපාලිත සමාගම් වේ. එන්එස්බී අරමුදල් කළමනාකරණ සීමිත සමාග මේ ප්‍රධාන ක්‍රියාකාරකම වන්නේ ශ්‍රී ලංකා මහ බැංකුවෙහි බලයලත් ප්‍රාථමික ගනුදෙනුකරුවෙකු ලෙස රජයේ සුරැකුම්පත් වෙළඳාම් කිරීමය.

ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුවේ ප්‍රධාන ක්‍රියාකාරකම වන්නේ ඉතිරිකිරීම් හා කාලීන තැන්පතු ලබා ගැනීම, ණය ලබාදීම, කල්බදු, කුලීපිට ගැණුම්, උකස් ණය සහ වෙනත් ණය පහසුකම් සැපයීම සහ ප්‍රමුඛ ඉතුරුම් සහ සංවර්ධන බැංකුවේ ණය ගිණුම් ප්‍රතිනිර්මාණය කිරීමත් සමග පැහැර හරින ලද තැන්පතු වගකීම් පියවීමයි.

ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුවේ වත්කම්, වගකීම් සහ කාර්ය මණ්ඩලය අවශෝෂණය කර ගැනීමට බැංකුව එකඟවන ලදී. 2024 මාර්තු 31 දිනට ප්‍රථම අවශෝෂණ ක්‍රියාවලිය සම්පූර්ණ කරන මෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ අංශයේ අධ්‍යක්ෂ සිය 2024 ජනවාරි 11 දිනැති ලිපිය මගින් දන්වා ඇත. ඒ අනුව ජාතික ඉතිරිකිරීමේ බැංකුව සහ ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව විසින් සම්පාදිත කාලරාමු සහිත ක්‍රියාකාරී සැලසුමක් බැංකු පිළිබඳ අධීක්ෂණ අධ්‍යක්ෂ වෙත යවනු ලැබිණි.

පිටු අංක 294 හි මූල්‍ය ප්‍රකාශන 24 සටහනෙහි ගනුදෙනු පිළිබඳ විස්තර දක්වා ඇත.

2.5 සමූහයේ ව්‍යුහයට වෙනස් කිරීම්

බැංකුවෙහි සහ සමූහයෙහි ප්‍රධාන ක්‍රියාකාරකම්වල ස්වභාවයේ සැලකිය යුතු වෙනස්කම් සිදු නොවීය.

2.6 වසරේ ව්‍යාපාර කාර්යසාධනය සමාලෝචනය

2023 මූල්‍ය වර්ෂය සඳහා බැංකුවේ සහ සමූහයේ සමස්ත මූල්‍ය කාර්ය සාධන සමාලෝචනය සභාපතිතුමාගේ පණිවිඩයේ (පිටු අංක 14) සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරිගේ සමාලෝචනයේ (පිටු අංක 18) තුළ දක්වා ඇත.

පිටු අංක 96 සිට 150 දක්වා කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන (පිටු අංක 232 - 385) මගින් බැංකුවේ ප්‍රධාන ව්‍යාපාර මාර්ග සහ කටයුතුවල තත්ත්වය පිළිබඳ විස්තීර්ණ සහ සාධාරණ සමාලෝචනයක් සපයයි. මෙම වාර්තා වාර්ෂික වාර්තාවෙහි සංකලිත කොටසකි.

2.7 ශාඛා ජාලය පුළුල් කිරීම

රටේ පැවති ආර්ථික අර්බුදය හේතුවෙන්, මුදල් අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශවලට අනුකූලව ප්‍රාග්ධන වියදම සම්පූර්ණයෙන් නියාමනය කරන ලදී. ඒ අනුව, වර්ෂය තුළ ශාඛා ජාලයට නව ශාඛා එක් නොකරන ලදී. වර්ෂය අවසානයේ දී බැංකුව සතු ශාඛා ජාලය ශාඛා 262 ක් විය. පාරිභෝගික පහසුව වැඩි දියුණු කරමින් ATM/CRM ජාලය තවදුරටත් පුළුල් කරන ලදී. බැංකුව වසර තුළ දිවයින පුරා නව CRM යන්ත්‍ර 25ක් සහ නව ATM යන්ත්‍ර 2 ක් ස්ථාපනය කරමින් ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ පාරිභෝගිකයන්ට ගනුදෙනු කළ හැකි අනෙකුත් බැංකුවල සාමාන්‍ය ATM යන්ත්‍ර හැර මුළු ATM/CRM යන්ත්‍ර ගණන 417 ක් දක්වා වැඩි කරන ලදී.

2.8 මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම

මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (SLFRSs/LKASs) සහ 1988 අංක 30 දරණ බැංකු පනතේ සහ එයට වූ සංශෝධනවල අවශ්‍යතා සහ විශේෂිත අනාවරණයන් ඇතුළුව නියාමන අවශ්‍යතාවයන්ට අනුකූලව, පිළියෙල කර ඇත. 2023 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා බැංකුවේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශයන් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී විසින් විධිමත්ව සහතික කරන ලද අතර, සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරී සහ බැංකුවේ සභාපති ඇතුළු ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂකවරුන් දෙදෙනෙක් විසින් අනුමත කර අත්සන් කරන ලද පිටු අංක 232 - 235 හි සඳහන් එය, බැංකුවේ වාර්ෂික වාර්තාවෙහි සංකලිත කොටසකි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

2.8.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වසර තුළ වෙනස් වීම්

බැංකුව සහ සමූහය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රී.ල.මූ.වා.ප්‍ර/ශ්‍රී.ල.ගි.ප්‍ර.) අනුකූලව එහි මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇත. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදාගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මෙම වාර්තාවේ පිටු අංක 242 සිට 258 දක්වා ඇතුළත් වේ. සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ බැකුවේ සහ සමූහයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල කිසිදු වෙනසක් සිදු නොවීය.

2.9 මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම්

2023 දෙසැම්බර් 31 වන දිනට බැංකුවේ කටයුතුවල තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵල පිළිබඳ සාධාරණ දැක්මක් පිළිබිඹු කරන මූල්‍ය ප්‍රකාශනයන් පිළියෙළ කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ. පිටු අංක 232 සිට 385 දක්වා වූ පිටුවල දැක්වෙන මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී.ල.මූ.වා.ප්‍ර/ ශ්‍රී ල.ගි.ප්‍ර.) සහ 1988 අංක 30 දරණ බැංකු පනත සහ එහි සංශෝධන සහ 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතෙහි අවශ්‍යතාවලට අනුකූලව පිළියෙළ කර ඇති බව අධ්‍යක්ෂවරු විශ්වාස කරති. මෙම වාර්ෂික වාර්තාවේ 233 පිටුවේ දැක්වෙන මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් ප්‍රකාශය මගින් මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් සවිස්තරාත්මකව පැහැදිලි කරන අතර, එය අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාවෙහි සංකලිත කොටසකි.

2.10 විගණකවරුන්ගේ වාර්තාව

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ 154 වන වගන්තියේ විධිවිධාන වලට අනුකූලව විගණකාධිපතිවරයා ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ විගණකාධිපතිවරයා වන්නේය. 2023 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවල සහ සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන විගණනය විගණකාධිපතිවරයා විසින් සිදු කරන ලදී.

තවද, විණනකාධිපතිවරයා විසින් බැංකුවේ පරිපාලිත සමාගම් වන එන්එස්බී අරමුදල් කළමනාකරණ සමාගම සහ ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව විගණනය කරන ලදී. 2023 වසර පුරාවටම, බැංකුව සඳහා විගණනය කරගෙන යන ලදී.

ඔවුන්ගේ වාර්තාවල හඳුනා ගන්නා ලද ගැටළු කඩිනම් ක්‍රියාමාර්ග සඳහා නිරන්තරව කළමනාකරණය වෙත ඉදිරිපත් කරන ලදී. මූල්‍ය වාර්තාකරණයේ නිවැරදි බව තහවුරු කර, මූල්‍ය ප්‍රකාශන අවශ්‍ය දත්ත සහ තොරතුරු සහිතව විගණකාධිපතිගේ පරීක්ෂාව සඳහා ලබා දෙන ලදී. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ මතය මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 228 පිටුවේ අන්තර්ගත වේ.

3. ඉදිරි සංවර්ධනයන්

බැංකුවේ අනාගත සංවර්ධනයන් පිළිබඳ සමාලෝචනයක් සභාපතිතුමාගේ පණිවිඩයෙහි (පිටු අංක 17), සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරීගේ සමාලෝචනයෙහි (පිටු අංක 22) සහ කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණයෙහි පිටු අංක 96 සිට 150 දක්වා පිටුවල 2023 ඒකාබද්ධ වාර්ෂික වාර්තාවේ දක්වා ඇත.

4. දළ ආදායම

2023 දී බැංකුවේ දළ ආදායම රු. මිලියන 232,064 ක් (2022 - රු. මිලියන 174,530) වූ අතර සමූහයේ ආදායම රු. මිලියන 238,825ක් (2022 - රු. මිලියන 174,977) ක් විය. දළ ආදායම්වල විශ්ලේෂණය මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 3 හි දක්වා ඇත. බැංකුවේ දළ ආදායම සමූහයේ දළ ආදායමෙන් 97.2%ක් (2022 -99.7%) විය. බැංකුවේ සහ සමූහයේ ප්‍රධාන ආදායම පොළී ආදායම වන අතර එය පිළිවෙලින් 97.8% (2022 - 99.1%) සහ 96.8% (2022 - 100.4%) සමන්විත වේ.

5 ලාභාංශ සහ සංචිත

5.1 මූල්‍ය ප්‍රතිඵල සහ විසර්ජනයන්

බැංකුවෙහි සහ සමූහයෙහි ආදායම් බදුවලට පෙර ලාභය පිළිවෙළින් මිලියන 4,287 ක් සහ රු.මිලියන 8,022 (2022-රු. මිලියන 4,510 ක් සහ සහ රු. මිලියන 2,340) ක් විය.

බැංකුවෙහි සහ සමූහයෙහි බදුවලට පසු ලාභය පිළිවෙළින් රු. මිලියන 7,216 ක් සහ රු. මිලියන 9,617 ක් (2022 රු. මිලියන 2,530 ක් සහ රු.මිලියන 949 ක්) විය. බැංකුවට අදාළ ලාභවල විස්තර පහත වගුවෙහි දී ඇත.

	2023 රු. මිලියන	2022 රු. මිලියන
සියලු වියදම් ගෙවීමෙන් පසුව ක්ෂයවීම්, අපේක්ෂිත ණය හානි සහ අවිනිශ්චිතතාවයන් වලට ගැලපීමෙන් පසු එකතු කළ අගය මත බදු (VAT) සහ ආදායම් බදු වලට පෙර වාර්ෂික ලාභය	**5,589**	7,763
මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු (VAT)	**1,143**	3,186
මූල්‍ය සේවා මත සමාජ ආරක්ෂණ දායකත්ව බදු (SSCL)	**159**	67
ආදායම් බදු වියදම්	**(2,929)**	1,980
වසර සඳහා ලාභය	**7,216**	2,530
වසර සඳහා වෙනත් බදු පසු ශුද්ධ විස්තීරණ ආදායම්	**386**	(1,223)
වසර සඳහා මුළු විස්තීරණ ආදායම	**7,602**	1,307
විසර්ජනයන්:		
ව්‍යවස්ථාපිත සංචිතයට මාරු කිරීම	**(144)**	(51)
ජාතික රක්ෂණ භාර අරමුදලට දායකත්වය (NITF)		(25)
ඒකාබද්ධ අරමුදල සඳහා දායකත්වය/ලාභාංශ	**–**	–
සංචිතයට	**(7,458)**	(1,231)

අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

5.2 බදු සඳහා ප්‍රතිපාදන

2023 දෙසැම්බර් 19 දින සහතික කළ 2022 අංක 45 දරන දේශීය ආදායම් පනත (සංශෝධිත) පරිදි, ආදායම් බදුවල සම්මත අනුපාතය 30% විය.

2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බද්දට අනුව, 2022 ඔක්තෝබර් 1 දින සිට ක්‍රියාත්මක වන පරිදි මූල්‍ය සේවාවන්ට එකතුකළ අගය මත 2.5%ක සමාජ ආරක්ෂණ දායකත්ව බදු සඳහා බැංකුව යටත් වේ. බැංකුවෙහි සහ සමූහයෙහි මෙහෙයුම් මූල්‍ය සේවා මත එකතුකළ අගය මත බදු සඳහා 18% අනුපාතිකයකට යටත් විය.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS 12) - "ආදායම් බදු" පිළිබඳ ගිණුම් ප්‍රමිතියට අනුකූලව වගකීම් ක්‍රමය යටතේ බැංකුව සහ සමූහය සියළු හඳුනාගත් තාවකාලික විෂමතා සඳහා විලම්බිත බදු සඳහා ප්‍රතිපාදන සිදුකොට ඇත. ආදායම් බදු වියදම් සහ විලම්බිත බදුකරණය පිළිබඳ තොරතුරු පිළිවෙළින් පිටු අංක 269 සිට 306 පිටුවල, 13 සහ 30 සටහන් යටතේ දක්වා ඇත.

5.3 ලාභාංශ, බදු සහ අයබදු/ජාතියට දායකත්වය

බැංකුව 2023 වසරේදී බදු සහ අයබදු ලෙස රු. මිලියන 1,308ක් රජයට දායක කර ඇත. (2022 - රු.මිලියන 5,578). මෙයට පහත දේ ඇතුළත්ය.

	2023 රු. මිලියන	2022 රු. මිලියන
ආදායම් බදු	**(2,929)**	1,980
එකතු කළ අගය මත බදු/සමාජ ආරක්ෂණ බදු	**1,301**	3,253
විශේෂ ගාස්තු	**320**	320
ඒකාබද්ධ අරමුදල සඳහා දායකත්වය	**–**	–
ජාතික රක්ෂණ භාර අරමුදලට දායකත්වය	**–**	25
ජාතිය සඳහා මුළු දායකත්වය	**(1,308)**	5,578

5.4 සංචිත

2023 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මුළු සංචිත රු. මිලියන 71,974 ක් විය (2022 - රු. මිලියන 63,492). බැංකුවෙහි සංචිත පහත ඒවායින් සමන්විතය.

	2023 රු. මිලියන	2022 රු. මිලියන
ව්‍යවස්ථාපිත සංචිත අරමුදල	**5,369**	5,225
ප්‍රත්‍යාගණන සංචිතය	**7,946**	6,494
රඳවා ගත් ඉපැයුම්	**14,408**	11,359
වෙනත් සංචිත	**44,251**	40,414
මුළු සංචිත	**71,974**	63,492

සංචිතවල වෙනස් වීම පිළිබඳ තොරතුරු හිමිකම්වල වෙනස් වීම පිළිබඳ ප්‍රකාශයෙහි 236 - 239 පිටුවල දක්වා ඇත.

6. තැපැල් දෙපාර්තමේන්තුව සඳහා සේවා ගාස්තු

2023 වසර සඳහා තැපැල්පති සඳහා සේවා ගාස්තුව 2022 පරිදිම එම පදනම මත, රු. මිලියන 326 ක් වෙන්කර ඇත.

7. විශ්‍රාමික ප්‍රතිලාභ සහ වගකීම්

බැංකුව විසින් විශ්‍රාම අරමුදල් දෙකක් පවත්වා ගෙන යනු ලබයි. එනම් කාර්ය මණ්ඩල විශ්‍රාම අරමුදල I සහ කාර්ය මණ්ඩල විශ්‍රාම අරමුදල II වශයෙනි. තවදුරටත් බැංකුව විසින් වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල මෙන්ම විශ්‍රාමික වෛද්‍යාධාර ක්‍රමයක් පවත්වාගෙන යනු ලබයි. විස්තර මූල්‍ය ප්‍රකාශනයන්හි විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම් 38, සටහන්වල 316 සිට 327 දක්වා පිටු තුළ දක්වා ඇත.

8. දේපල, පිරියත සහ උපකරණ සහ ප්‍රාග්ධන වියදම්

වසර තුළ දේපළ, පිරියත සහ උපකරණවල සහ අස්පෘශ්‍ය වත්කම් (නොනිමි ප්‍රාග්ධන වැඩ ඇතුළුව) අත්කර ගැනීම මත බැංකුව විසින් දරන ලද මුළු ප්‍රාග්ධන වියදම රුපියල් මිලියන 1,576 (2022 රුපියල් මිලියන 906) ක් වූ අතර සමූහයේ වියදම රුපියල් මිලියන 1,578 ක් (2022 රුපියල් මිලියන 912) ක් විය. මේ පිළිබඳ විස්තර මෙම වාර්ෂික වාර්තාවේ 295 සිට 300 හා 305 පිටුවල මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් 26 (අ) සහ 26 (ආ) 29.1 හා 29.2 හි දක්වා ඇත.

9. දේපල, පිරියත සහ උපකරණවල වටිනාකම

2023 වසර අවසානය බැංකුවේ සහ සමූහයේ දේපළ, පිරියත සහ උපකරණවල මුළු ශුද්ධ පොත් අගය පිළිවෙලින් රු.මිලියන 17,249ක් සහ රු. මිලියන 18,389ක් විය. (2022 රු. මිලියන 14,756ක් සහ සමූහයේ රු. මිලියන 15,646ක් විය) විස්තර මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් වල පහත පරිදි ඇත.

- මූල්‍ය ප්‍රකාශනවලට සටහන් 26: දේපළ, පිරියත සහ උපකරණ පිටු අංක 295
- මූල්‍ය ප්‍රකාශනවලට සටහන් 29: කීර්තිනාමය සහ අස්පෘෂ්‍ය වත්කම් පිටු අංක 304
- මූල්‍ය ප්‍රකාශනවලට සටහන් 48.1: ප්‍රාග්ධන බැඳීම් පිටු අංකය 334

10. ප්‍රකාශිත ප්‍රාග්ධනය සහ කොටස් හිමිකම

10.1 ප්‍රකාශිත ප්‍රාග්ධනය

බැංකුවේ අනුමත කොටස් ප්‍රාග්ධනය රුපියල් බිලියන 10ක් වන අතර එය එකක් රුපියල් 10/- ක් වූ බිලියන 01 ක සාමාන්‍ය කොටස්වලින් සෑදී ඇත. 2023 දෙසැම්බර් 31 වන දිනට බැංකුවේ නිකුත් කළ කොටස් ප්‍රාග්ධනය රුපියල් බිලියන 9.4කි. භාණ්ඩාගාර ලේකම් ඔහුගේ නිල බලයෙන් නිකුත් කළ කොටස් ප්‍රාග්ධනය සියල්ල රඳවා ගනී. මේ පිළිබඳ විස්තර මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 329 හි සටහන් 43 ඇති ප්‍රකාශිත ප්‍රාග්ධන/පැවරුම් ප්‍රාග්ධනය යටතේද සටහන් අංක 46.1 ඇති ඉල්ලුම් නොකළ තැන්පතු සංචිතය පිටු අංක 331 යටතේද දක්වා ඇත.

10.2 කොටස් හිමිකම

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ එකම කොටස්කරු ශ්‍රී ලංකා රජයයි.

11. යටත්කාලීන ණයකර/බැඳුම්කර නිකුත් කිරීම

2023 දෙසැම්බර් 31 වන දිනට බැංකුවේ යටත්කාලීන වගකීම රු. බිලියන 05, අතිරේක ස්ථර 1 ප්‍රාග්ධනය සඳහා සුදුසුකම් ලැබූ 2020 ඔක්තෝබර් 27 වන දින පුද්ගලික ස්ථානගත කිරීම මත නිකුත් කළ ලැයිස්තුගත නොකළ, ශ්‍රේණීගත, යටත් රු.100 යේ සදාකාලීන ණයකර වලින් සමන්විතය. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනට ගෙවා අවසන් නොකළ ණයකරවල විස්තර මූල්‍ය ප්‍රකාශනවල 314 පිටුවේ යටත්කාලීන වගකීම්වල සටහන් 37.1 හි දක්වා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

12 ජ්‍යෙෂ්ඨ ණයකර නිකුතුව

2023 දෙසැම්බර් 31 දින වන විට බැංකුවේ ගෙවා අවසන් නොකළ, 2021 සැප්තැම්බර් 24 වන දින රු. 100/- බැගින් පුද්ගලික ස්ථානගත කිරීම මත නිකුත් කරන ලද රු. බිලියන 11.5 ක් වටිනා ලැයිස්තුගත නොකළ, ශ්‍රේණිගත, මුදවාගත හැකි, ජ්‍යෙෂ්ඨ, ණයකර වලින් සහ 2019 සැප්තැම්බර් 10 වන දින රු.100/- බැගින් නිකුත් කරන ලද රු. බිලියන 6.3 ක් වටිනා ලැයිස්තුගත නොකළ, ශ්‍රේණිගත, ජ්‍යෙෂ්ඨ, සුරැකුම් රහිත, නිදහස් කළහැකි ණයකර වලින් සමන්විත වේ. ජ්‍යෙෂ්ඨ ණයකරවල විස්තර වාර්ෂික වාර්තාවේ 315 - 316 පිටුවල සටහන් 37.2 හි දක්වා ඇත.

13. කොටස් තොරතුරු

සමාලෝචනය යටතේ ඇති කාල පරිච්ඡේදය සඳහා පිළිවෙළින් බැංකුවේ කොටසක මූලික ඉපයුම සහ කොටසකට ශුද්ධ වත්කම් අගය 2023 දී රු. 7.68 (වර්ෂ 2022 දී - රු. 2.69) සහ රු. 86.57 (2022 වර්ෂයේදී - රු. 77.54) කි. සටහන 14 හි මෙම තොරතුරු ඇති අතර සාමාන්‍ය කොටසකට මූලික ඉපැයීම පිටුව 271 සහ සටහන් 50 හි සාමාන්‍ය කොටසකට ශුද්ධ වත්කම් අගය පිළිබඳ විස්තර 341 පිටුවේ දක්වා ඇත.

14. පරිත්‍යාග

රජය විසින් පනවන ලද සීමා හේතුකොටගෙන ආයතනික සමාජ වගකීම්වලට අදාළ කිසිදු වැඩසටහනක් බැංකුව විසින් ක්‍රියාත්මක නොකරන ලදී.

15. අධ්‍යක්ෂ මණ්ඩලය

15.1 2023 වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු

1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ 11 (1) වගන්තිය සහ 1995 අංක 28 දරන පනතින් එයට කළ සංශෝධන ප්‍රකාරව, 2023 වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩලය සභාපති සහ මුදල් අමාත්‍යාංශය සහ තැපැල්පති නියෝජනය කරමින් නිල බලයෙන් පත් වූ සාමාජිකයන් දෙදෙනෙක් ඇතුළුව හත් දෙනෙකුගෙන් සමන්විතය. මුදල් අමාත්‍යවරයා සභාපති සහ අනෙකුත් අධ්‍යක්ෂවරු හතර දෙනා පත් කරයි. වසර තුළ පහත දැක්වෙන පුද්ගලයන් අධ්‍යක්ෂවරුන් ලෙස කටයුතු කළ අතර ඔවුන්ගේ සංක්ෂිප්ත පැතිකඩ, වාර්ෂික වාර්තාවේ පිටු අංක 158 හි දක්වා ඇත.

නම	පත් කළ දිනය	සාමාජිකත්ව තත්ත්වය
ජනාධිපති නීතීඥ, ආචාර්ය හර්ෂ කබ්රාල් සභාපති	2023 මැයි 02 - අද දක්වා	විධායක නොවන/ ස්වාධීන
ශ්‍රීඩ් නිලුක්ෂාන් - නිල බලයෙන් පත් අධ්‍යක්ෂ	2022 පෙබරවාරි 28 - අද දක්වා	විධායක නොවන/ ස්වාධීන නොවන
එස් ආර් ඩබ් එම් ආර් පී සත්කුමාර - නිල බලයෙන් පත් අධ්‍යක්ෂ	2023 මාර්තු 27 - අද දක්වා	විධායක නොවන/ ස්වාධීන
දුෂ්‍යන්ත බස්නායක - අධ්‍යක්ෂ	2023 මාර්තු 31 - අද දක්වා	විධායක නොවන/ ස්වාධීන
අශේන් ජයසේකර - අධ්‍යක්ෂ	2024 ජනවාරි 09	විධායක නොවන/ ස්වාධීන
එච් කේ ඩී ලක්ෂ්මන් ගාමිණී - අධ්‍යක්ෂ	2020 දෙසැම්බර් 14 - සිට 2023 දෙසැම්බර් 14 දක්වා	විධායක නොවන/ ස්වාධීන නොවන

2023 වසර තුළ බැංකුවේ පරිපාලිත සමාගම් අධ්‍යක්ෂකවරුන්ගේ ලැයිස්තුව

සී/ස එන්එස්බී ෆන්ඩ් මැනේජ්මන්ට් ලිමිටඩ් හි අධ්‍යක්ෂකවරුන්ගේ නම් පහත පරිදි වේ:

දුෂ්‍යන්ත බස්නායක මයා - සභාපති
(2023 දෙසැම්බර් 28 - අද දක්වා)

ඩබ්ලිව් ඕ රැදිගු මයා
(2020 ජනවාරි 13 - අද දක්වා)

ශෂී කණ්ඩම්බි මිය
(2024 පෙබරවාරි 15 - අද දක්වා)

කේ රවීන්ද්‍රන් මයා (2022 ජුනි 24 - අද දක්වා)

එච් කේ ඩී ලක්ෂ්මන් ගාමිණී මයා
(2021 මාර්තු 30 - 2023 දෙසැම්බර් 14 දක්වා)

එම් පි ඒ ඩබ්ලිව් පීරිස් මයා
(2020 නොවැම්බර් 04 - 2023 නොවැම්බර් 07 දක්වා)

කේශිලා ජයවර්ධන මිය
(2020 ජනවාරි 17 - 2023 අප්‍රේල් 27 දක්වා)

එම් ටී ජේ පෙරේරා මයා
(2020 ජුනි 02 - 2023 පෙබරවාරි 21 දක්වා)

මනෝහාරි අබේසේකර මිය
(2020 ජනවාරි 14 - 2023 ජනවාරි 02 දක්වා)

ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුවෙහි අධ්‍යක්ෂවරුන්ගේ නම් පහත දැක්වේ

බී එම් ඩී බී බස්නායක - සභාපති

එච් එම් එස් ධර්මවර්ධන

එච් ඩී පී ගමගේ

එන් පී ඉඹුල්ගොඩ

එම් කේ ජී ජේ අරුණශාන්ත

එච් කේ ඩී එල් ගාමිණී

15.2 අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු

මහ බැංකුව විසින් ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා ආයතනික යහපාලනය පිළිබඳ 2007 අංක 12 දරන බැංකු පනතේ විධානයන්ට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්පූර්ණ වගකීම සහ වගවීම භාර ගන්නා අතරතුර බැංකුවේ කටයුතු පිළිබඳ පාලනය සහතික කිරීම සඳහා අනිවාර්ය අධ්‍යක්ෂක මණ්ඩල අනුකමිටු හතරක් එනම්; අධ්‍යක්ෂක මණ්ඩල විගණන කමිටුව, අධ්‍යක්ෂක මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුව හා අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සහ 2023 අංක 1 දරන බැංකු පනත මගින් අනිවාර්ය කරන ලද හදිසි නොවන වියදම් හා අත්‍යවශ්‍ය නොවන වියදම් අධ්‍යක්ෂ මණ්ඩල කමිටුව පිහිටුවා ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුව, ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත මෙන්ම ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන් වැනි නියාමනයන් විසින් කරනු ලබන නිර්දේශ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටුවේ යොමු කොන්දේසි අනුකූල වේ.

2023 දෙසැම්බර් 31 දිනට අධ්‍යක්ෂක මණ්ඩල අනුකමිටුවල සංයුතිය සහ රැස්වීම්වලදී අධ්‍යක්ෂකවරුන්ගේ සහභාගීත්ව විස්තර 174 පිටුවෙහි හෙළිදරව් කර ඇති අතර මෙම අනුකමිටු වාර්තා පිටුව 182 සිට 190 දක්වා ඇතුළත් කර ඇත.

15.3 අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීම්

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු රැස්වීම් යන ඒවායින් සමන්විත අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීම්වල විස්තර සහ රැස්වීම් සඳහා අධ්‍යක්ෂවරුන්ගේ සහභාගිත්වය, වාර්ෂික වාර්තාවෙහි යහපාලන පාලන වාර්තාවේ පිටුව 174 තුළ දක්වා දැක්වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

15.4 කොන්ත්‍රාත්තු පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ බැඳියාව

සෘජු සහ වක්‍ර යන දෙයාකාරයෙන්ම, අධ්‍යක්ෂවරුන්ගේ බැංකුව සමග වන කොන්ත්‍රාත්තු පිළිබඳ බැඳියාවන් මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 49.5.2 හි පිටු අංක 338 තුළ දැක්වේ. මෙම බැඳියාවන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී ප්‍රකාශ කර ඇත. අධ්‍යක්ෂවරුන් බැංකුව සමග වෙනත් කොන්ත්‍රාත්තු හෝ යෝජිත

කොන්ත්‍රාත්තු පිළිබඳ කිසිදු සෘජු හෝ වක්‍ර බැඳියාවක් නැත,

15.5 බැංකුව මගින් නිකුත් කළ ණයකරවල අධ්‍යක්ෂකවරුන්ගේ බැඳියාව/ඇල්ම

කිසිදු අධ්‍යක්ෂකවරයකුගේ නමින් ලියාපදිංචි කළ ණයකර නොතිබිණි.

15.6 අධ්‍යක්ෂකවරුන්ගේ පාරිතෝෂික සහ වෙනත් ප්‍රතිලාභ

2022 මූල්‍ය වර්ෂය සඳහා බැංකුව සහ සමූහය සම්බන්ධයෙන් අධ්‍යක්ෂකවරුන්ගේ වේතන සහ වෙනත් ප්‍රතිලාභ පිළිබඳ විස්තර පිටු අංක 338 හි මූල්‍ය ප්‍රකාශනවල සටහන 49.5.1 හි දක්වා ඇත.

15.7 සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී අදාළ කර ගන්නා ලද සම්බන්ධිත පාර්ශ්ව හෙළිදරව් කිරීම් පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 24 හි ප්‍රකාරව සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ලෙස වර්ගීකරණය කළ හැකි, ගනුදෙනු කිසිවක් තිබේ නම් ඒවාද අධ්‍යක්ෂවරුන් හෙළිදරව් කළ යුතුය. අධ්‍යක්ෂවරුන් විසින් හෙළිදරව් කරන ලද එම ගනුදෙනු, අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාවෙහි කොටසක් වන මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 49.5.3 හි පිටු අංක 338 තුළ දැක්වේ.

16 පරිසරය ආරක්ෂා කිරීම

බැංකුව සහ සමූහය දැනීමේ තරමට පරිසරයට හානිකර හෝ අනතුරුදායක කිසිදු ක්‍රියාකාරකමක නියැලී නැත. පරිසර ආරක්ෂණය සඳහා ගන්නා ලද විශේෂ පියවර පිටු අංක 146 සිට 150 දක්වා ඇත.

17 ව්‍යවස්ථාපිත ගෙවීම්

අධ්‍යක්ෂ මණ්ඩලය, ඔවුන්ගේ දැනීමේ සහ විශ්වාසයේ තරමට, රජයට, නියාමන ආයතනවලට සහ සේවකයන් සම්බන්ධව ගෙවිය යුතු සියලු ව්‍යවස්ථාපිත ගෙවීම් නිසි කලට සිදු කර ඇති බවට සෑහීමට පත් වෙයි.

18 වාර්තාකරණ දිනෙන් පසු සිදුවීම්

පිටු අංක 342 හි මූල්‍ය ප්‍රකාශනවලට සටහන් 52 හි හෙළිදරව් කළ ඒවා හැර ගිණුම්වලට ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් අවශ්‍යවන වැදගත් අවස්ථා වාර්තා කරන දින සිට පැන නැඟී නැත.

19 අඛණ්ඩ පැවැත්ම

බැංකුව සතුව එහි ඉදිරි පැවැත්ම තුළ මෙහෙයුම් අඛණ්ඩව කර ගෙන යාමට ප්‍රමාණවත් සම්පත් තිබෙන බවට අධ්‍යක්ෂක මණ්ඩලය සමාලෝචනය කර තෘප්තිමත් වී ඇත. තවද, සීමා කිරීම් හෝ මෙහෙයුම් අඩු කිරීමට සැලසුම් වැනි බැංකුවේ අඛණ්ඩ පැවැත්ම කෙරෙහි සැලකිය යුතු බලපෑම් ඇති කළ හැකි කිසිදු ප්‍රමාණාත්මක අවිනිශ්චිතතා පිළිබඳ අධ්‍යක්ෂවරු දැනුවත් නැත.

20. අවදානම් කළමනාකරණය, අභ්‍යන්තර පාලනය සහ කළමනාකරණ තොරතුරු පද්ධති

20.1 අවදානම් කළමනාකරණය

අධ්‍යක්ෂක මණ්ඩලය අවදානම් කළමනාකරණය කිරීම වෙනුවෙන් සමස්ත වගකීම භාර ගනී. බැංකුව මුහුණ දෙන අවදානම් හඳුනා ගැනීම සඳහා අඛණ්ඩ ක්‍රියාවලියක් ඇත. අවදානම ලිහිල් කිරීමේදී බැංකුව මගින් ගන්නා ලද විශේෂිත ක්‍රියාමාර්ග මෙම වාර්තාවේ අවදානම් කළමනාකරණ වාර්තාවේ පිටු 208 සිට 236 දක්වා සහ අධ්‍යක්ෂක මණ්ඩල ඒකාබද්ධ අවදානම් සමාලෝචන වාර්තාවේ පිටු 199 සිට 201 දක්වා විස්තරාත්මකව දක්වා ඇත.

20.2 අභ්‍යන්තර පාලනයන් සහ කළමනාකරණ තොරතුරු පද්ධති

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව තුළින් බැංකුව තුළ ඵලදායී සහ පුළුල් අභ්‍යන්තර පාලන පද්ධතියක් සහ කළමනාකරණ තොරතුරු පද්ධති සථාපිත කර ක්‍රියාත්මක කර ඇති බව අධ්‍යක්ෂක මණ්ඩලය සහතික කර ඇත. බැංකුව නිරාවරණය වන අවදානම් අවම කිරීමට, වැදගත් අවප්‍රකාශ සහ හානි අනුව සාධාරණ සහතිකය ලබාදීමට අභ්‍යන්තර පාලන පද්ධති සැලසුම් කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ වාර්තාව මෙම වාර්තාවේ 182 සිට 184 දක්වා පිටුවල දැක්වේ.

බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා ආයතනික යහපාලනය පිළිබඳ 2007 අංක 12 දරන බැංකු පනතේ අංක 3 (8)(ii)(ආ) නියෝගයට අනුකූලව බැංකුවේ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණ පිළිබඳ ප්‍රකාශයක් අධ්‍යක්ෂ මණ්ඩලය නිකුත් කර ඇති අතර, එය මෙම වාර්තාවේ 388 - 407 පිටුවල දක්වා ඇත. මූල්‍ය වාර්තාකරණයේ විශ්වාසය සම්බන්ධයෙන් සාධාරණ සහතිකය ලබාදීමට සහ බාහිර වාර්තාකරණ අරමුණ සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම අදාළ ගිණුම්කරණ මූලධර්ම සහ නියාමන අවශ්‍යතාවන්ට අනුකූලව සිදුකර ඇති බවට සහතික වීම සඳහා මූල්‍ය වාර්තාකරණ ක්‍රමය සැලසුම් කර ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය පිළිබඳ විගණකාධිපතිවරයාගෙන් සහතිකයක් ලබා ගෙන ඇති අතර එය පිටු අංක 224 - 225 හි දක්වා ඇත.

21. විගණකවරුන් පත්කිරීම සහ ඔවුන්ගේ වේතන

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජ ව්‍යවස්ථාවේ 154 වන වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව විගණකාධිපති ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ විගණක වේ.

ගිණුම් කාලපරිච්ඡේදය තුළ විගණන ගාස්තු සහ ලබා දුන් වෙනත් සේවා සම්බන්ධයෙන් දරන ලද වියදම් පිටුව 268 හි මූල්‍ය ප්‍රකාශන වෙත සටහන 12 හි දක්වා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

21.1 නියාමන අධීක්ෂණය

ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) නියාමන අධීක්ෂණ ආයතනයක් ලෙස, ශ්‍රී ලංකා මහ බැංකුව මගින් නිකුත් කළ නියෝගවලට අනුකූල වීම තහවුරු කිරීමට බැංකුවේ වාර්තා සහ කටයුතු පිළිබඳ කාලානුරූපව පරීක්ෂාවක් සිදු කරයි. එමෙන්ම එය පාර්ශ්වකරුවන්ගේ යහපත විශේෂයෙන්ම තැන්පත්කරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා වන ලෙස අවශ්‍ය මට්ටමට අවශ්‍ය මූල්‍ය දර්ශක පවත්වාගෙන යන්නේදැයි තීරණය කරයි.

22. ආයතනික පාලනය

බැංකුවේ කළමනාකරණ කටයුතු සිදු කිරීමේ දී ආයතනික පාලන මනා පරිචයන් සහ ක්‍රියාපටිපාටි සමග අනුකූල වීම තහවුරු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අවධානය යොමු කර ඇත. ඒ අනුව, අධ්‍යක්ෂවරුන් පහත දේ ප්‍රකාශ කර ඇත.

අ) බැංකුව එහි ව්‍යාපාර කටයුතු කරගෙන යාමේදී අදාළ වන නීති සහ රෙගුලාසි සමග අනුකූල වී ඇති අතර, අදාළ නීති සහ රෙගුලාසි කඩ කරන කිසිදු ක්‍රියාවක නියැලී නැත.

(ආ අධ්‍යක්ෂවරු බැංකුව හා සම්බන්ධ වන ප්‍රමාණාත්මක ඇල්මක් ඇති සියළු කොන්ත්‍රාත් හෙළිදරව් කර ඇති අතර ඔවුන් ප්‍රමාණාත්මක ඇල්ම ඇති කිසිදු කාරණයකට සම්බන්ධ වීමෙන් වැළකී ඇත.

(ඇ) ව්‍යාපාරයට අඛණ්ඩ පැවැත්මක් ඇති අතර අධ්‍යක්ෂක මණ්ඩලය උපායමාර්ගික ව්‍යාපාර සැලසුම් සමාලෝචනය කර ඉදිරි අනාගතය තුළ බැංකුවෙහි අනාගත ගම්‍යතාව වේගවත් කිරීමට ප්‍රමාණවත් සම්පත් තිබෙන බවට තෘප්තිමත් වී ඇත. එබැවින්, බැංකුවේ සහ එහි පරිපාලිත සමාගමේ මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පදනම මත පිළියෙළ කර ඇත.

(ඈ) බැංකුව සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර ඇත.

(ඉ) බැංකුව මූල්‍ය, මෙහෙයුම් සහ අනුකූලතා පාලන, අවදානම් කළමනාකරණය ආවරණය කරන අභ්‍යන්තර පාලනයන් පිළිබඳ සමාලෝචනයක් පවත්වා ඇති අතර, ඒවායේ ඵලදායීතාව සහ අනුගත වීම පිළිබඳ සාධාරණ සහතිකයක් ලබා ගෙන ඇත.

23. තිරසාරබව

බැංකුවේ ව්‍යාපාර උපායමාර්ග ක්‍රමවත්ව සකස් කරන විට, බැංකුව තිරසාර බවේ පැති සලකා බලන අතර, පිටු අංක 434 සිට 436 දක්වා ඇති ගෝලීය වාර්තාකරණ දර්ශකයේ (GRI) විස්තරාත්මකව දක්වා ඇත.

24. මානව සම්පත්

බැංකුව සිය උසස් තත්ත්වයේ සේවාව ඔස්සේ තිරසාර අගය නිර්මාණය කිරීමට කැප වීමෙන් සහ ඉහළ අභිප්‍රේරණයකින් යුතුව කටයුතු කරන සේවකයන්ගේ උන්නතිය සඳහා සහ ඔවුන්ව රඳවා තබා ගැනීමට අඛණ්ඩව ක්‍රියාකරයි. බැංකුවේ මානව ප්‍රාග්ධනයෙහි සංවර්ධනය සඳහා සැලකිය යුතු ආයෝජන සිදු කර ඇත. මානව ප්‍රාග්ධනය වැඩිදියුණු කිරීම සඳහා බැංකුව විසින් අනුගමනය කරනු ලබන ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි 2023 වාර්ෂික වාර්තාවේ පිටු අංක 124 සිට 135 දක්වා විස්තරාත්මකව දක්වා ඇත.

25. දැනට පවතින නඩුකර

අධ්‍යකෂකවරුන්ගේ සහ බැංකුවේ නීතිඥයන්ගේ මතය අනුව, 341 පිටුවේ මූල්‍ය ප්‍රකාශනවලට සටහන් 51 අනාවරණය කර ඇති බැංකුවට එරෙහිව ඇති නඩුකරවලින්, බැංකුවේ මූල්‍ය තත්ත්වය හෝ එහි අනාගත මෙහෙයුම් කෙරෙහි ප්‍රමාණාත්මක බලපෑමක් නොමැත.


26. වාර්තාවේ අන්තර්ගතවල වගකීම භාර ගැනීම

අධ්‍යක්ෂක මණ්ඩලය මෙයින් වාර්ෂික වාර්තාවේ අන්තර්ගතවල වගකීම භාර ගනී.

අධ්‍යක්ෂක මණ්ඩලයේ නියෝගය අනුව



ජනාධිපති නීතීඥ, ආචාර්ය හර්ෂ කබ්රාල්
සභාපති



එම් ඒ පී මුහන්දිරම්
අධ්‍යක්ෂක මණ්ඩලයේ ලේකම්

2024 මාර්තු 25
කොළඹ

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම සම්බන්ධ ප්‍රකාශය

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ (බැංකුව) මූල්‍ය ප්‍රකාශන සහ බැංකුවේ සහ එහි පරිපාලිතයේ (සමූහය) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධව අධ්‍යක්ෂවරුන්ගේ වගකීම මෙම ප්‍රකාශයෙන් දක්වා ඇත.

මූල්‍ය ප්‍රකාශන

බැංකුව සහ සමූහය සියලු ගනුදෙනුවල නිසි ගිණුම් තැබීම කරන බවට සහ අදාළ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවලට අනුකූලව එක් එක් මූල්‍ය වර්ෂය අවසානයේදී බැංකුවේ සහ සමූහයේ කටයුතුවල තත්ත්වය පිළිබඳ සත්‍ය සහ සාධාරණ දැක්මක් ලබා දෙන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කරන බවට සහතිකවීම සඳහා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වග කියයි. මූල්‍ය ප්‍රකාශනවලට 2023 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, 2023 වසර සඳහා ආදායම් ප්‍රකාශය සහ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, හිමිකම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශ සහ මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය සහ සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ එයට සම්බන්ධ සටහන් ඇතුළත්ය.

බැංකුවේ සහ පරිපාලිතයේ මූල්‍ය ප්‍රකාශන පහත කරුණු පිළිබඳ සත්‍ය සහ සාධාරණ දැක්මක් ලබා දෙයි:

1. 2023 දෙසැම්බර් 31 වන දිනට බැංකුවේ සහ එහි පරිපාලිතයේ මූල්‍ය තත්ත්වය; සහ

2. 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා බැංකුවේ සහ එහි පරිපාලිතයේ මූල්‍ය කාර්ය සාධනය.

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී අධ්‍යක්ෂවරුන් පහත දේවල් පිළිබඳව තහවුරු කිරීම අවශ්‍යය:

1. මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී යොදා ගන්නා ලද පිටු අංක 242 හි දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති පවතින මූල්‍ය වාර්තාකරණ රාමුවට අනුකූලව යෝග්‍ය ඒවා විය. මෙම ප්‍රතිපත්ති සංගත ලෙස භාවිතා කරන අතර ඒවා ප්‍රමාණාත්මකව හෙළිදරව් කරන ලදී.

2. මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී ගනුදෙනුවේ නෛතික පදනම හා ආර්ථික හරය නිසි ලෙස පිලිබිඹු වන බව සහතික කිරීමට අවශ්‍ය අවස්ථාවලදී සාධාරණ සහ විචක්ෂණශීලී විනිශ්චයන් සිදු කර ඇත.

3. අදාළ වන සියළුම ගිණුම්කරණ ප්‍රමිතීන් අදාළ ලෙස අනුගමනය කර ඇත.

1971 අංක 38 දරන මුදල් පනත, 1988 අංක 30 දරන බැංකු පනත, 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ 7(1) වගන්ති විධිවිධාන ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවේ කටයුතු සහ බැංකුවේ ව්‍යාපාර කටයුතු පාලනය සහ පරිපාලනය කිරීම අවශ්‍ය වේ. මූල්‍ය ප්‍රකාශන මහ බැංකුව විසින් බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා නිකුත් කර ඇති ආකෘතියට අනුකූල බව අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කරයි.

සලකනු ලබන ඕනෑම කාල පරිච්ඡේදයක සාධාරණ නිරවද්‍යතාවක් සහිතව, බැංකුවේ මූල්‍ය තත්ත්වය නිවැරදිව වාර්තා කරන සහ විස්තර කරන අදාළ ගිණුම්කරණ වාර්තා ලබා දෙමින් මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ හැකියාව තහවුරු කරන බව සහතික කිරීම සඳහාද අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය.

මෙම වාර්ෂික වාර්තාවේ ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශනවල සත්‍ය බව සහ විෂය මූලික බව සඳහා වන වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය පිළිගනී. (මූල්‍ය ප්‍රකාශන පිටු 232 සිට 241 දක්වා දක්වා ඇත) 2023 වර්ෂය සඳහා පිළියෙළ කළ මෙම වාර්තාවේ ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති, 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති පනත සහ 1988 අංක 30 දරන බැංකු පනත සහ එහි සංශෝධන යන ඒවායෙහි අවශ්‍යතා සමග අනුකූල වේ.

අභ්‍යන්තර පාලන

අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවේ සහ සමූහයේ වත්කම් ආරක්ෂා කිරීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගැනීමට සහ විධිවිධාන ලබා දීමට, වංචා සහ අනෙකුත් අක්‍රමිකතා හෙළිදරව් කිරීමට වගකියන ලද අතර ඵලදායී සහ විස්තීර්ණ අභ්‍යන්තර පාලන පද්ධතියක් සහ අභ්‍යන්තර විගණනයක් ඇතුළත් ඵලදායිතාව නිරීක්ෂණය කිරීමේ ඵලදායී පද්ධතියක් ද පිහිටුවා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය මූල්‍ය ප්‍රකාශන ඔවුන් විසින් ඔවුන්ගේ විධිමත් රැස්වීම්වලදී සහ විගණන කමිටු මණ්ඩලයේදීද සමාලෝචනය කරන බව සහතික කරයි. මෙම වාර්ෂික වාර්තාවේ 224 පිටුවේ මූල්‍ය වාර්තාකරණය කෙරෙහි අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය දී ඇති අතර බැංකුවේ අභ්‍යන්තර පාලනය පිළිබඳ විගණකාධිපතිගේ සහතිකකරණ වාර්තාව 226 පිටුවෙහි දක්වා ඇත.

විගණන වාර්තාව


අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන ඇතුළුව සියලු වාර්තා විගණකාධිපති වෙත ලබා දී ඇති අතර සුදුසු යැයි ඔවුන් සලකන සියලු පරීක්ෂා කිරීම් සිදු කිරීමට සෑම ඉඩ ප්‍රස්තාවක්ම ලබා දෙන ලදී. විගණකාධිපති දෙපාර්තමේන්තුව පරීක්ෂා කිරීම් කර ඇති අතර විගණකාධිපතිගේ මතය ඔහු විසින් වාර්තා කළ පරිදි මෙම වාර්ෂික වාර්තාවෙහි 228 පිටුවේ දක්වා ඇත.

අනුකූලතා වාර්තාව

අධ්‍යක්ෂවරුන් ඔවුන්ගේ උපරිම දැනුමේ සහ විශ්වාසයේ තරමට බැංකුව හා සමූහය විසින් ගෙවිය යුතු සියලු බදු, ගාස්තු සහ අය බදු සහ රජයට සහ අනෙකුත් අදාළ නියාමන සහ ව්‍යවස්ථාපිත අධිකාරිවලට බැංකුවේ සහ සමූහයේ සේවකයන් වෙනුවෙන් සහ ඔවුන් සම්බන්ධව ගෙවිය යුතු සියලු දායකත්ව මුදල් සහ බදු, සහ වෙනත් දන්නා සියළු ගෙවිය යුතු ව්‍යවස්ථාපිත ගෙවීම් බැංකුව සහ සමූහය විසින් කළයුතු සහ ගෙවිය යුතු දේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දිනට ගෙවා ඇති බව හෝ අදාළ තැනදී වෙන් කර ඇති බව තහවුරු කරයි. තවද, වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය සහ සුරුකුම්පත් විනිමය කොමිෂන් සභාව විසින් ඒකාබද්ධව නිකුත් කළ "ආයතනික යහපාලන" සංග්‍රහය තුළ දැක්වීමට අවශ්‍ය මූල්‍ය තත්ත්වය, මෙහෙයුම් තත්ත්ව සහ නියාමන සහ වෙනත් සාධක සැලකීමෙන් පසුව අධ්‍යක්ෂ මණ්ඩලය එය තහවුරු කර ඇත.

බැංකුවට සහ සමූහයට ඉදිරි අනාගතයේදී මෙහෙයුම් අඛණ්ඩව කරගෙන යාමට සහ මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී අඛණ්ඩ පැවැත්ම පදනම යොදා ගැනීම සාධාරනීකරණය කිරීමට ප්‍රමාණවත් තරම් සම්පත් ඇති බව සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කර ඇති විධිවිධාන සමග අනුකූල වීමට අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගෙන ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,



එම් ඒ පී මුහන්දිරම්
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

2024 මාර්තු 20
කොළඹ

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය

වගකීම

මෙම වාර්තාව බැංකු පනතේ 2007 අංක 12 දරණ නියමයේ, 3 (8) (සස) (ආ) වගන්තිය සමග අනුකූලව නිකුත් කර ඇති අතර ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය (CA Sri Lanka) විසින් නිකුත් කර ඇති යහපරිචයන් සහිත ආයතනික යහපාලන සංග්‍රහය 2017 හි ෘග1.5 මූලධර්ම මත පදනම්ව පිළියෙළ කළ අභ්‍යන්තර පාලනය පිළිබඳ මෙම වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉදිරිපත් කරයි.

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ප්‍රමාණවත් තරම් සහ ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් පිහිටුවා පවත්වාගෙන යන බව සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය (මණ්ඩලය) වගකියයි. කෙසේ වුවද එවැනි පද්ධතියක් බැංකුවේ ව්‍යාපාර පරමාර්ථ ළඟා කර ගැනීම අසාර්ථක වීමේ අවදානම ඉවත් කරනවාට වඩා, පිළිගත හැකි අවදානම් පරාසයක් තුළ බැංකුවේ සැලකිය යුතු අවදානම් ක්ෂේත්‍ර කළමනාකරණය කිරීමට සැලසුම් කෙරේ. ඒ අනුව අභ්‍යන්තර පාලන පද්ධතියට කළමනාකරණ සහ මූල්‍ය තොරතුරු සහ වාර්තාවල සැලකිය යුතු සාවද්‍ය ප්‍රකාශ සහ වාර්තා හෝ මූල්‍යමය අලාභ හෝ වංචාවලට එරෙහිව පරම සහතිකයක් නොව සාධාරණ සහතිකවීමක් පමණක් සපයනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුව මුහුණ දෙන සැලකිය යුතු අවදානම් හඳුනා ගැනීම, ඇගයීම සහ කළමනාකරණය කිරීම සඳහා අඛණ්ඩව ක්‍රියාත්මක වන ක්‍රියාවලියක් ස්ථාපනය කර ඇති අතර මෙම ක්‍රියාවලියට ව්‍යාපාර පරිසරයට හෝ නියාමන අවශ්‍යතාවලට සහ අනෙකුත් මාර්ගෝපදේශවල වෙනස් කිරීම් ඇති පරිදි සහ ඇති විට මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන පද්ධතිය වැඩි දියුණු කිරීම ඇතුළත්ය. මෙම ක්‍රියාවලිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිරන්තරව සමාලෝචනය කරනු ලබන අතර ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කර ඇති මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශන පිළිබඳ බැංකුවේ අධ්‍යක්ෂවරුන් සඳහා මාර්ගෝපදේශය සමග අනුකූල බව තහවුරු කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය එම මාර්ගෝපදේශයෙහි දී ඇති අභ්‍යන්තර පාලන පද්ධතිය ඇගයීම සඳහා වූ මූලධර්ම සැලකිල්ලට ගෙන අභ්‍යන්තර පාලන පද්ධතිය ඇගයීමට ලක් කර ඇත.

අභ්‍යන්තර පාලන පද්ධතිය මූල්‍ය වාර්තාකරණයේ විශ්වසනීය බව පිළිබඳ සාධාරණ සහතිකයක් සැපයීමට තරම් යහපත් සහ ප්‍රමාණවත් බවද, බාහිර අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ නියාමන අවශ්‍යතාවලට අනුකූල බවද අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස වේ.

කළමනාකාරිත්වය අධ්‍යක්ෂ මණ්ඩලයට අවදානම සහ පාලනය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක කිරීමට, බැංකුව විසින් මුහුණ දෙන අවදානම් හඳුනා ගැනීම සහ තක්සේරු කිරීම, මෙම අවදානම් ලිහිල් කිරීම සහ පාලනය කිරීම සඳහා යෝග්‍ය අභ්‍යන්තර පාලන සැලසුම් කිරීම, මෙහෙයවීම සහ අධීක්ෂණය කිරීම මගින් සහාය වෙයි.

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන ක්‍රමයේ සැලසුම සහ කාර්යක්ෂමතාවය යොදා ගැනීමේදී හා සමාලෝචනය කිරීමේ දී අනුගමනය කරන ක්‍රියාවලියේ ප්‍රධාන ලක්ෂණ

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන පද්ධතියේ සැලසුම සහ ඵලදායීතාව සමාලෝචනය කිරීමේ පද්ධතියද අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කාලානුරූපීව පිහිටුවනු ලැබ තිබේ. අනෙකුත් දේවල් අතර එහි මූලික ක්‍රියාවලිවල පහත දේවල් අඩංගු ය:

- බැංකුවේ මෙහෙයුම්වල කාර්‍යක්ෂමතාව තහවුරු කිරීමටත්, අනුමත ආයතනික අරමුණු, උපාය මාර්ග සහ ප්‍රතිපත්ති සහ අනුමත කර ඇති ව්‍යාපාර නියමයන් සමග අනුකූල බව සහතික කිරීමට නිශ්චිත විෂය පථයන් සහ කාර්යයන් සහිතව අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු පිහිටුවා ඇත.
- අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC) විසින් බැංකුවේ අභ්‍යන්තර විගණන අංශය, බාහිර විගණකවරුන්, නියාමන අධිකාරීන් විසින් හඳුනා ගන්නා අභ්‍යන්තර පාලන දුර්වලතා වරින්වර සමාලෝචනය කරනු ලබන අතර එම දුර්වලතා නිවැරදි කිරීමට නිසි ක්‍රියාමාර්ග ගනියි. බැංකුවේ බාහිර විගණනය විගණකාධිපති විසින් සිදු කරනු ලැබේ. රජයේ විගණන අධිකාරී වෙත සාමාන්‍යයෙන් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු රැස්වීම් සඳහා ආරාධනා කෙරේ.
- විගණනයෙහි විෂයපථය සහ ගුණාත්මක බව කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව අභ්‍යන්තර විගණන කාර්යය සමාලෝචනය කරයි. මෙම වාර්ෂික වාර්තාවේ 199 පිටුවෙහි ඇති අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාවේ 2023 වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග දක්වා ඇත. බැංකුවේ අභ්‍යන්තර විගණන අංශය වාර්ෂික විගණන සැලසුම පරිදි ශාඛාවල, අංශවල සහ අනෙකුත් ඒකකවල විගණනය සිදු කරයි. විගණනය කරන වාර ගණන තක්සේරු කළ අවදානම් මට්ටම අනුව තීරණය කෙරේ. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විගණන සැලසුම ක්‍රියාත්මක කිරීම සඳහා අනුමත කරනු ලැබේ. අභ්‍යන්තර විගණන අංශය ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි සමග අනුකූලතාව සහ අභ්‍යන්තර පාලන පද්ධතිවල ඵලදායිතාව සහතික කිරීමට විගණන පරීක්ෂා සිදු කරන අතර කිනම් හෝ අනනුකූලතාවක් සම්බන්ධව එහි සොයා ගැනීම් වාර්තා කරයි. මෙහෙයුම් සහ කළමනාකරණ ක්‍රියාකාරකම් පිළිබඳ ස්වාධීන සහ විෂය මූලික වාර්තාවක් සැපයීමට විගණන සිදු කෙරේ. විගණනවල සොයා ගැනීම් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවෙහි වරින් වර පවත්වන රැස්වීම්වලදී සමාලෝචනය සඳහා යොමු කෙරේ. කමිටු රැස්වීම්වල සටහන් සමගින්, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවෙහි ක්‍රියාකාරකම් කාලානුරූපී පදනමකින් අධ්‍යක්ෂ මණ්ඩලයේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කෙරේ.
- බැංකුවේ ප්‍රධාන අවදානම් ක්ෂේත්‍රවල සමස්ත කළමනාකරණය අධීක්ෂණය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (ඊෂසඑඒ) පිහිටුවා ඇත. බැංකුවෙහි ක්‍රියාකාරකම්, අදාළ නීති, රෙගුලාසි සහ නියාමන උපදෙස්වලට අනුකූලව සිදු කරන බව සහතික කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්වාධීන අනුකූලතා ඒකකයක්ද ස්ථාපනය කර ඇති අතර අනුකූල නොවීම පිළිබඳ යම් ගැටලු කාලානුරූපීව අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත වාර්තා කෙරේ. අවදානම් තක්සේරුව පිළිබඳ වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් කාලානුරූපීව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරේ.
- බැංකුවේ එදිනෙදා ව්‍යාපාර මෙහෙයුම්වලදී බැංකුවේ ප්‍රධාන ක්ෂේත්‍රවල ඵලදායී කළමනාකරණ සහ අධීක්ෂණය සහතික කිරීමට කළමනාකරණ මට්ටමේ කමිටු ද නිසි සවිබලගැන්වීමක් සමගින් ක්‍රියාත්මකව ඇත. තක්සේරු කිරීම බැංකුව විසින් යොදන ක්‍රියාවලි පමණක් ආවරණය කරන අතර එහි පරිපාලිතය විසින් කරගෙන යන ක්‍රියාවලි අඩංගු නොකරයි.

බැංකුව 2012 වසරේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් සමන්විත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් යොදා ගන්නා ලදී. එකී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති යොදා ගැනීමෙහි සිට, හඳුනා ගැනීම, ඇගයීම, වර්ගීකරණය, සහ හෙළිදරව් කිරීම යන ඒවායෙහි නව අවශ්‍යතා සමග අනුකූල වීමට ක්‍රියාවලිවල නිරීක්ෂණය සහ අභිවෘද්ධිමය දියුණුව අඛණ්ඩව කර ගෙන යන ලදී.

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය

පසුගිය වසරවල මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනයන්ට අදාළව බාහිර විගණකවරුන් විසින් ඉදිරිපත් කරන ලද අදහස් වර්ෂය තුළ සමාලෝචනය කර ඒවා නිවැරදි කිරීමට සුදුසු පියවර ගෙන ඇත. මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනයන්ට අදාළව 2023 දී බාහිර විගණකවරුන් විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශවලට ඉදිරියේදී විසඳුම් ලබාදෙනු ඇත.

තහවුරු කිරීම

ඉහත ක්‍රියාවලි මත පදනම්ව, මූල්‍ය වාර්තාකරණයේ විශ්වසනීය බව පිළිබඳව සාධාරණ සහතිකයක් සැපයීමට බැංකුවේ මූල්‍ය වාර්තාකරණ පද්ධතිය නිර්මාණය කර ඇති බවත් සහ බාහිර අවශ්‍යතාවයන් සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමන අවශ්‍යතාවලට අනුකූල බව අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,



ආචාර්ය හර්ෂ කබ්රාල්
සභාපති



දුෂ්‍යන්ත බස්නායක
අධ්‍යක්ෂ



ජූඩ් නිලුක්ෂාන්
අධ්‍යක්ෂ

2024 මාර්තු 20
කොළඹ

අභ්‍යන්තර පාලනය පිළිබඳ ස්වාධීන සහතික වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } බීඒඑන්/ඒ/එන්එස්බී/අයිසී/2023/01
ඔබේ අංකය உமது இல. Your No. }
දිනය திகதி Date } 2024 අප්‍රේල් 22

සභාපති
ජාතික ඉතිරිකිරීමේ බැංකුව

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂකවරුන්ගේ ප්‍රකාශය මත අධ්‍යක්ෂක මණ්ඩලයට විගණකාධිපතිගේ සහතිකකරණ වාර්තාව

හැඳින්වීම

මෙම වාර්තාව, 2023 දෙසැම්බර් 31 දින අවසන් වර්ෂය සඳහා වාර්ෂික වාර්තාවට ඇතුලත් කර ඇති ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අභ්‍යන්තර පාලනය ("ප්‍රකාශය") පිළිබඳ අධ්‍යක්ෂකවරුන්ගේ ප්‍රකාශය මත සහතිකවීමක් ලබා දීමටයි.

කළමනාකාරිත්වයේ වගකීම

කළමනාකාරිත්වය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් 2007 අංක 12 දරණ බැංකු පනත් නියෝගයේ 3 (8) (ii) (ආ) වගන්තියට අනුකූලව නිකුත් කර ඇති "අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය මත බැංකුවේ අධ්‍යක්ෂවරුන් සඳහා මාර්ගෝපදේශ" අනුව ප්‍රකාශය සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා වගකියයි.

SLSAE 3050 සමග මගේ වගකීම් සහ අනුකූලත්වය (සංශෝධිත)

අධ්‍යක්ෂ මණ්ඩලය පිළියෙල කළ හෝ/ඔවුන් වෙත ලබාදුන් ලියකියවිලි මගින් හා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඇති කළ අභ්‍යන්තර පාලන ක්‍රියාවලීන් නිර්මාණය හා එහි ඵලදායීතාවය විමර්ශනය කිරීමෙන් ඒ පිළිබඳ වාර්තාවක් ලබාදීම මාගේ වගකීමයි. මම ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය මත බැංකු සඳහා වන සහතික කිරීමේ වාර්තාව – සහතිකකරණ කාර්යභාරය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රමිති (SLSAE 3050) සමග අනුකූලව මම මෙම විගණන කාර්යභාරය ඉටු කළෙමි.

මෙම ප්‍රමිතිය මගින් සියළුම ප්‍රමාණාත්මක අංශයන්ගෙන් ගත් කළ අභ්‍යන්තර පාලනය පිළිබඳ ප්‍රකාශය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිළියෙල කර ඇත්ද යන්න පිළිබඳ සීමිත තහවුරු කිරීමක් ලබාදීම පිණිස මා විසින් සැලසුම් කිරීම හා ක්‍රියාමාර්ගයන් ක්‍රියාත්මක කිරීම මෙම ප්‍රමිතිය මගින් අත්‍යවශ්‍ය වේ.

මෙම කාර්යභාරයට අදාළව කිසිදු වාර්තාවක් යාවත්කාලීන කිරීම හෝ නැවත ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් මා වෙත වගකීම නොපැවරෙන අතර, මෙම කර්යභාරය අතරතුර මූල්‍ය තොරතුරු විගණනය හෝ සමාලෝචනය කිරීම ද මා විසින් සිදු නොකරන ලදී.

සිදු කළ කාර්ය සාරාංශය

අධ්‍යක්ෂවරුන් සඳහා හෝ විසින් සකස් කරන ලද ලේඛන ප්‍රකාශය සහ බැංකුවේ අභ්‍යන්තර පාලන ක්‍රම සමාලෝචනය කිරීමේදී අධ්‍යක්ෂවරුන් විසින් අනුගමනය කර ඇති ක්‍රියාවලිය මැනවින් පිළිබිඹු වෙන ආකාරයට ප්‍රකාශය සකසා ඇත්ද යන්න ඇගයීම සඳහා මගේ මැදිහත්වීම සිදුකර ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරනු ලබන ක්‍රියාවලියට සහාය වන ආදර්ශ පදනමක් මත ලේඛන පැවැත්ම සහ බැංකු කාර්යමණ්ඩලයේ විමසීම්වලට, අනුගමනය කරන ක්‍රියා පටිපාටීන් මූලිකවම සීමා වේ.

SLSAE 3050 (සංශෝධිත) අනුව, ප්‍රකාශය සියලුම අවදානම් සහ පාලන ආවරණය කරන්නේද යන්න පිළිබඳව හෝ බැංකු අවදානම සහ පාලන ක්‍රියාදාමයේ කාර්යක්ෂමතාව පිළිබඳ මතයක් සැකසීම සලකා බැලීමට මට අවශ්‍යතාවක් ඇති නොකරයි. එසේම SLSAE 3050 (සංශෝධිත) අනුව, වාර්ෂික වාර්තාවේ සඳහන් කිනම් හෝ සුවිශේෂී ගැටලුවක් සම්බන්ධයෙන් වැදගත් අභ්‍යන්තර පාලන අංශ සමඟ කටයුතු කිරීමට විස්තර කර ඇති ක්‍රියාපටිපාටි ඇත්ත වශයෙන්ම, ගැටලු විසඳන්නේද යන්න සලකා බැලීමටද මට අවශ්‍යතාවක් ඇති නොකරයි.

බැංකුව සම්බන්ධයෙන් ඇති මාගේ අවබෝධය මෙම ප්‍රකාශය සම්බන්ධිත ගනුදෙනු හා සිදුවීම් මත මාගේ ක්‍රියාමාර්ග තෝරා ගැනීමට බලපාන ලදී.

නිගමනයට එළඹීමේ පදනමක් සහිත ප්‍රමාණවත් හා යෝග්‍ය සාක්ෂි රැස් කරගත් බව මම විශ්වාස කරමි.

මාගේ නිගමනය

බැංකුවේ මූල්‍ය වාර්තාකරණය හා සම්බන්ධ අභ්‍යන්තර පාලන පද්ධතියේ සැකැස්ම හා ඵලදායීතාවය සමාලෝචනය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ක්‍රියාවලිය පිළිබඳ මාගේ අවබෝධය හා වාර්ෂික වාර්තාවේ ඇතුළත් ප්‍රකාශය අතර නොගැලපීමක් පවතින බව විශ්වාස කිරීමට හේතු වන කිසිදු කරුණක් අනුග මනය කරන ලද පටිපාටි මත පදනම්ව මාගේ අවධානයට ලක් වී නොමැත.

ඩබ්ලිව් පී සී වික්‍රමරත්න
විගණකාධිපති

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීගේ සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීගේ වගකීම් පිළිබඳ ප්‍රකාශය

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ (බැංකුව) මූල්‍ය ප්‍රකාශන සහ බැංකුවේ සහ එහි පරිපාලිතයේ (සමූහයේ) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 2023 දෙසැම්බර් 31 වන දිනට පහත සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූලව පිළියෙළ කර ඉදිරිපත් කර ඇත:

- 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත සහ එයට සිදුකළ සංශෝධන.
- 1971 අංක 38 දරන මුදල් පනත.
- 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති පනත.
- 1988 අංක 30 දරන බැංකු පනත හා එයට සිදුකළ සංශෝධන සහ එය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ මූල්‍ය ප්‍රකාශන ආකෘති සහ තොරතුරු හෙළිදරව් කිරීම් තොරතුරුවලට අදාළ නියෝග සහ මාර්ගෝපදේශ.
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය (CA Sri Lanka) විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (SLFRSs/ LKASs)/ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ඇති සංස්ථාපිත පාලනය පිළිබඳ වඩා යහපත් පරිචය සංග්‍රහය 2017.
- සංස්ථාපිත පාලනය සඳහා වඩා යහපත් සංග්‍රහය පිළිබඳ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද 2007 අංක 12 දරන බැංකු පනත් නියමය.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී භාවිත කර ඇති ආකෘති සහ සිදු කර ඇති හෙළිදරව් කිරීම්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 1 (LKAS 1) – "මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම" හි හෙළිදරව් කිරීමේ අවශ්‍යතා සමගද අනුකූල වන අතර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කර ඇති නිශ්චිත ආකෘති සමගද අනුකූලය. බැංකුව සහ සමූහය එහි මූල්‍ය ප්‍රතිඵල එහි පරිශීලකයන්ට කාර්තුමය පදනමකින් ඉදිරිපත් කරයි.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා බැංකුව සහ සමූහය විසින් නිසි ගිණුම්කරණ ප්‍රතිපත්ති අඛණ්ඩව යොදා ගෙන ඇත. ඉහළ මට්ටමේ විනිශ්චයක් සහ සංකීර්ණතාවක් සහිත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ඇස්තමේන්තු යොදා ගැනීම බැංකුවේ බාහිර විගණකවරුන් සහ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව සමග සාකච්ඡා කරන ලදී.

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව ප්‍රකාශයට පත් කළ දින සිට ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගණනය කිරීම් ක්‍රමවේදයෙහි කිසිදු වෙනසක් සිදු නොවිය. ඒ අනුව වර්තමාන ඉදිරිපත් කිරීමට අනුකූල වන පරිදි සංසන්දනාත්මක තොරතුරු සංශෝධනය කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණි.

අපි අපගේ දැනුමේ තරමට මෙම වාර්තාවේ අඩංගු මූල්‍ය ප්‍රකාශන, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් මූල්‍ය තොරතුරු, සමාලෝචිත වර්ෂය තුළ බැංකුවේ සහ සමූහයේ වත්කම්, වගකීම්, මෙහෙයුම්වල ප්‍රතිඵල සහ මුදල් ප්‍රවාහවල සියලු ප්‍රමාණාත්මක අංශ සාධාරණව නිරූපණය කරන බව සහ මූල්‍ය ප්‍රකාශනවල සත්‍ය සහ සාධාරණ දැක්මක් දී ඇති බව තහවුරු කරමු. තවද අපි මෙහෙයුම් කටයුතු අඛණ්ඩව කරගෙන යාමට බැංකුවට සහ සමූහයට ප්‍රමාණවත් සම්පත් ඇති බවත් මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී අඛණ්ඩ පැවැත්ම පදනම යොදා ගෙන ඇති බවටත් තහවුරු කරමු.

අභ්‍යන්තර පාලනය පිළිබඳ වගකීම සහ ක්‍රියාපටිපාටි

බැංකුව සහ එහි පරිපාලිතයේ අභ්‍යන්තර පාලන ස්ථාපනය කිරීමට, ක්‍රියාත්මක කිරීමට, සහ පවත්වාගෙන යාමට අපි වගකිව යුතු වෙමු. වත්කම් ආරක්ෂා කිරීම, වංචා සහ/හෝ වැරදි මෙන්ම අනෙකුත් අකුමිකතා වැළැක්වීම සහ හෙළිදරව් කිරීම සඳහා බැංකුවට සහ සමූහයට අදාළ වැදගත් තොරතුරු අපට දැන ගැනීමට හැකි බවත් සහතික කරමින් ඵලදායී අභ්‍යන්තර පාලන සහ ක්‍රියාපටිපාටි නිසි ලෙස ස්ථානගත කර ඇති බව, සහ ඒවා අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය, ඇගයීම සහ යාවත්කාලීන කරන බව අපි සහතික කරමු. අපගේ දැනීමේ තරමට, අභ්‍යන්තර පාලන සහ ක්‍රියාපටිපාටි සැලසුම් කිරීමේ හෝ ක්‍රියාත්මක කිරීමේ සැලකිය යුතු අඩුපාඩු සහ දුබලතා නොවූ බවට අපි සැහීමට පත් වෙමු. අපි අපගේ ඇගයීම් මත පදනම්ව, අභ්‍යන්තර පාලනවල සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳ සැලකිය යුතු අඩුපාඩු හෝ කැපී පෙනෙන දුබලතා සහ කළමනාකරණ හෝ අනෙකුත් සේවකයන් සම්බන්ධ වංචා නොවූ බව අපි තහවුරු කරමු.

මූල්‍ය වාර්තාකරණය සහ ක්‍රියාපටිපාටි සම්බන්ධව අභ්‍යන්තර පාලන සහ ක්‍රියාපටිපාටි අඛණ්ඩව අනුග මනය කරන බව සහතික කිරීමට බැංකුවේ අභ්‍යන්තර විගණකවරුන්ද කලින් කලට විමර්ශන සිදු කරයි. කෙසේ වෙතත්, ඕනෑම අභ්‍යන්තර පාලන හා ගිණුම්කරණ ක්‍රමයක් මගින් ලබාදෙන සහතිකය 100% ක් පිළිගැනීමේ යම් ආවේනික සීමාවන් පවතී.

මූල්‍ය වාර්තාකරණය මත අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂකවරුන්ගේ ප්‍රකාශය මෙම වාර්ෂික වාර්තාවේ 224-225 පිටුවේ දක්වා ඇත. විගණකාධිපතිවරයා විසින් බැංකුව විසින් යොදා ගන්නා ලද මූල්‍ය වාර්තාකරණය මත අභ්‍යන්තර පාලනයේ සඵලතාවය විගණනය කර ඇති අතර ඒ පිළිබඳ විකරණය නොකළ මතයක් ලබා දී ඇත. මෙම වාර්ෂික වාර්තාවේ 226 පිටුවේ එය දක්වා ඇත.


බාහිර විගණනය

බැංකුවේ සහ එහි පරිපාලිතයේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති විසින් විගණනය කරන ලදී. බැංකුවේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිගේ වාර්තාව මෙම වාර්ෂික වාර්තාවෙහි 228-230 පිටුවෙහි දක්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව අනෙක් කරුණු ද සමගින්, සියලු අභ්‍යන්තර විගණන සහ පරීක්ෂණ වැඩසටහන්, අභ්‍යන්තර පාලන පද්ධති සහ ක්‍රියාපටිපාටිවල කාර්යක්ෂමතාව සමාලෝචනය කළ අතරම වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ව්‍යවස්ථාපිත සහ නියාමන අවශ්‍යතාවන්වලට ඒවායේ අනුකූල බවද සමාලෝචනය කළ අතර, ඒවායේ විස්තර මෙම වාර්ෂික වාර්තාව තුළ 182 සිට 184 දක්වා පිටුවල ඇති අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාවේ දී ඇත. පූර්ණ ස්වාධීනත්වය සහතික කිරීමට විගණකාධිපතිට සහ අභ්‍යන්තර විගණකවරුන්ට, වැදගත් වන කරුණු සාකච්ඡා කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ සාමාජිකයන් වෙත පූර්ණ සහ නිදහස් ප්‍රවේශය ඇත.

තහවුරු කිරීම

අපි අපේ දැනුමේ තරමට පහත දේවල් තහවුරු කරමු.

- බැංකුව සහ සමූහය සියලු අදාළ විය හැකි නීති සහ රෙගුලාසි සහ විවක්ෂණශීලී අවශ්‍යතාවන් සමඟ අනුකූල වී ඇත.
- මූල්‍ය ප්‍රකාශනවල 341 පිටුවේ 51 සටහනේ හෙළිදරව් කර ඇති තොරතුරු හැර සැලකියයුතු අනුකූල නොවීමේ අවස්ථා සහ බැංකුවට සහ සමූහයට එරෙහිව නඩු පැවරීම් ද නැත.
- බැංකුව සහ සමූහය විසින් ගෙවිය යුතු සියලු බදු, තීරු බදු, අය බදු සහ සියලු ව්‍යවස්ථාපිත ගෙවීම් සහ බැංකුවේ සහ සමූහයේ සේවකයන් වෙනුවෙන් ගෙවිය යුතු සියලු දායක මුදල්, අය බදු සහ බදු 2023 දෙසැම්බර් 31 වන දිනට ගෙවා හෝ අවශ්‍ය පරිදි ප්‍රතිපාදනයන් කර ඇත.



ශෂී කණ්ඩම්බි මිය
සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී



කේ රවීන්ද්‍රන්
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී

2024 මාර්තු 25
කොළඹ

විගණකාධිපති වාර්තාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE



මගේ අංකය எனது இல. My No. } බීඒඑන්/ඒ/එන්එස්බී/එෆ්ඒ/2023/01

ඔබේ අංකය உமது இல. Your No. }

දිනය திகதி Date } 22 මාර්තු 2024

සභාපති

ජාතික ඉතිරිකිරීමේ බැංකුව

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සහ එහි පරිපාලිතයන්හි 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ("බැංකුව") සහ එහි පරිපාලිතයන්හි ("සමූහය") 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

බැංකුවේ සහ සමූහයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 බැංකුවේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කළයුතු අනෙකුත් තොරතුරු

අනෙකුත් තොරතුරු, බැංකුවේ 2023 වාර්ෂික වාර්තාවට ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ මත මාගේ විගණන වාර්තාවට ඇතුළත් නොවන තොරතුරු වලින් සමන්විත වන අතර, මෙම විගණන වාර්තාවේ දිනට පසුව එය මා වෙත ලබාදෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ මතය, අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මා ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතික නිගමනයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් වෙනත් තොරතුරු ලබාගෙන හැකි විට එය කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමග ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපේ ද යන්න හෝ විගණනයේදී ලබාගත් මාගේ දැනුම හෝ එසේ නොමැති නම් ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් පෙන්වන්නේද යන්න සලකා බැලීමයි.

මා විසින් බැංකුවේ 2023 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වැරදි අර්ථකථන ඇති බව නිගමනය කළහොත් ඒවා නිවැරැදි කිරීම සඳහා වගකිව යුතු පාලකයන් සමග එම කරුණු පිළිබඳ අදහස් හුවමාරු කර ගැනීමට මට අවශ්‍ය වේ. තවදුරටත් නිවැරැදි නොකළ වැරදි අර්ථකථන තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව ඉදිරියේදී මා විසින් පාර්ලිමේන්තුවට සභාගත කරන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

විගණකාධිපති වාර්තාව

කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

බැංකුවේ සහ සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව, සමූහය වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බැවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමූහයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනයන් පදනම් වී ඇත්තේ මාගේ විගණක වාර්තාවේ දිනය දක්වා ලබාගත් විගණක සාක්ෂි මතය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.
- ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම සඳහා සමූහය තුළ ඇති ආයතන හෝ ව්‍යාපාර ක්‍රියාකාරකම් වල මූල්‍ය තොරතුරු සම්බන්ධයෙන් ප්‍රමාණවත් සහ අදාළ විගණන සාක්ෂි ලබාගැනීම, සමූහ විගණනයේ මෙහෙයවීම, අධීක්ෂණය සහ කාර්ය සාධනය පිළිබඳ වගකීම මා සතුය. මාගේ විගණන මතයට මම සම්පූර්ණයෙන්ම වගකිව යුතුයි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා බැංකුව විසින් පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) **(iii)** වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) **(iv)** වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව බැංකුවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට බැංකුව සම්බන්ධ වී ඇති යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනුයාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 **(B)** වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාළ ලිඛිත නීතියකට හෝ බැංකුවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව බැංකුව බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව බැංකුවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

ඩබ්ලිව් පී සී වික්‍රමරත්න
විගණකාධිපති

මූල්‍ය ප්‍රකාශනවල අන්තර්ගතය

		පිටු අංකය
මූලික මූල්‍ය ප්‍රකාශය		
ආදායම් ප්‍රකාශය		232
විස්තීරණ ආදායම් ප්‍රකාශය		233
මූල්‍ය තත්ත්වය පිළබඳ ප්‍රකාශය		234
හිමිකමේ වෙනස්වීම් දක්වන ප්‍රකාශය - බැංකුව		236
හිමිකමේ වෙනස්වීම් දක්වන ප්‍රකාශය - සමූහය		238
මුදල් ප්‍රවාහ ප්‍රකාශය		240
මූල්‍ය ප්‍රකාශනවල සටහන් - පොදු		
1.	**වාර්තාකරණ ඒකකය**	242
1.1	ආයතනික තොරතුරු	242
1.2	ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන	242
1.3	මූල්‍ය ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය	242
2.	**ගිණුම්කරණ ප්‍රතිපත්ති**	242
2.1	ගිණුම් පිළියෙල කිරීමේ පදනම	242
2.2	ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස්වීම්	246
2.3	සාධාරණ අගය මිනීම	246
2.4	සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති - පොදු	247
2.5	සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති - වත්කම් හා වගකීම් හඳුනාගැනීම මූල්‍ය උපකරණ	248
2.6	වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති - මූල්‍ය උපකරණ සඳහා ආදායම් හා වියදම් හඳුනාගැනීම	257
2.7	වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති - බදුකරණය	257
2.8	මුදල් ප්‍රවාහ ප්‍රකාශය	257
2.9	නියාමන ප්‍රතිපාදන	257
2.10	වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසු සිදුවීම්	258
2.11	නිකුත් කරන ලද මුත් වාර්තාකරණ දිනට බල නොපැවැත්වෙන ගිණුම්කරණ ප්‍රමිතීන්	258
මූල්‍ය ප්‍රකාශනවල සටහන් - ආදායම් ප්‍රකාශය		
3.	දළ ආදායම	259
4.	ශුද්ධ පොළී ආදායම	259
5.	ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම	262
6.	වෙළඳාම් කටයුතු වලින් ලත් ශුද්ධ ලාභය/(අලාභය)	263
7.	ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කළ මූල්‍ය උපකරණයන්ගෙන් ලත් ශුද්ධ ලාභය/(අලාභය)	263
8.	මූල්‍ය වත්කම් හඳුනාගැනීම අත්හැරීම මගින් ලත් ශුද්ධ ලාභය/(අලාභය)	264
9.	වෙනත් මෙහෙයුම් ආදායම් (ශුද්ධ)	264
10.	හානිකරණ වියදම්	265
11.	සේවක මණ්ඩල වියදම්	266
12.	වෙනත් වියදම්	268
13.	බදු වියදම්	269
14.	කොටසක ඉපැයුම	271
මූල්‍ය ප්‍රකාශනවල සටහන් - මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය වත්කම්		
15.	ගණනය කරන ලද පදනම මත මූල්‍ය උපකරණවල විශ්ලේෂණය	272
16.	මුදල් හා මුදල් සමානයන්	275
17.	මහ බැංකුව වෙතැති ශේෂයන්	275
18.	බැංකුවල ඇති තැන්පතු	276
19.	ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	276
20.	ලාභ/අලාභ මගින් හඳුනාගත් මූල්‍ය වත්කම්	277
21.	ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් - ණය හා අත්තිකාරම්	281
22.	ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් - ණය හා වෙනත් උපකරණ	288
23.	වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම්	290
24.	පාලිත සමාගම්වල ආයෝජනය	294
25.	ආශ්‍රිත සමාගම්වල සහ බද්ධ ව්‍යාපාරවල ආයෝජනය	295
26.	දේපල, පිරියත සහ උපකරණ	295
27.	පරිහරනය කිරීමේ අයිතිය හිමි වත්කම්	301
28.	දේපල ආයෝජන	302
29.	කීර්තිනාමය සහ අස්පෘශ්‍ය වත්කම්	304
30.	විලම්බිත බදු (වත්කම්)/වගකීම්	306
31.	වෙනත් වත්කම්	309
මූල්‍ය ප්‍රකාශනවල සටහන් - මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය - වගකීම් සහ හිමිකම්		
32.	බැංකුවලට ගෙවිය යුතු	310
33.	ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	310
34.	ලාභ/අලාභ මගින් හඳුනාගත් මූල්‍ය වගකීම්	310
35.	ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වගකීම්	311
36.	කල්බදු වගකීම්	312
37.	නිකුත්කළ ණය සුරකුම්පත්	313
38.	සේවාවසාන ප්‍රතිලාභ බැඳීම්	316
39.	ප්‍රවර්තන බදු වගකීම්	328
40.	වෙනත් ප්‍රතිපාදන	328
41.	වෙනත් වගකීම්	328
42.	පරිපාලිත සමාගම්වලට ගෙවිය යුතු	329
43.	ප්‍රකාශිත ප්‍රාග්ධනය/පවරන ලද ප්‍රාග්ධනය	329
44.	ව්‍යවස්ථාපිත සංචිත අරමුදල	329
45.	රඳවාගත් ඉපයීම්	330
46.	වෙනත් සංචිත	330
47.	පාලනය යටත් නොවන හිමිකම	333
මූල්‍ය ප්‍රකාශනවල සටහන් - අනෙකුත් හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවයන්		
48.	අසම්භාව්‍ය වගකීම් හා බැඳීම්	333
49.	සම්බන්ධිත පාර්ශවයන්ට අදාළ හෙළිදරව් කිරීම	334
50.	සාමාන්‍ය කොටසක ශුද්ධ වත්කම් වටිනාකම	341
51.	බැංකුවට හා සමූහයට විරුද්ධව ඇති නීති කෘත්‍යයන්	341
52.	මූල්‍ය ප්‍රකාශ වාර්තා කළ දිනට පසු සිදුවීම්	342
53.	සංසන්දනාත්මක තොරතුරු	342
54.	මූල්‍ය අවදානම් කළමනාකරණය	342
55.	කල් පිරීමේ විශ්ලේෂණය	375
56.	මූල්‍ය උපකරණවල සාධාරණ අගය	379
57.	ප්‍රාග්ධන කළමනාකරණය (නියාමන වාර්තාකරණය අනුව)	384
58.	පිටපත් රහිත භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර වලට අදාළ ප්‍රතිමිලදී ගැනීම් හා ප්‍රතිවිකුණුම් ගනුදෙනු	385

ආදායම් ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන	පිටුව	බැංකුව 2023 රු. '000	බැංකුව 2022 රු. '000	බැංකුව වෙනස %	සමූහය 2023 රු. '000	සමූහය 2022 රු. '000	සමූහය වෙනස %
දළ ආදායම	3	259	**232,064,322**	174,530,349	33	**238,824,651**	174,977,187	36
පොළී ආදායම			**226,967,227**	172,940,351	31	**231,204,088**	175,769,899	32
අඩුකළා: පොළී වියදම			**197,402,011**	140,477,402	41	**199,266,982**	142,166,248	40
ශුද්ධ පොළී ආදායම	4	259	**29,565,216**	32,462,949	(9)	**31,937,106**	33,603,651	(5)
ගාස්තු සහ කොමිස් ආදායම			**1,593,415**	2,172,978	(27)	**1,605,521**	2,180,276	(26)
අඩුකළා: ගාස්තු සහ කොමිස් වියදම			**317,046**	232,767	36	**317,292**	235,201	35
ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම	5	262	**1,276,369**	1,940,211	(34)	**1,288,229**	1,945,075	(34)
වෙළඳාම් කටයුතුවලින් ලද ශුද්ධ ලාභය/(අලාභය)	6	263	**1,425,791**	(971,434)	247	**3,701,827**	(3,489,830)	206
ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කළ මූල්‍ය උපකරණයන්ගෙන් ලත් ශුද්ධ ලාභය/(අලාභය)	7	263	**–**	–	–	**–**	–	–
මූල්‍ය වත්කම් හඳුනාගැනීම අත්හැරීම තුළින් ලත් ශුද්ධ ලාභය/(අලාභය)	8	264	**1,820,617**	(26,203)	7,048	**1,820,617**	(26,203)	7,048
වෙනත් මෙහෙයුම් ආදායම් (ශුද්ධ)	9	264	**257,272**	414,656	(38)	**492,598**	543,045	(9)
මුළු මෙහෙයුම් ආදායම			**34,345,265**	33,820,181	2	**39,240,377**	32,575,739	20
අඩුකළා: හානිකරණ වියදම්	10	265	**4,258,828**	4,862,198	(12)	**4,159,978**	4,935,391	(16)
ශුද්ධ මෙහෙයුම් ආදායම			**30,086,437**	28,957,983	4	**35,080,399**	27,640,348	27
අඩුකළා: වියදම්								
සේවක මණ්ඩල වියදම්	11	266	**16,110,458**	13,790,521	17	**16,424,824**	14,117,672	16
ක්ෂයවීම් හා ක්‍රමක්ෂය වියදම්			**1,432,520**	1,414,697	1	**1,448,489**	1,431,867	1
වෙනත් වියදම්	12	268	**6,954,619**	5,990,018	16	**7,097,612**	6,352,583	12
මූල්‍ය සේවා මත එකතුකළ අගය මත බදු සහ සමාජ ආරක්ෂණ දායකත්ව බදු පෙර මෙහෙයුම් ලාභය			**5,588,840**	7,762,747	(28)	**10,109,474**	5,738,226	76
අඩුකළා: මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු			**1,142,716**	3,185,879	(64)	**1,832,755**	3,326,549	(45)
අඩුකළා: මූල්‍ය සේවා මත සමාජ ආරක්ෂණ දායකත්ව			**158,708**	67,259	136	**254,298**	72,067	253
මූල්‍ය සේවා මත එකතුකළ අගය මත බදු සහ සමාජ ආරක්ෂණ දායකත්ව බදු පසු මෙහෙයුම් ලාභය			**4,287,416**	4,509,609	(5)	**8,022,421**	2,339,610	243
ආශ්‍රිත සමාගම්වල සහ බද්ධ ව්‍යාපාර වල ලාභයෙන් හිමි කොටස			**–**	–	–	**–**	–	–
ආදායම් බදුවලට පෙර ලාභය			**4,287,416**	4,509,609	(5)	**8,022,421**	2,339,610	243
අඩුකළා: ආදායම් බදු වියදම	13	269	**(2,929,067)**	1,979,942	(248)	**(1,594,388)**	1,390,619	(215)
වර්ෂය සඳහා ලාභය			**7,216,483**	2,529,667	185	**9,616,809**	948,991	913
ලාභය බෙදී යන ආකාරය								
පාලක සමාගමේ හිමිකරුවන්			**7,216,483**	2,529,667	185	**9,616,809**	948,991	913
පාලනයට යටත් නොවන හිමිකම්			**–**	–	–	**–**	–	–
වර්ෂය සඳහා ලාභය			**7,216,483**	2,529,667	185	**9,616,809**	948,991	913
ලාභය මත කොටසක ඉපයීම								
සාමාන්‍ය කොටසක මූලික ඉපයීම් (රු.)	14	271	**7.68**	2.69	185	**10.23**	1.01	913
සාමාන්‍ය කොටසක තනුක ඉපයීම් (රු.)			**7.68**	2.69	185	**10.23**	1.01	913
වර්ෂය සඳහා ලාභය			**7,216,483**	2,529,667	185	**9,616,809**	948,991	913

242 පිටුවේ සිට 385 පිටුව දක්වා හෙළිදරව් කර ඇති වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් පිළිබඳ සටහන්, මෙම මූල්‍ය ප්‍රකාශනයන්ගේ සංකලිත කොටසකි.

විස්තීරණ ආදායම් ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව			සමූහය		
	2023 රු. '000	2022 රු. '000	වෙනස **%**	**2023 රු. '000**	2022 රු. '000	වෙනස **%**
වර්ෂය සඳහා ලාභය	**7,216,483**	2,529,667	185	**9,616,809**	948,991	913
ආදායම් ප්‍රකාශයට නැවත වර්ගීකරණය කළ යුතු වෙනත් විස්තීර්ණ ආදායම්						
විදේශ ගනුදෙනු පරිවර්තනය මත වූ විනිමය වෙනස්කම්	**–**	–	–	**–**	–	–
ඉදිරි සුරැකුම් මුදල් ප්‍රවාහ කටයුතු වලින් ලත් ශුද්ධ ලාභ/(අලාභ)	**–**	–	–	**–**	–	–
වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට පවතින ණය උපකරණ මත ශුද්ධ ලාභ/(අලාභ)	**–**	–	–	**–**	–	–
ආශ්‍රිත සමාගම් සහ බද්ධ ව්‍යාපාර වල ලාභයෙන් හිමි කොටස	**–**	–	–	**–**	–	–
වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට පත් කළ ණය උපකරණ	**3,742,285**	(658,872)	668	**3,919,079**	(596,547)	757
වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට නම් කළ ණය උපකරණ ඉවත් කිරීම මත සාධාරණ අගය මත ලාභ/(අලාභ) ආදායම් ප්‍රකාශයට මාරු කිරීම	**(1,820,617)**	7,913	(23,108)	**(1,820,617)**	7,913	(23,108)
ඉහත අයිතම සඳහා විලම්බිත බදු බලපෑම	**(576,501)**	220,995	(361)	**(629,539)**	220,995	(385)
ආදායම් ප්‍රකාශයට නැවත වර්ගීකරණය කලයුතු වෙනත් විස්තීර්ණ ආදායම් එකතුව	**1,345,167**	(429,964)	413	**1,468,923**	(367,638)	500
ආදායම් ප්‍රකාශයට නැවත වර්ගීකරණය කළ යුතු නොවන වෙනත් විස්තීර්ණ ආදායම්						
වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට පවතින හිමිකම් උපකරණවල ආයෝජනයන්හි සාධාරණ අගයෙහි වෙනස්වීම	**1,971,371**	(581,536)	439	**2,070,885**	(643,881)	422
ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට පවතින මූල්‍ය වගකීම් මත බැංකුවේ ණය අවදානම ආරෝපණය කිරීමේ සාධාරණ වෙනස්වීම	**–**	–	–	**–**	–	–
සේවාවසාන ප්‍රතිලාභ බැඳීම් නැවත ආගණනය	**(6,107,248)**	(880,529)	594	**(6,106,664)**	(882,050)	592
ඉහත අයිතම සඳහා විලම්බිත බදු බලපෑම	**1,723,862**	1,225,071	41	**1,723,503**	1,225,071	41
සේවාවසාන ප්‍රතිලාභ බැඳීම් නැවත ආගණනය (බදු පසු)	**(4,383,386)**	344,542	(1,372)	**(4,383,161)**	343,021	(1,378)
ප්‍රත්‍යාගණන අතිරික්තයේ වෙනස්වීම්	**2,075,948**	–	100	**2,333,511**	–	100
ඉහත අයිතම සඳහා විලම්බිත බදු බලපෑම	**(623,608)**	(555,724)	12	**(623,608)**	(555,724)	12
ප්‍රත්‍යාගණන අතිරික්තයේ වෙනස්වීම් (බදු පසු)	**1,452,340**	(555,724)	361	**1,709,903**	(555,724)	408
ආශ්‍රිත සමාගම් සහ බද්ධ ව්‍යාපාර වල ලාභයෙන් හිමි කොටස	**–**	**–**	**–**	**–**	**–**	**–**
ආදායම් ප්‍රකාශයට නැවත වර්ගීකරණ කළ යුතු නොවන වෙනත් විස්තීර්ණ ආදායම් එකතුව	**(959,675)**	(792,718)	21	**(602,373)**	(856,584)	(30)
වර්ෂයට අදාළ වෙනත් විස්තීර්ණ ආදායම්, බදු ගෙවූ පසු	**385,492**	(1,222,682)	132	**866,550**	(1,224,223)	171
වර්ෂයට අදාළ මුළු විස්තීර්ණ ආදායම	**7,601,975**	1,306,985	482	**10,483,359**	(275,232)	3,909
ලාභය බෙදී යන ආකාරය						
පාලක සමාගමේ හිමිකරුවන්	**7,601,975**	1,306,985	482	**10,483,359**	(275,232)	3,909
පාලනයට යටත් නොවන හිමිකම්	**–**	–	–	**–**	–	–
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම	**7,601,975**	1,306,985	482	**10,483,359**	(275,232)	3,909

242 පිටුවේ සිට 385 පිටුව දක්වා හෙළිදරව් කර ඇති වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් පිළිබඳ සටහන්, මෙම මූල්‍ය ප්‍රකාශනයන්ගේ සංකලිත කොටසකි.

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනට	සටහන	පිටුව	බැංකුව 2023 රු. '000	බැංකුව 2022 රු. '000	බැංකුව වෙනස %	සමූහය 2023 රු. '000	සමූහය 2022 රු. '000	සමූහය වෙනස %
වත්කම්								
මුදල් හා මුදල්වලට සමානයන්	16	275	**9,508,563**	8,734,069	9	**9,546,756**	8,782,807	9
මහ බැංකුව වෙතැති ශේෂයන්	17	275	**246,998**	236,480	4	**247,232**	236,696	4
බැංකුවල ඇති තැන්පතු	18	276	**22,576,750**	10,466,409	116	**23,618,966**	11,034,246	114
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	19	276	**924**	28,172	(97)	**11,231**	35,392	(68)
ලාභ අලාභ මගින් හඳුනාගත් මූල්‍ය වත්කම්	20	277						
– සාධාරණ අගයට ගණනය කළ			**17,748,501**	14,173,948	25	**40,189,162**	23,236,848	73
– සාධාරණ අගයට නම් කළ			**–**	–	–	**–**	–	–
ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම්								
– ණය හා අත්තිකාරම්	21	281	**526,520,530**	553,027,321	(5)	**523,809,104**	553,052,170	(5)
– ණය හා වෙනත් උපකරණ	22	288	**943,704,684**	919,129,377	3	**953,056,324**	927,916,442	3
වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම්	23	290	**61,924,412**	27,662,763	124	**62,694,519**	28,252,211	122
පාලිත සමාගම්වල ආයෝජනයන්	24	294	**7,311,000**	7,311,000	–	**–**	–	–
ආශ්‍රිත සමාගම්වල සහ බද්ධ ව්‍යාපාරවල ආයෝජනයන්	25	295	**–**	–	–	**–**	–	–
දේපල, පිරියත සහ උපකරණ	26	295	**17,248,961**	14,755,775	17	**18,389,400**	15,645,732	18
භාවිතයට අයිතිය ඇති වත්කම්	27	301	**1,164,595**	1,213,649	(4)	**1,193,161**	1,246,383	(4)
දේපළ ආයෝජන	28	302	**–**	–	–	**349,000**	204,977	70
කීර්තිනාමය හා අස්පෘශ්‍ය වත්කම්	29	304	**744,715**	747,248	(0.3)	**747,225**	752,221	(1)
විලම්බිත බදු වත්කම්	30	306	**5,885,288**	2,892,984	103	**5,885,288**	3,663,879	61
වෙනත් වත්කම්	31	309	**72,378,671**	56,306,931	29	**72,570,357**	56,576,713	28
මුළු වත්කම්			**1,686,964,592**	1,616,686,128	4	**1,712,307,725**	1,630,636,718	5
වගකීම්								
බැංකු වලට ගෙවිය යුතු	32	310	**8,984,779**	4,086,731	120	**15,399,100**	12,711,256	21
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	33	310	**201**	–	100	**201**	–	100
ලාභ අලාභ මගින් හඳුනාගත් මූල්‍ය වගකීම්	34	310	**–**	**–**	**–**	**–**	**–**	**–**
ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වගකීම්	35	311						
– තැන්පත්කරුවන්ට ගෙවියයුතු			**1,482,532,430**	1,476,739,818	0.4	**1,482,951,028**	1,475,808,557	0.5
– ණය සුරැකුපත් හිමියන්ට ගෙවිය යුතු			**–**	–	–	**–**	–	–
– වෙනත් ණය ගැනීම් සඳහා ගෙවිය යුතු			**61,611,014**	16,766,044	267	**72,891,598**	18,889,245	286
කල්බදු වගකීම්	36	312	**1,365,547**	1,377,229	(1)	**1,400,575**	1,414,959	(1)
නිකුත් කළ ණය සුරැකුම්පත්	37	313	**23,806,514**	23,778,255	0.1	**23,879,683**	23,851,810	0.1
සේවාවසාන ප්‍රතිලාභ බැඳීම්	38	316	**18,100,399**	12,488,912	45	**18,169,106**	12,547,851	45
ප්‍රවර්තන බදු වගකීම්	39	328	**–**	2,760,857	(100)	**305,869**	2,943,314	(90)
විලම්බිත බදු වගකීම්	30	306	**–**	–	–	**58,630**	4,155	1,311
වෙනත් වෙන්කිරීම්	40	328	**–**	–	–	**–**	–	–
වෙනත් වගකීම්	41	328	**9,189,455**	5,796,053	59	**9,463,508**	6,075,889	56
පාලිත සමාගම්වලට ගෙවිය යුතු	42	329	**–**	–	–	**–**	–	–
මුළු වගකීම්			**1,605,590,339**	1,543,793,899	4	**1,624,519,298**	1,554,247,037	5

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනට	සටහන	පිටුව	බැංකුව 2023 රු. '000	බැංකුව 2022 රු. '000	බැංකුව වෙනස %	සමූහය 2023 රු. '000	සමූහය 2022 රු. '000	සමූහය වෙනස %
හිමිකම්								
ප්‍රකාශිත ප්‍රාග්ධනය/පවරන ලද ප්‍රාග්ධනය	43	329	**9,400,000**	9,400,000	–	**9,400,000**	9,400,000	–
ව්‍යවස්ථාපිත සංචිත අරමුදල	44	329	**5,369,172**	5,224,842	3	**5,464,218**	5,281,952	3
රඳවාගත් ඉපැයීම්	45	330	**14,408,118**	11,359,151	27	**18,605,719**	13,589,101	37
වෙනත් සංචිත	46	330	**52,196,963**	46,908,235	11	**54,318,490**	48,118,628	13
අයිතිකරුවන්ගේ මුළු හිමිකම			**81,374,253**	72,892,229	12	**87,788,427**	76,389,681	15
පාලනයට යටත් නොවන හිමිකම්	47	333	**–**	–	–	**–**	–	–
මුළු හිමිකම			**81,374,253**	72,892,229	12	**87,788,427**	76,389,681	15
මුළු හිමිකම් සහ වගකීම්			**1,686,964,592**	1,616,686,128	4	**1,712,307,725**	1,630,636,718	5
අසම්භාව්‍ය වගකීම් සහ බැඳීම්	48	333	**9,884,874**	14,416,802	(31)	**9,928,995**	14,617,867	(32)
නාමික තොරතුරු								
සේවක සංඛ්‍යාව			**4,358**	4,528				
ශාඛා සංඛ්‍යාව			**262**	262				

සටහන: හානිකරණයෙන් හා ක්ෂය කිරීමෙන් පසු ශුද්ධ අගයන් දක්වා ඇත.

242 පිටුවේ සිට 385 පිටුව දක්වා හෙළිදරව් කර ඇති වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් පිළිබඳ සටහන්, මෙම මූල්‍ය ප්‍රකාශනයන්ගේ සංකලිත කොටසකි.

සහතික කිරීම

ඉහත සඳහන් මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට බැංකුවේ කටයුතු සහ ඒදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි ලාභය පිළිබඳ සත්‍ය හා සාධාරණ තත්ත්වයන් පෙන්නුම් කරන බවට සහතික කරමි.

කේ රවීන්ද්‍රන්
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම, අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.
අනුමත කර අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරන ලදී.

ආචාර්ය හර්ෂ කබ්රාල්
සභාපති

දුෂ්‍යන්ත බස්නායක
අධ්‍යක්ෂ

ශෂී කණ්ඩම්බි
සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී

2024 මාර්තු 20
කොළඹ, ශ්‍රී ලංකාව

හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

බැංකුව

	ප්‍රකාශිත ප්‍රාග්ධනය /පවරන ලද ප්‍රාග්ධනය රු. '000	ව්‍යවස්ථාපිත සංචිත අරමුදල රු. '000	ප්‍රත්‍යාගණන සංචිතය රු. '000	
2022 ජනවාරි 01 දිනට ශේෂය	9,400,000	5,174,249	7,049,600	
පෙර වර්ෂයේ ගැලපීම්*	–	–	–	
2022 ජනවාරි 01 දිනට නැවත අගයන ලද ආරම්භක ශේෂය	9,400,000	5,174,249	7,049,600	
2022 වර්ෂය සඳහා ලාභය	–	–	–	
වෙනත් විස්තීර්ණ ආදායම් (බදු පසු)	–	–	(555,724)	
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම	–	–	(555,724)	
හිමිකමට සෘජුව ගලපන ලද හිමිකරුවන් සමඟ සිදුකළ ගනුදෙනු				
වර්ෂය තුළ සංචිත වෙත/වෙතින් මාරුකිරීම්	–	50,593	–	
ඒකාබද්ධ අරමුදලට දායකවීම්-ලාභාංශ/විශේෂ බදු	–	–	–	
ජාතික රක්ෂණ භාරකාර අරමුදලට දායකවීම්	–	–	–	
හිමිකම් නොපෑ තැන්පතු සංචිතයට මාරුකිරීම්	–	–	–	
හිමිකම් දරන්නන් සමඟ සිදුකළ මුළු ගනුදෙනු එකතුව	–	50,593	–	
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	9,400,000	5,224,842	6,493,876	
2023 වර්ෂය සඳහා ලාභය	–	–	–	
වෙනත් විස්තීර්ණ ආදායම් (බදු පසු)	–	–	1,452,340	
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම	–	–	1,452,340	
හිමිකමට සෘජුව ගලපන ලද හිමිකරුවන් සමඟ සිදුකළ ගනුදෙනු				
වර්ෂය තුළ සංචිත වෙත/වෙතින් මාරුකිරීම්	–	144,330	–	
ඒකාබද්ධ අරමුදලට දායකවීම්-ලාභාංශ/විශේෂ බදු	–	–	–	
ජාතික රක්ෂණ භාරකාර අරමුදලට දායකවීම්	–	–	–	
හිමිකම් නොපෑ තැන්පතු සංචිතයට මාරුකිරීම්	–	–	–	
හිමිකම් දරන්නන් සමඟ සිදුකළ මුළු ගනුදෙනු එකතුව	–	144,330	–	
2023 දෙසැම්බර් 31 දිනට ශේෂය	9,400,000	5,369,172	7,946,216	

*කරුණාකර සටහන් අංක 53 සංසන්දනාත්මක තොරතුරු වෙත යොමුවන්න.

242 පිටුවේ සිට 385 පිටුව දක්වා හෙළිදරව් කර ඇති වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් පිළිබඳ සටහන්, මෙම මූල්‍ය ප්‍රකාශනයන්ගේ සංකලිත කොටසකි.

හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

	වෙනත් විස්තීර්ණ ආදායම් සංචිතය	වෙනත් සංචිත	රඳවාගත් ඉපයුම්	මුළු හිමිකම
	රු. '000	රු. '000	රු. '000	රු. '000
	(658,376)	41,319,482	13,727,801	76,012,757
	–	–	(5,166,968)	(5,166,968)
	(658,376)	41,319,482	8,560,833	70,845,789
	–	–	2,529,667	2,529,667
	(1,011,500)	–	344,542	(1,222,682)
	(1,011,500)	–	2,874,209	1,306,985
	–	–	(50,593)	–
	–	–	–	–
	–	–	(25,297)	(25,297)
	–	764,753	–	764,753
	–	764,753	(75,890)	739,456
	(1,669,876)	42,084,235	11,359,152	72,892,229
	–	–	7,216,483	7,216,483
	2,956,339	–	(4,023,187)	385,492
	2,956,339	–	3,193,296	7,601,975
	–	–	(144,330)	–
	–	–	–	–
	–	–	–	–
	–	880,049	–	880,049
	–	880,049	(144,330)	880,049
	1,286,463	42,964,284	14,408,118	81,374,253

හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

සමූහය

	ප්‍රකාශිත ප්‍රාග්ධනය /පවරන ලද ප්‍රාග්ධනය රු. '000	ව්‍යවස්ථාපිත සංචිත අරමුදල රු. '000	ප්‍රත්‍යාගණන සංචිතය රු. '000	
2022 ජනවාරි 01 දිනට ශේෂය	9,400,000	5,209,101	7,488,706	
පෙර වර්ෂයේ ගැලපීම්*	–	–	–	
2022 ජනවාරි 01 දිනට නැවත අගයන ලද ආරම්භක ශේෂය	9,400,000	5,209,101	7,488,706	
2022 වර්ෂය සඳහා ලාභය	–	–	–	
වෙනත් විස්තීර්ණ ආදායම් (බදු පසු)	–	–	(555,724)	
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම	–	–	(555,724)	
හිමිකමට සෘජුව ගලපන ලද හිමිකරුවන් සමඟ සිදුකළ ගනුදෙනු				
වර්ෂය තුළ සංචිත වෙත/වෙතින් මාරුකිරීම්	–	72,851	–	
ඒකාබද්ධ අරමුදලට දායකවීම්-ලාභාංශ/විශේෂ බදු	–	–	–	
ජාතික රක්ෂණ භාරකාර අරමුදලට දායකවීම්	–	–	–	
හිමිකම් නොපෑ තැන්පතු සංචිතයට මාරුකිරීම්	–	–	–	
හිමිකම් දරන්නන් සමඟ සිදුකළ මුළු ගනුදෙනු එකතුව	–	72,851	–	
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	9,400,000	5,281,952	6,932,981	
පෙර වර්ෂයේ ගැලපීම්*	–	–	–	
2023 ජනවාරි 01 දිනට නැවත අගයට ලද ආරම්භක ශේෂය	9,400,000	5,281,952	6,932,981	
2023 වර්ෂය සඳහා ලාභය	–	–	–	
වෙනත් විස්තීර්ණ ආදායම (බදු පසු)	–	–	1,709,903	
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම	–	–	1,709,903	
හිමිකමට සෘජුව ගලපන ලද හිමිකරුවන් සමඟ සිදුකළ ගනුදෙනු				
වර්ෂය තුළ සංචිත වෙත/වෙතින් මාරුකිරීම්	–	182,266	–	
ඒකාබද්ධ අරමුදලට දායකවීම්-ලාභාංශ/විශේෂ බදු	–	–	–	
ජාතික රක්ෂණ භාරකාර අරමුදලට දායකවීම්	–	–	–	
හිමිකම් නොපෑ තැන්පතු සංචිතයට මාරුකිරීම්	–	–	–	
හිමිකම් දරන්නන් සමඟ සිදුකළ මුළු ගනුදෙනු එකතුව	–	182,266	–	
2023 දෙසැම්බර් 31 දිනට ශේෂය	9,400,000	5,464,218	8,642,884	

*කරුණාකර සටහන් අංක 53 සංශෝධනාත්මක තොරතුරු වෙත යොමුවන්න.

242 පිටුවේ සිට 385 පිටුව දක්වා හෙළිදරව් කර ඇති වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් පිළිබඳ සටහන්, මෙම මූල්‍ය ප්‍රකාශනයන්ගේ සංකලිත කොටසකි.

හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

	වෙනත් විස්තීර්ණ ආදායම් සංචිතය	වෙනත් සංචිත	රඳවාගත් ඉපයුම්	මුළු හිමිකම
	රු. '000	රු. '000	රු. '000	රු. '000
	(754,140)	42,186,553	17,918,992	81,449,213
	–	–	(5,523,755)	(5,523,755)
	(754,140)	42,186,553	12,395,237	75,925,458
	–	–	948,991	948,991
	(1,011,519)	–	343,021	(1,224,223)
	(1,011,519)	–	1,292,012	(275,232)
	–	–	(72,851)	–
	–	–	–	–
	–	–	(25,297)	(25,297)
	–	764,753	–	764,753
	–	764,753	(98,148)	739,456
	(1,765,659)	42,951,306	13,589,101	76,389,681
	19,900	–	15,438	35,338
	(1,745,759)	42,951,306	13,604,539	76,425,019
	–	–	9,616,809	9,616,809
	3,179,609	–	(4,022,962)	866,550
	3,179,609	–	5,593,847	10,483,359
	–	410,401	(592,667)	–
	–	–	–	–
	–	–	–	–
	–	880,049	–	880,049
	–	1,290,450	(592,667)	880,049
	1,433,850	44,241,756	18,605,719	87,788,427

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව		සමූහය	
	2023 රු. '000	2022 රු. '000	**2023 රු. '000**	2022 රු. '000
මෙහෙයුම් කටයුතු වලින් ලත් මුදල් ප්‍රවාහ				
පොලී ලැබීම්	**213,131,665**	157,730,789	**217,040,151**	160,184,287
පොලී ගෙවීම්	**(214,047,888)**	(106,467,959)	**(215,725,905)**	(107,964,314)
ශුද්ධ කොමිස් ලැබීම්	**1,276,369**	1,940,211	**1,288,229**	1,945,075
වෙළඳාම් ආදායම	**3,025,719**	604,677	**3,864,848**	(1,451,632)
සේවක මණ්ඩල ගෙවීම්	**(13,670,876)**	(15,326,878)	**(13,985,920)**	(15,627,914)
මූල්‍ය සේවා මත එකතුකළ අගය මත බදු සහ සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද	**(1,676,459)**	(2,921,186)	**(2,452,649)**	(3,052,866)
වෙනත් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලැබීම්	**263,012**	315,602	**347,353**	435,836
වෙනත් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලට ගෙවීම්	**(6,962,648)**	(5,955,251)	**(7,076,615)**	(6,318,723)
මෙහෙයුම් වත්කම් හා වගකීම්වල වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය	**(18,661,106)**	29,920,005	**(16,700,508)**	28,149,749
මෙහෙයුම් වත්කම්වල (වැඩිවීම)/අඩුවීම				
බැංකුවල ඇති තැන්පතු	**(11,652,088)**	(3,323,523)	**(12,248,452)**	(1,515,758)
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	**80,310**	(15,773)	**77,223**	(15,773)
ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට පවතින මූල්‍ය වත්කම්	**(3,521,905)**	4,057,889	**(15,034,040)**	15,380,741
ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් – ණය හා අත්තිකාරම්	**23,620,755**	(12,868,207)	**26,461,823**	(13,296,497)
ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් – ණය හා වෙනත් උපකරණ	**(13,316,612)**	23,489,440	**(13,853,444)**	20,080,005
මූල්‍ය ආයෝජන විකිණීම හා කල්පිරීම මගින් ලත් මුදල්	**–**	–	**–**	–
වෙනත් වත්කම්	**(2,500,591)**	(23,508,621)	**(2,482,936)**	(23,524,364)
	(7,290,131)	(12,168,797)	**(17,079,826)**	(2,891,648)
මෙහෙයුම් වගකීම්වල වැඩිවීම/(අඩුවීම)				
බැංකු වලට ගෙවිය යුතු	**4,750,000**	(3,526,250)	**2,518,067**	2,309,185
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	**201**	–	**201**	–
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වගකීම් - තැන්පත්කරුවන්ට ගෙවියයුතු	**9,809,431**	16,036,697	**11,156,350**	16,626,285
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වගකීම් - ණය සුරැකුම්පත් හිමියන්ට ගෙවියයුතු	**–**	–	**–**	–
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වගකීම් - වෙනත් ණය ගැනීම් සඳහා ගෙවියයුතු	**44,462,152**	8,615,033	**53,457,442**	(8,594,251)
නිකුත්කළ ණය සුරැකුම්පත්	**–**	(13,677,000)	**3,617**	(13,692,321)
වෙනත් වගකීම්	**2,109,889**	4,355,971	**2,073,966**	4,240,331
	61,131,673	11,804,452	**69,209,643**	889,229
ආදායම් බදු පෙර මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලත් ශුද්ධ මුදල් ප්‍රවාහ	**35,180,436**	29,555,660	**35,429,309**	26,147,331
ගෙවූ ආදායම් බදු	**(2,403,112)**	(9,880,107)	**(2,739,667)**	(10,551,646)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වල (යෙදවූ)/වලින් ලත් ශුද්ධ මුදල්	**32,777,324**	19,675,553	**32,689,642**	15,595,685

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව		සමූහය	
	2023 රු. '000	2022 රු. '000	**2023 රු. '000**	2022 රු. '000
ආයෝජන කටයුතුවලින් ලත් මුදල් ප්‍රවාහ				
දේපල, පිරියත හා උපකරණ මිලදී ගැනීම්	**(1,145,156)**	(558,740)	**(1,147,412)**	(562,353)
දේපල, පිරියත හා උපකරණ විකිණීමෙන් ලත් මුදල්	**3,438**	3,045	**3,438**	14,432
වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට පවතින මූල්‍ය උපකරණවල ශුද්ධ (වැඩිවීම්)/අඩුවීම්	**(30,021,350)**	(14,402,860)	**(29,937,745)**	(12,850,581)
මූල්‍ය ආයෝජන විකිණීම හා කල්පිරීම මගින් ලත් මුදල්	**–**	–	**–**	–
අස්පෘශ්‍ය වත්කම් ශුද්ධ මිලදී ගැනීම්	**(344,272)**	(370,093)	**(344,272)**	(372,543)
ආයෝජන දේපළවල ශුද්ධ මිලදී ගැනීම් සහ වැඩිදියුණු කිරීම්	**–**	–	**–**	7,510
පාලිත හා ආශ්‍රිත සමාගම්වල ආයෝජන අත්පත් කර ගැනීම මගින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	**–**	(2,500,000)	**–**	–
පාලිත හා ආශ්‍රිත සමාගම්වල ආයෝජනයෙන් ලද ලාභාංශ	**–**	–	**–**	–
ආයෝජන ක්‍රියාකාරකම්වල (යෙදවූ)/වලින් ලත් ශුද්ධ මුදල්	**(31,507,340)**	(17,828,648)	**(31,425,991)**	(13,763,534)
මූල්‍යනය කිරීමේ කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහ				
සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය නිකුත් කිරීමෙන් ලද ශුද්ධ මුදල්	**–**	–	**–**	–
යටත්කාලීන ණය නිකුත් කිරීම් මගින් ලත් ශුද්ධ මුදල්	**–**	–	**–**	–
යටත්කාලීන ණය ආපසු ගෙවීම්	**–**	–	**–**	–
යටත්කාලීන ණය මත ගෙවූ පොළිය	**(600,000)**	(541,660)	**(604,003)**	(542,342)
ඒකාබද්ධ අරමුදලට දායකවීම් - ලාභාංශ/විශේෂ බදු	**–**	–	**–**	–
මූල්‍යන කටයුතු වලින් ලද ශුද්ධ මුදල්	**(600,000)**	(541,660)	**(604,003)**	(542,342)
මුදල් හා මුදල් සමානයන්ගේ ශුද්ධ වැඩිවීම්/(අඩුවීම්)	**669,984**	1,305,245	**659,648**	1,289,808
වර්ෂය ආරම්භයේදී මුදල් හා මුදල් සමානයන්	**8,894,757**	7,589,511	**8,943,521**	7,653,712
මුදල් හා මුදල් සමානයන්ගේ විනිමය වෙනස	**–**	–	**–**	–
වර්ෂය අවසාන දිනට මුදල් හා මුදල් වලට සමානයන්	**9,564,741**	8,894,757	**9,603,169**	8,943,521
මුදල් හා මුදල් සමානයන් අයිතම සැසඳීම				
අතැති මුදල්	**2,991,147**	3,207,729	**2,994,088**	3,212,553
බැංකුව වෙතැති ශේෂයන්	**6,185,654**	5,524,723	**6,220,907**	5,568,637
ඉල්ලුම් සහ කෙටිකාලීන තැන්පතු	**333,054**	2,756	**333,054**	2,756
ශ්‍රී ලංකා මහ බැංකුව වෙතැති ශේෂයන්	**246,998**	236,480	**247,232**	236,696
බැංකුවලට ගෙවිය යුතු	**(192,112)**	(76,931)	**(192,112)**	(77,121)
	9,564,741	8,894,757	**9,603,169**	8,943,521

242 පිටුවේ සිට 385 පිටුව දක්වා හෙළිදරව් කර ඇති වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් පිළිබඳ සටහන්, මෙම මූල්‍ය ප්‍රකාශනයන්ගේ සංකලිත කොටසකි.

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

1 වාර්තාකරණ ඒකකය

1.1 ආයතනික තොරතුරු

ජාතික ඉතිරිකිරීමේ බැංකුව, 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත යටතේ 1972 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ ස්ථාපනය කරන ලද බලපත්‍රලාභී විශේෂිත බැංකුවකි. එය 1988 අංක 30 දරන බැංකු පනත හා එහි සංශෝධන යටතේ නියාමනය වන බලපත්‍රලාභී විශේෂිත බැංකුවකි. බැංකුවේ ලියාපදිංචි කාර්යාලය, අංක 255 "ඉතිරිකිරීමේ මන්දිරය" ගාලුපාර, කොළඹ 03, ශ්‍රී ලංකාව යන ලිපිනයෙහි පිහිටා ඇත.

සේවක සංඛ්‍යාව	**2023**	2022
බැංකුව	**4,358**	4,528
සමූහය	**4,479**	4,654

වාර්ෂික වාර්තාවේ පසුපස කවරයේ ඇතුළත ආයතනික තොරතුරු දක්වා ඇත.

සේවා සැපයුම් ස්ථාන ලෙස ශාඛා 262 ක්, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 295 ක් හා සීආර්එම් යන්ත්‍ර 122 ක් ද බැංකුව සතුව පවතින අතර, නියෝජිත ජාල ලෙස තැපැල් කාර්යාල 652 ක් සහ උප තැපැල් කාර්යාල 3,354 ක් බැංකුව සතුව පවතී.

1.2 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයෙහි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලට බැංකුව (මව් සමාගම) සහ එහි පූර්ණ අයිතියට යටත් එන් එස් බී ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පනි ලිමිටඩ් සහ ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව නම්වූ පාලිත සමාගම් දෙක ඇතුළත් වේ. (පොදුවේ "සමූහය" ලෙසද තනිව ගත් කල "බැංකුව" ලෙස ද ඇතුළත් වේ.)

බැංකුවෙහි පූර්ණ අයිතිය ශ්‍රී ලංකා රජය සතුවේ. බැංකුව සමූහයෙහි අවසන් පරිපාලකයා වේ. බැංකුවේ සහ එහි පරිපාලිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශන සඳහා දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන පොදු මූල්‍ය වර්ෂයක් පාදක වෙයි. සෑම වසරකදීම පාර්ලිමේන්තුවේ දී සභාගත කිරීම පිණිස, දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන මාස දොළහක කාලපරිච්ඡේදය සඳහා "බැංකුවේ" සහ "සමූහයේ" මූල්‍ය ප්‍රකාශන බැංකුව විසින් පිළියෙල කරනු ලබයි..

1.3 මූලික ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

බැංකුව

පෙර පරිදිම, ශ්‍රී ලාංකික ජනතාව අතර ඉතිරිකිරීම ප්‍රගුණ කරවීමත් එසේ එක්රැස් කරගන්නා ලද ඉතුරුම් ලාභදායී අයුරින් ආයෝජනය කිරීමත් බැංකුවේ ප්‍රධාන ක්‍රියාකාරකම් වේ. තැන්පතු භාර ගැනීම, ආයතනික සහ පාරිභෝගික ණය, ව්‍යාපාර මූල්‍යයනය, රාජ්‍ය ව්‍යාපෘති සඳහා ණය, උකස් ණය, අන්තර්ජාල බැංකුකරණය, එස් එම් එස් බැංකුකරණය යනාදී මූල්‍ය විසඳුම් රැසක් ජාතික ඉතිරිකිරීමේ බැංකුව වෙතින් සැපයෙයි. 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත ප්‍රකාර බැංකුව එහි තැන්පතු වලින් අවම වශයෙන් 60% ක් රාජ්‍ය සුරැකුම්පත්හි ආයෝජනය කිරීමට බැඳී සිටී.

පාලිත සමාගම්

සීමාසහිත එන් එස් බී ෆන්ඩ් මැනේජ්මන්ට් සමාගම

සීමාසහිත එන් එස් බී ෆන්ඩ් මැනේජ්මන්ට් සමාගම, ප්‍රාථමික අලෙවිකරුවකු වශයෙන් කටයුතු කරන අතර, රජයේ සුරැකුම්පත් ගනුදෙනු කිරීමෙහි යෙදී සිටියි.

සීමාසහිත ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව

ඉතුරුම් හා කාලීන තැන්පතු සංචලනය, ණය, කල්බදු, කුලී පිට ගැනුම්, උකස් ණය හා වෙනත් ණය පහසුකම් සැපයීම සහ සීමාසහිත ප්‍රමුඛ ඉතිරිකිරීමේ හා සංවර්ධන බැංකුවේ ණය ගිණුම් ප්‍රතිව්‍යුහගත කිරීමත් සමග සී.ස. ප්‍රමුඛ ඉතිරිකිරීමේ හා සංවර්ධන බැංකුවේ පැහැර හරිනු ලැබූ තැන්පතු වගකීම් පියවීම යනාදිය බැංකුවේ මූලික ක්‍රියාකාරකම් යටතට අයත් වීණි.

ජාතික ඉතිරිකිරීමේ බැංකුව සමග ඒකාබද්ධවීමේ ක්‍රියාපටිපාටිය හේතුවෙන් 2021 වර්ෂයේ සිට ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව නව ණය ප්‍රදානය, තැන්පතු භාර ගැනීම, නව සේවක බඳවා ගැනීම් සහ කිසියම් පාර්ශ්වයක් සමඟ නව ගිවිසුම්වලට එළඹීමෙන් වළකින ලදී. 2024 මාර්තු 31 දිනට පෙර අවශෝෂණ ක්‍රියාවලිය සම්පූර්ණ කරන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියෝග කර තිබේ. ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුවේ වත්කම්, වගකීම් හා කාර්ය මණ්ඩලය ජාතික ඉතිරිකිරීමේ බැංකුවට අවශෝෂණය කර ගැනීමෙන් අනතුරුව ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුවට ඇවර කරනු ලැබීමට නියමිතය.

2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

ගිණුම් ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී වෙනත් ආකාරයකට දක්වා ඇති බවට සඳහනක් නොවේ නම්, සෑම කාලපරිච්ඡේදයකදීම පහත සඳහන් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති උපයෝගී කරගනු ලැබ ඇත. බැංකුවේ මෙම ප්‍රතිපත්ති නොකඩවාම සමූහය විසින් උපයෝගී කරගනු ලැබ ඇති අතර ඉන් පරිබාහිර අවස්ථාවන් ඒ අනුව හෙළිදරව් කර ඇත.

2.1 ගිණුම් පිළියෙල කිරීමේ පදනම

2.1.1 අනුකූලතාවය පිළිබඳ ප්‍රකාශය

ආදායම් ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, හිමිකම් වෙනස්වීම් දක්වන ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශනවලට සටහන් යනාදියෙන් සමන්විත බැංකුවේ මූල්‍ය ප්‍රකාශන හා සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට **(SLFRS සහ LKAS)** අනුකූලව වන අතර, එය 1988 අංක 30 දරණ බැංකු පනත සහ එහි සංශෝධන වලටද අනුකූල වේ. මුදල් ප්‍රවාහ තොරතුරු හැරුණු කොට සෙසු මූල්‍ය ප්‍රකාශන පිළියෙල කොට ඇත්තේ උපචිත පදනමටය.

මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී භාවිත කරන ලද ආකෘති ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකුවල වාර්ෂික විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම, ඉදිරිපත් කිරීම සහ ප්‍රකාශනය කිරීම සඳහා බලපත්‍රලාභී බැංකුවල වාර්ෂික හා කාර්තුමය මූල්‍ය ප්‍රකාශ හා වෙනත් හෙළිදරවිකිරීම් ප්‍රකාශයට පත්කිරීම පිළිබඳ 2019 ජනවාරි 18 දිනැති චක්‍රලේඛ අංක 02 හි 2019 මගින් නිර්දේශ කර ඇති ආකෘතියට ද අනුකූල වේ.

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

2.1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ වගකීම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් සහ 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතෙහි හා එහි සංශෝධනවල ප්‍රතිපාදන ප්‍රකාර, බැංකුවේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමයි.

"අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව", "මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ ප්‍රකාශය", මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයෙහි සහතිකකරණය මගින් දක්වා ඇති පරිදි මූල්‍ය ප්‍රකාශ සඳහා සිය වගකීම, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිළිගනු ලබයි.

මෙකී මූල්‍ය ප්‍රකාශයන්ට පහත කොටස් අන්තර්ගත වේ.

(i) සමාලෝචිත වර්ෂය සඳහා බැංකුවේ හා සමූහයේ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ විස්තර සපයන ආදායම් ප්‍රකාශය හා වෙනත් විස්තීර්ණ ආදායම (පිටු අංක 232 හා 233)

(ii) වර්ෂාවසානයට බැංකුවේ හා සමූහයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ තොරතුරු සපයන මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය (පිටු අංක 234 හා 235)

(iii) සමාලෝචනයට බඳුන් වූ වර්ෂය තුළ බැංකුවේ හා සමූහයේ කොටස්හිමියන්ගේ අරමුදල්වල සියලු වෙනස්කම් දැක්වෙන හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය (පිටු අංක 236 හා 238)

(iv) මුදල් හා මුදල්වලට සමාන දෑ ජනනය කිරීමට බැංකුව හා සමූහය සතු හැකියාව මෙන්ම එම මුදල් ප්‍රවාහ භාවිතය පිළිබඳ විස්තර සපයන මූල්‍ය ප්‍රවාහය පිළිබඳ ප්‍රකාශය (පිටු අංක 240)

(v) සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වෙනත් සවිස්තරාත්මක කරුණු ඇතුළත් මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන් (පිටු අංක 242 සිට 285 දක්වා)

2.1.3 මූල්‍ය ප්‍රකාශන සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බැංකුවේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන (2022 වර්ෂය හා සන්සන්දනාත්මක තොරතුරු සමඟ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2024 මාර්තු 20 දින අනුමත කරන ලදී. (2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බැංකුවේ හා සමූහයේ මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2023 අප්‍රේල් 27 වන දින අනුමත කර පළ කිරීම සඳහා අවසර දෙන ලදී.)

2.1.4 මිනුම්කරණ පදනම

පහත අයිතමයන් හැරුණු කොට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි සාධාරණ අගය මත ගණනය කර ඇති බැංකුවේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙල කර ඇත.

(i) වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම් (සටහන් අංක 23)

(ii) ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ (සටහන් අංක 19 හා 33)

(iii) ලාභ හෝ අලාභ මගින් හඳුනාගනු ලැබූ මූල්‍ය වත්කම් සහ වගකීම් (සටහන් අංක 20 හා 34)

(iv) ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කළ මූල්‍ය වත්කම් සහ වගකීම් (සටහන් අංක 20)

(v) අත්පත් කර ගැනීමේදී පිරිවැයට මනිනු ලබන හා පසුව සාධාරණ අගය මත ප්‍රත්‍යාගණිත අගයන් අනුව මිනුම් කරනු ලබන ඉඩම් හා ගොඩනැගිලි (සටහන් අංක 26)

(vi) මූලිකව පිරිවැයට හඳුනාගනු ලබන, පසුව සාධාරණ අගයට අනුව මනිනු ලබන ආයෝජන දේපළ (සටහන් අංක 28)

(vii) නිශ්චිත ප්‍රතිලාභ වගකීම් වර්තමාන වටිනාකමෙන් සැලසුම්ගත වත්කම්වල සාධාරණ අගය ඉන් අඩු කිරීමෙන් පසු සේවක නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් වල වගකීම හඳුනාගනු ලබයි. (සටහන් අංක 38) සැලසුම්ගත වත්කම්වල ශුද්ධ වටිනාකම අඩුකර, හඳුනානොගත් ආයුගණක ලැබීම් එකතුකර හඳුනා නොගත් පසුගිය සේවා පිරිවැය හා හඳුනානොගත් ආයුගණක අලාභ අඩු කළ පසු නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්හි වත්මන් අගය ලෙස නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල ශුද්ධ වගකීම හඳුනාගනු ලැබේ.

2.1.5 ක්‍රියාකාරී සහ ඉදිරිපත් කරනු ලබන ව්‍යවහාර මුදල

සමූහයේ මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබන මූලික ආර්ථික පරිසරයේ ව්‍යවහාර මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් (රු.) වලින් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇති අතර, විශේෂයෙන් දක්වා ඇති අවස්ථාවලදී හැරුණු කොට සියලුම අගයන් ආසන්න දහස් ස්ථානයට වටයා ඇත. සමාලෝචිත වර්ෂය තුළ සමූහයේ ඉදිරිපත් කළ වාර්තා වල ක්‍රියාකාරී හා ඉදිරිපත් කරනු ලැබූ ව්‍යාපාර මුදල් හි වෙනසක් වාර්තා නොවිනි.

2.1.6 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි ඉදිරිපත් කර ඇති බැංකුවේ සහ සමූහයේ වත්කම් හා වගකීම්, ඒවායෙහි ස්වභාවය අනුව වර්ගකර, කල්පිරීමේ රටාව හා සාපේක්ෂ ද්‍රවශීලතා අනුපිළිවෙල පිළිබිඹු වන අයුරින් ලැයිස්තුගත කර ඇත.

මූල්‍ය ප්‍රකාශනවලට බලපාන උද්ධමන සාධක සම්බන්ධයෙන් ගැලපීමක් සිදුකර නොමැත. බැංකුවේ හා සමූහයේ වත්කම් හා වගකීම් වල කල්පිරීමේ රටාවන්හි විශ්ලේෂණය සටහන් අංක 55 (පිටු අංක 375 සිට 378) හි දක්වා ඇත.

2.1.7 අඛණ්ඩ පැවැත්ම

අඛණ්ඩ පදනමක් මත ඉදිරියට පැවතීමට බැංකුවට ඇති හැකියාව පිළිබඳව කළමනාකාරිත්වය විසින් තක්සේරුවක් සිදුකර ඇති අතර, ඉදිරි අනාගතයේ දී ව්‍යාපාර කටයුතුවල නිරතවීමට බැංකුව සතු ශක්‍යතාව පිළිබඳ සෑහීමට පත්වී ඇත.

තවද අඛණ්ඩ පැවැත්ම සඳහා සමූහයට ඇති හැකියාව පිළිබඳ සැක පහළ වන සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකි සාධකයක් කළමනාකාරිත්වයට හමු වී නොමැත. එහෙයින් අඛණ්ඩ පැවැත්ම යන පදනම මත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම තව දුරටත් සිදු කෙරෙයි.

2.1.8 ප්‍රමාණාත්මකභාවය සහ සමාහරණය

සෑම ප්‍රමාණාත්මක සමාන අයිතම පන්තියක්ම මූල්‍ය ප්‍රකාශන වල වෙන් වෙන්ව ඉදිරිපත් කරනු ලබයි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ශ්‍රී.ල.ගි.ප්‍ර. 01) "මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම" මගින් ඉඩදී ඇති පරිදි අසමාන ස්වභාවයේ අයිතමයන් හෝ කාර්යයන් ප්‍රමාණාත්මක නොවන දෑ ලෙස නොසලකයි නම් පමණක් ඒවා වෙන වෙනම ඉදිරිපත් කරනු ලබයි.

2.1.9 සංසන්දනාත්මක තොරතුරු

ප්‍රවර්තන කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ වැඩි අවබෝධයක් ලබාගැනීම සඳහා සහ කාලපරිච්ඡේද දෙක සංසන්දනය කිරීමේ හැකියාව ඉහළ නැංවීම සඳහා මූල්‍ය ප්‍රකාශනයෙහි පසුගිය කාලපරිච්ඡේදයට අදාළ සංසන්දනාත්මක තොරතුරු ප්‍රමාණාත්මකව, විස්තරාත්මකව හෙළිදරව් කර ඇත. වඩාත් හොඳ ඉදිරිපත් කිරීමක් අරභයා මෙන්ම ප්‍රවර්තන වර්ෂයේ ඉදිරිපත් කිරීම් සමග අනුරූපවීමට

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

අවශ්‍ය අවස්ථාවලදීද සංසන්දනාත්මක තොරතුරු නැවත වර්ග කර දක්වා ඇත. පිටු අංක 342 හි මූල්‍ය ප්‍රකාශනවලට සටහන් 53 යටතේ අදාළ සංසන්දනාත්මක තොරතුරු ඉදිරිපත් කර ඇත.

2.1.10 වැටයීම

"මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම" පිළිබඳ ශ්‍රී ල.ගි.ප්‍ර. 01 - ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් මගින් අනුමත පරිදි වෙනයම් අයුරකින් දක්වා ඇති අවස්ථාවලදී හැරුණු විට මූල්‍ය ප්‍රකාශනයන්හි දක්වා ඇති අගය ආසන්න රුපියල් දහසට වටයා ඇත.

2.1.11 හිලව් කිරීම

මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් හිලව් කර ශුද්ධ අගය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි සඳහන් කරනු ලබන්නේ හඳුනාගත් අගයන් හිලව් කිරීම නෛතිකව බලාත්මක කළ හැකි වූ හා ශුද්ධ පදනමක් මත පියවීමට හෝ එක්වරම වත්කම් උපලබ්ධි කර වගකීම් පියවීමට අදහස් කරන විට පමණි. ගිණුම්කරණ ප්‍රමිතියක්/අර්ථකථනයක් (අන්තර්ජාතික මූල්‍ය වාර්තාකරන ප්‍රමිතීන් අර්ථකථන කමිටුව සහ ප්‍රමිතීන් අර්ථකථන කමිටුව විසින් නිකුත් කරන ලද) සහ බැංකුවේ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තියක් මගින් නිශ්චිතව අනුමත කර හෝ අවශ්‍ය බව දක්වා ඇති විටකදී හැර ආදායම් සහ වියදම්, ආදායම් ප්‍රකාශයේ හිලව් කරනු නොලැබේ.

2.1.12 සැලකිය යුතු ගිණුම්කරණ තීන්දු, ඇස්තමේන්තු හා උපකල්පන

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් හා අනුකූලව වන පරිදි බැංකුවේ හා සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී වත්කම්, වගකීම්, ආදායම් හා වියදම්වල අගයන් තීරණය කිරීම සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතය සම්බන්ධයෙන් තීන්දු, ඇස්තමේන්තු සහ උපකල්පන උපයෝගී කර ගැනීමට කළමනාකාරිත්වයට සිදු වේ. සැබෑ ප්‍රතිඵල මෙම ඇස්තමේන්තු වලින් වෙනස් විය හැකිය.

ඇස්තමේන්තු හා උපකල්පන අඛණ්ඩව සමාලෝචනයට භාජනය කරයි. ගිණුම් ඇස්තමේන්තුවල යම් සංශෝධනයක් වෙතොත් එම සංශෝධනය කෙරෙන කාලපරිච්ඡේදය තුළදී, එම සංශෝධන ඉදිරි කාලපරිච්ඡේදයකට බලපාන්නේ නම්, ඉදිරි කාලපරිච්ඡේදවලදී ද ගිණුම්ගත කරනු ලැබේ.

බැංකුවේ හා සමූහයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති අගයන් මත වැඩිම බලපෑමක් ඇති කිරීමට හැකි ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතයේ දී යොදාගත් සැලකිය යුතු තීන්දු, ඇස්තමේන්තු සහ උපකල්පන පහත දක්වා ඇත.

අ. සැලකිය යුතු ගිණුම්කරණ තීන්දු

මෙම මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන ඇති අගයන් සම්බන්ධයෙන් සැලකිය යුතු බලපෑමක් ඇති කරලන අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති වලදී ගනු ලබන තීන්දු, පිළිබඳව තොරතුරු පහත සටහන් අංක 2.1.12.1 මගින් දැක්වේ.

2.1.12.1 මූල්‍ය වත්කම් සහ වගකීම් වර්ගීකරණය

ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 09 අනුව පහත නිර්නායක මත පදනම්ව ක්‍රමක්ෂය පිරිවැය, වෙනත් විස්තීර්ණ ආදායම මගින් සාධාරණ අගය, ලාභය හෝ අලාභ මගින් සාධාරණ අගය යන විවිධ කාණ්ඩවලට මූල්‍ය වත්කම් වර්ග කිරීමට හා මැනීමට සමූහයේ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මගින් අවකාශය සැලසේ.

- පිටු අංක 248 හි සටහන් අංක 2.5.1.4.1 හි දක්වා ඇති මූල්‍ය වත්කම් කළමනාකරණය කිරීමේ ආයතනික ව්‍යාපාරික ආකෘතිය
- පිටු අංක 248 හි සටහන් අංක 2.5.1.4.2 හි දක්වා ඇති මූල්‍ය වත්කම්හි ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ගුණාංග

2.1.12.2 ආයෝජන දේපළ වර්ගීකරණය

ආයෝජන දේපළක් ලෙස දේපළක් සුදුසුකම් ලබන්නේ ද යන්න තීරණය කිරීම සඳහා කළමනාකාරිත්වය විසින් සිය විනිශ්චය යොදා ගනු ලබයි. කුලී ආදායමක් ඉපයීම සඳහා හෝ ප්‍රාග්ධන ඇගැයීම සඳහා හෝ ඒ ද්විත්වයම සඳහා රඳවාගනු ලබන දේපළක් හා ඒ ඔස්සේ සමූහයේ අන් වත්කම්වලින් ස්වාධීනව මූල්‍ය ප්‍රවාහ උත්පාදනය කරනු ලබන දේපළ ආයෝජන දේපළ ලෙස වර්ගීකරණය කරනු ලැබෙයි. අනෙක් අතට භාණ්ඩ හා සේවා නිෂ්පාදනය හෝ සැපයීම සඳහා හෝ පරිපාලනය සඳහා උපයෝගී කරගනු ලබන දේපළ සහ ඒ මගින් අදාළ දේපළට පමණක් නොව නිෂ්පාදන හා සැපයුම් ක්‍රියාවලිය සඳහා උපයෝගී කර ගනු ලබන වෙනත් වත්කම් සඳහා දායක වන මූල්‍ය ප්‍රවාහ උත්පාදනය කරනු ලබන දෑ, දේපළ, පිරියත හා උපකරණ ලෙස වර්ගීකරණය කරනු ලැබෙයි.

ආ. උපකල්පන සහ අවිනිශ්චිතතා තක්සේරු කිරීම

සැලකියයුතු වෙනස්වීම්වලට තුඩු දිය හැකි අන්දමේ උපකල්පන හා අවිනිශ්චිතතා තක්සේරු පිළිබඳ තොරතුරු පහත සටහන් අංක 2.1.12.3 සිට 2.1.12.9 මගින් දක්වා ඇත.

2.1.12.3 මූල්‍ය උපකරණ වල සාධාරණ අගය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි වාර්තා කර ඇති මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් වල සාධාරණ අගයන්, සක්‍රීය වෙළඳපොළ තුළින් ලබාගත නොහැකි විට, එය තීරණය කිරීම සඳහා ගණිතමය ආකෘතීන් භාවිතය ද ඇතුළත් තක්සේරුකරණ ක්‍රමවේද යොදා ගැනෙයි. මෙකී ආකෘතීන් සඳහා යෙදවුම්, නිරීක්ෂණය කළහැකි වෙළඳපොළ දත්ත වෙතින් හැකි අවස්ථාවලදී ලබා ගන්නා අතර, නිරීක්ෂණය කළ හැකි වෙළඳපොළ දත්ත නොමැති විට සාධාරණ අගයක් ස්ථාපිත කර ගැනීමට තීන්දුවක් ගත යුතු වේ.

මූල්‍ය උපකරණ අගය කිරීම පිණිස යොදාගන්නා ක්‍රමවේද සහ සාධාරණ අගයන්හි ධුරාවලිය සටහන් අංක 56 මගින් මූල්‍ය ප්‍රකාශනයෙහි පිටු අංක 379 හි සවිස්තරාත්මකව දක්වා ඇත.

2.1.12.4 මූල්‍ය වත්කම් මත හානිකරණ අලාභ

සියලුම මූල්‍ය වත්කම් කාණ්ඩ, ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 09 සහ ශ්‍රී.ල.ගි.ප්‍ර. 39 යටතේ හානිකරණ අලාභ මිනීම සඳහා විශේෂයෙන්ම හානිකරණ අලාභ නිශ්චය කිරීමේදී ඉදිරි මුදල් ප්‍රවාහ වල අගය හා කාල වකවානුව සහ ඇප වටිනාකම්වල අගය පිළිබඳව නිසි තීන්දු ගැනීම අවශ්‍ය වේ.

ඒ අනුව, ආදායම් ප්‍රකාශයෙහි හානිකරණ අලාභ වාර්තා කළ යුතු දැයි තක්සේරු කිරීම පිණිස මූල්‍ය තත්ත්ව පිළිබඳව වාර්තා කරනු ලබන සෑම දිනයකදීම සමූහය විසින් එහි සැලකිය යුතු ණය හා අත්තිකාරම් පිළිබඳව තනි තනිව සමාලෝචනය කෙරෙයි. හානිකරණ අලාභ නිශ්චය කිරීමේ දී විශේෂයෙන්ම අනාගත මුදල් ප්‍රවාහ වල කාලය හා වටිනාකම තීරණය කිරීමට කළමනාකාරිත්වයේ තීන්දු අවශ්‍ය වේ. මෙකී ඇස්තමේන්තු පදනම් වනුයේ සාධක රාශියක් පිළිබඳ උපකල්පන ගණනාවක් මත වන හෙයින් සත්‍ය ප්‍රතිඵල මීට වෙනස්විය හැකිය.

හානිකරණය සඳහා කේවල ඇගයීමට ලක් කරනු ලබන මූල්‍ය වත්කම් සහ ඉදිරියේදී ලැබෙතැයි අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහවල වත්මන් අගය පිළිබඳ කළමනාකාරිත්වයේ නිසි ඇස්තමේන්තුව මත කේවල හානිකරණ ප්‍රතිපාදන පදනම් වේ. මෙම මුදල් ප්‍රවාහ ඇස්තමේන්තු කිරීමේදී ණයකරුගේ මූල්‍ය තත්ත්වය හා පාදක වූ ඇපවල ශුද්ධ උපලබ්ධි අගය පිළිබඳ කළමනාකාරිත්වය විසින් සලකා බැලෙයි. සෑම හානිකරණ වත්කමක්ම එහි වටිනාකම හා ප්‍රායෝගික උපාය මාර්ග, ආපසු ලබාගත හැකි යැයි සැලකෙන මුදල් ප්‍රවාහවල ඇස්තමේන්තුව මත ඇගයීමට ලක් කෙරෙයි.

පහත පරිදි සාමූහික හානිකරණ ප්‍රතිපාදන ස්ථාපිත කර ඇත.

- කේවල වශයෙන් නොසැලකෙන සමජාතීය ණය හා අත්තිකාරම් කාණ්ඩ

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

- කේවල වශයෙන් සැලකූ නමුත් කේවල වශයෙන් හානිකරණය වී නොමැති වත්කම් කාණ්ඩ

ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 09 අනුව සමූහයේ අපේක්ෂිත ණය පාඩු ගණනය කිරීම, විචල්‍ය යෙදවුම් විකල්ප සහ ඒ මත වන අන්තර් යැපීමට පාදක උපකල්පන ගණනාවකින් යුත් සංකීර්ණ ආකෘතිවල ප්‍රතිඵලයකි. ගිණුම්කරණ තීන්දු හා ඇස්තමේන්තු ගණයෙහි ලා සැලකෙන අපේක්ෂිත ණය පාඩු ආකෘතිවලට පහත සාධක ඇතුළත් වේ.

- ණය අවදානමෙහි සැලකියයුතු වැඩිවීමක් වී ඇත්දැයි ගුණාත්මක ඇගයීම සඳහා සමූහයේ නිර්නායක සහ අපේක්ෂිත ජීවකාල ණය පාඩු පදනම මත මනිනු ලබන මූල්‍ය වත්කම් සඳහා වන දීමනා
- සාමූහික පදනමක් මත අපේක්ෂිත ණය පාඩු අගයනු ලබන අවස්ථාවේ මූල්‍ය වත්කම් වර්ගීකරණය
- විවිධ සංඛ්‍යාත්මක සූත්‍ර සහ යෙදවුම් විකල්ප ඇතුළත් අපේක්ෂිත ණය පාඩු ආකෘති සංවර්ධනය
- දළ දේශීය නිෂ්පාදිත වර්ධනය, උද්ධමනය, පොළී අනුපාතික, විනිමය අනුපාතික, විරැකියාව, ණය පැහැර හැරීමේ සම්භාවිතාවය **(PD)** නිරාවරණයවීමේ පාඩුව **(EAD)** හා පැහැර හැරීමකදී සිදුවිය හැකි පාඩුව **(LGD)** ආදී සර්ව ආර්ථික යෙදවුම් අතර සම්බන්ධතාවය තීරණය කිරීම.
- ආර්ථික යෙදවුම්, අපේක්ෂිත ණය පාඩු ආකෘති වලට අදාළ කර ගැනීම සඳහා ඉදිරි දැක්මැති සාර්ව ආර්ථික සංසිද්ධීන් හා එහි සම්භාවිතාව පිළිබඳ බර තැබීම් තෝරා ගැනීම.

2.1.12.5 මූල්‍ය නොවන වත්කම් හානිකරණය

සෑම වාර්තාකරණ දිනකම විලම්භීත බදු වත්කම් හැර අනෙකුත් වත්කම් හානිකරණය වූ බවට කිසියම් හෝ හැඟවීමක් ඇත්දැයි සමූහය විසින් අගයනු ලබයි. එබඳු හැඟවීමක් ඇත්නම් හෝ වත්කමක් සඳහා වාර්ෂික හානිකරණ පරීක්ෂාවක් සිදුකිරීම අවශ්‍ය වන්නේ නම්, සමූහය විසින් වත්කමෙන් නැවත අයකරගත හැකි වටිනාකම ඇස්තමේන්තු කරනු ලැබේ. වත්කමක ධාරණ අගය එහි නැවත අයකරගත හැකි වටිනාකම ඉක්මවයි නම්, එම වත්කම හානිකරණය වී ඇතැයි සලකනු ලබන අතර, එම වත්කමේ අගය නැවත අයකරගත හැකි අගය දක්වා කපා හරියි.

2.1.12.6 දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය

සමූහය විසින් වෙනත් විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ කොටස් ලෙස හඳුනාගනු ලබන සාධාරණ වටිනාකමෙහි වෙනස්වීම් සහිත ප්‍රත්‍යාගණිත අගයන්ට අනුව ඉඩම් හා ගොඩනැගිලි මනිනු ලැබෙයි. "සාධාරණ අගය මැනීමට" අනුකූලව සින්නක්කර ඉඩම් හා ගොඩනැගිලිවල සාධාරණ අගය නිර්ණය කිරීම සඳහා සමූහය විසින් ස්වාධීන වෘත්තීය තක්සේරුකරුවන් යොදවන ලදී.

සින්නක්කර ගොඩනැගිලි සහ ඉඩම්වල සාධාරණ අගය නිර්ණය කිරීම සඳහා භාවිතා කල ක්‍රමවේද හා ප්‍රධාන උපකල්පන මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 2.3 හි තවදුරටත් විස්තර කර දක්වා ඇත.

2.1.12.7 දේපළ, පිරියත හා උපකරණවල ඵලදායී ජීවකාලය

සමූහය, දේපළ, පිරියත හා උපකරණවල සුන්බුන් වටිනාකම, ඵලදායී ජීවකාලය හා ක්ෂය ක්‍රමය, සෑම වාර්තාකරණ දිනකම සමාලෝචනය කරයි. මෙම අගයන්, අනුපාත හා ක්‍රම ඇස්තමේන්තු කිරීමේ දී කළමනාකාරිත්වයේ තීරණ භාවිතා කෙරෙන හෙයින් ඒවායෙහි අගයන් අවිනිශ්චිතතාවයකින් යුක්ත වෙයි.

2.1.12.8 විලම්බිත බදු වත්කම්

විලම්බිත බදු වත්කම් හඳුනාගනු ලබන්නේ එම බදු අලාභ අයකර ගත හැකි, බදු වන අනාගත ලාභ ලැබීමේ භව්‍යතාවක් ඇතිතාක් දුරට පමණි. හඳුනාගත හැකි විලම්බිත බදු වත්කමේ අගය නිර්ණය කිරීම පිණිස අනාගතයේ විය හැකි බදු වන ලාභයන්හි කාලසීමාව හා ප්‍රමාණය සහ අනාගත බදු සැලසුම්කරණ උපායමාර්ග මත පදනම්ව තීරණ ගත යුතු වේ.

2.1.12.9 නිර්වචිත ප්‍රතිලාභ වගකීම්

ආයුගණක තක්සේරු උපයෝගී කරගනිමින් නිර්වචිත ප්‍රතිලාභ සැලසුම්වල පිරිවැය සහ එම වගකීම්වල වර්තමාන අගය තීරණය කෙරෙයි. වට්ටම් අනුපාත, වත්කම් මත අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාත, ඉදිරි වැටුප් වැඩිවීම්, සේවක මරණ අනුපාතය හා ඉදිරි විශ්‍රාම වැටුප් වැඩිවීම් පිළිබඳ උපකල්පන ආයුගණක තක්සේරුව හා සම්බන්ධ වේ.

මෙම සැලසුම්වල දීර්ඝ කාලීන ස්වභාවය හේතුකොට ගෙන එම ඇස්තමේන්තු සැලකිය යුතු අවිනිශ්චිතතාවයකින් යුක්ත වෙයි.

යෝග්‍ය වට්ටම් අනුපාතය තීරණය කිරීමේදී විශ්‍රාම අරමුදලේ කාලසීමාවට බර තැබූ සාමාන්‍ය ශ්‍රේෂයට සමාන ඉහළ ගුණාත්මක බවින් යුතු ආයතනික බැඳුම්කරයක ප්‍රතිලාභ කළමනාකරණය විසින් සලකා බලනු ලැබෙයි. වෙළඳපොළ තුළ ගැලපෙන ඉහළ ගුණාත්මකබවින් යුතු ආයතනික බැඳුම්කර නොමැති අවස්ථාවකදී සමාන කාලසීමාවකට අවදානම ගලපන ලද රාජ්‍ය බැඳුම්කර ප්‍රතිලාභ, වට්ටම් අනුපාතය ලෙස යොදා ගනු ලැබිණි.

පොදුවේ භාවිත මර්ත්‍යතා චක්‍ර අනුව මර්ත්‍යතා අනුපාතිකය තීරණය වෙයි. අපේක්ෂිත අනාගත උද්ධමන අනුපාත හා බැංකුවේ අපේක්ෂිත අනාගත වැටුප් වර්ධක මත ඉදිරි වැටුප් හා විශ්‍රාම වැටුප් වැඩිවීම් තීරණය වෙයි.

2.1.12.10 වගකීම් හා අලාභ සඳහා ප්‍රතිපාදන, බැඳියාවන් හා අසම්භාව්‍යයන්

සමූහයේ සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වලදී සමූහයට එරෙහි නෛතික හිමිකම් ඉල්ලීම් ඉදිරිපත්වූ විට එම හිමිකම් ඉල්ලීම් සාර්ථක වීමේ ඉඩකඩ සම්බන්ධයෙන්, ප්‍රතිපාදන සැලසීම කළමනාකාරිත්වය විසින් තීරණය කරයි. නීතිමය හිමිකම් සම්බන්ධ ක්‍රියාමාර්ග අවසන් කිරීමට ගතවන කාලසීමාව මෙන්ම ආර්ථික ප්‍රතිලාභ ගලායෑමේ ප්‍රමාණය ද අවිනිශ්චිත වේ. මේ සඳහා ගතවන කාලසීමාව සහ පිරිවැය අවසාන වශයෙන් තීරණය වනුයේ අදාළ නෛතික බලසීමාව මතය. වර්ෂය තුළ සාමාන්‍ය ව්‍යාපාරික මෙහෙයුම් තුළදී හඳුනාගනු ලැබූ සියලුම අලාභ වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කරනු ලැබේ.

2.1.12.11 කල්බදු - (ශ්‍රී.ල.මූ.වා.ප්‍ර.16)

බැංකුව විසින් ගිවිසුමක් ආරම්භයේදී එම ගිවිසුම කල්බදු ගිවිසුමක්දැයි හෝ එයට කල්බදු ගිවිසුමක් අයත්දැයි යන්න හා ශ්‍රී.ල.මූ.වා.ප්‍ර.16 හි මාර්ගෝපදේශ අනුව සලකා බැලීම සඳහා යම් කාල පරිච්ඡේදයකදී හඳුනාගත් වත්කමක් ලෙස භාවිත කිරීමේ හැකියාව පාලනය කිරීමේ අයිතිය, එම ගිවිසුමෙන් සන්නිවේදනය වේද යන්න තක්සේරු කරනු ලබයි. මෙම තක්සේරුවේ දී නැවත භාවිත කෙරෙන කාල පරිච්ඡේදය තුළ හඳුනාගත් වත්කම භවිතයෙන් සියලු ආර්ථික ප්‍රතිලාභ ලැබීමේ අයිතිය මෙන්ම හඳුනාගත් වත්කම භාවිත කරනුයේ කවර පරමාර්ථයෙන් සහ කෙසේද යන්න විධාන කිරීමේ අයිතිය බදු ගැනුම්කරු සතු වේ.

ගිවිසුම කල්බදු ගිවිසුමක්දැයි හෝ එයට කල්බදු ගිවිසුමක් අයත්දැයි යන්න තක්සේරු කිරීමෙන් අනතුරුව ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 16 හි සවිස්තරාත්මක මාර්ගෝපදේශ අනුව, එයට අතිරේක කල්බදු ගිවිසුමක/කල්බදු නොවන (සේවා) අංශ ඇතුළත්දැයි යන්න බැංකුව විසින් තීරණය කරනු ලැබෙයි. ඒ අනුව තනිව ගත් විට හෝ බදු ගැනුම්කරුට පහසුවෙන් ලබාගත හැකි වෙනත් සම්පත් සමග අදාළ වත්කම භාවිත කිරීමෙන් බදු ගැනුම්කරුට ප්‍රතිලාභ ලැබිය හැකි නම් සහ අදාළ

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

වත්කම, ගිවිසුමෙහි වෙනත් වත්කම් සමග ඉහළ අන්තර් සම්බන්ධයක් නොමැති නම් හෝ ඒ මත විශාල වශයෙන් රඳා නොපවතී නම්, හඳුනාගත් වත්කමක් භාවිත කිරීමේ අයිතිය වෙනම කල්බදු අංගයක් ලෙස සැලකෙයි.

2.1.12.11.1 භාවිතයට අයිතිය ඇති වත්කම්

භාවිතයට අයිතිය ඇති වත්කම්, සමුච්චිත ක්ෂයවීම් හා හානිකරණ පාඩු අඩුකර පිරිවැයට මනිනු ලබන අතර කිසියම් කල්බදු වගකීම් ප්‍රතිමිනුම් වේ නම් ඊට ගලපනු ලැබෙයි. හඳුනාගනු ලැබූ කල්බදු වගකීම් අගය සහ ලද කල්බදු දිරිදීමනා වේ නම් එය අඩු කළ පසු ආරම්භක දිනට හෝ ඊට පෙර සිදු කරනු ලද කල්බදු ගෙවීම්, භාවිතයට අයිතිය ඇති වත්කම්වල පිරිවැයට අන්තර්ගත වේ. කල්බදු කාලසීමාව අවසානයේදී කල්බදු වලට අදාළ වත්කමෙහි හිමිකාරිත්වය පිළිබඳ සාධාරණ සහතිකයක් බැංකුව සතු නොවේ නම් මිස, භාවිතයට අයිතිය ඇති වත්කම්, එහි අපේක්ෂිත ඵලදායී ජීවකාලය හා කල්බදු කාලසීමාව යන දෙකෙන් අඩු සීමාව තුළ සරල රේඛීය පදනම මත ක්ෂය කරනු ලැබෙයි. භාවිතයට අයිතිය ඇති වත්කම් හානිකරණයට බඳුන් වෙයි.

2.1.12.11.2 කල්බදු වගකීම්

කල්බදු සමාරම්භක දිනට බැංකුව විසින් කල්බදු කාලසීමාව තුළ කළයුතු ගෙවීම්වල වත්මන් අගයට මනිනු ලබන කල්බදු වගකීම් හඳුනා ගැනෙයි. ස්ථාවර ගෙවීම්, ලැබිය හැකි කල්බදු දීමනා අඩු කළ පසු දර්ශකයක් හෝ අනුපාතයක් මත පදනම් වන විචල්‍ය කල්බදු ගෙවීම් සහ ඇපකර වටිනාකම් යටතේ ගෙවීමට අපේක්ෂිත අගයන් කල්බදු ගෙවීම්වලට අයත් වේ. බැංකුව විසින් උපයෝගී කරගනු ලැබීමට හේතු සහගත ගැනුම් විකල්පයක පුරුදු මිල හා ගිවිසුම අවසන් කළ හැකිය යන විකල්පය බැංකුවට භාවිත කිරීමේ අයිතිය කල්බදු කොන්දේසි වලින් පිළිඹිබු වේ නම්, කල්බදු ගිවිසුමක් අවසන් කිරීමට අදාළ දඩ මුදල් ද කල්බදු ගෙවීම්වලට ඇතුළත් වේ. ගෙවීම් කිරීමට තුඩු දෙන යම් සිදුවීමක් හෝ තත්ත්වයක් උදාවූ කාලසීමාව තුළ යම් දර්ශකයක් හෝ අනුපාතිකයක් මත පදනම් නොවූ විචල්‍ය කල්බදු ගෙවීම් වියදම් ලෙස හඳුනා ගැනෙයි.

කල්බදු ගෙවීම්වල වත්මන් අගය ගණනය කිරීමේදී කල්බදු වලට අදාළ පොලී අනුපාතිකය එක්වරම තීරණය කළ නොහැකි වන විටක කල්බදු ආරම්භක දිනට පවතින භාණ්ඩාගාර බැඳුම්කර අනුපාතිකය (භාණ්ඩාගාර බැඳුම්කර කාලසීමාව කල්බදු ගිවිසුම් කාලසීමාවට සමාන විය යුතුයි) බැංකුව විසින් උපයෝගී කරගනු ලැබෙයි.

සමාරම්භක දිනට පසුව පොලිය එකතුවීම පිළිඹිබු කිරීමට කල්බදු වගකීම් ප්‍රමාණය වැඩිකර ගෙවන ලද කල්බදු ගෙවීම් ප්‍රමාණය අඩු කරනු ලබයි. ඊට අමතරව වෙනස් කිරීමක්, කල්බදු කාලසීමාවෙහි වෙනසක්, ප්‍රධාන වශයෙන් ස්ථාවර කල්බදු ගෙවීම්හි වෙනසක් හෝ පාදක වූ වත්කම මිලදී ගැනීමේදී තක්සේරුකරණයේ වෙනසක් යනාදිය ඇති අවස්ථාවලදී කල්බදු වගකීම්හි ධාරණ අගය ප්‍රත්‍යාගණනය කෙරෙයි.

කල්බදු වගකීම මෙලෙස යළි මනිනු ලබන විට වත්කම් භාවිත කිරීමේ අයිතියෙහි ධාරක අගයට අදාළ ගැලපීමක් සිදු කරනු ලබයි. නොඑසේ නම්, වත්කම් භාවිත කිරීමේ අයිතියෙහි ධාරක අගය 0 තෙක් අඩු වී ඇත්නම්, එය ලාභ/අලාභ යටතේ වාර්තා කරනු ලබයි.

සමූහය විසින් වත්කම් භාවිතා කිරීමේ අයිතිය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි දක්වන අතර කල්බදු වගකීම්, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි "වෙනත් වගකීම්" යටතේ දක්වනු ලැබෙයි.

2.1.12.11.3 කෙටිකාලීන කල්බදු හා අඩු වටිනාකමැති කල්බදු වත්කම්

බැංකුව එහි කෙටිකාලීන කල්බදු වලට (එනම්, මිලදී ගැනීමේ විකල්පයක් නොමැති හා ආරම්භක දින සිට මාස 12 ක හෝ ඊට අඩු කල්බදු කාලසීමාවක් සහිත කල්බදු වලට) කෙටිකාලීන කල්බදු හඳුනාගැනීම් නිදහස් කිරීම අදාළ කර ගනියි. එමෙන්ම අඩු වටිනාකමක් ඇති බවට සලකනු ලබන අවස්ථාවලදී ද බැංකුව අඩු වටිනාකමැති වත්කම් කල්බදු හඳුනාගැනීම් නිදහස් කිරීම අදාළ කර ගනියි. කෙටිකාලීන කල්බදු මත හා අඩු වටිනාකමැති වත්කම් මත කල්බදු ගෙවීම්, කල්බදු කාලසීමාව තුළදී සරල රේඛීය පදනමක් මත වියදම් ලෙස හඳුනාගනු ලබයි. බැංකුව විසින් පාදක වූ වත්කමෙහි අගය රු. මිලියන 1ට සමාන හෝ අඩු නම්, අඩු වටිනාකමැති වත්කම්වල කල්බදු සලකා බැලෙය

2.1.12.11.4. අළුත්කිරීමේ විකල්පය සහිත ගිවිසුම්වල කල්බදු කොන්දේසි තීරණය කිරීමේදී වැදගත් තීරණ

උපයෝගී කරගත හැකි බවට පිළිගත හැකි පරිදි තහවුරු කළ හැකි, දීර්ඝ කළ හැකි විකල්පයක් මගින් ආවරණය වන කිසියම් කාලච්ඡේද සමග හෝ උපයෝගී කරගනු ලබන බවට පිළිගත හැකි පරිදි තහවුරු කළ නොහැකි විටකදී කල්බදු අවසන් කිරීමට විකල්පයක් මගින් ආවරණය වන කාලච්ඡේද සමග අවලංගු කළ නොහැකි කල්බදු කොන්දේසි, බැංකුව විසින් කල්බදු කොන්දේසි ලෙස තීරණය කරනු ලබයි. අළුත් කිරීමේ විකල්පය උපයෝගී කරගනු ලබන බවට පිළිගත හැකි පරිදි තහවුරු කර ගැනීම උදෙසා බැංකුව තීරණ ගනු ලබයි. එනම්, අළුත් කිරීම උපයෝගී කර ගැනීම සඳහා ආර්ථිකමය දිරිදීමනාවක් උත්පාදනය කරන අදාළ සියලු සාධක එය සලකා බලනු ලබයි. ආරම්භක දිනට පසු, සිය පාලනය යටතේ ඇති හා අළුත්කිරීමේ විකල්පය උපයෝගී කර ගැනීමට (හෝ උපයෝගී කර නොගැනීමට) ඇති හැකියාව බලපානු ලබන වාතාවරණයන්හි වෙනසක් හෝ වැදගත් සිද්ධියක් වේ නම්, බැංකුව විසින් කල්බදු කොන්දේසි යළි ඇගයීමට ලක් කෙරෙයි. කල්බදු දීර්ඝ කර ගැනීමේ හෝ අවසන් කිරීමේ විකල්ප අඩංගු ගිවිසුම්හි කල්බදු කොන්දේසි තීරණය කිරීමේදී බැංකුව පසු දැක්මක් යොදා ගනියි. ඒ අනුව, බැංකුව හා බදුහිමියා විසින් අත්සන් කරන ලද කුලී එකඟතාව මගින් ආවරණය වන කාලච්ඡේදය තුළ වසර ගණන මත පදනම්ව බැංකුව විසින් කල්බදු කොන්දේසි හඳුනාගනු ලබයි.

2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස්වීම්

පහත කරුණු හැරුණුවිට 2023 වර්ෂය තුළ ගිණුම්කරණ ප්‍රතිපත්තීන්හි ප්‍රධාන පෙළේ වෙනස්කම් සිදු නොවිණි.

2.3 සාධාරණ අගය මිනීම

"සාධාරණ අගය" වූ කලී විධිමත් ගනුදෙනුවකදී වත්කමක් විකිණීමට හෝ වගකීමක් ගෙවා නිදහස් වන මිල සඳහා ගෙවීමේදී හෝ එසේ නොමැති විටක මනිනු ලබන දින වෙළඳපළ පාර්ශ්වකරුවන් අතර සිදුවන නිසි ගනුදෙනුවකදී සමූහයට එදිනට පිවිසිය හැකි වඩා ප්‍රතිලාභදායී වෙළඳපළකදී ලැබෙන මිලකි. වගකීමක සාධාරණ අගය එහි කාර්යසාධනමය නොවන අවදානම පිළිඹිබු කරයි.

යම් උපකරණයක් සඳහා සක්‍රීය වෙළඳපොළක් තුළ ප්‍රකාශිත මිල භාවිත කරමින් සමූහය විසින් එකී උපකරණයෙහි සාධාරණ අගයට මනිනු ලබයි. අඛණ්ඩ පදනමක් මත මිලකරණ තොරතුරු සැපයීමට ප්‍රමාණවත් ධාරිතාවක් හා නිවැරදිතාවයක් සහිත වත්කමක හෝ වගකීමක ගනුදෙනු සිදුවන්නේ නම්, එකී වෙළඳපළ සක්‍රීය යැයි සැලකෙයි.

සක්‍රීය වෙළඳපොළක් තුළ ප්‍රකාශිත මිලකරණයක් නොවේ නම් නිරීක්ෂණය කළ හැකි අදාළ යෙදවුම්වල භාවිතය උපරිම කරවන සහ නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම්වල භාවිතය අවම කරවන තක්සේරු විධික්‍රම සමූහය විසින් භාවිත කෙරෙයි. මිලකරණ ගනුදෙනුවකදී වෙළඳපළ පාර්ශ්වකරුවන් ආර්ථික අතින් ඔවුන්ගේ උපරිම යහපත තකා කටයුතු කරන්නේ නම්, වත්කම හෝ වගකීම මිලකරණයේදී ඔවුන් සාධාරණ අගයෙහි ධූරාවලිය උපයෝගී කරගනු ඇතැයි යන උපකල්පනය මත වත්කමක/වගකීමක සාධාරණ අගය මනිනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

වෙනස්වීම් සිදුවී ඇති වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයේදී සාධාරණ අගයෙහි ධූරාවලි මට්ටම් අතර මාරුවීම් සමූහය විසින් හඳුනාගනු ලබයි.

මූල්‍ය නොවන වත්කමක සාධාරණ අගය මැනීමේදී වත්කමක් එහි ඉහළම/හොඳම භාවිතය තුළින් හෝ එලෙස ඉහළම/හොඳම ලෙස භාවිත කරනු ලබන වෙනත් වෙළඳපළ පාර්ශ්වකරුවෙකුහට විකිණීම තුළින් ආර්ථික ප්‍රතිලාභ ජනනය කිරීමට වෙළඳපළ පාර්ශ්වකරුවකු සතු හැකියාව සලකා බලනු ලබයි. ඉඩම් සහ ගොඩනැගිලි වැනි සැලකිය යුතු වත්කම් තක්සේරු කිරීම සඳහා බාහිර වෘත්තීමය අගය කරන්නන් සම්බන්ධ වේ.

මූල්‍ය වත්කම් හා වගකීම්වල සාධාරණ අගය මිනිමේ/විශ්ලේෂණයක් පිටු අංක 379 සිට 381 දක්වා සටහන් අංක 56 හි දක්වා ඇත.

2.4 සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති – පොදු

2.4.1 ඒකාබද්ධ කිරීමේ පදනම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 10) "ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන" සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (ශ්‍රී.ල.මූ.වා.ප්‍ර.27) "ඒකාබද්ධ හා තනි මූල්‍ය ප්‍රකාශන" ප්‍රකාර බැංකුවේ හා සමූහයේ මූල්‍ය ප්‍රකාශන, බැංකුවේ සහ එහි පාලිතයේ මූල්‍ය ප්‍රකාශන වලින් සමන්විත වේ.

2.4.1.1 ව්‍යාපාරික ඒකාබද්ධවීම්

පාලනය සමූහය වෙත සංක්‍රමණය වන අවස්ථාවේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්හි ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 3 - "ව්‍යාපාරික ඒකාබද්ධවීම්" යටතේ අත්පත් කර ගැනීමේ ක්‍රමවේදය උපයෝගී කර ගනිමින් ව්‍යාපාරික ඒකාබද්ධවීම් ගිණුම්ගත කෙරෙයි. අත්පත් කර ගැනීමේදී සංක්‍රමණය කෙරෙන ප්‍රතිලාභ හා අත්පත් කරගනු ලබන ශුද්ධ හඳුනාගත හැකි වත්කම් සාධාරණ අගයට මනිනු ලැබෙයි. පැන නගිනු ලබන යම් කීර්තිනාමයක් වේ නම්, වාර්ෂිකව හානිකරණය සඳහා පරීක්ෂා කරනු ලබයි. කේවල් කර මිලදි ගැනීමකදී ඇති වන ඕනෑම ලාභයක් වහාම ලාභයට හෝ අලාභයට හඳුනාගනු ලැබෙයි. ණය හෝ හිමිකම් කොටස් සුරැකුම් නිකුතුවට අදාළ නම් හැර ගනුදෙනු පිරිවැය සිදු වූ වියදම් ලෙස ගණනය වෙයි.

පෙර පැවති සබඳතා පියවීමට අදාළ ප්‍රතිලාභ සංක්‍රමණය වූ ප්‍රතිලාභ වලට ඇතුළත් නොවෙයි. එබඳු ප්‍රමාණ සාමාන්‍යයෙන් ලාභ හෝ අලාභවල හඳුනාගනු ලැබෙයි.

අත්පත් කරගනු ලබන ඕනෑම අසම්භාව්‍ය ප්‍රතිලාභයන් එය අත්පත් කරගන්නා දිනට එහි සාධාරණ වටිනාකමට මනිනු ලබයි. හිමිකම් ලෙස වර්ගීකරණය කර ඇති විට එය ප්‍රත්‍යාගණනය නොකරන අතර හිමිකම් තුළ පියවීම ගිණුම්කරණය කෙරෙයි. අඛණ්ඩ සලකා බැලීමත්. ගෙවීමට ඇති බැඳියාව මූල්‍ය උපකරණ වර්ගීකරණයෙහි හිමිකම නිර්වචනය යටතට ගැනෙන විට එය ප්‍රත්‍යාගණනය නොකරන අතර පියවීමද හිමිකම් ඇතුලත ගිණුම්ගත කරයි. නොඑසේ නම් අඛණ්ඩ සලකා බැලීමක සාධාරණ වටිනාකම පසුකාලීන වෙනස්වීම් ලාභයට හෝ අලාභයට හඳුනා ගනියි. මූල්‍ය උපකරණයක නිර්වචනයට සරිලන අසම්භාව්‍ය ප්‍රතිලාභ ගෙවීමට ඇති බැඳියාව, නොඑසේ නම්, අසම්භාව්‍ය ප්‍රතිලාභයන්හි සාධාරණ වටිනාකමෙහි පසුකාලීන වෙනස්කම් ලාභයට හෝ අලාභයට හඳුනාගනු ලැබෙයි.

2.4.1.2 පාලනය නොවන හිමිකම

ඉහත විස්තර පිටු අංක 333 හි සටහන් අංක 47 යටතේ දක්වා ඇත.

2.4.1.3 පරිපාලිත සමාගම්

බැංකුව වෙත පාලනය පැවරෙන දින පටන් පාලිතයෙහි මූල්‍ය ප්‍රකාශන මුලුමනින්ම ඒකාබද්ධ කෙරෙන අතර, එබඳු පාලනයක් අවසන් වනතුරු ඒකාබද්ධ කිරීම සිදුවෙයි. පාලනයක් පවතින්නේ බැංකුවට එකී පාලිත සමාගමේ ක්‍රියාකාරකම් වලින් ප්‍රතිලාභ ලබාගත හැකිවන පරිදි, එහි මූල්‍ය හා මෙහෙයුම් ප්‍රතිපත්ති පාලනය කිරීමට බලයක් ඇති විටදීය. ඒකාබද්ධ කිරීමේදී භාවිතා වන බැංකුවේ පරිපාලිතයෙහි මූල්‍ය ප්‍රකාශන, ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙහි මූල්‍ය ප්‍රකාශන වාර්තාකරණ කාලපරිච්ඡේදය අදාළ වන අතර ඊට සමාන ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කරමින් පිළියෙල කරනු ලබයි.

2.4.1.4 පාලනය අහිමිවීම

පාලිත සමාගමක පාලනය සමූහය සතු නොවන විට එය විසින් පාලිත සමාගමෙහි වත්කම් හා වගකීම් සහ අදාළ ඕනෑම පාලනයකට යටත් නොවන හා හිමිකම්වල වෙනත් උපාංග හඳුනාගනු නොලැබෙයි. එහි ප්‍රතිඵල ලෙස උත්පාදිත ලාභ හෝ අලාභ, ලාභයට හෝ අලාභයට හඳුනාගනු ලැබෙයි. පාලනය සතු නොවන විට පෙර පාලිත සමාගමෙහි රඳවාගත් ඕනෑම පොලියක් සාධාරණ වටිනාකමට මනිනු ලබයි.

2.4.1.5 ආශ්‍රිතයන්

පිටු අංක 295 හි සටහන් අංක 25 යටතේ විස්තර දක්වා ඇත.

2.4.1.6 ඒකාබද්ධ කිරීමේදී ඉවත් කරනු ලැබූ ගනුදෙනු

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සියලුම අන්තර් සමාගම් ශේෂයන්, ආදායම් හා වියදම් මෙන්ම එවැනි අන්තර් සමාගම් ගනුදෙනුවලින් පැන නගින ලද උපලබ්ධි නොවූ ලාභ සහ අලාභ සම්පූර්ණයෙන් ඉවත් කර ඇත. පිටු අංක 336 හා 337 හි දක්වා ඇති පාලිත සමාගම සමග ගනුදෙනුවලට අදාළ සටහන් අංක 49.3 හා 49.4 වෙත යොමු වන්න.

2.4.2 විදේශ මුදල් ගනුදෙනු සහ ශේෂ

විදේශීය ව්‍යවහාර මුදලින් කරනු ලබන ගනුදෙනු, එකී ගනුදෙනු සිදුවූ අවස්ථාවේදී පැවති විනිමය අනුපාතික මත වාර්තාකරන/ක්‍රියාකාරී මුදල් වර්ගය වන ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කරනු ලබයි.

ශේෂපත්‍ර දිනට විදේශ ව්‍යවහාර මුදලින් සමන්විත මූල්‍ය වත්කම් හා වගකීම් වාර්තාකරණ දිනට පවතින මධ්‍යම විනිමය අනුපාතය යොදාගනිමින් ශ්‍රී ලංකා රුපියල් වලට යළි පරිවර්තනය කරනු ලබයි. මූල්‍ය අයිතම පියවීම මත හෝ මුලින් වාර්තා කළ අනුපාතයකට වඩා වෙනස් අනුපාත වලට මූල්‍ය අයිතම පරිවර්තනය මත පැන නගින සියලුම විනිමය වෙනස්කම්, එකී වෙනස්කම් පැනනගින කාලපරිච්ඡේදය තුළ ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගනු ලැබෙයි.

ඓතිහාසික පිරිවැයට අගය කරනු ලබන මූල්‍ය නොවන විදේශ මුදලින් ප්‍රකාශිත අයිතම, ආරම්භක ගනුදෙනු සිදු වූ දින පැවති විනිමය අනුපාත භාවිතයට ගනිමින් ව්‍යවහාරික මුදල් වලට පරිවර්තනය කරනු ලබේ. විදේශ මුදලින් ප්‍රකාශිත සාධාරණ අගයට අගය කරනු ලබන මූල්‍ය නොවන අයිතම සාධාරණ අගය තීරණය කළ දින පැවති විනිමය අනුපාත භාවිතයට ගනිමින් පරිවර්තනය කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

2.5 සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති – වත්කම් හා වගකීම් හඳුනාගැනීම

මූල්‍ය උපකරණ

2018 ජනවාරි මස 01 දින හෝ ඉන් පසුව එළඹෙන වාර්ෂික කාලපරිච්ඡේදය සඳහා ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 9 "මූල්‍ය උපකරණ" මගින් ශ්‍රී.ල.ගි.ප්‍ර 39 ආදේශ වෙයි. ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 9 යටතේ අනුමත ප්‍රතිපත්තිමය විකල්පයක් ලෙස ශ්‍රී.ල.ගි.ප්‍ර 39 ප්‍රකාර ඉදිරි ගිවිසුම් ගිණුම්කරණ අබණ්ඩවම යොදාගැනීමට බැංකුව තීරණය කරන ලදී.

2.5.1 මූල්‍ය උපකරණ – මූලික හඳුනාගැනීම්, වර්ගීකරණය සහ පසුව මිනීම

2.5.1.1 හඳුනා ගැනීමේ දිනය

සමූහය විසින් ආරම්භයේදී ණය හා අත්තිකාරම්, තැන්පතු හා යටත්කාලීන වගකීම් යනාදිය ඒවා ඇති වූ දිනට හඳුනාගනු ලැබෙයි. ගනුදෙනුකරුවන්ට ලබාදෙන ණය හා අත්තිකාරම් හඳුනාගනු ලබන්නේ ගනුදෙනුකරුවන්ගේ ගිණුම්වලට අරමුදල් බැර වූ පසුවය. ගනුදෙනුකරුවන්ගේ අරමුදල් බැංකුවට ලැබූ පසුව තැන්පත්කරුවන්ට ගෙවිය යුතු ශේෂ ලෙස බැංකුව හඳුනාගනී.

අනෙකුත් සියලුම මූල්‍ය උපකරණ (සාමාන්‍ය ක්‍රමයට මිලදී ගැනීම් හා මූල්‍ය වත්කම් විකිණීම් ඇතුළත්ව) මූලිකව ගනුදෙනු කරන දිනට එනම්, උපකරණවල ගිවිසුම්ගත ප්‍රතිලාභ සඳහා සමූහය පාර්ශ්වකරුවකු වන දිනට හඳුනා ගැනේ.

2.5.1.2 මූල්‍ය උපකරණ හඳුනාගැනීම හා මූලික ගණනය කිරීම

මූලික ගණනය කිරීම් සඳහා මූල්‍ය උපකරණ වර්ගීකරණය කිරීම තීරණය වනුයේ, සටහන් අංක 2.5.1.4.1 සහ 2.5.1.4.2 හි විස්තර කර ඇති පරිදි උපකරණ කළමනාකරණය කිරීමේ ව්‍යාපාරික ආකෘතිය සහ ගිවිසුම්ගත කොන්දේසි මතය.

ලාභය හෝ පාඩුව හරහා වාර්තා කළ මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් වලදී හැරුණුවිට මූල්‍ය උපකරණ මූලික ගණනය කිරීමේදී ඒවායේ සාධාරණ වටිනාකමට (සටහන් අංක 56 හි නිර්වචිත අයුරින්) මනිනු ලබන අතර ඊට වෙළඳ ගනුදෙනු පිරිවැය එකතු කිරීම හෝ අඩු කිරීම සිදු කෙරෙයි. වෙළඳාම් මගින් ලැබීම් ගනුදෙනු මිලට මනිනු ලබයි. මූලික ගණනය කිරීමේ මූල්‍ය උපකරණවල සාධාරණ අගය වෙළඳ ගනුදෙනු මිලෙන් වෙනස් වන අවස්ථාවේදී බැංකුව සහ සමූහය විසින් පහත සඳහන් පරිදි දින 1 ලාභය හෝ අලාභය සඳහා ගිණුම්කරණය කෙරෙයි.

2.5.1.3 "දින 1" ලාභය හෝ අලාභය ("Day 1" Profit or Loss)

නිරීක්ෂණය කළ හැකි වෙළඳපොළහි දත්ත ඇතුළත් විචල්‍යයන් මත වූ ඇගයීමේ ශිල්පක්‍රම පදනම්ව ගණනය කළ සාධාරණ අගය හෝ එකම නිරීක්ෂණය කළ හැකි වෙළඳපොළ ගනුදෙනු පදනම් කරගෙන නිර්ණය කළ සාධාරණ අගය ගනුදෙනු මිලෙන් වෙනස් වන විට වෙනස සමූහය විසින් වහාම හඳුනාගනී. නිරීක්ෂණය කළ නොහැකි දත්ත උපයෝගී කර ගනිමින් සාධාරණ අගය තීරණය කරනු ලබන අවස්ථාවල දී යෙදවුම් දත්ත නිරීක්ෂණය කළ හැකි වන විට හෝ අයිතමය හඳුනා නොගන්නා විට ගනුදෙනු කරන මිල හා ආකෘතියෙහි අගය අතර වෙනස විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි පමණක් හඳුනාගනු ලබයි. ගනුදෙනුකරන මිලෙහි සහ සාධාරණ අගයෙහි වෙනස ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගනු ලබයි.

පොදු යෝජනා ක්‍රමයක් යටතේ සහනදායී පොළී අනුපාතයට සේවකයන්ට ප්‍රදානය කරන ලද ණය වලින් ජනිත වන දින 1 අලාභය සේවකයන්ගේ ඉදිරියට ඇති සේවා කාලය හෝ ණය කාලසීමාව යන දෙකෙන් අඩු අගයට පොළී අදායම් හා පුද්ගල වියදම් හි සඵල පොළී අනුපාතය භාවිතයෙන් හඳුනාගනු ලබයි.

2.5.1.4 මූල්‍ය වත්කම් වර්ගීකරණය සහ පසුව මිනීම

බැංකුව විසින් පහත කවරාකාරයෙන් හෝ මනින ලදුව වත්කම්වල ගිවිසුම්ගත කාලසීමා කළමනාකරණය කිරීමේ ව්‍යාපාරික ආකෘතිය මත පදනම්ව එහි සියලු මූල්‍ය වත්කම් වර්ගීකරණය කෙරෙයි.

- ක්‍රමක්ෂය පිරිවැය
- වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගය
- ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගය

සටහන් අංක 2.5.1.6 හි විස්තර කොට ඇති පරිදි බැංකුව හා සමූහය විසින් ව්‍යුත්පන්න සහ ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගයට අගය කරන වෙළඳ කළඹ වර්ගීකරණය කර අගය කරනු ලබයි. බැංකුව විසින් ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට මූල්‍ය උපකරණ නියම කරනු ලබන අතුරින් එමගින් අගය කිරීමේ හෝ හඳුනාගැනීමේ අසමානතා සැලකියයුතු ලෙස අඩු කෙරෙයි.

2.5.1.4.1 ව්‍යාපාරික ආකෘති ඇගැයීම

සිය අරමුණු ඉටුකර ගැනීමට මූල්‍ය වත්කම් කළමනාකරණය කරන අයුරු හොඳින්ම පිළිඹිබු වන මට්ටමට බැංකුව සහ සමූහය විසින් එහි ව්‍යාපාරික ආකෘතිය තීරණය කරනු ලබයි.

බැංකුවේ ව්‍යාපාරික ආකෘතිය, උපකරණයෙන් උපකරණය යන පදනම නොව වඩාත් ඉහළ මට්ටමේ කළඹ එකතුව මත ඇගයීමට ලක් වන අතර, පහත සඳහන් නිරීක්ෂණය කළහැකි සාධක මත පදනම් වේ.

- ව්‍යාපාරික ආකෘතියෙහි කාර්ය සාධනය සහ එකී ව්‍යාපාරික ආකෘතිය තුළ රඳවා ගනු ලබන මූල්‍ය වත්කම් අගයන අයුරු හා ආයතනයේ ප්‍රධාන කළමනාකාරිත්ව පිරිස් වෙත වාර්තා කරනු ලබන අයුරු.
- ව්‍යාපාරික ආකෘතියෙහි කාර්ය සාධනයට බලපානු ලබන අවදානම් (සහ එකී ව්‍යාපාරික ආකෘතිය තුළ රඳවා ගනු ලබන මූල්‍ය වත්කම්) හා විශේෂයෙන්ම එකී අවදානම් කළමනාකරණය කරන අයුරු.
- ව්‍යාපාරයේ කළමනාකරුවන් හානිපූරණය කෙරෙන අයුරු (උදා: වශයෙන් කළමනාකරණය කරනු ලබන වත්කම්වල සාධාරණ වටිනාකම මත නැතහොත් රැස් කරනු ලබන ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ මත හානිපූරණය කෙරේද)
- අපේක්ෂිත වාර ගණන, වටිනාකම හා විකුණුම් සිදු කරනු ලබන කාලසීමාව යනාදිය ද බැංකු මගින් කරනු ලබන ඇගයීමේදී වැදගත් අංගයක් වේ.

ආතති සිදුවීම් හා වියහැකි නරකම සිදුවීම් සැලකිල්ලට නොගෙන පිළිගත හැකි අපේක්ෂිත සිදුවීම් මත පදනම්ව ව්‍යාපාරික ආකෘතිය ඇගයීම සිදුකෙරේ. මූලික හඳුනාගැනීමෙන් පසුව බැංකුවේ මුල් අපේක්ෂාවට වඩා වෙනස් අයුරින් මුදල් ප්‍රවාහ හඳුනාගනු ලැබේ නම්, එකී ව්‍යාපාරික ආකෘතියෙහි රඳවාගනු ලබන සෙසු මූල්‍ය වත්කම් වල වර්ගීකරණය බැංකුව විසින් වෙනස් නොකරන අතර අලුතින් ජනිත හෝ අලුතින් මිලට ගනු ලැබූ මූල්‍ය වත්කම් අගය කිරීමේදී එකී විස්තර අන්තර්ගත කරනු ලැබේ.

2.5.1.4.2 ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ හුදු මුල් මුදල සහ පොළිය ගෙවීමේ ඇති ඇගැයීම (SPPI Test)

වර්ගීකරණ ක්‍රියාවලියේ දෙවන පරීක්ෂාව වශයෙන් මුල් මුදල හා පොළිය ගෙවීම සම්බන්ධයෙන් පමණක් අදාළ වේදැයි හඳුනාගැනීම පිණිස බැංකුව විසින් මූල්‍ය වත්කම්වල ගිවිසුම්ගත නියමයන් අගයනු ලබයි.

මෙම පරීක්ෂාවේදී මුල් මුදල නිර්වචනය කරනු ලබන්නේ මූලික හඳුනාගැනීමේදී මූල්‍ය වත්කමෙහි සාධාරණ අගය ලෙස වන අතර, මූල්‍ය වත්කමෙහි ජීවකාලය තුළ එය වෙනස් වියහැකිය. (උදා: වශයෙන් මුල් මුදල යළි ගෙවීම හෝ අධිමිල/වට්ටම් ක්‍රමක්ෂයවීම් මත)

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

ණයදීමේ ක්‍රියාවලිය තුළ වඩාත් වැදගත් පොළී සම්බන්ධ සාධක වන්නේ ණය අවදානම සහ මුදල්වල කාලීන අගය පිළිබඳ සලකා බැලීමයි. ඉහත කී ඇගයීම සිදුකිරීම පිණිස මූල්‍ය වත්කම පවතින මුදල් වර්ගය සහ පොළී අනුපාතිකය අදාළ වන කාලසීමාව ආදී කරුණු බැංකුව විසින් සලකා බලා විනිශ්චයකට එළඹෙයි.

අවදානමට ඇති අවම නිරාවරණයවීම් හෝ වෙනස්වීම් හඳුන්වාදෙනු ලබන ගිවිසුම්ගත නිරාවරණයවීම් වලට වඩා මූලික ණයදීමේ ක්‍රියාවලියට සම්බන්ධ නොමැති ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ, හිඟ මුදල් මත පමණක් මුල් මුදල් හා පොළී ගෙවීම් වලට තුඩු නොදෙයි. එවන් අවස්ථාවලදී මූල්‍ය වත්කම් සාධාරණ අගය මත ලාභ අලාභ අනුව ගණනය කළ යුතු වේ.

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයෙහි හඳුනාගෙන ඇති විවිධ මූල්‍ය වත්කම් කාණ්ඩ පිළිබඳ විස්තර සඳහා සටහන් අංක 2.5.1.4.3 සිට 2.5.1.4.5 දක්වා යොමු වන්න.

2.5.1.4.3 ක්‍රමක්ෂය පිරිවැයට මනින ලද මූල්‍ය වත්කම්

පහත සඳහන් කොන්දේසි දෙකම සපුරාලන්නේ නම් සහ ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නියම නොකෙරේ නම්, මූල්‍ය වත්කම ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරනු ලැබෙයි.

- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ රැස්කිරීම් සඳහා වත්කම් රඳවාගැනීම අරමුණ වන ව්‍යාපාරික ආකෘතියක් තුළ වත්කම රඳවාගනු ලැබීම.
- මූල්‍ය වත්කම්වල ගිවිසුම්ගත කොන්දේසි නිශ්චිත දිනයන්හි ගෙවියයුතු සම්පූර්ණ මුදලෙහි මුල් මුදල හා පොළිය ගෙවීම් පමණක් වන මුදල් ප්‍රවාහ ඇතිකරවීම.

ක්‍රමක්ෂය පිරිවැයට මනින ලද මූල්‍ය වත්කම් පහත දැක්වේ.

(අ) මුදල් හා මුදල්වලට සමානයන්
මුදල් හා මුදල්වලට සමානයන් පිළිබඳ විස්තර පිටු අංක 275 හි සටහන් අංක 16 හි දැක්වේ.

(ආ) මහ බැංකුව වෙතැති ශේෂයන්
මහ බැංකුව වෙතැති ශේෂයන් පිළිබඳ විස්තර පිටු අංක 275 හි සටහන් අංක 17 හි දැක්වේ.

(ඇ) බැංකුවල ඇති තැන්පතු
බැංකුවල ඇති තැන්පතු පිළිබඳ විස්තර පිටු අංක 276 හි සටහන් අංක 18 හි දැක්වේ.

(ඈ) ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් – ණය හා අත්තිකාරම්
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් – ණය හා අත්තිකාරම් පිළිබඳ විස්තර පිටු අංක 21 හි සටහන් අංක 281 හි දැක්වේ.

(ඉ) ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් – ණය හා වෙනත් උපකරණ
ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් – ණය හා වෙනත් උපකරණ පිළිබඳ විස්තර පිටු අංක 288 හි සටහන් අංක 22 හි දැක්වේ.

2.5.1.4.4 වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට දක්වන මූල්‍ය වත්කම්

වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට දක්වන ණය හා හිමිකම් උපකරණ යනාදිය වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට දක්වන මූල්‍ය වත්කම් වලට ඇතුළත්ය.

වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට දක්වන මූල්‍ය වත්කම් පිළිබඳව පහත සඳහන් සටහන් (අ) සහ (ආ) මගින් දැක්වේ.

(අ) වෙනත් විස්තීරණ ආදායම් මගින් සාධාරණ අගයට ගණනය කරන ලද ණය උපකරණ
ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ රැස්කිරීම සඳහා වත්කම් රඳවා ගැනීම අරමුණු වන ව්‍යාපාරික ආකෘතියක් තුළ වත්කම රඳවාගනු ලබන්නේ නම් හෝ ගෙවියයුතු මුළු මුදලින් මුල් මුදල හා පොළිය ගෙවීම පමණක් නියෝජනය කරනු ලබන වත්කමක මුදල් ප්‍රවාහ විකිණීම සිදු කරනු ලබන්නේ නම්, වෙනත් විස්තීරණ ආදායම් මගින් සාධාරණ අගයට ණය උපකරණ ගණනය කරනු ලබයි.

ඉහත විස්තර පිටු අංක 290 සිට 292 දක්වා සටහන් අංක 23 මගින් දැක්වේ.

(ආ) වෙනත් විස්තීරණ ආදායම් මගින් සාධාරණ අගයට නියම කරන ලද හිමිකම් උපකරණ
මූලික හඳුනාගැනීමේදී වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ගණනය කරන ලද හිමිකම් උපකරණ ලෙස උපාය මාර්ගික හා ව්‍යවස්ථාපිත අරමුණු උදෙසා රඳවාගන්නා හිමිකම් ආයෝජන අතරින් ඇතැම් ඒවා යළි වෙනස් නොකළ හැකි සේ වර්ගීකරණය කිරීමට සමූහය තීරණය කරනු ලබයි.

ඉහත විස්තර පිටු අංක 292 සිට 294 දක්වා සටහන් අංක 23 හි දැක්වේ.

2.5.1.4.5 ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට දක්වන මූල්‍ය වත්කම්

ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 9 ට අනුව ක්‍රමක්ෂය පිරිවැයට හෝ වෙනත් විස්තීරණ ආදායම් මගින් සාධාරණ අගයට දක්වන මූල්‍ය වත්කම් හැර අනෙකුත් සියලු මූල්‍ය වත්කම් ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයට දක්වනු ලබයි.

කොන්ත්‍රාත්තුමය මුදල් ප්‍රවාහ රැස්කිරීමට හෝ මූල්‍ය වත්කම් විකිණීම සඳහා යන කරුණු හේතුවෙන් රඳවා නොගන්නා බැවින් සාධාරණ අගය යන පදනම මත අගයනු ලබන වෙළඳාම සඳහා රඳවාගන්නා හෝ කළමනාකරණය කරන මූල්‍ය වත්කම් ලාභය/අලාභය මගින් සාධාරණ අගයට මූලිකව හඳුනාගැනීමෙන් නියම කරන ලද මූල්‍ය වත්කම් පහත සාකච්ඡාවට භාජනය කර ඇත.

(අ) ලාභය/අලාභය මගින් සාධාරණ අගයට නියම කරන ලද මූල්‍ය වත්කම්
ලාභය/අලාභය මගින් සාධාරණ අගයට නියම කරනු ලබන මූල්‍ය වත්කම්, මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයෙහි සාධාරණ අගයට වාර්තා කරනු ලබයි. සාධාරණ අගයෙහි වෙනස්කම්, "ලාභය/අලාභය හරහා සාධාරණ අගයට නියම කරනු ලබන මූල්‍ය වත්කම් සහ වගකීම් මත ශුද්ධ ලැබීම් හෝ අලාභයන්හි" වාර්තා කරනු ලබයි. උපයනු ලබන පොළිය සළුල පොළී අනුපාත උපයෝගී කර ගනිමින් "පොළී ආදායම්" හි උපචිත වන අතර මුදල ලැබීමේ අයිතිය ස්ථාපිත වූ විට ලාභාංශ ආදායම "වෙනත් මෙහෙයුම් ආදායම්හි" වාර්තා කෙරෙයි.

කාලපරිච්ඡේදය අවසානයේදී ලාභය/අලාභය මගින් සාධාරණ අගයට ගණනය කිරීමේදී මූලිකව හඳුනාගනු ලබන නියම කරන ලද මූල්‍ය වත්කම් සමූහය සතුව නැත.

2.5.1.5 මූල්‍ය වගකීම් වර්ගීකරණය සහ පසුව මිනීම

ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 9 ප්‍රකාර මූල්‍ය ඇප සහ ණය බැඳීම් හැරුණු විට අනෙක් මූල්‍ය වගකීම්, සමූහය විසින් පහත කාණ්ඩ අතුරින් එකකට වර්ගීකරණය කෙරෙයි.

- ලාභ/අලාභ මගින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වගකීම්
  - වෙළඳාම සඳහා රඳවාගත්
  - ලාභ/අලාභ මගින් සාධාරණ අගයට නම් කළ
- ක්‍රමක්ෂය පිරිවැයට මනින ලද මූල්‍ය වගකීම්

මූල්‍ය වගකීම්හි පසුකාලීන මිණුම් ඒවායෙහි වර්ගීකරණය මත පදනම් වේ. මූල්‍ය වර්ගීකරණයෙහිලා පැවති ශ්‍රී ල.ගි.ප්‍ර. 39 නිර්නායක බොහොමයක් ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 9 යටතේ ද පවතී.

2.5.1.5.1 ලාභය/අලාභය මගින් සාධාරණ අගයට මනින ලද මූල්‍ය වගකීම්

වාර්තාකරන කාලය අවසානයේදී ලාභ අලාභ මගින් සාධාරණ අගයට නම් කළ කිසිම මූල්‍ය වගකීමක් සමූහය සතුව නැත.

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

2.5.1.5.2 ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කළ මූල්‍ය වගකීම්

සමූහය විසින් එළඹ ඇති ගිවිසුම්වලට අනුව, දරා සිටින්නාට මුදල් හෝ වෙනත් මූල්‍ය වත්කමක් භාරදීමට බැඳියාවක් පවතින විට හෝ බැඳියාවක් පියවීම සඳහා නිශ්චිත හිමිකම් කොටස් සංඛ්‍යාවක් නිශ්චිත මුදලකට හෝ නිශ්චිත වෙනත් මූල්‍ය වත්කම් අගයකට හුවමාරු වන අවස්ථාවක් හැරුණුවිට, සමූහය විසින් නිකුත් කරන ලද ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් නොකළ මූල්‍ය වගකීම්, "බැංකු වලට ගෙවියයුතු", "වෙනත් තැන්පත්කරුවන්ට ගෙවිය යුතු","ණය සුරැකුම්පත් හිමියන්ට ගෙවියයුතු" හෝ "නිකුත් කළ ණය සුරැකුම්පතු" මෙම වර්ගීකරණයට අයත්ය.

උපකරණයේ ගිවිසුම්ගත කොන්දේසි ප්‍රකාර සමූහය විසින් ප්‍රධාන උපකරණ මූල්‍ය වගකීම් හෝ හිමිකම් උපකරණ ලෙස වර්ගීකරණය කෙරෙයි.

මූලික හඳුනාගැනීමෙන් අනතුරුව, සළුල පොළී අනුපාතික ක්‍රමය යොදා ගනිමින් එම මූල්‍ය වගකීම් ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලබයි. අත්පත් කර ගැනීමට අදාළ වට්ටම් හෝ අධි මිල සහ සළුල පොළී අනුපාතිකයෙහි අත්‍යන්ත කොටසක් වන ගාස්තු හා පිරිවැය ද සැලකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලබයි. සළුල පොළී අනුපාතික ක්‍රමක්ෂයවීම් ආදායම් ප්‍රකාශයෙහි "පොළී වියදම්" යටතේ හඳුනා ගනී. සළුල පොළී අනුපාතික ක්‍රමක්ෂය ක්‍රියාවලිය හරහා වගකීම් හඳුනා ගැනීම අත්හරින විට ලාභ හා අලාභ ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගනු ලබයි.

(අ) බැංකු වලට ගෙවිය යුතු
බැංකු වලට ගෙවිය යුතු පිළිබඳ විස්තර පිටු අංක 310 හි සටහන් අංක 32 මගින් දැක්වේ.

(ආ) තැන්පත්කරුවන්ට ගෙවිය යුතු
තැන්පත්කරුවන්ට ගෙවිය යුතු පිළිබඳ විස්තර පිටු අංක 311 හි සටහන් අංක 35 මගින් දැක්වේ.

(ඇ) ණය සුරැකුම්පත් හිමියන්ට ගෙවියයුතු
ණය සුරැකුම්පත් හිමියන්ට ගෙවිය යුතු පිළිබඳ විස්තර පිටු අංක 311 හි සටහන් අංක 35 මගින් දැක්වේ.

(ඈ) වෙනත් ණය ගැනීම් සඳහා ගෙවියයුතු
වෙනත් ණය ගැනීම් සඳහා ගෙවිය යුතු පිළිබඳ විස්තර පිටු අංක 312 හි සටහන් අංක 35 මගින් දැක්වේ.

(ඉ) නිකුත් කළ ණය සුරැකුම්පත්
නිකුත් කළ ණය සුරැකුම්පත් පිළිබඳ විස්තර පිටු අංක 313 හි සටහන් අංක 37 මගින් දැක්වේ.

2.5.1.6 ව්‍යුත්පන්න වත්කම් සහ වගකීම්

ව්‍යුත්පන්න වූ කලී පහත සඳහන් ගුණාංග තුනෙන්ම සමන්විත මූල්‍ය උපකරණයක් හෝ වෙනත් ගිවිසුමකි.

1. මූල්‍ය නොවන විචල්‍ය අතින් ගිවිසුමෙහි පාර්ශ්වයකට එය සීමා නොවේ නම්, නිශ්චිත පොළී අනුපාත, මූල්‍ය උපකරණ මිල, වෙළෙඳ ද්‍රව්‍ය මිල, විදේශ විනිමය අනුපාත, මිල හෝ අනුපාත දර්ශක, ණය ශ්‍රේණිගත කිරීම් හෝ ණය දර්ශක හෝ වෙනත් විචල්‍ය වල වෙනස්කම්වලට ප්‍රතිචාර ලෙස එහි අගය වෙනස් වෙයි.

2. ඊට මූලික ශුද්ධ ආයෝජන හෝ වෙළෙඳපළ සාධක වල වෙනස්වීම් වලට සමාන ප්‍රතිචාර දැක්වීමට අපේක්ෂිත වෙනත් ගිවිසුම් වර්ගවලට අවශ්‍ය ප්‍රමාණයට වඩා අඩු මූලික ශුද්ධ ආයෝජන අවශ්‍ය නොවේ.

3. එය ඉදිරි දිනයකදී පියවනු ලැබේ.

බැංකුව විවිධ පාර්ශ්ව සමග ව්‍යුත්පන්න ගනුදෙනුවලට එළඹෙයි. පොළී අනුපාත හුවමාරු, ණය පැහැර හැරීම් හුවමාරු, විවිධ විනිමය හුවමාරු, ඉදිරි විදේශ හුවමාරු ගිවිසුම් සහ විදේශ ව්‍යවහාර මුදල් ඊට ඇතුළත්ය. ව්‍යුත්පන්න සාධාරණ අගයට වාර්තා කරන අතර එම අගය ධන වන විට වත්කම් ලෙස සලකන අතර, සාධාරණ අගය සෘණ වන විට වගකීම් ගණයෙහිලා සැලකෙයි. එවන් ව්‍යුත්පන්නවල සාධාරණ අගය සහ නාමික අගය සටහන් අංක 19 හි වෙන් වෙන්ව හෙළිදරව් කර ඇත. ඉදිරි ගිවිසුම් ගිණුම්කරණය අදාළ කර නොගන්නේ නම් ව්‍යුත්පන්න වල සාධාරණ අගයෙහි වෙනස්වීම්, ශුද්ධ වෙළෙඳ ආදායම් හි ඇතුළත් කෙරෙයි.

2.5.1.6.1 ලාභ/අලාභ මගින් සාධාරණ අගයට වාර්තා කළ ව්‍යුත්පන්නි

ව්‍යුත්පන්න මූල්‍ය වත්කම් සාධාරණ අගයට වාර්තා කරනු ලැබෙයි. ව්‍යුත්පන්නයන්හි සාධාරණ අගයෙහි වෙනස්කම් ආදායම් ප්‍රකාශයෙහි "වෙළඳාමෙන් ලද ශුද්ධ ලාභ/(අලාභ)" යටතේ ඇතුළත් වෙයි.

2.5.1.6.2 අවදානම් කළමනාකරණ අරමුණු සහ ඉදිරි ගිවිසුම් ගිණුම්කරණය සඳහා රඳවාගන්නා ව්‍යුත්පන්න

වෙළෙඳ වත්කම් හා වගකීම් ලෙස වර්ගීකරණය නොකළ සියලු ව්‍යුත්පන්න වත්කම් හා වගකීම්, අවදානම් කළමනාකරණ අරමුණු සඳහා රඳවා ගන්නා ව්‍යුත්පන්න වලට අයත් වේ. අවදානම් කළමනාකරණ අරමුණු සඳහා රඳවා ගන්නා ව්‍යුත්පන්න මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයෙහි සාධාරණ අගයට මනිනු ලබයි.

2.5.1.7 මූල්‍ය වත්කම් හා වගකීම් නැවත වර්ගීකරණය

ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 9 ට අනුව මූල්‍ය වත්කම් ඒවායේ මූලික හඳුනාගැනීමෙන් අනතුරුව අත්පත් කර ගැනීම, ඉවතලීම හෝ ව්‍යාපාරික ක්‍රියාදාමයක් නැවතීම යනාදීය ඇතුළත්ව එවන් මූල්‍ය වත්කම් කළමනාකරණය කිරීම සඳහා ව්‍යාපාරික ආකෘතියක අරමුණ සමූහය විසින් වෙනස් කරනු ලබන දුර්ලභ අවස්ථාවලදී පමණක් හැර ඒවායේ මූලික හඳුනාගැනීමට පසුව නැවත වර්ගීකරණය නොකෙරෙයි.

ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 9 ප්‍රකාර නැවත වර්ගීකරණය කිරීම්වලට අවසර නොමැති හෙයින් මූල්‍ය වගකීම් නැවත වර්ගීකරණය නොකෙරෙයි.

2.5.1.7.1 මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය හා මිනීම

2.5.1.7.1.1 ලාභ/අලාභ මගින් සාධාරණ අගයට මූල්‍ය උපකරණ නැවත වර්ගීකරණ

– **වෙනත් විස්තීරණ ආදායම් මගින් සාධාරණ අගය**
නැවත වර්ගීකරණ දිනට සාධාරණ අගය නව දළ ධාරණ අගය බවට පත් වෙයි. නව දළ ධාරණ අගය මත පදනම්ව සළුල පොළී අනුපාතිකය ගණනය කෙරෙයි. සාධාරණ අගයෙහි පසුකාලීන වෙනස්කම් වෙනත් විස්තීරණ ආදායම්හි හඳුනාගනු ලැබෙයි.

– **ක්‍රමක්ෂය පිරිවැය**
නැවත වර්ගීකරණ දිනට සාධාරණ අගය නව ධාරණ අගය බවට පත් වෙයි. නව දළ ධාරණ අගය මත පදනම්ව සළුල පොළී අනුපාතිකය ගණනය කෙරෙයි.

2.5.1.7.1.2 වෙනත් විස්තීරණ ආදායම් මගින් සාධාරණ අගයට මූල්‍ය උපකරණ නැවත වර්ගීකරණය

– **ලාභ/අලාභ මගින් සාධාරණ අගය**
වෙනත් විස්තීර්ණ ආදායම්හි සමුච්චිත ශේෂය, නැවත වර්ගීකරණ දිනට ලාභයට/අලාභයට නැවත වර්ගීකරණය කෙරෙයි.

– **ක්‍රමක්ෂය පිරිවැය**
මූල්‍ය වත්කම්, සාධාරණ අගයට නැවත වර්ගීකරණ කරයි. වෙනත් විස්තීර්ණ ආදායම් හි සමුච්චිත ශේෂය, ඉවත් කර නැවත වර්ගීකරණ දිනට සාධාරණ අගයට ගැලපීම් කරයි. ගලපන ලද අගය, ක්‍රමක්ෂය පිරිවැය බවට පත් වෙයි.

මූලික හඳුනාගැනීමේදී තීරණය කරන ලද සළුල පොළී අනුපාතිකය හා දළ ධාරණ අගය, නැවත වර්ගීකරණ ප්‍රතිඵල ලෙස ගලපනු නොලබයි.

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

2.5.1.7.1.3 ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය උපකරණ නැවත වර්ගීකරණය

– **වෙනත් විස්තීර්ණ ආදායම මගින් සාධාරණ අගය**
වත්කම සාධාරණ අගයට යළි මනිනු ලබන අතර වෙනස වෙනත් විස්තීරණ ආදායම්හි හඳුනාගනු ලබයි. මූලික හඳුනාගැනීමේදී තීරණය කරනු ලබන සළුල පොළී අනුපාතික, නැවත වර්ගීකරණයෙහි ප්‍රතිඵල ලෙස ගලපනු නොලබයි.

– **ලාභ/අලාභ මගින් සාධාරණ අගය**
නැවත වර්ගීකරණ දිනට සාධාරණ අගය නව ධාරණ අගය බවට පත් වෙයි. ක්‍රමක්ෂය පිරිවැය සහ ධාරණ අගය අතර වෙනස ලාභ සහ අලාභ ලෙස හඳුනාගනු ලැබෙයි.

වාර්තා කරනු ලබන කාලසීමාව සඳහා බැංකුව හා සමූහය විසින් කිසිදු මූල්‍යමය උපකරණ නැවත වර්ගීකරණය කිරීමක් සිදු නොවිණි.

2.5.1.8 මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් හඳුනා නොගැනීම

2.5.1.8.1 මූල්‍ය වත්කම්

වත්කම මගින් මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතිය ඉකුත්වී ඇති විට හෝ වත්කම වෙතින් මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතිය සමූහය විසින් වෙනත් පාර්ශ්වයකට පවරා ඇති විට හෝ වත්කමෙහි සියලුම අවදානම් හා ප්‍රතිලාභ සමූහය විසින් සැලකියයුතු මට්ටමකට වෙනත් පාර්ශ්වයකට පවරා හෝ සමූහය විසින් වත්කමට අදාළ සියලුම අවදානම් හා ලාභ සැලකියයුතු මට්ටමකට රඳවාගෙන පවරා නොමැති මුත් වත්කමෙහි පාලනය පවරා ඇති විට, සමූහය විසින් මූල්‍ය වත්කමක් (හෝ අදාළ අවස්ථාවලදී මූල්‍ය වත්කමක කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් කාණ්ඩයක කොටසක්) හඳුනාගනු නොලබයි.

මූල්‍ය වත්කම් හඳුනා නොගැනීම තුළ වත්කමක ධාරණ අගය (වත්කමක හඳුනා ගනු නොලබන කොටසට වෙන් කරන ලද ධාරණ අගය) සහ ලද මුදල්වල (ලද නව වත්කම් අඩු කිරීම නව වගකීම් ඇතුළත්ව) වෙනස සහ වෙනත් විස්තීර්ණ ආදායමෙහි හඳුනා ගන්නා ලද සමුච්චිත ලැබීම්/අලාභ, ලාභයට/අලාභයට හඳුනාගනු ලබයි.

කෙසේ වුවද ධාරණ අගයට වෙනස් විස්තීරණ ආදායම් හි නියම කරන ලද හිමිකම් ආයෝජන සුරැකුම් සම්බන්ධයෙන් වෙනත් විස්තීරණ ආදායම් හි හඳුනාගනු ලබන සමුච්චිත ලැබීම්/අලාභ, ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 9 අනුව එවන් සුරැකුම් හඳුනා ගැනීම මත ලාභයට/අලාභයට හඳුනාගනු නොලබයි. සමූහය විසින් ජනිත/රඳවාගනු ලැබූ මාරු කරන ලද මූල්‍ය වත්කම්වල පොළිය හඳුනාගනු නොලැබීමට හසු වන අතර වෙනත් වත්කමක්/වගකීමක් ලෙස හඳුනාගනු ලැබෙයි.

මූල්‍ය තත්වය පිළිබඳ වත්කම් ප්‍රකාශයෙහි හඳුනාගෙන ඇති වත්කම් පවරනු ලබන ගනුදෙනුවලට සමූහය ඇතුළත් වන නමුත් මාරු කරන ලද වත්කම්වල සියලු අවදානම් සහ ප්‍රතිලාභ සියල්ල හෝ සැලකිය යුතු ප්‍රමාණයක් හෝ කොටසක් රඳවා ගනු ලබයි.

වත්කම මගින් මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතිය සමූහය විසින් වෙනත් පාර්ශ්වයකට පවරා ඇති විට හෝ මුදල් ප්‍රවාහ මුළුමනින්ම තෙවන පාර්ශ්වයකට ගෙවීමට බැඳීමක් ඇති කරගත් විට සමූහය විසින් වත්කම් වලට අදාළ සියලුම අවදානම් හා ලාභ සැලකිය යුතු මට්ටමකට රඳවාගෙන හෝ පවරා නොමැති මුත් වත්කමෙහි පාලනය පවරා ඇති විට වත්කමෙහි කටයුතු සම්බන්ධයෙන් සමූහයේ සහභාගීත්වයේ ප්‍රමාණය අනුව අදාළ වත්කම හඳුනාගනු ලබයි. එබඳු අවස්ථාවලදී සමූහය විසින් ආශ්‍රිත වගකීමක් ද හඳුනාගනු ලබයි. සමූහය විසින් රඳවාගනු ලැබූ අයිතීන් හා වගකීම් පිළිබිඹු වන ආකාරයට පවරන ලද වත්කම් හා ආශ්‍රිත වගකීම් මනිනු ලබයි.

2.5.1.8.2 මූල්‍ය වගකීම්

වගකීම් යටතට ගැනෙන ගිවිසුම්ගත බැදියාව ඉකුත් වී හෝ අවලංගු වී හෝ නිදහස් කර ඇති විට මූල්‍ය වගකීම හඳුනාගැනීම සමූහය විසින් අත් හරිනු ලබයි.

2.5.1.9 මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් නවීකරණය

2.5.1.9.1 මූල්‍ය වත්කම් නවීකරණය

මූල්‍ය වත්කම් පිළිබඳ කොන්දේසි නවීකරණය කෙරෙයි නම්, නවීකරණය කරන ලද වත්කම්වල මූල්‍ය ප්‍රවාහ සැලකිය යුතු ලෙස වෙනස් වන්නේදැයි සමූහය ඇගයීමට ලක් කරයි. මුදල් ප්‍රවාහ සැලකිය යුතු ලෙස වෙනස් වන්නේ නම්, මුල් මූල්‍ය වත්කමෙහි සිට මුදල් ප්‍රවාහවලට ඇති ගිවිසුම්ගත අයිතීන් කල් ඉකුත් වී ඇති බවට සැලකෙයි. මෙහිදී හඳුනාගත් මුල් මූල්‍ය වත්කම් ඉවත් කර නව මූල්‍ය වත්කමක් සාධාරණ අගයට හඳුනාගනු ලබයි.

ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 9 ට අනුව, ක්‍රමක්ෂය පිරිවැයට පවතින නවීකරණය වූ වත්කම්වල මූල්‍ය ප්‍රවාහ සැලකිය යුතු ලෙස වෙනස් නොවේ නම්, එකී නවීකරණය, හඳුනාගත් මූල්‍ය වත්කම් ඉවත් කිරීමකට තුඩු නොදෙයි. මේ අවස්ථාවේදී මූල්‍ය වත්කම් දළ ධාරණ අගයට, සමූහය විසින් නැවත ගණනය කර එම දළ ධාරණ අගය ගැලපීම තුළින් ඇති වන ලාභය/අලාභය නවීකරණ ලාභය/අලාභය ලෙස ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගනී. ණයකරුගේ මූල්‍ය අපහසුතා හේතුවෙන් එවන් නවීකරණය කිරීමක් සිදුවන්නේ නම්, අදාළ ලාභය/අලාභය හානිකරණ පාඩු සමඟින් ඉදිරිපත් කෙරෙයි. අනෙක් අවස්ථාවන්හිදී එය පොළී ආදායමක් ලෙස ඉදිරිපත් කෙරෙයි.

2.5.1.9.2 මූල්‍ය වගකීම් නවීකරණය

පවතින මූල්‍ය වගකීමක් එකී ණයකරුගේම වෙනත් මූල්‍ය වගකීමකින් ආදේශ වන විට, පවත්නා කොන්දේසි සැලකිය යුතු ලෙස වෙනස් වන්නේ නම් සහ පවතින වගකීමක කොන්දේසි සැලකියයුතු ලෙස නවීකරණය වන්නේ නම්, එවන් හුවමාරු කිරීමක්/නවීකරණය කිරීමක් මුල් වගකීමෙහි ඉවත් කිරීමක් සිදුවන අතර එය නව වගකීමක් ලෙස හඳුනා ගැනෙයි. මෙහිදී නවීකරණය වූ කොන්දේසි මත පදනම් වූ නව මූල්‍ය වගකීමක් සාධාරණ අගයට හඳුනාගනු ලබයි. ඉවත් වූ මූල්‍ය වගකීමෙහි සහ නවීකරණය වූ කොන්දේසි සහිත නව මූල්‍ය වගකීමෙහි ධාරණ අගයෙහි වෙනස ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගනු ලබයි.

2.5.1.10 මූල්‍ය උපකරණ හිලව් කිරීම

හඳුනාගනු ලැබූ අගයන් හිලව් කිරීමට දැනට ක්‍රියාත්මක කළහැකි නීතිමය අයිතියක් වේ නම් පමණක් සහ ශුද්ධ පදනමක් මත පියවීමට හෝ එකවර වත්කම් උපලබ්ධි වීමට හෝ වගකීම් පියවීමට අරමුණක් වේ නම්, මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් හිලව් කර ශුද්ධ අගය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි වාර්තා කෙරෙයි. බැංකුව හා සමූහය විසින් වාර්තා කරනු ලබන කාලසීමාව තුළ කිසිදු මූල්‍ය උපකරණ හිලව් කිරීමක් සිදු නොකෙරිණි.

2.5.1.11 ක්‍රමක්ෂය පිරිවැය සහ දළ ධාරණ අගය

මූල්‍ය වත්කමක හෝ මූල්‍ය වගකීමක ක්‍රමක්ෂය පිරිවැය යනු මූලික හඳුනාගැනීමේ පිරිවැයෙන් මුල් ආපසු ගෙවීම් අඩුකර, මූලික අගය හා කල් පිරුණු අගය අතර වෙනස සළුල පොළී අනුපාත ක්‍රමවේදය උපයෝගී කර ගනිමින් ගණනය කළ සමුච්චිත ක්‍රමක්ෂය එකතුකර හෝ අඩුකර මනිනු ලබන මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම්වල අගයයි. මූල්‍ය වත්කම්වලට අපේක්ෂිත ණය පාඩු දීමනා ද ගලපනු ලබයි.

මූල්‍ය වත්කමක දළ ධාරණ අගය වූ කලී, කිසියම් අපේක්ෂිත ණය පාඩු දීමනාවක් සඳහා ගැලපීමට ප්‍රථම මූල්‍ය වත්කමක ක්‍රමක්ෂය පිරිවැයයි.

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

2.5.1.12 මූල්‍ය උපකරණවල සාධාරණ අගය

සාධාරණ අගයෙහි ධූරාවලිය ඇතුළත්ව මූල්‍ය උපකරණවල සාධාරණ අගය මිනීම පිළිබඳ අංක 246 හා 379 යන පිටුවල සටහන් අංක 2.3 හි හා 56 හි දක්වා ඇත.

2.5.2 මූල්‍ය වත්කම් හානිකරණය

2.5.2.1 අපේක්ෂිත ණය පාඩු පිළිබඳ දළ විශ්ලේෂණය

2018 ජනවාරි 01 දින සිට ලාභ/අලාභ මගින් සාධාරණ අගයට රඳවා නොගත් වෙනත් මූල්‍ය වත්කම් හා සියලුම ණය සඳහා අපේක්ෂිත ණය පාඩු දීමනා මෙම කොටසෙහි "මූල්‍ය උපකරණ" ලෙස දක්වා ඇති ණය බැඳීම් සහ මූල්‍ය ඇපකර ගිවිසුම් සමගින් බැංකුව විසින් වාර්තා කරනු ලැබ ඇත. ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 9 යටතේ හිමිකම් උපකරණ හානිකරණයට ලක් නොවේ.

ආරම්භයේ පටන් සැලකියයුතු ණය අවදානම් වර්ධනයක් නොමැති විටකදී හැර ණය පාඩු දීමනාව මාස 12 කට අපේක්ෂිත ණය පාඩු ලෙස ගණනය වෙයි. එසේ නොමැති වූ විට වත්කමක ජීවකාලය තුළ පැන නැගීමට ඉඩ ඇති ණය පාඩු මත පදනම්ව අපේක්ෂිත ණය පාඩු දීමනාව තීරණය වෙයි. ණය අවදානමෙහි සැලකියුතු වර්ධනයක් සිදුවී ඇත්දැයි යන්න තීරණය කිරීම සඳහා වූ බැංකුවේ ප්‍රතිපත්ති පිළිබඳ පිටු අංක 276 හි සටහන් අංක 2.5.2.7 හි දක්වා ඇත.

මාස 12 තුළ අපේක්ෂිත ණය පාඩු යනු වාර්තාකරනු ලබන දිනෙන් මාස 12 ක් තුළ මූල්‍ය උපකරණ මත පැහැර හැරීමේ සිදුවීම් මගින් අපේක්ෂිත ණය පාඩු මගින් නියෝජනය කරනු ලබන ජීවකාල අපේක්ෂිත ණය පාඩුවල කොටසකි. සලකනු ලබන මූල්‍ය උපකරණ කළඹේ ස්වභාවය මත පදනම්ව ජීවකාල අපේක්ෂිත ණය පාඩු සහ මාස 12 තුළ අපේක්ෂිත ණය පාඩු යන ද්විත්වයටම කේවල පදනම මත හෝ සාමූහික පදනම මත ගණනය කෙරෙයි.

මූල්‍ය උපකරණවල අවශේෂ ජීවකාලය පුරාවට ණය පැහැර හැරීම් සිදුවීමේ අවදානම වෙනස්වීම සලකා බලමින් බැංකුව විසින් සෑම වාර්තාකරණ කාලසීමාවක් අවසානයේදීම යම් මූල්‍ය උපකරණයකට ණය අවදානම මූලික හඳුනාගැනීමේ පටන් සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇතිදැයි ඇගයීමක් කිරීමේ ප්‍රතිපත්තියක් ස්ථාපිත කර ඇත.

එබඳු ක්‍රියාවලි මත පදනම්ව බැංකුව විසින් 1 අදියර, 2 අදියර, 3 අදියර ලෙස ණය කාණ්ඩ ගත කරනු ලබයි.

1 වන අදියර

- ණය පළමුව හඳුනාගනු ලැබූ විට බැංකුව විසින් මාස 12 තුළ අපේක්ෂිත ණය පාඩු මත පදනම් වූ දීමනාවක් හඳුනාගනු ලබයි. ණය අවදානම යහපත් වී ඇති විට සහ 2 වන අදියරෙන් ණය නැවත වර්ගීකරණය කර එම පහසුකම් 1 වන අදියරේ ණය වලට ඇතුළත් කරයි.

2 වන අදියර

- ආරම්භයේ පටන් ණය අවදානමෙහි සැලකිය යුතු වර්ධනයක් පෙන්වනු ලබන විට බැංකුව විසින් ජීවකාල අපේක්ෂිත ණය පාඩු සඳහා ප්‍රතිපාදන වෙන් කරනු ලබයි. ණය අවදානම යහපත් වී 3 වන අදියරෙන් නැවත වර්ගීකරණය කර ණය පහසුකම් ද 2 වන අදියරේ ණය යටතට අයත් වේ.
- ගනුදෙනුකාර ගිවිසුම්ගත ගෙවීම් සිදු කළයුතු කාලසීමාව දින 30 ඉක්මවන අවස්ථාවලදී පහත 3 අදියර යටතේ වර්ගීකරණය කර ඇති ණය පහසුකම්වලදී හැර ශ්‍රී ල.මූ.වා.ප්‍ර.9 හි ප්‍රකාශිත උපකල්පනයට යටත්ව ණය පහසුකම් ලබාදෙයි.

3 වන අදියර

- ගනුදෙනුකාර ගිවිසුම්ගත ගෙවීම් සිදු කළයුතු කාලසීමාව දින 90 ඉක්මවන අවස්ථාවලදී ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 9 හි ප්‍රකාශිත උපකල්පනවලට යටත් ණය පහසුකම්
- දෙවරකට වඩා ප්‍රතිව්‍යුහගත කරන ලද සියළු ණය
- සියලුම නැවත සැලසුම් කළ ණය
- ශ්‍රී ලංකා මහ බංකු නියාමන ප්‍රකාර අක්‍රීය ලෙස වර්ගීකරණය කරන ලද සියලු ණය පහසුකම්/ ගනුදෙනුකරුවන්
- ගනුදෙනුකරුවකුගේ හෝ උපකරණයක අවදානම් ශ්‍රේණිගත කිරීම, ණය ශ්‍රේණිගත කිරීමේ නියෝජිතායතනයක් මගින් B+ දක්වා පහත දැමූ අවස්ථාවලදී සහ/හෝ බැංකුවල අභ්‍යන්තර ශ්‍රේණිගත කිරීමේ පද්ධතිය මාපාංක 2 කින් පහත දැමූ අවස්ථාවලදී
- ණය පහසුකම්/ගනුදෙනුකාර ණය අවදානම් කැපී පෙනෙන ලෙස වර්ධනය (සටහන් අංක 2.5.2.7 වෙත යොමු වන්න)

මූල්‍ය වත්කම්, උදෙසා මුළු හිඟ මුදල හෝ ඉන් කොටසක් හෝ යළි අයකර ගැනීමට බැංකුව සතු සාධාරණ අපේක්ෂාවන් නොපවතින විටදී මූල්‍ය වත්කම් හි දළ ධාරණ අගය අඩු කෙරෙයි. මෙය මූල්‍ය වත්කම් (අර්ධ වශයෙන්) හඳුනාගැනීම අත්හැරීමක් යැයි සැලකේ.

2.5.2.2 අපේක්ෂිත ණය පාඩු ගණනය කිරීම

සළුල පොළී අනුපාතිකයට ආසන්න වට්ටම් අගයක් යොදාගෙන අපේක්ෂිත මුදල් හිඟය මිනීමට බැංකුව විසින් අපේක්ෂිත ණය පාඩු ගණනය කරනු ලබයි. මුදල් හිඟය යනු ගිවිසුම් අනුව ආයතනයකට ගෙවිය යුතු මුදල් ප්‍රවාහ හා ගිවිසුම ප්‍රකාර යම් ආයතනයක් විසින් ලබා ගැනීමට අපේක්ෂිත මුදල් ප්‍රවාහ අතර පරතරයයි.

අපේක්ෂිත ණය පාඩු ගණනය කිරීමේ යාන්ත්‍රණය පහත සඳහන් පරිදි සැකෙවින් දක්වා ඇති අතර ප්‍රධාන සාධක පහත පරිදි වේ.

- **පැහැර හැරීමේ සම්භාවිතාවය (PD)**
  මෙය වූ කලී යම් කාලසීමාවක් තුළ ණය ගෙවීම පැහැර හැරීමේ හැකියාව පිළිබඳ ඇස්තමේන්තුවයි. යම් ණය පහසුකමක් මීට පෙර හඳුනාගෙන නොතිබිණි නම් සහ තවමත් කළඹට අයත් නම්, ඇගයීමට බඳුන් වූ කාල පරිච්ඡේදය තුළ නිශ්චිත කාලසීමාවකදී පමණක් පැහැර හැරීම සිදුවිය හැකිය.
- **පැහැර හැරීමට නිරාවරණයවීම (EAD)**
  මෙය වූ කලී ගිවිසුම් මත හෝ වෙනත් හේතූන් මත මුල් මුදල සහ පොළිය ආපසු ගෙවීමද අතපසු වූ ගෙවීම්වල සමුච්චිත පොළිය ද ඇතුළුව වාර්තා කළ දිනට පසුව නිරාවරණයවීම්හි අපේක්ෂිත වෙනස්වීම් සැලකිල්ලට ගනිමින් ඉදිරි පැහැර හැරීම් දිනකදී නිරාවරණය වීමේ තක්සේරුවයි.
- **පැහැර හැරීමකදී සිදුවියහැකි පාඩුව (LGD)**
  මෙය වූ කලී යම් අවස්ථාවකදී පැහැර හැරීමක් සිදුවූ විටක උද්ගත වන පාඩුව ඇස්තමේන්තු කිරීමයි. කිසියම් පාර්ශ්වයක් ඇප සුරැකුම් උපලබ්ධිවීම් ද ඇතුළුව ණය හිමියන් විසින් ලබා ගැනීමට අපේක්ෂිත සහ ලබාගැනීමට නියමිත ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ අතර වෙනස මත එය පදනම් වේ. එය සාමාන්‍යයෙන් පැහැර හැරීමට නිරාවරණය වීමෙහි ප්‍රතිශතයක් ලෙස ප්‍රකාශ කරනු ලබයි.

ඊට ප්‍රථම කාලසීමාවක් තුළ ඇරයුම් කිරීමට බැංකුව සතුව නීතිමය අයිතියක් වේ නම් හැර ණය පාඩු තීරණය කරනු ලබන උපරිම කාලසීමාව, මූල්‍ය උපකරණයකට ගිවිසුම්ගත ජීව කාලයයි.

හානිකරණ පාඩු සහ මුදාහැරීම්, මූල්‍ය වත්කම්වල දළ ධාරණ අගයෙහි ගැලපීමක් ලෙස ගණනය කරනු ලබන අතර නවීකරණය මගින් ජනිත වූ අලාභ/ලැබීම් වලින් වෙන්කර හෙළිදරව් කරනු ලබයි.

අපේක්ෂිත ණය පාඩු ක්‍රමවේද යාන්ත්‍රණ පහත සැකෙවින් දක්වා ඇත.

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

1 වන අදියර

වාර්තා කරනු ලබන දිනෙන් පසුව එළඹෙන මාස 12 ක කාලසීමා තුළ පැවතිය හැකි මූල්‍ය උපකරණ මත ආපසු ගෙවීම් පැහැර හැරීම්වල ප්‍රතිඵල ලෙස ඇති වියහැකි අපේක්ෂිත ණය පාඩු, ජීව කාලය පුරා අපේක්ෂිත ණය පාඩුවල කොටසක් ලෙස මාස 12 ක් තුළ අපේක්ෂිත ණය පාඩු ගණනය කෙරෙයි. වාර්තා කරන දිනට පසුව එළඹෙන මාස 12 තුළ අපේක්ෂිත, පැහැර හැරීමේ සම්භාවිතාව පදනම් කරගෙන මාස 12 ක් තුළ අපේක්ෂිත ණය පාඩු ගණනය කරයි. එම අපේක්ෂිත මාස 12 ක් තුළ පැහැර හැරීමේ අවදානම් පැහැර හැරීම් නිරාවරණ පුරෝකථනයට යොදා ගනිමින් අපේක්ෂිත පැහැර හැරීම් නිසා ඇති වන අලාභය ගුණිත කර මුල් සළුල පොළී අනුපාතිකයට ආදේශකයක් ලෙස යොදා ගනු ලැබෙයි.

2 වන අදියර

ආරම්භයේ පටන් ණය අවදානමෙහි කැපී පෙනෙන වර්ධනයක් ණය මගින් පෙන්නුම් කර ඇති විට බැංකුව විසින් ජීව කාල අපේක්ෂිත ණය පාඩු වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කරයි. එහිදී අදාළ කරගනු ලබන යාන්ත්‍රණය ඉහත විස්තර කර ඇති කරුණු වලට සමාන වන නමුත් උපකරණයෙහි ජීව කාලය අරභයා පැහැර හැරීමේ සම්භාවිතාව සහ පැහැර හැරීම මත අලාභ තක්සේරු කෙරෙයි. මුල් සළුල පොළී අනුපාතිකය ආසන්න වශයෙන් සැලකීමෙන් අපේක්ෂිත හිඟ මුදල් වට්ටම් කෙරෙයි.

3 වන අදියර

හානිකරණය වී ඇතැයි සැලකෙන ණය සඳහා බැංකුව විසින් ජීවකාල අපේක්ෂිත ණය පාඩු හඳුනාගනු ලබයි. මෙම ක්‍රමවේදයේ, ණය පැහැර හැරීමේ සම්භාවිතාව 100% ලෙස සලකන අතර අනෙකුත් දෑ අදියර 2 වත්කම් සඳහා වූ ක්‍රමවේදයට සමාන වේ.

2.5.2.3 හානිකරණයෙහි කේවල තක්සේරුව

පෙර තීරණය කරන ලද සීමාවකට (වෙන් වෙන් වශයෙන් ගත්විට වැදගත් වන මූල්‍ය වත්කම්) වඩා ඉහළ මූල්‍ය වත්කම් සඳහා හානිකරණ පාඩුවක් සිදුවී ඇති බවට විෂයානුබද්ධ සාක්ෂි පවතී නම්, වත්කමෙහි ධාරණ අගය සහ අනාගත මුදල් ප්‍රවාහ (අනාගත අපේක්ෂිත ණය පාඩු ඉවත් කළ විට) වල තක්සේරුගත වත්මන් අගය අතර වෙනස, අලාභ අගය ලෙස මනිනු ලබයි.

සුරැකුම් ලෙස තබා ඇති මූල්‍ය වත්කම්වල තක්සේරුගත ඉදිරි මුදල් ප්‍රවාහවල වත්මන් අගය ගණනය කිරීම මගින් පූර්වාවරණය කිරීම හෝ නොකිරීම කෙසේ වුවද වත්කම අත්පත් කර ගැනීම හා විකිණීම සඳහා වන පිරිවැය අඩුකර පූර්වාවරණය කිරීමේ ප්‍රතිඵල ලෙස ඇති වන මුදල් ප්‍රවාහ පිළිඹිබු වේ. පිටු අංක 283 හි ඇති සටහන් අංක 21 (ඈ) මගින් කේවල හානිකරණ තක්සේරුව පිළිබඳ විස්තර දැක්වේ.

2.5.2.4 වෙන් වෙන්ව ගත් විට සැලකිය යුතු තක්සේරුවක් ඇති නමුත් වෙන් වෙන්ව හානිකරණය නොවූ ණය

හානිකරණය නොවූ නමුත් වෙන් වෙන්ව ගත් විට සැලකිය යුතු ණය ආරම්භයේ පටන් සැලකිය යුතු ණය ක්ෂයවීම් තිබී ඇත්දැයි යන නිර්ණායක මත පදනම්ව 1 වන හෝ 2 වන අදියර යටතේ හානිකරණය සඳහා සාමූහිකව අගයනු ලබයි.

බැංකුවේ සැලකියයුතු ණය අපහායනයන් සනිටුහන් කර ගැනීමේදී පහත නිර්ණායක සලකා බලනු ලබයි.

- දැනට පවතින මූල්‍ය උපකරණවල නවක ආරම්භයේදී දැනට පවතින කොන්දේසි හෝ අනුපාතිකවල මූලාරම්භයට වඩා ඇති සැලකිය යුතු වෙනස්කම්
- විශේෂිත මූල්‍ය උපකරණ හෝ සමාන මූල්‍ය උපකරණවල ණය අවදානම පිළිබඳ බාහිර වෙළඳපොළ දර්ශකවල සැලකියයුතු වෙනස්කම්
- ණයකරුවෙකුගේ ණය/හිමිකම් කොටස් උපකරණවල අගයෙහි වෙනස්කම් ආදී ණයකරුට සම්බන්ධ වෙනත් තොරතුරු
- ණයකරු සඳහා සත්‍ය/අපේක්ෂිත අභ්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීම් පහත වැටීම හෝ අභ්‍යන්තර වශයෙන් ණය අවදානම ඇගයීමට යොදා ගනු ලබන චර්යාත්මක ලකුණුවල පහත වැටීම.
- ණයකරුවෙකුට සිය බැඳියාවන් පියවීමට ඇති හැකියාවට සැලකිය යුතු බලපෑම් සිදු කරන දැනට පවතින හෝ ඉදිරියට පුරෝකථනය කළ අහිතකර ව්‍යාපාරික වෙනස්වීම්, මූල්‍ය හෝ ආර්ථික තත්ත්වයන්.
- ආදායමෙහි තත්‍ය හෝ අපේක්ෂිත අඩුවීම, මෙහෙයුම් අවදානම ඉහළයාම, කාරක ප්‍රාග්ධන හිඟය, වත්කමෙහි ගුණාත්මක බව අඩුවීම, තෝලනය ඉහළ යාම, ද්‍රවශීල කළමනාකාරිත්වයට අදාළ ගැටළු නිසා ණයකරුගේ මෙහෙයුම් ප්‍රතිඵල වල සත්‍ය හෝ අපේක්ෂිත සැලකිය යුතු වෙනස්වීම්
- එකම ණයකරුගේ වෙනත් මූල්‍ය උපකරණ මත ණය අවදානම සැලකියයුතු ලෙස වර්ධනය වීම.
- ණය බැඳීම්වලට මුහුණදීමට ණයකරුවෙකු සතු හැකියාවෙහි සැලකිය යුතු වෙනස්වීම්වලට
- තුඩු දෙන ණයකරුගේ නියාමන, ආර්ථික හෝ තාක්ෂණික පරිසරයෙහි සිදුවන සත්‍ය හෝ
- අපේක්ෂිත සැලකිය යුතු අහිතකර වෙනස්වීම්

2.5.2.5 වෙනත් විස්තීරණ ආදායම් මගින් සාධාරණ අගයට මනින ලද ණය උපකරණ

වෙනත් විස්තීරණ ආදායම් හරහා සාධාරණ අගයට මනින ලද ණය උපකරණ සඳහා අපේක්ෂිත ණය පාඩු මගින් සාධාරණ අගයට පවතින මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි මූල්‍ය වත්කම්වල ධාරණ අගයට අඩු නොකෙරෙයි. ඒ වෙනුවට ක්‍රමක්ෂය පිරිවැයට වත්කම් අගය කිරීමෙන් ඇති වන වෙන් කිරීමට සමාන අගයක් සමුච්චිත හානිකරණ අගයක් ලෙස වෙනත් විස්තීරණ ආදායම්හි හඳුනාගනු ලබන අතර අදාළ අනෙක් සටහන ආදායම් ප්‍රකාශයට ගලපනු ලබයි. විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගත් සමුච්චිත පාඩු වත්කම ඉවත් කිරීමේදී නැවත ආදායම් ප්‍රකාශයට ගලපනු ලබයි. වාර්තාකරණ කාලසීමාව තුළ හානිකරණයට භාජනය වූ වෙනත් විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ වටිනාකමට මනින ලද ණය උපකරණ කිසිවක් බැංකුව හා සමූහය සතු නොවිණි.

2.5.2.6 ප්‍රක්ෂේපිත තොරතුරු

අපේක්ෂිත ණය පාඩු ආකෘතියේ දී බැංකුව විසින් ආර්ථික සාධක ලෙස පහත සඳහන් ආකාරයේ පුළුල් පරාසයක ප්‍රක්ෂේපිත තොරතුරු මත රඳා පවතී.

- දළ දේශීය නිෂ්පාදිත වර්ධන වේගය
- විරැකියා අනුපාත
- උද්ධමනය අනුපාත
- විනිමය හුවමාරු අනුපාතික
- පොළී අනුපාත

අපේක්ෂිත ණය පාඩු ගණනය කිරීම සඳහා උපයෝගී කරගනු ලබන යෙදවුම් සහ ආකෘති සෑම විටකම මූල්‍ය ප්‍රකාශනයෙහි දිනට වෙළඳපළ හැසිරෙන ආකාරය මුළුමනින්ම ග්‍රහණය කරගනු නොලැබීය. මෙය පිළිඹිබු කිරීම සඳහා එවන් සැලකිය යුතු වෙනස්වීම් පවතින අවස්ථාවලදී තාවකාලික ගැලපුම් ලෙස ගුණාත්මක ගැලපුම් සිදුකරයි.

2.5.2.7 ණය අවදානය සැලකියයුතු ලෙස වර්ධනය වීම

යම් උපකරණයක් හා උපකරණ කළඹක් මාස 12 අපේක්ෂිත ණය පාඩු හෝ ජීවකාල අපේක්ෂිත ණය පාඩු සඳහා බඳුන්වී දැයි තීරණය කරගනු පිණිස අපේක්ෂිත ණය පාඩු යටතට ගැනෙන සියලු වත්කම් බැංකුව විසින් අබණ්ඩව අධීක්ෂණය කරනු ලබයි. මූලික හඳුනා ගැනීමේ පටන් ණය අවදානමෙහි සැලකියයුතු වර්ධනයක් සිදු වී

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

ඇත්දැයි සමූහය විසින් තක්සේරු කරනු ලබයි. අනවශ්‍ය පිරිවැයක් හෝ පරිශ්‍රමයක් රහිතව උපයෝජ්‍ය හා අදාළ වන සහය වන පිළිගත හැකි තොරතුරු බැංකුව විසින් සලකා බලනු ලැබෙයි. බැංකුවේ ඓතිහාසික කරුණු හා ප්‍රක්ෂේපිත තොරතුරු ඇතුළුව විශේෂඥ ණය තක්සේරු මත පදනම් වූ ප්‍රමාණාත්මක හා ගුණාත්මක විස්තර විශ්ලේෂණ මීට ඇතුළත්ය. ඒ අනුව, පහත සඳහන් නිර්ණායක වලින් එකක් හෝ සපුරාලන ලද විට ණය අවදානම සැලකියයුතු ලෙස වර්ධනය වී ඇති බව බැංකුව විසින් සලකනු ලබයි.

- ගෙවිය යුතු ගිවිසුම්ගත ගෙවීම් දින 30 ඉක්මවීම. (ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ නගී)
- අඛණ්ඩව දෙවසරක් තුළ පෙර වර්ෂය සමග සන්සන්දනය කිරීමේදී ණය ගනු ලබන ආයතනයේ බදු පෙර ලාභයෙන්/පිරිවැටුමෙන් 50% ක අඩුවීම. (ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ යාමකි.)
- පෙර මූල්‍ය වර්ෂය හා සසඳන විට ණය ගනු ලබන ආයතනයේ ශුද්ධ වටිනාකම 25% කින් පමණ බාදනය වීම. (ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ යාමකි.)
- ණය ගනු ලබන ආයතනයේ බාහිර ණය වර්ගීකරණ ශ්‍රේණිය, පසුව **BB+** හෝ ඊට පහළ දැමීම. (ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ යාමකි.) (මුල් ණය වර්ගීකරණය පසුව (ණය ප්‍රදානයේදී) පහළ දැමීම සලකා බැලිය යුතුය.
- අභ්‍යන්තර ශ්‍රේණිගත කිරීම් යටතේ ඒකක දෙකකින් පහළ දැමීම. (ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ යාමකි.)
- ඉහළ නංවන ලද ණය පහසුකමට අමතරව ණය පහසුකම දෙවතාවක් ප්‍රතිව්‍යුහගත කිරීම.
- මුල්වරට එකඟ වූ දින සිට දෙවසරකට වඩා ප්‍රමාදයක් සහිත ව්‍යාපාරික මෙහෙයුම්/ව්‍යාපෘති ආරම්භක ප්‍රමාදවීම් (ගනුදෙනුකාර අවදානම මත පැහැර හැරීමේ නිර්නායක හෝ ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ යාම යන දෙකම විය හැකිය.)
- විශේෂිත දේපළක් සඳහා නිශ්චිත දර්ශක මත පදනම්ව සුරැකුමෙහි වටිනාකම සැලකිය යුතු ලෙස අඩුවී (25% ක් ඉක්මවා) හෝ සුරැකුම උපලබ්ධිවීමේ හැකියාව සැක සහිත වීම. (දේපළ දර්ශක) (ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ යාමකි.)
- පොදු ප්‍රවේශය සහිත තොරතුරු මත පදනම්ව අධ්‍යක්ෂ මණ්ඩලයේ හා ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ නිරන්තර වෙනස්වීම් (ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ යාමකි.)
- ණය ගිවිසුමෙහි නිශ්චිතව දක්වා ඇති අරමුණ හැර වෙනත් අරමුණක් උදෙසා ණයකරු විසින් ණය මුදල පරිහරණය කරනු ලබන බවට සෘජු සාක්ෂි තිබීම.
- අවදානම අවම කිරීමේ කිසිදු පියවරකින් තොරව ඇපකරු විසින් ඇපකාරිත්වය ඉවත්කර ගැනීම.
- ඇස්තමේන්තුගත පිරිවැයේ සිට ව්‍යාපෘති අවසානයේ තෙක් ව්‍යාපෘති පිරිවැයෙහි සැලකිය යුතු ඉහළයාම (25%) ව්‍යාපෘති ආරම්භ වන තුරු මෙම සාධක අදාළ වේ.
- **AAA** ශ්‍රේණියේ සිට **BBB-** දක්වා ශ්‍රේණිගත කිරීම හැර වත්මන් බාහිර ශ්‍රේණිගත කිරීම් හමුවේ එක් ඒකයකින් පහළ දැමීම.
- පිළිගත හැකි තොරතුරු මත ණය පහසුකම්හි කාර්ය සාධනය වෙත සැලකිය යුතු බලපෑමක් ඇති කළහැකි නීතිමය කෘත්‍යයට ණයකරු යටත් වන බවට සාක්ෂි තිබීම (ගනුදෙනුකාර අවදානම මත පැහැර හැරීමේ නිර්නායක හෝ ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ යාම යන දෙකම විය හැකිය.)
- ගෙවීමට නියමිත පියවිය යුතු ගෙවීම් අවස්ථා වළකන සුළු, ණය පහසුකම්හි කාර්යසාධනයට සෘජු බලපෑමක් ඇති කරන භූගෝලීය පිහිටීමෙහි සැලකිය යුතු විපර්යාස/ස්වභාවික ව්‍යසන (ගනුදෙනුකාර අවදානම මත පැහැර හැරීමේ නිර්නායක හෝ ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ යාම යන දෙකම විය හැකිය.)
- ව්‍යාපෘතිය මෙහෙයවනු ලබන ක්ෂේත්‍රයට/ණය ලබාගත් අරමුණ වන ව්‍යාපෘතියෙහි/පහසුකම්හි ආපසු ගැනීමේ හැකියාවට හානිකරණ මට්ටමට සාර්ව ආර්ථික සාධක ක්ෂයවීම. එකඟ වූ පරිදි ණය ආපසු ගෙවීමේ මෙහෙයුම් වළකන නව රෙගුලාසි/රාජ්‍ය ප්‍රතිපත්ති වල බලපෑමද මීට අයත් වේ. (ගනුදෙනුකාර අවදානම මත පැහැර හැරීමේ නිර්නායක හෝ ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ යාම යන දෙකම විය හැකිය.)
- ණය ආපසු ගෙවීමට අහිතකර බලපෑම් ඇති කරන ගිවිසුම් අත්හැරීම්, ගෙවීම් විලම්භනය, කාලය දීර්ඝ කිරීම ආදී සහන සලසන කොන්දේසි නවීකරණය (ගනුදෙනුකාර අවදානම මත පැහැර හැරීමේ නිර්නායක හෝ ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ යාම යන දෙකම විය හැකිය.)
- ණයකරු හමුවීමට හෝ සම්බන්ධ කර ගැනීමට නොහැකිවීම (පැහැර හැරීම් දර්ශකය)
- ඉහළ දමන ලද ණය පහසුකම් හැරුණුවිට අනෙක්වා දෙවතාවකට වඩා ප්‍රතිව්‍යුහගත කිරීම (ණය හානිකරණ දර්ශක)
- ඉහළ දමන ලද ණය පහසුකම් හැරුණුවිට ප්‍රතිලේඛණගත කළ ණයපහසුකම්
- ගෙවිය යුතු ගිවිසුම්ගත ගෙවීම් දින 90 ඉක්මවවීම.
- අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ගැටළු හේතුවෙන් හෝ අයිතිය අත්හැරීමේ ප්‍රකාශයක් හෝ හානිකර මතයක් හේතුවෙන් විගණකවරයා විසින් විගණන මත සීමා කර ඇති අවස්ථාවක
- ණයකරු බුන්වත් වී ඇති බවට/දුවශීලතා ක්‍රියාමාර්ග දැනටමත් ඇරඹී ඇති බවට හෝ ආරම්භවීමට නියමිත බවට ණය පැහැර හැරීම් පිළිබඳ දර්ශක) සෘජු සාක්ෂි ඇති අවස්ථාවක

2.5.2.8 ණය හානිකරණය වූ හා පැහැර හැරි වත්කම් පිළිබඳ නිර්වචනය

පහත සඳහන් අවස්ථාවලදී සමූහය විසින් වෙනත් ගනුදෙනුකරුවන් ලබා දෙන ණය හා අත්තිකාරම් පැහැර හැරීම් ලෙස සලකනු ලබයි.

- සුරැකුම් උපලබ්ධි කිරීම (සුරැකුම් කිසිවක් රඳවාගෙන ඇත්නම්) ආදී ක්‍රියාමාර්ග වලට යොමුවීම හැර ණයකරු විසින් අදාළ බැඳීම් මුළුමනින්ම ගෙවීමට අපොහොසත් අවස්ථාවලදී හෝ
- ණයකරු තම ගිවිසුම්ගත ගෙවීම් කළ යුතු දිනය ඉක්මවා දින 90 ක් ඉකුත් වී තිබීම.

වැඩිමනත් වශයෙන්, සමූහය විසින් යම් ආයෝජනයකට පවරා ඇති බාහිර ණය ශ්‍රේණිගත කිරීම, පැහැර හැරීමක් වන විට 3 වන අදියර යටතේ මූල්‍ය ආයෝජන වර්ගීකරණය කරනු ලබයි.

2.5.3 දේපළ, පිරියත හා උපකරණ

දේපළ, පිරියත හා උපකරණ පිළිබඳ විස්තර පිටු අංක 295 හි සටහන් අංක 26 මගින් දැක්වේ.

2.5.3.1 ක්ෂයවීම්

පිටු අංක 297 දක්වා ඇති සටහන් අංක 26 යටතේ ක්ෂයවීම් තොරතුරු දැක්වේ.

2.5.3.2 ණය ගැනීමේ පිරිවැය

ණය ගැනීමේ පිරිවැය පිළිබඳ ල.ගි.ප්‍ර. 23 - ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් ප්‍රකාර සුදුසුකම් ලබන වත්කමෙහි අත්පත් කර ගැනීම්, ඉදිකිරීම් හෝ නිෂ්පාදනය අදාළව සෘජුව හඳුනාගත හැකි ණය පිරිවැය වත්කමෙහි පිරිවැයෙන් කොටසක් ලෙස ප්‍රාග්ධනීත කරනු ලබයි. අපේක්ෂිත භාවිතාව හෝ විකිණීම සඳහා සූදානම් කිරීමේදී සැලකිය යුතු කාලසීමාවක් ගතවන වත්කම්, සුදුසුකම් ලබන වත්කම් නම් වේ. අනෙකුත් ණය ගැනීමේ පිරිවැය එම පිරිවැය හටගන්නා කාලසීමාව තුළ ඇති ලාභයට හෝ අලාභය මත හඳුනාගනී. වාර්තා

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

කරන ලද කාලසීමාව තුළ බැංකුව හා සමූහය විසින් කිසිදු ණය ගැනීමේ පිරිවැයක් ප්‍රාග්ධනීත නොකරන ලදී.

2.5.4 අස්පෘශ්‍ය වත්කම්

අස්පෘශ්‍ය වත්කම් පිළිබඳ විස්තර පිටු අංක 304 හි සටහන් අංක 29 මගින් දැක්වේ.

2.5.5 මූල්‍ය නොවන වත්කම් හානිකරණය

සෑම වාර්තාකරණ කාලපරිච්ඡේදයක් අවසානයේදීම විලම්බිත බදු වත්කම් නොවන වත්කම් හානිකරණය වූ බවට කිසියම් හෝ සළකුනක් ඇත්දැයි සමූහය විසින් අගයනු ලබයි. එබඳු හැඟවීමක් ඇත්නම් හෝ වත්කමක් සඳහා වාර්ෂික හානිකරණ පරීක්ෂාවක් සිදුකිරීම අවශ්‍ය වන්නේ නම්, සමූහය විසින් වත්කමෙන් නැවත අයකරගත හැකි වටිනාකම ඇස්තමේන්තු කරනු ලැබේ. වත්කමක ධාරණ අගය එහි නැවත අයකරගත හැකි වටිනාකම ඉක්මවයි නම්, එම වත්කම හානිකරණය වී ඇතැයි සලකනු ලබන අතර, වත්කමේ ධාරණ අගය එහි නැවත අයකරගත හැකි වටිනාකම අඩු කරයි.

2.5.6 විශ්‍රාම ප්‍රතිලාභ බැදීම්

2.5.6.1 නිර්වචිත විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම්

2.5.6.1.1 සේවක විශ්‍රාම අරමුදල - I

1995 ඔක්තෝබර් 01 දිනට ප්‍රථම බැංකුවට බැඳුනු ස්ථිර කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා නිර්වචිත විශ්‍රාම සැලසුම් ක්‍රමයක් බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ලබයි. මේ සඳහා වෙනම පාලනය කෙරෙන අරමුදලක් වෙත බැංකුව විසින් සාමාජිකයන්ගේ දායකත්වය ලබාදෙනු ලබයි. පුරෝකථන ඒකක ණය ජීවගණක තක්සේරු කිරීමේ ක්‍රමය භාවිතා කරමින් නිර්වචිත විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම යටතේ ප්‍රතිලාභ සැපයීමේ පිරිවැය වෙන වෙනම තීරණය කරනු ලබයි. ජීවගණක ලාභ හා අලාභ ඒවා ඇතිවන කාලපරිච්ඡේදය තුළ වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ වාර්තා කරනු ලබයි.

නිර්වචිත ප්‍රතිලාභ වත්කම් හෝ වගකීම්, මින් පෙර හඳුනා නොගත් අතීත සේවා පිරිවැය හා බැඳීම් පියවීමට සෘජුවම අවශ්‍ය කෙරෙන සැලසුම් වත්කම්වල සාධාරණ අගය හා මින් පෙර හඳුනා නොගත් ජීව ගණක අලාභ අඩු කළ පසුව එළඹෙන නිර්වචිත ප්‍රතිලාභ බැඳීම්හි වත්මන් අගය ලෙස ගණනය කෙරේ. නිර්වචිත ප්‍රතිලාභ වගකීමෙහි අගය, බැංකුව විසින් දරනු ලබන අතර, ලාභ හෝ අලාභ යටතේ වාර්තා කරනු ලබයි. යම් වත්කමක අගය කිසියම් ජීව ගණක අලාභයක් සහ මින් පෙර හඳුනා නොගත් පැරණි සේවා පිරිවැය හා විශ්‍රාම සැලසුමට අදාළ ඉදිරි දායකත්ව මුදල් අඩු කිරීමක් හෝ ආර්ථික ප්‍රතිලාභයක වත්මන් අගය යනාදියෙහි ඒකාබද්ධයට, සීමා වෙයි.

වෘත්තීමය ජීවගණක සමාගමක් වන සී/ස ජීවගණක හා කළමනාකරණ උපදේශක පෞද්ගලික සමාගමෙහි එම්. පූපලානාදන් මහතා විසින් දෙසැම්බර් 31 දිනට නවතම ජීවගණක ඇගයීමක් සිදුකරන ලදී.

2023 දෙසැම්බර් 31 දිනට යෙදුනු ඇගයීමේදී යොදා ගන්නා ලද ප්‍රධාන මූල්‍ය උපකල්පන පහත පරිදි වේ.

පොළී/වට්ටම් අනුපාතය	13% (වාර්ෂිකව)
ජීවන වියදම් දීමනාවේ ඉහළයාම (වාර්ෂිකව)	8% (වාර්ෂිකව)
මූලික වැටුප් සාමාන්‍යයෙහි ඉහළයාම (වාර්ෂිකව)	10% (වාර්ෂිකව)

විශ්‍රාම අරමුදලෙහි වත්කම්, බැංකුවේ වත්කම් වලින් වෙන්ව පවත්වාගෙන යනු ලබන අතර, භාරකාර අරමුදලෙහි ප්‍රතිපාදන අනුව භාරකරුවන් විසින් ස්වාධීනව පරිපාලනය කරනු ලැබෙයි. එමෙන්ම එය ස්වාධීන බාහිර විගණකවරුන්ගේ වාර්ෂික විගණනයට භාජනය වේ. සේවක විශ්‍රාම අරමුදල් – I හි මූල්‍ය ප්‍රකාශන මෙන්ම විගණන වාර්තාවද සභාගත කිරීමෙන් අනතුරුව භාරකාර මණ්ඩලය හා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කරනු ලබයි. අරමුදල් සැපයීම, ප්‍රශස්ත මට්ටමින් සිදුවන බවට වගබලා ගැනීමට බැංකුව බැඳී සිටින බැවින් මෙකී මූල්‍ය ප්‍රකාශන සහ විගණන වාර්තාව ද බැංකුවේ හෙළිදරව් කිරීම් වලදී සමාලෝචනයට ඉදිරිපත් කෙරෙයි. මෙම අරමුදලට දායක වූ සාමාජිකයෙකුගේ දිවි ඇති තෙක් විශ්‍රාම වැටුප මාසිකව ගෙවනු ලබයි.

සේවක විශ්‍රාම අරමුදල – I පිළිබඳ විස්තර පිටු අංක 318 සිට 320 දක්වා සටහන් අංක 38 (අ) 1 හි දැක්වේ.

ජීවගණක ඇගයීම සිදු කළ වහාම අරමුදල් නොයෙදවූ පසුගිය සේවා පිරිවැය වෙනත් විස්තීරණ ආදායම් යටතේ හඳුනාගනු ලබයි. 2023 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 12,917 ක ශුද්ධ බැඳීම් හිඟයක් ජීවගණක ඇගයීම් තක්සේරුවෙහි ප්‍රතිඵල මගින් පෙන්නුම් කරන අතර, එය මුළුමනින්ම ප්‍රතිපාදනය කර ඇත. අරමුදල් නොයෙදූ විශ්‍රාම වගකීමෙහි විස්තර පිටු අංක 318 සිට 320 දක්වා සටහන් අංක 38 (අ) 1 හි දක්වා ඇත.

2.5.6.1.2 සේවක විශ්‍රාම අරමුදල – II

1995 ඔක්තෝබර් මස 01 දින හෝ ඉන් අනතුරුව බැංකු සේවයට බැඳුනු ස්ථිර කාර්ය මණ්ඩල සාමාජිකයන් සඳහා, බැංකුව විසින් අදාළ සාමාජිකයාගේ මාසික දළ වැටුපින් 12% ක දායකත්වයක් වෙනම පාලනය වන අරමුදලක් වෙත මාසිකව දායක කළ යුතු වන නිර්වචිත විශ්‍රාම ප්‍රතිලාභ සැලසුමක් බැංකුව විසින් ස්ථාපනය කර මෙහෙයවනු ලබයි.

පුරෝකථන ඒකක ප්‍රතිලාභ, ජීවදත්ත ඇගයීම් ක්‍රමයක් භාවිත කරමින් නිශ්චිත ප්‍රතිලාභ විශ්‍රාම සැලසුම් යටතේ ප්‍රතිලාභ සැපයීමේ පිරිවැය වෙනම තීරණය කරනු ලබයි. ආයු ගණනයෙන් ඇති වූ ලාභ හා පාඩු, ඒවා පැන නගිනු ලබන කාලපරිච්ඡේදය තුළ වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ හඳුනාගනු ලබයි.

නිර්වචිත ප්‍රතිලාභ වත්කම් හෝ වගකීම්, මින් පෙර හඳුනා නොගත් අතීත සේවා පිරිවැය හා බැඳීම් පියවීමට සෘජුවම අවශ්‍ය කෙරෙන සැලසුම් වත්කම්වල සාධාරණ අගය හා මින් පෙර හඳුනා නොගත් ජීවගණක අලාභ අඩු කළ පසුව එළඹෙන නිර්වචිත ප්‍රතිලාභ බැඳීම්හි වත්මන් අගය ලෙස ගණනය කෙරේ. නිර්වචිත ප්‍රතිලාභ වගකීමෙහි අගය, බැංකුව විසින් දරනු ලබන අතර, ලාභ හෝ අලාභ යටතේ වාර්තා කරනු ලබයි. යම් වත්කමක අගය කිසියම් ජීව ගණක අලාභයක් සහ මින් පෙර හඳුනා නොගත් පැරණි සේවා පිරිවැය හා විශ්‍රාම සැලසුමට අදාළ ඉදිරි දායකත්ව මුදල් අඩු කිරීමක් හෝ ආර්ථික ප්‍රතිලාභයක වත්මන් අගය යනාදියෙහි ඒකාබද්ධයට, සීමා වෙයි.

වෘත්තීමය ජීවගණක සමාගමක් වන සී/ස ජීවගණක හා කළමනාකරණ උපදේශක පෞද්ගලික සමාගමෙහි එම්. පූපලානාදන් මහතා විසින් 2023 දෙසැම්බර් 31 දිනට නවතම ජීවගණක ඇගයීමක් සිදුකරන ලදී.

2023 දෙසැම්බර් 31 දිනට යෙදුණු ඇගයීමේදී යොදා ගන්නා ලද ප්‍රධාන මූල්‍ය උපකල්පන පහත පරිදි වේ.

පොළී/වට්ටම් අනුපාතය (වාර්ෂිකව)	13%
ජීවන වියදම් දීමනාවේ ඉහළයාම (වාර්ෂිකව)	8%
මූලික වැටුප් සාමාන්‍යයෙහි ඉහළයාම (වාර්ෂිකව)	10%

විශ්‍රාම අරමුදලෙහි වත්කම්, බැංකුවේ වත්කම් වලින් වෙන්ව පවත්වාගෙන යනු ලබන අතර, භාරකාර අරමුදලෙහි ප්‍රතිපාදන අනුව භාරකරුවන් විසින් ස්වාධීනව පරිපාලනය කරනු ලැබෙයි. එමෙන්ම එය ස්වාධීන බාහිර විගණකවරුන්ගේ වාර්ෂික විගණනයට භාජනය වේ. සේවක විශ්‍රාම

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

අරමුදල – II හි මූල්‍ය ප්‍රකාශන මෙන්ම විගණන වාර්තාවද සභාගත කිරීමෙන් අනතුරුව භාරකාර මණ්ඩලය හා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කරනු ලබයි. අරමුදල් සැපයීම, ප්‍රශස්ත මට්ටමින් සිදුවන බවට වගබලා ගැනීමට බැංකුව බැඳී සිටින බැවින් මෙකී මූල්‍ය ප්‍රකාශන සහ විගණන වාර්තාව ද බැංකුවේ හෙළිදරව් කිරීම් වලදී සමාලෝචනයට ඉදිරිපත් කෙරෙයි. මෙම අරමුදලට දායක වූ සාමාජිකයෙකුගේ දිවි ඇති තෙක් විශ්‍රාම වැටුප මාසිකව ගෙවනු ලබයි.

සේවක විශ්‍රාම අරමුදල – II හි විස්තර පිටු අංක 320 සිට 324 හි සටහන් අංක 38 (අ) 2 මගින් දැක්වේ.

ජීවගණක ඇගයීම සිදු කළ වහාම අරමුදල් නොයෙදවූ පසුගිය සේවා පිරිවැය වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ හඳුනාගනු ලබයි. 2023 දෙසැම්බර් 31 දිනට රු. 2,230 ක අතීත සේවා පිරිවැය අතිරික්තයක් ජීවගණක ඇගයීම් තක්සේරුවෙහි ප්‍රතිඵල මගින් පෙන්නුම් කරන අතර, එය මුළුමනින්ම හඳුනාගෙන ඇත. විශ්‍රාම අරමුදල – II ට අත්තිකාරම් ගෙවීම් විස්තර පිටු අංක 320 සිට 324 දක්වා සටහන් අංක 38 (අ)2 හි දක්වා ඇත.

2.5.6.1.3 වැන්දඹු හා අනත්දරු විශ්‍රාම අරමුදල

2013 දෙසැම්බර් මස සිට බලපැවැත්වෙන පරිදි බැංකුව විසින් සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය II හි සාමාජිකයන් වෙනුවෙන් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් ස්ථාපනය කරන ලදී. සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය II හි සාමාජිකයින්හට ඔවුන්ගේ කැමැත්ත අනුව වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ සාමාජිකත්වය ලබා ගැනීමේ අවස්ථාව ඇත. බැංකුව විසින් මෙම අරමුදල සඳහා දායක නොවන අතර බැංකු සේවකයන් විසින් ඔවුන්ගේ මූලික වැටුපින් 5% ක් මාසිකව දායක මුදල් ලෙස ගෙවනු

2.5.6.2 විශ්‍රාම පාරිතෝෂික

සේවක විශ්‍රාම වැටුප් II යෝජනා ක්‍රමය ස්ථාපිත කිරීමත් සමග 1995 ඔක්තෝබර් මස 01 දින හෝ ඉන් පසුව බැංකු සේවයට බැඳුනු සේවකයින් සේවක විශ්‍රාම වැටුප් II යෝජනා ක්‍රමයට ඇතුළත් වේ. එහෙයින් ඔවුන් සේවා පාරිතෝෂික ක්‍රමය යටතේ හිමිවන අයිතීන් හා වරප්‍රසාද සඳහා හිමිකම් නොකියයි. කෙසේ වුවද, මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ හිමිකර ගැනීම සඳහා අවම වශයෙන් මාස 120 ක අඛණ්ඩ සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කළ යුතුව පවතී. එහෙයින් වසර 10 ක සේවා කාලය සම්පූර්ණ කිරීමට පෙර විශ්‍රාම යනු ලබන හෝ විශ්‍රාම යාම හැරුණු කොට වෙනත් හේතු මත වසර 05 කට පසු සේවා කාලය අවසන් වන සේවකයින්හට 1983 අංක 12 දරණ පාරිතෝෂික දීමනා ගෙවීමේ පනත යටතේ සේවාවසාන පාරිතෝෂික දීමනා හිමිකර ගැනීමේ වස්ථාව හිමි වේ. මේ යටතේ සිය සේවය අවසන් කරන ලද මූල්‍ය වර්ෂයේ අවසන් මාසය සඳහා ගෙවන ලද දළ වැටුප මෙන් මාස 1/2 ක අනුපාතයක් යටතේ අඛණ්ඩ සේවයේ නියැළුණු සෑම වසරක් වෙනුවෙන්ම පාරිතෝෂික දීමනා ගෙවනු ලබයි.

කළමනාකාරිත්වයේ අදහස හා පසුගිය අත්දැකීම්වලට අනුව එබඳු සිදුවීමක් ඇතිවීමේ සම්භාවිතාවය විරලය. වාර්තා කරන දිනට සැලකිය යුතු වගකීමක් වාර්තා නොවුනහොත්, සේවා පාරිතෝෂික සඳහා මූල්‍ය ප්‍රකාශයෙහි ප්‍රතිපාදන වෙන් කරනු නොලබයි. 1983 අංක 12 දරණ සේවා පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ ඉහත දැක්වූ අන්දමේ සිදුවීමක් මත සේවකයෙකුහට සේවා පාරිතෝෂික ගෙවීම සිදු කළහොත්, එය ගෙවූ වර්ෂයේ ආදායම් ප්‍රකාශයෙහි පාරිතෝෂික වියදමක් ලෙස හඳුනාගනු ලබයි.

2.5.6.3 විශ්‍රාමික සේවක වෛද්‍ය ප්‍රතිලාභ

විශ්‍රාමික සේවකයින් වෙනුවෙන් බැංකුව විසින් දායකත්ව වෛද්‍යාධාර යෝජනා ක්‍රමයක් පවත්වාගෙන යනු ලබයි. මේ සැලසුම යටතේ ඇති වත්කම් බැංකුවේ සෙසු වත්කම් වලින් ස්වාධීනව පවත්වා ගෙන යනු ලබන අතර, එම අරමුදලෙහි භාරකාර ඔප්පුවෙහි ප්‍රතිපාදන ප්‍රකාර බැංකුවේ කළමනාකාරිත්වය හා විශ්‍රාමිකයින් නියෝජනය කරනු ලබන කළමනාකාර/භාරකාර මණ්ඩලයක් මගින් පරිපාලනය කරනු ලබයි. ප්‍රක්ෂේපිත ඒකක භාර ජීවගණක ඇගයීම් ක්‍රමවේදය උපයෝගී කර ගනිමින් නිශ්චිත ප්‍රතිලාභ සැලසුම යටතේ ප්‍රතිලාභ ලබාදීමේ පිරිවැය තීරණය කෙරෙයි. ජීවගණක ලාභ හා අලාභ එම අගයන් පැවති කාලසීමාවට අදාළ වෙනත් විස්තීරණ ආදායම්වල හඳුනාගනු ලැබේ.

වරින් වර සිදු කරනු ලබන ජීවගණක නිර්දේශ මත බැංකුවේ කළමනාකාරිත්වය විසින් තීරණය කරනු ලබන මුදල් ප්‍රමාණය බැංකුව විසින් දායකත්ව වෛද්‍යාධාර සැලසුම් ක්‍රමය වෙත දායක කරනු ලබයි. ඒ අනුව 2023 වර්ෂයේ ලාභයෙන් රුපියල් මිලියන 733 ක් මේ සඳහා ප්‍රතිපාදනය කර ඇත.

වෘත්තීමය ජීවගණක සමාගමක් වන සී/ස ජීවගණක හා කළමනාකරණ උපදේශක පෞද්ගලික සමාගමෙහි එම්.පූපලානාදන් මහතා විසින් 2023 දෙසැම්බර් 31 දිනට නවතම ජීවගණක ඇගයීමක් සිදුකරන ලදී.

2023 දෙසැම්බර් 31 දිනට යෙදුනු ඇගයීමේදී යොදාගන්නා ලද ප්‍රධාන මූල්‍ය උපකල්පන පහත පරිදි වේ.

පොළී/වට්ටම් අනුපාතය (වාර්ෂිකව)	13%
වෛද්‍ය පිරිවැය උද්ධමන අනුපාතය (වාර්ෂිකව)	8%

විශ්‍රාම අරමුදලෙහි වත්කම්, බැංකුවේ වත්කම්වලින් වෙන්ව පවත්වාගෙන යනු ලබන අතර, භාරකාර අරමුදලෙහි ප්‍රතිපාදන අනුව භාරකරුවන් විසින් ස්වාධීනව පරිපාලනය කෙරෙනු ලැබෙයි. එමෙන්ම එය ස්වාධීන බාහිර විගණකවරුන්ගේ වාර්ෂික විගණනයට භාජනය වේ. විශ්‍රාම වැටුප් II අරමුදලෙහි මූල්‍ය ප්‍රකාශය මෙන්ම විගණන වාර්තාව භාරකාර මණ්ඩලය හා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබ සමාලෝචනයට බඳුන් වී ඇත. අරමුදල් සැපයුම, ප්‍රශස්ත මට්ටමින් සිදු කරනු ලැබීමේ වගකීම බැංකුව සතු වන බැවින් බැංකුවේ නිරාවරණයවීම් සමාලෝචනය සඳහා ද ඉහත වාර්තා ඉදිරිපත් කෙරෙයි. අදාළ සාමාජිකයා ජීවතුන් අතර සිටිනතාක් විශ්‍රාම වැටුප මාසිකව ගෙවනු ලබයි.

විශ්‍රාමික සේවක වෛද්‍ය ප්‍රතිලාභ පිළිබඳ විස්තර පිටු අංක 324 හි සටහන් අංක 38(අ)3 මගින් දැක්වේ.

ජීවගණක ඇගයීම සිදුකළ වහාම අරමුදල් නොයෙදූ පසුගිය සේවා පිරිවැය වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ හඳුනාගනු ලබයි. 2023 දෙසැම්බර් 31 දිනට රු.මි. 5,113 ක ශුද්ධ බැඳීම් හිඟයක් ජීවගණක ඇගයීම් තක්සේරුවෙහි ප්‍රතිඵල මගින් පෙන්නුම් කරන අතර, එය මුළුමනින් ප්‍රතිපාදනය කර ඇත. අරමුදල් නොයෙදූ විශ්‍රාම වගකීමෙහි විස්තර පිටු අංක 324 සිට 326 හි සටහන් අංක 38(අ)3 හි දක්වා ඇත.

2.5.6.4 නිර්වචිත දායකත්ව සැලසුම්

නිර්වචිත දායකත්ව සැලසුම් පිළිබඳ විස්තර පිටු අංක 266 හි සටහන් අංක 11 මගින් දැක්වේ.

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

2.5.7 වෙනත් වගකීම්

වෙනත් වගකීම් පිළිබඳ විස්තර පිටු අංක 328 හි සටහන් අංක 41 මගින් දැක්වේ.

2.5.8 ප්‍රතිපාදන

අතීත සිද්ධියක ප්‍රතිඵලයක් ලෙස සමූහය හමුවේ ප්‍රවර්තන බැඳීමක් (නෛතික හෝ සම්මුතික) ඇති විට හා එකී බැඳීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ වලින් යුතු සම්පත් පිටතට ගලායාම අවශ්‍යවීම හව්‍ය වන විටක සහ බැඳීම් ප්‍රමාණයෙහි විශ්වසනීය ඇස්තමේන්තුවක් කළ හැකි විටකදී ප්‍රතිපාදන හඳුනාගනු ලබයි. කිසියම් ප්‍රතිපාදනයකට අදාළ වියදම්, ආදායම් ප්‍රකාශයෙහි දක්වනු ලබන්නේ කිසියම් ප්‍රතිපූරණයක් වේ නම් එය අඩු කිරීමෙන් අනතුරුවය.

2.5.8.1 වංචා සහගතව මුදල් ආපසු ගැනීම් වෙනුවෙන් සිදු කළ ප්‍රතිපාදන

2023 දෙසැම්බර් 31 දිනට හඳුනාගනු ලැබූ වංචා සහගත මුදල් ආපසු ගැනීම්වලට අදාළ මුළු වටිනාකම රු. මිලියන 58.3 ක් විය. වංචා සහගතව මුදල් ආපසු ගැනීම් ශේෂය වෙනුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 42.6 ක ප්‍රතිපාදන වෙන් කර ඇත. රක්ෂණාවරණ මගින් රු. මිලියන 15 ක සහන දීමනා හිමිවිණි.

2.5.9 අසම්භාව්‍ය වගකීම් හා බැඳියාවන්

මේ යටතට බැංකු ඇපකර, ණයවර ලිපි, නොලැබූ ණය පහසුකම්, වෙනත් වක්‍ර ණය පහසුකම් සහ ප්‍රාග්ධන බැඳියාවන් ඇතුළත් වේ. බැංකු ඇපකර වූ කලී, ණය උපකරණයක නියාමනවලට අනුව යම් ණයකරුවෙකු නිසි දිනට ගෙවීම් සිදු කිරීමට අපොහොසත් වන අවස්ථාවලදී ඇති වියහැකි අලාභය වෙනුවෙන් සමූහය විසින් නිශ්චිත ගෙවීමක් සිදු කිරීමට අදාළ ගිවිසුම්ය. නොගෙවූ ණය බැඳියාවන්, ණයවර ලිපි යනු බැඳියාවට අදාළ කාලසීමාව තුළ ඇති බැඳියාවන් යටතේ බැංකුව විසින් පූර්ව නිශ්චිත කොන්දේසි යටතේ ගනුදෙනුකරුහට ණයක් ලබාදිය යුතු අවස්ථාය.

2018 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී.ල.මූ.ගි.ප්‍ර. 09 යටතේ හානිකරණ ඇගයීම්වලට මෙකී ගිවිසුම් යටත් වේ. අසම්භාව්‍ය වගකීම් හා බැඳියාවන් පිළිබඳ විස්තර පිටු අංක 333 හි දක්වා සටහන් අංක 48 හි දක්වා ඇත.

2.5.10 කොටසක් සඳහා ඉපයීම්

කොටසක මූලික සහ තනුක ඉපැයීම් පිළිබඳ විස්තර පිටු අංක 271 හි සටහන් අංක 14 හි දක්වා ඇත.

2.6 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති – මූල්‍ය උපකරණ සඳහා ආදායම් හා වියදම් හඳුනාගැනීම

ආදායම විශ්වසනීය ලෙස අගය කළ හැකි සහ ආර්ථික ප්‍රතිලාභ, බැංකුව වෙත ගලාඒමේ සම්භාවිතාව ඇති තාක් දුරට ආදායම හඳුනාගනු ලබයි. ආදායම් සහ වියදම් පිළිබඳ විස්තර පිටු අංක 259 සිට 270 දක්වා සටහන් අංක 3 සිට 13 හි දක්වා ඇත.

2.6.1 පොලී ආදායම් සහ වියදම්

පොළී ආදායම් සහ වියදම් පිළිබඳ විස්තර පිටු අංක 259 සිට 261 දක්වා සටහන් අංක 3 හා 4 හි දක්වා ඇත.

2.6.2 ගාස්තු සහ කොමිස් ආදායම

ගාස්තු සහ කොමිස් ආදායම විස්තර පිටු අංක 262 හි දක්වා සටහන් අංක 5 මගින් දැක්වේ.

2.6.3 වෙළඳාම මගින් ලත් ශුද්ධ ලාභ/(අලාභ)

වෙළඳාම මගින් ලත් ශුද්ධ ලාභ/(අලාභ) පිටු අංක 263 හි සටහන් අංක 6 මගින් දැක්වේ.

2.6.4 ලාභාංශ ආදායම

ආදායමක් ලැබීමට ඇති අයිතය තහවුරු වූ විට ලාභාංශ ආදායම හඳුනාගනු ලැබෙයි. සාමාන්‍යයෙන් මෙය ලැයිස්තුගත කොටස සඳහා ලාභාංශ රහිත දිනයයි. ලාභාංශ ආදායම් පිළිබඳ විස්තර පිටු අංක 264 හි සටහන් අංක 09 මගින් දැක්වේ.

2.6.5 කුලී ආදායම

කුලී ආදායම, උපචිත ආදායම මත ලාභයට හෝ අලාභයට හඳුනාගනු ලැබෙයි. කුලී ආදායම පිළිබඳ විස්තර පිටු අංක 264 හි සටහන් අංක 09 මගින් දැක්වේ.

2.7 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති - බදුකරණය

2.7.1 ප්‍රවර්තන බදුකරණය

ප්‍රවර්තන බදු පිළිබඳ විස්තර පිටු අංක 269 හි සටහන් අංක 13 මගින් දැක්වේ.

2.7.2 විලම්බිත බදුකරණය

විලම්බිත බදු පිළිබඳ විස්තර පිටු අංක 269 සහ 306 හි පිළිවෙලින් සටහන් අංක 13 හා 30 මගින් දැක්වේ.

2.7.3 මූල්‍ය සේවා සඳහා එකතුකළ අගය මත බදු

2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතෙහි 25 (අ) වගන්තිය සහ එහි සංශෝධන ප්‍රකාර මූල්‍ය සේවා සඳහා එකතුකළ අගය මත බදු ගණනය කෙරෙයි.

ආර්ථික ක්ෂයවීම් හා සේවක පාරිශ්‍රමික සඳහා ගලපන ලද මෙහෙයුම් ලාභයෙන් මූල්‍ය සේවා සඳහා එකතු කළ අගය මත බදු හා සමාජ ආරක්ෂණ දායකත්ව අයබදු ගෙවීමට පෙර, 18% ක් මූල්‍ය සේවා සඳහා එකතුකළ අගය මත බදු ලෙස ගෙවිය යුතුවේ.

2.7.4 සමාජ ආරක්ෂණ දායකත්ව අයබදු (SSCL)

2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව අයබදු පනත යටතේ 2022 ඔක්තෝබර් මස 01 වන දින සිට සමාජ ආරක්ෂණ දායකත්ව අයබදු බලපැවැත්වේ. 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතෙහි 6 වන වගන්තිය යටතේ එකතු කළ අගය මත බදු අරමුණ සඳහා නිශ්චිත කරගත් අයිතමවල අගය මත 2.5% ක අනුපාතයකට අයබදු අය වනු ඇත.

2.8 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ශ්‍රී.ල.ගි.ප්‍ර.7) අනුව මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කරනු ලැබ ඇත්තේ සෘජු ක්‍රමය පදනම් කර ගෙනය. මුදල් හා මුදල් සමානයන්, කිසියම් මුදල් ප්‍රමාණයකට පහසුවෙන් පරිවර්තනය කළ හැකි, කෙටි කාලීන, ඉහළ ද්‍රවශීලතාවයෙන් යුතු ආයෝජනවලින් සමන්විත වන අතර, ඒවායේ වටිනාකම වෙනස්වීමේ අවධානම නොසැලකිය යුතු තරම් වේ. අතැති මුදල්, බැංකු වල තැන්පත් කර ඇති මුදල් ශේෂයන් හා කෙටි දැනුම්දීමකින් ලබා ගත හැකි මුදල්, මුදල් හා මුදල් සමානයන්ට අයත් වේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිටු අංක 240 හි දක්වා ඇත.

2.9 නියාමන ප්‍රතිපාදන

2.9.1 තැන්පතු සඳහා රක්ෂණ යෝජනා ක්‍රමය

බැංකුවේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය මත පදනම්ව අදාළ වන ව්‍යවස්ථාපිත අනුපාතිකය වන 0.10% ක් ලෙස, බැංකුව විසින් අදාළ තැන්පතු පදනම මත රක්ෂණ වාරිකය ගණනය කරයි. රක්ෂණ නියාමන මගින් දක්වා ඇති පරිදි සෑම කාර්තුවක් අවසානයේ සිටම දින 15 ක කාලසීමාවක් ඇතුළත අදාළ වාරිකය බැංකුව විසින් ප්‍රේෂණය කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

2.9.2 බෝග රක්ෂණ අයබදු (CIL)

2013 අංක 12 දරණ මුදල් පනතෙහි 14 වන වගන්තියෙහි ප්‍රතිපාදන ප්‍රකාර 2013 අප්‍රේල් 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි බෝග රක්ෂණ අයබද්ද හඳුන්වා දෙනු ලැබූ අතර, එය ජාතික රක්ෂණ භාරකාර අරමුදලට ගෙවිය යුතු වේ. මේ වන විට බදු පසු ලාභයෙන් 1% ක් බෝග රක්ෂණ අයබදු ලෙස ගෙවිය යුතුය.

2.10 වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසු සිදුවීම්

වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසු සිදුවීම් පිළිබඳ විස්තර පිටු අංක 342 හි සටහන් අංක 52 මගින් දැක්වේ.

2.11 නිකුත් කරන ලද මුත් වාර්තාකරණ දිනට බල නොපැවැත්වෙන ගිණුම්කරණ ප්‍රමිතීන්

බැංකුවේ/සමූහයේ මූල්‍ය ප්‍රකාශ නිකුත් කරනු ලබන දිනට ප්‍රකාශිත එනමුත් මෙතෙක් බලනොපැවැත්වුණු බැංකුවට හෝ සමූහයට සැලකිය යුතු බලපෑමක් ඇති කරලන නව ප්‍රමිතීන් හෝ සංශෝධිත ප්‍රමිතීන් සහ අර්ථකතන කිසිවක් නොතිබුණි.

රක්ෂණ ගිවිසුම් පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් - ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 17 යනු රක්ෂණ ගිවිසුම් වලට අදාළ හඳුනාගැනීම, මිනීම, ඉදිරිපත් කිරීම හා හෙළිදරව් කිරීම් සඳහා විස්තීර්ණ නව ගිණුම්කරණ ප්‍රමිතීන් ආවරණය කරන්නකි.

ක්‍රියාත්මක කරනු ලැබූ විට ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 17 මගින් 2005 දී නිකුත් කරන ලද "රක්ෂණ ගිවිසුම්" මත ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 4 යන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ආදේශ කරනු ඇත.

2026 ජනවාරි 01 වන දින හෝ ඉන් පසුව එළඹෙන වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේද සඳහා ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 17 බලපැවැත්වෙනු ඇත. මූල්‍ය ප්‍රකාශයන් මත සැලකිය යුතු අන්දමේ බලපෑමක් මේ මගින් ජනිත වනු ඇතැයි සමූහය අපේක්ෂා නොකරයි.

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

3 දළ ආදායම

ගිණුම්කරණ ප්‍රතිපත්ති

සමූහයට ආර්ථික ප්‍රතිලාභ ගලාඒම හා ආදායම, විශ්වසනීය ලෙස ගණනය කිරීමට හැකි මට්ටම දක්වා දළ ආදායම් හඳුනාගනු ලබයි. ආදායම් හඳුනා ගැනීමට පූර්ව වෙනත් විශේෂිත නිර්ණායක ඒ ඒ ආදායමට අදාළ සටහන් යටතේ දක්වා ඇත.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	**2023** රු. '000	2022 රු. '000	**2023** රු. '000	2022 රු. '000
පොළී ආදායම	**226,967,227**	172,940,351	**231,204,088**	175,769,899
ගාස්තු හා කොමිස් ආදායම	**1,593,415**	2,172,978	**1,605,521**	2,180,276
වෙළඳාම් කටයුතු වලින් ශුද්ධ ලාභය/(අලාභය)	**1,425,791**	(971,434)	**3,701,827**	(3,489,830)
ලාභය/(අලාභය) මගින් සාධාරණ අගයට ඇති මූල්‍ය උපකරණවලින් ශුද්ධ සාධාරණ අගය ලාභ/(පාඩු)	**–**	–	**–**	–
මූල්‍ය වත්කම් හඳුනා ගැනීම අත්හැරීම තුළින් ශුද්ධ ලාභ/(අලාභ)	**1,820,617**	(26,203)	**1,820,617**	(26,203)
වෙනත් මෙහෙයුම් ශුද්ධ ආදායම්	**257,272**	414,656	**492,598**	543,045
දළ ආදායම	**232,064,322**	174,530,349	**238,824,651**	174,977,187

4 ශුද්ධ පොළී ආදායම

ගිණුම්කරණ ප්‍රතිපත්ති

පොළී ආදායම සහ පොළී වියදම හඳුනා ගැනීම්

ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරන ලද සියලු මූල්‍ය උපකරණ සඳහා හා වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ලෙස වර්ග කරන ලද පොළී සහිත මූල්‍ය වත්කම් සහ ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කළ මූල්‍ය උපකරණ සඳහා පොළී ආදායම හෝ වියදම වාර්තා කරනුයේ සඵල පොළී අනුපාත භාවිතයෙනි. මෙය මූල්‍ය උපකරණයෙන් අපේක්ෂිත ජීව කාලය තුළ හෝ ඊට අඩු කාලසීමාවක් තුළ තක්සේරු කළ ඉදිරි මූල්‍ය ගෙවීම් හෝ ලැබීම් සුදුසු විටකදී මූල්‍ය වත්කමෙහි හෝ වගකීමෙහි පවතින ශුද්ධ අගයට නිශ්චිතව අඩුකරන අනුපාතයයි. මෙම ගණනය කිරීම සඳහා මූල්‍ය උපකරණයෙහි සියලුම ගිවිසුම් ප්‍රකාර කොන්දේසි (උදාහරණ වශයෙන් කලින් ගෙවීමේ විකල්ප) සැලකිල්ලට ගනු ලබන අතර මූල්‍ය උපකරණයට සෘජුවම සම්බන්ධ හා සඵල පොළී අනුපාතයෙහි සංකලිත කොටසක් වන කිසියම් ගාස්තු හෝ වර්ධක පිරිවැය මීට ඇතුළු වන මුත් අනාගත ණය පාඩු ඊට අන්තර්ගත නොවේ.

සමූහය විසින් එහි ගෙවීම් හෝ ලැබීම්වල තක්සේරු අගයන් සංශෝධනය කෙරෙයි නම්, මූල්‍ය වත්කම් හෝ වගකීම් හි ධාරණ අගයද ගලපනු ලබයි. මුල් සඵල පොළී අනුපාත මත පදනම්ව අදාළ ගැලපීම් වලින් පසු ධාරණ අගය ගණනය කෙරෙන අතර, ධාරණ අගයෙහි වෙනස වෙනත් මෙහෙයුම් ආදායම් ලෙස වාර්තා කරනු ලබයි. කෙසේ වුවද, ලද මුදලෙහි ඉහළ ගිය අයකර ගැනීම් හැකියාවෙහි ප්‍රතිඵලයක් ලෙස බැංකුව විසින් අනාගත මුදල් ලැබීම් පිළිබඳ තක්සේරු පසුව වැඩි කරනු ලබන නැවත වර්ගීකරණය කරන ලද මූල්‍ය වත්කම් සඳහා තක්සේරුව වෙනස් කළ දින සිටම එම වැඩිකිරීම්වල බලපෑම සඵල පොළී අනුපාතිකයට කළ ගැලපීමක් ලෙස හඳුනාගනු ලබයි.

ණය හානිකරණය වූ වත්කම් හැර අනෙකුත් මූල්‍ය උපකරණ සඳහා සඵල පොළී අනුපාත ගණනය කිරීමේදී අපේක්ෂිත ණය පාඩු හැරුණුකොට මූල්‍ය උපකරණවල සියලු ගිවිසුම්ගත කොන්දේසි සලකා බලමින් බැංකුව විසින් ඉදිරි මුදල් ප්‍රවාහ ඇස්තමේන්තු කරයි. අදියර 3 යටතේ වර්ගීකරණය කරන ලද ණය හානිකරණය වූ මූල්‍ය වත්කම් සඳහා අපේක්ෂිත ණය පාඩු ඇතුළත් කරමින් තක්සේරු කළ ඉදිරි මුදල් ප්‍රවාහ භාවිත කරමින් ණය ගලපන ලද අපේක්ෂිත පොළී අනුපාත ගණනය කෙරෙයි. ණය ගලපන ලද සඵල පොළී අනුපාත යනු මුල් හඳුනා ගැනීමේදී (ණය පාඩුද ඇතුළත්ව) තක්සේරු කළ ඉදිරි මුදල් ප්‍රවාහ ක්‍රමක්ෂය පිරිවැයට වට්ටම් කරන පොළී අනුපාතයයි.

හානිකරණ අලාභය හේතු කොට ගෙන මූල්‍ය වත්කමක හෝ සමාන මූල්‍ය වත්කම් කාණ්ඩයක වාර්තා කළ අගය අඩුවූ විටද හානිකරණ අලාභය ගණනය කිරීම සඳහා අනාගත මූල්‍ය ප්‍රවාහ වට්ටම් කිරීමට යොදාගත් පොළී අනුපාතයම භාවිත කරමින් පොළී ආදායම හඳුනාගැනීම සිදු කෙරෙයි.


මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

4. ශුද්ධ පොළී ආදායම (සම්බන්ධයි)

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව		සමූහය	
	2023 රු. '000	2022 රු. '000	**2023 රු. '000**	2022 රු. '000
04. (අ) පොළී ආදායම				
මුදල් හා මුදල් සමානයන්	**186,984**	25,957	**196,588**	32,533
මහ බැංකුව වෙතැති ශේෂයන්	**–**	–	**–**	–
බැංකුවල ඇති තැන්පතු	**1,260,615**	752,884	**1,416,223**	895,121
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	**–**	–	**–**	–
ලාභ අලාභ මඟින් හඳුනාගත් මූල්‍ය වත්කම්				
– සාධාරණ අගයට ගණනය කරන ලද	**3,214,030**	1,571,085	**5,797,276**	3,304,353
– සාධාරණ අගයට නම් කළ	**–**	–	**–**	–
ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම්				
– ණය හා අත්තිකාරම්	**87,805,226**	64,421,104	**87,768,331**	64,236,437
– ණය හා වෙනත් උපකරණ	**127,897,236**	97,428,830	**129,337,433**	98,455,841
වෙනත් විස්තීර්ණ ආදායම් මඟින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම්	**6,603,136**	1,976,313	**6,688,235**	2,081,436
වෙනත්	**–**	6,764,179	**–**	6,764,179
මුළු පොළී ආදායම	**226,967,227**	172,940,351	**231,204,088**	175,769,899
04. (ආ) පොළී වියදම්				
බැංකුවලට ගෙවිය යුතු	**699,246**	330,665	**1,685,203**	1,515,426
ලාභ අලාභ මඟින් හඳුනාගත් මූල්‍ය වගකීම්	**–**	–	**–**	–
ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වගකීම්				
– තැන්පත්කරුවන්ට ගෙවිය යුතු	**185,701,754**	133,223,445	**185,556,313**	132,966,640
– ණය සුරැකුම්පත් හිමියන්ට ගෙවිය යුතු	**–**	–	**–**	–
– වෙනත් ණය ගැනීම් සඳහා ගෙවියයුතු	**3,443,789**	3,317,165	**4,468,243**	4,078,055
නිකුත් කළ ණය සුරැකුම්පත්	**7,557,223**	3,606,126	**7,557,223**	3,606,126
මුළු පොළී වියදම්	**197,402,011**	140,477,402	**199,266,982**	142,166,248
ශුද්ධ පොළී ආදායම	**29,565,216**	32,462,949	**31,937,106**	33,603,651

පොළී ආදායමට එදිරිව පොළී වියදම

පිටුව 76



4. ශුද්ධ පොළී ආදායම (සම්බන්ධයි)

04. (අ) ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්වලින් ලද ශුද්ධ පොළී ආදායම

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශයන්ට අනුව, පහත දැක්වෙන රජයේ සුරැකුම්පත් සඳහා පොළී ආදායම සහ පොළී වියදම් පිළිවෙලින් 4 (අ) සහ 4 (ආ) සටහන් වල දක්වා ඇති පොළී ආදායමෙන් සහ පොළී වියදම් වලින් උපුටා ගෙන වෙන වෙනම අනාවරණය කර ඇත.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	**2023 රු. '000**	2022 රු. '000	**2023 රු. '000**	2022 රු. '000
පොළී ආදායම				
ලාභ අලාභ මගින් හඳුනාගත් මූල්‍ය වත්කම්				
– සාධාරණ අගයට ගණනය කරන ලද	**3,214,030**	1,571,085	**5,797,276**	3,304,353
– සාධාරණ අගයට නම් කළ	**–**	–	**–**	–
ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම්				
– ණය හා අත්තිකාරම් (ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලදී ගත් සුරැකුම්පත්)	**802,154**	508,637	**680,788**	458,871
– ණය හා වෙනත් උපකරණ	**95,565,494**	78,892,064	**96,550,554**	79,361,258
වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම්	**6,603,136**	1,976,313	**6,688,235**	2,081,436
	106,184,814	82,948,099	**109,716,853**	85,205,917
අඩු කළා: පොළී වියදම්				
බැංකුවලට ගෙවිය යුතු (ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ විකුණන ලද සුරැකුම්පත්)	**699,246**	290,708	**1,618,294**	1,475,469
වෙනත් ණය ගැනීම් සඳහා ගෙවිය යුතු (ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ විකුණන ලද සුරැකුම්පත්)	**3,443,789**	3,317,165	**4,455,234**	4,062,797
	4,143,035	3,607,873	**6,073,529**	5,538,266
රජයේ සුරැකුම්පත් වලින් ලත් ශුද්ධ පොළී ආදායම	**102,041,779**	79,340,226	**103,643,325**	79,667,651

04. (ඇ) ණය තාවකාලික අත්හිටුවීම සහ කල්දැමීම නිසා පොළී ආදායමට වූ බලපෑම

ණය සහනය හෝ ගෙවීම් කල්දැමීම ප්‍රතික්ෂේප කළ අය හැර සෙසු සියළු ගනුදෙනුකරුවන්ට බැංකුව සිය ණය සහනය සහ ගෙවීම් කල් දැමීම ලබාදී ඇත. ණය සහනය 7% ක අනුපාතයකට ලබාදී ඇති අතර, ණය කාලය අවසන් වන තෙක් ගෙවීම් කල්දමා ඇත. ණය සහන කාලසීමාව මාස දෙකක සිට මාස හයක් දක්වා වෙනස් වී ඇති අතර ඉතා සීමිත අවස්ථාවක එය මාස හයකට වඩා වැඩි කර ඇත.

මූල්‍ය වර්ෂය තුළදී කල් දැමූ දින 1 අලාභය වූ රු. මිලියන 1,391 න් රු. මිලියන 137.1 ක පොළී ආදායමක් හඳුනාගත් අතර 2023 දෙසැම්බර් 31 දිනට කාල වෙනස සහ පාරිභෝගිකයාගේ කලින් ගෙවීම නිසා සිදුවූ කල්දැමූ දින 1 අලාභය ලෙස රු. මිලියන 560.5 වාර්තා කරන ලදී. මෙයට කාල වෙනස සහ ගනුදෙනුකරුවන්ගේ පෙර ගෙවීම් හේතු විය.

04.(ඉ) දේශීය ණය ප්‍රශස්තකරණ වැඩසටහන නිසා පොළී ආදායමට වූ බලපෑම

දේශීය ණය ප්‍රශස්තකරණ වැඩසටහනේ විකල්ප III යටතේ බැංකුව විසින් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර කළඹ සම්පූර්ණයෙන්ම ලංකා රුපියල් බැඳුම්කර බවට පරිවර්තනය කර ඇත.

ශ්‍රී ලංකා රජය ක්‍රියාත්මක කරන දේශීය ණය ප්‍රශස්තකරණ වැඩ සටහන නිසා පැන නගින දින 01 වෙනස නීර්ණය කිරීම ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කරන පොදු රාමුවට අනුව සිදුකර ඇති අතර, බැංකුව විසින් 2023 දෙසැම්බර් 31 දිනට දින 01 අලාභය ලෙස රු. මිලියන 209.3 වාර්තා කරන ලදී.

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

5 ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම

ගිණුම්කරණ ප්‍රතිපත්ති

ගනුදෙනුකරුවන්ට සපයනු ලබන විවිධ වූ සේවාවන්ගෙන් සමූහය, ගාස්තු සහ කොමිස් ආදායම උපයාගන්නා අතර, එම සේවාවන් කාණ්ඩ දෙකකට බෙදා වෙන් කළ හැකිය.


(අ) යම් කාලසීමාවක් පුරා සපයනු ලබන සේවාවන්ගෙන් උපයාගන්නා ගාස්තු හා කොමිස් ආදායම
යම් කාලසීමාවක් පුරා සපයනු ලැබූ සේවාවන් වෙනුවෙන් ලැබෙන ගාස්තු සහ කොමිස් ආදායම එම කාලසීමාව පුරා උපචිත කර හඳුනාගනු ලැබේ.
(ආ) ගනුදෙනු සේවා සැපයීම වෙනුවෙන් ලද ගාස්තු හා කොමිස් ආදායම

අවිනිශ්චිත සාර්ව ආර්ථික පරිසරයක් තුල අපි දිගටම ක්‍රියාත්මක වන්නෙමු. සටහන 2 හි අනාවරණය කර ඇති පරිදි ඇස්තමේන්තු සහ උපකල්පන මත බලපෑම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී ශ්‍රී. ල. මු. ව. ප්‍ර. අනුව වත්කම්, වගකීම්, ශුද්ධ අදායම, විස්තීර්ණ ආදායම සහ හෙළිදරව් කිරීම්, කළමණාකරණයට අවශ්‍ය උපකල්පන හා ඇස්තමේන්තු මත සිදු කරයි. සැලකිය යුතු ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කරනු ලබන්නේ, මූල්‍ය උපකරණ, ණය පාඩු දීමනා, වත්කම් හානිකරණය, ආදායම් බදු, ප්‍රතිපාදන සහ අසම්භාව්‍ය වගකීම්, පශ්චාත් රැකියා සහ අනෙකුත් දිගුකාලීන ප්‍රතිලාභ සැලසුම් උපකල්පන සඳහා අදාල තක්සේරු කරණයෙනි. කෙසේවුවත් සැබෑ ප්‍රතිඵල මෙම ඇස්තමේන්තු සහ උපකල්පනවලට වඩා වෙනස්විය හැක. ආර්ථික කඩා වැටීම් ගිණුම්කරන ඇස්තමේන්තු සහ උපකල්පන හා සම්බන්ධ වන බැවින් ආර්ථික සහ වෙළඳපල පරිසරය සහ එහි බලපෑම සැලකිය යුතු ලෙස තක්සේරු කිරීමේදී ඉහළ අවිනිශ්චිතතාවයක් ඇති කරයි. මෙය විශේෂයෙන්ම ණය පාඩු දීමනා, මූල්‍ය උපකරණ තක්සේරු සහ වත්කම් හානිකරණය සඳහා වූ තක්සේරු සහ ඇස්තමේන්තු සිදුකිරීමේදී බලපෑම් ඇති කරයි.

ණය පාඩු සඳහා දීමනාව

ආර්ථික අර්බුදය මගින් වඩාත් බලපෑමට ලක් වූ ක්ෂේත්‍රයන් තීරණය කිරීම පිණිස අප විසින් අපගේ විනිශ්චය යොදා ගනු ලැබූ අතර මාස 12 සහ අපේක්ෂිත ණය පාඩු යන ද්විත්වයම ගණනය කිරීමේදී බැංකුවේ අපේක්ෂිත ණය පාඩු ක්‍රමවේදය මගින් පැහැර හැරීමේ සම්භාව්‍යතාවය (PD) පැහැර හැරීමට නිරාවරණයවීම (EAD) සහ පැහැර හැරීමකදී සිදුවිය හැකි පාඩුව (LGD) යන ප්‍රධාන සාධක තෝලනය කොට ඇත. ප්‍රමිතිගත ව්‍යාපාර සහ රජයේ ණය කළඹ සඳහා අදාළ පැහැර හැරීමේ සම්භාව්‍යතාවය (PD) පැහැර හැරීමට නිරාවරණයවීම (EAD) පැහැර හැරීමකදී සිදුවිය හැකි පාඩුව (LGD) යන ප්‍රධාන සාධක ශ්‍රී.ල.මූ.වා.ප්‍ර 9 යටතේ අපේක්ෂිත ණය පාඩු මැනීම සඳහා ඉදිරි දැක්මැති තොරතුරු ඇතුළත් කිරීම තුළින් තත්කාලීන පරාමිතීන් බවට පරිවර්තනය කර ඇත.

ණය කළඹට අදාළ ඉදිරි දැක්මැති තොරතුරු විචල්‍යයන් තීරණය කිරීම සඳහාත්, යම්කිසි කාල පරාසයක් තුළ පවතින පරාමිතීන් තීරණය කිරීම සඳහා ඉදිරි දැක්මැති තොරතුරු ගැලපිය යුතු ප්‍රමාණය තීරණය කිරීමේදී සැලකිය යුතු විනිශ්චයන් කළයුතු වේ. කාල පරාසයක් තුළ පවතින පැහැර හැරීමේ සම්භාව්‍යතාවය (PD) පැහැර හැරීමට නිරාවරණයවීම (EAD) පැහැර හැරීමකදී සිදුවිය හැකි පාඩුව (LGD) යම්කිසි අවස්ථාවක පවතින පරාමිතීන් බවට පරිවර්තනය කිරීම සඳහා භාවිතා කරන ඉදිරි දැක්මැති තොරතුරු විචල්‍යයන්ගේ වෙනස්වීම එක්තරා කාලපරාසයකදී අපේක්ෂිත ණය පාඩු දීමනා වැඩිකිරීමට හෝ අඩු කිරීමට හේතු විය හැකි අතර ඉදිරි දැක්මැති තොරතුරු විචල්‍යයන් ණය සිතියම්ගත කිරීමෙහි වෙනස්කම් කලාතුරකින් අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, අපගේ අනාවැකි කාර්තුමය පදනමින් යාවත්කාලීන වන බැවින් කිසියම් නිශ්චිත අවස්ථාවක පවතින පරාමිතීන් ගණනය කිරීම සඳහා භාවිතා කරන විශේෂිත ඉදිරි දැක්මැති තොරතුරු පරාමිතින්හි වෙනස්කම් නිතර සිදු කෙරේ. ඉදිරි දැක්මැති තොරතුරු විචල්‍යයන්හි අශුභවාදී මට්ටමේ වැඩිවීම අපේක්ෂිත ණය පාඩු වැඩි කිරීමට හේතු වන අතර ඉදිරි දැක්මැති තොරතුරු විචල්‍යයන්හි සුභවාදී වෙන්වීම් අපේක්ෂිත ණය පාඩුවෙහි අඩුවීමට හේතු වේ. මෙම වැඩිවීම් හා අඩුවීම් කිසියම් විශේෂිත කාල පරිච්ඡේදයක් තුළ සැලකිය යුතු විය හැකි අතර අනාගතය පිළිබඳ අපගේ දැක්ම වෙනස් වන කාල පරිච්ඡේදයේදී එය සිදුවීමට පටන් ගනී.

ආර්ථික අර්බුදය හේතුවෙන් ඇතැම් කර්මාන්ත සහ කළඹ වෙත ඇති විය හැකි සෘණාත්මක බලපෑමේ ප්‍රමාණය තීරණය කිරීම සඳහාත් රජයේ විවිධ ආධාර වැඩසටහන් මගින් ණය පාඩු සීමා කළහැකි ප්‍රමාණය තීරණය කිරීම සඳහාත් අප විසින් නිරීක්ෂණයන් යොදා ගතිමු. බහුවිධ අවස්ථා සඳහා ඉදිරි දැක්මැති තොරතුරු පුරෝකථනය කිරීම සහ ඉහත දක්වා ඇති පරිදි සිදුවීම් සඳහා බර තැබීමේ සම්භාව්‍යතාව තීරණය කිරීමේ දී මූල්‍ය වත්කමක් එහි මූලික හඳුනාගැනීමෙන් පසු ණය අවදානමෙහි සැලකිය යුතු වැඩිවීමක් අත්විඳ තිබේද යන්න පිළිබඳ අපේ තක්සේරුව සහ අපේක්ෂිත ණය අලාභය පිළිබඳ අපගේ තක්සේරුව යන දෙකම ඇතුළත් කළෙමු.

ප්‍රධාන ඉදිරි දැක්මැති තොරතුරු විචල්‍යයන්ට දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය, විරැකියා අනුපාතය, උද්ධමන අනුපාතය, විනිමය අනුපාතය, පොලී අනුපාතය ඇතුළත් වේ. අපගේ ණය කළඹේ බහුතරයක් සඳහා ඉදිරි දැක්මැති තොරතුරු විචල්‍යයන් පිළිබඳ පුරෝකථනයන් ප්‍රතිෂ්ඨාපනය කිරීමේදී අපගේ කළමනාකාරීත්වය විසින් අභ්‍යන්තර සැලසුම් සහ පුරෝකථනයන් සඳහා යොදාගනු ලබන මූලික සිද්ධි සහ ඇතිවීමේ වැඩි සම්භාව්‍යතාවයක් ඇති සිද්ධි යොදා ගැනේ. මූලික සිද්ධි සැකසීමේදී, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වැනි ජාත්‍යන්තර සංවිධාන සහ ශ්‍රී ලංකා මහ බැංකුව වැනි මූල්‍ය බලධාරීන්ගේ මෙන්ම පෞද්ගලික අංශයේ ආර්ථික විද්‍යාඥයින්ගේ පුරෝකථනයන් අපි සලකා බලන්නෙමු. ඇති විය හැකි මූලික සිද්ධි තත්ත්වයට ඉහළින් සහ පහළින් ඇති බාහිර පුරෝකථනයන් සහ කළමනාකරණ විනිශ්චයන් යොදා ගනිමින් වාසිදායක සිද්ධි තත්ත්වය සහ අවාසිදායක සිද්ධි තත්ත්වයන්ට අදාළව සම්භාව්‍යතාවය බර තැබීම සඳහා අප විසින් කළමනාකරණ විනිශ්චයන් යොදා ගැනේ. ඉදිරි දැක්මැති තොරතුරු පිළිබඳ අපගේ අපේක්ෂාව සුබවාදී නොවීම සිදුවිය හැකි අවාසි සිද්ධි තත්ත්වයේ සම්භාව්‍යතාවය වැඩිවීමක් හෝ වාසිදායක සිද්ධි තත්ත්වයේ සම්භාව්‍යතාවය අඩුවීම ඇස්තමේන්තුගත අපේක්ෂිත ණය පාඩු දීමනාව වැඩි කරයි.

ඊට හාත්පසින්ම වෙනස්ව, පුරෝකථනය කරන ලද ඉදිරි දැක්ම තොරතුරු පිළිබඳ අපගේ දෘෂ්ටියේ වැඩි දියුණුවක්, වාසිදායක සිද්ධි තත්වයේ සම්භාව්‍යතාවය වැඩිවීමක් හෝ අවාසිදායක සිද්ධි තත්ත්වයේ සම්භාව්‍යතාවය අඩුවීමක් ප්‍රතිවිරුද්ධ බලපෑමක් ඇති කරයි. විචල්‍යයන්ගේ අන්තර් සම්බන්ධතාවය, යම් සිද්ධියකට ආවේණික වූ අශුභවාදී මට්ටම සහ එය සම්භාව්‍යතාවයේ අන්තර් සම්බන්ධතාවය හේතුවෙන්, යම් සිද්ධියකට අදාළව පවතින විවිධ ඉදිරි දැක්මැති තොරතුරු විචල්‍යයන්ගේ වෙනස්වීමේ බලපෑම අර්ථවත් ලෙස වෙන් වෙන්ව ගත නොහැක. අපගේ පුරෝකථන මගින් ආර්ථික අර්බුදයේ බලපෑම පිළිබඳ බොහෝ උපකල්පන සහ අවිනිශ්චිතතාවයන් පිළිබිඹු වන බැවින් ආර්ථික අර්බුදයට අදාළව ඉදිරි දැක්මැති තොරතුරු පුරෝකථනය කිරීමට සහ එම තත්ත්වයන්ට අදාළව බර තැබීම් තීරණය කිරීම සඳහා ක්ෂේත්‍ර ගණනාවකට අදාළව විනිශ්චයන් ඉහළ නැංවීමට සිදුවිය. අපගේ අපේක්ෂිත ණය අලාභය තක්සේරු

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

21. ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් – ණය හා අත්තිකාරම් (සම්බන්ධයි)

21. (ඊ) ණය හා අත්තිකාරම් සහ අපේක්ෂිත ණය පාඩු ප්‍රතිපාදන මත කොවිඩ් 19 හි බලපෑම (සම්බන්ධයි)

කිරීම සඳහා භාවිතා කරන තොරාගත් ඉදිරි දැක්මැති තොරතුරු විචල්‍යයන් සඳහා මූලික සිද්ධි තත්ත්වය, වාසිදායක සිද්ධි තත්ත්වය සහ අවාසිදායක සිද්ධි තත්ත්වයන්ට අදාළ අවස්ථා පිළිබඳ පුරෝකථනයන් පහත වගුව මගින් සපයයි.

අවස්ථා සම්භාවිතා බර තැබීම (බැංකුව)

දෙසැම්බර් 31 දිනට	2023 %	2022 %
මූලික සිද්ධි	**10**	10
වාසිදායක සිද්ධි තත්ත්වය	**10**	10
අවාසිදායක සිද්ධි තත්ත්වය	**80**	80

කළමනාකරණ ආවරණ භාවිතය

අපේක්ෂිත ණය අලාභ දීමනා ඇස්තමේන්තු සඳහා කළමනාකරණ ආවරණ යනු අපගේ පවත්නා යෙදවුම්, උපකල්පන සහ ආකෘති ශිල්පීය ක්‍රම අදාළ සියලු අවදානම් සාධක ග්‍රහණය කර නොගන්නා බවට අප විනිශ්චය කරන අවස්ථාවන්හිදී භාවිතා කරන ගැලපුම් වේ. නව සාර්ව ආර්ථික, ක්ෂුද්‍ර ආර්ථික හෝ දේශපාලන සිදුවීම්වල මතුවීම්, අපගේ වර්තමාන පරාමිතීන් තුළ ඇතුළත් නොවන පරාමිතීන්, ආකෘති හෝ දත්තවල අපේක්ෂිත වෙනස්කම්, අභ්‍යන්තර අවදානම් ඇගයීම් සංක්‍රමණ හෝ ඉදිරි දැක්මැති තොරතුරු එවැනි තත්වයන්ට උදාහරණ වේ.

වත්මන් ආවරණය තුළ ගැබ්වී ඇති අවිනිශ්චිතතාවට පිළියම් ලෙස ඇතැම් ව්‍යාපාර සංක්‍රමණ කෙරෙහි ආර්ථික අර්බුදය මගින් ඇති කළහැකි බලපෑම් සම්බන්ධයෙන් සහ එම නිරාවරණ සඳහා අපේක්ෂිත ණය අලාභය මැනීම සම්බන්ධයෙන් සහ එම අවදානම්වලට වඩාත් ලක්විය හැකි බවට අපි විශ්වාස කරනු ලබන රාජ්‍ය නිරාවරණයවීම් සම්බන්ධයෙන් අපි කළමනාකරණ ආවරණ භාවිත කළෙමු. මෙම ආවරණ තීරණය කිරීමේදී රජයේ සහන ක්‍රියාමාර්ග මගින් අපගේ ආකෘතීන් මත දැනටමත් පිළිඹිබු නොවන මට්ටමට සලකා බැලිණි. මීට අමතරව, පාරිභෝගික නිරාවරණ විතැන් කිරීම සඳහා රජයේ සහාය සහ සේවාදායකයින්ගේ සහන ක්‍රියාමාර්ගවල බලපෑම සහ එම නිරාවරණ සඳහා අපේක්ෂිත ණය අලාභය මැනීම සම්බන්ධයෙන් කළමනාකරණ ආවරණ යොදන ලදී. කළමනාකරණ ආවරණ භාවිත කිරීම සඳහා පිළිගත් අපේක්ෂිත ණය පාඩු දීමනා ප්‍රමාණයට බලපාන සැලකිය යුතු විනිශ්චයක් යෙදීම අවශ්‍ය වේ. තථ්‍ය ණය පාඩු අපගේ ඇස්තමේන්තු වලින් බොහෝ සෙයින් වෙනස් විය හැකිය. සියලු ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ ණය සහන කාලය හෝ ගෙවීම් කල් දැමීමේ කාලය නොසලකා ඉදිරි පැහැර හැරීමේ සම්භාවිතාව (PD) භාවිතා කරන ලදී.

සියලුම ආයතනික සේවාදායකයින් ඔවුන්ගේ අතීත ගෙවීම් රටා, ඔවුන්ගේ අංශයට හා භූගෝලීය ප්‍රදේශයට ආර්ථික අර්බුදය බලපෑම, ක්ෂේත්‍රයේ අපේක්ෂිත ප්‍රකෘතිය, ආයතනයේ මූල්‍ය ශක්තිය, රජයේ සහ මහ බැංකු සහාය සහ වෙනත් සාධක මත පදනම්ව තනි තනිව ඇගයීමට ලක් කරන ලදී. අපගේ තක්සේරුව මත පදනම්ව සමහර ණය ගැතියන් පළමු අදියර සිට දෙවන අදියර දක්වා (SICR) ගෙන ගිය අතර සමහර ණය ගැතියන් ඔවුන්ගේ අතීත ගෙවීම් තත්ත්වය නොතකා දෙවන අදියර සිට තුන්වන අදියර දක්වා (අපේක්ෂිත මුදල් ප්‍රවාහ දුර්වලතා හේතුවෙන්) ගෙන යන ලදී.

තනි ණය ගැනුම්කරුවන් සඳහා කළඹ මට්ටමේ හානිකරණ තක්සේරු කිරීම් සිදු කරන ලදී. කෙසේ වෙතත්, සමහර අවස්ථාවලදී, දිගුකාලීන ණය සහන හෝ කල් දැමීම පිළිබඳ පාරිභෝගික ඉල්ලීමෙහි සාධාරණත්වය තක්සේරු කිරීමට කළමනාකරණ විනිශ්චය භාවිත කරන ලදී. ණය ගැනුම්කරුවන්ට ඔවුන්ගේ අංශය සහ කළමනාකරණ විනිශ්චය මත පදනම්ව අදියර අතර වෙන් කරන ලදී. අපගේ තක්සේරුව මත පදනම්ව සමහර ණයගැතියන් පළමු අදියර සිට දෙවන අදියර දක්වා (SICR) ගෙනගිය අතර සමහර ණය ගැතියන් ඔවුන්ගේ අතීත ගෙවීම් තත්ත්වය නොතකා දෙවන අදියර සිට තුන්වන අදියර දක්වා (අපේක්ෂිත මුදල් ප්‍රවාහ දුර්වලතා හේතුවෙන්) ගෙන යන ලදී.

කළමනාකරණ ආවරණ මගින් අපේක්ෂිත ණය පාඩු සඳහා වන බලපෑම

ණය සහ අත්තිකාරම් අදියර 1 න් අදියර 2 ට සංචලනය

අදියර 1 යටතේ මූලිකව සමූහගත වූ තෝරාගත් අංශවල සිල්ලර ණය හා අත්තිකාරම් අදියර 2 වෙත මාරු විය. ප්‍රතිඵලයක් ලෙස 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට අදියර 1 සිට අදියර 2 දක්වා ණය සහ අත්තිකාරම් රු. මිලියන 7,954.8 මාරුවූ අතර හානිකරණ ප්‍රතිපාදන රු. මිලියන 1,078.6 කින් ඉහළ යන ලදී.

	අදියර 1 රු. '000	අදියර 2 රු. '000	ශුද්ධ බලපෑම රු. '000
නිරාවරණය	(7,954,776)	7,954,776	–
හානිකරණ ප්‍රතිපාදන	(123,151)	1,201,749	1,078,598

ණය සහ අත්තිකාරම් අදියර 2 න් අදියර 3 ට සංචලනය

අදියර 2 යටතේ මූලිකව සමූහගත වූ තෝරාගත් අංශවල සිල්ලර ණය හා අත්තිකාරම් අදියර 3 වෙත මාරු විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට ණය සහ අත්තිකාරම් රු. මිලියන 1,289.2 අදියර 2 සිට අදියර 3 දක්වා ගෙන යන ලද අතර හානිකරණ ප්‍රතිපාදන රු. මිලියන 302.4 කින් ඉහළ යන ලදී.

	අදියර 1 රු. '000	අදියර 2 රු. '000	ශුද්ධ බලපෑම රු. '000
නිරාවරණය	(1,289,191)	1,289,191	–
හානිකරණ ප්‍රතිපාදන	(196,705)	499,082	302,377

22 ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් – ණය හා වෙනත් උපකරණ

ගිණුම්කරණ ප්‍රතිපත්ති

සමූහයට කල්පිරීම තෙක් රඳවා ගැනීමට අදහස් කරන හා හැකියාව තිබෙන ක්‍රමක්ෂය පිරිවැය – ණය ගණනය කරන මූල්‍ය වත්කම් හා වෙනත් උපකරණයි. නිශ්චිත කල්පිරීම් සීමා හා නිශ්චිතව තීරණය කළ හැකි ගෙවීම් සීමා සමග ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් මූලික මිනීමෙන් අනතුරුව ක්‍රමක්ෂය පිරිවැය – ණය ගණනය කරන මූල්‍ය වත්කම් හා වෙනත් උපකරණ, සඵල පොළී අනුපාතික යොදා ගනිමින් හානිකරණය අඩුකර ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලබයි. සඵල පොළී අනුපාතිකයෙහි අත්‍යන්ත කොටසක් වන අත්පත් කර ගැනීමෙහිලා අදාළ වාරික සහ ගාස්තු හෝ වට්ටම් සැලකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරනු ලබයි. ආදායම් ප්‍රකාශයෙහි, පොළී හා සමාන ආදායම්, හි ක්‍රමක්ෂය ඇතුළත් වේ. එවන් ආයෝජන වලින් පැන නගින හානිකරණය ආදායම් ප්‍රකාශයෙහි හානිකරණ ගාස්තු යටතේ හඳුනා ගැනෙයි.

		බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	සටහන	**2023** රු. '000	2022 රු. '000	**2023** රු. '000	2022 රු. '000
ශ්‍රී ලංකා රාජ්‍ය සුරැකුම්පත්					
භාණ්ඩාගාර බිල්පත්		**81,381,441**	6,483,616	**83,062,596**	6,981,266
භාණ්ඩාගාර බැඳුම්කර		**728,230,365**	768,959,383	**735,219,630**	776,263,184
ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර		**–**	9,388,730	**–**	9,388,730
ප්‍රති විකුණුම් ගිවිසුම් යටතේ මිලදී ගත් සුරැකුම්පත්		**–**	–	**50,041**	–
ණයකර (භාණ්ඩාගාර ඇපකර)		**131,860,577**	132,760,669	**131,860,577**	132,760,669
ආයතනික ණය උපකරණ	(22.1)	**2,232,945**	2,476,508	**2,864,318**	3,462,287
වාණිජ පත්‍රිකා		**–**	–	**6,000**	6,000
වෙනත් ආයෝජන		**–**	–	**165,595**	165,595
දළ එකතුව		**943,705,329**	920,068,906	**953,228,757**	929,027,729
අපේක්ෂිත ණය පාඩු හානිකරණය		**(645)**	(939,528)	**(172,433)**	(1,111,287)
ශුද්ධ එකතුව		**943,704,684**	919,129,377	**953,056,324**	927,916,442

22.1 ආයතනික ණය උපකරණ – බැංකුව

	බැංකුව			
දෙසැම්බර් 31 දිනට	**2023** ණයකර ගණන	**2023** ධාරණ අගය	2022 ණයකර ගණන	2022 ධාරණ අගය
පීපල්ස් ලීසිං පීඑල්සී	**2,064,900**	**214,025**	2,064,900	214,076
කොමර්ෂල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී	**7,500,000**	**780,336**	7,500,000	796,157
හේලීස් පීඑල්සී	**5,000,000**	**535,142**	7,000,000	754,787
කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී	**1,000,000**	**107,422**	1,000,000	107,447
නේෂන් ට්‍රස්ට් බැංකුව පීඑල්සී	**3,212,800**	**335,375**	3,212,800	335,455
රේසස් බලශක්ති පීඑල්සී	**2,500,000**	**260,645**	2,500,000	268,586
ශුද්ධ එකතුව		**2,232,945**		2,476,508

22. ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් – ණය හා වෙනත් උපකරණ (සම්බන්ධයි)

22.1 ආයතනික ණය උපකරණ – සමූහය

	සමූහය			
දෙසැම්බර් 31 දිනට	**2023** ණයකර ගණන	**2023** ධාරණ අගය	2022 ණයකර ගණන	2022 ධාරණ අගය
පීපල්ස් ලීසිං පීඑල්සී	**6,203,600**	**642,460**	6,203,600	642,511
කොමර්ෂල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී	**7,500,000**	**780,336**	8,174,200	867,161
හේලීස් පීඑල්සී	**5,000,000**	**535,142**	8,250,000	886,326
කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී	**1,000,000**	**107,422**	1,000,000	107,447
නේෂන් ට්‍රස්ට් බැංකුව පීඑල්සී	**3,212,800**	**335,375**	3,212,800	335,455
රේසස් බලශක්ති පීඑල්සී	**2,500,000**	**260,645**	2,500,000	268,586
ඒමියා ඇසට්ස් ෆිනෑන්ස් පීඑල්සී	**–**	**–**	250,000	27,025
සෙලාන් බැංකුව පීඑල්සී	**1,000,000**	**107,033**	1,000,000	107,052
සියපත ෆිනෑන්ස් පීඑල්සී	**929,500**	**95,905**	2,112,700	220,725
ශුද්ධ එකතුව		**2,864,318**		3,462,287

22.2 විශ්ලේෂණය

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2023** රු. '000	2022 රු. '000	**2023** රු. '000	2022 රු. '000
සුරුකුම්කරණය මගින්				
සුරුකුම් ලෙස ගිවිසින ලද	**47,437,615**	6,772,300	**55,926,347**	13,253,580
තබා නොමැති	**896,267,714**	913,296,606	**897,302,410**	915,774,149
දළ එකතුව	**943,705,329**	920,068,906	**953,228,757**	929,027,729
ව්‍යවහාර ඒකක අනුව				
ශ්‍රී ලංකා රුපියල්	**943,705,329**	910,680,176	**953,228,757**	919,639,000
ඇමෙරිකානු ඩොලර්	**–**	9,388,730	**–**	9,388,730
දළ එකතුව	**943,705,329**	920,068,906	**953,228,757**	929,027,729

22. ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් – ණය හා වෙනත් උපකරණ (සම්බන්ධයි)

22.3 වර්ෂය තුළ හානිකරණ සංචලන

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2023 රු. '000**	2022 රු. '000	**2023 රු. '000**	2022 රු. '000
1 අදියර				
ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය	**655**	528	**820**	728
ආදායම් ප්‍රකාශයට ගැලපීම/(ආපසු ගැලපීම)	**(10)**	127	**19**	92
වර්ෂය තුළ කපාහැරීම්	**–**	–	**–**	–
වෙනත් සංචලන	**–**	–	**–**	–
දෙසැම්බර් 31 දිනට ශේෂය	**645**	655	**839**	820
2 අදියර				
ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය	**938,873**	1,384,634	**938,873**	1,384,634
ආදායම් ප්‍රකාශයට ගැලපීම/(ආපසු ගැලපීම)	**(938,873)**	(445,761)	**(938,873)**	(445,761)
වර්ෂය තුළ කපාහැරීම්	**–**	–	**–**	–
වෙනත් සංචලන	**–**	–	**–**	–
දෙසැම්බර් 31 දිනට ශේෂය	**–**	938,873	**–**	938,873
3 අදියර				
ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය	**–**	–	**171,595**	171,595
ආදායම් ප්‍රකාශයට ගැලපීම/(ආපසු ගැලපීම)	**–**	–	**–**	–
වර්ෂය තුළ කපාහැරීම්	**–**	–	**–**	–
වෙනත් සංචලන	**–**	–	**–**	–
දෙසැම්බර් 31 දිනට ශේෂය	**–**	–	**171,595**	171,595
දෙසැම්බර් 31 දිනට මුළු හානිකරණ ප්‍රතිපාදන	**645**	939,528	**172,433**	1,111,287

23 වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම්

ගිණුම්කරණ ප්‍රතිපත්ති

වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ගණනය කරන ලද මූල්‍ය වත්කම් ගණයට හිමිකම් සහ ණය සුරැකුම්පත් අයත්වේ. වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගය ලෙසින් වර්ගීකරණය කරනු ලබන හිමිකම් ආයෝජන, උපාය මාර්ගික ආයෝජන ලෙස පවතින අයිතමයන්ය. වෙළඳපල තත්වයන්ගේ වෙනස්වීම් වලට ප්‍රතිචාර ලෙසින් හෝ ද්‍රවශීලතාව අවශ්‍යතාවන්ට ප්‍රතිචාර ලෙසින් විකුණනු ලබන මෙම ප්‍රභේදයට අයත් ණය සුරැකුම්පත් නිශ්චිත නොවන කාලපරිච්ඡේදයකට රඳවා ගැනීමට අපේක්ෂා කරනු ලබන අයිතමයන්ය.

මූලික මිනුමෙන් පසුව වෙනත් විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ අගයට ගණනය කරන ලද මූල්‍ය වත්කම් පසුව සාධාරණ අගයට මනිනු ලබයි. වෙනත් විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ අගයට ඇති මූල්‍ය වත්කම් පහත පරිදි ප්‍රභේද දෙකකට වර්ග කළ හැකිය.

i. වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ඇති හිමිකම් උපකරණ

මූලික හඳුනාගැනීමෙන් පසුව, ශ්‍රී ල.ගි.ප්‍ර. 32 මූල්‍ය උපකරණ යටතේ හිමිකම් යන්නෙහි නිර්වචනයට සරිලන අවස්ථාවලදී බැංකුව විසින් ඇතැම් විටෙක එහි හිමිකම් ආයෝජන වෙනත් විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ අගයට ඇති හිමිකම් උපකරණ ලෙස ආපසු හැරවිය නොහැකි පරිදි වර්ගීකරණය කරනු ලබයි. එවන් වර්ගීකරණයක් උපකරණයෙන් උපකරණය යන පදනම මත තීරණය වෙයි.

23. වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම් (සම්බන්ධයි)

උපලබ්ධි නොවූ ලැබීම් හා අලාභ, වෙනත් විස්තීර්ණ ආදායම් සංචිතයෙහි සෘජුවම හිමිකම් ලෙස හඳුනාගනු ලබයි. මෙකී හිමිකම් උපකරණ මත ඇති වන ලැබීම් හා අලාභ යළි ලාභයක් ලෙස කිසි විටෙක ප්‍රතිවර්ගීකරණය කරනු නොලබයි. උපකරණයෙහි පිරිවැයෙහි කොටසක් ලෙස යළි අයකර ගැනීමෙහිදී එකී අරමුදලින් බැංකුව ප්‍රතිලාභ ලබන අවස්ථාවලදී හැර ගෙවීමේ අයිතිය ස්ථාපිත කර ගන්නා අවස්ථාවලදී ලාභාංශ, වෙනත් මෙහෙයුම් ආදායම් ලෙස ලාභයට/අලාභයට හඳුනාගනු ලබයි. එබඳු අවස්ථාවලදී එකී ලැබීම්, වෙනත් විස්තීර්ණ ආදායම්හි වාර්තා කරනු ලබයි. වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ඇති හිමිකම් උපකරණ හානිකරණ ඇගයීමට යටත් නොවේ.

කෙසේ වෙතත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගය යටතේ ඇති ප්‍රකාශිත වෙළඳපොළ මිලක් නොමැති සහ සාධාරණ අගය විශ්වසනීය ලෙස මැනිය නොහැකි හිමිකම් ආයෝජන පිරිවැයට මනිනු ලබයි.

ii. වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ඇති ණය උපකරණ

පහත කොන්දේසි ද්විත්වයටම අනුකූල වන අවස්ථාවලදී වෙනත් විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ අගයට මනිනු ලබන ණය උපකරණ සඳහා සමූහය විසින් ශ්‍රී.ල.මූ.වා.ප්‍ර.9 යටතේ නව වර්ගීකරණය අදාළ කරගනු ලබයි.

- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ රැස් කිරීම සහ මූල්‍ය වත්කම් විකිණීම මගින් සාක්ෂාත් කරගත හැකි අරමුණු සහිත උපකරණ ව්‍යාපාරික ආකෘතියක් යටතේ රඳවාගනු ලබයි.
- මූල්‍ය වත්කම් ගිවිසුම්ගත නියමයන් **SPPI** පරීක්ෂාවට බඳුන් වෙයි.

වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ඇති ණය උපකරණ පාඩුව සාධාරණ අගයට මනිනු ලබන අතර, එමඟින් ඇතිවන ලැබීම් සහ අලාභ වෙනත් විස්තීර්ණ ආදායමෙහි වාර්තා කරනු ලබයි. පොලී ආදායම, අපේක්ෂිත ණය පාඩු සහ අඩුවීම් ලාභය/අලාභයට හඳුනාගනු ලබයි. හඳුනාගැනීම අත්හැරීමේදී, වෙනත් විස්තීර්ණ ආදායමට කලින් වාර්තා කරන ලද මුළු ලාභ හෝ අලාභ ආදායම් ප්‍රකාශයට නැවත වර්ගීකරණය කරනු ලැබේ.

		බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	සටහන	**2023** රු. '000	2022 රු. '000	**2023** රු. '000	2022 රු. '000
ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්	(23.අ)				
භාණ්ඩාගාර බිල්පත්		**42,428,135**	8,001,757	**42,428,135**	8,001,757
භාණ්ඩාගාර බැඳුම්කර		**16,466,074**	17,347,185	**17,031,685**	17,831,708
හිමිකම් සුරැකුම්පත්					
නිල ලැයිස්තුගත හිමිකම් සුරැකුම්පත්	(23.ඇ)	**2,772,958**	2,146,925	**2,975,291**	2,249,685
නිල ලැයිස්තුගත නොවන හිමිකම් සුරැකුම්පත්	(23.ඉ)	**257,244**	166,897	**301,885**	211,537
(අඩුකළා): හානිකරණය		**–**	–	**(42,476)**	(42,476)
වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ශුද්ධ මූල්‍ය වත්කම්		**61,924,412**	27,662,763	**62,694,519**	28,252,211

23. (අ) විශ්ලේෂණය

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2023** රු. '000	2022 රු. '000	**2023** රු. '000	2022 රු. '000
සුරැකුම්කරණය මගින්				
සුරැකුම් ලෙස ගිවිසින ලද	**–**	–	**460,888**	387,192
තබා නොමැති	**61,924,412**	27,662,763	**62,233,632**	27,865,019
දළ එකතුව	**61,924,412**	27,662,763	**62,694,519**	28,252,211
ව්‍යවහාර මුදල් ඒකක අනුව				
ශ්‍රී ලංකා රුපියල්	**61,924,412**	27,662,763	**62,694,519**	28,252,211
ඇමෙරිකානු ඩොලර්	**–**	–	**–**	–
දළ එකතුව	**61,924,412**	27,662,763	**62,694,519**	28,252,211

23. වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම් (සම්බන්ධයි)

23. (අ) වර්ෂය තුළ හානිකරණ සංචලන

වර්ෂය තුළ හානිකරණ සංචලන වාර්තා නොවීය.

23. (ආ) – ශ්‍රී ලංකා රාජ්‍ය සුරැකුම්පත්

	බැංකුව					
	2023			2022		
	මුහුණත අගය	ආයෝජන පිරිවැය රු. '000	සාධාරණ අගය රු. '000	මුහුණත අගය	ආයෝජන පිරිවැය රු. '000	සාධාරණ අගය රු. '000
ශ්‍රී ලංකා රාජ්‍ය සුරැකුම්පත් – භාණ්ඩාගාර බිල්පත්	**43,805,328**	**41,226,853**	**42,428,135**	8,565,000	7,445,499	8,001,757
ශ්‍රී ලංකා රාජ්‍ය සුරැකුම්පත් – භාණ්ඩාගාර බැඳුම්කර	**15,724,930**	**14,875,308**	**16,466,074**	19,374,930	17,604,776	17,347,185
		56,102,161	**58,894,209**		25,050,275	25,348,941

	සමූහය					
	2023			2022		
	මුහුණත අගය	ආයෝජන පිරිවැය රු. '000	සාධාරණ අගය රු. '000	මුහුණත අගය	ආයෝජන පිරිවැය රු. '000	සාධාරණ අගය රු. '000
ශ්‍රී ලංකා රාජ්‍ය සුරැකුම්පත් – භාණ්ඩාගාර බිල්පත්	**43,805,328**	**41,226,853**	**42,428,135**	8,565,000	7,445,499	8,001,757
ශ්‍රී ලංකා රාජ්‍ය සුරැකුම්පත් – භාණ්ඩාගාර බැඳුම්කර	**16,237,616**	**15,288,000**	**17,031,685**	20,024,051	18,106,103	17,831,708
		56,514,853	**59,459,820**		25,551,601	25,833,465

23. (ඇ) නිල ලැයිස්තුගත ආයෝජන – හිමිකම් සුරැකුම්පත් – බැංකුව සහ සමූහය

	බැංකුව					
	2023			2022		
	කොටස් ගණන	පිරිවැය රු. '000	සාධාරණ අගය රු. '000	කොටස් ගණන	පිරිවැය රු. '000	සාධාරණ අගය රු. '000
හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී	**12,815,744**	**1,730,274**	**2,169,065**	12,293,280	1,730,274	969,940
ශ්‍රී ලංකා ටෙලිකොම් පීඑල්සී	**–**	**–**	**–**	13,158,700	445,643	894,792
පීපල්ස් ලීසිං ෆිනෑන්ස් පීඑල්සී	**56,438,626**	**832,312**	**603,893**	49,834,269	832,312	282,193
		2,562,586	**2,772,958**		3,008,229	2,146,925

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

23. වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම් (සම්බන්ධයි)

	සමූහය					
	2023			2022		
	කොටස් ගණන	පිරිවැය රු. '000	සාධාරණ අගය රු. '000	කොටස් ගණන	පිරිවැය රු. '000	සාධාරණ අගය රු. '000
හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී	**12,815,744**	**1,730,274**	**2,169,065**	12,293,280	1,730,274	969,940
ශ්‍රී ලංකා ටෙලිකොම් පීඑල්සී	**–**	**–**	**–**	13,158,700	445,643	894,792
පීපල්ස් ලීසිං කම්පනි පීඑල්සී	**56,438,626**	**832,312**	**603,893**	49,834,269	832,312	282,193
ජාතික සංවර්ධන බැංකුව	**18,340**	**1,401**	**1,190**	17,451	1,357	558
කොමර්ෂල් බැංකුව	**241**	**11**	**23**	228	10	11
ලංකා ඔරික්ස් ලීසිං සමාගම	**200**	**1**	**71**	200	1	80
සම්පත් බැංකුව	**11,095**	**325**	**782**	10,827	311	370
වටවල ප්ලාන්ටේෂන් පීඑල්සී	**4,046**	**21**	**292**	4,046	21	299
ට්‍රාන්ස් ඒෂියා හොටෙල් පීඑල්සී	**4,000**	**35**	**156**	4,000	35	180
ලංකා සෙරමික් පීඑල්සී	**917**	**24**	**86**	917	24	91
ලංකා වෝල්ටයිල් පීඑල්සී	**585**	**2**	**25**	585	2	30
කැළණි වැලි ප්ලාන්ටේෂන් පීඑල්සී	**11,000**	**198**	**799**	11,000	198	899
හපුගස්තැන්න ප්ලාන්ටේෂන් පීඑල්සී	**100**	**3**	**3**	100	3	5
එයිටිකන් ස්පෙන්ස් පීඑල්සී	**18,000**	**160**	**2,088**	18,000	160	2,304
පැන්ඒෂියා බැන්ක් පීඑල්සී	**10,298,499**	**96,012**	**196,701**	10,298,499	96,012	97,836
හැටන් ප්ලාන්ටේෂන් පීඑල්සී	**4,000**	**30**	**116**	4,000	30	97
		2,660,810	**2,975,291**		3,106,394	2,249,685

23. (ඉ) නිල ලැයිස්තුගත නොවන ආයෝජන – හිමිකම් සුරකුම්පත්

	බැංකුව					
	2023			2022		
	කොටස් ගණන	පිරිවැය රු. '000	සාධාරණ අගය/ පිරිවැය රු. '000	කොටස් ගණන	පිරිවැය රු. '000	සාධාරණ අගය/ පිරිවැය රු. '000
ආයෝජනය – ණය තොරතුරු කාර්යාංශය	**30,450**	**57,364**	**57,364**	30,450	57,364	57,364
ආයෝජනය – ඇසෝසියේටඩ් නිව්ස් පේපර්ස් සිලෝන් ලිමිටඩ්	**20,000**	**127**	**127**	20,000	127	127
ආයෝජනය – ප්‍රාදේශීය සංවර්ධන බැංකුව (RDB)	**16,452,126**	**164,521**	**199,753**	16,452,126	164,521	109,406
(අඩුකලා:) හානිකරණ ප්‍රතිපාදන		**–**	**–**		–	–
		222,012	**257,244**		222,012	166,897

23. වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම් (සම්බන්ධයි)

	සමූහය					
	2023			2022		
	කොටස් ගණන	පිරිවැය	සාධාරණ අගය/ පිරිවැය	කොටස් ගණන	පිරිවැය	සාධාරණ අගය/ පිරිවැය
		රු. '000	රු. '000		රු. '000	රු. '000
ආයෝජනය – ණය තොරතුරු කාර්යාංශය	**32,093**	**57,528**	**57,528**	32,093	57,528	57,528
ආයෝජනය – ඇසෝසියේටඩ් නිව්ස් පේපර්ස් සිලෝන් ලිමිටඩ්	**20,000**	**127**	**127**	20,000	127	127
ආයෝජනය – ප්‍රාදේශීය සංවර්ධන බැංකුව (RDB)	**16,452,126**	**164,521**	**199,753**	16,452,126	164,521	109,406
ආයෝජනය – ශ්‍රී ලංකා මූල්‍ය සේවා කාර්යාංශය	**200,000**	**2,000**	**2,000**	200,000	2,000	2,000
ප්‍රමුඛ මර්චන්ට් කෝපරේෂන්	**500,000**	**5,000**	**5,000**	500,000	5,000	5,000
ප්‍රයිම් ඩිවෙලොප්මන්ට් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන්ස්	**230,000**	**2,300**	**2,300**	230,000	2,300	2,300
ජනශක්ති ලයිෆ්	**2,500,000**	**25,000**	**25,000**	2,500,000	25,000	25,000
ජනශක්ති හෝල්ඩිංග්ස්	**1,000,000**	**10,000**	**10,000**	1,000,000	10,000	10,000
වණික් ඉන්කෝපරේෂන්	**17,000**	**176**	**176**	17,000	176	176
දළ එකතුව		**266,652**	**301,885**		266,652	211,537
(අඩුකලා:) හානිකරණ ප්‍රතිපාදන		**–**	**(42,476)**		–	(42,476)
ශුද්ධ එකතුව		**266,652**	**259,408**		266,652	169,061

නිල ලැයිස්තුගත නොකළ වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ගණනය කළ හිමිකම් කොටස් සියල්ල (ප්‍රාදේශීය සංවර්ධන බැංකුව හැරුණු විට) ඒවායේ සාධාරණ අගය විශ්වාසනීය ලෙස ඇස්තමේන්තු කල නොහැකි බැවින් පිරිවැයට වාර්තා කර ඇත. මෙම ආයෝජන සඳහා ක්‍රියාකාරී වෙලඳපොළක් නොමැති බැවින් ඒවා දිගුකාලීනව පවත්වා ගනී. නිරීක්ෂණය කරන ලද දත්ත පදනම් කරගෙන ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ කොටස් මත වූ ආයෝජන ඇගයීමේ ආකෘතිය වන සාධාරන අගයට ගණනය කර ඇත.

24 පාලිත සමාගම්වල ආයෝජනයන්

ගිණුම්කරණ ප්‍රතිපත්ති

පාලිත සමාගම්වල ආයෝජන, හානිකරණය වෙනුවෙන් දීමනා අඩු කළ පසු පිරිවැයට ගණනය කර බැංකුවේ මූල්‍ය ප්‍රකාශයන්හි දැක්වේ. කිසියම් හානිකරණ ඇඟවීමක් ඇත්දැයි තීරණය කිරීම පිණිස සෑම වාර්තාකරන දිනකදීම පාලිත සමාගම්වල ශුද්ධ වත්කම්, සමාලෝචනය කරනු ලබයි. කිසියම් හානිකරණයක් සිදුවී ඇති බවට ඇඟිවීමක් වේ නම්, ආයෝජනයේ යළි අයකරගත හැකි අගය ඇස්තමේන්තු කරනු ලබන අතර, ශුද්ධ වත්කම්වල අලාභයෙහි මට්ටමට හානිකරණ අලාභය හඳුනාගනු ලබයි.

දෙසැම්බර් 31 දිනට		2023	2022	2023		2022	
	සටහන	%	%	පිරිවැය රු. '000	තක්සේරුව* රු. '000	පිරිවැය රු. '000	තක්සේරුව* රු. '000
නිල ලැයිස්තුගත නොවන හිමිකම් කොටස්							
එන්.එස්.බී. ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පනි ලිමිටඩ් 100 (එකක් රු. 10 බැගින්වූ සාමාන්‍ය කොටස් 420,000,000)		**100**	100	**4,200,000**	**5,501,307**	4,200,000	3,715,208
ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව (සාමාන්‍ය කොටස් 8,204,464)		**100**	100	**3,111,000**	**8,223,865**	3,111,000	7,108,682
අඩුකලා: හානිකරණ ප්‍රතිපාදන	24.3			**–**	**–**	–	–
ශුද්ධ එකතුව				**7,311,000**	**13,725,172**	7,311,000	10,823,890

* පාලිත සමාගම්වල ආයෝජන පිළිබඳ තක්සේරුකරණය, ශුද්ධ වත්කම් පදනම මත 2023 දෙසැම්බර් 31 දිනට විගණිත මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇත.

24. පාලිත සමාගම්වල ආයෝජනයන් (සම්බන්ධයි)

24.1 පාලිත සමාගම් අත්පත් කර ගැනීම හා විකිණීම.

2023 වර්ෂය තුළ කිසිදු අත්පත් කර ගැනීමක් හෝ විකිණීමක් සිදු කර නොමැත.

24.2 පොළී ආදායම හා අත්පත් කරගැනීමේ ලාභය

2023 වර්ෂය තුළ කිසිදු අත්පත් කර ගැනීමක් හෝ විකිණීමක් සිදු කර නොමැත.

24.3 වර්ෂය තුළ හානිකරණ සංචලන

2023 වර්ෂය තුළ හානිකරණ සංචලන වාර්තා නොවීය.

25 ආශ්‍රිත සමාගම්වල සහ බද්ධ ව්‍යාපාරවල ආයෝජනය

ගිණුම්කරණ ප්‍රතිපත්ති

ආශ්‍රිතයන් යනු සමූහයට සැලකිය යුතු බලපෑමත් ඇති නමුත් ආයෝජකයාගේ බලය හරහා විචල්‍ය ප්‍රතිලාභ පාලනය කල නොහැකි ආයතනයි. අනෙක් ආයතනයේ 20% හෝ ඊට වැඩි ඡන්ද බලය පවතිනම්, සමූහය සැලකිය යුතු බලපෑමක් සිදුකළ හැකි යැයි උපකල්පනය කෙරේ.

ශ්‍රී.ල.ගි.ප්‍ර. 28, ආශ්‍රිත සහ බද්ධ ව්‍යාපාර ආයෝජන, යටතේ ආශ්‍රිතයන්ගේ ආයෝජන හිමිකම් ක්‍රමයට අනුව මූලිකව පිරිවැයට ගිණුම්ගත කළ හැකිවේ. හිමිකම් ක්‍රමය යටතේ ආශ්‍රිතයන්ගේ ආයෝජන පිරිවැයට අමතරව සමූහයේ ශුද්ධ වත්කම් වල අත්පත් කර ගැනීමේ කොටසෙහි වෙනස්කම් සහ මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනයේ වෙනම අයිතමයක් ලෙස වාර්තා කර ඇත. ආශ්‍රිතයන්ගේ මෙහෙයුම්වල ප්‍රතිඵලවල සමූහයේ කොටස ආදායම් ප්‍රකාශයෙන් පිළිබිඹු කරයි. එම ආයෝජකයින්ගේ වෙනත් විස්තීර්ණ ආදායමේ කිසියම් වෙනසක් සමූහයේ වෙනත් විස්තීර්ණ ආදායමේ කොටසක් ලෙස ඉදිරිපත් කරයි. ඊට අමතරව ආශ්‍රිත හිමිකමෙහි සෘජුවම හඳුනාගත් වෙනසක් සිදු වූ විට සමූහය විසින් අදාළ අවස්ථාවන්හිදී අදාළ වෙනස්වීමේ කොටස වෙනත් විස්තීර්ණ ආදායමේ හිමිකම ලෙස හඳුනාගනී. සමූහය සහ ආශ්‍රිතයන් අතර ගනුදෙනුවල ප්‍රතිඵලයක් ලෙස හඳුනා නොගත් ලාභ අලාභ ආශ්‍රිතයාගේ අනුමැතිය පරිදි ඉවත් කෙරේ.

සමූහය සැලකිය යුතු බලපෑමක් සිදු කිරීම අවසන් වන දිනයේ සිට හිමිකම් ක්‍රමය භාවිතය අවසන් කරන අතර එවැනි ආයෝජකයන් ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 09 ක්‍රමය මූල්‍ය උපකරණ අනුව ගිණුම්ගත කරයි. ආශ්‍රිතයන් කෙරෙහි සැලකිය යුතු බලපෑමක් නැති වූ විට සමූහය විසින් රඳවාගත් ආයෝජන මැනීම සහ හඳුනා ගැනීම සාධාරණ අගයට සිදු කරයි. ආශ්‍රිතයාගේ සැලකියයුතු බලපෑමක් ඇති කළ හැකි අලාභයේ සාධාරණ අගය සහ රඳවාගත් ආයෝජනයේ ලාභාලාභ වශයෙන් හඳුනා ගනී.

2023 දෙසැම්බර් 31 දිනට ආශ්‍රිත සමාගම්වල බද්ධ ව්‍යාපාර සඳහා ආයෝජන නොමැත.

26 දේපල, පිරියත සහ උපකරණ

ගිණුම්කරණ ප්‍රතිපත්ති

හඳුනාගැනීමේ පදනම

වත්කමෙහි පිරිවැය විශ්වාසනීය ලෙස ගණනය කළ හැකි නම් සහ වත්කම් හා සබැඳි අනාගත ප්‍රතිලාභ, සමූහය වෙත ගලා ඒමේ සම්භාවිතාවයන් ඇති විටක දේපල, පිරියත හා උපකරණ පොත්වල හඳුනාගනු ලබයි. වත්කම අත්පත් කර ගැනීමට සෘජුවම අදාළ වන පිරිවැයද ඇතුළත්ව දේපල, පිරියත හා උපකරණ මූලිකවම පිරිවැයට ගණනය කරනු ලබයි.

මිනීමේ පදනම

වත්කමක් ලෙස හඳුනා ගැනීමට සුදුසුකම් ලබන දේපල, පිරියත හා උපකරණ අයිතමයක් මුල් වරට එහි පිරිවැයට මනිනු ලබයි. පිරිවැය යන්නට වත්කම අත්පත් කර ගැනීම සඳහා සෘජුව අදාළ කලහැකි පිරිවැය සහ පසුකාලීන පිරිවැය ඇතුලත් වේ. තමන් විසින්ම ඉදිකල වත්කමක පිරිවැය යන්නට සෘජු ද්‍රව්‍ය පිරිවැය, සෘජු ශ්‍රම පිරිවැය සහ වත්කම කළමනාකාරීත්වය විසින් අපේක්ෂිත ආකාරයෙන් ක්‍රියාකරවිය හැකි තත්ත්වයට ගෙන ඒමට සෘජුව අදාළ කලහැකි අනෙකුත් පිරිවැය මෙන්ම වත්කම ස්ථානගත කර ඇති වැඩ බිමෙන් ගලවා දැමීම, ඉවත් කිරීම සහ භූමිය ප්‍රතිසංස්කරණ කිරීම සඳහා වන පිරිවැයෙහි මුල් ඇස්තමේන්තුව සහ ප්‍රාග්ධනිත කරන ලද ණය ගැණුම් පිරිවැය ඇතුළත් වේ. පරිගණක උපකරණවල ක්‍රියාකාරීත්වයේ සංකලිත කොටසක් වන මිලදී ගත් පරිගණක මෘදුකාංග, පරිගණක උපකරණ යටතේ ප්‍රාග්ධනිත කරයි.

දේපල, පිරියත හා උපකරණ අයිතමයක කොටස් විවිධ වූ ඵලදායී ජීවකාල වලින් යුක්ත වන විට එම කොටස් වෙන් වෙන් වූ දේපල, පිරියත හා උපකරණ අයිතමයන් ලෙස හඳුනාගනු ලැබේ.

26. දේපල, පිරියත සහ උපකරණ (සම්බන්ධයි)

පිරිවැය ආකෘතිය

සින්නක්කර ඉඩම් හා ගොඩනැගිලි හැරුණුවිට සෙසු දේපල, පිරියත හා උපකරණ සඳහා සමූහය විසින් පිරිවැය ආකෘතිය උපයෝගී කරගනු ලබන අතර, මිලදී ගැනීමේ හෝ ඉදිකිරීමේ පිරිවැය සහ ඒ සම්බන්ධ අමතර පිරිවැයද ඇතුලත්ව, සමුච්චිත ක්ෂය හා සමුච්චිත හානිකරණ අලාභ අඩුකල පසු අගයට වාර්තා කරනු ලබයි.

ප්‍රත්‍යාගණන ආකෘතිය

සමූහය විසින් සමස්ත සින්නක්කර ඉඩම් හා ගොඩනැගිලි කාණ්ඩයටම ප්‍රත්‍යාගණන ආකෘති උපයෝගි කරගනු ලබයි. ප්‍රත්‍යාගණනය කරනු ලබන දිනට වත්කමෙහි සාධාරණ අගයෙන් පසුකාලීනව සමුච්චිත ක්ෂය සහ සමුච්චිත හානිකරණ අලාභයන් අඩුකල පසු අගය වන ප්‍රත්‍යාගණිත අගයට එම දේපල පවත්වාගෙන යනු ලබයි. වාර්තාකරන දිනට ඇති සාධාරණ අගය හා ධාරණ අගය අතර සැලකියයුතු වෙනසක් නොමැති බව සහතික කරනු වස් චක්‍රීය පදනම මත සමූහයෙහි සින්නක්කර ඉඩම් හා ගොඩනැගිලි සෑම තෙවසරකටම වරක් ප්‍රත්‍යාගණනය කරනු ලබයි.

මෙබඳු වාතාවරණයක් යටතේ, ඇතිවන ඉහළයාම පෙර ලියා හැරීමේ අගය දක්වා ආදායමක් ලෙස වාර්තා කරනු ලබයි. ධාරණ අගයෙහි යම් අඩුවීමක් වේ නම්, එය ආදායම් ප්‍රකාශයෙහි වියදමක් ලෙස හඳුනා ගත යුතුය. කෙසේ වුවද එම වත්කමට අදාළව ප්‍රත්‍යාගණන සංචිතයෙහි පවතින යම් බැර ශේෂයක් වේ නම් එම අගය තෙක් ප්‍රත්‍යාගණය අඩුවීමක් වෙනත් විස්තීර්ණ ආදායම් වෙත හර කරනු ලබයි. වෙනත් විස්තීර්ණ ආදායම් හි වාර්තා කරනු ලබන එම අඩුවීම මගින් ප්‍රත්‍යාගණන සංචිත යටතේ සමුච්චිත හිමිකම් වල අගය අඩුවෙයි. යම් වත්කමකට අදාළව ප්‍රත්‍යාගණන සංචිතයෙහි ඉතිරි වන යම් ශේෂයක් වේ නම්, එය විශ්‍රාම යාම මත හෝ එම වත්කම් ඉවත් කිරීම මත රඳවාගනු ලබන ඉපයීම් වෙත සෘජුවම මාරු කරනු ලබයි.

හඳුනාගැනීම අත්හැරීම

විකුණා බැහැර කිරීමේදි හෝ එය පාවිච්චි කිරීමෙන් අනාගත ප්‍රතිලාභ කිසිවක් අපේක්ෂා නොකරන විට දේපල, පිරියත හා උපකරණ පොත් වලින් ඉවත් කරනු ලැබේ. වත්කම් ඉවත් කිරීමේදි පැන නඟින කිසියම් ලාභයක් හෝ අලාභයක් (වත්කමෙහි ධාරණ අගය සහ බැහැරලීමේ ශුද්ධ අගය අතර වෙනස ලෙස ගණනය කෙරෙයි) එම වර්ෂය තුළ ආදායම් ප්‍රකාශයෙහි වෙනත් මෙහෙයුම් ආදායම් යටතේ හඳුනාගනු ලබයි.

ප්‍රාග්ධනිත කල හැකි කෙරීගෙන යන වැඩ

ප්‍රාග්ධනිත කිරීමට අපේක්ෂා කරන, ගොඩනැගිලි ඉදිකිරීම්, ප්‍රධාන යන්ත්‍රෝපකරණ සහ පද්ධති වැඩි දියුණු කිරීම සඳහා දරන ලද ප්‍රාග්ධන ස්වභාවයේ වියදම් මේ යටතට අයත් වේ. මේවා මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ සමුච්චිත හානිකරණ අලාභ අඩු කරන ලද පිරිවැයට දක්වා ඇත. කළමනාකාරීත්වය විසින් අපේක්ෂිත ආකාරයට ක්‍රියා කල හැකි තත්ත්වයට සහ ස්ථානයට පත්වූ පසු එම ප්‍රාග්ධනිත කළ හැකි කෙරීගෙන යන වැඩ, අදාළ වත්කම වෙත මාරු කරනු ලැබේ.

ණය පිරිවැය

සමූහය විසින් දේපළ, පිරියත හා උපකරණ අත්පත් කර ගැනීමට අදාළ ප්‍රාග්ධනිත කළහැකි ණය පිරිවැය නොවීය.

කුලියට/බදු දීම සඳහා ගොඩනැගිලිවලට සිදුකරනු ලබන වැඩිදියුණු කිරීම්

2017.01.01 දින සිට කුලියට/බදු දීම සඳහා ගොඩනැගිලිවලට සිදුකරනු ලබන වැඩිදියුණු කිරීම් ප්‍රාග්ධනිත කිරීම සඳහා බැංකුව විසින් තීරණය කර ඇත. එදින සිට බලපැවැත්වෙන පරිදි බදු කාලසීමාව තුළදී එකී වැඩිදියුණු කිරීම් ක්‍රමක්ෂය කරනු ලැබේ.

26. දේපල, පිරියත සහ උපකරණ (සම්බන්ධයි)

ක්ෂයවීම්

දේපල පිරියත සහ උපකරණ පිරිවැය, ඒවායේ තක්සේරු කළ ඵලදායී ජීවකාලය තුළ අවශේෂ වටිනාකම දක්වා සරළ මාර්ග ක්‍රමය උපයෝගී කරගනිමින්, ක්ෂයවීම් ගණනය කර ලාභ/අලාභ යටතේ වාර්තා කරනු ලබයි. ඉඩම් වල ක්ෂයවීමක් නොසැලකෙයි. හඳුනාගනු ලැබූ වත්කම් කාණ්ඩවලට අදාළ ක්ෂයවීම් අනුපාතික පහතින් දක්වා ඇත.

වත්කම් වර්ගය	ක්ෂයවීම් කාලය
කල්බදු දේපල, කුලියට/බදු දීම සඳහා සිදුකරනු ලබන වැඩිදියුණු කිරීම්	බදු කාලසීමාව තුළදී
සිත්නක්කර ගොඩනැගිලි	වසර 20 – 50
කාර්යාල හා විවිධ උපකරණ සහ ලීබඩු හා සවිකිරීම්	වසර 5 – 10
මෝටර් වාහන	වසර 5
පරිගණක දෘඩාංග	වසර 4 – 5
පරිගණක මෘදුකාංග	වසර 4 – 5

සමූහය විසින් පරිහරණය කිරීමට හැකි දින සිට භාවිතයෙන් ඉවත් කරන දිනය දක්වා ක්ෂයවීම් ප්‍රතිපාදනය කරයි.

26. (අ) දේපල, පිරියත සහ උපකරණ – බැංකුව – 2023

	ඉඩම් හා ගොඩනැගිලි	බදු දේපල, කුලියට/බදු දීම සඳහා වැඩිදියුණු කරන ලද ගොඩනැගිලි	පරිගණක දෘඩාංග	කාර්යාලීය හා විවිධ උපකරණ, ලී බඩු හා සවිකිරීම්	මෝටර් රථවාහන	කෙරීගෙන යන වැඩ–ගොඩනැගිලි	එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
පිරිවැය/සාධාරණ අගය							
2023 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය	**12,603,413**	**868,735**	**3,821,259**	**2,544,477**	**447,254**	**63,351**	**20,348,490**
එකතු කිරීම්	**21,208**	**90,730**	**1,041,511**	**54,111**	**–**	**17,477**	**1,225,037**
ප්‍රත්‍යාගණන ලාභය/(අලාභ) (සටහන 26 ඇ)	**1,801,405**	**–**	**–**	**–**	**–**	**–**	**1,801,405**
ලියාහැරීම්	**–**	**–**	**–**	**–**	**–**	**–**	**–**
ඉවත් කිරීම්	**–**	**–**	**(126,401)**	**(9,699)**	**(1,838)**	**–**	**(137,938)**
මාරු කිරීම්/ගැලපීම්	**(3,026)**	**(30,906)**	**–**	**(16,054)**	**–**	**(32,968)**	**(82,954)**
2023 දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය	**14,423,000**	**928,559**	**4,736,369**	**2,572,835**	**445,416**	**47,860**	**23,154,039**
අඩුකළා: සමුච්චිත ක්ෂයවීම්							
2023 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය	**186,965**	**308,772**	**2,944,334**	**1,701,654**	**415,761**	**–**	**5,557,486**
වර්ෂය තුල අයකිරීම්	**90,661**	**50,137**	**407,292**	**156,736**	**21,966**	**–**	**726,792**
ප්‍රත්‍යාගණිත වත්කම් සඳහා ක්ෂයවීම් ගැලපීම්	**(277,626)**	**–**	**–**	**–**	**–**	**–**	**(277,626)**
ඉවත් කිරීම්	**–**	**–**	**(126,100)**	**(8,874)**	**(1,838)**	**–**	**(136,812)**
මාරු කිරීම්/ගැලපීම්	**–**	**–**	**7**	**1**	**–**	**–**	**8**
2023 දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය	**–**	**358,909**	**3,225,533**	**1,849,517**	**435,889**	**–**	**5,869,849**
අඩුකළා: හානිකරණය	**–**	**–**	**–**	**–**	**–**	**35,228**	**35,228**
2023 දෙසැම්බර් 31 දිනට ශුද්ධ පොත් අගය	**14,423,000**	**569,650**	**1,510,836**	**723,317**	**9,527**	**12,631**	**17,248,961**

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

26. දේපල, පිරියත සහ උපකරණ (සම්බන්ධයි)

26. (අ) දේපල, පිරියත සහ උපකරණ – බැංකුව – 2022

	ඉඩම් හා ගොඩනැගිලි	බදු දේපල, කුලියට/බදු දීම සඳහා වැඩිදියුණු කරන ලද ගොඩනැගිලි	පරිගණක උපාංග	කාර්යාලීය හා විවිධ උපකරණ, ලී බඩු හා සවිකිරීම්	මෝටර් රථවාහන	කෙරීගෙන යන වැඩ–ගොඩනැගිලි	එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
පිරිවැය/සාධාරණ අගය							
2022 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය	12,568,468	857,321	3,492,162	2,538,770	448,748	49,341	19,954,810
එකතු කිරීම්	34,945	13,085	287,265	149,204	–	51,500	535,998
ප්‍රත්‍යාගණන ලාභය/(අලාභ)	–	–	–	–	–	–	–
ප්‍රත්‍යාගණිත වත්කම් සඳහා ක්ෂයවීම් ගැලපීම්	–	–	–	–	–	–	–
ඉවත් කිරීම්	–	–	(63,706)	(5,186)	(1,494)	–	(70,386)
මාරු කිරීම්/ගැලපීම්	–	(1,670)	105,539	(138,311)	–	(37,489)	(71,932)
2022 දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය	12,603,413	868,735	3,821,259	2,544,477	447,254	63,351	20,348,490
අඩුකළා: සමුච්චිත ක්ෂයවීම්							
2022 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය	96,557	249,464	2,589,236	1,546,680	392,027	–	4,873,963
වර්ෂය තුල අයකිරීම්	90,408	59,308	416,670	159,064	25,228	–	750,678
ප්‍රත්‍යාගණිත වත්කම් සඳහා ක්ෂයවීම් ගැලපීම්	–	–	–	–	–	–	–
ඉවත් කිරීම්	–	–	(61,571)	(4,090)	(1,494)	–	(67,155)
මාරු කිරීම්/ගැලපීම්	–	–	–	–	–	–	–
2022 දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය	186,965	308,772	2,944,334	1,701,654	415,761	–	5,557,486
අඩුකළා: හානිකරණය	–	–	–	–	–	35,228	35,228
2022 දෙසැම්බර් 31 දිනට ශුද්ධ පොත් අගය	12,416,447	559,963	876,925	842,823	31,493	28,122	14,755,775

26. දේපල, පිරියත සහ උපකරණ (සම්බන්ධයි)

26. (අ) දේපල, පිරියත සහ උපකරණ – සමූහය – 2023

	ඉඩම් හා ගොඩනැගිලි	බදු දේපල, කුලියට/බදු දීම සඳහා වැඩිදියුණු කරන ලද ගොඩනැගිලි	පරිගණක දෘඩාංග	කාර්යාලීය හා විවිධ උපකරණ, ලී බඩු හා සවිකිරීම්	මෝටර් රථවාහන	කෙරීගෙන යන වැඩ ගොඩනැගිලි	එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
පිරිවැය/සාධාරණ අගය							
2023 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය	**13,468,125**	**873,811**	**3,887,883**	**2,604,330**	**494,199**	**63,351**	**21,391,701**
එකතු කිරීම්	**21,208**	**90,730**	**1,042,178**	**55,703**	**–**	**17,477**	**1,227,295**
ප්‍රත්‍යාගණන ලාභය/(අලාභ)	**2,058,968**	**–**	**–**	**–**	**–**	**–**	**2,058,968**
ලියාහැරීම්	**–**	**–**	**(5,637)**	**(14,995)**	**–**	**–**	**(20,633)**
ආයෝජන දේපළ මාරු කිරීම්	**–**	**–**	**–**	**–**	**–**	**–**	**–**
මාරු කිරීම්/ගැලපීම්	**(3,026)**	**(30,906)**	**–**	**(16,054)**	**–**	**(32,968)**	**(82,954)**
2023 දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය	**15,545,275**	**933,635**	**4,798,023**	**2,619,285**	**492,361**	**47,860**	**24,436,439**
අඩුකළා: සමුච්චිත ක්ෂයවීම්							
2023 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය	**193,440**	**308,773**	**2,996,830**	**1,756,131**	**455,567**	**–**	**5,710,741**
වර්ෂය තුල අයකිරීම්	**91,036**	**50,137**	**412,398**	**158,212**	**24,346**	**–**	**736,129**
ප්‍රත්‍යාගණිත වත්කම් සඳහා ක්ෂයවීම් ගැලපීම්	**(277,626)**	**–**	**–**	**–**	**–**	**–**	**(277,626)**
ලියාහැරීම්	**–**	**–**	**(5,636)**	**(14,993)**	**–**	**–**	**(20,629)**
ඉවත් කිරීම්	**–**	**–**	**(126,100)**	**(8,874)**	**(1,838)**	**–**	**(136,812)**
2023 දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය	**6,850**	**358,910**	**3,277,499**	**1,890,477**	**478,075**	**–**	**6,011,811**
අඩුකළා: හානිකරණය	**–**	**–**	**–**	**–**	**–**	**35,228**	**35,228**
2023 දෙසැම්බර් 31 දිනට ශුද්ධ පොත් අගය	**15,538,425**	**574,725**	**1,520,524**	**728,808**	**14,286**	**12,632**	**18,389,400**

26. දේපල, පිරියත සහ උපකරණ (සම්බන්ධයි)

26. (ආ) දේපල, පිරියත සහ උපකරණ – සමූහය – 2022

	ඉඩම් හා ගොඩනැගිලි	බදු දේපල, කුලියට/බදු දීම සඳහා වැඩිදියුණු කරන ලද ගොඩනැගිලි	පරිගණක දෘඩාංග	කාර්යාලීය හා විවිධ උපකරණ, ලී බඩු හා සවිකිරීම්	මෝටර් රථවාහන	කෙරීගෙන යන වැඩ–ගොඩනැගිලි	එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
පිරිවැය/සාධාරණ අගය							
2022 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය	13,441,880	862,397	3,555,263	2,598,533	497,893	49,341	21,005,308
එකතු කිරීම්	34,945	13,085	290,787	149,294	–	51,500	539,610
ප්‍රත්‍යාගණන ලාභය/(අලාභ)	–	–	–	–	–	–	–
ලියාහැරීම්	–	–	–	–	–	–	–
ප්‍රත්‍යාගණිත වත්කම් සඳහා ක්ෂයවීම් ගැලපීම්	–	–	–	–	–	–	–
ඉවත් කිරීම්	(8,700)	–	(63,706)	(5,186)	(3,694)	–	(81,286)
ආයෝජන දේපළ මාරු කිරීම්	–	–	–	–	–	–	–
මාරු කිරීම්/ගැලපීම්	–	(1,670)	105,539	(138,311)	–	(37,489)	(71,932)
2022 දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය	13,468,125	873,811	3,887,883	2,604,330	494,199	63,351	21,391,701
අඩුකළා: සමුච්චිත ක්ෂයවීම්							
2022 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය	102,657	249,465	2,637,132	1,599,669	431,653	–	5,020,575
වර්ෂය තුල අයකිරීම්	90,783	59,308	421,269	160,552	27,608	–	759,521
ප්‍රත්‍යාගණිත වත්කම් සඳහා ක්ෂයවීම් ගැලපීම්	–	–	–	–	–	–	–
ඉවත් කිරීම්	–	–	(61,571)	(4,090)	(3,694)	–	(69,355)
මාරු කිරීම්/ගැලපීම්	–	–	–	–	–	–	–
2022 දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය	193,440	308,773	2,996,830	1,756,131	455,567	–	5,710,741
අඩුකළා: හානිකරණය	–	–	–	–	–	35,228	35,228
2022 දෙසැම්බර් 31 දිනට ශුද්ධ පොත් අගය	13,274,685	565,038	891,053	848,199	38,632	28,122	15,645,732

26. (ඇ) ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය/සාධාරණ තක්සේරුව

සෑම වසර 03 කට වරක් වෘත්තීමය වශයෙන් සුදුසුකම්ලත් ස්වාධීන තක්සේරුකරුවන් විසින් බැංකුවෙහි ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කරන ලදී. ඒ අනුව 2023.12.31 දින ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කර එදිනට රු. මිලියන 2,076 ක ප්‍රත්‍යාගණන අගයන් මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කරන ලදී.

26. (ඈ) බැංකුවේ ඉඩම් හා ගොඩනැගිලි

2023.12.31 දිනට ඉඩම් හා ගොඩනැගිලි ශේෂයට රු. මිලියන 10.975 ක සින්නක්කර ඉඩම් අගයක් ඇතුළත්ය.

26. (ඉ) වගකීම් සඳහා ඇප ලෙස සහතික කරන ලද දේපල, පිරියත හා උපකරණ

දේපල, පිරියත හා උපකරණ කිසිවක් වගකීම් සඳහා ඇප වශයෙන් තබා නොමැත.

26. දේපල, පිරියත සහ උපකරණ (සම්බන්ධයි)

26. (ඊ) සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද දේපල, පිරියත හා උපකරණ

වාර්තාකරණ දින දක්වා භාවිතයේ පවතින සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද දේපල, පිරියත හා උපකරණවල මූලික පිරිවැය පහත දක්වා ඇති පරිදි වේ.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2023 රු. '000**	2022 රු. '000	**2023 රු. '000**	2022 රු. '000
පරිගණක දෘඩාංග	**2,200,393**	1,690,532	**2,239,676**	1,694,868
කාර්යාල උපකරණ, ලී බඩු හා සවිකිරීම්	**596,463**	566,574	**627,088**	568,024
විවිධ උපකරණ/මෝටර් රථවාහන සහ වෙනත් දෑ	**753,792**	749,044	**799,350**	749,044
එකතුව	**3,550,648**	3,006,150	**3,666,114**	3,011,937

27 පරිහරණය කිරීමේ අයිතිය හිමි වත්කම්

ගිණුම්කරණ ප්‍රතිපත්ති

සමූහයේ පරිහරණය කිරීමේ අයිතිය හිමි වත්කම් ප්‍රාග්ධනීත කල්බදු ගිවිසුමෙහි වටිනාකමින් සමන්විතය.

හඳුනාගැනීමේ පදනම

කල්බදු ආරම්භක දිනට (කල්බදු ගිවිසුමෙහි නිශ්චිතව දක්වා ඇති දින පරිදි) පරිහරණය කිරීමේ අයිතිය හිමි වත්කම් එනම් කල්බදු කාලසීමාව තුළ සිදු කළයුතු කල්බදු ගෙවීම්වල වත්මන් අගය සමූහය විසින් හඳුනාගනු ලැබෙයි.

මැනීමේ පදනම

ඕනෑම සමුච්චිත ක්ෂයවීම් හා හානිකරණ පාඩු අඩුකර, කල්බදු වගකීම්වල කිසියම් ප්‍රතිමිනීම් සඳහා ගැලපීම් සිදුකර පරිහරණය කිරීමේ අයිතිය හිමි වත්කම් පිරිවැයට මනිනු ලැබෙයි. හඳුනාගත් කල්බදු වගකීම්වල අගය හා ලද කල්බදු දීමනා අඩුකර, ආරම්භක දිනට හෝ ඊට පෙර සිදුකළ කල්බදු ගෙවීම්, පරිහරණය කිරීමේ අයිතිය හිමි වත්කම්වලට ඇතුළත්ය.

ඵලදායී ජීවකාලය හා ක්‍රමක්ෂය වීම්

කල්බදු කාලසීමාව අවසානයේදී කල්බදු වත්කමෙහි හිමිකාරිත්වය ලබාගැනීමට පිළිගත හැකි සහතිකයක් බැංකුව සතුවේ නම්, හැර කල්බදු කාලසීමාව හා අපේක්ෂිත ඵලදායී ජීවකාලය යන්නෙන් කෙටි කාලසීමාව තුළ හඳුනාගත් පරිහරණය කිරීමේ අයිතිය හිමි වත්කම්, සරල රේඛීය පදනමක් මත ක්ෂය කරනු ලැබේ. පරිහරණය කිරීමේ අයිතිය හිමි වත්කම්, හානිකරණයට බඳුන්වෙයි.

27. (අ) පරිහරණය කිරීමේ අයිතිය හිමි වත්කම්හි ප්‍රාග්ධනීත අගය

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2023 රු. '000**	2022 රු. '000	**2023 රු. '000**	2022 රු. '000
ආරම්භක ශේෂය	**2,403,399**	2,043,296	**2,469,647**	2,109,545
එකතු කිරීම්	**293,958**	340,271	**293,958**	340,271
ගැලපීම්	**15,910**	19,831	**15,910**	19,831
අඩුකළා				
ඉවත්කිරීම්	**–**	–	**–**	–
අවසන්කිරීම්/මාරුකිරීම්	**–**	–	**–**	–
හානිකරණය	**–**	–	**–**	–
අවසාන ශේෂය	**2,713,267**	2,403,399	**2,779,515**	2,469,647

27. පරිහරණය කිරීමේ අයිතිය හිමි වත්කම් (සම්බන්ධයි)

27. (ආ) පරිහරණය කිරීමේ අයිතිය හිමි වත්කම්හි සමුච්චිත ක්ෂය

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2023** **රු. '000**	2022 රු. '000	**2023** **රු. '000**	2022 රු. '000
ආරම්භක ශේෂය	**1,189,749**	837,380	**1,223,265**	865,407
වර්ෂය සඳහා අයකිරීම්	**358,923**	352,370	**363,090**	357,858
ඉවත්කිරීම්	**–**	–	**–**	–
ගැලපීම්	**–**	–	**–**	–
අවසන්කිරීම්/මාරුකිරීම්	**–**	–	**–**	–
අවසාන ශේෂය	**1,548,672**	1,189,749	**1,586,354**	1,223,265
දෙසැම්බර් 31 දිනට ධාරණ වටිනාකම	**1,164,595**	1,213,649	**1,193,161**	1,246,383

28 දේපළ ආයෝජන

ගිණුම්කරණ ප්‍රතිපත්ති

ඉපැයීමට රඳවාගත් කුලී හෝ ප්‍රාග්ධන ඇගයීම් හෝ ගොඩනැගිල්ලක කොටසක් හෝ ද්විත්වයම දේපළ ආයෝජන ලෙස වර්ගීකරණය කෙරෙයි.

පිරිවැය ආකෘතිය

ගනුදෙනු පිරිවැය ඇතුළත්ව ගොඩනැගිලි ආයෝජන හැර දේපළ ආයෝජන (මූලිකව) පිරිවැයට (ල.ගි.ප්‍ර.40 – 56 වගන්තිය) මනිනු ලබයි. කළමනාකාරිත්වය විසින් දේපළ ආයෝජනවල සාධාරණ අගය වාර්ෂික පදනම මත මනිනු ලබන අතර එය මූල්‍ය ප්‍රකාශනවල සටහන් යටතේ වෙනම දක්වනු ලබයි.

සාධාරණ වටිනාකම

යම් පසුකාලීන සමුච්චිත ක්ෂයවීම් හා පසුකාලීන සමුච්චිත හානිකරණ පාඩු අඩු කළ පසු ප්‍රත්‍යාගණිත දිනට සාධාරණ අගය වන හා ඒවායෙහි සාධාරණ වටිනාකම පිළිගත හැකි අයුරකින් මැනිය හැකි ඉඩම් ආයෝජන ලෙස හඳුනාගැනීමෙන් අනතුරුව ප්‍රත්‍යාගණිත අගයට සලකනු ලැබේ. සෑම වසර 3කට වරක්ම ධාරණ අගය, වාර්තාකරණ කාලසීමාව අවසානයේදී සාධාරණ වටිනාකම උපයෝගී කර ගනිමින් තීරණය කරගත හැකි, සැලකිය යුතු ලෙස නොවෙනස් වන බවට වගබලා ගනු පිණිස ප්‍රත්‍යාගණනය කෙරෙයි. කල්බදු සීමාව තුළ සරල රේඛීය පදනමක් මත ලැබිය හැකි කුලී පැතිරී පවතී. කල්බදු කාලසීමාව තුළදී දිරිමත් කිරීම්, කල්බදු ලබන්නෙකුහට ලබාදෙන අවස්ථාවකදී මෙම පදනම යටතේ කුලී ආදායම හඳුනාගැනීමේ ප්‍රතිඵල ලෙස දේපළ ආයෝජනවල ධාරණ අගයෙන් වෙන් වෙන් වත්කම් ලෙස වාර්තා කරනු ලබන අගයන් ඉවත් කෙරෙයි.

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

28. දේපළ ආයෝජන (සම්බන්ධයි)

28. (අ) දේපළ ආයෝජනවල සාධාරණ අගය

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2023** රු. '000	2022 රු. '000	**2023** රු. '000	2022 රු. '000
ඉඩම්				
ආරම්භක ශේෂය	**–**	–	**195,785**	201,385
එකතු කිරීම්	**–**	–	**–**	–
ඉවත්කිරීම්	**–**	–	**–**	(5,600)
ප්‍රත්‍යාගණන ලාභය	**–**	–	**145,215**	–
දේපළ, පිරියත හා උපකරණ වලින් මාරුකිරීම්	**–**	–	**–**	–
දේපළ, පිරියත හා උපකරණ වෙත මාරුකිරීම්	**–**	–	**–**	–
හානිකරණය	**–**	–	**–**	–
අවසාන ශේෂය	**–**	–	**341,000**	195,785
ගොඩනැගිලි				
ආරම්භක ශේෂය	**–**	–	**9,192**	9,192
එකතු කිරීම්	**–**	–	**–**	–
ප්‍රත්‍යාගණන ලාභය	**–**	–	**(1,192)**	–
දේපළ, පිරියත හා උපකරණ වලින් මාරුකිරීම්	**–**	–	**–**	–
දේපළ, පිරියත හා උපකරණ වෙත මාරුකිරීම්	**–**	–	**–**	–
හානිකරණය	**–**	–	**–**	–
අවසාන ශේෂය	**–**	–	**8,000**	9,192

28. (ආ) දේපළ ආයෝජනවල සමුච්චිත ක්ෂය

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2023** රු. '000	2022 රු. '000	**2023** රු. '000	2022 රු. '000
ආරම්භක ශේෂය	**–**	**–**	**–**	**–**
වර්ෂය සඳහා අයකිරීම්	**–**	**–**	**–**	**–**
දේපළ, පිරියත හා උපකරණ වලින් මාරුකිරීම්	**–**	**–**	**–**	**–**
දේපළ, පිරියත හා උපකරණ වෙත මාරුකිරීම්	**–**	**–**	**–**	**–**
අවසාන ශේෂය	**–**	**–**	**–**	**–**
දෙසැම්බර් 31 දිනට ශුද්ධ පොත් අගය	**–**	**–**	**349,000**	204,977

දේපල ආයෝජනවල සාධාරණ අගයෙහි වැඩිවීම වෙනත් මෙහෙයුම් ආදායම් යටතේ හඳුනාගෙන ඇත.

ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව, සෑම වසර 03 කට වරක් දේපළ ආයෝජන යළි මැනීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කෙරෙයි. එහෙයින් ල.ගි.ප්‍ර. 40 අනුව දේපළ ආයෝජන, සාධාරණ අගයට මනිනු ලබන අතර, සෑම වසර 03 කට වරක්ම ප්‍රත්‍යාගණනය කෙරෙයි.

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

29 කීර්තිනාමය සහ අස්පෘශ්‍ය වත්කම්

ගිණුම්කරණ ප්‍රතිපත්ති

මිලදී ගත් පරිගණක මෘදුකාංගවල වටිනාකම සමූහයේ අස්පෘශ්‍ය වත්කම් ගණනයට ඇතුළත් වේ.

හඳුනාගැනීමේ පදනම

අස්පෘශ්‍ය වත්කමක් හඳුනාගනු ලබන්නේ, එහි පිරිවැය විශ්වසනීය ලෙස මැනීමට හැකි විට සහ ඊට අදාළව අනාගතයේදී අපේක්ෂිත ආර්ථික ප්‍රතිලාභ සමූහයට ගලා ඒමේ භව්‍යතාවයක් ඇති විටදීය.

මැනීමේ පදනම

වෙන් වෙන්ව අත්පත් කර ගන්නා අස්පෘශ්‍ය වත්කම් මුල් වරට හඳුනා ගැනිමේදී අගය කරනු ලබන්නේ ඒවායේ පිරිවැයටයි. ව්‍යාපාර සංයෝජනයේදී අත්පත් කර ගත් අස්පෘශ්‍ය වත්කම් වල පිරිවැය වනුයේ එසේ අත්පත් කර ගත් දිනට ඒවායේ සාධාරණ අගයයි. මූලික හඳුනාගැනීමෙන් අනතුරුව අස්පෘශ්‍ය වත්කම් පිරිවැයෙන් සමුච්චිත ක්‍රමක්ෂය සහ යම් සමුච්චිත ප්‍රත්‍යාගණන හානිකරණ අලාභයක් අඩු කල පසු අගයට ඉදිරියට ගෙනයා යුතුයි.

ඵලදායී ජීවකාලය හා ක්‍රමක්ෂය වීම්

සමූහය අස්පෘශ්‍ය වත්කම්වල ඵලදායී ජීවකාලය සීමිත හෝ අසීමිත ද යන්න තක්සේරු කරනු ලබයි. සීමිත ජීව කාලයකින් යුත් අස්පෘශ්‍ය වත්කම් ඒවායේ ඵලදායී ජීව කාලය තුළ ක්‍රමක්ෂය කරනු ලබයි. සීමිත ජීව කාලයක් ඇති අස්පෘශ්‍ය වත්කමක ක්‍රමක්ෂය කාලපරිච්ඡේදය සහ ක්‍රමක්ෂය, ක්‍රමය අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදීම සමාලෝචනය කළ යුතුවේ. වත්කම්වල අපේක්ෂිත ඵලදායී ජීව කාලයක් හෝ වත්කම් වල අන්තර්ගත අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ පාරිභෝජන රටාවේ වෙනස්වීම් සඳහා ගිණුම් තබනු ලබන්නේ සුදුසු පරිදි ක්‍රමක්ෂය කාලසීමාව හෝ ක්‍රමක්ෂය ක්‍රමය වෙනස් කිරීමෙනි. මේවා ගිණුම්කරණ ඇස්තමේන්තු වල වෙනස්කම් වශයෙන් සලකනු ලැබේ. සීමිත ජීව කාලයක් ඇති අස්පෘශ්‍ය වත්කම්වල ක්‍රමක්ෂය වියදම ආදායම් ප්‍රකාශනයේ අදාල අස්පෘශ්‍ය වත්කම්වල කාර්යයට අනුරූප වියදම් කාණ්ඩය යටතේ හඳුනාගනු ලබයි.

හඳුනා ගැනීම අත්හැරීම

අසීමිත ඵලදායී ජීවකාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් සමූහය සතුව නොපවතී. සමූහයේ පරිගණක මෘදුකාංගවල තක්සේරු කරන ලද ඵලදායී ජීවකාලය වසර 4 හෝ 5 කි. (වාර්ෂිකව 20% සිට 25% බැගින්) අස්පෘශ්‍ය වත්කම් ඉවත් කිරීමෙන් හෝ භාවිතා කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විට බැහැර කිරීම සඳහා හඳුනාගනු ලබයි.

බැහැර කිරීමේදී හඳුනාගත් වත්කම් මත යම් ලාභයක් හෝ අලාභයක් පැන නගීනම් (ඉවත් කිරීමේ වටිනාකම හා ඉදිරියට ගෙනයනු ලබන වටිනාකම අතර වෙනස) අදාල හඳුනාගත් වර්ෂයේ ආදායම් ප්‍රකාශයේ "වෙනත් මෙහෙයුම් ආදායම්" තුල හඳුනාගෙන ඇත.

කීර්තිනාමය

කීර්තිනාමය මූලිකව පිරිවැයට අගය කරනු ලබයි. හුවමාරු ගැණුම් ප්‍රතිෂ්ඨාව, අත්පත් කරගැනීමට භාජනය වන්නාගේ පාලනයට යටත් නොවන හිමිකම් වටිනාකම සහ කලින් දරණ ලද ස්කන්ධ හිමිකමෙහි අත්පත් කරගන්නා දිනට සාධාරණ වටිනාකම යන සමාහාරයට අතිරික්තව ඇති අත්පත් කරගන්නා දිනට හඳුනාගතහැකි, අත්පත්කරගත් වත්කම් සහ පවරාගත් වගකීම්වල ශුද්ධ අගය කීර්තිනාමය ලෙස මූලිකව හඳුනාගැනේ.

මූලිකව හඳුනාගැනීමෙන් පසුව කීර්තිනාමය මනිනු ලබන්නේ පිරිවැයෙන් සමුච්චිත හානිකරණ පාඩු අඩුකිරීමෙනි. පසුකාලීන මිනුම්කරණයේදී කීර්තිනාමය අත්පත්කරගත් දිනට හඳුනාගත් පිරිවැයේ යම් සමුච්චිත හානිකරණ අලාභ ඇතොත් අඩුකර මිනුම්කරයි. හානිකරණ පරීක්ෂා කිරීමේ අරමුණු සඳහා ව්‍යාපාර සංයෝජනයකදී අත්පත් කරගත් කීර්තිනාමය අත්පත් කරගත් දිනයේ සිට අත්කරගන්නාසේ වෙනත් වත්කම් හෝ වගකීම් මුදල් උත්පාදන ඒකක වලට පවරා තිබේද යන්න නොසලකා සංයෝජනය නිසා අපේක්ෂිත ප්‍රතිලාභ ලබන සෑම මුදල් උත්පාදන ඒකක වලට කීර්තිනාමය බෙදාහැරිය යුතුය.

පරිගණක මෘදුකාංග

සමූහය මිලදීගත් පරිගණක මෘදුකාංග එහි පිරිවැයෙන් සමුච්චිත ක්‍රමක්ෂය සහ යම් සමුච්චිත හානිකරණ අලාභයන් අඩුකිරීමෙන් පසු අගයට අගය කරනු ලබයි. අභ්‍යන්තර උත්පාදිත මෘදුකාංග සඳහා වන වියදම වත්කමක් ලෙස හඳුනාගත හැක්කේ සමූහය විසින් එම මෘදුකාංගය අනාගත අපේක්ෂිත ආර්ථික ප්‍රතිලාභ ලබාගත හැකි පරිද්දෙන් සම්පූර්ණ කර භාවිතයට ගැනීමේ අභිප්‍රාය සහ ශක්‍යතාවය තහවුරු කිරීම මත සහ අභ්‍යන්තර උත්පාදනය සම්පූර්ණ කිරීම සඳහා වැය වන පිරිවැය විශ්වසනීය ලෙස නිශ්චය කළහැකි නම් පමණි. අභ්‍යන්තර උත්පාදිත මෘදුකාංගවල ප්‍රාග්ධනීකරණය කරන ලද පිරිවැයට එම මෘදුකාංග උත්පාදනය කිරීම සඳහා සෘජුවම ආරෝපනය කළ හැකි සියලු වියදම් සහ ප්‍රාග්ධනීකරණය කළ ණය ගැනීමේ පිරිවැය ඇතුළත් වන අතර එම පිරිවැය එහි ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරාවටම ක්‍රමක්ෂය කර ඇත. අභ්‍යන්තර උත්පාදිත මෘදුකාංගවල ප්‍රාග්ධනීකරණය කරන ලද පිරිවැය එහි සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හානිකරණ පාඩු අඩු කිරීමෙන් පසු වටිනාකමට දැක්වේ.

29. කීර්තිනාමය සහ අස්පෘශ්‍ය වත්කම් (සම්බන්ධයි)

පහත හෙළිදරව් කර ඇති මිලදී ගත් පරිගණක මෘදුකාංග හැර බැංකුවට සහ සමූහයට වෙනත් අස්පෘශ්‍ය වත්කම් නොමැත.

		බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	සටහන	**2023 රු. '000**	2022 රු. '000	**2023 රු. '000**	2022 රු. '000
පරිගණක මෘදුකාංග	29.1	**715,222**	725,029	**717,732**	730,001
සංවර්ධනය කරමින් පවතින මෘදුකාංග	29.2	**29,493**	22,220	**29,493**	22,220
එකතුව		**744,715**	747,248	**747,225**	752,221

29.1 පරිගණක මෘදුකාංග

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2023 රු. '000**	2022 රු. '000	**2023 රු. '000**	2022 රු. '000
පිරිවැය/තක්සේරුව				
ආරම්භක ශේෂය	**2,674,623**	2,414,573	**2,697,517**	2,435,016
වර්ෂය තුළ එකතු කිරීම්	**336,999**	346,804	**336,999**	349,254
වර්ෂය තුළ ඉවත්කිරීම්	**–**	–	**–**	–
ගැලපීම්	**–**	(86,754)	**–**	(86,754)
අවසාන ශේෂය	**3,011,622**	2,674,623	**3,034,516**	2,697,517
අඩුකළා: සමුච්චිත ක්‍රමක්ෂය				
ආරම්භක ශේෂය	**1,949,595**	1,637,946	**1,967,516**	1,653,028
වර්ෂය සඳහා අයකිරීම්	**346,805**	311,649	**349,268**	314,488
ඉවත්කිරීම්	**–**	–	**–**	–
අවසාන ශේෂය	**2,296,399**	1,949,595	**2,316,784**	1,967,516
අඩුකළා: හානිකරණය	**–**	–	**–**	–
ශුද්ධ පොත් අගය	**715,222**	725,029	**717,732**	730,001

29.2 සංවර්ධනය කරමින් පවතින මෘදුකාංග

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2023 රු. '000**	2022 රු. '000	**2023 රු. '000**	2022 රු. '000
පිරිවැය/තක්සේරුව				
ආරම්භක ශේෂය	**22,220**	39,431	**22,220**	39,431
වර්ෂය තුළ එකතු කිරීම්	**13,608**	23,289	**13,608**	23,289
වර්ෂය තුළ ඉවත්කිරීම්	**–**	–	**–**	–
මාරුකිරීම්/ගැලපීම්	**(6,335)**	(40,500)	**(6,335)**	(40,500)
අවසාන ශේෂය	**29,493**	22,220	**29,493**	22,220

29. කීර්තිනාමය සහ අස්පෘශ්‍ය වත්කම් (සම්බන්ධයි)

29.3 සම්පූර්ණයෙන් ක්‍රමක්ෂය කළ අස්පෘශ්‍ය වත්කම්

වාර්තාගත දිනයේදී තවමත් භාවිතයේ පවතින සම්පූර්ණයෙන්ම ක්‍රමක්ෂය කළ අස්පෘශ්‍ය වත්කම්වල මූලික පිරිවැය පහත පරිදි වේ. (පරිගණක මෘදුකාංග)

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2023 රු. '000**	2022 රු. '000	**2023 රු. '000**	2022 රු. '000
අස්පෘශ්‍ය වත්කම්/පරිගණක මෘදුකාංග	**1,538,107**	1,307,357	**1,554,602**	1,309,727
එකතුව	**1,538,107**	1,307,357	**1,554,602**	1,309,727

30 විලම්බිත බදු (වත්කම්)/වගකීම්

ගිණුම්කරණ ප්‍රතිපත්ති

හිලව් කිරීමට කිසිදු නීතිමය බලාත්මක අයිතියක් නොපවතින බැවින් සමූහයේ එක් ආයතනයක විලම්බිත බදු (වත්කම්)/වගකීම් තවත් ආයතනයක විලම්බිත බදු වගකීම්/(වත්කම්) හා හිලව් කළ නොහැක. විලම්බිත බදු සඳහා අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්තිය පිළිබඳ විස්තර පිටු අංක 43 හි 13 වන සටහනෙහි දක්වා ඇත.

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ සටහන් කර ඇති විලම්බිත බදු සහ ආදායම් බදු වියදමට වාර්තා වී ඇති වෙනස්කම් පහත වගුවෙන් දැක්වේ.

		බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	සටහන	**2023 රු. '000**	2022 රු. '000	**2023 රු. '000**	2022 රු. '000
වත්කම් යටතේ හඳුනාගත්	30.(අ)	**(5,885,288)**	(2,892,984)	**(5,885,288)**	(3,663,879)
වගකීම් යටතේ හඳුනාගත්	30.(ආ)	**–**	–	**58,630**	4,155
ශුද්ධ විලම්බිත බදු (වත්කම්)/වගකීම්	(30.(ඇ) සහ (ඈ)	**(5,885,288)**	(2,892,984)	**(5,826,658)**	(3,659,724)

30. (අ) විලම්බිත බදු වත්කම්

		බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	සටහන	**2023 රු. '000**	2022 රු. '000	**2023 රු. '000**	2022 රු. '000
ආරම්භක ශේෂය		**2,892,984**	1,104,779	**3,663,879**	1,105,653
විලම්බිත බදු වගකීම් වෙත මාරු කිරීම්		–	–	**(770,894)**	–
වර්ෂය සඳහා හඳුනාගත් ගෙවීම්					
– ආදායම් ප්‍රකාශය	13 (ආ)	**2,468,550**	897,864	**2,468,549**	1,658,428
– පෙර වර්ෂවල ගැලපීම්		**–**	–	**–**	9,455
– වෙනත් විස්තීර්ණ ආදායම්		**523,754**	890,342	**523,754**	890,342
අවසාන ශේෂය		**5,885,288**	2,892,984	**5,885,288**	3,663,879

30. විලම්බිත බදු (වත්කම්)/වගකීම් (සම්බන්ධයි)

30. (අ) විලම්බිත බදු වගකීම්

		බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	සටහන	**2023 රු. '000**	2022 රු. '000	**2023 රු. '000**	2022 රු. '000
ආරම්භක ශේෂය		**–**	–	**4,155**	1,939
විලම්බිත බදු වත්කම් වෙත මාරු කිරීම්		**–**	–	**(770,894)**	–
වර්ෂය සඳහා හඳුනාගත් ගෙවීම්					
– ආදායම් ප්‍රකාශය	13(අ)	**–**	–	**807,310**	2,215
– පෙර වර්ෂවල ගැලපීම්	13(අ)	**–**	–	**(35,338)**	–
– වෙනත් විස්තීර්ණ ආදායම්		**–**	–	**53,397**	–
අවසාන ශේෂය		**–**	–	**58,630**	4,155

ලාභ/අලාභ මගින් හඳුනාගත් මූල්‍ය වත්කම්					
– සාධාරණ අගයට ගණනය කළ	20	**40,189,162**	**40,189,162**	23,236,848	23,236,848
ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම්					
– ණය හා අත්තිකාරම්	21	**523,809,104**	**523,698,789**	553,052,170	575,726,903
– ණය හා වෙනත් උපකරණ	22	**953,056,324**	**929,197,135**	927,916,442	683,967,559
වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම්	23	**62,694,519**	**62,694,519**	28,252,211	28,252,211
මූල්‍ය වත්කම් එකතුව		**1,613,173,294**	**1,589,203,789**	1,552,546,811	1,331,272,663
මූල්‍ය වගකීම්					
බැංකුවලට ගෙවිය යුතු	32	**15,399,100**	**15,399,100**	12,711,256	12,711,256
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	33	**201**	**201**	–	–
ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වගකීම්					
– තැන්පත්කරුවන්ට ගෙවියයුතු	35	**1,482,951,028**	**1,488,906,928**	1,475,808,557	1,475,204,929
– ණය සුරැකුම්පත් හිමියන්ට ගෙවියයුතු		**–**	**–**	–	–
– වෙනත් ණයගැනීම් සඳහා ගෙවියයුතු		**72,891,598**	**72,891,598**	18,889,245	18,889,245
නිකුත් කළ ණය සුරැකුම්පත්	37	**23,879,683**	**23,879,683**	23,851,810	23,851,810
මූල්‍ය වගකීම් එකතුව		**1,595,121,610**	**1,601,077,510**	1,531,260,868	1,530,657,241

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

56. මූල්‍ය උපකරණවල සාධාරණ අගය (සම්බන්ධයි)

56.6 සාධාරණ අගයට නීර්ණය කිරීම

සාධාරණ අගයට පවත්වා නොගත් මූල්‍ය වත්කම් හා වගකීම්වල සාධාරණ අගය

මූල්‍ය ප්‍රකාශනවල සාධාරණ අගය වාර්තා නොකළ මූල්‍ය උපකරණ සඳහා සාධාරණ අගයන් තීරණය කිරීම පිණිස උපයෝගී කර ගත් ක්‍රමවේද සහ උපකල්පන පිළිබඳ විස්තරයක් පහත දක්වා ඇත.

සාධාරණ අගයට ආසන්න ධාරණ අගය ඇති වත්කම්

කෙටිකාලින කල්පිරීම් සහිත මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් (වසරකට අඩු ආරම්භක කල්පිරීමක් සහිත) සඳහා අදාළ ධාරණ අගය ඒවායේ සාධාරණ අගයට ආසන්න බව උපකල්පනය කර ඇත. නිශ්චිත කල්පිරීමක් නොමැති ඉතිරිකිරීමේ තැන්පතු සඳහාද මෙම උපකල්පනය අදාළ වේ.

කාලානුරූපව ගෙවනු ලබන පොළී සහිත ගනුදෙනුකරුවන්ගෙන් ලබා ගන්නා දිගුකාලීන තැන්පතු සහ විවිධ අනුපාතික යටතේ ගනුදෙනුකරුවන්ට පිරිනමන ණය හා අත්තිකාරම්ද සාධාරණ අගයට පොත්වල පවත්වාගෙන යාම සඳහා සලකා බලනු ලබයි.

ස්ථාවර අනුපාත මූල්‍ය උපකරණ

කෙටිකාලින ණය පහසුකම් සඳහා සාධාරණ අගයන් ලෙස ධාරණ අගයන් සලකනු ලබයි. කල්පිරීම තෙක් දරා සිටින සුරැකුම්වල සාධාරණ අගය ඇගයීමේදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශිත, ඊට සමාන ගනුදෙනු කළහැකි සුරැකුම් වෙනුවෙන් යොදාගත් අනුපාතික භාවිතා කරන ලදි. සමාලෝචිත වර්ෂයෙහි සිව්වන කාර්තුව තුළ නව ණය ප්‍රදානය කරනු ලැබූ වෙළඳපොළ අනුපාතික යොදා ගනිමින් ස්ථාවර පොළී අනුපාතික සහිත ණය හා ලැබියුතු දෑ සාධාරණ අගය අගයන ලදී. කල්පිරීමේදී පොළී ගෙවනු ලබන සහ එක් වසරකට වඩා වැඩි මුල් කාලසීමාවක් සහිත ස්ථාවර තැන්පතුවලට සමාලෝචිත වර්ෂයෙහි සිව්වන කාර්තුව තුළ ගනුදෙනුකරුවන්ට ලබාදුන් දැනට පවතින වෙළඳපොළ අනුපාතික අනුව වට්ටම් කරන ලදී. සමාලෝචිත වර්ෂයෙහි සිව්වන කාර්තුව තුළ නව ණය ප්‍රදානය කරනු ලැබූ වෙළඳපොළ අනුපාතික යොදා ගනිමින් ස්ථාවර පොළී අනුපාතික සහිත ණය හා වෙනත් උපකරණ සාධාරණ අගය අගයන ලදී.

මූල්‍ය වත්කම්වල නිල ලැයිස්තුගත නොකළ හිමිකම් කොටස්

සාධාරණ අගය විශ්වසනීය ලෙස ඇස්තමේන්තු කළ නොහැකි බැවින් වෙනත් විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ අගයට ගණනය කරන ලද මූල්‍ය වත්කම් වල නිල ලැයිස්තුගත නොකළ හිමිකම් සියල්ල (ප්‍රාදේශීය සංවර්ධන බැංකුව හැර) පිරිවැයට වාර්තා කරනු ලබයි. මෙකී ආයෝජන සඳහා සක්‍රීය වෙළඳපළක් නොමැති අතර සමූහය විසින් එය දීර්ඝකාලීනව රඳවා ගැනීමට අපේක්ෂා කරයි. නිරීක්ෂණ කළ හැකි දත්ත මත පදනම්ව තක්සේරුකරණ ආකෘතියක් උපයෝගී කර ගනිමින් ප්‍රාදේශීය සංවර්ධන බැංකු කොටස්වල ආයෝජන සාධාරණ අගයට ගණනය කර ඇත. පිටු අංක 65 හි දක්වා ඇති සටහන් අංක 23 (ඉ) වෙත යොමු වන්න.

57 ප්‍රාග්ධන කළමනාකරණය (නියාමන වාර්තාකරණය අනුව)

අරමුණ

බැංකුවේ අවදානම් රුචිකත්වය හා අනුගාමීවන පරිදි සකස් කළ උපාය මාර්ගික අරමුණු ඉටු කරගැනීමට ප්‍රමාණවත් ප්‍රාග්ධන ආවරණ රඳවා ගැනීමත් නියාමන අවශ්‍යතාවලට සරිලන පරිදි ප්‍රාග්ධනය කළමනාකරණය කිරීමත් බැංකුවට අවශ්‍ය වේ.

නියාමන ප්‍රාග්ධනය

ශ්‍රී ලංකා මහ බැංකුව එකාබද්ධ හා කේවල පදනම මත නියාමන අවශ්‍යතා පැනවීම ද අධීක්ෂණය කිරීමද සිදු කරනු ලබයි. බැංකුව විසින් නියාමන ප්‍රාග්ධනය හා වෙනත් අමතර අවදානම් ආවරණය පිණිස බාසල් III නියාමනවල ප්‍රතිපාදන හා අනුකූල විය යුතුය. බාසල් III ප්‍රාග්ධන නියාමන, 2019 ජනවාරි 01 දින සිට සම්පූර්ණයෙන් බලපැවැත්වෙන පරිදි ක්‍රියාත්මක කර ඇති අතර, බාසල් II යටතේ හඳුන්වා දුන් උපස්ථම්භන ත්‍රිත්වය මත එනම්, අවම ප්‍රාග්ධන අවශ්‍යතාව, අධීක්ෂණ සමාලෝචන ක්‍රියාවලිය සහ වෙළඳපොළ විනයානුකූලබව යන ස්ථම්භ මත පදනම්ව අබණ්ඩව ක්‍රියාත්මක වනු ඇත. බැංකුව පෙරදී දේශීය පද්ධති අනුව වැදගත් බැංකුවක් (D-SIB) ලෙස සලකන ලද අතර මහ බැංකුව විසින් 2019 දෙසැම්බර් 20 දින නිකුත් කරන ලද 2019 අංක 12 දරන බැංකු අනපනතට අනුව තවදුරටත් බැංකුව එසේ සලකනු නොලබයි.

බැංකුව විසින් අවදානම සම්බන්ධයෙන් ප්‍රමාණකරණ ප්‍රවේශය ද වෙළඳපොළ අවදානම සම්බන්ධයෙන් ප්‍රමාණකරණ මිනුම් ප්‍රවේශය ද මෙහෙයුම් ණය අවදානම සම්බන්ධයෙන් මූලික දර්ශක ප්‍රවේශය ද දැනට භාවිත කරනු ලබයි. පොදු හිමිකම් ප්‍රාග ්‍රධනය ප්‍රතිනිර්වචනය කිරීම තුළින් සහ ප්‍රාග්ධන සංරක්ෂණ අවරෝධකය සහ දේශීය පද්ධති අනුව වැදගත් බැංකු (D-SIB) මත ප්‍රාග්ධන අධිභාර ආදී නව ප්‍රාග්ධන අවරෝධක හඳුන්වාදීම තුළින් ප්‍රාග්ධනයෙහි ප්‍රමාණාත්මක බව හා ගුණාත්මක බව විශේෂයෙන්ම හර ප්‍රාග්ධනය වර්ධනය කිරීම සඳහා බාසල් III මගින් අවධාරණය කෙරෙයි. ශ්‍රී ලංකා මහ බැංකු බාසල් III නියාමනය අනුව 2023 අවසානය වන විට බැංකුව සහ සමූහය විසින් අවම ස්ථර ප්‍රාග්ධන අනුපාතය 8.5% ක්ද, අවම මුළු ප්‍රාග්ධන අනුපාතය 12.5% ක් ද පවත්වාගෙන යා යුතුය.

නියාමන ප්‍රාග්ධනය, ස්ථර I ප්‍රාග්ධනය සහ ස්ථර II ප්‍රාග්ධනය යන ද්විත්වයෙන් සමන්විත වේ.
ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවන ලද අවම ප්‍රාග්ධන අවශ්‍යතාවලට බැංකුව හා සමූහ සෑම විටම අනුකූල වී ඇත.

57. ප්‍රාග්ධන කළමනාකරණය (නියාමන වාර්තාකරණය අනුව) (සම්බන්ධයි)

නියාමන ප්‍රාග්ධන අනුපාතය

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2023***	2022	**2023**	2022
පොදු හිමිකම් ස්ථර I ප්‍රාග්ධන අනුපාතය (අවම අවශ්‍යතාව – 7.0%)	**15.329**	14.357	**18.391**	16.492
ස්ථර I ප්‍රාග්ධන අනුපාතය (අවම අවශ්‍යතාව – 8.5%)	**16.908**	15.778	**19.943**	17.903
සමස්ථ ප්‍රාග්ධන අනුපාතය (අවම අවශ්‍යතාව – 12.5%)	**19.263**	17.999	**22.239**	19.959

* ඉහත අනුපාත ලාභය සැලකිල්ලට නොගෙන ගණනය කරනු ලබන අතර, ප්‍රාග්ධන ගණනය කිරීම සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනයන් සලකා බැලීමෙන් පසු මෙම අනුපාත වෙනස් වේ.

58 පිටපත් රහිත භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කරවලට අදාළ ප්‍රතිමිලට ගැණුම් හා ප්‍රති විකුනුම් ගනුදෙනු

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කර ඇති දේශීය භාණ්ඩාගාර බිල්පත් පනතේ 2019 අංක 01 විධානය අනුව ප්‍රතිමිලට ගැනුම් හා ප්‍රති විකුණුම් ගනුදෙනු පිළිබඳ අමතර තොරතුරු පහත පරිදි වේ.

58.1 ප්‍රතිමිලට ගැණුම් ගනුදෙනු සඳහා වෙන් කරන ලද සුරුකුම්වල ධාරණ අගය

	බැංකුව	
දෙසැම්බර් 31 දිනට	**2023** රු. '000	2022 රු. '000
ප්‍රතිමිලට ගැණුම් සඳහා වෙන් කරන ලද සුරුකුම්වල ධාරණ අගය	**37,982,464**	22,799,900
ප්‍රතිවිකුණුම් සඳහා වෙන් කරන ලද සුරුකුම්වල වෙළඳපොළ අගය	**10,329,344**	771,293

58.2 ප්‍රතිමිලට ගැණුම් හා ප්‍රතිවිකුණුම් සඳහා කපාහැරීම්

දෙසැම්බර් 31 දිනට එක් එක් පරිනත කාණ්ඩයන්ට අදාළ අවම කපාහැරීම් පහත පරිදි වේ.

	2023 අවම කපාහැරීම		2022 අවම කපාහැරීම	
දෙසැම්බර් 31 දිනට	ප්‍රතිමිලට ගැණුම් ගනුදෙනු	ප්‍රතිවිකුණුම් ගනුදෙනු	ප්‍රතිමිලට ගැණුම් ගනුදෙනු	ප්‍රතිවිකුණුම් ගනුදෙනු
	%	**%**	%	%
අදාළ සුරුකුම්පත්වල අවශේෂ පරිනත කාලය				
වසර 1 දක්වා	**4**	**4**	4	4
වසර 1 සිට වසර 3 දක්වා	**6**	**6**	6	6
වසර 3 සිට වසර 5 දක්වා	**8**	**8**	8	8
වසර 5 සිට වසර 8 දක්වා	**10**	**10**	10	10
වසර 8 ට වඩා වැඩි	**12**	**12**	12	12

58.3 අනුකූල නොවීම නිසා බැංකුව වෙත පනවන ලද දඩුවම්

2022 සහ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂ සඳහා මහ බැංකුව විසින් නිකුත් කර ඇති 2019 අංක 01 දරණ විධානයට අනුව අනුකූල නොවීම නිසා බැංකුවට දඩුවම් පනවා නොමැත.



සංයුක්තය

අතිරේක තොරතුරු

බැංකු පනතේ මාර්ගෝපදේශයන්ට අනුකූලතාවය
388

ශ්‍රී ලංකා චාරලත් ගණකාධිකාරී ආයතනය මගින් නිකුත් කරන ලද ආයතනික පාලනය සම්බන්ධයෙන් වූ යහපරිච සංග්‍රහය සමග අනුකූලතාවය
408

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කරන ලද අනෙකුත් හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවයන්
413

2016 අංක 01 දරන බැංකු පනතේ නියෝගයෙහි iii උපලේඛන ප්‍රකාර බාසල් iii හෙළිදරව් කිරීම්
420

දේශීය පද්ධති අනුව වැදගත් බැංකු තක්සේරු කිරීමේ ක්‍රියාකාරකම - 2023
432

GRI අන්තර්ගත දර්ශකය
434

ආදායම් ප්‍රකාශය ඇමරිකානු ඩොලර්
437

විස්තීර්ණ ආදායම් ප්‍රකාශය ඇමරිකානු ඩොලර්
438

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය ඇමරිකානු ඩොලර්
439

සංඛ්‍යාලේඛනාත්මක දර්ශකයන් 2014 - 2023
440

තැන්පතු විශ්ලේෂණය
441

අනුරූප බැංකු
442

විදේශ විනිමය හුවමාරු සමාගම්
442

යුරෝජයිරෝ සාමාජිකත්වය
443

මූල්‍ය සහ බැංකුකරණයට අදාළ පාරිභාෂික වචන මාලාව
444

ආයතනික තොරතුරු
450

බැංකු පනතේ නියාමනය සමග අනුකූලවීම

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා වන ආයතනික පාලනය පිළිබඳ 2007 අංක 12 දරණ බැංකු පනත් නියාමනය සහ එහි පසුකාලීන සංශෝධන

		2023 දී අනුකූලතා මට්ටම
3 (1)	**අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම**	
3 (1) (i)	අධ්‍යක්ෂ මණ්ඩලය පහත කරුණු පිළිබඳව සහතික වෙමින් බැංකුවේ සුරක්ෂිතභාවය සහ ස්ථාවරත්වය ශක්තිමත් කළ යුතුය.	
	(අ) බැංකුවේ උපායමාර්ගික අරමුණු හා ආයතනික වටිනාකම් අනුමත කිරීම හා අධීක්ෂණය කිරීම සහ මේ පිළිබඳව තොරතුරු බැංකුවේ සියළු පිරිස් වෙත සන්නිවේදනය වන බව සහතික කිරීම.	අනුකූලවී ඇත. පිටු අංක 67- 121හි සඳහන් පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවේ උපාය මාර්ගික අරමුණු හා ආයතනික වටිනාකම් තීරණය කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද 2024 - 2026 කාලසීමාව සඳහා වන උපාය මාර්ගික සැලසුමට මේවා අන්තර්ගත කර ඇති අතර සැලසුම්ගත රැස්වීම් හරහා සියලු ශ්‍රේණිවල සේවකයන් දැනුවත් කර ඇත. ආයතනික වටිනාකම් බැංකුවේ වෙබ් පිටුවෙහි ද සඳහන් කර ඇති අතර, බැංකුවට සේවකයන් අනුගත කිරීම සඳහා සංවිධානය කරන වැඩසටහන් වලදී ද ආයතනික රැස්වීම් වලදී ද නිරන්තරයෙන් සේවකයන්ව දැනුවත් කෙරේ. ආයතනික අගයන් බැංකුවේ වෙබ් පිටුවේ ඇතුළත් කර ඇත.
	(ආ) අවම වශයෙන් ඉදිරි වසර තුන සඳහා බැංකුවේ සමස්ත ව්‍යාපාරික උපායමාර්ගය, සමස්ත අවදානම් ප්‍රතිපත්තිය සහ කළමනාකරණ ක්‍රියාපටිපාටි හා මැනිය හැකි ඉලක්ක සහිත යාන්ත්‍රණ අනුමත කිරීම.	අනුකූලවී ඇත. ආයතන කළමනාකාරිත්වය සමග සවිස්තරාත්මකව සාකච්ඡා කිරීමෙන් අනතුරුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද 2024 - 2026 කාලසීමාව සඳහා ව්‍යාපාරික උපායමාර්ගික සැලැස්ම සකස් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මාර්ගෝපදේශකත්වය හා නියාමනය සපයන ලදී. උපායමාර්ගික ව්‍යාපාරික සැලැස්ම බැංකුවේ අවදානම් කළමනාකරණ කාර්යරාමුව, ක්‍රියාවලි, සහ අවදානම් අභිරුචිය සමග අනුකූල වේ. ව්‍යාපාරික උපායමාර්ගික සැලැස්ම ඉදිරි වසර තුන සඳහා මැනිය හැකි ඉලක්ක සහිත ක්‍රියාකාරී සැලසුමක් ඔස්සේ ක්‍රියාත්මක කෙරේ. ව්‍යාපාරික උපායමාර්ගික සැලැස්ම, වාර්ෂිකව යාවත්කාලීන හා සමාලෝචනයට ලක් කෙරෙන සැලසුමකි. 2024 - 2026 කාලසීමාව සඳහා වන උපාය මාර්ගික ව්‍යාපාර සැලසුම 2023 දෙසැම්බර් 06 දින විශේෂ අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමකදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී.
	(ඇ) ප්‍රධාන අවදානම් හඳුනාගැනීම සහ දූරදර්ශී ලෙස අවදානම් කළමනාකරණය කරගැනීම සඳහා ගැළපෙන පද්ධති ක්‍රියාත්මක වන බව සහතික කිරීම.	අනුකූලවී ඇත. බැංකුවේ අවදානම් ප්‍රතිපත්තිය අනුමත කිරීම, බැංකුවට මුහුණ පෑමට සිදුවන මූලික අවදානම් හඳුනාගැනීම, පාලන ව්‍යුහ ස්ථාපිත කිරීම සහ මූලික අවදානම් තක්සේරුව, නිරීක්ෂණය හා කළමනාකරණය කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත පවරනු ලැබ ඇත. පහත වාර්තා මේ සම්බන්ධයෙන් වැඩිදුර විස්තර සපයයි. • පිටු අංක 191 සිට 213 දක්වා වන අවදානම් සමාලෝචන වාර්තාව • පිටු අංක 188 සහ 189 දක්වා වන අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව
	(ඈ) තැන්පත්කරුවන්, ණය ගැතියන්, ණය හිමියන්, කොටස්කරුවන් ඇතුළු සියළු පාර්ශ්වකරුවන් සමග සන්නිවේදනය කිරීම සම්බන්ධයෙන් ප්‍රතිපත්තියක් ක්‍රියාවට නැංවීම අනුමත කිරීම.	අනුකූලවී ඇත. එළදායී හා කාලීන සන්නිවේදනයක් සහතික කිරීම සඳහා සියළු පාර්ශ්වකරුවන් ආවරණය කෙරෙන පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද හා ක්‍රියාත්මක කරන ලද සන්නිවේදන ප්‍රතිපත්තියක් බැංකුව සතුව ඇත.
	(ඉ) බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධති හා කළමනාකරණ තොරතුරු පද්ධතිවල ප්‍රමාණවත්භාවය හා විශ්වාසනීයත්වය සමාලෝචනය කිරීම.	අනුකූලවී ඇත. බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධති හා කළමනාකරණ තොරතුරු පද්ධතිවල ප්‍රමාණවත්භාවය හා විශ්වාසනීයත්වය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයට සහය වේ. අධ්‍යක්ෂ මණ්ඩලය ද ඒ පිළිබඳව සෑහීමකට පත්වේ. ඒ පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමකට පත් විය. විගණන අංශය සහ රාජ්‍ය විගණක විසින් මේ පිළිබඳව සමාලෝචනය කරනු ලබන අතර එම සමාලෝචන මෙන්ම ඊට අදාළ කළමනාකරණ ප්‍රතිචාරද අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් සමාලෝචනය කෙරේ.

බැංකු පනතේ නියාමනය සමග අනුකූලවීම

	2023 දී අනුකූලතා මට්ටම
(ඊ) ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිතිවල නිර්වචනය කර ඇති පරිදි ප්‍රධාන කළමනාකරණ පිරිස් හඳුනාගැනීම හා තනතුරු සඳහා පත් කිරීම.	අනුකූලවී ඇත. ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිති ඒසම්බන්ධිත පාර්ශව හෙළිදරව් කිරීම්ද හි ප්‍රධාන කළමනාකරණ පිරිස් නිර්වචනය කර ඇත්තේ ප්‍රතිපත්ති කෙරෙහි සැලකිය යුතු ආකාරයෙන් බලපෑම් කළ හැකි පුද්ගලයන් ප්‍රධාන කළමනාකරණ පිරිස් ලෙස හඳුනාගැනේ. සියළුම ප්‍රධාන කළමනාකරණ පිරිස් පත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව විසින් නිර්දේශ කරනු ලබන අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබේ. ආයතනික පාලනය පිළිබඳ ශ්‍රී ලංකා මහ බැංකු මාර්ගෝපදේශ අනුව බැංකුවේ සාමාන්‍යාධිකාරී, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, සහකාර සාමාන්‍යාධිකාරී සහ අනුබද්ධ ශ්‍රේණිවල නිලධාරීන් ආයතනික පාලන අරමුණු සඳහා බැංකුවේ ප්‍රධාන කළමනාකරණ පිරිස් හඳුනාගෙන ඇත.
(උ) අධ්‍යක්ෂවරුන් සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා අධිකාරී ක්ෂේත්‍ර සහ ප්‍රධාන වගකීම් නිශ්චය කිරීම.	අනුකූලවී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ අධිකාරී ක්ෂේත්‍රය ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ 7 වගන්තිය යටතේ පාලනය වේ. ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත අනුව සකස් කර ඇති අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියෙහි අධ්‍යක්ෂ මණ්ඩලයේ විෂයය ක්ෂේත්‍රය හා වගකීම් සවිස්තරාත්මකව දැක්වේ. අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව විසින් ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා වන අධිකාරී ක්ෂේත්‍ර හා ප්‍රධාන වගකීම් නිශ්චය කර ඇත. එම වගකීම් ප්‍රධාන කළමනාකරණ පිරිසෙහි සෑම සාමාජිකයෙකුගේම රැකියා විස්තරයෙහි අන්තර්ගත වේ.
(ඌ) ප්‍රධාන කළමනාකරණ පිරිස් විසින් අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රතිපත්තියට ගැළපෙන පරිදි බැංකු කටයුතු යෝග්‍ය ලෙස අධීක්ෂණය කෙරෙන බව සහතික කිරීම.	අනුකූලවී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවේ උපායමාර්ගික ව්‍යාපාර සැලැස්මට අනුකූලව බැංකුවේ කාර්යසාධනය සාමාලෝචනය කරන අතර අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු වෙතින් මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලන, අවදානම් කළමනාකරණය සහ එම කමිටුවලට පවරා ඇති අනෙකුත් අදාළ කරුණු පිළිබඳ වාර්තා ලබා ගනී. එසේම, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ විෂයය පථයට අයත් කරුණු අවශ්‍ය විටදී පැහැදිලි කිරීම සඳහා ඔවුන් කැඳවනු ලබයි.
(එ) අධ්‍යක්ෂවරුන් හා ප්‍රධාන කළමනාකරණ පිරිස් තෝරා ගැනීම, නාමයෝජනා කිරීම සහ පත්කර ගැනීම; අභිලාෂ ගැටුම් කළමනාකරණය; සහ දුර්වලතා නිර්ණය කිරීම සහ අවශ්‍ය අවස්ථාවලදී වෙනස්කම් ක්‍රියාත්මක කිරීම ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයේ පාලන පරිච වල ඵලදායීතාවය කලින් කලට ඇගයීම.	අනුකූලවී ඇත. සාමාන්‍යයෙන් මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ ස්වයං ඇගයීමක් වාර්ෂිකව එහි පාලන භාවිතයෙන් තක්සේරු කිරීම මගින් සිදු කෙරේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්වයං ඇගයීම 2023 වසර සඳහා අවසන් කර ඇත. සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ප්‍රතිපත්තිය බැඳීම් ගැටුම කළමනාකරණය කිරීම සඳහා ක්‍රියාත්මක වේ. සම්බන්ධිත පාර්ශ්ව සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික ප්‍රකාශය සහ ඔවුන්ගේ අවශ්‍යතා ගැටුම් ඇත්නම් ඒවා නිරීක්ෂණය කිරීම සඳහා අධ්‍යක්ෂවරුන්ගෙන් ලබාගනී.
(ඒ) ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා යෝග්‍ය අනුප්‍රාප්තික සැලැස්මක් බැංකුවට තිබෙන බව සහතික කිරීම.	අනුකූලවී ඇත. 2022 වසර සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා අනුප්‍රාප්තික සැලැස්මක් 2023 වසර දක්වාද ක්‍රියාත්මක වේ.
(ඔ) ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම, සන්නිවේදන මාර්ග ස්ථාපිත කිරීම සහ ආයතනික අරමුණු කරා ළඟාවීමේ ප්‍රගතිය අධීක්ෂණය සඳහා අවශ්‍යතාවය මත ප්‍රධාන කළමනාකරණ පිරිස් නිරතුරුව හමුවීම.	අනුකූලවී ඇත. කාර්යසාධනය, උපායමාර්ගය, ප්‍රතිපත්තිය සහ තම විෂයය පථයට අදාළ වෙනත් ඕනෑම කරුණක් ආශ්‍රිත ප්‍රගතිය ප්‍රධාන කළමනාකරණ පිරිස් විසින් අධ්‍යක්ෂ මණ්ඩල හා ඒවායේ අනු කමිටු රැස්වීම් වලදී සාකච්ඡා කෙරේ. ඊට අමතරව, න්‍යාය පත්‍රයේ ඇතුළත් සිය අධීක්ෂණය යටතේ පවතින ප්‍රධාන කරුණු පිළිබඳව ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් විසින් කරුණු ඉදිරිපත් කරනු ලබන අතර ආයතනික අරමුණු හා අදාළ ප්‍රතිපත්ති සම්බන්ධයෙන් කරුණු දැක්වීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය සහ අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු විසින් ඔවිහූ කැඳවනු ලබති. මීට අමතරව ප්‍රධාන කළමනාකරණ පිරිස් විසින් ඔවුන්ගේ විෂයපථය යටතේ න්‍යායපත්‍රයේ ඇති ප්‍රධාන අයිතම පිළිබඳව ඉදිරිපත් කිරීම් සිදු කරන අතර ආයතනික අරමුණු සඳහා වන ප්‍රතිපත්ති සම්බන්ධයෙන් එහි ඇති ප්‍රමාණාත්මක කාරණා සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සහ එහි අනු කමිටු විසින් කැඳවනු ලැබේ.

බැංකු පනතේ නියාමනය සමග අනුකූලවීම

		2023 දී අනුකූලතා මට්ටම
	(ඕ) නියාමන පරිසරය අවබෝධ කරගැනීම සහ බැංකුව විසින් නියාමන ආයතන සමග ඵලදායී සම්බන්ධතාවයක් පවත්වාගෙන යන බව සහතික කිරීම.	අනුකූලවී ඇත. අධ්‍යක්ෂවරුන් ලෙස පත්වීමෙන් පසු සියළු නියාමන අවශ්‍යතා පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලයට සිය කාර්යයන් ඵලදායී ලෙස ඉටු කිරීමේ හැකියාව ලබාදෙමින් අනුකූලතා නිලධාරී විසින් නියාමන ප්‍රවණතා පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කරනු ලබයි. අනුකූලතා නිලධාරියා නියාමකයා වෙත සියළුම ප්‍රතිලාභ පිළිබඳ මාසික මණ්ඩල පත්‍රිකාවක් මුදල් විශුද්ධිකරණය (AML) හා ත්‍රස්තවාදයට මුදල් සැපයීමට එරෙහිවීම (CFT) තොරතුරු සහ ඕනෑම නියාමන වෙනස්කම් වෙත ඉදිරිපත් කරයි.
	(ඵ) බාහිර විගණකවරුන්ගේ සේවය ලබාගැනීමේදී හා අධීක්ෂණය කිරීමේදී අවශ්‍ය සුපරීක්ෂාකාරී බවින් යුතුව කටයුතු කිරීම.	අනුකූලවී ඇත. ජාතික ඉතිරිකිරීමේ බැංකුව රාජ්‍ය බැංකුවක් වන හෙයින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ව්‍යවස්ථාවේ 154 වන වගන්තිය සහ ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ 37 වන වගන්තියේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව විගණකාධිපතිවරයා බැංකුවේ බාහිර විගණකවරයා වේ. එසේම, විගණන ක්‍රමවේදයේ ස්වාධීනත්වය, විෂයය මූලිකත්වය සහ ඵලදායීතාවය සමාලෝචනය කිරීම සහ නිරීක්ෂණය කිරීම සහ විගණකාධිපතිවරයාට සහයවීම සඳහා විගණකාධිපතිවරයා විසින් බාහිර විගණකවරයෙක් පත් කරගන්නේ නම් එසේ පත් කරගනු ලබන එවැනි ඕනෑම බාහිර විගණකවරයෙක් සම්බන්ධයෙන් විගණන අධිකාරී හරහා විගණකාධිපතිවරයාට නිර්දේශ ඉදිරිපත් කිරීමේ බලය අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව වෙත පැවරී තිබේ.
3 (1) (ii)	මෙම නිර්දේශවල නිර්දේශ අංක 3 (5) ප්‍රකාරව සභාපති හා ප්‍රධාන විධායක නිලධාරී පත් කිරීම සහ සභාපති හා ප්‍රධාන විධායක නිළධාරි සතු කාර්යභාරය හා වගකීම් නිශ්චිතව දැක්වීම හා අනුමත කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදු කරනු ලබයි.	මෙය 3(9) (II) වගන්තිය සමග එක්ව කියවන විට අනුකූලවී ඇත. 1995 වසරේ අංක 28 දරණ පනතින් සංශෝධනය කරන ලද 1971 අංක 30 දරණ ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ 11 (1) වගන්තිය ප්‍රකාරව සභාපතිවරයා පත් කරනු ලබන්නේ අමාත්‍යවරයා විසිනි. ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ 26 (1) වගන්තියෙන් දක්වන පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවේ සාමාන්‍යාධිකාරී තනතුර සඳහා යෝග්‍ය හා නිසි පුද්ගලයෙකු පත්කරනු ලබන අතර එම තැනැත්තා බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරියාද වේ. සභාපතිවරයාගේ සහ ප්‍රධාන විධායක නිළධාරීගේ කාර්යභාරය හා වගකීම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිර්වචනය කිරීම හා අනුමත කිරීම සිදු කරනු ලැබ තිබේ. ඉහත සඳහන් රෙගුලාසිවලට අනුව වත්මන් ප්‍රධාන විධායක නිලධාරිතුමිය 2024.01.10 වන දින පත් කරන ලදී. අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියේ ඇතුළත් මෙම නිර්දේශවල නිර්දේශ අංක 3 (5) ප්‍රකාරව සභාපතිවරයාගේ සහ ප්‍රධාන විධායක නිළධාරියාගේ කාර්යභාරය සහ වගකීම් නිශ්චිතව දැක්වීම හා අනුමත කිරීම සිදු කර ඇත. තවදුරටත් මෙය පිටු අංක 197 විස්තර කර ඇත.
3 (1) (iii)	අධ්‍යක්ෂ මණ්ඩලය නිති පතා හමුවිය යුතු අතර ආසන්න වශයෙන් මසකට වරක් ලෙස වර්ෂයක් තුළ අවම වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 12 ක් පැවැත්විය යුතුය. එසේ පැවැත්වෙන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සහභාගී වීමට සුදුසුකම් ඇති අධ්‍යක්ෂවරුන් බහුතරයකගේ ක්‍රියාකාරී සහභාගීත්වය අත්‍යවශ්‍ය වේ. රැස්වීමකින් තොරව ලිඛිත යෝජනා හෝ ලියවිලි සංසරණය කිරීම මගින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් හැකිතාක් දුරට වැළකීමට කටයුතු කෙරේ.	අනුකූලවී ඇත. අධ්‍යක්ෂවරුන්ගේ සක්‍රිය සහභාගීත්වයෙන් සෑම මසකම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් විධිමත්ව පැවැත්වෙන අතර පැවැත්වූ රැස්වීම් සංඛ්‍යාව සහ අධ්‍යක්ෂවරුන්ගේ සහභාගීත්වය පිටු අංක හි දැක්වේ. 2023 වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා 13 ක් සංසරණය හරහා අනුමත කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සංසරණය කිරීම ඔස්සේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීම අවම කිරීමට බැංකුව හැකි සෑම පියවරක්ම ගෙන ඇති අතර එවැනි යෝජනා ඊළඟ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබේ.
3 (1) (iv)	සියළුම අධ්‍යක්ෂවරුන්ට බැංකුවේ ව්‍යාපාර ප්‍රවර්ධනය හා අවදානම් කළමනාකරණයට අදාළ කරුණු හා යෝජනා නිතිපතා පැවැත්වෙන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල න්‍යාය පත්‍රවලට ඇතුළත් කිරීමේ අවස්ථාව සහතික කිරීමට පියවර ගෙන ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වග බලා ගැනෙයි.	අනුකූලවී ඇත. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා වන න්‍යායපත්‍ර සහ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අධ්‍යක්ෂවරුන් වෙත බෙදා හරිනු ලබන්නේ ඔවුන්ට සහභාගිවීමට සහ යෝජනාවන් ඉදිරිපත් කිරීමට කාලය ලබාදෙමිනි.
3 (1) (v)	සියළුම අධ්‍යක්ෂවරුන් හට සහභාගිවීමේ අවස්ථාව සලසමින් අවම වශයෙන් නිතිපතා පැවැත්වෙන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා දින 7 ක පූර්ව දැනුම්දීමක් ලබා දෙන බවට අධ්‍යක්ෂ මණ්ඩල කාර්ය පටිපාටිය මගින් සහතික වෙයි. සියළුම අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සාධාරණ කාලසීමාවක් තුල දැනුම් දීමක් සිදු කරනු ලැබේ.	අනුකූලවී ඇත.

බැංකු පනතේ නියාමනය සමග අනුකූලවීම

		2023 දී අනුකූලතා මට්ටම
3 (1) (vi)	නොකඩවා පූර්වගාමී රැස්වීම් 3 කට සහභාගී නොවූ හෝ මාස 12 ක කාල පරිච්ඡේදය තුල පවත්වන ලද පූර්වගාමී රැස්වීම් වලින් අවම වශයෙන් රැස්වීම් 2/3 ක් සඳහා සහභාගී වී නොමැති අධ්‍යක්ෂවරුන්ගේ අධ්‍යක්ෂ ධුරය අවලංගු වන බවට අධ්‍යක්ෂ මණ්ඩල කාර්ය පටිපාටිය මගින් වග බලා ගැනෙයි.	අනුකූලවී ඇත. 2007 අංක 12 දරණ බැංකු පනත් නියමය ප්‍රකාරව අධ්‍යක්ෂවරුන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා ඔවුන්ගේ සහභාගිත්වයට අදාළව ඇගයීම සිදු කෙරේ. අධ්‍යක්ෂවරුන්ගේ සහභාගිත්වය පිටු අංක 174 පිටුවෙහි දක්වා ඇත. ගත වූ මාස 12 තුල පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට සහභාගි නොවූ හෝ අඛණ්ඩව රැස්වීම් තුනකට සහභාගි නොවූ කිසිදු අධ්‍යක්ෂවරයෙක් නොමැත.
3 (1) (vii)	1988 අංක 30 දරන බැංකු පනතෙහි 43 වන වගන්තියේ විධිවිධාන සපුරාලන ලේකම්වරයෙකු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කෙරෙයි.	අනුකූලවී ඇත. 1988 අංක 30 දරණ බැංකු පනතේ 43 වන වගන්තියේ විධිවිධානවලට සහ එහි සංශෝධනවලට ප්‍රකාරව ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා අක්තපත්‍ර/සුදුසුකම් ඇති නීතීඥයෙකි.
3 (1) (viii)	අධ්‍යක්ෂ මණ්ඩල කාර්ය පටිපාටිය සහ අදාළ සියළු නීති හා රෙගුලාසි අනුගමනය කෙරෙන බව සහතික කිරීමේ අරමුණින් අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්ගේ උපදෙස් හා සේවය ලබා ගැනීමට සියළු අධ්‍යක්ෂවරුන්ට අවස්ථාව සලසා තිබිය යුතුය.	අනුකූලවී ඇත. අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රමවේද අනුගමනය කරන බව සහ අදාළ නීති හා රෙගුලාසි සමග අනුකූල වන බව සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයාගේ උපදෙස් හා සේවය ලබාගැනීමේ පූර්ණ අවස්ථාව සියළු අධ්‍යක්ෂවරුන්ට හිමිවේ.
3 (1) (ix)	අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා පවත්වාගෙන යා යුතු අතර එකී වාර්තා ඕනෑම අධ්‍යක්ෂවරයෙකුට සාධාරණ කාල පරාසයක් තුල සාධාරණ දැනුම් දීමක් මත පරීක්ෂා කිරීම සඳහා විවෘතව තිබිය යුතුය.	අනුකූලවී ඇත. ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ලේකම්වරයා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වාගෙන යන අතර සභාපතිවරයාගේ සමාලෝචනයෙන් පසු සියලුම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් වෙත එය බෙදා හරිනු ලැබේ. අධ්‍යක්ෂවරුන් විසින් යෝජනා කරන ලද යම් සංශෝධන/ඇතුළත් කිරීම් ඇතුලත් කිරීමෙන් පසු මීළඟ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් විසින් එම වාර්තා සමාලෝචනය කර අනුමත කරනු ලැබේ. අධ්‍යක්ෂවරුන් සඳහා පසුගිය අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සහ වාර්තා වෙත ප්‍රවේශවීමට අවස්ථාව ලබාදෙයි.
3 (1) (x)	අධ්‍යක්ෂ මණ්ඩලය සිය රාජකාරි කටයුතු ඉටුකිරීමේදී සැලකිලිමත් බවින් යුතුව හා විචක්ෂණශීලීව ක්‍රියා කරන්නේද යන්න රැස්වීම් වාර්තාවලින් දැන ගත හැකි වන පරිදි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පිළිබඳව ප්‍රමාණවත් පරිදි විස්තර සහිත අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා තබාගත යුතුය. එමෙන්ම, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා, නියාමන හා අධීක්ෂණ අධිකාරීන්ට අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල දී සිදුකරන විවරණවල ගැඹුර ඇගයීම පිණිස පවතින මූලාශ්‍රයක්ද වේ. එබැවින්, අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාවන් හි පහත කරුණු පැහැදිලිව ඇතුළත් විය යුතු වේ. (අ) සිය විවරණයන්හිදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් භාවිත කරන ලද දත්ත හා තොරතුරුවල සාරාංශයක්; (ආ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සලකා බලනු ලැබූ කරුණු; (ඇ) නියමිත අවධානයෙන් හා විචක්ෂණශීලී බවින් යුතුව අධ්‍යක්ෂ මණ්ඩලය සිය වගකීම් ඉටුකර ඇත්දැයි විදහාපාන කරුණු විමර්ශනය කෙරෙන සාකච්ඡා සහ විසංවාදී හෝ එකඟ නොවන කරුණු; (ඈ) අධ්‍යක්ෂ මණ්ඩල උපාය මාර්ග සහ ප්‍රතිපත්ති සහ අදාල නීති හා රෙගුලාසි කෙරෙහි අනුකූලතාවය පිළිබිඹු කෙරෙන සාක්ෂි සහ අදාළ විධායකයන්ගේ තහවුරු කිරීම්; (ඉ) බැංකුව නිරාවරණය වී සිටින අවදානම් පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයේ ඇති දැනුවත්භාවය හා අවබෝධය සහ සම්මත කරගෙන ඇති අවදානම් කළමනාකරණ පියවර පිළිබඳ දළ විශ්ලේෂණය; සහ (ඊ) තීරණ හා අධ්‍යක්ෂ මණ්ඩලයේ සම්මුති;	අනුකූලවී ඇත.

බැංකු පනතේ නියාමනය සමග අනුකූලවීම

		2023 දී අනුකූලතා මට්ටම
3 (1) (xi)	සාධාරණ ඉල්ලීමක් මත සුදුසු වාතාවරණයක් යටතේ බැංකුවේ වියදමින් ස්වාධීන වෘත්තිමය උපදෙස් ලබා ගැනීමට අධ්‍යක්ෂවරුන්ට අවස්ථාව සලසන අධ්‍යක්ෂ මණ්ඩලය එකඟවූ කාර්ය පටිපාටියක් පැවතිය යුතුය. බැංකුව වෙනුවෙන් ඉටු විය යුතු සිය රාජකාරී ඉටු කිරීම සඳහා යම් අධ්‍යක්ෂවරයෙකුට/අධ්‍යක්ෂවරුන්ට සහාය වනු පිණිස ස්වාධීන වෘත්තිමය උපදෙස් ලබාගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය එකඟ විය යුතුය.	අනුකූලවී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයට සිය වගකීම් ඉටු කිරීමේදී අවශ්‍යතාවය අනුව වෘත්තිමය උපදෙස් ලබා ගැනීමට හැකියාව තිබෙන බව ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ 27 වන වගන්තියේ සඳහන් වේ. සාධාරණ ඉල්ලීමක් මත සුදුසු වාතාවරණයක් යටතේ බැංකුවේ වියදමෙන් ස්වාධීන වෘත්තිමය උපදෙස් ලබාගැනීමට අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තිය මගින්ද අධ්‍යක්ෂවරුන්ට අවස්ථාව සලසාදී තිබේ.
3 (1) (xii)	සම්බන්ධිත පාර්ශ්ව හෝ වෙනත් ආයතන සමග කටයුතු කිරීමේදී හා එම ආයතන සමග ගිවිසුම්වලට එළඹීමේදී ආයතනය පිළිබඳව ඇති වගකීම් සම්බන්ධයෙන් මතුවිය හැකි අභිලාෂ ගැටුම් හෝ එවැන්නක් පවතින බවට හැඟෙන පරිදි කටයුතු කිරීමෙන් වැළකීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කළ යුතුය.	අනුකූලවී ඇත. පත්වීම ලබාගන්නා අවස්ථාවේදී හෝ වෙනස්කමක් සිදුවන අවස්ථාවකදී අධ්‍යක්ෂවරු සිය අභිලාෂ පිළිබඳ ප්‍රකාශයක් සිදු කරති. අභිලාෂ ගැටුම් සහ එවැන්නක් ඇතිවූ අවස්ථාවකට අදාළ කරුණු හා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව සම්බන්ධිත පාර්ශව පිළිබඳ හෙළිදරව් කිරීමේ ප්‍රතිපත්තිය මගින් විස්තර කෙරේ. අභිලාෂ ගැටෙන අවස්ථාවලදී අධ්‍යක්ෂවරු සාකච්ඡාවලට සහභාගීවීමෙන්, තම අදහස් ප්‍රකාශ කිරීමෙන් හෝ එවැනි සිදුවීමක් අනුමත කිරීමෙන් වැළකී සිටීමට කටයුතු කරති.
3 (1) (xiii)	බැංකුවේ පාලනය හා එය යා යුතු දිශාව අධ්‍යක්ෂ මණ්ඩලයේ දැඩි බලාධිකාරිය යටතේ පවතින බව සහතික කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණ සඳහා නිශ්චිතව වෙන් කෙරුණු කටයුතු පිළිබඳ විධිමත් උපලේඛනයක් අධ්‍යක්ෂ මණ්ඩලය සතුවිය යුතුය.	අනුකූලවී ඇත. බැංකුවේ ක්‍රියාකාරකම් අධීක්ෂණය සම්බන්ධයෙන් වගකියන ප්‍රධාන අධිකාරිය ලෙස, බැංකුවේ පාලනය හා එය යා යුතු දිශාව අධ්‍යක්ෂ මණ්ඩලයේ දැඩි බලාධිකාරිය යටතේ පවතින බව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික කරනු ලබයි. සිය වගකීම් ඵලදායීව ඉටු කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලයට වෙන් කර ඇති බලතල පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියෙන් විස්තර කෙරේ.
3 (1) (xiv)	බැංකුව බුන්වත්වීමට ආසන්න හෝ එහි වගකීම් ඉටු කිරීමට අපොහොසත්වීමට හෝ එසේ වීමට ඉඩ ඇති බවට හෝ එහි තැන්පත්කරුවන්ට හා වෙනත් ණය හිමියන්ට ගෙවිය යුතු ගෙවීම් අත්හිටුවීමට සිදුවන බව පෙනී යන්නේ නම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒ සම්බන්ධ කිසිදු තීරණයක්/ ක්‍රියාමාර්ගයක් ගැනීමට පෙරාතුව ඒ බව වහාම ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ අංශයේ අධ්‍යක්ෂ වෙත දැන්විය යුතුය.	අනුකූලවී ඇත. බැංකුව නුබුන්වත් වන අතර අදාළ වර්ෂය තුල්දී බැංකුවේ නුබුන්වත්භාවයට අභියෝග කරන කිසිදු අවස්ථාවක් වසර තුල්දී පැන නැගුණේ නැත.
3 (1) (xv)	ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතිකය සහ වෙනත් ආරක්ෂාකාරී පදනම් මත මූල්‍ය මණ්ඩලය විසින් නියම කරනු ලැබ ඇති මට්ටම් වලදී බැංකුව ප්‍රාග්ධනිත බව තහවුරු කර ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය වගබලා ගතයුතුය.	අනුකූලවී ඇත. නියාමන අවශ්‍යතා හා බැංකුවේ නිර්වචනය කරන ලද අවදානම් අභිරුචිය සමග අනුකූලතාවය සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රාග්ධන ප්‍රමාණාත්මකභාවය හා අනෙකුත් විචක්ෂණශීලී පියවර අධීක්ෂණය කෙරෙනු ලැබේ. බැංකුව අවම ප්‍රාග්ධන අවශ්‍යතා සමග අනුකූල වී ඇත.
3 (1) (xvi)	මෙකී නියමයන්හි තෙවන නියමය හා බැංකුවේ අනුකූලතාවය දැක්වෙන වාර්ෂික ආයතනික පාලන වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවේ වාර්ෂික වාර්තාවෙහි ප්‍රකාශයට පත් කළ යුතුය.	අනුකූලවී ඇත. මෙම වාර්තාව වාර්ෂික වාර්තාවේ 167 -181 වන පිටුවේ දැක්වෙන ආයතනික පාලන වාර්තාවේ කොටසකි.
3 (1) (xvii)	එක් එක් අධ්‍යක්ෂවරයෙකු විසින් වාර්ෂිකව සිදු කළ යුතු ස්වයං ඇගයීමේ පටිපාටියක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කළ යුතු අතර එවන් ඇගයීම් වල වාර්තා පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය.	අනුකූලවී ඇත. බැංකුව එක් එක් අධ්‍යක්ෂවරයෙකු විසින් වාර්ෂිකව සිදු කළ යුතු ස්වයං ඇගයීමේ පටිපාටියක් අනුගමනය කරන අතර එය අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා විසින් පවත්වාගෙන යනු ලබයි. කෙසේ වුවද බොහෝ අධ්‍යක්ෂවරුන්ගේ ධූර කාලය 2023 වසර ආරම්භ වන විට අවසන් වූ බැවින් 2022 වසර සඳහා ස්වයං තක්සේරුව අවසන් කර නොමැත.
3 (2)	**අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය**	
3 (2) (i)	අධ්‍යක්ෂ මණ්ඩලයට අයත් අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව 7 ට වඩා අඩු හෝ 13 ට වඩා වැඩි නොවිය යුතුය.	අනුකූලවී ඇත. ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ 8 (1) වගන්තිය ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩලය සභාපතිවරයා ඇතුළුව අධ්‍යක්ෂවරුන් 7 දෙනෙකුගෙන් සමන්විත වෙයි. 2023 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩලය අධ්‍යක්ෂවරුන් 05 දෙනෙකුගෙන් සමන්විත විය. වත්මන් අධ්‍යක්ෂ මණ්ඩලයේ විස්තර පිටු අංක 158 සිට 161 දක්වා මෙම වාර්තාවේ ඇතුළත්වේ.

බැංකු පනතේ නියාමනය සමග අනුකූලවීම

		2023 දී අනුකූලතා මට්ටම
3 (2) (ii)	(අ) ප්‍රධාන විධායක නිලධාරී තනතුර හොබවන අධ්‍යක්ෂවරයෙකු හැරුනු කොට වෙනත් අධ්‍යක්ෂවරයෙකුගේ මුළු සේවා කාලය වසර 9 නොඉක්මවිය යුතුය.	අනුකූලවී ඇත. වත්මන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වසර 09 කට අඩු කාලයක් බැංකුවේ සේවය කර ඇත. ඔවුන්ගේ සේවා කාලය පිළිබඳ විස්තර පිටු අංක 174 දක්වා ඇත.
	(ආ) 2008 ජනවාරි මස 01 දිනට වසර 09 සම්පූර්ණ කර ඇති හෝ 2008 දෙසැම්බර් මස 31 දිනට ප්‍රථම ඕනෑම අවස්ථාවකදී එවන් සේවා කාලයක් සම්පූර්ණ කරන අධ්‍යක්ෂවරයෙකු හට 2009 ජනවාරි මස 01 දින සිට ඇරඹෙන ඉදිරි වසර 3 ක උපරිම කාලයක් සඳහා සේවය කළ හැකිය.	අනුකූලවී ඇත.
3 (2) (iii)	අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව මුළු අධ්‍යක්ෂවරුන්ගේ සංඛ්‍යාවෙන් 1/3 නොඉක්මවන්නේ නම් බැංකුවේ සේවකයෙකු බැංකුවේ අධ්‍යක්ෂවරයෙක් ලෙස (මෙහි මින් මතු විධායක අධ්‍යක්ෂ ලෙස හැඳින්වෙන) පත් කිරීමට, තෝරා පත් කිරීමට හෝ නම් කිරීමට හැකිය. එවන් අවස්ථාවකදී විධායක අධ්‍යක්ෂවරුන්ගෙන් එක් අයෙකු බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරියා විය යුතුය.	අනුකූලවී ඇත. සියළුම අධ්‍යක්ෂවරුන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් වේ.
3 (2) (iv)	අවම වශයෙන් විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරුන් 3 දෙනෙකු හෝ අධ්‍යක්ෂ මණ්ඩලයේ මුළු අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවෙන් 1/3 ක් හෝ මින් කවර හෝ ඉහළ අගයට සරිලන අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවක් අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටිය යුතුය.	අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු ස්වාධීන වන අතර අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු ස්වාධීන නොවන අධ්‍යක්ෂවරු වේ. අධ්‍යක්ෂකත්වයේ කාණ්ඩය පිටු අංක 158-161 දක්වා ඇත.
3 (2) (v)	ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු නියෝජනය කිරීමට විකල්ප අධ්‍යක්ෂවරයෙකු පත් කරනු ලබන අවස්ථාවකදී එසේ පත් කරන ලද පුද්ගලයාද ස්වාධීන අධ්‍යක්ෂවරයෙකුට අදාළ වන නිර්නායක සපුරන අයෙකු විය යුතුය.	අදාළ නොවේ.
3 (2) (vi)	විධායක නොවන අධ්‍යක්ෂවරුන් පිළිගත හැකි වෘත්තිමය පසුබිමක් ඇති සහ/හෝ උපායමාර්ග, කාර්යසාධනය හා සම්පත් ආදී කරුණු සම්බන්ධව ස්වාධීන තීරණයන්ට එළඹිය හැකි අත්දැකීම් හා සුදුසු කුසලතාවයන්ගෙන් සපිරි පිරිසක් විය යුතුය.	අනුකූලවී ඇත. අවශ්‍ය තොරතුරු ඇතුළු අධ්‍යක්ෂවරුන්ගේ පැතිකඩ පිටු අංක 158 සිට 161 දක්වා සඳහන් කර ඇත.
3 (2) (vii)	ඝනපූරණයට අවශ්‍ය අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව සපිරුණද සපැමිණි විධායක නොවන අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව සපැමිණි මුළු අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවෙන් අඩක් නොඉක්මවයි නම් එවන් අවස්ථාවකදී නියමාකාරයෙන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් පැවැත්විය නොහැකිය.	අනුකූලවී ඇත. ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ ඝනපූරණය 4 කි. එය අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවෙන් අඩකට වඩා වැඩි වන අතර අධ්‍යක්ෂවරුන් පස්දෙනාම විධායක නොවන අධ්‍යක්ෂවරුන් වේ.
3 (2) (viii)	බැංකුවේ අධ්‍යක්ෂවරුන්ගේ නම් හෙළිදරව් කෙරෙන සියළු ආයතනික සන්නිවේදනයන්හීදී ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් විශේෂයෙන් හඳුන්වා දිය යුතුය.	අනුකූලවී ඇත. අධ්‍යක්ෂවරුන්ගේ නම් ඇතුළත් කෙරෙන සියළු ආයතනික සන්නිවේදනයන්හී බැංකුවේ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් විශේෂිතව හඳුන්වාදී ඇත. සභාපතිවරයාගේ, විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ, ස්වාධීන හා ස්වාධීන නොවන අධ්‍යක්ෂවරුන්ගේ නම් ඇතුළුව අධ්‍යක්ෂවරු කාණ්ඩය අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය පිටු අංක 174 හි දැක්වේ.
3 (2) (ix)	අධ්‍යක්ෂ මණ්ඩලයට නව අධ්‍යක්ෂවරුන් පත් කිරීම සඳහා විධිමත්, සැලකිල්ලට භාජනයවූ හා විනිවිද භාවයෙන් යුත් කාර්ය පටිපාටියක් පැවතිය යුතුය. එමෙන්ම ක්‍රමවත්ව අනුප්‍රාප්තිකයන් පත්කිරීම පිණිස ද පටිපාටියක් තිබිය යුතුය.	අනුකූලවී ඇත. බැංකුවේ අධ්‍යක්ෂවරුන් පත් කරනු ලබන්නේ ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ 8 (1) (අ) වගන්තිය ප්‍රකාරවය. ඒ අනුව, බැංකුවේ අධීක්ෂණය භාර අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරු පස් දෙනෙක් පත් කෙරේ.එක් අධ්‍යක්ෂවරයෙක් භාණ්ඩාගාර ලේකම් හෝ ඔහු විසින් නම් කරනු ලැබූ තැනැත්තෙක් විය යුතු අතර තවත් අධ්‍යක්ෂවරයෙක් තැපැල්පති හෝ ඔහු විසින් නම් කරනු ලැබූ තැනැත්තෙක් විය යුතුය.

බැංකු පනතේ නියාමනය සමග අනුකූලවීම

		2023 දී අනුකූලතා මට්ටම
3 (2) (x)	තාවකාලික ලෙස පුරප්පාඩුවක් පිරවීම පිණිස පත් කරනු ලබන සියළු අධ්‍යක්ෂවරුන් ඔවුන්ගේ පත්වීමෙන් අනතුරුව පවත්වනු ලබන පළමු මහා සභා රැස්වීමේදී පාර්ශ්වකරුවන්ගේ ජන්ද වීමසීමකට භාජනය විය යුතුය.	අදාළ නොවේ. විෂයභාර අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරුන් පත්කිරීම සිදු කරන හෙයින් මෙවැනි තත්ත්වයක් පැන නොනගී.
3 (2) (xi)	අධ්‍යක්ෂවරයෙකු සිය තනතුරින් ඉල්ලා අස්වන්නේ නම් හෝ ඉවත් කරනු ලබන්නේ නම්, අධ්‍යක්ෂ මණ්ඩලය විසින්; (අ) එම අධ්‍යක්ෂවරයාගේ ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම, එවන් ඉල්ලා අස්වීමකට හෝ ඉවත් කරනු ලැබීමකට බලපෑ හේතුද, එසේ කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරයාට බැංකුව සමග යම් එකඟතාවයකට නොපැමිණීමට හේතුවක් තිබේ නම් එයද ඇතුළුව නිවේදනය කිරීම	අනුකූලවී ඇත. බැංකුවේ එකම කොටස් හිමිකරු වන ශ්‍රී ලංකා රජය, බැංකුව සිය විෂයය පථයට අයත් වන විෂයයභාර අමාත්‍යවරයා මගින් අධ්‍යක්ෂවරු පත් කිරීම මෙන්ම ඉවත් කිරීමද සිදු කරනු ලබයි. ඕනෑම ඉල්ලා අස්වීමක් යොමු කෙරෙන්නේද විෂයයභාර අමාත්‍යවරයා වෙතය. ඉල්ලා අස්වීම් පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව දැනුවත් කෙරේ.
	(ආ) හිමිකරුවන්ගේ අවධානයට යොමු කළ යුතු කරුණු වේද/නොවේද යන්න සහතික කරමින් ප්‍රකාශයක් නිකුත් කළ යුතුය.	බැංකුවේ කොටස් හිමිකරුවා ශ්‍රී ලංකා රජය වන අතර නිල බලයෙන් පත්වන අධ්‍යක්ෂවරුන් හැර අනෙකුත් අධ්‍යක්ෂවරු පස්දෙනාගේ වෙනස්වීම් සිදු කරනු ලබන්නේ රජය විසින් අදාළ අමාත්‍යවරයා හරහාය.
3 (2) (xii)	බැංකු අධ්‍යක්ෂවරයෙකු හෝ සේවකයෙකු වෙනත් බැංකු අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කිරීම, තෝරා පත් කර ගැනීම හෝ නම් කිරීම එකී බැංකුව, පළමුව සඳහන් කළ බැංකුවේ පරිපාලිත සමාගමක් හෝ ආශ්‍රිත සමාගමක් වන්නේ නම් පමණක් හැර සිදු නොකළ යුතුය.	2008 අංක 41 දරණ ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ විධිවිධාන ප්‍රකාරව ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ කොටස් හිමිකාරිත්වය නියෝජනය කරමින් බැංකුවේ සේවකයෙකු වන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වත්කම් සහ ජාත්‍යන්තර බැංකු) ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කිරීම හැර ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂවරු හෝ සේවකයන් වෙනත් බැංකුවල අධ්‍යක්ෂවරු ලෙස පත්කර නොමැත.
3 (3)	**අධ්‍යක්ෂවරුන්ගේ හැකියා හා යෝග්‍ය බව ඇගයීමේ නිර්ණායක**	
3 (3) (i) (අ) සහ (ආ)	අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කරන තැනැත්තෙකුගේ වයස අවුරුදු 70 නොඉක්මවා තිබිය යුතුය.	අනුකූලවී ඇත. වයස අවුරුදු 70 ඉක්මවූ අධ්‍යක්ෂවරු අධ්‍යක්ෂ මණ්ඩලයේ නොමැත.
3 (3) (ii)	යම් පුද්ගලයකු බැංකුවේ පරිපාලිත හෝ ආශ්‍රිත සමාගම්ද ඇතුළුව සමාගම්/ආයතන 20 කට වඩා වැඩි සංඛ්‍යාවක අධ්‍යක්ෂ ධුර නොදැරිය යුතුය.	අනුකූලවී ඇත. කිසිදු අධ්‍යක්ෂවරයෙක් බැංකුවේ පරිපාලිත හෝ ආශ්‍රිත සමාගම්ද ඇතුළුව සමාගම්/ආයතන 20 කට වඩා වැඩි සංඛ්‍යාවක අධ්‍යක්ෂ ධුර දරන්නේ නැත.
3 (3) (iii)	ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන බලපත්‍රලාභී බැංකුවක අධ්‍යක්ෂවරයෙකු හෝ ප්‍රධාන විධායක නිලධාරියෙකු ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන වෙනත් බලපත්‍රලාභී බැංකුවක අධ්‍යක්ෂවරයෙකු හෝ ප්‍රධාන විධායක නිලධාරියෙකු ලෙස ඔහුගේ සේවය අවසන් වූ දින සිට මාස 06 ක කාලයක් ඉකුත්වීමට පෙර පත් නොකළ යුතුය. ප්‍රතිව්‍යුහගත කිරීම අවශ්‍ය බලපත්‍රලාභී බැංකුවල අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රතිසංවිධානය කිරීමේදී විශ්‍රාම යන බැංකුකරුවන්ගේ ප්‍රවීණත්වය අවශ්‍ය විය හැකි අවස්ථා වැනි සුවිශේෂී අවස්ථාවන්හි එහි යම් වෙනසක් මුදල් මණ්ඩලයේ පූර්ව අනුමැතියට යටත්ව සිදු කළ යුතුය. මේ සම්බන්ධයෙන්, බලපත්‍රලාභී බැංකු අධ්‍යක්ෂවරුන් හෝ ප්‍රධාන විධායක නිලධාරියා පත් කිරීමේදී සිසිලන (Cooling – off) කාලසීමාවේ අවශ්‍යතා පිලිපැදීමට සහතික විය යුතුය. බලපත්‍රලාභී බැංකුවට අධ්‍යක්ෂවරයෙකු පත් කරනු ලැබුවහොත්, බලපත්‍රලාභී බැංකුව එවැනි පත් කරන්නෙකුට යම් බලතල ක්‍රියාත්මක කිරීමෙන් හෝ යම් වරප්‍රසාද භුක්ති විඳීමෙන් හෝ ඔහුගේ මඟ පෙන්වීමට පටහැනිව වැලැක්වීමට බලපත්‍රලාභී බැංකුව පියවර ගතයුතුය.	අනුකූලවී ඇත. සමාලෝචිත වර්ෂය තුළ මෙවැනි තත්ත්වයක් ඇති වී නොමැත.

බැංකු පනතේ නියාමනය සමග අනුකූලවීම

		2023 දී අනුකූලතා මට්ටම
3 (4)	**අධ්‍යක්ෂ මණ්ඩලය මගින් පවරන ලද කළමනාකරණ කාර්යභාරය**	
3 (4) (i)	අධ්‍යක්ෂවරුන් විසින් දැනට ක්‍රියාත්මක වන බලතල පැවරීමේ ක්‍රියාපිළිවෙත සුපරීක්ෂාකාරීව අධ්‍යයනය කර පැහැදිලිව අවබෝධ කර ගත යුතුය.	අනුකූලවී ඇත. බලය පැවරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක වේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවේ කටයුතු හා වගකීම් පැවරීමේ ක්‍රමවේදය කලින් කලට සමාලෝචනය කරනු ලබයි. කිසිදු බාධාවකින් තොරව කාර්යක්ෂමව සිය කාර්යයන් ඉටු කිරීමේ අවස්ථාව අධ්‍යක්ෂ මණ්ඩලයට ලබාදෙන අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බලය පැවරීමේ පටිපාටිය සමාලෝචනය හා අනුමත කරන අතර බලතල පැවරීම බැංකුවේ අවශ්‍යතා ආමන්ත්‍රණය කරන බවට සහතික වේ.
3 (4) (ii)	සමස්තයක් ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය සතු කාර්යභාරය ඉටු කිරීමේ හැකියාව අවම කිරීමට හෝ ඊට සැළකිය යුතු ආකාරයෙන් බාධාවක් වන මට්ටමකට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිය කටයුතු අධ්‍යක්ෂ මණ්ඩල කමිටුවකට, ප්‍රධාන විධායක නිලධාරියාට හෝ ප්‍රධාන කළමනාකාරීත්වයට අදාළ පිරිස් වලට පැවරීම නොකළ යුතුය.	
3 (4) (iii)	බැංකුවේ අවශ්‍යතාවලට අදාළ වන ලෙස බලතල පැවරීමේ කාර්ය පටිපාටිය පවතින බවට සහතික කරගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වරින්වර එය සමාලෝචනය කරනු ලබයි.	
3 (5)	**සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී**	
3 (5) (i)	සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී යන භූමිකා වෙනම පැවතිය යුතු අතර, එකම පුද්ගලයෙකු විසින් ඉටු නොකළ යුතුය.	අනුකූලවී ඇත. සභාපතිවරයාගේ සහ ප්‍රධාන විධායක නිලධාරීගේ භූමිකා අතර පැහැදිලි කාර්යභාර වෙන්කිරීමක් ඇත. සභාපතිවරයාගේ සහ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීගේ වගකීම් විග්‍රහ කෙරෙන අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියක් ක්‍රියාත්මකය.
3 (5) (ii)	සභාපති, විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු විය යුතු අතර ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු වන්නේ නම් වඩාත් සුදුසුය. සභාපතිවරයා, ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු නොවන අවස්ථාවකදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සුදුසු පරිදි සීමා නිර්ණ ලේඛනගත කිරීමෙන් අනතුරුව ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයෙක් ලෙස පත් කළ යුතුය. ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයාගේ තනතුර බැංකුවේ වාර්ෂික වාර්තාවේ අනාවරණය කළ යුතු වේ.	අනුකූලවී ඇත. බැංකුවේ සභාපතිවරයා ස්වාධීන සහ විධායක නොවන අධ්‍යක්ෂවරයෙකි.
3 (5) (iii)	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එහි ආයතනික පාලන වාර්තාවෙහි, සභාපතිගේ හා ප්‍රධාන විධායක නිලධාරියාගේ අනන්‍යතාවයද, ඔවුන් අතර පැවතිය හැකි යම් සම්බන්ධතාවයක ස්වභාවයද හෙළිදරව් කළයුතුය.	අනුකූලවී ඇත. සභාපතිගේ හා සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීගේ අනන්‍යතාවය පිළිබඳ තොරතුරු වාර්ෂික වාර්තාවේ පිටු අංක සහ හි සඳහන් කර ඇත. සාමාජිකයින්ගේ හා ප්‍රධාන විධායක නිලධාරීගේ අනන්‍යතාවය පිටු අංක හි සඳහන් කර ඇත. සභාපතිවරයා සහ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී අතර කිසිදු භෞතික, මූල්‍ය, ව්‍යාපාරික හෝ පවුල් සබඳතාවයක් නොමැති බවට අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත්ව සිටී. එසේම, අධ්‍යක්ෂ මණ්ඩලයේ අනෙකුත් සාමාජිකයන් අතරද එවැනි සබඳතා නොමැත.
3 (5) (iv)	සභාපති විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය සැපයීම; අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එහි වගකීම් ඉටු කරන බව හා කාර්යක්ෂමව කටයුතු කරන බව සහතික කිරීම; හා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සියළු ප්‍රධාන හා අවශ්‍ය කරුණු කාලෝචිතව සාකච්ඡාවට බඳුන් කරන බවට වගබලා ගත යුතුය.	අනුකූලවී ඇත. සභාපති විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය සපයනු ලබන අතර, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එහි වගකීම් කාර්යක්ෂමව ඉටු කරන බවට වගබලා ගනියි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සියළුම ප්‍රධාන කරුණු කාලීන අයුරින් සාකච්ඡාවට ගැනෙයි.
3 (5) (v)	සෑම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් සඳහාම න්‍යාය පත්‍රය සැකසීමේ හා අනුමත කිරීමේ මූලික වගකීම සභාපති සතුය.	අනුකූලවී ඇත. සභාපති රැස්වීම් සඳහා න්‍යාය පත්‍රය සකස් කරයි.

බැංකු පනතේ නියාමනය සමග අනුකූලවීම

		2023 දී අනුකූලතා මට්ටම
3 (5) (vi)	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී සාකච්ඡාවට ගැනෙන කරුණු සම්බන්ධයෙන් සියළු අධ්‍යක්ෂවරුන් නිසි ලෙස දැනුවත් කර ඇති බවට මෙන්ම අධ්‍යක්ෂවරුන් වෙත කලට වේලාවට ප්‍රමාණවත් තොරතුරු සැපයෙන බවටද සභාපති විසින් වග බලා ගත යුතුය.	අනුකූලවී ඇත. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී සාකච්ඡාවට ගැනෙන කරුණු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රමාණවත් පරිදි දැනුවත් කර ඇති බවට සභාපති සහතික වේ. ඒ බව සහතික කිරීමෙහිලා පහත දැක්වෙන ක්‍රමවේදය භාවිතයට ගැනේ. • සමාලෝචනය කිරීම, වැඩිමනත් තොරතුරු ලබාගැනීම සහ පැහැදිලි කරගැනීම සඳහා සහ රැස්වීමෙන් අනතුරුව රැස්වීමේදී සාකච්ඡා කළ කරුණු පිළිබඳව පසු විපරම් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමෙන් දින හතකට පෙර රැස්වීමේ වාර්තා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා බෙදා හැරීම. • අවශ්‍යවූ විටෙක ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගෙන් පැහැදිලි කරගැනීම් ලබාගැනීම.
3 (5) (vii)	සභාපති අධ්‍යක්ෂ මණ්ඩලයේ කටයුතු සඳහා පූර්ණ හා සක්‍රිය දායකත්වයක් ලබාදීමට සියළුම අධ්‍යක්ෂවරුන් දිරිමත් කිරීම සහ බැංකුවේ උපරිම යහපත පිණිස අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කරන බවට වගබලා ගැනීම සඳහා ප්‍රමුඛත්වය ගැනීම සභාපති විසින් කළ යුතුය.	අනුකූලවී ඇත.
3 (5) (viii)	විශේෂයෙන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් වෙතින් කාර්යක්ෂම දායකත්වයක් ලබා ගැනීම උදෙසා සභාපති විසින් පහසුකම් සැලසිය යුතු අතර, විධායක හා විධායක නොවන අධ්‍යක්ෂවරුන් අතර සඵලදායී සම්බන්ධතාවයක් පවත්වා ගැනීමට වගබලා ගත යුතුය.	අනුකූලවී ඇත. සමස්ත අධ්‍යක්ෂ මණ්ඩලයම විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වේ.
3 (5) (ix)	සභාපතිවරයා ප්‍රධාන කළමනාකාරිත්වයට අදාළ පිරිස් සම්බන්ධව හෝ කිසිදු ආකාරයකින් අනෙකුත් විධායක රාජකාරී කටයුතු සෘජු අධීක්ෂණයට ලක්කිරීමෙහි නොයෙදිය යුතුය.	අනුකූලවී ඇත සභාපති ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් වන අතර ඔහු ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් අධීක්ෂණය කිරීම හෝ වෙනත් කිසිදු ආකාරයක විධායක කාර්යයන්හි නියුක්ත නොවේ.
3 (5) (x)	කොටස්හිමිකරුවන් සමග සඵලදායී සන්නිවේදනයක් පවත්වා ගැනීමට යෝග්‍ය පියවර ගන්නා බවට හා කොටස් හිමිකරුවන්ගේ මත/අදහස් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සන්නිවේදනය කෙරෙන බවට සභාපති වග බලා ගත යුතුය.	අනුකූලවී ඇත. බැංකුව සිය කොටස් හිමිකරු වන ශ්‍රී ලංකා රජය සමග ඵලදායී සන්නිවේදනයක් පවත්වාගෙන යයි. ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතට අනුව නිළ බලයෙන් පත්වූ අධ්‍යක්ෂවරයා, අධ්‍යක්ෂ මණ්ඩලය කොටස් හිමිකරු අතර සන්නිවේදන මාර්ගය ලෙස ක්‍රියා කරයි.
3 (5) (xi)	ප්‍රධාන විධායක නිළධාරියා, බැංකුවේ එදිනෙදා සිදුකෙරෙන මෙහෙයුම් හා ව්‍යාපාර කළමනාකරණයේ මුදුන් මට්ටමේ භාරකාරත්වය දරන විධායක ලෙස කටයුතු කරයි.	අනුකූලවී ඇත. බැංකුවේ එදිනෙදා කටයුතු සාමාන්‍යාධිකාරී/විධායක නිලධාරී වෙත පවරා ඇත. අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියෙහි සාමාන්‍යාධිකාරී/විධායක නිලධාරියාට පැවරෙන එවැනි බලතල පිළිබඳව විශේෂයෙන් කරුණු ඉදිරිපත් කර ඇත.

බැංකු පනතේ නියාමනය සමග අනුකූලවීම

		2023 දී අනුකූලතා මට්ටම
3 (6)	**අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කළ කමිටු**	
3 (6) (i)	මෙම නියමන්හි 3(6)(ii), 3(6)(iii) 3(6)(iv) සහ 3(6)(v) යන නියමයන් මගින් දක්වා ඇති පරිදි සෑම බැංකුවක්ම අවම වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු 4 ක් පිහිටු විය යුතුය. සියළුම අනු කමිටු සඳහා ලේකම්වරයෙකු පත් කළ යුතුවේ. අධ්‍යක්ෂ මණ්ඩලය වාර්ෂික මහා සභා රැස්වීමේදී එක් එක් අනු කමිටුවේ කාර්යසාධනය, වගකීම් සහ කාර්යභාරය පිළිබඳව වාර්තාවක් සැපයිය යුතුය.	අනුකූලවී ඇත. 2017 අංක 12 දරන බැංකු පනත් නියාමනය ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවධානම් කළමනාකරණ කමිටුව, ලිඛිත යොමු කොන්දේසි සහිතව අනිවාර්යය කමිටු පහක් ස්ථාපිත කර ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ හා උපාය මාර්ගික කමිටුව බැංකුවේ ව්‍යාපාරික අවශ්‍යතා සපුරාලීම සඳහා පත්කර ඇත. සියලුම කමිටු, කමිටු සභාපතිවරුන් හරහා සෘජුවම අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරයි. ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ලේකම්/අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් අදාළ කමිටුවල සභාපතිවරයාගේ අධීක්ෂණය යටතේ රැස්වීම් සංවිධානය කිරීම සහ වාර්තා ආදිය පවත්වාගෙන යන අතර සියලුම කමිටුවල ලේකම් වරයා ලෙස කටයුතු කරයි. අධ්‍යක්ෂ මණ්ඩල කමිටු වාර්තා පිටු අංක 182 සිට 190 දක්වා පිටුවල ඇත. රජය තනි කොටස් හිමියා වන අතර, බැංකුවේ වාර්ෂික වාර්තාව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට සහ බැංකුව භාර අමාත්‍යාංශයට ඉදිරිපත් කෙරේ.
3 (6) (ii)	විගණන කමිටුව සම්බන්ධයෙන් පහත සඳහන් නීති අදාළ වේ.	
	(අ) කමිටුවේ සභාපතිවරයා ගණකාධිකරණයේ සහ/හෝ විගණනයෙහි සුදුසුකම් හා අත්දැකීම් සහිත ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු විය යුතුය.	2023 මූල්‍ය වර්ෂය තුළ විගණන කමිටුවේ සභාපති ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු වන අතර, අවශ්‍ය සුදුසුකම් සහ පළපුරුද්ද දරයි. කමිටුවේ සභාපතිගේ පැතිකඩ 2023 මූල්‍ය වාර්තාවේ පිටු අංක 159 දක්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ සභාපති, විධායක නොවන සහ ස්වාධීන නොවන අධ්‍යක්ෂවරයෙකි. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ සභාපති අවශ්‍ය සුදුසුකම් හා අත්දැකීම් ඇති අයෙකි. කමිටුවේ සභාපතිවරයා පිළිබඳ තොරතුරු 160 පිටුවේ දැක්වේ.
	(ආ) කමිටුවේ සියළුම සාමාජිකයින් විධායක නොවන අධ්‍යක්ෂවරුන් විය යුතුය.	අනුකූලවී ඇත. බැංකුවේ සියළු අධ්‍යක්ෂවරු විධායක නොවන අධ්‍යක්ෂවරු වෙති. එහෙයින්, කමිටුවේ සියළුම සාමාජිකයෝ විධායක නොවන අධ්‍යක්ෂවරු වෙති.
	(ඇ) පහත කරුණු සම්බන්ධයෙන් කමිටුව විසින් නිර්දේශ ඉදිරිපත් කළ යුතුය. (i) අදාළ නීතිවලට අනුකූල වෙමින් විගණන සේවා සඳහා බාහිර විගණකවරයෙකු පත් කිරීම; (ii) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වරින්වර විගණකවරුන් හට නිකුත් කරන ලද උපදෙස් ක්‍රියාත්මක කිරීම; (iii) අදාල ගිණුම්කරණ ප්‍රමිති භාවිතයට ගැනීම සහ; (iv) විගණන කොටස්කරුවන් සමග බැඳීම වසර 5 නොඉක්මවයි නම් සහ පූර්ව කාලසීමාව සම්පූර්ණ කළ දින පටන් වසර 3 ක් ඉකුත්වීමට ප්‍රථම අදාළ විගණන කොටස්කරුවන් හා යලි විගණන බැඳීමකට ඇතුළු නොවන්නේ නම් සේවා කාලය, විගණන ගාස්තු හා විගණකවරයාගේ ඉල්ලා අස්වීම හෝ සේවයෙන් පහකිරීම.	අනුකූලවී ඇත. යොමු නියමයන්ට අනුව අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව අනෙකුත් නිර්දේශ අතර පහත සඳහන් නිර්දේශ කරයි. • ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වරින්වර විගණකවරුන් හට නිකුත් කරන ලද උපදෙස් ක්‍රියාත්මක කිරීම. • අදාල ගිණුම්කරණ ප්‍රමිති භාවිතයට ගැනීම. අදාළ ප්‍රඥප්ති වලට අනුව විගණකාධිපති බැංකුවේ බාහිර විගණකවරයා වශයෙන් කටයුතු කරයි. එබැවින්, බාහිර විගණකවරයා සම්බන්ධයෙන් කමිටුවට වගකීමක් නොපැවරේ.

බැංකු පනතේ නියාමනය සමග අනුකූලවීම

	2023 දී අනුකූලතා මට්ටම
(ඈ) අදාළ වන ප්‍රමිති සහ යහපරිච අනුව විගණන ක්‍රියාවලින්හිදී බාහිර විගණකවරයාගේ ස්වාධීනත්වය, විෂයය මූලිකත්වය සහ කාර්යක්ෂමතාවය කමිටුව විසින් සමාලෝචනය හා නිරීක්ෂණය කළ යුතුය.	අනුකූලවී ඇත. විගණකාධිපතිවරයා බාහිර විගණකවරයා ලෙස කටයුතු කරන බැවින් ස්වාධීනත්වය සහ විෂයය මූලිකත්වය ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් තහවුරු කොට පවත්වාගැනීම සිදු වෙයි. විගණන ක්‍රියාවලියේ කාර්යක්ෂමතාවය පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු රැස්වීම්වලදී රජයේ විගණන අධිකාරී සමග සාකච්ඡා කරනු ලැබේ.
(ඉ) විගණන නොවන සේවා ලබාදීම සඳහා බාහිර විගණකවරයෙකු යොදා ගැනීම පිළිබඳ ප්‍රතිපත්තියක් කමිටුව විසින් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුය.	අදාළ නොවේ. විගණකාධිපතිවරයා බැංකුවේ බාහිර විගණකවරයා ලෙස කටයුතු කරයි. කෙසේ වුවත්, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ ප්‍රඥප්තිය ප්‍රකාරව, තමාට සහයවීම සඳහා විගණකාධිපතිවරයා තවත් බාහිර විගණකවරයෙකු පත් කරන්නේ නම් එමගින් විගණන සේවා සපයන ආයතනයේ ස්වාධීනත්වය, විෂයය මූලිකත්වය සහ කාර්යක්ෂමතාවය කෙරෙහි බලපෑමක් ඇති නොකරයි. 2023 වර්ෂයේ විගණනය සඳහා විගණකාධිපති විසින් අර්නස්ට් ඇන්ඩ් යන්ග් සමාගම (Messers Ernst and Young) උපදේශන කටයුතු සඳහා පත් කරගන්නා ලදී.
(ඊ) කමිටුව විසින් විගණනය ඇරඹීමට ප්‍රථම විගණනයේ ස්වභාවය හා විෂයය පථය පිළිබඳ බාහිර විගණකවරුන් සමග සාකච්ඡා කර අවසන් නිගමනයකට පැමිණිය යුතුය.	අදාළ නොවේ. විගණනයේ විෂයය පථය හා සීමාව බාහිර විගණකවරයා ලෙස කටයුතු කරන විගණකාධිපති විසින් නිර්ණය කරනු ලබයි. 2023 වර්ෂයේ විගණන සැලසුම අභ්‍යන්තර විගණන අංශයෙන් පිළියෙල කොට කමිටුව වෙත ඉදිරිපත් කොට අනුමැතිය ලබාගෙන ඇත.
(උ) බැංකුවේ මූල්‍ය ප්‍රකාශවල, වාර්ෂික වාර්තාවේ ගිණුම්වල හා හෙළිදරව් කිරීම පිණිස සකසා ඇති ත්‍රෛමාසික වාර්තාවන්හි විශ්වසනීය බව හා ඒවායෙහි අන්තර්ගතය, සැලකිය යුතු මූල්‍ය වාර්තාකරණ තීරණ අධීක්ෂණය කරනු පිණිස කමිටුව විසින් බැංකුවේ මූල්‍ය තොරතුරු සාමාලෝචනය කරනු ලැබිය යුතුය. අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට ප්‍රථම බැංකුවේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් හා ත්‍රෛමාසික වාර්තා සමාලෝචනය කිරීමේදී කමිටුව පහත කරුණු කෙරෙහි අවධානය යොමු කළ යුතුය. (i) ප්‍රධාන විනිශ්චය ක්ෂේත්‍ර; (ii) ගිණුම්කරණ ප්‍රතිපත්ති හා යහපරිච වල කිසියම් වෙනස්වීමක්; (iii) විගණනයෙන් පැන නගින සැලකිය යුතු ගැළපීම්; (iv) ව්‍යාපාර අඛණ්ඩතා උපකල්පනය සහ (v) අදාළ ගිණුම්කරණ ප්‍රමිති සහ අනෙකුත් නීතිමය අවශ්‍යතා වලට අනුකූලවීම.	අනුකූලවී ඇත. විගණන කමිටුව විසින් ත්‍රෛමාසික මූල්‍ය ප්‍රකාශන සහ හෙළිදරව් කිරීම පිණිස පිළියෙල කර ඇති බැංකුවේ වාර්ෂික වාර්තාව, ප්‍රකාශයට පත් කිරීමට සූදානම් අවස්ථාවේදී සමාලෝචනය කරන ලදී. මෙම සෑම අවස්ථාවකදීම අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ අවධානය පිණිස අභ්‍යන්තර විගණන අංශය විසින් ලබාදෙන සමාලෝචන වාර්තාවෙහි ගිණුම්කරණ ප්‍රතිපත්තීන්හි වෙනස්කම්, ප්‍රධාන තීරණාත්මක ක්ෂේත්‍රයන්හි විචලන ආදිය පිළිබඳ වෙනම සමාලෝචන වාර්තාවක් අභ්‍යන්තර විගණන අංශය විසින් ඉදිරිපත් කෙරේ. එසේ කිරීමේ අවශ්‍යතාවය මත අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කරනු ලබයි.
(ඌ) අවසන් හා අතුරු විගණනවලින් පැන නගින කරුණු, ගැටළු හා සීමා සහ එම කරුණු ඇතුළුව විගණකවරයා විසින් සාකච්ඡා කිරීමට අපේක්ෂා කරන කරුණක් කමිටුව විසින් සාකච්ඡා කළ යුතුය.	අනුකූලවී ඇත. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් අවසන් හා අතුරු විගණනවලින් පැන නගින කරුණු, ගැටළු හා සීමා සාකච්ඡා කරනු ලබයි. විගණකාධිපතිවරයාගේ නියෝජිතයෝ වසර පුරාම කමිටු රැස්වීම් සඳහා සහභාගී වූහ.
(එ) කමිටුව විසින් බාහිර විගණකවරයාගේ කළමණාකරණ ලිපිය හා ඊට කළමනාකාරිත්වයේ ප්‍රතිචාරය සමාලෝචනයට ලක් කළ යුතුය.	අනුකූලවී ඇත. මුදල් පනතේ 14 (2) (ඇ) සහ 13 (7)(අ) යන වගන්ති යටතේ ඉදිරිපත් කරන ලද බාහිර විගණකවරයාගේ වාර්තාව සහ ඊට අදාළව කළමනාකාරිත්වයේ ප්‍රතිචාරය අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් සමාලෝචනය කරනු ලබයි.

බැංකු පනතේ නියාමනය සමග අනුකූලවීම

		2023 දී අනුකූලතා මට්ටම
	(ඒ) බැංකුවේ අභ්‍යන්තර විගණන කාර්යභාරය සම්බන්ධයෙන් කමිටුව විසින් පහත සඳහන් පියවර ගත යුතුය. (ස)අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ සම්පත්, කාර්ය භාරය හා විෂයය පථය ආදියෙහි ප්‍රමාණවත් බව සමාලෝචනය කිරීම සහ එහි කටයුතු කරගෙන යාමට අවශ්‍ය අධිකාරි බලය දෙපාර්තමේන්තුව සතුව පවතින බවට තෘප්තිමත් වීම.	අනුකූලවී ඇත. 2023 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන කමිටුව විසින් සකස් කරන ලද වාර්ෂික විගණන සැලැස්ම අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව වෙත ඉදිරිපත් කොට අනුමත කර ඇත. සැලැස්මට අදාළ විෂයය පථය, කාර්යයන් සහ සම්පත් අවශ්‍යතා එහි ඇතුළත් වේ.
	(ii) අභ්‍යන්තර විගණන වැඩසටහන් සහ අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ ප්‍රතිඵල සමාලෝචනය කිරීම සහ අවශ්‍ය විටෙක අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ නිර්දේශ මත යෝග්‍ය ක්‍රියාමාර්ග ගනු ලබන බව සහතික කිරීම.	අනුකූලවී ඇත. අභ්‍යන්තර විගණන කමිටුව විසින් අභ්‍යන්තර විගණන සැලැස්ම සහ අභ්‍යන්තර විගණන ක්‍රමවේදයන්හි ප්‍රතිඵල සමාලෝචනය කරනු ලබන අතර වැඩි දියුණු කිරීම් සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගෙන ඇති බවට සහතික වේ.
	(iii) අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගේ හා ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ යම් කාර්යසාධන ඇගයීමක් සමාලෝචනය කිරීම.	ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ/නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (විගණන) ගේ කාර්යසාධනය ඇගයීම සහ අභ්‍යන්තර විගණන කාර්යයේ ක්‍රියාවලිය හා ප්‍රතිඵල ඇගයීම සාමාන්‍යයෙන් සිදු කරනු ලබන්නේ විගණන කමිටුව විසිනි. ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ කාර්යසාධනය ඇගයීම සිදු කෙරෙන්නේ ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් සකස් කරන ලදුව අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව වෙත ඉදිරිපත් කිරීමෙන් පසු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ඇගයීමේ ක්‍රමවේදයට අනුකූලවය. 2022 වර්ෂයට අදාළ ඇගයීම් සිදු කර තිබේ.
	(iv) අභ්‍යන්තර විගණන කාර්යභාරය සඳහා පත්කළ ප්‍රධානියාගේ, ජ්‍යෙෂ්ඨ කාර්යමණ්ඩල සාමාජිකයින්ගේ පත්වීමක් හෝ සේවය අවසන් කිරීමක් නිර්දේශ කිරීම හා කුලී පදනම මත සේවය සපයන ආයතන පත් කිරීම/ඉවත් කිරීම නිර්දේශ කිරීම.	අදාළ නොවේ. වසර තුලදී එවැනි සිදුවීමක් පැන නැගුනේ නැත.
	(v) අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා සහ වෙනත් සමාගම් හරහා සේවා සපයන්නන් ද ඇතුළුව ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ ඉල්ලා අස්වීම් පිළිබඳව කමිටුව දැනුවත් කෙරෙන බවට වග බලා ගැනීම සහ එලෙස ඉල්ලා අස්වූ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින්හට සහ බාහිර සමාගම් හරහා සේවා සපයනු ලබන සේවකයින්හට ඔවුන්ගේ ඉල්ලා අස්වීම් සම්බන්ධ හේතු සැපයීමට අවස්ථාව සැපයීම.	අදාළ නොවේ. වසර තුලදී එවැනි සිදුවීමක් පැන නැගුනේ නැත.
	(vi) අභ්‍යන්තර විගණන කාර්යයන් ස්වාධීනව සිදුකරනු ලබන බවට සහතිකවීම වස් එහි කටයුතු අපක්ෂපාතීව, ප්‍රවීනත්වයකින් හා නිසි වෘත්තීමය සැලකිල්ලකින් යුතුව සිදු කිරීම.	අනුකූලවී ඇත. බැංකුවේ පාලන ව්‍යුහය අනුව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (විගණන) අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව ඔස්සේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සෘජුව වාර්තා කරන අතර බැංකුවේ වෙනත් මෙහෙයුම් වලින් ස්වාධීන වේ.
	(ඔ) සිදුකරන අභ්‍යන්තර විමර්ශනවල මූලික හෙළිදරව් කිරීම් සහ ඊට කළමණාකාරිත්වයේ ප්‍රතිචාර කමිටුව විසින් සැලකිල්ලට ගනු ලැබිය යුතුය.	අනුකූලවී ඇත. කමිටුව විසින් අභ්‍යන්තර විමර්ශනවලදී සිදු කරන ලද මූලික හෙළිදරව් කිරීම් සහ ඊට කළමනාකාරිත්වයේ ප්‍රතිචාර සමාලෝචනය කර ඇත. එවැනි පරීක්ෂණ වල නිර්දේශ ක්‍රියාත්මකවූ බවද සහතික කෙරේ.
	(ඕ) ප්‍රධාන මූල්‍ය නිලධාරියා, ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා සහ බාහිර විගණකවරුන්ගේ නියෝජිතයෙක් සාමාන්‍යයෙන් රැස්වීම් වලට සහභාගී වෙති. විධායක අධ්‍යක්ෂවරුන් නොමැතිව කමිටුව විසින් බාහිර විගණකවරුන් සමග අවම වශයෙන් රැස්වීම් 2 ක් පවත්වා ඇත.	අනුකූලවී ඇත. 2023 වර්ෂය තුළ රැස්වීම් 09 ක් පවත්වා ඇති අතර, විගණකාධිපති කාර්යාලයේ නියෝජිතයා සියළු රැස්වීම් වලට පැමිණ ඇත. සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී ආරාධනයෙන් රැස්වීම් සඳහා සහභාගි වේ. ඉහත රැස්වීම්වලට අමතරව අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC) බැංකුවේ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ බැංකුවේ අභ්‍යන්තර විගණක නොමැතිව බාහිර විගණක (ජාතික විගණන කාර්යාලයේ විගණන අධිකාරී) සමග රැස්වීම් 02 ක් පවත්වන ලදී.

බැංකු පනතේ නියාමනය සමග අනුකූලවීම

		2023 දී අනුකූලතා මට්ටම
	(ක) කමිටුවලට, (i) කමිටුවේ විෂයය ක්ෂේත්‍රයට අයත් ඕනෑම කරුණක් පිළිබඳව විමර්ශනය කිරීමේ පැහැදිලි බලයක්; (ii) ඒ සඳහා අවශ්‍ය සම්පත්; (iii) තොරතුරු ලබාගැනීමේ පූර්ණ හැකියාව; සහ (iv) අවශ්‍ය විටෙක අදාළ අත්දැකීම් සහිත බාහිර පාර්ශ්වයන්ට ආරාධනා කිරීමේ හා බාහිර පාර්ශ්වයන් වෙතින් වෘත්තීමය උපදෙස් ලබා ගැනීමේ අධිකාරිය තිබිය යුතුය.	අනුකූලවී ඇත. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු ප්‍රඥප්තිය අනුව කමිටුවට පහත බලතල ඇත. • සිය යොමු කිරීමේ අනුදේශයට අනුකූලව ඕනෑම කරුණක් විමර්ශනය කිරීමේ පැහැදිලි බලය • එසේ කිරීමට අවශ්‍ය සම්පත් • තොරතුරු ලබාගැනීමේ පූර්ණ හැකියාව • බාහිර වෘත්තිය උපදෙස් ලබාගැනීමේ සහ අවශ්‍ය වෙතොත් සහභාගීවීම සඳහා අදාළ සුදුසුකම් සහිත පුද්ගලයන්ට ආරාධනා කිරීමේ බලය පිටු අංක 182 සිට 184 දක්වා ඇති අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව බලන්න.
	(ග) සාකච්ඡා කළ යුතු කරුණු සම්බන්ධයෙන් නිසි දැනුම්දීමකින් පසුව නිරතුරුව කමිටුව රැස්ව, එහි වගකීම් හා රාජකාරී ඉටු කිරීම සම්බන්ධ නිගමන වාර්තාකර තබා ගත යුතුය.	අනුකූලවී ඇත. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව නිතිපතා රැස්වීම් සැලසුම් කර ඇත. අවශ්‍යවූ විට අමතර රැස්වීම් සංවිධානය කෙරේ. වර්ෂය තුල කමිටුව 09 වතාවක් රැස් වී තිබේ. සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වන කරුණු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු සාමාජිකයන්ට නිසිලෙස පෙර දැනුම්දීමක් සිදු කරනු ලබන අතර එහි රාජකාරී හා වගකීම් ඉටු කිරීමට අදාළ නිගමන අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු ලේකම්/ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් පවත්වාගෙන යනු ලබන වාර්තා වල සටහන් කෙරේ.
	(ඛ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත කරුණු විස්තරාත්මකව හෙළිදරව් කළ යුතුය. (i) විගණන කමිටුවේ ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු; (ii) වර්ෂය තුළ පවත්වන ලද විගණන කමිටු රැස්වීම් සංඛ්‍යාව; සහ (iii) එම රැස්වීම් සඳහා එක් එක් අධ්‍යක්ෂවරයාගේ සහභාගීත්වය පිළිබඳ විස්තර	අනුකූලවී ඇත. පිටු අංක 182 සිට 184 දක්වා ඇති අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාවේ පහත කරුණු අඩංගු වේ. • විගණන කමිටු ක්‍රියාකාරකම් පිළිබඳ විස්තර • 2023 වසර තුල පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු රැස්වීම් ගණන • එම රැස්වීම් වලට අදාළ එක් එක් අධ්‍යක්ෂවරයාගේ සහභාගීත්වය පිළිබඳ තොරතුරු
	(ඡ) කමිටුවේ ලේකම්, සමාගමේ ලේකම් හෝ අභ්‍යන්තර විගණන කාර්යයෙහි ප්‍රධානියා වන අතර, කමිටු රැස්වීම් පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් පිළියෙල කිරීම හා පවත්වාගෙන යාම කළ යුතුය.	අනුකූලවී ඇත. ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් කමිටුවේ ලේකම් ලෙසද කටයුතු කරන අතර විස්තරාත්මක කමිටු වාර්තා පවත්වාගෙන යාම සිදු කෙරේ.
	(ට) මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලනය හෝ වෙනත් කටයුතුවලදී සිදුවිය හැකි විෂමාචාර සම්බන්ධයෙන් සේවකයින්ට සිය රහස්‍යභාවය රැකගනිමින් කරුණු දැක්විය හැකි ආකාරය පිළිබඳ කමිටුව විසින් සමාලෝචනය කළ යුතුය. ඒ අනුව, එවන් කරුණු සම්බන්ධයෙන් ස්වාධීන හා සාධාරණ විමර්ශන පැවැත්වීම සඳහා සුදුසු පියවර ගන්නා බවටත්, බාහිර විගණකවරුන් සමග බැංකුව පවත්වන සබඳතා අධීක්ෂණය සඳහා වන ප්‍රධාන නියෝජිත අධිකාරිය ලෙස ක්‍රියා කිරීමටත් කමිටුව වග බලා ගත යුතුය.	මෙම අංශ ආවරණය වන පරිදි බැංකුව විසින් අනුමත කරන ලද වංචා අවදානම් කළමණාකරනය සහ විස්ල් ඊකදඅසබට ප්‍රතිපත්තියත් ක්‍රියාත්මක කර ඇත. සැලකිය යුතු සොයාගැනීම් සුදුසු පසු විපරම් ක්‍රියාමාර්ග සඳහා වාර්තා වේ. බැංකුවේ සේවකයින් විසින් මතුකරන ඕනෑම ගැටළුවක් සම්බන්ධයෙන් සාධාරණ සහ ස්වාධීන පරීක්ෂණයක් සහ සුදුසු පසු විපරම් ක්‍රියාමාර්ගයක් පැවැත්වීම සඳහා ක්‍රියාවලියක් සහ නිසි ක්‍රියාමාර්ග ක්‍රියාත්මකවේ. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව බාහිර විගණකවරයා සමග බැංකුවේ සබඳතා අධීක්ෂණයට කිරීමේ ප්‍රධාන නියෝජිතයා ලෙස කටයුතු කරයි.
3 (6) (iii)	මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව සම්බන්ධයෙන් පහත නීති අදාළ වේ. (අ) බැංකුවේ අධ්‍යක්ෂවරුන්ට, සමානාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරි හා ප්‍රධාන කළමණාකාරිත්වයට අදාළ පිරිස් වලට අදාළ පාරිශ්‍රමික පිළිබඳ ප්‍රතිපත්තිය (වැටුප්, දීමනා හා වෙනත් මූල්‍ය ගෙවීම්) තීරණය කිරීම.	අනුකූලවී ඇත. 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ 10 වන වගන්තිය හා එහි සංශෝධන අනුව අධ්‍යක්ෂවරුන්ගේ වේතනය විෂයයභාර අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබයි. සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් වල වේතන සාමූහික එකඟතා ගිවිසුම සහ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව විසින් තීරණය කරනු ලබයි.

බැංකු පනතේ නියාමනය සමග අනුකූලවීම

		2023 දී අනුකූලතා මට්ටම
	(ආ) කමිටුව විසින් අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරියා හා ප්‍රධාන කළමණාකාරිත්වයට අදාළ පිරිස් සඳහා අරමුණු හා ඉලක්ක ලබාදිය යුතුය.	අනුකූලවී ඇත. 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ 08 වන වගන්තිය හා එහි සංශෝධන අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ සියළුම අධ්‍යක්ෂවරුන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් වන අතර ඉන් පස්දෙනෙක් පත් කරන්නේ විෂයයභාර අමාත්‍යවරයා විසිනි. අනෙක් දෙදෙනා නිල බලයෙන් පත් වන අධ්‍යක්ෂවරු වෙති. එබැවින්, නිශ්චිත අරමුණු හා ඉලක්ක ඔවුන් වෙත පවරා නැත. සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහාවූ ඉලක්ක හා අරමුණු සකස් කරන්නේ උපාය මාර්ගික ව්‍යාපාර සැලසුම පදනම් කරගෙන වන අතර ඒ පිළිබඳ විස්තරාත්මක පැහැදිලි කිරීමක් බැංකුවේ ක්‍රියාකාරී සැලැස්මෙහි දක්වා ඇත. ඒවා ප්‍රධාන කාර්යසාධන දර්ශක හා සම්බන්ධ වේ.
	(ඇ) කමිටුව විසින්, දෙන ලද ඉලක්ක වලට අනුව ප්‍රධාන විධායක නිලධාරීගේ හා ප්‍රධාන කළමනාකාරිත්වයට අදාළ පිරිස් වල කාර්යසාධනය කලින් කලට ඇගයීම සිදු කළ යුතු අතර වේතන, ප්‍රතිලාභ හා කාර්යසාධනය මත ලබාදෙන වෙනත් දිරිදීමනා සංශෝධනය කිරීමේදී මූලික කරගත යුතු පදනම තීරණය කළ යුතුය.	වාර්ෂිකව සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරියාගේ සහ ප්‍රධාන කළමනාකාරිත්ව අංශයේ කාර්ය සාධනය පිළිබඳ නිර්ණායක පූර්ව ඇගයීම්, නියමිත ඉලක්ක සහ ඉලක්ක වලට එරෙහිව ඉදිරි වර්ෂයේ පළමු කාර්තුවේදී කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී. නව අධ්‍යක්ෂ මණ්ඩලය 2023 මැයි මස පත් කරන ලද අතර ඇගයීම් කාර්යයන් ඉන්පසු සිදු කරන ලදී.
	(ඈ) ප්‍රධාන විධායක නිලධාරී හා සම්බන්ධ කරුණු සාකච්ඡා කරනු ලබන රැස්වීම් හැරුණුවිට අනෙකුත් සෑම කමිටු රැස්වීමකටම ප්‍රධාන විධායක නිලධාරියා සහභාගී විය යුතුය.	අනුකූලවී ඇත. සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී හා සම්බන්ධ කරුණු සාකච්ඡා කරනු ලබන රැස්වීම් හැරුණුවිට අනෙකුත් සෑම කමිටු රැස්වීමකටම සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරියා සහභාගී වී තිබේ.
3 (6) (iv)	නාමයෝජනා කමිටුව සම්බන්ධයෙන් පහත නීති අදාළ වේ. (අ) කමිටුව විසින් නව අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරියෙකු සහ ප්‍රධාන කළමනාකාරිත්වයට අදාළ පිරිස් තෝරා ගැනීම/පත් කිරීම සඳහා කාර්ය පටිපාටියක් ක්‍රියාත්මක කළයුතුය.	ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතට අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන්ගෙන් පස්දෙනෙක් පත් කරන්නේ විෂයයභාර අමාත්‍යවරයා විසින් වන අතර අනෙක් දෙදෙනා නිල බලයෙන් පත් වන අධ්‍යක්ෂවරු වෙති. 11 වගන්තිය වන වගන්තිය ප්‍රකාරව අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ එක් අධ්‍යක්ෂවරයෙකු එහි සභාපති වශයෙන් පත් කළ යුතු වේ. 26 වන වගන්තිය ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සුදුසු හා යෝග්‍ය පුද්ගලයෙකු බැංකුවේ සාමාන්‍යාධිකාරී ලෙස පත් කළ යුතු අතර එම තැනැත්තා බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරීද වේ. අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කිරීමේ කමිටුවේ නිර්දේශ මත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රධාන කළමනාකාරිත්වයට අදාළ පිරිස් පත් කරනු ලැබේ.
	(ආ) චත්මන් අධ්‍යක්ෂවරුන් යළි තෝරා පත් කිරීම, කමිටුව විසින් සලකා බලා නිර්දේශ කිරීම (හෝ නොකිරීම) සිදු කරනු ලබයි.	අදාළ නොවේ. ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතට අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන්ගෙන් පස්දෙනෙක් පත් කරන්නේ විෂයයභාර අමාත්‍යවරයා විසින් වන අතර අනෙක් දෙදෙනා නිල බලයෙන් පත් වන අධ්‍යක්ෂවරු වෙති.
	(ඇ) ප්‍රධාන විධායක නිලධාරී තනතුරට සහ ප්‍රධාන කළමනාකාරිත්වයට අදාළ තනතුරු සඳහා තෝරා පත් කිරීමේ හෝ උසස්කිරීමේ සුදුසුකම් සලකා බැලීමේ නිර්නායක, කමිටුව විසින් සකස් කළ යුතුය.	අනුකූලවී ඇත. 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතට හා එහි සංශෝධන වලට අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත පිළිගත් ක්‍රමවේදයක් මත පදනම්ව සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී පත් කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද උසස්වීම් ක්‍රමයක් බැංකුව තුල ක්‍රියාත්මක කර තිබෙන අතර ප්‍රධාන කළමනාකරණ තනතුරු වලට පත් කිරීම හෝ උසස් කිරීම සඳහා සපුරාලිය යුතු අවශ්‍යතා එහි සඳහන් කර ඇත.
	(ඈ) 3 (3) නියාමනයෙහි අන්තර්ගත නිර්නායක මගින් නිශ්චිත ලෙස දක්වා ඇති පරිදි, අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරී හා ප්‍රධාන කළමනාකාරිත්වයට අදාළ තනතුරු හොබවන පිරිස ඊට සුදුසු හා යෝග්‍ය බවට කමිටුව විසින් සහතික විය යුතුය.	අනුකූලවී ඇත. අධ්‍යක්ෂවරුන් සහ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීගේ පත්කරන අවස්ථාවේදී ඔවුන්ගෙන් අත්සන් සහිත දිවිරුම් ප්‍රකාශ සහ සහතික කිරීමේ ප්‍රකාශ අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් විසින් භාරගනු ලබන අතර ඉන් පසුව එම ප්‍රකාශ මානව සම්පත් සංවර්ධන අංශය විසින් ලබාගෙන යෝග්‍යතාව ඇගයීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යොමු කෙරේ.

බැංකු පනතේ නියාමනය සමග අනුකූලවීම

		2023 දී අනුකූලතා මට්ටම
	(ඉ) විශ්‍රාම යාමට නියමිත අධ්‍යක්ෂවරුන් /ප්‍රධාන කළමණාකාරිත්වයට අදාළ පිරිස් සඳහා අනුප්‍රාප්තික වැඩ පිළිවෙලක් සහ නව විශේෂඥතාවය/අතිරේක අවශ්‍යතා පිළිබඳව සලකා බලා කමිටුව විසින් වරින්වර නිර්දේශ ඉදිරිපත් කළයුතුය.	අනුකූලවී ඇත. සභාපති, අධ්‍යක්ෂවරුන් හා සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරියාගේ පත්වීම් සිදු කෙරෙන්නේ 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතට හා එහි සංශෝධන වලට අනුවය. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අනුප්‍රාප්තික සැලැස්මක් ක්‍රියාත්මක කෙරේ. අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුවේ නිර්දේශය මත අනුප්‍රාප්තික වැඩපිළිවෙලට අනුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රධාන කළමනාකාරිත්වයට අදාළ පිරිස් පත් කරනු ලබයි.
	(ඊ) ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු කමිටුවේ සභාපති ධූරය දැරිය යුතුය. ආරාධනය පිට ප්‍රධාන විධායක නිලධාරී හට රැස්වීම් වලට සහභාගි විය හැකිය.	අනුකූලවී ඇත. කමිටුවේ සභාපතිත්වය දරන්නේ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු විසිනි.
3 (6) (v)	ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව :	
	(අ) ණය, වෙළඳපොළ ද්‍රවශීලතාව, මෙහෙයුම් සහ උපාය මාර්ගික අවදානම වැනි පුළුල් අවදානම් කාණ්ඩ අධීක්ෂණය කිරීම සඳහා අවම වශයෙන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙක්, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් වලින් කමිටුව සමන්විත විය යුතුය. කමිටුව ප්‍රධාන කළමනාකරණ පිරිස් සමග සමීපව කටයුතු කළ යුතු අතර කමිටුව වෙත පවරා ඇති අධිකාරිය සහ වගකීම යන රාමුව තුල අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් තීරණ ගත යුතුය.	අනුකූලවී ඇත. ණය, වෙළඳපොළ ද්‍රවශීලතාව, මෙහෙයුම් සහ උපාය මාර්ගික අවදානම වැනි පුළුල් අවදානම් කාණ්ඩ අධීක්ෂණය කිරීම සඳහා වගකිව යුතු විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙක්, සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන අවදානම් නිලධාරියාගෙන් කමිටුව සමන්විත වේ. ආරාධනය මත අනුකූලතා නිලධාරියා සියළුම රැස්වීම් වලට සහභාගී වේ. අවශ්‍යතාවය මත ඕනෑම ප්‍රධාන කළමනාකරණ නිලධාරියෙකු හෝ සේවක මණ්ඩලයේ නිලධාරියෙකුට ආරාධනා කෙරේ. කමිටුව වෙත පවරා ඇති අධිකාරිය හා වගකීම් රාමුව තුල ප්‍රධාන කළමනාකරණ පිරිස් සමග කමිටුව සමීපව කටයුතු කරයි.
	(ආ) කමිටුව විසින්, බැංකුව මුහුණදෙන සියළු අවදානම්, එනම්, ණය, වෙළඳපොළ ද්‍රවශීලතාව, මෙහෙයුම් සහ උපාය මාර්ගික අවදානම, දර්ශක හා කළමනාකරණ තොරතුරු මත පදනම්ව මාසිකව ඇගයිය යුතුය. පරිපාලිත සමාගම් හා ආශ්‍රිත සමාගම් වල අවදානම් කළමනාකරණය, බැංකු පදනම හා සමූහ පදනම යන දෙයාකාරයෙන්ම සිදු කළ යුතුය.	අනුකූලවී ඇත. අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ නිර්දේශය මත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ණය අවදානම් කළමනාකරණය, වෙළඳපොල හා ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය හා මෙහෙයුම් අවදානම් කළමනාකරණය හා සම්බන්ධ ප්‍රතිපත්ති අනුමත කරනු ලැබ ඇත. එය බැංකුවේ අවදානම් ඇගයීම හා කළමනාකරණ රාමුව සකස් කරනු ලබයි. කමිටුව විසින් සමාලෝචනය කරනු ලබන පූර්ව නිශ්චිත අවදානම් අභිරුචි මට්ටම මත පදනම්ව අවදානම් කළමනාකරණ අංශය විසින් බැංකු පදනමෙන් හා සමූහ පදනමෙන් අවදානම් දර්ශක පිළිබඳ මාසික වාර්තා ඉදිරිපත් කරනු ලබයි.
	(ඇ) කමිටුව විසින් ණය කමිටුව, වත්කම් හා වගකීම් කමිටුව ආදී සියළු කළමනාකරණ කමිටුවල ප්‍රමාණාත්මකභාවය හා ඵලදායීතාවය සමාලෝචනය අතර එමගින් ඒ හා ආශ්‍රිත නිශ්චිත අවදානම් හඳුනාගෙන ඒවා කමිටුව විසින් හඳුනාගෙන ඇති ප්‍රමාණාත්මක හා ගුණාත්මක අවදානම් සීමා යටතේ කළමනාකරණය වගබලාගනු ලබයි .	අනුකූලවී ඇත. ප්‍රමාණවත් බව සහ සඵලතාවය තක්සේරු කිරීමට නිශ්චිත අවදානම් ආමන්ත්‍රණය කිරීම සහ එම අවදානම් කළමනාකරණය කිරීම සහතික කිරීමට නිශ්චිතව දක්වා ඇති පරිදි ප්‍රමාණාත්මක හා ගුණාත්මක අවදානම් සීමාවන් තුළ බැංකුවේ අවදානම් රුචි මට්ටම අනුව ණය කමිටුව, ආයෝජන කමිටුව සහ වත්කම් හා වගකීම් කමිටුව වැනි කළමනාකරණ මට්ටමේ කමිටු වල වාර්තා නිතිපතා පදනමින් සමාලෝචනය කරයි. සියළුම කළමනාකරණ මට්ටමේ කමිටු වල ප්‍රමාණාත්මකභාවය හා ඵලදායීතාවය අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් වාර්ෂිකව සමාලෝචනය කරනු ලබයි.
	(ඈ) නිශ්චිත අවදානම් වලින් ඇතිවන ප්‍රතිඵල අවම කිරීම සඳහා කමිටුව විසින් කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගනු ලබයි.	අනුකූලවී ඇත. කමිටුවේ නිර්දේශ මත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරන ලද දූරදර්ශී මට්ටම් ඉක්මවන ආකාරයේ අවදානම් පැන නගින අවස්ථාවලදී නියාමන හා ප්‍රතිපත්ති මට්ටමේ අවශ්‍යතා මත පදනම්ව එවැනි අවදානම් අවම කිරීම සඳහා කමිටුව විසින් ක්ෂණික නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගනු ලබයි.

බැංකු පනතේ නියාමනය සමග අනුකූලවීම

		2023 දී අනුකූලතා මට්ටම
	(ඉ) යාවත්කාලීන කළ ව්‍යාපාරික අඛණ්ඩතා සැලසුම්ද ඇතුළුව අවදානම් කළමනාකරණයේ සියළු අංශ ඇගයීම සඳහා කමිටුව අවම වශයෙන් ත්‍රෛමාසිකව රැස්විය යුතුය.	අනුකූලවී ඇත. වසර තුල කමිටුව රැස්වීම් පහක් පවත්වා තිබේ. රැස්වීම් හා සහභාගීත්වය පිළිබඳ තොරතුරු පිටු අංක 188 හි දැක්වේ.
	(ඒ) කමිටුව විසින් නිර්දේශ කර ඇති පරිදි සහ/හෝ බැංකු අධීක්ෂණ අංශයේ අධ්‍යක්ෂ විසින් නියම කර ඇති පරිදි නිශ්චිත අවදානම් හඳුනාගැනීමට හා ඒ සම්බන්ධයෙන් නිසි නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට අපොහොසත් වන නිළධාරීන්ට එරෙහිව කමිටුව විසින් යෝග්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	අනුකූලවී ඇත. එවැනි ගැටළු විසඳීම සඳහා බැංකුව විසින් විනය ක්‍රියාපටිපාටියක් ස්ථාපනය කරන ලදී. වසර තුල එවන් අවශ්‍යතාවයක් පැන නොනැගුණි.
	(ඔ) කමිටුව විසින් සෑම රැස්වීමක්ම පවත්වා සතියක් ඇතුළත අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස්, එකඟතාවය සහ/ හෝ උපදෙස් සඳහා අවදානම් ඇගයීම් වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය	අනුකූලවී ඇත. කමිටුවේ නිර්දේශ සහ අවදානම් කළමනාකරණ වාර්තා සමග රැස්වීමට අදාළ සවිස්තරාත්මක වාර්තාව රැස්වීමෙන් පසුව ඊළඟට පැවැත්වෙන පළමු අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම වෙත ඉදිරිපත් කෙරේ.
	(ඕ) බැංකුවේ සියළු මෙහෙයුම් ක්ෂේත්‍ර ආශ්‍රිතව නීති, රෙගුලාසි, නියාමන උපදෙස්, අභ්‍යන්තර පාලන සහ අනුමත ප්‍රතිපත්ති සම්බන්ධයෙන් බැංකුවේ අනුකූලතාව ඇගයීම පිණිස කමිටුව විසින් අනුකූලතා ක්‍රියාවලියක් ස්ථාපිත කළ යුතුය. ප්‍රධාන කළමනාකාරීත්වයට අදාළ පිරිස අතුරෙන් තෝරාගන්නා ලද කැපවීමෙන් කටයුතු කරන අනුකූලතා නිලධාරියෙකු විසින් අනුකූලතා ක්‍රියාවලිය ක්‍රියාවට නැංවිය යුතු අතර, ඒ පිළිබඳව වරින්වර කමිටුවට වාර්තා කළ යුතුය.	අනුකූලවී ඇත. බැංකුවේ සියළු මෙහෙයුම් ක්ෂේත්‍ර ආශ්‍රිතව නීති, රෙගුලාසි, නියාමන උපදෙස්, අභ්‍යන්තර පාලන සහ අනුමත ප්‍රතිපත්ති සම්බන්ධයෙන් බැංකුවේ අනුකූලතාව ඇගයීම පිණිස අනුකූලතා ක්‍රියාවලිය ස්ථාපිත කර තිබේ. මෙම කාර්යය පිළිබඳව ප්‍රධානත්වය දරනු ලබන්නේ අනුකූලතා නිළධාරියා විසිනි. අනුකූලතා නිළධාරියා විසින් කලින් කලට අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව/ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව/අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා ඉදිරිපත් කරනු ලබයි.
3 (7)	**සම්බන්ධිත පාර්ශවවල ගනුදෙනු**	
3 (7) (i)	කිසියම් පුද්ගලයෙකු හා බැංකුව අතර කිසියම් ගනුදෙනුවක් සම්බන්ධයෙන් පැන නැගිය හැකි ඕනෑම ආකාරයේ අනිසි සැලැකිලිමත්කමක් වැළැක්වීමට අවශ්‍ය පියවර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලැබිය යුතුය.	අනුකූලවී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිය අභිලාෂ ගැටීම වළක්වාලීම අරමුණු කරගෙන සම්බන්ධිත පාර්ශවයන්ට වඩා වාසිදායක ලෙස සැලකීම සීමා කිරීම සඳහා සම්බන්ධිත පාර්ශව, ඔවුන්ගේ ගණුදෙනු සහ ඒ ආශ්‍රිත සීමා ආවරණය කෙරෙන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද සම්බන්ධිත පාර්ශව වල ගණුදෙනු පිළිබඳ ප්‍රතිපත්තියක් බැංකුව තුල ක්‍රියාත්මක වේ. ඔවුන්ට අදාළ සම්බන්ධිත පාර්ශව වල ගණුදෙනු තනි තනිව ප්‍රකාශ කරන ලෙස අධ්‍යක්ෂවරුන් වෙත ඉල්ලීම් ඉදිරිපත් කර තිබේ. ස්වයංක්‍රීය පද්ධතියක් ඔස්සේ මෙම ගණුදෙනු නිරීක්ෂණය කෙරේ.
3 (7) (ii)	සම්බන්ධිත පාර්ශව සමග සිදු කරන ගනුදෙනු වල ස්වභාවය මේ නියාමනය තුලින් ආවරණය විය යුතුය.	අනුකූලවී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද සම්බන්ධිත පාර්ශව සමග සිදු කරන ගනුදෙනු පිළිබඳ ප්‍රතිපත්තිය මගින් පහත දැක්වෙන ගනුදෙනු ආවරණය වේ. • ප්‍රදානයේ උපරිම සීමාව පිළිබඳව මූල්‍ය මණ්ඩල නියාමනයේ නිශ්චිතව දක්වා ඇති පරිදි ඕනෑම ආකාරයක ප්‍රදානයක් ලබාදීම. • තැන්පතු, ණය ගැනීම් හා ආයෝජන ලෙස බැංකුවේ ඕනෑම වගකීමක් නිර්මාණය කිරීම. • මූල්‍ය හෝ මූල්‍ය නොවන ඕනෑම සේවාවක් බැංකුවට සැපයීම හෝ බැංකුවෙන් ලබාගැනීම. • එවැනි සම්බන්ධිත පාර්ශව වලට ළඟදායි විය හැකි හිමිකාරීත්ව විභවතාවයකින් යුත්, රහස්‍ය නැතහොත් වෙනත් ආකාරයකින් සංවේදී තොරතුරු බෙදාගැනීමට මග පාදන, බැංකුව හා සම්බන්ධිත පාර්ශව අතර වාර්තාකරණ ක්‍රමවේදයක් සහ තොරතුරු ප්‍රවාහයක් පවත්වාගැනීම. සම්බන්ධිත පාර්ශව හෙළිදරව් කිරීම් යටතේ මේ පිළිබඳ තොරතුරු සටහන් අංක 49.5 පිටු අංක 338 හි දක්වා ඇත.

බැංකු පනතේ නියාමනය සමග අනුකූලවීම

		2023 දී අනුකූලතා මට්ටම
3 (7) (iii)	ඉහත 3 (7) (i) නියමයෙහි නිශ්චිතව දක්වා ඇති පරිදි ඒ හා සමාන ව්‍යාපාරික කටයුතු සිදු කරනු ලබන බැංකුවේ වෙනත් පාර්ශ්වයන්ට ලබා දෙන සැලකීමට වඩා වැඩි සැලකීමක් එවන් පාර්ශව වෙත පිරිනැමෙන ආකාරයෙන් ආශ්‍රිත පාර්ශව සමග ගනුදෙනුවල නියැලීමෙන් වළකින බවට අධ්‍යක්ෂ මණ්ඩලය වගබලා ගත යුතුය.	අනුකූලවී ඇත. බැංකුවේ සම්බන්ධිත පාර්ශව ගනුදෙනු ප්‍රතිපත්තිය මගින් ගනුදෙනු තහනම් කරනු ලබන අතර එමගින් අනෙකුත් ගනුදෙනුකරුවන්ට ලබා දෙන ප්‍රමාණයට වඩා සම්බන්ධිත පාර්ශවයන්ට වඩාත් හිතකර සැලකිලි ලබාදෙනු ඇත. ඒවාට පහත සඳහන් දෑ ඇතුළත් වේ. අ. බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් නියමිත ප්‍රතිශතය ඉක්මවා සම්බන්ධිත පාර්ශවයන්ට මුලු ශුද්ධ පහසුකම් ප්‍රදානය කිරීම. ආ. බැංකුවේ හොඳම ණයදීමේ අනුපාතිකයට වඩා අඩු පොලී අනුපාතිකයක් අය කිරීම හෝ නොබැඳි සැසඳිය හැකි ප්‍රතිපාර්ශවයක් සමග සැසඳිය හැකි ගනුදෙනුවක් සඳහා බැංකුවේ තැන්පතු අනුපාතයට වඩා වැඩි මුදලක් ගෙවීම. ඇ. සම්බන්ධිත නැති පාර්ශවයන් සමග සිදුකරන සාමාන්‍ය ව්‍යාපාරයේදී ලබාදී ඇති කොන්දේසි ඉක්මවා යමින් හිතකර කොන්දේසි, වෙළඳ පාඩු ආවරණය කිරීම සහ/හෝ ගාස්තු, කොමිස් නිදහස් කිරීම වැනි වරණීය පහසුකම් සැපයීම ඈ. ඇගයීම් ක්‍රියාපටිපාටියකින් තොරව සම්බන්ධිත පාර්ශවයකට සේවා සැපයීම හෝ සේවා ලබාගැනීම ඉ. නීත්‍යානුකූල රාජකාරි සහ කාර්යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය පරිදි හැර, අදාළ පාර්ශව සමග විභව හිමිකාර, රහස්‍ය හෝ වෙනත් සංවේදී තොරතුරු හුවමාරු කර ගැනීමට හේතු වියහැකි වාර්තාකරණ පිළිවෙල සහ තොරතුරු ප්‍රවාහයන් පවත්වාගෙන යාම. අනුකූලතා අංශය විසින් අධීක්ෂණය කරනු ලබන සහ අනුකූලතා තත්වය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන මාසික අනුකූලතා වාර්තාවේ දක්වා ඇති අදාළ පාර්ශව ගනුදෙනු අධීක්ෂණය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත ක්‍රියාවලියක් බැංකුව විසින් ක්‍රියාත්මක කර ඇත. තවදළ අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානයට ගෙන එන යම් අනුකූලතාවයක් නොමැති නම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විසඳනු ලැබේ. සාමාන්‍ය ව්‍යාපාරයේදී සම්බන්ධිත පාර්ශවය සමග සිදු කරනු ලබන ගනුදෙනු (ඇත්නම්) 49.5 සටහනේ 338 පිටුවේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධිත පාර්ශව හෙළිදරව් කිරීම මගින් අනාවරණය කර ඇත.
3 (7) (iv)	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී අදාළ අධ්‍යක්ෂවරයා හැර අනෙකුත් අධ්‍යක්ෂවරුන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු පිරිසකගේ ඡන්දයෙන් අනුමැතිය ලැබී ඇති විට හැර බැංකුවක් එහි අධ්‍යක්ෂවරයෙකුට හෝ එවැනි අධ්‍යක්ෂවරයෙකුගේ සමීප ඥාතියෙකුට කිසිදු ආකාරයක ප්‍රදානයක් ලබාදීමට කටයුතු නොකළ යුතුය.	අනුකූලවී ඇත. එවැනි සිදුවීම් වාර්තා වී නොමැත.
	(අ) බැංකුවක් මගින්, යම් පුද්ගලයෙකුට හෝ පුද්ගලයෙකුගේ සමීප ඥාතියෙකුට හෝ පුද්ගලයෙකුගේ සැලකිය යුතු උනන්දුවක් ඇති අරමුණක් වෙනුවෙන් කිසියම් ප්‍රදානයක් ලබාදී ඇති විටක, පසු කාලීනව එකී පුද්ගලයා බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් වුවහොත් එම පුද්ගලයා අධ්‍යක්ෂවරයෙකු ලෙස පත්වීමෙන් වසරක් ඇතුළත ඒ සඳහා මූල්‍ය මණ්ඩලයේ අනුමැතිය ලද හැකි වන පරිදි සුදුසු ඇපකරයක් ලබා ගැනීමට බැංකුව කටයුතු කළ යුතුය.	අනුකූලවී ඇත. අධ්‍යක්ෂවරයෙක් ලෙස පත්වීම් ලැබීමට පෙර සියළුම අධ්‍යක්ෂවරුන් වෙතින් ප්‍රකාශ ලබාගැනීමට අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් කටයුතු කරන අතර එයට වැඩිමනත් ගනුදෙනු ඇත්නම් ඒවාද ප්‍රකාශ කරන ලෙස ඉල්ලා සිටී. අවශ්‍යතායක් පැන නගින විට මුදල් මණ්ඩලය විසින් අර්ථ දක්වා ඇති පරිදි අවශ්‍ය ආරක්ෂාව ලබාගැනීමේ අවශ්‍යතා පිලිබඳව බැංකුවේ සේවකයින් දැනුවත්ය.

බැංකු පනතේ නියාමනය සමග අනුකූලවීම

		2023 දී අනුකූලතා මට්ටම
	(ආ) 3 (7) (v) (අ) නියාමනයෙන් එවැනි ඇපකරයක් ලබාදී නොමැති විටක එවැනි ප්‍රදානයක් ලබාදෙන අවස්ථාවේ නිශ්චිතව දක්වා ඇති කාල සීමාව තුල හෝ පත්වීම් ලද දින සිට මාස දහඅටක කාලයක් ඉකුත්වී ඇති විට හෝ ඉහත අවස්ථා දෙකෙන් කලින් යෙදෙන අවස්ථාවට අනුව ඕනෑම ප්‍රදානයක් හේතුවෙන් ගෙවිය යුතු ඕනෑම මුදලක් පොලිය සමග එම අධ්‍යක්ෂවරයාගෙන් අයකරගැනීමට බැංකුව පියවර ගත යුතුය.	අනුකූලතා අංශය විසින් මෙම නියාමනය සම්බන්ධ ක්‍රියාවලිය නිරීක්ෂණය කරනු ලබන අතර ඒ පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ත්‍රෛමාසික වාර්තාවක් ඉදිරිපත් කෙරේ.
	(ඇ) ඉහත උප නියාමන වලට අනුකූලවීමට අපොහොසත් වන ඕනෑම අධ්‍යක්ෂවරයෙක් අධ්‍යක්ෂ ධූරයෙන් ඉවත්වූ බවට සැලකෙන අතර බැංකුව එවැන්නක් පිළිබඳ කරුණු මහජනතාවට හෙළි කළ යුතුය.	
	(ඈ) කෙසේවෙතත්, ප්‍රදානය කරන අවස්ථාවේදී බැංකුවේ සේවකයෙක්වූ සහ එම බැංකුවේ සියළු සේවකයන්ට අදාළ වන යෝජනා ක්‍රමයක් යටතේ ප්‍රදානය ලබාදුන් අධ්‍යක්ෂවරයෙකුට මෙම උපනියාමනය අදාළ නොවේ.	
3 (7) (vi)	බැංකුවේ කාර්යමණ්ඩලයට අදාළ වන යෝජනා ක්‍රමයක් හැරුණු කොට වෙනත් කිසිදු ආකාරයක ප්‍රදානයක් හෝ "වඩා වාසිදායක සැලකීමක්" ලබාදීමට බැංකුවක් කටයුතු නොකළ යුතුය.	අනුකූලවී ඇත. කාර්යමණ්ඩල ප්‍රතිලාභ හැරුණු විට බැංකුවේ සේවකයන්ට වඩා වාසිදායක ලෙස සැලකීම හෝ ප්‍රදාන ලබාදීම සිදු කර නොමැත. වෙනත් සේවකයන්ට හෝ සමීප ඥාතීන්ට විශේෂ සැලකීම් ලබාදීමෙන් වළකින ලෙස චක්‍රලේඛ උපදෙස් මගින් බැංකුවේ සේවකයන් දැනුවත් කර ඇත.
3 (7) (vii)	ඉහත 3 (7) (v) සහ 3 (7) (vi) යන නියමන් යටතේ බැංකුවක් විසින් ලබාදෙන ලද ප්‍රදානයක් හෝ එවැනි ප්‍රදානයක කිසිදු කොටසක් හෝ ඊට අදාළ වන කිසිදු පොළියක් හෝ මුදල් මණ්ඩලයේ පූර්ව අනුමැතියෙන් තොරව ප්‍රේෂණය නොකළ යුතු අතර එවැනි අනුමැතියකින් තොරව සිදු කරනු ලබන ඕනෑම ප්‍රේෂණයක් බල රහිත හා ඵල රහිත වේ.	අනුකූලවී ඇත. එවැනි සිදුවීම් වාර්තා වී නොමැත.
3 (8)	**හෙළිදරව් කිරීම්**	
3 (8) (i)	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත කරුණු සම්බන්ධයෙන් සහතික විය යුතුය.	
	(අ) අධීක්ෂණ හා නියාමන අධිකාරීන් විසින් නිර්දේශ කරනු ලබන ආකෘති වලට අනුකූල වන ලෙස සහ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අදාළ වන පරිදි වාර්ෂික විගණිත මූල්‍ය ප්‍රකාශන සහ ත්‍රෛමාසික මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ප්‍රකාශයට පත් කිරීම.	අනුකූලවී ඇත.
	(ආ) එවන් ප්‍රකාශ සංක්ෂිප්තව සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පුවත්පත්හි පළ කිරීම.	අනුකූලවී ඇත.
3 (8) (ii)	පහත සඳහන් අවම හෙළිදරව් කිරීම් වාර්ෂික වාර්තාවෙහි සිදුකර ඇති බවට සහතික කර ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය වගබලා ගත යුතුය.	
	(අ) නිශ්චිත හෙළිදරව් කිරීම් ඇතුළුව, අදාළ ගිණුම්කරණ ප්‍රමිති හා නියාමන උපදෙස් වලට අනුව විගණිත වාර්ෂික මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇති බවට සඳහන් කෙරෙන ප්‍රකාශයක්.	අනුකූලවී ඇත. වාර්ෂික විගණන මූල්‍ය වාර්තාව සකස් කිරීමේදී අදාළ ගිණුම්කරණ ප්‍රමිති හා නියාමන අවශ්‍යතා වලට අනුකූලවීම පිළිබඳ හෙළිදරව් කිරීම් පිටු අංක සිට දක්වා ඇති "මූල්‍ය වාර්තාකරණය සඳහා වන අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය" සහ පිටු 223 දක්වා ඇති "සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීගේ (මූල්‍ය හා ආයතනික සැලසුම් හා තොරතුරු පද්ධති) වගකීම් පිළිබඳ ප්‍රකාශනයෙහි" පිටු අංක 227 හි ඇතුළත් වේ.

බැංකු පනතේ නියාමනය සමග අනුකූලවීම

	2023 දී අනුකූලතා මට්ටම
(අ) මූල්‍ය වාර්තාකරණයෙහි විශ්වාසනීය බව සම්බන්ධයෙන් සාධාරණ සහතිකයක් සැපයීම අරමුණු කරගනිමින් මූල්‍ය වාර්තාකරණ පද්ධතිය සැලසුම් කර ඇති බවට සහ බාහිර අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා නියාමන උපදෙස් වලට අනුකූලව සිදු කෙරෙන බව තහවුරු කිරීම සඳහා වන බැංකුවේ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාවක්.	අනුකූලවී ඇත. මූල්‍ය වාර්තාකරණයෙහි විශ්වාසනීය බව සම්බන්ධයෙන් සාධාරණ සහතිකයක් ලබාදීම සඳහා මූල්‍ය වාර්තාකරණ පද්ධතිය සැලසුම් කර ඇති බව සහ බාහිර අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා නියාමන උපදෙස් වලට අනුකූලව සිදු කර ඇති බව වාර්ෂික වාර්තාවට ඇතුළත් කර ඇති බව පහත දැක්වෙන වාර්තා ඔස්සේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සනාථ කරනු ලැබ ඇත. • පිටු අංක 217 සිට 222 හි ඇති අධ්‍යක්ෂ මණ්ඩල වාර්ෂික වාර්තාව • පිටු අංක 223 හි දක්වා වන මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් ප්‍රකාශය • පිටු අංක 224 සහ 225 හි ඇති මූල්‍ය වාර්තාකරණයේ අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය
(ආ) 2008 දෙසැම්බර් 31 දිනෙන් පසුව පිළියෙල කරන ලද හෝ ප්‍රකාශයට පත් කරන ලද කිසියම් ප්‍රකාශයක් සම්බන්ධයෙන් ඉහත 3 (8) (ii) (අා) නියාමනයෙහි සඳහන් අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයෙහි ඵලදායීතාවය පිළිබඳ බාහිර විගණකවරයාගේ සහතිකය.	අනුකූලවී ඇත. මූල්‍ය වාර්තාකරණයේ අභ්‍යන්තර පාලනයේ ඵලදායීතාව පිළිබඳව පිටු අංක 226 හි දැක්වෙන සහතිකය බැංකුව විසින් ලබාගෙන ඇත.
(ඇ) අධ්‍යක්ෂවරුන් පිළිබඳ තොරතුරු (i) නම්, නිසි යෝග්‍යතාවය සහ දේපල (ii) බැංකුව සමග ඇති ගනුදෙනු සහ; (iii) බැංකුව විසින් ගෙවන ලද මුළු ගාස්තු/පාරිශ්‍රමික	අනුකූලවී ඇත. චර්ෂය තුළ නිලතල දැරූ අධ්‍යක්ෂවරුන්ගේ පසුබිම් තොරතුරු පිටු අංක 158 - 161. මූල්‍ය වාර්තා වල සටහන් අංක 49.5 පිටු අංක 338 යොමුවන්න. මූල්‍ය වාර්තා වල සටහන් අංක 49.5.1 පිටු අංක 338 යොමුවන්න.
(ඉ) 3 (7) (iii) හි නියම කර ඇති පරිදි, සම්බන්ධිත පාර්ශවයන්ගේ එක් එක් කොටසකට ලබාදී ඇති සමස්ත ශුද්ධ ප්‍රදාන. අදාළ පාර්ශවවල එක් එක් කොටසකට ප්‍රදානය කර ඇති සමස්ත ශුද්ධ ප්‍රදාන බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙහි ප්‍රතිශතයක් ලෙස හෙළිදරව් කළ යුතුය.	අනුකූලවී ඇත. බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙහි ප්‍රතිශතයක් ලෙස පිරිනමා ඇති ශුද්ධ ප්‍රදාන පිළිබඳව පිටු අංක 338 හි දැක්වෙන මූල්‍ය ප්‍රකාශ යටතේ සටහන මගින් ඉදිරිපත් කර ඇත.
(ඊ) බැංකුව විසින් එහි ප්‍රධාන කළමනාකාරිත්වයට අදාළ පිරිස් වෙත ගෙවන ලද වේතන වල සමුච්චිත අගය සහ වේතන ආදී පුළුල් වර්ගීකරණ යටතේ දක්වා ඇති බැංකුව හා එහි ප්‍රධාන කළමනාකාරිත්වයට අදාළ පිරිස් අතර සිදු කෙරුණු ගනුදෙනුවල සමුච්චිත අගය.	අනුකූලවී ඇත. පිටු අංක 338 හි දැක්වෙන මූල්‍ය ප්‍රකාශ යටතේ අංක 49.5.1 සටහන මගින් අදාළ විස්තර දක්වා ඇත.
(උ) ආයතනික පාලන වාර්තාවේ මෙම නියාමන සමග අනුකූලවීම සම්බන්ධයෙන් බාහිර විගණකවරයාගේ වාර්තාව	අනුකූලවී ඇත. බැංකුව 2007 අංක 12 දරන ආයතනික පාලන නියාමනයට අනුකූල වන මට්ටම පිළිබඳව බැංකුව විගණකාධිපතිවරයා වෙතින් සහතිකයක් ලබාගෙන ඇත. විගණකවරයාගේ සියළු හෙළිදරව් කිරීම් මෙම ආයතනික පාලන වාර්තාවට ඇතුළත් කර ඇත.
(ඌ) විචක්ෂණශීලී අවශ්‍යතා, රෙගුලාසි, නීති, අභ්‍යන්තර පාලන සහ කිසියම් සැලකිය යුතු අනුකූල නොවීමේ අවස්ථාවක් නිවැරදි කිරීමට ගන්නා ලද ක්‍රියාමාර්ග යනාදිය ඇතුළත් වාර්තාවක්	අනුකූලවී ඇත. පිටු අංක 223 හි සඳහන් මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම යටතේ විචක්ෂණශීලී අවශ්‍යතා, රෙගුලාසි, නීති, අභ්‍යන්තර පාලන සමග අනුකූලවීම පිළිබඳ තොරතුරු පැහැදිලිව දක්වා ඇත.
(එ) බැංකුවේ අවදානම් කළමනාකරණයේ අඩුලුහුඬුකම් පිළිබඳ නියාමන හා අධීක්ෂණ කරුණු හෝ බැංකු අධීක්ෂණ අංශයෙහි අධ්‍යක්ෂ විසින් පෙන්වා දෙන ලද, මෙකී නියාමයන්ට අනුකූල නොවන අවස්ථා සහ එසේ මූල්‍ය මණ්ඩලය විසින් මහජනතාවට හෙළිදරව් කළ යුතු යැයි නියම කරන ලද එවැනි කරුණු මෙන්ම එම කරුණු සම්බන්ධයෙන් බැංකුව විසින් ගනු ලැබූ පියවර ඇතුළත් ප්‍රකාශයක්	2023 කාලපරිච්ඡේදය තුළ එවැනි ආකාරයේ සිදුවීමක් සිදු නොවූ අතර, එම නිසා මුදල් මණ්ඩලය විසින් එම වර්ෂය තුල කිසිදු හෙළිදරව් කිරීමක් ප්‍රසිද්ධියට පත්කිරීමට උපදෙස් දී නොමැත.

බැංකු පනතේ නියාමනය සමග අනුකූලවීම

		2023 දී අනුකූලතා මට්ටම
3 (9)	**සංක්‍රාන්තික හා වෙනත් පොදු ප්‍රතිපාදන**	
3 (i)	2008 ජනවාරි 01 වෙනිදා සිට මෙම විධිවිධාන වලට අනුකූලව කටයුතු කිරීම ආරම්භ වන අතර, මෙම විධිවිධානයන්හි විශේෂයෙන් සඳහන් කර නොමැති නම් සියළුම ලියාපදිංචි වාණිජ බැංකු විසින් 2009 ජනවාරි 01 වන දිනට හෝ ප්‍රථමව මෙම විධිවිධානයන්හි ප්‍රතිපාදන වලට අනුකූලව කටයුතු කළ යුතුය.	අනුකූලවී ඇත. බැංකුව විසින් අදාළ සංක්‍රාන්තික ප්‍රතිපාදන සමග අනුකූල වී ඇත.
3 (9) (ii)	නිශ්චිත ප්‍රඥප්තියක් මගින් ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත බැංකු විසින් අදාළ ප්‍රඥප්තිවල සඳහන් කර ඇති ආකාරයට කටයුතු කරන බවට අනුකූල වන බවටත් එසේ නොවන අවස්ථාවලදී මෙම විධිවිධානවලට අනුකූල වන බවටත් අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කළ යුතුය.	අනුකූලවී ඇත. 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත හා එහි සංශෝධනවලට මෙම විධිවිධානයෙහි සඳහන් ප්‍රතිපාදනවලට නොගැලපෙන අවස්ථාවන්හිදී අනුකූලවීම සඳහා අදාළ සියළු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලබයි. ඒ අනුව මෙහි සඳහන් විධිවිධාන වලට අනුකූල නොවී ජාතික ඉතිරිකිරීමේ බැංකුවට අදාළ ප්‍රඥප්තිවලට අනුකූලව කටයුතු කරන අවස්ථාවන්වලදී ඒවා ඒ ඒ අංශවලදී විශේෂයෙන් සඳහන් කර ඇත.
3 (9) (iii)	එවැනි බැංකුවක සංස්ථාපිත රටෙහි අදාළ වන රෙගුලාසි සහ නීතිවලට පටහැනි නොවන තරමට ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන විදේශීය බැංකුවල ශාඛාවලට මෙම උපදෙස් අදාළ වේ. විදේශීය බැංකුවක ශාඛාව විසින් එහි මව් බැංකුවේ වාර්ෂික ආයතනික පාලන වාර්තාව එහි වාර්ෂික වාර්තාව සහ ශ්‍රී ලංකාවේ ශාඛා මෙහෙයුම් පිළිබඳ ගිණුම් ද ප්‍රකාශයට පත් කළ යුතුය.	අදාළ නොවේ.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ යහපරිච සංග්‍රහය සමග අනුකූලතාව

කේතය යොමුව	මූලධර්ම
A	**අධ්‍යක්ෂවරු**
A.1	**අධ්‍යක්ෂ මණ්ඩලය** 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත හා එහි සංශෝධන වල දක්වා ඇති පරිදි සභාපති ඇතුළු විධායක නොවන අධ්‍යක්ෂවරු සත්දෙනෙකුගෙන් ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වේ. ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත අනුව ඉන් පස් දෙනෙක් අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන අතර නිළ බලයෙන් පත් වන අධ්‍යක්ෂවරු දෙදෙනාගෙන් එක් අයෙක් භාණ්ඩාගාර ලේකම් හෝ ඔහු විසින් නම් කරන ලද අයෙක් විය යුතු අතර අනෙක් පුද්ගලයා තැපැල්පතිවරයා හෝ ඔහු විසින් නම් කරන ලද තැනැත්තෙක් විය යුතුය. සභාපති විසින් ප්‍රධානත්වය දරන අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවේ තීරණ ගැනීමේ අග්‍රස්ථානය වේ. ඵලදායී පාලනයක් සහිතව සෘජු නායකත්වයෙන් යුතුව බැංකුව මෙහෙයවීමට හැකි කීර්තිමත් වෘත්තිකයන් 05 දෙනෙකුගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයක් වර්ෂය තුළදී විය. 2023 වර්ෂයේ අධ්‍යක්ෂවරුන්ගේ විස්තර 158 සිට 161 දක්වා පිටුවල දක්වා ඇත.
A.1.1	**විධිමත් රැස්වීම්** අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් අවම වශයෙන් සෑම සති 6 කට වරක් වත් පැවැත්විය යුතු බව, අවශ්‍ය යැයි සිතිය හැකි සෑම විටම අධ්‍යක්ෂ මණ්ඩලය රැස්විය යුතු බවට නියම කර ඇති ප්‍රඥප්තියට අනුකූලව වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩලය විධිමත්ව රැස්වී ඇත. වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 11 ක් කැඳවා ඇත. අදාළ ප්‍රඥප්තීන්ට අනුකූල වෙමින් අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු වසර තුළ විධිමත්ව රැස් විය. අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීම් වල විධිමත්භාවය සහ තොරතුරු ඉදිරිපත් කිරීමේ රාමුව හා ක්‍රමවේදය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය එකඟතාවය පළ කර තිබෙන අතර ඒවා ලේඛණගත කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩල සහ අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු රැස්වීම් පිළිබඳ තොරතුරු 173 හා 174 පිටුවල දක්වා ඇත.
A.1.2	**අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරය සහ වගකීම්** අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇති කාර්යභාරය සහ වගකීම් අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියේ අන්තර්ගත කර තිබෙන අතර ඒ පිළිබඳ විස්තර 172 පිටුවේ දක්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තිය අවසන් වරට සමාලෝචනය කරන ලද්දේ 2022 වර්ෂයේදීය. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වේ.
A.1.3	**අධ්‍යක්ෂ මණ්ඩලය මෙරට නීතිය හා අනුකූලව කටයුතු කරයි.** මෙහෙයුම් ආශ්‍රිතව බැංකුවට අදාළ වන නීති, ශ්‍රී ලංකා මහ බැංකු නියාමන සහ මාර්ගෝපදේශ හා ජාත්‍යන්තර යහපරිච සමග බැංකුව අනුකූලවී ඇති බව සහතික කිරීම සඳහා අනුමත කරන ලද පටිපාටියක් අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ. මේ සඳහා ස්වාධීන වෘත්තීය උපදෙස් ලබාගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයට අවශ්‍ය විය හැකි ක්‍රියා පටිපාටි මෙයට ඇතුළත් වන අතර ඒ සඳහා වන පිරිවැය බැංකුව විසින් දරනු ලැබේ.
A.1.4	**අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්ගේ උපදෙස් හා සේවය ලබාගැනීම සහ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් පත්කිරීම හෝ ඉවත් කිරීම** අධ්‍යක්ෂ මණ්ඩල පටිපාටි අනුගමනය කෙරෙන බව සහ අදාළ වන නීති හා නියාමන සමග අනුකූල වන බව සහතික කිරීමේ වගකීම පැවරෙන අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයාගේ උපදෙස් හා සේවය ලබාගැනීමේ අවස්ථාව සියළුම අධ්‍යක්ෂවරුන්ට හිමිවේ. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් යනු ප්‍රධාන කළමනාකරණ පිරිසට අයත් තනතුරක් හෙයින් අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් පත් කිරීම හෝ ඉවත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුවේ උපදෙස් මත සමස්ත අධ්‍යක්ෂ මණ්ඩලය සම්බන්ධ වන කාර්යයකි. සමාගමේ ලේකම්වරයාගේ භූමිකාව පිළිබඳ වැඩිදුර විස්තර සඳහා "අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්ගේ භූමිකාව" පිළිබඳ 180 පිටුව බලන්න.
A.1.5	**ස්වාධීන විනිශ්චය** බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය ඔවුන්ගේ ක්ෂේත්‍රවල ප්‍රවීණයන් වන අතර උපාය මාර්ග, කාර්ය සාධනය, සම්පත් බෙදා හැරීම, අවදානම් කළමනාකරණය, අනුකූලතාවය සහ ව්‍යාපාර ආචාරධර්ම පිළිබඳ ප්‍රමිති ආශ්‍රිත කරුණු සම්බන්ධයෙන් හැමවිටම ස්වාධීන තීරණ වලට එළඹෙයි.
A.1.6	**අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ සමාගමේ කටයුතු වෙනුවෙන් ප්‍රමාණවත් පරිදි කාලය සහ ශ්‍රමය කැප කිරීම** අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු රැස්වීම් ප්‍රමාණවත් කාලයකට පෙර සංවිධානය කෙරෙන අතර අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සමාලෝචනයට, අමතර තොරතුරු ඉල්ලා සිටීමට සහ රැස්වීමෙන් පසු රැස්වීමේ සාකච්ඡා කරන ලද කරුණු පිළිබඳව පසු විපරමක යෙදීම සඳහා අධ්‍යක්ෂවරුන්ට ප්‍රමාණවත් කාලයක් ලැබෙන බව සහතික කිරීමට සාමාන්‍යයෙන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට සතියකට පෙර ඉලෙක්ට්‍රොනික මාධ්‍යයක් ඔස්සේ අදාළ පත්‍රිකා අධ්‍යක්ෂවරු අතර සංසරණය කිරීම සඳහා විධිවිධාන පවතී. ව්‍යාපාරික මෙහෙයුම්, අවදානම් හා පාලන සම්බන්ධයෙන් යම් අවබෝධයක් ලබාගැනීමට ප්‍රමාණවත් කාලයක් එමගින් ලබාදීමට අපේක්ෂිතය.
A.1.7	**යෝජනා සඳහා කැඳවීම** ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත අනුව ඕනෑම අධ්‍යක්ෂවරු දෙදෙනෙක් විසින් සිදු කරනු ලබන ලිඛිත ඉල්ලීමක් අනුව විශේෂ රැස්වීමක් කැඳවීමට සභාපතිවරයාට අවස්ථාව ඇත. එවැනි විශේෂ රැස්වීමක් පිළිබඳව රැස්වීමට දින හතරකට පෙර සියළු අධ්‍යක්ෂවරු දැනුවත් කළ යුතුය.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ යහපරිච සංග්‍රහය සමග අනුකූලතාව

කේතය යොමුව	මූලධර්ම
A.1.8	**අධ්‍යක්ෂවරු පුහුණු කිරීම** බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය පත්වීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් පුහුණුවක් හිමිවේ. අදාළ තොරතුරු සඳහා පිටු අංක 177 බලන්න.
A.2	**සභාපති සහ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීගේ වගකීම් බෙදා හැරීම** අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියේ පැහැදිලිව නිර්වචනය කර ඇති බලතුලනය පවත්වා ගැනීම සඳහා හොඳම භාවිතයන්ට අනුකූලව සභාපතිවරයා හා සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී තනතුරු වෙන් කර ඇත. බැංකුවේ සභාපතිවරයා ස්වාධීන හා විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් වන අතර ප්‍රධාන විධායක නිලධාරී අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙක් නොවේ.
A.3	**සභාපතිගේ කාර්යභාරය** යහපාලනය ආරක්ෂා කිරීම සඳහා නායකත්ව කාර්යභාරයක් සපයන අතර, අධ්‍යක්ෂ මණ්ඩලයේ ඵලදායී කාර්යසාධනය සඳහා පහසුකම් සැපයීම අරමුණු කරගෙන සභාපති විසින් නායකත්ව කාර්යභාරයක් ඉටු කරනු ලබයි. ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සමග විවෘත සන්නිවේදනයක් පවත්වාගැනීම සහ උපායමාර්ගික හා මෙහෙයුම් කටයුතු සඳහා දායකත්වය ලබාදීම සභාපතිගේ වගකීම වේ. රැස්වීමේ න්‍යාය පත්‍රය සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී, අධ්‍යක්ෂවරු සහ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්ගේ උපදේශකත්වයෙන් උපාය මාර්ග, කාර්ය සාධනය, සම්පත් බෙදාහැරීම, අවදානම් කළමනාකරණය සහ අනුකූලතාවයට අදාළ කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් සකස් කෙරේ. න්‍යාය පත්‍රයේ අඩංගු කරුණු පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු කාලෝචිත ආකාරයෙන් අධ්‍යක්ෂවරු වෙත ලබාදීම සිදු කෙරේ. සියළුම අධ්‍යක්ෂවරු සිය කාර්යයන් හා වගකීම් සහ අනුකම්ටු ව්‍යුහය පිළිබඳව දැනුවත්ය. න්‍යාය පත්‍රයේ සඳහන් කරුණු සම්බන්ධයෙන් ඵලදායී දායකත්වයක් සැපයීම සඳහා අධ්‍යක්ෂවරු දිරිමත් කෙරේ. අවධානයට ලක් කර ඇති කරුණු පිළිබඳව අධ්‍යක්ෂවරුන්ගේ මතය විමසා දැනගෙන රැස්වීම් වාර්තාවන්හි සටහන් කෙරේ.
A.4	**මූල්‍ය නිපුණත්වය** ඇතැම් අධ්‍යක්ෂවරු මූල්‍ය/ගිණුම්කරණ සහ/හෝ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරු සහ/නැතහොත් අධ්‍යක්ෂ තනතුරු දරන පුද්ගලයන් වන හෙයින් මූල්‍ය හා සම්බන්ධ කරුණු වලදී මාර්ගෝපදේශකත්වය සැපයීම සඳහා අවශ්‍ය මූල්‍ය නිපුණත්වය හා දැනුම අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ.
A.5	**අධ්‍යක්ෂ මණ්ඩලයේ තුලනය** බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත ප්‍රකාරව පත් කරනු ලබන විධායක නොවන අධ්‍යක්ෂවරු සත් දෙනෙකුගෙන් සමන්විත වේ. කෙසේ වෙතත් 2023 වසරේ අධ්‍යක්ෂවරුන් පස් දෙනෙකුගෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වූ අතර, එය රැස්වීම් කැඳවන විට ගණපූරණය ආවරණය කිරීමට ප්‍රමාණවත් වේ. සිය ස්වාධීනත්වය/ස්වාධීන නොවන බව පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වාර්ෂිකව අත්සන් තබන ලද හා දාතම යොදා ඇති ප්‍රකාශයක් ඉදිරිපත් කෙරේ.
A.6	**තොරතුරු සැපයීම** සාමාන්‍යයෙන් සිය කාර්යභාරය හා වගකීම් ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් හෝ අධ්‍යක්ෂ මණ්ඩල අනුකම්ටු රැස්වීම් වලට දින හතකට පෙර සාමාන්‍යයෙන් කළමනාකාරිත්වය විසින් සුදුසු හා කාලීන තොරතුරු ලබාදෙන අතර අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රමාණවත් පරිදි එම කරුණු පිළිබඳව දැනුවත්ව සිටින බවට සභාපති සහතික වන අතර අවශ්‍ය අවස්ථාවන්හිදී තොරතුරු සැපයීම සඳහා කළමනාකරණ නිලධාරීන්ට රැස්වීමට සහභාගී වන ලෙස ඉල්ලා සිටී. කිසියම් අධ්‍යක්ෂවරයෙක් රැස්වීමකට සහභාගී වීමට අපොහොසත් වුවහොත් එම රැස්වීමේදී සාකච්ඡාවට කරනු ලබන කරුණු පිළිබඳව ඊළඟ රැස්වීමට පෙර විධිමත් ලෙස ලේඛනගත කර රැස්වීම් වාර්තා හරහා ක්‍රියාදාමයන් පිළිබඳව යාවත්කාලීන කරනු ලැබේ. අවශ්‍ය රැස්වීම් සහ ලිපිලේඛන වල න්‍යාය පත්‍රය සාමාන්‍යයෙන් දින හතකට පෙර සංසරණය කරනු ලබන අතර, පෙර රැස්වීම් වාර්තාව, රැස්වීම පවත්වා අවම වශයෙන් සති දෙකක් ඇතුළත සංසරණය කෙරේ.
A.7	**අධ්‍යක්ෂ මණ්ඩලය පත් කිරීම** රජයේ හිමිකාරිත්වය දරන බැංකුවක් ලෙස බැංකුව අයත් වන විෂයය භාර අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරු පස් දෙනෙක් පත් කරනු ලබන අතර ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත අනුව අධ්‍යක්ෂවරු දෙදෙනෙක් නිළ බලයෙන් පත් වෙති. නව අධ්‍යක්ෂවරු පත් කිරීමට අදාළ නියාමන අවශ්‍යතාවලට බැංකුව අනුකූල වී ඇත. විස්තර සඳහා 177 පිටුවෙහි ආයතනික පාලනය කොටස බලන්න.
A.8	**නැවත පත් කිරීම** ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත ප්‍රකාරව, අභාවය, ඉල්ලා අස්වීම නිසා හෝ තනතුරෙන් පහ කිරීම හේතුවෙන් යම් අධ්‍යක්ෂවරයෙකුගේ ධූරය නියමිත දිනට පෙර පුරප්පාඩු වන්නේ නම් හැර සාමාන්‍යයෙන් අධ්‍යක්ෂවරයෙකුගේ ධුර කාලය වසර තුනකි. අධ්‍යක්ෂවරු පත් කිරීම සහ නැවත පත් කිරීම පිළිබඳ තොරතුරු සඳහා 177 පිටුවෙහි ආයතනික පාලනය කොටස බලන්න.
A.9	**අධ්‍යක්ෂ මණ්ඩල කාර්යසාධනය ඇගයීම** අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිය වගකීම් සතුටුදායක ලෙස ඉටු කරන බව සහතික කරගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිය කාර්යසාධනය ආශ්‍රිතව ස්වයං ඇගයීමක් සිදු කරනු ලබයි. ඇගයීම් ක්‍රමවේදය යටතේ සෑම අධ්‍යක්ෂවරයෙක්ම අධ්‍යක්ෂ මණ්ඩල ඇගයීම් පත්‍රිකාවක් සම්පූර්ණ කළ යුතුය. රැස් කරගනු ලබන ප්‍රතිචාර අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුව වෙත ඉදිරිපත් කරනු ලබන අතර කමිටුවේ සමාලෝචනයෙන් පසු ඒවා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කෙරේ. 2024 වසර ආරම්භ වන විට මණ්ඩල අනු කමිටු වාර්ෂික ඇගයීම අවසන් කර ඇත.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ යහපරිච සංග්‍රහය සමග අනුකූලතාව

කේතය යොමුව	මූලධර්ම
A.10	**අධ්‍යක්ෂවරු සම්බන්ධ තොරතුරු හෙළිදරව් කිරීම** අධ්‍යක්ෂවරු සම්බන්ධයෙන් සංග්‍රහයේ නිශ්චිතව දක්වා ඇති තොරතුරු පහත දැක්වෙන පරිදි මෙම වාර්තාවේ සඳහන් කර ඇත. නම, සුදුසුකම්, ප්‍රවීනත්වය, ප්‍රමාණාත්මක ව්‍යාපාරික අභිලාෂ සහ පසුබිම් තොරතුරු පිටු අංක 158 සිට 161 දක්වා වන පිටුවල ඇත. අධ්‍යක්ෂවරු, විධායක හෝ විධායක නොවන අධ්‍යක්ෂවරුන්ද සහ/හෝ ස්වාධීන හෝ ස්වාධීන නොවන අධ්‍යක්ෂවරුන්ද යන්න පිටු අංක 174 හි දක්වා ඇත. සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු මූල්‍ය ප්‍රකාශයන්ගේ සටහන් 49.5, පිටු අංක 338 හි දක්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු සාමාජිකත්වය සහ අධ්‍යක්ෂ මණ්ඩල හා අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු සහභාගිත්වය පිටු අංක 174 දක්වා ඇත.
A.11	**සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී ඇගයීම** අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේ සහය ඇතිව උපායමාර්ගික ව්‍යාපාර සැලැස්මේ දක්වා ඇති මූල්‍ය හා මූල්‍ය නොවන ඉලක්ක මත පදනම්ව සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරීගේ කාර්යසාධනය වාර්ෂිකව ඇගයීමට ලක් කෙරේ. අවසන් වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරේ.
B	**අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමිකය**
B.1	ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත හා එහි සංශෝධන ප්‍රකාරව අධ්‍යක්ෂවරුන්ට ගෙවනු ලබන වේතන තීරණය කරනු ලබන්නේ විෂයය භාර අමාත්‍යවරයා විසිනි. ඔහුගේ/ඇයගේ වැටුප තීරණය කිරීම සඳහා කිසිදු අධ්‍යක්ෂවරයෙක් සම්බන්ධ නොවේ. අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමිකය සහ මට්ටම සැකසීම යන කොටස අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු වාර්තාවේ පිටු අංක 185 සහ 186 හි දක්වා ඇත.
B.2	**පාරිශ්‍රමික වල සැකැස්ම හා මට්ටම** රාජ්‍ය බැංකුවක් ලෙස ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත ප්‍රකාරව පාරිශ්‍රමිකවල සැකැස්ම හා මට්ටම තීරණය කරනු ලබන්නේ විෂයයභාර අමාත්‍යවරයා විසිනි.. අධ්‍යක්ෂ වරුන්ගේ පාරිශ්‍රමික සහ මට්ටම් සැකසීම පිටු අංක 181 හි ඇතුළත් වේ.
B.3	**පාරිශ්‍රමික පිළිබඳ හෙළිදරව් කිරීම** අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමිකවල සැකැස්ම හා මට්ටම පිටු අංක 181 හි දැක්වේ. අධ්‍යක්ෂවරුන්ගේ සමස්ත පාරිශ්‍රමිකවල පිළිබඳ තොරතුරු සඳහා පිටු අංක 338 පිටුවෙහි මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් 49.5 ට යොමු වන්න. අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු සාමාජිකයන් පිළිබඳ තොරතුරු සඳහා පිටු අංක 185 සිට 186 යොමුවන්න.
C	**කොටස් හිමියා සමග සබඳතා**
C.1	**වාර්ෂික මහා සභා රැස්වීම ඵලදායී ලෙස භාවිතයට ගැනීම සහ සාමාන්‍ය රැස්වීම් පැවැත්වීම** රාජ්‍ය බැංකුවක් ලෙස ජාතික ඉතිරිකිරීමේ බැංකුව විෂයයභාර අමාත්‍යාංශය සමග නිතිපතා රැස්වීම් පවත්වයි. ශ්‍රී ලංකා රජය බැංකුවේ එකම කොටස් හිමිකරු වේ. කොටස් හිමියා (රජය) නියෝජනය කරමින් අධ්‍යක්ෂ මණ්ඩලයට මුදල් අමාත්‍යාංශයේ නිලධාරියෙක් පත් කර ඇත. වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන අතර, එය විවාදයට විවෘතය. එබැවින්, බැංකුව සිය විෂය පථයට අයත් වන මුදල් අමාත්‍යාංශය හරහා මේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබයි.
C.2	**කොටස් හිමියා සමග සන්නිවේදනය** සන්නිවේදන ප්‍රතිපත්තිය කොටස් හිමියා සමග සන්නිවේදන මාර්ග සකසයි. මෙයට වෙබ්/ඊ-ප්‍රතිචාර, මාධ්‍ය නිවේදන ආදිය ඇතුළත් වේ. කොටස් හිමියාගේ (ශ්‍රී ලංකා රජය) ගැටළු උත්සුකයන් අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේ රජයේ නියෝජිතයන්ගේ සහභාගිත්වයෙන් සාකච්ඡා කරනු ලැබේ. තවදුරටත් අවධානය යොමු කළයුතු ගැටළු අවශ්‍ය පරිදි අමාත්‍යාංශයට හෝ ඉහළ නිලධාරීන් වෙත යොමු කෙරේ.
C.3	**ප්‍රධාන හා ප්‍රමාණාත්මක ගණුදෙනු පිළිබඳව හෙළිදරව් කිරීම** බැංකුවේ හෝ සමූහයේ ශුද්ධ වත්කම් පදනම කෙරෙහි බලපෑමක් ඇති කළ හැකි "ප්‍රධාන ගණුදෙනු" හෝ හෙළිදරව් කරන ලද ගණුදෙනු හැර වෙනත් ප්‍රමාණාත්මක සම්බන්ධිත පාර්ශව ආශ්‍රිත ගණුදෙනු කිසිවක් නොමැත. අධ්‍යක්ෂ මණ්ඩල වාර්ෂික වාර්තාව පිටු අංක 217 සිට 222 දක්වා ඇතුළත් වන අතර මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් අංක 49.5 පිටු අංක 338 හි සිට දැක්වේ.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ යහපරිච සංග්‍රහය සමග අනුකූලතාව

කේතය යොමුව	මූලධර්ම
D	**වගවීම් හා විගණනය**
D.1	**මූල්‍ය හා ව්‍යාපාරික වාර්තාකරණය (වාර්ෂික වාර්තාව)** බැංකුවේ මූල්‍ය තත්වය, කාර්යසාධනය, ව්‍යාපාරික රාමුව, පාලන ව්‍යුහය, අවදානම් කළමනාකරණය, අභ්‍යන්තර පාලන සහ අභියෝග, අවස්ථා හා අපේක්ෂා පිළිබඳ තුලනාත්මක සහ වටහාගත හැකි සමාලෝචනයක් මෙම වාර්ෂික වාර්තාවෙන් ඉදිරිපත් කෙරේ. ප්‍රකාශයට පත් කිරීමට පෙර අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් සමාලෝචනයට ලක් කෙරෙන මූල්‍ය ප්‍රකාශන මෙන්ම අතුරු මූල්‍ය ප්‍රකාශන ද ඇතුළත් වන මෙම වාර්ෂික වාර්තාව සත්‍ය හා සාධාරණ දැක්මක් ලබාදෙන බවටත් අදාළ නීති හා නියාමනයන්ට අනුකූලව සකස් කර ඇති බවටත් සහතික වීම සඳහා බැංකුව විසින් සෑම පියවරක්ම ගන්නා ලදී. සංග්‍රහය මගින් දක්වා ඇති පහත හෙළිදරව් කිරීම් මෙම වාර්ෂික වාර්තාවේ දැක්වේ. ● කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය සඳහා පිටු අංක 96 සිට 150 දක්වා බලන්න. ● අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සඳහා පිටු අංක 217 සිට 222 දක්වා බලන්න. ● අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ ප්‍රකාශනය සඳහා පිටු අංක 223 බලන්න. ● අභ්‍යන්තර පාලන පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය සඳහා පිටු අංක 224 සිට 225 දක්වා බලන්න. ● සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීගේ (මූල්‍ය, ආයතනික සැලසුම් හා කළමනාකරණ තොරතුරු පද්ධති) වගකීම පිළිබඳ ප්‍රකාශය සඳහා පිටු අංක 227 බලන්න. ● සම්බන්ධිත පාර්ශව වල ගණුදෙනු සඳහා පිටු අංක 334 සිට 340 දක්වා සහ සම්බන්ධිත පාර්ශව වල හෙළදරව් කිරීම පිළිබඳ සටහන 49 බලන්න. ● බැංකුවේ ශුද්ධ වත්කම් වටිනාකම 341 පිටුවේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 50 යටතේ දක්වා ඇත.
D.2	**අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලන පිළිබඳ බැංකුවේ පවතින ක්‍රියාවලිය** බැංකුවේ උපායමාර්ග ළඟා කර ගැනීම, සුදුසු අවදානම් කළමනාකරණ ක්‍රමවේදයක් සහ කොටස්හිමිකරුවන්ගේ ආයෝජන සහ බැංකුවේ වත්කම් ආරක්ෂා කිරීමේ අරමුණ ඇතිව මනා අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා එහි අවදානම් අභිරුචිය තීරණය කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරේ. අවදානම් කළමනාකරණයට අදාළ සිය කාර්යයන් ඉටු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයට සහය වන අතර අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව අවදානම් කළමනාකරණ ක්‍රියාවලියේ සහ අභ්‍යන්තර පාලන වල ඵලදායීතාවයට අදාළ අධ්‍යක්ෂ මණ්ඩල කාර්යභාරය ඉටු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට සහයවේ. අදාළ අනු කමිටු වල වගකීම් පිළිබඳ සාරාංශයක් එක් එක් අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටුව පිළිබඳ වාර්තාවේ දැක්වේ. මෙම අනු කමිටු ස්ථාපිත කර තිබෙන්නේ 2007 අංක 12 දරණ ආයතනික පාලනය පිළිබඳ බැංකු පනත, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ යහපරිච සංග්‍රහය සහ බැංකුවේ ප්‍රතිපත්ති වලට අනුකූලවය. බැංකුවේ අවදානම් කළමනාකරණ අංශය විසින් අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට අවශ්‍ය සහය ලබාදෙන අතර බැංකුව අවදානම කළමනාකරණය කරන්නේ කෙසේද යන්න පිළිබඳව සවිස්තරාත්මක වාර්තාවක් පිටු අංක 191 සිට 213 දක්වා ඇති අවදානම් සමාලෝචන වාර්තාව සහ පිටු අංක 188 සිට 189 දක්වා ඇති අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව මගින් බැංකුව අවදානම කළමනාකරණය කරන ආකාරය පිළිබඳ සවිස්තර වාර්තාවක් ඇතුළත් වේ..
D.3	**විගණන කමිටුව** අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වේ. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ විෂයය පථයේ සාරාංශයක් මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 182 සිට 184 දක්වා ඇතුළත් වේ. සංග්‍රහය මත පදනම්ව යොමු කිරීමේ අනුදේශ සකස් කෙරේ අභ්‍යන්තර පාලන පිළිබඳ සමාලෝචනය අභ්‍යන්තර විගණන අංශය විසින් සිදු කරනු ලබන අතර එහි ප්‍රතිඵල නිතිපතා අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව වෙත වාර්තා කරනු ලබයි. අභ්‍යන්තර පාලන වල ඵලදායීතාවය පිළිබඳ බාහිර සහතික කිරීම බාහිර විගණකවරයා වන විගණකාධිපති වෙතින් ලබාගැනේ. එම සහතික කිරීම මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 226 හි ඇතුළත් වේ..
D.4	**සම්බන්ධිත පාර්ශව ආශ්‍රිත ගණුදෙනු පිළිබඳ සමාලෝචන කමිටුව** අධ්‍යක්ෂ මණ්ඩලයේ අභිලාෂ ගැටීම් වලක්වා ගැනීම පිණිස සම්බන්ධිත පාර්ශව, ඔවුන්ගේ ගනුදෙනු සහ සම්බන්ධිත පාර්ශවයන්ට විශේෂ සැලකීමක් නොදැක්වීම ආවරණය වන පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද සම්බන්ධිත පාර්ශව ගනුදෙනු ප්‍රතිපත්තියක් බැංකුව සතු වේ. ප්‍රධාන කළමනාකරණ පිරිසට අදාළ සම්බන්ධිත පාර්ශවයන්ගේ ගණුදෙනු පිළිබඳ වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ 338 පිටුවේ 49.5.2 සටහනේ දක්වා ඇත.
D.5	**ව්‍යාපාර චර්යාව සහ අචාර ධර්ම සංග්‍රහය** ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් ඇතුළු සියළුම සේවකයන්ට අදාළ වන පරිදි අභ්‍යන්තරිකව සකස් කරන ලදුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ව්‍යාපාර චර්යා සහ ආචාර ධර්ම පද්ධතියක් බැංකුව සතුය. බැංකුවේ සියළුම නිලධාරීන් වාර්ෂිකව වත්කම් හා බැරකම් ප්‍රකාශයක් මානව සම්පත් සංවර්ධන අංශය වෙත ඉදිරිපත් කළ යුතුය. සියළුම අධ්‍යක්ෂවරු සිය වාර්ෂික වත්කම් හා බැරකම් ප්‍රකාශය අදාළ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරති. කිසියම් උල්ලංඝණය කිරීමක් වෙතොත් ඒවා හඳුනා ගැනීම හා ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීමට අදාළ ප්‍රතිපත්ති හා ක්‍රමවේද බැංකුව විසින් ස්ථාපනය කර ඇත. ප්‍රසම්පාදන ක්‍රමවේද විනිවිදභාවයෙන් යුක්ත බව සහතික කරගැනීම සඳහා බැංකුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශයක් ක්‍රියාවට නංවයි.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ යහපරිච සංග්‍රහය සමග අනුකූලතාව

කේතය යොමුව	මූලධර්ම
D.6	**ආයතනික පාලන හෙළිදරව් කිරීම්** ස්ථාපිත යහපත් ආයතනික පාලන ප්‍රතිපත්ති හා පරිචයන් සමඟ බැංකුව කෙතරම් දුරකට අනුකූල වී තිබේද යන්න අධ්‍යක්ෂවරු විසින් හෙළිදරව් කල යුතුය. යහපත් ආයතනික පාලන ප්‍රතිපත්ති හා පරිචයන් කෙරෙහි බැංකුවේ අනුකූලතාවය පහත දැක්වෙන වාර්තා වල සඳහන් වේ පිටු අංක 167 සිට 181 දක්වා ඇති ආයතනික පාලන වාර්තාව පිටු අංක 408 සිට 412 දක්වා ඇති ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික යහපරිචයන් පිළිබඳ සංග්‍රහය කෙරෙහි අනුකූලතාව
E/F	**කොටස් හිමිකරු සහ අනෙකුත් ආයෝජකයන්** පාර්ලිමේන්තු පනතකින්, එනම්, ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත යටතේ බැංකුව සංස්ථාපනය කරන ලද අතර ශ්‍රී ලංකා රජය එහි එකම කොටස්හිමිකරු වේ. අවශ්‍ය අවස්ථාවන්හිදී විෂයයභාර අමාත්‍යවරයා ඔස්සේ අනොන්‍ය අවබෝධය මත පදනම්ව බැංකුව ශ්‍රී ලංකා රජය සමඟ නිරන්තර හා ව්‍යුහාත්මක සාකච්ඡා පවත්වයි.
G	**අන්තර් ජාලය හා සයිබර් ආරක්ෂාව** දත්ත/තොරතුරුවල රහස්‍ය භාවය, අඛණ්ඩතාවය පවතින බව සහතික කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් ගෝලීය වශයෙන් පිළිගත් යථාර්තවාදී ප්‍රමිතිය, ගෙවීම් කාඩ්පත් කර්මාන්ත දත්ත ආරක්ෂණ ප්‍රමිතිය (PCI DSS) යටතේ බැංකුව සහතික කර ඇත. එබැවින් බැංකුවේ තොරතුරු පද්ධති සයිබර් තර්ජනවලින් ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කර ඇති මූලික ආරක්ෂක ප්‍රමිතියේ දක්වා ඇති අවශ්‍යතා මෙන්ම තොරතුරු ආරක්ෂාවට අදාළ දැඩි කළමනාකරණය, භෞතික සහ තාක්ෂණික පාලනයන්ට අනුකූලව බැංකුවේ (ISMS) තොරතුරු තාක්ෂණ පද්ධතියක් ස්ථාපිත කර ඇත. බැංකුවේ සමස්ත තොරතුරු ආරක්ෂණ කාර්යය සඳහා මග පෙන්වීමත් සැපයීම සඳහා සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී වෙත වාර්තා කරන ප්‍රධාන තොරතුරු ආරක්ෂණ නිළධාරියෙක් (CISO) බැංකුව විසින් පත් කර ඇත. සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී විසින් සභාපතිත්වය දරණ බැංකුවේ තොරතුරු ආරක්ෂාව සඳහා වගකිව යුතු කළමනාකරණ මට්ටමේ ආයතනය වන්නේ තොරතුරු ආරක්ෂණ කමිටුව (ISC) වන අතර එය අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව හරහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරන අතර, තොරතුරු සහ සයිබර් අවදානම් කළමනාකරණය සඳහා අධීක්ෂණ වගකීම් පවරා ඇත. තොරතුරු තාක්ෂණ කළමනාකරණ (ISMS) රාමුවට අනුව සේවකයින්, හවුල්කරුවන් සහ අනෙකුත් බාහිර පාර්ශ්වයන් විසින් සපුරාලිය යුතු සියලුම ආරක්ෂණ අවශ්‍යතා නිර්වචනය කරන විස්තීරණ, මණ්ඩලය අනුමත තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තිය (ISP) බැංකුව විසින් ක්‍රියාත්මක කර ඇත. ISO/TEC 27001:2013 ප්‍රමිතියට මූලිකව පෙළගැසී ඇති තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තිය තොරතුරු ආරක්ෂාව, භෞතික සහ තාර්කික ප්‍රවේශ පාලනය, වෘත්කම් කළමනාකරණය, මෙහෙයුම් සහ සන්නිවේදන ආරක්ෂාව, මානව සම්පත් ආරක්ෂාව, සැපයුම්කරු සබඳතා, තොරතුරු ආරක්ෂණ සිදුවීම් කළමනාකරණය, ව්‍යාපාර අඛණ්ඩ කළමනාකරණය යනාදිය බැංකු ජාලයේ/වල තොරතුරු සහාය තොරතුරු සැකසුම් පහසුකම් ආරක්ෂා කිරීම සහ සංවිධානය තුළ සහ බාහිර ආයතන සමඟ හුවමාරු වන තොරතුරුවල ආරක්ෂාව පවත්වා ගැනීම සඳහා ජාල ආරක්ෂණ කළමනාකරණ පාලන සහ තොරතුරු හුවමාරු ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තිය (ISP) තුළ අර්ථ දක්වා ඇත. බැංකුවේ ප්‍රතිපත්ති සහ අනුකූලතා අවශ්‍යතා අනුව (උදාහරණ PCI DSS,CBSL) බැංකුවේ සයිබර් අවදානම් පැහැකඩ මැන බැලීම සඳහා අවදානම් තක්සේරු කිරීම්, විනිවිදයාමේ පරීක්ෂණ යෙදුම් ආරක්ෂණ තක්සේරු කිරීම්, වින්‍යාස තක්සේරු කිරීම් වැනි තාක්ෂණික ආරක්ෂණ තක්සේරු කිරීම් බැංකුව විසින් වරින් වර (මාසික, කාර්තුමය,සය මාසිකව සහ වාර්ෂිකව) සිදු කරයි. තොරතුරු තාක්ෂණ කළමනාකරණ රාමුව (ISMS) ස්වාධීනව PCI කවුන්සිලයේ සුදුසුකම් ලත් ආරක්ෂක තක්සෙරුකරුවන් විසින් වාර්ෂික පදනමෙන් සහතික වේ. තොරතුරු තාක්ෂණ කළමනාකරණ රාමුව (ISMS) හි කාර්ය සාධනය සහ කිසියම් අපගමනයක් වේ නම්, තොරතුරු ආරක්ෂණ සිදුවීම්, අභ්‍යන්තර හා බාහිර තොරතුරු ආරක්ෂණ විගණනවල ප්‍රතිඵල, තොරතුරු ආරක්ෂණ මාර්ග සිතියම/සයිබර් ආරක්ෂණ ව්‍යාපෘතිවල ප්‍රගතිය මෙන්ම බැංකුවේ තොරතුරු ආරක්ෂණ අවදානම් පැහැකඩ තොරතුරු ආරක්ෂණ කමිටුව වෙත නිරන්තරයෙන් වාර්තා කරනු ලබන අතර ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව අවදානම් දර්ශක සහ අනෙකුත් වාර්තා හරහා වරින්වර යාවත්කාලීන කරනු ලැබේ.
H	**පරිසරය, සමාජය හා පාලනය (ESG)**
H.1	**පරිසර, සමාජ හා පාලන වාර්තාකරණය (ESG)** අවස්ථාවන් ග්‍රහණය කරගන්නා අතර සහ අවදානම් කළමනාකරණය කරන අතර වටිනාකම් නිර්මාණය කරගැනීම සඳහා වන සාකල්‍ය ප්‍රවේශයක් තිරසාර ව්‍යාපාරික ප්‍රවේශය තුල අන්තර්ගත වේ. බැංකුව එහි ව්‍යාපාර සම්බන්ධයෙන් අදාළ කරගන්නා තිරසාර ප්‍රවේශයේදි බැංකුව විසින් සිය කෙටි, මධ්‍යම හා දිගු කාලීන උපායමාර්ග ඔස්සේ නිර්මාණය කරන ලද ආර්ථික, සමාජයීය හා පාරිසරික වටිනාකම් පිළිබඳව අවධානය යොමු කරනු ලබයි. තිරසාර වාර්තාකරණයේදී බැංකුව, පිළිගැනීම, තක්සේරු කිරීම සහ හෙළිදරව් කිරීම සිදු කළ යුතුය. සංග්‍රහය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු තොරතුරු වාර්ෂික වාර්තාවේ පහත සඳහන් කොටස් වල දැක්වේ. • කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණය - පිටු අංක 96 සිට 150 දක්වා බලන්න. • ආයතනික පාලනය - පිටු අංක 167 සිට 181 දක්වා බලන්න. • පාර්ශ්වකරුවන් - පිටු අංක 81 සිට 93 දක්වා බලන්න. • ප්‍රමාණාත්මකබව - පිටු අංක 45 සිට 59 දක්වා බලන්න. මේ වාර්ෂික වාර්තාව IIRC රාමුවට සහ GRI මාර්ගෝපදේශයන්ට අනුකූල වී ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කරන ලද අනෙකුත් හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවයන්

බලපත්‍රලාභී විශේෂිත බැංකුවලට අදාළව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීම් වලට අදාළ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවා ඇති ආකෘති වලට අනුකූලවීම.

	හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවය	විස්තරය	පිටු අංකය
1	**මූල්‍ය තත්ත්වය හා කාර්යසාධනය සඳහා මූල්‍ය උපකරණවල වැදගත්කම පිළිබඳ තොරතුරු**		
1.1	මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනය		
1.1.1	මූල්‍ය වත්කම් හා වගකීම් වර්ග හෙළිදරව් කිරීම්	මූල්‍ය ප්‍රකාශනවලට සටහන් : සටහන් අංක 15 - මිණුම්කරණ පදනම මත මූල්‍ය උපකරණ විශ්ලේෂණය	272
1.1.2	අනෙකුත් හෙළිදරව් කිරීම්		
	i. ලාභ හෝ පාඩු මගින් සාධාරණ අගයට ගණනය කිරීම සඳහා නම්කළ මූල්‍ය වත්කම් හා වගකීම් පිළිබඳ විශේෂ හෙළිදරව් කිරීම්, ණය අවදානම හා වෙළඳපොළ අවදානම, මෙම අවදානම් සඳහා ආරෝපිත සාධාරණ අගයෙහි වෙනස්වීම් සහ ඇගයීම් ක්‍රම යනාදිය ද මෙයට ඇතුළත් වේ.	සැලකියයුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති: සටහන් 2.5.1.4.5 ලාභ හෝ පාඩු මගින් සාධාරණ අගයට ගණනය කිරීම සඳහා නම් කළ මූල්‍ය වත්කම් සටහන් 2.5.1.5.1 ලාභ හෝ පාඩු මගින් සාධාරණ අගයට ගණනය කිරීම සඳහා නම් කළ මූල්‍ය වගකීම්	249 250
	ii. මූල්‍ය උපකරණ එකින් එකට ප්‍රතිවර්ගීකරණය කිරීම	සැලකියයුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති සටහන් 2.5.1.7 මූල්‍ය වත්කම් සහ වගකීම් ප්‍රතිවර්ගීකරණය	251
	iii. සුරැකුම් ලෙස ඇපයට තබා ඇති මූල්‍ය වත්කම් පිළිබඳ තොරතුරු සහ සුරැකුම් වශයෙන් පවත්වාගෙන යන මූල්‍ය සහ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ තොරතුරු	මූල්‍ය ප්‍රකාශනවල සටහන් : සටහන් අංක 22 - ක්‍රමක්ෂය පිරිවැය සඳහා පවතින මූල්‍ය වත්කම් - ණය සහ අනෙකුත් උපකරණ	288
	iv. මූල්‍ය වත්කම් වර්ගවල ණය අලාභ සඳහා දීමනා ගිණුම සංසන්දනය	සටහන් අංක 16 - මුදල් හා මුදල් සමානයන් සටහන් අංක 18 - බැංකුවල ඇති තැන්පතු සටහන් අංක 21(ඈ) - වසර තුලදී හානිකරණය සංචලනයන් සටහන් අංක 22(ආ) - වසර තුලදී හානිකරණය සංචලනයන්	275 276 283 290
	v. බහුවිධ ව්‍යුත්පන්න උපකරණ වලින් සමන්විත සංයුක්ත මූල්‍ය උපකරණ පිළිබඳ තොරතුරු	බැංකුව සතුව බහුවිධ සංයුක්ත ව්‍යුත්පන්න උපකරණ වලින් සමන්විත මූල්‍ය උපකරණ නොමැත.	
	vi. ණය ගිවිසුම් කඩකිරීම් පිළිබඳ කොන්දේසි	නැත	
1.2	**විස්තීර්ණ ආදායම් ප්‍රකාශය**		
1.2.1	ආදායම්, වියදම්, ලාභ හා පාඩු අයිතම අනාවරණය	මූල්‍ය ප්‍රකාශනවලට සටහන් : සටහන් අංක 3 -13	259-270
1.2.2	අනෙකුත් හෙළිදරව් කිරීම්		
	i. ලාභ හෝ පාඩු මගින් සාධාරණ අගයට මිනුම් නොකළ මූල්‍ය උපකරණ මත වන මුළු පොළී ආදායම හා පොළී වියදම	මූල්‍ය ප්‍රකාශනවලට සටහන් : සටහන් අංක 4 - ශුද්ධ පොළී ආදායම	259
	ii. ගාස්තු ආදායම හා වියදම	මූල්‍ය ප්‍රකාශනවලට සටහන් : සටහන් අංක 5 - ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම	262
	iii. මූල්‍ය වත්කම් කාණ්ඩය අනුව හානිකරණ අලාභ වටිනාකම	මූල්‍ය ප්‍රකාශනවලට සටහන් : සටහන් අංක 10 - හානිකරණ වියදම්	265
	iv. හානිකරණය වූ මූල්‍ය වත්කම් මත පොළී ආදායම	මූල්‍ය ප්‍රකාශනවලට සටහන් : සටහන් අංක 4(අ) පොළී ආදායම	260

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කරන ලද අනෙකුත් හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවයන්

	හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවය	විස්තරය	පිටු අංකය
1.3	**අනෙකුත් හෙළිදරව් කිරීම්**		
1.3.1	මූල්‍ය උපකරණ සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති	සටහන් අංක 2.5.1 මූල්‍ය උපකරණ මූලික හඳුනාගැනීම, වර්ගීකරණය සහ පසුව මිනුම් කිරීම	248
1.3.2	ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට ගණනය කිරීම සඳහා නම් කළ මූල්‍ය වගකීම්	බැංකුව/සමූහය මගින් මූල්‍ය වගකීමක් ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නියම කර නැත. මූල්‍ය ප්‍රකාශනවලට සටහන් : සටහන් 2.5.1.5.1 ලාභ හෝ පාඩු මගින් සාධාරණ අගයට ගණනය කිරීම සඳහා නම් කළ මූල්‍ය වගකීම්	250
1.3.3	**වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට නම් කළ හිමිකම් උපකරණ ආයෝජන**		
	(i) වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට නම් කළ හිමිකම් උපකරණ පිළිබඳ විස්තර සහ එසේ නම් කිරීමට හේතු	මූල්‍ය ප්‍රකාශනවලට සටහන් : සටහන් අංක 23 - වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට නම් කළ මූල්‍ය වත්කම්	290
	(ii) ශේෂපත්‍ර දිනට පවතින ආයෝජනයන්හි සාධාරණ අගය	මූල්‍ය ප්‍රකාශනවලට සටහන් : සටහන් අංක 23 (අ) - ලැයිස්තුගත ආයෝජන ස්කන්ධ සුරකුම් - බැංකුව හා සමූහය සටහන් අංක 23 (ඉ) - ලැයිස්තුගත නොවන ආයෝජන - හිමිකම් සුරකුම්	292 293
	(iii) කාලපරිච්ඡේදය තුළදී හඳුනාගත් ලාභාංශ, වාර්තා කළ කාලපරාසය තුළදී ඉවත් කළ ආයෝජන සහ ශේෂපත්‍ර දිනට පවතින ආයෝජන සඳහා වෙන වෙනම හඳුනා ගැනීම	මූල්‍ය ප්‍රකාශනවලට සටහන් : සටහන් අංක 9 - වෙනත් ශුද්ධ මෙහෙයුම් ආදායම්	264
	(iv) කාලපරිච්ඡේදය තුළදී හිමිකම් තුල පවතින සමුච්චිත ලාභ හෝ අලාභ මාරු කිරීම සහ ඒ සඳහා හේතු	ආදායම් ප්‍රකාශය, විස්තීරණ ආදායම් ප්‍රකාශය සහ ප්‍රකාශිත ප්‍රාග්ධන අයිතිය සහ සංචිත වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය	232-233 236-239
	(v) කාලපරිච්ඡේදය තුළදී ඉවත් කරන ලද වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට නම් කළ හිමිකම් උපකරණ ආයෝජන හඳුනා ගැනීම – ආයෝජන බැහැර කිරීමට හේතු – ඉවත් කල දිනට ආයෝජනයන්හි සාධාරණ අගය – බැහැර කිරීමේ සමුච්චිත ලාභ හෝ අලාභ	ආදායම් ප්‍රකාශය, විස්තීරණ ආදායම් ප්‍රකාශය සහ ප්‍රකාශිත ප්‍රාග්ධන අයිතිය සහ සංචිත වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය	232-233 236-239
1.3.4	**මූල්‍ය වත්කම් ප්‍රතිවර්ගීකරණය**		
	(i) ප්‍රතිවර්ගීකරණය කළ වර්තමාන හෝ පෙර වාර්තා කාලපරිච්ඡේද මූල්‍ය වත්කම්හි – ප්‍රතිවර්ගීකරණ දිනය – ආයතනික ආකෘතිය වෙනස්වීම පිළිබඳ විස්තරාත්මක පැහැදිලි කිරීම සහ මූල්‍ය ප්‍රකාශනයන්ට එහි බලපෑම පිළිබඳව ගුණාත්මක විස්තරය – එක් එක් කාණ්ඩයට ඇතුළත් කරන ලද හා ඉවත් කරන ලද ප්‍රතිවර්ගීකරණය කළ වටිනාකම්	සටහන 2.5.1.7 මූල්‍ය වත්කම් සහ වගකීම් ප්‍රතිවර්ගීකරණය කාලපරිච්ඡේදය තුළදී බැංකුව විසින් මූල්‍ය වත්කම් ප්‍රතිවර්ගීකරණය කර නොමැත.	251
	(ii) ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයෙන් ක්‍රමක්ෂය පිරිවැයට හෝ වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ප්‍රතිවර්ගීකරණය කිරීම – ප්‍රතිවර්ගීකරණ දිනට තීරණය කළ සඵල පොලී අනුපාතය – හඳුනාගත් පොලී ආදායම	කාලපරිච්ඡේදය තුළදී බැංකුව විසින් මූල්‍ය උපකරණයක් ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයෙන්, වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට හෝ ක්‍රමක්ෂය පිරිවැයට වර්ගීකරණය කර නොමැත.	

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කරන ලද අනෙකුත් හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවයන්

	හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවය	විස්තරය	පිටු අංකය
